ඒ. ටී. ආරියරත්න



භව තණ්හා

පළමුවන වෙලුම

ස්ව චරිතාපදානය

භව තණ්හා

ස්ව චරිතාපදානය

පළමුවන වෙලුම

(1931 - 1972)

ඒ. ටී. ආරියරත්න

භව තණ්හා යනුවෙන් නම් කර ඇති මේ ස්ව චරිතාපදානය ආචාර්ය ඒ. ටී. ආරියරත්නයන් විසින් එදිනෙදා සටහන් කරන ලද දින පොත් හා සටහන් පිටු දහස් ගණනක් කැටිකොට ලියන ලද්දකි. එය චරිත කතාවක් හැටියට සම්පිණ්ඩනය කිරීම ඉතා අමාරු කටයුත්තක් සේ ආචාර්ය ආරියරත්නයන් සඳහන් කරයි. මේ නිසා තමා අතින් ලියැවුණ සෙසු පොත්පත් හා ලිපි ද කියැවූ පාඨකයනට ඊට වඩා වැඩි යමක් දැන ගැනීමට උපකාරී වන කෘතියක් ලෙස මෙම පොත එතුමා දක්වයි.

සර්වෝදය දර්ශනය ව්‍යාප්ත කිරීමට මහාද්වීප පහටම ගොස් ඇති ආචාර්ය ඒ. ටී. ආරියරත්නයන්, ඒ ගමන්වලදී අවස්ථාව ලත් හැම විටකම ඒ රටවල දීම, නැතහොත් ගුවන් යානයේදී විස්තර සටහන් ලියන අතර'තුර, උපන්දා සිට මතක සටහන්ද ලියා තැබුවේය. එය වර්තමානයෙන් අතීතයටත් – අතීතයෙන් – වර්තමානයටත් දෝලනය වන රීතියකින් ලියැවුණු බව එතුමා කියයි.

මේ භව තණ්හා පළමුවන වෙලුමයි. ඉතිරි වෙලුම් හතර ද අනුපිළිවෙලින් ඉදිරි කාලයේ ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

සර්වෝදය විශ්ව ලේඛා ප්‍රකාශනයක්

සර්වෝදය පොත් එකතුව/විශ්ව ලේඛා ප්‍රකාශන

දෙල්ගහයට ගෙදර විප්ලවය (පළමු මුද්‍රණය)	–	1978
(දෙවන මුද්‍රණය)	–	1987
දේශන සංහිතා	–	1995
ලේඛන සංහිතා	–	1997
යුග පුරුෂයෙකුගේ කතාව (ළමයින්ට)	–	1997
ජනාධිපති ප්‍රේමදාසයි පුරවැසි මමයි	–	1999
සර්වෝදය මාර්ගෝපදේශකයා	–	1999
සර්වෝදය – මහත්මා ගාන්ධි	–	1999
උගුල – ජේම්ස් ගෝල්ඩ්ස්මිත්	–	1996
(සංස්: වෛද්‍ය වින්‍යා ආරියරත්න)		

The Sarvodaya Book Collection / VISHVA LEKHA PUBLICATIONS

COLLECTED WORKS
by Dr. A.T. Ariyaratne

Edited by Prof. Nandasena Ratnapala
in an exclusive gift pack
Reprinted in 1999

Vol. I	-	1978
Vol. II	-	1980
Vol. III	-	1985
Vol. IV	-	1989
Vol. V	-	1991
Vol. VI	-	1996
Vol. VII	-	1999

Voices from the Heart	1999
With Gandhiji in Ceylon	1998
Revolution under the Breadfruit Tree	1988
People's Movement Under Seige	1993
Schumaker Lectures on Buddhist Economics	1999
Apostle of Peace (S. Godage Books)	1997
Sarvodaya and Buddhism	1997

භව තණ්හා

ස්ව චරිතාපදානය

පළමුවන වෙලුම
(1931 - 1972)

ඒ. ටී. ආරියරත්න

සර්වෝදය

විශ්ව ලේඛා
ප්‍රකාශකයෝ

41 ලුම්බිණි මාවත රත්මලාන

© ඒ. ටී. ආරියරත්න

පළමුවන මුද්‍රණය: 2001

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය – ප්‍රකාශනගත සූචිකරණ දත්ත

ආරියරත්න, ඒ. ටී.
භව තණ්හා/ඒ. ටී. ආරියරත්න –
රත්මලාන : සර්වෝදය විශ්ව ලේඛා, 2001
පි.600: සෙ. මී. 22: ආචාර්ය ඒ. ටී. ආරියරත්න
මහතාගේ ස්ව චරිතාපදානය
ISBN 955-599-224-X මිල : රු. 750/-
i. 920 ඩිවි 21 ii. ග්‍රන්ථ නාමය
1. චරිතාපදාන 2. ස්ව චරිතාපදාන

ISBN 955-599-224-X

මුද්‍රණය

සර්වෝදය
විශ්ව ලේඛා

41 ලුම්බිණි මාවත රත්මලාන

දශක හතරක්ම අඛණ්ඩව සර්වෝදය සංසදයට ආශිර්වාදයක් වූ

සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක*

මැතිනියගේ කීර්තිමත් නාමයට

ස්ව චරිතාපදානයේ පළමුවන වෙලුම - භව තණ්හා

භක්ති ප්‍රණාමයෙන් පුද කරමි.

ඒ. ටී. ආරියරත්න

* තමන්ගේ දුර්වල ශාරීරික සෞඛ්‍යයක් තිබියදීත් ගරු අගමැතිනි සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මැතිනිය සර්වෝදය විශ්ව සමාධි ශාලාවේ 1996 ජුනි මස 29 දින පැවැති සිව්වැනි සර්වෝදය වාර්ෂික සම්මාන ප්‍රදානෝත්සවයට ප්‍රධාන අමුත්තා වශයෙන් පැමිණි අවස්ථාව.

ඡායාරූපය: ප්‍රියන්ත කොළඹගේ

පෙරවදන

මා මේ ස්වයං ලිඛිත චරිතාපදානය ලිවීමට පටන් ගත්තේ 1976 අප්‍රේල් 4 දාය. එනම්, හරියටම අවුරුදු 24 කට ඉහතදීය. මේ කාලය ඇතුළතදී මා ගැන චරිත කතා කිහිපයක්ම සුප්‍රසිද්ධ ලේඛකයින් කිහිප දෙනෙකු විසින් ලියා පළ කරන ලදී. මෙයින් ප්‍රධානම කෘතිය සම්පාදනය කළේ ගුණදාස ලියනගේ මහත්මා ය. එය 1978 අගෝස්තු මස පළවුණු අතර, එහිම විශාල කරන ලද දෙවැනි මුද්‍රණයක් 1987 අගෝස්තු මාසයේදී ප්‍රකාශයට පත් විය. ඔහු මේ චරිතාපදානය නම් කර තිබුණේ *දෙල්ගහයට ගෙදර විප්ලවය* යනුවෙනි.

දෙල්ගහ යට ගෙදර විප්ලවය ඉංගිරිසි, ජපන්, දෙමළ ආදී භාෂාවලටද පරිවර්තනය විය. පොත, එහි කර්තෘ විසින්ම සොයා ගන්නා ලද කරුණු අනුව ලියැවී තිබුණ අතර, ඔහු මගෙන් ඉල්ලූ සෑම තොරතුරක්ම මම සැපයීමි. මා විසින් වරින් වර නොයෙක් රටවලදී විශේෂයෙන් දීර්ඝ ගුවන් ගමන් යන අතර ලියා තුබූ මතක සටහන් පොත්ද කියැවීමට ඔහුට ඉඩ දුනිමි.

මගේ කුඩා කාලය අළලා ලාල් ප්‍රේමනාත් ද මැල් මහතා "*අලුත් පාර*" (1981 නොවැම්බර් පළමුවැනි මුද්‍රණය හා 1982 දෙවැනි මුද්‍රණය) සහ "*යුග පුරුෂයකුගේ කතාව*" (1997 ජූලි මාසයේදී) පළ කොට තිබේ. **THE APOSTLE OF PEACE** *(සාමයේ ශ්‍රාවකයා)* යන මැයින් ප්‍රේමිල් රත්නායක මහතා මා ගැන ඉංගිරිසි පොතක් සම්පාදනය කළේ 1997දීය.

මගේ 50 වන ජන්ම දිනය නිමිත්තෙන් මහාචාර්ය නන්දසේන රත්නපාල මහත්මා විසින් අභිස්තව සංග්‍රහයක් ද **(A Felicitation Volume)**, මගේ 60 වන ජන්ම දිනය නිමිත්තෙන්, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහත්මා විසින් "*අංජලී ප්‍රණාම*" නම් කෘතියක් ඉංගිරිසියෙන් හා සිංහලෙන්ද එළි දක්වන ලදී. ලොව පුරා මා ගැන දත් මිතුරන් විසින් මේවාට ලිපි සපයා තිබේ. මේ හැරුණු විට, විවිධ රටවල අය මා ගැන විවිධ අන්දමේ තොරතුරු හා අදහස් විවිධ බසින් පළ කොට තිබේ.

මෙසේ මා ගැන හොඳ මෙන්ම නරක ද, ප්‍රශංසා මෙන්ම – නිග්‍රහයන්ද, සත්‍යය මෙන් ම, අසත්‍යයද ලියා පළ කළ හැම දෙනාටම පොදුවේ උපේක්ෂා සහගතව මම පින් දෙමි.

"භව තණ්හා" යනුවෙන් නම් කර ඇති මේ ස්ව චරිතාපදානය මා විසින්ම එදිනෙදා සටහන් කරන ලද දිනපොත් හා සටහන් පිටු දහස් ගණනක් කැටිකොට ලියන ලද්දකි. එය චරිත කතාවක් හැටියට සම්පිණ්ඩනය කිරීම ඉතා අමාරු කටයුත්තක් විය. මේ නිසා මා අතින් ලියැවුණු සෙසු පොත්පත් හා ලිපි ද කියැවීමෙන්, මගේ ජීවිතය පිළිබඳ උනන්දු වන අයට තවත් යමක් දැන ගැනීමට හැකි වේ. සමහර විට තමන්ගේ ජීවිතයට ප්‍රයෝජනවත් වන යමක්ද, ඒවායින් උගත හැකි වේ.

මේ පොත ලියැවී තිබෙන ශෛලිය ගැන යමක් කිව යුතුය. මම සර්වෝදය දර්ශනය ව්‍යාප්ත කිරීමට මහාද්වීප පහටම ගොස් ඇත්තෙමි. අවස්ථාව ලත් හැම විටකම, ඒ රටවලදීම – නැතහොත් ගුවන් යානයේදී, ඒ ගමන් විස්තර සටහන් පොතේ ලීවෙමි. එසේ ලියාගෙන යන අතර උපන් දා සිට – පිළිවෙළින් මතකයට එන දේ ද ලියා තැබුවෙමි. මේ හේතුවෙන් මේ කතාන්තරය, වර්තමානයේ (එනම් ඒ ලියූ දින) සිට අතීතය දක්වා දිවේ. නැවත අතීතයේ සිට වත්මනට දිවේ. නැවතත් නැවැත්වූ තැන සිට අතීතයට දිවේ. වත්මනත් – අතීතයත් මේ මොහොතේදී එක් වන විට කතාන්තරය නිමැ වේ.

මේ ස්ව චරිතාපදානය කියවන ඔබට, මගේ ජීවිතයේ තල දෙකක් පෙනෙනු ඇත. එකක් මට මෙන්ම, අන් අයටත් පොදු අත්දැකීම්ය. අනෙක, මට තර්කයෙන් තේරුම් කළ නොහැකි, මට පෞද්ගලිකව බලපෑම්ද කළ නොහැකි යම් ආකාරයක අන්තර් ඥානයකට සම්බන්ධ වූ අත්දැකීම්ය. මේවා මා අත් දුටු විලසින්ම, ලියා තැබීමට මම පසුබට නොවීමි.

ඊළඟ වෙලුම්වලදී, මෙවැනි සිද්ධීන් වඩ වඩාත් විස්තර වනු ඇත. සමහර විට, මාස කීපයක් හෝ ඔබ්බෙහි සිදුවන දේවල් ඒ අන්දමටම, සැබෑ ජීවිතයත් – සිහින ජීවිතයත් අතර වූ ආකාරයකින් මා අත් දැක තිබේ. බොහෝ අවස්ථාවලදී මගේ මිතුරන්ගේ තර්කානුකූල යම් වැදගත් තීරණ ප්‍රතික්ෂේප කොට, අන්තර් ඥානයෙන් මට අවබෝධ වූ ආකාරයට, සමහර විට – ඉතා භයානක තීරණ පවා මා විසින් ගෙන තිබේ.

මේ ස්වයං චරිතාපදානයේ සිංහල භාෂා ව්‍යාකරණ රීතිය හැකි තාක් ඒ පිළිවෙලටම මා ලියා ඇතත්, පද බෙදීම හැරුණ විට – වචනයක මුල–අග ප්‍රත්‍ය බෙදීම මවිසින් බැහැර කර ඇත්තේ හිතාමතාමය; හේතුව අප වචන කඩන්නේ නැත්නම් බෙදන්නේ ඒ වචනයෙන් වෙනමම අර්ථයක් දනවන අවස්ථාවලදී පමණි.

ඒ අනුව ස්වයං චරිතාපදානය වචන දෙකකට කඩා ලියුවෙමි. ප්‍රත්‍ය වශයෙන් යෙදෙන අක්ෂර එසේ වෙන් කිරීමේ අවශ්‍යතාවක් මට නොහැඟේ.

සිංහල හෝඩියේ අකුරු 54 හේතුවෙන් තවම අපට 'පෝටබල්' නැත්නම් පහසුවෙන් ගෙන යා හැකි වර්ගයේ කුඩා යතුරු ලියන දැන් නිෂ්පාදනය නොවන්නේ, පරිගණක (සිංහල) අකුරු සංයෝජනය සඳහා යතුරු පුවරු (key board) සම්බන්ධ තවමත් අවුලක් ඇත්තේ එහෙයිනි.

අක්ෂර භාවිතයේදී මූලික අක්ෂරය හැකි හැම තැනකම යොදා ඇත්තේ හැකි තාක් ප්‍රභේද අවම කර ගැනීමේ පහසුව ඇති කරනු පිණිසය; එමෙන් ඒ මූලික අක්ෂරය සියලු ප්‍රභේද උදෙසාම යොදා ගැනීමට අවකාශ ඇති බව පෙන්වා දීමත් උදෙසාය.

ඉස්පිලි–පාපිලි සම්බන්ධව, ප්‍රවීන ලේඛක අජිත් තිලකසේන මහතාද (අප එකඟ නොවූවත්) නව අක්ෂර ප්‍රභේද ලිවීම විෂයයෙහි ක්‍රම දක්වා ඇත.

හෙළ ජාතික චින්තනය හඳුනා, ඒ ඔස්සේ 21 වන සියවසට පිය නඟනු රිසි අප හැමට, භාෂාව සම්බන්ධවද අලුතින් – වඩා නිවරද ආකාරයට සිතන්නට කාලය එළඹ ඇත.

මගේ වෑයම ආලෝක පුංජයක් පමණි; වියත්හු ඒ ගැන අපව දැනුවත් කරත්වා!

මේ භව තණ්හාවේ පළමුවන වෙළුමයි. ඉතිරි වෙළුම් හතර ද ළඟදීම ඔබ අතට පත් කරමි.

භව තණ්හා සම්බන්ධ සහෘද පාඨක ප්‍රතිචාර ලියා දන්වන්නේ නම් ඉතාමත් අගය කරමි.

ඒ. ටී. ආරියරත්න

විශ්ව නිකේතනය
රාවතාවත්ත පාර මොරටුව
2000 නොවැම්බර් 5 දා

හැඳින්වීම

ඒ. ටී. ආරියරත්න මහතාගේ 'භව තණ්හා' ස්ව චරිතාපදානය කියවීම මට විචිත්‍ර අත්දැකීමක් විය. වෙනත් මූලාශ්‍ර වලින් ආරියරත්න මහතාගේ ජීවිත කතාව පිළිබඳ තොරතුරු දැන ගත්තත් මෙහිලා කාරණා කියන්නේ ආරියරත්න මහතාම නිසා එහි විශේෂයක් ඇත. තමා ලියන කතාවට නම දුන්නේ භව තණ්හා යනුවෙනි.

"මේ භව තණ්හා ගැන මා ලැජ්ජා නොවන්නේ තවමත් මා කෙළෙස් ජය ගැනීමට නුපුළුවන් වූ කෙනෙකු බැවිනි. මේ ආසාව නිසා වුව ලියැවෙන මේ පොතින් එය කියවන ඔබට ප්‍රයෝජනයක් තිබිය යුතු යැයි මම විශ්වාස කරමි. එමෙන්ම මගේ චිත්ත ශක්තියෙන් හා කාය ශක්තියෙන් වැඩි කොටසක් කැප කළ සර්වෝදය ශ්‍රමදාන සංසදයට ද මෙයින් වැඩක් විය යුතුය."

ආචාර්ය ආරියරත්න අපට වැඩක් ඇති දේ පමණක් ලියන්නට කල්පනා කර ඇත. එහෙයින් ඔහුගේ චරිතාපදානය ඔහු මුහුණ දුන් ජීවිත ප්‍රශ්න ගැන අපට කියා දෙයි. ප්‍රශ්න පිළිබඳ ව ඔහු මුහුණ දුන් සැටි අපි දකින්නෙමු. ඔහු ඒ ප්‍රශ්න ගැන විග්‍රහයක් කරයි. බොහෝ විට සර්වෝදය දර්ශනය හා සම්බන්ධව කරන විවරණයක්ද එහි ඇත.

ආචාර්ය ආරියරත්නයන්ගේ ජීවිතය පිළිබඳ කරුණු දැන ගැනීමට මෙතරම් හොඳ මූලාශ්‍රයක් තවත් නැත. කුඩා කාලයේ හැදුනු වැඩුන හැටි විස්තර කරන ඔහු පන්සල ඇසුරින් තමා හැඩ ගැසුනු සැටි දක්වා ලයි. ඔහුට ගමේ විශ්ව විද්‍යාලයය වූයේ නායක හාමුදුරුවන්ය. ඔහු ගමේ ඇත්තන්ගේ චිත්ත කියන විට ඒ පැරණි අය අප මනසේ ජීවත් වෙති. ඉපදුනු දවසේ සිට ගමේ ඇත්තන්ගේ බලපෑමට හසුව චරිතය හැඩ ගැසුනු ආකාරය පැහැදිලිව පෙනේ.

පළමුවෙන්ම ලංකාවෙන් පිටතට ගොස් පුවටෝරිකෝවල කාලය ගත කළ අන්දම විස්තර වන්නේය. පුවටෝරිකෝ සිට එවූ කවි ද සඳහන්ය. එහිදී හමු වූ මිනිසුන් හා මතු වූ අත්දැකීම් ඉතා විචිත්‍රය.

ජපන් රටින් ආ සමාජ සේවකයකු වූ තැනැත්තෙක් අපගේ රට ස්වයංපෝෂිත කිරීම සංවර්ධනයේ පළමු පියවර බව කියයි. සර්වෝදයේ දර්ශනය පිළිබඳව වැදගත් මූල ධර්මයක් මෙහි දී ආරියරත්න මහතාගේ හිතට ඇතුලු වූවා සේ පෙනේ.

'මැද කඳු සිරිය' යන නමින් රත්නපුරේ බලංගොඩ මැද්දේකන්දට ආ ගමන විස්තර වෙයි. ආරියරත්න කෙතරම් දුරට ස්වභාව සෞන්දර්යය පිළිබඳව ප්‍රිය කරන්නෙකුදැයි මේ විස්තරයෙන් පෙනෙයි. ඔහුගේ අධ්‍යාපනයේ පළමු පියවර මෙහිදී වැටිණ.

"ගුරුගෝල සම්බන්ධය පන්ති කාමරයට පොතට හෝ විධිමත් අවස්ථාවලට පමණක් සීමා නොවීය. මෙම සම්බන්ධය වඩා පැවතුණේ විෂය බාහිර කටයුතුවලදීය. වොලිබෝල් පිටිය, නැටුම්, ගැයුම්, වැයුම් කළ තැන්, බලංගොඩ, රාස්සගල, ඕපනායක වැනි සැතපුම් පහේ සිට පහලොව දක්වා ප්‍රදේශවලට පයින් ම ගමන් කිරීම, එළවලු කොටු හේන් ආදිය වගා කිරීම, ලොකු මහත්තයාගේ ගෙදර පිටුපස කුස්සියක් කටුමැටි ගසා බැඳීම, ළිං කැපීම ආදි මේ සියලු ස්ථානම අප අධ්‍යයන ක්ෂේත්‍ර විය."

සර්වෝදයේ අධ්‍යාපනය ද පසු කලෙක ජීවිතයෙන් හැඩ ගැසුනේ මේ අත්දැකීම් ඔස්සේම බව මම සිතමි. අධ්‍යාපනය යනු පොත පත පමණක් ඉගනීම නොව, ජීවිතය පිළිබඳවත් ගැඹුරින් දැන ගැනීම බව ආරියරත්නයන්ගේ අත්දැකීම්වලින් පැහැදිලි වේ.

පාසලෙන් දුන් පොත් ලැයිස්තුවේ ලෝකෝපකාරය, උම්මග්ග ජාතකය, සුභාෂිතය, New Method Reader පළමුවැනි පොත තිබිණි. මැද්දේකන්දේ පාසලේදී මීට අමතරව සැළලිහිණි, ගිරා, තිසර ආදී සංදේශ පොත්ද, කුස දා කව, ගුත්තිලය, දහම් සොඬකව, පූජාවලිය, සද්ධර්ම රත්නාවලිය, බුත්සරණ, කාව්‍යශේඛරය ආදී පොත් ද කියවීමෙන් අධ්‍යාපනය පිළිබඳ හොඳ පසුබිමක් වැටිණි. අද වූවත් ගැඹුරු අධ්‍යාපනයක් ලබා දෙන්නට නම් මේ පොත් ඉගනීම කෙතරම් වැදගත් දැයි පෙනේ. ඒ අතර ඉංග්‍රිසි දැනීමද වැඩීමට මූලික පියවර ගත්තේය.

ආරියරත්නයන්ගේ මේ පොත තත්කාලීන සමාජය පිළිබඳ කදිම විග්‍රහයකි. ඒ කාලයේ තලගුලි පිළිබඳ ප්‍රචාරයක් සඳහා පද්‍යයක් උපුටා දැක්වූයේ මෙසේය:

පිය සොඳුර නොපැකිළි
කැමට සිතෙන යලි යළි
රස ගුණයෙන් උදුලි
කන්න ජිනදාසගේ තලගුලි

අද වෙළඳ ප්‍රචාරකයින්ගේත් මේවාත් අතර වෙනස හෙතෙම අපට කියා දෙයි. එකල මුදලාලිලා ධාර්මික, නිර්ලෝභී, ශාසනාලය ඇති පුද්ගලයින්ය.

ග්‍රන්ථය පුරාම පරිහාසය හා උපහාසය නැගී එයි. විහිලුකාර අයියා වැස්සියකුට පැටවකු ලැබුනු බව මිතුරෙකුට කියා යැව්වේ මෙසේය:

පීප්පේ වගේ බඩ තිබූ ඔබගේ සුරුපී
කේප්පී මහත්මිය දුවක් වැදූවාය ඊයේ
වල්ගය සුදුයි බඩ කලුයි තමුසේ වගේමයි
ආවොත් හොඳයි දැක ගැනීමට දෝණියැන්දෑ

මුලු ග්‍රන්ථය පුරාම මේ හාස්‍ය රසය අපට දැක ගැනීමට පුලුවන.

ගාල්ලේ මහින්ද විද්‍යාලයෙන් ලත් ඉගෙනීම ඉතා වැදගත්ය. ආරියරත්නගේ චරිතය හැඩ ගැසුනු හැටි මෙන්ම එකල විද්‍යාලයේ ඉගැන්වීම කෙරුණු සැටිද මින් විස්තර වේ. තමා සමග එකට උගත් අය ගැනද සෑහෙන විස්තරයක් එහි ඇත.

ඊළඟට කොහු අඹරන මිනිසුන් එකතු කර ගෙන ආර්ථික සූරා කැමට පිළියමක් හැදූ සැටි දැක්වේ. පක්ෂ දේශපාලනයෙන් තොර නායකත්වයක් ගොඩනගන්නට අදත් ඇති අදහස එහි දැක ගත හැක.

ඊට පසු බොනවිස්ටාහි ගුරුවරයකු වශයෙන් හෙතෙම කටයුතු කළේය. ඉක්බිතිව මහරගම ගුරු අභ්‍යාස විද්‍යාලයට ඇතුල් විය. සර්වෝදය පිළිබඳව සියලුම අදහස් හැඩ ගැසුනේ මහරගම ගුරු විද්‍යාලයේදීය. මෙහිදී මතුවුනු වැදගත් ඇත්දැකීමක් හෙතෙම විස්තර කරයි. එක්තරා ග්‍රන්ථයක් තමාට ගෙනත් දුන් සහෝදරියක් වැනි කාන්තාවකට තමා බැන වැදුනු සැටි එහි විස්තර වේ. මේ සිද්ධියෙන් පසු මහරගම ගුරු විද්‍යාලයේ ඉගෙනීමෙන් පසුව, නාලන්දා විද්‍යාලයට ඇතුල් විය. සර්වෝදයේ මුල් අත්තිවාරම වූ කනතොලුව ශ්‍රමදාන කඳවුර ඇති වූයේ මේ අවදියේදීය.

ආරියරත්නගේ විවාහය සිදු වූයේ මේ අතර ය. ඒ ගැන දක්වා ඇති විස්තරයක් සිත් ගන්නා සුලු ය. විවාහයේ දී මඩිහේ පඤ්ඤාසීහ මහා නායක හාමුදුරුවන් දුන් අවවාදය මෙසේය:

"එකට ජීවත්වන විට තරහා යන්න ඉඩ තියෙනවා. එහෙත් වරකට තරහා යා යුත්තේ එක්කෙනාටයි. අනෙක් එක්කෙනා ඒ වෙලාවට ඉවසිය යුතුය." දෙවැනි අවවාදය නම් අවිශ්වාසය පිළිබඳවයි. "සැක කටයුතු විදියට හැසිරෙනවා දුටුවොත්, ඇසුවොත්, තමන්ගේ ඇස් දෙක – කන් දෙක විශ්වාස කරන්න එපා. ඒ තරමට ඔවුනොවුන් කෙරෙහි විශ්වාසය තිබිය යුතුයි." මේ අතින් ආදර්ශවත් බිරියක් ලැබීම ආරියරත්න මහතා ලැබූ උසස්ම වාසනාවයි.

ඊට පසු කතාන, මාලඹේ, දෙනියාය, පල්ලේගම, වතුරාව ආදී කඳවුරු පවත්වන ලදී. විනෝබා භාවේතුමා හමුවීම ඒ අතුරින් අසිරිමත් සිද්ධියකි. ඔහුගේ භූදාන්, ග්‍රාමදාන්, සම්පත්තිදාන්, ජීවන්දාන් හා ශාන්ති සේනා යන ව්‍යාපාරයන් දැක සර්වෝදය ද ඒ අන්දමින් හැඩ ගැස්වීමට ආරියරත්න මහතාට හැකි විය.

අනුරාධපුරයේ පැවැත් වූ රැස්වීමක දී කළ අධිෂ්ඨානය අදත් අපට වැදගත්ය. "සර්වෝදයේ සේවකයින් වූ අපි සත්‍යය, අවිහිංසාව හා ආත්මහරණය යන ධර්මතාවන් මුල් වූද, කොයිම ආකාරයක නමුත් පෙළීම්වලින් තොර වූද, සැම මනුෂ්‍යයකුගේම සම්පූර්ණ වර්ධනය ස්ථිර කරගන්නා වූද, සමාජ ක්‍රමයක් බිහි කරලීම සඳහා ව්‍යායාම කරමු."

ආරියරත්න මහතා සටන්කාමී පුද්ගලයෙකි. තරුණ කාලයේ කොමියුනිස්ට් දර්ශනයට බර වූ හෙතෙම, අධ්‍යාපන දෙපාර්තමේන්තුව සමග ද සටන් කළේය. කඳවුරු පැවැත්වීමේ දී මතු වූ අත්දැකීම් අපට ලබාගත හැකි මාර්ගය මේ ග්‍රන්ථයයි. ඒ කඳවුරුවලදී කරන ලද සේවය මෙහි විස්තර වේ.

ආරියරත්න මහතා සාමාන්‍ය මිනිසෙකි. දියණිය බිහි වූ හැටි දැන ගත් වහාම, වාට්ටුවට දිව ගිය ඔහු ළපටි දරුවාගේ මුහුණ දුටුවේය. තාත්තා යහපත් ධර්මයක් රැගෙන රටපුරා සැරිසරන නිසා ඇයට සාම්‍යා චාරිකා යන් නම දැම්මේය.

මෙතරම් වර්ගවාදී සටන් උද්වේගවත් වූ අවදියක මිනිසුන් අතර සහෝදරත්වය මුල් කරගෙන කටයුතු කළ හැටි යාපනයේ තිර්වේලි, කයිතඩි කඳවුරු වලින් පෙනේ. ආරියරත්න මහතා ගෙන ගිය ඒ

ව්‍යාපාරය තවදුරටත් ඉදිරියට ගෙන ගියේ නම්, අද රටේ පවතින මේ වර්ගවාදී සටන් ඇති වන්නේ නැත.

බොදු පුබුදුවට මගක් නමින් එතුමා ලියා ඇති විස්තරය අප කවුරුත් සැනසිල්ලේ කියවිය යුතු ය. පක්ෂ හා බලකාමී දේශපාලනයෙන් මිදුනු සංස්ථාවක් ඇති කිරීමට අරමුණු මහ හා සැලැස්ම එහි පැහැදිලි වේ. ක්‍රියා මාර්ගයේ පිරිසිඳු බවට එහි වැදගත් තැනක් ලැබී ඇත.

අධ්‍යාපනය හා ප්‍රජා සංවර්ධනය කෙතරම් හොඳින් සිදු වූවාද යන්න මෙහි පැහැදලිය. "ආරිගේ අවවාදය ගණන් නොගෙන මගේ කරුමෙට නැවතත් දේශපාලනයට ඇතුල්වන්න සිදු වුණා" යැයි ඩඩ්ලි සේනානායක මහතා පවසා ඇත. ඔවුන්ගේ අවවාද කෙතරම් සිතට ගත්තා දැයි ආරියරත්න මහතාගේ චරිතයෙන්ම පෙනේ. "අපි දෙන්නාම කවදා හරි මැරෙන්නේ බඩේ ලෙඩෙන් තමයි. හේතුව දන්නවාද? මේ දේශපාලනය නිසා කවදාවත් අපට එකම වේලක්වත් වෙලාවට කන්න ලැබෙන්නේ නැහැ. ඒක සෞඛ්‍යයට හරිම නරකයි. ඔබට මම දෙන අවවාදය නම් ප්‍රධාන වේල් තුනෙන් එකක් වත් නියම වේලාවට කන්න පුරුදු වෙන්න ඕනෑ." ආරියරත්න මහතා අවවාදය පිළිගත්තේය. "එදා සිට අදවනතුරු ලෝකයේ කොහේ හිටියත්, දිවා ආහාරය 12.30 ටත් 1.00 ටත් අතර ගැනීමට මම අමතක නොකෙළෙමි." මෙසේ කීවේ ආර්. ජී. සේනානායක මහතා ය.

සර්වෝදයේ වැදගත් අංගයක් වූ ශාන්ති සේනා ආරම්භ වීම, තිරුකේතිශ්වරන් කඳවුර හා ගම් සියය යෝජනා ක්‍රමය ගැන මින් පසු විස්තර වේ. ඉන්දියාවේ වීර පුරුෂයෙකු වූ ශ්‍රී ජයප්‍රකාශ් නාරායන් තුමා ලංකාවට පැමිණියේ මේ අවදියේ ය. එතුමා ගැන සෑහෙන විස්තරයක් මේ ග්‍රන්ථයේ ඇතුළත්ය.

බලාපොරොත්තු නොවූ රැමන් මැග්සයිසයි ත්‍යාගය ආරියරත්න මහතාට ලැබුනේ තරුණ වයසේදීමය. ඒ පිළිබඳ සියලු විස්තර මෙහි ඇතුළත්ය. මෙතරම් උසස් ත්‍යාගයක් ලැබුණත් ඒ ගැන අපේ අය දැක් වූ ප්‍රතික්‍රියාව කුමක් ද? "එහි සිටි මෝඩ නිලධාරියෙක් මා ළඟ තිබූ රත්තරන් පදක්කමත් ඩොලර් 10000 ක චෙක් පතක් නිසා රේගු බදු අය කිරීම ගැන ප්‍රශ්නයක් මතු කළේය."

ආරියරත්නට ඊර්ෂ්‍යාකාරයින්ගෙන් අඩුවක් නැත. යහපත් කෙනෙකුට මෙන්ම, වැඩ කරන කෙනෙකුට අනෙක් අයට වඩා බාධක ඉදිරිපත් වේ. මැග්සයිසයි ත්‍යාගය පිරිනැමීමෙන් එහි තත්ත්වය පහළ බැස්ස බව කීමට තරම් සමහර නිල දරුවෝ දරුණු වූහ. තමාට ලැබුණු

ත්‍යාග මුදල හෙතෙම සර්වෝදය ශ්‍රමදාන සංගමයේ කටයුතු සඳහා දුන්නේ ය.

ඉහළ කුරුකැටියාවේ වෙදමහතා ආරියරත්නයන් ගේ දර්ශනය හැඩ ගැස්වීමට ප්‍රධාන වූ තවත් අයෙකි. සතුටින් ජීවත්වීමට නම් ලස්සන පරිසරයක් තිබිය යුතුය. ඊළඟට ජලය තිබිය යුතුය. විලි වසා ගැනීමට සරල චාම් ඇඳුම් උවමනාය; ආහාර පිස ගැනීමට ඉන්ධන අවශ්‍ය වේ. පොතපත ඉගෙන ගන්නා අධ්‍යාපන ක්‍රමයකුත්, ආධ්‍යාත්මික දැනුමකුත් අවශ්‍ය වන්නේය. සතුටින් ඉන්න මීට වඩා අවශ්‍ය වෙන කුමක්ද? අද සර්වෝදයේ ක්‍රියාත්මක වන මූලික මානුෂික අවශ්‍යතා පිළිබඳ අදහස ආරියරත්නයන්ට කියා දුන්නේ කුරුකැටියාවේ වෙදමහතා ය.

මෙරිල් ප්‍රනාන්දු මහතා 'මෙත් මැදුර' සර්වෝදයට ලබා දුන්නේය. ආරියරත්නයන්ගේ පියා මිය ගියේ මේ අතරය. ඒ කණගාටුදායක මොහොත සවිස්තර ව විස්තර වේ. 1971 තරුණ කැරැල්ල ඇති වූයේ මේ කාලයේදීය. කැරැල්ලට අසුවූ අයට ආරියරත්න මහතා දුන් උදව් අපමණය. ආරියරත්න මහතා විවේචනය කරන්නට යන අයට මේ කාරණා මතක නැත. බොහෝ පණ්ඩිතයන් ආරියරත්න මහතා සහ එම ව්‍යාපාරය දෙස බලන්නේ වපර ඇසකිනි. අප රටේ අය කෙසේ වෙතත්, පිටරට අය ඔහු ගැන දැරූ අදහස පිටරට පළ වන පොත් පත් හා සඟරාවලින් පෙනේ.

මේ ග්‍රන්ථයේ අවසානයට එන 'දස්සනේන සම්පන්නෝ' මුලු මහත් චරිතාපදානයම කුළු ගන්වා ඉදිරිපත් කරයි. තමන්ගේ ජීවිතයේ ගත් සෑම ක්‍රියාවකටම පොදු වූ දර්ශනය මෙහි දැක ගත හැක. මිනිසාගේ කුසගින්න නිවා, ඔහුගේ ආර්ථික ජීවිතය සාර්ථක කර ආධ්‍යාත්මික ජීවිතය එල ගැන්වීම එහි අදහසය. සර්වෝදය නූතන සමාජ ප්‍රශ්න –වලින් පිට පැන යාමක් නැත. සුභ සාධන වැඩ පිළිවෙලක් පමණකින් නොනවතී. නූතන සමාජ ප්‍රශ්න දිහා බලා මිනිසුන් ප්‍රබෝධ කිරීමෙන් ඊට පිළිතුරු සැපයීමටද වැයම් කරයි. සර්වෝදයේ දේශපාලන ක්‍රමයක් ඇත. එය කාරණා දොළහක් ඔස්සේ මෙහි දක්වා ඇත. පස් වැදෑරුම් වැඩ පිළිවෙල සර්වෝදයේ දේශපාලන වැඩ සටහන ලෙස දක්වා ඇත. එය පැහැදිලිව තේරුම් ගත් අයකුට අපට ඇති ඒකායන මාර්ගය එය බවම වැටහෙනු ඇත.

ආචාර්ය ආරියරත්න මහතාගේ මෙම ග්‍රන්ථය චරිතාපදානයක්ම පමණක් නොවේ. මිනිස් ජීවිතය පිළිබඳ උතුම් විග්‍රහයකි. ආරියරත්න

මහතාගේ චරිතය ගොඩ නැගුණු අයුරු දැනගත යුතු අයකුට නවකතාවක් මෙන් එය කියවිය හැක. සර්වෝදයේ උපත හා වැඩීම දැන ගත යුතු අයකුට එහි සමාජ විද්‍යාත්මක මූලාශ්‍ර මෙයින් සොයාගත හැක. සර්වෝදයේ දේශපාලන දර්ශනය දැන ගන්නට කැමති අයකුට සර්වෝදය සුභ සාධන ආයතනයක් නොව, ප්‍රාණවත් ක්‍රියාකාරී මෙහෙයුමක් බව වටහා ගත හැකිය. අපේ අත්දැකීම් සහ දැන නුවණ මෙයින් මුහුකුරා යනු ඇත. ආරියරත්න මහතා ජීවිත කාලයක් එකතු කරගත් අත්දැකීම් තුළින් අපි දිගු ගමනක යෙදෙන්නෙමු. ඔහුත් අපි වැනි මිනිසකු බව කතාවේදී පැහැදිලිය. නමුත් ඔහු අපට වඩා වෙනස් වන්නේ කුමන ප්‍රශ්නයක් පැමිණිය ද ඉන්ද්‍රඛීලයක් ලෙස ඊට මුහුණ දෙන්නට හැකි නිසාය. ඔහු ආශ්චර්යමත් මිනිසෙකි. දුර්ලභ මිනිසෙකි. මිනිසුන් අතර උතුම් මිනිසෙකි.

මහාචාර්ය නන්දසේන රත්නපාල

භව තණ්හා ප්‍රකාශනය සඳහා අනුග්‍රහය දැක් වූ
ධර්මයට සහ සාමයට කැප වූ මගේ කල්‍යාණ මිත්‍ර
අමෙරිකා එක්සත් ජනපදයේ, මැසචුසෙට්ස් ප්‍රාන්තයේ
වෙස්ට් නිව් බෙරි නගරයේ පදිංචි
ජැකලින් ඊ. එස්. බෙනට්
සොයුරියට
කෘතඥතා පූර්වකව පින් දෙමි.

2001 පෙබරවාරි 6 දා
මැසචුසෙට්ස්
ඇමරිකා එක්සත් ජනපදය

අදරැති ආරි,

මිනිස් වර්ගයාගේ උන්නතිය සඳහා මේ වැදගත් සහ ආශ්චර්යමත් කෘතිය ඔබ අතින් ලියැවෙන බව අසා අතිශය සන්තෝෂයට පත්වීමි. අපි ජීවත් වන්නේ සෙසු මනුෂ්‍යයනට සේවය කිරීමට බැව් හැමදෙනාම මතකයේ තබා ගත යුතුය. සියලු දෙනා සඳහා ඔබ කරන ලද සේවය සහ දක්වන අසීමිත දයාව අපට ආශිර්වාදයකි; ධෛර්යයකි. මේ ජීවිතයේ දී මේ මිහිපිට දී ඔබ හඳුනා ගැනීමට ලැබීම පිළිබඳව දෙවියන්ට ද, විශ්ව ශක්තියට ද මම කෘතඥ වෙමි. ඔබට හැකියාවක් තිබේ නම් "භව තණ්හා" – ස්ව චරිතාපදානය සඳහා අනුග්‍රහය දැක්වීමට මට අවස්ථාවක් දෙන්න.

මගේ හද පත්ලෙන්ම නැඟෙන ආදරය සමග,
සාමයට සදා කැප වූ
ජැකලින් ඊ. එස්. බෙනට්

පටුන

		පිටුව
	පෙරවදන	ix
	හැඳින්වීම	xiii
1.	ඇරඹුම	1
2.	වියනා නගරයේ දී ලත් සුභාරංචිය	4
3.	වැරදි පැත්තට යෑම	7
4.	අපේ පන්සල	14
5.	අපේ ගමේ ඇත්තෝ	22
6.	උපත හා මමත්වය තුවාල වීම	32
7.	මුල් පාසල, පන්සල හා සමාජ පරිසරය	37
8.	කවුද කාමරේ? කවුද කාමරේ?	40
9.	මගේ බුදු නැන්දා	42
10.	සම අවස්ථා සඳහා අරගලය	44
11.	හිතේ බර සැහැල්ලු වෙයි	50
12.	මැද කඳු සිරිය	56
13.	ලොකු මහත්මයාගේ භාරයට	61
14.	සැබෑ අධ්‍යාපනයට පදනම වැටීම	64
15.	ජීවිතය තුළින් අධ්‍යාපනයක්	67
16.	කවියට හිත වැටීම	69
17.	තාත්තා නඩු මගට බැසීම	72
18.	අසරණයන් සූරා කෑමට වඩා හිඟාකෑම හොඳයි	74
19.	පළමු මැතිවරණ අත්දැකීම	77
20.	සිරි අයියා	79
21.	ජිනදාස (තලගුලි) මුදලාලි	81
22.	මා දුටු පළමු විවාහ මංගල්‍යය	83
23.	පුංචි අක්කා ආනන්ද බාලිකාවට – මා බොනවිස්ටාවට	87

පිටුව

24.	ගාල්ලේ මහින්ද විද්‍යාලය	90
25.	නරක කාලයක්	101
26.	ඔබ කොමියුනිස්ට් කාරයෙක්	103
27.	ආර්ථික සූරාකෑමට පිළියමක්	104
28.	සංසාරික සබඳකමක් අලුත්වීම	107
29.	අධ්‍යාපනය ඇනහිටීම	109
30.	ජීවිතය හරහා විශ්ව විද්‍යාලයට	111
31.	ගුරු දිවියට පිවිසීම	113
32.	රුමස්සල කන්ද – 'බොනවිටු' දිවිය	116
33.	ආගම ඇදහීමේ නිදහස	123
34.	කපුකමක්	124
35.	ආර්ථික විද්‍යා අධ්‍යයනයකට යොමු වීම	126
36.	දෙවසරක මහරගම ජීවිතය	130
37.	සාහිත්‍ය සිතිවිලි මංමුළාව	137
38.	පුලුල් දැනීමක් ලබා ගැනීමේ පිපාසය	141
39.	නාලන්දාවේ සේවයට බඳවා ගැනීම	143
40.	මාරක තුනක්	147
41.	බඩගිනි නිවීමට ගොස් සිදු වූ ඇබැද්දිය	151
42.	වන මැද ප්‍රජාවන් තුළින් ජාතික පුනරුදයකට	158
43.	මගේ පළමු විදේශ සංචාරය – භාරතයට	165
44.	පුදුම හමුවීමක්	176
45.	දෙල්ගහ යට ගෙදර පදිංචියට පැමිණීම	184
46.	විෂයය ඉගැන්වීම තුළින් පූර්ණ පෞරුෂෝදය	188
47.	කනතොලුව මුල් කඳවුර	191
48.	යුග දිවියට යොමුවීම	207
49.	මෝරන පෙම් දමක්	218
50.	අපේ විවාහය සිදු වූ හැටි	223

		පිටුව
51.	ගමෙන් ගමට ශ්‍රමදානය	230
52.	හොඳ පාඩමක්	237
53.	කරුණානන්ද මැතිතුමාගේ තෝරා ගැනීම	240
54.	තිලක් රත්නායක අයියා – සැබෑ දේශ ප්‍රේමියෙක්	242
55.	භූදාන් යාත්‍රාවට එකතු වීම	246
56.	විනෝබා කවුරුද?	254
57.	සර්වෝදය ජාතික සංස්කෘතියේ අංගයක් වෙයි	259
58.	කවුරුද අර පුංචි යකා? අපේ වැඩ විද්‍යාත්මකයි, ඔබ හැහීම්බරයි	270
59.	අනුරපුර අදිටන	274
60.	නාලන්දා සත්‍යග්‍රහය – වරදට විරුද්ධව සටන් කිරීම	281
61.	විදුලියෙන් ක්‍රියා කරන මුල් පඩි පෙළ	291
62.	ස්ව සංවර්ධනයේ පළමු පියවර ශ්‍රමදානය	295
63.	මම දැන් පියෙක් වෙමි. ගෙදරට රජෙක් වෙමි	320
64.	ඇල්බට් විජේගුණවර්ධන මහතා	325
65.	මඩකලපුව පතිච්චන්කර්නි කඳවුර	329
66.	යාපනයේ තිර්වේලි කයිතඩි ශ්‍රමදාන කඳවුර 1964 අප්‍රේල් 11 වැනි දා සිට 25 දක්වා	331
67.	බෞද්ධ ජාතික බලවේගය	339
68.	බොදු පුබුදුවට මගක්	354
69.	රුවන්මඩුව පවුල් ගොවිපළ	378
70.	උන්ගේ පාඩුවේ ඉන්න ඇරපන්	389
71.	ඊශ්‍රායල් ගමන	392
72.	තරුණ සමුලුවට සංස්කෘතික ආක්‍රමණයක්	398
73.	ගාන්ධි ශත සංවත්සරය	403
74.	අධ්‍යාපනය සහ ප්‍රජා සංවර්ධනය	408
75.	බඩේ ලෙඩේ හදාගන්න එපා	410

පිටුව

76.	ශාන්ති සේනාවේ ආරම්භය	413
77.	තිරුකේතීශ්වරම් කඳවුර	417
78.	ගම් සියයේ යෝජනා ක්‍රමය	422
79.	ශ්‍රී ජයප්‍රකාශ් නාරායන්තුමාගේ ලංකා සංචාරය	425
80.	ශ්‍රී ජයප්‍රකාශ් නාරායන් තුමා	435
81.	රමන් මැග්සයිසයි ත්‍යාගය	441
82.	ඉහළ කුරුකැටියාවේ වෙද මහතා	459
83.	අදම ආපසු සිය රටට යන්න	462
84.	දෙල්ගහ යට ගෙදරින් මෙත් මැදුරට	464
85.	ඔබේ වහලෙන් වතුර කාන්දුවීම නවත්වන්න	470
86.	මගේ පියාගේ අභාවය	476
87.	1971 තරුණ කැරැල්ල	480
88.	නාලන්දාවට ආයුබෝවන් කීම	490
89.	කෝ බුද්ධිමතුන්? බුද්ධිමතකුගේ පිස්සුව	496
90.	නැවත පිලිපීනයට	500
91.	ඊනියා සංවර්ධනය හා දුප්පත් ජනතාව	511
92.	පීට් ඩයික්ස්ට්‍රා මහතා	520
93.	ලංකාවේ අසරණයින්ට කැත්තෙන් උදැල්ලෙන් සරණවන්නෝ	524
94.	සෙරිනේෂන් උත්සවයක්	532
95.	බඩගින්නේ සිටීමට උපන්නෝ	537
96.	මාතු පාදං නමාමි	541
97.	අනගාරිකයෙක් වීමට කළ ඉල්ලීමක්	544
98.	දස්සනේන සම්පන්නෝ	547
	පසුවදන	583
	පින් දීම	587

ඡායාරූප නාමාවලිය

			පිටුව
ඡායාරූප	1	රූමස්සල කන්ද	1
ඡායාරූප	2	දියත් සමන්ත (මාස තුනකට පසු) පළමු වරටදුටු පියා හා සිනාසෙයි	6
ඡායාරූප	3	දියත් හා නීතා	6
ඡායාරූප	4	මගේ උපන් ගෙදර – පන්සල පහළ ගෙදර	7
ඡායාරූප	5	අපේ ගෙදර	8
ඡායාරූප	6	පීල්ලේගොඩ චෛත්‍යාලංකාර විහාරස්ථානය	8
ඡායාරූප	7	ගණනන්දාරාම විහාරයට ඇතුළුවන දොරටුව	9
ඡායාරූප	8	අපේ ගමේ පිහිටි අමරසූරිය වලව්ව	9
ඡායාරූප	9	අපේ ගෙදරට පෙනෙන මහ මුහුද	10
ඡායාරූප	10	එඩ්වින් ආරියදාස මහතා	10
ඡායාරූප	11	ගල්කැටිය පන්සල	11
ඡායාරූප	12	ජෝමිස් අයියා	11
ඡායාරූප	13	ළඟ දී පියදාස අයියා සමග මුහුදු වෙරළෙ පැරණි මතකය අවදි කරමින්	12
ඡායාරූප	14	අහංගම, යක්ෂණීගේ රේන්ද කොට්ටය කුඩා කල මා සිත් ගත් මග සලකුණක්	12
ඡායාරූප	15	වතුර ටැංකි දෙක	14
ඡායාරූප	16	ශ්‍රී සුමනජෝති නාහිමියෝ	15
ඡායාරූප	17	නාහිමියන්ගේ සොහොන	15
ඡායාරූප	18	විහාර ගෙය හා චෛත්‍යය	16
ඡායාරූප	19	සණ්ඨාර කුලුණ	17
ඡායාරූප	20	සීමාගෙය හා දේවාලය	17
ඡායාරූප	21	බෝධීන් වහන්සේ	18
ඡායාරූප	22	ධර්ම ශාලාව	18
ඡායාරූප	23	අහංගම වනරතන ලොකු හාමුදුරුවෝ හා මා	19
ඡායාරූප	24	පූජ්‍ය නාරද්දේ වේදානන්ද හිමි	19
ඡායාරූප	25	උණවටුනේ චන්දානන්ද හිමි සහ පොල්හේනේ සීලානන්ද හිමි සමග (වයස 12 දී 1943)	20
ඡායාරූප	26	ජී. කේ. ඩී. ජයසේන ගුරුතුමා	21
ඡායාරූප	27	අහංගමගේ නොහොත් තොම්මාහේවාගේ හෙන්ද්‍රික් ජිනදාස (තාත්තා)	24
ඡායාරූප	28	තාත්තා කොටුවේ ගෝර්ඩන් උද්‍යානය ඉදිරිපස	25
ඡායාරූප	29	තාත්තා බාප්පෝච්චි හා නැන්දලා	25

පිටුව

ඡායාරූප	30	අපේ අම්මා හා ඇගේ නංගිලා තිදෙනා පද්මිනී නංගීගේ විවාහය දා	26
ඡායාරූප	31	මගේ පියා සිරිමාන අයියාගේ තාත්තා ලොකු මාමාගේ කාරෙක ඉදිරිපස	26
ඡායාරූප	32	අම්මා හා බාලම්මා කොළඹ ඩයස් පෙදෙස් ගෙදර ඉදිරිපස	26
ඡායාරූප	33	නාලන්දා ක්‍රිකට් කණ්ඩායමේ නායකව සිටි ඩබ්. විමලරත්න ද සිල්වා මල්ලී	27
ඡායාරූප	34	රොසි අක්කාගේ වැඩිමහල් සොහොයුරු සාමෙල් අයියා	28
ඡායාරූප	35	අම්මා හා තාත්තා විවාහ වූ දා	30
ඡායාරූප	36	ලයනල් අමරවික්‍රම අයියා හා සිරිමාන අයියා මිතුරකු සමග	31
ඡායාරූප	37	අපේ ලොකු අක්කා සමග මා හා මල්ලී විහාරගෙය ඉදිරිපිට	31
ඡායාරූප	38	ඇසිලින් සුමිත්‍රා (ලොකු අක්කා)	32
ඡායාරූප	39	ලලනා චූලලතා (පුංචි අක්කා)	32
ඡායාරූප	40	මා	33
ඡායාරූප	41	වීර ජිනදාස (මල්ලී)	33
ඡායාරූප	42	මධුරා පත්මාවතී (ලොකු නංගී)	33
ඡායාරූප	43	අමරා කුලවතී (බාල නංගී)	33
ඡායාරූප	44	ඇඩ්මන් අයියා	34
ඡායාරූප	45	ඇඩ්මන් අයියාගේ පුතා නන්දලාල්, නංගී හා පවුලේ අය සමග	35
ඡායාරූප	46	රොසි අක්කා	36
ඡායාරූප	47	පූජ්‍ය පණ්ඩිත දෙනිපිටියේ චන්ද්‍රජෝති හිමිපාණෝ	37
ඡායාරූප	48	සඳසීලී ඉස්කෝලේ හාමිනේ	37
ඡායාරූප	49	පී. එම්. හේමසිරි මල්ලී	39
ඡායාරූප	50	පොල්හේනේ අග්ගාරාම හිමි (78 වියේ දී) මට හමු වූ අවස්ථාවක	40
ඡායාරූප	51	පූජ්‍ය පණ්ඩිත ගිංතොට පඤ්ඤාලෝක හිමි	42
ඡායාරූප	52	දෙනනගල කන්ද රාස්සගල පාරට පෙනෙන හැටි	56
ඡායාරූප	53	මැද්දේකන්දේ සාප්පු කඩය (අද)	57
ඡායාරූප	54	ගම මැදට වැටෙන දිය ඇල්ලේ ජල පහර	58
ඡායාරූප	55	තාත්තා පැළ කළ බෝධීන් වහන්සේ (අද)	58
ඡායාරූප	56	මැද්දකන්දට යන පාර	59
ඡායාරූප	57	මැද්දේකන්ද වත්තේ තේ දලු නෙළන කතුන්	59
ඡායාරූප	58	එස්. ඒ. ද අල්විස් වීරසිරිවර්ධන මුල් ගුරුතුමා (ලොකු මහත්මයා)	62

පිටුව

ඡායාරූප	59	දෙවැනි මවක් මෙන් වූ වීර සිරිවර්ධන මැතිනිය (ඩී. සී. කේ. සමරවීර මැතිනිය)	62
ඡායාරූප	60	පන්සලට නගින පඩි පෙළ	64
ඡායාරූප	61	එදා පාසල හැටියට තිබුණු ධර්ම ශාලාව	65
ඡායාරූප	62	එදා මා හා ඉගෙනගත් අද 73 හැවිරිදි විජේසේන මහතා සමග ළඟදී පාසල් ගොඩනැගිල්ලේ අප ඉගෙන ගත් පන්තිය තුළ වාඩි වී	66
ඡායාරූප	63	ශ්‍රීමත් ෆ්‍රැන්සිස් මොලමුරේ මහතා	75
ඡායාරූප	64	සිරි ජිනදාස මහතා	79
ඡායාරූප	65	සිරි අයියා සමග පැලස් හෝටලයේ අයිතිකරු ඩැනි අයියා හා එල්. ඒ. පෙරේරා මුදලාලි	80
ඡායාරූප	66	කේ. ජී. ජිනදාස (තලගුලි) මුදලාලි	82
ඡායාරූප	67	කලවානේ අයියා හා ලොකු අක්කා	84
ඡායාරූප	68	පුංචි අක්කා ලලනා සහ සුජාතා කුමාරසිංහ මෙනෙවිය	87
ඡායාරූප	69	ඊ. ඒ. විජේසූරිය මැතිතුමා	90
ඡායාරූප	70	මහින්ද විද්‍යාලය	91
ඡායාරූප	71	මහින්ද නියෝජ්‍ය විදුහල්පතිව සිටි මගේ ආචාර්ය පීටර් දන්තනාරායන මහතා	91
ඡායාරූප	72	ඒ. ඩී. එස්. ජයවර්ධන මැතිතුමා	92
ඡායාරූප	73	මහින්ද විදුහල්පතිව සිටි ජේ. එච්. ගුණසේකර මහතා	94
ඡායාරූප	74	1951 මහින්ද විද්‍යාලයේ ගුරු මණ්ඩලය	95
ඡායාරූප	75	මේජර් සයිමන් විජේරත්න	96
ඡායාරූප	76	මහාචාර්ය විනී විතාරණ	96
ඡායාරූප	77	1951 ක්‍රිකට් කණ්ඩායම	97
ඡායාරූප	78	ගාල්ලේ, මහින්ද විද්‍යාලයේ සමකාලීනයෝ	98
ඡායාරූප	79	මහාචාර්ය ජේ.කේ. පී. ආරියරත්න සමග වසර 54කට පසු	99
ඡායාරූප	80	රූපා කරුණාතිලක මහතා	99
ඡායාරූප	81	වෛද්‍ය සනත් එම්. ගුණසේකර	100
ඡායාරූප	82	මහින්ද විද්‍යාලයයේ ආචාර්යවරයකු වූ කැඩ්මස් සමරසිංහ මහතා	100
ඡායාරූප	83	ජී. එම්. සුමනතිලක ද සිල්වා මහතා	100
ඡායාරූප	84	මහින්ද ආදි ශිෂ්‍යයකු වූ නාවික හමුදාපති බැසිල් ගුණසේකර මහතා හා මැතිනිය මෙත් මැදුර නැරඹීම	100
ඡායාරූප	85	පූජ්‍ය නාරද්දේ වේදානන්ද හිමි	105
ඡායාරූප	86	ගරු ඒ රත්නායක මැතිතුමා	108
ඡායාරූප	87	අසෝක දේවේන්ද්‍ර මහතා	109
ඡායාරූප	88	මහින්ද විද්‍යාලයේ වාර්ෂික තෑගි උත්සවයේ	110

පිටුව

ඡායාරූප	89	මහින්ද විදුහලේ වර්තමාන ආචාර්යවරුන් සමග	110
ඡායාරූප	90	වයි. කේ. ඩී. ඩැනී මහතා	114
ඡායාරූප	91	විශ්‍රාමලත් විදුහල්පති එඩ්ගාර් විජේසූරිය මහතා හා මැතිනිය ඔවුන්ගේ නිවසේ දී	115
ඡායාරූප	92	රුමස්සල කන්ද	116
ඡායාරූප	93	කලාශූරි අරිසෙන් අහුබුදු මහතා හා සඳා අහුබුදු මැතිනිය	117
ඡායාරූප	94	අමරසේන ආශුතෝෂ ශූරීන්	118
ඡායාරූප	95	සුගතදාස ද සිල්වා මහතා	119
ඡායාරූප	96	බොනවිස්ටා ජ්‍යෙෂ්ඨ පාසල	120
ඡායාරූප	97	බොනවිස්ටා ප්‍රාථමික පාසල	121
ඡායාරූප	98	පී. හෙට්ටිහේවා මහතා සමග අවුරුදු 47 කට පසු	121
ඡායාරූප	99	ජී. සී. ප්‍රැන්සිස් පිල්ලේ මහතාගේ පන්තිය	127
ඡායාරූප	100	මා මහරගම ගුරු විද්‍යාලයට පිවිසි කාලයේ	128
ඡායාරූප	101	ඩී. ඩබ්ලිව්. සී. මොහොට්ටි මහතා	129
ඡායාරූප	102	ඩී. වයි. විජේවික්‍රම මහතා	129
ඡායාරූප	103	ෆ්‍රැන්ක් වික්‍රමසිංහ මහතා	129
ඡායාරූප	104	මහරගම ගුරු අභ්‍යාස විද්‍යාලය	130
ඡායාරූප	105	ධර්මා ගුණසිංහ මහතා	131
ඡායාරූප	106	සිරිල් ඒකනායක මහතා	133
ඡායාරූප	107	ඩී. ඒ. අබේසේකර මහතා	133
ඡායාරූප	108	1956 දී පැවැත් වූ මහරගම පමුණුව කඳවුර	134
ඡායාරූප	109	දුන්වත්තේ දී ක්ලාන්ත වූ ගුරුවරිය	135
ඡායාරූප	110	එම්. ඩබ්. කරුණානන්ද මහතා	143
ඡායාරූප	111	ධර්මසේන සේනානායක මහතා	144
ඡායාරූප	112	එම්. ඒ. තිලකරත්න මහතා	145
ඡායාරූප	113	කමල් දිසානායක මහතා	145
ඡායාරූප	114	මහාචාර්ය ටියුලි ද සිල්වා	145
ඡායාරූප	115	කොළඹ නාලන්දා විද්‍යාලයයේ විදුහල්පතිවරු	146
ඡායාරූප	116	ඩන්කට් වයිට් මහතා සමග	151
ඡායාරූප	117	ගෝල්ෆේස් හෝටලයේ දී ධර්මා ගුණසිංහ මහතා සමග ඩන්කන් වයිට් හමුව	152
ඡායාරූප	118	ඩන්කන් වයිට් මහතා ඔහුගේ දියණිය සහ මිනිබිරිය සමග	153
ඡායාරූප	119	ආර්. අයි. ටී. අලස් මහතා	156
ඡායාරූප	120	මව්වරුන්ගේ දුක	158
ඡායාරූප	121	දරුවන් දුක් විඳීම	158
ඡායාරූප	122	වන මැද වැදි පවුල්	159
ඡායාරූප	123	තිසාහාමි සමග දඹානේදී	160

පිටුව

ඡායාරූප	124	ඩී. ඒ. අබේසේකර මහතා මහාචාර්ය ඩී. ජේ. විජයරත්න මහතා දඹානේ වැදි නායක තිසාහාමි සමග	160
ඡායාරූප	125	මහාචාර්ය ඩී. ජේ. විජයරත්න, තිසාහාමි සමග. මැදින් සිටින්නේ ග්‍රාම සංවර්ධන නිලධාරී පී. බී. වීරකෝන් මහතා	161
ඡායාරූප	126	නොදියුණු ගමක දරුවන්ගේ කොණ්ඩා කපන මාලතී වික්‍රමරත්න මැතිනිය	162
ඡායාරූප	127	(පසු කලක) ඒ. සී. ඒබ්‍රහම් මහතා මගේ දුව චාරිකා වඩාගෙන සිටී	164
ඡායාරූප	128	ශ්‍රමදානයට යැමට පෙර පැවැත්වෙන පවුල් හමුවක්	175
ඡායාරූප	129	දෙල්ගහ යට ගෙදර	183
ඡායාරූප	130	වෛද්‍ය ඩබ්ලිව්. ජේ. විමලධර්ම මහතා	185
ඡායාරූප	131	පී. ඩබ්. මහවත්ත, ධර්මසේන සේනානායක, ටී. එස්. සිල්වා, කේ. දසනායක මහත්වරු සහ නාලන්දාරාමාධිපති හිස්සැල්ලේ ඤාණවිමල හිමි දෙල්ගහයට ගෙදර කාර්යාලයේ දී	186
ඡායාරූප	132	දෙල්ගහයට ගෙදර සර්වෝදය කාර්යාලය ඉදිරිපස	187
ඡායාරූප	133	නාලන්දා විද්‍යාලයඃ ගොඩනැගිලි	189
ඡායාරූප	134	හීනටියන ධම්මාලෝක මහ නාහිමි	192
ඡායාරූප	135	පූජ්‍යපාද ගරු තුන්නානේ සුමනතිස්ස නාහිමි	193
ඡායාරූප	136	කරුණානන්ද මහතා කනතොලුවේ දී	193
ඡායාරූප	137	ළිඳක් කැපීම	194
ඡායාරූප	138	වැඩට බට නාලන්දා ශිෂ්‍යයෝ	194
ඡායාරූප	139	බෝධීන් වහන්සේ ළඟට පිළිම වහන්සේ නමක් වැඩම කිරීම. වම් පැත්තේ වියන අල්ලා ගෙන සිටින්නේ දැන් ගණකාධිකාරිවරයකු වූ කේ. එන්. ජයලත් මහතාය.	194
ඡායාරූප	140	පූජ්‍ය පණ්ඩිත ගරු කොත්මලේ අමරවංස නාහිමි	195
ඡායාරූප	141	ශ්‍රමදානයක දී කොණ්ඩා කැපීම	195
ඡායාරූප	142	කනතොලුව ගම්මානයේ පළමු පිඩුසිඟා වැඩීම	196
ඡායාරූප	143	ශ්‍රමදානයක දී පාර කැපීම ඉදිරියෙන් සිටින්නේ දැන් ගණකාධිකාරිවරයකු වූ කේ. එන්. ජයලත් මහතාය.	196
ඡායාරූප	144	තුන්නානේ සුමනතිස්ස නාහිමි කනතොලුවේ නිවසකට වැඩිය අවස්ථා	198
ඡායාරූප	145	ගරු අගමැති එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා	200
ඡායාරූප	146	සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මැතිනිය	200
ඡායාරූප	147	බණ්ඩාරනායක මැතිනිය ළිඳ කපන හැටි නරඹයි	201

පිටුව

ඡායාරූප 148 සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මැතිනිය
තෑගි බෙදා දෙයි 202
ඡායාරූප 149 කනතොලුව ගමට එන පාර සකස් කිරීම 202
ඡායාරූප 150 මැහුම් පන්තියක් 202
ඡායාරූප 151 සිසිර සේනාරත්න හා ඉන්ද්‍රාණි සේනාරත්න සමගින් ද 203
ඡායාරූප 152 කනතොලුව සේවා කඳවුරු බැලීමට පැමිණි
අගමැති බිරිඳ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය 204
ඡායාරූප 153 බණ්ඩාරනායක මැතිනිය තෑගි බෙදා දෙයි 204
ඡායාරූප 154 කනතොලුවේ සිල්ගත් පිරිසට බුද්ධ පින්තූර බෙදාදීම 205
ඡායාරූප 155 මුල් යුගයේ කඳවුරුවලට සහභාගි වූ පුරෝගාමී
නාලන්දා ශිෂ්‍යයින් කීපදෙනෙක් 205
ඡායාරූප 156 ඒ. එම්. ගුණසේකර මහතා වේවැල් වැඩ කියාදෙයි 206
ඡායාරූප 157 පනිච්චන්කර්නි කඳවුරේදී ඩී. එස්. සේනානායක සහ
ධර්මා ගුණසිංහ සමග 206
ඡායාරූප 158 සුප්‍රකට සිනමාවේදී හා උතුරු නැගෙනහිර හිටපු
ආණ්ඩුකාර ගාමිණී ෆොන්සේකා මහතා ජර්මන්
ජාතික ෆ්‍රෙඩ් රොමාන් මහතා 208
ඡායාරූප 159 සීතා රාජසූරිය මැතිනිය මියුසියස් විදුහලේ
බාලදක්ෂිකාවන් සමග 208
ඡායාරූප 160 ඩී. සී. කටුගම්පල මහතා මානාව කඳවුරේ දී ඇඳුම් බෙදයි 209
ඡායාරූප 161 නාලන්දා ශ්‍රමදායකයෝ 209
ඡායාරූප 162 නීතා, නාලන්දා ශ්‍රමදායකයන් සමග 209
ඡායාරූප 163 මානාව වැඩ කරන බාලදක්ෂිකාවන් 210
ඡායාරූප 164 කර්නල් වීරසේන රාජපක්ෂ හා ඉන්දියානු ගුවන්
සේවයේ සිටි අත්ලේ මහතා මානාව කඳවුරේ 211
ඡායාරූප 165 හේමපාල ඇල්පිටිආරච්චි මහතා හා
ජේන් රත්නායක මහත්මිය 215
ඡායාරූප 166 නීතා ගේ සොයුරියන් සමග
චිත්‍රා, නීතා, වජිරා, විනීතා හා සුවිනීතා 216
ඡායාරූප 167 නීතාගේ පවුලේ අය සමග පේරාදෙණිය මල් වත්තේ දී 216
ඡායාරූප 168 වෛද්‍ය එන්. එම්. පී. මැන්දිස් මහතා 217
ඡායාරූප 169 මානාව කඳවුරේදී විනෝබා භාවේ ගීතය ප්‍රබන්ධ කළ
නාලන්දා ආදි ශිෂ්‍ය ආචාර්ය ගාමිණී අබේසේකර මහතා 217
ඡායාරූප 170 කරුණානන්ද මහතා අපේ විවාහයට අත්සන් තබයි 224
ඡායාරූප 171 1960 ජූලි 25 දා බොරැල්ල තරුණ බෞද්ධ සමිති
කාර්යාලයේ දී 225
ඡායාරූප 172 විවාහයෙන් පසු ගත් ඡායාරූපය 225
ඡායාරූප 173 අප විවාහ වූ දා මඩිහේ මහනාහිමියන් තෑගි දුන් පොත 226

පිටුව

ඡායාරූප 174 විවාහ වී අවුරුදු හතළිහක් පිරුණු 2000 ජූලි 25 දා මඩිහේ මහානායක හිමියන් තැගි කළ පොත රැගෙන ගොස් උන් වහන්සේ බැහැ දැක්ක අවස්ථාව 227

ඡායාරූප 175 නවදිල්ලි අන්තර් ජාතික ජාත්‍යන්තර චිත්‍රපට උළෙලේ සම්මානය දිනූ ගම්පෙරළිය (1964) චිත්‍රපටයේ රූප රාමුවක ගාමිණී ෆොන්සේකා රංග ශිල්පියා (වම් කෙළවරේ) 228

ඡායාරූප 176 ගාමිණී ෆොන්සේකා මහතා සමග 229

ඡායාරූප 177 මුක්තා විජේසිංහ මැතිනිය 230

ඡායාරූප 178 සැම් විජේසිංහ මහතා 231

ඡායාරූප 179 වෛද්‍ය බැසිල් සෙනෙවිරත්න මහතා සෞඛ්‍යදාන කඳවුරේ දී 232

ඡායාරූප 180 සෞඛ්‍යදාන නිර්මාතෘ දොස්තර ලක්ෂ්මන් සිල්වා 232

ඡායාරූප 181 මා, පළමු සිරිපා සෞඛදාන කඳවුරේදී 233

ඡායාරූප 182 සෞඛ්‍යදාන ව්‍යාපාරයේ නිර්මාතෘ වෛද්‍ය ලක්ෂ්මන් ද සිල්වා මහතා, ස්ටැන්ලි ප්‍රනාන්දු මහතා සහ ටාර්සි ජයසිංහ මහතා පළමු ශ්‍රීපාද කඳවුරේදී 233

ඡායාරූප 183 මහාචාර්ය වෛද්‍ය පී. ආර්. අන්තෝනිස් මහතා 234

ඡායාරූප 184 වෛද්‍ය ඩබ්. ඒ. එස්. සිල්වා මහතා 235

ඡායාරූප 185 මහාචාර්ය කේ. එන්. සෙනෙවිරත්න මහතා 235

ඡායාරූප 186 විනිෂියා ගමගේ මහත්මිය 235

ඡායාරූප 187 උපාලි සේනානායක මහතා (වම්පස) ශ්‍රමදාන කඳවුරක දී 236

ඡායාරූප 188 ස්ටැන්ලි ප්‍රනාන්දු මහතා 236

ඡායාරූප 189 ගරු පත්බේරියේ ඉන්ද්‍රානන්ද හිමි 237

ඡායාරූප 190 කනාන ගමට යාමට අප කැපූ පාර 239

ඡායාරූප 191 විල්මට් ජයනේත්ති මහතා හා විජයගුණවර්ධන මහතා කනාන මාලබේ කඳවුරේදී 241

ඡායාරූප 192 වතුරාව කඳවුරේදී 242

ඡායාරූප 193 වතුරාව පාර ලකුණු කරන තිලක් අයියා 243

ඡායාරූප 194 එෆ්. එල්. වුඩ්වර්ඩ් මහතා 244

ඡායාරූප 195 කොලවෙනිගම තිලක් රත්නායක මහතාගේ නිවසට රැස්වූ ශ්‍රමදායකයෝ 244

ඡායාරූප 196 නීතා ඇතුලු ශ්‍රමදායක පිරිස දෙනියාය වික්ටර් රත්නායක මහතාගේ නිවසේ දී 245

ඡායාරූප 197 ශ්‍රමදාන නිමකොට නවාතැනට ආපසු එන පිරිසක් 245

ඡායාරූප 198 ධර්මා ගුණසිංහ සමග ඉන්දියාවේ දී 247

ඡායාරූප 199 ජනාධිපති ආචාර්ය ශ්‍රී රාජේන්ද්‍ර ප්‍රසාද් තුමා හමුවීම 247

පිටුව

ඡායාරූප 200 අගමැති ශ්‍රී ජවහර්ලාල් නේරු හමුවීම 248
ඡායාරූප 201 දෙවේන්ද්‍ර කුමාර් ගුප්ත මහතා දරුවන් සමග 248
ඡායාරූප 202 බුද්ධගයාවේ දී 249
ඡායාරූප 203 මා කුලියට ගත් තුන් පා පැදිය 250
ඡායාරූප 204 බුදු හිමියන් ස්නානය කළ පොකුණ 250
ඡායාරූප 205 අශෝක කුලුණ 251
ඡායාරූප 206 ධර්මපාල ප්‍රතිමාව අසළ 251
ඡායාරූප 207 ධර්මපාල පාර (සාරනාත්) 252
ඡායාරූප 208 ආචාර්ය විනෝබාභාවේ තුමා 254
ඡායාරූප 209 විනෝබා තුමා මා දුන් ලිපිය කියවයි 255
ඡායාරූප 210 විනෝබා තුමා ජනතාව අමතයි 256
ඡායාරූප 211 විනෝබා තුමාගේ චරිත කතාව ලියූ
ශ්‍රී සුරේෂ් රාම් මහතා සමග 257
ඡායාරූප 212 විනෝබා භාවේතුමා නූල් කටියි 258
ඡායාරූප 213 සොම් මීගම මැතිනිය 259
ඡායාරූප 214 අති පූජ්‍ය කලුකොඳයාවේ ප්‍රඥාශේඛර මහ නාහිමියන්
සහ පූජ්‍ය අඹන්වැල්ලේ පඤ්ඤාශේඛර නාහිමියන්
මෙත් මැදුර නරඹද්දී 260
ඡායාරූප 215 වෛද්‍ය එඩ්වින් මාරසිංහ මැතිතුමා හා එම මැතිනිය 261
ඡායාරූප 216 ජේ. ඩී. වික්‍රමරත්න මහතා 263
ඡායාරූප 217 ජේ. ඩී. වික්‍රමරත්න මැතිනිය 263
ඡායාරූප 218 ගරු ඤාණපෝනික මාහිමි 265
ඡායාරූප 219 මා, මහාචාර්ය එල්. ජී. හේවගේ, ඇම්. ඩබ්. කරුණානන්ද
මහතා හා මහාචාර්ය ජේ. ඩී. පී. ජයතිලක සමග 265
ඡායාරූප 220 මහාචාර්ය එල්. ජී. හේවගේ 266
ඡායාරූප 221 ප්‍රධාන ලේකම් ඩී. ජේ. පෙරේරා මහතා හා භාණ්ඩාගාරික කමල්
දිසානායක මහතා සමග 266
ඡායාරූප 222 ශ්‍රමදාන කඳවුරක අවස්ථාවක් 267
ඡායාරූප 223 ශ්‍රමදාන කඳවුරක අවස්ථාවක් 267
ඡායාරූප 224 සිංහ පෙරේරා මහතා 269
ඡායාරූප 225 ලක්ෂ්මි පෙරේරා මැතිනිය 269
ඡායාරූප 226 ටී. බී. ඉලංගරත්න මැතිතුමා 272
ඡායාරූප 227 මෛත්‍රීපාල සේනානායක මැතිතුමා 272
ඡායාරූප 228 ශ්‍රමදායකයින් පිරිසක් ගිමන් හරිමින් 273
ඡායාරූප 229 රුවන්වැලි මහා සෑය 274
ඡායාරූප 230 කඳවුර ඇරඹීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී සිරිමෙවන්
ගොඩගේ මහතා මුල් පස් පිඩැල්ල කපයි. 275
ඡායාරූප 231 ආනන්ද සේමගේ මහතා 276

පිටුව

ඡායාරූප 232 ලීල් ගුණසේකර මහතා 277
ඡායාරූප 233 අනුරපුර ශ්‍රමදානය 277
ඡායාරූප 234 මෛත්‍රීපාල සේනානායක මහතා පවුල් හමුව අමතයි 278
ඡායාරූප 235 කඳවුරු වාසීන් ලැඟුම් ගෙන සිටි අනුරාධපුර
මධ්‍ය මහා විද්‍යාලය 279
ඡායාරූප 236 අනුරපුර ශ්‍රමදානය 279
ඡායාරූප 237 තරුණ ළමා ශ්‍රමදායකයින් 280
ඡායාරූප 238 ඩබ්. එම්. ඒ. වර්ණසූරිය මහතා 286
ඡායාරූප 239 පූජ්‍ය පණ්ඩිත හිස්වැල්ලේ ඥානවිමල හිමි 287
ඡායාරූප 240 ඩී. බී. ධනපාල මහතා 291
ඡායාරූප 241 කාල්ටන් සමරජීව මහතා 292
ඡායාරූප 242 ජස්ටින් කොතලාවල මහතා 294
ඡායාරූප 243 ලලිත් කොතලාවල මහතා 294
ඡායාරූප 244 චන්ද්‍රා ෆොන්සේකා මහතා 295
ඡායාරූප 245 ඇල්බට් එදිරිසිංහ මහතා 296
ඡායාරූප 246 විලියම් කන්දගේ මහතා 297
ඡායාරූප 247 කේ. විජේසේකර මහතා 298
ඡායාරූප 248 ඒ. කේ. වික්‍රමසිංහ මහතා 298
ඡායාරූප 249 පාරවල් කැපීම 303
ඡායාරූප 250 ළිං සෑදීම 304
ඡායාරූප 251 ගෙවතු වගා කිරීම 305
ඡායාරූප 252 ගෘහ කර්මාන්ත 306
ඡායාරූප 253 වැව් හා වාරිමාර්ග පිළිසකර කිරීම 307
ඡායාරූප 254 දොස්තර ලක්ෂ්මන් සිල්වා මැතිනිය
අකරැල්ල කඳවුරේ දී ගමේ ළමයින් සමග 308
ඡායාරූප 255 මහාචාර්ය ධර්මසේන අරම්පත්ත මහතා 310
ඡායාරූප 256 ආර් එස් උඩුකුඹුර මහතා වජිරා නංගී ඇතුලු පිරිස 319
ඡායාරූප 257 අවුරුදු නවයක් වයසැති හර්ෂ කුමාර නවරත්න
(මගේ ලොකු අක්කාගේ පුතා) චාරිකා දියණිය වඩාගෙන 320
ඡායාරූප 258 වීරේට සුබ පතන නීතා හා චාරිකා 321
ඡායාරූප 259 මල්ලී එංගලන්තය බලා පිටත් වන විට සුබ
පැතීමට වරායට ආ (වමේ සිට) බාප්පොච්චී,
තාත්තා, මල්ලී, පුංචි නැන්දා සහ බුදු නැන්දා 321
ඡායාරූප 260 මල්ලී හා මම, පුංචි නැන්දා හා බුදු නැන්දා
සමග වරායේ දී 321
ඡායාරූප 261 මගේ වැඩිමහල් පුතා විත්‍යා ශාන්තිදාස් 322
ඡායාරූප 262 මගේ දෙවැනි පුතා ජීවන් ධම්මික 322
ඡායාරූප 263 මහාචාර්ය එස්. එච්. පී. නානායක්කාර 323

පිටුව

ඡායාරූප 264	වමේ නීතාගේ වැඩිමහල් සොයුරියගේ පුත් අජිත් මැද චාරිකා හා වින්යා	323
ඡායාරූප 265	අමරා හා විනීතා නංගිලා චාරිකා, වින්යා හා ජීවන් සමග දෙල්ගහ යට ගෙදර ඉදිරිපස	324
ඡායාරූප 266	ඇල්බට් විජේගුණවර්ධන මහතා සමග	325
ඡායාරූප 267	චිත්‍රා විජේගුණවර්ධන මැතිනිය කනතොලුවේදී පොල් පැළ බෙදයි	326
ඡායාරූප 268	5 ශ්‍රී 1106 දරන ජීප් රිය එහි අධ්‍යක්ෂ නොඑස් මහතා විසින් පරිත්‍යාග කළ අවස්ථාව	327
ඡායාරූප 269	ධර්මා ගුණසිංහ, විජේදාස මහවත්ත, ඩී. ඒ. පෙරේරා, සරත් හේවාගම, සිරිල් ඒකනායක, ධර්මසේන සේනානායක යන මහත්වරු සමග	328
ඡායාරූප 270	යාපනේ ප්‍රථම සමගි පා ගමනඃ	331
ඡායාරූප 271	පූජ්‍ය පණ්ඩිත ගරු වැල්මිල්ලේ සෝමානන්ද නාහිමි	332
ඡායාරූප 272	වමේ සිට නවරත්නම් මන්ත්‍රීතුමා, නෙවිල් ජයවීර දිසාපතිතුමා, මා, බටකැත්තර රේවත හිමියන්	332
ඡායාරූප 273	දිසාපති නෙවිල් ජයවීර මහතා හා කේ. නේසයියා මහතා ඇතුලු පිරිස මුල් පස් පිඩැල්ල කැපීම	333
ඡායාරූප 274	දිසාපති නෙවිල් ජයවීර මහතා කතා කරයි	333
ඡායාරූප 275	අපේ අම්මා යාපනයේ නීර්වේලි කයිතඩි කඳවුරේ දී	334
ඡායාරූප 276	ආචාර්ය ෂිරෝමී රාජරත්නම් මෙනෙවිය	336
ඡායාරූප 277	මහාචාර්ය හේන්පිටගෙදර ඥාණවාස නාහිමි, ඥාණසීහ නාහිමි හා ස්විස් ජාතික සුමෙධ හිමි	340
ඡායාරූප 278	හේන්පිටගෙදර ඥාණසීහ නාහිමි	341
ඡායාරූප 279	ඇල්. එච්. මෙත්තානන්ද මහතා	344
ඡායාරූප 280	පොලිස්පති ස්ටැන්ලි සේනානායක මහතා	347
ඡායාරූප 281	මායා සේනානායක මැතිනිය සමග	348
ඡායාරූප 282	බද්දේගම විමලවංස නාහිමියෝ	349
ඡායාරූප 283	ආචාර්ය ඒ. එන්. එස්. කුලසිංහ	350
ඡායාරූප 284	විජයානන්ද ආබෲ මහතා	350
ඡායාරූප 285	ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු මහතා	351
ඡායාරූප 286	1961 සර්වෝදය වාර්ෂික සම්මේලනය පන්නිපිටියේ ධර්මපාල විද්‍යාලයේ දී පැවති අවස්ථාවේ විල්මට් ඒ. පෙරේරා මහතා සම්මේලනය අමතා කතා කරයි. රොනී ද මැල් මහතා සහ මම (බිම වාඩි වී)	353
ඡායාරූප 287	අනගාරික ධර්මපාලතුමා	354
ඡායාරූප 288	යූ. බී. විජේකෝන් මහතා	378
ඡායාරූප 289	ඩබ්ලිව්. ඩී. පීටන් මහතා	381

			පිටුව
ඡායාරූප	290	ඩී. ටී. අමරසේකර මහතා	382
ඡායාරූප	291	සියඹලාගස්වැව විමලසාර නාහිමි	385
ඡායාරූප	292	එස්. කේ. වේලායුදපිල්ලේ මහතා	385
ඡායාරූප	293	පරන්තන් කඳවුරේ දී:උද්යෝගිමත්ව කඳවුරුවලට සහභාගි වූ රංජිත් සන්දනායක ශිෂ්‍යයා	387
ඡායාරූප	294	ශ්‍රීමත් ජෝන් කොතලාවල	389
ඡායාරූප	295	ඊශ්‍රායලයේ මා නැවතී සිටි ගෙදරක අය සමග	392
ඡායාරූප	296	ඊශ්‍රායලයේ ගොවිපලේ වැඩට යෑම මා දකුණු කෙළවරේ	393
ඡායාරූප	297	ඊශ්‍රායලයේ ඩොරොත් ගමේ මිතුරන් සමග	394
ඡායාරූප	298	ඊශ්‍රායලයේ මළ මුහුද අසළ	394
ඡායාරූප	299	ජෙරුසලමේ පවුලක් සමග	395
ඡායාරූප	300	ඇපල් වත්තක වැඩ කිරීම	395
ඡායාරූප	301	ඊශ්‍රායලයේ මා බලා ගත් යුවළ	396
ඡායාරූප	302	ඊශ්‍රායලයේ කුඩා දරුවන් සමග	396
ඡායාරූප	303	රටේ දකුණු කෙළවර අසල වූ ඉලාට්වලදී	397
ඡායාරූප	304	මා නතර වී සිටි කාමරය ඉදිරිපස	397
ඡායාරූප	305	එම්. වී. රාජසේකරන් මහතා සමග	399
ඡායාරූප	306	පීට් ඩයික්ස්ට්‍රා මහතා	400
ඡායාරූප	307	ගාන්ධි ශත සංවත්සර උළෙලට සහභාගි වූ ජාතික නායකයින් ප්‍රධාන පිරිස පන්සිල් ගැනීම	404
ඡායාරූප	308	ගාන්ධිතුමාගේ ජීවිත කතාව ප්‍රදර්ශනය	405
ඡායාරූප	309	ඉන්දීය මහ කොමසාරිස් ආචාර්ය හිම්සෙන් සචාර්, ගාන්ධි සාම පදනමේ සභාපති ආචාර්ය ආර්. ආර්. දිවාකර්, නැදලගමුවේ ධර්මරාජ පිරිවෙනේ පැවති සමුලුවට කැඳවාගෙන යෑම	406
ඡායාරූප	310	ආචාර්ය එන්. එම්. පෙරේරා	407
ඡායාරූප	311	මහාචාර්ය ජේ. ඊ. ජයසූරිය	408
ඡායාරූප	312	ආචාර්ය ස්වර්ණා ජයවීර මැතිනිය	409
ඡායාරූප	313	ඩඩ්ලි සේනානායක මැතිතුමා	410
ඡායාරූප	314	ආර්. ජී. සේනානායක මැතිතුමා	411
ඡායාරූප	315	ශ්‍රීමතී ආශා දේවි	413
ඡායාරූප	316	ආශා දේවී සර්වෝදය සේවකයෝ අමතයි	414
ඡායාරූප	317	ආශා දේවී වවුනියාවේ දී කළ දේශනයට සවන් දුන් පිරිස	416
ඡායාරූප	318	තිරුකේතීශ්වරම් කෝවිල	418
ඡායාරූප	319	කඳවුරු සැලසුම් කිරීම	420
ඡායාරූප	319.1	දකුණෙන් ගිය පොල්අතු බෑම	420
ඡායාරූප	319.2	ආහාර පිසීම	420

පිටුව

ඡායාරූප	320	ගාන්ධි මාර්ග සහරාවේ කර්තෘ ටී. කේ. මහාදේවන් මහතා චාරිකා විසින් පිළිගැනීම	423
ඡායාරූප	321	නැදලගමුවේ සමුද්‍රුවට යාපනයෙන් පැමිණි මුදලියර් සින්නතම්බි ප්‍රධාන පිරිස	424
ඡායාරූප	322	ශ්‍රී ජය ප්‍රකාශ් නාරයන්	425
ඡායාරූප	322.1	රත්මලාන ගුවන් තොටුපළේ දී ජය ප්‍රකාශ්තුමා පිළිගැනීම	426
ඡායාරූප	322.2	ඉන්දීය තානාපති ගන්දේවියා මහතා සංස්කෘතික ලේකම් ත්‍රිපාති මහතා ගුවන් තොටුපලේ දී	426
ඡායාරූප	322.3	ආචාර්ය වල්පොල රාහුල හිමියන් සමග ජයප්‍රකාශ් නාරායන්තුමා හා ප්‍රබාවතී දේවි මැතිනිය	427
ඡායාරූප	322.4	කම්කරු නායක අබ්දුල් අසීස් මහතා සමග	428
ඡායාරූප	322.5	ජයප්‍රකාශ් නාරායන්තුමා උරුත්‍රපුරම්වලදී	429
ඡායාරූප	322.6	හැටන් හි දී	429
ඡායාරූප	322.7	සමාධි පිළිමය අසළ	430
ඡායාරූප	322.8	කුට්ටම් පොකුණ අසළ	430
ඡායාරූප	322.9	ඉසුරුමුණියේ	430
ඡායාරූප	322.10	ජයප්‍රකාශ් නාරායන් යුවල ගමන් කළ රිය	431
ඡායාරූප	322.11	පොලිස් අධිකාරී විමලසේන ද සිල්වා මහතා	431
ඡායාරූප	322.12	එස්. වේලායුදපිල්ලේ හා මුදලියර් සින්නතම්බි සමග උරුත්‍රපුරම් හි දී	432
ඡායාරූප	322.13	ගරු තලේවෙල විජිත ධම්මරක්ඛිත නාහිමි සමග කැලණි විහාරයේ දී	432
ඡායාරූප	322.14	අම්රත් අම්ලියන් මහතා	433
ඡායාරූප	322.15	සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය සමග	434
ඡායාරූප	323	රමන් මැග්සයිසයි රන් තිළිණය	441
ඡායාරූප	324	දෙල්ගහයට ගෙදර මැග්සයිසයි ප්‍රවෘත්තිය ඇසූ ගුවන් විදුලි යන්ත්‍රය	442
ඡායාරූප	325	තිල වශයෙන් පිලිපීන තානාපතිතුමා මැග්සයිසයි ත්‍යාගය පිළිබඳ දැනුම්දීමට දෙල්ගහ යට ගෙදරට පැමිණි අවස්ථාව	443
ඡායාරූප	326	සෙනෙට් සභික මනහාන් මහතා, බෙලෙන් ආබෘ මෙනෙවිය හා අපේ තානාපති ප්‍රනාන්දු මහතා ගුවන් යානය ළඟ දී අපව පිළිගත්හ	445
ඡායාරූප	327	බෙලෙන් ආබෘ මෙනෙවිය අප කැඳවාගෙන යයි	445
ඡායාරූප	328	බෙලෙන් එච්. ආබෘ මෙනෙවිය	446

පිටුව

ඡායාරූප	329	ඌරුවල කඳවුර කේ. වී. රෙඩ්ඩි මහතා හා කරුණානන්ද මහතා	448
ඡායාරූප	330	ලෝක තරුණ සමුලුවේ මහ ලේකම් ජෝති ශංකර් සිං මහතා	448
ඡායාරූප	331.1	මැග්සයිසයි ත්‍යාග ප්‍රදානය සඳහා වේදිකාව වෙත කැඳවාගෙන යාම	450
ඡායාරූප	331.2	මැග්සයිසයි ත්‍යාගය පිළිගැනීමේ දේශනය	450
ඡායාරූප	331.3	(මැද) අග්‍ර විනිශ්චයකාර තුමා අතින් ත්‍යාගය ලබා ගැනීම.	450
ඡායාරූප	331.4	මැග්සයිසයි ආර්යාව ගෙන් සුබ පැතුම්	450
ඡායාරූප	332	මැග්සයිසයි ත්‍යාගලාභීන් සමග	452
ඡායාරූප	332.1	ජනාධිපති රිසාල් ස්මාරකයට මල් වඩමක් තැබීම	452
ඡායාරූප	333	මැග්සයිසයි ත්‍යාගය ලබාගෙන ලංකාවට පැමිණි අවස්ථාව	455
ඡායාරූප	334.1	මාපා රා පොඩි අප්පුහාමි මහතා කතා කරයි. අතිගරු බිෂොප් ලක්ෂ්මන් වික්‍රමසිංහ, මා, නීතා, ඒ. රත්නායක මහතා, නාලන්දා විදුහල්පති ගුණපාල වික්‍රමරත්න, ඩී. එල්. එෆ්. පේදිරිස් මහතා ද මෙහි සිටිති	456
ඡායාරූප	334.2	කරුණානන්ද මහතා අප කැඳවා ගෙන නාලන්දාවට එයි	456
ඡායාරූප	334.3	සර්වෝදය සේවක සේවිකාවෝ පිළිගැනීම් ගීතයන් ගයති	456
ඡායාරූප	335	ත්‍යාග මුදලේ චැක්පත අගමැති ඩඩ්ලි සේනානායක මහතාට බාර දීම	457
ඡායාරූප	336	එංගලන්තයේ කෙන්ට් ඇමර්ෂම්වල මල්ලීගේ ගෙදර	462
ඡායාරූප	337	මෙරිල් ඒ. ප්‍රනාන්දු මහතා	464
ඡායාරූප	338	උපාලි සේනානායක මහතා	465
ඡායාරූප	339	උපාලි සේනානායක මහතා හා කරුණානන්ද මහතා මහාචාර්ය මලලසේකර මහතා සමග	466
ඡායාරූප	340	මෙරිල් ප්‍රනාන්දු මහතා, දුව නෙලුම්, මුණුපුරා දිමිත්‍රි සමග අප දෙදෙනා	466
ඡායාරූප	341	ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මැතිතුමා මෙත් මැදුරේ පවුල් හමුව අමතයි	467
ඡායාරූප	342	මෙත් මැදුරේ මගේ කාර්යාලය	467
ඡායාරූප	343	මෙත් මැදුරේ කුඹුරේ පැළ සිටුවීම	467
ඡායාරූප	344	ඇලෙක්ස් තෙන්නකෝන් මහතා පෙර පාසල් ගුරුවරියන්ට සෞඛ්‍ය පාඩමක් කියා දෙයි	468
ඡායාරූප	345	මෙත් මැදුරේ පළමු සිහිති හමුව (පෙර පාසල)	469

			පිටුව
ඡායාරූප	346	ප්‍රජා නායකත්ව පුහුණුව ලබන තරුණියෝ	469
ඡායාරූප	347	**"Small is Beautiful"** කතුවර ආචාර්ය ඊ. එෆ්. ෂූමාකර් මෙත් මැදුර නැරඹීම	471
ඡායාරූප	348	ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහතා ආචාර්ය හැවන්පොල රත්නසාර හිමි සමග මා මෙත් මැදුරේ දී	472
ඡායාරූප	349	නොවිබ් මහලේකම් ආචාර්ය ජෙෆ් තියුනිස්, පාර්ලිමේන්තු මන්ත්‍රී විමලසිරි ද මෙල්, පාර්ලිමේන්තු මන්ත්‍රී බර්නාඩ් සොයිසා යන මහත්වරු මෙත් මැදුරේ දී	472
ඡායාරූප	350	පූජ්‍ය පණ්ඩිත නැදලගමුවේ ජිනානන්ද හිමි; අග්‍රාණ්ඩුකාර විලියම් ගොපල්ලව මැතිතුමා සමග මෙත් මැදුරේ දී	473
ඡායාරූප	351	නිම්නා, ලොකු අක්කා සහ අම්මා	473
ඡායාරූප	352	නොවිබ් මහලේකම් ජෙරාඩ් වැන් ෆ්ලයිමන් මහතා සහ මැතිනිය සමග මෙත් මැදුරේදී	473
ඡායාරූප	353	ආනන්ද මෛත්‍රීය මහ නාහිමි මෙත් මැදුරේදී	474
ඡායාරූප	354	බිෂොප් ලක්ෂ්මන් වික්‍රමසිංහ සමග	474
ඡායාරූප	355	වින්යා ආග්‍රාණ්ඩුකාර විලියම් ගොපල්ලව මැතිතුමාට සර්වෝදය කොඩියක් විකුණයි	474
ඡායාරූප	356	තිස්ස විජයවර්ධන මහතා	475
ඡායාරූප	357	මගේ පියා අවුරුදු 89 දී	476
ඡායාරූප	358	රෝහණ විජේවීර මහතා	484
ඡායාරූප	359	ටී. බී. වේරපිටිය මහතා	485
ඡායාරූප	360	එච්. සෝමරත්න මහතා	489
ඡායාරූප	361.1	මුල්ම පෙර පාසල් ගුරුවරියන්, ලීලා ජයසේකර මැතිනිය, බාලසූරිය මහතා සමග	496
ඡායාරූප	361.2	ලීලා ජයසේකර මැතිනිය සමග	497
ඡායාරූප	362	මහාචාර්ය යොහාන් ගල්තුං	498
ඡායාරූප	363	දොස්තර හඩ්සන් සිල්වා මහතා	501
ඡායාරූප	364	පිලිපීනයේ තානාපතිව සිටි එන්. එම්. එම්. අයි. හුසේන් මහතා	502
ඡායාරූප	365	පිලිපීන දූපත්වල දිගටම කථා පැවැත්වීම්	503
ඡායාරූප	366	මැනිලා ජාත්‍යන්තර සමුලුව ඇමතූ අවස්ථාව	511
ඡායාරූප	367	පීට් ඩයික්ස්ට්‍රා මහතා සමග	520
ඡායාරූප	368	පීට් ඩයික්ස්ට්‍රා මහතා මෙත් මැදුරේ දී	521
ඡායාරූප	369	චන්ද්‍රා සොයිසා මහතා	522
ඡායාරූප	370	මාපා රා පොඩි අප්පුහාමි මහතා	525

පිටුව

ඡායාරූප	371	තිංක්ලිං ඩාන්ස්	534
ඡායාරූප	372	මහාචාර්ය ගුණපාල මලලසේකර මැතිතුමා	544
ඡායාරූප	373	මහාචාර්ය ගුණපාල මලලසේකර මහතා වැවල කුරුප්පු මහතා සමග මෙත් මැදුරේ දී	545
ඡායාරූප	374	භාවනා	557
ඡායාරූප	374.1	භාවනා	558
ඡායාරූප	374.2	භාවනා	558
ඡායාරූප	374.3	භාවනා	559
ඡායාරූප	374.4	භාවනා	559
ඡායාරූප	374.5	සාමූහික භාවනා	560
ඡායාරූප	374.6	සක්මන් භාවනා	561
ඡායාරූප	375	මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ	583
ඡායාරූප	376	මා පිළිබඳ චරිත කතා සම්පාදනය කළෝ :	589
ඡායාරූප	377	1970 දශකයේ සිට අප දෙදෙනාගේ සර්වෝදය මෙහෙයට එක් වූ දරුවෝ (වමේ සිට) විත්‍යා, මා, නීතා, ජීවන්, නිම්නා, චාරිකා, සදීවා සහ දියත්	590

1

ඇරඹුම



ඡායාරූප 1: රූමස්සල කන්ද

අද දට මගේ වයස අවුරුදු 44 මාස 4 දින 29 කි. මා උපන් දා සිට අද වන තෙක් මා ලද ජීවිත අත්දැකීම්වලින් වැදගත් යැයි හඟින කිහිපයක් වත් ලියා තැබීමට මා කල්පනා කළේ අදට බොහෝ කලකට පෙර ය. එහෙත් එම කල්පනාව මා සිතට ආ හැම මොහොතකම, ඒ ආශාව මම යටපත් කර ගත්තෙමි. ඊට හේතු කිහිපයක් තිබේ. අද සිට ලියන්නට පටන් ගැනීමටද හේතු කිහිපයක් තිබේ. මේ එක් එක් හේතුවක් ගෙන විග්‍රහ කරන්නට යැමට මම අදහස් නොකරමි.

මරණයෙන් පසුත් ජීවත් වන්නවුන් තුළ 'මා' ගැන මතකය නොමරා පවත්වා ගැනීමට තිබෙන ආශාව නිසා, ස්ව චරිතාපදානයක් ලිවීමට මා පෙළඹුණා විය හැකි ය. මෙය ස්ව චරිතාපදානයක් නිසා කෙතරම් සංයමයකින් ලීවත් 'මා, මගේ,' යන ආත්මීය හැඟීම මේ කතාන්තරය තුළින් යම් අවස්ථාවල දී ඉස්මතු වනු ඇත. මේ භව තණ්හාව ගැන මා ලජ්ජා නොවන්නේ තවමත් මා කෙළෙස් ජය

ගැනීමට නුපුලුවන් වූ කෙනෙකු බැවිනි. මේ ආශාව නිසා වුව ලියැවෙන මේ පොතෙන්, එය කියවන ඔබට ප්‍රයෝජනයක් තිබිය යුතු බව මම විශ්වාස කරමි. එමෙන්ම මගේ චිත්ත ශක්තියෙන්, වාග් ශක්තියෙන් හා කාය ශක්තියෙන් වැඩි කොටසක් කැප කළ සර්වෝදය ශ්‍රමදාන සංසදයටද මෙයින් වැඩක් විය යුතුය. ඔබට වැඩක් ඇති දේ පමණක් මා ලියන්නට කල්පනා කළේ මගේ වැරැදිවලින් අවැඩක් වූයේ නම්, එහි විපාකය විඳින්නේ මා පමණක් නිසා ය. මා කළ කී දෙයින් සමහර විට යමෙකුට අවැඩක් වන්නට ඇත. එහෙත් හිතා මතා කිසිවකුට මා අවැඩක් කරන අදහසින් කිසිවක් කළ බවක් මගේ මතකයට නොනැගේ. සමහර විට එවැනි දෙයක් සිදු වූයේ නම්, එය වෙන කෙනෙකුට උදව්වක් කරන්නට යැම නිසා, අනියම්ව තව කෙනෙකුට සිදු වූ පාඩුවක් වන්නට ඇත. හිතා–මතා කරන ලද්දක් නම් නොවේ.

මෙහි ලියැවෙන ජීවිත සිද්ධීන් මා ලත් අත්දැකීම් වන ඒවා නිසා එහි ප්‍රධාන චරිතය බොහෝ විට "මා" වීම, නොවැළැක්විය හැක්කකි. හැකි තරම් දුරට උපේක්ෂා සහගතව ඒවා ලියා තැබුවත්, මගේ ලෞකික ගතිය නිසා ඒ සිද්ධීන් තුළින් මා වීරයකු ලෙස ඉස්මතු වුණොත්, එයත් මට නොවැළැක්විය හැකිය.

එක් අතකින් වත්මන් අත්දැකීම් මතින් මෙන් ම, අතීත් අතීත් මතකයට එන පිළිවෙළින් මේ ජීවිත කථාන්තරය ලියමි. හැකි තරම් දුරට කාලයේ අනුපිළිවෙළින්, උපන් දා සිට අද දක්වා සිද්ධීන් කථාන්තරයක ස්වරූපයෙන් ලියන්නට වැර වඩමි.

මෙහි එන සියලුම චරිත සැබෑ ඒවාය. එයින් සමහරකගේ නම් මම සඳහන් නො කරමි. එයට හේතුව ඒ අයට, මා ඔවුන් දුටු අයුරින් ඔවුන් – ඔවුන්ටම නො පෙනෙන නිසාය. මෙහි ලියැවෙන්නේම විසින් "මා" දුටු අයුරැත්, මා හා මේ කථාන්තරයට සම්බන්ධ වූවන් මට පෙනුණු ආකාරයත්ය. මට සැබෑ වූ දේ ඔවුනට සැබෑ නොවන්නට පුලුවන. හැම පුද්ගලයකුටම විශේෂ වූ පෞරුෂයක් ඇත්තාක් මෙන්ම, ඔවුනට සත්‍යය පෙනෙන්නේ ද ඒ ඒ පුද්ගලයාටම විශේෂ වූ අන්දමකිනි.

මගේ ජීවිතයට සහ සර්වෝදයට සම්බන්ධ සියලුම චරිත ගැන මෙහි සඳහන් වී නොමැත. අඛණ්ඩව සම්බන්ධ වී හෝ මගේ සේවයට යම් බලපෑමක් කළ අය පිළිබඳව මම වෙසෙසින් සඳහන් කළෙමි. යම් අයෙකු පිළිබඳව අමතක වීමක් – අඩුවක් හෝ වූයේ නම්, මම සමාව අයදිමි.

මගේ යැයි කිවහැකි කාලයක් මට නැත. කවදා එය ලැබේ දැ'යි ද නොදනිමි. සමහර විට මැරෙණ තුරුම මටම වෙන් වූ මටම ඕනෑ දෙයක් කළ හැකි කාලයක් මට නොලැබෙන්නට පුලුවන. මගේ හැම නිමේෂයක්ම සර්වෝදයට යෙදී ඇති නිසාය. යම් දිනෙක මට ඉඩක් ලැබුණොත්, කුඩා කල සිට මේ කථාවට සම්බන්ධ වුණු, අදත් ජීවත් වන අයවලුන් සොයා ගොස් මට මතක තොරතුරු ඔවුන්ගේ මතකයන් හා සසඳා බලා සත්‍යයට වඩාත් සේවයක් කළ හැකිය. අප්‍රිය දේ අමතක කිරීමත්, ප්‍රිය දේ පමණක් මතකයේ තබා ගැනීමත් මිනිස් ස්වභාවය යැයි සිතමි. හැම මිනිසකුම පූර්ණ විමුක්තියක් සඳහා පරිණාමය වෙමින් සසර ගමන් කරන නිසා දෝ, මේ ගුණය මිනිසා ළඟ තිබෙන්නට පුලුවනි. හොඳ වෙන්ට අරමුණු කරන නිසා වැරදි වසා ගෙන හොඳ පමණක් එළියට දැමීමට යැමෙන්, සමහර විට තම සිත තුළ තමා ගැනම ප්‍රසාදයක් යම් කලකදී ඇති වේ. ඒ නිසාවත් අනාගතයේදී අප හොඳ වනවා නම් එහි ඇති වරද කිමෙක්ද?

මෙවැනි අඩුපාඩු රැසක් ඇතිවන්ට ඉඩ තිබියදීත් 1976 අප්‍රේල් මස 4 දා මේ කථාව ලිවීම ඇරඹීමි.

2

වියනා නගරයේ දී ලත් සුභාරංචිය

මා මව් බිමෙන් මෙවර පිට වූයේ පසුගිය මස, එනම් 1976 ජුනි මස 23දාය. එදා මා කෙලින්ම ආවේ ස්විට්සර්ලන්තයේ සූරිච් නගරයටය. එහි සිට තවත් ගුවන් යානයකින් ඔස්ට්‍රියාවේ අගනුවර වූ වියානා නගරයට ගියෙමි. එහි මා නවාතැන් ගත්තේ 'හොටෙල් ඩී ෆ්‍රාන්ස්' නම් වූ හෝටලයේය. එහි සිට දිනපතා "පැලේ අවුස්බර්ග්" නම් පැරණි මාලිගයට ලස්සන උද්‍යාන මැදින් ඇවිද ගෙන ගියෙමි. එම මාලිගය ජාත්‍යන්තර ස්වේච්ඡා සේවා සමුලුව පැවැත්වූ තැනයි. එම සමුලුවට රටවල් 96කින්, නියෝජිතයන් තුන්සියයක් පමණ දෙනා සහභාගි වූ අතර, එහි විධායක සභිකයන් දහසය දෙනාගෙන් කෙනෙකු ලෙසද ප්‍රධාන කථිකයකු හැටියටද මම ක්‍රියා කළෙමි.

මහ සමුලුව ඉදිරියේ ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා සේවා ඉතිහාසය අළලා දෙසුමක් කිරීමටද මට පැවැරී තිබුණි. කිසිදු සටහනක් අත නැතිව හදවතින්ම එන හැඟීම් අළලා දෙසුමක් කළෙමි. සංඝ සමාජය, බෞද්ධ පරමවිඥාර්ථ සමාගම, අමද්‍යප මහ සභාව, මහාබෝධි සමාගම, තරුණ බෞද්ධ සමිතිය ආදිය තුළින් ජාතික පුනරුදය ඇති වූ සැටිත්, ඒ සාරධර්ම නොනසා වත්මනට ගැලපෙන අන්දමට සර්වෝදය ස්වේච්ඡා සේවය ගොඩනගන හැටිත්, මම විස්තර කළෙමි. එය හැම දෙනාගේම ප්‍රබෝධයට හේතු වූ බව මට පෙනිණි. සියයකට අධික අය පෞද්ගලිකව පැමිණ එම සමුලුවට ඒමේ ප්‍රතිඵලය එම දෙසුමට සවන් දීමෙන්ම පමණක් ඉටු වූ බව පළ කොට මට ස්තුති කළහ. මා අමුතු දෙයක් කීවේ නැත. මා කීවේ මිනිස් හදවතත්, මිනිස් හිතත් එක ලෙස ප්‍රයෝජනයට ගෙන භෞතික සම්පත් හා ආධ්‍යාත්මික ගුණය එක්තැන් වන නව ලෝක සමාජයක් ගොඩ නැංවීමේ බලය ඔවුන් හා අප ළඟ තිබෙන බවත්, එයට සූදානම් වන ලෙසත්ය.

දියත් සමන්ත

වියානා නගරයේදී මගේ ජීවිතයේ වැදගත් සිද්ධියක් සිදු විය. එක්දහස්නවසිය හැත්තෑහයේ ජූලි පළමු වැනිදා දිවා අහරින් පසු මා

අවුස්බර්ග් මාලිගයට පැමිණියේ සිතිවිලි දහසක වෙලෙමිණි. මා 23 වැනිදා රටින් පිට වූයේ වෙනදා මෙන් සැහැල්ලු සිතකින් නොවේ. එක් අතකින් බලවත් චිත්ත පීඩනයකින් නිදහස්වීමටය. අනිත් අතින් එවැනිම බලවත් බරක් ඔලුවට ගනිමිනි.

බලවත් චිත්ත පීඩනය නම් මා අසීමිතව ආදරය කරන, ගරු කරන වැඩිහිටියෙක් මා කෙරෙහි සියුම් ඊර්ෂ්‍යාවකින් කටයුතු කරනවා දැයි යන සැකයක් මා තුළ එන්ට එන්ට ම බල පැවැත්වීමත්, ඒ සැකය මා තුළින් ඉවත් කර ගැනීමට මා පසුගිය මාස කීපය තුළම ගත් ප්‍රයත්නය ව්‍යර්ථ වීමත්ය. මේ හේතුවෙන් සියල්ලෙන් ඈත් වී කලකට රටින් පිටවීමට මම අදහස් කළෙමි.

එහෙත් මේ තීරණය ක්‍රියාත්මක කිරීමට යෙදී තිබුණ කාල පරිච්ඡේදය ආදරණීය සැමියකුට, දයාන්විත පියකුට, කිසිසේත් තම බිරියගෙන් දරුවන්ගෙන් ඈත් විය හැකි අවස්ථාවක් නොවන නිසා, එසේ කළ හැකිව තිබුණේ බලවත් බරක් ඔලුවට ගනිමිනි. මගේ ආදරණීය නීතාට පස්වැනි දරුවා බිහි කිරීමට යෙදී තිබුණේ මේ සතියේ දීය. ඒත් මම චිත්ත ශක්ති පරිචයෙන් කෙසේ වෙතත්, සිරුරින් ඔවුන්ගෙන් මිදී ජුනි 23 දා උදේ හත හමාරට පමණ නිවසින් පිටවීමි. මීට කලින් අනේක වාරයක් නීතා තනිකර රටින් පිට වුණත් එදා නිවසින් පිටවන විට පමණෙකි, මා නීතාගේ දෙ ඇසේ කුඩා මුතු ඇට දෙකක් වැනි කඳුලු බින්දු දෙකක් දුටු වේ. එය නුදුටු විලාශයක් පෙන්වා හිත තද කරගෙන, ඇයත් – අපගේ නූපන් දරුවාත් අපේ චිත්තාභ්‍යාවකාශයේ සම්‍යක් ශක්තීන්ට බාර දී මම ගුවන් තොටුපලට යෑමට රථයට නැංගෙමි. මට මතක හැටියට ජේම්ස් අයියාත්, සාලිය සමරවික්‍රම සහ වින්සන්ට් සිරිසේන මල්ලිලාත් මා සමඟ ගුවන් තොටුපලට පැමිණියහ.

එදා බණ්ඩාරනායක ජාත්‍යන්තර තොටුපලෙන් මා රැගත් ස්විස් එයාර් යානය ගුවන් ගත් වේලේ සිට කලින් සඳහන් කළ පරිදි, ජූලි පළමුවැනිදා දිවා අහරින් පසු නැවත සමුලුවට සහභාගිවීමට අවුස්බර්ග් මාලිගයට පැමිණෙන තුරු විටෙක බලවත්ව උඩු හිතෙහිත්, හැම විටම බලවත්ව යටි හිතෙහිත් නීතාගේ කුස තුළ සිටි ලේ කැටියාත්, නීතාත් යන දෙදෙනා මගේ චිත්ත ශක්ති ක්ෂේත්‍රයෙන් ඈත් නොවූහ.

විසිරී ගිය චිත්ත ශක්තිය යම්තමින්වත් තමා යටතට ගත හැකි ආනාපාන සති භාවනාවත්, ඒ එක්තැන් කළ සිතිවිලි ශක්තිය විශ්වමය වශයෙන් ගුණ කළ හැකි මෙත්තා භාවනාවත්, ඒ විශ්ව චිත්ත ශක්තිය

මගේ නීතාත් දරු පැටියාත් සුවපත් කිරීමට සැතැපුම් දහස් ගණනක් ඈත සිට යොමු කිරීමත් තුළින් මම ඔවුන් සමඟ ආධ්‍යාත්මික ව මේ දින හත තුළම බැඳී සිටියෙමි. තිස් වැනිදා රාත්‍රියේ මේ ශක්තිය මා තුළින් තුනී වී සැහැල්ලු ගතියක් මට දැනිණි. ඉන්පසු මට නින්ද ගියේ නැත. මා බලාපොරොත්තුව සිටි නව පුත් රුවන ලැබුණා ද? එතැන් සිට මා තුළ ක්‍රියාත්මක වූයේ මේ සිතිවිල්ලයි.



ඡායාරූප:2
දියත් සමන්ත (මාස තුනකට පසු)
පළමු වරට දුටු පියා හා සිනාසෙයි.

සමුලුව පැවැත්වෙන සාලය ඉදිරිපස ආලින්දයේ සිටි තරුණ කාන්තාව මා අතට විදුලි පණිවිඩයක් දුන්නාය. මා බලාපොරොත්තු වූ ශුභාරංචිය එහි විය. සාමියා චාරිකා, මගේ වැඩිමහල් දියණිය, 'මල්ලී කෙනෙක් ලත් බවත්, මව හා දරුවා සැපෙන් සිටින බවත්' එහි සඳහන් කර තිබිණි. මට පණිවිඩය දුන් කාන්තාව සිප වැළඳ ගැනීමට මට සිතිණි. මට අහසින් ඉගිලී මා නව පොඩි පුතු වැළඳ ගන්නට ඇත්නම්! මේ අතර සමුලුව පුරා ආරංචිය පැතිර ගියේය. එහි සිටි ලාබාල, වැඩිහිටි ගැහැනු පිරිමි කාගෙනුත් මා ලත් සතුටු හාදුවලින් කෙසේ නම්, 'දියත් සමන්ත' පොඩි පුතුගේ සිඟිති දෙකම්මුලේ පහස ලැබෙන තුරු සැනසෙන්න ද?

ඡායාරූප: 3
දියත් හා නීතා

අන්ත සම කිරීමේ චේතනාවෙන් ලෝකයට අත දෙන්නට පියා රටින් බැහැරව ගොස් සිටින විට ඉපැදුණු මගේ තුන්වැනි පුතාට 'දියත් සමන්ත' යයි නම දෙන්නට යෝජනා කොට, තෙරුවන් සරණ පතමින් මගේ ආදරණීය නීතා ධම්මචාරීට විදුලි පණිවුඩයක් වහාම යැවීමි.

3
වැරැදි පැත්තට යෑම

පසුගියදා මා ගුවන් තොටුපලට එන විට, මා ඇරැලීමට ආ අයගෙන් කෙනකු වූ ජෝමිස් අයියා ගැන මට සිහි විය. ජෝමිස් අයියා දකින විට, මට මගේ ජීවිතයේ ඉතා අතීත සිද්ධියක් මගේ සිහියට නැගේ. ජෝමිස් අයියා දැන් සේවය කරන්නේ මොරටුවේ මෙත් මැඳුරේ ආරක්ෂක සේවකයකු වශයෙනි. මෙත් මැඳුර, අපේ සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරයේ මූලස්ථානයයි.

ජෝමිස් අයියාගේ ගම උණවටුනයි. මගේ ගමත් උණවටුනයි. උණවටුන විශාල ගමකි. ජෝමිස් අයියලාගේ ගෙදර ගාලු – මාතර පාරේ මුහුද පැත්තේ පිහිටා තිබුණු අතර, අපේ ගෙදර පිහිටියේ පාරෙන් ගොඩ පැත්තේය. ජෝමිස් අයියාගේ ගෙදර පිහිටි පෙදෙස ජා කොටුව හෙවත් ජය කොටුව යයි හැඳින්වෙන අතර, එය මුහුදු මට්ටමේම මුහුදට යාර සියයක් විතර ඈතින් පිහිටියේය. අපේ ගෙදර පිහිටියේ පිල්ලෙගොඩ



ඡායාරූප: 4 – මගේ උපන් ගෙදර – පන්සල පහළ ගෙදර

ඡායාරූප: 5
අපේ ගෙදර



යන නමින් හැඳින්වෙන කොටසේ කඳු බෑවුමේය. අපේ ගෙදරට යාර තුන්සියයක් පමණ පල්ලමේ සිට පටන් ගැනෙන මුහුද අපේ ගෙදරට ලස්සනට පෙනේ.

අපේ ගෙදරට ඉහළින් පිහිටියේ පීල්ලෙගොඩ චෛත්‍යාලංකාර විහාරස්ථානයයි. මේ නිසා කවුරුත් අපේ ගෙදර හැඳින්වූයේ 'පන්සල පහළ ගෙදර' කියාය. අප කුඩා කාලයේ පන්සල ගමේ හැම දෙයටම මධ්‍යස්ථානය විය. අප කුඩා කාලයේ නිතරම පන්සලේ ගැවසුණු තරුණ දායකයන් අතර ජෝමිස් අයියාද කෙනෙකි. ජෝමිස් අයියාට වැඩිමල් අදත් ජීවතුන් අතර සිටින, තවත් හුරු බුහුටි තරුණයෙක් හැටියට එදා ක්‍රියා කළ ඉහළ ගෙදර ඇඩ්මන් අයියාද මතක් වේ. සර්වෝදය මූලස්ථානයේ බොහෝ කලක් සේවය කළ පියදාස අයියාද මේ පිරිසට අයත්ය.

ඡායාරූප: 6 – පීල්ලේගොඩ චෛත්‍යාලංකාර විහාරස්ථානය

අපේ ලොකු අක්කා, ජෝමිස් අයියාට වඩා වැඩිමල් බව මට හිතෙන්නේ ජෝමිස් අයියා, ඇයට

‘නෝනක්කා’ යනුවෙන් ආමන්ත්‍රණය කළ නිසා වන්නට ඇත. ඒ කාලයේ නම කියා ආමන්ත්‍රණය කිරීම පාසලේදී පමණක් සිදු වූවකි. අපේ ලොකු අක්කා ‘නෝනා’ යනුවෙන්ද, ඊළඟ අක්කා ‘බේබි’ යනුවෙන්ද, මා ‘පොඩි මහත්මයා’ යනුවෙන්ද මල්ලී ‘බේබි මහත්මයා’ යනුවෙන් ද ගමේදී හැඳින්වුණු අතර, ලොකු නංගී හා බාල නංගී ඔවුන්ගේම නම් වූ පද්මා හා අමරා යන නම්වලින් හැඳින්වූයේ ඔවුන් උපදින විට කාලය අනුව සමාජ විපර්යාසයක් ඇති වී තිබුණු නිසා විය හැකිය.

ඡායාරූප: 7 – ගණනන්දාරාම විහාරයට ඇතුළුවන දොරටුව

අපේ ලොකු අක්කා

අපේ ලොකු අක්කා ඇස්ලින් සුමිත්‍රා සමඟ මා වයස තුනේ පමණ සිට, උණවටුනේ බෞද්ධ මිශ්‍ර පාඨශාලාවට ඇයගේ අතේ එල්ලී පාසල් ගියා මට මතකයි. එහෙත් නිල වශයෙන් පාසලට ඇතුල් කිරීමේ වයසට මා පත් ව නො සිටි නිසා, අක්කාගේ පන්තියේ අන්තිම බංකුවේ ඉඳ හිට

ඡායාරූප: 8 – අපේ ගමේ පිහිටි අමරසූරිය වලව්ව

ඡායාරූප: 9 –
අපේ ගෙදරට
පෙනෙන මහ මුහුද

වාඩි වී සිටි හැටි මට යන්තම් මතකයි. ලොකු අක්කා ඒ කාලයේ ඉගෙන ගත්තේ ජ්‍යෙෂ්ඨ පන්තියේය. ඒ කාලයේම මා සිත්ගත් තවත් දෙයක් නම්, ඇයගේ ලස්සන අත් අකුරු ය. සුප්‍රසිද්ධ ලේඛක එඩ්වින් ආරියදාස මහතාද, ඔහුගේ සොයුරිය දයාවතී අක්කාද, මේ පන්තියේම ඉගෙන ගත්හ. අපේ ලොකු අක්කා ආරියදාස අයියාට කතා කළේ 'හින්නි මල්ලී' කියාය. ජේම්ස් අයියාද ඒ පාසලේම අක්කාට පහළ පන්තියක ඉගෙන ගන්නට ඇත.

මේ කාලයේ මා ඉතා ආශා කළ දෙයක් නම් පසළොස්වක පෝයදාට සුදු ඇඳුමින් සැරසී මල් වට්ටි අතින් ගෙන පාසලේ සිට පන්සල දක්වා ලස්සනට පෙළ ගැසී ගිය පෙරහැරවල්ය. අපේ පන්සලට සැතැපුම් කාලක් පමණ මාතර පැත්තට ගණේහේනේ ගණනන්දාරාම පන්සලත්, ගාල්ල පැත්තට සැතැපුමක් පමණ ඈතින් ගල්කැටියේ ද්විභූම්භිකාරාමය පන්සලත්, මෙයට අමතර ව යද්දෙහිමුල්ලේ අමරසිංහාරාමයත් අපේ ගමේ පන්සල්ය. මේ පන්සල් තුනටම පෙරහැරවල් පාසලේ සිට යන හැටි මට අදත් මතකයට නැගේ. මේ පෙරහැරවල් මෙහෙය වූ අප ගමේ තරුණ ශිෂ්‍යයන් අතර ජේම්ස් අයියාද කෙනෙකි.

ඡායාරූප: 10
එඩ්වින් ආරියදාස මහතා

වැරදි පැත්තට දිවීම

දිනක් ගල්කැටියේ පන්සලට පෙරහැරක් ගොස් මල් පූජා කොට ආපසු ගෙදර බලා යෑමට ගොස් වූ සිද්ධියක් මට මතක් වේ. ලොකු අක්කා පන්සලේ ගල් පඩි පෙළෙන් බැස, මා අතින් අල්ලා ගෙන මාතර පැත්තට යන්ට හැරුණාය. අපේ ගෙදර සැබවින්ම පිහිටියේ එතැන සිට හැතැප්මක් පමණ මාතර පැත්තට හැරී ගමන් කළ විටය. එහෙත් මම අක්කාගේ අත අතහරවා ගෙන ගෙදර තිබෙන්නේ ඔය පැත්තේ නොව, අනිත් පැත්තේය කියා ගාලු පැත්තට දුවන්ට වීමි. අක්කා කෑ ගසමින් මා පසුපස එළවන විට, මගේ කුඩා දෙපාවලින් වඩාත් වේගයෙන් අඩමින් දිව් හැටි මට අදත් මතකය. මේ වෙලාවේ ජෝමිස් අයියා මා පසුපස එළවා ගෙන ගොස් මා අල්ලා ගෙන වඩා ගත්තේය. මට හැකි වෙරෙන් ජෝමිස් අයියාට අතින් පයින් පහර දුන්නෙමි.



ජායාරූප: 11 – ගල්කැටිය පන්සල

පුදුම මිනිහෙක්



ජායාරූප: 12–ජෝමිස් අයියා

ජෝමිස් අයියා පුදුම මිනිසෙකි. මා දණ ගාන කාලයේ ඔහුට යම් රූපයක් තිබුණේද, අදත් ඔහු ඒ වගේමය. එදත්, අදත් වූ මේ අවුරුදු හතළිහට විවාහ වී, ළමයින්ද හත් අට දෙනෙකු ඔහුට සිටියද, ඔහුගේ රූප ස්වභාවයේ වෙනසක් ඇති වී තිබෙන බවක් මට නොපෙනේ.

ජෝමිස් අයියා වැනි චරිත, අපේ ගම්වලින් ඉතා ඉක්මණින්

මැකී යයි. ගමේ පන්සලේ ඕනෑම උත්සවයක්, පන්සලේ හාමුදුරුවන්ගේ ඕනෑ එපාකම්, ගමේ ගෙදරක තොවිලයක්, මඟුලක්, මරණයක් ආදී සෑම කටයුත්තකදීම, කැමැත්තෙන් ඉදිරිපත් වී ස්වේච්ඡා සේවයෙන් වැඩ කිරීම ඔවුන්ගේ ස්වභාවයි. මත්පැනින්, සූදුවෙන්, දුරාචාරකම් වලින් තොරවූ ඔවුහු, ගතානුගතික සිංහල සංස්කෘතියෙන් සංයමය වූවෝ වෙති. විභාගයක් පාස් නොකර, පාසලෙන් අස්වූ ජෝමිස් අයියා මේසන් කෙනෙකු හැටියට පුහුණු විය. ඒ කර්මාන්තයට ඔහු දක්ෂයෙකු නො වන බව, මට ඔප්පු වුණේ, දැනට අවුරුදු හයකට පමණ පෙර තාත්තාට වැසිකිළියක් හදා දීමට ඔහුට බාර දුන් අවස්ථාවේදීය. අදත් අපේ මහ ගෙදර ඕනෑවට වඩා යටට ආසනය සවි කොට කොන්ක්‍රීට් දමා ඇති ඒ වැසිකිළිය පාවිච්චි නොකොට තිබේ.

ඡායාරූප: 13
ළඟ දී පියදාස අයියා සමග
මුහුදු වෙරළේ පැරණි මතකය අවදි කරමින්



ඡායාරූප: 14
අහංගම, යක්ෂණීගේ රේන්ද කොට්ටය කුඩා කල මා සිත් ගත් මග සලකුණක්

පසු කලෙක රැකියාවක් නැති කමින් බොහෝ අමාරුවට පත්ව සිටි ජෝමිස් අයියා මට අහම්බෙන් ගමට ගිය විටෙක හමු විය. අපේ සර්වෝදය මූලස්ථානයේ ආරක්ෂක සේවකයකු ලෙස ඔහු මා මොරටුවට කැඳවා ගෙන ආවේ ඒ අවස්ථාවේය.

එදා මා වැරදි පැත්තට දුවද්දී අතින් පයින් මගෙන් බැට කමින් ගෙදර තිබුණු හරි පැත්තට මා වඩා ගෙන දිව ආ ජෝමිස්, අයියාට අද මට හරි පැත්ත පෙන්වීමට නො හැකි ද? බොහෝ විට ඔහු දකින විට මා මගෙන්ම අසන පැනයකි, මේ.

සමාජය ඇදෙන පැත්තට නොඇදී වෙනත් පැත්තකට සමාජයත් ඇද ගෙන අද මා යන්ට හදන ගමනේ පෙර ලකුණක් හැටියට ජෝමිස්, අයියා සම්බන්ධ එදා ඒ සිද්ධිය මට කල්පනා වේ. වස්තුව, බලය, නිලය, කීර්තිය පසුපස එළවන්නේ නැතිව – අත් හැරීමත්–බෙදාගැනීමත්– සහයෝගයත් ආදී වටිනාකම් පසු පස එළවීමට මා පෙළඹෙන්නේ ඇයි?

4

අපේ පන්සල

අපේ ගෙදර පීල්ලෙගොඩ පන්සලට පහළින් පිහිටා ඇති බව මම කලින් පැවසීමි. කලින් වතුර පීල්ලක් තිබුණු නිසා මේ ගම් ගොඩ පීල්ලගොඩ වන්නට ඇත. දැන් නම් පීල්ල වෙනුවට නෑමට විශාල ටැංකියකුත්, බීමට වතුර ගැනීමට කුඩා ළිඳකුත් එතැන තිබේ. මේ දෙකම අයිති පන්සලටය. ඒ ටැංකිය පහළ විශාල බට පඳුරක්ද පන්සල ඉදිරිපිට විශාල සල් ගසක්ද තිබුණේය.



ඡායාරූප: 15 –වතුර ටැංකි දෙක

මම දණ ගාන කාලයේ සිටම පන්සලට යෑමට පුරුදු වීමි. මුලු දකුණු පළාතටම සිටි ශ්‍රේෂ්ඨ පඬිරුවනක් වූ අහංගම ශ්‍රී සුමනජෝති නායක හිමිපාණන් වහන්සේ මගේ නම තැබූ බවත්, මට හා පුරා කියා 'අ' යන්නට අත පොත් තැබූ බවත්, මගේ දෙමාපියෝ මට කීහ. කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙණේ අධ්‍යාපනය ලැබ, දීප්තිමත් ලෙස රාජකීය පණ්ඩිත උපාධිය ලබා ගත් අහංගම ශ්‍රී සුමනජෝති නායක හාමුදුරුවෝ, මිහිරිපැන්නේ නිකායයේ අනුනායක පදවියද දැරූ තේජාන්විත, බහුශ්‍රැත ධර්ම කථිකයෙකි, ලේඛකයෙකි. උන්වහන්සේ

නිසා උණුවටුන ගම පමණක් නොව, මුලු ප්‍රදේශය ම පිබිදුණු බව අදත් උන්වහන්සේ ගැන මතකය තිබෙන වැඩිහිටියෝ පවසති.

නායක හාමුදුරුවන්ගේ රූපය මට හොඳට මතකය. විශාල සල්ගස ඉදිරියේ එකල පිහිටි මහා ශාලාවේ කාමරයක උන්වහන්සේ වැඩ විසූ සේක. කකුලේ තුවාලයකට ගලගම වෙද මහතා නැමැති වෛද්‍යවරයකු උන් වහන්සේට ප්‍රතිකාර කරනවා මට මතකය.



ඡායාරූප: 16 – ශ්‍රී සුමනජෝති නාහිමියෝ

මා පොත පාඩම් දීමට පන්සලට ගියවිට, හාන්සි පුටුවේ අත උඩ මා වාඩි කරගෙන පාඩම ගැනීම නායක හාමුදුරුවන්ගේ සිරිතය. මගේ වයස අවුරුදු තුනකට වැඩි විය නොහැකිය. පාඩම හොඳට කියා අවසන් වූ වහාම මට මුද්දරප්පලම් ගෙඩි කිහිපයක් දීම නායක හිමියන්ගේ සිරිතයි. දිනක් මා අතට මුද්දරප්පලම් තබා නායක හාමුදුරුවෝ පුටුවෙන් නැගිට්ටා විතරයි. මගේ කටට දමාගත් මුද්දරප්පලම් ගෙඩිය කෑමට ප්‍රථම හෙණ පහරක් මෙන් කව්දෝ මට කම්මුල් පාරක් දුන්නේය. මා අඬාගෙන හැරී බලන විට ඒ අපේ තාත්තාය. "සාංඝික දේ කෑම තහනම් බව" කියමින් නැවත තාත්තා මට ගැසීමට පෙර, නායක හාමුදුරුවෝ මා සිවුරට මුවා කරගෙන තාත්තාට හොඳටම බැණ වැදුනහ. මේ කිරිගෝරිස් මුදලාලි ගෙනත් දුන් මුද්දරප්පලම්

ඡායාරූප: 17 – නාහිමියන්ගේ සොහොන

බවත්, ඒවා සාංඝික නො කරන ලද බවත්, ඒවා කැවාට පව් සිදු නොවන බවත් පවසා, උන් වහන්සේ තාත්තාට තදින් දොස් නැඟුහ. මේ අතර ගෙදර දිවූ මා, මාස ගණනකට තවත් මොනවා ගෙනැවිත් දුන්නත් ගියේ තාත්තා ළඟට නම් නොවේ. තාත්තා එකල වෙළදාම් කළේ උඩරට ය. මගේ පියා ගෙදර ආවේ මසකට – දෙකකට වරකි. එසේ ආ වාරවලදී තාත්තා ගෙදර සිටින විට, පන්සලට යැමත් – තාත්තා පන්සලට එන විට අනිත් පැත්තෙන් ගෙදර යැමටත් තරම් මම මුරණ්ඩු වීමි. එදා සිට අද වනතුරු පිල්ලෙගොඩ පන්සලෙන් කුරුම්බා ගෙඩියක් වත් බීවේ මා නොවේ.

පිල්ලේගොඩ චෛත්‍යාලංකාර විහාරයේ ආදි කර්තෘන් වහන්සේ වූ අඹගහවත්තේ ජයතිස්ස හිමියනට, අප පියතුමාගේ සීයා වූ ගබෝ සිංඤෝ උපාසක තුමා ඇතුලු පිරිසක් තමනට අයිති අක්කර දෙකක පමණ ඉඩම සිද්ධස්ථානය ගොඩනැඟීමට පරිත්‍යාග කර ඇත. පන්සලේ විහාර මන්දිරය, දාගැබ, සංඝාවාසය හා දේවාලය සාදා ගැනීමට ඒ අය ඉමහත් උත්සාහයක් ගෙන ඇත. ගල්වැටි දැමීමට හා මාර්ගය සකස් කිරීමට මේ වැඩිහිටියනගේ ශ්‍රමය මහත් සේ කැප කර ඇත.

පසු කලෙක අහංගම සුමනතිස්ස නම් හිමිනම, ජයතිස්ස හිමියන්ගේ ශිෂ්‍ය නම විය. ඒ ළඟට අහංගම සුමනජෝති නාහිමියන්ගේ ප්‍රව්‍රජ්‍යාව සිදුව ඇත. උන්වහන්සේ විද්‍යෝදය පිරිවෙණේ අධ්‍යාපනය ලබා, පණ්ඩිත උපාධිය ලබාගෙන ගමට ඒමෙන් අනතුරුව වර්තමාන ප්‍රගතියේ ආරම්භය විය.

ඡායාරූප: 18 –විහාර ගෙය හා චෛත්‍යය

හබරාදුව ධීරසේකර (හෙන්ද්‍රික්) උපාසක මහතා, නායක හිමියන්ගෙන් බණ අසා පැහැදුණු සැදැහැ සිත, මහඟු ශාසන උද්දීපනයකට අත්තිවාරමක් විය. ක්‍රි.ව. 1918 දී ආරම්භ කළ විහාර කර්මාන්තයට ධර්මශාලා, දාන ශාලා, සංඝාවාස, සීමා ගෙවල් හා ගිනිහල් ගෙයද, වැසිකිළි, කැසිකිළි, ආදිය ද ඇතුළත් විය. මෙම ගොඩනැගිලි නිර්මාණවල දී සිදු අඩුපාඩු ගැන උපාසකතුමාට සිහිනෙන් දන්වන බව අප වැඩිහිටි ඇත්තන් කියනු අපට මතකය. සුභ මුහුර්ති සෑදීමේ උසස් හැකියාව නායක හිමියන්ට ඇති වූයේ ජ්‍යොතිශ් ශාස්ත්‍රයේ හසල නිපුණතාව නිසයි. කුල දරුවන් බොහෝ දෙනෙකු සසුන් ගත කළ මුත්, මහණ දම් පිරීමේ භාග්‍යය උදා වූයේ සුලු පිරිසකටය.



ඡායාරූපː 19
ඝණ්ඨාර කුලුණ

ඡායාරූපː 20
සීමාගෙය හා
දේවාලය

පූජ්‍ය අහංගම වනරතන, පූජ්‍ය අහංගම පඤ්ඤානන්ද, පූජ්‍ය පොල්හේනේ සීලානන්ද, පූජ්‍ය අහංගම විජයවංශ, පූජ්‍ය උණවටුනේ චන්දානන්ද, පූජ්‍ය නාරද්දේ වේදානන්ද, පූජ්‍ය දෙවුන්දර උපසේන, පූජ්‍ය පොල්හේනේ අග්ගාරාම, යන යතිවරු මහණ ජීවිතය අත් නොහැරියෝය.



ඡායාරූපඃ 21 බෝධීන් වහන්සේ

අපේ පියතුමා, එක්දහස්නමසිය විසිඅටේදී අබලන් වූ චෛත්‍යය කේ. එම්. සියනේරිස් මුදලාලි මහතාගේ ධන පරිත්‍යාගයෙන් පිළිසකර කර, ඒ අවුරුද්දේ කොත් පැළඳවීම සිදු කළේය. අරහත් ධාතූන් වහන්සේලා එකසියහැත්තෑ නමක් ඉන්දියාවෙන් පැමිණි බ්‍රාහ්මණ පින්වතෙකුගෙන් ලැබී චෛත්‍යයේ නිදන් කිරීම සිදුව ඇත. දේව බැල්ම මේ ස්ථානයට ඇති බව බොහෝ දෙනාගේ විශ්වාසයයි.

බුදුරජාණන්වහන්සේට, ආනන්ද හාමුදුරුවෝ යම් සේද අපේ නායක හාමුදුරුවන්ගේ උපස්ථානයට අහංගම වනරතන හාමුදුරුවෝ, එසේම වූහ. වනරතන ලොකු හාමුදුරුවෝ, එක්දහස් නවසියඅනූවේ මාර්තු දහඅටවැනිදා රාත්‍රි 7ට පමණ අපවත් වූහ. එක්දහස් නවසිය තිස්අටේ අප්‍රේල් විසිනවවැනි දිනක අපේ ගුරු දේව නාහිමිපාණන් වහන්සේ අපවත් වූ සේක. එදා හාමුදුරුවරු, හෙන්රි සහ තෝමස් අමරසූරිය, ඒ.ඩී. ජයසුන්දර, ජී.ටී. පණ්ඩිත ගුණවර්ධන, ඩී. ඩී. ජයවර්ධන නොතාරිස් රාළහාමි, ඒ. ජයතිලක වෙද රාළහාමි, යටලවත්තේ විජේසිංහ වෙද මහතා, වෛද්‍යශේඛර වෙද මහතා, සෙනෙවිරත්න

ඡායාරූපඃ 22 ධර්ම ශාලාව

දොස්තර මහතා, ටැටී අමරසූරිය ඉංජිනේරු මහතා, ජී. එච්. අරනෝලිස් බාස් උන්නැහේ, කේ. එම්. සියනේරිස් මුදලාලි, පී. පුඤ්ඤධීර, එම්. කේ. දෙසායස් ද සිල්වා, ඒ. අබේරත්න රාළහාමි, ටී. සාමෙල් සිල්වා රාළහාමි, ජී. කේ. ඩී. ජයසේන ආදී ප්‍රභූහු, උගත්හු, සාමාන්‍ය ගම්වාසීහු, කුඩා දරුවන් මෙන් ඇඬූහ. මමත් හොඳටම ඇඬීමි. මහ මුහුද අයිනේ පොල්රුප්පේ විශාල අලංකාර ගෙඩි ගෙවල් සොහොන් කොත් ඉදි කරවා ලස්සන රන්සිවි ගෙයක උන්වහන්සේගේ ශ්‍රී දේහය තැන්පත් කොට ගම් වටා මහ පෙරහැරකින් චිතකය ට ගෙන ගොස් එදා පැවැත් වූ ආදාහනෝත්සවය මා මනසට චිත්‍රයක් මෙන් දිස් වේ. වජිරාරාමාධිපති නාරද හිමිපාණන් වහන්සේ ද එදා ආදාහන උළෙලේ දී දේශනාවක් කරනු මට මතකය.

ජායාරූපඃ 23 – අහංගම වනරතන ලොකු හාමුදුරුවෝ හා මා

සෑම වෙසක් පුන් පොහෝ උත්සව කාලයකම, පන්සලට හැරෙන තැන මහ පාරේ තොරණක් ඉදි විය. එම තොරණේත්, ධාතූන් වහන්සේලා වැඩම කරන මණ්ඩපය ඉදිරියේත් ලස්සන කවියක් ලියා තිබීම ඒ කාලයේ සිරිතයි. නායක හාමුදුරුවන් එදා ලියා තුබූ කවියක් අදත් මට මතකය.

ජායාරූපඃ 24
පූජ්‍ය නාරද්දේ වේදානන්ද හිමි

පුන්න පෙරුම් බල පෙන්නවමින් එ උපන්න අපේ මහතා - වෙසක් මස
පුන්න සඳින් යුතු මෙන්න මෙ පෝ දින එන්න මෙහේ දෙනෙතා
ගන්න නිවන් මග පෙන්නවමින් දෙසූ වන්න සයෙන් දිමුතා - මුනිඳුගෙ
මෙන්න ධාතු නමදින්න හොඳයි ලැබ ගන්න නිවන් සැපතා.

අපේ ආත්තම්මා

අපේ තාත්තාගේ, මෑණියන් වහන්සේ වන අපේ ආත්තා, පන්සලේ ප්‍රධාන දායිකාව වූවාය. ආත්තාගේ රූපයත් මට හොඳින් මතකය. නායක හාමුදුරුවන් ළඟට බිය සැක නැතිව ළංවන්නට ශක්තිය තිබුණේ ඉතා වයෝවෘද්ධ වියේ සිටි අපේ ආත්තාටය. ඇය නායක හාමුදුරුවන් ප්‍රධාන ලොකු කුඩා හාමුදුරුවරුන් කාටත් සැලකුවේ ඇයගේම දරුවන් හැටියටය. දවසක් ආත්තා පන්සලට යන්විට, සමහර හාමුදුරුවරුන් හාල් ගරමින්ද, සමහර හාමුදුරුවරුන් පොල් ගාමින්ද, තවත් සමහර සාමණේරයන් වහන්සේලා ලිප ගිනි මොලවමින් ද සිටිනු දැක තිබේ. වහාම ගෙදර ආ ආත්තා, තාත්තා කැඳවා ගම පුරා ඇවිද, උදේ හීල හා දවල් දානය එක් එක් ගෙවලට බාර දීමට පවරා තිබේ. මේ සඳහා ඒ. එච්. දිනෝරිස් මහතා ද සහාය වී තිබේ. මේ අනුව සලාක දාන ක්‍රමයක් අපේ පන්සලේ ඇති වූ බව තාත්තා අපට කියා තිබේ. අදත් හැම මසකම එකොළොස්වැනිදාත්, සිංහල අලුත් අවුරුද්ද දවසේත් සලාක දානය අපේ ගෙදරින්ය.



ඡායාරූප: 25
උණවටුනේ චන්ද්‍රානන්ද හිමි සහ පොල්හේනේ සීලානන්ද හිමි සමග (වයස 12 දී 1943)

ගමේ විශ්ව විද්‍යාලය

අපේ ප්‍රදේශයට තිබූ විශ්ව විද්‍යාලය අපවත් වූ අපේ නායක හාමුදුරුවෝය. ඒ විශ්ව විද්‍යාලයෙහි ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර අපේ ආත්තා වැනි වයෝවෘද්ධ මාතාවන්, උණවටුන පාසලේ ප්‍රධානා-

–චාර්යතුමා වැනි අධ්‍යාපනඥයන්, ගමේ සිටි ගම්මුලාදෑනියා වැනි රජයේ සේවකයන් මගේ මතකයට නැඟේ. මොවුන් තුළ තිබූ ශික්ෂණය අද එවැනි අය කෙරෙහි දක්නට නැත. අදත් ජීවතුන් අතර (1976) සිටින ජී.කේ.ඩී. ජයසේන උප ප්‍රධානාචාර්ය තුමා වැනි අය දකින විට ඔවුන්ගේ ශික්ෂිත කථා විලාශය, ඇඳුම පැළඳුම, ගමන බිමන, ජීවිත ගැඹුර දකින විට නායක හාමුදුරුවන් වැනි අධ්‍යාපන ප්‍රදීපස්ථම්භ නිවී යෑම නිසා ගම පුරා පැතිර ඇති අන්ධකාරය පෙනේ.



ඡායාරූප:26
ජී. කේ. ඩී. ජයසේන ගුරුතුමා

අමරා නංගී

අපේ ආත්තාගේ අවසාන මොහොත ඔවුන් තුළ තිබූ පෞරුෂෝදයට හොඳ උදාහරණයකි. ඇය මියයන විට අසූවිය පිරී තිබුණේය. ඒ 1940 දීය. අවසාන දිනය මට මතකයි. පන්සලේ ලොකු හාමුදුරුවන්ට පණිවිඩ යවා, සතිපට්ඨානය කියවා ගැනීම ඇය කළ පළමු කාර්යයයි. දෙඅත් එකතු කොට වැඳගෙන සිටි ඕ ඉක්බිතිව ලොකු හාමුදුරුවන්ට වැඳ අවසර ගත්තාය. ඊළඟට මුණුපුරු මිණිපිරියන් ළඟට කැඳවා, කතා කොට ඔවුන්ටද ආයුබෝවන් කීවාය. ඊළඟට දරුවන් එකිනෙකා කැඳවා අවසන ලොකු පුතා වූ අපේ තාත්තා ද සිප, අප කා කෙරෙහිවත් තණ්හාවක් දැන් නැති බව ප්‍රකාශ කොට, නැවත සතිපට්ඨාන සූත්‍රය කීමට අපට අණ කළාය. අප හැමෝම පොත කියවද්දී සිනාමුසු මුහුණින් ඕ අවසන් හුස්ම හෙළුවාය. එහෙත් අවසාන මොහොතේ 'අම්මේ, මගේ දුව වී ඉපදෙන්න' යයි කෑ ගැසීමට තරම් අපේ තාත්තා බොළඳ වූයේ ආත්තා කෙරෙහි ඔහු තුළ තිබූ බලවත් භක්ත්‍යාදරය නිසාය. අප පවුලේ මා දුටු පළමු මරණය මෙයයි.

අපේ බාල නංගී අමරා, තමාගේ දුව ලෙස පවුලට නැවත එකතු වූ තම මෑණියන් වහන්සේ බව, තාත්තා මිය යන තෙක්ම විශ්වාස කළේය. අප කාටත් වඩා අමරාට තාත්තා ආදරේ බව, තාත්තා මිය යෑමට කිට්ටු දිනවල දී පවා ප්‍රකාශ කළේය. විවාහ වී අවුරුදු කීපයක් ගත වීත්, අමරාට දරුවකු නොමැතිවීම ගැන තාත්තා ඉතා කණගාටුවෙන් සිටියේය. ජීවත්වන කාලයේ දී පමණක් නොව, මරණින් පසුවත් අපේ පවුල්වල ඔවුනොවුන් කෙරෙහි තිබෙන බැඳීම පුදුම සහගතය.

5

අපේ ගමේ ඇත්තෝ

එක්දහස් නවසිය හැත්තෑහයේ අගෝස්තු පස්වැනි දා මැදියම් රැයෙහි මම වියානාවේ සිට ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රාන්තයක් වූ පෝර්ටෝ රිකෝ දිවයිනට තවත් සමුළුවක් සඳහා පැමිණියෙමි. ඊයේ උදේ පැය තුනක් පමණ මම මේ කතාව ලීවෙමි. නැවත සවස් කාලයේ ද පැය දෙකක් ලීවෙමි. පැය දෙකක පමණ අපේ සාකච්ඡාවක් හැර ඊයේ වෙන කිසිදු වැඩක් නොවීය. මා කාමරයට ගෙනැවිත් තබා ගෙන තිබුණු කිරි වීදුරුවක් පමණක් උදේ ආහාරයට ගතිමි. දවල් කැන්ටීමෙන් බත් ටිකකුත් සෝයා බෝංචි හොදි ටිකකුත් ගෙන බුදීමි. අනිත් සියලුම දේවල් මස්වලින් සාදපු ඒවාය. අපේ ආහාර හා සසඳා බලන විට, පුවටෝරිකෝවල මේ මිනිස්සු කවදාවත් රස ආහාරයක් කා ඇත්තේ දැයි සැක සිතේ.

මා රස ආහාර බුදීමට පුරුදු වූයේ අපේ පුංචි නැන්දාගෙනි. අපේ තාත්තාගේ බාලම නංගි වූ පුංචි නැන්දා, අපේ පවුලේ ආහාරය හා පෝෂණය පිළිබඳ විශේෂඥවරිය වූවාය.

තාත්තාගේ පවුල

අපේ ලොකු අක්කාගෙන් මා දැනගත් කරුණු අනුව, අපේ තාත්තාගේ පවුලේ අයවලුන්ගේ ඉතිහාසය මෙසේය:

අහංගමගේ තොහොත් තොම්මාහේවාගේ ගබෝසිංඤෝ හා බෝගවත්තගේ සවුම්යහාමිගේ දරු නව දෙනාගෙන්, දරු හත් දෙනෙකු පාරේ වත්තේ ගෙයක දී කන්ද කඩා වැටී මිය ගිය පුවත අසා ඇත. එයින් බස්තියන් හා සුබානාහාමි යන පුතා හා දුව මේසයක් යට නිදා සිටි බැවින් දිවි ගැල වී ඇත. බස්තියන් මහතා මාතරගේ නොන්නොහාමි නම් කාන්තාවක් හා සරණ බැඳී, දරුවන් සිව් දෙනෙකුගේ පියකු විය. එහෙත් සුබානාහාමි අයියාගේ දරුවනට කැපකරු මවක වී, අනගාරික දිවියක් ගෙව්වාය. අයියාගේ බිරිය හදිසියේ මිය ගියාය. අත දරුවෙක් ද මොවුන් අතර විය. වැඩිහිටි අයගේ කැමැත්ත පරිදි, හබරාදුව ගමේ වත්තේ ප්‍රභූ පවුලක වේරදූවගේ එන්සිනාහාමි මහත්මිය හා බස්තියන්

ජිනදාස මහතාගේ දෙවන විවාහය සිදු විය. පාරවත්තේ ගෙය කඩා වැටුණු පසු පන්සල පහළ ගෙදර නමින් දැන් හැඳින්වෙන අපේ නිවස ගොඩනගා තිබෙන්නේ 1855 පමණ කාලයේ දීය. පන්සල පහළ ගෙදර වර්තමානයේ ඇති වූ ප්‍රගතියේ මුල් අදියර එන්සිනා මාතාවගේ පැමිණීමයි. මේ මාතාව තම සැමියාගේ පළමු විවාහයේ පුතුන් තිදෙනාට හා දුවට ප්‍රේමාන්විත මාතාවක් වූවාය. එවකට කිරි බොන කුඩා පුතාට, අසල්වැසි කිරි ඇති මව්වරුන්ට සංග්‍රහ කර, ඒ කිරිවලින් දරුවා පෝෂණය කළ බැව් අප අසා ඇත.

සරදියස්, කර්ලිනාහාමි, තෝමස්, එරමානිස් යන දරුවන් ලොකු මහත් කර ගැනීමෙන් අනතුරු ව හෙන්ද්‍රික් (මගේ පියා), සොපිනෝනා, කොරනේලිස්, නෝනහාමි, ලැයිසිනාහාමි යන දරුවන් ද ලැබී ඇත. මේ දරුවන් නව දෙනෙකු ඉතා සෙනෙහසින් දැඩි කර ගැනීම වාසනාවකි. මවට පින් පිණිස ලොකු පුතා සරදියස්, උණවටුනේ ජිනරතන නමින් ගණහේනේ ගණනන්දාරාමයේ පැවිදි කරන ලදී. මේ පොඩි හාමුදුරුවෝ අවුරුදු කීපයක් බණ දහම් ඉගෙන ගන්නා අතර, දිනපතාම ගෙදරට පිඩු සිඟා ඒම සිරිතක්වූ. තමා හැදූ අම්මා දානය පිළිගැන්වීම කරන අතර, දිනක් මේ තරුණ හිමියන්ට ඉතා දුකක් ඇතිවීම අභාග්‍යයකි. තමා හැදූ මව දරුවන් දැඩි කිරීමට ගන්නා වෙහෙස හා තම නංගී කිලුටු රෙදි හැට්ට ඇඳ සිටීමත් යන කරුණුවලින් හිත වාවා ගන්නට බැරිව, ගෙදර යාමට අවසර ලබාගෙන, ගිහි තත්ත්වයට ආ බැව් දැන ගන්නට ලැබුණි. පන්සලේ දී ලැබූ අධ්‍යාපනය නිසා, මොහුට බදුල්ලේ වෙළඳසැලක ලිපිකරුකමක් ලැබී ඇත. වසර කිහිපයකට පසු තම ලොකු මල්ලී තෝමස් ද හවුල් කරගෙන, තනිව ව්‍යාපාරයක් ආරම්භ කර දියුණු කිරීමට වාසනාව උදා කර ගෙන ඇත. උලු සෙවිලි ගෙයක් සෑදීමත්, තම නංගී ගොවියාපානේ ඉඩම් හිමි වැවිලිකරුවකු වූ නිකුලස් රයිගම්කෝරාල යන අයට විවාහ කර දීමත් ඔහුගෙන් ඉටු විය. එදා අශ්ව කරත්ත කීපයකින් තම ඉතා රුමත් දුව කැන්දාගෙන ගිය හැටි අපේ මිත්තණිය කියන්නේ ඉමහත් සතුටකිනි. ඒ පවුලේ පස් දෙනෙකි.

ආර්. කේ. එමලිහාමි, අගෝහාමි, සිසිලිහාමි, බේබිනෝනා හා සිරිපාල මේ අයගේ දරුවන් රටේ හොඳින් ජීවත් වූ අයයි. සිරිපාල නැමති අය මැලේසියාවේ – ක්වාලාලම්පූර්හි දී විවාහ වී එහි දී මිය ගොස් ඇත.

සරදියස් මහතා හබරාදුව වේරදූවගේ දිසානාහාමි මහත්මිය හා විවාහ වී ඇත.

සිරිසේන, විමලසේන යන පුතුන් දෙදෙනාගේ මව කුඩා අවදියේ මිය ගියාය. විමලසේන දරුවා උපතේදී මව මිය ගිය බැවින්, ගොවියාපාන නැන්දා ඔහු ඇති දැඩි කළ මුත්, තුන් හැවිරිදි වියෙහි දී මිය ගොස් ඇත.

ක්‍රි. ව. 1925 දී පමණ සරදියෙස් ජිනදාසගේ මරණයෙන් පසු සිරිසේන ජිනදාස (සිරි අයියා) මිත්තණියගේ සෙවණේ වැඩුණේය. බදුල්ලේ ධර්මදූත විදුහලෙන් අස් වූවාට පසු ඔහු අනුරාධපුරයේ ශ්‍රාවස්ති වත්තේ (ඩබ්. ඒ. ද සිල්වා මහතාගේ) ලිපිකරුවකුව සිට වරින් වර ඇදුම රෝගයට ද ගොදුරුව ඇත. 1935 දී ඕපනායක කේ. එම්.එස්. කොම්පැනියේ ද ලිපිකරු සේවයේ සිට පසුව වේයන්ගොඩ ඩැනි අයියාගේ පැට්‍රල් ෂෙඩ් එක බාරව සිටියේය.

තාත්තාගේ වතගොත

අපේ තාත්තා, අපේ ආත්තම්මාගේ ලොකු පුතාය. තාත්තාගේ නම අහංගමගේ නොහොත් තොම්මාහේවාගේ හෙන්ද්‍රික් ජිනදාස යනුයි. තාත්තා ළඟට බාල නංගී, අපේ ලොකු නැන්දා වැලිගම පැලැණේ දිනෝරිස් වික්‍රමතුංග නැමැති මුදලාලි කෙනකු හා විවාහ වී පැලැණේ පදිංචිව සිටියාය. ඇගේ නම සොපිනෝනා ජිනදාසය. ඊළඟ නංගී තමා අපේ බුදු නැන්දා. ඇයගේ නම නෝනහාමි ජිනදාස යි. මේ දෙදෙනා අතර තාත්තාට මල්ලී කෙනෙක් ද සිටියේය. ඔහු සුප්‍රසිද්ධ නවකතාකරුවෙක් වූ උණවටුනේ ඒ.ටී.සී. ජිනදාසයි. තාත්තාගේ පවුලේ බාලම නංගී වූ අපේ පුංචි නැන්දාගේ නම ලැයිසිනාහාමි ජිනදාසයි.



ඡායාරූප: 27 –අහංගමගේ නොහොත් තොම්මාහේවාගේ හෙන්ද්‍රික් ජිනදාස (තාත්තා)

කුමන හේතුවක් නිසා හෝ මගේ උප්පැන්නයෙන් ජිනදාස කොටස ගිලිහී තිබේ. කෙසේ නමුත් මගේ මල්ලී වීරමන් ජිනදාස, ජිනදාස පෙළපතේ නම රැක ගෙන තිබේ. ඔහුගේ පුතාලා වන දීපාල් සහ සහන් ජිනදාස, ඒ නාමය ඉදිරි පරපුරට දැනටමත් එක් කොට ඇත.

අපේ තාත්තාගේ පවුලේ විවාහ වූවෝ තාත්තා හා ලොකු නැන්දා පමණය. බුදු නැන්දාත්, බාප්පොච්චිත්, පුංචි නැන්දාත් විවාහ වූයේ නැත. මේ නිසා අපේ තාත්තාගේ පාර්ශවයෙන් අපට වැඩි නෑදෑ පිරිසක්

ඡායාරූපඃ 28
තාත්තා කොටුවේ
ගෝර්ඩන් උද්‍යානය
ඉදිරිපස

ඡායාරූපඃ 29 – තාත්තා බාප්පෝච්චි හා නැන්දලා

නැත. තාත්තගේ පියා, අපේ සීයා මා දැක නැත. මා උපදින විට ඔහු මිය ගොස්ය. අපට ලේ නෑදැයින් යැයි කීමට වැඩි දෙනෙක් නැත. එහෙත් කුල මල බේද නොතකා මුලු ගමේ හැමෝටම ව්‍යවහාරයෙන් නෑකම් කීමට අපි පුරුදු වීමු.

අම්මාගේ පවුල

අපේ තාත්තාගේ පවුලේ ඥාති පිරිස අඩු වුවත්, අපේ අම්මාගේ පවුලේ ඥාති පිරිස ඊට වඩා බොහෝ අධිකය. මගේ අම්මාගේ පියා ගජධීර ආරච්චිගේ කරෝලිස් සිල්වා නම් විය. අම්මාගේ මව බඹරන්දේ මද්දුම හේවාගේ සංගොහාමි නම් වූවාය. මේ දෙදෙනා මා ඉතා කුඩා කාලයේ දී දැක ඇතත්, ඔවුන්ගේ රූපය මට හරියට මතක නැත. අම්මාගේ අයියා ගජධීර ආරච්චිගේ බේබි සිල්වා, අපේ ලොකු මාමා, මට හොඳට මතකය. ඔහු කොළඹ වරායේ ප්‍රථම කුලී රිය සමාගමේ

ඡායාරූප: 30
වාඩි වී වමේ සිට
දකුණට අපේ අම්මා
හා ඇගේ නංගිලා
තිදෙනා පද්මිනී
නංගීගේ විවාහය දා



ඡායාරූප: 31
මගේ පියා (වමේ)
සිරිමාන අයියාගේ
තාත්තා (දකුණේ)
ලොකු මාමාගේ
කාරෙක ඉදිරිපස

ඡායාරූප: 32
අම්මා හා බාලම්මා
කොළඹ ඩයස්
පෙදෙස් ගෙදර
ඉදිරිපස

රියැදුරෙක් වශයෙනුත්, එහි රථවාහන අංශය බාරව ක්‍රියා කළ පුද්ගලයා වශයෙනුත් කුඩා කල සිටම මට මතකය. අම්මාට අයියා හැරුණු විට, ගජධීර ආරච්චිගේ කරලැයින් ලියනආරච්චි, ගජධීර ආරච්චිගේ ලීලාවතී ද සිල්වා, ගජධීර ආරච්චිගේ මැගිලින් වික්‍රමසිංහ යනුවෙන් නංගිලා තිදෙනෙක්ද, දෙවැනි ලෝක යුද්ධ සමයේදී, කාලතුවක්කු හමුදාවේ සේවය කළ ගජධීර ආරච්චිගේ විලියම් සිල්වා නැමති මල්ලී කෙනෙක් ද සිටියහ. හොඳ සංගීතඥයෙකු හා ගායකයකු වූ පුංචි මාමා, අපේ මරදානේ ගෙදරට විත් ඔහු තැනූ ගී ගායනා කොට, අප ව විනෝදමත් කළේය. මගේ පුංචි අක්කා ලලනාගේ විවාහ මංගල්‍ය උත්සවයේදී ඔහු විශේෂ සිංදු තැටියක් පටිගත කොට ගෙනවුත් අක්කාට තෑගි කරනවා මට මතකය.

මේ කිසිවෙක් අද ජීවතුන් අතර නැත. එහෙත් ඔවුන්ගේ දූ දරුවන් කිහිප දෙනෙක්ම මා පුද්ගලිකව දැන හැඳින ආශ්‍රය කළත්, මගේ මුලු කාලයම සර්වෝදය වෙනුවෙන් කැප කළ නිසා, මරණ මගුල් ආදියේදී හැර, පෞද්ගලික ජීවිතයේ දී ඔවුන් සමග කිට්ටු සම්බන්ධයක් ඇති කර ගැනීමට නොහැකි වීම ගැන මම කණගාටු වෙමි.

අපේ ලොකු මාමාට ලූවී ධනසේන, බන්දුසේන, කරුණාසේන, චන්දන සහ ආනන්ද යනුවෙන් පුතාලාම හතර දෙනෙක් සිටියහ. අපේ මද්දු අම්මාට සිරිමාන්න, දයාසීලි, චූලරත්න, ධම්මතිස්ස, කල්‍යාණරත්න, ජයරත්න, පද්මිණී යනුවෙන් දරුවන් පස් දෙනෙක් සිටියහ. පද්මිණී නංගී අපේ නීති සහන සේවා සංසදයේ පූර්ණ කාලීනව සේවය කරයි. අපේ බාලම්මාට නාලන්දා විද්‍යාලයීය ක්‍රිකට් කණ්ඩායමේ නායකයෙක්ව සිටි විමලරත්න, ගුවන් හමුදාවේ සේවය කළ සිරිවර්ධන, මහින්ද යනුවෙන් පුතුන් තිදෙනෙක් ද රානි නමින් දුවක් ද සිටියහ. මහින්ද හැර අන් සියලු දෙනාම අද ජීවතුන් අතර නැත. පුංචි අම්මාට තිලක්, ඉන්ද්‍රානි, අනෝමා සහ මහින්ද යනුවෙන් දරුවන් හතර දෙනෙක් සිටියහ.

ඡායාරූප: 33 – නාලන්දා ක්‍රිකට් කණ්ඩායමේ නායකව සිටි එච්. විමලරත්න ද සිල්වා මල්ලී

ඉදිරි අනාගතයේ දී මා සිත තුළ තිබෙන එක් අදහසක් නම්, මේ සියලුම දෙනා අප නිවසට කැඳවා ඔවුන්

හා මගේ දරු මුණුපුරන් උනුනුන්ට හඳුනා ගැනීමට අවස්ථාව සලසා දීමයි.

අපේ වත්තේ ජීවත් වූ පවුල් තුනක්

අපේ වත්තේම, අප කුඩා කල තවත් පවුල් තුනක් ජීවත් වූහ. මැටියෙන් සදා තිබූ ගෙවල් තුනේ මුල්ම ගෙයි පදිංචිව සිටියේ රොසි අක්කා, ඇයගේ මල්ලීලා වූ සාමෙල් අයියා හා විලියම් අප්පු අයියා, ඇයගේ මාමා වූ ලුවිස්සාමි මාමා, ඇයගේ මව මාතරගේ පොඩිහාමි කුඩම්මා හා අප විසින් අප්පොච්චි නමින් හැඳින් වූ කුරුණෑයකගේ අයෝනිස්, ඇයගේ පියාය. අප්පොච්චි කළේ දවස පුරාම පොල් ගස් නැග ගෙඩි කඩා ගසකට ගෙඩිය බැගින් කුලිය ගෙන, ඒවා සවසට කරේ එල්ලා ගෙන ගෙදර ඒමය. ඇගේ වෙහෙස නිවා ගැනීමට ඔහු රා ටිකක් පානය කොට එන බවද කුඩා අපි දැනගෙන සිටියෙමු. ලුවිස්සාමි මාමා තෙල් මැතිරුවේය. අප අසනීප වූ හැම අවස්ථාවක ම වෙනත් ප්‍රතිකාර ගැනීමට පෙර, ඔහු තෙල් මතුරා අපේ ඔලුවේ ගෑවේය. එයින් සනීප නොවුන හොත්, අඹ අත්තක් ඔලුවට සලමින් මතුරමින් අපට ප්‍රතිකාර කළේය. එයිනුත් සනීප වුනේ නැත්නම්, තවත් මතුරා කහපාට ඇප නූලක් බැඳ සනීප වූවාට පසු වෙනත් අය ලවා තොවිලයක් කර වූයේය. බොහෝ විට ගමේ සිටි කුඩා ළමයි මේ ගුරුකම්වලින් ම සනීප වූහ.

ඡායාරූප: 34 – රොසි අක්කාගේ වැඩිමහල් සොහොයුරු සාමෙල් අයියා

ඊළඟට තිබුණේ කොග්ගල නැන්දා හෙවත් කරලිංචිහාමිගේ ගෙයයි. ඇයගේ සැමියා මාතරගේ මතෙස්හාමි මාමාය. ඔහුට කරත්තයක් සමග ගොනෙක් සිටියේය. ජසලින් අක්කා, සොමලින් නංගී, සෝමදාස, නන්දදාස, තිමෝනා, සැම්සන්, ඇලිස් නෝනා, සෝමාවතී නංගී, සැම්සන් මල්ලී ආදී වූ දූ දරුවෝ ඔවුන්ට සිටියහ.

පිටි පස්සේ ගෙදර ඇසිලින් අක්කාගේ පවුල ජීවත් විය. ඇයට හා කරෝලිස් අයියාට පියසිරි, ධර්මසිරි හා විජේසිරි යනුවෙන් පුත්තු තිදෙනෙක් වූහ.

මෙම වැඩිහිටියන්ගේ මරණවලදී හැකි පමණින් මම ගමට ගොස් උදව් වීමි. සමහර තරුණ අයට රැකියා සපයා දුන්නෙමි. අවශ්‍ය අයට නිවාස සාදා ගැනීමටද උදව් වීමි. එම වැඩිහිටි පරම්පරාව දුප්පත් වූවත්, නම්බුකාර ලෙස අගතියෙන් තොරව ජීවත් වූහ.

සාදිනා ආත්තා

මා උපදින විට අම්මා ළඟ සිටි අයගෙන් කෙනෙකි කන්දේ සාදිනා ආත්තා. සාදිනා උපාසකම්මා යනුවෙන් හැඳින්වුණු ඕ සිංහල බෞද්ධ සංස්කෘතියේ ශ්‍රේෂ්ඨ කාන්තා රත්නයක් බව ආපසු හැරී බලන මට අවබෝධ වේ. මව් කුසයෙන් මා පළමුවෙන් ම බිහිවූයේ ඇයගේ අතට බව අම්මා මට කියා තිබේ. මෙය දැනගත් දවසේ සිට ඇ කෙරෙහි මා තුළ තිබුණේ පුදුම භක්ත්‍යාදරයෙකි.

අපේ ගෙදරින් එළියට බැස යාර තිහක් විතර නැගෙනහිරට ගමන් කොට, වමට හැරී පඩි පෙළෙන් නැංග විට පන්සලේ සංඝාවාසය තිබූ මලුව හමුවේ. ඒ කෙලින්, කන්ද මුදුනට තවත් පඩි හතළිහක් විතර නැඟ යන විට, දේවාලයත් ඊට ඉහළින් විශාල ධර්ම ශාලාවත් තිබේ. ධර්ම ශාලාවට ඉහළින් තිබෙන්නේ විහාර මන්දිරයයි. විහාර මන්දිරයේ වහළ උඩ පිහිටි, මුහුදේ ඈතට පවා පොල්ගස් අතරින් සුදට දිස්වෙන, මහා චෛත්‍යරාජයාණන් පෙනේ. විහාර භූමියේ කෙළවර තිබෙන තාප්පය පසු කොට යාර හාර සියයක් පමණ යන විට සාදිනා ආත්තාගේ ගෙදර හමු වේ.

කන්දේ අරනෝලිස් බාස් උන්නැහේ සාදිනා ආත්තාගේ පුතා ය. අප ඔහුට කතා කළේ බාස් උන්නැහේ මාමා කියාය. අපේ තාත්තාත්, බාස් උන්නැහේ මාමාත් ගජ මිත්‍රයෝ වූහ. අලුත් අවුරුද්දට හෝ වෙනත් පැමිණෙන ඕනෑ ම අවස්ථාවක හෝ ඇපල්, මුද්දරප්පලම් ආදී තෑගි බෝග හුහක් අර ගෙන ඒම බාස් උන්නැහේ මාමා ගේ සිරිතය. ඔහුගේ සුදු කෝට් සාක්කුව නිතරම රිදී කාසිවලින් පුරවා ගෙන පැමිණෙයි. අපි කෝට් සාක්කුවට අත දමා කාසි අහුරක් ගෙන එයින් යම් කඩචෝරුවක් ගෙන කෑමට පොර කැවෙමු.

බාස් උන්නැහේ මාමාල, එකල කන්දට සිටි මහ පෝසතාය. කන්දේ අනිත් කෙළවර පාමුල ඔහු විශාල ගෙයක් හදා ගෙන ගියා මට මතකය. ඒ ගෙය තට්ටු ගෙයකි. එහෙත් එය කවදාවත් හදා නිම කරන්නට නුපුලුවන් වූයේ, ඔහු නිර්ලෝභී කිසිදු තැකීමක් නැතිව මුදල් වියදම් කරන කෙනෙකු වූ නිසාය. ඔහුගේ භාර්යාව, රත්නපුරේ නැන්දා ලස්සන තරබාරු කාන්තාවකි. එකම පුතා සිරිසේන අයියා මට

ජීවිතයේ මුණ ගැසුණු පළමුවන කොමියුනිස්ට් වාදියාය. මා පළමුවෙන්ම මාක්ස්වාදය ගැන ඇසුවේ ඔහුගෙන්ය; කියැවූයේ ඔහුගේ පොත්ය.

සාදිනා ආත්තා අවුරුදු අනූවකට අධික කාලයක් ජීවත් ව සිට මිය ගියාය. ඇයගේ මළ ගෙයට මම ගියෙමි. දණ ගසා ඇයගේ මළ සිරුරට වැන්දෙමි. අවමංගල්‍යයේ දී ගුණ කථනයක්ද කෙළෙමි. පසුව ඇගේ අවසාන කැමැත්ත පරිදි, අවසාන කටයුතු නිමකොට, ඇ ඉතා ගෞරවයෙන් වැඳ පුදා ගෙන නිවසේ ආරක්ෂා කරගෙන සිටි සර්වඥ ධාතූන් වහන්සේලා සහිත කරඬුව මගේ හිසින්ම පන්සලට වැඩම කෙළෙමි. දැන් එය ලොකු හාමුදුරුවන් භාරයේ සෙසු ධාතූන් වහන්සේලාද සමඟ සුරක්ෂිත ව තිබේ.

අප පවුල් දෙක අතරේ තිබූ සම්බන්ධය නිසාම උණවටුන කන්දේ ජීවත් වන මිනිසුන් කෙරෙහි අද දක්වා මගේ විශේෂ ඇල්මක් තිබේ. පසු කලෙක බාස් උන්නැහේ මාමා බංකොළොත් විය. මා අවසනට සහභාගි වූයේ ඔහුගේ අවසාන ගමනට ය. රත්නපුරේ නැන්දාගේ මරණය ගැන මම නොදත්තෙමි.

ඔක්කොම නෑදෑයෝ

අපේ අම්මාට කවුරුත් කියන්නේ 'කොළඹ' යන විශේෂණය ඉදිරියට දමා කොළඹ ළමයා, කොළඹ අක්කා, කොළඹ නැන්දා, කොළඹ කුඩම්මා ආදී වශයෙනි. මෙය ඒ කාලයේ අපේ ගැමි සමාජයේ සිරිතක් විය. අම්මාගේ උපන් ගම වැලිගම පැලෑණේ වුවත්, අම්මාගේ පියා රැකියාව කර තිබෙන්නේ කොළඹය. තාත්තාට– අම්මා මුණගැසී තිබෙන්නේ අම්මලාගේ කොළඹ ගෙදර දී ය. අම්මා හා විවාහ වී තාත්තා ගෙදර ආවේ පන්සලේ විදුලි ආලෝකය දමා මහ උත්සවයක් පැවැත්වුන දිනකලු. අම්මා සිතා ගෙන සිටියේ ඔවුන් පිළිගැනීමට පවත්වන උත්සවයක් කියාලු. මේ තාත්තා අලුත් මනමාලියට කළ විහිලුවක්ලු.

ඡායාරූප: 35
අම්මා හා තාත්තා විවාහ වූ දා

අම්මා 'කොළඹ සිට ගෙනා ළමයා' නිසා ගමේ මිනිසුන් කොළඹ විශේෂණය කොට අම්මාට ආමන්ත්‍රණය කළ බව මා දැන ගත්තේ පසු කලකය.

අපේ ගෙදරට අල්ලපු ගෙදර කොග්ගල නැන්ද, ඉස්සරහ ගෙදර වැලිගම නැන්දා, ඊළඟ ගෙදර කටුකුරුන්දේ නැන්දා, හබරාදුව නැන්දා ආදී වශයෙන් ගෙයක් ගෙයක් ගානේ ගැහැනු අය හැඳින්වූහ. කිසිදු කුල මල භේදයක් නැතිව වයස අනුව අයියා, අක්කා, නංගී, මල්ලී, නැන්දා, මාමා ආදී වශයෙන් උනුනුනට ප්‍රිය වචනයෙන් ආත්ම ගෞරවය රක දෙමින් පැවැතුණු කතා ව්‍යවහාරය කුඩා කලදීම මගේ සිතට කා වැදුණේය. සමහර විට අද දහස් ගණනක් සර්වෝදය ශ්‍රමදාන සංසදයේ සාමාජික සාමාජිකාවන්, අයියා අක්කා නංගී මල්ලී යනුවෙන් උනුනුන් ඇමතීමට පුරුදු වුනේ කුඩා කලදී මා කෙරෙහි මේ ප්‍රිය වචනය බලපෑමේ ප්‍රතිඵලයක් වශයෙන් විය හැකිය.

ඡායාරූප: 36
වමේ නැගිට ලයනල් අමරවික්‍රම
අයියා හා දකුණෙන් සිරිමාන
අයියා මිතුරකු සමග



ඡායාරූප: 37
අපේ ලොකු අක්කා සමග
මා හා මල්ලී විහාරගෙය ඉදිරිපිට

6

උපත හා 'මමත්වය' තුවාල වීම

මා ඉපැදුනේ 1931 නොවැම්බර් මස 5 වැනිදාලු. මගේ කේන්දරය අනුව පස්වරු 6.27ට. මා ළඟට වැඩිමල් අක්කා වූ ලලනා චූලලතා ඉපැදුනේ 1928 ජනවාරි දෙවැනිදාලු. ලොකු අක්කා ඇස්ලින් සුමිත්‍රා ඉපැදුනේ 1921 අප්‍රේල් දහසයවැනිදාලු. මට බාල මල්ලී වීරමන් ඉපැදුනේ 1934 මාර්තු 11 දාය. ඊළඟ නංගී මධුරා පද්මවතී 1937 දෙසැම්බර් 25 දා ඉපැදුනු අතර, බාලම නංගී අමරා කුලවතී ඉපැදුනේ 1941 සැප්තැම්බර් 16 වැනිදාය.

අප හය දෙනාගේ උපත් දින පරතර ගැන සිතා බලන විට, අපේ දෙමව්පියන් කෙතරම් ඉහළින් පවුල් සංවිධානය කර තිබේද යන්න පැහැදිලි වේ. ඔවුන් පවුල් සංවිධාන දෙසුමකට කවදවත් සවන් දී නැති



ඡායාරූප: 38
ඇසිලින් සුමිත්‍රා (ලොකු අක්කා)

ඡායාරූප: 39
ලලනා චූලලතා (පුංචි අක්කා)



ඡායාරූප: 40
මා



ඡායාරූප: 41
වීර ජිනදාස (මල්ලී)

ඡායාරූප: 42
මධුරා පත්මාවතී (ලොකු නංගී)

ඡායාරූප: 43
අමරා කුලවතී (බාල නංගී)

අතර උප්පත්ති පාලනය සඳහා යොදවන භෞතික හෝ රසායනික මෙවලම්ද දැක නැත. අද වන තුරු මාත් මේවා දැක නැත. දකින්නට උවමනාවකුත් නැත.

අප හයදෙනාම ඉපැදුනේ අපේ මහ ගෙදරමය. පද්මා උපදින අවස්ථාව මට මතකයි. ඉහළ ගෙදර විලියම් අයියා ඉස්තෝප්පුවේ ඉඳ "සරමක් ද? කම්බායක් ද?" කියා කෑ ගසා අසනවාත්, කාමරය තුළින් වින්නඹු අම්මා "කම්බායක්, කම්බායක්" කියා උත්තර දෙනවාත් මට මතකය. සරමක් හැටියට පිරිමි දරුවකු ද, කම්බායක් හැටියට ගැහැනු දරුවකු ද හඳුන්වා දීම ඒ කාලයේ සිරිත බව පසුව මට අවබෝධ විය.

දරු ප්‍රසූතියක් ළං වන විට, පන්සලේ ස්වාමින් වහන්සේලා වැඩමවා දින හතක් අංගුලිමාල පිරිත උදේ සවස සජ්ඣායනා කිරීම ඒ කාලයේ සිරිතය. එමෙන්ම දරුවා ඉපැදෙන අවස්ථාවේදීත් කවුරු හෝ

ගිහියෙක් අංගුලිමාල පිරිත කියයි. එදා අංගුලිමාල පිරිත කීවේ විලියම් අයියාය. සුදු සරමක් හා බැනියමක් ඇඳගෙන සිටි ඔහුගේ සිරුර සුදුපාටය. ලස්සනය. එහෙත් නාසය විකෘති වී තිබිණි. පසු කලෙක අතේ මෙන්ම, කකුලේ ද ඇඟිලි සමහරක් පුරුක් වලින් වෙන් වී තිබෙනු දුටුවෙමි. කලින් කල ඔහු හැඳල රෝහලක සිට එන බව මම ඇසීමි. හුඟක් පසු කලෙකයි මා විලියම් අයියා ලාදුරු රෝගයෙන් පෙළෙන බව දැන ගත්තේ. ඔහු ඉතා දක්ෂ මන්ත්‍ර ගුරුකම් කාරයෙක් විය. ඒ නිසා බොහෝ දෙනා ඔහුට බයෙන් සිටියහ. වරක් ඔහුට ඉන්න තැනක් නැති වූ විට, අපේ තාත්තා අපේ පවුලේ සොහොන් බිමේ ඉහලම කෙළවර කන්ද මුදුනේ ගෙයක් සාදා ගැනීමට ඔහුට ඉඩ දුන්නේය. මම ද එය අනුමත කර උදව් දුන් හැටි මට මතකය.

විලියම් අයියා විවාහ වී සිටියේ ජොසිනහාමි අක්කා නම් තරුණ කාන්තාවක් සමඟය. ඇය නිතරම මට පෙනුණේ අපේ ගමේ සිටි ලස්සනම කාන්තාවක් හැටියටය. ජොසිනහාමි අක්කාට මම හුඟක් ගරු කෙළෙමි. සුදු හැට්ටයක් හා චීත්ත රෙද්දක් නිතර ම හැඳ සිටි ඇයට මා විශේෂ ළැදියාවක් දැක්වූයේ, ඇය තම ස්වාමියා බලාගත් ආකාරය දැකීමෙනි. සමහර විට දින ගණන් අව්වේ ගල් තලා ගෙන ගොස්, රාත්‍රියේ අත හම යන තුරු කොහු අඹරා උපයා ගත් දෙයින් ඕ තම ස්වාමියා මිය යනතුරුම බලා ගත්තාය. ඕ ස්වාමි භක්තියේ මූර්තියකි.


ඡායාරූප: 44
ඇඩ්මන් අයියා

විලියම් අයියා ඉහල ගෙදර පියුම් මාමා ගේ පළමුවැනි හිරේ පුතාය. පියුම් මාමා දෙවැනිව බැන්ද කාන්තාව, මාතර නැන්දාය. ලණු හේවාගේ ඇඩ්මන් අයියා, මාතර නැන්දාගේ පුතාය. දයාවතී අක්කා හා ඇග්නස් අක්කා ඔහුගේ නංගිලාය. අපේ ගෙදර ඕනෑම දෙයකදී මුල් තැන ගෙන ක්‍රියා කළේ මේ පවුලේ උදවියයි.

පියුම් මාමාගේ රූපය මට යන්තම් මතකය. ඔහු තේජාන්විත දේහයක් තිබූ පුරුෂයෙකි. කර වහපු බොත්තම් දාපු සුදු කෝට් එකක් හා සුදු ට්වීඩ් රෙද්දක් ඔහුගේ ඇඳුම් කට්ටලය බව මට මතකය. ඔහු වැඩ කළේ ගාල්ලේ පිස්කල් කන්තෝරුවේ 'දෙපිට පිස්කල්' එදිරිසිංහ මහතා (Deputy Fiscal) යටතේලු. හිරකාරයන් උසාවියේ භාරයට ගෙන ඒමත්,

පසුව ඔවුන් නැවත හිර ගෙදරට ගෙන යැමත් මට මතක හැටියට ඔහුගේ රස්සාවයි. ඔහුගෙන් පසු ඇඩ්මන් අයියාට මේ රස්සාව ලැබුණේය.

මා තනියෙන් ගෙදර සිට යන ලොකු ම දුර ඉහළ ගෙදරටයි. ඉහළ ගෙදර පිටිපස්සේ කන්ද තිබේ. ඔය කන්ද මුදුනේ වෙරලු ගහක් තිබුණේය. ඒ වෙරලු ගහෙන් ගෙඩි කඩන්නට ගොස් දවසක් කන්දෙන් පහළට මම පෙරලුනෙමි. අත බිම තැබූ විට වැලමිට ළඟින් අත කැඩුනේය. මම විලාප දී කෑ ගැසුවෙමි. ටිකකින් මගේ සිහිය නැති විය. ඇඩ්මන් අයියා මා උස්සා ගෙන ගොඩේ වත්තේ රාළහාමිලාගේ ගෙදරට ගොස්, එහි දී අත හරියට තියා බේත් බැඳ, ලී පතුරු තබා බැන්ඩේජ් කරවාගෙන ගෙදරට හැරලූ හැටි මට මතකයි. ඒ වන විට මගේ වයස අවුරුදු හතක් පමණ වන්නට ඇත.

ඡායාරූප: 45
ඇඩ්මන් අයියාගේ පුතා නන්දලාල්, නංගී හා පවුලේ අය සමග

තවත් දවසක් මීට අවුරුදු දෙකකට පමණ පසු, මම රෑ නිදා ගැනීමට ඉහළ ගෙදරට ගියෙමි. මා කැඳවා ගෙන ගියේ ඇඩ්මන් අයියාය. පියුම් මාමා හැන්දෑවට අඩියක් ගැසීම සිරිතය. ඒ වෙලාවට ඔහු ටිකක් කියවයි. කුඩා කල සිට ම, මට අඩි ගහන අය පේන්ට බැරිය. එදා රෑ මා නැවතීමට ගියේ අපේ ගෙදර හැම දෙනා ම පැළැණේ අපේ ලොකු නැන්දාගේ දියණිය වූ සෝමවතී අක්කාගේ මරණ ගෙදරට ගොස් සිටි නිසාය. පියුම් මාමා මා දුටු විට 'ඕන්න ඕකාට පොල් සම්බල් ටිකකුයි

බතුයි කන්ට දීල ඇඳ යට පැදුරක් දාලා නිදාගන්ට දීපියව්' කියනු මට ඇසිණි. එය විහිලුවක් බව තේරුම් ගැනීමට තරම් මා මෝරා තිබුණේ නැත.

ඡායාරූප: 46
රෝසි අක්කා

මගේ 'මමත්වය' කෙතරම් තුවාල වුණා ද කිවහොත්, එවේලේම කලුවරේ ගෙයින් එළියට බැස්ස මම මහ පාර දිගේ අපේ ගෙදරටම එක පිම්මේ දිව්වෙමි. අල්ලපු ගෙදර රෝසි අක්කාට කියා බත් ටිකක් උයවා ගෙන, කට්ට සම්බලයක් හා පොල් සමඟ මම කෑවෙමි. ඇඩ්මන් අයියා මා ආපසු ගෙන යෑමට පැමිණි මුත්, ගියේ මා නොවේ. 'මල්ලි බය නැතුව මාත් එක්ක නිදා ගන්න' යයි කී රෝසි අක්කා මට නින්ද යන තුරුම භූමිතෙල් ලාම්පුව පත්තු කරගෙන අපේ ඉස්තෝප්පුවේ වාඩි වී කොහු ඇඹරුවාය. එදා සිට මිය යනතුරුම පියුම් මාමා ඉන්න පළාතේ ගියේ මා නොවේ. අදත් රෝසි අක්කා, කේ. එන්. රෝසිනහාමි මා දුටු විට මේ කතාන්තරය කියා සිනාසෙන්නීය.

7

මුල් පාසල, පන්සල හා සමාජ පරිසරය

මා ලොකු අක්කාගේ අතේ එල්ලී, උණවටුනේ බෞද්ධ මිශ්‍ර පාඨමාලාවට වයස තුනේ සිටම ගිය බව පැවසීමි. එහෙත් තුන්වැනි ප්‍රමාණය දක්වා මා එහි ඉගෙන ගත් මුත්, ඒ යුගය ගැන වැඩි මතකයක් නැත. මගේ වම් කකුලේ මාපටැඟිල්ල යටට අදත් තද යමක් පැගුණොත් වේදනාවක් දැනෙයි. ඊට හේතුව එහි අඟල් භාගයකටත් වඩා ලොකු කැපුමක් තිබීමයි. එය ඒ කාලයේ පාසල් භූමියේ තිබූ බෝතල් කටුවකට කකුල කැපීමෙන් වූ තුවාලයකි. මේ සිද්ධිය මට මතකයි.



ඡායාරූප: 47
පූජ්‍ය පණ්ඩිත දෙහිපිටියේ චන්ද්‍රජෝති හිමිපාණෝ

මේ හැරුණු විට කොණ්ඩය බැඳපු හීන්දැරි උස උඩු රැවුලක් තිබුණ, කර වහපු සුදු කබායක් හා රෙද්දක් ඇඳ පාසලට පැමිණි නිතරම වේවැල අතේ තිබුණු රාළහාමි ඉස්කෝලේ මහත්මයා මට මතකයි. සුප්‍රසිද්ධ මනෝ වෛද්‍ය ඩී. වී. ජේ. හරිශ්චන්ද්‍ර මැතිතුමාගේ මැණියන් වූ සඳසිලි ඉස්කෝලේ හාමිනේ තුන්වැනි පන්තියේදී මට උගන්වනවා මතකයි. අක්කලාගේ පන්තියට ඉගැන්වූ ජී.කේ.ඩී. ජයසේන නම් උප විදුහල්පතිතුමා ද මට මතකයි. අපේ ගෙදරට නිතර පැමිණි උප ප්‍රධානාචාර්ය ඇල්. එච්. ජයසේන ගුරුතුමාත්, ඉතා මිටි වුවත් වොලිබෝල් ගැහීමට හපන් ජිනදාස මහත්මයාත්, ප්‍රධානාචාර්ය කරුණාරත්න මහත්මයාත් මට මතකයි.

ඡායාරූප: 48
සඳසීලී ඉස්කෝලේ හාමිනේ

පාසලේදී ඉගෙන ගත්තාට වඩා මා උගත්තේ, ගෙදර දී පන්සලේ දී හා ගමේදීයි. පූජ්‍ය පණ්ඩිත දෙහිපිටියේ චන්ද්‍රජෝති හිමිපාණෝ මේ කාලයේ අපේ පන්සලේ වැඩ සිටියහ. ශ්‍රේෂ්ඨ පඬිරුවනක් වූ උන් වහන්සේට අපි කියන්නේ 'වැල්ලේතොට හාමුදුරුවෝ' කියාය. උන් වහන්සේගේ උච්චාරණය හා ස්වරය සීනු හඬක් මෙන් කනට මිහිරිය. වැල්ලේතොට හාමුදුරුවන්ගෙන් ඉගෙන ගැනීමට මම ඉතාම ප්‍රිය කළෙමි. බුද්ධගජ්ජය, ව්‍යාශකාරය හා ප්‍රත්‍ය ශතකය උන්වහන්සේ අපට ඉගැන් වූ හ. ඒවා පසු දින කටපාඩම් කර ගෙන යා යුතු විය. පුංචි හාමුදුරුවරුන් සමඟ මම ද විහාරය පිටුපස තිබුණු ගල් තලාවල ඉඳගෙන මේ ශ්ලෝක කටපාඩම් කළෙමි.

ජෝමිස් අයියලා, ඇඩ්මන් අයියලා, දවිත්සිංඤෝ අයියලා සමඟ මම ද පෝය පින්කම කිරීමට මුදල් එකතු කිරීමට ගමේ ගෙන් ගෙට පයින් ඇවිද්දෙමි. උණවටුන කන්දේ වේවා, ගොඩැල්ලේ වේවා, ගණහේනේ වේවා, ජා කොටුවේ වේවා, යද්දෙහි මුල්ලේ වේවා, පීල්ලෙගොඩ වේවා, මහරඹ වේවා මේ හැම ගම් ගොඩකම හැම ගෙදරකටම මම අවුරුදු නවය වන විට ගොස් ඇත්තෙමි.

පන්සලේ නිතරම බණ පින්කම් තිබුණේය. පෝයදාට විශේෂයි. වෙසක් පොසොන්වලට සති ගණන් බණ පින්කම් බුද්ධ පූජා ආදිය තිබුණේ ය. මේවාට අපේ අම්මා ගේ නැන්දලා ගේ හා අක්කලා ගේ කාලයෙන් වැඩි හරියක් ගත වූයේය. වෙසක්දාට දවුල් හඬ හා හොරණෑ නාද අස්සේ, මහා සාදුකාර මැද්දේ, ලොකු හාමුදුරුවන් වහන්සේ ධාතූන් වහන්සේලා එළියට වැඩම වන හැටිත් ඒ අවස්ථාවල දී අනිවාර්යයෙන් ම වාගේ මල් වැස්සක් වැස්ස හැටිත්, ඒ මොහොතේ අප බුද්ධාලම්බන ප්‍රීතියෙන් පිනා ගොස් සාදුකාර හඬ දුන් හැටිත්, කෙසේවත් අමතක කළ නොහැකිය.

අපේ ගෙදරට ගිනිකොණ දිගින් පන්සල පාරට එහා පැත්තෙන් පිහිටා තිබෙන්නේ තවත් කඳු වැටියකි. ඒ කඳුවැටිය මුදුනේ ගෙවල් කිහිපයක් ම පිහිටා තිබුණේය. කඳු වැටියෙන් එහා පැත්තේ සම බිමේ ද තවත් ගෙවල් රාශියකි. මේ හැම ගොඩකට ම ගොඩැල්ල, රේන්ද ගෙදර ආදී නම් පටබැඳී තිබුණේය. අපේ අක්කලා රේන්ද ගොතන්නට ඉගෙන ගන්නට යන්නේ චාර්ලිනා හාමි (චාරි) නැන්දලාගේ ගෙදරටය. එක් එක් ගෙදරට ගැමි ආර්ථිකයෙහි හා ප්‍රජා අධ්‍යාපනයෙහි විශේෂ සේවයක් කිරීමට තිබුණේය. ගනේහේන පන්සල පිහිටා තිබෙන්නේ මේ මණ්ඩියට නැගෙනහිර දිගින්ය. අපේ පන්සලේ උඩ පැත්තේ කන්ද

හරහා ගොස්, නැවත මහ පාර පැත්තට අඩි පාරක් දිගේ බැස ඒමෙන් ද නැවත ගණේගේන පන්සලට පැමිණිය හැකිය.



ඡායාරූප: 49
පී. එම්. හේමසිරි මල්ලී

ගමට අවුරුදු ඇවිත්

වැලිගම කුඩම්මාගේ ගෙදර අපේ ගෙදරට ඉදිරිපසින් පිහිටා තිබේ. විලියම් අමරවික්‍රම මුදලාලි, වැලිගම කුඩම්මාගේ ස්වාමි පුරුෂයාය. විලියම් සිංඤ්ඤෝ බාප්පා වෙළඳාම් කළේ දැරණියගලය. සිංහල අලුත් අවුරුද්දට අපේ තාත්තලා විලියම් සිංඤ්ඤෝ බාප්පලා චාරි නැන්දාගේ ස්වාමියා වූ හෙන්ද්‍රික් බාප්පලා හා ජෝර්ජ් බාප්පා (ජෝර්ජ් පී. මහාබෝධි දොස්තර මහතා) ආදී ගමේ සියල්ලෝම ගමට එති. අළුත් අවුරුදු තෑගි හුවමාරු කර ගනිති. බබුන් අප්පු බාප්පා කරන්නේ බ්‍රාහ්මණයකුට ඇඳ නාගුණ වැල් කරේ දා ගෙන, ගෝලයා මෙන් ඔහුගේ පුතා දයාරත්න අයියා ද අන්දවාගෙන, ගමේ ඇවිදීමයි. අවුරුද්දට තුන් හතර දිනක් කලින් ඇරැඹෙන අවුරුදු උළෙල විනෝදයෙන් දින ගණනක්ම පවතියි.

පන්සලේ පුංචි හාමුදුරුවරුන් වැලිගම කුඩම්මාගේ පුතා ලයනල් අයියා, පොඩිනෝනා කුඩම්මාගේ පුතා හේමසිරි මල්ලී, කටුකුරුන්දේ නැන්දාගේ බන්දුසේන හා ආරියදාස පුතාලා, ඩයිමිස් අයියා ආදී කොලු ගැටයන් වූ අප කළේ කජු එකතු කර ගෙන වල කජ්ජු ගැසීමයි.

ගල්වලින් බෝල හදාගෙන වල බෝල ගැසීම, කල්ලි ගැසීම, බඹර කර කැවීම, රෝද පැදවීම, උංචිල්ලා පැදීම, තාච්චි පැනීම, ලුණු ඇල්ලීම, ගිනි ඇල්ලීම සහ හැංගිමුත්තන් ගැසීම ආදී විවිධ ක්‍රීඩාවලින් අපි විනෝද වීමු.

8
කවුද කාමරේ? කවුද කාමරේ?

දවසක් පන්සලේ කාමරයක තිබෙන විශාල අල්මාරියක් ඇතුලේ අග්ගාරාම පොඩි හාමුදුරුවෝත්, උපසේන පොඩි හාමුදුරුවෝත්, තවත් අපි කීප දෙනෙකුත් සැඟවී හැංගි මුත්තන් ගැසීමේ ක්‍රීඩාවේ යෙදී සිටියෙමු. ලොකු හාමුදුරුවෝ හිටි හැටියේ කාමරයට කඩා වැදුණහ. කිසිවෙකුට සද්ද නොකරන හැටියට අපි කතා වුනෙමු.

එහෙත් ලොකු හාමුදුරුවෝ කීපවරක්ම "කවුද කාමරේ? කවුද කාමරේ?" කියා කෑ ගසන විට අග්ගාරාම හාමුදුරුවන්ට කතා නොකර හිටිය නොහැකි විය.

"අපි"

"කවුද අපි කියන්නේ?"

"අපි"

"කවුද යකෝ අපි කියන්නේ?" නැවතත් ලොකු හාමුදුරුවෝ හඬ නැගුහ.

"මම" කියා අග්ගාරාම හාමුදුරුවෝ කෑ ගැසුහ.



ජායාරූප: 50 – පොල්හේනේ අග්ගාරාම හිමි (78 වියේ දී) මට හමු වූ අවස්ථාවක

"කවුද මම කියන්නේ?" නැවතත් ලොකු හාමුදුරුවෝ සැරෙන් ඇසූහ.

"අග්ගාරාම හාමුදුරුවෝ"යි උත්තර ලැබුණි. අග්ගාරාම හාමුදුරුවෝ පෙට්ටියෙන් එළියට වෙවුලමින් ගිය අතර, අපි නො සෙල් වී සිටියෙමු. ලොකු හාමුදුරුවන්ට විහිලුව තේරී සිනාසෙමින් ඈතට වඩිනු අපි දිටිමු.

දවසේම සෙල්ලම් කර සවස මා ගෙදර එන්නේ, අම්මාගෙන් ඉරටු පාර කෑමට සූදානම්වය. අම්මා හන්දියට ගොස් සිටි වේලාවක් නම්, බුදු නැන්දාට හෝ පුංචි නැන්දාට හෝ කියා ඇඟ සෝදවා ගෙන කෑම කවා ගෙන කලින්ම නින්දට ගියෙමි. අම්මා සිටියොත් මොනවා හරි වරදක් පෙන්වා, කමිසය කිළිටි වී තිබීම උඩ හරි ඉරටු පාරක් කා, ඇඟ සෝදවා ගෙන බලෙන් කෑම කා නින්දට යෑමට සිදු වේ.

9

මගේ බුදු නැන්දා


ඡායාරූප: 51 – පූජ්‍ය පණ්ඩිත ගිංතොට පඤ්ඤාලෝක හිමි

පූජ්‍ය පණ්ඩිත ගිංතොට පඤ්ඤාලෝක හිමිපාණෝ දක්ෂ ධර්ම කථිකයෙකි. උන්වහන්සේ නිතර අපේ පන්සලට වැඩියහ. දවසක් මල්ලිත් සමඟ මම අපේ ගේ ඉදිරිපිට පන්සල පාරේ සිටින විට, උන් වහන්සේ නැවතී මල්ලී ඉල්ලුවේය. මට කේන්ති ගොස් එතැන ම සිට ගෙදර පැත්තට හැරී "නැන්දේ, මෙන්න මේ බැල්ලි පුතා මගේ මල්ලි ගෙනි යන්න ඉල්ලනවා" යි කෑ ගැසීමි. ගිංතොට හාමුදුරුවෝ සිවුරු පට එක් අතකින් අල්ලා ගෙන වටාපතින් මුහුණ වසාගෙන, පස්ස නො බලා මහ පාර පැත්තට වේගයෙන් වැඩියේය. නැන්දා දුවගෙන මා ඉන්නා තැනට අවුත්, මගේ අතින් තදින් අල්ලාගෙන ගෙදරට ඇදගෙන ගියාය. පොල් ලෙලි ගැසීමට බිම හිටවා තිබුණ අලවංගුවේ ලණු කැල්ලකින් මගේ දෙඅත් බැන්දාය. ඉරටු දෙකක් අරන් මගේ පස්සටත් – කකුල් දෙකටත් වේගයෙන් ගසමින් "තවත් හාමුදුරුවන්ට නරක වචනයෙන් බණිනවා දැ"යි අසමින් මට හොඳටම තැලුවාය.

"අනේ බුදු නැන්දේ මට තලන්න එපා. තවත් නරක වචන කියන්නෙ නෑ." මම පොරොන්දු වීමි. අපේ ගෙදර සිටි උසස්ම උපේක්ෂා සහගත පුද්ගලයා වූ පුංචි නැන්දා අවුත් දැන් ඔය ඇතියි කියා මා බේරාගෙන තුරුල් කරගෙන ගියාය. එදා සිට අද වන තුරු නරක වචනයක් කීවේ මා නොවේ.

අපේ මද්දුම නැන්දා වූ නෝනාහාමි ජිනදාස මහත්මියට, එදා සිට හැමෝම ආමන්ත්‍රණ කළේ බුදු නැන්දා කියාය.

මම ඔය නරක වචනය ඉගෙන ගත්තේ වැලිගම කුඩම්මාගේ පුතා වූ ලයනල් අයියාගෙනි. ලයනල් එදා අපේ කල්ලියේ සිටි චණ්ඩියාය. ඕනෑම කෙනෙකුට ගස්සවන්න ඕනෑ නම්, තිබුණේ පොඩ්ඩක් ලයනල් වයින් කිරීමය.

දවසක් අපි කන්ද උඩ කැලේ සෙල්ලම් කරමින් සිටියදී ඈත පාරේ වයසක කෙනෙක් යනවා දුටුවෙමු. "ඔච්චර එල්ලෙකාරයා තමුසෙට බැනේ අර මිනිසාගේ තට්ටයට ඔය අඹ ඇටේ එල්ලෙ කරන්න?" අපි කීවෙමු. ගස්වලට උඩින් කඳු මුදුනේ සිට යාර සිය ගණනක් ඈත පාරේ ගිය මිනිසෙකු හිස අත ගාමින් වටපිට බලනවා දකින්නට අපට ගත වූයේ මොහොතකි. එන්ට එන්ට ම හිතුවක්කාර වූ නිසා, ලයනල් අයියා ඔහුගේ තාත්තා සමඟ උඩරට ගියේය. මට ද තාත්තා සමඟ උඩරට යෑමට ආශාවක් ඇති විය. තාත්තා ගමේ ආ අවස්ථාවක දී මේ බව කීවෙමි. තාත්තාත් මා වාගේම හදිසි තීරණ ගැනීමට හපනෙකි.

"හ්ම්! හෙට උදේ මා යන විට යමු."

මට මතක හැටියට ඒ එක්දහස්නවසිය හතළිහේ මුල් කාර්තුවේදීය.

10

සම අවස්ථා සඳහා අරගලය

මේ පොතේ තුන්වන පරිච්ඡේදයේ සිට නවවැනි පරිච්ඡේදය අවසන් වන තුරු මා ලීවේ එක්දහස් නවසිය හැත්තෑ හයේ ජූනි විසිතුනත් ජූලි පළමුවැනිදාත් අතරය. දැන් මා මේ ලියන්නේ මගේ මව් බිමට සැතපුම් 12000 ක් ඈත පිහිටි පුවටෝරිකෝ නම් දිවයිනේ සිටය. මා වියානාවේ සිට පුවටෝරිකෝවලට ආවේ එක්දහස් නමසිය හැත්තෑ හයේ ජූලි පස්වැනි දා මැදියම් රැයේදීය. එදා රෑ සැන්වාන් ගුවන් තොටුපළේම පිහිටි හෝටලයක කාමරයක් කුලියට ගෙන රාත්‍රි නිදා ගතිමි. හයවැනිදා උදේ කුලී රියකින් සග්‍රාඩෝ කොරාසාන් යුනිවර්සිටි කොලීජියට (Sagrado Corazon University College) පැමිණියෙමි.

මා හුහක් ගරු කරන කේට් කැට්ස්කි මැතිනියගේ බලවත් ආරාධනය නිසා මම මෙහි පැමිණියෙමි. ඈය ජාත්‍යන්තර සමාජ ශුභ සාධන මණ්ඩලයේ මහ ලේකම්වරියයි. මේ මණ්ඩලයේ 17 වැනි මහා සමුලුව 1974 දී නයිරෝබි නගරයේදී පැවැත්විණි. මම එයට සහභාගි වීමි. 18 වැනි සමුලුව මේ මස 18 ද (එක්දහස් නවසිය හැත්තෑ හයේ ජූලි මස) මෙම නගරයේ මහා සම්මන්ත්‍රණ ශාලාවේදී දෙදහක් පමණ නියෝජිත පිරිසකගේ සහභාගිත්වයෙන් පැවැත්වේ.

එම සමුලුවට අවශ්‍ය ප්‍රධාන නිබන්ධනය "සම අවස්ථා සඳහා අරගලය" යන මැයින් සකස් කිරීම මා ඇතුළු මෙහි කලින් පැමිණි නව දෙනාගේ කාර්යය විය.

මේ පූර්ව සම්මේලන කමිටුවට ඕස්ට්‍රේලියාව, කැනඩාව, ඝානා, සැම්බියා, ඇමරිකාව, කොස්ටරිකා සහ මැක්සිකෝව යන රටවලින් මහාචාර්යවරුන්ද, ඔස්ට්‍රියාව හා ඉතාලියෙන් මහාචාර්යවරියන් දෙදෙනෙක්ද මා සමඟ ඇතුළත් වෙති. ඔවුන් සැමදෙනාම අවංක බවත්, මට වඩා දක්ෂ බවත් මම පිළිගනිමි. එහෙත් බෞද්ධ දර්ශනයේ පසුබිම ඔවුන් තුළ නැති නිසා ප්‍රශ්නවල මතුපිට පමණක් අතගාන හැටි දුටුවාම, මට අනුකම්පා සිතේ. බාහිර ලෝකය පිළිබඳව නම්, ඔවුන්ගේ සාකච්ඡාවලින් මට හුහක් ඉගෙන ගැනීමට දේ තිබේ.

පුවටෝරිකෝ

පුවටෝරිකෝ දිවයිනේ තිස් ලක්ෂයක් පමණ ජනතාව වාසය කරති. මොවුන් කතා කරන්නේ ස්පාඤ්ඤ භාෂාවයි. මෙය ඇමරිකා එක්සත් ජනපදයට අයත් ප්‍රාන්තයකි. ඒ නිසාම මෙහි සම්පත්වලින් වැඩි හරියක් ඇමරිකානුවන්ට අයත් වේ. රැකියා සොයා මේ රටේ ස්වදේශිකයන් දස ලක්ෂයක් පමණ ඇමරිකාවට ගොස් තිබේ. ඇමරිකානුවන් දස ලක්ෂයක් පමණ ඒ වෙනුවට මෙහි ව්‍යාපාරවල යෙදී සිටින බව ඇසීමි. පුවටෝරිකෝව ඇමරිකන් ආර්ථික ආධිපත්‍යය පිළිබඳ හොඳ උදාහරණයකි.

මෙහි තිබෙන්නේ බාහිර ආටෝපයට පමණක් සීමා වූ හිස් ජීවන රටාවක් බව බැලූ බැල්මටම පෙනේ. සාමාන්‍ය මෝටර් රිය වෙනුවට වඩා තිබෙන්නේ බාග ලොරි තරම් විශාල වූ සුඛෝපභෝගී මෝටර් රථය. මෙම විශ්ව විද්‍යාලයයේ ශිෂ්‍යයින් උනන්දුවෙන් පොත පත හදරනු පෙනේ. එහෙත් ඔවුන්ගේ ඇඳුම් පැළඳුම් හා කාම සුබල්ලිකානුයෝගයට බරවුනු හැසිරීම් රටාවන්, ප්‍රසිද්ධියේ ඔවුනොවුන් සිප වැළඳගෙන කරන අනඟ රැඟුම් ආදිය දකින විට ඔවුන් යම් පුහුණුවක් ලබන නමුත්, අධ්‍යාපනයක් ලබන බවක් නම් නොපෙනේ.

මේ දිවයින සොබා දහමේ දයාදය ලැබූ තැනක් බව නම් කිව යුතුය. හැම පැත්තෙන්ම කොළ පාට වෘක්ෂලතා දිස් වේ. අඹ, දෙඹ, සියඹලා, පොල් ආදී විශාල ගස් කොළන් දකින විට මගේ මනරම් මව්බිමේ සිරියාව මට මතක් වේ.

ඝානාවේ විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අංශයේ ප්‍රධානියා වූ මහාචාර්ය ජොන්සන් සමඟ සවස ආහාරය ගැනීමට කැන්ටිමට ගියෙමි. එහෙත් එහි තිබුණේ දවල් ගත් ආහාර වර්ග ම නිසා, අපි නගරයට ඇවිදගෙන යාමට තීරණය කළෙමු. මේ විශ්ව විද්‍යාලයේ ඉගෙනීමට එන ශිෂ්‍යයින්ගේ විශාල කාර් සිය ගණනක් පසු කොට අපි මහ පාර දෙසට ගියෙමු.

රැකියා නොමැතිකම වාසියකි

මෙහි අධ්‍යාපනය ලබන අයට අධ්‍යාපනය කෙළවර රැකියා ලැබෙනවාදැයි අපි ඉංග්‍රිසි කතා කරන මහතකුගෙන් ඇසීමු. ඔහු කීවේ රැකියා හිඟයක් විශාල වශයෙන් තිබෙන බවත්, එහෙත් බොහෝ දෙනා රැකියා ලබා ගැනීමට නොවෙහෙසෙන බවත්ය. මීට හේතුව රැකියාවක් කරන අයගේ ප්‍රමාණයටම කිට්ටු ආදායමක්

ලැබීමට රැකියා විරහිත අයට ද රජයෙන් සහන ගෙවීමක් කිරීමයි. ඉගෙන ගන්නා කාලයේ දී මසකට අධ්‍යාපනය සඳහා ඩොලර් 200 ක් පමණද, ආහාරවලට තවත් මසකට ඩොලර් 200 ක්ද ඔවුන්ට ලැබේ. පසුව ඔවුන්ට ඩොලර් 800 ක රැකියාවකට සුදුසුකම් තිබේ නම්, ඩොලර් 600 ක් විතර රැකියා විරහිතයිනට දෙන සහන දීමනාවක් ලැබේ. රැකියා කරන අය මෙයින් ඩොලර් 150 ක් විතර අය බදු වශයෙන් ගෙවිය යුතු අතර රැකියා නොකරන අය බදු ගෙවිය යුතු නැත. මේ නිසා බොහෝ දෙනා රැකියා ගැන නොතකා රජයෙන් දෙන දෙයින් කා බී විනෝද වෙති.

අපි විශ්ව විද්‍යාල භූමියෙන් පිට වී මහ පාරේ පදික වේදිකාව දිගේ ගමන් කළෙමු. කිට් කිට්යේ ඇඟට තදවෙන අශෝභන ඇඳුම් ඇඳ ගත් ගැහැනුන් සහ බීමත්කමින් කෑ ගසමින් යන මිනිසුන් තිදෙනෙක් අපට මුණ ගැසුණහ. චීන හෝටලයට ගොඩ වූ අපි සුප් එකක් බී, එළවලු සහිත බත් පිඟානක් කා ඩොලර් 10 ක් ගෙවා ආපසු ආවෙමු.

අපේ නේවාසික කාමර තිබෙන්නේ දෙවැනි මාලයේය. විදුලි සෝපානයෙන් එයට යා යුතුය. සෝපානය ඉදිරිපිට කවුන්ටරය පිටුපස සිටින්නේ අපේ අම්මලාගේ වයසට අයත් සිරියාවන්ත කාන්තාවකි. උසට ගැලපෙන මහතින් යුත් ඕ නිතරම ලා පාටකින් යුත් දිග ගවුමක් ඇඳ උපැස් යුවළක් පැළැඳ සිටින්නීය. නිතරම සිනහ වී, ස්පාඤ්ඤ භාෂාවෙන් මොනවා දේ අපට කියන ඇය දකින හැම මොහොතේම අපේ බුදු නැන්දා මට මතක් වෙයි. මේ කාන්තාව හා කතා කිරීමට ස්පාඤ්ඤ භාෂාව නොදැනීම ගැන මම කණගාටු වෙමි.

මාතෘත්වය

ඊයේ රාත්‍රි නවය වනතුරුම අපි අපේ සාකච්ඡාව ගෙන ගියෙමු. *"සමානත්වය සඳහා අරගලය"* යන මැයින් අප විසින් සූදානම් කළ යුතු නිබන්ධනයේ අවසාන කොටස ඊයේ කෙසේ හෝ නිම කළ යුතු විය. මේ දිනවල පුවටෝරිකෝවල උදේ පහ වන විට ඉර පායන අතර, සන්ධ්‍යාවේ අට පමණ වන තෙක් දිවා කාලය පවතියි.

වැඩිහිටි උපස්ථානය

වයසට ගිය විට දෙමාපිය වැඩිහිටියන් මහලු මඩම්වලට නො යවා, දරු මල්ලන් විසින් සතුටින් රැක බලා ගැනීම යන පැරණි සංස්කෘතික වටිනාකම විනාශ නො වී ආරක්ෂා කිරීම, සමාජ ශුභ සාධන සේවයේ යෙදී සිටින්නන්ගේ යුතුකමක් බව මම ප්‍රකාශ කළෙමි.

මේ අදහස නිබන්ධනයට ඇතුලු කිරීමට කිසිවෙක් සතුටු නොවූහ. එහෙත් මගේ බල කිරීම නිසා වැඩිහිටියන්ට ගරු කිරීම යන කොටස ඇතුලු කිරීමට මේ උගත්හු කැමති වූහ.

කාන්තාවන්ගේ ශුභ සාධනය යන කොටසට "මාතෘ" යන වචනය ඇතුලු කිරීමට යෑමේදීද මෙවැනිම විරුද්ධත්වයක් ඇති විය. සමාජයක දරුවන්ට ආධ්‍යාත්මික හා සංස්කෘතික වටිනාකම් කෙරෙහි සැලකිල්ලක් දක්වීමට උගැන්වීමේ මූලික සේවය මවගෙන් ඉටුවිය යුතු බවත්, ලෝකයේ පැවැත්මට වනිතාවන්ගේ ආත්ම ගෞරවය රැක දීම වැදගත් බවත්, මා ප්‍රකාශ කළ විට එයට මුලින්ම විරුද්ධ වූයේ ඉතාලියෙන් පැමිණ සිටි මැදවිය පසු කරමින් සිටින ආනා මරියාය. "මව" යන වචනය ඇතුලු කිරීමට ඇය කිසිසේත් අකැමැති බව තරයේ ම කියා සිටියාය. අපේ සංස්කෘතියේ මව බුදුන්ට සමාන බව පැවැසූ මම, අද පොහොසත් රටවල කඩාකප්පල් වූ පවුල් දෙස බලන විට, ඒ තත්වය අපේ රටවල ඇතිවීමට ඉඩ නොදිය හැකි බව පළ කළෙමි. සාමාන්‍යයෙන් සිහින් ස්වරයෙන් කතා කරන මා, ටිකක් හඬනඟා කතා කරන විට, මෙය ඇතුලු කිරීමට ඔවුහු එකඟ වූහ.

රූප රැජින තරගයක්

ඒයේ උදේ මම කිරිකෝපි කෝප්පයකින් පමණක් රැකුණෙමි. දවල් සාන්ත ආනා නම් හෝටලයට අත් අය සමඟ ගොස් බත් කෝප්පයක්, අප්‍රියෙන් මාලුවක් සමඟ කැවෙමි. ඒයේ රාත්‍රියේ කිරි ක්වාට් එකක් පමණක් බී කුස ගිනි නිවා ගතිමි. අනිකුත් අය ආහාර ගැනීමට නගරයට ගිය අතර, මහාචාර්ය කාලෝස් මා සමඟ නිවහනේ ඉතිරි විය. එක්දහස් නමසිය හැත්තෑහයේ වසරේ ලෝක රූප රාජිනී තරඟය හොංකොංවල සිට රූපවාහිනියෙන් පෙන්වන නිසා, එය බැලීමට රූපවාහිනී කාමරයට හෙතෙම මා අඬගසා ගෙන ගියේය.

ශ්‍රී ලංකාව ඇතුලු රටවල් 72 ක තරුණ තරුණියෝ හොංකොංවල පැවැති මේ ව්‍යාපාරික විකාරයට පැමිණ තරග කළහ. මහා ව්‍යාපාරිකයෝ, චිත්‍රපටි නිෂ්පාදකයෝ, නලු නිළියෝ පිරිසක් විනිශ්චයකාරයන් වශයෙන් ක්‍රියා කළහ. මුලින්ම ඒ ඒ රටවල තරුණියන් තනි තනිව පැමිණ තම නම කියා, තම මව්බසින් හා ඉංගිරිසියෙන් කතා කොට හඳුන්වා දෙනු ඇති බව තරගය මෙහෙය වූ ප්‍රකාශකයා පැවැසීය.

ශ්‍රී ලංකාවේ තරුණිය එන තුරු මම නො ඉවසිල්ලෙන් බලා සිටියෙමි. මා බලාපොරොත්තු වූයේ ලස්සන උඩරට සාරියක් ඇඳගත් සිංහල කෙල්ලක් අවුත් දෑත් එකතුකොට "ආයුබෝවන්" කියා පසුව ඉංග්‍රිරිසියෙන් තමා හඳුන්වා දෙනු ඇත කියාය. අපේ රටකට ගිය කල! මොකක්දෝ තුප්පහි ඇඳුමක් ඇඳගත් ඉංගිරිසි නමක් තිබුණ තරුණියක් පැමිණ, "හලෝ, ලේඩීස් ඇන්ඩ් ජෙන්ටල්මන්" යනුවෙන් කතා කොට ඉවත්ව යන විට මා තුළ ඇති වූයේ බලවත් කෝපයකි. ඇය විදේශිකයකු බවත්, අපේ සංස්කෘතියට ඇය අයත් නැති බවත්, මා ළඟ සිටි මහාචාර්යවරයාට මම පැවැසුවෙමි. අපේ හැදිච්ච ලස්සන සිංහල, දෙමළ කෙල්ලන් මේ වගේ අනඟ රූගුම්වලට නො පැමිණෙන බව ද මම කීමි.

නාන ඇඳුමින්, සන්ධ්‍යා ඇඳුමින් ආදී වශයෙන් ඇඳ පැළඳගෙන ආ මේ තරුණියන් අතරින් පළමු තැනට ඊශ්‍රායලයෙන් පැමිණි කාන්තාවත්, දෙවැනි තැනට දකුණු ඇමරිකාවේ වෙනිසුලාවෙන් පැමිණි කාන්තාවත් තේරිණි. ශ්‍රී ලංකාවේ නම පාවිච්චි වන නිසා මෙවැනි ජාත්‍යන්තර තරගවලට සහභාගිවීමේ දී අපේ සංස්කෘතික වටිනාකම් නොකෙළෙසා, ඒවාට සහභාගිවීමට අපේ තරුණියන්ට ඉඩ දුන්නාට කමෙක් නැත. මේ පිළිබඳව රජය සැලකිලිමත් වී සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් යම් අවම නීති රීති පැනවිය යුතුය.

රූපවාහිනිය නරඹා සෝපානයෙන් ඉහළට නැග, නිදන කාමරයට වුත්, තවත් කිරි වීදුරුවක් බී, දොඩම් ගෙඩියක් ද කෑවෙමි. දැන් රාත්‍රී 12.30 විය. හෙට උදේ අපි මෙතැනින් පිට වී අපේ මහ සමුලුව පැවැත්වෙන කොන්රාඩෝ බීච් හෝටලයට යා යුතු වෙමු. මේ අතර රෙදි සෝදන මැෂිමේ දමා මගේ කිළිටි ඇඳුම් සෝදා ගැනීමට අදහස් කළෙමි. මෙක්සිකෝවෙන් පැමිණ සිටින මහාචාර්ය සැල්වඩෝර්ගේ උදව් ඇතිව ඇඳුම් සෝදා ගතිමි. යන්ත්‍රය තුළට ඇඳුම් දමා සත දහයක් කට්ටයක් තුළින් ඇතුලු කළ විට යන්ත්‍රය ක්‍රියා කරන්නට පටන් ගනී. මිනිත්තු විස්සකින් රෙදි සේදී වියළී සූදනම් වෙයි. ඊට පසු ළඟ තිබෙන විදුලි ඉස්ත්‍රික්කය ගෙන ඇඳුම් ටික මැද ගතිමි. මා ඊයේ රෑ නින්දට යන විට දෙකට පමණ ඇත. අද උදේ ඇහැරුණේ පහමාරටය. උණු වතුර නා, ඉතිරි වූ කිරි ටික බී, අවසන් දොඩම් ගෙඩියත් අනුභව කොට මෙතැනින් ඉවත් ව යෑමට ඇඳ ගතිමි.

මෙහි ගත කළ රාත්‍රී පහට අමෙරිකානු ඩොලර්ස් 75 ක් ගෙවා, කුලී රියක් ගෙන්වා ගෙන අපේ සමුලුව පැවැත්වෙන ශාලාව තිබෙන

කොන්රාඩෝ බීච් හෝටලයට පැමිණියෙමි. එහි අටවන තට්ටුවේ අංක 849 දරණ කාමරය මට වෙන්කර තිබිණි. මගේ ඇඳුම් බෑගය කාමරයේ තබා වටපිට දැක බලා ගැනීමට නැවත පහළට ගියෙමි.

පුවටෝරිකෝවේ සිට බන්දුල මල්ලී බාරේ මෙත් මැදුර පවුල් හමුවට පින්තූර තැපැල් පතක් තැපැල් කළෙමි. මේ කවි ඒ තැපැල් පතේ ලීවෙමි.

අත්ලන්තික් සමුදුර මැද දීපෙක
කල් ගෙවමින් පැටලී සංවාදෙක
මා ඇති මුත් මෙත් මැදුරේ වාදක
ගී හඬ ඇසෙනව දහසක් වාරෙක

තනිවයි දවසෙන් වැඩිය ගෙවන්නේ
දින දෙකකට එක වේලයි කන්නේ
අටවැනි මහලෙයි මා නිදි යන්නේ
බැලූ බැලූ තැන හිස් බව රජයන්නේ

මා මගෙ බව නැති වී ලොව බෝවා
සේවය කැරුමට ඔබ කැප වේවා
මුලුතැන් ගෙයි හැළි හිස් නොම වේවා
සර්වෝදය පවුලට ජය වේවා

11

හිතේ බර සැහැල්ලු වෙයි

රූපවාහිනියේ සිංහලෙන්

දැන් මා මේ හෝටලයට වුත් දින දෙළහකි. මෙහි බොහෝ දෙනෙක් දැන් මා හඳුනති. බොහෝ අවස්ථාවල ශ්‍රී ලංකාව, හෙවත් සිලෝන් (ඔවුන් කියන්නේ සයිලාන්) තිබෙන්නේ කොහේද කියා මට සිතියමකින් පෙන්වා දෙන්ට සිදුවේ. ඊයේ රාත්‍රී හිටිහැටියේ ඊශ්‍රායලයෙන් පැමිණි මහාචාර්ය සයිමන් බර්ග්මනුත්, ඇමරිකාවේ මහාචාර්යවරයකු වූ ලෝරින්, මැක්සිකෝ ජාතික තරුණියන් දෙදෙනෙකුත්, මමත් මේ සමුලුවේ විධායක ලේකම් මහාචාර්ය පෙලිසිඩාස් ආර්. කැටලා මැතිනිය විසින් රූපවාහිනී මධ්‍යස්ථානයට කැඳවාගෙන යනු ලැබුවෙමු. 'එන්කවුන්ටර්' නැමැති වැඩ සටහනට පැයක් පමණ අපි සහභාගි වීමු. ස්පාඤ්ඤ භාෂාවෙන් පැවැති එම සංවාදයට සිංහලෙන් සහ ඉංග්‍රීසියෙන් කතා කරන්නට මට සිදුවිය. මා කී දේ ස්පාඤ්ඤ භාෂාවට අන් අය පරිවර්තනය කළහ. ලාංකිකයෙක් පෝටෝරිකෝවල රූපවාහිනියේ පෙනී සිටි එමෙන්ම සිංහල භාෂාව කතා කළ ප්‍රථම වාරය එය බව ඔව්හු කීහ. සිතියමකින් ශ්‍රී ලංකාව පිහිටා තිබෙන තැන ද පෙන්වීමි.

ජන ශක්තිය

දහඅට වැනිදා රාත්‍රී මේ රටේ ආණ්ඩුකාරවරයා අතින් සමුලුව විවෘත විය. දෙදහක් පමණ නියෝජිතයෝ පැමිණ සිටියහ. සමුලුවට පෙර අප විසින් සකස් කර තිබුණ නිබන්ධනයේ සාරය මහාචාර්ය ග්‍රාන්ට් ජොන්සන් විසින් ඉදිරිපත් කරන ලදී. හැමදාම එක් මහා සභාවකුත්, ඉන් ඉක්බිති ව විවිධ මාතෘකා යටතේ සාකච්ඡාද පැවැත්වෙයි. මට හිතට ඇල්ලූ එකම දේශනය ජැමෙයිකාවල සිට පැමිණි මහාචාර්ය රෙක්ස් කෙට්ල්පෝඩ් නැමැති තරුණ කථිකයාගේ දේශනයයි.

අධිරාජ්‍යවාදී හාම්පුතාලා විසින් ඇති කළ අසමානත්වය, ක්‍රිස්තියානි පල්ලිවල ආශීර්වාදයද ලැබ ලොව පුරා පැතිර ගිය හැටි ඔහු

ලස්සනට විස්තර කළේය. ඇඩම් ස්මිත් දුන් ධනවාදී දර්ශනයත්, කාල් මාක්ස්ගේ සමාජවාදී දර්ශනයත් යන දෙකම යුරෝපය නිජ බිම කර ගත් 'සුදු දර්ශන' බවත්, මේවායින් උසස් සංස්කෘතීන් තිබුණු දුප්පත් රටවලට ගැලවීමක් නො ලැබෙන බවත්, ඔහු ප්‍රකාශ කළේය. යායුතු එකම මග පොදු මහජනතාව අතට කෙලින්ම බලය ලැබෙන සේ අපේම සංස්කෘතීන් මත ජනතා මට්ටමෙන් සංවිධානයවීම බව ඔහු ප්‍රකාශ කළේය. ඔහුගේ දෙසුම අවසන මිනිත්තු දහයකට අධික වේලාවක් දෙසුම් හලෙන් ඔල්වර හඬ නැගිණි.

මගේ දෙසුම තිබුණේ ඊයේ සවසය. "අධ්‍යාපනය සමාන අවස්ථාවලට මගක්" යන මාතෘකාවයි මට තිබුණේ. මා සමග කතා කිරීමට සිටි අනිත් කථිකයා, සූඩාන්වල සමාජ ශුභසාධන ඇමති ආචාර්ය පැට්මා මහමුඩ් නැමැති කාන්තාවකි. මා, මට දී තිබුණු මැය අනුව දෙසුම නිම කළ පසු, ඕ කලින් සූදානම් කරගත් එම මාතෘකාවට කිසිසේත් සම්බන්ධයක් නැති ආර්ථික සම්බන්ධතාව ගැන කථාවක් කළාය. මේ නිසා මගෙන් ඇසූ එක ප්‍රශ්නයකට සර්වෝදය ගැන කෙටියෙන් හැඳින්වීමක් කිරීම හැර, වෙන කිසිවක් කරන්නට මට නො හැකි විය. ඊළඟට ප්‍රශ්න ඇසීමට අවස්ථාව දී මා වාඩිවී මිනිත්තුවක් යන්නටත් පෙර, ඇය වෙන ප්‍රශ්න නැති නිසා සභාව ඉවරයි කියා හිටි හැටියේ රැස්වීම හමාර කළා ය. මේ මෝඩ අම්මන්ඩී නිසා මිනිත්තු 45 ක අගනා කාලයක් අපතේ ගියේය.

පෙරේදා රාත්‍රී පැට් රයිස් නම් මහතකුගේ නිවසට අපි රාත්‍රී භෝජනයට කැඳවා ගෙන යනු ලැබුවෙමු. සෙරමික්වලින් හදපු ගෙම්බෙක් ඔවුන් මට තෑගි දුන් අතර, සිංහ කොඩියක් මම ආපසු තෑගි දුනිමි.

දැන් මා මෙහි ගත කරන්නේ යාන්ත්‍රික ජීවිතයකි. උදේ හයට විතර නැගිටිමි. වතුර නා, ළඟ කඩයකට ගොස් උදේ තේ බොමි. ඊළඟට සමුලුවට ගොස් එකට පමණ නැවත චීන හෝටලයකට ගොස් මොනවා හෝ කමි. නැවත සමුලුවට සහභාගි වී, රෑ කෑම කා නිදා ගනිමි. හිතුනොත් දිගටම මොනවත් නොකා හිඳිමි.

පසුගිය ඉරිදා මගේ කාමරයට තවත් අලුත් මිත්‍රයෙක් ආවේය. ඔහු ශ්‍රී ලංකා සමාජ සේවා විදුහලේ වැඩ බලන විදුහල්පති ඩඩ්ලි දිසානායක සොහොයුරායි. ඔහු කුඩා කළ සිට මම හඳුනමි. මේ සමුලුවට කලින් සතියේ පැවැති සමාජ සේවා විදුහල්වල සමුලුවට ඔහු ලංකාව වෙනුවෙන් පැමිණ සිටියේය. කේට් කැට්ස්කි මැතිනියට කියා ඩොලර් 200 ක් ඔහුට

ලබා දී, මේ සමුලුවට ඔහුත් රඳවා ගතිමි. ඒ නිසා දැන් මට එතරම් පාලුවක් නැත.

මට නයිරෝබි සමුලුවේ දී හමුවුණු රොබට් බර්ගස් නැමැති ඇමරිකානු ජාතික ක්වේකර් සංවිධානයට අයත් මහතා, මට මෙහිදී නැවත හමුවීම ලොකු ප්‍රීතියකි. නයිරෝබිවලදී ගත් මගේ පින්තූරයක් ද රැගෙන ඔහු පැමිණ සිටියේය. මගේ දුම්පානය නැවැත්වීමට ඔහු එහිදී මෙන්ම මෙහිදීද ලොකු ප්‍රයත්නයක් දරයි.

මගේ හිතට ලොකු සැහැල්ලුවක් දැනේ. ගෙදරින් ලියුම් කිහිපයක්ම ලැබීම, වර්ණසේන රාසපුත්‍රම් සොයුරා දෙවරක් ම වොෂින්ටනයේ සිට ටැලිපෝනයෙන් කතා කිරීම, මේ ස්ථානයට පුරුදුවීම, ඩඩ්ලි මා සමඟ සිටීම, මගේ දෙසුම නිමවීම ආදී කරුණු ඊට හේතු වන්නට ඇතැයි සිතමි.

ලිවීම තාවකාලිකව නවත්වා ලිපියක් තැපැල් කරන්නට වීදිය දිගේ ගියෙමි. මග දිගට කිහිපදෙනෙක්ම මා හඳුනාගෙන ඊයේ රෑ රූපවාහිනියේ දුටු බව කියා මගේ අදහස්වලට ප්‍රශංසා කොට සුබ පැතූහ.

සවස ඕස්ට්‍රේලියානු කමිටුවේ ඩේවිඩ් ස්කොට්ගේ ප්‍රධානත්වයෙන් පැවැති පිළිගැනීමකට සහභාගි වීමි. රාත්‍රී 'ගෝල්ඩ් කොයින්' නම් චීන හෝටලයේ, හොංකොං කමිටුව විසින් පැවැත්වුණු රාත්‍රී ආහාරයට ආරාධනා ලැබ ගියෙමි. පනහක් පමණ ආරාධනා ලැබ පැමිණ සිටි අතර මේ කමිටුව විසින් මුලු හෝටලයම කුලියට ගෙන තිබුණු ආකාරයක් පෙනිණි. පළමුවෙන්ම මත් පැන් සහිත බීමවලින් සංග්‍රහයක් පැවැත්විණි. හැමොම හොඳටම කෑ බව නම් පෙනිණි. මමත් මස් හැර සෙසු ආහාර බඩ පිරෙන්නට කෑවෙමි. අදට ගත් එකම අහර මෙයයි. එහෙත් දස ලක්ෂ ගණන් බඩගින්නේ ලොව පුරා සිටිද්දී ලොවැ හතර වටින් පැමිණි සමාජ ශුභ සාධන සේවකයන්ට මෙසේ සුඛෝපභෝගී ආහාරපාන සංග්‍රහ පැවැත්වීම සුදුසුද?

අද පස්වරුවේ පුවටෝරිකෝවලට ආයුබෝවන් කියා වොෂින්ටන් බලා පිටත් වෙමි. හෝටලයට නිදා ගත්තාට පමණක් ඩොලර් 415 කුත් ශත 45 ක් ගෙව්වෙමි. කෑම බීමවලට, ලියුම්වලට, දුරකථන ගාස්තුවලට ගිය මුදලත් බලන විට, මෙහි සිටි සති තුනට ඩොලර් 750 කට කිට්ටුව වියදම්වන්නට ඇත. මේ සමුලුවේ අමුත්තෙකු ලෙස මා පැමිණි නිසා සියලු වියදම් ජාත්‍යන්තර සමාජ ශුභ සාධක මණ්ඩලය විසින් ගෙවන ලදී. මේ

මුදල රුපියල්වලින් බැලීමට දහතුනෙන් වැඩි කළ යුතුය. එවිට මෙහි ජීවන වියදම කොතරම් අධික දැයි වැටහේ.

මේ සමුලුව ගැන සමාලෝචනයක් කිරීමට මට දන් වේලාවක් නැත. එහෙත් හුඟක් අලුත් මිතුරන් ඇති කර ගතිමි. සෑහෙන පිරිසකට සර්වෝදය හඳුන්වා දිනිමි. **ICSW** ආයතනය ගැන අවබෝධයක් ලබා ගතිමි. එයට අමතරව ලෝකයේ නොයෙක් තැන්වල කෙරෙන සමාජ ශුභසාධක කටයුතු පිළිබඳ දැනීම පුලුල් කර ගතිමි.

ඊයේ ඇතිවුනු සුලු බඩේ අමාරුවක් හැරුණු විට, මම හොඳ සුවෙන් පසුවෙමි. ඩඩ්ලි පැමිණියාට පසු තනිකම අඩු විය. ඔහුත්, අද නිව්යෝක් - ලන්ඩන් හරහා ආපසු ගමන අරඹයි. මාගේ ඉතිරි ගමන් සටහන තීරණය කරන්නේ වොෂින්ටන්වලට ගියාට පසුවයි.

මෙහි දී මට මා නිතරම විශ්වාස කළ සිද්ධාන්තයක් තවත් ප්‍රත්‍යක්ෂ විය. එනම්, ජීවිත දර්ශනයක් ඇති ව මිනිස් සංහතියේ යහපත සහ තමාගේ ආත්ම පාරිශුද්ධිය අරමුණු කරගත් කෙනෙකුට විවේකය කියා දෙයක් නැති බවයි. විවේකය යනු කකා බිබී නිදගෙන නිකම් ඉඳීම නම් එයින් මට නම් කිසිම සිතට හෝ ගතට හෝ සුවයක් නම් නො ලැබේ. නිකම් ඉඳීම මහා වදයෙකි.

මා මෙහි ගත කළ කාලයෙන් වැඩි හරියක් ගෙවුනේ නිකම් ඉඳීමෙනි. අනුන් කරන කියන දේ දැක බලා ගෙන සිටි මට කිසිම වගකීමක් නො තිබුණේය. මේ නිසා කිසිවෙකු හෝ කිසිවක් හෝ කෙරෙහි මට විශේෂ උනන්දුවක් නො තිබුණේය. මගේ හිතත්, කල්පනාවත් නිතරම තිබුණේ සර්වෝදය ශ්‍රමදාන පවුල හා නීතා, දරුවන් හා ගෙදර ඇත්තන් ළඟය. මා පමණක් ප්‍රධාන තාරකාව හැටියට ක්‍රියා කරන තැනකට වුත්, අපේ දහම බෙදා දෙනු හැර මෙවැනි සමුලුවලට පැමිණීම කාලය කා දැමීමක් බව, මා කියන්නේ මගේ ලොකු කමක් හිතට ගෙන නොවේ. මටත් වැඩකට ඇති වැඩ කරන්ට ඕනෑ තරම් පහසුකම් අප ව්‍යාපාරය තුළම තිබෙන නිසාය.

මෙහි පැමිණීමෙන් එකක් සිදු විය. එනම්, මා රටින් පිටවෙද්දී තිබුණු සිත් වේදනාව තුනී වී යෑමයි. ඈත සිට ප්‍රශ්න දෙස බැලීමේ අගය මෙයින් පෙනේ. අඩුවෙන් ප්‍රශ්න ගැන කතා කොට වැඩියෙන් නිශ්ශබ්දව නිර්මාණාත්මක වැඩවල යෙදීම වැදගත්ය. මා උසුලන නිලය නිසාත්, පාලක වගකීම් නිසාත්, කතා නොකර වැඩ කිරීම අපහසු වුවත්, දැන් සිට වත් ඒ ගැන මහන්සි ගත යුතුය.

එක් අතකින් සති තුනක් තිස්සේ මෙතැනට මම නේවාසිකයෙක් වීමි. පෘථග්ජනකම නිසා මෙතැන අත හැර අලුත් තැනකට යෑම දුකෙකි. අනික් අතින් මේ මගේ නිජබිම නොවේ. මා අයත් සංස්කෘතිය, මගේ ඇත්තන්, මා උපන්, මා ජීවත්වෙන, මා මැරෙන, පස් වෙන, මගේ ජන්ම භූමියට මා යායුතුය. ඒ මගේ ක්ෂේම භූමියයි. මගේ දිව්‍ය ලෝකයයි.

මැද්දෙකන්දේ මා ජීවත්වන කලෑ මට විදු නැණ පැදු වීර සිරිවර්ධන මැති මැතිනියන් සිහි වී ඔවුනට මේ කවි තුන ගුවන් තොටුපළේදී තැපැල් පතක ලියා හැරියෙමි.

ලොවැ වැඩුමට බුදුහිමි දෙසු සැටියෙන්
සර්වෝදය අප යන මග කෙටියෙන්
පස්මහ දිවයින පතුරන අටියෙන්
යන තැනැ ඔබ මගෙ මනැසින් දිටියෙන්

අත්ලන්තික් සයුරෙන් ඇති වටවී
පෝටොරිකෝ දූපතෙ සිට තනිවී
මැද කඳු කලැ නැණ දුන් ඔබ සිහිවී
හර සරයෙන් මෙයැ මා'තින් ලියැවී

නැණ දන සවි බල අඩු නොමවේවා
සුවයෙන් ගිය ගිය තැනැ සැනැසේවා
තෙරුවන් සරණින් ඔබ සැනැපේවා
විරු සිරි වඩු පවුල ම සැරදේවා

දැන් මා සැන්වාන් සිට වොෂින්ටන් බලා පිටත්වෙන ගුවන් යානය තුළය. තව මොහොතකින් ඇමරිකන් එයාර්ලයින් සමාගමට අයත් මේ යානය වොෂින්ටන් බලා ගුවන් ගනී. මෙය බොයිං 707 වර්ගයේ ජෙට් යානයකි. මේ ගුවන් තොටුපල තරම් කරදර ගුවන් තොටුපලක් මම මෙතෙක් නොදුටිමි. මුලින්ම ඇමරිකාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නීති අනුව, යම් පැලෑටියක් මගීන් විසින් ගෙන යා දැයි බැලීමට අප ළඟ තිබෙන බෑගයන් විවෘත කළ යුතුය. මේ සඳහා සියයක් දෙනා එක වර පොර කති. ඊළඟට පරීක්ෂා කළ බවට ලේබලය අලවා ගෙන තව තැනකට බෑග් බාර දිය යුතුය. තවත් තැනක ආසන අංකය දෙයි. තවත් තැනක නැවත අත් බෑග පරීක්ෂා කරන්නේ අවි ආයුධ රැගෙන යනවා දැ යි පිරික්සීමටයි. මේ ව්‍යායාමයට පැයක් පමණ

ගත වේ. ඊයේ සිට බඩේ අමාරුව නිසා කෝපි කෝප්පයකින් පමණක් සෑනැසී සිටින මට ඇඟට පණ නැති වී ගෙනත් ආවේය. ඩඩ්ලි ද මට පැයකට කලින් වෙනත් යානයකින් නිව්යෝක් බලා පිටත් විය.

ගුවන් යානයට නැගීමට අවසර දෙන තුරු රැඳී සිටි සාලයේදී ජපන් රටින් ආ සමාජ සේවකයන් පිරිසක් සමඟ මම කතාවට වැටුණෙමි. එයින් එක් අයෙක් සමුලුවේ දී මා හඳුනාගෙන සිටි අයෙකි. ඔහු මා ගැනත් ව්‍යාපාරය ගැනත් අන් අයට ජපන් භාෂාවෙන් විස්තරයක් කළේය. එවිට එහි සිටි එක් ජපන් මහතෙක් ශ්‍රී ලංකාවට අප ආහාර ආනයනය කරනවා දැයි ඇසුවේය. අපේ අවශ්‍යතාවලින් බාගයකට කිට්ටු වෙන්ට ආනයනය කරන බව මා පැවැසූ විටම ඔහු කීවේ, අහරින් ස්වයංපෝෂිතවීම සංවර්ධනයේ පළමු පියවර බවත්, කෘෂිකාර්මික කළමනාකාරිත්වය අතිශයින්ම වැදගත් දියුණු කළයුතු විෂයයක් බවත්ය. රජයත් අපත් මේ අංශයෙන් දරණ ප්‍රයත්නය ගැන මා විස්තර කරන අතර, ගුවන්යානයට ඇතුලුවීමට අපට සංඥාව ලැබුණේය.

යානය ගුවන් ගන්නා තැනට වුත් මිනිත්තු පහළොවක් සිටියේය. ඒ ටිකට ගුවන්යානා හයක් ගොඩ බෑ අතර, හතරක් පමණ ගුවන් ගත විය. හතරයි හතළිස්පහට අපි ගුවන් ගත වීමු. දැන් අපි පුවටෝරිකෝ දෙස ගුවනින් බලමින් වලාකුලු අතරින් අඩි විසි දහසකට ඉහළ පියාසර කරමු. තැනින් තැන තිබෙන වලාකුලුත්, ලා නිල්වන් මුහුදත් පමණකි, දැන් පෙනෙන්නේ.

12
මැද කඳු සිරිය

දකින කවුරුත් මා හා මිත්‍රවීමට පෙළඹවීමේ වාසනාව මා තුළ ඇති බවත්, තමා ද ඉතා ඉක්මණින් ඕනෑම කෙනෙකු ගැන පැහැදෙන බවත්, ඒ වාගේම හිටි හැටියේ ක්ෂණිකව එම මිතු දම කඩා දැමීමත් මගේ චරිත ලක්ෂණයක් බවත් මැද්දෙකන්දේ බෞද්ධ මිශ්‍ර පාඨශාලාවේ අධිපති මගේ ආචාර්ය එස්. ඒ. ද අල්විස් වීරසිරිවර්ධන මහතා මගේ කේන්දරය බලා ලියා තැබුවේ මා මැද්දෙකන්දට ගිය අලුතදීමය.

පානදුර රත්නපුර බලංගොඩ හරහා තාත්තා සමඟ මා මැද්දෙකන්දට ආවේ සිහිනයකින් මෙනි. ඒ 1940 මුල් කාර්තුවේය. හිමිදිරි උදයේ උණවටුනේ සිට පානදුර එන බසයක නැඟුණු හැටි මතකය. නමුත් මා තාත්තාගේ උකුලේ නිදා ගතිමි. නැවත පානදුරයේ දී අවදිව ලියෝ ප්‍රනාන්දු මහතාට අයිති පානදුර මෝටර් ට්‍රාන්සිට් සමාගමේ බසයකින් රත්නපුරයට එනවා මතකයි. රත්නපුරේ කලු ගඟ

ඡායාරූප: 52 – දෙතනගල කන්ද රාස්සගල පාරට පෙනෙන හැටි

අයිනේ තිබුණු හෝටලයකින් කෑම අරන් දී, බලංගොඩටත් එතැන සිට කාරයකින් මැද්දෙකන්දටත් හාපුරා කියා ආමි. පළමුවැනිවම මා දුටුවේ හිරු බැස යන මැද්දෙකන්දයි.

මා ගෙන ඒම ගැන වෙසෙසින් සතුටු වූයේ මැද්දේකන්දේ සාප්පුවේ සේවය කළ ඩේවිඩ් නම් තරුණ සේවකයෙකි. එදා සිටම මාගේ ආරක්ෂාව බාර ගත්තේ රෙන්ගසාමි නැමැති වත්තේ වැඩ කළ තාත්තාගේ ඉතා කුලුපග සේවකයෙකි. අපේ ගමේ තවත් රූබන් නැමැති ළමයෙක් කුස්සියේ ආහාර පිළියෙල කිරීමට සිටියේය. සමරජීව නැමැති උපැස් යුවළක් පැළඳ සිටි අහංගම ලියන මහත්මයෙක්ද සාප්පුවේ සේවය කළේය. වෙනත් සේවකයින් ගැන දැන් මට මතක නැත.

මැද්දෙකන්දේ මා ගත කළ පළමුවැනි උදෑසන මට හොඳට මතකයි. තාත්තාගේ කඩයට මිනිසුන් කීවේ සාප්පු කඩය කියායි.

ජායාරූප: 53 – මැද්දේකන්දේ සාප්පු කඩය (අද)

සාප්පු කඩය පිහිටියේ හරියටම තුන්මන් හන්දියේය. ඉදිරිපස පාර මැද්දේකන්දේ ගමටය. දකුණට යන පාර රාස්සගල යන පාරයි. වමට බලංගොඩට යන පාරයි. ඉදිරිපස ලස්සන මල් වත්තකි. අක්කර දෙකකටත් වඩා ලොකු වූ මේ ලස්සන මල් වත්ත තාත්තාගේම අතින් සකස් වූවකි. තාත්තා කුඩා බෝ පැලයක් ද පැළ කර, එයට ඉතා ආදරයෙන් සාත්තු කරමින් තිබුණේය. බෝ පැළය ළඟ කුඩා නාගයෙක්



ඡායාරූප: 54
ගම මැදට
වැටෙන
දිය ඇල්ලේ
ජල පහර

නිතර ගැවසුනේය. මම ඒ නාගයා කිහිප විටක්ම දැක ඇත්තෙමි. මල් වත්තේ දකුණු කෙළවර කඳු ගැටයක් මත පිහිටියේ මැද්දකන්ද වත්තේ ප්‍රධාන ලිපිකරුගේ බංගලාවයි. එවකට සිටියේ දෙමළ මහත්මයෙකි.

මේ බංගලාව ළඟින් රාස්සගලට යන මහ පාර වංගුවකින් හැරෙයි. එතැන සිට දකුණු පස බලන විට මහ පල්ලමකුත්, ඈත ඉතා උස ලස්සන කඳු වැටිත් පෙනෙයි. මේ කඳුවැටි අතර බෑවුම් බෑවුම් පැත්තෙන් පෙනෙන්නේ තේ වතුය. සාප්පුවේ වම් පස කෙළවරට පාර දිගේ පැමිණි විට තේ වවන ලද තවත් විශාල බෑවුමක්පෙනේ ඈත පෙනෙන්නේ මහා කඳු වැටි ය. කඳුවැටි අතරින් ලස්සන දිය ඇල්ලක් පහළට වැටෙයි. මේ දිය ඇල්ලට කී නම මට දැන් මතක නැත.



ඡායාරූප: 55
තාත්තා පැළ කළ බෝධීන් වහන්සේ (අද)

සාප්පුවේ පිටිපස තාත්තාගේ එළවලු වත්තයි. කෙසෙල් පඳුරුත්, ඒ අතර වවන ලද විවිධ උඩරට එළවලු වර්ගත් මගේ සිත් ගත්තේ ය. මීට පෙර මම

රාබු, කැරට්, නොකෝල්, ගෝවා, ලීක්ස් ආදී එළවලු වගාවන් දැක තිබුණේ නැත. ඒ සියල්ලට වඩා මගේ සිත් ගත්තේ සාප්පුවේ බේකරිය පිටුපස තිබුණු විශාල ජමනාරම් ගසයි. පසු කාලවල මගේ කාලයෙන් සැහෙන වෙලාවක් ගත කළේ මේ ජමනාරං ගස මුදුනේය.



ඡායාරූප: 56
මැද්දකන්දට යන පාර

එදත් අදත් උදැසනින් අවදිවීම මගේ පුරුද්දකි. උදේ වරුවේ මුල් භාගයේදී මැද්දකන්ද ප්‍රදේශයේ පවතින්නේ සිසිල්, සුවදායී දේශගුණයකි. හැමදාම උදැසන සාප්පු කඩේ සිට රාස්සගල පැත්තට යාර සීයක් පමණ ඇවිද ගෙන ගොස් සමතල ගිර ඇතුලු ඈත පෙනෙන විශාල කඳුවැටි දෙස බලා සිටීමට මම ඉතා ප්‍රිය කළෙමි. බලන්ගොඩට යන ඕනෑම අයකුගේ සිත් ඇද ගන්නා දෙතනගල කන්ද ද මගේ සිත්ගත් තවත් තැනකි. කෙමෙත්

ඡායාරූප: 57 – මැද්දේකන්ද වත්තේ තේ දලු නෙළන කතුන්

කෙමෙත් කඳු මුදුන් අබිබවා මැදකඳු පියසට වැටෙන හිරු එළිය සමගම එතෙක් මුලු පෙදෙස ම වසාගෙන සිටි සිනිඳු සේද සලුවක් මෙන් වූ මීදුම ඒ හා සමගම අතුරුදහන් වෙයි.

මෙවැනි සොබාදහමේ අසිරිමත් සිරිය ඒ. ටී. සී. ජිනදාසයන්ගේ කවි මනසට පෙනුණේ මෙසේය:

සුරහනත් විසින් ලකහනගේ තුමුල
කඳු මුදුන් ඒ පියයුරු දැක කර කොමළ
ඇඳ ගනින් නගේ කියමින් දෙන ධවල
සලු ලෙසින් පෙනේ කඳු මතු වලා පෙළ

මීට පන්සිය වසරකට පමණ පෙර සිරි රහල් හිමියෝ මෙම සොබා සිරියට බුදු බැතියත් එකතු කොට කවි ඇසින් දුටුවේ මෙසේය.

සුරරද සමන් සමඟින් සුරහන එවර
පැහැනද මදාරා පරසතු මල් පතර
කර පුද වඳින බැති මුනි සිරිපා තඹර
සකි සඳ පෙනේ සමනොළ ගල නැගෙනහිර

මේ කඳු දෙස බලා ගෙන සොබා සවිය රිසි පරිදි උරා ගනිමින් මෙවැනි කවි හඬ නගා කීමෙන්, මම අපමණ සතුටක් මැද්දෙකන්දේදී භුක්ති වින්දෙමි.

මීට බොහෝ කලකට පසු මා රාජ්‍ය උදහසට ලක්ව සිටි කාලයේ දී මේ පෙදෙසේම දහස් ගණන් හිතවතුන් සමඟ සාම සක්මන් භාවනාවෙන්, සෙංකඩගල පුරවරයේ සිට සිරිපා මලුවට යද්දී සමන් දෙවියන්ගේ සෙත් පතා ගැයූ මගේම නිබන්ධනයක් ද මතක් වේ.

හමන පවන් සිල් සුවඳින් පිරියේ
සමන කුළින් සිරිපා තෙද දැරියේ
බමණ පිනින් අරි මගෙහි ම සැරියේ
සුමන සමන් සුරිඳුට සත් කිරියේ

13

ලොකු මහත්මයාගේ භාරයට

මැද කඳු සොබා සිරියෙන් වශී වී මා නව ලෝකයක ජීවත් වන අතර, තාත්තා මහන්සි ගත්තේ මා නව සමාජයට හඳුන්වා දීමටයි. පළමුවෙන් ම සාප්පුවේ පහළොවක් – විස්සක් පමණ වූ සේවක පිරිස මට හඳුන්වා දුන්නේය. බේකරිය, සාප්පුව, තේ කඩය, සිල්ලර බඩු අංශය ආදී සියල්ලෙන් ම සම්පූර්ණ වූ සාප්පු කඩය, ඇඳුම් මහන අංශයකින් හා බෝල මේසයකින් ද යුක්ත විය. ගමේ මිනිසුනුත්, වත්තේ කම්කරුවනුත්, සියලු දෙනා ම බඩු ගැනීමට ආවේ අපේ සාප්පුවටයි. තාත්තාට දෙමළ කතා කරන්ට, ලියන්ට, කියවන්ට හොඳට පුලුවන. මමත් ටික දිනකදී දෙමළ කතා කරන්ට පුරුදු වීමි.

තාත්තා මාව ටේලර් ළඟට කැඳවා ගෙන ගියේය. කලිසම් දෙකක් හා කමිස දෙකක් මැසීමට ඔහුට අණ කළේය. ඒ කුඩා කලු පාටට හුරු කලිසම් දෙක සහ රතුපාට කලු ඉරි වැටී තිබුණු කමිස දෙක මට අදත් මතකයි. මා ජීවිතයේ දී ඇඳුම්වලට ආශා කළා නම්, මා වැඩියෙන්ම ආශා කළේ ඒ ඇඳුම් කට්ටල දෙකටයි.

මැද කඳු ජීවිතයේ දී මා කෙරෙහි වැඩිම බලපෑමක් ඇති කළ පුද්ගලයා ඊළඟට මට මුණගැසිණි. ඔහු මිටිය. තරබාරුය. ශක්ති සම්පන්නය. ශරීරය රන්වන් පැහැයෙන් යුක්තය. ඇස් දෙක කුඩාය. සිනාසෙන විට ඇස් වටා රැළි වැටේ. කතා කරන විට මුව පසකට හරවා කතා කරයි. ඒ කාලයේ තිබූ ෆියුජි සිල්ක් වලින් සාදන ලද රෙද්ද හා ජාතික බැනියම අඳියි. බැනියම් අත් දෙකේ හා කමිසයේ බොත්තම් වැල් රත්රන් පැහැය ඇති ඒවාය. අපේ තාත්තා හැර, කිසිවකු ඔහු හා සමව ඉඳ ගන්නවා හෝ මුහුණට මුහුණ දී ඔහු හා කතා කරනවා හෝ මැද්දෙකන්දේදී මා දැක නැත.

ගමේ කවුරුත් ඔහු ඇමතුවේ 'ලොකු මහත්මයා' කියාය. එසේ කළේ මැද්දෙකන්ද බෞද්ධ මිශ්‍ර පාඨශාලාවේ ප්‍රධානාචාර්යවරයා නිසාය.

ලොකු මහත්මයාගේ නියම නම එස්.ඒ. ද අල්විස් වීරසිරිවර්ධනයි. ගම රත්නපුර හිදැල්ලන ප්‍රදේශයේයි. ලොකු මහත්මයා විවාහ වී තිබුණේ මා මැද්දකන්දට ගිය දිනයට කිට්ටුවමයි. මනාලිය හංවැල්ල ප්‍රදේශයේ ඩී.සී.කේ. සමරවීර නැමැති මෙනෙවියකි. මට මතක හැටියට ඇය කලින් ක්‍රිස්තියානි පවුලක වුවත්, විවාහයෙන් පසු මහත්මයා මෙන්ම, බෞද්ධාගම වැළඳ ගත්තාය. කල් යත්ම ලොකු මහත්මයා හා මැතිනිය මගේ මවුපියෝ මෙන් වූහ.



ඡායාරූප: 58
එස්. ඒ. ද අල්විස් වීරසිරිවර්ධන
මුල් ගුරුතුමා (ලොකු මහත්මයා)

ලොකු මහත්මයා මුලින්ම සාප්පුවේදීයි මට මුණ ගැසුණේ. එදා උදේ ලොකු මහත්මයා සාප්පුවට ගොඩවැදෙත්ම, තාත්තා "ඔන්න මහත්මයා ගෝලයෙක් එක්ක ආවා. බාර ගන්න" යයි කීවේය. "බොහොම අගෙයි. මේ පුතාද?" "ඔව්, ලොක්කා. මාත් එක්ක උඩරට එන්න ඕනෑ කීවා."

"පුතාගේ නම?"

"ටියුඩර් ආරියරත්න"

"කීවෙනි පන්තියේද?"

"තුනේ. හතරටයි පාස් වෙන්නෙ."

"හොඳයි. එහෙනම් ටියුඩරයන් හෙට සිටම පාසලට එවන්නකො."

"අස්වීම් සහතිකය ගෙනාවේ නෑ."

"ඒක පස්සෙ පුලුවන්"

ඡායාරූප: 59
දෙවැනි මවක් මෙන් වූ වීර සිරිවර්ධන
(ඩී. සී. කේ. සමරවීර මැතිනිය)

ලොකු මහත්මයා කී අන්දමට පසුවදා තාත්තා හා රෙන්ගසාමිත් සමඟ හාපුරා කියා මම අලුත් පාසල කරා පා නැඟුවෙමි. හැම දෙයකම මට අලුත්ය. සාප්පුව ඉදිරිපිට තිබෙන පාරත් අලුත්ය. පාරේ වම්පැත්ත පල්ලමේ ලස්සනට වැවී තිබෙන තේ පඳුරුත්, ඇත කන්දෙන් ඇද හැලෙන ආදි කල්පිත ග්‍රීක කාන්තාවකගේ දිග ශ්වේත වර්ණ කේශ කලාපය බඳු දිය

ඇල්ලත් මට අලුත්ය. පාරේ දකුණු පැත්තේ දිගටම තිබෙන තිරිවානා ගල් වැටිත් මට අලුත්ය. කොණ්ඩය බැඳපු පාසල් යන පිරිමි ළමයින්, හිසේ මොට්ටැක්කිලි ලා ගෙන පිටේ තේ දලු නෙලන, කුඩා එල්ලා ගෙන බිමට බර වී, පාර පුරාම අප ඉදිරියට ඉක්මන් ගමනින් එන වතුකරයේ දෙමළ 'තංගච්චිලා' ද මට අලුත්ය. ඔවුන් පසුපස සුදු වේට්ටියක් හා කලු කබායක් ඇඳගෙන හිසේ තලප්පාවක් බැඳගෙන කට පුරා බුලත් හපමින්, එක් අතකින් කෝපි පිහියක් අරගෙන එන කංගානිලාද මට අලුත්ය. ඔවුන් කතා කරන භාෂාව ද මට අලුත්ය. මා දෙපයේ දා ගෙන සිටි පටි සපත්තු දෙකත්, මා ඇඳ සිටි කලු කොට කලිසමත්, රතුපාට කමිසයත් සියල්ලම අලුත්ය. මම අලුත් ලෝකයකට පිවිස ඇත්තෙමි.

14

සැබෑ අධ්‍යාපනයට පදනම වැටීම

කුඩා කඩ කීපයක් ද පසුකොට සැතැපුම් බාගයක් පමණ යන විට දකුණු පැත්තේ කන්ද මුදුනට නගින විශාල ගල් පඩි පෙළකි. මට මතක හැටියට ගල් පඩි සියයකට ආසන්නව ඇත. පඩි පෙළ ඇරඹෙන තැන වම් පැත්තේ රත්තරන්හාමි අයියා යන කෙනෙකුට අයත් කුඩා ගෙයක් ද, පඩිපෙළ දකුණු පැත්තේ එකිනෙකට සම්බන්ධ කොට සාදා තිබුණු කඩ කාමර දෙකක්ද විය. පසු කලෙක අවුරුදු හතරක්ම අපේ තාවකාලික නිවස වන්නේ මේ කුඩා ගොඩනැගිලි තුන බව ඒ මොහොතේ මම නො දත්තෙමි.

ඡායාරූප: 60
පන්සලට නගින පඩි පෙළ

මේ පඩි පෙළ නිම වන්නේ මැද්දෙකන්දේ පන්සලෙනි. පන්සල් භූමියේ ඉදිරිපස තිබුණු අඩි විස්සේ හතළිහේ පමණ ශාලාව මගේ අලුත් පාසලයි. එයට පහළින් පඩි පෙළ දෙපැත්තේ ගුරු නිවාස දෙකක් විය. එකක් ලොකු මහත්මයා හා ඔහුගේ බිරිඳගේ වාසස්ථානය වූ අතර අනිත් නිවස දෙවැනි මහත්මයාගේ, මට මතක ඇති හැටියට, ඩී. එන්. පෙරේරා මහතාගේ හා ඔහුගේ බිරියගේ වාසය විය. ලොකු මහත්මයාත් දෙවැනි මහත්මයා හා ඔහුගේ බිරියත් යනුවෙන් ගුරුවරුන් තිදෙනෙක් මේ පාසලේ එකල සේවය කළහ.

ඡායාරූප: 61 – එදා පාසල හැටියට තිබුණු ධර්ම ශාලාව

පාසල් ගොඩනැගිල්ල ඇත්ත වශයෙන් පන්සලේ ධර්ම ශාලාවය. ඒ හැරුණු විට සංඝාවාසයක්, විහාර මන්දිරයක් හා වතුර ටැංකියක් පමණකි, ඒ භූමියේ තිබුණේ. පසු කලෙක බෝධි අංකුරයක් ද පැළ කරනවා මට මතකයි.

තාත්තා ලොකු මහත්මයා ළඟට මා ගෙන ගියේය. මම විස්කෝතු ටින් එකක් සහ බුලත් දුංකොළ– ලොකු මහත්මයා අතට දී දණ ගසා වැන්දෙමි. රෙංගසාමි පඩිපෙළේ කෙළවර ඇණ ගසා ගෙන එළියේ සිටියේය.

“මහත්මයා මං අපේ ලොකු දුවට ලීවා – පුතාගේ අස්වීම් සහතිකය අරන් එවන්න. එතකං ප්‍රශ්නයක් නැ නේ.” තාත්තා කීවේය.

“ඒවා ඔක්කොම හරි. ආවාම පුතා අත එවන්න. මැනේජර් මහත්මයා යන්න. ළමයා රෙන්ගසාමි අත එවන්නම්.” ලොකු මහත්මයා පිළිතුරු දුන්නේය.

“පුතා රෙන්ගසාමි එක්ක ඉස්කෝලෙ ඇරුණා ම එන්න.”

තාත්තා මගේ ඔලුව අතගා, කුඩය අතට ගෙන යෑමට පිටත් විය. තාත්තා පඩි පෙළෙන් බසින තුරුත් තාත්තාගේ වෙරලු ගෙඩියක් විතර කොණ්ඩය බැඳපු හිසත් නොපෙනී යන තුරුත්, මම බලා සිටියෙමි.

මට මහ පාලුවක් දැනිණි. අම්මා, නැන්දලා, අක්කලා, නංගීලා හා මල්ලී මතක් විය. මගේ ඇසට කඳුලු පිරුණේය. පන්සලත් – හාමුදුරුවරුත්, මහ මුහුදත් – මුහුදු වෙරළත් මගේ මනස ඉදිරියේ මැවී පෙනේ. ආපසු දුව යන්ට ඇත්නම් මා උපන් ගමට!

"ටියුඩර් එන්න." ලොකු මහත්මයාගේ කටහඬ මට ඇසුණේය. මම බයෙන් සැකෙන් තිල්පාට විල්ලූද රෙද්දක් දමන ලද ලොකු මහත්මයාගේ මේසය ළඟට ගියෙමි. එක වරටම මා දුටුවේ දම්පාට තීන්තෙන් ලියන ලද ඔහුගේ ලස්සන අත් අකුරුය. එහි තිබුණේ මා ගත යුතු පොත්වල ලැයිස්තුවයි. ඒවා අතර සුභාෂිතය, ලෝකෝපකාරය, උම්මග්ග ජාතකය, 'නිව් මැතඩ් රීඩර්' පළමුවන පොත ද ලියා තිබුණා මට මතකය.

ඡායාරූප: 62
එදා මා හා ඉගෙනගත් අද 73 හැවිරිදි විජේසේන මහතා සමග ළඟ දී පාසල් ගොඩනැගිල්ලේ අප ඉගෙන ගත් පන්තිය තුළ වාඩි වී

"තාත්තාට කීවාම බලංගොඩින් හෝ රත්නපුරයෙන් මේවා ගෙන්වා දේවි. මම ටියුඩර හතරවැනි පන්තියට ඇතුල් කරන්නෙ. නමුත් හතරවැනි පන්තියෙ මේ අවුරුද්දෙ වෙන ළමයි නෑ. ඒ නිසා පස්වැනි පන්තියේ ඉන්න ළමයි දෙන්නෙක් එක්ක ඉගෙන ගන්න ඕනෑ. හැබැයි හයවැනි පන්තියෙත් මේ අවුරුද්දෙ ළමයි නෑ. ඒ නිසා බොහොම පන්ති ගන්න වෙන්නෙ එකට. ඕනෑම බැරි දෙයක් මගෙන් ඇවිල්ල බය නැතුව අහන්න."

"හොඳයි මහත්මයා"

මම ගොස් පන්තියේ ඉස්සරහ බංකුවේ අනිත් ළමයින් සමඟ වාඩි වුණෙමි. කලිසමක් සහ කමිසයක් ඇඳගෙන සිටියේ තවත් ළමයි දෙදෙනෙක් පමණය. අන් සියල්ලෝම ඇඳ සිටියේ සරම හා කමිසය හෝ බැනියමය. නැතිනම් ජංගියය. එකම පහත රටියා මම වීමත්, සපත්තු දාපු එකම ළමයා මා වීමත්, ගමේ පුලුවන්කාරයෙකු වූ සාප්පු කඩේ මැනේජර් මහතාගේ පුතා වීමත්, මට කුඩය ඉහළා ගෙන යෑමට රෙංගසාමි සිටීමත්, මේ සියල්ලම – මාත් මේ ළමයිනුත් අතර ආරම්භයේම මානසික පරතරයක් ඇති වූ කරුණු විය. කෙසේ නමුත් එදා දවස ගෙවෙන්ට පෙර ළමයි කීප දෙනෙක්ම මා හා යාලු වූහ.

15

ජීවිතය තුළින් අධ්‍යාපනයක්

මම මැද්දෙකත්දේ පාසල් ජීවිතය අරඹූ අන්දම කලින් සඳහන් කළෙමි. එක් පන්තියකට එක් ගුරුවරයකු බැගින් පන්ති භාරව නොසිටීමත්, සියලුම විෂයයන් එකම ගුරුවරයකු විසින් ඉගැන්වීමත්, විවිධ වයස්වල ළමයින් පොදු කාර්යයන් රැසකට එකට සහභාගිවීමත් නිසා එකල අධ්‍යාපනය විෂයබද්ධ නොවී, ශිෂ්‍යයාට වඩා කිට්ටු වූ පුද්ගල බද්ධ අධ්‍යාපනයක් වූ බව මගේ හැඟීමයි.

බෙර ගැසීම, ලී කෙළි, බර්ලින් ක්‍රීඩාව, පන්තේරු ක්‍රීඩාව, උඩරට නැටුම් ආදී විෂය බාහිර කටයුතුවලට මගේ කාලයෙන් සෑහෙන කොටසක් ගත විණි. මේවා අපට ඉගැන්වූ ප්‍රථම ගුරුවරයා ලොකු මහත්මයාය. පුදුම ක්‍රියාශීලි පුද්ගලයකු වූ හෙතෙම අප සමඟ මෙම සියලු ම ක්‍රීඩාවල යෙදුණේය. අත්කොට මේස් බැනියමක් ඇඳගෙන, සරම කැහිපට ගසා ගෙන, එතුමා අප සමඟ ළමයෙකු ලෙස මෙම සියලු ක්‍රීඩාවලම යෙදුණේය. සුප්‍රසිද්ධ උඩරට නැටුම් කලා ශිල්පියකු වූ කොස්කොළ වත්තේ ගුරුන්නාන්සේ අපට නැටුම් ඉගැන්වීය. මේ අංශයෙන් මම බොහෝ ත්‍යාග ද ඒ කාලයේ දිනා ගත්තෙමි.

ගුරු ගෝල සම්බන්ධය පන්ති කාමරයට පොතට හෝ විධිමත් අවස්ථාවලට පමණක් සීමා නොවීය. මෙම සම්බන්ධය වඩා පැවැතුණේ විෂය බාහිර කටයුතුවලදීය. වොලිබෝල් පිටිය, නැටුම් ගැයුම් වැයුම් කළ තැන්, බලංගොඩ, රාස්සගල, වලේබඩ, ඕපනායක වැනි සැතැපුම් 5 සිට 15 ක් දක්වා අතර ප්‍රදේශවලට පයින්ම ගමන් කිරීම, එළවලු කොටු හේන් ආදිය වගා කිරීම, ලොකු මහත්මයාගේ ගෙදර පිටුපස කුස්සියක් කටු මැටි ගසා හැදීම, ළිං කැපීම ආදී මේ සියලු ස්ථානම අපේ අධ්‍යයන ක්ෂේත්‍ර විය.

මගේ පාසල් වේලාවෙන් බාහිර කාලය වැඩියෙන් ගෙවුනේ ලොකු මහත්මයාගේ ගෙදරය. එතුමා සිය නිවසින් බැහැර ගත කළ හැම රැයකම තති රකිමින් මැතිනිය බලා ගත්තේ මමය. පසු කලක ඇයට "අම්මා" යනුවෙන් ඇමතීමටද තරම් මම ළං වීමි.

පාසල පිහිටියේ පන්සල් භූමියේම ධර්ම ශාලාවේ බව මම සඳහන් කළෙමි. මේ නිසා පන්සලත්–පාසලත් අතර තිබුණේ ඉතා කිට්ටු සම්බන්ධයකි. සුමනතිස්ස හිමියෝ ලොකු හාමුදුරුවෝ වූ අතර, මැද්දේකන්දේ වජිරපාල හිමියෝ දෙවැනි හාමුදුරුවෝත්, මැ. සුගතතිස් හිමියෝ පොඩි හාමුදුරුවෝත් වූහ.

කුඩා කාලයේ සිට පීල්ලෙගොඩ පන්සලේ ආශ්‍රයෙන් හැදුණු මම, මැද්දේකන්දේ පන්සලේ හාමුදුරුවන් සමඟ ආශ්‍රයට වැටීම නිරායාසයෙන්ම සිදු වූවකි. ලොකු හාමුදුරුවන් සමඟ මගේ තුබුණු සම්බන්ධය ආර්ථික එකක් විය. එනම් හාමුදුරුවන්ගේ තේ දලු ස්ටෝර්රුවට යැව්වාම ඒවා කිරවා – බාර දී මුදල් ගෙනැවිත් දෙන්නේ මාය. රුපියල් ගණන තමන් ගෙන, සත ගණන හාමුදුරුවෝ මට දුන්හ. පසු කලෙක සුමනතිස්ස හාමුදුරුවෝ සිවුරු හැර ගියහ.

වජිරපාල හාමුදුරුවන් සමඟ මගේ තිබුණේ ගුරු – ගෝල සම්බන්ධයකි. හාමුදුරුවෝ ඉංගිරිසි දැන සිටි නිසා මට "නිව් මැතඩ් රීඩර්" පොත කියා දුන්හ. හොඳ නරක කියා දුන්හ. මා සමඟ ඇත ගමන් පයින් වැඩම කරන අතර, ලස්සන කථාන්තර කියා දුන්හ. හාමුදුරුවන් පිළිබඳ මගේ මතකය ගෞරව සම්ප්‍රයුක්ත එකකි. පසු කලෙක පින්නවල පැත්තේ ආරාමයක විහාරාධිපතිව වැඩ වාසය කළ වජිරපාල හාමුදුරුවෝ අවුරුදු විස්සකට පමණ පසුව නැවත කොහේ දී දෝ මට මුණ ගැසිණි. එක්දහස් නවසිය අසූඑකේ දී හදිසියේ උන්වහන්සේ අපවත් වූ බව මම දැන ගතිමි. මා පිළිගන්නා හැටියට එතුමා ශ්‍රේෂ්ඨ බුද්ධ පුත්‍රයෙකි.

16
කවියට හිත වැටීම

මැද්දේකන්දේ සුගතතිස්ස හිමියන් හා මා අතර තිබුණේ මිතුරන් අතර තිබෙන විධියේ සම්බන්ධයකි. සුගතතිස්ස හාමුදුරුවෝ මහා කලාකාමියෙකි. අත් අකුරු පුදුම ලස්සනය. හිටිවන කවි කීමටත්, ලිවීමටත් ගජ හපනෙකි. යුද සමයේ කොළඹ කවීන් අතින් ලියැවී පළ වූ කවි පොත් සියල්ල මා ලබාගෙන කියවා රස වින්දේ සුගතතිස්ස හාමුදුරුවන්ගේ ආශ්‍රයෙනි. මට මතක හැටියට, හාමුදුරුවෝත් අප සමහම මුල් ගුරුතුමාගෙන් අපේ පන්තියේම වාඩි වී ඉගෙන ගත්හ. ගුණේරිස්, චාර්ලිස්, පුංචි පිරිස්, කීර්තිසුමන ආදී නම් තිබුණු මිත්‍ර ශිෂ්‍යයෝ රාශියක් ම අපේ කවි රස විඳි හවුලට අයත් වූහ. දිනක් සාහිත්‍ය සංගමයේ රැස්වීමේ මුලසුන මා ගෙන සිටිද්දී කවි සංවාදයක දී හාමුදුරුවන් විසින් මා හඳුන්වා දුන් කවි පද දෙකක් මට මතක් වේ.

"කතුර වගේ කට කැපුවත් හරිම ඇත්ත කියන පසිඳු
චතුර කතික මේ ඒ.ටී. ආරියරත්න සබාපතිඳු"

දිනක් "සුවඳ" නම් වූ අතින් ලියන ලද කවි සඟරාවක් මැ. සුගත තිස් හිමියන්ගේ සංස්කාරත්වයෙන් අපි සකස් කළෙමු. සාහිත්‍ය සංගමයේ සභාපති හැටියට දෝ මගේ නමත් එහි ලියා තිබුණා මට මතකයි. ඒ මුලු සඟරාවම වාගේ ලීවේ මැ. සුගතතිස් හිමියන් විසින් නමුත්, අප කීප දෙනකුගේ නමින් ද කවි ලියැවී තිබිණි. හාමුදුරුවන් විසින් මේ සඟරාව ලොකු මහත්මයාට දෙන ලෙස බාර දුන් බැවින්, මා එය කියවා මහ ආඩම්බරයකින් යුතුව දැතින්ම එය එතුමාට පිළිගැන්නුවෙමි.

"හ්ම්, සුවඳ...?"

සැණෙකින් ලොකු මහත්මයාගේ මුහුණම රතු විය. එතරම් සැරට එතුමාට කේන්ති ගොස් තිබෙනු ඊට කලින් දැක තිබෙනු මට මතක නැත.

“මේකෙ ඇති සුවඳක් නෑ. මේක ගඳක්. කවුද මේ කුණුහරුප ලීවේ. අනුමාන නෑ අර සුගතතිස්ස ගේ වැඩක්. තේරෙනෙවාද මේ කවිවල තේරුම?”

මම බියෙන් සැලෙන්නට වීමි.

මේ පිළිබඳ මා අහිංසක බව ගුරුතුමාට තේරුම් ගියේය.

“යුදට ගිය අයියාට” යන පැදි පෙළෙන් කවි කීපයක් එතුමා හඬ නගා කියෙව්වේය. මට පද කීපයක් මතකයි.

“සුවඳැල් පැළය ගියාය බසයක එල්ලී”

“කවුද, දන්නවද මේ කියන හන්දියෙ ගෙදර සුවඳැල් පැළය? ඒ අර සැමි අයියා ගේ බාල දූ”

“සුදු මාමගෙ හේනේ පන්සල් වත්ත කොණේ”

“දන්නවා ද මේ සුදු මාමා කියන්නෙ කාට ද කියා? ඒ මට. පන්සල් වත්ත කොණේ තිබෙන්නේ අපේ ගෙදර. හේන කියන්නේ අපේ නෝනට. පල හට ගත්තේ නැද්ද කියා අසා තියෙන්නෙ අපේ නෝනට ළමයා හම්බවුනා ද කියා අසන එකයි.”

මේ අන්දමට මුලු කවි පොතම කවියෙන් කවිය විග්‍රහ කරන කොට තමා, කුමක් සිදු වී ඇත් දැයි මට තේරුම් ගියේ. මේ අතර සුගත තිස්ස හාමුදුරුවෝ ජේන තෙක් මානයේ සිටියේ නැත. මම ලොකු මහත්මයා ගෙන් සමාව අයැදිමි.

පසු දා උදේ අප පාසල් එන විට දුටුවේ මුලු කලුලැල්ල පුරාම රට හුණු වලින් ලස්සන අකුරින් ලියා තිබූ දස පද හැල්ලකි. එහි මුල් අකුරු පහළට කියැ වූ විට කියැවුණේ “මැ. සුගතතිස් ගියා” යන අදහසය. හාමුදුරුවෝ මේ කවි පෙළින් කර තිබුණේ ගුරුතුමාගෙන් සමාව අයැදීමකි. ඉන්පසු කවදාවත් මා සුගත තිස්ස හාමුදුරුවෝ නැවත දුටුවේ නැත. මීට අවුරුදු තිහකට පමණ පසු දිනක හදිසියේ බලන්ගොඩ දී මට මුණ ගැසුණු කෙනෙක් මැ. සුගතතිස්ස නමින් මහණ වී සිටියේ තමන් බව මට පැවැසීය. ඔහුගේ නම බී.එස්. හේමචන්ද්‍ර බව ද දැන ගතිමි. ඔහු 1999 වසරේ දී පරලෝ සැපත් වී තිබේ.

සුගත තිස්ස හිමියන්ගේ ආභාසයෙන් මමද බොහෝ කවි ලීවෙමි. මේවා දැන් මතක නැත. පීල්ලෙගොඩ පන්සලේ ලොකු හාමුදුරුවන්ට මා යැවූ කවි ලිපියක් පසු කලෙක හාමුදුරුවෝ මට පෙන්වූහ. එහි වූ පහත සඳහන් කවි දෙක මට මතකය. එයින් මගේ දස හැවිරිදි වියේ අදහස් හෙළි වේ:

"කාලය අමාරු ව නො තකා දිරිය දරා
කරගෙන ගිය විහාරයෙ වැඩ දවස පුරා
නිම වුනෙ නැති ද අසනෙමි මම කඳුලු පෙරා
පිළිතුරු එවනු මැන මගෙ පියතුමට හොරා

සීලා නන්ද උපසෙන් අග්ගාරාම
ආදී හාමුදුරුවරු හිත ඇති බෝම
සිහි කර කළ නමුත් නිති කඳුලැලි නැම
එයිනුත් සැනසුමක් වූයේ නෑ තාම"

මැද්දේකන්දේ පාසලේ දී මගේ අධ්‍යාපනයට හොඳ ප්‍රායෝගික පදනමක් වැටුණු බව මගේ හැඟීමයි. සැළලිහිණි, ගිරා, තිසර ආදී සන්දේශ පොත්ද කුසදා කව, ගුත්තිලය, දහම්සොඬ කව, පූජාවලිය, සද්ධර්මරත්නාවලිය, බුත්සරණ, කාව්‍යශේඛරය, සුභාෂිතය, ලෝකෝපකාරය ආදී වෙනත් පැරණි සාහිත්‍ය පොත්ද කියවීමට මට ආශාව ඇති වුණේ ඒ අධ්‍යාපනයේ හොඳකම නිසයි. පසු කාලවල මගේ චර්යා ධර්මයන් හා සේවාවන් බොහොමයක් හැඩ ගැසුණේ මේ පසුබිම නිසා බව මම කල්පනා කරමි. තමන්ගේ සංස්කෘතිය ගැන නොදන්නා පුද්ගලයා තමන්ගේම රටේ පරදේශක්කාරයෙක් වේ.

17

තාත්තා නඩු මගට බැසීම

සාප්පු කඩේ භූමියේ හා ගොඩනැගිලිවල අයිතිකාරයා වූයේ ඕපනායක ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන සබරගමු පළාතේ ප්‍රසිද්ධ වෙළෙන්දෙක් වශයෙන් කවුරුත් දත්, කේ. ඇම්. සියනේරිස් මුදලාලි මහතාය. තාත්තාට අයත්ව තිබුණේ වෙළඳාම් කළ බඩු පමණක් බව මගේ හැඟීමය.

මේ කාලයේ මැද්දෙකන්ද වත්තේ සුපරින්ටෙන්ඩෙන්ට් හැටියට වැඩ කළේ ඩයක් නැමැති සුදු මහතෙකි. තාත්තා ඔහු සමඟ කිට්ටු මිත්‍රකම් පැවැත්වීය. ඒ නිසා දෝ සාප්පුව ඉදිරිපිට තිබූ අක්කරයකටත් වඩා ලොකු ඉඩම මල් වැවීම සඳහා තාත්තාට ඔහු විසින්දී තිබිණි. මේ මල් වත්ත ඒ කාලයේ මුලු පළාතේම ප්‍රසිද්ධ මල් වත්තක් විය. බොහෝ දිනවල අවට වතුවල සුදු මහත්වරුත්, බලංගොඩ විසූ රත්වත්තේ පවුලේ ළමයින් වැනි ප්‍රාදේශීය ප්‍රභූනුත්, මේ වත්තට බොහෝ විට පැමිණියහ. සිරිමාවෝ රත්වත්තේ (බණ්ඩාරනායක) මැතිනිය කෙරෙහි, තාත්තා මිය යන තුරුම භක්තියක් තිබුණේ "කුඩා කාලයේ මල් වත්තෙන් නිතර මල් ගෙන යෑමට පැමිණි ළමයින්" නිසාය.

මේ මල් වත්තේ, තාත්තා බෝධීන් වහන්සේ නමක්ද පැළ කළේය. අප මල් වත්තේ ඇවිදින විට, නිතරම ඒ බෝධීන් වහන්සේ සමීපයේ සුදු නයෙක් සිටියේය. කුඩා කාලයේ සිටම මේ නයාට තාත්තා ආදරය කළේය. අප මැද්දේකන්දෙන් පදිංචිය ඉවත් කොට ටික දවසකින් මේ නයා මිය ගොස් තිබුණ බව තාත්තා සංවේගයෙන් යුතුව දවසක් පවසනවා මට මතකය.

තාත්තා ගමේ ගොස් තිබුණු දිනයක සියනේරිස් මුදලාලි හිටිහැටියේ සාප්පුවට පැමිණියේය. වේලාව රාත්‍රී අටට පමණ ඇත. ඔහු සමඟ පොලිස් රාළහාමිලා දෙ දෙනෙක්ද පැමිණියහ. තවත් නාඳුනන අය කීප දෙනෙක් ද ඔහු රැගෙන ආහ. ඒ අය කඩේ නැවැත් වූ මුදලාලි අත් සියලු දෙනාටම බලංගොඩට යෑමට අණ දුන්හ. ඩේවිඩ් පමණක් මා සමඟ ඉතිරි විය. ඔහු මගේ පොත් ටික පමණක් රැගෙන, මා සාප්පුව

ඉදිරිපිට තිබූ වත්තේ ප්‍රධාන ලිපිකාර මහතාගේ ගෙදරට කැඳවාගෙන ගියේය. එහි අපි නිදා ගතිමු. මගේ කලු කලිසම් දෙක හා රතු කමිස දෙක ද මට අහිමි විය.

රාත්‍රියේ තාත්තා කඩයට පැමිණියේය. දොර ඇරගෙන ඇතුලු වූ තාත්තාට සියනේරිස් මුදලාලි කර තිබූ 'ත්‍රස්තවාදී' ක්‍රියාව අවබෝධ විය. උදෙන්ම පැමිණ මා සැනසූ තාත්තා, කෙලින්ම ගියේ බලන්ගොඩ පොලීසියටය. ඒ කාලයේ එහි ප්‍රධානියා ව සිටියේ එළියතම්බි නැමැති මහතෙකි. රාත්‍රියේ මුර ගමනක් යන කොස්තාපල්වරුන් දෙදෙනෙකු කාරයේ නංවාගෙන අවුත් සාප්පුවේ සිටි අයවලුන් බය කොට, මේ ක්‍රියාව කර තිබෙන බව හෙළි විය. මැද්දේකන්දට නුදුරු වෙලේකුඹුර වත්තේ පැක්ටේරිය ගිනි ගත් විට, එහි ඉතිරි වූ යන්ත්‍ර සූත්‍ර යකඩ ආදිය තාත්තා මිළට ගෙන සාප්පුව අවට ගොඩ ගසා ගෙන තිබුණේය. මේවාට තණ්හාවෙන් මේ ක්‍රියාව කළ බව ඔප්පු විය.

සියනේරිස් මුදලාලිට විරුද්ධව තාත්තා නඩු දැම්මේය. රත්නපුර උසාවියේ පැවැරූ මේ නඩුව පිළිබඳ සිද්ධිය ප්‍රදේශය පුරා ම ආරංචි විය. ටික කාලයකට පසු දෙදෙනාගේම මිත්‍රයන් ඉදිරිපත් වී, මට මතක හැටියට තාත්තා වෙනුවෙන් පෙනී සිටි නීතිඥ ආර්. ඇල්. පෙරේරා මහතාගේ ද බලවත් උත්සාහයෙන්, තාත්තාට රුපියල් ලක්ෂයකට කිට්ටු වන්දියක් දී නඩුව සමාදාන විය.

18

අසරණයන් සූරා කෑමට වඩා හිඟා කෑම හොඳයි!

මේ අතර මැද්දෙකන්දේ පාසලට නුදුරු නිවාස දෙකක් තාත්තා කුලියට ගත්තේය. දෙවැනි ලෝක මහා යුද්ධය එන්ට එන්ටම පැතිරී ගියෙන්, ගමේ සිටි සියලු දෙනාමත්, දැන් මැද්දෙකන්දේ පදිංචියට තාත්තා විසින් කැඳවා ගෙන එනු ලැබීය.

මැද්දෙකන්දේ කිට්ටං ගෙයි තාත්තාගේ ප්‍රධාන බඩු ගබඩාව ද, අප කුලියට ගත් එක් ගෙයක තවත් ගබඩාවක්ද විය. තාත්තා තොග බඩු වෙළඳාම ඇරැඹීය. අවට වතුවලට බඩු සැපයීමෙන් තාත්තා ටික කලක දී නැවත ස්ථාවර විය.

ලොකු අක්කා ගමේ සිට එන විට ජ්‍යෙෂ්ඨය සමත් වී සිටියාය. බේබි අක්කා, ලලනා කණිෂ්ඨ පන්තියට ඇතුළු වූවාය. මා හතේ සිටියත්, ඉගෙන ගත්තේ බේබි අක්කාගේ අටේ පන්තියේ ළමයින් සමඟ ය. මේ නිසා අප දෙදෙනා අතරේ තරගයක් ද පැවැතිණි. විභාගය කිට්ටු වන විට මම කලින් බොරුවට නිදා ගන්නා බව පෙන්වා, අන් අය නිදා ගත්තාට පසු හෙමිහිට නැගිට රෑ පැය ගණන් පාඩම් කළෙමි. දවල් කාලයේ කොල්ලන් සමඟ ක්‍රීඩා කරමින් ඇවිද්දෙමි.

කණිෂ්ඨ විභාගයට ඉදිරිපත් වීමට සුදුස්සන් තේරීමේ විභාගයෙන් මම ද සමත් වීමි. ඒ නිසා මට ද රජයේ විභාගයට ඉදිරිපත් වීමට පුලුවන් විය. රජයේ විභාගයෙන් අක්කා අසමත් වූ අතර, මම සමත් වීමි. නැවත ප්‍රශ්න පත්‍ර බැලීමට ඉල්ලුම් කිරීමෙන් පසු අක්කා ද සමත් වී ඇති බව ප්‍රකාශ වූ නිසා ගෙදර සාමය රැකුණේය.

මල්ලීත්, පත්මා නංගීත්, පුංචි පන්තිවල ඉගෙන ගත් අතර, අමරා මගේ බාලම නංගී තාත්තාගේ සුරතලී විය. තාත්තා ඇය ඇමතුයේ "මගේ සුන්ඩුව" කියාය.

දිනක් තාත්තා හමුවීමට බලංගොඩ සිටි මුදලාලි කෙනෙක් පැමිණියේය. මොහු මුස්ලිම් ජාතික හෝ දෙමළ ජාතික දැ යි මට මතක නැත. මුදලාලි සමඟ තාත්තා අපේ බඩු ස්ටෝරුවට යැමේදී මාද කැඳවා ගෙන ගියේය. මට මතක යි එහි තිබුණු හාල්, පිටි, මුං ඇට, කඩල, සීනි,

පරිප්පු, කොල්ලු ආදී ආහාර මිටි රාශියක් තාත්තා මට ගණින්ට කී හැටි. ඒ මුදලාලි පැමිණියේ එහි තිබුණු සියලු ම ද්‍රව්‍ය එකවර එකට එක වැඩිපුර මුදල් දී මිලට ගැනීමටයි. ළඟදීම ආහාර මිල පාලනය එන නිසා, මේ සියල්ල ඒ වේලේම වැඩිපුර මිලට විකිණුවොත්, තාත්තාට එකවරම ලක්ෂ කීපයක් ලැබෙන්නේය.

කිට්ටං ගෙයි දොර වැසූ තාත්තා, ටික වේලාවක් ඈත කඳු දිහා බලා ගෙන කල්පනා කරනු මට මතකයි. ඒ අතර අර මුදලාලි ද තොර තෝංචියක් නැති ව දෙමළෙන් හා සිංහලෙන් තාත්තා පෙළඹවීමට කතා කළේය. අවසාන වරට තාත්තා කී කතාව මට අද මෙන් මතකය.

"නෑ මුදලාලි බොහොම ස්තූතියි. මා තමුසෙව මෙතනට කැඳවා ගෙන එන කොටත් මම මේක තීරණය කරලා ඉවරයි. මට ඕනෑ කළේ මගේ පුතාට දැන ගන්න – ඔහුගේ තාත්තා ධාර්මිකව මුදල් හම්බ කරලා ඔවුන්ට කන්න දුන් කෙනෙක් බව. මා පාරේ හිඟා කැවත් අසරණයා සූරා කමින් ලක්ෂපතියෙක් වෙන්ට හදන්නෙ නෑ. ඒ නිසා ඔය ගනුදෙනුව මාත් එක්ක කරන්ට හම්බ වෙන්නේ නෑ."

"ලියන මහත්තයා පුදුම මිනිහෙක්. මම ගිහින් එන්නම්."

එදා ආපසු ගෙදරට වුත් තාත්තා දැහැමි ජීවිතය ගැන අපට තවදුරටත් කතා කළා මට මතකය.

ඡායාරූප: 63
ශ්‍රීමත් ෆ්‍රැන්සිස් මොලමුරේ මහතා

පසුවදා, තාත්තා මා සමඟ රත්නපුර කච්චේරියට ගියේ ඔහු ළඟ තිබූ ආහාර තොගවල සම්පූර්ණ ලැයිස්තුවක් ද සාදා ගෙනය. එකල උප ආහාර කොමසාරිස් වූ දිසාපතිතුමා හමුව තාත්තා එම ලැයිස්තුව දී,

"මහත්මයා මට ආරංචියි අද හෙටම ආහාර පාලනය එනවා කියා. කරුණාකර මේ ලැයිස්තුව තියා ගන්න. ඕනෑම වේලාවක මගේ ළඟ තිබෙන බඩු රජයේ පාලනය යටතට ගෙන මගේ මුදල දෙන්න."

දිසාපති තුමා ද තාත්තාගේ හැසිරීම ගැන පුදුම විය. එකල රාජ්‍ය මන්ත්‍රණ සභාවේ කතානායකව සිටි ශ්‍රීමත් ෆ්‍රැන්සිස් මොලමුරේ මහතාටද මේ සිද්ධිය ආරංචි විය. තාත්තාගේ මිත්‍රයකු වූ එතුමා කෙලින්ම මැද්දෙකන්දේ අපේ ගෙදරට ආවේය. ගෙදරට ගොඩ වන

විටම, මා අල්ලා උස්සා බිම තියන මොලමුරේ මහතා, එදිනද මා අල්ලා ඉස්සූ විට මගේ ඔලුව දොරේ උලුවස්සේ හැපුන හැටි මතක් වේ.

තාත්තාට මුලින් දොස් කී මොලමුරේ මහතා, පසුව තාත්තාට ප්‍රශංසා කොට, ගොඩකවෙල, ඇඹිලිපිටිය ආදී ප්‍රදේශවල රජයේ කොන්ත්‍රාත් බාර ගන්නා ලෙස පැවසීය. එතැන සිට තාත්තා කොන්ත්‍රාත්කරුවෙක් විය.

19
පළමු මැතිවරණ අත්දැකීම

මැද්දෙකන්දේ ජීවත් වූ කාලයේදී සිදු වූ අමතක නොවන අත්දැකීමක් නම්, මා දුටු පළමුවන මැතිවරණයයි. එය රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අසුනක් සඳහා වූ අතුරු මැතිවරණයෙකි. තරග බිමේ සිටියේ ශ්‍රීමත් ෆ්‍රැන්සිස් මොලමුරේ මහතා සහ බාර්න්ස් රත්වත්තේ මහතායි. මොලමුරේ මහතාට ලැබී තිබුණ පාට කොළපාට විය. රත්වත්තේ මහතාට ලැබී තිබුණ පාට කහපාට විය. අපේ තාත්තා මොලමුරේ මහතාගේ පැත්තට වැඩ කළ අතර, ලොකු මහත්මයා වැඩ කළේ රත්වත්තේ පැත්තටයි. කොළ පාටෙන් මසන ලද විශේෂ ඇඳුම් ඇඳගෙන මොලමුරේ මහතාගේ අනුගාමිකයෝත්, කහ පාට ඇඳුම් ඇඳගෙන රත්වත්තේ මහතාගේ අනුගාමිකයෝත් ඡන්ද සටන ගෙන ගියහ.

බලංගොඩ පැවැති ඡන්ද රැස්වීමකට ගිය අපි මොලමුරේ මහතාගේ රැස්වීමකට සහභාගි වීමු. පළමුවරට දේශපාලන කතාවක් මා ඇසුයේ එදායි. කථිකයා ගාලු නගරාධිපති වූ විජයානන්ද දහනායක මහතායි. එදා දහනායක මහතා කළ කතාව බොහෝ කලක් යන තුරු පුංචි අපට කට පාඩම්ව තිබුණේය. එහි හරය වූයේ බාර්න්ස් රත්වත්තේ මහතා මේ තරගයෙන් පැරදෙන බව දන්නා නිසා ඉදිරිපත් වීමට මැළි කළ බවත්, බණ්ඩාරනායක මහතා (එනම් රත්වත්තේ මහතාගේ බෑනනුවන්) බල කළ නිසා ඉදිරිපත් වූ බවත්ය.

ඉතා ම හාස්‍ය ජනක ලෙස බණ්ඩාරනායක මහතා ජොකියකුටත්, රත්වත්තේ මහතා අශ්වයකුටත් සමාන කරමින් දහනායක මහතා දිග කථාවක් කළේය. එක් අවස්ථාවකදී රැස්වීමේ එක කොණකින් කලබලයක් දක්නට ලැබිණි. එවිට දහනායක මහතා කීවේ, ගාල්ලෙ කොල්ලො ගුටි කාලා යන්ට ආවේ නැති බවත්, ගුටි දීල යන පිරිසක් බවත්, ඔහුගේ ඇඟට අත තිබ්බොත්, රත්වත්තේ වලව්වෙ එක උළු කැටයක්වත් ඉතිරි වෙන්නේ නැති බවත්ය. මේවා අසා සිටි කොලු අපට, ඡන්දය ත්‍රාස

ජනක වූත්, විනෝද ජනක වූත් සිද්ධියක් විය. එකල කටින් ගසා ගත්තා මිස අතින් පයින් ගසා ගත්තේ නැත.

මොලමුරේ මහතා මෙම අතුරු ඡන්දයෙන් අති විශිෂ්ට ජයග්‍රහණයක් අත් කර ගත්තේය.

හා පුරා කියා චලන චිත්‍රපටි - සිනමාවත් දක්නට ලැබුණේත් මැද්දෙකන්දේ සිටි කාලය තුළදීය. සන්ධ්‍යාවේ මැද්දෙකන්දේ සිට පයින්ම බලංගොඩට ආ අපි කූඩාරමක පෙන් වූ දෙමළ චිත්‍රපටි දෙකක් නැරඹුවා මතකය.

පළමුවැන්නේ ශබ්දය තිබුණේ නැත. එහි සිටි විහිලුකාර චරිතයක් රඟ පෑ එස්.එස්. කොකෝ ගේ නම මට මතකය. එමෙන්ම කැලෑ සතුන් සමඟ වීරකම් කළ වනමෝහිනී චිත්‍රපටය ද නැරඹුවා මට මතකය.

20
සිරි අයියා

අපේ ලොකු අක්කා විවාහ වූයේ අප මැද්දෙකන්දේ සිටින කාලයේදීය. මේ සඳහා කපුකම කළේ සිරි අයියාය. ඔහුගේ සම්පූර්ණ නම සිරිසේන ජිනදාසය. සිරි අයියා අපේ තාත්තාගේ අයියා ගේ පුතාය. අපේ තාත්තාගේ පියාගේ පළමුවන විවාහයෙන් ලැබුණු දරුවන් දෙදෙනෙක් වූ බව කලින් සඳහන් කෙළෙමි. එක් කෙනෙක් සිරි අයියාගේ පියා වූ සිරිදියස් ජිනදාසය. නම අසා තිබුණත්, ඔහු අප දැක නැත. අනෙකා ලොකු අප්පච්චි නමින් අප හැඳින් වූ තෝමස් ජිනදාසය. චන්ද්‍රා සෝප් මුදලාලි වශයෙන් ද හැඳින්වුන ලොකු අප්පච්චි අප දැක තිබේ.



ඡායාරූප: 64
සිරි ජිනදාස මහතා

අප මැද්දෙකන්දේ සිටින කාලයේ සිරි අයියා අප බැලීමට නිතර ආවේය. සිරි අයියාගේ දෙමාපියන් කුඩා කල දීම මිය ගිය හෙයින්, ඔහු දෙමාපියන් හැටියට සැලකුයේ අපේ දෙමාපියන්ටය. එහෙත් සිරි අයියා කුඩා කාලයේදී ඔවුන්ගෙන් විශේෂ සැලකිල්ලක් නො ලැබූ නිසා දෝ ඉහළට අධ්‍යාපනයක් නො ලැබුවේය.

ගාල්ලේ බොනවිස්ටාවේ අවුරුදු කීපයකුත්, බදුල්ලේ ධර්මදූත විද්‍යාලයේ අවුරුදු කීපයකුත් ඉගෙන ගත් සිරි අයියාගේ ඉංග්‍රීසි සහ සිංහල දැනුම වත්මන් උපාධිධරයකුටවත් නැති තරම්ය.

ඔහු සහජ කවියෙකි. කලක් එවක සිටි ශ්‍රේෂ්ඨ ජාතික නායකයෙක් වූ ඩබ්ලිව්. ඒ ද සිල්වා මහතාගේ අනුරාධපුර තිබූ ශ්‍රාවස්ති වත්තේද පසුව ඕපනායක කේ. එම්. සියනේරිස් සහ සමාගමේ ද ඔහු ලිපිකරුවෙකු වශයෙන් සේවය කළේය.

ඒ කාලයේ පළවූ ස්වදේශ මිත්‍රයා සඟරාවේ 'දේව නාගර' යන ආරූඪ නාමයෙන් "ගැහැනු කරුණාවන්ත ද?" යන තේමාව යටතේ කවි

සංවාදයක් මෙහෙය වූයේ සිරි අයියාය. විහිලු වදන් පැවසීමට හපනෙක් වූ ඔහු, ඒ වාදයේ දී ලියූ කවි කිය කියා අප ව නිතර ම විනෝද කළේය. ගැහැනුන් තරහ කිරීමට ගජ හපනෙක් වූ ඔහු, වාදයේ දී දුන් උපමා හරිම හාස්‍ය ජනකය. වරක් ඔහු කී කවියක පදයක් මට මතකය.

"ගැහැනු කරුණාවන්ත නම්
ඇයි පපුවෙ ලොම් නොවැඩෙන්න කාරණා?"

ඡායාරූප: 65
සිරි අයියා (වමේ) පැලස් හෝටලයේ අයිතිකරු ඩැනි අයියා (මැද) හා එල්. ඒ. පෙරේරා මුදලාලි

අප මැද්දෙකන්දේ සිටින කාලයේ අයියා ජීවත් වූයේ වේයන්ගොඩ සයිරස් ස්ටෝර්ස් නැමැති සාප්පුවේ හා පසුව නිට්ටඹුවේ ඩැනි අයියාට අයිති පැලස් හෝටලයේ ය. එහිදී වරක් බණ්ඩාරනායක මැතිතුමාගේ ඡන්දයකදී ඔහු ලියූ ප්‍රශස්ති ගීයක පද කීපයක් මට මතකය. තුන්වැනි පදය මට මතක නැත.

"පත්මත් ගජන් කුඩු විදාරණයේ සමත් වූ
වාදීභ සිංහයකු සේ ජයගත් සියල් ලෙව්
....
බණ්ඩාරනායක මහත්මා මෙන් කෙනෙක් නැ"

21

ජිනදාස (තලගුලි) මුදලාලි

සිරි අයියා, තලගුලි ජිනදාස මුදලාලි නමින් ප්‍රසිද්ධ වූ වරකපොළ කේ. ජී. ජිනදාස මුදලාලිගේ ගජ මිත්‍රයෙකි. තලගුලි වර්ණනා කරමින්, සිරි අයියා ඒ කාලයේ ලියා දුන් කවි පෙළක් මෙසේය:

සොඳුර නුඹෙ වරදයි
දරුවන්ට පණු ගායයි
පැණි රස කැවිලි ගෙයි
තිබුණ පළියට දීම නරකයි

පිතට ගුණ දේ යම්
වාතෙට අගුණ වේ නම්
තුනට වා පිත් සෙම්
ගුණැති කැමක් කොහෙන් සොයනෙම්?

පිය සොඳුර නොපැකිළි
කැමට සිතෙන යළි යළි
රස ගුණයෙන් උදුලි
ගන්න ජිනදාසගේ තලගුලි

අද පළවෙන වෙළඳ ප්‍රචාරක ගීත්, මේවාත් අතර කෙතරම් වෙනසක් තිබේද?

මා තවමත් නුවර යන එන විට, වරකාපොළ තලගුලි ජිනදාස මහත්මා හමු වී කතා කර යැමට අමතක කරන්නේ නැත. දැන් ඔහුගේ වයස අවුරුදු 95 ඉක්ම වී තිබුණත්, හොඳ සිහි කල්පනාවෙන් යුක්තය. ඔහු ද එක්තරා විධියක ජාතික ආයතනයක් නිසාත්, සාර්ථක දේශීය නිෂ්පාදනයක නිර්මාතෘවරයා නිසාත්, ඔහු ගැන එදා ලියැවී තුබුණු කවි කීපයක් මෙහි සටහන් කර තබමි:

නෙද විහිදෙන ජගත් රැවුලකින් හොබවන මුව   සිහිත්ත
ඇද නැති එඩිතර ගති ගුණයෙන් පිරිපුන් පපු   කැනැත්ත
රඳවා පෙම් සුවඳ දිදී මේ ආදර මල්   කිතිත්ත
වෙද වරදක් ඔබ පිළිබඳ මා මෙහි පැවසුවට   ඇත්ත

බත්දුල සෙනවියකු පරිද්දෙන් සූරු බුහුටිය   සූරය
අන්තිම ළදරුවකු වගේ බොළඳ ය   නිරහංකාරය
සිංහයකුගෙ එඩිය එහෙත් පපුවේ රජවුණු   වීරය
සිංහල ජාතියයි රටයි ඔබ වැනියන්ට ම   බාරය

කාගෙන් වත් උපුට නො ගෙන ව්‍යාපාරයක්   කරන්ට
මේ සිංහල රටට දුන්නෙ ඔබ ම ය පුලුවනි   කියන්ට
මානෙන් උඩඟුවෙන් එහෙත් ඉදි මුණ ගති නැත   පෙනෙන්ට
ආඩම්බරයකි! ඔබ වැනි වීරවරයො   සිහලුවන්ට!

කේ. ජී. ජිනදස මුදලාලි වැනි ධාර්මික, නිර්ලෝභී, ශාසනාලයැති දේශීය ව්‍යාපාරිකයෝ ද, අප ඉදිරියේ සිදුවන ගෝලීයකරණය නිසා නිෂ්පාදන වෙළඳ ලෝකයෙන් අතුරුදන් වෙමින් පවතිත්.



ඡායාරූප: 66
කේ. ජී. ජිනදාස (තලගුලි) මුදලාලි

22

මා දුටු පළමු විවාහ මංගල්‍යය

දවසක් සිරි අයියා කලවානේ වෙළදාම් කළ තරුණ වෙළඳ මහතෙකු සමඟ අපේ ගෙදරට පැමිණියේය. අප පුංචි වුණාට මේ පැමිණියේ අලුත් මස්සිනා කෙනෙක් බව තේරුම් ගැනීමට වැඩිහිටියන්ගේ කතා බස් නිසා අපට වැඩි වේලාවක් ගියේ නැත. අපේ අම්මා, තමාගේ පළමුවන බෑනා වෙන්ට යන වේරදූවගේ ගුණදාස ලියන මහත්මයාට නොකළ සැලකිල්ලක් නැත.

අවස්ථාවක් ලත් විට, අම්මාට විහිලුවක් කිරීමේ වරය අත් නො හරින තාත්තා, පාර පැත්ත බලා ගෙන වේවැල් පුටුවක වාඩි වී ඔවුන් ගියාට පසු අලුත් බෑනා ගැන මෙසේ කවියක් කියනවා මට මතකය.

"අලුත් පිටට බෑනා ගෙදර එන විට
මලුත් පුදා දුව කැඳවයි ඉදිරියට
පරණ වෙලා බෑණා ගෙදර එන විට
බලුත් නො වටී ය බෑනා නැන්දාට "

ඇහට නොදැනී තාත්තා මෙසේ කවියක් කියන විට අම්මා තාත්තා දෙසට අත දිගු කොට "අනේ මගේ කට....." කියා මඳ සිනාවක් පාමින් කුස්සිය ඇතුළට රිංගා ගනී. මේ සියල්ල බලා අපි විනෝද වීමු.

මේ අතර මේ කටයුත්තට ලොකු අක්කාගේ බලවත් අකැමැත්ත අම්මා හා වෙනත් ගෙදරට එන අය සමඟද ප්‍රකාශ වනු ඇසේ. ලොකු අක්කාගේ අකැමැත්ත, ගුණදාස අයියාගේ ඇඳුමට බව අප හැමෝටම පෙනිණි. ඔහු ඇන්දේ රෙද්ද හා කෝට් එකයි. ලොකු අක්කාද ගුණය තිබෙන්නේ ඇඳුමේ නොව, එය අඳින මිනිසාගේ බව තේරුම් ගත් නිසා දෝ, කලිසම්කාරයෙක් නොවූ ගුණදාස ලියන මහත්මයාට කැමති විය.

ඇත්ත වශයෙන්ම ගුණදාස අයියා (පසුව අප ඔහු ඇමතුයේ කලවානේ අයියා කියාය) හොඳ ගුණවත් සදාචාර සම්පන්න අවංක පුද්ගලයෙකි. කට්ටයෙක් නොවේ. සූරයෙකි. ඔහු වෙළඳාම් කළේ කලවානේ ඩබ්ලිව්. පියදාස සහ සහෝදරයෝ සමාගමේය. පියදාස

අයියා ඔහුගේ වැඩිමල් සොහොයුරාය. විවාහයට ප්‍රථමයෙන්ම කලවානේ අයියා වෙනම ඔහුගේ තොග වෙළඳ ව්‍යාපාරය කලවානේ කඩ පොළේම ආරම්භ කළේය.

ඡායාරූප: 67
කලවානේ අයියා හා ලොකු අක්කා

අපේ ලොකු අක්කා ඇසිලින් සුමිත්‍රා හා කලවානේ අයියා ඩබ්ලිව්. ගුණදාස අතර වූ විවාහ මංගලෝත්සවය සිදු වූයේ මැද්දෙකන්දේ අපේ තාවකාලික නිවාසයේදීය. අපේ ගෙදර පවුලේ සිදු වූ පළමුවන විවාහ මඟුල එයයි. ගෙදර ප්‍රතිසංස්කරණය කොට, අලුත් ඇඳුම් මසාගෙන, කිට්ටුම නෑ මිතුරන්ට පමණක් ඇරයුම් කොට මේ උත්සවයට, ලොකු – කුඩා අපි සියල්ලෝ සූදානම් වීමු.

අපේ අම්මාගේ පාර්ශවයෙන් කොළඹ සිට නෑදැයෝ රැසක්ම මංගල්‍යය සඳහා පැමිණියහ. තාත්තාගේ පාර්ශවයෙන් බාප්පොච්චිත්, නැන්දලා දෙදෙනාත්, සිරි අයියාත් පමණක් වූහ. කේ. එන්. සාමෙල් අයියාත් පැමිණ සිටියේය. නීත්‍යානුකූල අවශ්‍යතා හා සිරිත් විරිත් අවසන් කොට දිවා භෝජනය ද ගෙන, නව යුවල පින්තූර ගැනීම සඳහා බලංගොඩට ගියහ. අයියාත්, ඔවුන් සමඟ ගියේය. කෙසේ හෝ මේ පිරිස ආපසු ඒමට යම් ප්‍රමාදයක් වූයෙන්, අපේ කොළඹ නෑදැයෝ ඔවුන්ට ආපසු කොළඹ යෑමට ප්‍රමාද වන බව කියා අනවශ්‍ය කලබලයක් ඇති කළහ. කොට කේන්තිකාරියක් වූ අපේ අම්මා හා ඒ පෙළඹවීම උඩ තාත්තාද, පිරිස ආපසු ආ වහාම අයියාට දොස් කීහ.

අයියා ද ඉක්මණින් කේන්ති ගන්නා කෙනෙකි. නව යුවල පිටත්ව ගිය වහාම, අයියාද කෝට් එක දමාගෙන, කුඩය අතට ගෙන බිම බලාගෙන පාර අයින දිගේ වේගයෙන් පිටව ගියේය. පුංචි අප අයියාගේ පස්සෙන් ගොස් ඔහු නවත්වා ගැනීමට කළ ප්‍රයත්නය ව්‍යර්ථ විය. අයියා හොඳටම තරහ වී මැද්දෙකන්දෙන් පිටව ගියේය. ඊට පසු මාස ගණනක්ම ඔහු කළේ දෙමාපියන්ට සරදම් කරමින්, ලියුම්–

තැපැල්පත්වල කවි ලියා එවීමය. එයින් සමහර කවි මට මතක ය. එකක් 'විවාපත් සොහොයුරාට' යන නමින් කලවානේ අයියාට යැවූ කවි පෙළකි.

"සට කපට කමින් කාගේ වුවත් ඇස් උලුප්පා
ගැනුමෙ සමතියක් වූවොත් නුඹේ නාකි නැන්දා
නිතරම අඩුපාඩු කන්නලව් බස් දෙඩීමෙන්
නුඹගෙ මඩියටයි කොයි අන්දමින් මුත් අනින්නේ

රුපියල් දෙ දහක් ඇත්නම් අරන් කොන්තරත්තු
මසකට දහදාහක් ලාබ ගත්තැකි සත්තයි
හිතැති මෙ මගෙ බෑනෝ මා අතේ සල්ලියක් නෑ
නුඹෙ පිහිට නො ලද්දොත් සිද්ද වෙන්නේ වැරැද්දයි

මට හොඳ බැනරිස් සාරී එකක් - හැට්ටයක් හා
දිගටි හැඩයෙ අත් ඔර්ලෝසුවක් ගන්ට ඕනෑ
හිතැති මෙමගෙ අයියේ මා අතේ සල්ලියක් නෑ
හෙමි හෙමිහිට නැනා මුල්ලකින් මූණ දාවි"

අයියා අවුරුදු හතක්ම මේ නෝක්කඩුව තියා ගෙන සිටියේය. මේ කාලය තුළදී ලියුම් ගනුදෙනු කිරීම තුළින් අයියා සමඟ හාදකම් පැවැත්වූයේ මා සහ පුංචි අක්කා ලලතාය. දෙවැනි ලෝක මහා යුද්ධය නිම වී නැවත අප අපේ ගමට - උණවටුනට ගියාට පසු, අයියාගෙන් ලිපියක් ලැබිණි. මා නමට තිබූ ඒ ලියුම් කවරයේ ඇතුළේ තිබුණේ අයියාගේ පින්තූරයකි. එහි අනිත් පැත්තේ මේ කවිය ලියා තිබුණේය.

"සත් වසකට උඩදි
මැද්දෙකන්දේ ගෙදරදි
මවුපියන් බැණ වැදි
මෙන්න මේකා ව එළවන ලදි"

මේ කවිය නැන්දලා දෙදෙනාට හා අම්මාට ඇසෙන පරිදි මම හඬ නගා කියවීමි. ඔවුහු සියලු දෙනාම ඇඬූහ. මම හැරෙන තැපෑලෙන් අයියාට පිළිතුරු ලිපියක් එක කවියකින් ලියා යැවීමි. එය මෙසේය.

"සත් වසකට උඩදි
දුටු සිය පුතුගෙ මන බැඳි
පිළිරුව මව ද නැදි
තිදෙන කඳුලින් වැළඳගනු ලදි"

මේ කවිය පුදුම බල ඇති සෙත් කවියක් මෙන් විය. එය කිය වූ වහාම, අයියා ඊළඟ බසයේ නැගී වේයන්ගොඩ සිට උණුවටුනට පැමිණියේය. එදා අපට මගුල් ගෙයක් මෙන් විය.

අයියා හරිම විහිලුකාරයෙකි. දිනක් ඔහුගේ මිතුරකුට අයත් වැස්සියකට පැටවෙකු ලැබුණු විත්තිය අයියා ඔහුට කියා ඇරියේ මේ ගීයෙනි.

"පිප්පේ වගේ බඩ තිබූ ඔබ ගේ සුරුපී
කේප්පී මහත්මිය දුවක් වැදුවාය ඊයේ
වල්ගේ සුදුයි බඩ කලුයි තමුසේ වගේමයි
ආවොත් හොඳයි දැක ගැනීමට දෝණියැන්දා!"

හුඟ කලක් අනුරාධපුර නැවතී භාවනා කළ අයියා අසනීප විය. ඔහු අපේ මරදනේ ගෙදරට වුත්, මා සමඟ ගොස් මහ රෝහලට ඇතුලු විය. දවසක් සවස මා අයියා බැලීමට ගිය විට, හති දමමින් – එහෙත් සිනාසෙමින් එදා රෑ ඔහු අපෙන් සමු ගන්නා බව කීය. ඔහුගේ අවසන් කටයුතු කිසිවෙකුට නොදන්වා නිම කොට, පසුව නෑදෑ හිතවතුන්ට දැන්වීමට ද මා පොරොන්දු කර ගත්තේය. එදා රාත්‍රී මම කොළඹ හෝටලයක නාලන්දා ආදි ශිෂ්‍යයින් විසින් සංවිධානය කර තිබූ මෛත්‍රීපාල සේනානායක මහතාගේ උපහාර උළෙලකට සහභාගි වෙමින් සිටියෙමි. අයියා අවසන් හුස්ම හෙලූ බව, එතැනට පැමිණි අපේ රියැදුරු පියදාස අයියා මට දැන්වීය. වහාම රෝහලට ගොස් දේහය එළියට ගැනීමට කටයුතු සලස්වා, පසු දිනම කනත්ත සුසාන භූමියේදී සංඝයා වහන්සේලා වඩමවා, පවුලේ අය පමණක් සහභාගිව අවසන් කටයුතු නිම කළෙමි. අයියා ද තනිකඩයෙක් වූ නිසා, අපේ ලොකු තාත්තාගේ පරපුර ද එතැනින් අවසන් විය.

කලවානේ අයියා තම තොග වෙළඳ ව්‍යාපාරය ගෙන ගිය අතර, අක්කා කුකුලු කෝරළයේ උප්පැන්න හා විවාහ රෙජිස්ට්‍රාර්වරිය හැටියට බොහෝ කලක් සේවය කළාය. පසුව ඔවුන් ළමයින්ද සමග හබරාදුවට පදිංචියට ආ අතර, අක්කා උණුවටුන ශ්‍රී සුමනජෝති විදුහලේ ගුරුවරියක් වශයෙන් විශ්‍රාම ගන්නා තුරු සේවය කළාය. මෙම විදුහල ගොඩනංවා රජයට බාරදීමට කේ. එම්. සියනේරිස් මුදලාලි මහතා උනන්දු කොට – මහන්සි වී කටයුතු කළේ ලොකු අක්කාය.

23

පුංචි අක්කා ආනන්ද බාලිකාවට මා බොනවිස්ටාවට

ජායාරූප: 68

පුංචි අක්කා ලලනා සහ සුජාතා කුමාරසිංහ මෙනෙවිය

ලොකු අක්කාගේ විවාහ මංගල්‍යය සිදු වී ගෙන යන අතර තවත් කපුකමක් සිදු විය. එනම් මගේ පුංචි අක්කා ලලනා, කොළඹ ආනන්ද බාලිකා විද්‍යාලයට ඇතුළු කිරීමට තීරණය කිරීමයි. මරදානේ, කුප්පියාවත්තේ, පන්සල් පාරේ, අංක 125 දරණ ස්ථානයේ, ඒ කාලයේ අපේ අම්මාගේ දෙවැනි නංගී, අපේ බාලම්මා, පදිංචිව සිටියාය. ඇය විවාහ වී සිටියේ පිට කොටුවේ එළවලු මාර්කට් එකේ ප්‍රසිද්ධ මුදලාලි කෙනෙක් වූ එමානිස් අප්පු මුදලාලි සමඟය. මේ ජෝඩුව පුංචි අක්කා කොළඹ ඉස්කෝලේට දමා, ඉංගිරිසි අධ්‍යාපනය දීමේ වැදගත්කම අවබෝධ කර දුන්නෙන්, සියලු දෙනාම ඊට එකඟ වූහ. ඇය පරදවා කණිෂ්ඨ විභාගයෙන් මා මුලින් සමත්වීමද, පුංචි අක්කා කොළඹට සංක්‍රමණය වීමට වැදගත් හේතුවක් විය. පුංචි අක්කා ආනන්ද බාලිකාවට ඇතුළුවීමට ගියේ ජයග්‍රාහී ලීලාවෙනි. පුංචි මට දැන් මෙය අභියෝගයෙකි.

පුංචි අක්කාට වඩා හරියටම අවුරුදු තුනක් බාල වූ මා, කණිෂ්ඨ විභාගයෙන් සමත් වූයේ ඇයට පෙරය. ඇය සමත් වූයේ ප්‍රශ්න පත්‍ර නැවත බැලීමෙන් පසුව නිසාය. හැරත්, මම පවුලේ වැඩිමල් පිරිමියා වෙමි. ඉතින් ඉංගිරිසි අධ්‍යාපනය ලැබිය යුත්තේ අක්කාට වඩා මා නො වේද? අක්කා කොළඹට ගියාට පසු මේ අදහස මට පමණක් නොව, වැඩිහිටියන්ටත් අවබෝධ විය. කෙසේ හෝ අක්කාට පෙර මම ඉංගිරිසි එස්.එස්.සී. පාස් කළ යුතුය.

මැද්දෙකන්දේ පාසලේ ජ්‍යෝෂ්ඨය සඳහා ඉගෙනීම අරඹා තිබූ නමුත්, මගේ හිත දැන් ගමේය. අක්කා කොළඹ ගිය නිසා මා ගාල්ලට යා යුතුය. පළමුවෙන් බොනවිස්ටාවට ඇතුලු වී, පසුව මහින්ද විද්‍යාලයට ඇතුලුවීම මගේ සිහිනය විය.

දැන් සියනේරිස් මුදලාලිත් සමඟ තාත්තා ඇයි හොඳයි කම් නැවත පවත්වයි. මේ නිසා මුදලාලි ගමේ යන විටක දිනක් මම ද ගෙදරින් අවසර ගෙන, ඔහුගේ රියෙන් උණවටුනට ගියෙමි. රාත්‍රි මුදලාලිගේ වලව්වේ නිදාගෙන මුදලාලි හාමිනේ, තංගල්ලේ කුඩම්මා නමින් අප හැඳින් වූ සොපායා සමරවීර මැතිනිය, හදා දුන් රට කැකුලු හාලේ කිරිබත් කා මම උදේ ගෙදර ගියෙමි. ඒ කාලෙ ගෙදර බලා ගෙන සිටියේ රොසි අක්කා ය. සියනේරිස් බාප්පා ආපසු ඕපනායක යන තෙක් මම ගෙදර නැවතී සිටියෙමි.

මේ 1943 මාර්තු හරියේය. අපේ ගෙදරට ඉදිරිපස ගෙදර සිටි විලියම් සිංකෝ බාප්පාගේ පුතා, ලයනල් අයියා ගැන මීට පෙර මම සඳහන් කෙළෙමි. ලයනල් ඒ කාලේ ඉගෙන ගත්තේ බොනවිස්ටාවේය. ලයනල් සමඟ බොනවිස්ටා විදුහලට ගිය මම විදුහල්පති ඩී. එම්. ඩබ්ලිව්. වීරසිංහ මැතිතුමා හමුව මට පාසලට ඇතුලුවීමට පුලුවන් දැයි ඇසීමි. ඇතුලු විය යුතු පන්තියත් – ගෙවිය යුතු පාසල් ගාස්තුවත්, පිරවිය යුතු පෝරමයත් ආදී සියලු විස්තර එතුමා මට දුන්නේය. ආපසු මැද්දෙකන්දට ගොස් අස්වීම් සහතික ආදී සියලුම ලියකියවිලි රැගෙන එන බව කියා, මම සතුටු සිතින් ලයනල් සමඟ ආපසු ගෙදර ගියෙමි.

මට මතක හැටියට සිංහල අවුරුද්ද කා නිම වූ හැටියේම, මම නැන්දලා දෙදෙනාත් සමඟ උණවටුනේ පදිංචියට පැමිණියෙමි. මගේ පෙර යොවුන් විය ඇරඹුණු – ගෙවුණු මැද කඳු ජීවිතය අතහැර ඒම ඉතා අමාරු තීරණයක් වුවත්, ඉංගිරිසි පාසලකට බැඳී ඉහළට ඉගෙන ගැනීමේ ආශාව නිසාත්, අක්කා අනුකරණය කරන්ට යෑම නිසාත්, එය එතරම් අපහසු කාරියක් නොවීය.

ලයනල් යන විටම ඔහු සමඟ මම පාසලට ගියෙමි. ඒ කාලයේ පාසල හැඳින් වූයේ මට මතක හැටියට බොනවිස්ටා ජ්‍යෝෂ්ඨ පිරිමි ඉංගිරිසි පාසල යනුවෙනි. මා ඉස්කෝල ගාස්තු ගෙවා ඇතුලු වූයේ ඒ කාලයේ 'ස්පෙෂල් වන්' යන නමින් හැඳින් වූ පන්තියටය. පන්තියේ ගුරුවරයා වූයේ මිස් අමරසිංහ නම් වූ මැදි වියේ කාන්තාවකි. සියලුම පාඩම් ඉගැන්වූයේ ඉංගිරිසියෙනි. මා සිංහල කණිෂ්ඨය සමත් වී සිටි

නිසා, මට සෑම විෂයයක්ම ඉතා පහසු විය. මට ඉගෙන ගැනීමට තිබුණේ ඉංගිරිසි භාෂාව පමණෙකි.

ඒ කාලයේ බොනවිස්ටාව තිබුණේ ඕපාතවත්ත නැමැති ස්ථානයකය. එරමුදු ගහ ළඟ රේල් ගේට්ටුව පසු කොට කලහෙ පැත්තට සැතපුම් භාගයක් පමණ යන විට තිබූ පැරණි ගොඩනැගිල්ලක සහ තාවකාලික ගොඩනැගිලිවල පන්ති පැවැත්වුණේය. ඩී.එම්.ඩබ්ලිව්. වීරසිංහ මහතා විදුහල්පති වශයෙන් සේවය කළේය. ඒ මහතා සියලු ගමන් බිමන් කළේ බයිසිකලයෙනි. සුදු හීන්දෑරි මිටි කාන්තාවක් වූ වීරසිංහ මැතිනිය ද චිත්‍ර ගුරුවරියක් වශයෙන් සේවය කළා මට මතකය.

යුද්ධ කටයුතු සඳහා රජය විසින් අත්පත් කරගෙන තිබූ නියම බොනවිස්ටා ගොඩනැගිලි ලැබුණේ පසුවය. ඕපාතවත්තේ සිට නැවත පැරණි තැනට පාසල මාරු කරනවා මට මතකය. විනෝදයෙන් ඩෙස්ක් බංකු ආදිය පාසලේ සිට බොනවිස්ටා කන්දට ගෙන යෑමට ලොරියට පටවන විට, කොලු අපි සැහෙන්න විනෝදයෙන් එය කළෙමු. එවකට එහි සිටි සැර ගුරුවරයකු හැටියට අප සැලකූ මානවඩු මහතා එක දිගට වේවැල් පාරවල් ගසාගෙන එන විට, මගේ පිටට ද පාරක් වැදුනේය. ඒ මා ජීවිතයේ ලබපු එකම වේවැල් පාර නිසා මට එය හොඳට මතකය. පසු කලෙක ඒ විදුහලේම අප දෙදෙනා ගුරුවරුන් හැටියට වැඩ කරන විට මේ සිද්ධිය මතක් කොට විනෝද වීමු.

"ස්පේෂල් වන්" පන්තියේ සිට "ස්පෙෂල් ටූ" පන්තියට ඊළඟ වාරයේදී මට යෑමට පිළිවන් විය. මෙහිදී මගේ මතකයේ හොඳට තිබෙන ගුරුවරයෙක් නම් ජෙරල්ඩ් ද අල්විස් මහතාය. රිච්මන්ඩ් විදුහලේ ඉගෙනීම තිම කොට, ඔහු බොනවිස්ටාවේ ගුරුවරයෙකු හැටියට සේවය කළේය. බොහෝ අවස්ථාවලදී අල්විස් මහතාගේ ගෙදරට ද අප ගොස් තිබේ. පසුව ඔහු සමාජ සේවා නිලධාරියෙක් වූ බව මට මතකයි.

බොනවිස්ටා කන්දේ පැරණි ගොඩනැගිලිවලට නැවත පාසල ගෙන ගිය පසු, එහි වැඩි කලක් මට ඉගෙන ගැනීමට අවස්ථාව නො ලැබුණේ මා මහින්ද විද්‍යාලයට ඇතුල් වූ නිසාය.

24
ගාල්ලේ මහින්ද විද්‍යාලය


ඡායාරූප: 69
ඊ. ඒ. විජේසූරිය මැතිතුමා

ඒ කාලයේ නිතර ම අපේ ගෙදරට ආ අමුත්තෙක් වූයේ කේ. ඩබ්. ජේ. කරුණාරත්න මහතාය. ඔහුට අප ආමන්ත්‍රණය කළේ තල්පේ මාමා කියාය. තල්පේ මාමා සේවය කළේ ගාල්ලේ කොටුවේ පිස්කල් කාර්යාලයේ, ඩී.පී. දලුවත්ත මහතා යටතේ ය. මහින්ද විද්‍යාලයට ළමයින් ඇතුලු කිරීම පිළිබඳ පෝරම කොළයක් ගෙනවිත් දී බාරකාරයා හැටියට අත්සන් කොට ඇතුලු වීමේ විභාගයට මා ඇතුළත් කළේ තල්පේ මාමාය.

මම විභාගයට ඉතා හොඳින් උත්තර ලීවෙමි. ප්‍රතිඵල බැලීමට ගිය විට මහින්ද විද්‍යාලයයාධිපති ඊ.ඒ. විජේසූරිය මැතිතුමා මා සමඟ කීවේ මා විභාගයෙන් මුල් තැනට සමත් වී ඇති බවය.

ගාල්ලේ මහින්ද විද්‍යාලයයට ඇතුලුවීම මගේ සිහිනයක් සැබෑ වීමකි. 1946 ජනවාරි මාසයේය, මා මහින්දයට ඇතුලු වූයේ. පන්තිය හයවැනි පන්තිය හෙවත් "ෆෝම් වන් – ඒ" පන්තියයි. මට මතක තිබෙන හැටියට කටුකුරුන්දේ ධාර්මික විදුහලේ අධිපතිව සිටි අභයවර්ධන මහතාගේ පුතුන් දෙදෙනෙකු වූ පියධීර අභයවර්ධන සහ ඩී. එන්. අභයවර්ධන යන ළමයින් දෙදෙනා ද, හම්බන්තොට සිට පැමිණි විල්සන් දේවසිරිනාරායන යන ළමයා ද මා සමඟ එකම දිනයේදී මහින්දයේ එකම පන්තියට ඇතුලු වූ තවත් ළමයි තිදෙනෙකි.

අප පන්තියේ සිටි තවත් ළමයින් අතර සමාජ සේවා ඇමතිවරයකුව සිටි, ඩී. එස්. ගුණසේකර මහතාගේ පුත්, වෛද්‍ය සනත් මහානාම ගුණසේකර, වෛද්‍ය උදයපාල ද සිල්වා, මහාචාර්ය ජේ. කේ. පී. ආරියරත්න, මහාචාර්ය ධර්මසේන ද සිල්වා, දැනට කටුකුරුන්ද

ඡායාරූප: 70 – මහින්ද විද්‍යාලය

පොලිස් විද්‍යාලයයේ අධිපති පොලිස් අධිකාරි විමලසේන ද සිල්වා, සෝමසිරි අඹවත්ත, පසු කලෙක ඇමතිවරයකු වූ රූපා කරුණාතිලක මහතා, සුප්‍රසිද්ධ නාට්‍ය ශිල්පී ජී. ඩබ්ලිව්. සුරේන්ද්‍ර, අම්බලන්ගොඩ නගර සභාපති ජී. එම්. සුමනතිලක ද සිල්වා ආදී අය ද වූහ.



ඡායාරූප: 71
මහින්ද නියෝජ්‍ය විදුහල්පතිව සිටි මගේ ආචාර්ය පීටර් දන්තනාරායන මහතා

අපේ ගෙදර ගාලු නගරයට සැතැපුම් හතරක් ඔබ්බෙහි පිහිටා තිබුණත්, මේ පාසලේ ළමයින් හා සිතන විට මම හද්ද පිටිසර ගොඩයෙක්මි යන හැඟීම මට තිබුණේය. ඔවුන් ඇඳ සිටියේ අලුත්ම මෝස්තරයට නගරයේ මැහුම් සාප්පුවල මහන ලද වටිනා ඇඳුම්ය. පැළඳ සිටියේ දිලිසෙන තරමට ඔප දමන ලද මුලු පාදයම වැසෙන සපත්තුය. සියලු දෙනාම වාගේ කථා කළේ ඉංගිරිසි භාෂාවය. බොහෝ දෙනකුගේ ගෙදර දොරවලද කතා කළේ ඉංගිරිසි භාෂාව බවත්, ඇන්දේ යුරෝපීය ඇඳුම බවත් මට හැඟිණි. මේ සියල්ලම නිසා එක්තරා විධියක හීන මානයක් මට ඇති විය. එහෙත් අභයවර්ධන ළමයින් දෙපළ ද, මා වාගේම වූ නිසා මේ හැඟීම බොහෝ දුරට යටපත් කර ගැනීමට මට හැකි විය.

"ෆෝම් වන්" ශ්‍රේණිය භාර ගුරුවරයා ඒ.ඩී.එස්. ජයවර්ධන මහතා විය. එතුමා ඇඳ සිටියේ මහින්ද විද්‍යාලයයීය වර්ණය තිබූ කරපටියක්

සහිත තනි සුදු යුරෝපීය ඇඳුම් කට්ටලයකි. සුදු පාට තරබාරු මිටි පුද්ගලයකු වූ ජයවර්ධන මහතා එවකට මැදි වියේ පසුවූයේ යයි සිතිය හැකිය. බැලූ බැල්මටම ඉතා සැර රෞද්‍ර පුද්ගලයෙකු මෙන් පෙනුණත් මා එතුමා ගෙන් ඉගෙන ගත් පළමු දිනයේ ම තීරණය කළේ, එතුමා ගුරුවරයෙකු සතු නියම ගුණාංග තිබෙන ශ්‍රේෂ්ඨ මහත්මයෙක් බවය.



ඡායාරූප: 72
ජේ. ඩී. එස්. ජයවර්ධන මැතිතුමා

හා පුරා කියා පන්තියට ආ අවස්ථාවේ දී "ගුඩ් මෝනිං" කියා අපගේ ශුභාශිංසනය පිළිගත් එතුමා අප තිස් දෙනා දෙස පිළිවෙළින් බැලීමට ගත්තේ මිනිත්තු කීපයකි. රටහුණු කැල්ල අතට ගත් එතුමා ඉතා ලස්සන අකුරින් පන්තියේ නමත් – දිනයත් කලු ලෑල්ලේ ලීවේය. එක් එක් ළමයාට තමාගේ නම සහ ගම කියන මෙන් ඉංගිරිසියෙන් පැවසීය. එයින් එක් ළමයෙක්, "අයි කම් ෆ්‍රොම් හැම්බැන්ටෝට්" යනුවෙන් උත්තර දුන්නා මට මතකය. එවිට සිංහලෙන් කථා කළ ජයවර්ධන මහතා "හැම්බැන්ටොට් නෙමෙයි, බූරුවෝ, හම්බන්තොට" කියා ඔහුව නිවරද කළා මට මතකය. එදා සිට අද වන තුරු ඉංගිරිසියෙන් කතා කළත්, සිංහල නගරවල නම් – සිංහලෙන්ම ශබ්ද කිරීම මම සිරිතක් කර ගතිමි.

මහින්ද විද්‍යාලයයේ ඉගෙන ගත්තා ශිෂ්‍යයින්ට ජීවිතයේ අමතක නොවන අත්දැකීමක් මෙන්ම, පුහුණුවක්ද ලැබෙන්නේ උදෑසන පැවැත්වෙන රැස්වීමෙනි. මෙය පැවැත්වෙන්නේ ඕල්කොට් ශාලාවේය. පළමුවන සීනුව නාදවන විට හය "ඒ" (ෆෝම් වන්) වල සිසුන් ගෙන් පටන් ගෙන, පිළිවෙළින් ඒ, බී, සී, ඩී පන්තිවල සිසුහු ද, හත්වන, අටවන, නවවන, දහවන, විශ්ව විද්‍යාල ප්‍රවේශ එක සහ දෙකේ සිසුන් ද අනුපිළිවෙළින් පේළියට විත් ඉදිරි ආසනවල සිට පිටුපසට වාඩි වෙති. ඊළඟට පැමිණෙන්නේ ශිෂ්‍ය නායකයෝය. ඔවුහු ඉදිරි පෙළ අසුන්වල වාඩි ගනිති. මීළඟට ගුරු මණ්ඩලය පැමිණ වේදිකාවේ පුටුවල වාඩි වෙති.

දෙවැනි සීනුව ශබ්ද වේ. "ටක් ටක්, ටක් ටක්, ටක් ටක්," යනුවෙන් කාර්යාලයේ සිට විදුහල්පති තුමා පැමිණෙන අඩි ශබ්දය දැන් අපට ඇසේ. අඩි ශබ්දය ළංවත්ම, මුලු ශාලාවම නිශ්ශබ්දය. දැන් සිසුන් අතරින් ශාලාව මැදින් විදුහල්පතිතුමා වේදිකාව බලා ගමන් කරයි. එතුමා පඩි පෙළ නැග, තිල්පාට විල්ලුද කවරයක් එළා තිබෙන මේසය ඉදිරි පසට ගොස් ශිෂ්‍යයන් පැත්තට හැරෙයි. එවිට සියලුම ගුරුවරු හා ශිෂ්‍යයෝ නැගිට එතුමාට දැත් එකතු කොට ආචාර කර, නැවත වාඩි වෙති. විදුහල්පති තුමාද වාඩි වෙයි. ශාලාව දෙස හොඳින් බලා නැගිට දැත් එකතු කොට පන්සිල් ගැනීමට සංඥාව දෙන විට, ශිෂ්‍යයෝ ද නැගිට පන්සිල් සමාදන් වෙති. විදුහල්පති එඩ්ගාර් විජේසූරිය මැතිතුමා ශබ්ද නගා පන්සිල් ගැනීම නිතරම කළේය. අපිදු එය අනුකරණය කළෙමු.

විදුහල්පති තුමාගේ කෙටි දෙසුමකි. යම් දැනුම් දීම් තිබුණේ නම් ඒවා කියවූයේ ද මෙතැනදීය. හැම වචනයක්ම හොඳින් උච්චාරණය කිරීමත්, ඉතා සරල නිවැරදි ඉංගිරිසියෙන් අපට යමක් ඉගෙනීමට හැකි වන පරිදි කතා කිරීමත්, එතුමාගේ ලක්ෂණයක් විය.

රැස්වීම අවසානයේ දී විදුහල්පතිතුමා "ප්‍රි ෆෙක්ට්ස්" කියන විට ශිෂ්‍ය නායකයෝ නැගිට ආචාර කොට පිටත්ව යති. "ෆෝම් වන්" කියන විට හයවැනි පන්තිවල ළමයි නැගිටිති. ආචාර කරති. පේළියට තම පන්තිවලට යති. ඒ අන්දමට සියලු ම පන්තිවල ශිෂ්‍යයෝ පිටව යති. අවසනට ගුරුවරු හා විදුහල්පතිතුමා වේදිකාවෙන් බැස පිටව යති. මහින්ද විද්‍යාලයයේ උදෑසන රැස්වීම, පන්ති කාමරය තුළ ඉගෙන ගත් දේ තරමට ම මගේ ජීවිතයට බලපෑවේය.

හයවැනි පන්තිය ඉතා වැදගත් අධ්‍යයන කේන්ද්‍රස්ථානයකි. මුල් අවුරුදු පහේ දී අධ්‍යාපනය සඳහා අවශ්‍ය මූලික හැඩගැස්ම ලබා ගෙන, විචක්ෂණාක්ෂියෙන් යුතුව දැනීම සොයා යෑමට ශිෂ්‍යයකු පෙළඹෙන්නේ මේ පෙර යොවුන් වියේදී ය. මේ අවධියේ දී ඒ.ඩී.එස්. ජයවර්ධන ගුරුතුමා යටතට වැටුණු අපි හරිම වාසනාවන්තයෝ වීමු. එතුමා අපේ පන්තියේ ගුරුවරයා වූවා පමණක් නොව, අපට ඉංගිරිසි භාෂාව, ඉංගිරිසි සාහිත්‍යය, අංක ගණිතය, වීජ ගණිතය, රේඛා ගණිතය ආදී විෂයයන් රැසක් ම ඉගැන්වූයේත් එතුමා ය. මේ නිසා අප එකිනෙකා ගැන පෞද්ගලික ව දැනගෙන මඟ පෙන්වීමට එතුමාට හැකියාවක් තිබුණේය.

මට මතක හැටියට අපට හයවැනි පන්තියේ දී විෂය දහහතරක්

ඉගෙන ගැනීමට තිබිණි. ඒවා නම් බුද්ධ ධර්මය, ඉංගිරිසි භාෂාව, ඉංගිරිසි සාහිත්‍යය, ඉංගිරිසි කියවන විට ලිවීම, සිංහල භාෂාව, සිංහල සාහිත්‍යය, පාලි භාෂාව, අංක ගණිතය, වීජ ගණිතය, රේඛා ගණිතය, සාමාන්‍ය විද්‍යාව, ඉතිහාසය, භූගෝලය, චිත්‍ර ශිල්පය යන විෂයයන් ය. අපට විවිධ විෂයයන් ඉගැන්වූ සමහර ගුරුවරුන් මට මතකය. සිංහල භාෂාව ඉගැන්වූයේ ජොනී ජයවික්‍රම මහතා සහ ජී. ඒ. එච්. ඊ. එස් ද සිල්වා මහතාය. බුද්ධාගම ඉගැන්වූයේ විල්මට් සිල්වා මහතාය. භූගෝලය ඉගැන්වූයේ මේජර් සයිමන් විජේරත්නය.



ඡායාරූප: 73
මහින්ද විදුහල්පතිව සිටි
ජේ. එච්. ගුණසේකර මහතා

පාලි භාෂාව යූ.ජී. හැන්ඩි මහතා විසින් ද, චිත්‍ර ශිල්පය ඩබ්ලිව්. එස්. ද මැල් මහතා විසින් ද ඉගැන්විණි. සාමාන්‍ය විද්‍යාව ඉගැන්වූයේ ඊ.ආර්. ද සිල්වා නැමැති ගුරුවරයෙකි.

පළමුවන වාර අවසානයේ විභාගයේ ප්‍රතිඵල එනවිට සියයට 85 –කටත් වඩා සාමාන්‍යයක් ගෙන මම පන්තියේ පළමුවැනියා වීමි. මා ළඟට දෙවැනියා වූ ළමයාට වඩා මම වැඩි ලකුණු සියයකටත් වඩා ගෙන තිබිණි. මේ නිසා එකවරම මට පන්තියේ පිළිගැනීමක් ලැබිණි. අපේ පන්තියේ ගැහැනු ළමයි කීප දෙනෙක්ද සිටියහ. මා හිතන හැටියට ඔවුහු ගුරුවරුන්ගේ ළමයි වූහ. ඉදිරි අසුන්වල වාඩි වී සිටියවුන්ගෙන් විදුහල්පතිතුමා ගේ දෙටු දියණි මෝහිනී විජේසූරිය, තිලකා හා කරුණා අබේසිරිවර්ධන සොයුරියන්, මැල්වරීන් ආදී ගැහැනු ළමයින්ගේ නම් මට මතකය. මට ද ඉදිරි පෙළේ අසුනක් ලැබී තිබුණේ විනය ගරුක ළමයකු හැටියටය.

පන්තියේ පළමුවැනියා වූ ළමයින්ගේ වාර්තා පොත් දෙන්නේ ඕල්කට් ශාලාවේ වාරාවසානයේ දී තිවාඩු දීමට ප්‍රථම පවත්වන රැස්වීමේ දී විදුහල්පති තුමා අතිනි. සියලුම පන්තිවලින් වැඩිම සාමාන්‍යය ගන්නා ළමයාගේ වාර්තාව, ඉතා විශිෂ්ට වාර්තාව, විදුහල්පති තුමා අතින් පිරිනමන්නේ අන්තිමටයි. එවිට වේදිකාවට යන තුරුත් වාර්තාව බාරගෙන ආපසු වුත්, මා අසුනේ වාඩිවන තුරුත් ළමයි අත් පොළසන් දෙති. මා පළමු වාරයේදීම, මුළු පාසලේම ඉතා විශිෂ්ට ලකුණු ගත් ශිෂ්‍යයා වීම නිසා, එතෙක් මා තුළ තිබූ හීන මානය දුරු



ජායාරූපː 74 – 1951 මහින්ද විද්‍යාලයේ ගුරු මණ්ඩලය

වූවා පමණක් නොව ඕනෑම ළමයෙක් සමඟ මටත් ඉංගිරිසියෙන් ඉගෙන ගැනීමටත්, කතා කිරීමටත් හැකියාව තිබෙන බව ද ප්‍රත්‍යක්ෂ විය.

හත්වැනි පන්තිය භාර අපේ ගුරුවරයා වූයේ එම්.එස්. ජයවික්‍රම මහතා යි. එතුමා විසින් මා අමතනු ලැබුවේ “පුතා හෝ ටියුඩර් හෝ ඒ.ටී.” කියා ය. ජයවික්‍රම මහතා ගැන මට විශේෂයෙන් මතක් වන්නේ එතුමා ඉංගිරිසි ඉගැන්වූ ආකාරයයි. එක පාඩමක් ඉවර කොට තවත් පාඩමකට ගොස්, පොත ඉගෙන ගෙන ඉවර කිරීමට අපට තිබුණු හදිස්සිය එතුමාට තිබුණේ නැත. සමහර විට මුලු වාරයටම එතුමා ඉගැන්වූයේ පාඩම් හතර පහකි. එක පාඩමක් සඳහා දින ගණනක්ම ගත කළේය. බොහෝ විට අප කල්පනා කළේ එතුමා විහිලු තහලු කරමින් කාලය ගත කරන බවකි. එහෙත් පසුව ගුරුවරයකු වශයෙන් සේවය කරන විට මට එතුමාගේ ඉගැන්වීමේ ක්‍රමයේ අගය තේරුණි. ඔහු ඉගැන්වූයේ ළමයාටය. විෂය නොවේ. විෂය ඉබේම ඉගැන්විණි.

අටවැනි පන්තියේ අපේ පන්ති භාර ගුරුවරයා වූයේ කැඩෙට් හමුදාවේ මේජර්වරයකු වූ සයිමන් විජයරත්න මහතාය. පන්තියේ පුස්තකාලයක් සකස් කිරීම එතුමා මට පවරා තිබුණේය. එකතු කළ හැම පොතක්ම මම ද කියවීමි. දිනපතා නින්දට යෑමට පෙර පාසලේ විෂයයනට සම්බන්ධ නො වූ යම් පොතක්, පැය භාගයක් වත් කියවිය යුතුය යනුවෙන් එතුමා වරක් අපට පැවසීය. ඒ පුරුද්ද අදත් නො කඩවා මගෙන් සිදු වේ.

ඡායාරූප: 75
මේජර් සයිමන් විජේරත්න



ඡායාරූප: 76
මහාචාර්ය විනී විතාරණ

නව වැනි පන්තියේදී පළමු වාරයේ අපේ පන්ති භාර ගුරුවරයා වූයේ සිව රාම ක්‍රිෂ්ණන් නැමැති කේරළ ජාතික ගුරුවරයෙකි. දෙවැනි තුන්වැනි වාරවල අපේ පන්ති භාරය ඉසිලුයේ විනී විතාරණ මහතාය. තරුණ ගුරුවරයකු වූ මෙතුමා, අප හා ආශ්‍රය කළේ මිත්‍රයකු මෙනි. අප සමඟ ක්‍රීඩා කිරීමට, විනෝද ගමන් යෑමට, අධ්‍යයන හා වන්දනා ගමන් යෑමට නිතරම විනී විතාරණ මහතා එක් විය. සඟරා හා පත්‍රවලට ලිපි ලිවීමට ඒ කාලයේ විනී විතාරණ මහතා මට ධෛර්යය දුන්නේය.

දහවැනි ශ්‍රේණියේ අපේ පන්ති භාර ගුරුවරයා වූයේ යූ.ජී. හැන්ඩි මහතා ය. එතුමා පන්තියේ ඉගැන් වූ එක ම විෂය බුද්ධ ධර්මයයි.

උසස් පන්තිවලට ඉගැන්වූ අපට ගුරුහරුකම් දුන් පෙර'පර භාෂා පිළිබඳ ලංකාවේ සිටි අද්විතීය පඬිවරයෙක් වූ චාරුලස් ද සිල්වා ගුරුතුමා ද මගේ මතකයට නැගේ.

ඊ. එස්. ජයවික්‍රම ගුරුතුමා වරක් මට අංක ගණිතය, රේඛා ගණිතය හා වීජ ගණිතයට ලකුණු සියයට සීය බැගින් ම දුන්නේය. ළමයෙක් මේ ගැන ප්‍රශ්න කළ විට එතුමා 100 න් 108 ක් දී මගේ ලකුණු ගණන උපරිමයටත් වඩා වැඩි කළේය.

අසනීපයෙන් සිටි වරක් හෝ දෙවරක් හෝ හැර අන් හැම වාරාවසාන විභාගයකදීම මම පන්තියේ පළමුවැනියා වීමි. බොහෝ විට විශිෂ්ට වාර්තාවද මගේ විය. සෑම තෑගි ප්‍රදානෝත්සවයකදීම පන්ති තෑග්ග ඇතුලු තෑගි කීපයක්ම දිනා ගතිමි.

ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් පළමු වන පන්තියේ සාමාර්ථයක්ද ලබා ගෙන මා ඉතා හොඳින් අධ්‍යාපන කටයුතු ගෙන



ඡායාරූප: 77 – 1951 ක්‍රිකට් කණ්ඩායම

ගියත්, ඉන්පසු විශ්ව විද්‍යාල ප්‍රවේශ පන්තියේ මා ගත කළ දෙ වසර එතරම් සතුටු දායක නොවීය. මෙයට හේතු කීපයකම තිබිණි. එකක් ගෙදර පරිසරයයි. දෙවැන්න පාසලේ පරිසරයයි.

මා අධ්‍යාපන කටයුතු හොඳින් කළ අතර, පාසලේ මෙන්ම ගමේද සියලු ම බාහිර කටයුතුවලට ද සහභාගි වුණෙමි. ක්‍රිකට් ක්‍රීඩාවට ආශා කළ මම, විද්‍යාලයයේ ක්‍රිකට් කණ්ඩායමේ සාමාජිකයෙක් වීමි. රිච්මන්ඩ් – මහින්ද තරඟයට ක්‍රීඩා කිරීමට අවස්ථාව නොලැබුණත්, අතිරේක ක්‍රීඩකයෙකු වශයෙන් සිටියෙමි. එවකට නාලන්දා කණ්ඩායමේ නායකව සිටි පසුව ශ්‍රේෂ්ඨ ජාතික ක්‍රීඩකයකු වූ ස්ටැන්ලි ජයසිංහ ලකුණු 111ක් රැස් කරගෙන සිටිද්දී, ඔහුගේ උඩ පන්දුවක් ඇල්ලීමෙන් දවාලීමට හැකි වූ නිසා වරක් මම ප්‍රසංශා ලැබුවෙමි. ඇත්ත වශයෙන් සිදු වූයේ ඔහුගේ වේගවත් පහරකින් මා වෙත ආ බෝලයෙන් මගේ මුහුණ ආරක්ෂා කර ගැනීම සඳහා මුවා කළ අතේ බෝලය රැඳීමය. පසු කලෙක අපේ සර්වෝදය විධායක අධ්‍යක්ෂ වශයෙන් ආ සරත් හේවාගම මහතා ද එදා නාලන්දා පිළ වෙනුවෙන් ක්‍රීඩා කළේය.

සිංහල සහ ඉංගිරිසි විවාද කණ්ඩායම්වල සාමාජිකයෙක් ද වීමි. වරක් ආනන්ද මහා විද්‍යාලයයේ පැවැති විවාදයක දී කළ කථාවක් නිසා ඇල්.එච්. මෙත්තානන්ද අනඳ මහ විදුහල්පති තුමාගෙන් විශේෂ ප්‍රශංසා ලදිමි. පසුව මෙත්තානන්ද මහතා සමඟ බෞද්ධ ජාතික බලවේගයේ රැස්වීම් හැට පහක ප්‍රසිද්ධ දේශන කිරීදීමේත්, එතුමා හා කිට්ටුවෙන් ආශ්‍රය කිරීමේත්, වරප්‍රසාදය ලැබේ යයි එකල මා සිහිනයකින් වත් සිතුවේ නැත.

ඡායාරූප: 78 – ගාල්ලේ මහින්ද විද්‍යාලයේ සමකාලීනයෝ



මහාචාර්ය ජේ. කේ. පී. ආරියරත්න

මහාචාර්ය නන්දදාස කෝදාගොඩ



මහින්ද විදුහල්පතිව සිටි
දයා ජයසුන්දර මහතා



මහින්ද විදුහල්පතිව සිටි
බී. කේ . ද සිල්වා මහතා

දයා ආනන්ද පෙරේරා මහතා



ආචාර්ය ඩබ්ලිව්. ජී. වීරරත්න

ඒ කාලයේ අපේ ආචාර්ය වීනී විතාරණ මහතාගේ නායකත්ව යෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශ ශිෂ්‍යයන්ගේ PLANET නැමැති සඟරාවක් අපි පළ කළෙමු. එහි සම කර්තෘවරයකු වශයෙන් වතාවක් මම සේවය කළෙමි. අධ්‍යයන චාරිකා, වන්දනා ගමන්, නිවාස ක්‍රීඩා ආදී හැම විෂය බාහිර ක්‍රියාවකම මම යෙදුණෙමි. මේ නිසා ගුරුවරුන් හා ශිෂ්‍යයන් රාශියක් හඳුනා ගැනීමේ භාග්‍යය මට ලැබුණේය.

ඡායාරූප: 79
මහාචාර්ය ජේ. කේ. පී. ආරියරත්න සමග
වසර 54 කට පසු

ගමේ පන්සලේ ආගමික කටයුතු ද විවිධ අන්දමේ ක්‍රීඩා ද මගේ ගැමි ජීවිතයේ කොටසක් විය. පීල්ලගොඩ ක්‍රිකට් සමාජයේ නායකයා වූ මම, සෙසු ගම්වල ක්‍රිකට් සමාජ ද සමඟ තරඟවලට සහභාගි වීමි. ඒ අතර මගේ මිත්‍රයන් වූ කේ.පී.ඒ., කේ.පී.ඩබ්., කේ.පී.එස්. පෙරේරා ආදී සොහොයුරන් ක්‍රීඩා කළ කොස්වත්තේ ක්‍රිකට් සමාජයේ ද මම උද්යෝගිමත් සාමාජිකයෙක් වීමි. පසු කලෙක ශ්‍රී ලංකා පිළට ක්‍රීඩා කළ හේමචන්ද්‍ර ද සිල්වා, ප්‍රේමචන්ද්‍ර ද සිල්වා, ගුණචන්ද්‍ර ද සිල්වා ආදී සොයුරෝ ද, දැනට ක්‍රීඩා කරන සෝමචන්ද්‍ර ද සිල්වා ද අපේ පිළේ සිටි ළාබාල ළමයි වූහ.



ඡායාරූප: 80
රූපා කරුණාතිලක මහතා

මහින්ද විද්‍යාලයෙන් අස්වූ පසු මා දිගට ම ආශ්‍රය කළ, ඒ වගේම සර්වෝදය වැඩවලට අනුග්‍රහය දුන්, අපට වඩා ඉහළ පන්තිවල ඉගෙනගත් නාවික හමුදාපති වශයෙන් කටයුතු කළ බැසිල් ගුණසේකර මහතා, ලංකා බැංකු නිලධාරියෙකු වූ ඔහුගේ සොහොයුරෙකු වූ හියූ ගුණසේකර මහතා, දන්ත වෛද්‍යවරයෙකු වූ ගුණපාල විමලධර්ම මහතා, තෙල් හා මේද රාජ්‍ය සංස්ථාවේ සේවය කළ, එවකට අපේ ක්‍රිකට් කණ්ඩායමේ නායක වූ ජී.ද.එස්.ජයසිංහ මහතා, නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු වූ පී.එල්.මුනිදාස මහතා, ඇමතිවරයෙකු වූ රූපා කරුණාතිලක මහතා, අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශකවරයෙකු සහ ජාතික

අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් සේවය කළ සර්වෝදය ප්‍රධාන ලේකම්වරයෙකු වූ දයා ආනන්ද පෙරේරා මහතා, කොළඹ විශ්ව විද්‍යාලයේ උප කුලපති මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මහතා, බෞද්ධ විශ්ව කෝෂයේ ප්‍රධාන කර්තෘ ආචාර්ය ඩබ්ලිව්. ජී. වීරරත්න මහතා ආදීන්ද මගේ මතකයට නැගේ.

ඡායාරූප: 81
වෛද්‍ය සනත් එම්. ගුණසේකර

ඡායාරූප: 82
මහින්ද විද්‍යාලයේ ආචාර්යවරයකු වූ කැඩ්මස් සමරසිංහ මහතා

ඡායාරූප: 83
ජී. එම්. සුමනතිලක ද සිල්වා මහතා



ඡායාරූප: 84
මහින්ද ආදිශිෂ්‍යයකු වූ නාවික හමුදාපති බැසිල් ගුණසේකර මහතා හා මැතිනිය මෙත් මැදුර නැරඹීම

25
නරක කාලයක්

විශ්ව විද්‍යාල ප්‍රවේශ පන්තියේ පළමුවැනි අවුරුද්දේදී මම හොඳින් පත පොත පාඩම් කළෙමි. එහෙත් මේ අතර කොළඹ ආනන්ද බාලිකා විදුහලේ උගත් මගේ පුංචි අක්කා ලලනා, මහින්ද විද්‍යාලයයේ ප්‍රාථමික අංශයේ ගුරුවරියක් හැටියට සේවය සඳහා බැඳුනාය. මහින්දයේ තිබුණු සැණකෙළියකදී, එක දිගට නිදි මැරීම නිසා ඇයට මානසික රෝගයක් හට ගත්තේය. මේ සඳහා මන්තර ගුරුකම් – තොවිල් පවිල් – පිරිත් දෙසුම්, වෙද හෙදකම් ආදී සෑම ප්‍රතිකාර ක්‍රමයක්ම අපේ ගෙදර සිදුවිය. ඒ කිසිවකින් පිහිටක් නොවීය.

ඒ කාලයේ තාත්තා ගොඩකවෙල පැත්තේ සාර්ථක මිනිරම් පතල් ව්‍යාපාරයක් අරඹා තිබුණේය. එහි ප්‍රතිඵල ලැබෙන්නට ඔන්න මෙන්න කියා තිබියදී, අක්කා ලෙඩ වූ නිසා, තාත්තාට ඒවා වෙන අයට පවරා ගෙදර ඒමට සිදුවිය. පසුව ඒ පතල් කර්මාන්තය සම්පූර්ණයෙන් වසා දැමීමට සිදුවිය. මෙතෙක් එතරම් ආර්ථික පීඩාවකින් නො පෙලුණු අපට, ආර්ථික මෙන්ම, මානසික දුක් කම්කටොලුද දැනෙන්නට විය.

අක්කාට බටහිර ප්‍රතිකාර ලබාදිය යුතු යැයි තීරණය කෙරුණෙන්, පළමුව වැල්ලවත්තේ 'ප්‍රනාන්දු මෙමෝරියල්' නම් රෝහලකද, පසුව 'සුලෙයිමාන්' රෝහලේ ද ඇය නවත්වන ලදී. ඇයගේ තනි රැකීමට තාත්තාටත් – අම්මාටත්, මටත්, සමහර විට වේයන්ගොඩ සිරි අයියාටත් සිදු විය. අපේ සියලුම සම්පත් අක්කාගේ රෝගය සඳහා යෙද වූ නිසා ඉතා දුක්බර යුගයකට අපට මුහුණ දෙන්නට සිදු විය. මට මතක හැටියට 1952 අවුරුද්දේ වැඩි කොටසක් ගෙවුනේ මේ අන්දමටය.

දිනක් අපේ විදුහල්පති ඊ.ඒ. විජේසූරිය මහතා අක්කා බැලීමට අප නිවසට පැමිණියේය. එහෙත් එයින් සැනසීමකට වඩා, මා සිතට ඇති වූයේ සංවේගයකි. ඊට හේතුව අක්කාට සනීප නැති නිසා, සනීප ලැබෙන තුරු ඇය අස් විය යුතු බව පවසා, ඇයගේ අස්වීම් පත්‍රය අත්සන් කරවා ගැනීමය. මෙය මට මහත් මානසික වේදනාවක් දුන්නේය.

දිනපතාම වාගේ නිදි මැරීමත්, වෙහෙසවීමත්, ඒ අතරම පොත් පත් පාඩම් කිරීමත් නිසා, මට තද හිසරදයක් ඇති විය. එවකට ගාල්ලේ රෝහලේ සේවය කළ – සේන්ස් නැමැති – වියානා විශේෂඥයෙක් මට අවවාද කළේ, වර්ෂ දෙකක් පාඩම් නො කර සිටින ලෙසය. මම කෙසේ නමුත්, 1952 දී විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගයට සූදානම් වීමි. එහෙත් මට වාඩි වීමට හැකි වූයේ භෞතික විද්‍යාව ප්‍රශ්න පත්‍රයට පමණකි. අනිත් විෂයයන්ට වාඩිවීමට මගේ හිස රදය ඉඩ දුන්නේ නැත. භෞතික විද්‍යාව සඳහා ප්‍රායෝගික විභාගයටද කොළඹ විශ්ව විද්‍යාලයට කැඳවා තිබිණි. ඒ විෂයයෙන් පමණක් මම සමත් වීමි.

මගේ ශරීර සෞඛ්‍යයත්, ආර්ථික තත්ත්වයත්, මානසික තත්ත්වයත්, ගෙදර පරිසරයත් යන හැම අංශයකින්ම බලාපොරොත්තු කඩ වූ යුගයෙකි, දැන් උදා වී තිබෙන්නේ. මේ අතර මා ළඟින්ම ආශ්‍රය කළ මගේ හොඳ මිතුරකු පවා, මා හා උරණ වී වෙන් වූයේ මේ කාලයේදීය. පසු කලෙක මට හැකි අන්දමින් ඔහුට උදව් වීමි.

දැන් කළ යුතු හොඳම දේ රැකියාවක් සොයා ගෙන ගෙදරට, නංගිලා හා මල්ලීට උදව්වීමය. මෙය අපේ සමාජයේ වැඩිමහල් පිරිමි සහෝදරයාගේ වගකීමයි. මේ අතර මට තවත් අකරතැබ්බයක් විය. එකල පැවැති මහජන ඡන්දයකදී බලයේ සිටි අපේක්ෂකයා අපේ ගෙදරට පැමිණ ඔහුට උදව් වන ලෙස ඉල්ලා සිටියේය. ඔහු සමඟ පැමිණි උදව්කාරයෙක්, රුපියල් දෙදාහක් මගේ අත තබා, ඡන්ද කටයුතුවලට වියදම් කරන ලෙස පැවැසීය. කෙතරම් ආර්ථික පීඩන තිබුණත්, අල්ලස් දූෂණවලට එදා සිටම විරුද්ධ වූ මම, ඒ මුදල්වලින්ම ඔහුගේ මුහුණට දමා ගසා, ගෙදරින් පිටවන ලෙස කෑ ගැසුවෙමි. එදාම උදේ, මේ අය ඡන්ද කටයුතුවලට පැමිණි අයට ගමේ ඉතා වැදගත් බෞද්ධ ගෙදරක දී මත්පැන් සංග්‍රහයක් ද කරනු මම දුටුවෙමි. එයින්ද කුපිත වී සිටි මම, මගේ අප්‍රසාදය මොවුන්ට පෙන්වූයේ ඒ ආකාරයෙනි.

එහෙත් පසුදින අපේ විදුහල්පතිතුමාට ආරංචිය ගියේ වෙන අන්දමකටය. එතුමා මට කතා කොට, අපේ ගමේ මා ප්‍රධාන කොමියුනිස්ට් කාරයෙක් නේදැයි එතුමා මගෙන් ප්‍රශ්න කළේය. මා පිළිතුරු දුන්නේ අල්ලසට හා මත්පැනට විරුද්ධවත්, ශිෂ්‍යයකු හැටියට දේශපාලන කටයුතුවල නො යෙදෙන හැටියටත්, එතුමා දී තිබුණ අවවාද අනුවත් මා ක්‍රියා කළ බවය. මගේ උත්තරයට විදුහල්පතිතුමාට දිය හැකි ප්‍රති උත්තරයක් නො තිබුණත්, එතුමා එයින් සෑහීමකට පත් වූ බවක් නොපෙනිණි. එතුමා කෙරෙහි තිබූ ගුරු භක්තිය මෙහිදී දෙදරුම් කෑ බව, මා පළ නොකළොත් එය අසත්‍යයෙකි. කෙසේ නමුත් මෙවැනි අසාධාරණ සමාජයකට විරුද්ධ ව කටයුතු කළ හැකි මගක් සෙවිය යුතුය.

26
"ඔබ කොමියුනිස්ට්කාරයෙක්?"

කොමියුනිස්ට්වාදය ගැන ගැඹුරට සෙවීමට මට ආශාව ඇති වූයේ මෙහිදීය. මා දත් එකම කොමියුනිස්ට්වාදියා වූ කන්දේ ජී. එච්. සිරිසේන අයියා සොයා ගියෙමි. ඔහු සමග විවිධ නම්වලින් පෙනී සිටි කිහිප දෙනාගෙන් කෙනෙක් හැටියට, මම ද තාවකාලික සාමාජිකයෙක් හැටියට බැඳුනෙමි. කාඩ් පතේ මටදී තිබුණ නම මට මතක නැත. ඔහු ළඟ තිබුණ හැම පොතක්ම – සඟරාවකම කියැවීමි. මාක්ස්වාදය තේරුම් ගැනීමට මහන්සි ගත්තෙමි. දේශනයක් පැවැත්වෙන තැනක් තිබුණොත්, කෙතරම් දුර වුනත් බයිසිකලයෙන් ගියෙමි. පක්ෂ සාකච්ඡාවලදී පාලම් බෝක්කු තිබෙන තැන් හා විප්ලවයේදී ඒවා පුපුරුවන හැටි සාකච්ඡා කෙළෙමු.

මේ අතර සෝවියට් දේශයේ නායකයා ස්ටාලින් කළ අපරාධ ගැන සඳහන් වූ පොතක් මා අතට පත් විය. මෙයින් මම මහත් සේ කම්පා වීමි. සිරිසේන අයියාටවත් මේ පිළිබඳව මට කරුණු අවබෝධ කරවීමට නො හැකි විය. ස්ටාලින් ගේ උපන් දිනට මොනවා දෝ කරන්ට සත පනහක් එකතු කිරීමට අණක් ලැබී තිබෙන බැවින්, මගෙන්ද එය ඉල්ලන ලදී. එවැනි මිනීමරුවකුට සත පනහක් වියදම් කිරීමට මා සූදානම් නැති බවත්, වෛද්‍ය එස්.ඒ. වික්‍රමසිංහ මහතා වෙනුවෙන් නම් රුපියලක් වුවත් දෙන බවත් පවසා මම නැගිට ගියෙමි.

මිනිහා – මිනිහාගෙන් ඈත් වීමත් පුද්ගලයා තමාගේම පෞරුෂයෙන් ඈත්වීමත් වළකා, මිනිස් නිදහස හා සහෝදරත්වය ආරක්ෂා වන මානවවාදී දහමක් දෙසූ කාර්ල් මාක්ස්, කොමියුනිස්ට්වාදීන් විසින් අමු අමුවේ මරා දමන හැටි ප්‍රථම වරට මා දුටුවේ ඒ අවස්ථාවේදීය. ඒ අංශයෙන්ද බලාපොරොත්තු සුන් කර ගත් මම, මහත් අවිවේකී සිතකින් මේ වකවානුව ගත කළෙමි.

27
ආර්ථික සූරාකෑමට පිළියමක්

මේ කාලයේ මා පාසල් ගියේ පා පැදියකිනි. මට මුදල් එව්වේ තලවාකැලේ සිටි මගේ බාප්පා වන ඒ.ටී.සී. ජිනදාස මහතාය. දිනකට සත විසිපහකට අඩු ප්‍රමාණයක් වියදම් කිරීමට මම පුරුදුව සිටියෙමි. එක් සඳුදා දිනයක මා ගෙදරින් පිට වී, මහපාරට පා පැදිය පැදගෙන විත්, ගාලු පැත්තට හරවන විට එක්තරා වයසක කාන්තාවක් මා නැවැත්තුවාය. මට මතක හැටියට ඇයගේ නම ඇල්පිනාහාමි වූවාය.

"අනේ පොඩි මහත්තයෝ, මට හාල් ගන්නට විදියක් නෑ. මට සත විසිපහක් දෙන්න."

මම ඇයට සත විසිපහක් දී, මගේ පාසල් ගමන ගියෙමි. මේ සිද්ධිය එක දිගට සති කීපයකම සඳුදා දිනවල දී සිදුවිය.

දිනක් සවස වැල්ල දිගේ – වැල්ලේ දේවාලය පැත්තට මා ඇවිද ගෙන යන විට, මගෙන් සත විසිපහ ඉල්ලා ගෙන සහල් ගන්නා ස්ත්‍රිය කුඩා පැල්පතක ලණු අඹරනවා මම දුටුවෙමි. වහාම එතැනට ගිය මම ඇය හා කතාවේ වැටුණෙමි.

"අම්මේ කොහු අඹරලා කීයක් සතියකට හම්බ කරනවාද?

"අනේ මහත්තයෝ දවසකට අත හම යන කන් පැය දොළහක් විතර කොහු අඹරලා, සුමානෙකට රුපියල් තුනක් විතර සොයනවා"

"කාට ද ලණු විකුණන්නේ? කවුද කොහු ගෙනැත් දෙන්නේ"

ආදී වශයෙන් හරස් ප්‍රශ්න ඇසූ මා කොහු කර්මාන්තයේ සුල මුල සෙවීමට පටන් ගත්තේ එදාය. දින ගණනක් තිසේ ගාල්ලේ ඊ. කෝට්ස්, හේලි ආදී එකල ලණු ගත් සමාගම්වලටද, මැද මුදලාලිලා හමුවටද, පොල් ලෙලි පල් කරන අය ළඟටද, අත් මැෂින් පාවිච්චි කරන අය ළඟටද ගිය මම, කොහු ලණු කර්මාන්තය ගැන ඉතා හොඳ අවබෝධයක් ලබා ගතිමි.

එහි හරය නම් මේ දුප්පත් ස්ත්‍රීන් ශ්‍රමය යොදා රුපියල් තුන හතරක් සොයන අතර මැද වෙළෙන්දා එමෙන් හතර පස් ගුණයක් ශ්‍රම සූරා කෑමෙන් සොයන බවය. මෙයට පිළියම කුමක් ද?


ඡායාරූප: 85
පූජ්‍ය නාරද්දේ වේදානන්ද හිමි

කොහු කාර්මිකයන්ගේ සමුපකාර සමිතියක් ඇරඹීමයි. එවකට අපේ පන්සලේ ක්‍රියාකාරීව සිටි නාරද්දේ වේදානන්ද හිමියනුත් සමඟ මේ කාර්යය ඉටු කිරීම සඳහා වෙහෙසුණෙමි. පළමුවැනි රැස්වීම තැබුවේ මුහුද අද්දර රුප්පේ සුදු වැල්ලේය. අහිංසක කොහු කාර්මික කාන්තාවන් අසූවක් පමණ එද රැස්වීමට සහභාගි වූහ. එහි සභාපති හැටියට නාරද්දේ වේදානන්ද හිමියනුත්, ලේකම් හැටියට මාත් භාණ්ඩාගාරික හැටියට පරංගියවත්තේ මැගිනෝනා අමරවික්‍රම මහත්මියත් තෝරා පත් වීමු.

ජීවිතයේ පළමු වරට සමිතියක් සංවිධානය කිරීමේ දී අවශ්‍ය වන පෝරම කොළ, ගණන් පොත්, වාර්තා පොත්, නීති රීති ආදිය සෑදීමට මම වෙහෙස වුණෙමි.

දැන් සමිතියේ වැඩ පටන් ගැනීමට සාමාජිකාවන්ගෙන් එකතු කරගත් මුදල් නො සෑහේ. කොහු ගැනීමටත්, යන්ත්‍ර සූත්‍ර ගැනීමටත්, ස්ථානයක් සාදා ගැනීමටත් මුදල් අවශ්‍යය. අපි තිදෙනා තවත් පිරිසකුත් සමඟ කේ. එම්. සියනේරිස් මුදලාලි හමුවීමට ගියෙමු. මැෂින් ගැනීමට හා තාවකාලික මඩුවක් ගසා ගැනීමට අවශ්‍ය බිමක් හා මුදල් ඔහුගෙන් ලැබිණි.

අපි අපේ සමිතියේ වැඩ පටන් ගතිමු. එහි වැඩ කළ කාන්තාවන් පුදුම උනන්දුවකින් වැඩ කරනු දකින මට, ක්‍රම ක්‍රමයෙන් යා යුතු මාර්ගය පෙනෙන්නට විය. පළමුවැනි ලණු තොගය විකුණා, වේතන දී දින කීපයකින් එක්තරා තරුණ ගැහැනු ළමයෙක් අලුත් ගවුමක් ඇඳ වැඩට පැමිණෙනු දක මට ඇතිවූයේ අමුතු විදියේ ප්‍රීතියකි. එද වනතුරු ඇය එකම ගවුමක් ඇඳගෙනයි වැඩට ආවේ.

සියනේරිස් මුදලාලිගෙන් ලත් ආධාරය, තාත්තාගෙන් ඉඳ හිට කරගත් අත හුවමාරු, ඊට පසු කලෙක බොනවිස්ටාවේ ගුරුවරයකු

හැටියට සේවය කිරීමේදී ලත් වේතනය ආදී මේ සියල්ල යොදවා කොහු කාර්මිකයන්ගේ සමුපකාර සමිතිය දියත් කළෙමි.

ස්ථිර ගොඩනැගිල්ලක් සාදවා දීමට සියනේරිස් මුදලාලි පෙළඹවීමි. මුලදී අර්ධ තාවකාලික වූවත්, පසුව ස්ථිර ගොඩනැගිල්ලක්ම සාදා ගැනීමට ඔහු උදව් විය. මේ ගොඩනැගිල්ල විවෘත කිරීමේ උළෙලට මා ඇරයුම් කළේ අගමැතිකමින් ඉවත්ව දේශපාලනයෙන් ඈත්ව සිටි ඩඩ්ලි සේනානායක මහතාටය. ඇරයුම් පිළිගෙන පැමිණි එතුමා ලස්සන පෙරහැරකින් කැඳවා ගෙන වුත් එතුමා අතින් නව ගොඩනැගිල්ල විවෘත කරවීමු.

පක්ෂ දේශපාලන ක්‍රමයෙන් තොර නායකත්වයක් ගොඩ නැංවීමටත්, පක්ෂ ක්‍රමයෙන් තොර ප්‍රජාතාන්ත්‍රික දේශපාලන ක්‍රමයක් සෙවීමටත්, ඒ අවස්ථාවේදී ඩඩ්ලි සේනානායක මහතාට ඇරයුම් කෙළෙමි. පක්ෂ නායකත්වය සහ පක්ෂ ක්‍රමය විසින් අපේ සමාජ සාර ධර්ම වනසන හැටි එදාත් මට අවබෝධ වී තිබුණේය. මේ 1953 වර්ෂයේය.

දැන් අපේ සමිතිය හොඳින් ක්‍රියාත්මක වේ. එහෙත් ගාල්ලේ සමුපකාර උප කොමසාරිස්වරයා වත්, කුඩා කර්මාන්ත උප අධ්‍යක්ෂ හා ග්‍රාම සංවර්ධන පරිපාලන නිලධාරියාවත් අපේ සමිතිය ලේඛනාරූඪ කරන ආකාරය, නො දනී. එකෙක් මා අනෙකා ළඟට යවනු හැර, ඔවුන් කළ උදව්වක් නැත.

28
සංසාරික සබඳකමක් අලුත් වීම

ඒ කාලයේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවත්, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවත් දෙකම තිබුණේ නිදහස් චතුරශ්‍රයේ පිහිටි ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශය යටතේ බවයි, මගේ හැඟීම. අපේ සමිතිය ලේඛනාරූඪ කර ගැනීම සඳහා මේවායේ අධ්‍යක්ෂවරුන් හමුවීමට කොළඹට ආවෙමි.

ආනන්ද – නාලන්ද ක්‍රිකට් තරඟවලට හා විවාදවලට පැමිණීම, පුංචි අක්කා බැලීමට කොම්පඤ්ඤ වීදියේ රෝමානිස් නානායක්කාර මහතාගේ නිවසට යෑම සහ සමහර අවස්ථාවලදී මරදානේ පන්සල් පාරේ අංක 125 තැන පදිංචිව සිටි මගේ අම්මාගේ නංගි කෙනෙක් වූ බාලම්මාගේ ගෙදරට පැමිණීම හැර, කොළඹ නගරයත් සමඟ මගේ තිබුණේ ඈත සම්බන්ධයකි. කෙසේ නමුත් බාලම්මාගේ ගෙදර නවාතැන් ගෙන, පාර අසා ගෙන, ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශය සොයා ගෙන ගියෙමි.

මට උවමනා කර තිබුණේ අධ්‍යක්ෂකවරුන් හමුවීමය. එහෙත් ඒ එය කාලයේ එතරම් ලේසි පහසු වැඩක් නොවේ. සුදු හම තිබෙන සුද්දන්ට වඩා, ඔවුන්ගේ සපත්තුවලට බැස තිබුණු අපේ කලු සුද්දෝ, සාමාන්‍ය මහජනයාට ඒ කාලයේ සැලැකුයේ දුවිලි මෙනි. මම බයෙන් බයෙන් පියගැට පෙළ දිගේ ඉහළට නැංගෙමි. මා වැරැදි පැත්තට ගිය බව හැඟුනේ, මා ඉදිරිපසට කාමරයක දොර ඇරගෙන මා පුවත්පත්වල දැක තිබුණු මුහුණක් ඇති මහත්මයෙකු එන බව දුටු විටය. එකවරම ඔහු ස්වදේශ කටයුතු භාර ඇමති ඒ. රත්නායක මැතිතුමා බව මම හැඳින ගතිමි.

අයින් වෙන්ට තැනක් නො තිබිණි. එකවරම මා ඇමතූ එතුමා, ඉංගිරිසියෙන්,

"ඔව්, පුතා කවුරු හමුවීමට ද යන්නේ?"

ස්ථානෝචිත ප්‍රඥාව පාවිච්චි කළ මම පිළිතුරු දුනිමි.

"ඔබතුමා හමුවීමට"

මගේ කරට අත දමා ගත් එතුමා ආපසු කාමරයට මා සමඟ ගියේය. මගේ මුලු කතාවටම ඉවසිල්ලෙන් සවන් දුන්නේය. දෙපාර්තමේන්තු දෙකෙන් උසස් නිලධාරීන් දෙදෙනෙකු කැඳවා මගේ ලියවිල්ලකම විධානයක් දී, වහාම සීමාසහිත 'උණවටුනේ කොහු කාර්මිකයන්ගේ සමුපකාර සමිතිය' ලේඛනාරූඪ කිරීමට කුඩා කර්මාන්ත අංශය යටතේ පියවර ගන්නා ලෙස නියෝග කළේය. සමුපකාර දෙපාර්තමේන්තුවත්, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවත් සම්බන්ධ කරන නිලධාරියෙක් පත් කරන ලෙස ද නියෝග කළා මට මතකය. පළමුවරට නිල කටයුත්තකට ඇමතිවරයෙකු හමුවීමත්, ඇමති කාර්යාලයකට ඇතුලුවීමත්, රජයෙන් වැඩක් කර ගැනීමත් නිසා මට ඇති වූ ප්‍රීතිය නිම්හිම් නැත.

ඡායාරූප: 86
ගරු ඒ. රත්නායක මැතිතුමා

මීට අවුරුදු පහළොවකට පමණ පසු ගරු ඒ. රත්නායක මැතිතුමා මගේ ඉතාම කුලුපග මිත්‍රයකු, උපදේශකයකු, වැඩිහිටියකු වේ යයි ඒ කාලයේ මම නො සිතුවෙමි. එතුමාගේ පසුබිමත්, මගේ පසුබිම හා වයසත් අතර තිබුණේ එතරම් විශාල පරතරයෙකි. එහෙත් සසර දී ඇති කර ගන්නා බැඳුම් අලුත් වීම කාටවත් වැළැක්විය නොහැකිය. මේ ගැන විස්තර කිරීම පසුවට තබමු.

29

අධ්‍යාපනය ඇනහිටීම



ඡායාරූප: 87
අසෝක දේවේන්ද්‍ර මහතා

ජී. දන්තනාරායන මහතා, අසෝක දේවේන්ද්‍ර මහතා, විනී විතාරණ මහතා, කැඩ්මස් සමරසිංහ මහතා වැනි මට ආදරය කළ ගුරුවරු කීවේ, අධෛර්යමත් නොවී 1953 විභාගයට සූදානම් වන ලෙසය. එහෙත් අක්කාගේ අසනීපයත්, ආර්ථික දුෂ්කරතාවයනුත්, විභාගයට සම්පූර්ණයෙන් වාඩිවීමට නොහැකි වූ නිසා ඇති වූ සිත් වේදනාවත්, දේශපාලන වශයෙන් මා නොකළ වරදකට, මා ආදරය කළ විදුහල්පතිතුමා මා හා අමනාපකමක් ඇති කරගෙන තිබේ යැයි යන හැඟීමත්, යමක් එකවරම සාර්ථකව කිරීමේ අත්දැකීම මෙතෙක් ලබා තිබීම නිසාත්, මා එතෙක් ජීවිතයේ තබා ගෙන තිබූ අරමුණු වෙනස් වනු මට දැනිණි. තිබෙන සමාජයේ තැනක් ගන්නවාට වඩා, සමාජය වඩා යුක්තිය, සමානත්වය හා සාධාරණත්වය දිසාවට යොමු කිරීමට මගේ ජීවිතය කැප කළ යුතු බව මට හැඟිණි. දුෂ්ඨ ධනවාදී ආර්ථික ක්‍රමය වත්, කෲර කොමියුනිස්ට්වාදී ආර්ථික – දේශපාලන ක්‍රමය වත්, අපේ රටට නොගැලපෙන බව මට ඉබේම තේරුම් ගියේය. එසේ නම් යා යුතු මග කිමෙක්ද?

සේවය තුළින් මෙය සෙවිය යුතුය.

මගෙන් දේශපාලන වාසි ලබා ගැනීමට අසමත් වූ, මා දූෂණය කිරීමට තැත් කළ අය, ඒ වන විට අපේ විදුහල්පතිතුමාට පමණක් නොව, පොලිසියටද විප්ලවකාරයෙකු හැටියට මගේ නම දී තිබුණේය.

මා සුදුසුකම් ලැබ තිබූ ශිෂ්‍ය නායක පදවියත් නොලැබී ගියේය. විදුහලේම සිටි දේශපාලනය කළ, අද රටේවත් නැති ශිෂ්‍යයෙක්, මා කළ විහිලුවක් නිසා මා දේශපාලන පිළට තවදුරටත් තල්ලු කර දැම්මේය.

විදුහලට අලුත් ශිෂ්‍යයෙක් වූ ඔහු විදුහල්පති තුමා කෙරෙහි මගේ සිත බිඳවා ශිෂ්‍ය නායක පදවිය ලබා ගත්තේය.

මේ විහිලුව මෙසේය.

ඡායාරූප: 88
මහින්ද විද්‍යාලයේ වාර්ෂික තෑගි උත්සවයේ ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගිවීම. දකුණු කෙළවරේ එවකට විදුහල්පති දයා ජයසුන්දර මැතිතුමා

දිනක් පුස්තකාලයේ තිබූ යම් සඟරාවක ශ්‍රීමත් ජෝන් කොතලාවල මහතා සහ ඩඩ්ලි සේනානායක මහතා සිටින පින්තූරයක් පළ වී තිබුණේය. මේ කාලය මේ දෙදෙනා අතර අසමගියක් ඇතැයි ආරංචි පැතිර තිබූ කාලයයි. මේ පින්තූරය යටින් මගේ මිත්‍ර ඒ ශිෂ්‍යයා "UNITED THEY STAND" කියා ලීවේය. ඔහු පාවිච්චි කළේ කොළ පාට තීන්ත තිබෙන පෑනකි. මම ඊට යටින් "DIVIDED THEY FALL" යැයි ලීවෙමි. එක පාරටම මේ සඟරාව අතට ගත් ඔහු එය යටින් නැවතත් "THAT WILL NEVER HAPPEN" යැයි ලීවේය. ඒ සඟරාව මා ළඟට නැවතත් ගත් මම "IT ALMOST HAPPENED" යැයි ලීවෙමි.

දැන් සඟරාව අතට ගත් ඔහු කෙලින්ම දිව්වේ විදුහල්පති තුමාගේ කාමරයටය. සැණෙකින් විදුහල්පති තුමා මා කැඳවා පුස්තකාලයේ සඟරාවල ලිවීම ගැන චෝදනා කළේය. එහි මුලින් ලීවේත්, බාගයක් ලීවේත් මේ ශිෂ්‍ය නායකයා බව කීවෙමි. එහෙත් විදුහල්පති තුමා මට පමණක් තදින් අවවාද කළේය.

ඡායාරූප: 89
මහින්ද විදුහලේ වර්තමාන ආචාර්යවරුන් සමග වම් කෙළවරේ විල්වින් අබේගුණවර්ධන මහතා ද විදුහල්පති ඩී. අතුකෝරාල මහතා මගේ වම්පසින් ද සිටිති

30
ජීවිතය හරහා විශ්ව විද්‍යාලයට

මේ අතර අතර සහල් සලාකය කැපීම නිසා රටේ කලබලකාරී තත්වයක් උදා විය. හර්තාලයක් සංවිධානය වූයේ මේ කාලයේය. ඒ දිනවල ඇඳිරි නීතිය පැනවී තිබිණි. එහෙත් කිසිදු කලබලයක් නො තිබුණු නිසා, එය ගණන් නො ගත් මම, මා මුණගැසීමට පැමිණි එල්.ඒ.පියසේන නැමැති මිත්‍රයකු හැරලීමට මහ පාරට වුත්, ඔහු සමග ගාල්ල පැත්තට බසයක් එනතුරු ගමන් කළෙමි. ඔහු හැරලීමෙන් පසු ආපසු ගෙදර දිහාවට එන විට අඳුරු වැටීගෙන එමින් තිබිණි. එහෙත් හන්දියේ තරුණයින් කිහිප දෙනෙකු කතාබස් කරමින් සිටි නිසා, මම ද නැවතී ඔවුන් හා කතාබස් කරමින් සිටියෙමි.

හිටිහැටියේම කිසිම සද්දයක් නැතිව ආ ජීප් රියක එළිය වැටුණේය. දඩි බිඩි ගා එයින් බැස්ස පොලිස් මුලැදනියන් කිහිප දෙනෙක් අප දෙසට දුව ආහ. මා සමග සිටි තරුණයෝ සී සී කඩ දුවන්නට වූහ. මම පමණක් නො සෙල්වී හිටි තැනම සිටියෙමි. මගේ පපුවට රයිපලයේ බයිනෙත්තුව තැබූ එක් පොලිස් නිලධාරියෙක් අත් උස්සන ලෙස මට අණ කළේය. මම අත් දෙක එසවූයෙමි. එවිට මගේ මුහුණට ටෝච් එළියක් එල්ල කරමින් පැමිණි යමෙක් :

"ඒ.ටී. මේ මොන පිස්සු වැඩක් ද? ඇඳිරි නීතිය තිබෙන බව දන්නේ නැද්ද? ඔබේ නමත් විප්ලවකාරයෙක් හැටියට පොලීසියට දී තිබෙනවා. දුවන්න ගෙදරට. මා ආ නිසා බේරුණා – දුවන්න. දුවන්න."

ඒ කතා කළ උප පොලිස් පරීක්ෂකවරයා මා සමග ජ්‍යෙෂ්ඨය දක්වා උගත් මිත්‍රයෙකි. ඔහු උසස් අධ්‍යාපනය සඳහා නොසිට, පොලීසියට බැඳුණු කෙනෙකි. මම හෙමි හෙමිහිට තිත්ත කලුවරේ ගෙදර පැත්තට ඇදුනෙමි. මගේ උත්පත්තියෙන් ලත් අවිහිංසාවාදී බව නොතිබෙන්නට අප රටේ හිංසාවාදී විප්ලවයකට මුල පුරන්නට මගේ හිත යෙදෙන්නට තිබුණේ එදායි.

මම විශ්ව විද්‍යාලය හරහා විභාග සමත් වී, ජීවිතයට මුහුණ දෙනු වෙනුවට ජීවිතය හරහා විශ්ව විද්‍යාලයට යෑමට තීරණය කළේ මේ දිනවලය.

රෝහණ විජේවීර මහතාගේ පියා වූ විජේවීර ඉස්කෝලේ මහත්මයා කටුකුරුන්දේ පොලීසියට ගෙනවුත්, ග්‍රීස් තවරන ලද කණුවක නගින්නට සලස්වමින් පොලීසිය විසින් පහර දුන්නේ, මේ හර්තාල් සමයේය. එයින් රෝහණ විජේවීර කෙනෙක් බිහිවීමේ බීජය රෝපණය වූවා යයි මම කල්පනා කරමි.

පසු කලෙක පානදුරේ පැත්තේ හින්දු කෝවිලක පූජකවරයෙක් ජාති භේද කෝලාහල කාලයක දස වද දී මරා දැමූ බවත්, එය ඔහුගේ බෑනා වූ කුඩා ප්‍රභාකරන් දුටු බවත් ආරංචි විය. මෙය සත්‍ය කතාවක් නම්, වත්මන් ප්‍රභාකරන් බිහිවීමේ බීජය රෝපණය වූයේ එදාය.

31

ගුරු දිවියට පිවිසීම

පළමුවෙන් ම රැකියාවක් සොයා ගත යුතුය. අහංගම ශාරිපුත්‍ර විද්‍යාලයේ විද්‍යා ගුරුවරයකුට ඇබෑර්තුවක් තිබෙන බව දැන ගතිමි. ඒ සඳහා ඉල්ලුම් පත්‍රයක් යවා, කළමනාකාර මහතා හමුවීමි. මගේ සහතික පත් ද රැගෙන පැමිණෙන ලෙසත්, ඒ තනතුර මට දීමට ඔහු සූදානම් බවත් ප්‍රකාශ විය.

අස්වීමේ ලිය කියවිලි විදුහල්පති තුමා හමුව ඉල්වූයෙමි. ඔහු ඒවා දීම ප්‍රතික්ෂේප කළේ, මගේ අධ්‍යාපනය කඩා කප්පල් කර ගන්නවාට ඔහු අකැමැති බව ප්‍රකාශ කරමිනි. අප ආර්ථික තත්වයෙන් ඉතා පහත බැස තිබෙන බව ප්‍රකාශ කළෙමි. එවිට එතුමා ප්‍රකාශ කළේ මහින්ද විද්‍යාලයයේ ම ප්‍රාථමික අංශයේ තුන්වැනි පන්තියක් භාරව සේවය කරන ලෙසය. අකැමැත්තෙන් වුවත්, එතුමාගේ ඉල්ලීම ප්‍රතික්ෂේප නො කළෙමි. පුරා මාස තුනක් මගේ ශක්ති ප්‍රමාණයෙන් මා උගත් පාසලේම ගුරුවරයෙක් ලෙස සේවය කළෙමි. මේ කාලය තුළ දී මගේ දිවා ආහාරය වූ වඩේ එක හා තේ එක මට අරන් දුන්නේ මා සමඟ ඉගෙන ගත් මගේ මිත්‍ර වයි.කේ.ඩී. ඩැනීය. තැපැල් දෙපාර්තමේන්තුවේ සේවයෙන් විශ්‍රාම ගිය පසු ඩැනී අයියා සර්වෝදය සේවාවට එක් විය.

මට වේතනයක් ලැබුණේ නැත. වේතනය ඉල්ලූ විට ප්‍රකාශ වුණේ මා ස්වේච්ඡාවෙන් සේවය කරන බව එතුමාගේ හැඟීම වූ බවයි. ගෙදර ආහාරය පවා අප ගන්නේ අමාරුවෙන් බව පැවැසූ මම, නැවත රැකියාවකට යෑමට මගේ සහතික ඉල්ලුයෙමි. දෙමසකට පසු පැමිණෙන ලෙස එතුමා පැවසූයෙන්, මා පිටව ගියේ හිතේ මහත් වේදනාවකිනි.

එහෙත් මම පසුබට නො වීමි. අපේ ගෙදරට අනිත් පැත්තේ කඳු ගැටය මත අලුත් ගෙයක් හිස් විය. මෙය මසකට රුපියල් 20 කට කුලියට ගත් මම පෞද්ගලික පාසලක් ඇරඹීමි. මෙහි විශේෂ ඉංගිරිසි පන්ති හැරුණ විට, ජ්‍යෙෂ්ඨය අසමත් වූ ළමයිනට ඉංගිරිසි, ගණිතය, ප්‍රජාචාරය ආදී අවශ්‍ය විෂයයන් මම ඉගැන්වීමි. එක් අවස්ථාවක ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සංඛ්‍යාව හැටක් පමණ විය. කෙසේ හෝ ඒ සියලු

දෙනාටම උගන්වා විභාගවලින් සමත් වීමට උදව් කෙළෙමි. එයින් සමහරෙක් අද රජයේ උසස් සේවාවල යෙදී සිටිති.

හාපුරා කියා රුපියල් හැටක් පමණ ගාස්තු එකතු කර ගෙන මා ගෙදර එන විට ඉදිරියට ආවේ කන්දේ අර්නෝලිස් බාස් උන්නැහේ මාමාය. ඔහු දැන් බංකොලොත් ලැබූවෙකි. එහෙත් කුඩා කල ඔහු අපට තැගි බෝග ගෙනා හැටි මට මතක් විය. ඔහු මගෙන් මුදලක් ඉල්ලීය. මා අතේ තිබූ සියලුම මුදල් ඔහුට දී, මම හිස් අතින් ගෙදර

ඡායාරූප: 90
වයි. කේ. ඩී. ඩැනී මහතා

ගියෙමි. මා හාපුරා කියා මගේම ශ්‍රමයෙන් ලත් ආදායම – වියදම් වූයේ එසේය.

මට විදුහල්පති තුමා එන්ට කී දිනයේ කාර්යාලයට ගියෙමි. එදින ද එතුමා මගේ සහතික පත් හා චරිත සහතිකයක් දීම ප්‍රතික්ෂේප කළේය. එවිට මම ධෛර්යය ගෙන කතා කළෙමි. තවත් එතුමාගෙන් උදව්වක් ඉල්ලීමට නොඑන බවත්, මගේ ජීවිතයේ යම් පටන් ගැනීමක් කිරීමට, මේ කොළ කෑලි ටික අවශ්‍ය බවත් පැවැසුවෙමි. එවිට මට සාමාන්‍ය චරිත සහතිකයක් එතුමා ටයිප් කිරීමට දුන්නේය. එය දුටු මම කේන්තියෙන් ගැහෙන්නට වීමි. ඒ වේලාවේ අසෝක දේවේන්ද්‍ර මහතා ද කාර්යාලයයේ සිටියේය. ඒ පත්‍රිකාව ද අතට ගෙන මම කාර්යාලයට ගියෙමි. මා ප්‍රථම පන්තියේ සාමාර්ථයක් ලත් බව ආදී කරුණු කීපයක්ම නැවත ඇතුළත් කරවා ගතිමි.

විදුහල්පතිතුමා සියලුම සහතික පත් ආදිය මට දුන් පසු, මම දණ ගසා වැන්දෙමි. එතුමාගේ මුවින් ගිලිහුණු සෑම වචනයක්ම, මා ඉගෙන ගත් හැටි පෙන්වීමට, මා ළඟ සාක්කුවේ තිබුණු සටහන් පොත් ද පෙන්වීමි; නැවත වැන්දෙමි. ඊළඟට මම තදින් කතා කළෙමි. ආත්මාර්ථකාමී දේශපාලකයන්ගේ කේළාම් බස් අසා එතුමා මට සැලකූ අන්දම වැරැදි බවත්, කවදා හෝ වෙනත් මගක ගොස් ජීවිතය සාර්ථක කර ගන්නා බවත් පවසා, මම මගේ ආදරණීය ආචාර්ය එඩ්ගාර් විජේ සූරිය මහතාටත්, මගේ ආදරණීය මහින්ද විද්‍යාලයටත් ආයුබෝවන් කියා මහ මගට බැස, මගේ පා පැදියෙන් – මා පණ මෙන් ආදරය කළ මිහිඳු මාතාවගෙන් සමු ගතිමි.

එදා මහින්දයත්, කඩවත පාලමත් අතර සැතැපුම් තුනක් පමණ මහ මග, මා පා පැදිය පදවා ගෙන ගියේ දහසක් සිතුවිලිවල වෙලෙමිනි. මා සිතා සිටියේ පාසලින් – විශ්ව විද්‍යාලයට මිස, මෙසේ මහ මග අතරමං වීමටද? මා කළ වරද කිම? තාත්තාත්, අක්කාත්, ගෙදරත්, ලෝකයත්, හැම දෙයක්ම මගෙන් ඈත්වෙනු දැනිණි.

මේ අතර මගේ බයිසිකලයට සමාන්තරව තවත් බයිසිකලයක් ළංවෙනවා මට දැනිණි. බොහොම බර කට හඬකින් කලිසම, කෝට් එක, ටයි එක පැළඳ සිටි මැදි වියේ මහත්මයෙක් "ගුඩ් මෝනිං ඒ.ටී." කියා මට ඉස්සර කොට බයිසිකලය නැවැත්වීය.

ඒ එවකට බොනවිස්ටා විද්‍යාලයාධිපතිව සිටි ඩී. එම්. ඩබ්ලිව්. වීරසිංහ මහතාය.

"ඔබ විශ්ව විද්‍යාලය හමාර කළාද?"

"නැහැ සර්, මා විශ්ව විද්‍යාලයට ගියේ නෑ"

වීරසිංහ මහතා පුදුම විය. මට සිදු වූ ඇබැද්දි ගැන එතුමාට පැවැසීමි. මා දෙස බලා කරුණාවන්ත බැල්මක් හෙලූ එතුමා කීවේ පසු දින සිට බොනවිස්ටා කණිෂ්ඨ විදුහලේ විද්‍යා ගුරුවරයකු ලෙස සේවය කිරීමට පැමිණෙන ලෙසයි.

මා සර්වෝදය ගොඩ නගන යුගයේ දී වරින් වර ගොස්, එවිට විශ්‍රාම ගෙන සිටි එඩ්ගාර් විජේසූරිය මහතා ඇතුලු වෙනත් ගුරුවරු මුණගැසීමට මම අමතක නොකෙළෙමි. මට මැග්සයිසයි ත්‍යාගය ලැබුණ අවස්ථාවේ එඩ්ගාර් විජේසූරිය මහතා මහින්ද විද්‍යාලයයේ පැවැත් වූ පිළිගැනීමේ උත්සවයකට පැමිණ, මා ගැන හදවතින්ම කළ කතාව නිසා නැවත වරක් හදවතින් මගේ ගුරු භක්තිය එතුමා කෙරෙහි ස්ථාපිත විය. එතුමාගේ ආදාහන උත්සවය ගාල්ලේ කොටු බැම්ම ඉදිරියේ දී පැවැත්විණි. එහි දී ආදි ශිෂ්‍යයන් වෙනුවෙන් මට කතා කිරීමට අවස්ථාව ලැබුණු නිසා, මගේ ආචාර්යවරයාට මට දැක්විය හැකි ඉහලම ගෞරවය පුද කළෙමි.

ඡායාරූප: 91
විශ්‍රාමලත් විදුහල්පති එඩ්ගාර් විජේසූරිය මහතා හා මැතිනිය ඔවුන්ගේ නිවසේ දී ධර්මා ගුණසිංහ මහතා සමග හමුවීම

32

රුමස්සල කන්ද – 'බොනවිටු' දිවිය

බොනවිස්ටා විද්‍යාලයය පිහිටියේ රුමස්සල කන්දේ බස්නාහිර බෑවුමේය. පාසල කොටස් දෙකකින් යුක්ත විය. ජ්‍යෙෂ්ඨ අංශය කඩවත පාලම පැත්තට මුහුණලා – මහා මාර්ගයට නුදුරුව පිහිටා තිබූ අතර, ප්‍රාථමික අංශය පිහිටා තිබුණේ කඳු මුදුනේය. අපේ නිවස

ඡායාරූප: 92 රුමස්සල කන්ද

පිහිටි උණවටුන් කන්ද මෙන්ම, බොනවිස්ටා විද්‍යාලය පිහිටි රුමස්සල කන්ද මා කුඩා කළ සිට ප්‍රිය කළ – නිතර විනෝදයෙන් මිතුරන් සමඟ වනය පීරමින් ක්‍රීඩා කළ තැනකි.

මහින්ද විද්‍යාලයයේ සඟරාවේ වරක් මම "රූ මත් සල" යන හිසින් පැදි පෙළක් පළ කළෙමි. මෙහි වැරදි නිවැරදි කර දුන්නේ මගේ ගුරු විනී විතාරණ මහතාය.

පෙරැ හෙළ දිවේ වූ ගොර රම් – රවුලු   යුද
කලැ හිමවත් කැළැඹූ තිසි ඔසු ලබන   ලෙද
හනුමා – රම් නිරිඳු සුමිතුරු වඳුරු   රද
සිහිපත් කරයි රූ මත් සල මුදුන   අද

සැරසෙන සදා පලබර තුරු රැසින්   ලෙළ
බැබලෙන නිබඳ නෙ වනින් සැදි මලින්   පුල
නැළැවෙන දිවා රෑ ගීයෙන් සියොත්   කැල
ඔබ වන රැජින වෙති කරවන මෙ වන   දුල

සැඩ මරු නගන රළ පෙළ සමුදුරැ   ඇඹැරී
ගොඩ – කර කරා පෙරළී විත් යන   විසිරී
ඔබ සල් ගතැ හැපී, පෙණ කඳ යෙයි   වැපිරී
ඉන් රුව ඔබ හෙබෙයි, රූ මත් සල   කුමරී

වැසි කලැ නො වැසි කලැ සොම්නස් ගී   දාරා
තිසි පමණට විසුරුවන වන පෙත   පීරා
රිසි දන සනස වන දොළ වැගිරෙන   මෝරා
දිසි කිරි දහරි ඔබ පියොවුරිනෝ'න   රූරා

හෙළ දිව රකින සමනොළ ගිරි රජු   පැහැද
රැක වරණෙහි යෙදුන රහ හහවා   නිබඳ
සමුදුර ගැඹුරටත් බිය නොව තෙද   විහිද
කම් ඉටු කෙරෙයි රූමත්සල සෙනෙවි   අද

කලාශූරී අහුබුදු ශූරීන්

මහ කවි අරිසෙන් අහුබුදු පඬිතුමා එකල ලස්සන හුරු බුහුටි තරුණයෙකි. මා ඇතුලු ගමේ තරුණයන් එතුමාගේ පාණ්ඩිත්‍යය නිසා

ඡායාරූප: 93
කලාශූරි අරිසෙන් අහුබුදු මහතා හා සඳා අහුබුදු මැතිනිය

එතුමාට සැලකුවේ ගුරුවරයෙක් වශයෙනි. මට මතක හැටියට එතුමා ඒ දිනවල මහින්ද විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ ගුරුවරයකු හැටියට සේවය කළේය. දිනපතාම වාගේ එතුමාගෙන් පත් පොත් ලබාගෙන කියැවීමත්, මා ලියූ කවි ලිපි ආදියේ වැරදි හදා ගැනීමටත්, එතුමා හමුවීමි. අනඳ

පිය කුඩාතිහි ශුරීන්ද අපේ කල්ලියේ කෙනෙක් විය. "එඩිය වැඩියේ පොඩියන්ගේ එඩි වඩන්ටයි" යන පාඨය මුල් කොට 'එඩිය' නම් සඟරාවක් එතුමාගේ සොයුරු අමරසේන ආශුතෝෂයන්ගේ හේළි පහරුව නම් මුද්‍රණාලයෙන් නිකුත් විණි. එවකට හබරාදුවේ සිටි මහ කවි වෙල්ලාල ජයමහ වෙදැදුරු තුමන් ද අපේ ගෞරවය දිනා ගත්, අප නිතර මුණ ගැසුණු පඬිවරයෙකි. මාස්පතා පැවැති හෙළ හවුලේ රැස්වීම්වලදී මොවුහු අපට රට දැය සමය ගැන බොහෝ දේ ඉගැන්වූහ.

ඡායාරූප: 94
අමරසේන ආශුතෝෂයන්

අරිසෙන් අහුබුදු මහතා වෙනුවෙන් 1989 මාර්තු මස 17 වැනිදා ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී උපහාර උළෙලක් පැවැත්විණි. මේ උළෙලේ මුලසුන හෙබැවූයේ අධ්‍යාපන ඇමති වි.ජ.මු. ලොකුබණ්ඩාර මහතාය. කුලියාපිටියේ සර්වෝදය මධ්‍යස්ථානයේ රැස්වීමකට ගොස් මෙම උළෙලට සහභාගිවීමට පැමිණි මම ශාලාවට ඇතුලු වූ විගස වේදිකාවට කැඳවා ගෙන යන ලදී. එකල අපේ සර්වෝදය පුවත්පතේ කතුවරිය වූ එතුමාගේ අදරැති බිරිඳ සඳා අහුබුදු මැතිනිය ද පසෙකින් සිටියාය. වේදිකාවේ වාඩි වූ මම නිතරම මා ළඟ තබා ගන්නා කුඩා සටහන් පොතේ පහත සඳහන් කවි හය ලීවෙමි. මට කතා කිරීමට ඇරයුම් කළ විට කවි හයකින් සමන්විත වූ මේ කවි කතාව පමණක් කළෙමි:

හෙළවිරු කුමරතුඟු මුනිදස් මගෙහි ගොසින්
හෙළි කළ හෙළේ උරුමය දෙස බසින් රැසින්
අහුබුදු අරිසෙන් පුදමින් නැමුණු හිසින්
පතනෙමි දිගාසිරි සම්පත් සියක් වසින්

නව යොවුන් අහුබුදු
තරුණ මැදි වියෙ අහුබුදු
දනිමි මම එනමුදු
මෙනෙක් නොදිටිමි නො-හැකි අහුබුදු

මුවදෙව් රද මෙන් නරකෙස් නොදැකත්
ගිහි ගෙය අසපුවකට හරවා ගත්
අහුබුදුවනි පැරුමෙන් ඔබ බෝසත්
උතුමෙකි දස පැරුමන් පුරනට පත්

එඩියක් වඩවා පොඩියන් එඩියන් කැරුමට ගමේදී
ඔබ ගත් තැන මට මතකයි නවසිය පනහේදී හැටේදී
මිහිදුවෙ සැත් තොමසුවෙ ගුරුකම් කැරුවත් හෙළ රටේදී
ගුරුලූ ගෝමී දම්සෙන් වැනි පඬි රුවනකි සිය වසේදී

පරදිවි රටාවන් හිස් මුදුනින් ගැනුණු
සාහිත කලාවන් දන බලයෙන් වැටුණු
ගැතිකම් වඩවමින් නිදහස් සිත් නැසුණු
යුගයේ අවසනක් අහුබුදුවනි දකිනු

හෙළ සිත පොබයන හෙළ බස සරුවන හෙළකම් මතුවන නවතාවෙන්
හෙළ හද උල්පත ඔබ ම ය කිවිදුනි පෝසිත වූ රවුළිඳු රාවෙන්
කළ මෙන් සිය ගුණයක් මතුවට දැය සරු කැරුමට ඔබගෙ සේවෙන්
බල සිත කය ලැබැ සැරදෙත් සබඳිනි තුන් සරණින් දෙවි අනුබාවෙන්

* *

බොනවිස්ටා සේවයට ගුරුවරයකු වශයෙන් බැඳීම දුර්වල වෙමින් තිබුණු මගේ ආත්ම ශක්තියට අලුත් පණක් ලැබීමෙකි. එමෙන්ම ගමේ අරඹා තිබූ සමාජ සේවා කටයුතු ද ඉදිරියට ගෙන යාමට ශක්තියෙකි. ගෙදර බර ටිකක් ඉසිලීමටත් නංගිලා හා මල්ලී ගැන සෙවීමටත්, අම්මාට හා තැන්දලා දෙදෙනාට උදව් වීමටත් දැන් තරමක් පහසු වේ.

අක්කාගේ අසනීපය කෙමෙන් සුව විය. ඇය ගිංතොට සුගතදාස ද සිල්වා නැමැති තරුණයෙකුට විවාහ කරදීමද සිදු විය. තාත්තාගේ හිතවතකු වූ හෙන්රි අමරසූරිය මැතිතුමා මාගාල්ලේ බෞද්ධ විද්‍යාලයයේ ඉංග්‍රීසි ගුරුවරියක් වශයෙන් ලලනා අක්කාට නැවත රැකියාව ලබා දුන්නේය. ලලනා අක්කාගේ නම යොදා, වේයන්ගොඩ සිරිසේන ජිනදාස අයියා ජිම්කානා ටිකට් එකක් මේ කාලයේ ගෙන තිබුණේය. මේ ටිකට් එකට ඩර්බි තරගය දිවූ 'ස්වොලෝ වේල්' නැමැති අශ්වයා තේරිණි. ඒ අශ්වයා ඩර්බි තරගයේ දී තුන්වැනි තැනට ආ නිසා අයියාට තුන්වැනි ත්‍යාගය හිමි විය. පවුලේ ආර්ථික තත්ත්වය වඩා හොඳ අතට හැරීමට මෙය ද උදව් විය.


ඡායාරූප: 95
සුගතදාස ද සිල්වා මහතා

මේ කාලයේ තාත්තා ගේ කකුලේ යකඩ ඇණයක් ඇනී තිබීම හා දියවැඩියා රෝගය නිසා එය සුව කර ගැනීමට අවුරුද්දක් පමණ එක්තැන් වී සිටියේය. මේ කාලය තුළදී ගොඩකවෙල තිබූ තාත්තාගේ මිනිරන් පතල්වල යන්ත්‍ර සූත්‍ර දිරාගොස් සියල්ල විනාශ විය. සනීප වූවාට පසු තාත්තා ඔහුගේ පරණ මිත්‍රයකු වූ මොණරාගල කලුවර මුදලාලි හෙවත් අකෝලිස් අප්පු මුදලාලි ළඟ සුලු සේවයක් සඳහා ගියේය.

ගුරුකමට පිවිසීම

මා බොනවිස්ටාවට ඇතුලු වූ පළමුවන දිනයේම වීරසිංහ මහතා මට පැවරුවේ ඔහුගේ කාල සටහනට අයිති අංක ගණිතය හා ඉංගිරිසි පාඩම් ගැනීමය. මේ අනුව පළමුවෙන්ම මා ගියේ ජ්‍යෙෂ්ඨ පන්තියටයි. ඒ පන්තියේ සිටි ළමයින්ගෙන් වැඩි දෙනෙක් මට වඩා වැඩිමල් අය වූහ. මොවුන් මට අවනත කර ගැනීමට තිබූ එකම ක්‍රමය අමාරුම ගණන් කීපයක් විසඳීමේ අභියෝගය ඔවුන් ඉදිරියේ තැබීම යයි මට කල්පනා විණි. මේ උපක්‍රමය හරි ගියේය. ඔවුනට වඩා හොඳින් මා විෂයය දත් බව එත්තු ගිය හැටියේම, ඔවුහු මට අවනත වූහ. පන්තියේ විනය රැක ගැනීමට මට එදා සිට කිසිම අපහසුවක් නොවීය. එහි සිටි ලාබාලම ශිෂ්‍යයා පී. අමරසිංහය. ඔහු පසුව කොළඹ නාලන්දා විද්‍යාලයේද ඉගෙන, දැන් මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයාය. පසුව සිවිල් සේවිකාවක් වූ කරුණා ස්පෙල්ඩ්වින්ද මහත්මියද ඒ පන්තියේ ඉගෙනීම ලැබුවාය.

ඡායාරූප: 96 බොනවිස්ටා ජ්‍යෙෂ්ඨ පාසල



ඡායාරූප: 97 බොනවිස්ටා ප්‍රාථමික පාසල

බොනවිස්ටාව ඒ කාලයේ පෞද්ගලික පාසලකි. එය අයිති වූයේ එංගලන්ත සභාව නම් වූ ක්‍රිස්තියානි නිකායකටයි. මා උගන්වන කාලයේ එහි කළමනාකරු හැටියට ක්‍රියා කළේ වැලිකල පියතුමාය. පාසලේ ක්‍රිස්තියානි ළමයින් සිටියේ ටික දෙනෙකි. ඒ අයත් කඳු මුදුනේ තුබූ අනාථ නිවාසයේ ළමයි වූහ. අන් සියලු දෙනාම – මුස්ලිම් ළමයකු දෙදෙනෙකු හැර, බෞද්ධ ළමයි වූහ.

ගුරුවරු ද වැඩි දෙනෙක් බෞද්ධයෝ වූ අතර, විදුහල්පතිතුමා, බිරිඳ හා රෙපරමාදු තව දෙතුන් දෙනෙක් හැරුණ විට, එක් කතෝලික ගුරුවරයෙක්ද සිටියේය. බොනවිස්ටාවේ උදේ රැස්වීම මා සිත් ගත් එකකි. ක්‍රිස්තියානි ළමයි පල්ලියට ගොස් යාච්ඤා කළ අතර, බෞද්ධ අය එළිමහනේ පන්සිල් ගත්හ. කතෝලිකයෙක් වූ රූපසිංහ ගුරුතුමා සිටියේ බෞද්ධ ගුරුවරුන් හා ළමයින් සිටි රැස්වීමේය.



ඡායාරූප: 98
පී. හෙට්ටිහේවා මහතා සමග අවුරුදු 47 කට පසු

ඩී.ඩබ්.සී. මොහොට්ටි මහතා, ගුණසේකර මහතා, ඩී.වයි. විජේවික්‍රම මහතා, ෆ්‍රැන්ක් වික්‍රමසිංහ මහතා, පී. හෙට්ටිහේවා මහතා, සී.

මානවඩු මහතා, වික්‍රමසූරිය මහතා ආදී වැඩිහිටි මෙන්ම මා හා ඉතා කුලූපග වූ මිත්‍ර ගුරුවරුන් රැසක්ම මෙහිදී මට හඳුනා ගැනීමේ අවස්ථාව ලැබුණේය. සමහර දිනවල සවස මම වීරසිංහ මහතාගේ නිවසට පැමිණ, ඔහු – ඔහුගේ බිරිඳ හා දරුවන් දෙදෙනා සමඟ චෙස්, බ්‍රිජ් ආදී ක්‍රීඩාවල යෙදීමද කෙළෙමි.

1955 අවුරුද්ද මට ගත කිරීමට සිදු වුණේ බොනවිස්ටා ප්‍රාථමික අංශයේය. ඒ අංශයේ විදුහල්පතිනිය වූයේ ගුණසියන්ගොඩ මෙනෙවිය යි. මා හැරුණ විට සිටි සියලුම සෙසු අය ගුරුවරියෝ වූහ. 'ලොකු අක්කණ්ඩි' නමින් අපි කුඩා කාලයේ සිට හඳුනාගෙන සිටි එඩ්වින් ආරියදාස මහතාගේ අක්කා වූ දයාවති මහත්මිය, සිල්වා මහත්මිය, චන්ද්‍රා කරුණාරත්න මෙනෙවිය හා අබේසිරි ගුණවර්ධන මෙනෙවිය ද ඒ අතර වූහ. පසු කලෙක දේවප්‍රිය සිල්වා මහතා ද අපට එක් විය.

ගුණසියන්ගොඩ මෙනෙවිය අපට මවක් මෙන් වූවාය. එකම පිරිමියා හැටියට ඒ කාලයේ මට විශේෂ වරප්‍රසාද හා කාගේත් ආදරය මෙන්ම, ගෙදර දොරවලින් සූදානම් කර ගෙන ආ රස කෑම ද විවේක කාලයේ දී ලැබුණේය.

බොනවිස්ටා ප්‍රාථමිකයේ ගත කළ කාලය ඉතාම විනෝද ජනක කාලයක් විය. බොහෝ විට මගේ නිදහස් වේලාවල් මා ගත කළේ කඳු මුදුනට ගොස් මහ මුහුදත්, ගාලු වරායත් නැතිනම් සමනොල ගිර පෙනෙන රට ඇතුළත දෙසත් බලමිනි. අපි සියල්ලෝම සහෝදර සහෝදරියන් මෙන් මෙහි සේවයේ යෙදුණෙමු. බොහෝ විට පඩි චැක්පත මාරු කර ගෙන ඒමට යන්නේ මායි. එදාට අනිවාර්යයෙන්ම සංග්‍රහයක් අපි හවුල් වී පැවැත්වූයෙමු.

විශේෂ සිද්ධි දෙකක් මෙහිදී මට මතක් වේ. පහළ පාසලේ මෙන් නොව, මෙහි සිරිත වූයේ ක්‍රිස්තියානි ළමයින් පමණක් ආගම අදහන අතර, බෞද්ධ හා මුස්ලිම් ළමයින් ජාතික ගීය ගායනා කිරීමයි. මේ සිරිත කඩ කිරීමට මට ඕනෑ විය.

33

ආගම ඇදහීමේ නිදහස

දිනක් මට රැස්වීම ගැනීමට අවස්ථාව පැමිණි හැටියේ, මුස්ලිම් ළමයින්ට දෙවැට දෙසින් ඈත පෙනෙන පල්ලිය දෙස බලාගෙන ඔවුන්ගේ ආගම කීමට අණ දුන් මම, බෞද්ධ ළමයින්ට එතැන ම තිබූ බෝ ගසට වැඳ ගන්නා ලෙස කියා පන්සිල් දුනිමි. ඒ අවස්ථාවේම වැලිකල පියතුමාගේ කාරෙක කන්ද උඩට ඇදෙනවා මම දිටිමි. ඔහු කෙලින්ම පැමිණ පන්සිල් දෙමින් සිටි මගේ පිටට තට්ටු කොට ඉංගිරිසියෙන් "මා කරන්නේ කුමක්දැ" යි ඇසීය. "පේන්නෙ නැද්ද? මම මගේ ආගම අදහනවා. ඔබේ ආගම අදහන වේලාවට මෙහෙම ඇවිල්ලා කරදර කරනවාට ඔබ කැමැති දැ" යි මම අසා නැවත මගේ ආගම ඇදහීමේ යෙදුණෙමි.

පියතුමා කේන්තියෙන් කාරෙකේ නැගී පහළට එළවාගෙන ගියේය. ටික වේලාවකින් වීරසිංහ මහතා මට පණිවුඩයක් එවීය. මවිසින් කර ඇත්තේ පාසලේ රීතියක් කැඩීම බව පෙන්වා දුන්නේය. ඒ දෙදෙනාටම කරුණාවන්තව, එහෙත් ස්ථිර ස්වරයෙන් මා කියා සිටියේ, ආගමක් නැතිව ළමයි හැදෙන්ට දීම වැරැදි බවත්, මා කළේ ආගමක් ඇති ව හැදෙන්ට උදව්වීම බවත්ය. එදා සිට ප්‍රාථමික පාසලේත් ඒ ඒ ශිෂ්‍යයෝ එක වරම තම තමන්ගේ ආගම ඇදහීමේ සිරිත ආරම්භ කළහ. ඩී.ඩබ්ලිව්.සී. මොහොට්ටි මහත්මයා මේ අන්දමටම මීට කලින් ඉහල පාසලේ සර්වාගමික පිළිවෙත අරඹා තිබිණි.

එහෙත් දැන් මා විප්ලවකාරයෙකු ලෙස හංවඩු ගැසීම සිදු වී හමාර බව මට අවබෝධ විය. එහෙත් යුක්තිය හා සාධාරණත්වය පිළිබඳ හැඟීම් කුඩා කල සිට මගේ හදවතේ තදින් කාවැදී තිබෙන නිසා, ඒ වෙනුවෙන් සටන් කිරීමට මම කවදාවත් බිය නොවීමි.

34
කපුකමක්

බොනවිස්ටාවේ සිටි යුගයේ දී සිදු වූ හාස්‍ය ජනක සිද්ධීන් කිහිපයක් ද මට සිහිවේ. එයින් එකක් මෙසේය:

දිනක් පාසල අවසන් වූ පසු මම කන්ද පහළට පාර දිගේ ගමන් කරමින් සිටියෙමි. එවිට බොනවිස්ටාවේ ආදි ශිෂ්‍යයෙක් වූ මගේ මිත්‍රයෙක්, කන්දේ ඉහළට එමින් සිටියේය. ඔහු මා සමඟ පහළට එමින් සිටි ගුරුවරියක් දැක එක පාරටම කලබල විය. ඇය ගැන විස්තර දැන ගැනීමට වුවමනා විය.

"ඒ.ටී. අර ලස්සන කාන්තාව කවුද?"

"මොකටද? ඒ මගේ ගුරු මණ්ඩලයේ ගුරුවරියක්"

"අනේ මට අඳුන්වා දීපන්"

"මොනවා. එහෙමත් පුලුවන්ද වැදගත්, ලස්සන, හැදිච්ච කාන්තාවක් උඹ වගේ කෙනෙකුට හඳුන්වා දෙන්න."

"අනේ ඒ.ටී."

"නිකම් යනවා අයිසේ. මොකද මේවා සෙල්ලම් බඩුයි කියල හිතුව ද?"

"ඒයි. මම සීරියස්. දැන් පනහක් විතර බලන්න ගියා. ඒ හැමෝගෙම කේන්දරය හරි ගියේ නෑ."

"මොකෝ අඟහරුවා හතේද?"

"අනේ මස්සිනා ඔව්?"

"ඒකෙත් අඟහරුවා හතේ වගේ මට පේන්නේ.

එයාටත් ගෙදරින් සොයනවලු?"

"ඉතින්?"

"ඉතින්, ඉතුරු හරිය කතා කරන්න අපේ ගෙදර පැත්තෙ එනවකෝ."

මෙසේ පවසා මම බයිසිකලේ නැගී ගෙදර ගියෙමි. එදාම සවස මගේ මිතුරා අපේ ගෙදරට ආවේය. ඔහු ඇත්ත වශයෙන්ම සහකාරියක්

සොයන බව මට එත්තු ගියේය. ඔහුගේ පවුල හොඳ පවුලක් බව දැන සිටියෙමි. එහෙත් දිනක් ගාලු ක්‍රීඩා සමාජ ගොඩනැගිල්ලේ දී ඔහු බීර වීදුරුවක් බොනු මම දැක ඇත්තෙමි. මේ ගැන සෙවීමට ප්‍රථම, බීර බොන පුරුද්ද නැවැත්වීමට මම ඔහු ලවා සහතික කර ගත්තෙමි.

පසු දින පාසල් ගිය වේලේම මේ කපුකම ගැන මම ක්‍රියාත්මක වීමි. හැම කාරණයක්ම සාර්ථකව ඉටු වූයෙන්, ජයට මඟුල් ගෙය ද අපි සියලු දෙනාම එකතු වී සංවිධානය කෙළෙමු. මනාලියගේ නෑදෑයන් වෙනුවෙන් ද මංගල සභාවේ දී දේශනය කළේ මාය. එහෙත් ඇය මගේ "ඕනෑයෙක් මිස නෑයෙක් නොවේ."

මෙවැනි කපුකම් කීපයක්ම මම කර ඇත්තෙමි.

35

ආර්ථික විද්‍යා අධ්‍යයනයකට යොමු වීම

උගත් අය සමඟ ආශ්‍රය කිරීම මම කුඩා කාලයේ සිටම ප්‍රිය කළ දෙයකි. සමහර විට මම ව්‍යාජ උගතුන්ට ද රැවටී ඇත්තේ මේ නිසාය. පාසල් ශිෂ්‍යයන් හැටියට අප තුළට කා වද්දා තිබූ අධිරාජ්‍යවාදී දේවලට ගරු කිරීමේ පුරුද්ද නිසා, අපේ ගෙදර හා අපේම අසල්වැසි බුද්ධිමත් උගතුන් ගැන නො තකා, සුද්දන් මෙන් ඉංගිරිසි කතා කළ පුහු මිනිසුන් උගතුන් හැටියට සැලකීමට මම ද පුරුදු වී සිටියෙමි.

ඒ කෙසේ වුවත්, ගාල්ලේ යම් ශාස්ත්‍රීය දේශනයක් පවත්වනු ලබන බව දැනගත් විගස එයට සවන් දීමට යෑම මගේ පුරුද්දක් විය. දිනක් ටී.ජී. ෆ්‍රැන්සිස් පිල්ලේ නමැති මහතෙක් ආර්ථික විද්‍යාව පිළිබඳ ප්‍රසිද්ධ දේශනයක් ගාලු ඇකඩමියේදී පවත්වන බව අසා, මම ද එය ඇසීමට ගියෙමි. පිල්ලේ මහතා හඳුන්වාදී තිබුණේ කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයෙක් හැටියටය. එවකට ඔහු මාතර තිල්වලා ගහබඩ බුල්ජන්ස් මහතාට අයිති නිවසක ආර්ථික හා දේශපාලන විද්‍යා (School of Economics and Political Science) විද්‍යාලයක් පවත්වා ගෙන ගියේය.

ආර්ථික විද්‍යා දේශනයක් කළ පිල්ලේ මහතා, දේශනය අවසානයේ එංගලන්තයේ දී සර් ජෝන් කොතලාවල මහතා විසින් කළ ප්‍රකාශයක හරි වැරැදි බව අපෙන් ප්‍රශ්න කළේය. එවකට අගමැතිව සිටි කොතලාවල මහතා කළ කී දේ සමහරක් දෙය නිතරම අවඥාවෙන් බැලූ ඊනියා "බුද්ධිමත්" පිරිසක් එවකට සිටියහ. එංගලන්තයේ ගෘහණියක් විසින් තේ රාත්තලකට වැඩි මිලක් ගෙවීමට සිදුව තිබෙන්නේ ලංකාවෙන් අය කළ තීරු බද්ද නිසා නොව, එංගලන්තයේ බ්‍රෝකර්වරුන්ගේ ක්‍රියා මාර්ගය නිසා බව කොතලාවල මහතා පවසා තිබුණෙන්, මේ නිසා අපේ තේ වෙළඳාමට පහරක් වැදුණු බවයි පුවත්පත්වලින් අදහස දී තිබුණේ. මෙහි හරි වැරැදි බවයි, කථිකයා අපෙන් ඇසුවේ. මා හැර සියල්ලන්ම එක හඬින් කියා සිටියේ කොතලාවල මහතා වැරැදි බවයි.

ඡායාරූප: 99
ජී. සී. ප්‍රැන්සිස් පිල්ලේ මහතාගේ පන්තිය; මා සිටින්නේ පසු පේළියේ වම් කෙළවරේය.

මගේ මතය හරි බව සඳහන් කළ ෆ්‍රැන්සිස් පිල්ලේ මහතා, රුස්වීමෙන් පසු ද මා හා කථාවට වැටුණේය.

මට මතක හැටියට ඔහුට, ස්කෝඩා කාර් එකක් තිබුණේය. ඔහු මාතර බලා ආපසු යන ගමන්, මාද නංවාගෙන උණවටුණේ අපේ ගෙදරට ගියේය. සති අන්තය නිසා, මාතර යෑමට ඔහු හා මම ද ගියෙමි. රාහුල පාරේ ගෙයක පදිංචි වී, සිටි පිල්ලේ මහතා, විවාහ වී සිටියේ ප්‍රංශ කාන්තාවක් සමඟය. ඇයගේ නම මට මතක හැටියට ජැකිලින්ය. කුඩා පුතුන් දෙදෙනෙක්ද සිටියහ. ඔවුන්ගේ නම් නාදන් හා ක්‍රිෂ්ණා වගේ මට මතකය.

සුදු කෝපි

මා බොනවිස්ටාවේ ගුරුවරයකු වුවත්, මහින්ද විද්‍යාලයයේ ඉගෙන ගෙන තිබුණත්, එතරම් නාගරික බලපෑමක් එතෙක් මා අත් දැක තිබුණේ නැත. මා දුටු, කතා කළ ප්‍රථම ප්‍රංශ කාන්තාව ජැකිලින්ය. **"Do you want Tea or Coffee?"** (ඔබට ඕනෑ තේද කෝපිද?) ඇය මගෙන් ඇසුවාය. **"Coffee"** ("කෝපි") මගේ පිළිතුර විය. **"Black or White"** "කලුද? සුදුද?" මම අන්දුන් කුන්දුන් වීමි. සුදු කෝපි ගැන ඒ මා ඇසූ පළමු අවස්ථාවය. කෙසේ හෝ දන්න මිනිහා වගේ මම **"Black"** "කලු" යයි කීමි. පසුව නිකම් කෝපි හා කිරි කෝපි හැඳින්වූයේ එසේ බව මට අවබෝධ විය.

පිල්ලේ මහතාගේ ගෙදර රාත්‍රී නිදා ගත් මම, උදේ ඔහු සමඟ ආර්ථික හා දේශපාලන විද්‍යා විදුහලට ගියෙමි. පළමු වතාවට හේමා ගොඩවිතාන මෙනෙවිය (පසුව හේමා අතුකෝරාළ මැතිනිය) මට මුණ ගැසුණේ එහිදීය. පිල්ලේ මහතාගේ පාඩමකට මම සවන් දීමි. ඒ අතර

ගණිතය උගන්වන විග්නේෂරම් නැමැති ගුරුවරයා එදින නොපැමිණ සිටියෙන්, එම පාඩම ගැනීමට මම ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වීමි. ඉබේම වාගේ පිල්ලේ මහත්මාගේ කුලුපග මිත්‍රයෙක් බවට මම මේ දින දෙකේ දී පත් වීමි.

එදින ලන්ඩන් විශ්ව විද්‍යාලයයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළට අයදුම්පත් යවන දිනය විය. මෙය පැවැත් වූයේ ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන්ය. ඒ අයදුම් පත් යැවූ ශිෂ්‍යයින් සියලු දෙනාම දෙවසරක් අධ්‍යාපනය ලැබූ අය වූහ. මට ද ලන්ඩන් මැට්‍රික් විභාගයෙන් සමත් වූ සහතික පත්‍රය තිබුණ නිසා, නිකම්ම වාගේ අයදුම් පත්‍රයක් ඉල්ලාගෙන පිරවීමේ ආශාව ඇති විය. ආර්ථික විද්‍යාව, ආර්ථික ඉතිහාසය හා බ්‍රිතාන්‍ය ව්‍යවස්ථාව යන විෂයයන් තුනෙන් මම ද විභාගයට පෙනී සිටීමට කැමැති බව ෆ්‍රැන්සිස් පිල්ලේ මහතාට කීවෙමි. ඔහු සිනහ වී එයට එකඟ වෙමින් ඉල්ලුම් පත්‍රයක් මා අත තැබුවේය. අන් අය දෙවසරක් කළ වැඩ මම මාස දෙකකට ටිකක් වැඩි දවසකින් කළ යුතු විය.

මහරගම ගුරු විදුහලට

කෙසේ හෝ හැම සති අන්තයකම මාතරට පැමිණ පොත් පත් පාඩම් කොට මම ද විභාගයට වාඩි වීමි. ඒ අතර මහරගම ගුරු විද්‍යාලයට ඇතුලුවීමේ විභාගයට ද වාඩි වීමි. මට මතක හැටියට සාමාන්‍ය දැනීම, අංක ගණිතය, සිංහල සහ ඉංගිරිසි යන විෂයයන්ට උත්තර ලිවිය යුතු විය. මා සමඟම එවක මහින්ද විද්‍යාලයයේ අධ්‍යයනය ලබමින් සිට, රිච්මන්ඩ් විද්‍යාලයයේ ගුරුවරයකු ලෙස සේවය කරමින් සිටි ධර්මා ගුණසිංහ මහතා ද විභාගයට වාඩි විය.



ඡායාරූප: 100
මා මහරගම ගුරු විද්‍යාලයට පිවිසි කාලයේ

අප දෙදෙනාටම මහරගම සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් ලැබිණි. එදා මම සම්මුඛ පරීක්ෂණයට ගියේ දින කීපයක්ම අසනීපයෙන් සිටය. බත්තරමුල්ලේ සිරිමාන අයියලාගේ ගෙදර රාත්‍රි නැවතී, උදේ සම්මුඛ පරීක්ෂණයට ගියෙමි. එහි පරීක්ෂණ මඩුල්ලේ සිටියේ අධ්‍යාපන අධ්‍යක්ෂ එස්.එෆ්.ද සිල්වා මහතා, විදුහල්පති ඊ.එච්. ද අල්විස් මහතා, සහ පසුව විදුහල්පති වූ ඩී.ජී. සුගතදාස

මහතාය. වැඩියෙන් ප්‍රශ්න ඇසුවේ අල්විස් මහතාය. මම විභාගයෙන් සමත් වූ බව කාමරයෙන් එළියට එන විටම මම දැන ගතිමි. මා ගුරු විදුලට ඇතුලු කර ගැනීමට සුදුසු බව අල්විස් මහතා පවසනවා සිරිමාන අයියාට ඉස්තෝප්පුවට ඇසී තිබේ.

ඡායාරූපඃ 101
ඩී. ඩබ්ලිව්. සී. මොහොට්ටි මහතා

ගුණසිංහ මහතාට කැඳවීමේ ලිපිය ලැබී දින දෙකකට පමණ පසු, මටද මහරගම ගුරු විදුහලට ඇතුලු වීමේ ලිපිය ලැබුණේය. ගුරු මණ්ඩලයෙන් සාදයක් ද පවත්වා, මට මුදල් ත්‍යාගයක් ද පිරිනැමුවා මතකය. මම බොනවිස්ටා විදුහලට ආයුබෝවන් කීමි. මේ අතර ගමේ කළ සමාජ සේවා කටයුතු ද මගේ තුබූ වෙනත් සම්බන්ධකම්වලටද තාවකාලිකව ආයුබෝවන් කීමට සිදු විය.



ඡායාරූපඃ 102
ඩී. වයි. විජේවික්‍රම මහතා

සිරි අයියාට රේස් ටිකට් එක ඇදීම නිසා අපේ පවුලේ ආර්ථික තත්වය තරමක් සතුටුදායක ව තිබුණේය. පුංචි අක්කාද, මාගාල්ලේ පාසලේ ඉගැන්වූවාය. ඔහු මහරගම ගුරු අභ්‍යාස විද්‍යාලයේ නේවාසික ගාස්තු තෙමසකට වරක් මට එවීමට පොරොන්දු විය. බොනවිස්ටාවේ මගේ මිත්‍රයන් වූ ඩී.ඩබ්.සී. මොහොට්ටි මහතා, පී. හෙට්ටිහේවා මහතා, ෆ්‍රෑන්ක් වික්‍රමසිංහ මහතා හා ඩී. වයි. විජයවික්‍රම මහතා ද මට රුපියල් විසිපහ – පණහ බැගින් දී උදව් කළහ. මේ කාගේත් උදව්වෙන් ගෙදරට ආයුබෝවන් කියා 1956 ජනවාරි මාසයේ සිට මම මහරගම ගුරු අභ්‍යාස විද්‍යාලයයේ පුහුණුවට ඇතුලු වීමි.



ඡායාරූපඃ 103
ෆ්‍රෑන්ක් වික්‍රමසිංහ මහතා

36

දෙවසරක මහරගම ජීවිතය

මහරගම රජයේ ගුරු අභ්‍යාස විද්‍යාලයේ මා ගත කළ දෙවසර මගේ ඉදිරි ජීවිතය හැඩ ගැසීමට මෙන්ම, මා යා යුතු මග තීරණය කිරීමට ද බෙහෙවින් උදව් වූ කාල පරිච්ඡේදයක් විය.

මගේ ළදරු විය ගෙවුනේ ගමේදීය. මේ වයසේදී අම්මාගෙන් මෙන්ම, අවිවාහකව සිටි නැන්දලා දෙදෙනාගෙන් ද, දරුවකුට ලැබිය යුතු දයාව සහ ආදරය මම නොඅඩුව ලැබුවෙමි. ඒ තිදෙනාම මට



ඡායාරූපඃ 104 මහරගම ගුරු අභ්‍යාස විද්‍යාලය

මව්වරු වූහ. මා වරදක් කළ විට ඉරටුවකින් මට තැලුවේත්, කේන්තියෙන් නොවේ; හොඳටම ආදරයෙන් බව මම දැන සිටියෙමි. දෙවැනිව, දරුවකුට අවශ්‍ය වන පෝෂණය ද ඔවුහු මට නොඅඩුව ලබා දුන්හ. කුඩා කල නිතර නිතර අසනීප වූ මා, ගාල්ලේ වෛද්‍ය ෆ්‍රෙඩ් අබේසූරිය මහතාට පෙන්වා ලබා ගත් ප්‍රතිකාරවලට වඩා හොඳ සෞඛ්‍ය රීති අනුව මා හදා වඩාගත් නිසා, ළමා කාලය ගෙවී පෙර යොවුන් වියට මම පත් වන විට සාමාන්‍ය හොඳ සෞඛ්‍යයෙන් සිටියෙමි. තාත්තා සහ

බාප්පොච්චී යන දෙදෙනාම, පවුලේ ආර්ථික බර ඉසිලූහ. දුප්පත්කමිනුත් තොර – සුඛෝපභෝගිත්වයෙනුත් තොර ජීවන රටාවක් අපට හිමි වූයේ ඒ නිසාය. කුල මල, ජාති, ආගම් භේදවලින් තොරව, සැබෑ සිංහල බෞද්ධ සංස්කෘතියකට පදනම දැමුවේ මගේ හත් වන විය ගෙවෙන්නටත් පෙරය.

හැකි තරම් තොරතුරු අපේ කුඩා මනසට බලෙන් ඇතුලු නොකොට, සම වියේ වෙනත් දරුවන් සමඟ සෙල්ලම් කිරීමට ඕනෑ තරම් ඉඩකඩ තිබූ පරිසරයක, අපට වැඩෙන්නට ඉඩ සැලැස්වීමෙන් අපේ ලාබාල මනස අනවශ්‍ය පීඩාවලින් තොරව, ස්වභාවික ලෙස පෝෂණය විය.

සිල්වත්, උගත්, නැණවත් නාහිමිපාණන් වහන්සේ නමක් හා ආදර්ශමත් භික්ෂු පරපුරක් එකල අපේ පන්සලේ වැඩවාසය කිරීම අපේ චරිතය අපේ සංස්කෘතියටත්, බෞද්ධ පිළිවෙත්වලටත් අනුව හැඩ ගසා ගැනීමට උදව් විය. එදා පන්සල වචනාර්ථයෙන්ම පන්සලක් විය.

මගේ පෙර යොවුන් විය ඇරඹුණේ මැද්දකන්දේ වාසය කළ අවුරුදු හතරක් පමණ වූ කාල පරිච්ඡේදය තුළදීය. රත්නපුර දිස්ත්‍රික්කයේ ලාබාලම ශිෂ්‍යයා හැටියට කණිෂ්ඨ විභාගයෙන් මා සමත් වීම නිසා උසස් අධ්‍යාපනය සඳහා මට වෙහෙසීමට තිබුණේ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් පිළිබඳ ප්‍රවීනත්වය ලබා ගැනීමට පමණකි.

බොනවිස්ටාවේ හා මහින්දයේ ඉගෙන ගන්නා අතර, මගේ මැද යොවුන් විය ගමේදීම නැවත ගත කිරීමට ලැබීමත් එක් අතකින් භාග්‍යයකි.

ඡායාරූප: 105
ධර්මා ගුණසිංහ මහතා

ඇත්ත වශයෙන් මගේ සැබෑ තරුණ විය ඇරඹුණේ මහරගම රජයේ ගුරු අභ්‍යාස විද්‍යාලයේදීය. කුඩා කල සිටම මගේ කල්‍යාණ මිත්‍රයෙක් වූ ධර්මා ගුණසිංහ මහතා, මා සමඟම ගුරු විද්‍යාලයට ඇතුලු වීම මට විශාල ධෛර්යයක් විය. ඕනෑම ප්‍රශ්නයකදී ඔහුගෙන් උපදෙස් ගැනීමට මම නො පසුබට වීමි. මට වඩා ඉතා උසස් ගති ගුණ සහ පෞරුෂයකින් හෙබි ගුණසිංහ මහතා, කිසි දිනෙක මගේ දස්කම් පිළිබඳව ඊර්ෂ්‍යා නො කළ අතර,

හැම අවස්ථාවේදීම ඒවා දියුණු කර ගැනීමට මට විශාල අත දීමක් කළේය. අදත් එසේමය.

මා මහරගම ගුරු විද්‍යාලයට ඇතුළු වූවායින් පසු විද්‍යාලයේ එවකට පැවැති බෞද්ධ සංගමය, සිංහල සාහිත්‍ය සංගමය, බාලදක්ෂ කණ්ඩායම, ක්‍රිකට් කණ්ඩායම, මනෝ විද්‍යා සංගමය, විද්‍යාලයේ සඟරාවේ ඉංග්‍රීසි කර්තෘ පදවිය, සිංහල සහ ඉංග්‍රීසි විවාද කණ්ඩායම්වල සාමාජිකත්වය ආදී වූ විෂයය බාහිර කටයුතු රැසකම නිරත වී සිටියද, විද්‍යාලයේ තිබූ ලොකු අඩුපාඩුවක් සම්පූර්ණ කිරීමට ද මම කල්පනා කළෙමි.

ඒ අනුව මහරගම ගුරු අභ්‍යාස විද්‍යාලයේ සමාජ සේවා සංගමයක් පිහිටුවීමට මම මූලිකව ක්‍රියා කළෙමි. අති පූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහා නායක හිමියනුත්, අධ්‍යාපන අධ්‍යක්ෂ එස්.එෆ්. ද සිල්වා මහතා, උප පොලිස්පති සිඩ්නි ද සොයිසා මහතා, දිස්ත්‍රික් විනිශ්චයකාර එස්. ආර්. විජේතිලක මහතා ආදී වූ සම්භාවනීය අමුත්තන් රැසක් ආරම්භක රැස්වීමට සහභාගි කර ගත්තෙමු. එහි මුල් සභාපති හැටියට මා තෝරා පත් කර ගන්නා ලදී. මගේ ඉතා කුළුපග මිතුරෙකු වූ ග්‍රාම සංවර්ධන සහකාර නිලධාරී ඩී.ජේ. අබේසේකර මහතාගේ උපදෙස්, මේ සංගමය පිහිටුවීමෙහිලා මට බෙහෙවින් උපකාරී විය.

මහරගමදී මගේ අධ්‍යාපන කටයුතු ඉතා හොඳින් කළෙමි. විශ්ව විද්‍යාල මහාචාර්යවරුන්, කථිකාචාර්යවරුන්ට නොදෙවෙනි ආචාර්ය මණ්ඩලයක් අපේ විවිධ විෂයයන් සඳහා ඒ කාලයේ සිටියහ. පසු කලෙක අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වූ ජ්.එච්. ද අල්විස් මහතා, සහ ඩී.ජී. සුගතදාස මහතා අප ඉගෙන ගත් කාලයේ සිටි විදුහල්පතිවරු වූහ.

භෞතික විද්‍යාව ඉගැන්වූයේ ඒ. ටී. කාරාලකුලසිංහම් නම් වූ ඉතා දක්ෂ කථිකාචාර්යවරයෙකි. රසායන විද්‍යාව ඉගැන්වූයේ ඩී.එන්. එඩ්වඩ් නමැති එවැනිම දක්ෂ ආචාර්යවරයකි. උද්භිද විද්‍යාව ඉගැන්වූයේ ස්නෙල් නම් වූ ආචාර්යවරියකි. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වූයේ ඔගස්ටින් තම්බිමුත්තු මහතා සහ ආචාර්ය ඩග්ලස් වලතර මහත්මායි. දේශපාලන විද්‍යාව ජෙරල්ඩ් කුරේ නම් වූ මහතෙක් ද, කෘෂිකර්මය පර්සිද සොයිසා මහතාද ඉගැන්වූහ. මනෝවිද්‍යාව ඉගැන් වූයේ හිල්ඩා පීරිස් මහත්මියයි. ගාමිණී විජේවර්ධන මහතා ඉතිහාසයද, සෙනරත් වතිගතුංග මහතා සිංහලද ඉගැන්වූ අතර, ශාරීරික අධ්‍යාපනය මෙන්ම, මහාමේඝ ශිෂ්‍ය නේවාසිකාගාරයද භාරව සිටියේ ඔලිම්පික් ශූර ඩන්කන් වයිට් මහතාය. අපේ සර්වෝදය සංසදයේ ප්‍රධාන ලේකම්වරයකු වූ සිරිල් ඒකනායක

සහ පී. සුබසිංහ ඉංජිනේරු, වඩු වැඩ ආදී වූ වෘත්තීය විෂයයන් ඉගැන්වූ කථිකාචාර්ය-වරු වූහ. ලේඛකාධිකාරී හැටියට ක්‍රියා කළේ පසු කලෙක සර්වෝදයේ පරිපාලන ලේකම්ව සිටි සුගතපාල ද සිල්වා මහතායි.



ඡායාරූප: 106
සිරිල් ඒකනායක මහතා

අධ්‍යාපන කටයුතුවලට මට එතරම් මහන්සි වීමට අවශ්‍ය වූයේ නැත්තේ මහින්ද විද්‍යාලයේ දී විද්‍යාව සහ ගණිතය විෂයයන් අතින් උසස් පෙළ දක්වා මනා දැනීමක් මා ලබාගෙන සිටි නිසාය. මේ නිසා විවිධ සමිති සමාගම්වලටත් ක්‍රිකට් ක්‍රීඩාවටත් මගේ කාලයෙන් වැඩි කොටසක් යෙදවීමට මට විවේකය තිබුණේය.

මම ක්‍රිකට් සංගමයේ ලේකම් වශයෙන් ක්‍රියා කළ අතර, මුල් පෙළේ ක්‍රීඩකයෙකු වශයෙන්ද ක්‍රියා කළෙමි. කොළඹ නගර සභාවේ ක්‍රිකට් කණ්ඩායමට එරෙහිව නොදැවී ලකුණු 87 ක් ලබා ගැනීම මගේ උසස්ම දස්කම වූ අතර, මා වඩා දස්කම් දැක්වූයේ පන්දු යැවීමටය. වේග පන්දු යවන පාක්කියම් මහතා ද, මධකලපුවෙන් අපට එකතු වූ තවත් ක්‍රීඩකයෙකි. පසුව ඩී. එස්. සේනානායක විද්‍යාලයේ විදුහල්පතිව සිටි රැල්ෆ් ඇලස් මහතාද අපේ කණ්ඩායමේ සාමාජිකයෙක් විය.

අපි තරග විශාල සංඛ්‍යාවක් මහරගම අපේ පිටියේදී පැවැත්වීමු. අපේ නායකයා වූයේ කේ. පී. කාසිනාදර්ය; උප නායකයා වූයේ සී. එස්. පාක්කියම් ය. මා සමඟ ක්‍රීඩා කළ අය අතර ජේ. වී. අම්බලවානර්, රැල්ෆ් ඉග්නේෂියස් ටිරොන් ඇලස්, පේබියන් ප්‍රනාන්දු, එල්.ඩී. ප්‍රේමරත්න, එන්. බාලසූරිය, ඩී. සී. ප්‍රනාන්දු, ඔස්ටින් ප්‍රනාන්දු, එම්.සී. ගුණතිලක සහ සෝමරත්න යන නම් මට මතකය.

ඡායාරූප: 107
ඩී. ඒ. අබේසේකර මහතා

හාපුරා කියා අබේසේකර මහතා මට මුණගැසුණේ මහරගම ගුරු අභ්‍යාස විද්‍යාලයේදීය. බෞද්ධ සංගමයේ ඇරැයුමෙන් එතුමා "නොදියුණු සමාජ සංවර්ධනය" යන මැයින් වරක් දේශනයක් පැවැත්විය. මගේ මතකයේ හැටියට 1956 මැයි මාසයේ පමණය. ඒ දේශනය මා ඉතා සිත් ගත් එකක් විය.

එයින් පළමුවරට සැඩොල්, කින්නර සහ වැදි යන ජන කොට්ඨාශ කෙරෙහි මගේ අවධානය යොමු විය. අබේසේකර මහතාගේ ලිපිනය ඉල්ලා ගත් මම පසු දිනම ඔහු හමුවීමට බත්තරමුල්ලේ පිහිටි ඔහුගේ නිවසට ගියෙමි.

ඔහුගේ බිරිඳ ඒඩා අබේසේකර මැතිනිය, ගුරුවරියක් වූවාය. රංජන් සහ නිලාංගනී යන නමින් පුතෙක් සහ දුවක් ඔවුනට සිටියහ. අබේසේකර මහත්මියගේ මවද ඒ ගෙදර සිටියාය. අබේසේකර මහත්මයාගේ මව ඔහුගේ සොහොයුරිය වූ මාලතී වික්‍රමරත්න මහත්මියගේ ගෙදර සිටියාය. මුල් දවසේම ඔවුන් හඳුනාගත් මම, පවුලේ කිට්ටු මිත්‍රයෙකු වීමි.

අබේසේකර මහතා සමඟ දීර්ඝ වශයෙන් සමාජ සංවර්ධනය ගැන අදහස් හුවමාරු කරගත් මම එතුමාගේ නොදියුණු සමාජ සංවර්ධන කටයුතුවලට සහභාගිවීමට කැමැත්ත පළ කළෙමි. එහි පළමු පියවරක් වශයෙන් මහරගම ගුරු අභ්‍යාස විද්‍යාලයයේ හාපුරා කියා සමාජ සේවා සංගමයක් සංවිධානය කළෙමි. ඒ සඳහා ආරාධනා ලැබ විශේෂ දේශන පැවැත්වූ අය අතර, අතිගරු මඩිහේ පඤ්ඤාසීහ මහා නාහිමි, අධ්‍යාපන අධ්‍යක්ෂ එස්.එෆ්.ද සිල්වා මහතා ආදීහු ද වූහ.

ඡායාරූපː 108
1956 දී පැවැත් වූ මහරගම පමුණුව කඳවුර

මුලින්ම අප සේවාවන් ආරම්භ කළේ මහරගම, පමුණුවේ තිබූ ළමා නිවාසයේ ළමුන්ට ඉංග්‍රීසි ඉගැන්වීමෙනි. කාසල් වීදියේ දුන්වත්ත

ඡායාරූප: 109 දුන්වත්තේ දී ක්ලාන්ත වූ ගුරුවරිය

ජනපදයේද, සංවර්ධන කටයුතු කිහිපයක් අපි ආරම්භ කළෙමු. එහිදී සිදුවූ එක් සිද්ධියක් මට මතක් වේ:

ගුරු විදුහලේ සිසු සිසුවියන් විසිපහක් පමණ රැගෙන දුන්වත්ත ජනපදයේ සාමාජික-ආර්ථික තත්ව සමීක්ෂණයක් කිරීම සඳහා වරක් මම ගියෙමි. අප සමග සිටි එක් සිසුවියක් වතුර තිබහ බව පැවැසීය. එවිට ගෙයක කළයක් වසා තිබුණු පොල් කට්ටකින් වතුර ටිකක් ගෙන බිවූ මම, නැවත ඇයට ද එයින්ම වතුර එකක් දුනිමි. ඇයට වතුර ටිකක් බීමට ඉඩ ඇරි මම, විහිලුවක් කරනු සිතා කණට කොඳුරා මෙසේ කීමි.

"දන්නවාද, ඔය කාගේ වතුරද බොන්නෙ කියා?" එවිට අප කුලහීන යැයි සම්මත ජනපදයක වැඩ කරන බව මතක් වූ ඇයගේ අතින්, ඉබේම ජලයත් සමග පොල්කටුව බිමට වැටුණේය. ඇස් දෙක උඩ ගොස් සිරුර ඇල විය. ඉක්මනට ඇයට උදව් වූ මා, අන් ගැහැනු ළමයින් ද කැඳවා, ඇය ගෙදරක ඉස්තෝප්පුවේ බිම තැබුවෙමි. රහස දන්නේ මා පමණක් නිසා, එය වසන් කොට ඇයට මහන්සි නිසා ක්ලාන්ත වූ බව මම අන් අයට පැවසුවෙමි.

එතැන සිටි "ඔබ්සවර්" පත්‍රයේ පුවත්පත් ලේඛකයෙක් මෙහි පින්තූරයක් ගත්තේය. පසුවදා එය පළ වූයේ මෙවැනි ශීර්ෂ පාඨයක් යටතේය. "රොඩී මිනිසුන්ගේ දුක දැක සමාජ සේවිකාව ක්ලාන්ත වෙයි" යනුවෙනි.

මේ සිද්ධිය මෙතැනින් ඉවර වූයේ නැත. පසුදින විදුහලේ පන්ති අවසන් කොට මහාමේඝ උයන නැමති අපේ නේවාසිකාගාරයට මම ආපසු පැමිණෙමින් සිටියෙමි. හරස් ඉස්තෝප්පුවකින් පිරිමි ළමයෙක්

දෙර පොල්ලකුත් රැගෙන එන බව මම දිටිමි. එහෙත් කිසිදු බලාපොරොත්තුවක් නැති ව මොහු සම්පූර්ණ වැර යොදා මගේ වම් කකුලේ දණහිසෙන් පහළ කොටසට ඒ පොල්ලෙන් පහරක් එල්ල කළේය. කෑ ගසාගෙන වේදනාවෙන් මා බිම ඇද වැටුණි. සුලු වේලාවකට මට සිහි නැති විය. මොහු මට තවත් පහරක් දෙනු වළක්වා ගෙන තිබෙන්නේ එතැන සිටි අනෙකුත් ශිෂ්‍යයන් විසිනි. සතියක් පමණ ප්‍රතිකාර ගැනීමෙන් පසුවයි මට නැවත ඇවිදීමට හැකි වූයේ.

මට පහර දුන් ඒ ශිෂ්‍ය ගුරුවරයා, අප ශිෂ්‍ය ගුරුවරියගේ පෙම්වතාය. දෙදෙනාම වලව්කාරයින් වූවා පමණක් නොව, ඒ කාලයේ කුල ගර්වයෙන් ඉදිමී සිටි අයවලුන්ය. පසුව මේ දෙපළම මගේ හොඳ මිත්‍රයන් වූ අතර, ඒ හැඟීම් ද ඔවුන් තුළින් ඉවත් වී තිබෙනු දිටිමි.

අබේසේකර මහතා ක්ෂේත්‍ර චාරිකා යන විට බොහෝ විට මා කැඳවාගෙන ගියේය. සිය බිරිඳ, දරුවන් හා නැගණිය ද තම සේවයට සම්බන්ධ කර ගැනීම එතුමා තුළ තිබූ උසස් ගුණයක් විය. මමද නෙවසරක් පමණ පවුලේ කෙනෙක් මෙන්ම ඇසුරු කළ නමුත්, කුමන හේතුවක් නිසා හෝ මානාව ජාත්‍යන්තර කඳවුරෙන් පසු අපේ ආශ්‍රය සම්පූර්ණයෙන්ම නැවතුණේය.

37

සාහිත්‍ය සිතිවිලි මංමුළාව

මහරගම ගුරු විද්‍යාලයයේ ඉගෙන ගන්නා කාලයේ දී මා ලැබූ අත්දැකීම් රැසකි. මෙයින් සමහරක් මට ඉඳහිට සිහිවේ. ඉන් එක් සිද්ධියක් මට දැන් සිහි වූයේ මේ දිනවල ලේඛකයකු විසින් පොදු ජාතික දර්ශනයක් පිළිබඳ අවශ්‍යතාව ගැන කියා ලිපි පළ කර තිබෙනු දැකීමෙනි.

මා ගුරු විදුහලට ඇතුළු වූ දිනයේම එහි දෙවැනි වසරේ උගත්, මට වඩා අවුරුදු දහයකින් වැඩිමහල් කාන්තාවක් මට මුණ ගැසිණි. ඇයගේ බාල මල්ලීත් – මාත් – ගාල්ලේ, මහින්ද විද්‍යාලයයේ එකම පන්තියේ උගත් නිසාත්, මා ඔවුන්ගේ නිවසට නිතර ගොස් තිබුණ නිසාත්, ඕ මට අමුත්තියක නොවූවාය. එදා මෙන්ම, මෙදාත් මම ඇයට 'අක්කේ' යැයි ඇමතුවෙමි; ඕ මට 'මල්ලී' යැයි ඇමතුවාය. විදුහලේ සිටින සියලුම සිසු සිසුවියන් සිතා සිටියේ ද අප සහෝදරයන් හැටියටය.

අප හැදුණු සංස්කෘතිය අනුව, මෙවැනි සබැඳියාවක් ඇතිවීම ස්වභාවිකය. පිරිමියෙක් කවදාවත්, තමාට වැඩිමහල් කාන්තාවක් සමග ප්‍රේම සම්බන්ධකම් ඇති කර ගැනීම, එදා සමාජය පිළිගත් සම්ප්‍රදායක් නොවේ. එවැනි හැඟීමක් අප තුළ ඇති නොවීමට තරම්, ඒ සම්ප්‍රදායෙන් අප හික්මවා තිබිණ. විවාහ වූ යුවළක් අතර හැර, එසේ නොවන දෙපලක් අතර කාමුක – ලිංගික සම්බන්ධකම් තිබීම ද බෞද්ධ සම්ප්‍රදායික සිරිත් විරිත්වලින් අනුමත නොකළේය. ඒ නිසා අපේ තරුණ සිත්වලට ආලය, ප්‍රේමය, කාමය, රාගය තෝරා බේරා ගැනීමට හෙළ හැදියාවෙන් ම මඟ පෑදී තිබුණේය. අපගේ සාහිත්‍යික සම්ප්‍රදායද ඒ අනුව – හැඩ ගැසී තිබුණි. සිංහල ප්‍රබන්ධ සාහිත්‍යයෙහි ආරම්භක කෘති මෙයට නිදසුනකි.

සිංහල බසින් නවකතා ලියා පළ කළ මුල්ම ලේඛකයන් අතර කෙනෙකි, උණවටුනේ ඒ.ටී.සී. ජිනදාස නම් පුරෝගාමී නවකතාකරුවා. ඒ අපේ තාත්තාගේ මල්ලීය. අපේ බාප්පොච්චිය. ඔහු පළ කළ "ජයරත්න හෙවත් නිර්භීත බාල දක්ෂයා, තිලකා හෙවත් නිර්භීත

තරුණිය, බද්ධ වෛරය හෙවත් නැන්දා සහ ලේලි, මධුර ජීවිතය හෙවත් නැලී සහ කමලා, හද්‍රා සහ කුඩම්මා, තනිකඩයා ආදී නවකතා පාසල් සිසුන් හැටියට අප කිහිප වර කියවා තිබුණා පමණක් නොව, ඒවායේ චරිත පිළිබඳ බාප්පොච්චී සමග කතා බස් කර, සංවාදයේ යෙදීමට ද අපට අවස්ථාව ලැබී තිබුණේය.

එවකට උණවටුනේ අපේ ගෙදරට පැමිණි උගතුන් සමග ද, තලවකැලේ නිවාඩු කාලය ගත කිරීමට ගිය අවස්ථාවලදීද, බාප්පොච්චි වෙනත් වැඩිහිටියන් සමග කතා කරන විටද, කුඩා අපි ඉතා ආශාවෙන් ඇහුම්කන් දුනිමු. කවදාවත් මේවා වැඩිහිටි කතාබහ යැයි අප එළවා නොදැමූහ. සාහිත්‍යය කාටත් එක සේ, පවුලේ සියල්ලන්ම එකට වාඩි වී කතාබස් කළ හැකි මාතෘකාවක් විය.

පියදාස සිරිසේන, මාර්ටින් වික්‍රමසිංහ, ඩබ්ලියු. ඒ. ද සිල්වා ආදී සුප්‍රකට සිංහල නවකතාකරුවන්ගේ ප්‍රබන්ධ කතා ද අප කියවූයේ ඉතා ආශාවෙනි.

* *

1956 නොවැම්බර් මස පස්වන දා උදේ මා විදුහල් භූමියට පැමිණෙන විට, මුලින් සඳහන් කළ අක්කා මට උපන් දින තෑගි අඩංගු පාර්සලයක් දුන්නාය. මම ඇයට ස්තුති කර, නේවාසිකාගාරයට ගොස් පාර්සලය ලිහා බැලුවෙමි. මගේ ප්‍රමාණයට ගැළපුණු සපත්තු කුට්ටමක්ද, අලුත්ම නවකතා පොතක්ද එහි විය.

මම එවේලේම ඒ පොත කියන්නට පටන් ගතිමි. එක හුස්මට ඒ නවකතාව කියවා අවසන් කළෙමි. මම එම නවකතාවේ නිරූපිත අත්දැකීම සහ චරිත හසුරුවා, සිද්ධි පෙළ ගස්වා ඇති ආකාරය ගැන මහත් සේ විපිළිසර වීමි.

ගැහැනු–පිරිමි සම්බන්ධතාවල කඩඉම වන්නේ 'විළි බියයි'. විළි බිය සිඳුන මොහොතක ගැහැනු–පිරිමි හැසිරෙනු ඇත්තේ තිරිසනුන් ලෙසයි. මිනිසා යනු මනස දියුණු කළ සත්වයෙකැයි විද්වත්හු විවරණය කරති. මේ පියාය, මේ දියණියය, මේ මැණියන්ය, මේ සොහොයුරියය යනුවෙන් හික්මීමක් අපට ඇති කර ඇත්තේ විළි බිය නිසාය. උම්මග්ග ජාතකයේ මහෞෂධ පණ්ඩිතයෝ, මහලු වේදේහ රජුට තරුණ බිසවක පාවා දීමට කටයුතු යොදා, අනතුරුව දියණියට වඩා රූපශ්‍රීයෙන් අග්‍ර වූ ඇගේ මැණියන් පිළිබඳ සීමා බන්ධන පැනවූයේ 'නෑකම් වරදවා පී නම් මහත් නපුරයි' කියමිනි.

මිනිසා හෝ ගැහැනිය තිරශ්චීන ලෙස හැසිරෙන්නට පටන් ගත් පසු, විළි බිය නැති වෙයි. සිය ලේලිය සමග කාම අපචාරයේ යෙදෙන පියකු සහ ඔහුගේම බාල පුතු නවකතාවකට නැඟිය යුතු තරම් ගැඹුරු අත්දැකීමක් වූයේ කෙලෙසකද?

තාත්වික රැල්ලේ බටහිර සාහිත්‍ය මතවාද කර පින්නා ගනිමින්, කාම මිථ්‍යාචාරය එලෙසින් ම නිර්මාණ කෘතියකට පාදක කර ගත් අනුකාරක නවකතා පෙළකටම මුල් වූයේ තාත්වික රැල්ලේ මෙවන් නවකතාය. ඉන් එකක මැණියන්ගේ නිරුවත දැකීමට තරම් එහාට ගිය පුතකුගේ හැඟුමන් පවා නිරූපිතව තිබිණ.

පියදාස සිරිසේන ප්‍රචාරකවාදී නවකතාකරුවකු ලෙසත්, ඩබ්ලියු. ඒ ද සිල්වා බටහිර නවකතා කොපි කර – නවකතා ලියූවකු හැටියටත් විවරණය කරමින්, සිංහල නවකතාවේ නව යුගයක් බිහි කළැයි උදම් ඇනූ සාහිත්‍ය විචාර මතවාද සිංහල පාඨකයා මංමුලා කළේය. එහි පලය වූයේ අක් මුල් නැති – පොළොවට ඉහළින් පා වෙන පරඬලා පත් වැනි තරුණ පරපුරක් බිහිවීමයි. අද දවසේ ශ්‍රී ලංකාවේ සමාජය මේ අක් මුල් සිඳුන පරපුර නිසා පීඩා විඳී.

මාර්ටින් වික්‍රමසිංහ මහ ලේඛකයාම මේ වැරදි විවරණ හුවා දක්වමින්, ‘ජපන් කාම කතා හෙවනැල්ල’ නමින් වෙනමම විචාර ග්‍රන්ථයක් පළ කළේ ය. අද මේ කාමෝන්මාදය එළිපිටම සමාජයේ දක්නට ලැබෙයි. ස්ත්‍රිය ගෞරවාන්විත මව් පදවිය උදෙසා නොව, සමාජයේ කෙළි බඩුවක් තරමට පහත් ලෙස–තිරශ්චීන ලෙස සැලකුම් ලබන්නේ එනිසයි.

යළි මේ තාත්වික නවකතා මාලාව ගැන ඊට අවුරුදු ගණනාවකට පසු ‘පාපෝච්චාරණයක’ යෙදීමටත්, ‘සාහිත්‍ය යනු හැව ඇරීමකැයි’ කියා පාමින් සැබෑ තත්වය වටහා ගන්නා විට, බොහෝ දේ සිදු වී හමාරය.

තරුණ පරපුර බිලිගන්නා මෙවන් සමාජ බලවේග එදත්–අදත් සමාජය තුළ දක්නට ඇත. තෑගි ලත් නවකතා පොත, මම ඒ තෑග්ග, පිරිනැමූ අක්කාටම භාර දුන්නෙමි. ඒ ගැන පසුතැවිල්ල පළ කරමින් ලිපියක් එවූ අක්කණ්ඩිය, මට ලියා තිබුණේ ‘නවකතා කලාවට අලුත් නැම්මක්’ දෙන නවකතාවක් ලෙස එය පුවත්පත් පොත් විචාර පිටුවක ලියා තිබුණ හෙයින්, ඒ පොත මිලදී ගත් බවයි. හිත මිත්‍ර භාවය නිසා හෝ තමන්ගේ කණ්ඩායම පතුරුවන සාහිත්‍ය මතවාද උලුප්පා දැක්වීමට සාහිත්‍යයේ නාමයෙන් කරනු ලබන බොරු වළවල් කැණීම

පාඨකයා අගාධයකට හෙළන්නකි. වංශනාථ දේශබන්ධු වැනි ආරූඪ නාමවලින් වැනි නිර්දය විචාරකයන් 'සාහිත්‍යය කොල්ලය' නමින් නිර්නාමිකව පොත් ලියා පළ කරන්නට මේ තත්වය අනුබල දුන්නේය. සාහිත්‍ය පිල් සහ අන්තවාදී සාහිත්‍ය මති මතාන්තර නොව, අපට අවශ්‍ය වන්නේ සාහිත්‍යය – සාහිත්‍යය ලෙස යථා අවබෝධයෙන් වටහා ගැනීමට රුකුලක් වන සාහිත්‍ය සංවාදයි.

අපට අවශ්‍ය පොදු ජාතික දර්ශනයක් ගැන කථා කරන්නවුන්, ආපසු හැරී හදවතට තට්ටු කර බලනවා නම්, වඩා අර්ථවත්ය. අපට අවශ්‍ය විශ්ව දර්ශනයකට පටහැනි නොවන ජාතික දැක්මකි. දැන් වත් එවන් ලේඛකයන් ඒ බව තේරුම් ගෙන නොතිබීම ජාතියේ අවාසනාවයි.

අපි ජාතික දර්ශනයක් නැත්තෝ නොවෙමු. එය සමහරුන් කියන අන්දමට පටු ගෝත්‍රිය හෝ ආගමික දර්ශනයක් නොවේ. එය විශ්වමය දර්ශනයකි. බෙහෙවින් පුළුල් දැකීමකි. එහෙත්, එයින් සමස්ත ජාතියේ ම අවශ්‍යතා සපුරා ලැමට සමත් වනු ඇත.

1962 මුල් භාගයේ 'පොදු ජාතික දර්ශනයක්' නමින් ලිපි පෙළක් මම 'සර්වෝදය' පත්‍රයේ පළ කළෙමි. සර්වෝදය දර්ශනය එයින් පැහැදිලි කිරීමට යත්න දැරීමි.

අපගේ අදහස් කියැවීමට මා සඳහන් කළ අන්දමේ පොත් ලියූ ලේඛකයන්ට උවමනාවක් හෝ විවේකයක් නොතිබෙන්නට ඇත. අපගේ දර්ශනය ක්‍රියාත්මකව – සජීවී ආකාරයෙන් – ප්‍රායෝගිකව දැකිය හැකි ගම්මාන දහසකින් එකක් හෝ දැකීමට එවැන්නවුන්ට උවමනාවක් හෝ විවේකයක් නොතිබෙන්නට ඇත. විදේශික ලේඛකයන් ඒ පිළිබඳව ලියා ඇති ආකාරය ද ඔවුන් නොදන්නවා විය හැකිය.

38

පුළුල් දැනීමක් ලබා ගැනීමේ පිපාසය

මම ඔගස්ටින් තම්බිමුත්තු මහතාගේ උසස් ඉංග්‍රීසි පාඨමාලාව හැදෑරීමි. දවසක් කේ. එම්. සියනේරිස් මුදලාලි බාප්පා ගුරු විදුහලට පැමිණ "පුතාට අවශ්‍ය පොත් මොනවාදැයි" මගෙන් ඇසීය. තම්බිමුත්තු මහතා අපට නියම කළ සියලුම පොත් ලැයිස්තුව ඔහුට දුනිමි. ආපසු ඕපනායක යන ගමනේදී, එතුමා එම සියලුම පොත් විශාල මුදලකට මිලට ගෙන මට බාරදී ගියේය. පැරැණි චෝසර්ගේ කාලයේ සිට වත්මන් ඩී.එච්. ලෝරන්ස් යුගය දක්වා ගද්‍ය පද්‍ය ඉංග්‍රීසි පොත් කියවීමේ වාසනාව ඒ දිනවල මට උදා විය.

මේ කාලයේ පඩියෙන් අධික මුදලක් මට ලැබිණි. කුඩා කාලයේ සිට පොත් මිලට ගැනීමේ හා කියවීමේ පුරුද්ද මට තිබුණේය. මරදානට එන විට, සිංහල ඉංගිරිසි පොත් සිය ගණනක් මා ළඟ තිබුණේය. නමුත් මේවා එකින් එක දිනපතා ගෙන ගොස් වික්ස් පරණ පොත් සාප්පුවට මා ළඟ සිටි ඥාති ළමයකු විසින් විකුණා ඇති බව මම දැන ගත්තේ බොහෝ කලකට පසුවය.

මහරගමට තවත් දෙවරක් පැමිණි සියනේරිස් බාප්පා අති ගරු පැළෑණේ වජිරඤාන මහා නාහිමියන්ගේ ආදාහනයටද, එකල තරුණ වියේ සිටි භික්ෂූන් වහන්සේ නමක් වූ මඩිහේ පඤ්ඤාසීහ මහා නාහිමියන්ගේ නායක උත්සවයටද ඔහුගේ කාරෙකෙන් මා කැඳවා ගෙන ගියේය.

එක්දහස් නවසිය පනස්හයේ පැවැති මහජන ඡන්දයේදී කෙසේ හෝ එක්සත් ජාතික පක්ෂයෙන් මා අපේ ගම් පළාතේ අසුනකට තරග කරවන්නට සියනේරිස් බාප්පා පක්ෂයේ අය සමඟ කතාබස් කොට මගේ කැමැත්ත විමසීය. මා දේශපාලන ක්‍රමයේ වෙනසක් දකින්නට කැමති බවත්, එහෙත් පාලක පක්ෂය පැරදවීමට මෙවර බණ්ඩාරනායක මහතාට උදව් කරන බවත් මා ප්‍රකාශ කළ විට ඔහු පුදුම විය. දේශීය සංස්කෘතියත්, දේශීය ස්වාධීනත්වයත්, වරප්‍රසාද නොලත් පන්තියක් වෙනුවෙන් මා වැඩ කරන බවත්, එහෙත් මගේ ප්‍රධාන ඉලක්කය පක්ෂ

හා බලකාමී දේශපාලනයෙන් තොර ජනතා සහභාගිත්වයක දේශපාලනයකට රට යොමු කිරීම බවත්, මම එතුමාට තේරුම් කර දුනිමි.

එදායින් පසු ඔහු මාස කිහිපයක්ම මා හමුවීමට නො පැමිණියේය. එහෙත් පණිවුඩයක් එවා, ජන්දයෙන් පසු මා ඔ්පනායකට ගෙන්වූයේ වෙනත් කරුණක් සඳහාය. ඒ මට කපුකමක් කිරීම සඳහාය. එය ද මම කාරුණිකව ප්‍රතික්ෂේප කළෙමි. මම මගේ පියා මෙන්ම, බලයට හෝ ධනයට කෑදර වූ හෝ බිය වූ හෝ පුද්ගලයෙක් නොවීමි. යුක්තිය හා සාධාරණත්වය ධනයට වඩා අගනේය.

හැම සතියකම සවසට දෙතුන් වරක් විවිධ සංගම් මගින් අපි ප්‍රසිද්ධ දේශපාලකයින්, උගතුන් අපව ඇමතීමට ගෙන්වා ගතිමු. ගරු මඩිහේ පඤ්ඤාසීහ මහ නාහිමි, ගරු නාරද නාහිමි, ගරු ඥානසත්ත මාහිමි, ගරු ඤාණසීහ මාහිමි ආදී වූ සංඝයා වහන්සේලාද, ආචාර්ය ඇන්.ඇම්.පෙරේරා, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා, වෛද්‍ය එස්.ඒ. වික්‍රමසිංහ, පීටර් කෙනමන්, ඩඩ්ලි සේනානායක, ජී.ජී. පොන්නම්බලම්, එම්. ඩී. බණ්ඩා, ඒ. රත්නායක ආදී වූ දේශපාලකයන්ද, ආචාර්ය ඊ. ඩබ්ලිව්. අදිකාරම්, විනිශ්චයකාර එස්.ඒ. විජේතිලක, එස්. එෆ්. ද සිල්වා, මහාචාර්ය කේ.එන්. ජයතිලක, මහාචාර්ය ජේ. ඊ. ජයසූරිය ආදී වූ අධ්‍යාපනඥයින් ද, ඩී. බී. ධනපාල, ටාසි විට්ටච්චි, මීමන ප්‍රේමතිලක ආදී වූ ප්‍රවීන පත්‍ර කලාවේදීන්ද මේ අන්දමින් අප අමතා කථා කළ අය අතර වූහ.

39

නාලන්දාවේ සේවයට බඳවා ගැනීම

ඡායාරූප: 110
එම්. ඩබ්. කරුණානන්ද මහතා

මා මහරගම ගුරු අභ්‍යාස විද්‍යාලයයේ සිටි 1956 සහ 1957 යන දෙවසර තුළ දී ඉගෙනීමේ කටයුතු හැරුණ විට, මගේ කාලය ගෙවුණේ සමාජ සේවා සංගමයේ, බෞද්ධ සහෝදරත්වයේ සහ ක්‍රිකට් සංගමයේ කටයුතුවලටයි. දිනක් සවස ක්‍රිකට් පිත්තත් රැගෙන මම ක්‍රීඩා පිටිය වෙත ගමන් කරමින් සිටියෙමි. විදුහල්පතිතුමා කාර්යාලය ඉදිරිපිට අමුත්තන් දෙදෙනෙකුත් සමඟ කතා කරමින් සිටිනු මම දුටුවෙමි. එතැන පසු කොට ටික දුරක් යන විට කවුදෝ අත්පුඩි ගසනවා ඇසී, හැරී මම ආපසු බැලුවෙමි. විදුහල්පති ඩී.ජී. සුගතදාස මහත්මා මට ආපසු පැමිණෙන ලෙස සංඥා කළෙන් මම ඔවුන් සිටි තැනට ගියෙමි.

මා අමතා කතා කළේ විදුහල්පතිතුමා නොවේ. කලුපාට උසට සරිලන මහතක් තිබුණ, උපැස් යුවළක් පළඳා සිටි, තේජවන්ත පුරුෂයෙකි. ඔහු ඇඳ සිටියේ උතුරු සළුවක් ද සහිත ජාතික ඇඳුමකි. කතා කළේ ඉංගිරිසියෙනි.

"අයියේ, කැමති ද – නාලන්දා ගුරු මණ්ඩලයට බැඳෙන්න?"

මා පිළිතුරු දීමට ප්‍රථම අපේ විදුහල්පති සුගතදාස මහතා කතා කළේය.

"මේ නාලන්දා මහා විද්‍යාලයාධිපති ඇම්.ඩබ්ලිව්. කරුණානන්ද මහතා. මේ නාලන්දා මධ්‍යම අංශයේ ප්‍රධානාචාර්ය සිසිල් අබේකෝන් මහතා."

මම මේ දෙපළගේම හිස සිට දෙපතුළ දක්වා බැලීමි.

"ඔව් සර්, මා කැමතියි නාලන්දාවේ සේවයට බැඳෙන්න."

ඔවුහු එකිනෙකාගේ මුහුණ දෙස බැලූහ.

"කොහොමද ඔච්චර ඉක්මණට තීරණය කළේ?"

කරුණානන්ද මහතා නැවත කතා කළේය.

"සර්, මා කලු - උස - තරබාරු අයට කැමතියි. ඒ වාගේම මගේ ජීවිතයේ හැම තීරණයක් ම ගෙන තිබෙන්නේ ක්‍ෂණිකව."

ඡායාරූප: 111
ධර්මසේන සේනානායක මහතා

"දැන් - පසුව තීරණය වෙනස් කරන්න එපා." සුගතදාස මහතා පැවැසීය.

"නැහැ. සර්, ඒ ගැන බයක් වෙන්ට එපා."

"හොඳයි, මා ලිපියක් එවන්නම්." කරුණානන්ද මහතා පැවැසීය. එතැනින් නාලන්දා ගුරු මණ්ඩලයට බැඳීමේ සම්මුඛ පරීක්‍ෂණය මහ පාරේදීම අවසන් විය. මම කරුණානන්ද මහතාට හා අබේකෝන් මහතාට අතට අත දී තිදෙනාගෙන්ම සමුගෙන පිට්ටනියට ගියෙමි.

"ඔහු ගැනීමට හැකිවීම ඔබේ වාසනාවක්" සුගතදාස මහතා මා පිටුපස හැරී යන විට කියනවා ඇසිණි. නාලන්දාවට එකතුවීමත්, කරුණානන්ද මහතා මුණ ගැසීමත් මගේ විශාල වාසනාවක් බව පෙනෙන්නේ ජීවිතය දිහා ආපසු හැරී බලන විටය.

1957 ඔක්තෝබර් දාතමෙන් නාලන්දා විද්‍යාලයයේ ගුරුවරයෙකු වශයෙන් මා පත් කොට, කරුණානන්ද මහතා විසින් එවුණු ලිපිය මීට දින කීපයකට පසු මට ලැබුණේය. ඉන් පසුවයි මා මගේ ප්‍රථම භාරත සංචාරය කළේ.

නාලන්දා ගුරු මණ්ඩලයට බැඳීමට ලැබීම මහත් භාග්‍යයක් කොට මම සැලකුවෙමි. කලින් ධර්මරාජ විදුහලට බැඳීමට තීරණය කොට තිබුණු ධර්මා ගුණසිංහ මහතාද, ඒ තීරණය වෙනස් කොට නාලන්දා ගුරු මඩුල්ලටම බැඳුණේය. රාජකීය විදුහලේ ඉගෙන, විශ්ව විද්‍යාලයයෙන් විද්‍යා උපාධියක් ලබා සිටි කමල් දිසානායක මහතාද අප හා එකම දිනයේ නාලන්දා ගුරු මණ්ඩලයට එකතු වූ ගුරුවරයෙකි. අපට වඩා ජ්‍යෙෂ්ඨ ගුරුවරුන් වූ ධර්මසේන සේනානායක සහ ඇම්. ඒ.

තිලකරත්න ආදී ගුරු මහත්වරුද ඉතා ප්‍රිය එළවන මිතුරෝ වූහ. මේ නිසා නාලන්දා ජීවිතය මා ඇරඹූයේ බොහෝ සිත් සතුටකිනි. මහාචාර්ය ටියුලි ද සිල්වා, එල්. පී. විජයසුන්දර ආදී ගුරුවරුද අපේ සුහද මිතුරෝ වූහ.



ඡායාරූප: 112
එම්. ඒ. තිලකරත්න මහතා



ඡායාරූප: 113
කමල් දිසානායක මහතා



ඡායාරූප: 114
මහාචාර්ය ටියුලි ද සිල්වා

ඡායාරූප: 115

කොළඹ නාලන්දා විද්‍යාලයයේ විදුහල්පතිවරු වර්ෂ 1925 සිට 2000 දක්වා

ජී. පී. මලලසේකර මහතා
1925 – 1927



ජී. කේ. ඩබ්ලිව් පෙරේරා
මහතා 1927 – 1928

ජේ. ඇන්. ජිනේන්ද්‍රදාස මහතා
1928 – 1947

ඩී. සී. ලෝරිස් මහතා
1947 – 1952

එම්. ඩබ්ලිව්. කරුණානන්ද
මහතා 1956 – 1962



කේ. ඇම්. ඩබ්. කුරුප්පු මහතා
1962 – 1963



ඩී. ජේ. එදිරිසිංහ මහතා
1963 – 1964

ගුණපාල වික්‍රමරත්න මහතා
1964 – 1969

සුගුණදාස අතුකෝරළ මහතා
1969 – 1982

ධර්මා ගුණසිංහ මහතා
1982 – 1990

ඩී. ජී. සුමනසේකර මහතා
1990 - 1992

එඩ්වර්ඩ් රණසිංහ මහතා
1992 - 1999

වත්මන් නාලන්දා විදුහල්පති
හේමන්ත ප්‍රේමතිලක මහතා

40
මාරක තුනක්

බුදුරජාණන් වහන්සේ පිරිනිවී, දෙදහස් පන්සියයක් වසර ගිය තැන ශ්‍රී ලංකාවේ බෞද්ධ පුනර්ජීවයක් ඇරඹෙන බවට බොහෝ දෙනා තුළ විශ්වාසයක් තිබුණේය. මහරගම ගුරු විදුහලේ ඉගෙන ගත් තරුණයකු වශයෙන් මට ද මේ විශ්වාසය තදින් තිබූ අතර, වෙසක් සතිය අනුරාධපුර පූජනීය නගරයේ ගත කිරීමට මම අධිෂ්ඨාන කර ගෙන සිටියෙමි.

මේ 2500 බුද්ධ ජයන්ති වර්ෂයේ බෞද්ධ ශාසනයේ පුනරුදය සඳහා නායකත්වය දෙන්නේ දියසේන නම් කුමාරයකු බවත්, ඔහු 2500 වෙසක් පුන් පොහෝ දා කල එළි බසින බවටත් බොහෝ බෞද්ධයන් තුළ විශ්වාසයක් තිබුණේය. ගාල්ලේ විසූ මුනිදාස අභයවික්‍රම නම් මහතෙක් මේ පණිවිඩය දෙමින්, එකල ගමින් ගම ගොස් දේශනා පැවැත්වීය. ඔහුට බොහෝ උපකාර කළ අය ඔහු සමඟ සිද්ධස්ථානයෙන් සිද්ධස්ථානයට ගොස්, උපෝසථ ශීලය නිති පතා සමාදන් වූහ. කලක් සංස්කෘතික ඇමැතිව සිටි ඩී.එස්. ගුණසේකර මහතා ද මෙහි දී සැමැරිය යුතුය. පාසල් යන ශිෂ්‍යයකු ලෙස මේ දෙපළගේ දෙසුම්වලට සවන් දීමට මම ආශා කළෙමි. මේ කණ්ඩායමේ සිටි තවත් මගේ සිත් ගත් බෞද්ධ නායකයෙක් නම් ගාල්ලේ උසස් අධ්‍යාපන ආයතනයේ අධිපති පී.පී. ආටිගල මහතාය.

ගුරු විදුහලේ බුද්ධ ජයන්තිය සඳහා ලැබුණු සතියේ නිවාඩුව අනුරපුර ගත කිරීමට මම සූදානම් වීමි. ඒ අතර අප විදුහලේ සිටි වැඩිහිටිම ශිෂ්‍යයා වූ බේරුවල පැත්තේ පොන්නම්පෙරුම නම් මහතෙක්, මගේ කේන්ද්‍රය බලා "පුතා, ඉදිරි දෙසතිය තුළ හොඳට ප්‍රවේශම් වන්න. මාරක තුනක් පසු කිරීමට ඔබට තිබේ" යැයි මා ගැන අනාවැකියක් පළ කළේය. සාමාන්‍යයෙන් කේන්දර විශ්වාස නොකළ මම, ඔහුට විහිලු කොට ගමනට සූදානම් වීමි.

මට යැමට තිබුණේ රාත්‍රී දුම්රියේය. එදා උදේ වන විට බොහෝ ශිෂ්‍යයින් නිවෙස් බලා ගොස් තිබිණ. අපේ නේවාසිකාගාරයේ (දැනට

මාතලේ හින්දු විදුහලේ අධිපති) සිතම්බරම් නැමැති මහතෙක් හා පසුව දෙමළ ගුරු විදුහලක අධිපති වූ බාලසුබ්‍රමනියම් නැමැති මහතෙක් පමණක් මා සමඟ සිටියහ. නෙස්ටොමෝල්ට් ටිකක් බීමට වතුර ඉතිරීමට තබා මම නාන කාමරයට ගොස් නැවෙමි. වතුර උතුරන ශබ්දය ඇසුණු නිසා, තුවාය ඇඳගෙන වුත්, මා විදුලි උපකරණය ඉවත් කිරීමට අත තැබුවා පමණකි, ක්ෂණික ව වැදුණු විදුලි කම්පනයෙන් මා ඉවතට විසි වී බිම ඇද වැටුණු අතර, උතුරන වතුර මගේ එක කකුලක දිගටම වැටිණි. ශබ්දය ඇසී එතැනට දුවගෙන ආ සිතම්බරම් හා බාලා මා උස්සා ඇඳේ තබා මා සාමාන්‍ය තත්වයට පත් වනතුරු ප්‍රථමාධාර දුන්හ. සීතා බාලදක්ෂ නායකයෙකි. මම ද බාලදක්ෂයෙක් වීමි. විදුලි සැරයත් – උතුරන වතුර කකුලට වැටීමත් එක වරම සිදු වූ නිසා මා පිළිස්සුණේ නැත. කෙසේ හෝ අනුරපුර යෑමට පෙර, පොන්නම්පෙරුම මහතා කී මාරක තුනෙන් එකක් පැන්න බව මම අවබෝධ කර ගතිමි.

රාත්‍රියේ කොටුවේ දුම්රියපළට ගිය මම, අනුරාධපුරය බලා දුම්රියෙන් පිටත් වීමි. අමතර සරමක්, බැනියමක්, උතුරු සලුවක්, පොරෝනයක්, තුවායක් සහ දත් බුරුසුවක් හැරුණු විට, වෙන කිසිවක් මා ගෙන ගියේ නැත. උදේ ආහාරය සඳහා ආප්ප තුනක් හා කෙසෙල් ගෙඩියක් කෑ මා, තේ කෝප්පයක් බී කෙලින් ම ගියේ ශ්‍රී මහා බෝධීන් වහන්සේ සහ රුවන්වැලි සෑය අතර රුක් සෙවනේ තුබූ ගල් තලාවකටය. පැය කීපයක්ම එහි හොඳින් නිදා ගත් මම, මල් වතු ඔයට ගොස් නැවෙමි. නැවත මහපාරට ඒමට දහයියා ගොඩක් මැදින් මම ගමන් කළෙමි. ක්‍රමයෙන් මගේ දෙපතුළට උණුසුමක් දැනෙන්ට විය. පසුව මගේ දෙපය පිළිස්සෙන විටයි මට අවබෝධ වුණේ යටින් ගිනිගෙන දැවෙන දහයියා ගොඩක් උඩින් මා ගමන් කරන බව. කෙසේ හෝ ඒ උඩින් ම වේදනාවෙන් මම පාර දෙසට දිව්වෙමි. මගේ මෝඩකම කොපමණ වී දැයි කිවහොත්, කෙලින්ම ගොස් දෙපා දැම්මේ මල්වතු ඔයේ බැසගෙන යන ජලයටය. එවිට දෙපතුළ පුරා දිය පට්ටා මතුවිණි. ඉතා වේදනාවෙන් ශ්‍රී මහා බෝධි පන්සල වෙතට ගියෙමි. එහි සිටි කුඩා හිමි නමක් මගේ දෙපතුළේ ගා ගැනීමට තෙල් වගයක් ලබා දී, මට නැවතීමට කාමරයක කොනක් ද පෙන්වා දුන්නේ ය. දොරගුලූ දමා තිබූ ළිඳක්ද පාවිච්චි කරන හැටි උන්වහන්සේ මට කියා දුන්නේය. එදා රාත්‍රියේ මා ගත කළේ ශ්‍රී මහා බෝධි විහාරයේය. පසළොස්වක පොහොය යෙදී තිබුණේ පසුදාටය.

උදේ පාන්දරින්ම දස දහස් සංඛ්‍යාත මිනිසුන් ද සමඟ මම ද අටසිල් සමාදන් වීමි. මා ළඟම අනුරාධපුරයේ රජයේ සේවකයෙක් වූ පියසේන නැමැති මහතෙක් හා ඔහුගේ මිතුරන් කීපදෙනෙක් ද, මිහිරිපැන්නේ කුමාරසිංහ නැමැති මහතෙක් ද සිටියහ. ඔවුන් සමඟ මිත්‍ර වූ මම, එදා දවසම ගත කළේ ඔවුන් සමඟ විවිධ වතාවත්වල යෙදෙමිනි.

රාත්‍රියේ රුවන්වැලි සෑ මලුවේ දකුණු දොරටුව ඉදිරිපස අපි වාඩි වීමු. පේන තෙක් මානයේ එකම හිස් ගොඩක් වූ අතර, වරින් වර බැතිමතුන්ගෙන් නැගෙන සාදු නාදය හැරුණු විට, ඉහළ ආකාශයේ පායා බැබැළෙමින් තිබුණු වෙසක් පුන් සඳේ එළිය තරමටම මුළු පරිසරයම නිශ්චලව තිබුණේය.

එහි සිටි බැතිමතුන්ගෙන් සෑහෙන පිරිසක ගේ අවධානය යොමු වූයේ ඒ කාලයේ රට පුරා විසිරී සිටි එදා දකුණු දොරටුව ඉදිරිපසට රැස්ව සිටි තාපස හාමුදුරුවරුන් වෙතය. 2500 බුද්ධ ජයන්තිය කඩාකප්පල් කිරීමටත්, සාමාන්‍ය මහා සංඝයා වහන්සේ සමච්චලයට භාජනය කිරීමටත්, කතෝලික ආක්‍රමණය විසින් කරන ලද උපක්‍රමයක් හැටියට ඒ කාලයේ මේ තාපස නිකාය ගැන මතයක් තිබිණි. කෙසේ හෝ මේ කියන දියසේන කුමාරයා එහි ප්‍රධානියා වත් දැයි යන සැකය මැදියම් රය ළංවන විට අපේ සිත්වලට ද නො ආවේ නොවේ. අපිදු දක්ෂිණ දොරටුව ඇරෙන තුරු බලා සිටියෙමු.

මැදියම් රයට මිනිත්තු කීපයක් තිබිය දී වරින් වර චූඩා මාණික්‍යයෙන් ලස්සන රැස් වළලු විහිදෙනවා මම ද දුටුවෙමි. සමහර විට සඳ කැලුම්වල වෛර්ණ පරාවර්තනයක් ද විය හැකිය. එහෙත් බුදු රැස් මාලාවක් ලෙසම විශ්වාස කළ අපි, වරින් වර සාදු නාද දීමු. දැන් නම් මට ඒ බුදු රැස් මාලා බවට සැකයක් නැත.

එළිවන තුරුම අපි රුවන්වැලි සෑයේ මලුවේ අතිශය ශ්‍රද්ධාවෙන් කාලය ගත කළෙමු. එළිවන යාමයේ තාපස හාමුදුරුවරුන් බලාපොරොත්තු කඩවීම නිසාදෝ, ක්‍රම ක්‍රමයෙන් රුවන්වැලි සෑ මලුවෙන් පිටත්ව ඈතට සුපුරුදු හෙමින් ගමනින් ගොස් නොපෙනී යනවා අපි දුටුවෙමු.

පෝයදාට පසුවදා, සිල් පවාරණය කළ මම, පියසේන මහතාගේ නිවසට ගොස් කුමාරසිංහ ද සමඟ දවස ගත කළෙමි. සන්ධ්‍යා වරුවේ අනුරපුර පූජනීය නගරයේ විවිධ සිද්ධස්ථාන හා නටබුන් නරඹමින්

රාත්‍රියේ නැවතා ගල් තලාවක නිදා ගතිමු. දැන් මගේ පාලුවට කුමාරසිංහ සිටී.

පසුව දා මිහින්තලා පව්වට යෑමට අපි පිටත් වීමු. කඳු බෑවුම දිගේ අපි කලුදිය පොකුණ දිසාවට ඉහළට නගිමින් සිටින විට, වයසක උපාසිකාවක් හති දමමින් ඉහළට යෑමට තතනනවා දුටිමු. ඇය වාරු කරගෙන, කලුදිය පොකුණු ඉවුරට යෑමට අපි උදව් කළෙමු. එවිට කලුදිය පොකුණේ නෑමට සිතක් ආවෙන්, මම දියට පැන පීනන්ට වීමි. එහා කෙළවරේ පෙනෙන ගල් තලාව ළඟට යෑමට යාර කීපයක් පීනාගෙන යන විට, අප උදව් කළ වයසක අම්මා කෑ ගසන හඬ ඇසී ආපසු හැරී බැලුවෙමි. එවිට ඔවුන් කෑ ගසමින්, මට ආපසු පීනන මෙන් අත වනනවා දිටිමි. කිඹුලෙකුවත් ඇත් දෝ යි සිතූ මම වහාම ආපසු හැරී මෙගොඩට පීනුවෙමි. මට දැනගන්ට ලැබුණේ තව යාර කීපයක් මා ඈතට පීනුවා නම් මඩේ එරෙන බවය. ඊට දින කීපයකට පෙර ඒ අන්දමින් තරුණයෙක් මඩේ එරී දියේ ගිලී මිය ගොස් තිබේ. පොන්නම්පෙරුම මහතාගේ අනාවැකිය අනුව තුන් වැනි මාරකයෙන්ද මා බේරුණ බව මට අවබෝධ වූයේත්, මතක් වූයේත් එවිටය.

මහරගම ගත කළ ජීවිතය අත්දැකීම් රාශියක් ලැබීමට ප්‍රයෝජනවත් විය. සමහර උසස් යැයි සම්මත විදුහල්වලින් ආ ශිෂ්‍යයන්ගේ පන්ති ආකල්ප ගැන දැන ගැනීමටද මේ කාලය මට ප්‍රයෝජනවත් විය. එයින් එක් සිද්ධියක් මගේ මතකයට ඒ. නම් සඳහන් කිරීමෙන් මම වැළකෙමි.

ලොකු පිරිසක් සිටින ඕනෑම නේවාසිකාගාරයක මතු වන ප්‍රධාන ප්‍රශ්නය නම් ආහාර ප්‍රශ්නයයි. කටට රසට දෙමාපියන්ගෙන් ගෙදර උයන ආහාරයට පුරුදු වූ තරුණ-තරුණියන්ට, ඒ රස හා ගුණය විශාල පිරිසකට උයන තැනක නො ලැබෙන බව අවබෝධ වන්නට කලක් ගත වේ.

41

බඩගිනි නිවීමට ගොස් සිදු වූ ඇබැද්දිය

මහරගම ගුරු විදුහලේ නේවාසිකාගාරය එකල පිහිටියේ මහාමේඝ උයන නම් ස්ථානයේය. එතැන සිට මහරගම කඩමංඩිය පෙනේ. ඇතුලුවන තැනම නේවාසිකාගාරය භාර කථිකාචාර්යවරයාගේ නිවස පිහිටා තිබේ. එවකට ඒ ධූරය ඉසුලුවේ අපේ ශාරීරික අභ්‍යාස භාරව සිටි, ශ්‍රී ලංකාවේ එකම ඔලිම්පික් ශූරයා වශයෙන් එවකට ප්‍රසිද්ධ වූ ඩන්කන් වයිට් මහතාය. අපි දෙදෙනා හොඳ මිත්‍රයන් වීමු. සන්ධ්‍යා වරුවේ බොහෝ දිනවල එතුමා සමඟ මම කථා කරමින් කාලය ගත කළෙමි.



ඡායාරූපඃ 116
ඩන්කන් වයිට් මහතා සමග

ඩන්කන් වයිට් මහතා කී පොඩි කතාවක් මට මතකය. යාර 400 හර්ඩල්ස් තරඟයේ ඔහු දුවන විට අන්තිම කොටසේදී තමා මුලු ලංකාවම උසුලාගෙන යන විදියේ හැඟීමක් ඔහුට ඇති වූ බවත්, හොඳ පුහුණු කරන්නෙක් ඔහුට සිටියා නම්, ඔහු තුන්වැනි තැන නොව පළමු තැන ගන්නා බව ජයග්‍රාහකයා පුහුණු කළ තැනැත්තා තරඟයෙන් පසු ඔහුට කී බවත්, ඔහු මා සමඟ පැවැසීය. උපතින් බර්ගර් ජාතිකයෙකු වූ ඔහුට, වෙනත් ඕනෑම සිංහල බෞද්ධයකුට තිබූ ජාත්‍යාලයයක් තිබුණු බවට කිසිම සැකයෙක් නැත. එහෙත් පටු ජාතිවාදය, ජාත්‍යාලයක් හැටියට වරදවාගෙන වත්මන් සිංහලයා ලෝක සමාජය ඉදිරියේ පටු

මිනිසෙක් වනු දැකීම, අතිශයින්ම වේදනා ගෙන දේ. ඩන්කන් වයිට්, එංගලන්තය තම මව් රට කරගෙන වාසය කළේය.

මේ ලියන දිනට දෙවසරකට පෙර ගෝල්ෆේස් හෝටලයේදී ඩන්කන් වයිට් මහතා හමුවීමට මමත්, ධර්මා ගුණසිංහ මහතාත්, සිරිල් ඒකනායක මහතාත් ගියෙමු. බොහෝ වේලාවක් අපි අතීත තොරතුරු කතා කළෙමු. සර්වෝදය පොත් කිහිපයක් ද තෑගි කළෙමු. ඊට මාස කිහිපයකට පසු ඔහු මිය ගිය බව අසා දුක් වීමු. ඩන්කන් වයිට් මැතිනියට ශෝක පණිවුඩයක් යැවීමි. ඊට පිළිතුරු එවූ ඩන්කන් වයිට් මැතිනිය ඇන්ජලා, සඳහන් කර තිබුණේ ඩන්කන් වයිට් මහතා මියෙන විට ඔහු කියවමින් සිටියේ අප දුන් පොතක් බවය.



ඡායාරූප: 117
ගෝල්පේස් හෝටලයේ දී ධර්මා ගුණසිංහ මහතා සමග ඩන්කන් වයිට් හමුව

නේවාසිකාගාරයේ අධිකාරි වශයෙන් සේවය කළේ සෙබැස්ටියන් හෙට්ටිආරච්චි නැමැති මහතෙකි. ඔහු ද මගේ මිතුරෙක් විය. මගේ සමරු පොතේ ඔහු ලියා තිබුණේ

"ආරි, ඔබ දැන් මෙහි සිටින ආකාරයට සැම විටම සිටිය යුතුය (Ari, Always be what you are!)" යනුවෙනි. කුස්සියේ හා කෑම ශාලාවේ වැඩ කළ සේවක පාලනයත්, නේවාසිකාගාරයේ සෙසු කටයුතුත් ඔහු භාරයේ තිබුණේය.

ශිෂ්‍යයන්ගේ ඡන්දයෙන් තෝරා පත් කර ගත් ආහාර කමිටුවක් මගින් මුදල් එකතු කරගෙන ආහාර ද්‍රව්‍ය මුදලාලිතැන්ගෙයට මිලට ගෙන දීමත්, ආහාරවල තත්වය උසස්ව තබා ගැනීමත් මේ කමිටුවේ වගකීම විය. ඔවුන්ට ලැබුණ ප්‍රති උපකාරය නම්, හැමදාම දොස් ඇසීමය. පසු

ඡායාරූප: 118
ඩන්කන් වයිට් මහතා, ඔහුගේ දියණිය සහ මිනිබ්රිය සමග



කලෙක ඩී.එස්. සේනානායක විදුහලේ විදුහල්පතිව සිටි රැල්ෆ් අලස්ගේ බල කිරීම නිසා, මම ද ආහාර කමිටුවේ ලේකම් වශයෙන් සේවය කිරීමට එක් වාරයක දී එකඟ වීමි. මහරගම හන්දියේ කඩවලට හා පොළට ගොස්, ආහාර ද්‍රව්‍ය තෝරා ගෙනැවිත් දීම එක්තරා විදියක ජීවිත අත්දැකීමක් විය. ගෙදර දී කවදාවත් කුස්සියට යෑමට හෝ කඩපිලකට ගොස් යමක් ගෙන ඒමට හෝ අම්මාගෙන් හා තැන්දලා දෙදෙනාගෙන් අවසර නොලත් මට, මුල් දිනවල දී මෙය මහත් විනෝදයක් විය.

විශාල පිරිසක් ආහාර ගන්නා ස්ථානයක් නිසා බොහෝ ආහාර ඉවත ගියේ ය. කුස්සියේ සේවකයෝ මේ ආහාර ඉඳුල් සියල්ල එකතු කොට කුස්සිය පිටුපස තිබුණ විශාල කුණු බාල්දිවලට දමති. දිනපතාම දෙවරක් මේ ආහාර ගෙන යෑමට කොහේදෝ සිට මුදලාලි කෙනෙක් අත් කරත්තයක් එවයි. පසු කලෙක කබල් වෑන් එකක් ද එව්වා වාගේ මට මතකය. කෙසේ හෝ මේ අහක යන ආහාර මුදලාලිගේ ඌරු කොටුවට යයි. ඌරෝ තර වෙති. පසුව තර වූ ඌරන් මරා මස් විකුණන මුදලාලි තර වෙයි. බොහෝ විට මම මේ ගැන කල්පනා කරමින් සිටියෙමි.

දිනක් අප ආහාර ගෙන නිම වූ පසු මම කුස්සිය පැත්තට ගියෙමි. කර වහපු සුදු කබායක්, සුදු රෙද්දක් හා පීකිරුණු කමිසයක් ඇඳ ගත් සුදුම සුදු හිසකෙස් පිටුපසට පීරා කුඩා කොණ්ඩයක් බැඳ ගත් තලඑළලු වයෝවෘද්ධ මිනිසකු කුස්සිය දෙසට බිම බලාගෙන ගමන් කරනු දුටුවෙමි. ඔහුගේ දේහය කෙසඟය; මිටිය. එහෙත් ඇඳුමෙනුත් ගමනෙනුත් අපේ ගමක වැදගත් ලජ්ජා බය ඇති වැඩිහිටියෙක්ය යන හැඟුම මට ආවේය. මම බලා සිටියෙමි. ඒ කාලයේ සාගත මල්ල යනුවෙන් අප හැඳින් වූ බෑගයක් ඔහු අත විය.

ඔහු එනු දුටු කෝකියා ශිෂ්‍යයන් ආහාර ගැනීමෙන් පිහන්වල ඉතිරි වී තිබුණු බත්, එළවලු – මාලු කෑලි ආදිය එකතු කොට කඩදාසි කොළයක ඔතා ඔහුගේ මල්ල තුළට දමනු මම දුටුවෙමි. 'පින් සිද්ද වේවා' යි බිනු මේ වැඩිහිටි මිනිසා, ආ පයින් ම ආපසු හැරී යෑමට පිටත් විය. ඔහුට නෑහෙන දුරට – ඔහු යන තෙක් සිට, මම ඔහු පිළිබඳ තොරතුරු කෝකියාගෙන් විමසීමි. කලක සිටම මොහු ඉතිරි ආහාර ගෙන යෑමට එන බව පමණකි, ඔහුට කීමට හැකි වූයේ. 'දුප්පතෙක් වෙනුවෙන් හදවත උනුවන්නේ දුප්පතකුගේ හදවත පමණයි.' කී මම හෙමි හෙමිහිට අර මිනිසා පිටුපස ගියෙමි. ඔහු දෙපැත්ත බලා මහ පාරෙන් එහා පැත්තට ගොස්, පරණ මහරගම පාර දිගේ හන්දිය දිසාවට ගියේය. මම ද පිටුපසින් ගියෙමි. ටික දුරක් ගොස් වම් පැත්තේ කඩ කාමරයක් වැනි ගෙයක් තුළට ඔහු ඇතුලු විය. මම ද එතැනට ඇතුලු වීමි.

එක වරම මට දෙනෙත් වැටුණේ පැදුරු කබලක වැතිර සිටි ගැහැනියෙකි. ඇය මොහුගේ බිරිඳ වීමට බැරි බව මට එකවරම වැටහිණි.

"සීයා, මම දුටුවා ඔබ අපේ කුස්සියට පැමිණ මේ ආහාර පාර්සලය ගෙනෙනවා. මා ආවේ ඔබට වෙන උදව්වක් කරන්නට පුලුවන් දැ යි බැලීමට?"

ඔහු මගේ හිසේ සිට දෙ පතුළ දක්වා බියෙන් මෙන් බැලීය. තුෂ්නිම්භූතව මෙන් සිටි ඔහුට නැවත මම කතා කළෙමි.

"සීයා, බය නැතුව කියන්න. මට ඕනෑ මොනවා හරි උදව්වක් කරන්න. මම අලුතෙන් අපේ විදුහලේ ඇති කළ සමාජ සේවා සංගමයේ සභාපති."

"අනේ මහත්තයෝ මම බොහොම හොඳට හිටි කෙනෙක්. මම පොඩි කාලේ මැකලම් පාරේ කොම්පැනියක සේවයට ආවේ. ඒ කාලයේ සුදු මහත්තුරුන්ට යි ඒක අයිති. වෙන කොහේ වත් මම වැඩ කරලා නැහැ. මම අවුරුදු හතළිස් ගණනක් එහි සේවය කළා. දැනට අවුරුද්දකට පෙර මගේ භාර්යාව මැරුණා. අපට ඉන්නේ එක ම ළමයයි. මේ ඒ දුව. දැනට අවුරුදු විසි අටක් වෙනවා. පොඩි කාලේ සිට ම පක්ෂ ඝාත රෝගය හැදී මේ අහිංසක දරුවා මේ තත්වයට වැටුණා. භාර්යාවගේ අවසාන කටයුතු කරල ඉවර වෙන කොට මට ඉතුරු වුන දෙයක් නෑ. දරුවා බලා ගන්නත් කවුරුවත් නැහැ. කෙසේ හෝ මම වැඩට ගියා. හැබැයි කවදාවත් ඊට පෙර දවසක් වත් නිවාඩු නොගත්

මට, නිතර නිවාඩු ගන්ට වුණා. දවසක් ලොකු මහත්තයා මට අඩගහලා මාසෙක පඩි දීලා කිව්වා තමුසේ තවත් නාවාට කමක් නැ කියලා. මගේ දුක ඒ මහත්තයාට කිව්වහම උත්තැහේ කිව්වේ, ඒ ගොල්ලො බිස්නස් කරනවා මිස – සමාජ සේවේ කොරන්නේ නැ කියලා. ඔෆිස් එකේ ඇත්තොත් යමක් එකතු කරලා දුන්නා. ඒ සියල්ලෙන්ම මාස කීපයක් අමාරුවෙන් යැපුණා. ඊට පස්සේ ජීවත්වෙන්නේ මහත්තයාලාගේ ඉඳුල් ටිකකට පින් සිද්ද වෙන්නයි. මේ ආහාරයෙන් තමයි අපි දෙන්නගෙම දවසම යැපෙන්නේ."

මගේ දෑසින් කඳුලු කඩා වැටුණා මට අද මෙන් මතකයි. ඒ අර කොම්පැනිකාරයන් කෙරෙහි වෛරයෙන් ද – මේ මිනිසුන් කෙරෙහි කරුණාවෙන් දැයි මට මතක නැත. මම වචනයක් නොදොඩා ආපසු නේවාසිකාගාරයට ගියෙමි.

පසුවදා ඒ වෙලාවටම කුස්සියට ගිය මම මුලුතැන්ගෙයි බාරකරුවාට මෙසේ කීමි:

"මම ආහාර කමිටුවේ ලේකම්, ඔබ දන්නවා නේ. ඉඳුල් ආහාර දෙනවාට වඩා හොඳයි – පිරිසිදු ආහාර දෙන එක. සද්ද නැතුව පිරිසිදු ආහාර පාර්සලයක් හදා – අර වයසක මිනිසා ආවාම දෙන්න. අද අපි ඔහුට කෑම ශාලාවේම – මගෙත් එක්ක වාඩිවෙලා කන්න දෙමු. අපි දෙන්නටම ලොකු පිනක් නේ."

කෝකියාගේ නම මට මතක නැත. බොහෝ දෙනා ආම්බොලන් කියා ඔවුන්ට කතා කළත්, අප ඔවුන්ට මිනිසුන් විලස සැලකුව නිසා ඒ මිනිස්සු අපට ගෞරවයක් හා ආදරයක් දැක්වූහ.

සියලුම ශිෂ්‍යයින් ආහාර ගෙන යනතුරු සිට, මේ වැඩිහිටි මිනිසා මගේ මේසය ළඟට කැඳවා බත් පිඟාන දී වාඩි කරවා කෑමට සැලැස්සුවෙමි. මම ද ආහාර බුදිමින් සිටියෙමි. කෑම ශාලාවේ අනෙක් කෙළවරට ප්‍රමාද වී තවත් ශිෂ්‍යයෙක් ආවේය. ඔහු රාජකීය පෙළපත්තියේ පුහු තරුණයෙකි. ඔහු කෑම මේසයේ වාඩි වී අප සිටිනා දෙස බලමින් කෑම බෙදා ගනු දුටුවෙමි. හිටි හැටියේ ඉංගිරිසි භාෂාවෙන් කෑ ගැසූ මොහු බෙදා ගත් කෑම ද ආපසු දීසිවලට විසිකොට, මේ උසස් විදුහලට හිඟන, පහත් අය අවුත් හිඟන්නන් සමඟ කෑම කන තැන, අපට කන්නට පුලුවන් දැයි කියා, මා දෙස රවා යන්නට ගියේය.

"හිඟන්නන් එක්ක කන්න බැරි නම් පලයන් ගෝල්ෆේස් හෝටලයට"යැයි මොහුට කී මම "සීයා බය නැතුව කන්න යැ"යි කීවෙමි.

ඉතා ලැජ්ජාවෙන් බයෙන් ආහාර ගැනීම නිම කළ ඔහු, අඩියට දෙකට ඉක්මණින් ගේට්ටුවෙන් පිට වී කෑම පාර්සලය ද සාගතමල්ලේ දමා ගෙන යන්ට ගියේය. කෝපයෙන් වෙව්ලමින් සිටි මට, තවත් බත් ඇටයක්වත් කෑමට සිත් දුන්නේ නැත.

ටික වේලාවකට පසු ඩන්කන් වයිට් මහතා, ඔහුගේ රිදී දත පේන සේ හිනහවෙමින්, මා සිටි කාමරය පැත්තට ආවේය.

"ආරි, ඔබට යමක් කියන්නට තියෙනවා" යි කී ඔහු මා කැඳවා ගෙන ගෙදරට ගියේය. අර රාජකීය පුද්ගලයා මට විරුද්ධව පැමිණිලි කළ බවත්, එවිට ඔහු දුන් අවවාදය – ශිෂ්‍ය සමුලුවේ රැස්වීමක් කැඳවා මට විරුද්ධව විශ්වාසභංග යෝජනාවක් ගෙනෙන හැටියට බවත් සිනාසෙමින් ඔහු මට කීවේය.

මා ආපසු හැරී එන්ට හදන විට නියම මහත්මයකු වූ ඩන්කන් වයිට් කීවේ:

"ඕකට අපි රැස්වීමේදී හොඳ පාඩමක් උගන්වමු" යන්න පමණකි.

මහා සභා රැස්වීමකට අවශ්‍ය අත්සන් ගණන එකතු කරමින් මොහු දැන් ශිෂ්‍යයන් අතරට යයි. කාරණය දැන ගත් විට, ඔහු වාගේම මහන්තත්ත දෙතුන් දෙනකු හැරුණ විට අන් ශිෂ්‍යයෝ එයට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළහ. මෙය දැනගත් මා සහ රැල්ෆ් ඇලස් ඇතුලු මගේ මිත්‍රයින් කළේ, කෙසේ හෝ මොහුට අවශ්‍ය අත්සන් ගණන එකතු කර ගැනීමට සිසුන්ට රහසේ කියා උදව් වීමය.

ඩන්කන් වයිට් මහතාගේ සහභාගිත්වය ඇතිව මහා සභා රැස්වීම ඇරඹිණි. මේ වගේ වැඩට රැල්ෆ් අලස් හරි හපනෙකි. ඔහු මුලසුනේ විය. විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරමින් අපේ යාලුවා කතා කළේය. අපේ වැදගත්කමත්, විද්‍යාලයයේ උසස්කමත්, එහි තිබෙන ඉහළ සම්ප්‍රදායනුත් ගැන ඔහු කතා කොට, මට විරුද්ධව විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කළේය. තාවකාලිකව ඔහුට යාලුකම් පෙන්වූ අපේ මිත්‍රයෙක් එය ස්ථිර කළේය. ඡන්දය ගැනීමට පෙර නිදහසට කරුණු කීමේ අවස්ථාව මට එළඹිණ.

ඡායාරූප: 119
ආර්. අයි. ටී. අලස් මහතා

මම පළමුවෙන්ම මේ මිනිසා පිළිබඳ මා සොයා ගත් කරුණු කීවෙමි. ඉන්පසු

ආහාර නාස්තිය ගැනත්, ඉතිරි වන ආහාරවලට වෙන දෙය ගැනත්, මුදලාලිගේ උඟුරු කතන්දරයත් කීවෙමි.

මා කළ මානුෂික ක්‍රියාව ගැනත්, මේ යෝජකයාගේ උඟුරු ක්‍රියාව ගැනත් සඳහන් කළ මා, සභිකයන්ට තිබෙන්නේ මේ දෙකෙන් එකක් තෝරා ගැනීම බව, මා කියත්ම ශිෂ්‍යයෝ එකවරම උඟුරෝ අපට එපා යැයි කෑ ගසමින් යෝජකයා දෙසට ගියහ. සිදු වූයේ ඔහු බලාපොරොත්තු නොවූ දෙයකි. ශිෂ්‍යයන්ගේ කර පිටින් ඔහු ශාලාවෙන් පිටතට යන සැටි අපි දුටිමු. සභාවේ වැඩ එතැනින් ඉවර වූ බව මුලසුනේ සිටි රැල්ෆ් ඇලස් මහතා ප්‍රකාශ කළේය.

ටික වේලාවකට පසු ඩන්කන් වයිට් මහතා සමඟ ඔහුගේ ගෙදර දෙසට යමින් සිටි අපට පෙනුණේ, නේවාසිකාගාරය ඉදිරිපිට තිබුණු ගඳ ගහන වතුර වලෙන් නැගිට සුදු සූට් එකේ මඩ ගසා දමමින් තනියම ගොඩට එන අපේ යාලුවාය.

"ආ යූ ඕල් රයිට්" යැයි සිනාසෙමින් ඔහුගෙන් ඇසූ වයිට් මහතා, තේ කෝප්පයක් අප හා බෙදා ගැනීමට අපව ගෙදරට කැඳවාගෙන ගියේය.

දින කීපයක් ඇතුළතදී අර අහිංසකයන් දෙදෙනාගේ ආහාර ප්‍රශ්නය පමණක් නොව, ඇඳුම් හා සෙසු අවශ්‍ය දේවල්ද පරිත්‍යාග කිරීමට තරම් අප විදුහලේ සිසු සිසුවියෝ මානුෂික වූහ.

පසු කලෙක මේ සිසුවාද, මගේ කුලුපග මිත්‍රයෙක් වූවා පමණක් නොව, ඉතා ශ්‍රේෂ්ඨ ගතිගුණවලින් හෙබි ආදර්ශමත් ගුරුවරයෙක් හා සමාජ සේවකයෙක්ද විය.

42

වන මැද ප්‍රජාවන් තුළින් ජාතික පුනරුදයකට

ඡායාරූප: 120 මව්වරුන්ගේ දුක

කාගේවත් පිළිසරණක් නොමැතිව, නපුරු මෙන්ම, අහිංසක වන සතුන් මැද්දේ, ඔවුන් හා සහවාසීව, සොබා සම්පත් රැක ගන්නා ගමන්ම, එයින් පෝෂණය වෙමින් වන මැද ජීවත් වූ අපේ අහිංසක ජන කොට්ඨාශවලට මගේ සිත් යොමු වූයේ අබේසේකර මහතාගේ ඇසුර නිසාය.

අබේසේකර මහතා සමග බින්තැන්න ආදී ප්‍රදේශවල සති ගණන් ගත කිරීමේදී, ඒවායේ ජීවත් වූ මිනිසුන් ගැන මෙන්ම, වන ලැහැබ්වලට ද මා සිත් ඇදී ගියේ සොබා දහමට මා තුළ වූ සහජ ඇල්ම නිසා විය හැකිය. ගමේ ජීවත්වන යුගයේ මුහුදු වෙරළ දිගේ ඇවිදිමින් මහ මුහුද දෙස නොපෙනෙන තෙක් සිතිජය දක්වා බලා සිටීමට මම ප්‍රිය කළෙමි. "මා තවම මුහුදු වෙරළේ සිප්පි කටු ඇහිඳින කුඩා ළමයෙකු"යි අයිසැක් නිව්ටන් පඬිවරයා ප්‍රකාශ කළ වදන්, එහිදී මට මතක් විය. උණවටුන කන්ද, රූමස්සල කන්ද ආදී කඳු මුදුන්වල නැග මම බොහෝ වේලා ඈත මුහුද දෙස බලා සිටියෙමි.



ඡායාරූප: 121 දරුවන් දුක් විඳීම

මැද්දෙකන්දේ ජීවත් වන කාලයේ රාස්සගල ආදී ප්‍රදේශවල රුස්ස ගස්, දිය ඇලි අතරින් ගමන් කරන විට, බුදුහාමුදුරුවන් වහන්සේ ආනන්ද හිමියන් අමතා "ආනන්දය, මා මේ අතට ගත් කොළ ප්‍රමාණය වැඩි ද? මේ වනයේ තිබෙන කොළ ප්‍රමාණය වැඩි ද?" යන ප්‍රශ්නය ඇසූ සැටිත්, කැලයේ ඇති කොළ ප්‍රමාණය අප්‍රමාණ යැ යි පැවැසූ සැටිත්, මට මතක් විය. කොපමණ දේ ඉගෙනීමට තිබේ ද? ජීවත්වන සමාජය තුළින් මෙන්ම, සොබා දහමින් ඉගෙන ගත හැකි දේ ඉගෙනීමට මගේ තිබූ ආශාව කවදාවත් නොසන්සිඳුණේ ය.

අබේසේකර මහතාගේ මහ ම ගමන් කළ සහාය ග්‍රාම සංවර්ධන නිලධාරීන් කීප දෙනෙකු මට මතක් වේ. සිත්තන්ඩි ග්‍රාම සංවර්ධන අභ්‍යාස ආයතනය භාරව සිටි ඒ.සී. ඒබ්‍රහම් මහතා, මහින්දයේ දී මා සමඟ ඉගෙන ගත් බී. විජයපාල මහතා, පසුව මගේ බිරිඳගේ අක්කා සමඟ විවාහ වූ පී.බී. වීරකෝන් මහතා, රිචඩ් ඩයස් මහතා හා මිහිරිපැන්නේ මගේ ඥාතියකු වූ රත්නදාස ද සිල්වා මහතා ආදීන් මතක් වේ.

ඡායාරූප: 122 වන මැද වැදි පවුල්

1957 අප්‍රේල් 28 සිට දෙසතියක පමණ කාලයක් අබේසේකර මහතා හා වෛද්‍ය එස්. සෝදිනාදන් මහතාද සමඟ නැගෙනහිර පළාතේ වන මැද ගම්මානවලට ගිය ගමන මට හොඳින් මතක ය. මා තුළ එතෙක් පැවැති ජීවිත අරමුණු සම්පූර්ණයෙන්ම වෙනස් වී, මුලු ජීවිත කාලය ම පැඟුණු ජනතාවගේ අවදිවීමක් සඳහා කැප කිරීමට මා තීරණය කර ගත්තේ මේ සංචාරයේ දී ලැබූ අත්දැකීම්වලිනි.

ඡායාරූප: 123 තිසාහාමි සමග දඹානේ දී

තලවාකැලේ මගේ බාප්පොච්චී, ඒ.ටී.සී. ජිනදාස මහතා සමඟ අවුරුදු නිවාඩුව ගත කරමින් සිටි මම, දුම්රියෙන් බදුල්ලට ගොස් එතැනට කොළඹ සිට පැමිණි අබේසේකර මහතාගේ ජීප් රියේ පැමිණි පිරිසට එකතු වීමි. එතැන් සිට දෙසතියක්ම අප ගත කළේ මුලු නැගෙනහිර පළාතේම කොන් වූ ගම්මාන අධ්‍යයනය කිරීමටය.

මහඔය දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී එස්. සෝදිනාදන් මහතාගේ ගෙදර නැවතී මහ ඔය අවට තිබූ ගම්මාන නැරඹීමට අපි දින කිහිපයක් ගත කළෙමු. එම ගම් අතර, අප ගිය නිල්ඹබේ, පොල්ලෙබැද්ද, කුමුදුවින්න, දමුණුගම, ඉඩම්බෝව, නෙල්ලියැද්ද, මුල්ලෙගම, බෙලිගල්ල වසමේ දඹාන, උල්හිටියාව, කැරගොඩ, කන්දගන්විල, වැල්පල්ලෙවෙල,

ඡායාරූප: 124
ඩී. ඒ. අබේසේකර මහතා (වම් කෙළවරේ) මහාචාර්ය ඩී. ජේ. විජයරත්න මහතා (මැද කොට කලිසමක් ඇඳ) සහ සෙසු අය දඹානේ වැදි නායක තිසාහාමි සමග

කුඩාතලාව, බුදුගහදෙන, සියඹලාවින්න, කුඩාවෙල, පදුකුඹුර, පරගන්වත, කඩපල්ල, එක්බැහැර, උස්කිවුල, කඳුබැද්ද, අලුකැටියාව, රඹකැන්ඹය, අත්දෙගන්වල ආදී ගම්මාන – ඇලදොළ – වැව් – පොකුණුවල නම් මගේ මතකයට එයි.

ඡායාරූප: 125
මහාචාර්ය
ඩී. ජේ. විජයරත්න,
තිසාහාමි සමග.
මැදින් සිටින්නේ
ග්‍රාම සංවර්ධන
නිලධාරී
පී. බී. වීරකෝන්
මහතා

වැදි භාෂාවට අයත් වචන 60 ක් පමණ මම මේ ගමනේදී මගේ දින පොතේ සටහන් කර ගත් අතර, මේ ගම්මුන්ගේ සාමාජික, ආර්ථික තත්වය සහ සංස්කෘතිය පිළිබඳ ලිපි කිහිපයක්ම පුවත්පත්වලට, විශේෂයෙන් ලංකාදීප පත්‍රයට ඒ දිනවලදී ලියා හැරියෙමි. මගේ දින පොතේ සමහර අකුරු කාලයත් සමඟම කියවීමට අමාරු තරමට මැකී ගොස්ය. එහෙත් එදාත්, අදත් මේ ගම්වල ජනතාව ගේ දියුණුවක් ඇති වී ඇත්දැයි සොයා බැලීම වැදගත්ය.

මේ කාලයේ සිදුවූ එක් සිද්ධියක් මට මතකයි. අබේසේකර මහතාත් සමඟ පේරාදෙනිය විශ්ව විද්‍යාලයයේ එවකට සුප්‍රසිද්ධව සිටි මහාචාර්යවරයෙක් හමුවීමට ගියෙමි. ඔහුගේ දෙපාර්තමේන්තුව මගින් වැදි ජනතාවගේ භාෂාව ගැන පර්යේෂණයක් කොට, එම බස ආරක්ෂා කිරීමට යම් මෙහෙයක් කරන ලෙස ඔහුගෙන් ඉල්ලීමටයි අප ගියේ. ඔහුගේ දැනීම තරම්ම, තරබාරු වූ මේ පුද්ගලයා, අප දෙදෙනාගෙන් අපේ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් කවුදැ යි විමසීය. අප ළඟට ඉහළ නිලධාරියාගේ නම කී විට, ඔහුගේ ප්‍රධානියාගේ නම කවුද? ආදී වශයෙන් අසා අන්තිමට ඇමතිවරයා දක්වා ඉහළට අපේ උසස් නිලධාරීන් කවුදැයි විමසීය. අපේ ඉල්ලීම ස්වදේශ කටයුතු බාර ඇමතිවරයා හා අධ්‍යාපන ඇමතිවරයා මගින් කළහොත්, ඒ ගැන සලකා බැලිය හැකි බව මේ "පඬිතුමා" ප්‍රකාශ කළේය. මීට බොහෝ කලකට පසු ඇමරිකාවේ විශ්ව විද්‍යාලයක මා දේශනයක් කිරීමට ගිය

අවස්ථාවේ දී මේ මහාචාර්යවරයා මා කරන සේවය පිළිබඳ මහ ඉහළින් අගැයීමක් කොට, මා හඳුන්වා දුන්නේය. අපේ මිනිස්සු විදේශ ගත වූ විට දේශමාමකයෝ වීමට හරි හපන්නු ය.

ඡායාරූප: 126
නොදියුණු ගමක දරුවන්ගේ කොණ්ඩා කපන මාලතී වික්‍රමරත්න මැතිනිය

පසුව මහාචාර්ය ඩී. ජේ. විජයරත්න මහතා විසින් මේ අධ්‍යයනය කරන ලදී. ඔහුගේ පුතා විශේෂඥ වෛද්‍ය ලලිත් විජයරත්න අපේ නාලන්දා ශිෂ්‍යයෙකි.

ප්‍රගතිශීලී නව රජයක් මේ වන විට බලයට පත් වී ඇති නිසා 1957 මැයි 25 දා පහත සඳහන් සටහන ඉංග්‍රීසි බසින් මගේ දින පොතේ මම ලියා තැබුවෙමි:

"නව ජනතා රජය, මෙවැනි වනාන්තර මධ්‍යයෙහි වාසය කරන ජනතාව දෙස නො පමා ව, ප්‍රගතිශීලී ප්‍රතිපත්තියක් ක්‍රියාවට නංවනු ඇතැයි මම විශ්වාස කරමි. දැන් මේ ජනතාව දඬුවම් මත මේ ප්‍රදේශයට මාරු කරන ලද සමහර නිලධාරීන්ගේ ගොදුරු බවට පත්ව තිබේ. මොවුන් මිනීමෝරුන් වැනි පෞද්ගලික අංශයේ වෙළඳ තැරැව්කාරයන් සමඟ එකතුව අගනුවර ඉහළ තැන්වල සිටින සමහර බලවතුන්ගේ අවසරය ඇති ව ගංජා පැටවීම වැනි සමාජ විරෝධී ක්‍රියාවල ද යෙදේ."

නෙල්ලියැද්ද, පොල්ලෙබැද්ද ආදී ප්‍රදේශවලින් ඉතාමත්ම සරුවට වැඩුණු ලොකු දොඩම් සැතපුම් 11 ක් පමණ දුර කරපිට ම පටවාගෙන, පදියතලාව හන්දියට මේ අහිංසකයෝ රැගෙන එති. ලොකු දොඩම් ගෙඩි ශත 5, ශත 3 වශයෙන් තෝරාගෙන, කුඩා දොඩම් නොමිලයේම ලොරිවල දමාගෙන යෑම ඔවුන්ගේ සිරිතය.

අබේසේකර මහතාගේ ඉල්ලීමක් අනුව, අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලොරියක් පදියතලාව හන්දියට එව්වේ එකම එක වරකි. ඒ ලොරියට එම දොඩම් පටවා සාධාරණ මිලක් ලබා ගත් අහිංසක ගම්වාසීහු, ආපසු යන විට, මේ මිනීමෝරු ඔවුන්ගේ ඇස්වලට මිරිස් කුඩු ගසමින් ඉදිරියට රජයේ ආයතනවලට ඔවුන්ගේ නිෂ්පාදන විකිණීම තහනම් කළහ.

ඒ කාලයේ පොලීසියක් තිබුණේ නැත. පොලිස් බලය තිබුණේ ආදායම් පාලක නිලධාරීවරයා අතේය. එවකට එහි සිටි නිලධාරියාද

දඬුවමක් පිට එහි එවා තිබූ කෙනෙකි. ඔහුගෙන් ජනතාවට සාධාරණයක් ඉටු වූයේ නැත. ඔහුගේ සහාය ලැබුණේ නීති විරෝධී කටයුතු කරන පන්තියටයි. නව රජය මේ තත්වය වෙනස් කරනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි."

කොළඹට පැමිණි වහාම, මම එවකට සෘජු උසස් පොලිස් නිලධාරියෙක් ව ප්‍රසිද්ධව සිටි, සිඩ්නි සොයිසා මහතා හමුව මේ තත්වය තේරුම් කර දී, එහි පොලීසියක් පිහිටුවන මෙන් ඉල්ලා සිටියෙමි. ඒ ගැන සොයා බැලීමට එතුමා පොරොන්දු විය.

මා නාලන්දයේ වැඩ බාර ගැනීමෙන් පසු, නිල ඇඳුමෙන් ම සැරසී මා හමුවීමට නාලන්දයට ආ සිඩ්නි සොයිසා මහතා, මට කියා සිටියේ "ආරි, අර ප්‍රශ්නය ගැන මම හෙව්වා. ඕකට අත ගහන්න එපා. ඔබටත් මටත් වඩා බලවත් බලවේග ගංජා පිටුපස මෙන්ම – දොඩම් ගෙඩිය පිටුපසත් ඉන්නවා. ඔබ හොඳ කෙනෙක්. ඔබ අනතුරුවලට මුහුණ නොදී ඔය ගැන කිසිම දෙයක් ලියන්නට, කියන්නට එපා. මම ඒ ගැන මගේ ශක්ති ප්‍රමාණයේ හැටියට කටයුතු කරන්නම්."

මම සිඩ්නි සොයිසා මහතා කෙරෙහි පැහැදුණෙමි. එහෙත් 1956 සිදු වූ දේශපාලන විප්ලවය, හිල්වුනු එක් පතිට්ටුවක් මාරු කොට, තවත් හිල්වුණු පතිට්ටුවක්, ජල උල්පත් සියල්ල සිඳී තිබෙන ළිඳකට දමා වතුර ගැනීමට තැත් කරන ස්වභාවයක් නේ දැයි මට කල්පනා වුණි.

කෙසේ හෝ ජීවිත කාලයම කැප කොට ශ්‍රී ලාංකික සමාජය නැමැති ළිඳේ නැවත වරක් ස්වභාවික උල්පත් හයම පෑදීමට ප්‍රයත්නයක් දැරීමට මම අධිෂ්ඨාන කර ගතිමි. ඒ සිඳී ගිය උල්පත් හය නම්: ආධ්‍යාත්මික, සදාචාර, සංස්කෘතික, සාමාජික, ආර්ථික සහ දේශපාලනික උල්පත් ය. එදා සිට අද වනතුරු මා කළේ මේ සිඳී ගිය උල්පත් නැවත ටිකින් ටික හෝ පෑදීමයි. ඒවා පෑදීමට ඉඩ නොදෙන, දහම නොපිළිපදින, ආගමිකයන්, දෙමාපිය – දරු, ගුරු – සිසු වටිනාකම් වනසන වැඩිහිටියන්, හැම දේම දූෂණය කරන බලවත් දේශපාලකයින්, මුදල් දෙවියන් හැටියට සලකන ධනේශ්වරයන්, වගකීමෙන් තොර මාධ්‍ය සමඟ කෙසේ ඒ දෑ මෙහෙවර ඉටු කරන්න ද? එහෙත් අධෛර්යමත් නොවීමි.

තැනක විළි වේදනාවෙන් මරහඬ දෙන කාන්තාවකි. කිසිම පුහුණු හෝ නුපුහුණු හෝ වින්නඹු මාතාවකගේ පිළිසරණ නොලැබ, දරුවෙක් මෙලොව එළිය දැකීමට සූදානම් වේ. බිළිඳාගේ හඬන හඬ ඇසූ විගස තමා අත තිබුණු අත් පොරවත් රැගෙන අමුඩයකින් සැරසී

සිටි සැමියා පෙකනිවැල කැපීමට ගේ තුළට දුවයි. මුළු ගෙයම සාදා තිබුණේ ගස්වල පොතුවලිනි. ගෙදර ඉදිරිපස සිට මේ ගැන විපරම් කළ මගේ දෙනෙතේ කඳුළු පිරිණි. මේක ද අවුරුදු 9 ක් දේශපාලන නිදහස විඳි ලංකාව?

ඡායාරූපː 127
(පසු කලක) ඒ. සී. ඒබ්‍රහම් මහතා මගේ දුව චාරිකා වඩාගෙන සිටී

තවත් තැනක ගස්වල පොතු හපමින්, ඒවායේ යුෂ වෙනත් ආහාරයක් නැති නිසා උරා බොන, නිරුවත් ඇටකටු පෑදුනු දරුවන් සමූහයකි. අප අතේ තිබුණු ආහාර ඒ දරුවන්ට දුන්නත්, ඔවුන් ඊළඟ වේල කන්නේ කෙසේද? ප්‍රධාන නගරවල ඇඳුම් මෝස්තර තරග අතුරු සිදුරු නැතුව පවත්වත්දී, මේ දරුවන්ගේ නිරුවත වසා ගැනීමට රෙදි කෑල්ලක් කවදා ලැබේද? නියං කාලයේ ඇළ දොළකින් වතුර පොදක් බීමට සොයා ගත නොහැකි මොවුන්ට, පිපාසය සංසිඳවා ගන්නට ලැබෙන්නේ කවදාද?

පදියතලාවේ සිට ඉඟිනියාගල ගල්ඔය මිටියාවත දක්වා අබේසේකර මහතාගේ ජීප් රියෙන් ගමන් කළ අප දුටු මෙවැනි සිද්ධීන්, කවදාවත් මට අමතක නොවන ශෝචනීය සිද්ධීන්ය.

අම්පාරේ සිට මඩකලපුව දිස්ත්‍රික්කයට ගොස් සිත්තන්ඩිවල නැවතී ඒ.සී. ඒබ්‍රහම් මහතාත් සමඟ වෙරළබඩ වැද්දන් හැටියට ඒ කාලයේ හැඳින්වූ ගම්මාන රැසකටම අපි ගියෙමු. ඔවුන් ඒ කාලයේ කතා කළේ සිංහලත් නොවන, දෙමළත් නොවන මිශ්‍ර භාෂාවකි. ඒ සංචාරයේ දී නැගෙනහිර පළාතේ පිහිටි බෞද්ධ සිද්ධස්ථානවල නටබුන් රැසක්ම මම දුටුවෙමි. පසු කලෙක ඒවායින් කිහිපයක්ම ප්‍රතිසංස්කරණය කිරීමට පමණක් නොව, ඒ ගැන පුරාවිදු අධිකාරීන්ගේ අවධානය යොමු කිරීමට 'නැගෙනහිර' නමින් පත්‍රයක් ද මම ප්‍රකාශයට පත් කළෙමි.

මා ආපසු මහරගමට පැමිණියේ ශාස්ත්‍රීය හෝ පරිපාලන හෝ දේශපාලන ක්ෂේත්‍රයේ ඉහළම පෙත්තට නැඟීමේ ආශාව තුරන් කොට, සම්පූර්ණ ජාතික පුනරුදයකට ජීවිතය කැප කිරීමේ ස්ථිර අධිෂ්ඨානයෙනි. මේ පුනරුදය පුද්ගලයා, පවුල හා ගම තුළින් ආරම්භ වී ඉහළට ව්‍යාප්ත විය යුතුය.

43

මගේ පළමු විදේශ සංචාරය භාරතයට

මා මුලින්ම ගිය විදේශීය රට ඉන්දියාවයි. ඒ සති තුනක සංචාරයකි. මා සමග ගියේ මසකට්සු මොරිටෝමෝ නැමැති ජපන් ජාතික මහතෙකි.

මොරිටෝමෝ මහතා මට හඳුන්වා දුන්නේ මගේ මිත්‍ර ඩී. ඒ. අබේසේකර මහතායි. ඔහු එවකට කොළඹ ක්‍රමයෙන් එවන ලද ජපන් විශේෂඥයෙක් ලෙස ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවට සම්බන්ධ ව සේවය කළේය. බොහෝ විට මොරිටෝමෝ සමග ක්ෂේත්‍රීය සංචාරවල යන විට, අබේසේකර මහතා මා ද කැටුව ගියේය. අපට ජපන් භාෂාව තේරුණේ නැත. මොරිටෝමෝද ඉංග්‍රීසි වචන දෙක තුනක් හැරුණු විට, අප හා කතා බස් කළේ සංඥා බසිනි.

1957 නොවැම්බර් අග හරියේදී මම මහරගම ගුරු අභ්‍යාස විද්‍යාලයෙහි දෙවසරක පුහුණුව අවසන් කොට විභාගයට සූදානම් වෙමින් සිටියෙමි. ඒ අතර දිනක් මොරිටෝමෝ මහතා මට ටැලිෆෝනයෙන් කතා කළේය. මහ හදිසියකින් මෙන් මා සමග ඉන්දියාවට යා යුතු බව ඔහු කීය. ටෙලිෆෝනයෙන් කිසි සේත් ඔහුව තේරුම් ගත නොහැකි නිසා මම "නිපොන්" හෝටලයට ගොස් ඔහු හමුවීමි. ඉන්දියාවට යෑමට ගමන් බලපත්‍ර, වීසා ආදිය අවශ්‍ය බවත්, ඒවා සූදානම් කර ගැනීමට කල් අවශ්‍ය බවත්, මගේ විභාගය ද අවසන් කළ යුතු බවත්, බොහෝ අමාරුවෙන් ඔහුට තේරුම් කර දී දෙසැම්බර් මැද හරියේ ගමන යොදා ගතිමි.

1957 දෙසැම්බර් 10 වැනි අඟහරුවාදා කොළඹ කොටුවේ දුම්රිය පළින් මොරිටෝමෝ සහ මම ඉන්දියා ගමනේ පළමු පියවර වූ තලෙයිමන්නාරම බලා රාත්‍රී 8.40 ට පිටත් වන තැපැල් දුම්රියෙන් ගමන් ඇරඹීමු. අබේසේකර මහතා, ඔහුගේ මැතිනිය ඒඩා අබේසේකර, පුතා රංජන් සහ දුව නිලංගනී අපට සුබ පැතීමට දුම්රිය පළට පැමිණ සිටියහ.

11 දා උදේ 5.45 ට පමණ අපි තලේමන්නාරම් දුම්රිය පොළට ළඟා වීමු. උදේ 8.20 ට බෝට්ටුවෙන් ධනුෂ්කොඩි බලා අපි ගමන් ඇරඹීමු. මට මතක හැටියට සිවරත්නම් නැමති මහතෙක්, රේගු නිලධාරියෙක්, තලේමන්නාරමේදී අපට උදව් කළේය. පැය දෙකක් පමණ බෝට්ටුවේ ගමන් කොට ධනුෂ්කොඩිවලට ළඟා වීමු. මොරිටෝමෝ සින්දු කියමින්, විනෝද වෙමින් ගමන් කළ අතර, මා බෝට්ටුවක දුර ගමන් කොට පුරුදු නැති නිසා වරක් කරකැවිල්ල සෑදී මට වමනයක් ආවේය. එවිට අම්පිටියේ දේවානන්ද නැමති ස්වාමීන්වහන්සේ නමක් මට උදව් කළේය. ඉන් පසු උන්වහන්සේ ද අප දෙදෙනා හා ගමනට එක් විය.

ධනුෂ්කොඩියේ දී පළමුවෙන්ම අප දුටුවේ සිය ගණන් හිඟා කන දරුවන්, ගැහැනුන් හා පිරිමින්ය. ගහක් කොළක් පේන්නට නැත. පාලු වැලි කතරේ, දුම්රිය එතැන් සිට රාමේස්වරම් දක්වා දිවෙයි. මුහුද මැදින් දමා ඇති දීර්ඝ පාලමක් බඳු දුම්රිය පාර, භාරත අර්ධ මහා ද්වීපයට ළඟට ඇතුලු වෙයි. පල්ලියක් දෙකක් හා වැලිකතර හැරුණු විට මට මතක තැනින් තැන දුටු පැල්පත් සමූහ පමණෙකි.

ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර යන එන මගීන්ගේ සෞඛ්‍ය පරීක්ෂණ ආදිය කෙරුණේ මණ්ඩපම් කඳවුරේය. මණ්ඩපම්වලදී වෙනත් දුම්රියකට මාරු වූ අපි, මදුරාසිය දක්වා යෑමට පිටත් වීමු. දුම්රිය දෙපස බොහෝ දුරක් යන තුරු වගුරුබිම්, තල් ගස් හා වී වගාව දුටිමි. රාම්නාඩ්, වල්ලිපුරම් ආදී නගර පසු කොට යන විට, එන්ට එන්ටම බිම සංවර්ධනය කර ඇති සැටි පේන්නට විය.

රාම්නාඩ් දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී ටී.ටී. සිරිනිවාසන් නැමැති මහතෙක්, අප හා එම දුම්රියේම මදුරාසිය බලා ගමන් කළේය. ඒ මහතා මගෙන් මෙසේ ප්‍රශ්නයක් ඇසීය.

“ලංකාවේ මිනිසුන් ඉන්දියානුවන් එළවන්ට තැත් කරන්නෙ ඇයි?”

මා දුන් පිළිතුර කුමක් දැයි මට මතක නැත.

12 වැනිදාට එළිවන විට අපි මදුරාසියට ළං වෙමින් සිටියෙමු. දුම්රිය නවත්වන දුම්රියපළවලදී, සෑම උදෑසනකම වේදිකාවට බැස ව්‍යායාම ගැනීම මොරිටෝමෝ මහතාගේ සිරිතයි. මිටි තරබාරු කොණ්ඩය කොටට කැපූ මේ ජපන් මිනිසාගේ ව්‍යායාම බැලීමට සිය ගණන් මිනිස්සු වේදිකාවේ රැස් වෙති.

මදුරාසිය

මදුරාසියට ළං වන විට දක්ෂිණ ලංකාවේ භූමි ස්වරූපයට සමාන පරිසරයක් දක්නට ලැබිණ. ඈත කඳුවැටිද, මෑත මිටියාවත් ද, කුඩා වැව් ද දිස් වේ. ගෙවල් සියල්ලම එක ගොඩේ සාදා තිබේ. වහලවල් සමතලාය. ගෙවල් මණ්ඩිය පිටුපස පේන තෙක් මානයේ ගොවි බිම්ය.

මදුරාසියේ එග්මෝර් දුම්රිය පොළට නුදුරු මහාබෝධි සමාගමේ පන්සලට අපි තිදෙනා මුලින්ම ගියෙමු. ඒ කාලයේ එහි අධිපතිව සිටියේ බී. ඡිනානන්ද නැමැති ස්වාමින් වහන්සේ නමකි. ඩී සෝමාරාම නැමැති ස්වාමීන් වහන්සේ නමක්ද එහි දී හමු විය.

මහාබෝධියේ අපේ බෑග් තබා, මොරිටෝමෝ මහතා හා මම මුදල් මාරු කර ගැනීමට නගරයට ගියෙමු. වික්ටෝරියා හෝටලයෙන් අප දෙදෙනාගේම ආහාරය සඳහා වියදම් වූයේ රුපියල් හයක් පමණකි. අපි නගරයේ ඇවිද්දෙමු.

මෙවැනි ජන සාගරයක් මීට පෙර මා දැක නැත. ප්‍රධාන පාර –වලින් අතුරු පාරවල් හරහා යන විට, ක්‍රම ක්‍රමයෙන් මිනිස් ලොව පසු කර, නරකාදියකට ඇතුලු වන ලෙසක් මට දැනිණි. හැම තැනම හිඟා කන්නන්ය. මොරිටෝමෝ දුටු විට ඔවුහු, ඔහු පසු පස එන්ට පටන් ගත්හ. මොරිටෝමෝ මහතා ඡායාරූප ගැනීමේද සමතෙකි. ඡායාරූපයක් ගත් පසු පොඩි සල්ලි සතයක් දෙකක් දීම ඔහුගේ සිරිතය. මේ දුටු හිඟන ළමයි හා වැඩිහිටියෝ මොරිටෝමෝගේ හිසේ සිට දෙපතුළ දක්වා සීනි ගුලියක් වටා දැවටෙන ඇඹලයන් මෙන් එක් රොක් වූහ. ඒ බලවේගයෙන් එන්ට එන්ට ම ඈතට තල්ලු වූ මා, කුමක් කරන්නෙම් දැයි කල්පනා කළෙමි. මොරිටෝමෝ බේරී දිව යෑමට තැත් කරයි. මම ටැක්සියක් නතර කර ගත්තෙමි. දන්නා දෙමළෙන් අර සෙනග අතරට යන ලෙස රියැදුරුට කීවෙමි. ජනෙල් වීදුරු වසා ගෙන මොරිටෝමෝ සිර වී තල්ලුවෙන තැනට කිට්ටු කොට, ඔහු අප දුටු වහාම දොර ඇර රිය ඇතුළට දා ගතිමි.

ඇඳුම් සියල්ල ම පොඩි වී කිළිටි වී තිබූ මොරිටෝමෝගේ කිසිවක් නැති වී තිබුණේ නැත. හතිදාමින් "චී" "චී" ගාමින් ඔහුගේ මුවින් පිට වූ වචන මට අදත් මතකය.

"සිලෝන් පීපල් වෙරි ගුඩ්. ඉන්ඩියා පීපල් වෙරි බෑඩ්". මම ඔහුට ඒ ඔහුගේම වරද බව තේරුම් කිරීමට වැර වැඩූ මුත්, අපේ භාෂා පරතරය නිසා නිසා එය ව්‍යර්ථ විය. මේ සිද්ධියෙන්ම ඔහුට මදුරාසිය

එපා විය. දුම්රිය ස්ථානයට ගිය අපි එදා රාත්‍රියේම බොම්බායට යෑමට ටිකට් ගත්තෙමු. දේවානන්ද හාමුදුරුවෝ ද නැවත අප හා එක් වූහ.

නැවත මහාබෝධියට ගොස් අපේ බෑග් එකතු කරගෙන, පැය දෙකක් පමණ කුලී රියකින් මදුරාසි නගරයේ විවිධ තැන් නැරඹීමු. වෛද්‍ය පුහුණු හා ගුරු පුහුණු ආයතන, හරිජාන් සේවා මධ්‍යස්ථානයක්, පාසල් කීපයක්, මවුන්ට් පාර වැනි ප්‍රධාන වීදි නරඹා, එග්මෝර් දුම්රිය පළෙන් බොම්බාය බලා පිටත්වීමු.

බොම්බාය බලා

මට මතක හැටියට එය දින එකහමාරක ගමනෙකි. වරක් දෙකක් ඇතින් දුටු කඳුවැටි හැරුණු විට දිගටම දිස් වූයේ වියලි සමතලා බිමය. බොහෝ තැන්වල කතරගම ප්‍රදේශයේ තිබෙන විදියේ කලුපාට ගල් තලා ද, රතු පස් ද තිබෙනු දුටුවා මතකය. එක ගොඩේ බිත්තියෙන් බිත්තියට යාවෙන සේ සාදා තිබෙන පැල්පත් වැනි ගෙවල් රාශියක් තිබෙන ගම් රැසක් පසු කෙළෙමු. බොම්බාය ළං වන විට පැරණි මුස්ලිම් ශිෂ්ටාචාරයේ නටබුන් ලෙස සිතිය හැකි තැන් රැසක් ද පසු කළෙමු. අප බොම්බායට ළඟා වන විට පසු දා සවස හිරු බස්නා යාමයයි.

අප බොම්බායේ ගත කළ දිනය ඉතා ප්‍රීතිදායක විය. මොරිටෝමෝද සතුටින් සිටියේය. බොම්බායට එතෙක් මා දැක තිබුණ විශාලම නගරය විය. බොම්බායේ අලුත් කොටස හොඳින් සැලැසුම් කර ඇති පිරිසිදු නාගරික පරිසරයෙකි. මෙතෙක් මා දුටු උසම ගොඩනැගිලි ද මෙහි විය. මුහුදු වෙරළ ඉතා ලස්සනය. මලබාර් කන්ද, එල්ලෙන මල් උයන ආදී ලස්සන තැන් නැරඹීමු. නයාර් රෝහලට යාබද ආනන්ද විහාරයේ සිටි ඩී. දසනායක නැමැති මහතෙක් බොම්බායේ දී අපට උදව් විය.

නව දිල්ලියට

දහ හතර වැනිදා රාත්‍රී අපි බොම්බායේ සිට දුම්රියෙන් නවදිල්ලිය බලා පිටත්වීමු. ඒ දුම්රිය හැඳින්වෙන්නේ "ෆ්‍රන්ටියර් මේල්" **(Frontier Mail)** යනුවෙනි. අජන්තා හා සාංචිය ද පසු කොට අප නවදිල්ලියට ළඟා වූයේ 16 දා උදේය. දුම්රිය පළේම විවේක කාමරවල අපි නතර වීමු.

ඇබැද්දි පිට ඇබැද්දි

බොම්බාය සහ නවදිල්ලිය අතර දුම්රිය ගමනේදී අපට උදව් වූයේ අප සමගම ගමන් කළ කිෂාන් සිත්ග් නැමැති ඉන්දීය යුද හමුදාවේ භටයෙකි. ඔහු හොඳින් ඉංග්‍රීසි කථා කළේය. ලංකාවට ඔහු තුළ පුදුම

ආදරයක් විය. රාම - සීතා කථාව ගැන විස්තර ඔහු නිතරම මගෙන් ඇසුවේය. ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවයේ හින්දි ගීතවලට ඇහුම්කන් දීමට ඔවුන් නිතර ම ආශා බව ද ඔහු මා සමග පැවැසීය.

නව දිල්ලියේ සිටි දින කීපය විශේෂයෙන් වැදගත් වූයේ මොරිටෝමෝ සමග කුඩා කර්මාන්ත මධ්‍යස්ථාන බැලීමට යාම නිසාය. ඔහු ජපන් තානාපති කාර්යාලය මාර්ගයෙන්, ඉන්දිය වෙළඳ හා කර්මාන්ත අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් ආර්.ජේ. හොයිවානි මහතා හඳුනා ගත්තේය. රජයේ වාහනයකින් නව දිල්ලි ප්‍රදේශයේ විවිධ ස්ථාන දැක බලා ගැනීමේ වාසනාව මට මේ නිසා ලැබුණේය.

බිර්ලා ආරාමය, මහාබෝධි පන්සල, රාෂ්ට්‍රපති භවන් නැමැති ජනාධිපති මන්දිරය, පාර්ලිමේන්තු ගොඩනැගිල්ල, කෞතුකාගාරය ආදී ප්‍රධාන ස්ථාන නැරඹීමට මේ මහඟු අවස්ථාවක් විය.

මොරිටෝමෝ ගේ භාෂා ප්‍රශ්නය නිසා අකරතැබ්බ කීපයකට ම මුහුණ පාන්ට සිදු විය. දිනක් ඔහු උදෙන් මා කැඳවා මහ ලේකම් කාර්යාලයේ මහතෙක් නවයට මුණ ගැසීමට තිබෙන බව පැවසීය. කාර්යාල විවෘත කරන්නේ දහයට යැයි මා කී නමුත් ඔහු එය නොපිළිගත්තේය. එම කාර්යාලයට ගිය පසු තමා, ඔහුට මා කී දෙය අවබෝධ වූයේ. ඉතිරි පැයෙන් ප්‍රයෝජනය ගැනීම සඳහා මොරිටෝමෝ ඔහුගේ කබාය ගලවා මා අතට දී ව්‍යායාම කිරීමට පටන් ගත්තේය.

මොරිටෝමෝ ගේ ව්‍යායාම නැරඹීමට මහ ලේකම් කාර්යාලය ඉදිරිපිට සෙනග රැස්වන්ට විය. මම ටිකෙන් ටික ඈත් වී මහජනයා අතරට වී ලජ්ජාවෙන් බලා සිටියෙමි. ඔහු හුස්ම පිට කරන්නේ මහ හඬක් නගමිනි. දැන් 9.45 ට පමණ ඇත. මහ ලේකම් කාර්යාලය ඉදිරිපිටට ප්‍රධාන නිලධාරීන් යැයි සිතිය හැකි මහත්වරු විස්සක් පමණ අවුත්, දොරටුව ඉදිරිපස පේළි දෙකකට සිට ගත්හ. ඒ ඉදිරිපිට ඈතින් රැස් වූ පොදු ජනතාව ද දැන් සිය ගණනකි. ඒ කණ්ඩායම් දෙක අතර කිසිම ගණනක් නැතිව මොරිටෝමෝ ඔහුගේ ව්‍යායාම කර ගෙන යයි.

එදා ඉන්දිය අගමැති ශ්‍රී නේරු තුමා මෙම මහ ලේකම් කාර්යාලයට එන දිනයකි. මේ සඳහායි, හැමදෙනා සූදානම් වන්නේ. ඒ අතර එක් නිලධාරී මහතෙක් මොරිටෝමෝ ඉදිරිපිටට යනු දුටුවෙමි. කුමක්දෝ ඔහුට කියන විට ඔහුට කේන්ති ගිය බව මට පෙනුණේය. එවේලේම මම, මොරිටෝමෝ ළඟට ඔහුගේ කබායේ අත් දෙක ද දිග හැර ගෙන ගියෙමි. අගමැති තුමා පැමිණෙන බව කියමින්, බලෙන් ම වාගේ කෝට් අත් ඔහුගේ අත්වලට පිටු පසින් ළං කෙළෙමි. "ඕ අගමැතිතුමා!, ඕ ශ්‍රී නේරු!

ශ්‍රී නේරු!" යයි පැවැසූ ඔහු වහාම අර නිලධාරින් පෙළ ගැසී සිටි තැනට ගොස් පේළියට එකතු විය. මම මිනිසුන් සිටි අතරට ගියෙමි.

මහා ඝෝෂාවකි, "ශ්‍රී නේරු කී ජායි" "නේරු තුමාට ජයවේවා"! එතුමා රියෙන් බැස්සේය. සම්පූර්ණ ගෞරව සම්ප්‍රයුක්ත නිශ්චලතාවයකි. පේන තාක් දුර සමහරු බිම වැතිර වඳිති. නැමී ආචාර කරති. ඒ කිසිවෙක් දෙස නොබැලූ නේරු තුමා, අඩියෙන් දෙකෙන් පිය ගැට පෙළ නැගගෙන මහලේකම් කාර්යාලයට ඇතුලු විය. ජන නායකයකුට ජනතාවගේ දයාව ලැබෙන හැටි දුටු මට ඇති වූයේ පුදුම හැඟීමකි. මේ මා නේරු තුමා දුටු දෙවැනි අවස්ථාවයි. ඊට පෙර කොළඹ විශ්ව විද්‍යාලයේදි එතුමා කළ ප්‍රසිද්ධ දේශනයකට සවන් දුනිමි.

කාශ්මීරයට

මෙතැන් සිට මොරිටෝමෝ දිගටම හැසුරුණේ පුදුම උන්මාදයකිනි. ශ්‍රී ලංකාවේ දී රජයේ අනුග්‍රහය ඇතිව තැනින් තැන යැමේදී ඔහුට ලැබුණ වරප්‍රසාද, මෙහිදී සංචාරයකයකු නිසා ඔහුට නොලැබුණේය. ඒ නිසා ඔහු ඉන්දිය ජාතිකයන් කෙරෙහි හැසුරුණේ මහත් අප්‍රසාදයකිනි; සැකයකිනි. ටැක්සියකින් ගිය විට ඔහු ගෙව්වේ අඩුවෙනි. ඉතිරි මුදල නිතරම මට ගෙවීමට සිදු විය. කාශ්මීරයට යැමට උවමනා වූ විට ඔහු ගියේ 'කාශ්මීර් ආට් එම්පෝරියම්' නැමැති සාප්පුවටය. එතැනට ගොස් කාශ්මීරයට යැමට බලපත්‍රයක් ඉල්වයි. එය සාප්පුවක් බව කී විට ඔහු බැණ වදියි. අන්තිමේ දී එහි භාරකාරිය වූ මහත්මියකට කියා නියම කාර්යාලය සොයා ගෙන ගොස් කාශ්මීරයට ඇතුලුවීමට අවසර පත්‍ර ගතිමු.

පළමු ගුවන් ගමන

දහහත් වැනිදා රාත්‍රියේ දුම්රියෙන් පතන්කොට් බලා පිටත්වීමු. සීතලේ ගැහෙමින් දුම්රියේ එළිවෙන තුරු ගමන් කොට, පතන්කෝට් නගරයට පැමිණියෙමු. ඉන්දියානු ගුවන් සේවා කාර්යාලයට ගොස් ශ්‍රී නගර්වලට යැමට ගුවන් බලපත්‍ර දෙකක් ගතිමු. දවල් 12.30 ට පමණ පතන්කෝට් සිට යානය ගුවන් ගත්තේය. මේ මගේ ප්‍රථම ගුවන් චාරිකාවයි. හිමෙන් වැසී තිබුණු හිමාල කඳු මුදුන් ඈතින් පෙනේ. පහළින් පෙනුණේ වාරිමාර්ග හා කුඹුරුය. කන් අගුලු වැටුණු නමුත්, ටික වේලාවකින් මට එය පුරුදු විය. මිනිත්තු 40 කින් අපි ශ්‍රී නගර් ගුවන් තොටුපලට ළඟා වීමු.

මුළු ගුවන් තොටුපලම හිමෙන් වැඩී තිබුණේය. මා ඒ හිම දුටු පළමු අවස්ථාවයි. ගුවන් යානයෙන් බැස සීතලේ වෙව්ලමින් ගොඩනැගිලි තුළට දිව්වෙමි. "ඔබ දුර්වල මිනිසෙක්, ජපානයේ හිම අඩි දහසයක් විස්සක් වැටෙනවා"යයි කියමින් මොරිටෝමෝ සිනාසෙයි.

හිමේ ගිය ගමනක්

ගුවන් තොටුපලේම සංචාරක කාර්යාලයක් විය. අපි අපේ බෑග්ද රැගෙන එතැනට ගියෙමු. එහි සිටි අය 'බෝට් හවුස්' එකක් ඕනද? හෝටලයක් ඕනැදැ?යි අපෙන් ප්‍රශ්න කළහ. මෙය තේරුම් නොගත් මොරිටෝමෝට කේන්ති ගියේය. "බෝට් හවුස්, බෝට් හවුස්, වට් බෝට් හවුස්," කියමින් එක බෑගයක් පමණක් අතින් ගෙන, අනිත් බෑග් දෙක මා ළඟ තබා ඔහු මහපාරට බැස්සේය. බෝට් හවුස් කියන්නේ ශ්‍රී නගරයේ තටාකය තුළ ඇති සංචාරක නිවාස බැව් ඔහුට තේරුම් කර දීමට මා ගත් මහන්සිය නිරර්ථක විය. ඔහු දැන් යාර ගණනක් ඈත පුපුරමින් සීඝ්‍රයෙන් ගමන් කරයි. බෑග් දෙක දෑතට ගත් මම ඔහු පසු පසින් ගමන් කළෙමි.

මගේ තොල් දෙකම සීතලට පුපුරා ගොස්ය. තොල්දෙකෙන් ලේ පනින තරමට මස් පැදී තිබේ. කන් දෙකත්, නාසයත් සීතල නිසා හිරි වැටී තිබේ. යට බැනියම් දෙකක්, ෂර්ට් දෙකක් සහ කබායක් ඇඳ තිබෙන නිසා යන්තම් පපුව උණුසුම්ව තිබේ. දෙපාවල යන්තම් වැර තිබේ. මේ තත්වය යටතේ ගුවන් තොටුපල ඉදිරිපිට තිබෙන පාරේ නගරය දෙසට මොරිටෝමෝ මට ඉදිරියේ යාර සීයයක් පමණ ඈතින් ගමන් කරන අතර, මම බරත් රැගෙන, පසු පසින් හැකි තරම් වේගයෙන් ගියෙමි. මා කිහිපවරක් කෑ ගැසූ නමුත් පස්ස බලන්නේ ඔහු නොවේ.

හිටි හැටියේ ගෙයක් ඉදිරියේ නැවතුණු ඔහු එහි සීනුව තද කළේය. ටික වේලාවකට පසු ඉදිරිපස දොර විවෘත ව ඔහු ඇතුළට යනු දිටිමි. එතැනට මට යෑමට තවත් මිනිත්තු කීපයක් ගත විය. මමත් එලෙසම සීනුව තද කළෙමි. සුදු ජාතික මහතෙක් දොර හැර මා ද ඇතුළට ගත්තේය. මම සීතලෙන් වෙව්ලමින්, අත්වලින් ලේ මතුව, කකුල් දෙක පණ නැතිව සිටි වේලාවකි. ඉවසීමේ ද සීමාව ඉක්ම ගොස්ය. ඔහු ඉදිරියට ගොස්, මා දන්නා තදම ඉංගිරිසියෙන් මොරිටෝමෝට බැන්නෙමි. එහෙත් එය තේරුණේ මොරිටෝමෝට නොවේ. ඔහු සිනාසෙමින් මට කීවේ,

"ඔබ හරි දුර්වලයි, ඒකයි ඔය සීතල"

යන්න පමණකි.

ඒ අතර අපට සෙවණ දුන් සුදු මහතා, කෝපි කෝප්ප දෙකකුත් සූදානම් කර ගෙන සාලයට පැමිණියේය. ඔහු ක්‍රිස්තියානි බිෂොප් වරයෙකි. මට මතක හැටියට නම ලෝඩ් හැන්කර්ය. මෙතෙක් මට වූ සියලු ඇබැද්දි ගැන ඔහුට පවසා, අපට ඉන්ට තැනක් සොයා දෙන මෙන් මම ඉල්ලා සිටියෙමි.

අප කෝපි බී ඉවර වූ පසු අමාරුවෙන් සිය මෝටර් රිය ස්ටාට් කරගත් ලොඩ් හැන්කර්, අප දෙදෙනාගේ සූට්කේස් ද පටවාගෙන අප නෙඩූස් හෝටලය නම් වූ හෝටලයකට හැර දැමීය. කාමරයට ඇතුලු වූ වහාම, ඇඳුම් වත් මාරු නො කළ මම ඇඳේ වැටී හොඳටම නිදා ගතිමි.

මරු කපොල්ලක්

මුලු දහනව වැනිදා දිනයම අප ගත කළේ ශ්‍රී නගර් නගරයේය. මොරිටෝමෝ, සිය කාලය විසිතුරු බඩු ගැනීමට යෙද වූ අතර, මම එක් අතකින් කාශ්මීරයේ අගනුවර වූ හිමාලය පාමුල පිහිටි භූමියේ සිරි නරඹමින් අන්ත දිළිඳුකම හා මහා පෝසත්කම එක ළඟ පවතින අයුරු දකිමින් කාලය ගත කළෙමි. එදා ලස්සනට හිරු එළිය වැටී අවට හිමෙන් වැසී කඳු මුදුන් හා භූමිය ආලෝක වී තිබුණත්, ඒ අතරින් සිරුරට දැනුණු තද සීතල මීට පෙර මා අත්දැක තිබුණේ නැත.

මොරිටෝමෝගේ තීරණය අනුව, විසිවැනි දා උදේ අපි ජම්මු – කාශ්මීර් ප්‍රාන්ත රජයට අයත් බසයකින් පතන්කෝට් බලා පිටත් වීමු. කොළ හැලුණු හිම දැවටුණු ගස් දෙපස තිබූ පාරේ අපේ රිය ගමන් කෙළේය. වැඩි දුර යැමට පෙර සැ. 1 3/4 ක් පමණ බිම්ගෙය දිගටම හිමෙන් වැසී පාරේ රථ ගමන් කිරීමට නුපුලුවන් තත්වයක තිබුණේ ය. මිනිසුන් රාශියක් හිම ඉවත් කිරීමේ යෙදී සිටියහ. නැවත ගමන් ඇරඹූ අප, ඊළඟට නතර වූ තැන ඊටත් වඩා විශාල බාධකයක් තිබුණේය. එනම් යාර සියයක් පමණ ප්‍රදේශයක පාර නාය ගොස් තිබීමයි. ඒ ස්ථානය රාම්බාන් නැමැති කුඩා නගරයේ සිට සැතැපුමක් පමණ මෙහා තැනකි.

දැන් වේලාව සවස 5 ට පමණ ඇත. අතරමග කිසිම තැනක දී කිසිවක් ආහාරය පිණිස අපට නොලැබිණි. අප සමග බස්රියේ ගමන් කළ විශ්ව විද්‍යාල ශිෂ්‍ය පිරිසකගෙන් ලැබුණු දොඩම් ගෙඩි දෙකක්

(ජමනාරම් ගෙඩි) හැරුණු විට, අපට කෑමට කිසිවක් නොලැබුණි. මිනිස්සු පන්සියක් පමණ පාර සෑදීමේ යෙදී සිටිති. කඳු මුදුනේ සිට තවමත් පහළට ගල් පෙරළේ. පොල් ගෙඩි පමණ ලොකු ගල් ගෙඩි කඳු බෑවුම් දිගේ හැපෙමින් පහළට වුත්, පාරෙන් යාර දෙසීයක් පමණ පහළ තිබෙන ගඟේ පාවෙමින් තිබෙන සිල්බරන් කොටන්වල ගැටේ. සමහර විට ඒ සිල්බරන් කොට එහි වේගය නිසා දෙකට කැඩෙනු දුටුවෙමි.

ආහාර ටිකක් සොයා ගැනීමට තිබෙන එකම ක්‍රමය, මේ භයානක කපොල්ල පසුකොට රාම්බාන් නගරයට යෑම පමණෙකි. බස් හා ලොරි රැසක් ම දැන් පාරේ දිගටම නවතා තිබේ. එයින් කීප දෙනෙක් ඒ පැත්තට යනු දුටු මම ද, මොරිටෝමෝට කියා ඔවුන් පසුපස ගියෙමි.

එතැන් සිට සැතැපුම් බාගයක් පමණ ඈතට ගොස් ඩාග්බන්ගලෝ නමින් හැඳින්වෙන තානායමකට ගොඩවීමි. එහි තිබුණේ හොඳට ම වේලුණු පාන් ගෙඩියක් පමණකි. එම පාන් ගෙඩිය ද, ජමනාරම් ගෙඩි හයක් ද මිලට ගත් මම, රෑ බෝවීමට ප්‍රථම ආපසු බස් රියට ළඟාවීමට ඉක්මණින් ආපසු ඒම ඇරැඹීමි. එහෙත් පාර නාය ගිය තැනට මා එන විට හොඳටම කලුවර වී රෑ බෝ වී තිබිණි. එතැනින් මෙහා දිගටම නතර කර තිබුණේ යුද හමුදාවට අයත් ලොරිය. එහි ඉදිරියේ ම තිබූ ලොරියේ සිටි රියැදුරුට මා පාර නාය ගොස් තිබූ තැනින් එහාට යන තුරු ලොරියේ ලාම්පු දල්වා තබන මෙන් ඉල්ලා සිටියෙමි. ඔහු ඊට එකඟ විය.

කඳු බෑවුම පැත්තට නැමී වරින් වර දකුණු අත බිම තබමින් මහ වේගයෙන් එහා පැත්තට දුවන්නට විමී. මගේ හිසට ඉහළින් ඉඳ හිට ගල් කුට්ටි පිණුම් ගසමින් පහළට දිවෙනවා මට දැනේ. හරියටම මා මැදක් එන විට, ලොරියේ ලයිට් නිවා දැම්මේය. මම හොඳටම බිය වීමි. මුලු ශරීරයම පණ නැති වී ගියේය. මට තෙරුවන් සිහිවිය. ඉදිරියටම කලුවරේ අත ගගා යනවා හැර, වෙන කළ යුතු දෙයක් නැත. බුදුන්, දහම්, සඟුන් සිහි කරමින්, දෙවියන් සිහි කරමින්, ඈත එපිට පෙනෙන බස් රථ ඇතුළේ පෙනුණු ආලෝකය දෙසට මම සතර ගාතයෙන්ම හැකි තරම් වේගයෙන් ගමන් කෙළෙමි. කෙසේ හෝ මේ මර උගුලෙන් මම එතෙර වීමි.

බස් රථය කිට්ටුවට එන විට මට පෙනුණේ, ගිනිමැලයක් වට කර ගෙන ගී ගයමින් නටන මොරිටෝමෝ ප්‍රධාන තරුණ තරුණියන් පිරිසකි. එක් අතකින් මට හොඳටම තරහ ගොස් තිබූ අතර, අනිත් අතින් මේ මනුෂ්‍යයා කෙරෙහි අනුකම්පා නොකර බැරි විය. මුලු රාත්‍රියේම බස් රියේ ගත කළ අපි, පසු දින ද සවස් වනතුරුම සිටියේ

ඒ ස්ථානයේ ම ය. මේ අතර යම් යම් සුළු සුළු පළතුරු ආදිය ද විකුණන අය පැමිණුනෙන් යන්තම් බඩගිනි නිවා ගත හැකි විය.

ශ්‍රී නගර්වල අමර් සිංහ් විද්‍යාලයයේ ශිෂ්‍යයන් දෙදෙනෙක් වන ජග් මොහාන් සිංහ් සහ සුෂිල් කුමාර් යන දෙදෙනා සමග මේ දින දෙකේ දී මම මිත්‍ර වීමි.

සවස හතර පමණ විට පාර සාදා නිම වූයෙන් තවත් සැතැපුම් 105 ක් පමණ ඈත තිබුණු ජම්මු නගරය බලා අපි නැවත ගමන් ඇරඹුවෙමු. රාත්‍රී 12.30 ට පමණ ජම්මු නගරයට ළඟාවීමු. ඩාග් බංගලාවක නිදා ගත් අපි, පසුදා උදේ තවත් බසයකින් පිටත් වී පස්වරුවේ පතන්කොට් කරා පැමිණියෙමු.

අප කාශ්මීරයට ගිය අතර, නව දිල්ලියේ රැඳී සිටි දේවානන්ද හාමුදුරුවන්ට අප දිල්ලියට පැමිණෙන දුම්රිය වේලාව විදුලි පුවතකින් දැන්වීමට මම අමතක නොකළෙමි.

පතන්කෝට් සිට නවදිල්ලියට පැමිණියේ 23 දා උදේය. එදිනම කල්කටාව බලා පිටත්වීම මොරිටෝමෝගේ අදහස විය. දේවානන්ද හිමියන්ගේ ළඟ අප තබා ගිය බෑග් ද රැගෙන, උන්වහන්සේ ද සමග නැවත දිල්ලියේ දුම්රිය පළට අපි ටැක්සියකින් ආවෙමු.

දිල්ලියේ දුම්රිය පොලේ වේදිකා රාශියක් තිබිණි. මොරිටෝමෝ වේගයෙන් ගොස් කල්කටා යන දුම්රියට ගොඩ වූ නමුත්, අප දෙදෙනාම පසු විය. පසුව ඔහු සොයා ගිය මට, හාමුදුරුවන් ද මග හැරිණි. ඒ අතර දුම්රිය පිටත් විණි. දුම්රියට ගොඩ වනු හැර මට කළ හැකි දෙයක් නොවීය. දුම්රිය ප්‍රවේශපත් ද මොරිටෝමෝ ළඟය. ඩෙල්හි – කල්කටා දුම්රිය ඉතා ම දිගය. එක කොණක සිට අනික් කොණටම මොරිටෝමෝ සොයමින් මම දුම්රිය තුළ පැයක් පමණ ඒ දෙසටත් මේ දෙසටත් ගියෙමි. එක් අවස්ථාවක දී ඔහු සිනාසෙනු ඇසුණෙන්, දුම්රියේ ඉහළ මට්ටමේ තිබෙන නිදන ආසනයේ ඔහු වැතිරී අනිත් පැත්තේ සිටි පිරිසක් සමග විහිලු කරමින් සිටිනු දිටිමි. මා දුටු ඔහු කීවේ ඔබ දුර්වලයෙකි" යන්න පමණකි.

දින එකහමාරක් දුම්රියේ ගතවිණි. එහෙත් දේවානන්ද හිමියන් දක්නට නැත. 24 දා උදේ දුම්රිය කල්කටාවට ළඟා විණි. අපි දුම්රියෙන් බැස පිටවන දොරටුව දිහාට ගමන් කෙළෙමු. මගේ බෑග් එකකුත්, ඒ ළඟ කහපාට රෙදි පොට්ටනියක් වැනි දේකුත් පදික වේදිකාවේ තිබෙනවා දිටිමි. මොරිටෝමෝ ද බලෙන් නවත්වා, එතැනට ගිය අප දුටුවේ දින දෙකහමාරක්ම බඩේ අමාරුවකින් පෙළමින් දුම්රියේ ගමන් කොට

පැමිණි දේවානන්ද හාමුදුරුවන්ය. ඉතා දුර්වල තත්වයක සිටි හාමුදුරුවන්ද වාරු කර ගෙන, අපේ බඩු මුට්ටු ද රැගෙන, අපි දුම්රිය විවේක කාමරයක් කුලියට ගතිමු.

දැන් මොරිටෝමෝට අවශ්‍යව ඇත්තේ මදුරාසිය බලා දුම්රියෙන් එදිනම පිටත්වීමය. මට ද එකහ වනු හැර වෙන කිරීමට දෙයක් නැත. වතුර ටිකක් නා ගැනීමටත්, බත් ටිකක් කෑමටත්, කල්කටාවේ දුම්රිය පලේ දී අවස්ථාව ලැබිණි. අපි තිදෙනා එදිනම කල්කටාවේ සිට මදුරාසි බලා පිටත්වීමු.

ඡායාරූප: 128
ශ්‍රමදානයට යෑමට පෙර පැවැත්වෙන පවුල් හමුවකි

44

පුදුම හමුවීමක්

ගද්‍රාවරි ගංගාව හරහා දිවෙන දිග පාලම පසුකොට ආන්ද්‍ර ප්‍රදේශය හරහා මදුරාසියට ළඟා වූ අපි, මදුරාසියේ නොනැවතී කෙලින්ම ලංකාව බලා ඒමට තීරණය කළේ ලංකාවේ විශාල ගංවතුරක් ගැන පත්‍රවල දුටු බැවිනි. මදුරාසියේ සිට මන්ඩපම්වලට අපි ආමු. එහෙත් එතැන සිට ඉදිරියට දුම්රිය සේවා අත්හිටවා තිබිණි.

දැන් මොරිටෝමෝගේ අදහස ආපසු ට්‍රිචිනපොලිවලට යැමය. ට්‍රිචි සිට ගුවන් සේවයක් තිබෙන බැවින්, ගුවනින් ලංකාවට ආපසු යැමයි ඔහුගේ යෝජනාව වූයේ. දේවානන්ද හිමියන් මණ්ඩපම්වල තානායමේ නවත්වා, අප දෙදෙනා ට්‍රිචිවලට යැමටත්, ගුවන් යානයේ ඉඩ තිබුණොත් පැමිණෙන ලෙස දන්වා හිමියන්ට විදුලි පුවතක් එවා ගෙන්වා ගැනීමත්ය. මෙයට මම එකඟ වීමි.

ඒ අනුව ටිචිවලට 28 දා සවස අපි ආපසු ආවෙමු. අප සමඟ මදුරාසියේ සිට, ලංකාව බලා එක ම දුම්රිය මැදිරියේ ගමන් කරමින් සිටි ක්‍රිස්ටියානා නැමැති කාන්තාවක් ද වූවාය. ඇය විවාහ වී සිටියේ ත්‍රිකුණාමලේ කොන්ත්‍රාත්කරුවකු සමඟය. ඇය එග්මෝර් කාන්තා විදුහලක විදුහල්පතිනිය බව අප සමඟ පැවසුවාය. තම සැමියාගෙන් වෙන්වීමට දික්කසාද නඩුවකට පෙනී සිටීමටයි ඇය ලංකාවට පැමිණෙමින් සිටියේ. එහෙත් දැන් නියමිත දිනට ලංකාවට යා නො හැකි නිසා, ඇය ආපසු මදුරාසියට යැමට තීරණය කළාය. ඇය ද අප සමඟ මණ්ඩපම් සිට ට්‍රිචිවලට ආවාය. දුම්රිය පළේ අංක 5 සහ අංක 10 කාමර මගේ නමින් කුලියට ගතිමි. අංක 5 හේ කාමරයේ මා නිදා ගත් අතර, අංක 10 යේ කාමරයේ මොරිටෝමෝ හා ඒ කාන්තාව නිදා ගත්හ.

විසිනව වනදා උදේ ට්‍රිචි සිට කොළඹ බලා පැමිණි ඉන්දීය ගුවන් යානයේ එක් අසුනක් හිස් ව තිබුණෙන්, මොරිටෝමෝ පමණක් යා යුතු යැයි තීරණය කළේය. පසු දිනෙක මා හට ආපසු ගුවනින් ඒමට ඔහු විසින් මුදල් දෙනු ඇතැයි මම බලාපොරොත්තු වුණෙමි. එහෙත් ඔහු කිසි කතාවක් නැතිව ටැක්සියක නැගී ගුවන් තොටුපළට ගියේ, මා

අතේ රුපියල් දහසක් පමණක් තබාය. මම දේවානන්ද හිමියන්ට වහාම ට්‍රිච්වලට පැමිණෙන ලෙස දන්වා විදුලි පුවතක් මණ්ඩපම්වලට යැවීමි.

මගේ අතේ දිනකට ප්‍රමාණවත් වියදම් තිබුණත්, ගුවන් ගමන් බලපත්‍රයකට අවශ්‍ය තරම් මුදල් නො තිබුණේය. මේ අතර තවත් අකරතැබ්බයක් සිදු විය. මා විදුලි පුවත යවා දවල් ආහාර ටිකක් ගෙන නගරයේ ඇවිද ආපසු වුත්, මගේ කාමරයේ නිදා ගතිමි. වේලාව දවල් 2.30 ට පමණ ඇත. මගේ කාමරයේ කවුදෝ දොරට ගසනු ඇසිණි. මා දොර හැරි විට, මා දුටුවේ රේල්වේ නිදන කාමර බාර කළමනාකාරවරිය වන ජෝර්ජ් මහත්මිය හා උප පොලිස් පරීක්ෂකවරයෙකි.

"ඉන්දීය රජය මෙවැනි දේට ඉඩ නොදෙන බවත්, සංචාරකයන් වෙනුවෙන් තද නීති රීති තිබෙන බවත්" ඔවුහු මට පැවසූහ.

මම අන්දුන් කුන්දුන් වීමි.

"ඔවුන් කතා කරන්නේ මොකක් ගැනදැ" යි මම විමසීමි.

එවිට කාමරයේ අනිත් කෙළවරේ තිබූ ඇඳ දෙසට ඔවුහු ඇඟිල්ල දිගු කළහ. මම ඒ දෙස බැලුවෙමි. මගේ පුදුමයකට මෙන්, මා දුටුවේ ක්‍රිස්තියානා මහත්මිය අනිත් ඇඳේ බිත්තිය පැත්තට හැරී නිදන ආකාරය යි. මට නින්ද ගොස් තිබුණ අතර, ඇ හෙමිහිට මගේ කාමරයේ දොර ඇරගෙන වුත් කෙළවර තිබූ අනිත් ඇඳට ගොඩ වී නිදා ගෙන තිබේ.

"ඊයේ රාත්‍රී චීන මහතෙකුත් – දැන් ඔබත් – මේ කාන්තාව හා නිදා ගන්නවා. මේවා නීති විරෝධි වැඩ"

මම ඔවුන් කාමරෙන් පිටතට කැඳවා ගෙන ගියෙමි. ඇත්ත වශයෙන් ම සිදු වී ඇති දෙය තේරුම් කර දුන්නෙමි. එදා තව පැය කීපයක් අනිත් කාමරයට ද මා ගෙවා තිබුණ හෙයින්, එහි ගොස් නැවත නිදා ගතිමි. මා නැගිටින විට ක්‍රිස්තියානා ඇගේ බඩු මුට්ටු ද රැගෙන මදුරාසි යන දුම්රියෙන් මට තුණ්ඩු කැල්ලක් ලියා තබා පිට ව ගොස් තිබිණි. එය මගේ හිතට ලොකු සැහැල්ලුවකි. මණ්ඩපම් සිට පැමිණෙන හැම දුම්රියක් ම වේදිකාවට එන වේලාව බලා මම එහි ගියෙමි. එහෙත් එකම දුම්රියක වත් හාමුදුරුවෝ පැමිණියේ නැත. දවසක් ම ගෙවිණි. දැන් මගේ අතේ තිබූ මුදල් ද හමාරය. අඳුනන කෙනෙක් ද නැත. උන්වහන්සේ ප්‍රමාද වී හෝ මගේ විදුලි පුවත ලැබී, එදින වඩීය යන බලාපොරොත්තුවෙන් නගරයේ ඇවිද, දුම්රිය එන වේලාවට වේදිකාවට ගියෙමි. එදා දිවා කාලයේත් එ හිමියන් පැමිණියේ නැත.

දැන් මගේ කාමරයට තවත් දිනකට ගෙවීමට මුදල් මා අතේ නැත. පස්වරු තුනට මා කාමරයෙන් පිට විය යුතුය. කෝපි එකක් බොනු හැර, යමක් කෑමට ද මුදල් නැත. මම කාමරයට ගොස් ඇඳේ හාන්සි වුණෙමි. මගේ අතේ තිබූ පුවත් පතක මට සිදු වූ දෙය හා මා පිළිබඳ විස්තර ද ලීවෙමි. හදිසියේ මට ක්ලාන්තයක් හැදුනොත් හෝ එය ප්‍රයෝජනවත් වී ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයට දැනුම් දීම සඳහාය.

කවුදෝ කාමරයේ දොරට තට්ටු කළේය. දොර ඇර තිබෙන බවත් ඇතුළට එන ලෙසත් මම කීමි. ඇතුළු වූයේ දුම්රිය නේවාසිකාගාරය බාර දැන් මා හොඳින් හඳුනන ජෝර්ජ් මැතිනියයි. මා තව පැයකින් පමණ කාමරයෙන් යායුතු නිසා, අනිත් ඇඳේ වෙනත් මහත්මයෙක් නැවැත්වූවාට කමෙක් නැද්දැයි ඇය මගෙන් ඇසුවාය.

"ඒකට කමක් නෑ."

ලොකු සූට් කේස් එකක් අරගෙන කුලීකරුවෙක් ඇතුල් විය. වයසක මහත්මයෙක් ද ඒ පිටුපස ඇතුළු විය.

"හලෝ"

"හලෝ" යයි මමත් කීවෙමි.

එපමණකි. මම සිතිවිලි සාගරයක ගිලී සිටියෙමි. තව ටිකකින් මා මහ පාරට බැසිය යුතුය. දහස් ගණන් පාර දෙපස සිටින හිඟන්නන් අතරට එකතු විය යුතුය. වූ සියලු දේ ජෝර්ජ් මහත්මියට කීවොත්, ඇය වත් උදව් කරාවි ද? මොරිටොමෝ කෙරෙහි ද මා අතර මං කර යෑම පිළිබඳව කෝපයක් සිතට ඒ.

මේ අතර මා අතේ තිබූ දුම්වැටියක් දල්වා ගතිමි. ඇඳේ හාන්සි වී දුම්වැටිය ඉරුවෙමි. දුම්වැටිය අතේ තිබේ. එහි සිට දුම්වැළක් ඉහළට නඟී. ඒ දිගේ මගේ නෙත් යොමු වේ. ඒ ධූම ධාරාවේ කෙළවරට ඊට වඩා කලු තද දුම් ධාරාවක කෙළවර හමු වේ. දැන් ඒ ධූම ධාරාව අනුව පහළට මගේ ඇස් යොමු කළෙමි. එහා කෙළවරේ ඇඳේ සැතැපී සිටින මහත්මයාගේ දිග හරින ලද අත කෙළවර තිබූ දිග සුරුට්ටුවකින්ය, ඒ ධූම ධාරාව පටන් ගෙන ඇත්තේ. ඒ එක්ක ම තිබූ ඔහුගේ බෑග් එකේ නම දුටුවෙමි.

ඉබේම ඇඳින් විසි වූ මම, ඒ මහතාගේ ඇඳ ළඟට දිව්වෙමි. නැවතත් හොඳින් සූට් කේස් එකේ ලියා තිබූ නම කියෙව්වෙමි. ඉංගිරිසි අකුරෙන් ලියා තිබූ ඒ නම මෙසේය.

නීතිඥ ඒ. ආරියරත්නම්, කොළඹ.

ඔහුගේ අත අල්ලා ගත් මම කතා කළෙමි.

"මහත්මයාණෙනි, ඔබ කොහේද?"

"මම කොළඹින්."

"මෙහේ කුමක් කරනවා ද?"

ව්‍යාපාරික කටයුත්තකට, චිත්‍රපටි නිෂ්පාදක ගුණරත්නම් මහතා හමුවීමට ආවා. ඔහු හමු වී මදුරායි සිට ආවේ. හෙට ආපසු සියරට බලා යනවා.

"ඔබ මෙහි කුමක් කරනවා ද?" ඔහු ඇසීය.

"මම අතරමං වෙලා. තව මිනිත්තු කීපයකින් මා මේ කාමරයෙන්ද පිට විය යුතුයි."

ඔහුට මම මෝඩයෙක් සමඟ කළ සම්පූර්ණ සංචාරය පිළිබඳ කරුණු හෙළි කළෙමි. ඔහු ඇඳින් නැගිට්ටේය; කල්පනා කළේය. ඔරලෝසුව දෙස බැලීය. මගේ අතට රුපියල් 30 ක් දී තව දින දෙකකට කාමරයට ගෙවා එන ලෙසත්, ඉතිරි රුපියල් දහය ආහාර ගැනීමට තබා ගන්නා ලෙසත් කීය.

මා කාමරයට ගෙවා ආපසු එන විට, ඔහු නැවත ඔහුගේ කලිසමද කෝට් එකද ඇඳගෙන ගමනකට සූදානම්ව සිටියේය.

"මා අත තිබූ මුදල් ඉවරයි, ඒ නිසා මා නැවත මදුරායි ගොස් ගුණරත්නම්ගෙන් මුදල් ටිකක් ඉල්වා ගෙන, අද රෑ ම එන්නම්. එවිට අප දෙදෙනාට ම ගුවන් යානයකින් යා හැකියි. එතෙක් මගේ බෑගය ද බලා ගෙන සතුටින් ඉන්න."

දැන් මගේ මළානික බව ඉවත් වී ගොස් තිබිණි. මගේ යෞවන ජීවය නැවත මා තුළ විය. බඩ පිරෙන්නට ආහාර ද ගත්තෙමි. දැන් තිබෙන එකම වේදනාව මගේ බඩු මුට්ටු ද රැගෙන දේවානන්ද හිමියන් මණ්ඩපම් සිට ට්‍රිච්වලට ආවේ නැත්තේ ඇයි ද? යන්නයි. බලාපොරොත්තු විරහිතව වුවත්, සිරිතක් වශයෙන් මම මණ්ඩපම් සිට පැමිණෙන හැම දුම්රියක්ම වේදිකාවට එන විට විමසිල්ලෙන් සිටියෙමි.

පුදුමයෙකි, ඈත දුම්රිය පදික වේදිකාවේ කහපාට සිවුර මට දිස්විණි. ඒ දෙසට දිවූ මම දුටුවේ මගේ බෑග් දෙකත්, හාමුදුරුවන්ගේ බෑගයත් ද දුම්රියෙන් බාන අපේ දේවානන්ද හාමුදුරුවෝ ය. මගේ සතුටේ තිම් හිම් නැත. හාමුදුරුවන්ට ද එසේම ය. කුලීකාරයෙක් ලවා අපේ බෑග් ද රැගෙන මා සිටින විවේක කාමරයට අපි ගියෙමු.

"හාමුදුරුවනේ ඇයි ප්‍රමාද වුනේ? මගේ විදුලි පුවත මෙහෙන් එව්වේ පළමු දා"

එතැන් සිට මට වූ ඇබැද්දිය හාමුදුරුවන්ට කීවෙමි. හාමුදුරුවන්ගේ පැත්තෙන් කතාව ද ඉක්බිති හෙළිවිණි.

"මහත්මයාලා ට්‍රිච්වලට ගියාට පසු, මම මණ්ඩපම් කඳවුරේ ටිකක් ඇවිද්දා. එවිට මට පෙරේරා නැමැති දොස්තර මහතෙක් හමු වුණා. ඒ ලාංකිකයෙක්. බෞද්ධයෙක්. ඒ මහතා මට ආරාධනා කළා මහත්මයා එනතුරු තානායමේ ඉන්නේ නැතිව – ඔහු සමඟ ඉන්න කියා. එය බාරගෙන මම ඒ මහතාගේ නිවසට මාරු වුණා. හැබැයි ට්‍රිච්වල සිට එන සෑම දුම්රියක් ම බැලීමට දුම්රියපළට ආවා. පසු ව මට හිතුණා මහත්මයා විදුලි පුවතක් වත් එවා ඇත්ද කියලා. එසේ සිතා ඊයේ ආපසු තානායමට ගොස් ඔබට තුන්ඩු කෑල්ලක් ඉංගිරිසියෙන් ලියා තැබුවා – මා දොස්තර මහතා ගේ ගෙදර සිටින බව දන්වමින්. එය දොරේ අලවා ගියා. මේ අතර විදුලි පුවත ගෙන ආ පණිවිඩකරුවා, දෙවැනි වරටත් තානායමට ගියාම මේ තුණ්ඩු කෑල්ල දැකලා මා ලියා තිබූ ලිපිනයට අවුත් විදුලි පුවත දුන්නා. මම එ වේලේම දුම්රියපළට වුත් තිබුණ පළමු දුම්රියෙන් මේ ආවා."

අප දෙදෙනාට ම ගුවන් ගමන් බලපත්‍ර ගැනීමට මුදල් ස්වාමීන් වහන්සේ ළඟ තිබිණි. ඒ නිසා එවේලේම ගුවන් සමාගමේ කාර්යාලයට ගොස් ආසනයක් ගැනීමට විපරම් කළෙමි. පසුදා උදයේ යානයේ එක් අසුනක් තිබෙන බව කීයෙන්, එහි හාමුදුරුවන්ට වඩින ලෙස කියා ආරියරත්නම් මහතා සමඟ පසු දින ඒමට මම යොදා ගතිමි. කොළඹට ගිය පසු, නාලන්දාවට පැමිණ මම හමුවන ලෙස හිමියනට දැනුම් දුන්නෙමි.

21 වැනිදා සන්ධ්‍යා කාලය අප දෙදෙනා ගත කළේ නගරය පුරා ඇවිදිමින් මහ විනෝදයකිනි. මොරිටෝමෝගේ හාස්‍ය ජනක හැසිරීම් කලාපය අපේ ප්‍රධාන තේමාව විය. රාත්‍රී බොහෝ වේලා කතා කරමින් සිට අපි නිදා ගතිමු.

එළිවන යාමයේ ආරියරත්නම් මහතා පැමිණියේය. සියලු ප්‍රශ්න විසඳී තිබෙනු දුටු ඔහු ද සතුටු විය. ඒ අතරම දුක් මුසු බවක් ද ඔහුගේ මුහුණේ මතු වී තිබිණි. එය මට ප්‍රහේලිකාවක් විය. ඔහු ටිකක් නිදා ගැනීමට අවසර ඉල්වා ගෙන නින්දට වැටුණේය.

උදේ පාන්දරින් ම හාමුදුරුවන් ගුවන් තොටුපළට හැරලූ මම, නැවත කාමරයට පැමිණියෙමි. ටික වේලාවකින් සූදානම් වූ ආරියරත්නම් මහතා මා සමඟ උදේ ආහාරය ද කැන්ටිමෙන් ගෙන, බර කල්පනාවකින් යුතුව ගුවන් සමාගම් කාර්යාලයට ගියේය. එදා රාත්‍රි බේත් හා ආහාර

ද්‍රව්‍ය ලංකාවට ගෙන යන විශේෂ ගුවන් යානාවක අප දෙදෙනාටද ආසන දෙකක් වෙන් කර ගැනීමට අපි සමත් වීමු. ඒ සියල්ල සූදානම් කරගෙන ආරියරත්නම් මහතා සමඟ මම ඇවිදීමට ගියෙමි.

සමාජ සේවා කටයුතුවලට මගේ ඇති ලැදියාව, අනාගත ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනය පිළිබඳ මගේ අදහස්, ආපසු ගිය පසු කොළඹ නාලන්දා මහා විද්‍යාලයයේ විද්‍යා ගුරුවරයකු වශයෙන් මා වැඩ බාර ගන්නා බව ආදී , මා පිළිබඳ කරුණු රැසක් දැන් ආරියරත්නම් මහතා දනී.

ත්‍රිචිනාපොලි දුම්රිය පාරවලට ඉහළින් තිබූ පාලම උඩින් දැන් අපි ඇවිදගෙන යමින් සිටියෙමු. එක වරම ආරියරත්නම් මහතා පාළම උඩ නැවතිණි. මා දෙස කෙළින්ම බලා ඔහු ප්‍රශ්නයක් ඇසීය.

"ඔබ කරදරයේ වැටී සිටි විටෙක මා ඔබට උදව් කිරීමට ඉදිරිපත් වුණා. ඒ වාගේ මා කරදරයකට වැටී සිටිනවා නම් – ඔබ උදව් කරනවාද?"

"සත්තකින්ම ඔව්. ඔබ මට කළ උදව්ව ජීවිතාන්තය තෙක් ම මතක තිබෙනවා. ඔබට තිබෙන්නේ මගෙන් උදව්ව ඉල්ලන එක පමණයි."

"ආරියරත්න, මා අවිවාහකයෙක්. මගේ මව් තවම ජීවත්ව සිටිනවා. ඇයට උදව් කිරීම මගේ තිබෙන එකම වගකීම, නමුත් ළඟදීම ඒක කරන්නට බැරි වෙනවා."

සාක්කුවෙන් ලේන්සුව අතට ගත් ඔහු කඳුලු පිස දැමීය.

"ඇයි ඒ?"

"මට ජීවත්වීමට තිබෙන කාලය ඉතා ටිකයි."

"ඔබේ වයස."

"මගේ වයස හැටයි."

"මගේ පියාගේ වයස හැත්තෑපහයි. තවමත් ඔහු ක්‍රියාශීලියි. ඉතින් ඔබ ඇයි ඔය තරම් වයස හිතට ගෙන තිබෙන්නේ." මම ඇසීමි.

"වයස නොවෙයි වරද, මට අසාධ්‍ය රෝගයක් තිබෙනවා. ඒක සනීප කරන්ට බෑ."

"මොකක්ද රෝගය? සමහර විට එය සනීප කරගන්ට මට උදව්වීමට පුලුවන් වේවි. මට සම්පූර්ණ ඇත්ත කියන්න."

මෙතෙක් අහක බලා ගෙන කතා කළ නීතිඥ ආරියරත්නම්, මා දෙස බලා මට ළං වී මගේ උරහිසට අත තැබුවේය.

"මට ලොකු ණය කීපයක් ලැබෙන්නට තිබෙනවා. මට මේ අසාධ්‍ය රෝගය තිබෙන බව දැන ගත්තොත් – ඒ ණයකාරයෝ ණය ගෙවන්නේ නෑ. එවිට මගේ මව්ට ඒ මුදල් දීමට මට පුලුවන් වන්නේ නෑ."

"ඔබට ඇති අසාධ්‍ය රෝගයක් නෑ. ඔබේ ලෙඩේ තිබෙන්නේ හිතේ. මට ඔබේ රෝගය සුව කරන්ට පුලුවන්. මම ඔබේ පුතා කියා හිතා ගන්න. සියලු විස්තර මට කියන්න. මා ඉපදී සිටින්නේ අන් අයගේ රෝග සුව කරන්න. ඒ නිසා බය නැතුව ඇත්ත කියන්න. මා ඔබ අත්හැර යන්නේ නෑ."

"ඔය ඇත්ත ද?"

"ඔව්."

"එහෙනම් බලන්න." ඔහු කට ඇරියේය. එක් අතකින් දිව පැත්තකට කොට හක්ක ප්‍රදේශය මට පෙන්වීය. එය මට පෙනුණේ සුදු පුලුන් ගුළියක් මෙනි.

"මෙය දොස්තර කෙනෙකුට පෙන්නුවා ද?"

"නෑ, මෙය පිළිකාවක්."

"එය කියන්න ඕනෑ දොස්තර කෙනෙක්. ලෙඩා නොවෙයි. මට විශ්වාසයි මෙය පිළිකාවක් නොවන බව. මගේ පුංචි නැන්දාගේ කටේත් ඔය වගේ සුදු මාංශ පේශියක් තිබී එය වෛද්‍යවරු සනීප කළා. පිළිකාවක් නොවෙයි. මට සහතිකයි."

ඔහු පුදුමයෙන් මා දෙස බැලීය. මම නැවත කතා කළෙමි.

"අද රාත්‍රි අපි ආපසු ගියාම මම හෙට හෝ අනිද්දා ඔබ හමුවන්ට එන්නම්. පිළිකා විශේෂඥ දොස්තර මහතෙක් ළඟට ඔබ මගේ පියා යයි කියා එක්කර ගෙන යන්නම්. ඔබට තිබෙන්නේ ඔබේ නමේ අග අකුර 'ම්' නැතුව ආරියරත්න කියා කියන එක විතරයි. ඊට පසු කාරණය දන්නේ දොස්තර මහතා යි – ඔබයි – මම යි පමණයි."

"එකඟ ද?"

"ඔව්. හැබැයි ගුවන් යානයෙන් බැස, ඔබ ඉස්සෙල්ලාම මගේ ගෙදරට එන්ට ඕනෑ. මා ඉන්නේ නාලන්දා විද්‍යාලයට කිට්ටුවෙන්. මා විතරයි ලොකු ගේක ඉන්නේ. ඔබටත් මා සමඟ ඉන්ට පිළිවනි." ඔහු ඉතා ඕනෑ කමින් ඇසීය. මම එම ඉල්ලීමට එකඟ වීමි. ආරියරත්නම් මහතා ගේ මුහුණ කාන්තිමත් වී සිත සැහැල්ලු වූ බව මට පෙනිණි.

එහෙත් මගේ හිතේ වැඩ කළේ වෙනත් අදහසකි. තාවකාලිකව මොහු සැනැසීමි. එහෙත් මෙය පිළිකාවක් ම වුවොත්? මගේ හිතේ ප්‍රශ්නයකි. එය යටපත් කරගෙන මාතෘකාව වෙනස් කළෙමි. ආපසු

දුම්රිය ස්ථානයේ අපේ විවේක කාමරයට ගොස්, අපේ බෑග් සූදානම් කර ගෙන, යතුරු බාර දී ගුවන් තොටුපළ බලා ගියෙමු.

අප ට්‍රිචි ගුවන් තොටුපළෙන් පිටත් වූයේ රාත්‍රි 7 ට පමණ ය. එම ගුවන් යානය විශේෂ ගුවන් යානයකි. අගමැති ජවහර්ලාල් නේරු තුමා විසින් ඉන්දීය ගුවන් විදුලි සේවය සහ ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් අපේ සහෝදර රාජ්‍යයක් වූ ශ්‍රී ලංකාවේ ගංවතුරෙන් හානි ඇති වී තිබෙන මේ අවස්ථාවේ සෑම ආධාරයක් දිය යුතුය යන, ඉල්ලීම මත එකතු වුණු බෙත් ද්‍රව්‍ය සහ ආහාර ආදියයි, මේ ගුවන් යානයෙන් ගෙන යන්නේ. මගීන් හැටියට සිටියේ අප දෙදෙනා පමණකි.

රත්මලාන ගුවන් තොටුපළට අප බසින විට රාත්‍රී 8.30 ට පමණ ඇත. මේ මගේ දෙවන ගුවන් ගමනයි. ආරියරත්නම් මහතා මා ද කැටුව ටැක්සියකින් කෙලින් ම ගියේ මරදානට යි. මරදානේ නිව් සිටි ස්ටෝරුව ඉදිරිපිට ටැක්සිය නවත්වා අපි බැස්සෙමු. එම සාප්පුවේ ආනන්ද විදුහල පැත්තේ අඩි පහක පමණ කුඩා අතුරු පාරක් සාප්පුව පිටි පස්සට වැටී තිබිණි. එය දිගේ අපේ බෑග් ද රැගෙන අප ගියේ තට්ටු දෙකක නිවසයකටයි. එය ඉදිරිපිට විශාල දෙල් ගසක් විය.

කොළඹ 10, මරදාන පාරේ අංක 493 දරණ නිවසට, දෙල්ගහ යට ගෙදරට, මා හාපුරා කියා පැමිණියේ මෙසේය. ඒ 1957 දෙසැම්බර් මස 31 වැනිදා යි. ආරියරත්නම් මහතා මට ඇඳක් සූදානම් කර දුන්නේය. කිරි කෝපි කෝප්පයක් ද ඔහුගේ අතින්ම හදා දුන්නේය. එදා සිට පුරා දහ හතර වසරක් මාගේ ජය භූමිය වූ මේ වාසනාවන්ත නිවසේ පළමු වරට එදා රාත්‍රියේ සුවසේ නිදා ගතිමි.

ඡායාරූප: 129
දෙල්ගහයට
ගෙදර

45

දෙල්ගහ යට ගෙදර පදිංචියට පැමිණීම

එක්දහස් නවසිය පනස්අටේ ජනවාරි පළමුවැනිදාට එළි විය. අවුරුදු දෙකක් මහරගම අභ්‍යාස විද්‍යාලයයේ නිදහසේ ගත කළ කාලය නිම වී, අදින් මගේ ජීවිතයේ අලුත් යුගයක් ඇරඹෙන බව මට කල්පනා වේ. හත්වැනිදා සිට නාලන්දා මහා විද්‍යාලයේ ගුරුවරයෙක් ලෙස සේවය අරඹමි. එක්දහස් නවසිය පනහේ සිටම මා සිත් තුළ තිබුණු යම් යම් සමාජ විප්ලවීය අරමුණු ද සැබෑ කර ගත යුතුය.

"සුබ උදෑසනක් වේවා! ඔබේ අද වැඩසටහන කුමක් ද?" මේ ඇසුවේ මට උදේ ආහාරය පිළියෙල කරමින් සිටි නීතිඥ ආරියරත්නම් මහතාය.

"මා මුලින්ම බත්තරමුල්ලට ගොස් අබේසේකර මහතා හමු විය යුතුය. ඊළඟට පුංචි අම්මලාගේ ගෙදරට යමි. ඉන් පසුව පිළිකා විශේෂඥ වෛද්‍යාචාර්ය ප්‍රනාන්දු මහතා හමුව, හෙට මගේ 'පියා' පෙන්වීමට අවස්ථාවක් ගත යුතුය. රාත්‍රියේ ආපසු මෙහි එමි. ඊට පසුව ගෙදරට – උණවටුනට – ගොස් මා සුවසේ ලංකාවට පැමිණි බව දෙමාපියනට දන්වා ආපසු එමි. ඊළඟට නාලන්දාවේ වැඩ බාර ගැනීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ගැනීමටත්, නාලන්දා නේවාසිකාගාරයේ නැවතීමට කටයුතු පිළියෙල කර ගැනීමටත් පුලුවන. කෙසේ හෝ මා ප්‍රමුඛතාව දී තිබෙන්නේ ඔබේ අසනීපය සනීප කර දීමටයි. බයවන්ට එපා. මා ඔබ අත්හැර යන්නේ නෑ."

ඔහු සැනසුම් සුසුමක් හෙළීය. උදේ ආහාරය පිළියෙල කර හමාර නිසා මා යෑමට ප්‍රථම එය භුක්ති විඳ යන ලෙසද පැවැසීය.

මගේ කටයුතු නිමවා, නැවත රාත්‍රී මා ආරියරත්නම් මහතාගේ නිවසට පැමිණියේ පිළිකා රෝග විශේෂඥ වෛද්‍ය ප්‍රනාන්දු මහතාගෙන් පසුව දා ඔහුව පෙන්වීමට වේලාවක් ද ලබා ගෙනය.

මහ රෝහලේ වෛද්‍ය ප්‍රනාන්දු මහතාගේ පිළිකා 'ක්ලිනික්' එකට ආරියරත්නම් මහතාට පෙර මම ඇතුලුවීමි. මගේ පියා හොඳටම බයෙන් සිටින බවත්, අසනීපය පිළිකා රෝගය වුවත් ඒ බව ඔහුට

නොකියන ලෙසත්, මම දොස්තර මහතාගෙන් ඉල්ලා සිටියෙමි. ආරියරත්නම් මහතා පරීක්ෂා කළ දොස්තර මහතා හොඳටම සිනාසිණි.

"ඔබේ පුතා මට කීවා ඔබට පිළිකාවක් තිබුණත් කියන්ට එපා කියා. ඔබට ඇති පිළිකාවක් නැ. ඔබේ උල්වෙච්ච දතක් තිබෙනවා. එය මස්වලට කා ගෙන යෑම නිසා ඒ කොටස සුදුපාට වෙලා. දත ගලවා දමන්න. මාස තුනක් යන විට සුදුපාට නැතිව යයි." මෙසේ පැවැසූ දොස්තර මහතා අපට යන්ට අවසර දුන්නේය.

ඡායාරූප : 130
වෛද්‍ය ඩබ්ලිව්. ජී. විමලධර්ම මහතා

එතැනින් අප කෙලින්ම ගියේ දන්ත වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ජී. විමලධර්ම මහතාගේ පුංචි බොරැල්ලේ තිබූ දන්ත ශෛල්‍යාගාරයටයි. දත ඉවත් කළ පසු, මම ගමේ දින දෙක, තුනකට යන බව කියා මගේ බෑගය එතන ම තබා ගාලු ගියෙමි. මා බෑගය තබා ගියේ ආරියරත්නම් මහතාට, මා නැවත නොඒවිය යන බිය ඉවත් කිරීමටය.

මා ඉන්දියාවට යන විට ලොකු අක්කාට පොරොන්දුවක්දී තිබිණි. එනම් ඉන්දියාවෙන් බුදු පිළිමයක් ගේන බවටය. මොරිටෝමෝ සමග එහි වූ අකරතැබ්බ නිසා එහි දී පිළිමයක් ගැනීමට වේලාවක් නොවීය. මේ නිසා මම ගමේ යෑමට ප්‍රථම, පිටකොටුවේ කුමාර වීදියේ සේමගේ සාප්පුවට ගොස් බුදු පිළිමයක් මිලයට ගතිමි. එය ශාන්ත ලස්සන සමාධි බුදු පිළිමයකි. වැඩි කතාවක් නොකොට එය ලොකු අක්කාට තෑගි දුනිමි. අදත් එය ගෙදරට එන හැමදෙනාටම පෙන්වා ලොකු අක්කා කියන්නේ, "මල්ලී භාපුරා කියා ඉන්දියාවට ගිය ගමනේ දී ගෙනා පිළිම වහන්සේ" යනුවෙනි. පසු කලක මා ඇයට ඇත්ත කීවත් එය කිසිසේත් ඕ විශ්වාස නොකරන්නීය.

ගිංතොට ට ගොස් පුංචි අක්කා ද හමුව, මම කොළඹ පැමිණියේ ජනවාරි හය වැනිදාය. එදින මගේ පැරණි ස්ථානය වූ මහරගම ගුරු අභ්‍යාස විද්‍යාලයට ද ගොස්, ආපසු දෙල්ගහ යට ගෙදරට පැමිණියෙමි. හත්වැනි දා නිල වශයෙන් මම නාලන්දාවේ වැඩ බාර ගත යුතුය. මා වෙන කොතනකවත් නේවාසික වීමට යනවාට ආරියරත්නම් මහතා ඇකැමැතිය. ඔහුට සම්පූර්ණයෙන් සුව වනතුරු එහිම රැඳී සිටින ලෙස

ඔහු පවසයි. ඒ අතර නිව් සිටි ස්ටෝරුව සහ අප සිටින නිවස හිමි පී.ඊ. පෙරේරා මහතා හා ඔහුගේ පුත් ජෝර්ජ් චන්ද්‍රසෝම මහතා මා හා මිත්‍ර විය. පෙරේරා මහතාගේ බෑනා කෙනෙක් වූ කලින් මාතලේ විජය විදුහලේ අධිපතිව සිටි - එමෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්ව ද සිටි ටී.ටී. නානායක්කාර මහතා ද සිටියේ අප නිවසේ උඩුමහලේ ය. එතුමාද මා හා මිත්‍ර විය. මේ සියලුදෙනාම මගෙන් ඉල්ලා සිටියේ එහි පදිංචිව සිට නාලන්දාවේ සේවයට යන ලෙසය. මම ද කැමති වීමි.

පී. ඊ. පෙරේරා මහතාගේ බාල පුතා වූ ගල්කිස්සේ ශාන්ත තෝමස් විදුහලේ ජ්‍යෙෂ්ඨ පන්තියේ උගත් පී. එස්. කුමාරට විභාගයට අවශ්‍ය විෂයයන්ට උදව්වීම ද ඔවුහු මගෙන් බලාපොරොත්තු වූහ.

දෙල්ගහයට ගෙදර මගේ තාවකාලික නේවාසිකය කර ගතිමි. එහෙත් එක් පොරොන්දුවක් මතයි. එනම්: ආරියරත්නම් මහතා මගෙන් යම් නේවාසික ගාස්තුවක් බාර ගත යුතුය. මට මතක හැටියට එය රුපියල් තිහකට වඩා වැඩි වූයේ නැත. එතුමාට සනීප වූ පසු මා වෙන තැනක් සොයා ගැනීමට හෝ පාසලේ නේවාසිකාගාරයට යෑමට සිතා සිටියෙමි.

දෛවය ක්‍රියා කරන්නේ අප සිතා සිටින අන්දමට නොවේ. මාස තුනක් පමණ ගත විය. දැන් ආරියරත්නම් මහතාට හොඳට ම සනීපය.



ඡායාරූප : 131
පී. ඩබ්. මහවත්ත, ධර්මසේන සේනානායක, ටී. එස්. සිල්වා, කේ. දසනායක මහත්වරු සහ නාලන්දාරාමාධිපති හිස්සැල්ලේ ඤාණවිමල හිමි දෙල්ගහයට ගෙදර කාර්යාලයේ දී

ඡායාරූප : 132
දෙල්ගහයට ගෙදර සර්වෝදය කාර්යාලය ඉදිරිපස වමේ සිට: මම, නාලන්දා සමාජ සේවා සංගමයේ ලේකම් සුනිල් වික්‍රමතුංග ශිෂ්‍යයා, ලෝක තරුණ සම්මේලනයේ මහ ලේකම් ජෝති ශංකර් සිංග් මහතා, නීතා සහ දරු තිදෙනා වින්‍යා, චාරිකා සහ ජීවන්

කටේ කොතැනකවත් සුදක් නැත. ඇගේ හොඳට මස් දමා මුහුණ ද ඉතා සතුටින් කාන්තියක් විහිදුවයි.

දවසක් සන්ධ්‍යාවේ මම ඔහු සමග කතා කළෙමි. "දැන් ඔබට හොඳටම සනීපයි. මගේ පොරොන්දුව ඉෂ්ට කර හමාරයි. මා දැන් වෙනත් තැනක් සොයා යා යුතුය."

ආරියරත්නම් මහතා වේට්ටිය හකුලාගෙන, කැහිපට ගහ ගත්තේය. ලොකු සුරුට්ටුවක් පත්තු කර ගත්තේය. ජනේලයෙන් එළිය පැත්ත බලා ටික වේලාවක් සිට මා පැත්තට හැරුණේය. "ආරියරත්න, මා දැන් ඔබ හොඳට හඳුනනවා. මගේ ජීවිතයේ ඔබ වැනි ශ්‍රේෂ්ඨ තරුණයෙක් මට මුණගැසී නැ. මේ ජාතියට විශාල සේවයක් කිරීමට ඔබට ආධ්‍යාත්මික ශක්තියක් තිබෙනවා. මා විශ්වාස කරන දෙවියන්ගේ පිහිට ද, මා ඔබ වෙනුවෙන් ඉල්ලා යාඥා කරනවා. මේ ස්ථානයේ හිමිකාරයා මම නොවෙයි. ඔබයි. මේක ඔබේ ජය බිම. ඔබ අරඹා ඇති ශ්‍රේෂ්ඨ සමාජ සේවය ගෙන යැමට මේ ස්ථානයට වඩා සුදුසු තැනක් නැහැ. මේ නිවසේ බද්ද ඔබ නමට හරවන ලෙස හෙට මා පෙරේරා මහතාට කියනවා. මට සිල්වර් ස්මිත් වීදියේ ගෙයක් තිබෙනවා. මම හෙටම එහි පදිංචියට යනවා. ඔබ මෙතනම ස්ථිරව පදිංචි වන්න."

ඔහුගේ වචන මට අදහා ගන්ට නොහැකි තරම් විය. ඒ අවස්ථාවේ එතරම් අවංක බවක් එහි රැඳී තිබිණි. ඒ අතර මෙහි ජීවත් වූ මාස කිහිපය තුළ මට ද දෙල්ගහයට ගෙදරට පුදුම ඇල්මක් ඇති වී තිබිණි. පසු දා සිට පුරා අවුරුදු දහහතරක් දෙල්ගහයට ගෙදර සිට, මම දියත් කළ අහිංසාවාදී විප්ලවය මෙහෙය වූවෙමි.

46

විෂයය ඉගැන්වීම තුළින් පූර්ණ පෞරුෂෝදය

නාලන්දා විද්‍යාලයේ පත්වීම ලැබ සේවයට වාර්තා කළ පළමු දිනයෙහි ම, 1958 ජනවාරි 7 වන දින, විදුහල්පති එම්.ඩබ්ලිව්. කරුණානන්ද මහතා 10 වැනි ශ්‍රේණියේ 'ඒ' පන්තිය භාර ගුරුවරයා හැටියට මා පත් කළේය. මගේ කාල සටහනේ 9, 10 පන්තිවල විෂයයන් හැටියට මට ඉගැන්වීමට බාරදී තිබුණේ ගණිතය සහ ජීව විද්‍යාවයි. එකල පැවැති අධ්‍යාපන ක්‍රමය පිළිබඳ වැඩි ප්‍රසාදයක් නොතිබුණු මට, ළමයින්ගේ මුහුණු දුටු පළමුවැනි දිනයේම කල්පනා වූයේ මම ජීව විද්‍යාව ඇතුලු කුමන විෂයයක් ළමයින්ට ඉගැන්වුවත් ඒ හැම අවස්ථාවකදීම ඔවුන්ට ඉගැන්වීමට වඩා, එසේ උගන්වන විෂයය තුළින් ඔවුන්ගේ පූර්ණ පෞරුෂෝදයකට තුඩු දෙන පාඩමක් ද ඉගැන්වීමයි. මේ නිසා මගේ වැඩි අවධානය යොමු කළේ, ළමයා ඉගෙන ගන්නා විෂයයට වඩා ළමයාගේ පෞරුෂ සංවර්ධනයටය. ජීවිත විද්‍යාව උගැන්වීමටය.

ගුරුවරුන් හැටියට අප පාසලට ඇන්දේ සුදු කලිසම, සුදු අත් දිග කමිසය, සුදු කබාය සහ ටයිපටියයි. පළමු සතියේම කබාය ඇඳීම අත්හැරියෙමි. මේ සඳහා මා පෙළඹවූයේ නිරුවතින් වන මැද සිටි දරුවන් සිහිවීමය. කරුණානන්ද මහතා කිසිදු විරුද්ධත්වයක් නො දැක්වූ බව පෙනුණේය. තව සති කිහිපයක් යනවිට ටයි පටිය පැළඳීම ද අත්හැර දැමීමි. උත්සව අවස්ථාවකට පමණක් ටයි පටිය දැමීම සීමා කළෙමි.

සන්ධ්‍යා සමයෙහි ළමයින් සමඟ එකතු වී ක්‍රිකට් ක්‍රීඩා කිරීමට මම දින කිහිපයක් පිට්ටනියට ගියෙමි. එවකට හංවැල්ලේ ශාන්ත ජෝන් බොස්කෝ විදුහලේ උප විදුහල්පතිව සිටි ඒ.ජී.ජී. පෙරේරා මහතාගේ නායකත්වයෙන් යුත් පාසල් ගුරුවරුන්ගේ ක්‍රිකට් කණ්ඩායමේ මා සෙල්ලම් කළ නිසා, සවසට මේ ආකාරයෙන් ටිකක් සෙල්ලම් කිරීම ව්‍යායාමයක් හැටියට මෙන්ම, පුහුණුවක් හැටියට ද මම සැලකුවෙමි.

ඉහළ පන්තිවල ළමයින් සමඟ මා කිට්ටුවෙන් ආශ්‍රය කිරීම ගැන පිට්ටනියට නිතර ආ සමහර ගුරුවරුන් අකැමැති බව මට හැඟී ගියෙන්, මගේ පන්දු පිත්ත ඇතුලු සියලුම භාණ්ඩ ක්‍රිකට් ක්‍රීඩා කළ ළමයකුට තෑගි දී, මම පිට්ටනියේ ක්‍රීඩා කිරීම නැවැත්වීමි. මම කුඩා කල සිටම කිසිවකු සමඟ ගැටීමෙන් වැළකුණෙමි. ගැටීමක් ඇති වුවහොත්, මා අගය කරන සාරධර්ම නො නසා ජයග්‍රහණය ලැබෙන තුරු ඉදිරියට යෑමද මගේ ප්‍රතිපත්තියයි.

නාලන්දා විද්‍යාලයය



ඡායාරූප: 133 – නාලන්දා විද්‍යාලය: ගොඩනැගිලි

මේ කාලයේ දී සිදුවුණු සිද්ධියක් මට මතකයි. පාසල් ගුරුවරුන්ගේ ක්‍රිකට් කණ්ඩායම සමඟ උඩරට රදැල්ලේ පිට්ටනියේ තවත් ක්‍රීඩා කණ්ඩායමක් සමඟ අපි තරග කළෙමු. ඉක්මනින් ම විකට් 2 ක් බිඳී ගිය නිසා, මට පිත්ත හැසිරවීමට යෑමට සිදුවිය. ඊට පෙර තලවාකැලේ මගේ මිත්‍රයෙක් ලයන් ලාගර් බෝතල් 1/2 ක් වීදුරුවකට වත්කොට මට බොන්න දුන්නේය. මෙය මත්පැනක් දැයි මම ඇසීමි. ඔහුගේ පිළිතුර වූයේ "නැහැ, මේ බීර" කියාය. බැට් කරන්නට පටන් ගත් විට බෝලය වෙනදාට වඩා ටිකක් ලොකුවට මට පෙනුණි. මේ නිසා දෝ හතර පැත්තට ම පහර දෙමින් තරගය දිනන තුරු ලකුණු හැත්තෑ ගණනක් රැස් කරමින් මම නො දැවී ක්‍රීඩා කළෙමි. මේ මා ක්‍රීඩා කළ අවසන් ක්‍රිකට් තරගය පමණක් නොව, ලයන් ලාගර් හෝ වෙනත් මත්පැනක් බිව් මුල්ම සහ අවසාන අවස්ථාව විය.

නව සහශ්‍රකයේ ළඟ දී පළ වූ සඟරාවකට ලිපියක් ලියමින් එක්තරා ව්‍යාපාරිකයෙක්, මා නාලන්දාවේ උගන්වන කාලයේ මට දිනපතා බීර බෝතලයක් නොමැතිව සිටීමට නොහැකි වූ බව ලියා තිබෙනු දැක පුදුම වීමි. එම ව්‍යාපාරික ලේඛකයා මගෙන් නොකළ හැකි උදව් ඉල්ලා, ප්‍රතික්ෂේප කිරීම නිසා මා සමඟ උරණ වී සිටියේ ය. ඔවුන්ගේ ඉතිහාසය ගැන මා දන්නා දේ සඳහන් කිරීමට තරම් මම පහත් පුද්ගලයෙක් නොවෙමි.

මුලින්ම ධර්මරාජ විද්‍යාලයට බැඳීමට අදහස් කර තිබුණත්, පසුව මා සමඟම නාලන්දා විදුහලේ ගුරු මණ්ඩලයට එක්වීමට ධර්මා ගුණසිංහ මහතා ද තීරණය කර තිබුණේය. මා සමඟම එතුමා ද විද්‍යාලයේ මධ්‍යම කොටසේ විද්‍යා ගුරුවරයා වශයෙන් පත් විය. රසායන විද්‍යා ගුරුවරයා හැටියට කමල් දිසානායක මහතා ද, අප සමඟම ගුරු මණ්ඩලයට එක් විය. භෞතික විද්‍යා ගුරුවරයා හැටියට ධර්මසේන සේනානායක මහතා ද, විශ්ව විද්‍යාල ප්‍රවේශ පන්තිවල ඒ වනවිටත් ඉගැන්වීය. කලා අංශයේ ගුරුවරුන් හැටියට සේවය කළ එම්. ඒ. තිලකරත්න මහතා ද, සුගතමුණි ඤාණසිරි මහතා ද, වික්ටර් සිල්වා මහතා ද, එස්. එස්. අමරසිංහ මහතා ද, අප සමඟ මහින්ද විද්‍යාලයේ ඉගෙන ගත් ශ්‍රියා ෆොන්සේකා මෙනෙවිය, අධිනීතිඥ බැටී වීරකෝන් මහතාගේ බිරිඳ වූ හේමා වීරකෝන් මැතිනිය, පී. ඒ. එස්. සිල්වා ආදී වූ මිතුරන් රැසක්ම නාලන්දයට බැඳුණු අලුතදී ම හඳුනා ගතිමු. ටී.එස්. සිල්වා මහතා හා සෝමා ද සිල්වා මහත්මිය ද, ජෙනට් කරුණාරත්න මහත්මිය ද මාස කිහිපයකට පසු අපේ ගුරු මණ්ඩලයට එක් වූහ.

විෂයයන් ඉගැන්වීම පිළිබඳ මට කිසිම ප්‍රශ්නයක් ඇති වූයේ නැත. වෙනත් ගුරුවරුන්ට සමානව ප්‍රසිද්ධ විභාගවලදී මගේ විෂයයන් කළ ශිෂ්‍යයෝ ද හොඳින් සාමාර්ථය ලැබූහ.

එහෙත් මා සිතට වඩාත්ම සතුටක් ගෙන දුන්නේ සර්වෝදය ශ්‍රමදාන කටයුතු තුළින්, සිය පෞරුෂෝදය ගොඩනගා ගත් සිසු දරුවන් මුණ ගැසෙන විටය. ඒ අය අතර මහාචාර්යවරු, වෛද්‍යවරු, ඉංජිනේරුවරු, හමුදා ප්‍රධානීහු, මැති ඇමතිවරු, දේශීය හා ජාත්‍යන්තර සිවිල් සේවකයෝ ආදීහු සිටිති. මේ කතාන්තරයේ මෙයින් සමහරෙකු මට මුණ ගැසෙන අවස්ථාවල දී ඔවුන්ගේ පමණක් නොව, ඔවුන්ගේ දරුවන් කෙරෙහිත් මගේ ආශ්‍රයෙන් ඇති වූයේ යයි ඔවුන් හඟින කරුණු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමි.

47

කනතොලුව මුල් කඳවුර

එක්දහස් නවසිය පනස්හයේ මැද සිට, එක්දහස් නවසිය පනස්හතේ අවසානය දක්වා මගේ සති අන්ත සහ නිවාඩු කාල මා යොදා ගත්තේ ආරියනන්ද අබේසේකර මහතා සමග විශේෂයෙන් වයඹ පළාත, උතුරුමැද පළාත, නැගෙනහිර පළාත, ඌව පළාත ආදී ප්‍රදේශවල රජය විසින් නොදියුණු ජන කොට්ඨාශ හැටියට නම් කර තිබුණු ගම්මාන බැලීමටය. එම නොදියුණු සමාජ සංවර්ධන අංශය බාරව ක්‍රියා කළේ ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආරියනන්ද අබේසේකර මහතාය. ඔහු සමග කළ සමහර සංචාර පිළිබඳව මම කලින් සඳහන් කළෙමි. ඔහුට කුඩා බග්ගියට් වැන්රියක් තිබුණේය. අද තිබෙන නවීන සුඛෝපභෝගී රථවලට යාමට නොහැකි තැන්වලට, මේ බග්ගියට් රථයෙන් ගියෙමු. යන්නට බැරි තැන්වල එය අපි උස්සාගෙන ගියෙමු. කැඩුනාම, ලී පතුරක් හෝ දමා එය රෙපයාර් කිරීමට අබේසේකර මහතා ගජ හපනෙක් විය. මේ දුප්පත් වන සතුන් අතරේ ජීවත් වන මිනිසුන් බලන්නට යෑම සමාජ සේවයක් මෙන්ම, ඒ කාලයේ මට ලොකු අධ්‍යාපනයක් සහ විනෝදයක් ද විය.

කුල භේදය නිසා කොන් වී තිබුණු රත්නපුර, කෑගල්ල සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල ගම්මාන රැසකටම සති අන්තවලදී අපි ගියෙමු. අපේ පළමුවන කඳවුර සඳහා තෝරා ගත්තේ කනතොලුව ගම්මානයයි. එවකට කුරුණෑගල දිස්ත්‍රික්කයේ අබේසේකර මහතාගේ කටයුතු බාර වී තිබුණේ, ඩබ්ලිව්. ඒ. සෙනෙවිරත්න නම් ඉතා හොඳ ග්‍රාම සංවර්ධන නිලධාරී මහතෙකුටය.

නාලන්දා විද්‍යාලයේ ඉතා පැරණි සමාජ සේවා සංගමයක් තිබුණේය. බලංගොඩ ආනන්ද මෛත්‍රී මහ නාහිමියන් සහ හීනැටියන ධම්මාලෝක නාහිමියන්, නාලන්දාවේ ධර්මාචාර්යවරුන් හැටියට සේවය කරන අවස්ථාවේදී, ලංකාවේ විවිධ පළාත්වල ඇති වූ මැලේරියා වසංගතයේ දී මහජනතාවට උදව් වීමට මෙම සංගමය පිහිටුවන ලදී.

මා නාලන්දාවට ඇතුලු වන විට ළමයිනට අවශ්‍ය පොත්පත්, පෑන්, පැන්සල් ආදිය ලබා දීමටත්, වෙනත් සුලු සුලු සමාජ සේවා කටයුතු කිරීමටත් පමණක් මේ සංගමය සීමා වී තිබුණේය. මගේ සමාජ සේවා පසුබිම ගැන විදුහල්පති කරුණානන්ද මහතාත්, සමාජ සේවා සංගමයේ සභාපති ධර්මසේන සේනානායක මහතාත් ශිෂ්‍යයින් බොහෝ දෙනෙකුත් දැන ගෙන තිබුණ නිසා 1958 දී පැවැත්වූ මහා සභා රැස්වීමේදී නාලන්දා සමාජ සේවා සංගමයේ උප සභාපතිවරයකු වශයෙන් මාද පත්කර ගන්නා ලදී.



ඡායාරූප: 134
හීනටියන ධම්මාලෝක මහ නාහිමි

මෙම රැස්වීමේදී මා පැවැත්වූ මුල් දේශනයේදීම මා අවධාරණය කළේ අධ්‍යාපනය, පන්ති කාමරය, පාසල, පතපොත, විභාග ආදිය අබිබවා ප්‍රජාවට සම්බන්ධ වූ ජීවත්වීම තුළින්, ජීවිතය සඳහා ජීවිතාන්තය තෙක් ක්‍රියාත්මක වන ක්‍රියාදාමයක් බවට, අප පත් කළ යුතු බවයි. කිසිදු විධිමත් අධ්‍යාපනයකට පාඩුවක් නොවී, එයට උපස්තම්භක වන සේ, පාසල සමාජයට යා යුතු බව මම ප්‍රකාශ කළෙමි. මෙය ආරම්භ කළ යුත්තේ අධ්‍යාපනික සහ ප්‍රජා සේවා කඳවුරක් තුළින් බවත්, එවැනි කඳවුරකට නාලන්දා ගුරු–සිසුන් පුරෝගාමිත්වය දිය යුතු බවත් මම ප්‍රකාශ කළෙමි. ලංකාවේ නොදියුණුම ගමක් තෝරා ගෙන, ඒ ගැමියන්ට සේවය කරන අතර, ඔවුන්ගෙන් ද ඉගෙන ගැනීමට අධ්‍යාපන සේවා කඳවුරක් සංවිධානය කිරීමට මම යෝජනා කළෙමි. මෙම කඳවුර ඓතිහාසික ආරම්භයක් විය හැකි බවත්, එය ජාතික ව්‍යාපාරයක් විය හැකි බවත්, අනාගතයේ දී එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ පවා මේ ගැන සඳහන් විය හැකි බවත් මම තවදුරටත් කීවෙමි.

එම්. ඒ. තිලකරත්න මහතා, එම්. එම්. ජනරත්න මහතා ආදී වූ ගුරුවරුද, ශිෂ්‍යයන් කිහිප දෙනෙක්ද මගේ යෝජනාව අනුමත කොට කතා කළහ. මේ සියල්ල අසා ගෙන සිටි විදුහල්පති එම්. ඩබ්ලිව්. කරුණානන්ද මහතා, ජාතික ව්‍යාපාරයක් වීමත්, එක්සත් ජාතීන්ගේ මණ්ඩලය දක්වා එය දියුණුවීමත් ආදී වූ සිහින අමතක කොට, ඉතා කාර්යක්ෂමව – අධ්‍යාපනික වශයෙන් ද ප්‍රයෝජනවත් වන කඳවුරක් සංවිධානය කරන හැටියට අවවාද දුන්නේය. ඔවුන්ට සම්පූර්ණ සහාය

එයට දෙන බව ප්‍රකාශ කළේය. අපි වහාම කඳවුරු සංවිධායක කමිටුවක් පත් කර ගත්තෙමු. සර්වෝදය ශ්‍රමදාන සංසදයේ බීජය රෝපණය වූයේ එදාය. එහෙත් නාමය 'නාලන්දා සමාජ සේවා සංගමය' වූයේය. වසරක් ඇතුළත 'ශ්‍රමදාන ව්‍යාපාරය' නමිනුත්, 1962 ක වනවිට සර්වෝදය ශ්‍රමදාන සංගමය නමිනුත්, පරිණාමය වූයේ එදා ඒ ගත් තීරණය නිසායි.



ඡායාරූප: 135
පූජ්‍යපාද ගරු තුන්නානේ සුමනතිස්ස නාහිමි

මෙම අධ්‍යාපනික සහ සේවා කඳවුර පැවැත්වීමට තීරණය කර ගත් දින සිට සෑම සති අන්තයකදීම කරුණානාන්ද මහතාගේ රියෙන් අපි කනතොලුවට ගියෙමු. බොහෝ අවස්ථාවල දී රිය පැදවූයේ ධර්මා ගුණසිංහ මහතාය. එතුමාගේ වාහනය නැති වූ විට, ඩී.එස්. සේනානායක මහතාගේ පර්ජෝ රියෙන් හෝ එල්.පී. විජේසුන්දර මහතාගේ ඩී.කේ.ඩබ්. රියෙන් හෝ ධර්මා ගුණසිංහ මහතාගේ ෆොක්ස්වගන් රියෙන් හෝ පර්සි විජේසූරිය මහතාගේ ෆෝඩ් කොන්සල් රියෙන් හෝ අපි කනතොලුවට ගියෙමු.

1958 මැයි මාසයේ සිට මාස 4 ක් පමණ කඳවුරට සහභාගි වන ළමයින් සඳහා සතියකට දිනක් හෝ දෙකක් බැගින් පුහුණු පාඨමාලා පැවැත්වූයෙමු. විවිධ දෙපාර්තමේන්තු සහ ආයතන ප්‍රධානීන් දේශකයන් වශයෙන් ගෙන්වා ගතිමු. ප්‍රජා සංවර්ධනය සහ සමාජ සුභසාධනය පිළිබඳව විවිධ තානාපති කාර්යාලවලින් ලබාගත් චිත්‍රපට පෙන්වූයෙමු. වරින්වර ළමයින් සහ ගුරුවරුන් කණ්ඩායම් සමඟ දෙසැම්බර් මාසයේ පැවැත්වීමට නියමිත



ඡායාරූප: 136
කරුණානන්ද මහතා කනතොලුවේ දී

කනතොළුවේ ශ්‍රමදාන කඳවුර

ඡායාරූප : 137
ළිඳක් කැපීම

ඡායාරූප : 138
වැඩට බට නාලන්දා ශිෂ්‍යයෝ

ඡායාරූප : 139
බෝධීන් වහන්සේ ළඟට පිළිම වහන්සේ නමක් වැඩම කිරීම
වම් පැත්තේ වියන අල්ලා ගෙන සිටින්නේ දැන් ගණකාධිකාරිවරයකු වූ කේ. එන්. ජයලත් මහතාය.

අධ්‍යාපනික සහ ප්‍රජා සංවර්ධන කඳවුර සඳහා කනතොලුව ගම්මානය සූදානම් කිරීමට අපි ගියෙමු. විවිධ ගුරු ශිෂ්‍ය කණ්ඩායම් සංවිධානය කොට, කනතොලුවේ පාසල් ගොඩනැගිල්ල ඉදි කිරීම, ළමයිනට අවශ්‍ය ඩෙස්-බංකු-ගල්ලෑලි ආදී ද්‍රව්‍ය සකස් කිරීම, ළමයිනට අවශ්‍ය ඇඳුම්-පැළඳුම්, පොත-පත, පෑන්-පැන්සල් ආදී දේ සූදානම් කිරීම, ගමට පාරවල් කැපීම, ගමේ නිවාස, වැසිකිළි, ළිං, වේවැල් කර්මාන්තය ආදිය ඇරඹීමට කටයුතු සම්පාදනය කිරීම ආදී වූ විවිධ කාර්යයන් සඳහා ගුරුවරුන්ගෙන් සහ ශිෂ්‍යයින්ගෙන් සමන්විත වූ කමිටු ක්‍රියාත්මක වූහ.



ඡායාරූප : 140
පූජ්‍ය පණ්ඩිත
ගරු කොත්මලේ අමරවංස නාහිමි

දෙසැම්බර් මාසය තුළදී ප්‍රථම ශ්‍රමදාන කඳවුර ක්‍රියාත්මක කළෙමු. මේ පිළිබඳ විස්තර පොතක් මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා විසින් ලියා ඇත.

මා නාලන්දාවට ඇතුලු වන විට එහි ධර්මාචාර්යවරයත් වහන්සේ ලෙස ක්‍රියා කළේ පූජ්‍ය පණ්ඩිත ගරු කොත්මලේ අමරවංස හිමියන්ය. උන් වහන්සේ සමග මම ඉතා කුලුපග වීමි.



ඡායාරූප : 141
ශ්‍රමදානයක දී කොණ්ඩා කැපීම

මගේ උපදේශකයකු වශයෙන් ද උන් වහන්සේ ක්‍රියා කළහ.

එදා උන් වහන්සේ කනතොලුව ව්‍යාපාරය ගැන ලියා තැබූ ඇත්දැකීම් 'අමරවදාන' නැමැති උන්වහන්සේගේ පොතක මෙසේ සඳහන් වේ:

"නාලන්දා විදුහල්පතිව සිටි ලෝරිස් මහතා කීපවිටක්ම කළ ආරාධනය පිළිගෙන, නාලන්දා විදුහලේ ධර්මාචාර්යවරයෙකු බවට පත් වූයෙමි. කිසිදු වැටුපක් නොලබමින්, නෙවසරකට වැඩි

කාලයක් බුදු දහම උගන්වමින්, පොහෝ දිනයන්හි මගේ හිතවත් භික්ෂූන් වහන්සේලා සිව් නමක් ද සහාය කර ගනිමින්, පන්තියක් පාසා ධර්ම දේශනාවක් කිරීමටත්, පන්ති කීපයක් එකතු කර ගෙන ජයශෛඛරාරාමයට ගොස් මල් පහන් පූජා කරවා, බුදුන් වැන්දවීමෙන් පසු භාවනාවක ද යොදවා, කැඳවාගෙන ඒමේ විශේෂ වැඩ පිළිවෙලක් ගෙන යමින්, පොහෝ දිනයන්හි සවස් කාලයේ ශිෂ්‍යයන්ගෙන් එකතු කර ගන්නා දේවල් ද රැගෙන ගොස් වික්ටෝරියා නිවාසය වැනි තැන්වල අනාථ සංග්‍රහ පැවැත්වීමෙන් ද, නාලන්දා මධ්‍ය මහා විද්‍යාලයේ විශේෂ පුස්තකාල ආරම්භ කිරීමෙන් ද, "නාලන්දා පහන" නමින් සඟරාවක් පළ කරවීමෙන් ද, බුද්ධ ජයන්ති කාලයේ දී පන්තියක් පාසා ළමා බෞද්ධ ශිෂ්‍ය සමිති පිහිටුවා, ඒ සියල්ලෙහි නියෝජිතයන් එකතු කොට 'නාලන්දා සමාජ සේවා සමිතිය' නමින් සමස්ත නාලන්දා ශිෂ්‍ය සමිතියක් ආරම්භ කොට, සමාජ සේවා කටයුතුවල යෙදවීමෙන්ද, බෞද්ධ ශිෂ්‍ය ජීවිතවලට නව ජීවයක් හා ප්‍රබෝධයක් ඇති කරවමින් වටිනා සේවයක් කෙළෙමි.

ඡායාරූප: 142
කනතොලුව ගම්මානයේ
පළමු පිඩුසිඟා වැඩීම

"මුල් කාලයේ දී දූරදර්ශී බුද්ධිමත් විදුහල්පතිවරයෙකු වූ ඩී. සී. ලෝරිස් මැතිතුමා සහ ගුරු මණ්ඩලයේ බොහෝ දෙනෙකුත්, මටත් – මා කරන යහපත් වැඩටත් සහයෝගය දුන්හ. ඉහත දැක්වුනු වැඩ හොඳින් කර ගත හැකි වූයේ එනිසාය. පින්වත් ඒ හැම

ඡායාරූප : 143
ශ්‍රමදානයක දී පාර කැපීම ඉදිරියෙන් සිටින්නේ ද ැන් ගණකාධිකාරිවරයෙකු වූ කේ. එන්. ජයලත් මහතාය.

නම් පමණකින් දැක්වීම සුදුසු වූවත්, එය දුෂ්කරය. එහෙත් ඒ. ටී. ආරියරත්න මහත්මා නම් මෙහි ලා සඳහන් නොකර බැරිය. එතුමා ගුරුවරයෙකු වශයෙන් පැමිණි දා පටන්, අප දෙස බලා – කරන කටයුතු ගැන විමසා – පුදුම සහයෝගයක් ලබා දුන්නා. අවංක–කාරුණික–පළල් හැඟීම්වලින් පොහොසත් ඒ මහත්මා, පෙරුම් පුරාගෙන එන සමාජ සේවා කටයුතු, උසස් ලෙස – සාර්ථකව විදුහලට ගෞරවයක් ලැබෙන සේ කරගත හැකි වූයේ, ඒ මහත්මාණන්ගේ බුද්ධිමත් සහයෝගයත් – පුරෝගාමීත්වයත් නිසාය.

කරන කටයුතුවල හෝ පුද්ගලයන්ගේ අගය තේරුම් ගත නොහැකි, ආත්මාර්ථ –කාමී, ඊර්ෂ්‍යා පරවශ මිතංපචයන් ගේ යටි කුට්ටු වැඩ නිසා මෙකල විද්‍යාලය තුළ භේද – ප්‍රභේද – ආරවුල් රාශියක් ඇති වුනා. කනතොලුව ව්‍යාපාරය වැනි බැහැර පෙදෙස්වල ශ්‍රමදාන ව්‍යාපාර පැවැත්වීමාදියෙන්, රටේ ගෞරවාදරයට පත්ව පැවති නාලන්ද සමාජ සේවා කටයුතු ද, එකී "අඩ්කෝඩයට" හසු විය.

ආරියරත්න මහත්මා සිරුරින් කුඩා වුවද, අදහස් මහත්ය; පළල්ය. මෙතෙක් සමාජ සේවා කටයුතුවලට සහාය දුන් ගුරු භවතුන් කීපදෙනෙකුත් සහ මා සමග ද කතා බස් කර, අපගේ ද, විද්‍යාලීය උසස් පන්තිවල ළමයින්ගේ ද මෙතෙක් කළ සේවාවන්හි අගය සලකන හිතවතුන්ගේද, සහයෝගය ලබාගෙන, ආනන්ද විද්‍යාලයට වම් පසින් මරදාන පාරේ ඇතුළත නිවසකදී රැස්වීමක් පවත්වා 'සර්වෝදය' නමින් සමිතියක් ආරම්භ කෙළේය.

අප්‍රතිහත ධෛර්යයෙන් හා අවංකව වැඩ කිරීම නිසාම එය දිනෙන් දින දියුණු විය. එහෙයින්ම නාලන්දයෙන් පමණක් නොව, රජයේ සේවයෙන්ද අස්වී, තම කාලයත් – ශ්‍රමයත්, ඇතැම් විට ධනයත් යොදමින්, එයට ඇප කැප වී ක්‍රියා කිරීම නිසා, අද ලක්දිවට පමණක් නොව, මුලු ලෝකයටම ප්‍රයෝජනවත් නොමැකෙන සේවාවක් කරන හැටිත් බුද්ධිමත් ලෝකයාගේ ගෞරවාදරයට පාත්‍රව සම්මානයට පත්ව සිටින සැටිත්, අප කවුරුත් දනිමු; දකිමු.

මෙහි, සර්වෝදය ගැන මේ ටික ලියන්නට මා පෙළඹුණේ, එහි ආරම්භයේදීත්, එයින් සිදු කළ කනතොලුව වැනි සත් ව්‍යාපාරවලදීත්, මා කළ කී දෑ බොහෝ දෙනෙකු නොදන්නා නිසාය; දන්නා අයත් නොකියන නිසාය.

කනතොලුව ව්‍යාපාරය

සර්වෝදය මඟින් මෙතෙක් කරන ලද ග්‍රාමෝදය වැඩ අතර අග්‍රගණ්‍ය සාර්ථක ව්‍යාපාරය නම්, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිටිසරබදව



ඡායාරූප: 144
තුන්නානේ සුමනතිස්ස නාහිමි
කනතොලුවේ නිවසකට වැඩිය අවස්ථාවක්

පිහිටි, වර්ෂ සිය ගණනක් සැඩොල් ගමකැයි සම්මතව, අන් අය වෙන් කළ – කොන් කළ අත්‍යර්ථයෙන්ම නොදියුණු-පිරිහුනු ගම්මානයෙහි මාසයක් මුලුල්ලේ කළ ශ්‍රමදානයයි. සාමාන්‍ය පාසල් ශිෂ්‍යයන් පමණක් නොව, විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ද, රජයේ දෙපාර්තමේන්තු කීපයක වෙනත් සමිති සමාගම්වල හා නොයෙක් පළාත්වලින් පැමිණි මහජනයාද, පොලීසිවලද සහයෝගය නිසා, මසක් මුලුල්ලේ උත්සවාකාර යෙන් එය පවත්වන ලදී; එය විචිත්‍ර සංදර්ශන භූමියක් (කානිවල්) වැනි විය.

සැප සේ හැදුනු වැඩුනු සිසු දරුවන් කණ්ඩායම් වශයෙන් බෙදී, අත්–මුහුණු ලේ පාට වන තුරු ගිනි අව්වේ, සැඩොල් ගමේ පාරවල් – ළිං – පොකුණු – වැසිකිළි වළවල් කැපූ හැටි – ක්‍රීඩා භූමි – වන්දනීය ස්ථාන – කර්මාන්ත ශාලා සකස් කළ හැටි, පෝලිමේ ගොස් වතුර ගෙනෙන විට දකින මගේ පමණක් නොව, කාගේත් නෙත්වලින් ගැලූ තුටු කඳුලින් එහි පොළව තෙත් වුනේ, ඔවුන්ගේ වෙහෙස දුරු කරන්නට මෙනි.

ආගමික කටයුතුවලටත් වෙන් වූ දෙදිනම, ඒ සියල්ලම මෙහෙය වූයේ මාය. එගම් වැසියන් සමග අපේ ගුරුවරු ද, සිසු පිරිස ද එකට වාඩි වී, සිල් සමාදන්ව බණ ඇසූහ; බවුන් වැඩූහ. ධර්ම සාකච්ඡා කළහ. දානය ද වැළඳූහ. සුනීත – සෝපාකාදීන් පැවිදි ලොවට දුන් සමානත්වයේ ආදර්ශය ක්‍රියාත්මක වනු දුටු කවුරුත් මවිත වූහ. සවස් කාලයේ පැවැත්වුන ධර්ම දේශනාව අවසානයේදී "මේ පින්වතුන්ගේ ගමේ හෙට හාමුදුරු නමක් පිණ්ඩපාතයේ වඩිනවා ඇතැ"යි මා කියත්ම, ඔවුන් දුන් 'සාදු' නාදය අදත් මගේ කණේ රැඳී ඇත. ගෙමිදුලේ පිරිසිදු කර වැලි අතුරා පැදුරක් එලා, එය මත සුදු රෙද්දක් දමා, පිඩු සිඟා වඩින තුරු සොම්නසින් බලා සිටින බැතිමතුන්, පෙරහැරක මෙන් මා පසුපසින් එන පිරිසට අපූර්ව දර්ශනයක් විය. පැරණි බෝ රුකක් මුල මලසුන් ගෙයක් සාදා වන්දනීය ස්ථානයක් පිළියෙල කර, විවෘත කිරීමේ උත්සවයක් පැවැත්වීම ආදී බොහෝ අවස්ථාවලදී ඔවුන් තුළ

පැවති පාරම්පරික හීන–දීන–බාන සුළුකම් අත් හැර, සිතින් – ගතින් – ධෛර්යවත්ව නැඟී සිටිය යුතු බව පහදා කළ දේශනා රාශියකි. ඒවාට කවුරුත් පැසසූහ.

එහෙත්, මෙකී බොහෝ අවස්ථා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මගින් චිත්‍රපටවලට ගෙන ප්‍රචාරය කළහ. පුදුමයකි? ටික කලකට පසු ප්‍රචාරය වුනු,'චණ්ඩාලි' නැමති චිත්‍රපටය කනතොලු ව්‍යාපාරයේ මා පෙනී සිටි අවස්ථා කීපයක්, අපට නොදන්වා ඇතුළත් කර තැබීම නිසා මා දැන් චිත්‍රපටවලද පෙනී සිට මුදල් උපයතියි ඇනුම් බැනුම් අහන්නටද සිදු වුනා. මා එම චිත්‍රපටය අද දක්වා දැකලා වත් නැත! විචාරමුඛ කතාවලට මම එදත් සිනාසුනෙමි; අදත් සිනාසෙමි."*

කනතොලුව කඳවුර සැබැවින්ම මහා විප්ලවීය ක්‍රියාවක් විය. ස්ථිර අධිෂ්ඨානයෙන් යුතුව කුල භේදයත්, උස්–පහත් භේදයත් සමාජයෙන් තුරන් කිරීමට පාසල් දරුවන්ගෙන් පටන් ගෙන, ජාතික වශයෙන් සංවිධානාත්මක ක්‍රියා මාර්ගයක් දියත් වූ ප්‍රථම අවස්ථාව මෙය විය. මේ කඳවුරට නාලන්දා විද්‍යාලයීය ශිෂ්‍යයින්ට අමතරව, කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලයේ බාලදක්ෂ කණ්ඩායමද, මහරගම ගුරු අභ්‍යාස විද්‍යාලයේ පුහුණු වන ගුරුවරුන් පිරිසක් ද, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් රැසක් ද සහභාගි වූහ.

අබේසේකර මහතා හා මගේ අත්සනින් මේ කඳවුර නැරඹීමට එන ලෙස සිය ගණනක් විශේෂ අමුත්තන්ට ආරාධනය කළෙමු. මේ දින එකොළහ ඇතුළත අප ආරාධනා කළ අයවලුන්ගෙන් විශාල පිරිසක් පැමිණ කඳවුර නැරඹූහ. මොවුන් අතර අති පූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහ නාහිමි, ආචාර්ය පී. ද ඇස්. කුලරත්න මහතා, පොලිස්පති ඔස්මන්ඩ් ද සිල්වා මහතා, උප පොලිස්පති ලැම්බ්‍රගන් මහතා, එවකට කුරුණෑගල සෞඛ්‍ය අධිකාරීව සිටි – පසුව ලෝක සෞඛ්‍ය සංවිධානයේ ආසියා හා පැසිපික් කලාපයේ අධ්‍යක්ෂ වූ වෛද්‍ය හේරත් ගුණරත්න මහතා, කටුගම්පල පාර්ලිමේන්තු මන්ත්‍රී ටී. බී. සුබසිංහ මහතා, සමූපකාර ව්‍යාපාරයේ නියමු – සඳලංකාවේ වින්සන්ට් සුබසිංහ රාළහාමි, ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ ජී.වී.පී. සමරසිංහ මහතා, මහාචාර්ය සිරි ගුණසිංහ ආදී සම්භාවනීය පුද්ගලයෝ ද වූහ.

අගමැති ගරු එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමන්ට ද අවසාන දින ත්‍යාග ප්‍රදානෝත්සවයට ආරාධනා කළෙමි. කඳවුරට දින

---

* 'අමරාවදාන': කොත්මලේ ශ්‍රී අමරවංශාභිධාන නාහිමි ස්වයං ලිඛිත අපදානය හා ශාස්ත්‍රීය සංග්‍රහය: 2000 – මහරගම

කිහිපයකට පෙර එතුමා දුරකතනයෙන් මට කතා කළේය. "එතුමාට එදිනට ඒමට අපහසු බැවින් තම මැතිනිය අත පණිවුඩයක් එවන බවත්, මේ පටන් ගත් සත් ක්‍රියාව නොනවතා දිගටම කරගෙන යන ලෙසත් කඳවුරෙන් පසු එතුමා හමුවන ලෙසත්" මට පැවසුවේය.



ඡායාරූප : 145
ගරු අගමැති එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා

1958 දෙසැම්බර් 16 වැනිදා එතුමා පොරොන්දු වූ පරිදි, පහත දැක්වෙන පණිවුඩයත් සමඟ සිරිමාවෝ ආර්.ඩී. බණ්ඩාරනායක මැතිනිය කඳවුරට සහභාගි වූවාය. මට මතක හැටියට ලංකා මහිලා සමිතියේ සභාපතිනි එන්. එස්. පෙරේරා මැතිනිය හා පිරිසක්ද ඒ සමඟ වූහ.

15.12.1958 දාතමින් ගරු අගමැතිතුමා අත්සන් කර එවූ ශුභාසිංශන ලිපිය මෙසේය:

"නාලන්දා විද්‍යාලයීය සමාජසේවා සංගමය මගින් පීඩිත ජන කොට්ඨාශයක් නඟාසිටුවාලීමට අරඹා ඇති වැඩ පිළිවෙල ගැන අසා මහත් සන්තෝෂයට පැමිණියෙමි.

පොදු මිනිස් අයිතිවාසිකම් පිළිබඳ පුලුල් හැඟීම්වලින් ලෝකයම පිබිදී ඇති මෙවැනි කාලයක, ආර්ථික පක්ෂයෙන් මෙන්ම අධ්‍යාපනික හා සමාජ තත්වයෙන්ද නොසලකා හරින ලද ජන කොට්ඨාශ තිබෙන්නට හැරීම කිසිම රටකට හෝ ජනතාවකට තරම් නොවන අසාධාරණයකි.

ඡායාරූප : 146
සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මැතිනිය

සෙසු ජනතාවන් විසින් නොසලකා හැර, අවාසනාවකට කැප වී සිටින ජනයා වෙසෙන ගමක් තෝරා, ඒ ගමේ වැසියන්ගේ උන්නතිය සැලසීමට නාලන්දා සමාජ සේවා අංශය ගත් පියවර ඉතා විශිෂ්ඨ ජන සේවක ක්‍රියා මාර්ගයක් වශයෙන් සැලකෙනු ඇත. එපමණක් ද නොවේ; ඒ වනාහි සෙසු විද්‍යායතනයන් ද, සමාජ සේවා සංස්ථාවන් හා

ආයතනද හමුවේ තබන ලද උසස් ආදර්ශයක් වශයෙන් පිළිගැනෙනු නො අනුමානය.

සහෝදර දිළිඳු ජනයා නැංවීමට ගත් මේ පියවර සර්ව සාර්ථක වේවා යයි ද එයම දීප ව්‍යාප්ත සමාජ සේවා ව්‍යාපාරයක ආරම්භය වේවා යයි ද ප්‍රාර්ථනා කරමි.

එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක
අගමැති
15.12.1958"

මේ කඳවුර සංවිධානය කිරීමට පටන් ගත් දිනයේ සිටම, කනතොලුව ගම්වාසීහු විශාල උනන්දුවක් දැක්වූහ. සමහර අවට ගම්වල තුගත් බලවත්තු කිහිප දෙනෙක් පෝස්ටර් ගලවා දැමීම වැනි නරක ක්‍රියා කළහ. එහෙත් දිනපතා සිය ගණන් ජනතාව කඳවුර බැලීමට පැමිණෙන විට, ඒ බාධක ටිකෙන් ටික අඩු වී, හැම දෙනාම වාගේ මේ කරන සත් ක්‍රියාව අගයන්නට පටන් ගත්හ.



ඡායාරූප : 147
බණ්ඩාරනායක මැතිනිය ළිඳක් කපන හැටි නරඹයි

නාලන්දාවේ ළමයින් කනතොලුවට වරින් වර ගොස් එහි ළමයින්ගේ අධ්‍යාපන සහ වෙනත් කටයුතුවලට සහභාගි වීම, කනතොලුවේ ළමයින් නාලන්දාවට කිහිප වරක් ගෙන්වා ඇඳුම් පැළඳුම්, පොත් පත් ආදිය ලබාදී සංග්‍රහ කිරීම ආදී කටයුතු රැසක් මේ කාලයේ සංවිධානය විය. ප්‍රදර්ශන කිහිපයක් පවත්වා නාලන්දා විදුහලෙන් කරන ලද නොදියුණු සමාජ සංවර්ධන කටයුතු ගැන ද මහජනයාට අවබෝධයක් දෙන ලදී.

බොරැල්ලේ තරුණ බෞද්ධ සමිති ශාලාවේ පැවැත් වූ විවිධ ප්‍රසංගයකදී නාලන්දා විදුහලේ ආදි ශිෂ්‍යයකු වූ සිසිර සේනාරත්න මහතා හිටිහැටියේම වේදිකාවට නැග එවේලේ ම ඔහු විසින් ප්‍රබන්ධ කළ ලස්සන ගීතයක් ගායනා කළේය. එයින් පද කීපයක් මට මතකයි.



ඡායාරූප : 148
සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මැතිනිය තෑගි බෙදා දෙයි.
දකුණේ සිට වමට – මා, බිම වාඩි වී, අබේසේකර මහතා සහ එම්. ඩබ්ලිව් කරුණානන්ද මහතා

ඡායාරූප : 149
කනතොලුව ගමට එන පාර සකස් කිරීම



ඡායාරූප : 150
මැහුම් පන්තියක්

ඡායාරූප : 151
සිසිර සේනාරත්න හා ඉන්ද්‍රාණී සේනාරත්න මැති – මැතිනියන්

"පාලු ගමකී කුඩා
අඳුරු බවෙන් සදා
ඒ කනතොලුවේ
ජීවේ ගෙවුනේ දුකේනීය ලෝකේ
කන්න දේකුත් නැහැ
බොන්න වතුරත් නැහැ
උනට තිබුණේ
තිරිසනුන් වාගෙ – සිටියා මෙ ලෝකේ
නාලන්දා සමාජ සේවකයින්
මුදා ගන්තා මොවුන් ව අඳුරෙන්//
...."

රජයේ චිත්‍රපට අංශය විසින් "හිරු උදා වෙයි" යන මැයින් සිංහල හා ඉංග්‍රීසි වාර්තා චිත්‍රපටියක් මේ කඳවුර අළලා නිෂ්පාදනය කරන ලදී. මට මතක හැටියට එය භාරව කටයුතු කළේ ඒ. සෙනෙවිරත්න යන සහකාර අධ්‍යක්ෂවරයෙකි. යූ.බී. ඇල්කඩුව මහතා කැමරාව මෙහෙය වූ අතර දයා ද සිල්වා සහ කේ. සතියානන්දන් යන මහත්වරු ද ඒ කණ්ඩායමේ සිටියහ.

හැම භාෂාවකින්ම පළ වෙන පුවත්පත්වලත්, ගුවන් විදුලි මාධ්‍යයෙනුත් මේ අධ්‍යාපනික හා සේවා කඳවුරට විශේෂ ප්‍රසිද්ධියක් දෙන ලදී. මා කොතරම් මාධ්‍යවලින් ඈත්ව සිටීමට මහන්සි ගත්තත්, මෙහි ප්‍රධාන සංවිධායකයා හැටියට නොදැනුවත්වම, මගේ නම

ඡායාරූප : 152
කනතොලුව සේවා කඳවුරු
බැලීමට පැමිණි අගමැති
බිරිඳ සිරිමාවෝ
බණ්ඩාරනායක මැතිනිය

ප්‍රසිද්ධියට පත් විය. අබේසේකර මහතාටත් එසේය. අවංක හොඳ මිනිසුන් අපේ සේවය ඉතා අගය කරමින් වචනයෙන් හෝ ධෛර්යය දුන් අතර, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමහර උසස් අය, අබේසේකර මහතාටද, නාලන්දාවේ සමහරුන් මටද තදින්ම ඊර්ෂ්‍යා කිරීමට පටන් ගත්තේ මේ අවදියේය.

නාලන්දාව බෞද්ධ සංස්කෘතිය පදනම් කර බිහිවුණු ආයතනයකි. වෙනත් ඕනෑම පෞද්ගලික පාසලකට නොදෙවෙනි අන්දමට ක්‍රිකට් ක්‍රීඩාව, කැඩෙට් බලකාය, පාපන්දු හා වෙනත් ක්‍රීඩා ක්ෂේත්‍රවලද නාලන්දාව මේ වනවිට ඉහල තත්වයට පත්ව තිබුණි. ඒ නිසා සමාජ සේවා කටයුතු අතින් ද නව නැම්මක් ගෙන ක්‍රියා කිරීමේදී, විශේෂ යෙන් සමහරුන් ඒ දෙස ඉහත කී ක්ෂේත්‍රවලට අභියෝගයක් වන සේ සැලකූ නිසාදෝ අභ්‍යන්තරික මතභේද හා ගැටුම් ඇතිවීම ස්වාභාවිකය. මේ නිසා ශ්‍රමදාන කටයුතුවලට

ඡායාරූප : 153
බණ්ඩාරනායක මැතිනිය තෑගි බෙදා දෙයි

යෙදුණු ගුරු වරුන් වූ අපි, මේවා උග්‍රවීමට නො දී, අපේ ශිෂ්‍ය නායකයින් හොඳ ඉවසීමකින් හා සංයමයකින් යුතුව ක්‍රියා කරන අන්දමට වග බලා ගතිමු. උපේක්ෂා සහගතව හා දූර්දර්ශීව ගත් මධ්‍යස්ථ පියවර නිසා, තීරණාත්මක සහ දීර්ඝකාලීන යහපත් ප්‍රතිඵල අපට ලබා ගත හැකි විය.

ඡායාරූප: 154
කනතොලුවේ සිල්ගත් පිරිසට බුද්ධ පින්තූර බෙදාදීම

අද මෙන්ම, එදාත් මා ප්‍රතිවාදීන්ට පිළිතුරු දෙන්ට හෝ ඔවුන්ට විරුද්ධව ප්‍රතික්‍රියා කිරීමට ගියේ නැත. ඒ වෙනුවට මා කළේ පැහැදිලි දර්ශනයක් ගොඩනැගීමත්, අධ්‍යාපනික සේවා ශිල්ප ක්‍රම ගොඩනැගීමත් සංවිධාන ව්‍යුහය ශක්තිමත් කිරීමත්ය. මේ පිළිබඳ දීර්ඝ වශයෙන් ලිපි සකස් කළ අතර, එයින් සමහරක් මුද්‍රණය කළෙමි. පුවත්පත් ලිපි මගින් ප්‍රචාරය කර හැරියෙමි. විවේචකයින්ට, විශේෂයෙන් ද්වේශයෙන් ඊර්ෂ්‍යා වෙන් ලියන කියන අයට පිළිතුරු දීමට යෑම, කාලය නාස්ති කිරීමකි.

ඡායාරූප:155

මුල් යුගයේ කඳවුරුවලට සහභාගි වූ පුරෝගාමී නාලන්දා ශිෂ්‍යයින් කිහිපදෙනෙක්

වෛද්‍යාචාර්ය ජේ. ජේ. තුරුසිංහ

මේජර් ජෙනරාල්
ආනන්ද වීරසේකර USP, M.A
කීර්ති ශ්‍රී ධර්මද්වීපාරක්ෂක



සුනිල් වික්‍රමතුංග මහතා

විවේචන අසන්නා හෝ කියවන්නා හෝ කළ යුත්තේ විවේචනයට භාජනය වූ පුද්ගලයා ගැන විනිශ්චයකට ඒමට පෙර, විවේචකයා විසින් සමාජ සංවර්ධනයට කුමක් කර තිබේ දැයි තුලනාත්මකව සොයා බැලීමය. ඔවුන්ගේ විවේචන කෙතරම් දුරට සත්‍යය, ප්‍රත්‍යක්ෂය හා සමාජ උන්නතිය පදනම් කොට කර තිබේද? නැතිනම් ඊර්ෂ්‍යාව, වෛරය, පලිගැනීමේ චේතනාව හෝ නොදැනුවත්කම මුල් වී තිබේද? මේවා ගැන බුද්ධිමත් පාඨකයා සැලකිලිමත් විය යුතුයි.

ඡායාරූප: 156
ඒ. ඩී. එම්. ගුණසේකර මහතා වේවැල් වැඩ කියා දෙයි

ඡායාරූප: 157
පර්විචන්කර්නි කදවුරේදී ඩී.එස්. සේනානායක සහ ධර්මා ගුණසිංහ සමග

48

යුග දිවියට යොමු වීම

මට නීතා හමු වූ පළමුවැනි දිනය අද වගේ මතකය. ඒ කර්මානුරූප මුණ ගැසීමක් ලෙස මම විශ්වාස කරමි. පාසල් යන වියේදී, මා ආලය කළ තරුණියක් සිටියත්, මගේ අනාගත ජීවිතය පිළිබඳ මනුෂ්‍ය සේවා බලාපොරොත්තු ඒ පවුල හා එක්වීමෙන් ඉටු කර ගත හැකි බවට මා තුළ සැකයක් ඇති වුයෙන්, එක්දහස්නවසිය පනස් පහේ අවසනදී ඒ සම්බන්ධය නතර කළෙමි. ඉන් පසු දෙවසරක් පමණ මා ජීවත් වූයේ මගේ සුළු පියා වූ ඒ.ටී.සී. ජිනදාසයන් හෝ ඥාති සොයුරු වූ සිරි ජිනදාසයන්, මෙන් තනිකඩ ජීවිතයක් ගත කරන බලාපොරොත්තුවෙනි.

එහෙත් නාලන්දා විද්‍යාලයට ඇතුලු වී සමාජ සේවා කටයුතු ඇරඹීමත්, ඒවා සාර්ථක වීමත් සමඟම, නොයෙක් අයගේ ඊර්ෂ්‍යාවලට මම ගොදුරු වීමි. එක්දහස් නවසිය පනස්අටේදී සිට දිගටම කඳවුරු පවත්වා ගෙන යෑම නිසාත්, ඒවාට ලොකු ප්‍රසිද්ධියක් ලැබීම නිසාත්, ගතානුගතික අධ්‍යාපන ක්‍රමවලින් පිටස්තර වෙනත් මගක යෑම නිසාත්, හතුරන් රැසක්ම ඇති වූහ. ලාබාල ශිෂ්‍යයන් කඳවුරුවලට ගෙන යාමත්, අප සේවය කළ ගම්වල කිසිදු ලිංග භේදයක් නොමැතිව ගැහැනු - පිරිමි එකට වැඩ කිරීමත් නිසා, නොයෙක් අය අපට බොරු චෝදනා එල්ල කළහ. මේ නිසා එක්දහස් නවසිය පනස්නමයේ වර්ෂය වන විට මා හා එක්ව මුලු ජීවිතයම අහිංසාවාදී සමාජ විප්ලවයකට කැපවීමට සූදානම් සහකාරියක් මම සොයමින් සිටියෙමි.

මානාව කඳවුර

එක්දහස් නවසිය පනස්අටේ, දෙසැම්බර මාසයේදී කනතොලුවේ දී පැවැත් වූ පළමු ශ්‍රමදාන කඳවුරේ සිට, සෑම කඳවුරක්ම සංවිධානය කිරීමේ දී සම සංවිධායකවරු හැටියට අත්සන් කළේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඩී.ඒ. අබේසේකර මහතා හා මාය. එක්දහස් නවසිය පනස්නවයේ අප්‍රේල් මාසයේ දී පැවැත්වූ මානාව කඳවුරේ එදින අපි දෙදෙනා ම සිටියෙමු. මට මතක හැටියට නාලන්දා ශිෂ්‍යයන් ඇතුලු

ඡායාරූප : 158
සුප්‍රකට සිනමාවේදී හා උතුරු නැගෙනහිර හිටපු ආණ්ඩුකාර ගාමිණී ෆොන්සේකා මහතා ජර්මන් ජාතික ෆ්‍රෙඩ් රොමාන් මහතා සමග ශ්‍රමදායකයින් සමග විරාමයකදී

සියයකට වඩා පිරිසක් කඳවුරේ සේවය කළහ. මා නිදා ගත්තේ මානාව රෙදි විවීමේ මධ්‍යස්ථානයේ බිම පැදුරක් එළාගෙනය.

මේ කඳවුරට සුප්‍රසිද්ධ සිනමා නලුවකු වූ ගාමිණී ෆොන්සේකා මහතා තවත් විදේශීය මිත්‍රයෙකු ද සමග සහභාගි වූවා මට මතකය.

සිහිනයක්

උදේ හතරට පමණ මම සිහිනයක් දැක අවදිවීමි. "වයසක කාන්තාවක්, ගැහැනු ළමයින් දෙදෙනෙකු සමඟ කඳවුරට එනවාත් එයින් එක් කෙනෙකුගේ අතින් අල්ලා ගෙන මම, කුරුල්ලකු මෙන් ඉගිලී

ඡායාරූප : 159
සීතා රාජසූරිය මැතිනිය මියුසියස් විද්‍යාලයේ බාලදක්ෂිකාවන් සමග. මානාව කඳවුරේ දී – වමේ සිට දකුණට ඉන්ද්‍රා දසනායක, නීතා, නාලිනී රාජපක්ෂ, පුෂ්පරාණි බස්නායක, සීතා රාජසූරිය මැතිනිය

ඡායාරූප : 160
ඩී. සී. කටුගම්පල
මහතා මානාව
කඳවුරේ දී ඇඳුම්
බෙදයි

ඡායාරූප : 161
නාලන්දා
ශ්‍රමදායකයෝ

ඡායාරූප : 162
නීතා, නාලන්දා
ශ්‍රමදායකයන් සමග

යනවා" ඒ සිහිනයයි. ඉන්පසු මට නින්ද ගියේ නැත.

උදේ පවුල් හමුවට සහභාගි වූ මම එදින කඳවුරේ කාර්ය භාරය අබේසේකර මහතා හා ධර්මසේන සේනානායක මහතා විසින් සම්පූර්ණයෙන්ම භාර ගත යුතු බව පවසා දිනක් නිවාඩු ගතිමි. අබේසේකර මහතා හා දැනට සර්වෝදයේ උපසභාපති ධර්මසේන සේනානායක මහතා පෞද්ගලික ව "ඇයි අද කඳවුරු භූමියට නොයන්නේ?" කියා ඇසූවාම,

ඡායාරූප: 163
මානාව වැඩ කරන බාලදක්ෂිකාවන්
පිටුපස හැරී ඉදිරියේ සිටින්නේ නීතාය.

මා පිළිතුරු දුන්නේ "අද මා විවාහවන්ට යන සහකාරිය තෝරා ගන්ට තිබෙනවා" යනුවෙනි. මා නිතරම විහිලු කරන නිසා "හොඳයි, හොඳයි ගුඩ් ලක්" කියා ඔවුහු උදේ ආහාරයෙන් පසු ළමයින් ද සමඟ පාරවල් කැපීම්, වැව හෑදීම, ගස් සිටුවීම, ළිං කැපීම ආදී විවිධ ශ්‍රමදාන කටයුතු කෙරෙන තැන්වලට ගියහ.

මම කඳවුරු කාර්යාලයට වී ලිය කියවිලි වැඩ කරමින් සිටියත් මගේ දෑස නිතරම වැටෙන්නේ ඈත ගල්පොත්ත හා නුග ගහ ළඟටයි. පිටින් එන වාහනයක් පැමිණ නතර කළ යුත්තේ එතැන නිසාය. මගේ හිතට මහත් අවිවේකී බවක් ද දැනිණි.

අමුත්තන් තිදෙනෙක්

ඔසරියකින් සැරසුණු වයසක කාන්තාවකුත් ගවුම් හැඳ ගත් ගැහැනු ළමයින් දෙනෙනකුත්, මා සිටින කඳවුරු කාර්යාලය පැත්තට ගමන් කරනු මම දුටුවෙමි. ඒ දෙදෙනා ගෙන් බාල ගැහැනු ළමයා දෙස, ඇඟිල්ල දිගු කොට, ඈත දීම "අර එන්නේ මා විවාහ වන ගැහැනු ළමයා ය"යි කණට කොඳුරා මා ළඟ සිටි ඩී.සී. කටුගම්පල මහතාට පවසා, මම ඔවුන් ඉදිරියට ගමන් කළෙමි. ඒ අවස්ථාවේදීම වැඩිමහල් කාන්තාව යමක් ඒ ළමයින් දෙදෙනාට කියනවාත්, ඒ සමඟම ඔවුන් දෙදෙනාම ආපසු කාරෙක දිහාවට දුවනවාත්, මම දිටිමි. ඒ අතර ඉක්මන් ගමනින් ඒ කාන්තාව, තෙන්නකෝන් මැතිනිය, මා දෙසට ආවාය.

"මිස්ටර් ආරියරත්න, මම ඔන්න ඔයාගේ ව්‍යාපාරෙට දෙන්නෙක් එක්ක ආවා. අක්කයි, නංගියි. නංගි ඔයාගේ පත්තරේ ලිපි කියවලා එකතු කරගෙන තියෙනවා. මට ඔයා අඳුන්නල දෙන්නෙයි කිව්වා.

එයාට ඕනෑලු ඔයත් එක්ක එකතු වෙලා වැඩ කරන්ට. මම කිව්වා ඔය ආරියරත්න කියන්නෙ වයසක මිනිහෙක් කියලා. ඒ නිසා එක පාරටම මා ඔයා අඳුන්නලා දෙන්නෙ නෑ. හොඳ විහිලුවක් කරමු."

ඡායාරූප: 164
කර්නල් වීරසේන රාජපක්ෂ හා ඉන්දියානු ගුවන් සේවයේ සිටි ආත්ලේ මහතා මානාව කඳවුරේ ආහාර ගනිමින්

තෙන්නකෝන් මැතිනිය ආපසු හැරී කාරෙක දිහා බැලීය. එවිට නැඹිලි වගයකුයි, තව මොනවාද ආහාර ද්‍රව්‍ය වගයකුයි අරගෙන, රියැදුරුත් සමඟ මේ ළමයි දෙදෙනා ආපසු එමින් සිටියහ.

"ඔයා එනවා දැකල කලින් කියන්නයි, මා ආපසු කාරෙක ළඟට අර බඩු ගේන්න මේ දෙන්නා පිටත් කළේ."

"හොඳයි. හොඳයි. මං කියන්නම් ආරියරත්න නිදියි කියල තාම. වයසයි නේ? විවේක ගන්නව කියල."

කර්මානුරූප හමුවීමක්

නීතා සහ ඇයගේ අක්කා චිත්‍රා දැන් අප ළඟය. මා සිනහව අමාරුවෙන් නවත්වාගෙන, හොරැහින් ඇය දෙස බැලීමි. ඊයේ රෑ මා සිහිනෙන් දුටු මගේ අනාගත සහකාරිය, මැය බවට දැන් මගේ සිතේ කිසිත් සැකයක් නැත. කර්මානුරූප හමුවීමක් සම්පූර්ණය.

මා නාලන්දාවේ තරුණ ගුරුවරයෙක් හැටියට හඳුන්වා දුන් තෙන්නකෝන් මැතිනිය, දැන් මට කතාව බාර දී හමාරය. ඔවුන් ගෙනා තෑගි බෝග ගබඩාවට බාර දීමට සැලැස්සුවෙමි.

"යන් කඳවුර බලන්න. ආපසු ආවාම, මිස්ටර් ආරියරත්න නැගිට්ටාම හමුවන්න පුලුවන් නේ."

පොඩි පිරික්සුමක්

දැන් තෙන්නකෝන් මහත්මිය හා චිත්‍රා පෙරමුණින් ද, නීතා හා මා ඊට පිටුපසින් ද, අඩි පාරවල් දිගේ මානාව ගමේ දිග ම අතුරු පාරවලින් ගම හා කඳවුර පෙන්වමින් කැඳවාගෙන ගියෙමි. ඒ අතර නීතා ගේ සිතිවිලි වගතුග සියල්ල මම දැන ගතිමි.

"නංගීගේ සම්පූර්ණ නම"

"නීතා ධම්මචාරී"

"ධම්මචාරී. ධම්මි. කොතරම් හැඩ නමක්ද?"

"කොහෙද ඉගෙන ගන්නෙ?"

"මියුසියස් විද්‍යාලයේ, කොළඹ"

"කොහෙද නැවතිල ඉන්නෙ?"

"පප්පාගේ යාලුවකුගෙ ගෙදර. සේමගේ මහත්මයගෙ ගෙදර. පප්පා බඩු ගන්නේ සේමගේ සාප්පුවෙන්."

"ඔව්. ඔව්. මං දන්නවා. සේමගේ මහත්මයා මටත් ශ්‍රමදාන වැඩට හුඟක් උදව් කරනවා."

"ඉතින්. ධම්මි මොන පන්තියෙද?"

"දහයෙ. මේ වර විභාගෙ ගන්නවා"

"විෂයයන්?"

"විද්‍යා විෂයයන්"

"ඊට පස්සේ?"

"ඊට පස්සෙ සමාජ සේවය කරනවා."

ඇය හිතුවක්කාර සිනාවක් පිට කළාය.

"සමාජ සේවේ කරන්නටත් ඉගෙන ගෙන තියෙන්ට ඕනෑ!"

"ඇයි මම ගයිඩ් කෙනෙක්. රේන්ජර් කෙනෙක්."

"ඒ මදි?"

"ඉතිරි හරිය ආරියරත්න මහත්මයගෙන් ඉගෙන ගන්න බැරිය?"

"මම කොහොම හරි ශ්‍රමදාන ව්‍යාපාරයට බැඳෙන්න ඕනෑ. අනේ මාව බාර ගනීවිද?"

දැන් මගේ හිත එක්තරා වේදනාවකින් කිති කැවේ. මේ අහිංසක ළමයා මා ගැන මෙතරම් භක්තියකින් සිටිද්දී ම, "මා" බව හෙළි කළයුතු නේද?

"නංගී, වෙන අය ගැන වගේ නෙවි ආරියරත්න මහත්මයා. ඔබ බඳවා ගැනීමට පෙර ඔබේ දෙමාපියන්ගෙන් අවසර ගන්න එපායැ?"

දැන් අපි වැව ළඟය. මේ අන්දමින් පැයකට වැඩි කාලයක් ඇවිදින ගමන් නීතා මට ගැලපේ දැයි ඇගේ සිතිවිලි පරීක්ෂා කළෙමි. ඕ සියයට සියයක් ලකුණු ගෙන සමත් වූවාය.

රහස හෙළිවේ

අබේසේකර මහතා කොහේදෝ සිට ඉදිරියට ආවේය. තෙන්නකෝන් මහත්මියත් සමඟ කතාවට වැටුණේය. ඒ අතර නීතා හා චිත්‍රා ශ්‍රමදාන

කණ්ඩායම්වලට එකතු වූහ. වැඩි වේලායත්ට පෙර ඔවුන් ආවේ ආරියරත්න මහතා සමඟ බව දෙදෙනාටම තේරුම් ගියේය.

මම හෙමිහිට වෙන කණ්ඩායමකට මාරු වී ඩී.සී. කටුගම්පල මහතා ගේ වාහනය සූදානම් කර ගත්තෙමි.

"තෙන්නකෝන් මැතිනිය හා පැමිණි මේ දෙදෙනා කාගේ කවුරුද?"

අද ම සොයා ගෙන, අද ම මානසික ව මේ ප්‍රශ්නය බරක් වෙන්ට නො දී ඔලුවෙන් ඇත්කර ගත යුතුය.

මඟුල් යෝජනාවක්

ඔවුන් ආපසු යන විට කටුගම්පල මහතා හා මම අපේ කාරෙකෙන් ඔවුන් පසුපස ගියෙමි. කාරෙක, කුලියාපිටිය නගරය මැදින් තෙන්නකෝන් වලව්වට හැරෙව්වේය. ඒ අසලම තිබූ වැටෙන් පැන නීතා හා චිත්‍රා අල්ලපු ගෙදරට යනු අපි ඈත සිට දුටිමු. ටික වේලාවකින් එතැනට ම කාරෙක ගෙන ගිය අපි දැන් තෙන්නකෝන් වලව්වේ මිදුලේය. කටුගම්පල මහතාට එතැනම ඉන්ට කියා, මම හෙමිහිට වැටෙන් පැන අල්ලපු ගෙදරට ගියෙමි. සුදු සරමක් හා සුදු මේස් බැනියමක් ඇඳගත් ඉතා සෞම්‍ය මුහුණක් තුබුණු අවුරුදු පනහක් පමණ වයසැති මහත්මයෙක් ඉස්තෝප්පුවේ සිට එළියට ආවේය. මට කොයි ලෝකයක සිට ආත්ම ශක්තියක් ආවේ දැයි නො දනිමි. මම එක පාරටම එතුමා අමතා කතා කළෙමි.

"මහත්මයාද නීතාගේ පියා?"

"ඔව්"

"මම මිනිත්තුවයි ඉන්නේ. මගේ නම ආරියරත්න. නාලන්දාවේ ගුරුවරයෙක්. ශ්‍රමදාන ව්‍යාපාරය ..."

"හා– හා– මම දන්නවා. වාඩි වෙන්න"

"නෑ. මා හදිසියෙ ආවේ. මෙන්න මගේ ලිපිනය. මම කුල මල භේද–ජාති භේද–දේශපාලක භේද–තකන්නෙ නෑ. මට ඕනෑ මා සමඟ ජීවිතයම කැප කරල, අපේ සමාජය හොඳ වෙනස් අතකට හරවන්න පුලුවන් සහකාරියක් සොයා ගන්න. මා හිතනවා ඔබේ දියණිය, නීතා මට ගැලපේ ය කියා. මා ඇය ගෙන් ඇහුවෙ නෑ. ඔබතුමා මා ගැන සොයා කැමැති නම්, කැමති දිනක මට දන්වන්න. දැන් මගේ හිත නිදහස්! මා යනවා."

මම පස්ස නො බලාම, තුෂ්ණිම්භූතව ගල් රුවක් මෙන් නැගිට සිටි, කුලියාපිටියේ චිත්‍රා ඡායාරූප ශාලාව හිමි හේමපාල ඇල්පිටි

ආරච්චි මහත්මාට ආචාර කොට, වැටෙන් පැන කාරෙක දෙසට ඉක්මන් ගියෙමි.

ලින්ක් - පුරුක

කටුගම්පල මහතා හිනැහෙමින් කාරෙකෙන් බසිනු දුටු මම, පස්ස හැරී බැලීමි. මා දුටුවේ මා පිටුපසින් දුව ගෙන එන නීතා හා චිත්‍රාය. මම තවත් ඉක්මණින් කාරෙක දෙසට ගොස් ඉක්මණින් යැමට කටුගම්පල මහතාට කී නමුත්, ඔහු සිගරැට්ටුවක් පත්තු කරමින් "මොකද ඔච්චර හදිසි?" කියා ඇසීය.

මම කාරෙක තුළ තිබුණු ඉන්දීය සඟරා දෙකක් වූ කුරුක්ෂෙත්‍ර "Kurukshetra" සහ ලින්ක් "Link" යන සඟරා දෙක අතට ගතිමි. ඉන් එකක් චිත්‍රාට දුනිමි. "Link" සඟරාව නීතා අතට දෙමින් "ඔය වචනය මතක තබා ගන්න" යැයි පැවසීමි. "මා ආවේ ඔබේ පියාට පණිවිඩයක් කියන්න"යයි පවසා, කටුගම්පල මහතා ද පොළඹවාගෙන සැහැල්ලු සිතින් මානාවට නැවත ගියෙමු.

තේ පැන් සංග්‍රහයක්

පසුව දා බලාපොරොත්තු නොවූ දෙයක් සිදු විය. කුලියාපිටියේ චිත්‍රා ඡායාරූප ශාලාව හිමි ඇල්පිටි ආරච්චිගේ හේමපාල මහත්මාගෙන් මට ලිපියක් ලැබුණේය. ඒ ලිපියේ සඳහන් වූයේ කඳවුර නිම කොට යන අතර මඟ, ඔවුන්ගේ ගෙදරට ගොඩ වී තේ පානය කොට යන හැටියටය. මුලු පිරිස කී දෙනෙක් දැයි දන්වන හැටියට ද මතක් කර තිබුණේය. අබේසේකර මහතා හා සාකච්ඡා කළ මම, එම ඇරයුම පිළිගෙන, ස්තුති කොට, පිළිතුරක් ඒ ලිපිය ගෙනා අය අතම යැවීමි.

මා දුටු සිහිනය, හේමපාල මහතා හා මා කතා කළ වචන කිහිපය සහ මා නීතා අත තැබූ "Link" සඟරාව පිටුපස තිබෙන සියලු දේ ක්‍රියාත්මක වන බව මට හැඟිණි. කලක් හිස්ව තිබූ මගේ හදවතේ නැවත ආදරයේ බීජය හැඟීම්වලට වහල් නොවී, කර්මානුරූපයට වඩා විඥාත්මකව රෝපණය වන බව මට හැඟිණි.

කටුගම්පල මහතා හා අබේසේකර මහතා හැර, කිසිවෙක් මේ පිළිබඳව දැන සිටියේ නැත. එහෙත් කුමන හෝ කාරණයක් නිසා අබේසේකර මහතා මේ සම්බන්ධ ව එතරම් කැමැත්තක් නොමැති බව මට හැඟිණ. කෙසේ හෝ අපි ආපසු යන ගමනේ නීතාගේ නිවසට ගොස් මැලිබන් විස්කෝතු හා චීස් කා තේ පානය කොට ගියෙමු. එදින ගත් පින්තූරයක් ළඟක් වනතුරු මා ළඟ තිබුණේය. වෛද්‍ය ශිෂ්‍යයෙක්

ඡායාරූප : 165
හේමපාල
ඇල්පිටිආරච්චි
මහතා හා ජේන්
රත්නායක
මහත්මිය

වූ මහින්ද ජයසිංහ, නාලන්දා ශිෂ්‍යයන් වූ සුනිල් වික්‍රමතුංග, සරත් මුණසිංහ, කුලතුංග උලුවිට, ගාමිණී කටුගම්පල, ඩෝල්ටන් වක්වැල්ල, ජී. ජී. තුරුසිංහ, උපාලි තෙලිසිංහ, ලයනල් වීරකොන්, ජයවික්‍රම පෙරේරා, ආනන්ද වීරසේකර, පාලිත පෙරේරා ආදීන් අප මේ ගෙදරට විශේෂයෙන් පැමිණීම ගැන සැකයක් පහළ කරගත් බව ඔවුන්ගේ මුහුණු වලින් පෙනිණි. නීතා මා කෙරෙහි දැක් වූ විශේෂ සැලකිල්ල ද, මොවුන්ගේ සැකයට භාජනය විය. පාසල් ආරම්භ කිරීමට පෙර දින ළමයින් නේවාසිකාගාරයට ගෙන එන විට, මා බැලීමට එන බව හේමපාල මහතා මා හා පැවසීය.

නීතාගේ පියාගේ නම ඇල්පිටි ආරච්චිගේ හේමපාලය. මවගේ නම රත්නායක මුදියන්සේලාගේ ජේන් රත්නායකය. මවගේ පියා, ආතා, රත්නායක මුදියන්සේලාගේ ටිකිරි බණ්ඩා රත්නායක වූ අතර, මව ජයසුන්දර මුදියන්සේලාගේ රන්මැණිකා ජයසුන්දරයි. නීතාගේ පවුලේ සියලු දරුවෝ ගැහැනු ළමයින් වූ අතර, වැඩිමලා චිත්‍රා අයිරාංගනීය. නීතා ධම්මචාරී දෙවැනියා වූ අතර, විනීතා රත්නාවලී, සුවිනීතා පද්මිණී, වජිරා ප්‍රියංගනී බාල නංගිලා විය.

දෙල්ගහ යට ගෙදර දී

ආපසු දෙල්ගහ යට ගෙදරට ගිය මම, එදා සිටම මේ අමුත්තන් එන බලාපොරොත්තුවෙන් අපේ තනිකඩ නිවහන පිළිවෙළකට සකස් කර තැබුවෙමි. ඔහුගේ වචනය පරිදි, හේමපාල මහතාත්, ඔහුගේ බිරිඳ ජේන් රත්නායක මහත්මියත්, චිත්‍රා, නීතා, වීනිතා, සුවිනීතා හා වජිරා යන දියණියන් පස් දෙනාත් මරදානේ අපේ නිවසට පැමිණියහ.

ඡායාරූප: 166 නීතා ගේ සොයුරියන් සමග
චිත්‍රා, නීතා, වජිරා, විනීතා හා සුවිනීතා

නීතාගේ දුර්වල විෂයයන් කියා දෙන්නට යැයි එදා ඉල්ලීමක්ද කෙරිණි. එහෙත් යම් ස්ථිර අනාගත වැඩ පිළිවෙලක් ගැන කතා කිරීමට තරම් අපි කුලුපග නො වීමු. නීතා තනිව හමු වී කතා කිරීමට ද අවස්ථාවක් නොවී ය.

හාදකම වැඩේ

අග්‍ර ශ්‍රාවක ධාතු ප්‍රදර්ශනයක් මේ දිනවල මාලිගාකන්දේ මහාබෝධි මන්දිරයේ පැවැත්විණි. ආනන්ද සේමගේ මහතාගේ රියෙන් ඔහුගේ දියණිය චන්ද්‍රා හා පැමිණි නීතා එහි දී මට නැවත මුණ ගැසිණි. කාටත් හොරා ඇය එම අවස්ථාව ප්‍රයෝජනයට ගෙන, ඒ නුදුරුවම තුබුණු අපේ නිවසට පැමිණියාය. පැයක් පමණ තනිව කතා කරමින් සිටීමට ලත් අවස්ථාවේ දී, දෙමාපියන්ගේ විරුද්ධත්වයක් නොමැති නම්, මා හා විවාහ වීමට කැමැති බව ඕ ප්‍රකාශ කළාය. එවිට පළමුවන දිනයේ ම මම පියාට පළ කළ අදහස ඇයට දැන්වීමි. එදා අප දෙදෙනා අතර ස්ථිර තීරණයක් ඇති වූ බව මගේ මතකයයි.

ඡායාරූප : 167
නීතාගේ පවුලේ අය සමග පේරාදෙණිය මල් වත්තේ දී

මියුසියස් විදුහලට දිනපතා ම වාගේ ගොස් හමු වී පොත පත කියාදීම, සේමගේ මහතාගේ ගෙදර දී හමුවීම, මා අසනීපයෙන් සිටින විට දිනපතා වාගේ පැමිණ දුක සැප සොයා සත්කාර කිරීම, කුලියාපිටියේ නිවසට නිවාඩු කාලවලදී මා නිතර ගොස් කාලය ගත කිරීම, බොහෝ විට නිවාඩු කාලවල ඔවුන්ගේ ෆෝඩ් කොන්සල් රියේ රියැදුරු මෙන් වන්දනා ගමන්වල යෑම ආදී ආශ්‍රයෙන් මාස කිහිපයක්ම අපි එකිනෙකා හොඳින් හඳුනා ගතිමු.

ඡායාරූප : 168
වෛද්‍ය එන්. එම්. පී. මැන්දිස් මහතා

වරක් මාතාවේ පැවැති කඳවුරකදී මා අසනීප විය. ඔවුන්ගේ ගෙදරට වූත් කාමරයේ සිටිය දී වෛද්‍ය එන්. එම්. පී. මැන්දිස් මහතා හා මැතිනිය පැමිණ මා පරීක්ෂා කොට, ඒ පැපොල් රෝගය බව හඳුනා ගත්තේය. එවේලේම ගාල්ලේ උණවටුනේ ගෙදරට යා යුතු යැයි මා තීරණය කළෙන් - හේමපාල මහතා වහාම, ඔහුගේ රියෙන් අබේසේකර මහතා සමඟ මා පිටත් කර හැරියේය. නීතාගෙන් ඈත් වී උණවටුන ගෙදර සිටිය දී, මා නීතාට යැවූ - කිවු ලිපියකින් ඒ කාලයේ මගේ හැඟීම් හා අදහස් ප්‍රකාශ වේ.

ඡායාරූප : 169
මාතාව කඳවුරේදී විනෝබා භාවේ ගීතය ප්‍රබන්ධ කළ නාලන්දා ආදි ශිෂ්‍ය ආචාර්ය ගාමිණී අබේසේකර මහතා සහ ඔහුගේ මැතිනිය නීතා සමඟ

49

මෝරන පෙම් දමක්

මෙකල සමාජය

උපන් වැරැද්දෙන් මිනිසුන් සමාජයේ
උසස් පහත් යැයි යනුවෙන් හඳුන්වමින්
දහස් ගණන් අවුරුදු ලක් දෙසේහී
වුනේ මහත් වූ අපරාදයෙක් මැ යි

කුලෙන් උදුම්මා ගත් සිත් සතන් හී
සැඩොල් කියාලා නම් ලත් දිළින්දෝ
දහස් ගණන් පැගී මේ සමාජයේ
අදත් සිටිත් කොන් වී බෝ තැනෙක් හි

"ඔහු" ඔහුට පෙනුණ හැටි

දුගී ජනතාවගේ සේවය පිණිස දිවි කැප කර සදා
හැරී යව්වන දිවියෙ සැප සම්පත් සියල් දිළිඳකු ලෙදා
අනාගතයක් අතැර මුළු වැර අනුන් යහපත වෙත යොදා
ගියා තරුණෙක් සැඩොල් පැල්පත් සොයා මෙත් පෙරටුව එදා

අතීතය නම් සිතේ නැත නැදෑ හිතැතියන් වෙතින් වෙන් විය
දෙමාපිය ගේ දොර ද ගම් රට සියලු දෙය ඔහු හට එපා විය
විවාහය දන රුස් කැරුම කිත් පැසැසුම් ද ඔහුගෙන් තුරන් විය
මහා සටනක කුලය වැනැසුමෙ හෙතෙම දිවි දුන් සෙනෙවියෙක් විය

බඩට අහරක් නැති ව අඩ නිරුවතින් හිඟමන් සොය සොයා
යනෙන මහමඟ තිරිසනුන් මෙන් අදෝනා කව් කිය කියා
තරුණ බවලත් දිළිඳු එ සැඩොල් දනන් නහවා ගනු නියා
සිහින දකිමින් තරුණ දිවියක් දිනෙන් දින වයසට ගියා

කලට සරිලන ඇඳුම් පැළඳුම් වලින් සරසා ගන්න කුණු ගත
කයට සැප දෙන අහර මත්පැන දිවට රසදෙන සිතට වෙරි මත
යසට කම්ලොව පිහිනවන රාගයෙන් මත් කොට කොළඹ හත කත
ඔහුට නො රිසිය ඔහුගෙ හදවතෙ මේවාට කිසිවිට ඉඩක් නැත

කොමළ ගමනින් බඳ සලාගෙන දෙනෙත විනිවිද බලන බැල්මෙන්
හසළ තරුණන් රඳන කිංකිණි කතාවෙන් සිත කරන කුල්මත්
අසල නිරතුරු හැසුරුණත් ගැහැනියක් කිසිදා වේ ය යහපත්
එකල ඔහු නො සිතුවේ පිළිකුල් කළ නිසා තරුණියන් කවදත්

ඔහුට "ඇය" පෙනුණු හැටි

දහස් ඇසින් සක් දෙවිඳා මෙ ලෝකේ
බලත් දුටින් මා තනිවී සිටින්නේ
සුරංගනාවන් කැඳවා තුසීතේ
දිවැස් යොදාලා බලනුයි අණක් දුන්

එයින් රුවැත් සත් ගුණවත් පිනැත්තියක්
පෙරත් බවේ දී තම පෙම් රදාණන්
දුකින් තනී වූ දිවියක් ගෙවන්නේ
තවත් බලා ඉන්නෙ නෑ මම් කියාලා

වරම් අරන් සක් දෙව් හා සබාවෙන්
අවුත් මිනිස් ලෝකේ මේ දුකින් යුත්
මගේ සුරංගී මෙත් සිත් දයාවෙන්
තිදස් පුරක් ලෙස් සැරසී ම'ජීවේ

මගේ සිතේ නෑ සංකා කිසිත් දැන්
ඇගේ පරාණේ මා හා එකක් වී
විනෝදයේ පාවෙන්නේ බොහෝ සේ
මෙ ලෝකයේ දුක් නැහැ දැන් කිසිත් නෑ

වණන්න බෑ ඇ සකලංක පූරිතයි
තිලෝකයේ වූ අකලංක නාරී
ප්‍රේමේ ප්‍රදීපේ වී ධම්මචාරී
මාගේ ම වේවා සංසාරචාරී!

ලිපියක්

තම දුක සැප මෙන් මැ – අනුන් දුක සැප ද එක සේ දැකැ
මෙ දිවි මෙ සසර තුළින් – මා හා සමසේ බෙදා ගත්

පරහට සේවාව – දිවියෙහි අරමුණැයි දත්

ඈත අතීතයෙ පෙර දිග සිටි — වීර
සීතා – විසාකා – මව් ගණයට — බාර

නීතාවති ඔබට – උතුම් තෙ සරණ සරණයි

ගත සහමුලින් දුබල ව සිත — මළානික
වී වේදනාවෙන් පෙළෙමින් විඳිමි — දුක
ජීවත් වීම මරණය වැනි — වෙලාවක
සරසවිය වත් වේවා මගෙ — සහායක

සත් වසකට උඩ දි මගෙ බල කොටුව — ලෙද
හැම සටනක් ම ගෙන ගිය ජය කෙහෙළි — බැඳ
දැන් අබලන් ව ඇති අව් වැසි පිනි ද — වැද
අප නිවසේ ඇඳක උඩුකුරු වීමි — අද

අතරක් නොහැර සිරුරෙහි බුරා බුරා	නැග
ආ පොඩි සොල්දාදුවන්ගේ රුදුරු	කග
දුනු හී පහර විදිනෙමි ඉවසුමෙහි	අග
පියවර තෙක් ආමි දැක ජීවිතයෙ	වග
එදා මානාවෙ ඉකිනියගේ	ගෙදර
ඇදේ උණ සැදී එකතැන් වූ	අතර
ලෙඩේ මෙය යි දැන ගති නම් ඔබෙ	ගෙදර
කොහෝමවත් නො ම යමි රෝ බිය	පතුර
පිහිටක් කිසිදු නො මැති ව රෝගයේ	නියා
මෙය යැයි දැන සිටින විට ඔබ පිනැති	පියා
මා වෙනුවෙන් කිසිදු බිය සැක නොවී	දයා
වෙන් සැලකුවා මට සැනැසිලි වදන්	කියා
දම්මි ජීවිතයෙ සැටි මෙහෙමයි	සසර
දුක සැප දෙක ම පෙරළෙයි මිනිසා	අතර
නොමැකෙන පෙම් දමින් පදවන දිවි	යතුර
තරණය කරයි සැපසේ ජීවිත	කතර
එළිවන විට නාමි හය සැරයක්	විතර
හොඳ හැටි බුදිමි නැදි මව් දෙන රස	අහර
ගෙදරින් පිටත තවමත් නොගියෙමි	බැහැර
මෙහෙමයි ජීවිතය මගෙ ගත වන	අයුර
චිත්‍රා විනීතා සුවිනීතා	නැගණී
වජිරා බිළිඳු සුරතල් සැම ගුණ	ගිහිණී
මව් පිය දෙදෙන හා සිහි කරමින්	පෙමිනී
නිදුකින් සැම බෙජේවා තෙ සරණ	බෙලෙනී

දවසක් දා

දවසක් ශ්‍රමදාන යව්වන	සේනාවේ
බල ඇණියක් බැඳන් කඳවුරු	මානාවේ
දහඩිය හෙළන විට සිදු කරමින්	සේවේ
නීතා කුමරියන් මගෙ දිවියට	ආවේ
මගෙ හද මැදුර මොහොතින්	ඒකා–ලෝක
විය නව පණක් ලැබ සුන් විය	සැම සෝක
පිළිගෙන ඔබත් ජීවිතයත්	ලව්කීක
සිතුවෙමි එකතු වන ලෙස	යම්කිසි දාක
දයිවය කියා ලොව බලවේගයක්	ඇතී
බැව් වී පසක් අපගේ දිවි එකට	ගෙතී
දම්මී–රුවන් දෙදෙනා සේවය	නැමැති
දෙව් රුක හට ගැනුණු රන් පල දෙකක්	වෙතී
පියකරු සිනහ රැල්ලෙන් සැරසුණු	මූණ
නිකැලැල් බව දෙනෙත් මිණි කැල්මෙන්	පේන
දම් සැරි මගේ ජීවිතයේ මිණි	පාන
පතුරයි කැලුම් මගෙ දිවි මොහොතක්	ගාන

මහබෝධියේ අගසව් දා වඩින අටී
යෙන් නවරත්නයන් හා ගොස් ඔබ ව දිටී
පැන යනු නො හැකි ලෙස පෙම් දැල හොඳට වැටී
මතක ද සුදෝ අප පෙම් ජප කරපු හැටී

අසනීපයෙනි එන්නට නො හැකි යැයි කියා
හසුනක් යැව් විට දී ළැම ගිනි අරන් ඔයා
අඳුරේ ලෙඩ ඇඳට වුත් මා දකින නියා
මතක ද ලෙඩා හොඳ වී ඔබ කැටුව ගියා

හොර බළලකු වගේ පාසල් ආලින්දේ
තව ඉවසනු නො හී පෙම පළ කළ සන්දේ
තත්පර තිහක් ගතවනු තුරු අර ඇන්දේ
බොරුවට තේ ද හද අම රස නෙද වින්දේ?

නැහැ බැහැ වැරදීමකින් එ පැනය ඇසුවේ
මට සමු දෙන්න ඉදිරියෙ අප නොම හමුවේ
යනුවෙන් මා පැවැසූ විට ඔබ ඉකි ගැසුවේ
ඇයි? ප්‍රේමයෙ රහස කවදා මුත් එළිවේ

හසුන් පිට හසුන් එවමින් ඒ පැත්තේ
එන්නට කියා කීමට බෝ දේ ඇත්තේ
ගිය විට නිහඬ වී හිනැහෙන්නට ගත්තේ
මට වද දෙන්න බව හැම විට දිම දත්තේ

පළමු මානාවේ කඳවුර වෙලාවේ
පැදුරක් දමා අසලින් කඩතුරාවේ
ඇසිපිය නො හෙළ මා දෙස කල්පනාවේ
බලමින් සිටිය හැටි මතක ද හිනාවේ

භාරත යන්ට පෙර සති අන්තයක් පුරා
පෝසිත වී දයාවෙන් පෙම් දහම් පුරා
යාමට පිටත් වී උණුසුම් කඳුළු පෙරා
මා සමුගත් විලස මතක ද ස–දම් සරා

සුපෙම්වත් මගේ නීතා දම් සැරිනී
ඔබ මාගේය මා ඔබගෙය දිවි හිමිනී
ඒ ආදරය ඇති තෙක් ජීවිතය ගෙනී
යම් නැති දාට ලොවැ හැර යම් තිර පෙමිනී

ඔයබඩ දී

සොබා දහමේ සිරිය රජවෙයි මුළු ලොව ම දැන් නිසංසල වේ
ගලා යයි ඔය නගා දිය සුළි වටපිට ම සිසිලසින් නැහැ වේ
සදා කාලික මිහිර දුන් දින රදාණන් සමුදුරට බර වේ
දයාවත් පෙම් වතුන් හට මොහොතකට ලෝකය මතක නැති වේ

හමා එන මඳ මාරුතය ගහ දෙපස ඇති බට පඳුර සොළවයි
සැඳෑ කල බව දැනී පොල්කිච්චියක් තුබ කුස වෙතට ඉගිලෙයි
පැහී ගෙන එන වී කරල් යුගලයක් එකිනෙක වෙතට ඇලවෙයි
අනාගතයක මිහිර සොයමින් පෙම්වතුන් අත් ගෙල වටා යයි

ලෝකය ම සුන්දරයි මිහිරියි පියකරුයි අති අලංකාරයි
ආදරය රජ කරයි ගුණ දම්වලින් මිනිසත් බව ම සාරයි
ප්‍රේමයෙන් හද කැකුළු ටික ටික සුවඳ දී හොඳ හැටි ම මෝරයි
වේගයෙන් ළා දෙතොල් පෙති එකිනෙකට ආලයෙ රසය බාරයි

ඔහුගෙ නිල්වන් දෙනෙත රළු සුපුළුල් දෙබැමකින් රැකුණු පැහැදිලි
කිසිදු සෙලවීමක් නැති ව බැස යන දිනිඳු වෙත රැඳෙයි නො පැකිලි
ඇයගෙ වත සිය ළමැද මත ඇත වමත පිරිමැදි සිනිඳු කෙස් රැළි
ආලයේ උණුසුමින් අග මෙහෙසියකි ඕ බට ලොවට කල එළි

පෙම් ලොවේ අග රැජින ලෙස රන් ඔටුනු පළඳාගෙන මෙදා
නත් වැදෑරුම් පෙම් කුසුම් පෙම් අග රදාණන් වෙත පුදා
සැහැල්ලුයි එපුළුන් රොදක් මෙන් ඇගේ සිත ළාමක සදා
සක් රදුන් දෙවි - සබාවත් රැක දේය මෙ යුවල කල් සදා

50

අපේ විවාහය සිදු වූ හැටි

දැන් අප දෙදෙනාගේ සම්බන්ධය ගැන අබේසේකර මහතා වෙතින් තව කීප දෙනෙක් දැනගෙන සිටින බව මට අවබෝධ විය. ඒ නිසා දිනක් මානාව–කනතොලුව යන අතරමඟ කරුණානන්ද මහතා කැටුව ගොස්, හේමපාල මහතා හා නීතාගේ පවුලේ අය හඳුන්වා දුනිමි. කරුණානන්ද මහතාට සියලුම සත්‍යය කියා, ආශීර්වාද ලබා ගතිමි. තලවකැලේ සිටි මගේ සුළු පියතුමන් වූ ඒ.ටී.සී. ජිනදාසයන්ට ද දන්වා ආශිර්වාද ලබා ගතිමි. මගේ පියා හා මව ද නීතා දුටු වහාම, ඔවුන්ගේ කැමැත්ත දුන්හ.

අප දෙදෙනාගේ විවාහයට එක් බාධාවක් විය. මගේ අදහස වූයේ ඉන්දියාවේ ගාන්ධි ග්‍රාමවලට නීතා යවා පුහුණුවක් ලබා දී, ඊට පසු විවාහ වී, අපේ ව්‍යාපාරය ගොඩනැංවීමය. එහෙත් දෛවය ඊට ඉඩ නුදුන්නේ ය. මේ නිසා නීතාගේ මවගේ බලවත් අකැමැත්ත මධ්‍යයේ අපේ විවාහය ලියාපදිංචි කිරීමට පමණක් ඔවුහු එකඟ වූහ. පසුව උත්සවයක් ගෙන කැන්දාගෙන ඒමට ද තීරණය විය.

විවාහ උළෙලක්

ඒ 1960 ජූලි මාසයේ 25 දාය. පුංචි අක්කා ලලනා ලවා, නීතාට උවමනා සියලුම ඇඳුම් මස්සවා ගතිමි. ගෙදරට තරුණ යුවලකට අවශ්‍ය බඩු මුට්ටුද හෙමින් එක්තැන් කර ගතිමි. ගෙදර අයවලුන්ට පමණක් දැන්වීමි. ඉතාමත් හිතවත් කීප දෙනෙකුට වාචිකව ඇරයුම් කළෙමි.

වයසින් විශාල පරතරයක් තිබුණත්, නාලන්දා විදුහල්පති ඇම්. ඩබ්ලිව්. කරුණානන්ද මහතා හා මා අතරේ තිබුණේ ඉතා කුලුපග සංසාරික මිත්‍රත්වයකි. මා එතුමාගෙන් කිසිවක් සැඟවූයේ නැත. ඒ කාලයේ පාසල් ඇරී ආපසු ගෙදර යන ගමන්, කරුණානන්ද මහතා සතියකට වරක් හෝ දෙවරක් අපේ ගෙදරට එයි. ස්වභාෂා ප්‍රකාශකයෝ පොත්හල පිහිටියේ මාලිගාකන්ද පාරේ අපේ නිවසට නුදුරින්ය. නිතරම එතුමාගේ පත පොත මුද්‍රණ කටයුතු සඳහා, එතැනට කරුණානන්ද



ඡායාරූප: 170
කරුණානන්ද
මහතා අපේ
විවාහයට
අත්සන් තබයි

මහතා එයි. මේ නිසා මා පාසල් ඇරී ගෙදර ආපසු කොයි මොහොතේ හෝ කරුණානන්ද මහතා ඒය යන බලාපොරොත්තුවෙන් සිටීම මගේ පුරුද්දක් විය.

මා විවාහ වීමට පෙර සතියේ, කරුණානන්ද මහතා එන විට– මාත්, මල්ලීත් ගෙදර වෙනත් අයවලුනුත් හුණු ගාමින්, සායම් ගාමින්, ගෙදර ලස්සන කරමින් සිටියෙමු. සුපුරුදු ලෙස ඇස් දෙක උඩ යවා, දෑත පසුපසට යවා ටිකක් නැමී සිනහ වූ කරුණානන්ද මහතා,

"මේ මොකද උත්සවයකට වගේ?" යැයි ඇසීය.

"ලබන සතියේ මඟුල් ගෙයක්. ඒකට සූදානම් වෙනවා සර්" යයි මම පිළිතුරු දීමි.

"Don't tell me it is you." "ඒ ඔබය කියා මට කියන්ට එපා" යැයි පුදුමයෙන් මෙන් එතුමා පැවැසී ය.

"ඔව්. මා තව දින කීපයකින් විවාහ වෙනවා. (1960) ජූලි 25 දා. සර් අත්සන් කරන්ට බොරැල්ල YMBA එකට දවල් 2 ට එන්ට ඕනෑ. මම අද හෙට දන්වන්ටයි සිටියේ" යයි මම තවදුරටත් ප්‍රකාශ කළෙමි.

1960 ජූලි 25 දා දිනයත් වෙනදා දිනයක් මෙන්ම විය. ඊට පෙරදා පැමිණ, නීතා – අපේ අක්කලාත් සමඟ අපේ ගෙදරම සිටියාය. නීතාගේ දෙමාපියන්ට දවල් 1.30 ට පමණ ඒමට දන්වා තිබුණේය. මම සුදු සරමක් හා බැනියමක් සූදානම් කර තබා වෙනදා මෙන්ම පාසලට ගියෙමි.

එදා උදේ පාසලේ මා සිටිනු දුටු කරුණානන්ද මහතා, මට අඬ ගැසුවේය. එදා "පාසල් ආවේ ඇයිදැ" යි අසා "දැන්වත් අන් ගුරුවරුන්ට

දැනුම් දීම හොඳ නේදැ" යි මට අවවාද කළේය. ඒ අදහසට කීකරු වූ මම පාසලේ පන්තියෙන් පන්තියට ගොස් ගුරුවරුන් හමුව මා එදා විවාහ වන බවත්, ඉඩ ඇතොත් සවසට අපේ ගෙදර පැත්තේ එන ලෙසත් ඔවුන්ට ඇරයුම් කළෙමි. සමහරු එය විහිලුවකට ගත්හ. සමහරු මා නැවත නැවතත් කියන විට විශ්වාස කළහ. දෙනියායේ ටයිටස් රත්නායක මහතා එවා තිබුණු තේ රාත්තලක් ප්‍රයෝජනයට ගෙන සීනි රාත්තල් කීපයක් මිලයට ගෙන තේ කෝප්පයක් හා ආදරය පමණක් ඔවුනට මා පිරිනමන නිසා තෑගි බෝග නො ගෙනෙන ලෙස මම ඔවුන්ට දැනුම් දුනිමි.

ඡායාරූප: 171
1960 ජූලි 25 දා බොරැල්ල තරුණ බෞද්ධ සමිති කාර්යාලයේ දී. පිටු පසින් සිටින්නේ මගේ පියාය.



ඡායාරූප: 172
විවාහයෙන් පසු ගත් ඡායාරූපය

එදා දවසම සුපුරුදු පස්වරු 1.20 වන තුරු පාසලේ සේවය කළ මම, ටැක්සියක් ගෙන වහාම ගෙදරට ගියෙමි. දිවා ආහාරය ගෙන තවත් ටැක්සි දෙකකින් බොරැල්ලේ **YMBA** ශාලාවට තාත්තා, අම්මා, අක්කලා, නංගිලා ආදී පවුලේ කීප දෙනෙක් සමඟ ගියෙමි. නීතා ඇයගේ දෙමාපියන්ගේ කාරෙකෙන් පිටත් කළෙමි.

කරුණානන්ද මැතිතුමා හා ස්ටැන්ලි ප්‍රනාන්දු මහතා විවාහයට අත්සන් තැබූහ. විවාහ රිජිස්ට්‍රාර් පණ්ඩිත ජී.පී. කාරියවසම් මහතා ලස්සන කතාවක් කොට, අපට

ආශිර්වාද කළේය. මගේ කුලුපග මිතුරන් වූ ධර්මසේන සේනානායක, කමල් දිසානායක, ඇම්. ඒ. තිලකරත්න, ධර්මා ගුණසිංහ ආදී ගුරු මහත්වරු පැමිණ සිටියහ. නීතාගේ පියාම පින්තූර කීපයක් ගත්තේය. ඒවා දැන් කොහේදැයි නොදනිමි. එහෙත් මගේම කැමරාවෙන් සෙල්ෆ්ටයිමර් එක දමා එදා දෙල්ගහයට ගෙදර දී ගත් පින්තූරයක් තාම තිබේ.


නියම බෞද්ධ ගෙදර
නොවරදින දෙව්වලාව

සම්පාදක :-
බම්බලපිටියේ වජිරාරාමවාසී
මඩිහේ පඤ්ඤාසීහ මහානායක
ස්ථවිරයන් වහන්සේ

ප්‍රකාශක :-
ගාල්ලේ
ඩී. එන්. පෙරේරා දෙස්තර මහතා

2503
1959 10. 24

CONVENER

ඡායාරූප: 173
අප විවාහ වූ දා මඩිහේ මහනාහිමියන් තෑගි දුන් පොත

වජිරාරාමයේ පින්කමක්

එතැන සිට අප දෙදෙනා ගියේ ධර්මසේන සේනානායක මහතාගේ ෆර්ජෝ කාරෙකෙන් කෙලින්ම වජිරාරාමයටය. ඊට කලින් දා මල් පහන් ටිකක් සූදානම් කරගෙන, වජිරාරාමයට පැමිණෙන ලෙස මගේ ශිෂ්‍යයන් කීප දෙනකුට දන්වා තිබුණෙන්, ඔවුහු ඒ සියල්ල සූදානම් කර ගෙන පැමිණ සිටියහ. එහෙත් කුමකටදැ' යි ඔවුන් දැන සිටියේ නැත.

අතිගරු මඩිහේ පඤ්ඤාසීහ මහ නාහිමියන්, නාරද නාහිමිපාණන් වහන්සේ ඇතුලු සංඝයා වහන්සේලා අප පන්සිල්හි පිහිටුවා තෙරුවන්

ඡායාරූප: 174
විවාහ වී අවුරුදු හතළිහක් පිරුණු 2000 ජුලි 25 දා මඩිහේ මහානායක හිමියන් තෑගි කළ පොත රැගෙන ගොස් උන් වහන්සේ බැහැ දැක්ක අවස්ථාව

වන්දවා මල් පහන් පුදවා, පිරිත් කියා ආශිර්වාද කළ සේක. උන් වහන්සේලාත්, අප විවාහ වන බව දැන ගත්තේ ඒ අවස්ථාවේය. එදා අති පූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහ නා හිමියන් දුන් අවවාදයක් අද මෙන් මට මතකය:

අවවාද දෙකක්

'එකට ජීවත් වන විට තරහ යන්ට ඉඩ තිබෙනවා. එහෙත් වරකට තරහ යා යුත්තේ එක්කෙනාටයි. අනිත් එක්කෙනා ඒ වෙලාවට ඉවසිය යුතුය.' මේ පළමුවැනි අවවාදයයි. දෙවැනි අවවාදය නම්, අන්‍යොන්‍ය විශ්වාසය ගැනයි. 'තම සැමියා හෝ බිරිඳ හෝ සැක කටයුතු විදියකට හැසිරෙනවා ඇසුවොත් – දුටුවහොත්, ඔහු හෝ ඇය හෝ විශ්වාස කරනු මිස, තමන්ගේ ඇස් දෙක හෝ කන් දෙක හෝ විශ්වාස කරන්ට එපා. ඒ තරම් දුරට උනුනුන් කෙරෙහි විශ්වාසය තිබිය යුතුය.'

ආදර්ශවත් බිරියක්

ඒ එම අවවාදයේ හරයයි. මේ අවවාද දෙකම මට වඩා හොඳට නීතා පිළිපැද්ද නිසා, අප දෙදෙනාත් – දරුවන් හයදෙනාත් අද මිහිපිට ජීවත් වන ඉතාම වාසනාවන්ත සතුටට හිමිකම් කියන පවුලක් විය.

මාගේ ගති ස්වභාවය හොඳින් දැන සිටි ඇය, ඒවා ඉවසා දරාගෙන, මා නිතරම යහ මගට හැරවූයේ වචනයක්වත් කතා නො කර, යහපත් චර්යාවෙනි. පවුල් නරකාදි බවට පත් කර ගන්නා අඹුවනට නීතා ශ්‍රේෂ්ඨ ආදර්ශයකි.

එදා අතිගරු මඩිහේ පඤ්ඤාසීහ මහා නාහිමියෝ අප දෙදෙනාට 'නියම බෞද්ධ ගෙදර – නොවරදින දෙව්ලොව' යන උන් වහන්සේ ලියා පළ කරන ලද කුඩා පොතක් අපට පරිත්‍යාග කළ සේක. ඒ පොත නීතා අදත් පරෙස්සම් කරගෙන තිබේ. අප විවාහ වී අවුරුදු 40 ක් සම්පූර්ණ වූ 2000 ජූලි 25 දා අපි මහරගම ශ්‍රී වජිරඥාණ ධර්මායතනයට ගොස් උන් වහන්සේගෙන් නැවත ආශිර්වාද ලබා ගතිමු.

* *

අප ගෙදර එන විට සවස හතරට පමණ ඇත. දෙකත් – හතරත් අතරේ දෙල්ගහයට ගෙදර නොසිතූ පරිවර්තනයක් සිදුවී තිබිණි. මෙයට වගකිය යුත්තේ මගේ මල්ලී වීරේය. වීරේ අප ගිය පසු ගෙදර සරසවා, ඇතුල් වන තැන මල් වෙඩිල්ලක් පවා සවිකර තිබුණේ ය. නිව් සිටි ස්ටෝර්ස් හිමි පී. ඊ. පෙරේරා මහතාගේ මැතිනිය, විශේෂයෙන්



ඡායාරූපː 175
නවදිල්ලි අන්තර් ජාතික ජාත්‍යන්තර චිත්‍රපට උළෙලේ සම්මාන දිනූ
ගම්පෙරළිය (1964) චිත්‍රපටයේ
රූප රාමුවක ගාමිණී ෆොන්සේකා රංගන ශිල්පියා (වම් කෙළවරේ)

මඟුල් කේක් සාදවා, බීම ජාති ගෙන්වා ලොකු සාදයක් සූදානම් කර තිබුණේය. බේක් හවුස් ආයතනයෙන් රු. 42.00 ක් වියදම් කොට, වීරේ පැටිස් සහ වෙනත් අතුරුපස ද ගෙනැවිත් තිබුණේය. පාසලේ මිතුරන් රැසකුත්, සොමී මීගම මැතිනිය, ප්‍රකට චිත්‍රපට නලුවන් වන ගාමිණී ෆොන්සේකා මහතා හා ආතර් වැන්ලැන්බර්ග් මහතා, පාසලේ ගුරු සිසුන් රැසක් ද කට වචනයට ආරාධිත වී පැමිණ සිටියහ.

මේ කාලය වනවිට මගේ හිත මිතුරු අබේසේකර මහතා, මගෙන් ඈත්වී මාස කීපයකි. එහෙත් මගේ යුතුකමක් වශයෙන් එතුමාට මම විවාහ වන බව දැන්වූයෙමි. එදිනටම සෞඛ්‍යදාන රැස්වීමක් කුසලා මුතුතන්ත්‍රි මහත්මියගේ ගෙදර යොදා ගෙන තිබුණෙන්, ඔහු පැමිණියේ හුඟක් සවස් වීය.

නීතාගේ දෙමාපියන් පැමිණියේ එදා විවාහය ලියා පදිංචි කර නීතා ගෙදර රැගෙන යෑමටය. එහෙත් අමුත්තන් විශාල පිරිසක් මෙහි රැස්ව සිටි නිසාත්, නීතාගේ මවට යෑමට හුඟක් හදිසියක් තිබුණ නිසාත්, ඔවුහු සවස 6.30 ට පමණ අපෙන් සමුගෙන ගියහ. නීතා විවාහයට සූදානම් කරවා දුන් ඇඳුම් කට්ටලයට අමතරව, දින දෙකකට සෑහෙන ඇඳුම් පමණක් ගෙනවිත් තිබුණත්, නතර වනු හැර ඇයට වෙන කිරීමට දෙයක් නොමැති විය.

දෙල්ගහයට නිදා ගතිමි

කර්නල් එම්. ඩබ්ලිව්. එෆ්. අබේකෝන් මහතා, යූ. බී. බාලසූරිය මහතා, ධර්මා ගුණසිංහ මහතා, ස්ටැන්ලි මුණසිංහ මහතා ආදී ගුරුවරුන් අපේ ගෙදරින් පිටවන විට රාත්‍රී10.30 ත් පසු වීය. සියලු දෙනාම පිටව ගිය පසු මම ගේ තුළට ගොස් මනමාලිය සෙව්වෙමි. මනමාලිය මගේ පුංචි අක්කාත් සමඟ මගේ ඇඳේ නිදාගෙන සිටියාය. උඩත්, සාලයේත්, කුස්සියේත් හැම තැනම අතිත් අය නිදාගෙන සිටියහ. මම විදුලි ආලෝකය නිවා දමා, ගෙදර දොර එළියෙන් වසා, යත්තම් පැදුරු කබලක් හා කොට්ට මාල්ලක් සොයා ගෙන, දෙල්ගහයටට වී මට උදව්වට සිටි ජයවික්‍රම නැමැති ළමයාට ඉස්තෝප්පුව දී, සොබා දහමට ළංව නිදා ගතිමි. මට එදාත් වෙන දා මෙන් හොඳට නින්ද ගියේය.

1960 ජූලි මස 25 වනදා අප විවාහ දිවියට එළඹුනේ මේ අන්දමටය. රුපියල් හතකට වඩා මට වියදම් නො වූයේ, කාරියවසම් මහතා මුදල් නොගත් නිසාත්, ඇඳුම් පැළඳුම්වලට හෝ උත්සවවලට වියදම් නො වුන නිසාත්ය. එකම වියදම මරදානේ සිට බොරැල්ලට ටැක්සි දෙකකින් යෑමට ගිය වියදමය. වීරේ වියදම් කළ මුදල ද එකතු වූ විට රු. 50 කින් අපේ විවාහයේ වියදම් පියවා ගත හැකි විය. අද සමාජයේ තරුණ තරුණියන් ණය වී, විවාහ දිවියට බැස ජීවිත කාලකන්නි කර ගන්නවා දකින මට, බොහෝ විට අපේ සරල විවාහය ගැන කල්පනා වී සතුටක් ඇති වේ.

පී. ර්. පෙරේරා මැතිනිය විශාල ආගම භක්තියක් තිබුණු උතුම් කාන්තාවකි. අපේ විවාහයට වැඩියෙන්ම මහන්සි වුනේත්, වියදම් කළේත් ඇයයි. අපේ අඩුපාඩුකම් ගැන හොඳින් දැන සිටි එතුමිය අපේ පළමු දරුවා, චාරිකා ලැබුණු විට, ඇයට මාස කිහිපයකට අවශ්‍ය ළමා ඇඳුම් ඇයගේ අතින්ම මසා දුන්නාය.



ඡායාරූප: 176
ගාමිණී ෆොන්සේකා මහතා සමඟ

51

ගමෙන් ගමට ශ්‍රමදානය

ඡායාරූප: 177
මුක්තා විජේසිංහ මැතිනිය

ප සුවදා උදේ අපට ලැබී තිබුණු තෑගි බෝග අතර, රුපියල් හත් අට සියයක මුදල් ත්‍යාගයන් ද විය. එදාම අපට කනතොලුවේ කඳවුරකටත්, ඊළඟ සතියේ කනාන–මාලබේ කඳවුරකටත්, ඊළඟ සතියේ දෙනියායේ වතුරාවේ කඳවුරකටත් යෑමට යොදා ගෙන තිබිණි. ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සම්බන්ධයක් නොමැතිව අප සංවිධානය කළ ප්‍රථම ප්‍රධාන කඳවුරු මේවාය. අපට ලැබුණු සියලුම මුදල් ත්‍යාග, එදා ඇරඹෙන කනතොලුව කඳවුර සඳහා යෙදවීමට තීරණය කළ අපි, කනතොලුවේ ළමයිනට ගත හැකි ඇඳුම් ආදිය ඒ මුදලින් මිලට ගෙන, සවස නාලන්දා ආදී පාසල්වල ගුරු සිසුන් සමඟ පිටත් ව ගියෙමු. විවාහක අඹු සැමියන් හැටියට කාගේවත් කයිකතන්දර අසන්නේ නැතිව, දැන් අපට එකට වැඩ කළ හැකිවීම ලොකු සැනසීමකි. මේ කඳවුරු පිළිබඳව නීතාට හා සීතා රාජසූරිය මැතිනියට මට වඩා මතකයක් ඇති නිසා, ඔවුන් මේවායේ අත්දැකීම් කවදා හෝ ලියා තබනු ඇතැයි කල්පනා කරමි.

විවාහයෙන් පසු දින සිටම, අපගේ සාමාන්‍ය දෛනික කටයුතුවල යෙදීමට අපට සිදු විය. වෙනත් අයට මෙන් මධුසමයට කියා විශේෂ කාල පරිච්ඡේදයක් අපට වෙන් නොවුනි. අපගේ මධුර–මනෝහර කාලය ගෙවුණේ කොහේ හෝ ශ්‍රමදාන කඳවුරක මහන්සි වී වැඩ කිරීමෙන් හා නැති බැරි අයට පිහිට වීමෙනි.

මගේ කටයුතුවලට සහායවීමට, බාල දක්ෂිකාවක් හැටියට ප්‍රධාන බාලදක්ෂිකා කොමසාරිස්වරිය වූ සීතා රාජසූරිය මැතිනිය යටතේ, නීතා ලබා තිබුණු පුහුණුව ඉතා වැදගත් වූයේ යැයි මම කල්පනා කරමි. ඇය ගාන්ධි ග්‍රාම්වලට යවා පුහුණුවක් ලබා දීමට මගේ තිබුණු ආශාව – මගේම හිතවතුන් අතින් කඩාකප්පල් වුවත්, එයින් ද අප දෙදෙනා එක්ව නව අභියෝගවලට මුහුණදීම නිසා වාසියක් මිස පාඩුවක් සිදු වූයේ නැත.

ඡායාරූප:178
සෑම් විජේසිංහ මහතා

* * *

එක්දහස් නවසිය පනස්අටේ මා ඉන්දියාවට ගිය අවස්ථාවේදී මුණ ගැසුණු එක් පුද්ගලයෙකි, දේවෙන්ද්‍ර දාස් චොප්රා මහතා. ඔහු එවකට සිටියේ නවදිල්ලියේ රෝතැක් පාරේ නිවසකය. එය ඔහුගේ නිවස වූ අතර, 'සර්විස් සිවිල් ඉන්ටර්නැෂනල්' ආයතනයේ ආසියානු කාර්යාලය ද එහි විය. චොප්රා එවකට එහි සිටි ආසියානු ලේකම්වරයාය. එස්.සී.අයි. ආයතනයත් සමඟ එක්ව කඳවුරක් පැවැත්වීමට මට ආශාවක් ඇති විය. ඒ අනුව ඔහු හා සම්බන්ධය ඇති කරගෙන පළමුවන කඳවුර එක්දහස් නවසිය හැටේ අප්‍රේල් මාසයට යොදා ගතිමි. ස්ථානය මාතාව ගම විය. ඒ මාසයක කඳවුරකි.

මේ කඳවුරට සූදානමක් වශයෙන් ඊට ටික දිනකට කලින් කෙටි කාලීන කඳවුරක් සංවිධානය කෙළෙමු. මේ කඳවුරට පැමිණි පළමු විදේශිකයා තියඩෝර් වොන් ෆෙලන් බර්ග් නැමැති ස්විස් ජාතික තරුණයෙකි. මොහු මුලින්ම මරදානේ අපේ නිවසේ නැවතී සිටියේය. අබේසේකර මහතා හා ඔහුගේ පවුලේ අය ද ඉන්දියාවෙන් පැමිණි ඊලා භාත් යන තරුණියක් ද, වෛද්‍ය ශිෂ්‍යයන් වූ මහින්ද ජයසිංහ ඇතුලු කණ්ඩායමක් ද, නාලන්දා ශිෂ්‍ය පිරිස ද මේ කඳවුරට සහභාගි වූහ.

රාජසූරිය මැතිනියගෙන් පසු ශ්‍රී ලංකා බාලදක්ෂ කොමසාරිස් වරිය වූ මුක්තා විජේසිංහ මැතිනිය ද, සර්වෝදයේ යහපත, දියුණුව ගැන වෙහෙසී කටයුතු කළ තැනැත්තියකි. ඇය පාර්ලිමේන්තුවේ හිටපු මහ ලේකම්වරයා හා ප්‍රථම ඔම්බුඩ්ස්මන්වරයා වූ සෑම් විජේසිංහ



ඡායාරූප: 179
වෛද්‍ය බැසිල්
සෙනෙවිරත්න
මහතා
සෞඛ්‍යදාන
කඳවුරේ දී

මහතාගේ බිරිඳ වූවාය. අපගේ පුහුණු කඳවුරු බොහොමයකටම මුක්තා විජේසිංහ මැතිනියගේ නිබඳ දායකත්වය ලැබුණි.

මට පැපොල රෝගය සැදී ගෙදර යෑමට සිදු වූයේ මේ කඳවුරේ දීය. මට මතක හැටියට, මට එම රෝගය බෝ වූයේ පළමුවන ශ්‍රී පාද සෞඛ්‍යදාන කඳවුරේ දී වෛද්‍ය බැසිල් සෙනෙවිරත්න මහත්මාගෙනි.

සති තුනක්ම මට ගෙදර නැවතී සිටීමට සිදු වූ නිසා, මානාව කඳවුරේ විශේෂයෙන් විනය පිරිහුණු බව මට නාලන්දා ශිෂ්‍යයන්ගෙන් දැනගන්ට ලැබිණ. ඊට මුල් වී තිබෙන්නේ අබේසේකර මහතාගේ ඇරැයුමෙන්, එතැනට පැමිණි දේශපාලනයට සම්බන්ධ වූ කණ්ඩායමක් නිසාය. මා පැමිණි වහාම මේ පිරිස කඳවුරෙන් පිට කළෙමි. අබේසේකර මහතා ද පිටව ගියේය. එස්.සී.අයි. ආයතනයද, අබේසේකර මහතා ද අපෙන් වෙන් වීමට පසුබිම් වූයේ මේ සිද්ධි මාලාවයි. පසුව සෞඛ්‍යදාන ව්‍යාපාරය ද, සර්වෝදයෙන් වෙන් වී ස්වාධීන ආයතනයක් බවට පත්විය.



ඡායාරූප: 180
සෞඛ්‍යදාන නිර්මාතෘ දොස්තර ලක්ෂ්මන් සිල්වා

සෞඛ්‍යදානය ඇරඹෙයි

සෞඛ්‍යදානය ගැන ආරම්භය ද ලියා තැබීම වැදගත් යයි සිතමි. මගේ පන්තියේ සිටි බත්තරමුල්ලේ සිට පැමිණි ඥානසේන නැමැති ශිෂ්‍යයෙක්, ලක්ෂ්මන් ද සිල්වා නැමැති තරුණ වෛද්‍යවරයකු මා හමුවීමට ආශාවෙන් සිටින බව කිහිපවරක්ම මට පවසා තිබිණි. දිනක් බත්තරමුල්ලේ ගිය අවස්ථාවක දී වෛද්‍ය

ඡායාරූප: 181
මා පළමු සිරිපා සෞඛ්‍යදාන කඳවුරේදී

ලක්ෂ්මන් සිල්වාගේ නිවසට ගියෙමි. ඔහු සිරිපා වැඳීමට ගිය අවස්ථාවේදී සිතට ආ කල්පනාවක්, ඔහු මා හා පැවසීය. එනම් සිරිපා වඳින කාලයේ දී වන්දනාකරුවන්ට ප්‍රථමාධාර දීමට ශ්‍රමදාන ප්‍රථමාධාර කඳවුරු පැවැත් – වීමේ අවශ්‍යතාවයි.

"ඇයි ඩොක්ටර් ශ්‍රමදාන? අපි සෞඛ්‍යදාන ව්‍යාපාරයක් ඒ සඳහා අරඹමු" යි එකවරම මම පැවැසීමි.

ඡායාරූප: 182
සෞඛ්‍යදාන ව්‍යාපාරයේ නිර්මාතෘ වෛද්‍ය ලක්ෂ්මන් ද සිල්වා මහතා, ස්ටැන්ලි ප්‍රනාන්දු මහතා සහ ටාර්සි ජයසිංහ මහතා පළමු ශ්‍රීපාද කඳවුරේදී

වෛද්‍ය ලක්ෂ්මන් සිල්වා මහතා විදුලි සැරයක් වැදුණු කෙනෙක් මෙන් වහාම පුටුවෙන් නැගිට,

"හරිම අගෙයි. අපි සෞඛ්‍යදාන ව්‍යාපාරයක් අරඹමු කොහොමද කරන්නේ?"

"ඕක සුලු වැඩක්. ඩොක්ටර්, නර්ස්ලයි, වෛද්‍යවරුනුයි, බේතුයි සොයා ගන්න. මම ස්වේච්ඡා සේවකයනුයි අවශ්‍ය ආහාරයි සොයා ගන්නම්. මේ නිවාඩුවේ දී අරඹමු"යි මම පිළිතුරු දුනිමි.

ඒ කාලයේ දොස්තර ලක්ෂ්මන් සිල්වා සේවය කළේ කොළඹ ඇස් රෝහලේය. දින කීපයක්ම සවස් භාගයේ එකතු වූ අපි සෞඛ්‍යදාන ව්‍යාපාරයට රීති මාලාවක් සකස් කළෙමු. පළමු රැස්වීම නාලන්දාවේ ක්‍රීඩා මණ්ඩපයේ තැබූ අතර, පළමුවන කතාව මම පැවැත්වීමි. මේ අදහසට තදින්ම විරුද්ධ වූ නමුත්, අබේසේකර මහතා ද මේ රැස්වීමට පැමිණියේය.



ඡායාරූප: 183
මහාචාර්ය වෛද්‍ය පී. ආර්. අන්තෝනිස් මහතා

පසුව වෛද්‍ය ලක්ෂ්මන් සිල්වා හා මා පළමුවෙන්ම ගියේ මගේ ඥාති සොයුරකු වූ හයිඩ්පාක් හන්දියේ අරුණෝදිසි හෝටලයේ අයිතිකරු අරනෝලිස් අයියා හමුවීමටය. ඔහු හාල්මිටි 5 ක් පරිත්‍යාග කළේය. ඊළඟට ගියේ මගේ ඉතා ළඟ හිතවතකු වූ රෝයල් කන්ෆෙක්ෂනරි හිමි කැළණියේ ජී.ඩී. වික්‍රමරත්න මහතා හමුවීමටයි. ඔහු සීනි මිටි 3 ක් දුන්නේය. බේක්හවුස් අයිතිව සිටි ඇම්. ඒ. පියතිස්ස මහතා කුලු බඩු තෑගි කළේය. ඉතිරි සියලුම දේවල් අඩංගු මුලු ලැයිස්තුවම දොස්තර පී. ආර්. ඇන්තනීස් මහතා පරිත්‍යාග කළේය. මේ සියල්ල නාලන්දාවේ ගබඩා කරගත් අපි නාලන්දා සමාජ සේවා සංගමය සංවිධානය කළ පළමුවන සිරිපා සෞඛ්‍යදාන කඳවුරට ගියෙමු. මේ එක්දාස් නවසිය හැටේ මාර්තු මස නවවෙනිදාය.

සිරිපා කඳවුර



ඡායාරූප: 184
වෛද්‍ය ඩබ්. ඒ. එස්. සිල්වා මහතා

අපේ පාද කඳවුර වූයේ වෛද්‍ය එච්. සී. එච්. ද සොයිසා මහතාට අයත් ගාට්මෝර් වත්තේ බංගලාවයි. පැය විසිහතරක් තුළ තෙවරක් සිරිපා නැගීමට තරම් මේ කාලයේ අපේ ගතේ සිතේ හයිය තිබිණි. මේ කඳවුරේ ඉතා මහන්සි වී වැඩ කළ කෙනෙකි, මොරටුවේ ලුනාව පාරේ මිපීලා නිවසේ පදිංචිව සිටි ස්ටැන්ලි ප්‍රනාන්දු මහතා.

පළමුවන දින අපට පුදුම අත්දැකීම් ලැබිණි. ඉහලම වෛද්‍ය උපාධිලත් ඩබ්ලිව්. ඒ. එස්. සිල්වා, එච්. එම්. පී. ගුණරත්න, කේ.

එන්. සෙනෙවිරත්න, බැසිල් සෙනෙවිරත්න ආදී විශේෂඥ වෛද්‍යවරුද, හෙදියෝ ද, ස්වේච්ඡා සේවකයෝ ද, විනිෂියා ගමගේ මහත්මිය ප්‍රධාන බාලදක්ෂිකාවෝ ද, අප හා එදා සිටියහ. එහෙත් බේත් අඩංගු පාර්සල් ගාට්මෝර්වත්තේ අමතකව පැමිණ සිටියෙන් ප්‍රතිකාර දීමට බාධා ඇති විය. මේ අවස්ථාවේ සිරිපාදය දෙස බලා පන්සිල් ගන්නා හැටියට හැමෝටම කියා, අවට තිබුණු කඩ වලින් පෙපර්මින්ට් සියල්ල ම ගෙනවුත් කුඩුකර කඩදාසිවල ඔතා තබන මෙන්, මම මගේ ශිෂ්‍යයිනට කීවෙමි. ඒ අවස්ථාවේ සිට හිසරදය, බඩයෑම, පපුවේ කැක්කුම් ආදී හැම රෝගයකට සමන් දෙවියන් සිහිකොට අප දුන් බෙහෙත් ඒවායි. හැම ලෙඩෙක්ම සනීප විය. බේත් පාර්සල් ලැබුණේ පසුදායි. මේ පුවත සිහි කරමින් පසුව අපි මුණ ගැසුන හැම අවස්ථාවකදීම විනෝද වීමු. සමන් දෙවියන්ට පින් දුනිමු.

ඡායාරූප: 185
මහාචාර්ය කේ. එන්. සෙනෙවිරත්න මහතා

මුල් සෞඛ්‍යදාන කඳවුරු දෙකම නාලන්දාවේ සමාජ සේවා සංගමයේ මූලිකත්වයෙන් සංවිධානය කළ අතර, ඉන්පසු එය ස්වාධීන වැඩ පිළිවෙලක් බවට පරිවර්තනය විය.

* * *

අප දෙදෙනා බැලීමට නිතර දෙල්ගහයට ගෙදරට ආ කීප දෙනෙක් වූහ. එයින් ඩැරල් පීරිස් මහතා පුදුම චරිතයකි. ඔහු ලස්සන ගී සින්දු අපට කියා දුන්නේ ය. එකම මාතෘකාව උඩ මිනිත්තු එකක්, පහක්, පහළොවක්, පැය භාගයක්, පැයක්, පැය තුනක් ආදී වශයෙන් කාලය සීමා කරන කථා පවත්වන හැටි ඔහු අපට ඉගැන්වීය. මහාචාර්ය එෆ්. ආර්. ජයසූරිය මහතා හා කථිකාචාර්ය කේ. එච්. එම්. සුමතිපාල මහතා ද නිතර අප නිවසට පැමිණියහ.

ඡායාරූප: 186
විනිෂියා ගමගේ මහත්මිය

අපේ විවාහයෙන් පසු අප සංවිධානය කළ මුල්ම කඳවුර කනතොලුවේ සති

කඳවුරකි. ආපසු ගෙදර පැමිණි අපි, එදිනම කලුතර දිස්ත්‍රික්කයේ කනාන මාලබේ කඳවුරට පිටත් වීමු.

ඡායාරූපː 187
උපාලි සේනානායක මහතා (වම්පස) ශ්‍රමදාන කඳවුරක දී

ඡායාරූපː 188
ස්ටැන්ලි ප්‍රනාන්දු මහතා (දකුණු පැත්තේ)

52
හොඳ පාඩමක්

කනාන මාලබේ කඳවුර

කනාන ගම ගැන මට මුලින්ම දන්වා එවූයේ ගරු පත්බේරියේ ඉන්ද්‍රානන්ද ස්වාමීන් වහන්සේය.

එහි සඳහන් වූ අන්දමට ඒ ගම අපරාධවලින් පිරි ගමකි. පවුල් 29ක අයි.ආර්.සී. කාරයින් හෙවත් දීප ව්‍යාප්ත අපරාධකරුවන් හැටියට නම් කළ තිස්පස් දෙනෙක් ඒ ගමේ සිටියහ. ප්‍රධාන රැකියාව හොර හරක් මැරීම, අසල රබර් වත්තකින් බලෙන් කිරි කැපීම සහ සොරකම්ය. කියවීමට – ලිවීමට දත් සංඛ්‍යාව ඉතා අඩුය. පසුගිය අවුරුදු කිහිපයේ දී පමණක් මිනී මැරුම් නවයක් පමණ සිදුවී තිබේ. පොලීසිය මේ ගමට යන්නේ සන්නාහ සන්නද්ධවය. මිනිසකු මරා ඔහුගේ අත කපාගෙන පොලීසියට යැමට තරම් එක් මිනිසෙක් දරුණු විය. මේ ගම ගැන කියවූ වහාම මේ ගමට යැමට මට සිත් විය.



ඡායාරූප: 189
ගරු පත්බේරියේ ඉන්ද්‍රානන්ද හිමි

කලුතර දිස්ත්‍රික්කයේ නිසා ඇල්බට් විජේගුණවර්ධන මහතා සමග මම දිනක් යොදාගෙන ඒ ගමට ගියෙමි. කාරෙක මහ පාර අයිනේ නවතා, අපි දෙදෙනා අඩි පාරක් දිගේ ගමට යමින් සිටියෙමු. අප ඉදිරියට පැමිණී මිටි හීන්දැරි මිනිසෙක් රබර් වත්ත මැද දී හමුවිය. අප දෙදෙනාම කලිසම් ඇඳ සිටියත්, මේ මිනිසා අපට කිසිම ගරු සරුවක් නැතිව ඉදිරියට ආවේය.

කලිසම් අඳින හැම මිනිසකුටම 'මහත්මයා' යයි කියන්නට පුරුදු වී සිටින අප රටේ, මෙවැනි මිනිසකු දැකීම මගේ යටි සිතට සතුටක් ගෙන දෙන කරුණක් විය. ඔහු අප ඇමතීය.

"තමුසෙලා කොහේද යන්නේ?"

පිළිතුරු දීමට මට ඉඩ දෙන ලෙස විජේගුණවර්ධන මහතාගෙන් මම ඉල්ලා සිටියෙමි.

"කනාන ගමට" මම පිළිතුරු දීමි.

"මොකටද? තමුසෙලා කවුද?"

"ඇයි තරහෙත් වාගේ? මුන්නැහෙට හිතන්න බැරිද අප කවුද කියලා?" මම කතා කළෙමි. ටිකක් අවුල් වූ සිතක් ඇති බව පෙන්වූ ඔහු, නැවත කතා කළේය.

"තමුසෙලා රජයේ නිලධාරීන් වෙන්න ඇති. තමුසෙලා යලට මහට එනවා. අපේ තොරතුරු සොයා ගෙන ලියා ගන්නවා. ඊට පස්සෙ මාරුවෙලා යනවා. ඊළඟට තවත් කවුරු හරි එනවා. හ්ම්. හ්ම්. යනවා. යනවා. ගණන් ගන්නවා. අපේ හැටි එහෙමම තමයි." කියමින් ඔහු යන්ට හැරුණේය. මම ඔහු නැවැත්වීමි.

"ඔබ වැරදියි. අප රජයේ නිලධාරීන් නොවෙයි. ආයි හිතන්න."

"ආ ආ එහෙනම් ළඟදී ඡන්දයක් එනවා ඇති. ගිය සැරේ ඡන්දයට පස්සේ තමුසෙලා දැක්කෙ නැහැ. යනවා. යනවා. ඡන්දෙ හිඟා කනවා– ගිහිල්ලා."

"නෑ, නෑ, ආයි වැරදුණා. අපි ඡන්දකාරයොත් නොවෙයි." මම හිනාවී පිළිතුරු දිනිමි.

"ආයි හිතන්න. අපි කවුරු කියා හිතනව ද?" මම නැවත ඇසීමි. දැන් මිනිහා හොඳටම අවුල් වූ සිතකින් අප දෙස අවධානයෙන් බැලීය.

"එහෙනම් අනුමාන නෑ. එකත් එකටම සී.අයි.ඩී. එකෙන්. අපේ වැරදි අල්ලන්න ඇවිල්ලා."

අපි රහස් පොලිසියෙනුත් නොවන බව ඔහුට පැහැදිළි කර දුනිමු.

"නිලධාරීනුත් නොවන දේශපාලකයනුත් නොවන, පොලීසියෙනුත් නොවන, අලුත් පිරිසක් දැන් ගම්වලට යන්න පටන් ගෙන තිබෙනවා. අපේ තැලී පෑගී තිබෙන ගම්වල ජනතාව අතරට සති අන්තවල, නිවාඩු කාලවලදී ගිහිල්ලා ගැමි ජනතාව සමග ඔවුන්ගේ අඩුපාඩු සම්පූර්ණ කිරීමට ශ්‍රමය කැපකරන පිරිසක් දැන් ඉන්නවා. අප එයින් දෙන්නෙක්."

ඡායාරූපඃ 190 කතාන ගමට යාමට අප කැපූ පාර

මේ අන්දමින් අපේ ගමන ගැන හැඳින්වීමක් කළෙමි. අවුරුදු නවයක් සිර දඬුවමක් විඳ, ගමට පැමිණ සිටි මේ තරුණයා, මිතිත්තුවෙන් එකවරම වෙනස් විය.

"මහත්තයල සමග ගමට මාත් එනවා. මම ගමේ සියලූදෙනාම රැස් කරන්නම්."

එදා පොසොන් පෝ දිනයක් බව මට අද මෙන් මතකය. ගල් තලාවක් මත අප වාඩි වී, මහින්දාගමනයෙන් පසු ශ්‍රී ලංකාවේ අප ගත් මග එදා වනවිට වෙනස් වී තිබෙන හැටිත්, ඒ තත්වයට මුහුණ දීමට ගැමි ජනතාව පෙරමුණ ගත යුතු හැටිත් අළලා දේශනයක් කළෙමි. මහා ශ්‍රමදාන කඳවුරක් පැවැත්වීමට එදිනම දින නියම කරගෙන, අපි ආපසු පිය නැඟුවෙමු.

53

කරුණානන්ද මැතිතුමාගේ තෝරා ගැනීම

මේ කඳවුරට සූදානම් වන අවස්ථාවේදී ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතුමාගෙන් නාලන්දා විදුහල්පති ඇම්. ඩබ්ලිව්. කරුණානන්ද මහතා නමින් ලිපියක් ලැබිණි. එහි සඳහන් වූයේ මේ කඳවුර නො පවත්වන ලෙසය. ළමයින්ගේ ජීවිතවලට පවා හානි විය හැකි බව, ඒ දීර්ඝ ලිපියේ සඳහන් විය. මේ වනවිට අබේසේකර මහතාගෙන් හා ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් අප ඈත්ව සිටි නිසා, මේ ලිපිය ගැන කරුණානන්ද මහතා කලබල වූයේ නැත. විජේ ගුණවර්ධන මහතා ද කඳවුර පැවැත්විය යුතු බව තදින් ම කියා සිටියේය. කඳවුරේ කටයුතු සූදානම් වන බව දත් අබේසේකර මහතා හා වෛද්‍ය ලක්ෂ්මන් සිල්වා මහතා පැමිණ කරුණානන්ද මහතා හමුවූහ. කාර්යාලයේ අනිත් පැත්තේ සිටි මට ඔවුන්ගේ සාකච්ඡාවේ අවසාන කොටස ඇසිණි. අබේසේකර මහතා මෙසේ පැවැසීය:

"කරුණානන්ද මහතාණනි, එක්කෝ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව නැතිනම් ආරියරත්න තෝරා ගන්න."

කරුණානන්ද මහතා පුටුව පස්සට තල්ලු කර නැගිට්ටනු ඇසිණි. "මහත්වරුනි, දැන් ඔබට යන්න පුලුවනි. මම ආරියරත්න තෝරා ගත්තා." කරුණානන්ද මහතාගේ ස්ථිර පිළිතුර විණි.

කාර්යාලයෙන් එළියට එන විට අප සිටිනු දුටු එතුමා, කඳවුරට සියල්ල සූදානම් දැයි ඇසීය. 'අයිසේ මාත් එනවා.'

සමගිය ගොඩනැගුණු ශ්‍රමදානය

අලුත්ගම දක්වා දුම්රියෙන් ගිය තුන්සීයක් පමණ වූ ශ්‍රමදාන දායක පිරිස, කනාන–මාලබේට ගියේ විශේෂ බස්වලිනි. බස්වලින් බසින විට අප දුටුවේ පාර දෙපැත්තට වී සිටින හාර පන්සීයක පමණ පිරිසකි.

විල්මට් ජයනෙත්ති මහතා ප්‍රධාන මාලබේ පිරිස, කනානට නොයන ලෙස කී අතර, කනානේ පිරිස – මාලබේ වැඩ නො කරන

ඡායාරූප: 191
විල්මට් ජයනේත්ති මහතා හා විජයගුණවර්ධන මහතා
කනාන - මාලබේ කඳවුරේදී

ලෙසත්, අපට ප්‍රකාශ කරමින්, සටනකට මෙන් සූදානම්ව සිටියහ. විජේ ගුණවර්ධන මහතා මට ඇති තත්වය තේරුම් කර දුන්නේ ය. හැමෝටම ආහාර උයන ලෙස අණ දුන් මම, වහාම පවුල් හමුවක් කැඳවීමි.

මිනිත්තු කිහිපයක භාවනාවකින් පසු, පැය දෙකහමාරක පමණ කාලයක් දීර්ඝ දේශනයක් දී දෙපැත්තේ නායකයින්ගේ ම මුවින් අනිත් පැත්තේ අයගේ ගමේ වැඩ කිරීමේ ආයාචනය ලබා ගතිමි. මෙය බලාපොරොත්තු නො වූ විශාල ජයග්‍රහණයකි.

පසුදා උදේ කඳවුර ඇරඹිණි. කනානේ කණ්ඩායම් මාලබේ පාර කැපීමටත්, මාලබේ කණ්ඩායම් කනානේ පාර කැපීමටත් සහභාගි වූහ. විල්මට් ජයනෙත්ති මහතා උදේ කනානට පැමිණීම විශේෂ සිද්ධියකි. පාරම්පරික වෛරයක් එදා සංසිඳිනි. සමාජයෙන් කොන් කර තිබුණු කනානේ ජනතාවට, එදා රාත්‍රී ආහාරය දුන්නේ විල්මට් ජයනෙත්ති රාළහාමිගේ ගෙදර වීම විශේෂ සිද්ධියකි. එවකට කටුකුරුන්ද පොලිස් අභ්‍යාස විද්‍යාලයේ සිටි පොලිස් පරීක්ෂක ජේ. ජී. ඊ. ප්‍රනාන්දු මහතා මේ කඳවුර ගැන විශේෂ උනන්දුවක් ගෙන ක්‍රියා කළ කෙනෙකි.

54

තිලක් රත්නායක අයියා – සැබෑ දේශප්‍රේමියෙක්

කනාන–මාලබේ කඳවුර සාර්ථකව නිම කළ අපි, එහි සිට කෙලින්ම ගියේ දෙනියායේ වතුරාවටයි. එහි දී ටයිටස් රත්නායක මහතාගේ නායකත්වයෙන් සතියක කඳවුරක් සංවිධානය කර තිබිණි.



ඡායාරූපඃ 192 වතුරාව කඳවුරේදී

කනතොලුව මුල් කඳවුර ගැන පුවත්පත්වල දුටු වහාම, මට ලියුම් එවා තිබුණු ටික දෙනාගෙන් කෙනෙකි ටයිටස් රත්නායක මහතා. සුප්‍රසිද්ධ මහින්ද ආදි ශිෂ්‍යයකු වූ ඔහු, මා මහින්ද විද්‍යාලයේ ආදි ශිෂ්‍යයකු බව දැනගත් වහාම, අප අතර ඇති වූ සම්බන්ධය වඩාත් ස්ථිර විය. ඔහුට තිලක් අයියා මෙන් අමතන මෙන් මට කියා තිබුණේය. කෙසේ හෝ මොරවක් කෝර්ළයට සර්වෝදය හඳුන්වා දීම ඔහුගේ ආශාව විය. මේ කඳවුරින් එය ඉටු විණි.

පල්ලෙගම පන්සල හා වතුරාව ගමේ තාවකාලිකව ඉදි කළ කුඩාරම් අපේ කඳවුරු භූමිය විය. මට මතක හැටියට බාහිරින් අපි

ඡායාරූප: 193 වතුරාව පාර ලකුණු කරන තිලක් අයියා

දෙසීයක් පමණ පැමිණ සිටියෙමු. ඉතා සාර්ථකව කඳවුරේ කටයුතුත්, පවුල් හමු ආදියත් ඉටු විණි.

අපි තනි වීමු

මේ අතර එක් සන්ධ්‍යාවක රත්නායක මහතාගේ අලුත් නිවසේ අප වෙනුවෙන් භෝජන සංග්‍රහයක් පැවැත්විණි. භෝජන සංග්‍රහය ඉවර වන විට රාත්‍රී නවයත් පසු විය. විවාහ වූවාට පසු නීතාට හා මට තනිව කතා කිරීමටවත් අවස්ථාවක් එතෙක් නොලැබුණු නිසා, අපි නොදැනුවත්වම වාගේ එක් මුල්ලක කතා කරමින් සිටියෙමු. මේ අතර අපට නො කියාම, රත්නායක මහතා විසින් අන් සියලු දෙනාම ආපසු කඳවුරට යවා තිබිණි. අපේ කතාව නිම වී වටපිට බලන විට ඉතිරිව සිටියේ අප දෙදෙනා හැරුණු විට – ගෙදර කෝකියා පමණි. අපට කඳවුරට යෑමට කිසිම ක්‍රමයක් නොවිණි. කෝකියා කියා සිටියේ දෙදිනකට රත්නායක මහතා නොඑන බවත්, අපට ගේ දොර බලා ගන්නා ලෙස පැවැසූ බවත්, ආහාර පානාදිය ඔහු විසින් සපයා දෙන බවත්ය.

රත්නායක මහතා යොදා තිබූ සම්‍යක් ප්‍රයෝගය අපට තේරුම් ගියේය. පල්ලෙගම රත්නායක වතුයායේ නිහැඬි කඳු මුදුනක අලුතින් තැනුණු නිවසක අපි දෙදෙනා තනිවීමු. විවාහ වී සති තුනකට පසු මේ අන්දමින් නිදහසේ උනුනුන් සමග කතා බස් කිරීමටත්, අනාගතය ගැන සැලසුම් හැදීමටත් – අඹු සැමියන් යයි අවබෝධ කර ගැනීමටත් අපට අවස්ථාව ලැබිණි.

දෙදිනකට පසු ඔහුගේ තිල්පාට බෙන්ස් රියෙන් පැමිණි තිලක් අයියා (ටයිටස් රත්නායක මහතා) සුපුරුදු රවුම් මුහුණ පිරී යන හිනාවක් පාමින්, "හරි දෙන්නා! කඳවුරු කරන්නයි කියල ඇවිත් අපි ව මග ඇරල මෙහේ කඳවුරු බැඳලා"යි පවසමින් අපට විහිලු කළේය.



ඡායාරූප: 194
එෆ්. එල්. වුඩ්වර්ඩ් මහතා

තිලක් අයියා මහින්ද විද්‍යාලයේ විදුහල්පතිවරයෙකු සිටි එෆ්. එල්. වුඩ්වර්ඩ් මහතා දේවත්වයෙන් සලකන උතුම් පුරුෂයෙකි. ඔහු විශ්වමය අදහස් ඇත්තෙකි. එහෙත් එම අදහස් මොරවක් කෝරළයට, සිංහල ජාතියට, බුද්ධ ශාසනයට තිබෙන භක්තිය සමග නොගැටෙන සේ සංයමයෙන් යුතුව සකසා ගත් පුද්ගලයෙකි.

වරක් ඔහුගේ තේ වත්තක් රජයට ගත් විට, දුන් වන්දි මුදලෙන් රුපියල් ලක්ෂයක් පරිත්‍යාග කොට, වුඩ්වඩ් අනුස්මරණ අරමුදලක් සර්වෝදය භාරයේ පිහිට විය. මෙයින් ලැබෙන ආදායම ධර්මදූත හා ආගමික කටයුතුවලට යොදවනු ලැබේ.

ඡායාරූප: 195
කොලවෙනිගම තිලක් රත්නායක මහතාගේ නිවසට රැස්වූ ශ්‍රමදායකයෝ

එක්දහස් නවසිය හැත්තහයේ දී මා අසනීප වී, තෙමසක් පමණ ඩර්ඩන්ස් රෝහලේ සිටින විට ඔහු නිතර පැමිණියේය. වටපිට බලා

ඡායාරූප: 196
නීතා ඇතුලු ශ්‍රමදායක පිරිස
දෙනියාය කඳවුර
දෙනියාය වික්ටර් රත්නායක
මහතාගේ නිවසේ දී

ලේන්සුව අතට ගෙන දිගහැර, ඔහු යම් දෙයක් මගේ අතේ තබයි. මෙය ලොකු ගණනකට විකුණන්නට හැකි වේ යයි සිතා ආපසු දෙන්නැයි මගෙන් ඉල්ලයි. මෙය කිහිප විටක්ම ඔහු කළේය. මා අසනීපය සුව වී ගෙදර එන විට දුටුවේ, අප දැන් පදිංචි නව නිවස ඉදිවෙමින් තිබෙන බවය. නීතාගෙන් මා විමසූ විට, දැන ගත්තේ අවශ්‍ය බඩු මුට්ටු සියල්ලම පාහේ තිලක් අයියා එවා ගෙය හැදීමට අත දුන් බවය. මා අත තබා ආපසු ලබා ගෙන ඇත්තේ මැණික් ගල්ය. ඔහු කොල්ලුපිටියේ මැණික් සාප්පුවක් ද අවුරුදු කිහිපයක් පවත්වා ගෙන ගියේය. මගේ අතේ තබා මැණික් ගෙන ගිය විට, ඔහු බලාපොරොත්තු වූ ලාභයට වඩා කිහිප ගුණයක්, ඔහුට ලැබුණු බව තිලක් අයියා මා සමග පැවසීය.

අපේ ගම් නියම් ගම්, අපේ මව්බිම දියුණු කිරීම පිළිබඳව ඔහු කෙළවරක් නැති දේ ගැන කල්පනා කරයි. පිටු ගණන් යෝජනා ක්‍රම හදා එවයි. සමහර විට මෙයින් සමහරක් ක්‍රියාත්මක කිරීමට ද පටන් ගනියි. එහෙත් මෙවැනි අය ජීවත් වන්නේ, වැරදි අගයන් රජ කරන සමාජයක නිසා, ඔවුන්ගේ නියම සේවය සමාජයට ලැබීමේ මං ඇහිරී තිබුණේය.

ඡායාරූප: 197
ශ්‍රමදාන නිමකොට නවාතැනට
ආපසු එන පිරිසක්

55

භූදාන් යාත්‍රාවට එකතු වීම

මා එක්දහස් නවසිය පනස්හතේදී ඉන්දියාවට ගිය අවස්ථාවේදී මහත්මා ගාන්ධිතුමා, විනෝබා භාවේ තුමා, ශ්‍රී ජයප්‍රකාශ් නාරායන්තුමා ආදීන් විසින් ලියැවුණු හෝ ඔවුන් ගැන ලියැවුණු පොත් පිංචි රැසක්ම විශේෂයෙන් නව දිල්ලියේ ගාන්ධි පොත් සාප්පුවෙන් මිලට ගෙන කියැවූයෙමි. මට දෙවැනි වර ඉන්දියාවට යෑමට අවස්ථාව ලැබුණේ එක්දහස්පනස් නවයේ දී ධර්මා ගුණසිංහ සොයුරා සමඟය. මේ වනවිට කනතොලුව මුල් කඳවුර හා තවත් - කඳවුරු තුනක් මානාව කඳවුරු දෙකක්, මඩකලපුවේ පනිච්චන්කර්නිවල කඳවුරක්, ඕපනායක අකරැල්ලේ කඳවුරක්, ශ්‍රී පාද සෞඛ්‍යදාන කඳවුරක් ආදී වශයෙන් කඳවුරු රැසක්ම සංවිධානය කර ක්‍රියාත්මක කර තිබිණි.

මේ කඳවුරු කරන අතර යම් පොදු ජාතික දර්ශනයක්, ශ්‍රමදාන ශිල්පීය ක්‍රම රැසක්, ගී සින්දු ඇතුලු නව සංස්කෘතික නිර්මාණයන්, රටට ගැලපෙන අධ්‍යාපන දර්ශනයක් හා ශිල්පීය ක්‍රමයන් ගැන සිතමින්, ලියමින්, යම් උගතුන් හා සාකච්ඡා කරමින් මම දිවා රෑ වෙහෙසුණෙමි. මේ කිසිවක් ගණනකට නොගෙන බයිලා විනෝදයත්, දේශපාලනයත්, පළමු ජාත්‍යන්තර කඳවුරේදී මා ලෙඩ වී සිටි සති දෙකේ දී රජයේ නිලධාරීන් හා දේශපාලකයන් මගින් ඇතුලුවීම නිසා එකළොස් වන කඳවුරේ සිට 'ශ්‍රමදාන ව්‍යාපාරය' යන නම කෙලින්ම පාවිච්චි කළෙමි. නාලන්දා සමාජ සේවා සංගමයේ සීමාවලට කොටු වී ජාතික ව්‍යාපාරයක් ගොඩනැගිය නොහැකි නිසා, මා පදිංචි වී සිටි කොළඹ 10, මරදාන පාරේ, අංක 493 දරණ නිවසේ අපේ කාර්යාලය පිහිටුවා ගතිමු.

සෑම සිකුරාදා දවසකම සවස අපි අපේ නිවසේ උඩ තට්ටුවේ එකතු වීමු. එම්.ඩබ්ලිව්. කරුණානන්ද මහතා, මහාචාර්ය එල්.ජී. හේවගේ මහතා, එම්.ජී. තිලකරත්න මහතා, කුමාර විදුහල්පති ධර්මසේන අරම්පත්ත මහතා, රාජකීය විදුහල්පති බෝගොඩ ප්‍රේමරත්න මහතා, ධර්මසේන සේනානායක මහතා, ධර්මා ගුණසිංහ මහතා, පියසෝම

මේදිස් මහතා ආදීන් මෙසේ එකතු වී සාකච්ඡා කළ අය අතර වූහ. පසු කලෙක සර්වෝදය අධ්‍යයන කවය යන නමින් හැඳින්වූ මේ කණ්ඩායම, අපේ සාකච්ඡා පොත් පිංචි වශයෙන් මුද්‍රණය කර බෙදා හැරීමට කටයුතු යෙදුවෙමු.

ඡායාරූප: 198
ධර්මා ගුණසිංහ සමග ඉන්දියාවේ දී

මගේ යටි හිතේ වැඩ කළේ කෙසේ හෝ ඉන්දියාවට ගොස් ආචාර්ය විනෝබා භාවේ, ශ්‍රී ජයප්‍රකාශ් නාරායන් වැනි මහත්මා ගාන්ධි අනුගාමිකයින් සියැසින්ම දැක, හඳුනාගෙන ඔවුන්ගේ දර්ශනය ගැන අවබෝධයක් ඇති කර ගැනීමේ අදහසයි. 1959 ඔක්තෝබර් මස අගදී නවදිල්ලියේ පැවැත්වූ New Education Fellowship නව අධ්‍යාපන මිත්‍ර සමුලුව සඳහා පිටත්ව ගිය නියෝජිත පිරිසට එකතුවීමට ලැබීමෙන් මේ අදහස සම්පූර්ණ විය. ධර්මා ගුණසිංහ සොහොයුරාද, පොළඹවා ගෙන අප දෙදෙනාද ලංකා දූත මණ්ඩලයට එක්වීමු. එහෙත් අප දෙදෙනා ගියේ දුම්රියෙන්ය. නවදිල්ලියේ දී කථිකාචාර්ය රතී ධනපාල, මහාචාර්ය යූ.ඩී. ජයසේකර, කථිකාචාර්ය කේ. නේසයියා, විදුහල්පති එච්.ඩී. සුගතපාල, අධ්‍යාපන අධ්‍යක්ෂවරු වූ ඩබ්ලිව්.එම්.ඒ. වර්ණසූරිය සහ බී. ජේ. පී. අලස් යන අනිත් නියෝජිත මහත්වරුන් සමඟ අපි එක්වීමු.

ඡායාරූප: 199
ජනාධිපති ආචාර්ය ශ්‍රී රාජේන්ද්‍ර ප්‍රසාද් තුමා රාෂ්ට්‍රපති භවන්වලදී හමුවීම

ඡායාරූප: 200
අගමැති ශ්‍රී ජවහර්ලාල් නේරු හමුවීම. පසු පෙළ වමේ සිට තුන්වැන්නා මාය. අගමැති තුමා ළඟ ම වම්පස වාඩි වී සිටින්නේ මහාචාර්ය ජී. රාමචන්ද්‍රන්, රතී ධනපාල මැතිනිය හා කේ. නෙසයියා මහතා ද වාඩි වී සිටිති.

නව අධ්‍යාපන සමුලුව විවෘත කර ප්‍රථම දේශනය පැවැත්වූයේ ඉන්දියාවේ ප්‍රථම ජනාධිපති වූ ආචාර්ය ශ්‍රී රාජේන්ද්‍ර ප්‍රසාද් මැතිතුමාය. මීළඟ දේශනය ඉන්දීය අගමැති ශ්‍රී ජවහල්ලාල් නේරු මැතිතුමන් විසිනි. උප ජනාධිපති, සුප්‍රසිද්ධ දාර්ශනිකයකු වූ ආචාර්ය ශ්‍රී සර්වපල්ලි රාධක්‍රිෂ්ණ මැතිතුමා සහ වෙනත් ඉන්දීය නායකයෝ ද ආරම්භක සමුලුවේ දී දේශන පැවැත්වූහ.

මෙම සමුලුවට දහසක් පමණ දෙනා නොයෙක් රටවලින් සහභාගි වූ අතර, ලාබාලම අය හැටියට කැපී පෙනුනේ ධර්මා ගුණසිංහ සහ මාය.

ඡායාරූප: 201
දෙවේන්ද්‍ර කුමාර් ගුප්ත මහතා දරුවන් සමග

ප්‍රධාන සම්මේලන සභාව හැරුණු විට විවිධ කාර්යය සැසි ද පැවැත්විණි. ඉන් එකක දී කේ. නේසයියා මහතා කළ කතාව යම් විදියක ජාතිවාදී ස්වරූපයක් තිබුණ නිසා, එයට කෙලින්ම පිළිතුරක් දෙන ආකාරයක් නොපෙන්වා ඔහු ඉදිරිපත් කළ සියයට ගණන් නිවැරදි කොට මා කතා කළා මට මතකයි. පසුව නේසයියා මහතා මේ සඳහා මට දොස් පැවැරූ නමුත්, අප දෙදෙනා අතර එදා පැවැති හැඳුනුම්කම ඔහු මියයන තුරුම අප අතර පැවැතුණේය. ඔහු මිය යන විට යාපනය නගරය පැවැතියේ

ඡායාරූපඃ 202 – බුද්ධගයාවේ දී

එල්ටීටීය පාලනය යටතේය. එහෙත් රජයෙන් අවසර ගෙන නීතා හා මම ඔහුගේ පුතා ආචාර්ය දේවනේසන් නේසයියා ද සමඟ ත්‍රිවිධ හමුදාවේ සහ අයි.සී.ආර්.සී. නැවේ ආධාරයෙන් තුන් මස අග දී පැවැත්වූ දේව මෙහෙයට සහභාගිවීමට යාපනයට ගියෙමු. ඒ 1993 දීය.

මෙම සමුළුවේ දී මට බලපෑ විශේෂම සිද්ධිය වූයේ 'වර්ධා අධ්‍යාපන ක්‍රමය' පිළිබඳව විශේෂ දේශනයක් කළ මහාචාර්ය ජී. රාමචන්ද්‍රන් මහතා හඳුනා ගැනීමට ලැබීමයි. **සර්වෝදය** යන වචනය මුලින්ම විග්‍රහ කරනු මා ඇසුවේ එතුමාගෙනි. සර්වෝදයේ ගැබ්වී ඇති අදහස් එකින් එක නෙලුම් මලක පෙති මෙන් අදිමින්, අවසානයේ දී සම්පූර්ණ නෙලුම් මලම ප්‍රදර්ශනය වන ආකාරයට, එතුමා සර්වෝදය දර්ශනය විස්තර කළේය. සර්වෝදය යන වචනය ද, ඒ තුළින් ශ්‍රී ලංකාවට දිය හැකි ජාතික දර්ශනය ද, මට ඒ අවස්ථාවේ දී ම අවබෝධ විය.

"සබ්බේ සත්ථා සුඛී හොන්තු" යන බුදු වදන, පූර්ණ පෞරුෂෝදයක පදනම හැටියට ගත හැකි සතර බ්‍රහ්ම විහරණය, සමස්තයක් වශයෙන් පවුලේ සිට ලෝක සමාජය දක්වාම අවදි කිරීමට පදනම් කරගත හැකි සතර සංග්‍රහ වස්තුව, ආදී වූ ප්‍රතිපත්ති නිරායාසයෙන්ම මගේ හිතේ මැවී පෙනෙන්නට විය. මහාචාර්ය රාමචන්ද්‍රන් මහතා ළඟට ගොස්, මගේ ගෞරව – ආදර ස්තූතිය එතුමාට දේශනය අවසානයේ දී පිරිනැමීමි.

ඡායාරූප: 203
මා කුලියට ගත්
තුන් පා පැදිය



ඡායාරූප: 204
බුදු හිමියන් ස්නානය
කළ පොකුණ අසළ

එවකට නවදිල්ලියේ ලංකා මහකොමසාරිස්ව සිටියේ හිටපු පොලිස්පතිවරයකු වූ සර් රිචඩ් අලුවිහාරේ මහතාය. අපේ කණ්ඩායම එතුමා හමුවීමට ගියෙමු. චාන්දනී චෞක් නැමැති කඩමණ්ඩියට ගොස් රුපියලකට මල් කළඹ දෙකක් මිලට ගෙන, එකක් අලුවිහාරේ මැතිනියටත්, අනෙක එතුමියගේ දියණිය වූ ඔස්මන් ද සිල්වා මැතිනියගේ (ර්නා ද සිල්වා) අතටත් දුන්නා මට මතකය. මට මතක හැටියට පළමුවන ලේකම් වශයෙන් එහි සේවය කළේ ඒ. බස්නායක මහතාය. දිනක් මහ කොමසාරිස් කාර්යාලයට ගිය විට, එතුමාගේ බත් මුල මා සමඟ බෙදාගෙන අනුභව කළ හැටි මට අදත් මතකය.

ආචාර්ය විනෝබා භාවේ තුමා හමුවීමට උවමනා බව පවසා, ඒ සඳහා මහ කොමසාරිස්තුමාගෙන් උදව් ඉල්ලීමි. ඔහු පන්ජාබය බාර උප ඇමතිවරයකු වූ ෂර්මා නැමැති මහතෙකුට මා හඳුන්වා



ඡායාරූපː 205
අශෝක කුලුණ
අසළ

ඡායාරූපː 206
ධර්මපාල ප්‍රතිමාව
අසළ

දුන්නේ ය. ෂර්මා මහතා, පන්ජාබයට යන බස්වල විස්තර කියා දී, ෂර්ෂා දිස්ත්‍රික්කයේ දී යම් කෙනෙකුට මා මුණගැසෙන හැටියට ද සූදානම් කර දුන්නේය. කෙසේ නමුත් එම පුද්ගලයා පැමිණ සිටියේ නැත. මම අතරමං වීමි. ගුණසිංහ මහතා මා සමඟ පැමිණියේ නැත. ඔහු කලින් ලංකාවට යෑමට සූදානම් කරගත් නිසාය.

හැම දේ වෙන්නේ හොඳට යැයි කීමක් තිබේ. ජීප් රථයකින් එතැනට පැමිණි මහත්මයෙක් සමඟ කතා කළෙමි. ඔහු පන්ජාබ් විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරයෙකි. භූදාන් කමිටුවේ ලේකම්ද වේ. ඉවසන්නට බැරි ශීතල සන්ධ්‍යාවකි. මා ගැන විස්තර කී විට, ඔහු මා විනෝබා භාවේ තුමා එදා රෑ සිටි කඳවුරට ගෙන ගියේය. එතරම් බ්ලැන්කට් සංඛ්‍යාවක් පොරවාගෙන කවදාවත් මා නිදාගෙන නැත.



ඡායාරූප: 207
ධර්මපාල පාර
(සාරනාත් අබියස)

උදේ පහට පමණ මම අවදි වීමි. අන් සියල්ලෝම නැගිට ඒ කිට්ටුව තිබෙන කුටියක් ළඟට ගොස් වාඩිවී සිටිනු පෙනිණි. ඒ පිරිස ඉදිරිපිටම වාඩි වී සිටියේ විනෝබා භාවේ තුමාය. එම රැස්වීම අවසන් වූ විගස, විනෝබා තුමා මුණගැසීමට මම තැත් කළෙමි. එහෙත් එතුමාගේ ලේකම්වරිය එයට ඉඩ නො දුන්නාය. ඇය පැවැසුවේ එතුමා මේ දිනවල කිසිවෙක් සමඟ කතා නොකරන බවය. මා කළේ එම දොරෙන් පිට ව ලේකම්වරිය එළියට එන තුරු බලා සිට, අනික් දොරෙන් ඇතුලුව කෙලින්ම විනෝබා භාවේ තුමා සමඟ කතා කිරීමය. ඔහුට ආචාර කළ මම, මා පිළිබඳ විස්තරයක් කළෙමි. ඔහු මගෙන් දිගටම ප්‍රශ්න වැලක් අසාගෙන ගියේය. ඒ සැමට ම මම උත්තර දුනිමි. ලංකාවේ තිබෙන ජාති, ආගම්, භාෂා, දේශපාලන පක්ෂ සංඛ්‍යාව ආදී සියල්ල ගැන සඳහන් කළ එතුමා, 'මේ සියල්ල එකිනෙකට වැඩි කළ විට ලංකාව බිංදුවට සමාන' බව පැවැසුවේය.

මේ පිළිබඳ මට අසතුටක් ඇති වූවත්, එතුමා බිංදුව එකෙන් බෙදුවාම ලැබෙන්නේ මොකක් දැයි මගෙන් ඇසීය. 'අනන්තය' යැයි මම උත්තර දුනිමි. 'ඔබේ රට දියුණු කිරීමට අනන්තයක් ක්‍රම තිබෙනවා. ඒ සඳහා පිටරටට ගැතිවෙන්නට වුවමනා නැහැ. ඔබ යා යුත්තේ ධම්මපදය තුළටයි. කෝ ඔබේ ධම්ම පදය?' යැයි එතුමා මගෙන් විමසීය. ධම්මපදයේ ගාථා බොහොමයක් මට කටපාඩම් බැව් කී විට, ධම්මපදයේ ගාථාවක් සජ්ඣායනය කළ එතුමා, නිතරම තමා ළඟ ධම්මපදය තබා ගත යුතු බව පැවැසුවේය.

ඇත්තවශයෙන්ම, එතුමාගේ "ඒකේන භෝගේ භුංජෙයිය" යන ගාථාවේ දැක්වෙන අදහස මත, සර්වෝදය අද නව බැංකු ක්‍රමයක් ගොඩනහා තිබේ. අර්ථ – ධර්ම – විද්‍යාව නම්වූ නව ආර්ථික දර්ශනයක් ද ලංකාවේ ගැමි ජනතාවට හඳුන්වා දී තිබේ. දේශීය සාරධර්ම සහ සංවර්ධනය තුළින් ලංකාවට නව මාවතක් ගොඩනඟන ලෙස එතුමා මට උපදෙස් දුන්නේය.

විනෝබා තුමා නැගිට පාද යාත්‍රාව ආරම්භ කළේය. ඒ ගමේ නම ජමාල් නම් විය. මම ද මගේ බෑගය ඒ සමඟ ගිය ජීප් රථයක දමා සැතපුම් පහක් පමණ පයින්ම ගමන් කළෙමි. ඊළඟ කඳවුර බැඳ ගත් නිර්වාන් නැමැති ගම්මානයට අන්තිමටම ළඟා වූයේ මමයි. කුඩා කඳු ගැටයක වාඩිවී, එතුමා වටා වාඩිවී සිටි දෙතුන් සීයක් පමණ වූ පිරිසට එතුමා කියා දුන්නේ දම්සක් පැවැතුම් සූත්‍රයයි. එතුමා සමඟ බෞද්ධයෙක් සිටින නිසා, බුදුරජාණන් වහන්සේ දේශනා කළ ප්‍රථම ධර්ම සූත්‍රය කියා දෙන බව එතුමා පැවැසීය. එතුමාගේ දේශනය අවසානයේ දී මිනිසුන් තමන්ගේ ඉඩකඩම්වල ලිය කියවිලි පමණක් නොව, රන් ආභරණ ආදිය ද වැළ නොකැඩී පැමිණ එතුමාට පරිත්‍යාග කළහ.*

භූදාන් ව්‍යාපාරය ලංකාවේ ආරම්භ කරන්නට යැයි එතුමා මගෙන් ඉල්ලා සිටියේය. ඒ වෙනුවට ශ්‍රමදාන ව්‍යාපාරයක් ආරම්භ කර ඇති බවත්, ඒ තුළින් ප්‍රථමයෙන්ම මිනිසුන් හැදීම මගේ අරමුණ බවත් එතුමාට ප්‍රකාශ කළෙමි.

භූදාන් ව්‍යාපාරය පිළිබඳ ඉගෙන ගත හැකි සෑම දෙයක්ම ඉගෙන ගෙන, විනෝබා හමුවට පැමිණ සිටි ශ්‍රී නේරුතුමාගේ හිටපු ලේකම්වරියක් වූ මිර්දුලා සාරාබායි මැතිනිය සමඟ මම ආපසු නවදිල්ලියට පැමිණියෙමි.

ශ්‍රී නේරු තුමා විසින් ශ්‍රී ලාංකික නියෝජිත පිරිසට දුන් තේ පැන් සංග්‍රහයකට ද අපි සහභාගි වීමු. රාෂ්ට්‍රපති භවන්, ගාන්ධි ස්මාරකය, බිර්ලා නිවස ආදී වූ ඓතිහාසික තැන් රැසක් ද නරඹා ආපසු ශ්‍රී ලංකාවට ආවෙමි. ගුණසිංහ මහතා මට දින කීපයකට කලින් බොම්බාය හරහා ලංකාවට පැමිණියේය.

---

* මා මේ පිළිබඳ ලියන ලද සවිස්තර සටහන් ගුණදාස ලියනගේ මහතා විසින් 'දෙල්ගහ යට ගෙදර විප්ලවය' යන පොතේ සවිස්තර ව ලියා ඇති නිසා නැවතත් විස්තර නොකරමි.

56

විනෝබා කවුරුද?

එදා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ කුරිරු රැහැනට අසුවී දීනතාවයෙන් මිරිකෙමින් සිටි භාරත ජනතාව මහත්මා ගාන්ධි තුමාගේ නිදහසේ කාහල නාදයෙන් අවදි විය. අද එතුමා ගිය මග ම ගනිමින්, ආචාර්ය විනෝබාභාවේ තුමා අසමගියෙන් හා තරහයෙන් බෙදී සිටින ලෝකයකට බලාපොරොත්තුව සහ විශ්වාසය දෙමින් සාමයේ හඬ පතුරුවයි.

ඡායාරූප: 208
ආචාර්ය විනෝබා භාවේ තුමා

සත්‍යය, අහිංසාව සහ ආත්ම හරණය (මම, මගේ යන දෘෂ්ටිය හැරීම) යන අවි තුන පමණක් රැගෙන භාරතයේ ගම් නියම්ගම් පයින්ම තරණය කරමින්, දහස් ගණනක ශාන්ති සේනාවක් (සාම හමුදාව) මෙහෙයවන විනෝබා කවුද?

මේ ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයා මුණ ගැසීමේ වාසනාව මම ලැබුවෙමි. ඔහුගේ වයස අවුරුදු හැට පහකි. එහෙත් වැහැරී ගිය සිහින් සිරුරෙන් හා පැසුණු දික් වූ රැවුලෙන් හෙතෙම ඊට වඩා වයෝවෘද්ධ බව කෙනෙකුට පෙනේ.

ඔහු සතු කිසිවක් මෙලොව නැත. 'මගේ පරමාර්ථය මගේ ජීවිතය ශූන්‍යයකට (බින්දුවකට) සමාන කිරීම'ය යයි විනෝබා කියයි. උදෑසන දෙක හමාරට නැඟිට, රාත්‍රී නවය හමාර වන තෙක් ගෙවන විනෝබාගේ දින චරියාවම ඔහු ගැන දැන ගැනීමට ප්‍රමාණවත් වේ.

නවදිල්ලියට සැතැපුම් එකසිය පනහක් පමණ ඔබ්බෙහි පන්ජාබ් ප්‍රදේශයේ ෂර්සා නමැති කුඩා නගරයක් තිබේ. මේ නගරයේ සිට

සැතපුම් දාහතක් පමණ ඈත පිහිටි ජමාල් නැමති කුඩා පිටිසර ගමකි. මට විනෝබා පළමුවරට මුණ ගැසුණේ මෙහි කුඩා මැටි ගෙයකදීය. මා ඔවුන් අතරට පළමුවෙන් එක් වූයේ විනෝබා නින්දට ගිය පසු රාත්‍රී එකොළහමාරට පමණය.

භූදාන් නායකයා දැක්මට මා සිත් තුළ තුබූ ආශාව නිසා දෝ පන්ජාබයේ දුරුත්තෙහි දී තිබෙන අතිශය ශීත දේශගුණය මට ඉවසන්නට පුලුවන් විය. උදෑසන තුනට මා අවදි වූ විට, භූදාන් පිරිස අවදිව බිම වාඩිගෙන භාවනානුයෝගීව සිටිනු මම දුටුවෙමි. මමත් ඔවුන් හා එක් වූවෙමි. ශාන්තිවාදියකු හා ඔහුගේ දෙවිස්සක ශ්‍රාවක පිරිසක් විසින් ඇති කරන ලද ඒ ශාන්ත නිශ්ශබ්දතාවයෙන්, මගේ ගත සිත නැවී ගියේය. ජීවිතයේ පළමුවරට වචනයට නොනැඟිය හැකි චිත්ත ප්‍රීතියක් විනෝබා වටා තිබුණු ඒ පරිසරයේදී මම වින්දෙමි.

ඡායාරූප: 209 – විනෝබා තුමා මා දුන් ලිපිය කියවයි

භාවනාවෙන් පසු පැය භාගයක් පමණ වේලා විනෝබා සිය අනුගාමිකයින් අමතයි. ඉන් ඉක්බිතිව උදේ හතර හමාර වනතුරු ධර්ම ග්‍රන්ථයකට සවන් දෙයි. හතර හමාරට පාද යාත්‍රාව හෙවත් ගමින් ගමට පයින් යාම අරඹයි. කඩිසරව හැමටම පළමු ගමන් කරන විනෝබා, උදෑසන පහමාරට නැවතී විඩා හරියි. දවසේ දෙවැනි භාවනාව සහ අනුශාසනාව කෙරෙන්නේ මෙසේ යන අතර මග එළිමහන් තැනකය. නැවත පාද යාත්‍රාව අරඹයි. හිරු එළිය වැටී තවත් දෙතුන් පැයක් ගමන් කරන විනෝබා අලුත් ගමකට පැමිණෙයි.

ඡායාරූප: 210
විනෝබා තුමා
දිනපතා ජනතාව
අමතයි



ජමාල් සිට තිර්වාන් නමැති ගමට විනෝබා පාද යාත්‍රා කළ හැටි මට වෙසෙසින් සිහිවේ. තිර්වාන්හි එළිමහනේ සාදන ලද තාවකාලික වේදිකාවක් ඉදිරිපිට දහසකට වැඩි පිරිසක් "හ්ම්" යන ශබ්දයක්වත් නැතිව දොහොත් මුදුන් තියා සිටිත්. විනෝබා වේදිකාව වෙතට බිම බලා ගෙන ගොස් එහි අසුන් ගනී. පිරිසට ආචාර කරයි. "ජය ජගත් බාබා" (මුලු ලෝකයට ම ජය වේවා, සීයා) යනුවෙන් පිරිස ඝෝෂා කරත්, "ජය ජගත්" යනුවෙන් බාබා ආචාරය පිළිගනියි. සංස්කෘත ශ්ලෝකයක් කියා මිනිත්තු කිහිපයක් බාබා කථා කරයි. ඉක්බිති මුලු පිරිසම විනාඩි කිහිපයක් භාවනා කරයි. නැවත විනෝබා දේශනය කරයි. අවසානයේ සම්පූර්ණ නිශ්ශබ්දතාවයක් පවතී. පිරිසේ එක් එක් අය නැගිට බාබාට ඉඩම් පරිත්‍යාග කරයි. අක්කර කාලක සිට අක්කර දහස් ගණන් හිමි අය පවා කැමැත්තෙන්ම සිය ඉඩම් පවරා දෙති.

භූදාන් සේවකයෝ ගෙයක් ගෙයක් පාසා යති. ඉඩම් දානය පිළිබඳ ඔප්පු හෙවත් භූදාන් පත්‍රවලට ගම්මු අත්සන් තබත්. මේ අතර විනෝබා පොත් පත් බලමින්ද, ලිය කියවිලිවලට පිළිතුරු සපයමින් ද කාලය ගෙවයි. දවල් එකේ සිට දෙක දක්වා විවේකිව සිටියි. දෙකයි පහළවට පමණ භූදාන් සේවකයෝ රැස් වෙති. එක් එක් භූදාන් පත්‍රය විනෝබා හොඳින් කියවා අත්සන් තබයි. ගමේ නොයෙක් දෙනා පැමිණ එතුමා හමුව අවවාදානුශාසනා ලබති. සවස හතරට නැවත එළිමහනේ පැවැත්වෙන භාවනා රැස්වීමකි. මෙහි සිය දහස් ගණන් රැස් වේ. ආගම, දේශපාලනය, ලෝක සාමය, සමගිය ආදී නානා විෂයයන් අළලා කෙරෙන ඒ දේශනය ගම්මුන් විසින් නගන ලද ප්‍රශ්න වලින් ද විනෝබා ගම්මුන්ගෙන් අසන ප්‍රශ්නවලින් ද, ඒවාට ලැබෙන පිළිතුරුවලින් ද පසු නිමා වේ.

"ග්‍රාම් සුඛී අම් සුඛී"

"ගම්මු සැප සේ වෙසෙත් නම් එය අපගේ සැපතයි"

"අපේ ගම ගම්මුන්ට අයිතිය"

"අපේ ගම එක ම පවුලකි" යනුවෙන් අගනා වදන් ඒ නූගත් ජනයාගේ මුවින් පිට වෙන තරමට ම විනෝබා ගැමි සිතේ පෙරළියක් ඇති කරයි.

සන්ධ්‍යා කාලය කුටිය තුළම ගත කරන විනෝබා, අමුත්තන් පිළිගන්නේය. ඔවුන්ගේ සියලු ප්‍රශ්නවලට ඉවැසීමෙන් කන් දී, පැහැදිලිවත්, කිසිම සැකයක් නොමැති ලෙසත්, පිළිතුරු දෙයි. මේ සම්මුඛ සාකච්ඡාව ලබා ගැනීමට භාරතයේ අගමැති ඇතුලු මැති ඇමතිවරු පමණක් නොව ලෝකයේ නොයෙක් රටවල කීර්තිමත් පුද්ගලයෝද, වරින් වර බාබා ළඟට එති. විනෝබා සමඟ දීර්ඝ සාකච්ඡාවකට මට ඉඩ ලැබුණේ මෙවැනි සන්ධ්‍යාවකදීය. අප රටේ ප්‍රශ්න මෙන්ම, මා නැගූ ලෝක සාමය ආදී ප්‍රශ්නවලට ද එතුමාගේ මුවින් පිට වූ හැම වචනයක්ම, අපේ තරගකාරී ලෝකයට වැටෙන මිණි මුතු සේ මට දැනිණ. නියම මනුෂ්‍යයකු මුණ ගැසී, ජීවිතයේ ලොකුම පාඩම් ඉගෙන ගත් මම, තව දුරටත් ඉවැසිය නොහී, විනෝබාගේ දෙපා මත මගේ හිස තබා වැන්දෙමි.

දවස නිමා වී රාත්‍රී නවයයි තිහට පමණ නින්දට යන්නට පෙර, භූදාන් සේවකයෝ නැවත එතුමා හමු වෙති. ගමේ පුද්ගලික ඉඩම්

ඡායාරූප: 211
විනෝබා තුමාගේ චරිත කතාව ලියූ ශ්‍රී සුරේෂ් රාම් මහතා සමග

අයිතිය එදින නිමා විය. දුප්පතා මෙන්ම, පොහොසතා ද, තම හිමිකම් කැමැත්තෙන්ම පවරා දීම නිසා, ඒ ගම එතැන් සිට ග්‍රාම්දාන් ගමකි. ගමේ අයිතිය, ගමේ සියල්ලන්ටම පොදුවේය. එහි ආරක්ෂාව සහ සංවර්ධනය සඳහා ග්‍රාම මණ්ඩලයක් පත් කොට, භූදාන් ව්‍යාපාරයට ජීවිතය පරිත්‍යාග කොට තිබෙන "ජීවන් දායකයෙක්" ද ඔවුන්ට මග පෙන්වන්ට සිටී. දවසේ සාම වන්දනාව නිම වූ ආචාර්ය විනෝබාභාවේ ශාන්තව නින්දට යයි. පසුදින උදේ හතරයි තිහට නැවත පාද යාත්‍රාව අරඹයි. එක්දහස් නවසිය පනස්එකේ අප්‍රේල් මස සිට අද වනතෙක් (එක්දහස් නවසියහැට – මේ ලියන මොහොතතෙක්) සැතැපුම් තිස්පන්දාහකට අධික දුරක් විනෝබා පාද යාත්‍රා කර ඇත.

ලක්ෂ සංඛ්‍යාත ජනයා කුසගින්නෙන් හා භේදවලින් බේරා ගනිමින්, ධන හා ඉඩම් ලෝභයෙන් දුප්පතුන් පෙළන දරදඬු හදවත් මොළොක් කරමින්, අධර්මය ඇති තැන ධර්මය පතුරවමින්, සැතැපුම් දහස් ගණන් පයින්ම යන මේ වයෝවෘද්ධ සාන්තුවරයාගේ ජීවිතය මෙන්ම, ඔහු බිහි කළ භූදාන්, ග්‍රාමදාන්, සම්පත්ති දාන්, ජීවන් දාන් සහ ශාන්ති සේනා යන ව්‍යාපාරයන් ද එක සේ රසවත්ය.



ඡායාරූප: 212
විනෝබා භාවේ තුමා නූල් කටියි

57

සර්වෝදය ජාතික සංස්කෘතියේ අංගයක් වෙයි

මරදානේ නිව් සිටි ස්ටෝරුව පිහිටියේ මරදාන දුම්රිය ස්ථානයේ සිට මිනිත්තුවක් පමණ පයින් යන දුරය. ඒ නිසා ලංකාවේ ඕනෑම තැනක සිට, එන ඕනෑම කෙනෙකුට අප නිවසට පැමිණීම ඉතා පහසු ය. එහෙත් එසේ පැමිණෙන අයට තේ කෝප්පයකින් සංග්‍රහ කිරීමට තරම්වත් අපට වත්කම් තිබුණේ නැත.

අපේ එකම ආදායම වූයේ මගේ මාසික පඩියයි. නීතාට ද මරදානේ මහාබෝධි විද්‍යාලයේ පත්වීමක් ලැබුණත්, ඒ සුළු වේතනයද අප දෙදෙනාට හා ගෙදර සිටි අන් අයගේ නඩත්තුවට මදිය. මගේ වේතනයෙන් හරියටම තුනෙන් එකක් ගෙවල් කුලිය සඳහා නිව්සිටි ස්ටෝර්ස්වලට දිය යුතුය. පසුව මෙය පඩියෙන් බාගයක් පමණ වූයේ ගෙවල් කුලිය පී. ඊ. පෙරේරා මහතා විසින් වැඩි කළ නිසාය.

ඡායාරූප: 213
සොමි මීගම මැතිනිය

අම්මා වසරකට දෙවරක් ගමේ සිට අපේ කුඹුරෙන් ලැබෙන කැකුළු සහල් බුසලක් හෝ දෙකක් අපට ගෙනත් දුන්නාය. මතුගම ඕවිටිගල විජේගුණවර්ධන මහතා ද ඉඳහිට සහල් ටිකක් ගෙනාවේය. දෙනියායේ ටී. ඩබ්ලිව්. රත්නායක මහතා, (තිලක් අයියා) කොළඹ එන විට යමක් මෙසේ අප නිවසට ගෙනැත් දුන්නේය. නීතාගේ තාත්තා ද කොළඹ එන විටකදී, සහල් පොල් ටිකක් ගෙනත් දීම සිරිතක් කර ගත්තේය. ඉතා අරපරෙස්සමින් එහෙත් අමාරුවෙන් හා සිනහ මුහුණෙන් යුතුව නීතා ගෙදර පරිපාලනයට, කුටුම්භ සංරක්ෂණයට, පුරුදු වූවාය. ගෙදරට පැමිණි කිසිවකු ඇයගෙන් ආගන්තුක සත්කාර නොලබා ගියේ නැත.

මා සොමී මීගම මැතිනිය හඳුනාගත්තේ මහරගම ගුරු අභ්‍යාස විද්‍යාලයේ ඉගෙන ගන්නා කාලයේදීය. එතුමියගේ නිවසේ දී ආචාර්ය ඩී. සී. පී. බෙනරගම සභාපති හැටියටත්, රත්නදේශප්‍රිය සේනානායක මහතා සහ මම සම ලේකම්වරුන් හැටියටත්, සොමී මීගම මැතිනිය භාණ්ඩාගාරික හැටියටත් පත් කරගෙන නොදියුණු 'සමාජ සංවර්ධන මණ්ඩලය' නමැති සංවිධානයක් පිහිටුවා ගතිමු. එහෙත් රත්න දේශප්‍රිය සේනානායක මහතා සහ බෙනරගම මහතා යන දෙපලම පූර්ණ කාලීනව දේශපාලනය කළ නිසා, එම සංවිධානය ක්‍රියාත්මක නොවී ය. එහෙත් සොමී මීගම මැතිනිය සමග මම නිතර ඇසුරු කරමින් ශ්‍රමදාන කඳවුරු සංවිධානය කළෙමු. කඳවුරු සංවිධාන කිරීමේදී බොහෝ විට බර පැන දැරුවේ එතුමියයි. සමස්ත ලංකා බෞද්ධ කාන්තා සම්මේලනයේ සභාපතිනිය ලෙස ඈය බොහෝ කලක් කටයුතු කළාය.

නීතාට අවශ්‍ය ඇඳුම් පැළඳුම් ගැනීමට අප අත මුදල් නොවීය. මේ දැනගත් සොමී මිගම මැතිනිය, වරින්වර ඇයට සාරියක්–දෙකක් ගෙනැත් දුන්නාය. පුංචි අක්කා ද ඇගේ ශක්ති ප්‍රමාණයේ හැටියට සාරියක් – දෙකක් ගෙනැත් දුන්නාය.



ඡායාරූප: 214

අති පූජ්‍ය කලුකොඳයාවේ ප්‍රඥාශේඛර මහ නාහිමියන් සහ පූජ්‍ය අඹන්වැල්ලේ පඤ්ඤාශේඛර නාහිමියන් මෙත් මැදුර නරඹද්දී පී. ඒ. කිරිවන්දෙනිය මහතා යමක් තේරුම් කරයි.

විද්‍යොදය පිරිවෙන විද්‍යොදය විශ්ව විද්‍යාලය තත්වයට පත්වීමෙන් පසුව, තාවකාලිකව පිරිවෙන – නාලන්දා විද්‍යාලයයේ මැද පාසලේ ගොඩනැගිලිවලට ගෙන යන ලදී. පරිවෙණාධිපති ගරු කලුකොඳයාවේ

පඤ්ඤාශේඛර මහා නාහිමියන්, කරුණානන්ද මහතාගේ අවසරය ගෙන, සන්ධ්‍යා භාගයේ ඉංගිරිසි, සෞඛ්‍යය හා ගණිතය පිරිවෙනේ හාමුදුරුවන්ට ඉගැන්වීමට මට බාර දුන්නේය. මේ නිසා ලංකාවේ දස දිශාවෙහිම සංඝයා වහන්සේලා දැන හැඳින ගැනීමට මට පුලුවන් විය. මගේ මහන්සියට රුපියල් දෙසීයක දීමනාවක් ලැබුණේය.

ඡායාරූප: 215
වෛද්‍ය එඩ්වින් මාරසිංහ මැතිතුමා හා එම මැතිනිය

වෛද්‍ය එඩ්වින් මාරසිංහ මහතා -ගේ පුතාලා සියලු දෙනාම, නාලන්දාවේ ඉගෙන ගත්හ. ඒ නිසා නාලන්දාව අසල ගෙයක් එතුමාට තිබුණේය. දිවා ආහාරය සහ රාත්‍රී ආහාරය මා තනිකඩ කාලයේ දී ඒ ගෙදරින් ගැනීමට දොස්තර මහතා නියම කර තිබුණේය. පසුව එය දිවා ආහාරයට පමණක් සීමා විය. කෙසේ හෝ ළමයින්ට අවශ්‍ය පොත පත කියාදීම ද මම එහි ගිය අවස්ථාවල දී කළෙමි. සර්වෝදය නඩත්තුව සඳහා යැයි එතුමාගේ මැතිනිය සෑම මසකදීම මගේ අතේ රුපියල් දෙසීයක් තැබුවාය.

ලංකා ගුවන් විදුලි සේවයේ කරුණාරත්න අබේසේකර, මඩවල එස්.රත්නායක, එච්.එම්. ගුණසේකර, ලලිත් එස්. මෛත්‍රීපාල, සරත් විමලවීර, චිත්‍රානන්ද අබේසේකර ආදී මගේ හිතවත්හු වරින් වර ගුවන් විදුලි වැඩ සටහන්වලට මා සම්බන්ධ කර ගත් නිසා, එයිනුත් රුපියල් සියයක විතර අමතර ආදායමක් ලැබිණි. පුවත් පත්වලට ලිපි සැපයීමෙන් ද සුලු මුදලක් උපයා ගතිමි.

ගුවන් විදුලිය ගැන සඳහන් කළ නිසා, එකදහස් නවසිය අනූඑකේ දී පමණ චිත්‍රානන්ද අබේසේකර මහතාගේ පිළිගැනීමේ උත්සවයකට ගොස් වූ සිද්ධියක් ද මෙහි සඳහන් කරමි.

මහාචාර්ය බෙල්ලන්විල විමලරතන හිමියන්ගේ ප්‍රධානත්වයෙන් බෙල්ලන්විල පන්සලේ ධර්මශාලාවේ සිංහල ස්වදේශීය සේවයේ සිංහල සේවා අධ්‍යක්ෂ වශයෙන් තේරී පත් වූ චිත්‍රානන්ද අබේසේකර මහතා පිළිගැනීමට උත්සවයක් සංවිධානය කර තිබුණේය. මෙයට මට ආරාධනා පත්‍රයක් ලැබුණු අතර, අබේසේකර මහතා ඇතුලු කිහිප දෙනෙක්ම

කෙසේ හෝ මෙම උත්සවයට සහභාගි වන මෙන් මට ආරාධනා කර සිටියහ.

මේ දිනවල ජනාධිපති ආර්. ප්‍රේමදාස මහතාගේ උදහසට මා තදින්ම ලක්ව සිටි යුගයක් බැවින්, මෙම උත්සවයට සහභාගි වන නමුත්, මට ඉදිරි අසුනක් දීමෙන් හෝ කතාවක් දීමෙන් හෝ වැළකෙන මෙන් මම සංවිධායක වරුන්ගෙන් ඉල්ලා සිටියෙමි. ඔවුන් එයට එකඟ වූ නමුත්, මම රැස්වීම් ශාලාවට ගිය විට මහාචාර්ය විමලරතන හිමියෝ පැමිණ මා ඉදිරි අසුනක බලයෙන් වාගේ වාඩි කරවූහ.

මා මෙතැන කතා කළහොත් චිත්‍රානන්ද අබේසේකර මහතාගේ පත්වීම අවලංගු වීම සිදුවනු ඇතැයි මා කී නමුත්, සංවිධායකයෝ කෙසේ හෝ මට කතාවක් කිරීමට බල කළහ. බැරිම තැන මම ඒ ඉල්ලීම පිළිගෙන කතාවක් කිරීම පසෙක තබා කතාන්තරයක් කීවෙමි. ඒ කතාන්තරය මෙසේ ය.

ඊජිප්තුවේ ජනාධිපති වශයෙන් අබ්දුල් නසාර් මැතිතුමා පාලනය කරන යුගයේදී විසි හතර පැයම වාගේ ගුවන් විදුලියෙන් විකාශනය වූයේ එතුමාගේ දීර්ඝ දේශනයි. ඒ කාලයේ රූපවාහිනිය තිබුණේ නැති අතර, සෑම පුරවැසියෙක්ම වාගේ ගුවන් විදුලි යන්ත්‍රයක් ලබා ගැනීමටත්, එයට සවන් දීමටත් ආශා කළේ ය.

ජනාධිපති නසාර්ට නිතරම ඇහුම්කන් දුන් දුප්පත් ගොවි සොහොයුරන් දෙදෙනෙක් සිටියා. මේ අයට ගුවන් විදුලි යන්ත්‍රයක් නොතිබුණු නිසා ඔවුන් ඇහුම්කන් දුන්නේ අසල්වැසි ගොවියකුගේ ගුවන් විදුලි යන්ත්‍රයකටයි.

එක කන්නයක දී ඔවුන්ගේ අස්වැන්න හුඟක් සරු වුණා. වැඩිපුර අතට ලැබුණු මුදල්වලින් කුඹුරේ නඟුල ඇදීමට බූරුවෙකුත්, ජනාධිපතිතුමාගේ දේශන ඇසීමට ගුවන් විදුලි යන්ත්‍රයකුත් ගැනීමට ඔවුන් තීරණය කළා. දැන් ඔවුන්ට කුඹුරේ වැඩ කරන ගමන් දිගටම ජනාධිපතිතුමාගේ දේශනවලට සවන්දීමට පුලුවන්.

දවසක් ජනාධිපතිතුමාගේ කටහඬ ඔවුන්ට ඇසුණු නමුත්, කුඩා ගුවන් විදුලි යන්ත්‍රය පෙනෙන්නට නොතිබුණේය. කට හඬ දිගටම ඇසිණි. සොයුරන් දෙපළ හිටි හැටියේම උඩ පැන පැන සතුටු කඳුලු වගුරවමින් කාරණය තේරුම් ගත්හ. අයියා මල්ලීට මෙසේ පැවැසුවේය:

"අනේ මල්ලියේ, මෙච්චර කල් අපි ඇහුවේ ජනාධිපතිතුමාගේ කට හඬ පමණයි. දැන් අපිට එතුමා ඇස් ඉදිරියේ ම පෙනෙනවා."

බූරුවා කුඩා ගුවන් විදුලි යන්ත්‍රය ගිලගෙන තිබුණේය.

මුලු සභාවම සිනාසුනු අතර මම මගේ අසුනේ වාඩි වුණෙමි.

මා යන යන තැන රහස් පොලීසියෙන් සිටි බැවිනුත්, මා පසුපස මේ කාලයේ එක්දහස් නවසියඅනූව මුල් භාගයේ සෙවණැලි ගමන් කළ බැවිනුත්, මම අවසර ගෙන උත්සව සභාවෙන් හිමිහිට පිටවී ගියෙමි.

* *

ඡායාරූප: 216
ජී. ඩී. වික්‍රමරත්න මහතා

කැලණිය රෝයල් කන්පැක්ෂනරි සීනිබෝල සමාගමේ අධිපති ජී. ඩී. වික්‍රමරත්න මහතා එකල පදිංචිව සිටියේ කොටහේනේ නිවසකය. එතුමා පියදාස සිරිසේන මහතාගේ දියණිය විවාහ කරගෙන සිටි ඉතා උගත් මුහුකුරා ගිය චරිතයකි. දිනක් එතුමා මට අලුත් බයිසිකලයක් ගෙනැවිත් දී, හැකි හැම අවස්ථාවකම සවස කොටහේනේ ගෙදරට එන ලෙස ඉල්ලා සිටියේය. මේ පාපැදිය මට බොහෝ ප්‍රයෝජනවත් විය. මා විවාහ වී මගේම පවුල අරඹන තුරු වික්‍රමරත්න පවුලේ හා මාරසිංහ පවුලේ දරුවන් මා ආශ්‍රය කළේ මගේ ම නංගිලා-මල්ලිලා හැටියටය. අදත් ඒ සම්බන්ධය එසේම පවතී.

ඡායාරූප: 217
ජී. ඩී. වික්‍රමරත්න මැතිනිය

කනතොලුව කඳවුරෙන් පසු- කොළඹ තිබෙන සෑම විදුහලකින්ම වාගේ රැස්වීම් අමතා කතා කිරීමට මට ඇරයුම් ලැබිණි. දහම් පාසල් හා විවිධ සමාජසේවා සංවිධානවලින් ද, දිනපතා ඇරයුම් ලැබිණි. කොළඹ නගරයේ හා තදාසන්න පෙදෙස්වල එක්දහස් නවසිය පනස්අටේ සිට එක්දහස් නවසිය හැටඑකේ අතර කාලයේ දී, මා නොගිය පාසලක් - පන්සලක් නැති තරම්ය. ඒ හැම රැස්වීමක් අවසානයේම අප සංසදයට පිරිසක් එකතු කර ගැනීමත්, ඒ අය ඊළඟ කඳවුරට සහභාගි කරවීමත් මගේ ශිල්ප ක්‍රමය විය.

එම්. ඩබ්ලිව්. කරුණානන්ද මහතා - නාලන්දාවේ සිට ආනන්දයේ විදුහල්පති වශයෙන් එක්දහස් නවසිය හැටදෙකේ මාර්තුවල දී මාරුවී

යෑම මගේ කටයුතුවලට ලොකු පහරක් විය. නාලන්දා සමාජ සේවා සංගමයෙන් මා බලාපොරොත්තු ජාතික පුනරුත්ථාපන ව්‍යාපාරය ඉටු නොකර ගත හැකි බව මට තේරුම් ගියේ එක්දහස් නවසිය හැටේ දීය. ඒ නිසා ලංකා සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය නමින් එක්දහස් නවසිය හැටේ සිට අපේ නිවසේ ලිපිනය යටතේ නව සංවිධානය ආරම්භ කෙළෙමි. මේ වන විට 'ශ්‍රමදාන' යන වචනය රට පුරාම ජනප්‍රියව තිබුණේය. 'ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමය' යන නමින් සංගමය නම් කළේ මීට ටික කලකට පසුවය. එනම් එක්දහස් නවසිය හැටදෙකේ අප්‍රේල් මාසයේදීය.

මා විශ්වාස කළේ රාජ්‍ය නීතිය සහ රාජ්‍ය ශක්තියට වඩා ජන නීතිය සහ ජන ශක්තිය කෙරෙහිය. රජයකට තිබෙන්නේ දණ්ඩ ශක්තියයි. එය පදනම් කොට කරන සෑම ක්‍රියාවක්ම උපරිම ප්‍රතිඵල ගෙන දෙන්නේ නැත. ධර්ම නීතිය සහ ධර්ම ශක්තිය කෙරෙහි විශ්වාසය තබා කටයුතු කිරීමෙන්, බොහෝ කල් පවතින ප්‍රතිඵල සහිත නිර්මාණාත්මක ක්‍රියා කළ හැකිය.

මට අවශ්‍ය වූයේ ධර්ම නීතියත්, ජන නීතියත්, ධර්ම ශක්තියත්, ජන ශක්තියත්, දණ්ඩ නීතිය සහ රාජ්‍ය නීතිය අබිබවා සමාජයේ ක්‍රියා කෙරෙන තත්වයක් ඇති කිරීමයි. සමහරු සිවිල් සමාජයක් ගොඩනැගීම ගැන වර්තමානයේ දී කතා කරනු ඇසේ.

මගේ සටහන් පොතෙහි පවතින සමාජ ක්‍රමය පිළිබඳ කරුණු දහයකුත්, ඇති කළ යුතු සමාජ ක්‍රමය පිළිබඳ කරුණු දහයකුත් මා ලියා තැබුවේ ඒ දිනවල දීය. අහිංසාවාදී නිර්මාණාත්මක ක්‍රමවලින් පවතින සමාජ ක්‍රමය, මා විශ්වාස කරන පරමාදර්ශී සමාජ ක්‍රමයකට හැරවීමට ක්‍රියා මාර්ග නිර්මාණය කිරීම මා කැපවුණු කාර්ය සාධනය විය.

ශ්‍රමදානය එහි පළමු ක්‍රියා මාර්ගය විය. මෙහි මූලික අරමුණ වූයේ රජය කළ යුතු වැඩක් නොමිලයේ කර දීම හෝ කම්මැලි මිනිසුනගේ අවශ්‍යතා වෙනත් අයගේ ශ්‍රමයෙන් සම්පූර්ණ කර දීම නොවේ. මෙහි පරමාර්ථය වූයේ පූර්ණ පෞරුෂෝදයකින් යුත් පුද්ගලයින්, කණ්ඩායම්, පවුල්, සමූහ හා ගම් වශයෙන් ස්ව ශක්තියෙන් නැගිටීමට ජනතාව පෙළඹවීමයි. ශ්‍රමයට තිබෙන ආත්මාර්ථකාමිත්වය නැති කොට ශ්‍රමය පරිත්‍යාග කිරීමෙන් අනාත්මීය හැඟීම් ශිෂ්‍යයින් තුළ ඇති කිරීමයි. බෞද්ධ සංස්කෘතියේ මූලික පදනම වූ සතර බ්‍රහ්ම විහරණය සහ සතර සංග්‍රහ වස්තුව මේ සඳහා ගුරු උපදේශ වශයෙන් ගතිමි.

මෙහි දී දාර්ශනික වශයෙන් මට හුඟක් උපකාර කළේ මහාචාර්ය කේ.එන්. ජයතිලක මහතා සහ මහාචාර්ය එල්.ජී. හේවගේ මහතාය. ඔවුන් දාර්ශනිකව නොපැහැදිලි තැන් පැහැදිලි කර දුන් අතර, මේ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමෙහි ලා මා ගත් මඟ බුද්ධ ධර්මයට සම්පූර්ණයෙන් එකඟ යැයි මට වාචිකව මෙන්ම, ලියුම් මාර්ගයෙන් ද ධෛර්යය දුන්නේ මහනුවර, මාවුස්සාකැලේ ආරණ්‍යවාසීව සිටි ශ්‍රේෂ්ඨ බෞද්ධ පුත්‍ර ඥාණපෝනික මාහිමිපාණන් වහන්සේය.



ඡායාරූප: 218
ගරු ඥාණපෝනික මාහිමි

මා විසින් රට–දැය–සමය ගැන සිතා, සැම දෙනාගේම උදාව අරමුණු කරගත් සමාජ ක්‍රමයකට අවශ්‍ය දාර්ශනික, තාක්ෂණික, සංවිධානාත්මක, ව්‍යුහාත්මක හා ක්‍රියාකාරී වැඩසටහන් නිර්මාණය කිරීමට දිවා රෑ වෙහෙසුනු අතර, හදවතින් ම මා හා බැඳුණු නීතා, ධර්මා ගුණසිංහ, ධර්මසේන සේනානායක, එම්. ඒ. තිලකරත්න, කමල් දිසානායක, විජේදාස මහවත්ත, කර්නල් වීරසේන රාජපක්ෂ, පියසෝම

ඡායාරූප: 219
මා, මහාචාර්ය එල්. ජී. හේවගේ, ඇම්. ඩබ්. කරුණානන්ද මහතා හා
මහාචාර්ය ජේ. ඩී. පී. ජයතිලක සමග

මේදිස්, ඇලෙක්ස් තෙන්නකෝන්, විලියම් කන්දගේ, තිලක් ද සිල්වා, ආර්. එස්. උඩුකුඹුර, කේ. දසනායක, දයා ආනන්ද පෙරේරා හා සෝමා

ද සිල්වා ආදීන් හැරුණු විට, මට සම්බන්ධ වූ බොහෝ දෙනෙක් ක්‍රියා කළේ ඔවුන්ගේ පටු සංකල්පනා ඔස්සේය. එය ඔවුන්ගේ වරදක් නොවේ. එතැනින් එහාට සිතීමට ඔවුන්ගේ එදිනෙදා ලෞකික පදනම් ඔවුන්ට ඉඩනොදුන් නිසාය. එහෙත් ඔවුන්ගෙන් හානියක් ඒ යුගයේ සිදු වූයේ නැත.



ඡායාරූප: 220
මහාචාර්ය එල්. ජී. හේවගේ

රජය පැත්තෙන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවත්, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවත් මා සමඟ උරණ වූහ. විවිධ පාසල්වලින් මා සම්බන්ධ කරගත් සමහර තරුණ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඔවුන්ගේ නොදැනුවත්කම නිසා ඉතා සුළු අඩුපාඩුකම් ඉස්මතු කරගෙන හරස් කැපූහ. මේ නිසා, මෙතෙක් තිලතල උසුලා නැති මා කෙලින්ම සර්වෝදය ප්‍රධාන ලේකම් ධූරය හෝ සංවිධායක ලේකම් ධූරය මා අත ම තබාගෙන, එවකට පක්ෂපාතීව සිටි වැඩිහිටියෙක් සභාපති පදවියේ තබාගෙන මේ මහා ජාතික ව්‍යාපාරය ගොඩනැඟීමට කිසිම බාධාවක් ගණන් නොගෙන වෙහෙසුණෙමි.

* *



ඡායාරූප: 221
ප්‍රධාන ලේකම් ඩී. ජී. පෙරේරා මහතා හා භාණ්ඩාගාරික කමල් දිසානායක මහතා සමඟ

ඡායාරූප: 222
ශ්‍රමදාන කඳවුරක
අවස්ථාවක්

මේ සියලුම කටයුතු කරගෙන යන අතර, හැකි ඉක්මනින් ගුරුවරයකුට අවශ්‍ය සියලුම අධ්‍යාපනික සුදුසුකම් ලබා ගැනීමට ද මම ක්‍රියා කළෙමි.

ආචාර්ය ෆ්‍රැන්සිස් පිල්ලේ මහතාගේ උදව් ඇතිව ආර්ථික විද්‍යාව, බ්‍රිතාන්‍ය ව්‍යවස්ථාව සහ ආර්ථික ඉතිහාසය යන විෂයයන්ගෙන් එක්දහස් නවසිය පනස් පහේ දී මම උසස් පෙළ සමත් වීමි. එක්දහස් නවසිය පනස්එකේ දී ලන්ඩන් විශ්ව විද්‍යාලයේ මැට්‍රික්යුලේෂන් විභාගය සමත් වී සිටි නිසා, ලන්ඩන් විශ්ව විද්‍යාලයයේ විද්‍යාව පිළිබඳ මධ්‍යම යොග්‍යතා විභාගයෙන් ද සමත්ව, ආර්ථික විද්‍යාවෙන් බී.එස්සී උපාධිය ලබා ගැනීමට ද ලේඛ්‍යාරූඪ වී සිටියෙමි. මේ අතර පේරාදෙණිය විශ්ව විද්‍යාලයයේ කලා උපාධිය සඳහා ද ලේඛ්‍යාරූඪ වීමි.

ඡායාරූප: 223
ශ්‍රමදාන කඳවුරක
අවස්ථාවක්

එක්දහස් නවසිය හැටඑකේ දී විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ මධ්‍යම උපාධිය ආර්ථික විද්‍යාව, මානව විද්‍යාව සහ සිංහල යන විෂයයන්ගෙන් සමත් වීමි. එක්දහස් නවසිය හැටහයේ දී ආර්ථික විද්‍යාව, අධ්‍යාපන විද්‍යාව සහ සිංහල යන විෂයයන්ගෙන් උපාධියට පෙනී සිටියෙමි. උපාධිය සමත් වී එක්දහස් නවසිය හැටඅටේ දී උපාධි සහතිකය ලබා ගත්තෙමි.

ඉන් එහාට ගුරුවරයෙක් වශයෙන් මට අධ්‍යාපන උපාධි අවශ්‍ය වූයේ නැත. විදුහල්පති ගුණපාල වික්‍රමරත්න මහතාගේ රෙකමදරුව මත අධ්‍යාපන ඇමති අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල මහතා මට පළමුවැනි ශ්‍රේණියේ විශේෂ ගුරු තනතුරක් ප්‍රදානය කර තිබුණු නිසා, වේතනය අතින් මම උසස් තැනක සිටියෙමි.

* *

කොළඹ 02, ඇල්ස්ටන් පාරේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ජාතික සේවා කාර්යාලයක් විවෘත වූයේ මේ දිනවලදීය. මට මතක හැටියට එයින් සිදු කළ ප්‍රධාන වැඩක් නම්, දෙනියායට යන කෙටි මාර්ගයක් නෙලුව ප්‍රදේශයේ සකස් කිරීම යි. මෙයට අපිදු සහභාගි වීමු. එහෙත් ජාතික සේවාව ජනප්‍රිය වූයේ නැත. හිටිහැටියේ ඇල්ස්ටන් පාරේ තිබූ කාර්යාලයේ නාම පුවරුව 'ජාතික ශ්‍රමදාන සේවාව' යනුවෙන් වෙනස් විය. මේ නිසා ශ්‍රමදානය යනු නොමිලයේ වැඩ කිරීම යන පටු අර්ථය මහජනයාගේ සිත්වලට ඇතුලුවෙමින් තිබූ අතර, අප සංවිධානය කළ කඳවුරු 'සර්වෝදය ශ්‍රමදාන කඳවුරු' හැටියට අපි නම් කළෙමු.

එක්දහස් නවසිය හැටේ, ජූනි මාසයේ දී උණවටුනේත්, අගෝස්තු මාසයේ දී කනාන මාලඹේ ගම්වලත්, අගොස්තු මාසයේ අවසානයේ දී දෙනියායේ වතුරාව යන ප්‍රදේශයේත්, එක්දහස් නවසිය හැටේ සැප්තැම්බර් විසිපස්වෙනිදා හොරගොල්ලේ බණ්ඩාරනායක අනුස්මරණ සෞඛ්‍යදාන කඳවුරත්, සැප්තැම්බර් තිස්වෙනිදා බුලර්ස් පාරේ ධර්මදූත ආශ්‍රමයේ කඳවුරත්, දෙසැම්බර් තුන–හතර දෙදින බුලර්ස් පාරේ සරණ ළමා නිවාසය සැදීමේ ශ්‍රමදානය, දෙසැම්බර් නවවෙනිදා සිට දොළොස්වෙනිදා දක්වා පස්දුන් කෝරළයේ නාහල්ල ගමේත්, මොණරාගල ගල්බොක්ක ගමේත් සර්වෝදය දර්ශනය, විනය හා ප්‍රතිපත්ති අනුව සර්වෝදය ශ්‍රමදාන කඳවුරු එක දිගටම අපි සංවිධානය කළෙමු. එක්දහස් නවසිය හැටේ අවසන් වන විට ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමය ලංකාවේ ජන සහභාගිත්වය වැඩියෙන් ලබා ගන්නා ජාතික ස්වේච්ඡා

සේවා ආයතනය බවට පත් වී හමාරය. එපමණක් නොව එය ශ්‍රී ලංකාවේ දුප්පත් ගම්මාන නඟා සිටුවීමෙහි ලා ක්‍රියාත්මක වන ප්‍රබලම ජාතික සංවිධානය බවට හැරවූයෙමු.

ඡායාරූප: 224
සිංහ පෙරේරා මහතා

සර්වෝදයට එක්වූ දා සිට මියයන තෙක්ම හෝ අද දක්වාම, හෝ අඛණ්ඩව මා සමඟ සිටි කලින් සඳහන් කළ අයට අමතරව වාර්තා ගත කළ යුතු ගිහි පැවිදි තවත් සෑහෙන පිරිසක් සිටිති. පූජ්‍ය වැල්මිල්ලේ සෝමානන්ද හිමිපාණෝ, පූජ්‍ය තුන්නානේ සුමනතිස්ස හිමිපාණෝ, පූජ්‍ය නැදලගමුවේ ජිනානන්ද නාහිමිපාණෝ, පූජ්‍ය තුන්නානේ සුමනතිස්ස හිමිපාණෝ, පූජ්‍ය නැදලගමුවේ ජිනානන්ද හිමිපාණෝ, පූජ්‍ය කලුකොඳයාවේ පඤ්ඤාශේඛර නාහිමිපාණෝ, පූජ්‍ය හිස්සැල්ලේ ඤාණවිමල හිමිපාණෝ හා පූජ්‍ය හඟුරන්කෙත සුමනජෝති නාහිමිපාණෝ මෙයින් කිහිප නමකි. පී. ඩබ්ලිව්. මහවත්ත මහතා, සිරිල් ඒකනායක මහතා, ටී. ඩබ්ලිව්. රත්නායක මහතා, විලියම් කන්දගේ මහතා, මා.පා.රා. පොඩිඅප්පුහාමි මහතා, සිංහ පෙරේරා මහතා, ලක්ෂ්මි පෙරේරා මැතිනිය, ඩී. එස්. ලියනගේ මහතා, පී. අමරසිංහ මහතා, ටී. එස්. සිල්වා මහතා, හෙන්රි ද සිල්වා මහතා, ඩී. ඒ. පෙරේරා මහතා, සෝමා ද සිල්වා මහත්මිය, ජැනට් කරුණාරත්න මහත්මිය ආදීහු දුකේ දී මෙන්ම, සැපතේ දීත් කවදාවත් මා අත්හැර ගියේ නැත.

ඡායාරූප: 225
ලක්ෂ්මි පෙරේරා මැතිනිය

58

කවුරුද අර පුංචි යකා?
අපේ වැඩ විද්‍යාත්මකයි. ඔබ හැඟීම් බරයි

කනතොලුව, මානාව, අකරැල්ල, පනිච්චන්කර්නි ආදී සාර්ථක කඳවුරුවලින් පසු රජයේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සැබෑ තත්වය අපට වැටහිණි. අබේසේකර මහතාගේ අදහස වූයේ කවදාවත් දෙපාර්තමේන්තු මට්ටමෙන් මෙය නොකළ හැකි බවත්, කෙලින්ම ඇමතිවරයා හමු විය යුතු බවත්ය.

මම සර්වෝදය ශ්‍රමදාන සංගමයේ සංවිධායක ලේකම් හැටියට ඇමතිතුමාගෙන් සම්මුඛ සාකච්ඡාවක් ඉල්ලුවෙමි. එවකට ස්වදේශ කටයුතු අමාත්‍යාංශය ගරු ටී. බී. ඉලංගරත්න මැතිතුමාගේ භාරයේ පැවැතිණි. ඒ සන්ධ්‍යා වරුවකය. මම එතුමාගේ කාර්යාලයට යොදා ගත් වේලාවට ගියෙමි. එතුමා අදරින් මා පිළිගත් අතර, අපේ සේවාවන් අගය කරමින් කතා කළේ ය. කාර්යාල සහකාර මහතා දෙසට හැරුණු ඉලංගරත්න ඇමතිතුමා 'අර මහත්වරුන්ට එන්න කියන්න'' යැයි කී විට, මම ටිකක් තිගැස්සුනෙමි.

එවකට ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ ව සිටි ජී. වී. පී. සමරසිංහ මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජේ. ඊ. ඩී. මඩවල මහතා සහ ඩී. ඒ. අබේසේකර මහතා ඇතුලු පිරිසක් පැමිණ මා සිටි ඉදිරිපස වාඩි වූහ. ඇමතිතුමා සමග සුහද සාකච්ඡාවකට පැමිණි මට, බලාපොරොත්තු නොවුණ විදියට ග්‍රාම සංවර්ධනය පිළිබඳ මේ නිලධාරීන් සමග වාදයකට පැටලීමට සිදු විය. ගැමි ජනතාවට තීරණ ගැනීමේ අයිතිය පැවැරීම, ජනතාව හැම අවස්ථාවකදීම සහභාගි කර ගැනීම සහ ග්‍රාම සංවර්ධනයට විශාල වශයෙන් ස්වේච්ඡා සේවක සහාය ලබා ගැනීම, මා ඉදිරිපත් කළ ප්‍රතිපත්තිවල වැදගත් කොටසක් විය. මේ අදහස්වලට විරුද්ධව හැකි හැම තර්කයක්ම සමරසිංහ මහතා ඉදිරිපත් කළ අතර, ඒවාට විරුද්ධව මම කතා කළෙමි. ඇමතිතුමා පැත්තක් ගත්තේ නැත. එහෙත් එතුමා මා ඉදිරිපත් කළ අදහස්වලට එකඟ බව මට පෙනිණ. මම එතැනට ගියේ ග්‍රාම සංවර්ධන ලොක්කන් හා ගැටෙන්නට නොවේ. එහෙත් සමරසිංහ මහතාගේ එක් වැකියකින් මගේ ඉවසීම ද දුර්වල විය.

"අපි දෙපාර්තමේන්තුවේ වැඩ කරන්නේ විද්‍යාත්මක න්‍යාය ධර්ම අනුවයි. ස්වෙච්ඡා ආයතන වැඩ කරන්නේ හැඟීම්වලට බරවයි."

මුලු සාකච්ඡාවම වැඩියෙන් පැවැත් වූයේ ඉංගිරිසියෙනි. දැන් මම ද ඉංගිරිසියෙන් බැටයක් දෙන්ට හිතා ගතිමි.

"දලුගම ඔබතුමන්ලාගේ අත් රෙදි කම්හලක් තිබෙනවා නේද?" මම ඇසීමි.

"ඔව්"

"එහි සරමක් නිෂ්පාදනය කිරීමට කීයක් වැය වෙනවාද?"

සමරසිංහ මහතා, මඩවල මහතා දෙසත්, ඔහු තවත් නිලධාරියෙකු දෙසටත් හැරුණේ ය.

උත්තරය: "රුපියල් දොළහයි"

"වෙළඳ පොළේ මේ සරම් කීයකට විකුණනවාද?"

හැමෝ ම නිරුත්තර වූහ.

"මම කියන්නම්! රුපියල් අටයි! "

"රුපියල් දොළහකට සරමක් නිෂ්පාදනය කොට – රුපියල් අටකට විකුණනවා. මේක ද? ඔබේ දෙපාර්තමේන්තුවේ විද්‍යාත්මක න්‍යාය? මම ගිය සතියේ දලුගම කුඩා කර්මාන්ත ස්ටෝරුවට ගියා. අවුරුද්දකට සරම් කී දාහක් කාවෝ කාලා විනාශ වෙනවා දැයි එහි ගොස් බලන්න."

ඇමතිතුමා සාකච්ඡාව එතැනින් නැවැත්වී ය. මා හැර අන් සියලු දෙනාට පිට වී යෑමට ඉඟි කළහ.

"යන්. අපි පාර්ලිමේන්තුවට ගොස් දොඩම් වීදුරුවක් බීලා කතා කරමු."

එතුමාගේ රියෙන්ම, පරණ පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ ආපනශාලාවට ගිය මම, ග්‍රාම සංවර්ධනය ගැන එතුමා සමග බොහෝ වේලා කතා කරමින් සිටියෙමි. එතුමාගේ රියෙන්ම, මා දෙල්ගහ යට ගෙදරට හැරලන ලදී. එදා සිට එතුමා මිය යන තෙක්ම අපි හොඳ මිත්‍රයෝ වීමු.

රාත්‍රී අබේසේකර මහතා අපේ නිවසට ආවේය. 'හරි වැඩේ–නේ ආරි, එළියට යන ගමන් ම අපේ ලොක්කා ඇහුව මගෙන්. අර පුංචි යකා කවුරුද කියා? (Who is that small devil?) ඊට පස්සේ මට හොඳටම දොස් කීවා."

කෙසේ නමුත් කාලයාගේ ඇවෑමෙන් සමරසිංහ මහතා හා මම මිත්‍ර වීමු! අවසනට එතුමා ජීවමානව හමු වූයේ කැබිනට් ලේකම්ව සිටි

කාලයේ ය. එතුමාගේ මැතිනියත් සමග පැමිණ, විමලා නම් අනාථ ගැහැනු ළමයෙක් අපේ සුවසෙතට බාර දෙනු ලැබීය. දැන් විවාහ වී ළමයින් ද සිටින මේ තැනැත්තිය, අපේ තණමල්විල ගොවිපළේ නිවසක අදත් වාසය කරයි.



ඡායාරූප: 226
ටී. බී. ඉලංගරත්න මැතිතුමා

* *

මෙහි දී ඉතිහාසයට වැදගත් කරුණක් සටහන් කර තැබීම අවශ්‍යය. එනම් රජයේ ලිපිකරු සේවා සංගමයේ වැඩ වර්ජනයක් හේතුවෙන්, එවකට මහනුවර කච්චේරියේ ලිපිකරුවකු ලෙස සේවය කළ ටී. බී. ඉලංගරත්න මැතිතුමා එම තනතුරෙන් පහ කළේ, එවකට එහි දිසාපතිව සිටි ජී. වී. පී. සමරසිංහ මහතාගේ නිර්දේශයක් මතය. මෙසේ මම අසා තිබේ. මේ දෙපළ මෙසේ තැන් මාරු කර ගැනීම දෛවයේ සරදමකි.

අපේ සම්මුඛ සාකච්ඡාවෙන් දින කීපයකට පසු සමරසිංහ මහතා ද වෙනත් දෙපාර්තමේන්තුවකට මාරු වූ බව ආරංචි විය.

ටී. බී. ඉලංගරත්න මහතා ඉහත සඳහන් කළ සිද්ධියෙන් පසු මට කිහිප වරක්ම විවිධ අවස්ථාවල දී හමු විය. මේ නිසා අපි හොඳ මිතුරන් වීමු. එතුමා මට වඩා විසි වසරක් පමණ වැඩිමහල් ජනප්‍රිය දේශපාලන නායකයෙකි. එතුමා වෙළඳ ඇමති කාලයේ නොයෙක් අවසරයන් ගැනීම සඳහා මම නිල ලියුම් යැව්වෙමි. මා හමු වූ හැම අවස්ථාවකදීම එතුමා කීවේ "ආරිගේ ලිපියක් ආවාම මම ඇස් පියාගෙන අනුමැතිය දුන්නා" යනුවෙනි.

ඡායාරූප: 227
මෛත්‍රීපාල සේනානායක මැතිතුමා

එක්දහස් නවසිය හැත්තෑහතේදී රජය පරාජය වීමෙන් පසු මම බණ්ඩාරනායක මැතිනිය හා මෛත්‍රීපාල සේනානායක මහතා හමු වී, ඉලංගරත්න මහතාගේ බෞද්ධාලෝක මාවතේ නිල නිවසට ගියෙමි. එක්දහස් නවසිය හැත්තෑවේ දී ජය ලැබූ දිනයේද, මෙසේ පරාජය වූ දිනයේ ද හැරුණු විට, මේ

ගෙවලට මා අතරතුර දී ගොස් නැත. 'අප බලයේ සිටින විට ආරි ආවේ නෑ. දැන් එනවා.' යැයි ඔවුහු තිදෙනාම පැවැසූහ.

මා කීවේ 'බලයේ නො සිටින විට හමුවන්න ලේසිනේ' යන්න පමණෙකි. කවදාවත් බලයේ සිටිද්දී පෞද්ගලික උවමනා ඉටු කර ගැනීමට මා දේශපාලන හිතවතුන් හමුවීමට ගොස් නොමැත.

ඉලංගරත්න මහතාගේ ගෙදරට ගිය විටදී, එදා මා දුටු සිද්ධියක් කවදාවත් අමතක නොවේ. තමරා කුමාරි මැතිනියත්, ඉලංගරත්න මහතාත්, තවත් ගෙදර සිටි තරුණියකුත්, ඒ වේලාවේ නිල නිවසේ තිබූ පෞද්ගලික බඩු මුට්ටු ලොරියකට පටවමින් සිටියහ. ඇඳක තිබූ කොහු හැලෙන කුලිත්තමක් උස්සාගෙන ඔවුන් එනු දුටු මට මගේ දෑස් කඳුලින් තෙත් වීම නතර කර ගත නොහැකි විය.

මින්පසු කිහිප දිනක් නුගේගොඩ පිහිටි එතුමාගේ නිවසට ගොස් මේ දෙපළ සමග මම සුහදව කතා බස් කරමින් සිටියෙමි. එවිට එතුමා දේශපාලනයෙන් විශ්‍රාම ගෙන සිටියේය. පශ්චාත් නිදහස් යුගයේ සිටි ශ්‍රේෂ්ඨතම දේශපාලනඥයකු වූ ඉලංගරත්න මැතිතුමාට, එතුමා ඇරැඹූ පක්ෂය කෙසේ වෙතත්, සැබෑ ඉතිහාසඥයෝ සිටිතොත්, නියම තැන හිමි කර දෙනු ඇත.

ඡායාරූප: 228
ශ්‍රමදායකයින් පිරිසක් ගිමන් හරිමින්

59

අනුරපුර අඳිටන



ඡායාරූප: 229
රුවන්වැලි මහා සෑය

දයා හේවාවිතාරණ ධර්මදූත සභාවේ සභාපතිනිය වූ පුෂ්පා හේවාවිතාරණ මැතිනිය මා හඳුනා ගත්තේ බෞද්ධ ජන නායකයෙකු වූ ආනන්ද සේමගේ මහතාගේ මාර්ගයෙනි. මුලින්ම මා ලියා ආර්. ඒ. විජේගුණවර්ධන මහතාගේ නමින් පළ කළ 'ලංකා සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය' නැමැති පොත් පිංච මුද්‍රණය කිරීමේ බර පැන ඉසිලුවේ ආනන්ද සේමගේ මහතාය. එතුමාගේ ඇරයුම පරිදි පුෂ්පා හේවාවිතාරණ මැතිනිය සමඟ මම දුප්පත් ගම්මානවල එතුමියගේ සේවාවන් දැක බලා ගැනීමට ගොස් ඇත්තෙමි. එක් වරක් මොණරාගල දිස්ත්‍රික්කයේ ගම්වල සංචාරයක යෙදුණෙමි. සරණ නිවාසය ගොඩනංවන කාලයේ දින දෙකක ශ්‍රමදාන කඳවුරක් ද පවත්වා, එයට උදව් කළෙමි. දිනක් මේ

ඡායාරූප: 230
කඳවුර ඇරඹීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී සිරිමෙවන් ගොඩගේ මහතා
මුල් පස් පිඩැල්ල කපයි. මහ දිසාපති නිශ්ශංක විජේරත්න මහතා ළඟින් ම සිටී

දෙදෙනා අනුරාධපුරයේ රැස්වීමකට යෑමට මටත් ආරාධනා කළහ. මේ රැස්වීම අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය පිහිටුවා, අනුරාධපුර නගර ශාලාවේ පැවැත්වූ පළමු රැස්වීමයි. සේමගේ මහතා සහ පුෂ්පා හේවාවිතාරණ මැතිනිය ඉදිරි පෙළ අසුන්වලට ගිය අතර, මම පිටුපස අසුනක වාඩි වුනෙමි.

වේදිකාවේ අනුරාධපුර දිසාපති නිශ්ශංක විජේරත්න මහතා සහ අනුරාධපුර විශේෂ කොමසාරිස් පී. කේ. දිසානායක මහතා ද, අටමස්ථානාධිපති නාහිමිපාණන් වහන්සේ ප්‍රධාන, ස්වාමීන් වහන්සේලා තුන් නමක් ද වූහ.

රැස්වීම පටන් ගත්තා පමණකි. නිශ්ශංක විජේරත්න මහතා මා පසු පෙළ අසුනක වාඩිවී සිටිනු දුටුවේය. ඔහු සිය අසුනෙන් නැඟිට වේදිකාවෙන් බැස කෙලින්ම මා සිටින තැනට පැමිණියේය. ඉංගිරිසියෙන් කතා කළ එතුමා, මගේ පැමිණීම බලාපොරොත්තු නො වූ දෙයක් යැයි පවසා, වේදිකාවට නගින විටත් එතුමා මා ගැන සිතූ බව පැවැසුවේය. එතුමාගේ ශක්තිමත් දකුණතින් - මගේ වම් අත අල්ලා ගෙන කෙලින්ම වේදිකාවට ගිය නිශ්ශංක විජේරත්න මැතිතුමා, ඔහුගේ ළඟින්ම අසුනක් පනවා එහි මා වාඩි කළේය.

නායක ස්වාමීන් වහන්සේගේ දේශනයෙන් පසු කෙටි කතාවක් කළ එතුමා, තමා බලාපොරොත්තුව සිටි පුද්ගලයා අහම්බෙන්ම මෙහි පැමිණ සිටින බවත්, ඔහුට විශේෂ දේශනයක් කිරීමට ඇරයුම් කරන බවත් පවසා, මට කතා කරන ලෙස විධාන කළේය.



ඡායාරූප: 231
ආනන්ද සේමගේ මහතා

මේ රැස්වීමට මට පැමිණෙන්න පුලුවන් වූයේ පුෂ්පා හේවාවිතාරණ මැතිනිය සහ ආනන්ද සේමගේ මහතා මා මෙහි කැඳවාගෙන ආ නිසා බව මම පළමුවෙන්ම පැවැසීමි. අවුරුදු එක්දහස් දෙසීයක් අපේ අගනුවරව පැවැති මේ පූජනීය නගරය, නැවතත් ලංකාවේ අගනුවර කිරීමත්, බුද්ධ ශාසනයේ ප්‍රධාන ලෝක පූජනීය නගරය බවට පත් කිරීම අපේ අරමුණ විය යුතු බවත් මම මුලින්ම ප්‍රකාශ කළෙමි. එක්දහස් නවසිය හැටේ දෙසැම්බර් විසිපස්වෙනිදා සිට ජනවාරි මස දෙවෙනිදා දක්වා දහසක් පමණ ස්වේච්ඡා සේවකයන් සමඟ මෙම පූජනීය නගරයේ සංරක්ෂණය සහ ප්‍රතිසංස්කරණය ආරම්භ කිරීමට ශ්‍රමය පිදීම සඳහා අප පැමිණෙන බවත්, ඒ සඳහා පැමිණ සිටින සියලු දෙනාගේම සහයෝගය අවශ්‍ය බවත් මම ප්‍රකාශ කළෙමි.

මා බලාපොරොත්තු වූවාටත් වඩා උද්යෝගයකින් සහ සතුටකින් සියල්ලෝම මේ අදහස අනුමත කරමින් කතා කළහ. අධ්‍යාපන අධ්‍යක්ෂතුමා කියා සිටියේ, අනුරාධපුර මධ්‍ය විද්‍යාලයේ ශ්‍රමදාන සේවකයන්ට නවාතැන් පහසුකම් සපයන බවයි. ග්‍රාම සංවර්ධන පරිපාලක හේරත් මහතා කියා සිටියේ, හැමදෙනාටම අවශ්‍ය ආහාර එතුමා විසින් සපයන බවයි. අනුරාධපුර විශේෂ කොමසාරිස් පී. කේ. දිසානායක මහතා ශ්‍රමදානයට අවශ්‍ය අවි–ආයුධ සහ උපකරණ ආදිය සැපයීමට බාර ගත්තේය. මේ අනුව ශ්‍රමදානයට අවශ්‍ය ඉඳුම්–හිටුම්, ආහාරපාන, උපකරණ, යාන–වාහන ආදී පහසුකම් සැපයීමට කමිටුවක් පත් විය.

උප දිසාපතිවරයෙකු හැටියට සේවය කළ ලීල් ගුණසේකර මහතා, අනුරාධපුර සංස්කෘතිය අළලා – බුද්ධිමතුන් ලවා දේශන මාලාවක් සංවිධානය කිරීමට බාර ගත්තේ ය. තවත් උප දිසාපතිවරයෙකු

වූ කේ. එච්. ජේ. විජේදාස මහතා සහ ඇල්කඩුව මහතා ද විවිධ වගකීම් බාර ගත්හ.

ඡායාරූප: 232
ලීල් ගුණසේකර මහතා

දහසකට වැඩි ශ්‍රමදාන හමුදාවකුත් රැගෙන, නියම කරගත් දිනෙක දුම්රියෙන් අනුරාධපුරයට පැමිණි අපි කඳවුරු බැඳ ගතිමු. උදේ පහේ සිට රාත්‍රී දහය වනතුරු කාල සටහනක් අනුව භාවනාව, අධ්‍යාපනය, විනෝදය, ශ්‍රමදානය ඇතුලු සෑම අංගෝපාංගයකින් යුත් සර්වෝදය ශ්‍රමදාන කඳවුරක් පැවැත්වීමු. අද අනුරාධපුරයට ඇතුලුවන ප්‍රධාන මාර්ගය එදා අපේ ශ්‍රමදානයෙන් හෙළි වූ පාරකි. ශ්‍රී මහා බෝධීන් වහන්සේත් – රුවන්වැලි සෑයත් අතර ප්‍රදේශය එදා පළමුවන වරට හෙළි පෙහෙළි වූයේ අපේ ශ්‍රම දායකයින්ගේ දහඩිය මහන්සියෙනි. අප මෙසේ වැඩ කරන අතර, නිශ්ශංක විජේරත්න මහතා, පොලීසියත්, රාජ්‍ය බලයත් යොදවා ශ්‍රී මහා බෝධිය සහ රුවන්වැලි සෑය අවට තිබුණු සියලුම ගණිකා මඩම්, කසිප්පු පොළවල් ආදිය බිමට සමතලා කොට, මුලු පූජනීය පෙදෙසම දුශ්චරිතයන් ඉවත් කොට පිරිසිදු කළේය.

අවසාන දිනයෙහි පැවැත් වූ මහා සම්මේලනයේ දී මා විසින් ලියන ලද, අනුරාධපුර අධිෂ්ඨානය නම් ප්‍රකාශනය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ සෙවනෙහි දී කියවා අපි සම්මත කර ගත්තෙමු.



ඡායාරූප 233
අනුරපුර ශ්‍රමදානය

ඡායාරූප: 234
මෛත්‍රීපාල සේනානායක මහතා පවුල් හමුව අමතයි. නිශ්ශංක විජේරත්න මහතා ළඟින් වාඩි වී සිටී

අනුරාධපුර අධිෂ්ඨානය

සර්වෝදය සේවකයෝ වූ අපි සත්‍යය, අවිහිංසාව සහ ආත්මහරණය යන ධර්මතාවන් මුල් වූ ද, කොයිම ආකාරයක තමුත් පෙළීම්වලින් තොර වූ ද, සෑම මනුෂ්‍යයකුගේම සම්පූර්ණ වර්ධනය ස්ථිර කර ගන්නා වූ ද, සමාජ ක්‍රමයක් බිහි කරලීම සඳහා ව්‍යායාම කරමු.

සියල්ලන්ගේම යහපත පරමාර්ථ කොට ඇති සර්වෝදය සමාජයක් බිහි කරලීමේ පළමුවන පියවර වශයෙන්, අපි ශ්‍රමදාන ව්‍යාපාරය ආරම්භ කළෙමු. පසුගිය දෙවර්ෂය ඇතුළත දී මේ ව්‍යාපාරය දිවයිනේ විද්‍යායතන, වෙනත් සමාජ සේවා හා ශුභ සාධක ආයතන විශාල ගණනක ද, ගැමි ජනතාවන් අතර ද ව්‍යාප්ත වී තිබේ. එහෙත් මේ ශ්‍රමදාන පණිවුඩය දීප ව්‍යාප්ත ව පැතිරී ගොස් නැති බව අපි පිළිගනිමු. ඒ නිසා ශ්‍රමදන දර්ශනය සහ ප්‍රතිපත්තිවලට අනුකූලව ශ්‍රමදන ව්‍යාපාරය දීප ව්‍යාප්ත කිරීම සඳහා ඉදිරි වර්ෂය තුළ ක්‍රමානුකූල වැඩ පිළිවෙලක් අනුගමනය කිරීමට අපි අධිෂ්ඨාන කර ගනිමු.

සර්වෝදය සමාජයක් බිහි කිරීමේ සෙසු ව්‍යායාමයන් වූ සම්පත්තිදාන, භූදාන්, ග්‍රාම්දාන්, ජීවදාන් සහ ශාන්ති සේනා ගැන නිසි අධ්‍යාපනයක් හා අවබෝධයක් ලබා ගැනීම වැදගත්ය. එසේම මේ අංශ විධිමත්ව, හැකි තරම් දුරට ක්‍රියාත්මක කිරීමට ද අපි මහන්සි ගනිමු.

ඡායාරූප: 235
කඳවුරු වාසීන්
ලැගුම් ගෙනසිටි
අනුරාධපුර මධ්‍ය
මහා විද්‍යාලය

අන්තර් ජාතික ශාන්ති සේනාව

එක්දහස් නවසිය හැටේ, දෙසැම්බර් විසිඑක් වැනිද සිට විසිඅට වැනිදා දක්වා, ඉන්දියාවේ ගාන්ධිග්‍රාම්හි පවත්වන ලද අන්තර් ජාතික යුද විරෝධී ත්‍රෛවාර්ෂික සම්මේලනයේ දී තීරණය කර ගත්, අන්තර් ජාතික ශාන්ති සේනාව පිහිටුවීමේ අදහස අනුමත කරන අතරම, ඒ පිළිබඳ සියලු සහයෝගයක්ම දීමට ද අපි බලාපොරොත්තු වෙමු. ඒ අතරම ලංකාවේ අභ්‍යන්තරික අවුල් වියවුල් සංසිඳවීම පරමාර්ථ කොට ගෙන ජාතික ශාන්ති සේනාවක් පිහිටුවීමට අපි මුල පුරමු.

ඡායාරූප: 236
අනුරපුර
ශ්‍රමදානය

ඡායාරූපː 237
තරුණ ළමා
ශ්‍රමදායකයින්

අධ්‍යාපනික අගය

ශ්‍රමදාන ව්‍යාපාරයේ දර්ශනය සහ ප්‍රතිපත්ති පුරුදු කිරීමෙන් ආත්ම දමනයෙන් සහ ආත්ම පරිත්‍යාගයෙන් යුතු තරුණ පරපුරක් බිහි කරලිය හැකි බව අපේ විශ්වාසය නිසා, එය මේ රටේ අධ්‍යාපන ක්‍රමයේ වැදගත් අංශයක් හැටියට සැලකිය යුතු බව අප රජයට පෙන්වා දීමට ද අදහස් කරමු.

ජාතික තරුණ සේවය

ලංකාවේ යෝජිත තරුණ ස්වේච්ඡා සේවාව රටේ ප්‍රජා සංවර්ධන කටයුතුවලට මහඟු ප්‍රයෝජනයක් වන බව අප පිළිගන්නා අතරම, රජයට අප ව්‍යාපාරයෙන් ලත් අත්දැකීම්වල ප්‍රයෝජනය ද දීමට අපි අදහස් කරමු. එහෙත් තරුණ සේවාව පිළිබඳ අංශ දෙකක් ගැන

1. සිය කැමැත්තෙන්ම සේවය සඳහා ඉදිරිපත් වීම

සහ

2 අහිංසාවාදී ආත්ම දමනය අනුව

මේ සේවයේ විනය හැඩ ගැස්වීම යන කරුණු ගැන රජයට කරුණු සැල කිරීමට අප ව්‍යාපාරය අදහස් කරන අතර, මේ ව්‍යාපාරය රටේ ප්‍රගතිය සඳහා ගොඩනැඟිය යුතු බව අපේ විශ්වාසයයි."

60

නාලන්දා සත්‍යග්‍රහය – වරදට විරුද්ධව සටන් කිරීම

ඕනෑම නිර්මාණාත්මක, යහපත් ක්‍රියාවක් කරන්නට යෑමේ දී බාධා ඇති වන්නේ එම ක්‍රියාවට සම්බන්ධ දේවලින් නොවේ. එයට කිසිම සම්බන්ධයක් නැති පුහු ඊර්ෂ්‍යාකාර මිනිසුන්ගේ ක්‍රියාවලිනි. එහෙත් එසේ වරද කරන්නන්ට විරුද්ධව සටන් කිරීමෙන් අප දුර්වල වේ. වරද කරන්නාට මෛත්‍රිය සහ අනුකම්පාව දක්වා ඔවුන්ගේ වැරදිවලට පමණක් විරුද්ධව උපරිම වැර යොදා සටන් කිරීම යම් හොඳ වැඩක් සාර්ථක කර ගැනීමට තිබෙන නිවැරදි මාර්ගය බව මම හැමදාම විශ්වාස කළෙමි.

අපේ අරමුණු ඉතාමත්ම පිරිසිදු විය හැකිය. උත්තරීතර විය හැකිය. එහෙත් එම උතුම් පරමාර්ථය ඉටු කර ගැනීමට අප යොදා ගන්නා මාර්ග ද උත්තරීතර විය යුතුය. කිසි විටෙක නරක මාර්ගවලින් හොඳ අරමුණු ඉටු කර ගත නොහැකිය. මේ නිසයි සත්‍යය, අවිහිංසාව, ආත්මහරණය යන ප්‍රතිපත්ති නිතරම අප ඉදිරියේ තබාගත යුත්තේ.

දෙල්ගහ යට ගෙදර විප්ලවය මගේ චරිත කතාව ලියූ ගුණදාස ලියනගේ මහතා අතට ඒ කාලයේ මා ළඟ එදිනෙදා සටහන් කරගෙන තිබූ සියලුම ලියකියවිලි බාර දුනිමි. සමහර විට මා උත්තම පුරුෂයෙන් ලියා තිබූ දේ – ඔහු ප්‍රථම පුරුෂයෙන් එම පොතේ ලියා තිබේ.

මේ නිසා නාලන්දයේ පැවැත්වුණු සත්‍යග්‍රහය, මා ජීවිතක්ෂයට පත් කිරීම සඳහා ගන්නා ලද ප්‍රයත්න සහ නිලධාරීන්ගේ වෛරයට සහ වැඩ තහනමට යටත් වීම පිළිබඳව මම මෙහි සවිස්තර වාර්තා නොලියමි. ඒ පිළිබඳ උනන්දුවක් ඇති අය ගුණදාස ලියනගේ ශූරීන්ගේ දෙල්ගහයට ගෙදර විප්ලවය පොත කියවන්න. මා මෙහි සඳහන් කරන්නේ සංක්ෂිප්ත විස්තරයක් පමණි.

එක්දහස් නවසිය හැටඑක අවසන් වන විට ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමයේ සියලුම සාමාජිකයන් සර්වෝදය දර්ශනයත්, විනයත්, ක්‍රියාමාර්ගත් ඒකමතිකව පිළිගන්නා තත්වයකට පත් කර ගැනීමට මම බොහෝදුරට සමත් වීමි. තාවකාලිකව හෝ පටු පරමාර්ථ ඉටු කර ගැනීමට සර්වෝදයට එකතු වන අයට,

දීර්ඝකාලීනව රැඳී සිටීමට අප වැඩසටහන් යටතේ ඉඩක් තිබුණේ නැත. මේ නිසා එදා සිට අද දක්වා එක් අවස්ථාවකදී හැර, අපි ගත් තීරණ ඒකමතිකව ගැනීමට සමත් වීමු.

සර්වෝදයේ ආභාෂය ලැබ, එයින් යම් යම් දේ ඉගෙන ගෙන සර්වෝදයෙන් ඉවත් වී, ඔවුනොවුන්ගේ අරමුණු අනුව ඒ කාලයේ පවා විවිධ සංවිධාන බිහිවී, ටික කලක් පැවැතී අභාවයට ගියේය. මේ අතර නාලන්දා සමාජසේවා සංගමය ද, සර්වෝදයේම සහෝදර ආයතනයක් හැටියට ක්‍රියාත්මක විය. කරුණානන්ද මහතා ආනන්දයේ විදුහල්පති හැටියට මාරුවී යැමත් සමගම, පාසලේ සෑම අංශයක්ම බිඳ වැටුණේය. ළමයින්ගේ සහ ගුරුවරුන්ගේ විනය, පන්තිවල ඉගැන්වීම, විෂයය බාහිර කටයුතු ආදී හැම දෙයක්ම දුර්වල විය. මේ තත්වයෙන් ප්‍රයෝජනය ගත් කිහිපදෙනෙක් හැර, කිසිවෙක් මේ තත්වය අනුමත කළේ නැත. මේ පිරිහීම පිළිබඳව වගකිව යුතු මුහුකුරා ගිය ශිෂ්‍යයෝද ප්‍රකෝපයට පත් වූහ. නාලන්දා වැටීම නවත්වා, පාසල යථා තත්ත්වයට ගන්නට යැයි දෙපාර්තමේන්තුවෙන් විවිධ ඉල්ලීම් කළ අතර, පුවත්පත්වල ද ලිපි පළ විය. නව විදුහල්පති වශයෙන් පත්ව ආ කේ. එම්. ඩබ්ලිව්. කුරුප්පු මහතා කෙතරම් හොඳ මහත්මයෙක් වූවත්, මේ තත්වයට මුහුණ දීමට තරම් ශක්තියක් තිබුණේ නැත. ශිෂ්‍යයන් අතර නාලන්දාව රැක ගැනීමෙහි ලා පුරෝගාමිත්වය ගත්තේ සර්වෝදය ශ්‍රමදාන කඳවුරුවලින් ආභාසය ලබා සිටි ශිෂ්‍යයන්ය.

මේ අතරේ නාලන්දා ශිෂ්‍යයෝ බොරැල්ල තරුණ බෞද්ධ සමිති ශාලාවේ ආචාර්ය විනෝබා භාවේ තුමාගේ උපන් දිනය නිමිත්තෙන් ජයන්ති උත්සවයක් සංවිධානය කළහ. 'සත්‍යග්‍රහය' යන මාතෘකාව යටතේ මේ උත්සවයේ ප්‍රධාන දේශනය කිරීමට ඔවුහු මට ඇරැයුම් කළහ. ශාලාව පිරෙන්නට තරම් පිරිසක් මෙහි සිටි අතර, අසාධාරණයකට හෝ අධර්මතාවකට විරුද්ධව සත්‍යයෙහි පිහිටා අහිංසාවාදී ව ආත්ම දමනයකින් යුතු ව විරෝධය පෑම සත්‍යග්‍රහය හැටියට මම විස්තර කළෙමි. 'සත්‍ය ආග්‍රහය' යනු සත්‍යය තදින් අල්ලා ගැනීමයි.

සත්‍යග්‍රහයක තිබිය යුතු විශේෂ ලක්ෂණ හයක් මෙහිදී මම තේරුම් කළෙමි. ඒවා නම්:

1. කුමන හේතුවක් නිසාවත් සත්‍යය සහ අහිංසාව කඩ නොකිරීම.
2. මත භේදයට හෝ ආරවුලට තුඩු දුන් කරුණ අහිංසාවාදීව වුවත්, සටනකින් තොරව විසඳා ගත හැකි සියලුම මාර්ගවලින් විසඳා ගැනීමට පළමුව ප්‍රයත්න දැරීම.

3. තමා හෝ තමාගේ කණ්ඩායම සම්පූර්ණයෙන්ම නිවැරදි බවත්, සැබෑ අසාධාරණයකට යටත්ව තිබෙන බවත්, තම හෘදය සාක්ෂියට අනුව ප්‍රත්‍යක්ෂ වී තිබීම.
4. වැරදි ක්‍රියාවලට විරුද්ධව මිස, වැරදි කරන්නන්ට විරුද්ධව පෞද්ගලික මට්ටමින් කිසි සේත් ද්වේශ සිතුවිල්ලක් හෝ වචනයක් හෝ ක්‍රියාවක් හෝ උපයෝගි කර ගැනීමෙන් වැළකීම.
5. අසාධාරණයට විරුද්ධව කරන සටනේ දී, ප්‍රතිමල්ලවයාත් ජන මතයත් යන දෙකම, තමා හා තම කණ්ඩායම කෙරෙහි ගෞරව සම්පන්න බියක් ගොඩනැගෙන පරිදි ක්‍රියා කිරීම.
6. තමා වරදක් කළ බව අසාධාරණය කළ අයට අවබෝධවීමට හැම අතින්ම සැලසීම.

විනෝබා ජයන්ති උත්සවය පැවැත්වූයේ එක්දහස් නවසිය හැට දෙකේ සැප්තැම්බර් මස එකළොස් වැනිදාය. දොළොස් වැනිදා පාසලට යන විට මා දුටුවේ ඉහළ පන්තිවල ළමයින් තුන්සියයක් පමණ ගේට්ටුව ඉදිරියේ රැස්ව

"නාලන්දාවේ තත්වය පිළිබඳ පරීක්ෂණයක් කරනු!"

"නාලන්දාව පරිහානියෙන් බේරා ගනිමු"

ආදී පුවරු රැගත් ශිෂ්‍යයින්ය. ඔවුන් එසේ සංවිධානය වී සිටියේ, පාසල විවෘත කිරීමේ වේලාවට පෙරය. උදේ හතයි පනහට කලින්, විදුහල්පතිතුමා වැරදි උපදේශයක් පිළිගෙන ගේට්ටුව වැසූ නිසා විධිමත්ව, විනයානුකූලව, අහිංසාවාදීව රැස්ව සිටි ශිෂ්‍ය පිරිසක්, ගේට්ටුවෙන් එළියට දැමූ රංචුවක් බවට පත් විය. මේ වන විට මම පාසල ඇතුළේය. 'ඔය ළමයින්ට ඔය බෝඩ් පාසල ඉදිරිපිට තබා පන්ති කාමරවලට යෑමට ඉඩ සලසා ගේට්ටුව අරින ලෙස' විදුහල්පතිතුමාට කීවත්, එතුමා එය ගණන් ගත්තේ නැත. ළමයි ගේට්ටුව උඩින් පැන ගොඩනැගිලි අතර තිබුණු චතුරස්‍රයේ තණපිල්ල උඩ වාඩි වී සත්‍යග්‍රහයක් ඇරඹූහ. ප්‍රාථමික සහ කණිෂ්ඨ පාසලේ ළමයින්ට පන්තිවලට ගොස් අධ්‍යාපනික කටයුතු කරන ලෙස ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයෝ අණ කළහ.

මේ අතර මරදානේ පෞද්ගලික ටියුටරියක ඉගෙන ගත් තරුණ ආදි ශිෂ්‍යයින් පිරිසක් පැමිණ, සත්‍යග්‍රහයේ යෙදී සිටි ශිෂ්‍යයින්ට අතින් පයින් පහර දෙන්නට පටන් ගත්හ. මේ අවස්ථාවේදී කිසිම ප්‍රති ප්‍රහාරයක් නොදැක්වූ සත්‍යග්‍රාහකයෝ "අපට පහර දෙන්නවුන් නිදුක් වෙත්වා"යි කියමින් තණ පිල්ලේම රැඳී සිටියහ. මෙය බලා සිටීමට නොහැකි වූ වික්ටර් සිල්වා ගුරු මහතා, බොරැල්ල පොලීසියට ටෙලිෆෝන්

කළේය. වහාම හතළිහක පමණ පොලිස් මුලාදෑනියන් පිරිසක් පැමිණ, පිටස්තර ළමයින් එළවා දමා, සත්‍යාග්‍රහයේ යෙදී සිටි ළමයින්ට ආරක්ෂාව සැපයූහ. කුලතුංග උලුවිට, ආනන්ද වීරසේකර, සුනිල් වික්‍රමතුංග ආදී වූ ශිෂ්‍ය නායකයෝ දහවල් පැයෙන් – පැයට ළමයින්ගේ පාඩම් සාමාන්‍ය පාසලේ දී මෙන් ඉගැන් වූහ. දෙමාපියෝ පැමිණ ළමයින්ට ආහාරපාන ආදියෙන් සංග්‍රහ කළහ. දහවල් අවසාන සීනුව නාද කිරීමෙන් පසු "සිරිත් පරිදි" ගාථා සජ්ඣායනා කොට ළමයි විසිර ගියහ.

යෝ වද තංපව රෝමනු ජේසු
ශාක්‍ය මුනි භගවා කත කිච්චෝ
පාරගතෝ බල විරිය සමංගි
තංසුග තං සරණතථ මුපේමි

රාග විරාග මනේජ ම සෝකං
ධමම මසංකත මප්පටි කුලං
මධුර මිමං පගුණං සුවි භත්තං
ධමම මිමං සරණතථ මුපේමි

යතථච දිනනමහප්ඵල මාහු
චතුසු සුචීසු පුරිස යුගෙසු
අටඨ ච පුගගල ධමම දසාසෙ
සංඝම්මං සරණතථ මුපේමි

පසු දා ද උදේ පන්සිල් ගෙන, මේ අන්දමට චතුරස්‍රයේ වාඩි වී විවිධ පාඩම් ඉගෙන ගත් ළමයින්, දෙමාපියන් දුන් ආහාර පාන ද භුක්ති විඳ පාසල් වෙලාවෙන් පසු ගාථා කියා පිටව ගියහ. පුවත්පත්වල මෙම නාලන්දා සත්‍යාග්‍රහය පිළිබඳ ප්‍රවෘත්ති පළ විණි. විශේෂයෙන් දවස පුවත්පතේ ඩී.බී. ධනපාල මහතා සත්‍යාග්‍රහයේ යෙදුනු ළමයින්ගේ නිවැරදි ක්‍රියා මාර්ගය පිළිබඳ ලිපි පළ කරවීය.

මීට දෙසතියකට පමණ පෙර අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම අධ්‍යක්ෂවරුන් පැමිණ, හදිසි වැටලීමක් කොට, ගුරුවරුන් පරීක්ෂා කළහ. ඔවුන්ට අපේ කිසිදු වරදක් සොයා ගැනීමට නොහැකි විය. සත්‍යාග්‍රහය පැවැත්වෙද්දී ආචාර්ය ආනන්ද ගුරුගේ මහතා පැමිණ ළමයින්ට කතා කොට, පන්තිවලට යවන මෙන් මගෙන් ඉල්ලා සිටියේය. එම ඉල්ලීම ලොග් පොතේ සටහන් කරන මෙන් මම ඉල්ලීමි. ඔහු එය ප්‍රතික්ෂේප කළ විට, මම ද ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළෙමි.

එවකට අමාත්‍යාංශයේ සිටි ස්ථිර ලේකම්වරයා මා සමඟ නෝක්කාඩුවක් ඇති කරගත් කෙනෙකි. කලුතර දිස්ත්‍රික්කයේ පඹේ

පැවැති කඳවුරකදී, හදිසියේ එහි ගොඩවී කතාවක් කිරීමට අවසර ඉල්ලූ විට, එය ප්‍රතික්ෂේප කොට කය වෙහෙසා වැඩට එකතු වෙන්නට යැයි ඔහුගේ අතට මුල්ලුවක් දීම නිසා, ඔහු මා සමඟ උරණ වී සිටියේය. අධ්‍යාපන අධ්‍යක්ෂ එස්.එෆ්. ද සිල්වා මහත්මා මගේ සහ ඩී.එස්. සේනානායක මහතාගේ වැඩ තහනම් කරමින් ලිපියක් අත්සන් කළ බව එම කාර්යාලයෙන්ම ආරංචි විය. සත්‍යග්‍රහයේ තුන්වැනි දින රාත්‍රියේ අප දෙදෙනාගේ වැඩ තහනම් කළ බවත්, නාලන්දා භූමියට ඇතුලුවීම අපට තහනම් බවත් දන්වා එවූ විදුලි පුවත් ලැබුණේය.

මෙය සැලවූ වහාම ශිෂ්‍ය නායකයෝ ඉදිරිපත්ව සත්‍යග්‍රහය නැවැත්වූහ. මම ද එය නවත්වන ලෙස ඔවුන්ට පණිවුඩ යැවීමි.

එම විදුලි පුවතත්, සීඝ්‍රගාමී ලිපියත් රැගෙන එස්.එෆ් ද සිල්වා මහතාගේ කාමරයට මම ඇතුලු වීමි. එතුමා මා එතෙක් කළ අධ්‍යාපනික සේවාව අගය කරමින්, එතුමාගේ අත්සනින් ම ඒවා තිබූ ලිපි පෙන්වා 'මෙවැනි අසාධාරණයක් කළේ ඇයි' දැයි ඇසීමි.

'ආරියරත්න, ඔබ නිවැරදි බව මා දන්නවා. එහෙත් ස්ථිර ලේකම්ගේ නියෝගයක් අනුවයි මම මෙය කළේ.' ඔහුගේ නිදහසට කරුණු කීවේය.

'සර්, මම දුප්පත් ගුරුවරයෙක් වුවත්, මගේ රැකියාව අහිමි වුවත්, ප්‍රතිපත්ති ගරුක කෙනෙක් බව මම ඔබතුමාට පෙන්වා දෙමි'යි කියමින් අනිත් කාමරයේ සිටි ස්ථිර ලේකම් හමුවීමට ගියෙමි. සෙසු නිලධාරීහු බිරාන්ත වී සිටිහ. මා ඔහුට කීවේ මගේ රක්ෂාව නැවැත්වූවාට, මගේ සේවය නැවැත්විය නොහැකි බවත්, වහාම මගේ වැඩ තහනම පිළිබඳ පරීක්ෂණයක් කරන ලෙසත්, මට මගේ පවුල රැක ගැනීමට වෙන කිසිම ආදායමක් නැති නිසා, වැඩ නවත්වා තිබෙන කාලය තුළදී මගේ සම්පූර්ණ පඩිය ගෙවන ලෙසත්, එසේ නො කළහොත් ඔහුගේ නිවසේ අපේ ගෙදර අයත් සමඟ අවුත් පදිංචි වන බවත්ය. ඔහුට වචනයක් වත් කතා කිරීමට නොහැකි විය. මම කාර්යාලයෙන් පිටවීමි.

එදා හැන්දෑවේ මෙතෙක් මා අත්දුටු භයානකම අත්දැකීම ලැබුවෙමි. එවකට මරදානේ සිටි පාතාල ලෝකයේ නායකයා වූ ධර්මදාස හෙවත් චොප්පේ නැමැත්තාට මා ඝාතනය කිරීමට කවුදෝ කොන්ත්‍රාත්තුවක් දී තිබෙන බව, අපේම ශිෂ්‍යයකුගෙන් මම දැන ගතිමි. එදිනම රාත්‍රියේ ධර්මා ගුණසිංහ මහතා සමඟ ගොස් මේ දරුණු යැයි කියූ සාහසික පුද්ගලයා හමු වී, සියල්ල තේරුම් කර දුනිමි. මෙය ඉතා ත්‍රාසජනක සිද්ධියක් විය. මගේ සටහන්වලින්, ගුණදාස ලියනගේ මහතා ඉතා ලස්සනට මේ සිද්ධිය විග්‍රහ කර තිබේ. මා සඳහන් කරන්නේ මේ අපරාධකාරයෙකු යැයි හංවඩු ගසා තිබෙන මේ පුද්ගලයා,

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලොක්කන්ට වඩා සාධාරණත්වය ගරු කරන පුද්ගලයෙක් බවයි. ඔහු අපේ සාධාරණත්වය පිළිගත් පසු ඔහු ලවා මේ දරුණු අපරාධය කිරීමට තැත් කළ අයගෙන් පළි ගැනීමට මම නොගියෙමි. ඔවුනට මම මෛත්‍රී කළෙමි.



ඡායාරූප: 238
ඩබ්. එම්. ඒ. වර්ණසූරිය මහතා

මාස තුනක් තිස්සේ පරීක්ෂණ පැවැත්වූයේ ය. අමාත්‍යාංශයේ සිටි ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරියා වූ ඩී.ජී. කුලතුංග මහතා අපේ පරීක්ෂණ අවසන් කොට, ඩී.එස්. සේනානායක මහතාත් මාත් දෙදෙනාම සියලුම චෝදනාවලින් නිදහස් කළේය. අපේ පඩිය කපා තිබුණේවත්, නවත්වා තිබුණේ වත් නැත. මේ නිසා පාසලේ ගත කිරීමට තිබුණු කාලයත්, රට පුරා පාසල්වලට ගොස් ළමයිනට සර්වෝදය ශ්‍රමදානය කියා දීමට මට ප්‍රයෝජනවත් විය. ගාල්ලේ අධ්‍යාපන අධ්‍යක්ෂව සිටි ඩබ්ලිව්. එම්. ඒ. වර්ණසූරිය මහතා, මා හඳුන්වා දුන්නේ අමාත්‍යාංශය විසින් වැඩ තහනම් කළ ගුරුවරයකු බවත්, ආරියරත්න මහතාගේ සේවය සමස්ත ගුරු ශිෂ්‍ය පරම්පරාවටම ලබාදිය යුතු බව එතුමාගේ නිගමනය බවත්ය. ගාල්ලේ මා කතා කළ හැම පාසලකටම එතුමා පැමිණ මට ධෛර්යය දුන්නේය. මෙවැනි ඍජු අධ්‍යාපනඥයෝ ද එවකට ලංකාවේ සිටියහ.

අප දෙදෙනාගේ වැඩ තහනම් කර, නාලන්දා විද්‍යාලයීය භූමියට ඇතුලුවීමටත්, අවසර නොමැති අවස්ථාවේ දී අපේ සිසුන්ට අහිමි වූ පන්ති විෂයයන් පස්වරුවේ ඉගැන්වීමට මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන් අධිපති, අතිගරු කලුකොඳයාවේ පඤ්ඤාශේඛර නාහිමිපාණන් වහන්සේගෙන් අවසරය ලැබුණු හෙයින්, එම පන්ති පැවැත් වූ බව මෙහිලා සඳහන් කරමි.

සියලුම චෝදනාවලින් නිදහස් වූවත්, තවමත් අපට පාසලට යෑමට අවසර දුන්නේ නැත. ලංකා ජාතික ගුරු සංගමයේ දේ. පීටර් සිල්වා මහතා, ල. මෙත්තානන්ද මහතා, ඇල්. ආරියවංශ මහතා, ශ්‍රේෂ්ඨ බෞද්ධ ජන නායකයෙක් වූ එල්. එච්. මෙත්තානන්ද මහතා, ටී. යූ. ද සිල්වා මහතා ආදී වූ නායකයෝ මා වෙනුවෙන් සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනියට කරුණු සැල කිරීමෙන් පසුවයි, නැවත නාලන්දාවේ සේවයට වාර්තා කිරීමට, ඩී. එස්. සේනානායක මහතාටත්

– මටත් හැකි වූයේ.

වැඩ තහනමෙන් පසු ධර්මසේන සේනානායක මහතා හා මා නැවත නාලන්දාවේ සේවයට එක් වූ පසු පැවැති පළමු උදේ රැස්වීමේ දී අමතක නොවන සිද්ධියක් සිදු විය.



ඡායාරූප: 239
පූජ්‍ය පණ්ඩිත හිස්වැල්ලේ
ඥානවිමල හිමි

නාලන්දාරාමයේ අධිපති පූජ්‍ය පණ්ඩිත හිස්වැල්ලේ ඥාණවිමල හිමිපාණෝ ඒ කාලයේ නාලන්දාවේ ධර්මාචාර්ය හිමියන් වශයෙන්, පණ්ඩිත කොත්මලේ අමරවංස හිමියන් ද සමග ස්වේච්ඡාවෙන් සේවය කළහ. එදා පැවැති රැස්වීමේ දී උන්වහන්සේ මෙසේ පැවැසූහ.

"ආරියරත්න මහතා ගැන මගේ තිබුණේ වැරදි අදහසක්. ඒ නිසා එතුමාට විරුද්ධව රහසේ අගමැතිතුමිය පවා හමුවන්ට මම නියෝජිත පිරිස් සමග ගියා. එහෙත් දැන් මම දන්නවා, මා නොමග ගොස් ඒ හතුරුකම් කළ බව. ආරියරත්න මහතා එතරම් විරුද්ධවාදීකම් කරලත් මට හෝ වෙනත් කාටවත් වෛර කළේ නෑ. අපට සැලකුවේ ආදරයෙන් හා ගෞරවයෙන්. මම භික්ෂූන් වහන්සේ කෙනෙක් නොවී නම් මා එතුමාගෙන් සමාව ගන්නේ මේ විදියට නොවෙයි. මම අද සිට එතුමා සමග සර්වෝදයේ සියලුම කටයුතුවලට මගේ ජීවිතය කැප කරනවා. මේ ගුරුවරුන් හා ශිෂ්‍යයන් සියලු දෙනාම එතුමාගේ අඩිපාරේ ගොස් හොඳ මිනිසුන් වී, අපේ රට නැවත වරක් දහම් දිවයිනක් කිරීමට කැපවෙන ලෙස මා ඉල්ලා සිටිනවා."

මේ දේශනය ගැන හැමෝම පුදුම වී උන් වහන්සේට ප්‍රශංසා කළහ. මම උන්වහන්සේට දණ ගසා වඳින විට මගේ හිසට වැටුණේ උන්වහන්සේ ගේ ඇස්වලින් වැහැරුණු කඳුලුය.

මේ ශ්‍රේෂ්ඨ බුද්ධ පුත්‍රයන් වහන්සේ එදා සිට සර්වෝදය විධායක මඬුල්ලට බැඳී, මා සමග ගම් නියම්ගම්වලට වැඩම කළහ. උන්, වහන්සේට හෘදය අමාරුවක් සෑදී රෝහලේ සිට ආ බව නොදත් නිසා අවිස්සාවේල්ල පැත්තෙන් පැමිණි ගැමි කණ්ඩායමක් හදිසි රිය අනතුරකින් තුවාල ලබා මහ රෝහලට ඇතුල් කළ ආරංචිය දුනිමි. වහාම එහි ගොස් අවශ්‍ය කටයුතු සැලසීමට මහන්සි වූ නිසා, උන්වහන්සේ නැවත අසනීප වී රෝහල් ගත වීමට සිදු විය. උන් වහන්සේ අපවත් වූ පසු ඉතා උසස් අන්දමකින් අපි ආදාහනෝත්සවය පැවැත්වීමු.

වැඩ තහනම් කළ බව
දැන්වීමේ ලිපියක*

වැලිෆෝන් / தொலைபேசி / Telephone: 6301, 6315, 2232, 3874, 3820

ඔබේ අංකය / உங்கள் எண் / Your No.

මගේ අංකය / எமது எண் / My No. NSH/A/32

(මීට පිළිතුරක් එවනවිට මේ අංකය හා දිනය එහි සඳහන් කරන්න. ලියුම් කවරයේ අධ්‍යාපන අධ්‍යක්ෂක තුමා .... ශාඛාව යනුත් ලියන්න.)

(இவ்விலக்கத்தை உங்கள் கடிதத்தில் குறிப்பிடுவதுடன் காகித உறையில் வித்தியாதிபதி .... கிளை என விலாசமிடவும்.)

(Please quote this number in your reply and address cover to the Director of Education, Branch....)

අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வித்தியா பகுதி
EDUCATION DEPARTMENT

කොළඹ 2 / கொழும்பு 2 / Colombo 2

1962 සැප්තැම්බර් 15 වැනිදින දීය.

ඒ.ටී. ආරියරත්න මහතා වෙතයි,

<u>නාලන්දා විද්‍යාලයයෙහි වර්ජනව්‍යාපාරය</u>

නාලන්දා විද්‍යාලයයෙහි ගුරුවරයෙකු වශයෙන් ඔබගේ ධුරයෙහි බලතල පාවිච්චි කිරීම හා කටයුතු කිරීම රාජ්‍යසේවාවේ යහපත සඳහා වහා නතර කළයුතු යයි කල්පනාකර ඇතිහෙයින් ඔබගේ වැඩ මේ ලත් මොහොතේ සිට තහනම් කරනලද බව මින් දන්වමි.

2. නැවත දැන්වීමක් කරනතුරු ඔබට නාලන්දා විද්‍යාලය භූමියට ඇතුළුවීමට අවසර නැති බව ද, එසේ ඇතුළු වුවහොත් ඔබට විරුද්ධව තවදුරටත් කටයුතු කිරීමට සිදුවන බව ද, තවදුරටත් දන්වමි.

3. ඔබට විරුද්ධව ඇති චෝදනාවවූ, ශිෂ්‍යයන් වැඩ වර්ජනයේ යෙදවීමට පෙළඹවීම හා ආධාරදීම ගැන විභාගයක් 1962 සැප්තැම්බර් මස 24 වැනි දින පෙරවරු 9.30 ට කොළඹ, තර්ස්ටන් පාරේ අධ්‍යාපන ප්‍රාදේශීය කාර්යාලයයේදී අධ්‍යාපන නිලධාරීතුමා විසින් පවත්වනු ලැබේ. එට පෙනී සිටියයුතු බවද මින් නියම කරමි.

අධ්‍යාපන අධ්‍යක්ෂ

සේවා/

---

* 289 පිටුවේ – වෙනත් අදාළ ලිපි

[illegible handwriting]

දුරකථන / தொலைபேசி / Telephone: 6301, 6315, 2232, 3874, 3820

අංකය / உங்கள் எண் / Your No.

මගේ අංකය / எனது எண் / My No. [illegible]/32

(මෙට පිළිතුරු එවනවිට මේ අංකය හා දිනය එහි සඳහන් කරන්න. ලියුම් කවරයේ අධ්‍යාපන අධ්‍යක්ෂක තුමා .... ශාඛාව යනුද ලියන්න.)

(இலக்கத்தை உங்கள் கடிதத்தில் குறிப்பிடுவதுடன் காகித உறையில் வித்தியாதிபதி .... கிளை என விலாசமிடவும்.)

(Please quote this number in your reply and address cover to the Director of Education, Branch ....)

අධ්‍යාපන දෙපාර්තමේන්තුව

வித்தியா பகுதி

EDUCATION DEPARTMENT

කොළඹ 2 / கொழும்பு 2 / Colombo 2 — 1962 සැප්තැම්බර් මස [illegible] වැනිදින.

~~[illegible]~~,
ඒ.ටී. ආරියරත්න මහතා,

මාගේ සමාංක හා 1962. 9. 15 දාතම දරණ ලිපියෙහි 3 වැනි ඡේදය සම්බන්ධයෙනි.

2. ඔබට විරුද්ධව ඇති චෝදනා සම්බන්ධයෙන් පවත්වන විභාගය සැප්තැම්බර් මස 24 වැනි දින පෙරවරු 9.30ට කොට එදිනම පස්වරු 2.30 ට [illegible] ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේදී උප අධ්‍යාපන අධ්‍යක්ෂ ඩී.පී. [illegible] මහතා විසින් පවත්වන බව මින් දන්වමි. එට පෙනී සිටිය යුතු බව මින් [illegible] කරමි.

සේවා/19.

(Signature)
අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවට

My No. NSHA 32
Education Department,
Colombo 2, 3rd October 1962.

Mr. A.T.Ariyaratne,
493, Second Division,
Maradana.

Asst. Tr.,C/Nalanda College.
Colombo.

The following telegram sent to you today is hereby confirmed:

" YOU ARE REINSTATED WITH IMMEDIATE EFFECT (STOP) LETTER FOLLOWS - EDUCATION NS"

Please report the date of assumption through the Principal to me and to the Asst. Director of Education, Western Region (North), Colombo 3.

(Signature)
/ Director of Education

Copies to:
1. Principal, C/Nalanda College, Colombo.
2. A.D.,W.R.(N)
3. A.D.,W.R.(N) -Sal.Br.
4. A.D./TRB

වැඩ තහනමට අදාළ පුවත්පත් උද්ධෘතයක්

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් මහ තැපැල් කාර්යාලයේ ලියා පදිංචි කරනලදී.

ප්‍රධාන කාර්යාලය
- "හෙළබිම" 165, සිරිධම්ම මාවත මරදාන, කොළඹ–10.
- මසකට වරක් පළවේ.
- කිසිම දේශපාලන පක්ෂයකට අයත් නැත.
- ළමා ලේඛක ලේඛිකාවන්ට අත දීමේ පරමාර්ථයෙන් පළවේ.

හෙළබිම

- මිළ ශත 10 යි
- 9 වෙනි පත්‍රය
- 2 වෙනි අවුරුද්ද
- 1962
- ඔක්තෝබර්
- සැම 1 ද කම නිකුත්වේ

ලංකා විනෝබාට උඩුවම්!

අද ලංකාවේ සැම පලාතකම, සැම පාසැලකම පාගේ "ශ්‍රමදාන" ව්‍යාපාරය පැතිරී ගොස් ඇත. සිය ශ්‍රමය අන් අය වෙනුවෙන් යොදවමින් කෙරෙන මේ ශ්‍රේෂ්ඨ ව්‍යාපාරය ලංකාවට හඳුන්වා දුන්නේ නාලන්දාවේ ආචාර්ය ඒ. ටී. ආරියරත්න මහතා ය. මේ උතුම් ව්‍යාපාරය හඳුන්වාදීම ගැන කළ ගුණ සැලකීමටදෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් ඒ මහතාගේ රැස්සාව තහනම් කර ඇත.

● පාසලක් ගැන අසාවත් නොතිබුණු දහගතට අධික ළමා පිරිසක් පාසල් යමින් අද ජාතික අධ්‍යාපනය ලබමින් දියුණු වන්නේ ඒ. ටී. ආරියරත්න මහතා හඳුන්වා දුන් ශ්‍රමදාන ව්‍යාපාරය නිසා බැව් කහතොටුවට යන ඕනෑම කෙනෙකුට අද හොඳින් පෙනෙන්නට තිබේ.

ශ්‍රමදානයට අඩිතාලම දැමූ, උතුම් ව්‍යාපාරයක් රටට හඳුන්වා දුන්, ශ්‍රේෂ්ඨ ස්ථානයක් වශයෙන් හැඳින්විය හැකි නාලන්දා මහා විද්‍යාලයට යැමට ආරියරත්න මහතාට අද තිබියෙන් තහනමය. එයට [illegible] ඇත්තේ [illegible] ඇති; අවංක [illegible] "මහතුන් කළ අවනීතියට" විරුද්ධව ගෙන ගිය සත්‍යාග්‍රහයට ආරියරත්න මහතා සහයෝගය දීම නිසාලු.

ආරියරත්න මහතා කවදත්, අවංක ව්‍යාපාරවලට සහයෝගය දුන් බව අපි දනිමු. එදා ශිෂ්‍යයින් කිපදෙනෙක් සරසවියෙන් පැනවුණු විභාග ගාස්තුවට විරුද්ධව කටයුතු කරද්දී ඒ මහතාගෙන් ලැබුණු

● ශ්‍රමදාන ව්‍යාපාරය නිසා කහතොටුවේ [illegible] නොදියුණු පවුල් රාශියකට අද නිවාස ලැබී තිබේ.

සහයෝගය ගැන අපි දනිමු. සිය ශ්‍රමදාන කාර්යාලය පවා ඒ මහතා ශිෂ්‍යයින්ගේ මේ අහිංසක විරෝධය පෑම සඳහා කටයුතු පිළියෙල කර ගැනීමට බාර දුන්නේය. ආරියරත්න මහතාගෙන් ලැබුණු ඒ සහයෝගය නිසා එදා – අගෝස්තු 26 ද දහදහසකට අධික ශිෂ්‍ය ශිෂ්‍යා පිරිසක් පෙලපාලි ගියහ. සරසවි ගාස්තුවට විරුද්ධව සිය අහිංසක විරෝධය මහජනතාවටත්, රජයටත්, සරසවියටත් පෙන්වූහ.

ශිෂ්‍ය සටන ජය ගත්තේය. සරසවිය විභාග ගාස්තු අහෝසි කරන්නට [illegible] ඒ [illegible] ආරියරත්න [illegible] සිය කාර්‍යදක්ෂතාවය [illegible] පළ කරන්නාහ.

මේ පරිද්දෙන් ම, තිලින්දයේ ශිෂ්‍යයන් ගෙන ගිය අවංක සත්‍යාග්‍රහයට, කඩාකප්පල්කාරී, පන්දම්කාර, වග කීමෙන් තොර පිරිසක් විරෝධය පාද්දී ශිෂ්‍යයින්ට බෝම්බ ගැසීමට තැත් කරද්දී, බොරු ප්‍රචාර ගෙන යද්දී, ශිෂ්‍යයින් විද්‍යාලයෙන් අස්කිරීමට තැත් කරද්දී, ආරියරත්න මහතා ශිෂ්‍යයින්ගේ සටනට සහයෝගය දෙන්නට ඇත.

අවංක කමට, සෘජු බවට අද රටේ ඉඩක් නැති බව අපි දනිමු. එහෙත් ආරියරත්න මහතා නිතර අවංක භාවය, සෘජු භාවයට මේ රටේ ඉඩ ඇති බව පෙන්වීමට තැත් [illegible] අධ්‍යාපන දෙපාර්තමේන්තුව [illegible] තහනම [illegible] ආරියරත්න මහතා [illegible] ඒ මහතා ගැන අසා ඇති සැම කෙනෙක් ම හිසේ අත ගසා ගත්හ. පුදුමය පළ කළහ. සාප කළහ,

[illegible] ආරියරත්න මහතාට [illegible] අද [illegible] වැඩ කළ ඒ සිරිතු දුක් කැ[illegible].

"ආරියරත්න මහතාණනි! ඔබේ ව්‍යාපාරයටත්, ඔබටත් ජයවේවා!" යි අනෙකුත් අය මෙන් අපි ද පතමු.



වෙලෝනා
ගාමන්ට්ස්
- ටී ෂර්ට්ස්
- බැනියන්
- කොට කලිසන්
- ඩැන්ඩි
- අයිලන්ඩ් ප්‍රයිඩ්
- ළමා ඇඳුම්
- බුෂ් ෂර්ට්ස්
- ත්‍රී ස්ටාර්ස්
- මල් වෙලෝනා

61

විදුලියෙන් ක්‍රියා කරන මුල් පඩි පෙළ



ඡායාරූප: 240
ඩී. බී. ධනපාල මහතා

නාලන්දාවේ සත්‍යග්‍රහයත්, නිලධාරි වෛරය නිසා මෙයට මා සම්බන්ධ කර ගැනීමත්, මගේ සහ ධර්මසේන සේනානායක මහතාගේ වැඩ තහනමත් ගැන පුවත්පත්වල ප්‍රවෘත්ති සහ ලිපිලේඛන සෑහෙන ප්‍රමාණයක් පළ විය. මහජනයාගේ අනුකම්පාව මේ නිසා අප කෙරෙහි යොමු වී තිබුණේය. විශේෂයෙන් 'දවස' පත්‍ර ආයතනයේ ප්‍රධාන කර්තෘ ඩී. බී. ධනපාල මහතා එතුමාගේ පත්‍රවලින් මට විශේෂයෙන් අසාධාරණයක් සිදු වී තිබෙන බව ජනතාවට ඒත්තු ගන්වා තිබුණේය.

සර්වෝදය මුල් අවුරුදු කිහිපය තුළ දී, සෑහෙන අවබෝධයක් දේශීය වශයෙන් මහජනතාවට ලබා දීමට 'දවස' කණ්ඩායමේ සිංහල, ඉංග්‍රීසි හා ද්‍රවිඩ පුවත්පත් හා සඟරා, 'ටයිම්ස්' කණ්ඩායමේ සිංහල, ඉංග්‍රීසි හා ද්‍රවිඩ පුවත්පත් හා සඟරා, ආයතනයේ නවයුගය වැනි ලේක්හවුස් ජනප්‍රිය සඟරා මෙන්ම, කුඩා පුවත්පත් හා සඟරා අපට බෙහෙවින් උදව් කළේය.

ලේක්හවුස් ආයතනය සහ එහි පුවත්පත් හා සඟරා ද අපට ප්‍රචාරය දිණි. සියලුම ලේඛකයින්ගේ නම් හා ඔවුන් පළ කළ ලිපිවල විස්තර මට මතක නැති වුවත්, ඩී. බී. ධනපාල මහතා, රෙජී මයිකල් මහතා, ජෝ සිගේරා මහතා, ප්‍රේමිල් රත්නායක මහතා, හෙන්රි මල්දෙනිය මහතා, සෝමවීර සේනානායක මහතා, ගරු අර්නස්ට් පෝරුතොට පියතුමා, නිමල් ප්‍රේමතිලක මහතා, රෝහණ ගමගේ මහතා, සිරිල් ඒ සීලවිමල මහතා, පියල් වික්‍රමසිංහ මහතා ආදීන්ගේ නම් මට සිහිවන අතර, නිතරම කෘතඥතා පූර්වකව ඔවුන් සිහි කිරීමට මම අමතක නොකරමි.

ගරු අර්නස්ට් පෝරුතොට පියතුමා, ඒ කාලේ කිතු දහම ආශ්‍රයෙන් සර්වෝදය විග්‍රහ කරමින් ලස්සන ලිපියක් රසවාහිනී සඟරාවේ ලියා තිබුණේය.

මුලින් ම 'ඒෂියන් ස්ටුඩන්ට්ස්' නම් විදේශීය ප්‍රවෘත්ති පත්‍රයකට එක්දහස් නවසිය පනස්හයේ දී මා කළ දේශනයක් ඉතා අගනා ලිපියකින් වාර්තා කළේ කාල්ටන් සමරජීව මහතාය. පසු කලෙක ඔහු අපේ 'දාන'-(DANA) සඟරාවේ කර්තෘ වශයෙන් ද, අගනා සේවයක් කළේය.

ඡායාරූප: 241
කාල්ටන් සමරජීව මහතා

මෙම ස්ව චරිතාපදානයේ ඉදිරි වෙළුම්වල දී මට අමතක වූ ලේඛකයින්ගේ නම් ද ඇතුළත් කරන්නෙමි.

* *

මා කිසි දිනක සම්බන්ධයක් නොතිබුණු, එහෙත් අපේ සේවය කෙරෙහි ප්‍රසාදයක් ඇති කර ගෙන තිබුණු, ඉහළ පන්තියේ ප්‍රභූන් ද සිටි බව මට ඒත්තු ගියේ, බොහෝ දෙනා ලියුම්වලින් හෝ දුරකථන මගින් හෝ පැමිණ හෝ අපට ඔවුන්ගේ අනුකම්පාව දක්වා තිබුණ නිසාය.

මෙයින් එක් සිද්ධියක් මට හොඳින් සිහියට නැගේ. හිටපු අගමැති ශ්‍රීමත් ජොන් කොතලාවල මැතිතුමාගේ සහෝදරයකු වූ ජස්ටින් කොතලාවල මැතිතුමා, තිව් සිටි ස්ටෝරුව ඉදිරිපිට සුදු යුනිෆෝම් එකකින් සැරසුණු රියදුරෙකු විසින් එලවා ගෙන ආ තමන්ගේ රිය නවත්වා, සාප්පුව පැත්තෙන් තිබුණු පටු මාර්ගය දිගේ අපේ නිවසට එන බව, යමෙක් දුව විත් මට දැනුම් දුන්නේය. කෝට් එක, බෝ ටයි එක ඇතුලු සම්පූර්ණ යුරෝපීය ඇඳුමෙන් සැරසුණු ජස්ටින් කොතලාවල මහතා පිළිගැනීමට මම ඉදිරියට ගියෙමි.

මා කලින් මුණ ගැසී නොතිබුණත්, එකවරම මට අතට අත දී ආචාර කළ එතුමා සාලයේ වාඩි වී, මට ද වාඩි වෙන්නට කියා මෙසේ පැවසීය. "ආරියරත්න මහත්මයා, මම ඔබ ගැන පත්‍රවල කියෙව්වා. ඔබ අධ්‍යාපනයටත් – රටටත් කරන සේවය මම බොහෝ අගයනවා. ඔබගේ වැඩ තහනම් කළ බව පත්‍රයේ දැකලයි මා ඔබ හමුවීමට ආවේ. ඔබ වෙනුවෙන් මට කළ හැකි යමක් තිබෙනවාද?"

"සර්, ඔබගේ පැමිණීම මම බොහෝ අගය කරනවා. ඔබ දැන් පැවසූ වචන ටිකම ඇති. එයින් මගේ ධෛර්යය තවත් වැඩි වුණා. මම

අසාධාරණයට විරුද්ධව අහිංසාවාදීව මෙන්ම නිර්මාණාත්මකව සටන් කරන කෙනෙක්. ඔබතුමාට මම බොහෝම ස්තුතිවන්ත වෙනවා."

"ඔබ – ඔබේ සටන දිගටම ගෙන යන්න. ඔබ දැනට පාසලේ දී ලබන වේතනය ඔබට ලැබෙන්නට මම සලස්වනවා. ඔබේ සමාජ සේවය දිගටම ගෙන යන්න."

"බොහොම ස්තුතියි සර්, මම අධ්‍යාපන අමාත්‍යාංශයට කීවා – මගේ වැඩ තහනම් කළාට, මගේ පඩි තහනම් කරන්න එපා කියලා. මගේ මාසික වේතනයෙන් තමා මගේ බිරිඳ සහ දරුවන් දෙදෙනාත් රැකගෙන, දෙමාපියන් ඇතුලු බාල අයටත් උදව් වන්නේ. මා හිතන්නේ නැහැ – ඔවුන්ට මගේ පඩිය නවත්වන්න සදාචාරමය ශක්තියක් තියෙනවා කියා. එසේ කළොත්, මම ඔබතුමා ගාවට ඇවිත් ඔබ දෙන්න බලාපොරොත්තු වන ආධාරය ඉල්ලනවා."

තව ටික වේලාවක් කතා කරමින් සිටි කොතලාවල මහතා, ඔහුත් සමඟ ඔහුගේ නව ව්‍යාපාරය බලන්නට මට ඇරයුම් කළේය. මම ඇඳුමක් දා ගෙන එතුමාගේ විශාල රියේ පිටු පස ආසනයේ වාඩි වෙන විට නිවි සිටි ස්ටෝරුව ඉදිරිපසත්, පාර දෙපැත්තෙත් සෑහෙන පිරිසක් බලා සිටියහ. එතරම් විශාල රියක වාඩි වී ගමන් කිරීම මට ලැජ්ජාවක් වුවත්, මම සිනාමුසු මුහුණින් එතුමා සමඟ පිටත් වීමි.

වාහනය දැනට සෙලින්කෝ මන්දිරය තිබෙන ගොඩනැගිල්ල ඉදිරිපිට නැවැත්තුවේය. මුලින්ම එතුමා එම ගොඩනැගිල්ල පිළිබඳ විස්තරයක් කොට, දැන් මා සමඟ හොඳටම කුලුපග හෙයින් මට 'ආරි' යනුවෙන් අමතා, විදුලියෙන් ඉහළට ඇදෙන පඩිපෙලක් මට පෙන්නුවේය.

"ආරි, මේ තමා ලංකාවේ ප්‍රථම එස්කැලේටර් එක" (විදුලියෙන් ක්‍රියා කරන පඩිපෙළ) අපේ රටේ මිනිස්සු මේවා දැකලා නවීන තාක්ෂණයත් – ලෝකයේ දියුණුව ගැනත් ඉගෙන ගන්නට ඕනෑ. එතකොටයි අපට දියුණු රටක් වෙන්න පුලුවන්."

මම සිනහ වී මෙසේ පැවසීමි. "සර්, තරහ වෙන්න එපා මේ කියන එකට. මම නම් කැමති විදුලි සෝපාන සහ විදුලි පඩිපෙළවල් නැතිව පයින්ම ඉහළ නගින්නට පුලුවන් තරමට අපේ ගොඩනැගිලි හදනවා නම්. අප අමතක කරන්න හොඳ නැහැ – මේ රටේ ඉන්න මිනිස්සු අවුරුදු දහස් ගණනක් අඩි 8296 ක් උස ශ්‍රීපාද කන්දට අදත් නගින බව. අනිත් එක අපේ මිනිස්සු කම්මැලි කරන්නත් හොඳ නැහැ. එහෙත්

නවීන තාක්ෂණය හඳුන්වා දීමට ඔබතුමා කරපු මේ වැඩේ මම ඉතා අගය කරනවා."

මේ අතර අපි ඊළඟ තට්ටුවට එස්කැලේටර් එකෙන් ළඟා වුණෙමු. හයියෙන් සිනාසුණු ජස්ටින් කොතලාවල මැතිතුමා ඊළඟට කළේ සෙලින්කෝ ආයතනය තුළ හැම අංශයටම මා කැඳවා ගෙන ගොස් විස්තර කිරීමයි.

ඡායාරූප: 242
ජස්ටින් කොතලාවල මැතිතුමා

එතුමාගේ කාර්යාලයේ දී, තේ පැන් සංග්‍රහයක් ද දී එතුමාගේම රියෙන් මා ගෙදරට හැරලන ලෙස එතුමා නියෝග කළේය. කාර්යාලයෙන් එළියට එන විට මගේ පිටට තට්ටු කොට එතුමා කීවේ,

"මාත් – සෙලින්කෝ ආයතනයත් ඔබ පිටුපස සිටින බව මතක තියා ගෙන, ඔබ හොඳ වැඩ ඔය අන්දමින් ම ඉදිරියට කර ගෙන යන්න."

ඡායාරූප: 243
දේශමාන්‍ය ලලිත් කොතලාවල මහතා

සුදු තොප්පියක් ද දා ගත් රියැදුරු සමඟ මා තනියෙන් පැමිණ, රියෙන් බසින විට සිනහ වී මා ඉදිරියට ආවේ නිව් සිටි ස්ටෝරුවේ අධිපති පී.ඊ. පෙරේරා මහතාගේ වැඩිමහල් පුත්, මගේ මිත්‍ර ජෝර්ජ් චන්ද්‍රසෝම මහතාය. ජස්ටින් කොතලාවල මහතා ආ කාරණයත්– කතා කළ දෙයත්, පෙන් වූ දේවලුත් පිළිබඳ විස්තරයක් ඔහුට කීමට මට සිදු විය.

එදා සිට එතුමා ජීවත් වනතෙක් වරින් වර වෝඩ් පෙදෙසේ තිබූ එතුමාගේ නිවසට ගොස් මම සුහද සංවාදවල යෙදී ඇත්තෙමි. තරුණ වියේ සිටි, දැනට සෙලින්කෝ ආයතනයේ අධිපති දේශමාන්‍ය ලලිත් කොතලාවල මහතා සමඟ මා මිත්‍ර වූයේ ඒ කාලයේදීය.

62

ස්ව සංවර්ධනයේ පළමු පියවර: ශ්‍රමදානය

සර්වෝදය අනුගමනය කරමින් ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජාතික සේවා අංශයක් පිහිටුවා, චන්ද්‍රා ෆොන්සේකා මහතාගේ අධ්‍යක්‍ෂකත්වයෙන් ආරියනන්ද අබේසේකර මහතා සහ වෛද්‍ය ලක්ෂ්මන් ද සිල්වා මහතා ද, එහි නිලධාරීන්, වශයෙන් පත් කරගෙන රජයේ එක් වැඩ පිළිවෙළක් ගෙන ගිය අතර, අධ්‍යාපන දෙපාර්තමේන්තුව ද, එවැනිම තවත් වැඩ පිළිවෙළක්, 'වැඩ හුරුව' යනුවෙන් ශිෂ්‍යයන් සඳහා ආරම්භ කළේ ය.



ඡායාරූප: 244
චන්ද්‍රා ෆොන්සේකා මහතා

චන්ද්‍රා ෆොන්සේකා මහතා දක්ෂ, උගත්, නිහතමානී සිවිල් සේවකයෙකි. අපි දෙදෙනා හඳුනාගත් දින සිටම හොඳ මිතුරන් වීමු. එක්දහස් නවසිය හැටඑකේ සිට – හැටපහ කාලය අතර ස්වේච්ඡා සේවා ආයතන එක්තැන් කොට තම දෙපාර්තමේන්තුව යටතේ කෙරුණු සංවර්ධන කටයුතුවලට සම්බන්ධ කර ගැනීමට එතුමා හුඟක් මහන්සි ගත්තේය. කලක් ඇල්ස්ටන් පෙදෙසේ තිබුණු එතුමාගේ දෙපාර්තමේන්තුවට අයිති ගොඩනැගිල්ලක කොටසක් ද, අපට කාර්යාලයක් පවත්වාගෙන යෑමට එතුමා ලබා දී තිබුණේය.

ආචාර්ය ගාමිණී විජේවර්ධන මහතා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වැඩ හුරුව අංශය බාරව සිටියේය. කිහිප වරක්ම මරදානේ අපේ නිවසට පැමිණි එතුමා, මේ සඳහා මගේ සහාය ඉල්ලුවා පමණක් නොව, මා අමාත්‍යාංශයට අනුයුක්ත කර ගැනීමට ප්‍රයත්න දැරුවේය. පිටින් සිට උදව් වෙනු හැර, නිලධාරියෙකු හැටියට උදව් වීම මම ප්‍රතික්ෂේප කළෙමි.

ඔහුගේ ඉල්ලීම අනුව, ශිෂ්‍ය නායකයන් හා ගුරුවරුන් වැඩ හුරුව සඳහා පුහුණු කිරීමට දෙහිවල මධ්‍ය විද්‍යාලයේ තුන් දින

කඳවුරක් සංවිධානය කළෙමි. ළමයින් පන්සියකට වැඩි ගණනක් දෙහිවල මධ්‍ය විද්‍යාලයට පිට්ටනියක් සෑදීමට නියම කරගත් දින එකතු වූහ. කඳවුරේ සංවිධායක වශයෙන් මා, ගාමිණී විජේවර්ධන මහතාට කියා තිබුණේ, ශ්‍රමදානයට අමතරව කාල සටහනක් අනුව, අකුරටම වැඩ කිරීමට ළමයින් හුරු කිරීම, භාවනාව, ජාතික ගීය, ජාතික සිරිත් විරිත්, සේවා විනය මාලාවක්, ශිෂ්ඨ සභ්‍ය ගීත, විනෝදාංශ මේ කඳවුරේ අවශ්‍යම අංග හැටියට ක්‍රියාත්මක කරන බවයි. සහභාගි වන සෑම ශිෂ්‍යයකුටම සහ ගුරුවරයකුටම වැඩ සටහන් පත්‍රිකාවක් දී තිබුණි.

කඳවුරට පෙර දා මා හමු වූ විජේවර්ධන මහතා පැවැසුවේ කඳවුරට අවශ්‍ය දිවා ආහාරය සඳහා කෑම පාර්සල්, තේ හා අතුරුපස ආදී සියල්ලම එතුමා විසින් සම්පාදනය කරන බවයි. ජාතික කොඩිය, සර්වෝදය කොඩිය හා දෙහිවල මධ්‍ය විද්‍යාලයේ කොඩිය ද එසවීමට තීරණය කළෙමු. හරියටම උදේ හතයි පනස්පහට පළාතේ මන්ත්‍රී ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මහතාත්, අධ්‍යාපන ඇමති ගරු බදුර්දීන් මොහොමඩ් මහතාත් පැමිණෙන බව එතුමා ප්‍රකාශ කළේය. වැරදිලාවත් එතුමන්ලා මිනිත්තු පහකට වඩා ප්‍රමාද වුවහොත්, කාල සටහන අනුව මම වැඩ පටන් ගන්නා බවට එතුමාට අනතුරු ඇඟවීමි.

පසුදා බලාපොරොත්තු වූ අන්දමටම, බලාපොරොත්තු වූ ආරාධිතයෝ ප්‍රමාද වූහ. බාලම ශිෂ්‍යයා කැඳවා ජාතික කොඩිය එසවීමට සැලැස්වීමි. වැඩිහිටිම ගුරුවරයා කැඳවා මුල් පස් පිඩැල්ල කැප්පුවෙමු. සියල්ලෝ ම ඉන්පසු පිට්ටනිය සකස් කිරීමේ වැඩ කටයුතු කළහ. පැයක් පමණ ප්‍රමාදව විජේවර්ධන මහතා මන්ත්‍රීතුමාත්, ඇමතිතුමාත්, අධ්‍යක්ෂවරයාත් සමඟ පැමිණි විට අවි ආයුධ සූදානම් කර තිබුණ නිසා, ඒවා ඔවුන් අතට දුන්නෙමි. ටිකක් වැඩ කොට ආරාධිතයෝ අපට ස්තුති කොට නික්ම ගියහ.


ඡායාරූප: 245
ඇල්බට් එදිරිසිංහ මහතා

ආහාර පානාදිය කිසිත් සූදානම් කර නොතිබුණ නිසා, ඇල්බට් එදිරිසිංහ මහතා සහ සෝමි මීගම මැතිනියගෙන් මුදල් පරිත්‍යාග ඉල්ලාගෙන අරුණදිසි හෝටලයේ මාගේ ඥාති සොහොයුරු අරනෝලිස්

අයියාගේ ද උදව් ඇතිව අවශ්‍ය ප්‍රමාණයට දිවා ආහාරය ගෙන්වා ගතිමු. දිවා පවුල් හමුව ද තබා, ඉතිරි වැඩ පස්වරුවේ නිම කොට, අවසන් පවුල් හමුව සවස හතරයි තිහට පමණ තබා, පහට පමණ අපි විසිර ගියෙමු. අධ්‍යාපන අමාත්‍යාංශය මා ලවා සංවිධානය කළ පළමු සහ අවසාන කඳවුර එයයි.

ඡායාරූප: 246
විලියම් කන්දගේ මහතා

ඊට සතියකට පමණ පසු අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ගිරාගම ගුරු විදුහලේ දී පුහුණු වන ගුරුවරුන් දාහක් පමණ කැඳවා, වැඩ හුරුව ගැන සම්මන්ත්‍රණයක් සංවිධානය කෙරිණි. ආචාර්ය ගාමිණී විජේවර්ධන මහතා සහ අධ්‍යාපන අධ්‍යක්ෂ ඊ. එච්. ද අල්විස් මහතා මුල් දේශන කළ මුත්, ගුරුවරුන් කිසිවෙකු එයින් ධෛර්යයක් ලත් බවක් නොපෙනිණි. ඊළඟ කතාව පවරා තිබුණේ මටයි. අධ්‍යාපනය යනු කුමක්ද? ගුරුවරයාගේ කාර්ය–භාරය කවරේද? හරිහැටි ශ්‍රමය යෙදවීම අධ්‍යාපනයේ අවශ්‍ය අංගයක් වන්නේ කෙසේ ද? යන කරුණු අළලා ශ්‍රමදාන පිළිබඳ පැයක පමණ දේශනයක් මම කළෙමි. ඊ. එච්. ද අල්විස් මහතා පවා, ගුරුවරුන්ගේ අවධානය මා ලබාගත් අන්දම ගැන පුදුම විය. කතාව අවසානයේ දී මේ ක්‍රියාවලියට සිය කැමැත්තෙන්ම ගුරුවරුන් කීදෙනෙක් ඉදිරිපත් වන්නේ දැයි මම සභාවෙන් විමසීමි. දහසකට අධික ගුරුවරුන් සැම දෙනාම අත ඔසවා කැමැත්ත ප්‍රකාශ කළහ. සමහරු දැතම එසවූහ. හැමෝම මට ප්‍රශංසා කළහ. එම සභාවේ සිටි ලේඛකයෙක් එනම් කාල්ටන් සමරජීව මහතා, මේ දේශනය පිළිබඳ ඉතා අගනා ලිපියක් පිටරට පත්‍රයකට ලීවේය. එහි පිටපතක් ඔහු මට එවා තිබුණේය.

මේ රැස්වීමේ ප්‍රධානතම ප්‍රතිඵලය වූයේ අප ව්‍යාපාරයේ ප්‍රබලම නායකයෙක් වූත්, ප්‍රධාන ලේකම්වරයෙක් වශයෙන් බොහෝ කලක් සිටි විලියම් කන්දගේ මහතා මට මුණගැසීමය. බදුල්ලේ ඒ. කේ. වික්‍රමසිංහ මහතා සහ කේ. විජේසේකර මහතා ද අපට එකතු වූ තවත් නායකයෝ දෙදෙනෙක් වූහ.

පසුදාම, මරදානේ අපේ නිවසට පැමිණි කන්දගේ මහතා, මා මුණ ගැසුණේය. එතුමා සේවය කළ කෑගල්ල දිස්ත්‍රික්කයේ කඳවුරු

ගණනාවක්ම කිරීමට සැලසුම් ද සාදාගෙනයි එතුමා මා හමුවීමට පැමිණියේ. නැටියාපාන, අරණායක, ගල්බොක්ක, රහල, හකුරුගම්මන ආදී ප්‍රදේශවල දහසක් දෙනාගේ සිට හය දහසක් දෙනා දක්වා සහභාගි වූ කඳවුරු රාශියක්ම, එතුමා විසින් සංවිධානය කරන ලදී. මේ ප්‍රදේශයේ අද විශාල බස් ගමන් කරන මහා මාර්ග රැසක්ම ඉදිවූයේ අපේ සර්වෝදය ශ්‍රමදාන කඳවුරු මාර්ගයෙනි.



ඡායාරූප: 247
කේ. විජේසේකර මහතා

කන්දගේ මහතා විසින්ම, මේ කඳවුරු අළලා ලියන ලද වාර්තාවක සමහර කොටස් ඔහුගේ වචනවලින්ම සමහර තැන්වල සඳහන් කරන්නේ, මේ කටයුතු කිරීමේ දී මුහුණදීමට සිදුවන දහසක් ප්‍රශ්න සහ එයින් ලැබුණු අත්දැකීම් පිළිබඳ අදහසක් දීමටය.

එක්දහස් නවසිය හැටඑකේ අප්‍රේල් පස්වැනි දා, මහනුවර ගිරාගම ගුරු විදුහලේදී ලංකාවේ නොයෙක් දෙසින් පැමිණි දහසකට අධික විදුහල්පතිවරුන් අතරින් කෙනෙකු වූ විලියම් කන්දගේ මහතා, මා හමුවීම පිළිබඳව ලියා තිබුණේ මෙසේය:

* * *

"අවුරුදු විසිහයක් වයසැති, කුඩා සිරුරක් ඇති, ජාතික ඇඳුමෙන් සැරසුණු ඒ. ටී. ආරියරත්න මහතා, සවස තුනට වේදිකාවට නැඟ "දාරිද්‍ර නාරායන" දුප්පත් දෙවියා දැකීම ද දේවාශීර්වාදයකැයි කියමින් සිය දේශනය ඇරඹීය. මහත්මා ගාන්ධිගේ දකුණු අප්‍රිකානු සටන් ව්‍යාපාරයත්, සර්වෝදය දර්ශනය බිහි වූ සැටිත්, ඉන්දියානු නිදහස් සටන සඳහා ඒ උපස්ථම්භක වූ ආකාරයත් පැහැදිලි කොට, ඉන්පසු ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ, අඩුපාඩු පෙන්වමින්, ගාන්ධිතුමන්ගේ, වර්ධා අධ්‍යාපන ක්‍රමයෙන් ගත හැකි ආදර්ශයත් පැහැදිලි කරමින්, දිය ඇල්ලකින් ඇද හැලෙන දිය දහරාවක් මෙන් නොකඩවා පැය තුනක දීර්ඝ දේශනයක් පවත්වමින්, සවස හයට දේශනය නිමවා අසුන් ගත්තේය. රැස්ව සිටි පිරිස ශාලාවෙන් පිටත්වත්ම, දේශනයෙන්

ඡායාරූප: 248
ඒ. කේ. වික්‍රමසිංහ මහතා

වසඟයට පත්ව සිටි මම, කථිකයා ළඟට ගොස්, ඔහුගේ දෑත් අල්ලාගෙන, දේශනයේ අන්තර්ගත වූ සාරවත් අරමුණු පිළිබඳ ව ස්තූති කළෙමි. සර්වෝදය දර්ශනයේ සඳහන් අන්දමට, මුළු දිවියම ඒ සඳහා කැප කළ යුතු "ජීවදාන්" අරුතට ගැලපෙන ලෙසින්, යාවජීව සර්වෝදය සාමාජිකයකුවීමේ අභිලාශය පළ කළෙමි. මගේ ගුරු ජීවිතයේත්, සමාජ සේවා කටයුතුවලත් විශාල වෙනසක් කිරීමට සමත් වූ එය, ජීවන පෙරළිය සඳහා පදනම වැටුණු දෛවෝපගත හමුවීමක් විය.

ඉන්පසු පන්ති කාමරයෙන් පරිබාහිර වූ අධ්‍යාපන ක්‍රමයක් ගොඩනැංවීමටත්, පක්ෂ දේශපාලනයෙන් තොර විවිධ භේදාදියෙන් විනිර්මුක්ත වූ, සර්ව සාධාරණ සමාජයක් ගොඩනැංවීමටත්, ශ්‍රමදාන කඳවුරක් උපයෝගී කර ගත හැකි අයුරින් දීර්ඝ ලෙස සාකච්ඡා කළෙමි. මේ වන විට, අධ්‍යාපනික ප්‍රජා සංවර්ධන ශ්‍රමදාන කඳවුරක් මා සේවය කළ කෑගලු දිස්ත්‍රික්කයේ පැවැත්වීමට මගේ සිතේ සැලසුම් කොට අවසාන වී තිබුණි. ඒ දැඩි අධිෂ්ඨානය, එතුමා සමඟ පැවැසූ විට, ඊළඟ සති අන්තයේ සෙනසුරාදා උදේ මරදානේ සිය නිවසේ දී මුණ ගැසෙන ලෙස ඇරයුම් ලැබීමි.

ගිවිස ගත් පරිදි, සෙනසුරාදා මම මරදානට ගියෙමි. මා ගියේ ශ්‍රමදාන කඳවුරක් පිළිබඳ දළ සටහනක් ඇතිව ය. ආරියරත්න මහතා ඒ සටහන කියවා, දීර්ඝ ලෙසින් සාකච්ඡා කර, ඊළඟ පාසල් විවේකය ඇරඹෙන අගෝස්තු මාසයේ මුල් සතියේ දී කඳවුර පැවැත්වීමට තීරණය කළෙමු.

එදා දහවල් බතට මට ඇරයුම ලැබුණත්, මුළුතැන් ගෙයි පිසෙන කුඩා බත් මුට්ටිය දුටු මම මා කෑමට නැවතුණහොත්, ගෙදර සියල්ලන්ට බඩගින්නේ සිටින්නට සිදු විය හැකි යයි කියා, යාබද සඳගිරි හෝටලයට ගොස් සත හැටකට බත් පාර්සලයක් ගෙනවුත් ආරියරත්න මහතාගේ සුළු පියා වූ බාප්පොච්චි නමින් හැඳින් වූ ඒ. ටී. සී. ජිනදාස මහතාගේ කාමරයේ දී අනුභව කොට, ගෙදර ගියෙමි."

* * *

සඳුදා පාසල පටන් ගන්නා උදෑසන රැස්වීමේ දී, ආචාර්ය මණ්ඩලයට හා සිසු පිරිසට ශ්‍රමදාන කඳවුර ගැන දැනුම් දුන් කන්දගේ මහතා, පාසල් කාලයෙන් බාහිර, මුළු කාලයම මේ කඳවුර ගැන ගම් පළාතේ ඇවිදිමින් කරුණු පැහැදිලි කළේය. හැම සති අන්තයකම මරදානේ අවුත් කඳවුරේ ප්‍රගතිය ගැන මට වාර්තා කළේය.

බාධක ජයගත් හැටි

කොළඹ නාලන්දා මහා විද්‍යාලය එවකට පරම විඥානාර්ථ බෞද්ධ සංගමයෙන් පාලනය වූ උපකෘත විදුහලක් ව පැවතිණි. එහි විදුහල්පති තුමන්ට හා ආචාර්ය මණ්ඩලයට ස්වාධීනව කටයුතු කිරීමේ වරප්‍රසාදය අයත්ව තිබුණි. එහෙත් රජයේ ගුරුවරුන්ට එවැනි අයිතිවාසිකමක් නොවීය. නොයෙක් නීති රීතිවලින් බැඳී සිටීම නිසා කන්දගේ මහතාට ශ්‍රමදාන කඳවුරක් පැවැත්වීම පහසු කාර්යයක් නොවීය. එහෙයින් වහාම ගුරු දෙගුරු සමිතිය කැඳවා එහි සම්මත කර ගත් යෝජනාවකින්, ඔහු බලය පවරා ගත්තේය. ඉන්පසු 'වැඩිහිටි අධ්‍යාපන පන්ති' යන නාමයෙන් කටයුතු සංවිධානය කළේය. ගම් ප්‍රදේශවල ඇවිදිමින් පෞද්ගලිකව ගම් වැසියන් මුණ ගැසී සාකච්ඡා කොට, අරමුණට ඔවුන් නතු කර ගත්තේය.

දෙවැනිව උඩුගම – පත්තම්පිටිය, කෙම්පිටිය, හලාගිරිය, කඩිගමුව, හේනේපොල, මාලියැද්ද, බැද්දේවෙල, වැනි විදුහල්වල ගුරු දෙගුරු සමිති කැඳවා අනුමැතිය ලබා ගත්තේය. ග්‍රාම සංවර්ධන සමිති, ක්‍රීඩා සමාජ, කාන්තා සමිති වැනි ආයතන ප්‍රධානීන් හමු වී, එකඟතාවය ලබා ගත් කන්දගේ මහතා, ගම්මුලාදෑනි මහතා, සෞඛ්‍ය පරීක්ෂක, සෞඛ්‍ය පාලිකා වැනි ගැමි මට්ටමේ රාජ්‍ය නිලධාරින් මුණ ගැසී සාකච්ඡා කළේය.

මේ සාර්ථක ක්‍රියා මාර්ගයෙන් පසු, කන්දගේ මහතා කෑගලු ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ අශෝක ධර්මකීර්ති මහතා මුණ ගැසී විස්තර සාකච්ඡාවකින් පසු, දිස්ත්‍රික්කයේ සියලු ම විදුහල්වල උදෑසන රැස්වීම්වලදී, ප්‍රජා සංවර්ධන අධ්‍යාපනික ශ්‍රමදාන කඳවුර, පිළිබඳව දේශනයන් පැවැත්වීමට ලිඛිත අවසරයක් ලබාගෙන, දිනපතා උදේ හතයි තිහට ප්‍රදේශයේ විදුහල් සිය ගණනකට ගොස් ගුරු ශිෂ්‍ය දෙපක්ෂය අතරේ වැටහීමක් ලබා දී, කාරුණික ක්‍රියාත්මක සහයෝගය ලබා ගත්තේය. හැම විදුහලකින්ම විදුහල්පතිතුමාත්, ආචාර්ය වරයෙකුත්, අඩු තරමින් වැඩිහිටි ශිෂ්‍ය--ශිෂ්‍යාවන් 10 දෙනෙකු වත් සහභාගී කරවා ගැනීමට ප්‍රතිඥා ලබා ගත්තේය. ඒ හැර උදලු, ගල් කටු, ස්කෝප්ප වැනි ආයුධ ලබා ගැනීමටත්, ආහාර පාර්සල්, සීනි, තේ කොළ, කෙසෙල් ගෙඩි ආදිය ලබා ගැනීමටත් ප්‍රතිඥා ලබා ගත්තේය.

ප්‍රදේශයේ හා දිවයිනේ නොයෙක් ආයතනයන්ට ලිපි ලිවීමටත්, මුද්දර හා කඩදාසි නොතිබූ හෙයින්, රඹුක්කන ගරු මන්ත්‍රී තුමාගෙන් හා මාවනැල්ල ගරු මන්ත්‍රී තුමාගෙන් මුද්‍රා සහිත ලියුම් කවර ලබා

ගෙන, ලිපි දහසකට ආසන්න ගණනක් ලීවේය. විශේෂයෙන් සඳහන් කළ යුත්තේ මාවනැල්ල ආදායම් පාලන නිලධාරී බණ්ඩාරනායක මහතාගේ විශේෂ අනුග්‍රහය ලබා ගැනීමයි. මාසයක් ඇතුළත ප්‍රදේශය තුළ විශාල ප්‍රචාරයක් ලබා ගත් හෙයින්, ඉන්පසු කැගලු දිස්ත්‍රික්කයේ ප්‍රධාන රාජ්‍ය නිලධාරියා වූ මහ දිසාපතිවරයා (ගයි අමිර්තනායකම් මහතා) මුණ ගැසී සාකච්ඡා කොට, රාජ්‍ය ආයතනයන්ගේ සහයෝගය ලබා ගැනීමට පොරොන්දුව ලබා ගත් මිහු, ඉන්පසු දිස්ත්‍රික් ඉඩම් සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම සහකාර අධ්‍යක්ෂ, සෞඛ්‍ය සහකාර අධ්‍යක්ෂ (විවේකානන්ද රාජා මහතා) ගොවිජන සේවා සහකාර කොමසාරිස් මහතා, පොලිස් අධිකාරී (පසුව පොලිස්පති ආනන්ද සෙනවිරත්න මහතා) වැනි අයගේ ලිඛිත හා වාචික අනුමැතිය ලබා ගත්තේය. මාවනැල්ල ආදායම් පාලන නිලධාරී තුමන් ශ්‍රමදාන කඳවුර පැවැත්වීමට සති දෙකක කාලයක සිට විශේෂයෙන් මිල්චාර්ඩ් හාල් හා සීනි, පරිප්පු ආදිය ගම්මානවලට බෙදා දීමට විධි විධාන යෙදීය. ලංගම නිලධාරිහු විශේෂ බස් සේවාවක් යෙදීමට කටයුතු යෙදූහ.

ප්‍රචාරක රැස්වීම – 1961 ජූනි 18

එක්දහස් නවසිය පනස්අටේ වසරේ බෞද්ධ පෙරහැරක් පත්තම්පිටිය නගරයේ පැවැත්විණි. එය ගමන් කළේ මුස්ලිම් දේවස්ථානය ඉදිරියෙනි. පෙරහැරේ හේවිසි නාදය මුස්ලිම්වරුන්ගේ ආගමික වතාවත්වලට බාධාවක් යයි සැලකූ පිරිස හා බෞද්ධ පෙරහැරේ අය අතර ගැටුමක් ඇති විය. පොලීසිය පැමිණ වෙඩි තැබීමෙන් බෞද්ධයෙක් මිය ගියේය. මුස්ලිම් පාසල හා මුස්ලිම් කඩ මේ නිසා ගිනිබත් විය. මේ නිසා ප්‍රදේශවාසීහු මුස්ලිම් හා සිංහල ජාතීන් අතර අසමගියක් පැන නැඟුණි.

මේ අතර සර්වෝදයේ පහන් ආලෝකය මේ ප්‍රදේශයේ දැල්විණි. 1961 මැයි මාසයේ දී කලින් ගිනිබත් කළ පාසල වෙනුවට, ගොඩනැඟුණු නව පාසල් ගොඩනැගිල්ලේ දී සර්වෝදය දර්ශනයත්, සර්වෝදයෙන් ගම් ප්‍රදේශය දියුණු කිරීම පිළිබඳවත් කරුණු පැහැදිලි කිරීමේ මහා සභා රැස්වීමක් පැවැත්විණි.

ඒ රැස්වීමට මා සමග ඇම්. ඒ. තිලකරත්න මහතාත් සහභාගි විය. එවකට රඹුක්කන මන්ත්‍රී ගරු අධිකරණ උප ඇමති අශෝක කරුණාරත්න මහතාත්, මාවනැල්ල මන්ත්‍රී ගරු වෙළඳ උප ඇමති පී.ආර්. රත්නායක මහතාත් සහභාගි වූහ. කැගලු දිසාපති තුමන්ගේ

නියෝජිතයෙක් ද, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරීහු ද, ප්‍රාදේශීය කෘෂිකර්ම, ප්‍රාදේශීය සෞඛ්‍ය දෙපාර්තමේන්තු නිලධාරීහු ද, රඹුක්කන පොලිස් ස්ථානාධිපති ප්‍රැන්සිස් ඉලේපෙරුම මහතා ඇතුලු කෑගල්ල පොලිස් අධිකාරී කාර්යාලයේ නියෝජිතවරුද, ගොවිජන සේවා සහකාර කොමසාරිස් ඇතුලු රජයේ විවිධ ආයතනවල නියෝජිතවරුද, ලංගම වැනි සංස්ථාවල නියෝජිතවරුද, ගම්වල ගම්මුලාදෑනිවරුද, සෞඛ්‍ය පරීක්ෂකවරු, මහිලා සමිති, ග්‍රාම සංවර්ධන සමිති නියෝජිතවරුද, ප්‍රාදේශීය විදුහල්වල විදුහල්පතිවරුද, පන්නම්පිටිය, කඩිගමුව, නැටියපාන, කෙම්පිටිය, උඩුගම, හේනෙපොල, මාලියැද්ද, යටිවල්දෙනිය, හලාගිරිය, කිරිවන්දෙනිය, මුවපිටිය, මාකෙහෙල්වල ආදී ගම්වල වැසියෝ ද, මුස්ලිම්වරු හා හත්බෑව, කෙම්පිටිය වතුවල දෙමළ ජනතාව ද දහසක් පමණ දෙනා මේ රැස්වීමට සහභාගි වූහ.

කඳවුරක දින චරියාව

පහන්දොර හතරයි තිහට අවදි වීම, ලැබෙන උණුසුම් තේ කෝප්පයෙන් නිදිගැට හැර මූණ කට සෝදා, තමන් හා අවට පවිත්‍ර කිරීමෙන් දවසේ වැඩ ඇරඹේ. වැසිකිළි සේදීම මුල්ම කාර්යයි. ඉන් පසු සරඹ ව්‍යායාම්වල යෙදේ. උදේ ආහාර නිම වීමෙන් පසු කඳවුරට සුදුසු ඇඳුමෙන් සැරසී "කොඩි" ගහ යට උදේ පවුල් හමුවට එක් වෙති. ඉන් පසු දහයේ කණ්ඩායම්, සිය කණ්ඩායම් නායක ගුරුභවතා හෝ ශිෂ්‍ය නායක ද, ප්‍රාදේශීය පාසල් කණ්ඩායම ද, ගම්වැසියන් කණ්ඩායම ද සමඟ තමන්ට අවශ්‍ය උපකරණ ප්‍රමාණය නැවත ගෙන ඒමේ පොරොන්දු පිට රැගෙන ශ්‍රමදාන ගීත ගයමින්, කඳවුරු ස්ථානයන් බලා පිටත්ව යති. ගමන් කරන විට

"ශ්‍රමදාන දියුණු වේවා,
අපේ කුඩා ගම් සැදේවා,
ලක් මැණියගේ ම පිහිටෙන්
අප සැමට වෙර ලැබේවා" යැයි ගී ගයන විට, මග දෙපස සිටි බාල, මහලු, වැඩිහිටි පිරිස් ද ඒ පිරිසට එක් වූහ. පාරවල් තැනීම සඳහා ගිය පිරිස්, දැන්වීම් පුවරු අනුව තමන් වැඩ කළ යුතු කොටසට ළඟා වී වැඩ පටන් ගත්හ. නගරබදින් ගිය කණ්ඩායම අපේ ගමේ උදව්වට පැමිණියෝ නොවේ දැයි සිතමින්, වැඩ කරන සැටි මවිතයෙන් බලා සිටියහ. එහෙත් ඔවුනට එසේ බලා සිටින්නට වේලාවක් නොවීය. කුඩා ළමයින් පවා පුවක් අතුවලින් පස් අදින හැටි බලා වැඩිහිටි කාන්තාවෝ ද වැඩ කළහ.

ඡායාරූප:249
පාරවල්
කැපීම

මේ අතර "නංගිලා, මල්ලිලා, අයියලා, අක්කලා එන්න මල් වාගේ උදයේ පිපී..." යැයි ගයන විට සියල්ලෝ කුමන හෝ වැඩකට සහභාගි වෙති.

වරින් වර වතුර සපයන කණ්ඩායම් මහන්සි වන අයට බීමට පිරිසිදු ජලය සපයා දෙති. ප්‍රථමාධාර කණ්ඩායම්, ප්‍රථමාධාර පෙට්ටි රැගෙන ඔබ මොබ යති. ඉඳ හිට කුඩැල්ලෙක් සිය පාදයේ එල්ලුනු විට නුපුරුදු අත්දැකීමක් ලෙස සැලකූ නගරබද පාසල් ශිෂ්‍යයෝ, උඩ පැන කෑ ගසති. උදේ දහය වන විට නැගුණු සීනු නාදයෙන් තමන් වැඩ කළ ආයුධ සුරැකිව තබා, තේ පානයට සූදානම් වේ. බනිස් හා කෙසෙල් ගෙඩි කා, තේ බී, යළිත් දහයයි පහළොවට වැඩ අරඹති. දහවල් දොළහයි තිහ වනවිට උදේ වරුවේ වැඩ නිම කරන්නේ කරන ලද වැඩ කොටස ගැන සතුටු වෙමිනි. ශබ්ද විකාශන යන්ත්‍රයකින් හෝ සීනුවකින් හෝ ලැබෙන සංඥාව අනුව ආයුධ සුරැකිව තබා – නියමිත ස්ථානයට, රුක් සෙවණකට රැස්ව මුහුණ කට සෝදා දහවල් ආහාරය සඳහා රැස් වෙති.

එක් කෙනෙක්ට ලැබෙන ආහාර පාර්සලය රැගෙන අනුභව කිරීමෙන් පසු, දිය බී, කෙසෙල් ගෙඩියක් කයි. ඒ අතර සමහරු ගැමියෙකුගේ මඩිස්සලයෙන් බුලත් විටක් ලබා ගෙන සපමින් විනෝද වෙති.

ඉන්පසු දිවා පවුල් හමුව ගුරු භවතෙකු, ගුරු මහත්මියක හෝ වැඩිහිටියෙකුගේ මූලිකත්වයෙන් ඇරඹේ. මිනිත්තු දෙකක භාවනාවෙන් පසු එක් එක් විශේෂාංග ඉදිරිපත් වේ. අතර තුර ගැමියෙක් නැගී සිට ජන කවියක්, ප්‍රදේශයේ පුරාවෘත්තයක් කියා පාමින් පිරිස ප්‍රීතිමත් කරයි.



ඡායාරූප: 250
ළිං සෑදීම

කඳවුරු බැඳ ඇති ගම්මාන හතේ ඒ ඒ ස්ථානවලදී මේ වෙලාවටම මෙසේ දිවා පවුල් හමු පැවැත් වේ. නැවත සවස දෙකට කාල සටහනේ සඳහන් පරිදි යළිත් ශ්‍රමදාන කටයුතු ඇරඹේ.

සවස තුනයි තිහට සවස තේ පානය සඳහා මිනිත්තු පහළොවක විවේකයකි. සවස් වරුවේ ද බිස්කට්, කෙසෙල් ගෙඩි සමඟ තේ ලැබේ.

මේ අතරතුර වාහන යා හැකි තැන්වල තේ ප්‍රචාරක මණ්ඩලයෙන් තේ ලැබේ. සමහර තැන්වලදී ගැමියන්ගෙන් කුරුම්බා, තැඹිලි ආදිය ශ්‍රමදාන කඳවුරේ අයට ලබා දෙයි. සවස තේ පානයෙන් පසු යළිත් වැඩ අරඹා සවස පහට දවසේ කටයුතු නිමා කොට නාන්නට යති. ඇලේ, දොලේ නෑම තහනම් හෙයින් ළිං, නාන පීලි ආදියෙන් නා අවසාන කඳවුරු භූමියට පැමිණ, උණු තේ කෝප්පයකින් වෙහෙස නිවා ගනී. ඉන්පසු පුවත් පත් බැලීම කරයි. සවස හතයි තිහ පමණ වනතුරු ගැමියන් හා සුහද සාකච්ඡා පවත්වමින්, කරුණු අධ්‍යයනය කරයි. ඒ අතර කණ්ඩායම් නායකයෝ දිනයේ විශේෂ සිද්ධීන් හා හෙට දිනයේ කරන වැඩ පිළිබඳ සාකච්ඡා කරමින් සැලසුම් සකස් කරති. රාත්‍රී අටට රාත්‍රී ආහාරය ගෙන රෑ පවුල් හමුව පැවැත් වේ. ගිනි මැලයක් වටා කවාකාර ව රැස් වෙන පිරිස නොයෙක් සංස්කෘතික අංගයන්ගෙන් විනෝද වෙති.

ගමින් ගම ගෙයින් ගෙට

සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරිවරයා තරුණියන් පිරිසක් සමග ගෙන් ගෙට ගියේ, සෞඛ්‍ය අධ්‍යාපනයක් - විශේෂයෙන් ගැමි කාන්තාවන්ට ලබා දෙන අටියෙනි.

ඔවුහු, ගෙදරකට ඇතුලු වූ විට මුලින් ම ගියේ මුලුතැන්ගෙටය. එහි උපකරණ රැස් කර තිබෙන අයුරු පිරික්සා බලා, වතුර කළගෙඩිය තිබිය යුතු ස්ථානයත්, එය වසා තැබිය යුතු අයුරුත්, හැලි වළං තිබිය යුතු පිළිවෙලත් කැත්ත, මන්නය, කුල්ල, මල්ල තිබිය යුතු තැන් ද, ඒවා පිළිවෙළට තිබිය යුතු අයුරු ද පහදා දුන් හ.

ඡායාරූපඃ 251
ගෙවතු වගා
කිරීම

ඉන්පසු රතුලූණු, වියලි මිරිස් ආදිය තැන්පත් කිරීමත්, කුලුබඩු වර්ග හා මිටි බත් ටින් හෝ බෝතලය බැගින් ගෙන, ඒවායේ කුලුබඩු වර්ගයේ නම් සඳහන් කොට, ලේබල් අලවා රාක්කයේ තැන්පත් කරන අයුරු පහදා දුන්හ. මිරිස් ගලේ ඉතිරි ව ඇති මිරිස් කොටස් ඉවත් කොට ජලයෙන් සෝදා පිරිසිදු කළහ. ලූණු පොල් කටුව තබා ගන්නා හැටිත් පෙන්වා දුන් හ. මුලුතැන් ගෙට ගෙන එන එළවලු එක් එක් ලෙසින් වෙන් කර තබන සැටිත් පහදා දුන්හ.

මිටි හාල් මුට්ටියට වේලකට බත් පිසීමට ගන්නා හාල්වලින් මිටක් එකතු කොට භාජනයකට තැන්පත් කිරීම ගැමි ළඳුන්ගේ සිරිතකි. මෙසේ මිට බැගින්, මිටි හාල් මුට්ටියේ එකතු වන හාල් හදිසි අවස්ථාවකදී ප්‍රයෝජනයට ගැනීම ඒ අයගේ සිරිතකි. අභාවයට යන මේ සිරිතට නව පණක් දීමට ඔවුහු විධි විධාන යෙදූහ.

ආහාර කල් තබා ගැනීම

ඡායාරූප: 252
හස්ත කර්මාන්ත

දැනට අභාවයට යමින් පවත්නා වැලි කොස් ඇට සඳහා කොස් ඇට මුල්ලක් කුස්සියේ මුල්ලක සාදා දුන්හ. අව් කොස් නමින් වියලි කොස් මදුලු වියලා ගන්නට උපදෙස් දී, දෙල් වාරයේ දී දෙල් බැද තබා ගන්නට ප්‍රායෝගිකව පෙන්වා දුන්හ. ලූණු දෙහි – බිලිං ආදිය කල් තබා ගන්නා ලෙස උපදෙස් දුන්හ. මේ අතර ඔවුහු ගැමි ළඳුන්ගෙන් කොහොල්ලෑ මැලියම් අරපරිස්සම් කර ගන්නා හැටි උගත්හ.

ගේ දොර හොඳින් තබා ගැනීම

නිතර අවශ්‍ය වන පනාව, කණ්ණාඩිය නියමිත තැන්වල තැබීමත්, පුටු – මේස ළමයින්ට අධ්‍යාපන කටයුතු කිරීමට අවශ්‍ය තැන් පිළියෙල කිරීමටත්, විධි විධාන යෙදූහ. ළමා සෞඛ්‍යය පිළිබඳ විශේෂ වැඩ සටහන් ද මේ අතර විය. මේ අතර කෘෂිකර්ම ව්‍යාප්ත නිලධාරි තැන මේ කණ්ඩායමට එකතු ව ගෙදරට අවශ්‍ය එළවලු ගෙවත්තේ වැවීම ගැන උපදෙස් දුන්හ. විශේෂයෙන් සමතුලිත ආහාරයක් සපයා ගැනීමට අවශ්‍ය දෑ ගැන සාකච්ඡා කළහ. මිදුලේ දේශීය මල් වැවීමට අනුබල දුන්හ. හැම ගෙදරකටම දහ අට මාසයේ කොස් පැලයක් ද, පේර පැලයක් ද, කෙසෙල් පැළයක් ද බෙදා – සිටවූහ.

වැසිකිළි තැනීම

කෑගලු සෞඛ්‍යය සේවා අධ්‍යක්ෂගේ අනුග්‍රහයෙන් වැසිකිළි සියයක් තැනීමට මුදල් වෙන් කර තිබුණි. සෞඛ්‍ය පරීක්ෂක (දැන් මහජන සෞඛ්‍ය නිලධාරි) ගෙන් ගෙට ගොස් වැසිකිළි වළ කපන තැන සිට, සතියක් තුළ සාදා අවසන් වනතුරු සියලු උපදෙස් දුන්නේය. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් වැසිකිළි පහළොවක් ද, ළිං පහක් ද, ගොවිකම් ළිං තුනක් ද, ආදායම් පාලක නිලධාරිතුමා ළිං පහක් රජයේ ආධාරයෙන් ද සෑදූහ.

ප්‍රථමයෙන් පස් පිඩැල්ල කැපීමෙන් පාසල් වත්තේ නාන ළිඳක් තැනීමට මම මුල පිරුවෙමි. ගෙයින් ගෙට වැඩ පිළිවෙල අවසන් වෙද්දී

ගැමියන්ට සෙතක් වූවා සේ එයට සහභාගි වූ තරුණියන්ට ද විශේෂ අධ්‍යාපනයක් ලබා ගන්නට ඉඩ ප්‍රස්ථාව ලැබුණි. විශේෂයෙන් බිළිඳුන් නැවීම, ආහාර සැපයීම, ළමා ඇඳුම් – ගේ – දොර පවිත්‍ර තබා ගැනීම, ගැමි සිරිත් විරිත්, ආගන්තුක සත්කාර, ගැමියන්ට චාම් දිවි පෙවෙත, ගැමි ආහාර, පැණි වළලු, කිරි රොටි, පුස්නාම්බු වැනි පැරණි සිංහල ආහාර පිළියෙල කරන හැටි උගත්හ. සවස පවුල් හමුවලදී ඒවා විස්තර කර දී, නගරබදින් ආ පිරිසට විස්තර කර දෙන ලදී.

ඡායාරූප: 253
වැව් හා වාරිමාර්ග පිළිසකර කිරීම

දිවා පවුල් හමුව

එදින දිවා ආහාරය අප ලබා ගත්තේ පිටවල ගමෙහි පාරකට කපන ලද පොල් කඳක් උඩට වී ඉඳගෙනය. දිවා පවුල් හමුවේදී විශේෂ පිරිසක් විය. එවකට ගම්මුලාදෑනි නමින් හැඳින් වූ ගම්පති තුමා විශේෂ දේශනයක් කරමින්, ඇස්වල කඳුලු පුරවා ගෙන මෙසේ කීවේය.

"මා සිතුවා පාසල් ළමයි එකතු වී කරන මේ ශ්‍රමදානය නිකං සෙල්ලම්කාර වැඩක්, බොරු වැඩක් කියා – දවසක වැඩ කොටස නිමා කොට ඇති ප්‍රමාණය දුටු විට මට ඉමහත් ලැජ්ජාවක් ඇති වුණා. ඒ නිසා කඩිගමුවේ කඳවුරේ සියලු දෙනාටම උදේ ආහාරය හා සවස ආහාරය මගෙන් දෙනවා. මේ කපන පාර තවත් දිගු කිරීමට මාගේ ඉඩම් වලින් භූමි ප්‍රමාණයක් වෙන් කර දෙනවා." එසේ පවසා ලිඛිත අවසරයක් ද දුන්නේය.

පවුල් හමුවෙන් පසු ශ්‍රමදාන කටයුතුවලට සහාය වී, උඩුගම බලා පිටත් වීමු. ගමේ පාරත්, රඹුක්කන එන පාර කැපීමේ ශ්‍රමදාන කඳවුරත්, ඉතා සාර්ථක ව පැවතිණි. දුම්රිය පාර දක්වා පාර කැපීමේ සෙනඟ යෙදී සිටියහ. අපි දු එයට සහභාගි වී හලාගිරිය කඳවුර බලා පිටත් වීමු. ගැමියන් බොහෝ දෙනෙක් එයට සහභාගි වී සිටියහ.

වළක වැටීමක්

අපි රෑ බෝවන හෙයින් අඩි පාරක් ඔස්සේ නැටියපාන බලා එමින් සිටියෙමු. ඉදිරි පාර සොයමින් කන්දගේ මහතාත්, පසුපසින් මමත්, කොටහේනේ කුමාර විදුහල්පති ව සිටි ඩී. අරම්පත්ත මහතාත් ගමන් කරමින් සිටියෙමු. අපි පරිසරය පිළිබඳවත්, වෙනත් පුරාවෘත්තයන් පිළිබඳවත් කතා කරමින් ගමන් කළෙමු. එකවර අරම්පත්ත මහතාගේ කට හඬ නැසී ගියේ ය.

ඉන් බියට පත් මම, "කෝ මිස්ට අරම්පත්ත?" යැයි කෑගැසීමි. එහෙත් අරම්පත්ත මහතා දක්නට නැත. 'මිස්ට අරම්පත්ත' යැයි නැවත මම කෑගැසීමි.

එවිට ම 'මම මෙහේ' යැයි වළක සිටි අරම්පත්ත මහතා කෑගසන හඬක් ඇසුණි. අපි දෙදෙනා ආපසු හැරී දිව්වෙමු. සිදු වී ඇත්තේ කුමක් ද? පටු පාරේ එද්දී ලිස්සී යාමෙන් එතුමා වළකට වැටී ඇත. අප දෙදෙනා මහත් ආයාසයෙන් දෑත් දිගුකොට එතුමා ගොඩට ගත්තෙමු. වාසනාවකට මෙන් කිසිදු තුවාලයක් නොවූවත්, වැලමිට යන්තම් සීරීයාමත් හා ඇඳුම්වල මඩ ගෑවීමත් සිදු වී තිබුණි. ළඟ තිබූ දොළ පාරට ගොස් ඇඳුම්වල මඩ සෝදා, ඉක්මණින් කඳවුර බලා ගොස් බෙහෙත් දැමීමු.

එදා රාත්‍රී කඳවුරේ ගත කළ අපි පසුදා හලාගිරිය, කිරිවන්දෙණිය කඳවුරට යාමට තීරණය කළෙමු.

ඡායාරූප: 254

දොස්තර ලක්ෂ්මන් සිල්වා මැතිනිය අකරල්ල කඳවුරේ දී ගමේ ළමයින් සමග

සංවිධාන කටයුතු

ප්‍රචාරක රැස්වීමෙන් පසු ප්‍රදේශවාසීන්ගෙන් ලැබුණු ධෛර්යය ප්‍රශංසනීය විය. එහෙයින් කොළඹින් පැමිණෙන දහසක් පිරිසකගේ නවාතැන් පහසුව, ආහාර, සෞඛ්‍යය ආදී දේ ගැන කටයුතු කරන්නට සිදු විය.

ආහාර සැපයීම

උදේ තේ, උදේ ආහාරය, උදේ දහයට තේ, දවල් ආහාරය, සවස තුනට තේ. සවස හයට තේ, රාත්‍රී ආහාරය මේ සඳහා පිළියෙල කළ යුතුව තිබුණි. මුදල් අය කිරීම සම්පූර්ණයෙන්ම තහනම් දෙයක් විය. ද්‍රව්‍යමය ආහාර ගැනීම පමණක් පොරොන්දු විය. වැඩිහිටි තරුණයන් කීප දෙනෙකු සිය කැමැත්තෙන් යොමු කර, ඔවුන්ගේ පිටේ හා ඉදිරිපස ප්‍රචාරක දැන්වීම් යොදා ශ්‍රමදාන කඳවුරට ආධාර දෙන ලෙස ඉල්ලමින් ඒවා බෙල්ලේ එල්ලාගෙන සීනුවක් නාද කරමින්, ප්‍රදේශය පුරා සැරිසරන්නට විධි විධාන යෙදීය. එහි ප්‍රතිඵල ඉතාමත් සාර්ථක විය.

අතරින් පතර ගම්මු ප්‍රාදේශීය උඩරට නැටුම්, ජන කවි, සී පද ආදිය කියමින් ද – නටමින් ද – රබන් වාදනය කරමින් ද සහභාගි වෙති. කණ්ඩායම් නායකයෝ එදින වැඩ කඳවුරේ සිද්ධීන් පිළිබඳ සමාලෝචනයක යෙදී, ඉදිරි දිනයේ වැඩ සටහන් විස්තර කර දෙති. සමහර විට තරුණ මල්ලී කෙනෙකු නැගී සිට තමා අතින් සිදු වූ සුලු වරදක් කියා, සමාව ඉල්ලමින් පාපෝච්චාරණයක යෙදේ. රාත්‍රී නවයයයි හතළිස්පහට පවුල් හමුව නිම වනුයේ හැම දෙනාම ප්‍රීතියෙන් කුල්මත් වී යාමෙනි. ගැමියන් ගේ–දොර බලා නික්ම වූ පසු පාසල් ගොඩනැගිල්ලේ හෝ ධර්ම ශාලාවේ බිම පැදුරු හෝ ඇතිරිලි අතුරා නින්දට යති. දහයෙන් පසු මීයට පිම්බාක් මෙන් පුදුම නිහැඬියාවකි. දිනක් කන්දගේ මහතා මා සමඟ කුමක්දෝ පවසද්දී කවුරුන්දෝ තරුණයෙක් නිදන වේලාවේ කථා කිරීම හිංසාවක් යැයි ද, අවිහිංසාවාදී ව වැඩ නොකරන්නේ යැයි කී විට, අපගේ කතා බහ නතර කොට ඔහුගේ ඉල්ලීම සාධාරණ යැයි කියා අපි ද නින්දට ගියෙමු.

කඳවුරු නැරඹීමට යාම

පසුදා නියමිත පරිදි කඳවුරේ වැඩ ඇරඹීමෙන් පසු ආචාර්ය අරම්පත්ත මහතාත්, කන්දගේ මහතාත්, මමත් කඳවුරු ප්‍රදේශය නැරඹීමට යාමට තීරණය කළෙමු. තුම්පහන කඳවුරේ සිට මාලියැද්ද කඳවුරට දුර සැතපුම් එකොළහකි. කෙම්පිට කන්ද කඳවුරත්, බැද්දේවෙල

කඳවුරත් ඒ අතර පිහිටියේය. අපි පා ගමනින් ගමන් ඇරඹීමු. කඳු තරණය කොට කෙම්පිටකන්දට ගියෙමු. එහි රබර්වත්තක් මැද්දෙන් අලුත් පාරක් තනන පිරිසක්, ගමට යන පාරේ වැසිකිළි තනන අයත්, ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් අමුණක් බඳිනුත් බලා, වතු දෙමළ ජනතාව සමඟ කතා බහ කරමින් කෙම්පිටියේ කඳවුරට ළඟා වීමු. එහිදී තේ පානය කොට, මුස්ලිම් ගම්මානයක් මැදින් බද්දේවෙල මහා විද්‍යාලයට



ඡායාරූප: 255
මහාචාර්ය ධර්මසේන
අරම්පත්ත මහතා

ළඟා වීමු. දැන් වේලාව දොළහයි; වැඩ කඳවුරු අවසාන කොට දිවා ආහාරය සඳහා ශ්‍රමදාන පිරිස රැස් වී සිටිය හ. අපිදු දිවා ආහාරය සඳහා වාඩි වීමු. ආහාර පාර්සල්වලින් සංතර්පිත වූ අපි දිවා පවුල් හමුවට සහභාගි වීමු.

අරම්පත්ත මහතාත්, මමත් කුඩා කතා දෙකක් පැවැත්වීමු. පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සංස්කෘතික සංදර්ශනයක් නරඹා, පවුල් හමුවේ නිමාවෙන් පසු වැඩ අරඹා, යළිත් මාලියැද්ද කඳවුරට යන්නට පිටත් වූ විට, වාහනයක් ලැබුණු නිසා සැතපුම් දෙකක් එහි ගොස් ඉන්පසු යළිත් මාලියැද්ද දක්වා සැතපුම් දෙකක් පයින් ගියෙමු. සවස තුනයි තිහට එහි ළඟා වීමු. එහිදී තේ විවේකයේ දී කෙටි කතාවක් කළ මම, ඉන් පසු පාර තැනීමේ ශ්‍රමදානයට සහභාගි වීමි. ඉන්පසු සවස හතරයි තිහ දක්වා වැඩ කර, යළිත් පයින්ම සැතපුම් දෙකක්ම අවුත්, ඉන්පසු පාරේ ගමන් කරන මෝටර් රියකින් පත්තම්පිටියේ කාර්යාලයට පැමිණියෙමු.

භූදානයක්

රෑ බෝ වූ නිසා ඉතිරි කඳවුරුවලට පසුව දා යාමට තීරණය කොට, එදා රෑ එහි නැවතුනෙමු. පසුදා උදේ යළිත් අපි තිදෙනා පයින්ම බද්දේවෙල කඳවුරට ගියෙමු. එහි විශේෂ සිද්ධීන් කීපයක් සිදු වී තිබුණි. දුප්පත් මහලු මවක් ඇ සන්තක ඉඩමේ අඩි දහයක කොටසක පාර තැනීමට ඉඩ දී තිබුණි. මෙහිලා සඳහන් කළ යුත්තේ පල දරන කොස් ගස් හයක් කැපීමට සිදු වීමයි. ඒත් ඒ ගැන ඇ කිසිසේත් ම දුක් නොවන බවත්, ගමට පාරක් කැපෙන එක ඊට වඩා වටිනා බවත්, කීවාය. පිටවල, උඩුවල ගමේ සිට ලෙඩෙකු රෝහලට ගෙන යා යුත්තේ මේ පාර

දිගේ පුටුවක කර තබා ගෙන බවත් රෝහලේ දී රෝගියාට බෙහෙත් කළ යුත්තේ වැළඳී තිබෙන රෝගයට නොව, ඔසවා ගෙන එද්දී ඇඟ හැල හැප් පීම්වලින් ඇති වූ තෙහෙට්ටුවට බවත් ය. කඳවුරේ තිබූ කොස් පැළ දහයක් හා අඹ පැලත්, පේර පැළත්, ඒ අම්මාගේ ගෙවත්තේ අරම්පත්ත මහතාත්, මාත් සිටුවා එතුමියට බෙහෙවින් ස්තුති කළෙමු.

මුලු කඳවුරට ම අවශ්‍ය සීනි, තේ, පාන්, බනිස්, බිස්කට්, කෙසෙල්ගෙඩි ආදිය පරිත්‍යාග කිරීමට නගරබද අය ප්‍රතිඥා දුන්හ.

ගම්බද ගෙයක් පාසා තරුණයෝ ගියහ. හාල් සේරුවකින් බත් මුල් හතරක් හා කුඩා බත් මුලක් පිළියෙල කිරීමට උපදෙස් දුනි. සතියක් තුළ දී සංඛ්‍යා ලේඛන සංසන්දනය කිරීමේ දී, සතියකට සෑහෙන්න රාත්‍රී ආහාර පැකට් පිළියෙල වී තිබුණි. ඒවා නිර්මාංශ ආහාර විය.

මාවනැල්ල ආදායම් පාලක නිලධාරි තුමා විශේෂ අනුග්‍රහයක් කොට, ඒ සති දෙක තුළ ප්‍රදේශයේ සමුපකාර බඩු ගබඩා හා පෞද්ගලික වෙළඳුන්ට සලාක සඳහා මිල්වාර්ඩ් හාල් නිකුත් කිරීමටත්, අවශ්‍ය තරම් පරිප්පු, රතුලූණු, මිරිස් ආදියත් පිටිත්, සීනිත් ලබා දෙන්නට විශේෂ පරිශ්‍රමයක් යෙදීය. එහෙයින් ආහාර ප්‍රශ්නයට ගැටලුවක් නොවීය. එහෙත් එක්තරා ගම් ප්‍රභුවරයෙක් තරුණ පිරිසට තර්ජනය කොට කිසිවක් නොදෙන බවටත්, කිසිම උපකාරයක් නොදෙන බවටත්, ප්‍රකාශ කර තිබූ බව ඔහුගේ නෑදෑ තරුණයෙක් කන්දගේ මහතාට පැමිණිලි කළේය. මොහු ආධාර නොදෙන බවට ගම්වාසීන් තුළ මතයක් ඇති වුවහොත්, තවත් අය මන්දෝත්සාහී වන්නට ඉඩ තිබූ නිසා ඔහු සොයා රෑ අටට කන්දගේ මහතා ඔහුගේ නිවසට ගියේය. මදක් බීමත්ව සිටි ඔහු, කිසියම් උපකාරයක් නොදෙන බවට පුරසාරම් දෙඩී ය. පැයකට අධික කාලයක් ඔහුට කරුණු වටහා දීමට තැත් කළත් ඒ ඉටු නොවිණි. අන්තිමේ දී කන්දගේ මහතාගේ ඉවසීමේ සීමාව ද ඉකුත් විය. ඔහු නිවසින් බැහැර මිදුලට කැඳවා පොල් ගොඩ පෙන්වා එයින් පොල් ගෙන යන බව කී විට, ඔහු පොල් බෑයක්වත් නොදෙන බව කීය. ඔහුගේ වෙරි මත සිඳී ගියේය. සීනි රාත්තල් දහයක් දෙන බවට පොරොන්දු විය. කලුවරේම කන්දගේ මහතා පාසලට පැමිණියේය. ශ්‍රමදාන කඳවුරට මුල්ම පරිත්‍යාගය වූ සීනි රාත්තල් දහයක් පසුවදා උදයම පාසලට ලැබුණි. මේ පරීක්ෂණය හේතුවෙන් තරුණ පිරිස උද්යෝගිමත් වූ අතර, පළාත පුරා ගිය රාවයෙන් කඳවුරට වැඩියෙන් ආධාර ලැබෙන්නට විය.

ආයුධ සැපයීම

එවකට සර්වෝදය සංගමය සතු උදැල්ලක් වත් නොතිබුණි. එහෙයින් අවශ්‍ය ආයුධ ප්‍රදේශය තුළින් සපයා ගත යුතුව තිබුණි. අවට වතුවල වතු අධිකාරින් මුණ ගැසී එක් එක් වත්තකින් උදලු පනහක්, යකඩ ඉති දහයක්, විල්බැරෝ දෙකක්, ස්කෝප්ප, ගල්කටු, තාච්චි, කූඩා ආදිය ලබා ගන්නට විධි විධාන යෙදීය. ප්‍රදේශයේ පාසල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන් තම තමන්ට අවශ්‍ය ආයුධ ගෙන ඒමටත්, ශ්‍රමදාන කඳවුරට සහභාගි වන ගම්වැසියන් තමන්ට අවශ්‍ය උපකරණ ගෙන ඒමටත් කටයුතු යොදන ලදී. තරුණ පිරිස, පස් ඇදීමට කිතුල් පතක් යොදා ගත් අතර, පාසල්වල කුඩා ළමයි ගොස් පුවක් කොළ රැගෙන ආහ. වැඩිහිටි අය පස් ඇදීමට ලෑලිවලට කඹ යොදා උපකරණ තනා ගත් හ.

සෞඛ්‍ය කටයුතු

කඳවුර පැවැත්වූ විද්‍යාල භූමි හතේ ම තාවකාලික වැසිකිළි හා කැසිකළි සාදන ලදී. ඒවාට ඉසීමට කුඩු සෞඛ්‍යය දෙපාර්තමේන්තුවෙන්ද, ජලය සැපයීමට වැඩ දෙපාර්තමේන්තුවෙන් පීප්ප ද ලබා ගන්නා ලදී. සියල්ලන්ට ම උණු වතුර බීමට උණු වතුර රැස් කර තබන ලදී. මෙම කඳවුරු භූමි තුළ කුරුම්බා බීමට කටයුතු සලසන ලදී.

තේ සැපයීම

එවකට පැවති ලංකා තේ ප්‍රචාරක මණ්ඩලයේ වෑන් රථ මගින් ශ්‍රමදාන කඳවුරු පැවැත්වෙන තැන් එකොළහක ප්‍රදේශයේ දී වරින් වර තේ බෙදා දෙන ලදී.

චිත්‍රපට දර්ශන

1. රජයේ චිත්‍රපට අංශයෙන් සෑම දිනක ම සවස එක් කඳවුර බැගින් තෝරා ගෙන චිත්‍රපට දර්ශන පැවැත්විණි.

2. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ චිත්‍රපටි අංශයෙන් තෝරා ගත් කඳවුරුවලදී චිත්‍රපට දර්ශන පෙන්වන ලදී.

3. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ චිත්‍රපට අංශයේ තෝරා ගත් කඳවුරුවල දී චිත්‍රපට දර්ශන පැවැත්විණි.

ක්‍රීඩා කටයුතු

1. සවස විවේක අවස්ථාවේ දී වොලිබෝල් ක්‍රීඩාවේ යෙදීමට ස්ථාන පිරිසිදු කරන ලදී.
2. ජාතික ක්‍රීඩා වූ තාච්චි පැනීම වැනි ක්‍රීඩාත් පැවැත්විණි.

පුස්තකාල පහසුකම්

සෑම කඳවුරකටම දිනපතා පුවත් පත් හා පොත් පත් සඟරා ආදිය කියවීමට සලස්වන ලදී.

ප්‍රාදේශීය පුරාවෘත්ත

ප්‍රදේශය පසුබිම් කර ගත් ඓතිහාසික පුරාවෘත්ත වැඩිහිටියන් ලවා සකස් කර, කඳවුර තුළ දී දේශන පැවැත්වීමට කටයුතු යොදන ලදී.

සංස්කෘතික කටයුතු

හලාගිරිය, වන්නම් කලාව උපත ලැබූ ප්‍රදේශයයි. එහි පාරම්පරික නැටුම් කලාවේ දක්ෂ ශිල්පී ටිකිරි බණ්ඩා මහතාගේ ප්‍රධානත්වයෙන් සංස්කෘතික සංදර්ශන පැවැත්වීමට කටයුතු යොදන ලදී.

අධ්‍යාපන කටයුතු

කඳවුරු පැවැත්වීමට පෙර පාසල් ශිෂ්‍යයන්ගේ කාල සටහනේ විෂය මාලාව කඳවුරු සම්බන්ධ කොට උචිත පරිදි සකස් කරන ලදී. භාෂාව පාඩම සඳහා උපයෝගී කර ගත්තේ කඳවුරු පැවැත්වීමට අදාළ කරුණුය.

ශ්‍රමදාන කඳවුරු ආරම්භය

අගෝස්තු පස්වෙනිදා සවස තුනට විශේෂ දුම්රියකින් දහසකට ආසන්න පිරිසක් රඹුක්කන දුම්රිය පොළට පැමිණියහ.

රඹුක්කන පාර්ලිමේන්තු මන්ත්‍රී හා එවකට අධිකරණ උප ඇමති අසෝක කරුණාරත්න මහතාත්, මාවනැල්ල මන්ත්‍රී පී. ආර්. රත්නායක මහතාත්, ප්‍රදේශයේ ගරුතර මහා සංඝයා වහන්සේ, ක්‍රිස්තියානි පූජකවරුන්, පොලිස් දෙපාර්තමේන්තුව වෙනුවෙන් පොලිස් පරීක්ෂක ඉලේපෙරුම මහතාත්, කෑගල්ලු අධ්‍යාපන අධ්‍යක්ෂ අසෝක ධර්මකීර්ති මහතා, සෞඛ්‍යය, කෘෂිකර්ම, ඉඩම් සංවර්ධන, ගොවි සේවා වැනි දෙපාර්තමේන්තුවල ප්‍රධානීහු ද ගම් ප්‍රදේශවල මූලාදෑනි මහත්වරු, විදුහල්පතිවරු හා ගම් ප්‍රධානීහු ද පැමිණ සිටියහ. සුළු පිළිගැනීම් උත්සවයකින් පසු, සියලුදෙනාටම තේ පැන් සංග්‍රහයක් කරන ලදී.

ඉක්බිති පිරිස කණ්ඩායම්වලට බෙදා, එක් එක් කඳවුරකට යැවිය යුතු පිරිස් නායකයන් සමඟ පැමිණ තිබූ ලංගම විශේෂ බස් සේවා පැවැත්විණි. එහෙයින් විදුහල්වලින් එන ශිෂ්‍ය කණ්ඩායම්වලට හා ස්වේච්ඡා ආයතනවල පිරිස්වලට පහසුවෙන් ආයුධත් රැගෙන කඳවුරු භූමිවලට යාමට පහසු විය.

මධ්‍යම කාර්යාලය

පත්තම්පිටියේ මුස්ලිම් මහතෙක් කාර්යාලයක් සඳහා කලකට කෝවිලකට පවරා තිබූ තම නිවස ලබා දුන්නේය. එම භූමියේ තිබූ විශාල නිවස නිසා, කඳවුරු භූමිය ඕනෑම කෙනෙකුට සොයා යාමට පුලුවන්කම තිබුණි.

පානදුරේ උපාලි දියෙස් මහතා යවා තිබුණු කොස් පැළ එක් දහසක් හා අඹ පැළ, පේර පැළ ආදිය කාර්යාලය ඉදිරියේ තැන්පත් කර තිබුණි.

මතභේද හැර එක්සත් වීම

මැලේරියා උවදුරෙන් කෑගල්ල දිසාවට විශාල හානියක් වූ අතර, ප්‍රදේශවාසීන්ට සහනදායි වැඩ වශයෙන් ගම්වැසියන්ට පාරවල් තැනීමටත්, එයින් සුලු ආදායමක් ලබා ගැනීමටත්, එවකට රජය ඉඩ දී තිබුණි.

ඒ අනුව, සකස් කළ පාරකි, හලාගිරිය කෝන්ගහ හන්දිය හා වැලිකන්ද පාර. මෙහි පාරේ වම් පසෙක කිරිවන්දෙනියේ, විජේසිංහ මහතා සතු රබර් ඉඩමකි. අනික් පසින් අඹගහමුලහේන වෙද මහතාගේ කමතකි. මේ දෙදෙනා එක්තැන් කොට මේ ප්‍රශ්නය විසඳීමට අවුරුදු විසි අටක් නොයෙක් දෙනා ගත් උත්සාහය නිශ්ඵල විය. එහෙත් සර්වෝදය සේවාවන් මේ ප්‍රදේශයේ ඇරඹීමට යන රාවය, ඒ දෙදෙනාටම දැන ගන්නට ලැබුණි. අපි දු ඒ දෙදෙනා මුණ ගැසුණෙමු. කාලාන්තරයක් තිස්සේ තිබූ කඹ ඇදීම අවසන් කොට, දෙදෙනා සමගියෙන් පාර ප්‍රතිසංස්කරණයට අභිමතය ලිඛිත ව ප්‍රකාශ කළා පමණක් නොව, ශ්‍රමදානය පවතින අවස්ථාවේ එහි පැමිණ, එයට සහභාගිවීමට ප්‍රතිඥා දුන්නහ. එක්දහස් නවසිය හැටඑකේ, අගෝස්තු හයවැනිදා මේ ශ්‍රමදානය අරඹත් ම, ඒ දෙදෙනා තම තමන්ගේ ඉඩම්වලින් රබර් ගස් කපා, කමත ගොඩ කොට අඩි විස්සක පාරක් තනා දුන්හ.

මොරටුව මෙත්මැදුරේ සර්වෝදය සංවර්ධන අධ්‍යාපන අංශයේ කලක් සේවය කළ පී. ඒ. කිරිවන්දෙණිය මහතා, ඒ කඳවුර පවත්වන

විට උසස් පෙළ අධ්‍යාපනය ලබන පාසල් ශිෂ්‍යයෙකු ව සිටියේය. ඒ මහතා තමාගේ ඥාති මළනුවන් වූ විජේසිංහ මහතාගේ ඉඩමේ ගස් කැපීමට හා පාර සෑදීමටත් හාපුරා කියා සර්වෝදයට එක් විය. එපමණක් නොවේ, ශ්‍රමදාන කඳවුරේ වැඩ කළ අයට තමන්ගේ වතුවලින් කුරුම්බා කඩා ගෙනවුත් සංග්‍රහ කළේය. දින දෙකක් තුළ පාර සාදා නිම කළේය. වතුර ගලා යන ස්ථානයක් තිබුණි. එතැන බෝක්කුවක් බැඳීමට කාලයක් නොවීය. එහෙත් ගැමියන්ගේ දක්ෂ කාර්මික ශිල්ප ඥානය යෙදීමෙන් මිල්ල ලීවලින් ශක්තිමත් ලී පාලමක් සාදා නිම කළේය. එදින සවස මාවනැල්ලේ පොලිස් පරීක්ෂක ව සිට, පසුව පොලිස් අධිකාරී බවට පත් වූ උපාලි විජයරත්න මහතා සිය ජීප් රිය පදවා ගෙන යාමත් සමඟ පාර විවෘත කළේය.

පොල් පැළ සිටුවීම හා ගෙවතු වගා

රඹුක්කන මාගොල්ල කෘෂිකර්ම ආයතනයේ අධිපති වශයෙන් සිටි, ඉලංගරත්න මහතාගේ (ටී.බී. ඉලංගරත්න මහතාගේ සහෝදර) මූලිකත්වයෙන්, ශිෂ්‍යයන් සියයක් පමණ පාසල් වතුවලත් සමහර ගෙවතුවලත්, පොල් පැළ සිය ගණනක් හා වෙනත් වගාවන් කරන ලදී.

කඳවුරු අවසානය

කඳවුර අවසාන දින ශිෂ්‍ය කණ්ඩායම් ගම්මුන්ගෙන් සමු ගෙන මහජන රැස්වීම පවත්වා පත්තම්පිටිය මුස්ලිම් විදුහලට එන්නට සූදානම් වූහ. වයසක අම්මලා, තරුණ සිසුවන්ගේ හිස අත ගා කඳුලු සලමින්, මේ දින කීපය තමන්ට අමතක නොවන බවත්, සෙනෙහබර සිතින් පැවසූහ. එක් අම්මා කෙනෙක් ලොසිංජර එක බෑගින් සිසු දරුවනට බෙදා දෙමින් 'මේ ලොසිංජරවල මිහිරි රසයට වැඩි රසයක් ඔබලා කෙරේ ඇති බව' කියමින් කඳුලු සලන්නට විය. කඳවුරු ගම් හතෙන් අප සමු ගත්තේ ගැමියන්ගේ ආදර සත්කාර හා තුටු කඳුලු මැදිනි.

සමු ගැනීමේ රැස්වීම

මුස්ලිම් – බොදු අරගලයකින් ගිනි ගත් මුස්ලිම් පාසල වෙනුවට ගොඩ නැගුණු ගොඩනැගිල්ලේ තිබුණේ එකම එක මඳක් පිළිස්සී ගිය බාලාංශ මේසයක් පමණි. මුලසුන සඳහා එය තෝරා ගන්නා ලදී. මුලසුන දැරුවේ එවකට කෑගල්ල මහ දිසාපති ගයි අමිර්තනායගම්

මහතාය. අධිකරණ උප ඇමති අශෝක කරුණාරත්න මහතාත්, මාවනැල්ල මන්ත්‍රීවරයාත්, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ අශෝක ධර්මකීර්ති මහතාත්, ගම් සභාපතිවරුත්, ආදායම් පාලන නිලධාරී තුමාත් මුලසුන අසල බිම එලූ පැදුරුවල වාඩි වූහ. ශ්‍රමදානයට සහභාගි වූ දහස් ගණන් ජනකාය පාසලේ බිම වාඩි වූහ.

කතාවාරය අවසානයේ දී මා විසින් රජයේ ග්‍රාම සංවර්ධන කටයුතු විවේචනය කරමින් කළ දේශනය, පසු කලෙක කන්දගේ මහතා ට රජයේ ආයතනවල උදව් ගැනීමට තරමක බාධාවක් වූ බව මෙහිලා සඳහන් කළ යුතුය. අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ සටහන මෙසේය. "පසුගිය දින තුළ මෙහි විශ්ව කර්මයා පහළ විය. නොතිබුණු ළිං, පාරවල්, ප්‍රදර්ශනය විය."

කඳවුරෙන් පසු

ප්‍රදේශයෙන් බාහිර ව පැමිණි පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්, ගුරුභවතුන්, වෙනත් ස්වේච්ඡා සේවක සේවිකාවන් කරන ලද වැඩ කොටස් හා හැසිරීම් රටාව ප්‍රදේශවාසීන්ගේ සිත් තුළ මහත් වෙනසක් කිරීමට සමත් විය.

ගම්වාසීන් එකිනෙකා අතර තිබූ සුළු ආරාවුල් අමතක කොට සියලු දෙනාම එක්සත් ව ක්‍රියා කිරීමේ වටිනාකම තේරුම් ගත් ඔවුහු පැරණි ගම්වල තිබූ ඒ උසස් ගුණ ධර්ම යළිත් නගා සිටුවීමට උත්සුක වූහ.

සති අන්තවල ඉතුරු වූ වැඩ කොටස් නිම කරන්නට වූහ. සමහරු රාත්‍රි කාලවල පැට්රෝල් ලාම්පු දල්වා ගෙන පාරවල් කපා ගමනා ගමනයට සුදුසු සේ සකස් කළහ.

ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවෙන් වෙන් කළ මුදල්වලින් අමුණු තනා අවසන් කළහ. වැඩිහිටි අධ්‍යාපන මධ්‍යස්ථාන තුනකට ලැබුණු මුදල් වලින් ආරම්භ කළ වැඩිහිටි මධ්‍යස්ථානවල සංගීත හා තූර්ය භාණ්ඩවලින් සංස්කෘතික කණ්ඩායම් ඇරඹීය.

එක්දහස් නවසිය හැටඑකේ දෙසැම්බර් මාසයේ පැවැත්වුණු අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගයේ සිංහල භාෂාව ප්‍රශ්න පත්‍රය සඳහා "ශ්‍රමදාන කඳවුරක්" යන මැයෙන් රචනාවක් ලැබුණු හෙයින් බොහෝ පාසල් ගිය ශිෂ්‍යාවෝ එම මාතෘකාව අනුව රචනය ලියා සාමර්ථය ලැබුණු බව බොහෝ දෙනා පැවසූහ.

අරණායක රහල කඳවුර

නැටියපාන කඳවුරට සහභාගි වූ අරණායක දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරි ඇම්.පී. අතාවුද මහතාත්, පොලිස් ස්ථානාධිපති රණතුංග මහතාත්, විදුහල්පතිවරුත් සැප්තැම්බර් මාසයේදී රහල කඳවුරක් පැවැත්වීමට සාකච්ඡා කළහ.

මේ අනුව අරණායක දී ගත් තීරණයක් අනුව, සැප්තැම්බර් 14, 15,16 දින තුනේදී අරණායක ගම් දෙකක කඳවුරු දෙකක් පැවැත්වීමට විධි විධාන යෙදූහ.

අරණායක, හොරේවල සිට රහල හරහා ඓතිහාසික සිද්ධා ස්ථානයක් වූ සැලව ට යාමට තිබුණේ කුඹුරුවල නියර මගින් යා හැකි අඩි පාරක් පමණයි. හොරේවල සිට රහල බටහිර විදුහල දක්වා පළමු අදියරේ දී වාහනයක් යාමට සුදුසු පාරක් තැනීමට අරමුණු කර ගෙන කටයුතු කළහ.

දෙවැනි කඳවුරක් වශයෙන් අරණායක නගරයේ සිට හකුරුගම්මන දක්වා පාරක් තැනීමටත්, ගෘහ සෞඛ්‍ය කටයුතු පිළිබඳවත් කඳවුර පැවැත්වීමට තීරණය විය.

රහල කඳවුර

මේ සඳහා විශේෂයෙන් දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරීතුමා – පොලිස් ස්ථානාධිපතිතුමා –රහල බටහිර විදුහල්පතිතුමන් ප්‍රමුඛ විදුහල්පතිවරු, ගම් ප්‍රධානීන් පෙරමුණු ගත්හ. ගම්වැසි එක් මහතෙක් සිය වියදමෙන් පාර තැනීමට අවශ්‍ය මැණුම් කටයුතු කර දුනි. ගම්වැසියෝ සිය ඉඩම්වලින් පාරට යන කොටස් බෙදා වෙන් කර දුන්හ.

ආරාධිත අමුත්තා වශයෙන් ප්‍රාදේශීය සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂතුමන්ට ඇරයුම් කළත්, එය නොපිළිගැනුණෙන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ඩබ්ලිව්. ඇම්. ඒ. වර්ණසූරිය මහතාට ආරාධනය කළෙන්, එතුමා විදේශගතව ගොස් ආපසු එන්නේ දහතුන් වැනිදා බව පවසා ඇරයුම පිළිගත්තා ලදී.

දහතුන් වැනිදා සවස අරණායක මහා විද්‍යාලයේ කඳවුරු බැඳ ගත් පිරිස, දහහතර වැනිදා සිරිත් පරිදි කඳවුරේ වැඩට ගියහ. සංඛ්‍යා ලේඛන අනුව, එක්දහස් හත්සිය පනස් දෙනෙක් මේ කඳවුරට සහභාගි වූ බව රහල බටහිර විදුහල්පතිතුමා පැවසූහ.

කෙතරම් දුරට කඳවුරේ වැඩ කටයුතු සාර්ථකවී ද යත්, දිනය නිමා වන්නට කලින් පාරේ කටයුතු නිමා විය. සවස හයට පමණ වන

විට දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරිතුමන්, පොලිස් පරීක්ෂකතුමන් ඇතුළු පිරිස ජීප් රියෙන් සැතපුම් දෙකක් අවුත් පාර දිගේ ගමන් කොට, රහල බටහිර විදුහලට ළඟා වූහ. ප්‍රදේශවාසීහු මෙයින් උද්යෝගයට පත් වූහ.

පසුදා පාරේ කාණු ආදිය සකස් කර සම්පූර්ණ කළහ. (දැන් මේ පාරේ බස් රථ ගමන් කරයි) සර්වෝදය ව්‍යාපාරයේ එවකට ලේකම්ව සිටි අභාවප්‍රාප්ත එම්. ඒ. තිලකරත්න මහතාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ඩබ්. එම්. ඒ. වර්ණසූරිය මහතාත්, ප්‍රදේශයේ මන්ත්‍රී පී.ආර්. රත්නායක මහතාත්, මහජන රැස්වීම සඳහා මා සමඟ සහභාගි වූහ.

ස්නානයෙන් පසු අපි අමුත්තන් දැකීමට ගියෙමු. අමුත්තෝ පාර දිගේ රථයකින් ගොස් ආපසු මහා සභා රැස්වීම පවත්වන තැනට පැමිණියහ. ඒ වන විට දහස් ගණන් ජනතාව රැස්වීම් භූමියේ රැස්ව සිටියහ.

වේදිකාවට නැගුණු වර්ණසූරිය මහතා, ශබ්ද විකාශනය අතට ගෙන කිසිවෙකු බලාපොරොත්තු නොවූ අයුරින් දේශන කිසිවක් අනවශ්‍ය බවත්, මහජනතාව කඳවුර තුළින් ලැබිය යුතු අධ්‍යාපනය ඉතා ඉහළින් ලබා ඇති බවත් පවසා, ඊළඟ අංශය වූ සංස්කෘතික අංශය ඇරඹීමට ඇරැයුම් කළේය. කන් බිහිරි කරවන අත්පොළසන් නාදය මැද්දේ, කථිකාචාර්ය ගුණතිලක මහතාගේ මෙහෙයීම යටතේ ශ්‍රමදානය සඳහා ම පිළියෙල වූ මුද්‍රා නාට්‍යය ඇරඹිණි. පැය භාගයකින් පසු උඩරට හා අරණායක ප්‍රදේශයට ආවේණික වූ බාලක, බාලිකාවන්ගේ නාට්‍ය සංදර්ශනයක් පැය දෙකක් පුරා පැවැත්වීමෙන් කඳවුර අවසන් විය.

මේ කාලයේදී එනම්, එක්දහස් නවසිය හැටඑකේ මාර්තු මාසයේදී හැඳල – පල්ලියවත්ත ග්‍රාමයේ දී, බෞද්ධ–කතෝලික පිරිස් එකට එකතු කොට, පල්ලියවත්තට ඇල කන්ද, අයින දිගේ පාරක් කැපීමේ ශ්‍රමදානයක් සංවිධානය කළෙමු. මේ කඳවුර මෙහෙයවූයේ කෝට්ටේ ක්‍රිස්තියානි විදුහලේ එවකට ආචාර්ය වරයෙක්ව සිටි ටී. ජයසිංහ මහතා සහ අපයි. ගමේ කටයුතු සංවිධානය කළේ ඇන්තනි ප්‍රනාන්දු නැමති තරුණ මහතෙකි. ඔහුගේ විවාහයට ද අත්සන් කළේ මායි. ආගමික කටයුතු කළේ ගරු කුරියකෝස් පියතුමායි. මේ විවාහය සිදු කිරීමට වූයේ රහසේය. කුල භේදයක් නිසා දෙමාපියන් අකමැති වීම එයට හේතුවයි. කතෝලිකයන් අතර ද කුලභේද තිබෙන බව මා දැන ගත්තේ මේ අවස්ථාවේදීය.

වාද්දුව, කොරොස්දූව ගම්මානයෙහි කඳවුරක් පැවැත්වූයේ ද මේ වකවානුවේදීය. පැපොල් රෝගය හැදුණු මිනිසෙක්, ගමට යෑමට පාරක්

නැති නිසා වතුරේ බැස යෑම නිසා මිය ගිය බව අසා එයින් ඇති වුණු කම්පනය නිසයි, මේ ගමට පාරක් කැපීමට යොදා ගන්නා ලෙස ඒවකට අප සමඟ සර්වෝදය කටයුතු කළ ඩොනල්ඩ් විජේසේකර මල්ලීට පැවැරුවේ.

ඡායාරූප: 256
ආර්. එස්. උඩුකුඹුර මහතා, වජිරා නංගී ඇතුලු පිරිස

එක්දහස් නවසිය හැටදෙකේ අප්‍රේල් මාසයේ දී බුලත්සිංහල, යටගම්පිටිය, පාහියංගල විහාරයේ කඳවුරු බැඳ තිග්ගහ – ගවරගිරිය පාර කැපීමේ මහා ශ්‍රමදානය ආරම්භ කළෙමු. මේ ගම අසල රොනී ද මැල් මහතාට අයත් 'ගී කියන කන්ද' නම් වත්තක් තිබුණේය. තිග්ගහ, ගවරගිරිය කඳවුරට යෑමේදී රොනී ද මැල් මහතා ද කිහිපවරක්ම, මා සමඟ එකතු විය. ඒ කාලයේ ඔහුට සිංහලෙන් කතා පැවැත්වීමට නොහැකිය. ගීකියන කන්ද වත්තේ දී සිංහල කතාව මා කී විදියට ලියා ගෙන, මා ඉදිරියේ කතාව පවත්වා පසුව – කඳවුරේ දී එම කතාව පැවැත්වීය. වැඩි කල් යන්නට පෙර රොනී ද මැල් මහතා දක්ෂ සිංහල කථිකයෙක් විය. මගේ දිනපොතේ සටහන් වී ඇති අන්දමට රොනී ද මැල් මහතා මහජනතාව අමතා ප්‍රථම සිංහල කතාව කළේ එක්දහස් නවසිය හැට දෙකේ අප්‍රේල් මාසයේ විසිඑක් වෙනිදාය. එම කඳවුරුවල නායකත්වය ඉසිලුයේ පූජ්‍ය පණ්ඩිත වැවල ධම්මරංසි හිමිපාණන්ය.

පේරාදෙනිය විශ්ව විද්‍යාලයයේ බෞද්ධ සහෝදරත්වයේ සහභාගිත්වයෙන් අපි හිඳගල ගමේ ද ශ්‍රමදාන කඳවුරක් සංවිධානය කළෙමු. ඒ සඳහා කථිකාචාර්ය සී. විතානාච්චි මහතා හා ආචාර්ය ඩේවිඩ් කලුපහන මහතා ද අපට උදව් වූහ.

දිස්ත්‍රික්කයක් දිස්ත්‍රික්කයක් පාසා මේ අන්දමින් ජනතාව එකතු කොට, ජනතා සහභාගිත්වය තුළින් ස්ව සංවර්ධන මාවතක් හෙළි කළෙමු. ස්ව ශක්තිය, සාමූහිකත්වය හා විද්‍යාත්මක සැලැස්මක් තුළින් සමස්ත ජනතාවම සංවර්ධනය හා සාමය දෙසට යොමු කිරීම අපේ අභිප්‍රාය විය.

63

‘මම දැන් පියෙක් වෙමි – ගෙදරට රජෙක් වෙමි’



ඡායාරූපඃ 257
අවුරුදු නවයක් වයසැති හර්ෂ කුමාර නවරත්න (මගේ ලොකු අක්කාගේ පුතා) චාරිකා දියණිය වඩාගෙන

එක්දහස් නවසිය හැටඑකේ ජූනි මාසයේ දී චීන දන්ත ධාතූන් වහන්සේ නමක් ලංකාවට ගෙනවුත් නිදහස් චතුරශ්‍රයේ මහජනයාට වැඳ පුදා ගැනීමට සලස්වා තිබුණේය. නිශ්ශංක විජේරත්න මහතාගේ ඇරයුමක් අනුව, අපි නාලන්දා විද්‍යාලයීය ශිෂ්‍යයින් සමඟ ඒ ස්ථානයේ ශ්‍රමදාන කඳවුරක් සංවිධානය කළෙමු. ජූනි දොළොස් වැනිදා උදේ නීතාට අපේ පළමු දරුවා ලැබීමට යන සලකුණු පහළ විය. අම්මාට ඇය බලා ගැනීමට සලස්වා මම ඉක්මනින් කඳවුරට ගොස් සියල්ල සංවිධානය කොට ආපසු පැමිණියෙමි. ඒ වනවිට ඇයගේ විළි වේදනා වැඩි වී තිබුණෙන්, වහාම කාසල් වීදියේ මාතෘ රෝහලට ඇය ඇතුල් කළෙමි. අම්මා ඇය ළඟ නවත්වා, දරුවා බිහි වනතුරු මම තාප්පය උඩ වාඩි වී ඉතා අසහනයෙන් සිටියා මට මතකයි.

දියණිය බිහි වූ බව දැනගත් විගස වාට්ටුවට දිව ගිය මම, පළමුවන වරට අපේ පළමු දරුවාගේ ළපැටි මුහුණ දුටුවෙමි. තාත්තා යහපත් ධර්මයක් රැගෙන රටපුරා සැරිසරන නිසා, ඇයට සාමියා චාරිකා යන නම එවේලේම ලියා දී, ඒ සුභාරංචිය අන් අයට දැන්වීමට මම දෙල්ගහ යට ගෙදරට දිව ගියෙමි. (මහාචාර්ය) වෛද්‍ය එස්. එච්.පී. නානායක්කාර මහතා, දියණිය බිහිවීම දක්වා බලාගත් තැනැත්තාය.

එතුමා කිසිවිටෙක අපෙන් මුදලක් අය කළේ නැත. චාරිකාගේ මුහුණ දුටු මට අපේ බාප්පොච්චි ලියූ කවියක පදයක් මතක් විය.

"මම දැන් පියෙක් වෙමි – ගෙදරට රජෙක් වෙමි."



ඡායාරූප: 258
වීරේට සුබ
පතන නීතා හා
චාරිකා

ඡායාරූප: 259
මල්ලී එංගලන්තය
බලා පිටත් වන විට
සුබ පැතීමට වරායට
ආ (වමේ සිට)
බාප්පොච්චී, තාත්තා,
මල්ලී, පුංචි නැන්දා
සහ බුදු නැන්දා

ඡායාරූප: 260
මල්ලී හා මම, පුංචි නැන්දා
හා
බුදුනැන්දා සමග
වරායේ දී

* *

එක්දහස් නවසිය හැටදෙකේ මැයි මස හත්වැනි දින මගේ මල්ලී වීරමන් ජිනදාස, එංගලන්තයට යෑම සඳහා නැව් නැඟීම මගේ ජීවිතයේ ඉතාමත්ම දුක් සහිත දිනයක් විය. මගේ එකම මල්ලී නිසා මම ඔහුට බොහෝ ආදරය කළෙමි. එම නිසා තම සහෝදරයා දිගු කලකට වෙන්වී යෑම දරාගත නොහැකි ජීවිත සිද්ධියක් විය.

ඡායාරූප: 261
මගේ වැඩිමහල් පුතා
වින්යා ශාන්තිදාස්

එක්දහස් නවසිය හැටදෙකේ ජූලි මාසයේ විසිහතර වැනිදා වින්යා ශාන්තිදාස් අපේ වැඩිමහල් පුතා කාසල්වීදියේ මාතෘ රෝහලේදීම ඉපදුණේය. ඒ දිනවල ශ්‍රීමතී ආශාදේවී මැතිනිය සහ ඊ. ඩබ්ලිව්. ආරියනායගම් මහතා අප සමඟ රටපුරා සැරිසරමින් විනෝබා භාවේ තුමා ගැන දේශන පවත්වමින් සිටි යුගයකි. විනෝබා තුමාට 'ආලෝකය' යන තේරුම ඇති 'වින්යා' යන නම ඔහුගේ දෙමාපියන් විසින් දී තිබුණේය. විනෝබා යන නම දුන්නේ ගාන්ධි තුමාය. විනෝබා භාවේ තුමා ගැන මගේ තිබූ ගෞරවය නිසාත්, වින්යා සාම සේවකයෙක් කිරීමේ අභිලාශය මා තුළ තිබූ නිසාත්, සාමයේ ආලෝකය ඇති කිරීමට කැප වූ සේවකයෙක් යන අර්ථය ඇති වින්යා ශාන්තිදාස් යන නම ඔහුට දුනිමි.



ඡායාරූප: 262
මගේ දෙවැනි පුතා
ජීවන් ධම්මික

මගේ තුන්වැනි දරුවා ජීවන් ධම්මික අපට ලැබුණු දෙවැනි පුත් රුවනයි. දැහැමි දිවියක අගය ඒ දිනවල මා කළ දේශනවල තේමාව වූ නිසා, ඔහුට ජීවන් ධම්මික යැයි නම තැබීමි. ඔහු ඉපදුනේ එක්දහස් නවසිය හැට හතේ අප්‍රේල් තුන්වැනි දා කාසල් රෝහලේ දීමය. ඔහු අනාගතයේදී ගුවන් නැවියකු වන බවට පෙර නිමිත්තකට මෙන් දෝ, අප සංගමයට 5 ශ්‍රී 1106 යන අංකය දරණ මිට්සුබිෂි ජීප් රථය ආසියා පදනමෙන් පරිත්‍යාග වශයෙන් ලැබුණේ ඊළඟ සතියේදීය.

මේ තිදෙනාත්, පසුව උපන් දරුවන් තුන් දෙනාත්, මුණුබුරු මිණිපිරියන් සියලු දෙනාත්, පිළිසිඳ ගත්දා සිට ඔවුන් බලාගෙන

මෙලොවට බිහි කිරීමට අත දුන්නේ මහාචාර්ය එස්.එච්.පී. නානායක්කාර වෛද්‍යාචාර්ය තුමාය. සමහර අවස්ථාවල දී, එතුමා තමාගේම අතින් රෝහල් බිල ගෙවීය. අප දෙදෙනා රටට කරන සේවය නිසා මේ සේවාව ස්වේච්ඡාවෙන් එතුමා විසින් ඉටු කළ යුතුය යන්න, නානායක්කාර මහතාගේ අදහස විය.

ජායාරූපඃ 263
මහාචාර්ය එස් එච් පී නානායක්කාර

මා පිටරට ගොස් සිටි සෑම අවස්ථාවකදීම, නීතා සහ දරුවන්ගේ සැප දුක් දිනපතා සොයා බැලුවේ සෙනෙට් සභාපති ගරු අභයරත්න රත්නායක මහතාත්, එවකට සෙනෙට් සභිකයෙක් ව සිටි ගරු ඩී. එල්. එෆ්. පේද්‍රිස් මහතාත්ය.

වැඩිමහල් දරුවන් තිදෙනා සර්වෝදය ශ්‍රමදාන කඳවුරුවලට සහභාගි වූයේ මව්කුස සිටිනා කාලය තුළ දී සිටමය.

මෙහිදී එක්දහස් නවසිය හැටදෙකේ ජූනි මස දහසයවැනි දා සිට විසිඑක් වැනි දින දක්වා පැවැති බුද්දම කඳවුර ගැන ද සඳහන් කළ යුතුය. වරක් මොකක් දෝ කලබලයක් නිසා පොළොන්නරුව දක්වා ගිය අපි, බුද්දම කඳවුරට නොගොස් ආපසු ආ මුත්, නැවත වරක් එහි ගොස් අපි බලාපොරොත්තු වූ අන්දමටම කඳවුරේ කටයුතු කළෙමු.

එක්දහස් නවසිය හැට ගණන්වල දී සහ හැත්තෑ ගණන්වලදී මා ළඟින්ම සිටිමින් මට උදව් කළ අය තර යුනයිටඩ් මෝටර්ස් සමාගමේ වැඩ කළ හෙන්රි ජයවික්‍රම පෙරේරා සහ කේ. ජී. ඩබ්ලිව්, කරුණාරත්න

ජායාරූපඃ 264
වමේ නීතාගේ වැඩිමහල් සොයුරියගේ පුත් අජිත් සමග (මැද) චාරිකා හා විත්‍යා

මහතා සිහිවේ. බොහෝ විට ඇත ගමන් යෑමට මගේ සහාය රියැදුරන් හා කඳවුරු සංවිධායකයන් හැටියට ඔවුහු මට අත දුන්හ.

ඡායාරූප: 265
අමරා හා විනීතා නංගිලා
චාරිකා, වින්යා හා ජීවන් සමග
දෙල්ගහ යට ගෙදර ඉදිරිපස

මේ කාලය තුළදී යම් ආයතනයක දේශනයක් නොකළ එකම දිනයක්වත් මට තිබුණේ නැත. මහනුවර ගුරුවරුන්ගේ සංගමය අමතා එක්දහස් නවසිය හැටදෙකේ ජූලි විසිතුන් වැනි දා මම දේශනයක් කළෙමි. මෙයට වසර කිහිපයකට පසු නැවත මා ලවා එම සංගමය දේශනයක් කරවූ අවස්ථාවේදී, ස්වේච්ඡා සේවාව පිළිබඳ ජාත්‍යන්තර මහ ලේකම් කාර්යාලයේ සේවය කළ සුදු මහත්මයෙකු මට මුණ ගැසුණේය. එහිදී මා කළ කතාවම බැංකොක් නගරයේ පැවැත්වෙන ස්වේච්ඡා සේවා සමුළුවක දී කරන්න යැයි එතුමා මගෙන් ඉල්ලීමක් කළේය. එම ඉල්ලීම මම බාර ගතිමි. එම දේශනයෙන් පසුවයි මෙතෙක් ශ්‍රී ලංකාවට පමණක් සීමා වී තිබූ මගේ සේවාව ලොව පුරා ව්‍යාප්ත කිරීමට මට අවස්ථාව ලැබුණේ.

64
ඇල්බට් විජේගුණවර්ධන මහතා

නාලන්දා විදුහලේ ආදි ශිෂ්‍යයෙක් වූ ආර්. ඒ. විජේගුණවර්ධන මහතා, කනතොලුව කඳවුරෙන් පසු දිනක් හිටිහැටියේම මා මුණගැසීමට අපේ මරදානේ දෙල්ගහයට ගෙදර නිවසට පැමිණියේය. ඊට කලින් මොහු කිහිප වරක්ම නාලන්දාවට පැමිණෙනු මම දැක ඇත්තෙමි. එහෙත් තකහනියක් මා හමුවීමට මගේ නිවසට මොහු පැමිණි ප්‍රථම අවස්ථාව මෙය විය. විජේගුණවර්ධන මහතා නාලන්දා ගුරු සිසුන් සමඟ අප ඇරඹූ ශ්‍රමදාන කඳවුරු ගැන ඉහළින් ඇගයීමක්ද කළේය. එතුමා ද කනතොලුව කඳවුර බැලීමට පැමිණියා මට මතකයි.

ඡායාරූප: 266 – ඇල්බට් විජේගුණවර්ධන මහතා සමග

තමා බෙන්තොට ඉලාස්ටෝ් සමාගමේ අධ්‍යක්ෂවරයකු බවත්, තමාගේ සහෝදර අධ්‍යක්ෂවරුන් වන විල්සන් ගුණසේකර සහ ඩොනල්ඩ් ගුණසේකර මහතුන් ද වෙනුවෙන්, ඉලස්ටෝ සපත්තු කම්හල බැලීමට මට ආරාධනා කිරීමට පැමිණි බවත්, විජේගුණවර්ධන මහතා මා සමඟ පැවසීය. මේ අනුව, බෙන්තොටට යාමට දිනයක් ද එදිනම තීරණය කර

ගතිමු. මට මතක හැටියට, සර්වෝදයට එක් වී බොහෝ කලක් කටයුතු කළ ඩබ්ලිව්. ඩී. පීටන් මහතා ද, විජේගුණවර්ධන මහතා සමඟ එදින පැමිණියේ ය.

ඡායාරූපː 267 චිත්‍රා විජේගුණවර්ධන මැතිනිය කනතොලුවේ දී පොල් පැළ බෙදයි

මට වාහනයක් නොතිබුණෙන්, විජේගුණවර්ධන මහතාගේ වාහනයෙන් එතුමා මා පැක්ටෝරියට කැඳවාගෙන ගියේය. ඔහු කතා බස් කළ ආකාරයෙනුත්, හැසිරුනු ආකාරයෙනුත්, මට හැඟුනේ ඔහු එහි ප්‍රධානියා බවය. කෙසේ නමුත්, කාර්මික අධ්‍යක්ෂවරයා වූ ඩොනල්ඩ් ගුණසේකර මහතා විවිධ යන්ත්‍ර සූත්‍ර වැඩ කරන ආකාරයත්, රබර් අමු ද්‍රව්‍ය හැටියට උපයෝගි කරගෙන බාටා සහ ඩී.එස්.අයි සමාගමට තරගයක් දිය හැකි අන්දමට ඔවුහු ඉලාස්ටෝ සෙරෙප්පු – සපත්තු සාදන ආකාරයත් මට පැහැදිලි කර දුන්හ. විල්සන් ගුණසේකර මහතා කළමනාකාර අධ්‍යක්ෂවරයා විය.

පසුව එම පැක්ටෝරියේ සේවක – සේවිකාවන් සියලුදෙනාම එක් තැනකට රැස් කොට, ඔවුන් අමතන ලෙස මට ඔවුහු ආරාධනයක් කළහ. මම ඉලාස්ටෝ අධ්‍යක්ෂවරුන්ගේ නිර්මාණ කෞශල්‍යයත්, දේශීය කර්මාන්තයක් ඇරඹීමෙන් සේවක සේවිකාවන් හා ප්‍රදේශයට ඉටු කරන අගනා සේවයත් පිළිබඳව කතා කෙළෙමි. ඉන්පසු ව සේව්‍ය – සේවක සම්බන්ධයේ අගය විස්තර කළ මම, සිගාලෝවාද සූත්‍රය ද ආදර්ශයට ගෙන, මහත්මා ගාන්ධිතුමාගේ භාරකාරත්වය පිළිබඳ ආර්ථික දර්ශනය ද සරල භාෂාවෙන් විස්තර කළෙමි.

ඡායාරූප: 268
5 ශ්‍රී 1106 දරන ජීප් රිය එහි අධ්‍යක්ෂ තොළුස් මහතා විසින්
පරිත්‍යාග කළ අවස්ථාව

වාහනයක් නොතිබුණු අවස්ථාවලදී, විජේගුණවර්ධන මහතාගේ 3 ශ්‍රී 7063 දරණ කේම්බ්‍රිජ් රථය, සංගමයේ කටයුතු සඳහා සම්පූර්ණයෙන් වාගේ යෙදෙව්වේය. ආසියා පදනමෙන් සර්වෝදයට ලැබුණු 5 ශ්‍රී 1106 දරන ජීප් රථය ද, ආයුධ කට්ටලය ද, සංගමය ලත් පළමුවන විදේශාධාරය වූ අතර, එය පිළිගන්නා අවස්ථාවේදී සංගමයේ සභාපති ධූරය දැරුවේ ආර්. ඒ. විජේගුණවර්ධන මහතාය. එක්දහස් නවසිය හැටඅටේ දී සංගමයේ ක්‍රියාකාරී කටයුතුවලට සහභාගිවීම එතුමා නැවැත්වූවත්, ඒ දෙපළම ජීවත්වන සිටින තුරු මට ඉඩ ලැබුණු හැම වතාවකම ගොස් දුක සැප සෙව්වෙමි.

එක්දහස් නවසිය හැටහයේ සිට එක්දහස් නවසිය හැටඅට දක්වා සංගමයේ සභාපති වශයෙන් විජේගුණවර්ධන මහතා කටයුතු කළේය. ඩී. අරම්පත්ත මහතා එක්දහස් නවසිය හැට තුනේ සහ එක්දහස් නවසිය හැටහතර වර්ෂවලදී ද, එම්. ඩබ්ලිව්. කරුණානන්ද මහතා එක්දහස් නවසිය හැට නවයේ සිට එක්දහස් නවසිය හැත්තපහ දක්වා වර්ෂවල ද සභාපති ධූරය දැරූ අතර, එක්දහස් නවසිය හැත්ත හයේ සිට අද දක්වා සභාපති වශයෙන් මම කටයුතු කරමි.

එක් නවසිය හැටේ දශකයේදී ප්‍රමාණය ඉක්මවා මම ආත්මාහරණය ක්‍රියාත්මක කිරීමට ප්‍රයත්න දැරීමි. මා සෑම වැඩකම බර කරට ගෙන ක්‍රියා කළ අතර, විවිධ තිලතල බලෙන්ම වාගේ එක් එක් අයට පවරා ජාතික කැඳවන්නා, කඳවුරු සංවිධායක, සංවිධායක ලේකම්, උප සභාපති ආදී තනතුරු පමණක් දැරීමි. කරුණානන්ද

ඡායාරූප: 269
වමේ සිට: ධර්මා ගුණසිංහ, විජේදාස මහවත්ත, ඩී. ඒ. පෙරේරා, සරත් හේවාගම, සිරිල් ඒකනායක, ධර්මසේන සේනානායක යන මහත්වරු සමග

මහතා ඇතුළු හැමෝම, මා සර්වෝදය නායකයා හැටියට හැඳින් වූ අතර, මගේ හිතේ නිතරම මා හඳුන්වා ගත්තේ සර්වෝදය සේවකයෙක් හැටියටය. සර්වෝදය දර්ශනය, ප්‍රතිපත්ති, සංවිධාන ව්‍යුහය හා ක්‍රියා මාර්ග ගොඩනැඟීම, සම්පත් සෙවීම, මහජන සම්බන්ධතා, ප්‍රජාවබෝධනය ආදී වූ සියලුම අංශවලට මගේ නිර්මාණ ශක්තිය යෙදවූ අතර, නිරායාසයෙන්ම බොහෝ දෙනෙක් නිලතලවල ගෞරවය පමණක් නොව, වරප්‍රසාද ද භුක්ති වින්දෝය. එයට කමෙක් නැත. එහෙත් එන්ට එන්ට ම දුර්ජනකම් කිරීමත්, මා වෙහෙසී ගොඩනඟන්නට ප්‍රයත්න දරන අහිංසාවාදී සමාජ විප්ලවීය බලවේගය දුර්වල කරන ආත්මවාදී කටයුතුවල යෙදීමත් නිසා, එවැන්නවුන් සර්වෝදය සංසදයේ පර්යන්තයට වැටෙන්ට ඉඩ හැර, සර්වෝදය සභාපති ධූරය මම භාර ගතිමි. ධර්මසේන සේනානායක, කමල් දිසානායක, ධර්මා ගුණසිංහ, එම්.ඒ. තිලකරත්න, අම්රත් අම්ලියන්, විලියම් කන්දගේ, සීතා රාජසූරිය, පී. ඩබ්ලිව්. මහවත්ත, කේ. දසනායක, ඩී.ඒ. පෙරේරා, සිරිල් ඒකනායක ආදී වූ සැබෑ සර්වෝදය හිතැතියන් විවිධ නිලතලවලට පත් කොට මම පෙරමුණ ගත්තෙමි. මේ නිසා ශ්‍රී ලංකාවේ ප්‍රබලම දේශපාලන නොවන නිදහස් ජනතා සංවිධානය ගොඩනැඟීමට අපි සමත් වීමු.

65

මඩකලපුව පනිච්චන්කර්නි කඳවුර

එක්දහස් නවසිය පනස් අටේ දී මුල්ම ජාතිභේද අරගලය ඇති විය. මරදානේ තිව්සිටි ස්ටෝරුව ඉදිරිපස සිට මරදානේ ද්‍රවිඩ කඩවලට ගිනි තබමින් සාපරාධී ක්‍රියා සිදුවන හැටි මම ජීවිතයේ පළමුවන වරට දුටුවෙමි. එවකට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වූ වී. ටී. නානායක්කාර මහතා ද, මා සමඟ මේ අපරාධ සිදුවන හැටි කිසිවක් කරගත නොහැකිව බලා සිටියේය. එතුමා අගමැතිතුමාට ද ටෙලිෆෝන් කර, මේ සිදුවන ගිනි තැබීම්, කොල්ල කෑම් පිළිබඳ රාත්‍රියේම සැල කළා මට මතකයි.

මේ ජාතිභේද කෝලාහලවලට එක් හේතුවක් හැටියට සැලකෙන මඩකලපුවේ දී සිදුවූ සෙනෙවිරත්න නැමති සිංහල වැව්ලිකරුවෙකුගේ ඝාතනය පිළිබඳව ද මේ වන විට අප අසා තිබුණේය. මොහු වෙඩි තබා මරා දමා තිබෙන්නේ, මඩකලපුවට උතුරෙන් පිහිටි පනිච්චන්කර්නි නමැති ගම්මානේදීය. වත්තාරමුල්ල මධ්‍ය මහා විද්‍යාලයේ ශිෂ්‍යයන් අමතා, ආරියනන්ද අබේසේකර මහතා සහ මම කළ කතාවක ප්‍රතිඵලයක් වශයෙන් පනිච්චන්කර්නි කියන ගමේ සිංහල–දෙමළ ශිෂ්‍යයන් එකතු කොට, සතියක ශ්‍රමදාන කඳවුරක් පැවැත්වීමට තීරණය විය. මෙහි සංවිධාන කටයුතු බාරව වැඩ කළේ ග්‍රාම සංවර්ධන නිලධාරී ඒ. සී. ඒබ්‍රහම් මහතාය. එක්දහස් නවසිය පනස්නවයේ අගෝස්තු මස විසිතුන දින සිට තිස්වැනි දින දක්වා පනිච්චන්කර්නි ගම්මානයේදී මේ කඳවුර පැවැත්වුණු අතර, කොළඹ නාලන්දා විද්‍යාලයේ ශිෂ්‍යයින් සහ ගුරුවරුන් පිරිසක් සමඟ මම මේ කඳවුරට සහභාගි වීමි.

මේ කඳවුරේ වැදගත් සිද්ධියක් වූයේ, කඳවුරු භූමියට හිටිහැටියේම පැමිණි ෆෙඩරල් පක්ෂයේ නායක එස්. ජේ. වී. චෙල්වනායගම් මහතාගේ සොහොයුරියක් වූ ඔලගසේකරන් මැතිනිය, වහාම කඳවුර නවත්වා පිටවන ලෙස අපට තර්ජනය කිරීමයි. මා ටිකක් අසනීප වී කඳවුරු කාර්යාලයේ විවේක ගනිමින් සිටි නිසා, එතුමිය තර්ජනය කළේ මටයි. මම එය ගණන් නොගෙන, සිංහල ශිෂ්‍යයින් සහ දෙමළ ශිෂ්‍යයින් එකට

එකතු ව කරන වැඩ බලා පසුව තීරණයක් ගනිමු යැයි ඇයට ප්‍රකාශ කළෙමි. පුදුමයකට මෙන් ඇය දුටුවේ සිංහල ළමයින්, දෙමළ භාෂාව කතා කරන්න හදන හැටියි. දෙමළ ළමයින් සිංහල භාෂාව කතා කරන්න හදන හැටියි! ඉතා මිත්‍රශීලීව ඔවුන් ළිං ප්‍රතිසංස්කරණය කිරීම, ප්‍රජා ශාලාවක් ඉදි කිරීම, ගෙවතු වගාව සඳහා බිම් සකස් කිරීම, ළමයින්ගේ කොණ්ඩා කැපීම ආදී කාර්යයන් රැසක එක්ව යෙදී සිටින ආකාරයයි.

මුලු දවසම එහි ගත කළ ඔලගසේකරන් මැතිනිය, නැවත මා ළඟට වුත් නොසැහෙන සේ ප්‍රශංසා කොට, කලින් ඈ තදින් කතා කිරීම ගැන කණගාටුව පළ කොට, සතියකට අවශ්‍ය කෑම සපයන බව දන්වා පිටව ගියාය. එදා සිට කඳවුර පැවැත්වුණු කාලය තුළ ආහාරවලින් අපට කිසිම අඩුවක් තිබුණේ නැත.

එක්දහස් නවසිය හැටදෙකේ සිට සිංහල, දෙමළ, මුස්ලිම් යන තුන් කොට්ඨාශයම එකට එකතු කොට අඛණ්ඩ ව අපි ශ්‍රමදාන කඳවුරු පැවැත්වීමු. ඒ හැම එකකදීම 'ජාතික සමගිය ඇති කිරීම' යන මැයින් සම්මන්ත්‍රණ පැවැත්වීමු. එක්දහස් නවසිය හැටදෙකේ අගෝස්තු මස දහඅට වැනි දින කිලිනොච්චියේ 'ගාන්ධි නිලයම්' ආශ්‍රමයේ ආරම්භ කළ ජාතික සමගි කඳවුර, ත්‍රිකුණාමලයේ පෙරියකුලම්, විල්ගම්වෙහෙර රජමහා විහාරය, පරන්තන්වල මුරුසමොටෙයි, කෑගල්ල, බුලත්සිංහල, නැදලගමුව ආදී ස්ථානවල ජාතීන් තුනම එකට එකතු කොට විශාල වශයෙන් කඳවුරු පැවැත්වීමු. කන්දගේ මහතා අතින් ලියැවුනු සටහනක් තුළින් මගේ මතකය අවුස්සා මා ඊ ළඟ පරිච්ඡේදය ලීවේ, මේ වැඩ සටහනට අවශ්‍ය රාජ්‍ය සහයෝගය සහ ජනතාවගේ සහභාගීත්වය දිගින් දිගටම ලැබුණේ නම්, අද අප මුහුණ දී තිබෙන ජාතික උවදුර කවදාවත් ඇති නොවන බව පෙන්වීමටයි.

66

යාපනයේ නිර්වේලි කයිතඩි ශ්‍රමදාන කඳවුර

1964 අප්‍රේල් 11 වැනිදා සිට 25 දක්වා

රාජ්‍ය භාෂා ප්‍රශ්නය මත උතුරේ සමහර ජන කොටස් ඇති කර ගත් ජාති භේද අරගලවලින් පසුව, යාපන අර්ධද්වීපයට දකුණේ ජනතාවගේ පැමිණීම සීමා විය. වරින්වර නාගදීපය වැඳීමට ගිය බෞද්ධ වන්දනා පිරිස් හා බේකරි හිමියන්, වඩු කාර්මිකයින්, රජයේ සේවකයන් වැනි සිංහල පිරිස් පමණක් එහි ගියහ.

මේ අතර සර්වෝදය ශ්‍රමදාන කඳවුරු ගැන දැන ගත් යාපනේ පිරිස් සිංහලයන් සමඟ සමගියේ අත්වැල් බැඳ ගත්හ.

ඡායාරූප: 270
යාපනේ ප්‍රථම සමගි පා ගමන:
පාර්ලිමේන්තු මන්ත්‍රී පී. නවරත්නම් මහතා ප්‍රධාන යාපනයේ වැසියන් හා
දකුණෙන් ගිය 300 ක් සහභාගි වූ අවස්ථාව

කිලිනොච්චි උරුත්තරපුරම් හි පිහිටුවා තිබූ 'ගාන්ධි නිලයම්' නැමැති ආශ්‍රමය සර්වෝදය සමඟ මිතුදම් පැවැත්විණි. මුදලියාර් එස්. සින්නතම්බි, එස්.කේ. වේලායුධපිල්ලේ, එස්. කේ. තම්බිපිල්ලේ, මහාචාර්ය

කේ. නේසයියා වැනි ද්‍රවිඩ නායකයෝ මරදානේ සර්වෝදය මධ්‍යස්ථානයේ මගේ නිවසට පැමිණ සාකච්ඡා කළහ. එම්. ඩබ්ලිව්. කරුණානන්ද, එම්. ඒ. තිලකරත්න, ධර්මසේන සේනානායක, මහාචාර්ය එල්. ජී. හේවගේ වැනි වැඩිහිටියන් සමඟ කළ සාකච්ඡාවලින් පසු තිර්වේලි – කයිතඩි ප්‍රදේශයේ කඳවුර පැවැත්වීමට තීරණය විය.



ඡායාරූප: 271
පූජ්‍ය පණ්ඩිත ගරු වැල්මිල්ලේ
සෝමානන්ද නාහිමි

ඒ අනුව සිංහලයන් තුන්සීයකගෙන් සමන්විත කණ්ඩායමක් යාපනේ දුම්රියේ වෙන්කර ගත් විශේෂ මැදිරි කිහිපයකින් යාපනය බලා පිටත් වූහ. පූජ්‍ය තුන්නානේ සුමනතිස්ස හිමියන්, පූජ්‍ය වැල්මිල්ලේ සෝමානන්ද හිමියන් හා මෑතක දී අපවත් වූ අනුරාධපුර ජාත්‍යන්තර බෞද්ධ පුස්තකාලයේ අධිපති බටකැත්තර රේවත නාහිමිපාණෝ ද සහභාගි වූහ.

මගේ උපාධි පරීක්ෂණය ද මේ දිනවලම යෙදී තිබුණි. අවසාන ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා, මා දුම්රියට දුවගෙන ආ සැටි අදත් කාටත් මතක ය. මගේ මැණියන්දෑ අවුරුද්දකුත් මාස අටක් වයසැති සිය මුණුබුරු, මගේ වැඩිමහල් පුතා–වින්‍යා කොට්ටයක උකුලේ තබා ගෙන අසුනක හිඳ ගත්තා ය. නීතා සිය තුන් හැවිරිදි දුව චාරිකා උකුලේ තබාගෙන සිටියාය. මිත්තණිය – පුතා – මුණුබුරා යන පරම්පරා තුනක පුරුකක් මේ කඳවුරට සහභාගි වීම විශේෂ සිද්ධියකි. කෑගලු ප්‍රදේශයෙන් පැමිණි විසිපහක් වූ පිරිස, පොල්ගහවෙල දුම්රිය ස්ථානයේ

ඡායාරූප: 272
(වමේ සිට) නවරත්නම් මන්ත්‍රීතුමා, නෙවිල් ජයවීර දිසාපතිතුමා, මා, බටකැත්තර රේවත හිමියන්

ජායාරූප: 273
දිසාපති නෙවිල් ජයවීර මහතා හා කේ. නේසයියා මහතා ඇතුළු පිරිස මුල් පස් පිඩැල්ල කැපීම

දී දුම්රියට ගොඩ වූහ. සර්වෝදය ගීත ගයමින්, විනෝද වෙමින්, දිවා ආහාරය ද දුම්රියේදී ලබා ගනිමින්, සවස යාපනයට ළඟා වීමු. එතැන් සිට පිළියෙල කර තිබූ විශේෂ බස් රියවලින් නිර්වේලි බලා පිටත්ව ගියෙමු.

එහිදී ලත් උණුසුම් පිළිගැනීමෙන් පසු රාත්‍රී ආහාරය ලබා ගතිමු. තෝසේ, වඩේ, ඉට්ලි ආදී යාපනයේ කෑම වර්ගවලින් පිරි රාත්‍රී ආහාරය රස මසවුලෙන් යුක්ත විය. අතුරුපස වශයෙන් ලැබුණු "පායාසම්" කාටත් රසවත් ආහාරයක් විය. සව් කිරෙන් උයා, ඊට කජු ආදිය දමා සකස් කර ගන්නා ලද පායාසම් සිංහල ශ්‍රමදාන සේවකයන්ට අලුත් ප්‍රණීත ආහාරයක් විය. රාත්‍රී පවුල් හමුවේදී කඳවුරු විනයත්, කඳවුරු කාර්ය භාරයත් විස්තර කළ පසු, දෙමළ ජනතාවගේ ගීතමය සුහද පිළිගැනීමෙන් පසු නිර්වේලි දේවාලයේ පැවැත්වෙන වාර්ෂික දේව පූජාවට සහභාගි වන්නට අපට ඇරයුම් ලැබුණි.

ජායාරූප: 274
දිසාපති නෙවිල් ජයවීර මහතා කතා කරයි

ඡායාරූප: 275
අපේ අම්මා
යාපනයේ
නීර්වේලි
කයිතඩි
කඳවුරේ දී

තුන්සීයකගෙන් සිංහල පෙරහැර සැදී, විශාල පූජා වට්ටියක් හිස තබා ගත් කන්දගේ මහතා පෙරටු කොට, කෝවිල දෙසට අපි පිය නැගීමු. අපේ පිටුපස පන්දම් විලක්කු දල්වා ගත් දස දහසක පමණ බැතිමත්හු නාගසලම්, මිහිඟු බෙර නද, දෙවටින් 'හරෝ හරා' නාදයත් සමඟ පෙරහැර ඉදිරියට ඇදී ගියේය.

කෝවිලට ඇතුලුවන දොරටුව අබියසදී සිංහල – දෙමළ පිරිස් උනුනුන් දැක ප්‍රබෝධමත් වූහ. ආශ්චර්යෝද්මක අවස්ථාවෙකි. දෙමළ පිරිස් සතුටෙන් උද්දාමව ඉදිරියට පැන, සිංහල එකිනෙකා සෙනෙහසින් වැළඳගෙන තුටු කඳුලු වගුරන අතර, තවත් සමහරෙක් ඔවුනගේ සම්ප්‍රදායික පිළිගැනීමේ චාරිත්‍රයන් ඉටු කළහ. උණුසුම් කැවුම් ගෙන සිය ආගන්තුක මිතුරන්ගේ පා තවන්නට වූහ. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම උණුසුම් පිළිගැනීමකි. කැවුම්, කෙසෙල්ගෙඩි, වඩේ ආදී ආහාරයන් කන්නට දෙමින්, සරුවත් වැනි සිසිල් පානයන් බොන්නට දෙමින්, කෝවිල තුළට කැඳවාගෙන ගියහ. එහිදී ප්‍රධාන පූජකවරයා ඉදිරියේ අප ගෙන ගිය පූජාවට්ටි හා ඔවුනගේ පූජා වට්ටි දේව මන්දිරයේ පූජාසනය මත තබා දේව ස්තෝත්‍ර ගයන්නට වූහ. සුවඳ දුම් වළලු හිස වටා කැරකැවෙන්නට විය. සුගන්ධයෙන් මුලු පෙදෙසම සුවඳවත් විය. වයන බිහිඟු බෙර හඬින් පෙදෙසම නින්නාද විය. ගයන ගැයුමෙන්, වයන වැයුමෙන්, නටන නැටුමෙන් මුලු දේව මන්දිර පෙදෙසම අමුතු සිරියක් පළ කළේය. තැන තැන ඉදිවුණු රඹ තොරන් හා මල්වැල්වලින් පෙදෙස අලංකාර විය. මේ අසිරි සිරි විඳි පැ තුනක කලකින් පසු අපි අපේ නවාතැන් කරා ළඟා වීමු.

නිර්වේලි මහා විද්‍යාලයේත්, අවට නිවෙස්වලත්, අපේ නවාතැන් තෝරා ගත් අපි, රෑ ඒවායේ ලැඟුම් ගතිමු. පාන්දර පහේ කණිසමට අපි

නැගිටීමු. උදේ තේ කෝප්පය වෙනුවට ලැබුණේ "මල්ලි තන්නි" (කොත්තමල්ලි වතුර කිරි මුසු කොට තනාගත් බීමක්) වීදුරුවකි. ඉන්පසු මුහුණ කට සෝදා, අවට පිරිසිදු කොට, උදේ අහර කිස නිමවීමෙන් පසු කඳවුර ඇරඹීම සඳහා සම්ප්‍රදායික පොල්තෙල් පහන දැල්වීම චාවාකච්චේරි මන්ත්‍රී වී. නවරත්නම් මහතා, ගරුතර පූජ්‍යපාද බටකැත්තර රේවත නාහිමිපාණන්, මුදලියර් සින්නතම්බි මහතා සහ මා අතින් සිදු විය.

සිංහල කණ්ඩායම, දෙමළ කණ්ඩායම සමඟ මිශ්‍ර වී කඳවුරේ වැඩපොළට ගිය හ. උදා හිරුගේ රශ්මිය ලබමින් ද, පොළව කොටන්නට උදලු පහරක් ගසන විට, උදලුතලය උඩට විසිවන්නේ පස කොන්ක්‍රීට් මෙන් තද නිසාය. මහත් ආයාසයෙන් උදේ වරුව වැඩ කළෙමු. දිවා ආහාරය සඳහා කඳවුර නිමා කොට, මුහුණ සෝදා ගැනීම සඳහා අසල තිබූ කෙසෙල් වතුවලට ගියෙමු. දකින තෙක් මානයේ කෙසෙල් වතු ය. එක කෙසෙල් පඳුරක පැළ තුනකට වඩා නැත. ළිඳකට මෝටරයක් සවි කොට එයට සම්බන්ධ වූ ලොකු නලයකින් කානුවට ජලය ගලයි. ඒ කාණුවේ ජලය කෙමෙන් කුඩා කාණුවලටත් ගලා යමින් සෑම කෙසෙල් පඳුරකටම දිය බෙදා හරියි.

අපි හැමදෙනාම ජල පොම්පයෙන් සිත් සේ නා ගතිමු. කොළඹ වෙළඳපොළට කෙසෙල්කැන් එවන්නේ, මේ ප්‍රදේශයෙන් බව අපි දැනගෙන විශ්මයට පත් වීමු. දිවා ආහාරයට පාසලට ගියෙමු. එහිදී මාලු එළවලු සහිත බතක්, කෙසෙල් කොළේට බෙදා අපට කන්නට ලැබුණි. අතුරුපස වශයෙන් පායාසම් හා කෙසෙල්ගෙඩි ලැබුණි. පායාසම්වලින් ප්‍රීතියට පත් අපේ පිරිස දෙතුන්වර පවා ලබාගෙන අනුභව කළහ. දිවා ආහාරයෙන් පසුව 'දිවා පවුල් හමුව' විය.

යාපනයේ දක්ෂම තූර්ය වාදන කණ්ඩායම ඉම්හිරි තූර්යවාදනයන් කළහ. ඉන්පසු අපේ කණ්ඩායම සමඟ කොළඹ සිට ගිය නාට්‍ය ශිල්පී හීන්බබා ධර්මසිරි ආචාර්යවරයාගේ ශිෂ්‍ය පිරිසකගේ සංස්කෘතික දර්ශනයක් විය. කන් බිහිරි කරවන අත්පොළසන් නාදයෙන් පසු දේශන අවස්ථාවේදී තිලකරත්න මහතාත් මාත් කතා කළ අතර, ආචාර්ය නේසයියා මහතා හා ෂිරෝමනී රාජරත්නම් මෙනෙවිය ද කතා කළහ. භාෂා පරිවර්තනය කළේ එස්. කේ. තම්බිපිල්ලේ මහතා විසිනි. ආචාර්ය ෂිරෝමනී රාජරත්නම් මෙනෙවිය සර්වෝදය විධායක මණ්ඩලයේ සාමාජිකාවන් වශයෙන් පසු කලෙක කටයුතු කොට හදිසියේ අභාවප්‍රාප්ත වූවාය.

පවුල් හමුවෙන් පසු, යළිත් ශ්‍රමදාන කඳවුර ඇරඹුණි. හිරු රැස් සැඩ හෙයින් කවුරුත් පාහේ පීඩාවට පත්වූහ. වියළි සුළඟත්, පොළොවේ තද බවත් නිසා වැඩ කළේ මහත් ආයාසයෙනි. සවස තේ පානයට ගත් සුලු විවේකය හැර, පස්වරු පහ වනතුරු අපි වැඩ කළෙමු.

ඡායාරූපඃ 276
ආචාර්ය ශිරෝමී රාජරත්නම් මෙනෙවිය

කඳවුර නිමා කොට එද්දි, අපි මෘත දේහයක් දමන සොහොනක් දුටිමු. සෑයේ තිබූ ලී කොටන් දෙක තුන එහා මෙහා පෙරළමින්, මළ සිරුර දමනු දුටු අපි මේ පළාතේ සොහොනකට ගන්නා දැව ප්‍රමාණය කෙතරම් විශාල දැයි සාකච්ඡා කළෙමු.

සවස ද, කෙසෙල් වතුවල ජල පොම්පවලින් සිත් සේ නා, යළිත් කඳවුරු භූමියට පැමිණියෙමු.

රාත්‍රී ආහාරය වේලාසනින් ගෙන, කඳවුර සමාලෝචනය හා ඉදිරි දින වැඩ පිළිවෙල කෙටියෙන් නිම කොට, සංස්කෘතික සංදර්ශනය නැරඹීමට සූදානම් වීමු. ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ක්‍රොසට් තම්බයියා මහතා මුලසුන ගත් අතර, යාපන අර්ධද්වීපයේ චිර ප්‍රසිද්ධ තූර්ය වාදක කණ්ඩායම සිය තූර්යවාදනය ඉදිරිපත් කළේය. ඊළඟට සිංහල සංස්කෘතික කණ්ඩායමේ අංගයන් ඉදිරිපත් වී, වරින් වර මාරුවෙන් මාරුවට ජාතීන් දෙකේ සම්ප්‍රදායික සංස්කෘතික සංදර්ශනයන්ගෙන් පිරිස වශීකෘත වූහ. සංදර්ශනයෙන් පසු ක්‍රොසට් තම්බයියා මහතා කළ දේශනයෙන් පසු සියලු දෙනා නින්දට ගියහ.

තුන්වන දින කඳවුර

සිරිත් පරිදි උදේ චාරිත්‍ර ධර්මයන් ඉටුකොට ආහාර ගෙන, කඳවුරු භූමිය කරා ගියෙමු. පැයක් පමණ වැඩ කරන විට ඈත කවුරුන්දෝ තුවාල වූ බවට පණිවුඩයක් ලැබුණි. එතැන තිබූ කාගේදෝ බයිසිකලයක් ඉල්ලා ගෙන කන්දගේ මහතා එම ස්ථානයට ගියේය. පුදුමයකි, උදැල්ලට පය කැපී ලේ ගලන තුවාලයක් සහිතව වැටී ඇති අයෙකි. හේ කන්දගේ මහතාගේ ආචාර්ය මණ්ඩලයේ සිටි ඔහුගේ හොඳම මිතුරකු වූ විජයවික්‍රම මහතායි. ඔහුගේ තුවාලය වඩා බරපතල බව පෙනුණි. ප්‍රථමාධාර පෙට්ටියෙන් ගත් බැන්ඩේජ් පටිවලින් තුවාලය ඔතා, වහාම කඳවුරට පිටින් තිබූ ලොරියක ඔහු නංවාගෙන යාපනයේ

රෝහලට ගෙන ගියෙමු. ඔහුගේ සාත්තුව සඳහා අරණායකින් ගොස් සිටි ටිකිරි බණ්ඩා මහතා නැවත්වීමු. (කඳවුර අවසන් කොට අතිත් පිරිස ගම්බලා පිටත්ව ගිය පසු සතියක් යන තුරු ඔවුනට රෝහලේ නවතින්නට සිදුවිය.) එදා සවස ද කඳවුර අවසානයේදී සංස්කෘතික සංදර්ශනයක් විය.

සිව්වැනි දින කඳවුර

මෙදින මා සම්පූර්ණයෙන් කම්පනයට පත් වූ දෙයක් සිදු විය. එනම් කොළඹින් පැමිණි සංස්කෘතික කණ්ඩායම හදිසියේම කොළඹට යා යුතු බව මට පැවසීමය. ඔවුන් සඳහා ද සාමූහිකව දුම්රිය ටිකට් ගෙන තිබුණෙන්, මෙම අනපේක්ෂිත වියදම දරා ගැනීමට මගේ අතේ මුදල් තිබුණේ නැත. එක් අතකින් මෙවැනි ජාතික කර්තව්‍යයක දී මේ අය හැසුරුණු බොළඳ විලාශය ගැන මම සංවේගයට පත් වීමි. මගේ අතේ මේ මුදල් නොතිබීමත්, ඒ වනවිට විවිධ අයගෙන් මුදල් ණයට ගෙන තිබීමත් නිසා, මගේ ඇසින් කඳුලු වැගිරුණි. මේ වේලාවේ ම මා සිටි කාමරයට පැමිණි අම්මා මේ බව දුටුවාය. කිසිවක් ඇයට නොපෙන්වා මම මොකක් දෝ කාරණයක යෙදුණෙමි. මා අඩන බව අම්මා, කන්දගේ මහතාට සහ අරම්පත්ත මහතාට කියා තිබේ. ඒ වෙලාවේදීම කාමරයට ආ මේ දෙපළ පෙරත්ත කරන විට, මේ සිද්ධිය ගැන ඔවුන්ට පැවසීමි. ඒ ප්‍රශ්නය මේ දෙපළ විසින් විසඳා එම කණ්ඩායම ඊ ළඟ දුම්රියෙන් කොළඹට පිටත් කරන ලදී.

එදින ශ්‍රමදාන කඳවුරේ නියමිත වැඩ කොටස සමාප්ත වී එයින් උද්දාමයට පත් දෙමළ ජනතාව, ඊළඟ දිනයේ යාපන අර්ධ ද්වීපයේ සුහද චාරිකාවක් සැලසුම් කළහ. එවකට එහි ආදායම් පාලන නිලධාරී සිවනාදන් මහතා (පසුව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ) බස්රථ හයක සිංහල පිරිස රැගෙන කීරමලේ උණුසුම් ජල උල්පත් කරා ගෙන ගියහ. අතරමගදී දුම්කොළ වතු, ප්‍රසිද්ධ කෝවිල් හා දෙමළ ජනතාවගේ දෛනික ජීවිතය පිළිබඳ දැනුමක් ලබා දෙමින් මේ සංචාරය පිළියෙල විය. කීරමලේ ජල උල්පත් මහ මුහුද ළඟ පිහිටි නමුත් ගොඩ පැත්තෙන් නොනවත්වා ගලන මිරිදිය නිසා මෙය දේව ප්‍රාතිහාර්යයක් ලෙස හින්දුහු සලකති. වැඩිදෙනා එහි බැස මුව සෝදා ඉන්පසු එතැන ඇති හින්දු කෝවිලට ගොස් දේවාශිර්වාද ලබා ගත් හ. ඉන්පසු තල්වතු රාජ්‍යයේ සැරිසරමින් නාගදීපය වැඳීමට ගියෙමු.

එහි හින්දු කෝවිලේ වේල් රථයේ පැරණි බෞද්ධ කැටයම් ද නරඹා, ඉන්පසු නාගදීප විහාරයට ගොස් බුදු පා පහස ලබා ගත් පුද

බිම සඳ රඳු මුදුන්වෙද්දී තෙල්, මල්, පහන් පුදා වැඳ ගතිමු. මෙසේ වන්දනාමානාදිය කිරීමෙන් පසු යළිත් මෝටර් ලෝන්ච්වල නැඟී පුන්ගුඩුතිව්වලට පැමිණ, බස් රථවලින් කලපු මැදින් වැටී තිබූ පාරවල් ඔස්සේ යළිත් තීර්වේලි කඳවුරට පැමිණියෙමු. එදින රාත්‍රී සමුගැනීමේ පවුල් හමුව තබා, ගිනිමැල ක්‍රීඩා අංශය ඇරඹිණි. සිංහල සහ දෙමළ දෙජාතීහු සිය ආවේනික කෙළි සෙල්ලම්, ජන ගායනා ආදියෙන් සොම්නස් වූහ.

පසුදා උදේ ආහාර ගැනීමෙන් පසු, පැමිණ තිබූ විශේෂ බස් රථවලින් සිංහල පිරිස යාපනයේ දුම්රිය පොළට ආහ. පසු ගමන් සඳහා ද්‍රවිඩ ප්‍රභූ පිරිස් ද ඒ පිරිසට එක්වූහ. මුදලියාර් සින්නතම්බි, වේලායුදපිල්ලේ, තම්බිපිල්ලේ, රාජරත්නම් මෙනවිය, සුප්‍රකට ස්වර්ණාභරණ වෙළඳසැල් හිමියකු වූ කනගරත්නම් මහතා, ආදායම් පාලක නිලධාරී සිවනාදන් මහතා, ආචාර්ය කේ. නේසයියා මහතා හා හින්දු පූජකවරු ද මේ පිරිසට අයත් වූහ.

දුම්රිය පොළේදී තුටු කඳුලු වගුරමින් දෙජාතීහු සමු ගත්හ. දුම්රිය කෙමෙන් ගමන් ඇරඹීය. වේදිකාවේ සිටි යාපනේ ජනතාව අත් ඔසවමින් ආචාර කළහ. තල්අතු වැටවලින් එළියට පැමිණ, දොරටු අසලට වී දුම්රිය පාර දෙපස ම රැස්ව සිටි ගෙවල වැසියෝ දිවෙන දුම්රියේ සිටි පිරිසට අත් වනමින් ප්‍රීතිය ප්‍රකාශ කරමින් ආචාර කළ හ.

සැතපුම් තුනක් එන විට පූජ්‍යපාද තුන්නානේ සුමනතිස්ස හිමිපාණන්ට උදරාබාධයක් වැළඳී, බෙහෙත් බීමට දෙහි අවශ්‍ය විය. එවිටම දුම්රිය පොළකට ළඟාවීය. ඈත ගෙදරක මිදුලේ දෙහි ගසක් තිබෙනු දුටු කන්දගේ මහතා, වේදිකාවට බැස ඒ ගෙදරට දිව ගියේය. සංඥා මගින් දන්නා දෙමළෙන් ඔවුනට කරුණු කියා, දෙහි ගෙඩි දෙක තුනක් කඩාගෙන ඔහු දුම්රියට දුව ගෙන ආවේය. දුම්රිය පිටත්වන සංඥාව හූ හඬ නිකුත් විය. එය ඔහුට සරදමට කළ හූවක් ලෙස සැලකූ කන්දගේ මහතා වේගයෙන් දුවමින්, ඉදිරියට ඇදෙන දුම්රියේ පා පුවරුවට නැග යන්තමින් මැදිරියට ඇතුලු වීය. තුන්නානේ හාමුදුරුවෝ මුව නොසැහෙන සේ ස්තුති කොට පින් දුන්හ. දෙහි ඇඹුල් මිශ්‍ර කළ බෙහෙතින් උදරාබාධය සුවපත් විය. යාපනේ ජනතාව දුන් දහවල් ආහාරය, දුම්රියේදී අනුභව කොට – ශ්‍රමදාන ගීත ගයමින් සවස කොළඹ කොටුවට ළඟා වීමු. සමහරුන් මරදානට ගිය අතර, අනෙක් අය නිවෙස් බලා පිටත් වූහ.

67

බෞද්ධ ජාතික බලවේගය

එක්දහස් නවසිය පනස්එකේ දී මහාචාර්ය ජී. පී. මලලසේකර මහතාගේ ප්‍රධානත්වයෙන් බෞද්ධ මහා සම්මේලනයේ නියෝජිත පිරිසක් ගරු අගමැති මහාමාත්‍ය ඩී. එස්. සේනානායක මහතා මුණගැසී බෞද්ධයා මුහුණදී තිබෙන ප්‍රශ්න ගැන සොයා බැලීමට කොමිසමක් පත් කරන ලෙස ඉල්ලා සිටියහ. මුලින් එයට කැමැත්ත දැක්වූවත්, දෙවැනි රැස් වීමේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව එය කළ නොහැකි බව ඩී.එස්. සේනානායක මහතා ප්‍රකාශ කළේය.

මේ තත්ත්වය යටතේයි, බෞද්ධ මහා සම්මේලනය විසින් බෞද්ධ තොරතුරු පරීක්ෂක සභාවක් පත් කිරීමට එක්දහස් නවසිය පනස්තුනේ දී කෑගල්ලේ පැවැති වාර්ෂික සමුලුවේ දී තීරණය කළේ. මේ කාලයේ රෙජිස්ට්‍රාර් ජෙනරාල් වශයෙන් සේවය කළ බෞද්ධ නායකයකු වූ ඇන්.කිව්. ඩයස් මහතා රටපුරාම මේ කමිටුවට සාක්ෂි දීමේ කටයුතු සංවිධානය කළ අතර, ඉතා උද්යෝගයෙන් බෞද්ධ ජනතාව මේ කමිටුව හැම තැනකදීම පිළිගත්හ.

පිටු දහස් ගණන් සාක්ෂි එක්තැන් කොට පිළියෙල කිරීමේ කාර්යභාරය – මට මතක හැටියට, එල්. එච්. මෙත්තානන්ද මහතා ඉටු කළ අතර, මහා සංඝයා වහන්සේ පිළිබඳ කොටස අති පූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ නාහිමියනුත්, අති පූජ්‍ය හේන්පිටගෙදර ඥාණසීහ නාහිමියනුත් භාරව සිටියහ. මහාචාර්ය තෙන්නකෝන් විමලානන්ද, නීතිඥ සී.ඩී.එස්. සිරිවර්ධන යන බෞද්ධ නායකයනුත් ඉතා මහන්සි වී, එක්දහස් නවසිය පනස් පහේ දී පිටු දෙසිය පනස් හයකින් සමන්විත මේ වාර්තාව සම්පූර්ණ කොට මහා සංඝයාට පිළිගන්වන ලදී.

වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට රජය හෝ එක්සත් ජාතික පක්ෂය හෝ ඉදිරිපත් නොවූ අතර, එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා හා පිලිප් ගුණවර්ධන මැතිතුමා ඒවා තමනට බලය ලැබුණහොත් ක්‍රියාත්මක කිරීමට පොරොන්දු වූහ.

ඡායාරූපඃ 277
මහාචාර්ය හේන්පිටගෙදර ඤාණවාස නාහිමි,
ඤාණසීහ නාහිමි හා ස්විස් ජාතික සුමෙධ හිමි

කොළඹ නගර සභා භූමියේ පැවැති රැස්වීමක දී, මේ දෙපළ ඒ ප්‍රතිඥාව දුන් හැටි බලා සිටි පිරිසේ තරුණ මම ද සිටියෙමි. බණ්ඩාරනායක මහතාගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා පිලිප් ගුණවර්දන මහතාගේ මහජන එක්සත් පෙරමුණු සන්ධානයට, ඇල්. එච්. මෙත්තානන්ද මහතා ප්‍රධාන බෞද්ධ බුද්ධිමතුන් ක්‍රියාකාරී කමිටුවක් පිහිටුවා අවශ්‍ය තොරතුරු මහජනයාට සැපයූ අතර, ගරු හේන්පිටගෙදර ඥාණසීහ නාහිමි ප්‍රධාන ත්‍රෛනිකායික සංඝ සභාව බෞද්ධ තොරතුරු පරීක්ෂක වාර්තාව සෑම පන්සලකටම ගෙන ගොස්, සංඝයාත් – ජනතාවත් දැනුවත් කර අවදි කළහ.

එක්දහස් නවසිය පනස් හයේ ඓතිහාසික දේශපාලන පෙරළිය සිදුවූයේ මේ අන්දමටයි. අවාසනාවකට මෙන්, ඩී.සී. විජයවර්ධන මහතාගේ මැදිහත් වීම නිසා, මාපිටිගම බුද්ධරක්ඛිත හිමියන් ඇතුළු වෙනත් ආත්මාර්ථකාමී අරමුණු තිබුණු ගිහි–පැවිදි අයවලුන් අවසන් මොහොතේ මේ සන්ධානයට එකතුවීම නිසා, එක්දහස් නවසිය පනස් හයේ පෙරළිය උපන්ගෙයිදීම වෙනත් මඟකට යන ලකුණු දක්නට ලැබිණි.

තරුණයෙක් හැටියට මගේ බලාපොරොත්තු කඩ වූයේ මේ අවදියේය. දේශපාලනයෙන් තොර විකල්පීය සමාජ විප්ලවීය ව්‍යාපාරයක් ඇරැඹිය යුතු යැයි මා තීරණය කළේ එක්දහස් නවසිය පනස් හත පනස් අට කාලයේය. සර්වෝදය ශ්‍රමදාන සංසදය එහි ප්‍රතිඵලයයි.

එක්දහස් නවසිය හැටේ දශකයේ මුල් අවුරුදු කිහිපය ශ්‍රී ලාංකික සමාජයේ එක්තරා තීරණාත්මක අවදියක් විය. එක්දහස් නවසිය පනස් හයේ බණ්ඩාරනායක මහතාගේ ප්‍රධානත්වයෙන් සිදුවූ ඓතිහාසික අහිංසාවාදී දේශපාලන විප්ලවය පිළිබඳ බලාපොරොත්තු මහජනයාගේ සිත්වලින් ඈත් වෙමින් තිබුණි. එක්දහස් නවසිය පනස්නවයේ දී අග්‍රාමාත්‍ය බණ්ඩාරනායක මහතා සාහසිකයකු අතින් මිය යෑමත්, ඒ

සාහසිකයා භික්ෂූන් වහන්සේ නමක් අඳින කහපාට වස්ත්‍රයකින් සැරසී සිටි පුද්ගලයෙකු වූ නිසාත්, අපේ මහා සංඝයා කෙරෙහි තිබූ ගෞරවය ලොව පුරා නැති කිරීමට විවිධ බෞද්ධ විරෝධී බලවේග ක්‍රියාත්මක වූහ.

ඡායාරූප: 278
හේන්පිටගෙදර ඤාණසීහ නාහිමි

බුද්ධ ජයන්තියත් සමඟ ඇති වූ බෞද්ධ ප්‍රබෝධය ද ක්‍රමයෙන් අඩු වෙමින් තිබිණි. බෞද්ධ ධර්මයත්, සිංහල සංස්කෘතියත් දෙස මා හැමදාම බැලුවේ විශ්වමය ඇසකිනි. පටු ආගමික ලේබලයක් අටවා ගෙන බෞද්ධ අයිතියක් සඳහා සටන් කිරීම නොව, බෞද්ධ ධර්මානුකූල ජීවිතයකට ලංකාවේ පමණක් නොව, ලොව පුරා සියලුම මිනිසුන් පෙළ ගස්වා හැඩ ගැස්වීම මගේ ස්ථාවරය විය. එමෙන්ම රටේ සමස්ත ජනතාවටම එක සේ පිළිගත හැකි සාමාජික, ආර්ථික සහ දේශපාලන ක්‍රමයක් බෞද්ධ ධර්මය මත පදනම් කොට ගොඩනැගිය හැකි බව මම තරයේ විශ්වාස කළෙමි. මේ නිසා බුද්ධ ශාසනයේ උන්නතියට වැඩ කිරීම වෙනත් කිසිදු ආගමකට පහර දීමක් තුළින් කළ යුතුය යන ප්‍රතිපත්තිය මම ප්‍රතික්ෂේප කළෙමි. එයින් බුද්ධ ශාසනයට වන්නේ හානියක් පමණකි. ඒ අතරම බෞද්ධයාට හෝ බුද්ධ ශාසනයට හෝ විරුද්ධව කෙරෙන සෑම ක්‍රියාවක්ම හෙළා දැකීමටත්, එයට විරුද්ධව කටයුතු කිරීමටත් මම කිසි දිනෙක මැළි නොවුණෙමි.

අනුරාධපුර පූජනීය නගරය මුල් කොට කෙරෙන සංරක්ෂණ කටයුතුවලට මුලු වැර යොදා, සර්වෝදය ශ්‍රමදාන සංසදයේ සහයෝගය ලබා දුන්නෙමි. බෞද්ධ සංස්කෘතියේ අතිශයින්ම වැදගත් ස්ථානයක් වූ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ විල්ගම් විහාරයට සැතැපුම් එකොළහක පාර කපා, විහාරය ප්‍රතිසංස්කරණය කිරීම, තපස්සු භල්ලුක දෙදෙනා විසින් තැන්පත් කළ කේශධාතූන් වහන්සේලා නිසා ඓතිහාසිකව වැදගත් වූ ගිරිහඬු සෑය, සේරුවිල ආදී ස්ථානවල විවිධ අන්දමේ සංරක්ෂණ කටයුතු අරඹා, මහජන අවධානය යොමු කිරීමට හැටේ දශකයේ මුල් භාගයේ අප කළ සේවාවන් අති විශාලය. බලපිටියේ ශාන්ත ස්වාමීන් වහන්සේ, මාදුවේ රතනවංශ තිස්ස ස්වාමීන් වහන්සේ, බලපිටියේ චන්ද්‍රවිමල තිස්ස ස්වාමීන් වහන්සේ ආදී වූ සංඝයා වහන්සේලා ද, එවකට උදව් – පදව් ගත හැකි ත්‍රිකුණාමලයේ බෝට්ටු සේවය අයිති ඒ. එච්. අල්විස් මහතා ඇතුළු බෞද්ධ ප්‍රභූන්ගේ සහයෝගය ඇතිව

මේ කාලයේ කළ වැඩ කොටස අප්‍රමාණය. සමහර විට බුද්ධ ශාසනය රැක ගැනීමට අද මොරහඬ දෙන සමහරුන්ට, එදා අප කළ වැඩ කොටස නො තිබෙන්නට අද උතුරු නැගෙනහිර ගැන කතා කරන්නට දෙයක් ඉතිරි වන්නේ නැත.

ඒ කාලයේ මා පළ කළ "නැගෙනහිර පත්‍රය" සහ "ජන්ම භූමිය" ආදී සඟරාවන් ද, වෙනත් ලිපි තුළින් ද, මහජනයාගේ අවධානය මේ සිද්ධස්ථාන කෙරෙහි යොමු කිරීමට හැකි හැම වෙරක්ම දැරීමි. විද්‍යෝදය පිරිවෙනේ ඉගෙන ගත්, ඈත එපිට පළාත්වල ජීවත් වන සංඝයා වහන්සේලා සිය ගණනකට මේ කාලයේ විවිධ අයගේ ආධාර උපකාර ලබා ගෙන සංඝාවාස සියයකට අධික ව සාදා දුනිමි. යාපනය අර්ධද්වීපයේ පමණක් කුලහීන යැයි කොන් කොට සිටි බෞද්ධ පිරිස් සඳහා පාසල් දහයක් සාදවා, රජයට බාර දුනිමි. මේවාට උදව් කළේ හින්දු නායකයින්ය. ගොඩනැගිලි ඉදිකිරීම බාරව කටයුතු කළේ වෙස්ලි විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙක් වූ වීරතුංග මල්ලීය. යාපනයේ සෑදූ පාසල්වලට නම් තැබීමට යෝජනා කිරීමේදී මහා නායක හිමිපාණන් වහන්සේලාගේ නම් ද, සොමී මීගම මැතිනිය, පී. ද එස්. කුලරත්න මහතා, ඇල්.එච්. මෙත්තානන්ද මහතා, ආනන්ද සේමගේ මහතා ආදීන්ගේ නම් යෝජනා කළේ මා නොව, එවකට යාපනයේ සිටි හින්දු නායකයෝය. පාසල් දෙකක් පමණකි, හින්දු නායකයින්ගේ නමින් නම් කිරීමට ඔවුන් යෝජනා කළේ. මේ සඳහා පෙරමුණ ගෙන ක්‍රියා කළ කෙනෙකි, දෙමළ බෞද්ධ සංගමයේ සභාපති මහතා. පිරිසිදු බුදු දහම අනුව කටයුතු කරන්නට යෑමේදී, වෛරය සහ ඇලීම මත කටයුතු කරනවාට වඩා, මෛත්‍රිය හා පරිත්‍යාගය තුළින් සාර්ථක අරමුණු ඉටු කර ගැනීම වඩා හොඳය.

අද මෙන්ම, එදාත් – සමහර ජාතික බෞද්ධ සංවිධාන ක්‍රියා කළේ මිථ්‍යා දෘෂ්ටියට බර ව පමණක් නොව, තරුණ මා කෙරෙහි ද තද ඊර්ෂ්‍යාවෙනි. ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මහතා එක්දහස් නවසිය හතේ වර්ෂයේ දී, ලංකා ප්‍රතිසංස්කරණ සභාව අමතා කළ කතාවක් මම බොහෝ විට අපේ බෞද්ධ කණ්ඩායම්වලට ඒ කාලයේ දී මතක් කර දුන්නෙමි. එතුමා එදා බ්‍රිතාන්‍යයන්ට ප්‍රකාශ කළේ

"ඔබට ඕනෑ තරම් අපේ ස්වභාව සම්පත් කොල්ලකා ගන්න පුලුවන්. එහෙත් එක් අපරාධයක් කරන්න එපා. එනම්, සිංහල ගැමි සමාජ ව්‍යුහය හා සංස්කෘතියට අත තබන්න එපා. අද සිට අවුරුදු

සීයක් ගිය තැන ලෝකයට වුවමනා කරන සමාජ ක්‍රමය ඇත්තේ සිංහල බෞද්ධ ගම්මාන තුළය."

මේ කතාවේ පිටපත මට පෙන්වූයේ කලක් අප නිවසේ සිටි ආචාර්ය මොට්වානි මහතාය.

මේ ප්‍රකාශය කළේ දෙමළ හින්දු දාර්ශනිකයෙක් විසිනි. එදා සිටි තවත් බොහෝ දෙමළ හින්දු උගතුන්, සිංහල බෞද්ධයා දෙස බැලුවේ මේ ඇසිනි. මට වුවමනා කළේ මේ දාර්ශනික සම්බන්ධය තව තවත් පෝෂණය කිරීමට යි. එහෙත් අපේ සමහර නාමධාරී බෞද්ධ නායකයන් අන් සියලු ම ජාතීන් දෙවැනි තත්ත්වයට පත් කොට, සිංහල බෞද්ධ රාජ්‍යයක් හදා ගෙන එහි සිරස්තලයේ එදා සුද්දන් හිටි තැන ඔවුන් වැජඹීමට කල්පනා කළ නිසා, සිංහල බෞද්ධයා එන්ට එන්ටම පරිහානියට පත් වන්නට විය.

අනගාරික ධර්මපාලතුමාගේ නම සිහි කිරීමට අනගාරික ධර්මපාල යෞවන සමාජයක් පිහිටුවා, මාළිගාකන්දේ අග්‍ර ශ්‍රාවක විහාරස්ථානය මුල් කරගෙන තරුණ තරුණියන් සියයක් ඒ සඳහා යොමු කළෙමි. ඒ.ටී.සී. ජිනදාස මහතා ලවා ධර්මපාල ගීතය ප්‍රබන්ධ කොට, ළමයිනට ඉගැන්වූයෙමි. මේ අන්දමින් හික්කඩුවේ ශ්‍රී සුමංගල, පිණ්ඩපාතික අසරණ සරණ සරණංකර සංඝරාජ නාහිමි, වලිසිංහ හරිස්චන්ද්‍ර මහතා ආදී ජාතික වීරවරයන් ගැන ගීත ලියා ඔවුන් අනුස්මරණය කිරීමේ වැඩසටහන් මේ කාලය තුළ දී සංවිධානය කළෙමි.

සර්වෝදය ශ්‍රමදාන නමින් රටපුරා ශ්‍රමදාන කඳවුරු සංවිධානය කිරීම සහ රටේ ප්‍රබෝධයක් ඇති කිරීමට කටයුතු කරන බව දැනගත් අවංක දේශප්‍රේමී ජන නායකයන් කිහිප දෙනෙක්, මා ගැන විපරම් කරන්නට වූහ. එයින් දෙදෙනෙකි, එල්. එච්. මෙත්තානන්ද මැතිතුමා සහ ටී.යූ. ද සිල්වා මැතිතුමා. දිනක් මේ දෙපොළ මා හමුවීමට මරදානේ දෙල්ගහ යට ගෙදරට පැමිණිය හ. වියට්නාමයේ ඩින් ඩියම් පාලනය යටතේ කෙරෙන බෞද්ධ විනාශය පිළිබඳ කතා කළ එතුමන්, ශ්‍රී ලංකාවේ ද මේ තත්වය ඇති වන බව මට තේරුම් කර දුන්නේ ය. අපි නිදහසේ සාකච්ඡා කොට, එක්තරා වැඩ පිළිවෙලකට බසිමු යැයි යෝජනා කර ගතිමු. ඉතාමත්ම අවංක බෞද්ධ විද්වතෙකු වූ ගුණසීල විතානගේ මහතා ද, ප්‍රේමචන්ද්‍ර සිල්වා මහතා ද, විජයානන්ද ද ආබෘ මහතා ඇතුලු අපි තරුණ කිහිප පළක් බෞද්ධ ජාතික බලවේගයේ පළමු රැස්වීම සංවිධානය කිරීමට යෝජනා කර ගතිමු.

එවකට ඇල්.එච්. මෙත්තානන්ද මහතාගේ සභාපතිත්වයෙන් කොළඹ 3, අංක 161 යන ස්ථානයේ බෞද්ධ ප්‍රචාරක සභාව යන සංවිධානය පිහිටුවා තිබුණේය. එක්දහස් නවසිය හැටදෙකේ නොවැම්බර් හත්වැනි දින දාතමෙන්, සිංහල බෞද්ධ සමාජයේ අනාගතය පිළිබඳ සාකච්ඡා සභාවක්, යන මැයින් පහත සඳහන් ආරාධනා ලිපිය අප කිහිප දෙනෙක් විසින් සකස් කොට, තෝරාගත් සියයක් පමණ වූ අයට ඇල්.එච්. මෙත්තානන්ද මහතාගේ අත්සනින් යවන ලදී.


ඡායාරූප: 279
ඇල්. එච්. මෙත්තානන්ද මහතා

බෞද්ධ ප්‍රචාරක සභාව

1962 නොවැම්බර් 7 වෙනි දින,
කොළඹ 3,
අංක 161 දරණ ස්ථානයේදීය.

පින්වත් මහත්මයාණෙනි,

සිංහල බෞද්ධ සමාජයේ අනාගතය පිළිබඳ සාකච්ඡා සභාවක්

වර්ෂ එක්දහස් නවසිය පනස්හයේ පෙබරවාරි හතර වෙනිදා මහා සංඝයා වහන්සේ වෙත හා බෞද්ධ මහජනයා වෙත යොමු කරන ලද බෞද්ධ තොරතුරු පරීක්ෂණ සභාවේ වාර්තාව නිසා ද, ඒ වර්ෂයේම එළැඹි 2500 බුද්ධ ජයන්ති මහෝත්සවය නිසා ද, අපේ මේ ශ්‍රී ලංකාව පරාධීන වූවායින් පසුව කවරදාකවත් ඇති නොවූ අන්දමේ ඉමහත් බෞද්ධ ප්‍රබෝධයක් ඒ වකවානුවේ දී ඇති වූ බැව් අපි දනිමු. ඒ හේතුව නිසාම, මෙරට සමාජ විප්ලවයක් ද ඇති විය. එහෙත් ඉන් ප්‍රයෝජන ගෙන බලයට පැමිණ, එහිම රැඳී සිටීමට උත්සාහ දරණ බලලෝභීන්ගේ කුහක ක්‍රියා මාර්ගයන් නිසා, කෙමෙන් ඒ බෞද්ධ ප්‍රබෝධය හීන වී ඇති අතර, බෞද්ධ විරෝධීන් අන් කවරදාකට වත් වඩා සමගියෙන් බැඳී, අද බුද්ධ ශාසනයටත් – සිංහල වර්ගයාටත් විරුද්ධව අවි ගෙන සිටිති. එක් අතකින් කතෝලික ආක්‍රමණය ද, අනික් අතින් ෆෙඩරල් ව්‍යාපාරය ද, සංවිධානය වී සෑම තැනකම බෞද්ධ අයිතියට පහර දෙන තත්වයක් අද උද්ගත වී ඇත. බෞද්ධ මහ

ජනතාවට සේවයක් කිරීමට වඩා ආත්මාර්ථකාමිත්වය තකන අපේ ඇතැම් ඊනියා බෞද්ධ නායකයින්ගේ අනුබලය ද ඔවුනට ලැබේ. මේ තත්වය යටතේ රජයේ ආයතනවලද, පුද්ගලික ආයතනවල ද, වෙනත් සෑම තැන්වලම බෞද්ධයින් කොන් කිරීමේ සහ ඔවුනට වෙනස්කම් කිරීමේ දරුණු වැඩ පිළිවෙලක් අද ක්‍රියාත්මක වී ගෙන යයි. මීට මුහුණ දීමට අවස්ථාව එළඹ තිබේ. මෙහිලා මූලික පියවරක් වශයෙන් පක්ෂ දේශපාලනය සහ අන් එවැනි මතභේද අබිබවා කටයුතු කළ හැකි, සිංහල බෞද්ධ බලවේගයක් ඇති කිරීමේ අරමුණින් බෞද්ධ ප්‍රචාරක සභාවේ මෙහෙයීමෙන් සාකච්ඡා සභාවක් කැඳවීමට අපි අදහස් කළෙමු. එම සභාව, එක්දහස් නමසිය හැට දෙකේ නොවැම්බර් විසි වැනි අඟහරුවාදා සවස පහට කොළඹ 7, බුලර්ස් පාරේ, අංක 400 දරණ තැන පිහිටි සමස්ත ලංකා බෞද්ධ කාන්තා සංගමයේ සභා ශාලාවේ දී පැවැත්වෙනු ඇත.

ඊට සහභාගි වන ලෙස බෞද්ධ කටයුතු ගැන උනන්දුවක් දක්වන ඔබතුමාගෙන් ද ශාසනාලයෙන් ඉල්ලා සිටිමි.

මීට,

අවංක

(ඇල්.එච්. මෙත්තානන්ද)

සභාපති.

එවකට සමස්ත ලංකා බෞද්ධ කාන්තා සංගමයේ සභාපතිනිය වී සිටි සොමී මීගම මැතිනියගෙන්, ඔවුන්ගේ සමිති ශාලාව අපේ පළමු රැස්වීම පැවැත්වීමට ලබා ගතිමු. දවස කර්තෘ ඩී. බී. ධනපාල මහතා, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු ඩී. පී. ජයසේකර මහතා, මහාචාර්ය කේ. ජයසූරිය මහතා, ආනන්ද සේමගේ මහතා, ආයුර්වේද කොමසාරිස් ඩබ්ලිව්.ජේ. ප්‍රනාන්දු මහතා, ඒ. එන්. එස්. කුලසිංහ මහතා සහ මැතිනිය ආදී බෞද්ධ නායකයින් රැසක්ම මේ සඳහා පෞද්ගලිකව හමුවී ආරාධනා කළෙමු.

මේ අතර අනුරාධපුර දිසාපති ව සිටි නිශ්ශංක විජේරත්න මහතා හිටිහැටියේ මට ටෙලිෆෝන් කළේය. එතුමා රාජ්‍ය සේවා කොමිසන් සභාවේ ලේකම් හැටියට පත්ව ආ බව දන්වා, වහාම මා හමුවීමට අවශ්‍ය බව කීවේය. එවේලේම අපේ දෙල්ගහ යට ගෙදරට පැමිණෙන ලෙස මම ඇරියුම් කළෙමි. එතුමා ප්‍රකාශ කළේ, සිංහල බෞද්ධයාට – කතෝලික ආක්‍රමණය විසින් කරන මේ පහරවල් තවදුරටත් ඉවසා ගත නොහැකි බවත්, අපේ පැරණි බෞද්ධ පත–පොත එකතු කොට, බටහිර මුහුදු

වෙරළේ පුලුස්සා දමන බවත්, මේ නිසා "පිස්සුවෙන්" මෙන් බෞද්ධ පුනර්ජීවයකට ජීවිතය කැප කිරීමට කැමති බවත්, එතුමා එක දිගටම කියාගෙන ගියේය. ඒ කාලයේ ලෝවැඩ සඟරාවත්, ලෝකෝපකාරයත්, සුභාෂිතයත්, ගුත්තිලයත්, මුවදෙව්දාවතත්, සද්ධර්ම රත්නාවලියත්, පූජාවලියත් ආදී වූ අප කට පාඩමින් ඉගෙන ගත් පැරැණි බෞද්ධ පොත්පත්, පී. කේ. ඩබ්ලිව්. සිරිවර්ධන, සමයවර්ධන පොත් සාප්පුව ආදී වූ තැන්වලින් පවා සොයා ගැනීමට අපහසු විය. ඒවා සියල්ල යම් පිරිසක් විසින් මිලට ගෙන විනාශ කර දමන බව ආරංචි විය.

ඉතාමත් ම උපේක්ෂාවෙන් යුතුව ආගම් භේදයකට හැරෙන්නේ නැති විදියට, බෞද්ධ ප්‍රබෝධය ඇති වන ආකාරය මම එතුමාට තේරුම් කර දුනිමි. හැරත්, මම දිවි කැපකොට තිබෙන සර්වෝදය ව්‍යාපාරය කිසිම ජාතියකට, ආගමකට, වර්ගයකට කොටු කර නැති නිසාත්, එය පිරිසිදු බුද්ධ ධර්මය මත පමණක් සකස් වී ඇති නිසාත්, ඒ සම්බන්ධව ඕනෑම කටයුත්තක් සඳහා එම ප්‍රතිපත්තිවලට එකඟ නම්, මා එකතු වන බවට මම ප්‍රකාශ කළෙමි. නිශ්ශංක විජේරත්න මහතාගේ ඉල්ලීම අනුව එල්.එච්. මෙත්තානන්ද මහතා එතුමාට හඳුන්වා දීමට අපි එවේලේම එතුමාගේ නිවසට ගියෙමු. ඉන්පසු නිශ්ශංක විජේරත්න මහතාගේම යෝජනාව අනුව, අපි දෙදෙනාම රොනී ද මැල් මහතා හමුවීමට ගියෙමු. ඔහු ද බෞද්ධ ජාතික බලවේගයට එකතුවීමට එකඟ විය. පළමු රැස්වීමට මේ දෙදෙනාම පැමිණියහ. නිලධාරීන් තෝරා ගැනීමේ දී, මට මතක හැටියට ඔවුන්ගේ නම් යෝජනා කළේ මාය.

ඉතාමත් ම අවංක ඇසූ–පිරූ තැන් ඇති බුද්ධිමතෙකු වූ ගුණසීල විතානගේ මහතා අපේ ප්‍රධාන ලේකම් විය. සභාපති හැටියට තෝරා ගත්තේ ඇල්.එච්. මෙත්තානන්ද මහතාය. උප සභාපති හැටියට නිශ්ශංක විජේරත්න මහතා ඇතුලු කිහිප දෙනෙක් ද භාණ්ඩාගාරික හැටියට රොනී ද මැල් මහතා ද තෝරා ගත් අතර මම කිසිම නිලයක් නොගෙන කොමිටියේ පමණක් වැඩ කිරීමට බාර ගතිමි.

බෞද්ධ ජාතික බලවේගය පිහිටුවීමටත් ඉතා කෙටි කලකින් ජනප්‍රියවීමටත් හේතු වූ තවත් සිද්ධියක් සඳහන් කළ යුතුය.

එක්දහස් නමසිය හැටදෙකේ ජනවාරි මස අවසානයේ දී රටේ බලය අල්ලා ගැනීමට කුමන්ත්‍රණයක් කෙරුණේ ය. මෙහි නායකත්වය ගෙන තිබුණේ කර්නල් එෆ්.සී. ද සේරම්, රොයිස් ද මැල්, නියෝජ්‍ය පොලිස්පති සී.සී. දිසානායක, සිඩ්නි ද සොයිසා යන මහත්වරු ප්‍රධාන

යුද හමුදාවේ, නාවික හමුදාවේ හා පොලීසියේ සමහර ප්‍රධානීන්ය. මොවුහු සියල්ලෝ ම වාගේ අබෞද්ධයන් වූ අතර, අගමැති සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රධානත්වයෙන් පැවැති බෞද්ධයාට පක්ෂපාතී වූ රජයක් පෙරළා දැමීමට ගත් ප්‍රයත්නයක් හැටියට මෙය මහජනයා දුටුවෝය. ඇත්ත වශයෙන්ම, එක්දහස් නවසිය පනස් හයෙන් පසු සිදුවූ පොදු මහජන ප්‍රබෝධය නිසා සිදුවෙමින් තිබුණු සමාජ පරිවර්තනය – වරප්‍රසාද ලත් පන්තිවල සිටි අයට අවබෝධ කර ගැනීමට නුපුලුවන් වූ නිසා, ප්‍රජාතන්ත්‍ර විරෝධී මගකින් නැවත එක්දහස් නවසිය පනස් හයට පෙර තත්වයට රට පත් කිරීම ඔවුන්ගේ අභිලාෂය වූවාට සැකයක් නැත. සිංහල භාෂාවෙන්, රාජ්‍ය පරිපාලනය කිරීම, විද්‍යාව ස්වභාෂාවලින් ඉගැන්වීම, පෞද්ගලික පාසල් රජයට පවරා ගැනීම වැනි මූලික ව්‍යුහමය වෙනස්කම් රැසක් මේ යුගයේ දී සිදුවෙමින් තිබුණේ ය. මේවා මෙතෙක් වරප්‍රසාද භුක්ති විඳි පන්තිය අවඥාවෙන් බැලූ වෙනස්කම් වූහ. වාමාංශික නායකයින් ද මේ රජයේ සිටීම ඔවුහු නොරිස්සූහ.

කොළඹ පොලිස් අධිකාරීවරයාව සිටි ස්ටැන්ලි සේනානායක මහතා, තම භාර්යාව වූ මායා සේනානායක මැතිනිය මගින් තම මාමණ්ඩිය වන පී. ද ඇස් කුලරත්න මහතා කැඳවා මේ බව දැන්වූ නිසා, එතුමා වහාම පොලිස්පති එම්. ඩබ්ලිව්. එෆ්. අබේකෝන් මහතාට දැන්වීමෙන් පලක් නොවූයෙන් , අගමැතිනි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට මේ භයානක තත්වය ගැන දැන්වීමට සැලැස්වීය. ඉතා දක්ෂ ඇමතිවරයකු වූ ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මැතිතුමා වහාම ක්‍රියාත්මක වී, පොලිස්පති අබේකෝන් මහතා කැඳවා රහස් පොලීසිය බාරව සිටි කුමන්ත්‍රණකරුවකුගේම සොහොයුරෙකු වූ, එහෙත් මේ ගැන කිසිත් නොදැන සිටි එස්. ඒ. දිසානායක මහතා ලවා පරීක්ෂණ ආරම්භ කොට, මෙයට සම්බන්ධ විසි නමයක් පමණ වූ සියලුම දෙනා සිරභාරයට ගෙන නීතිය ඉදිරියට පැමිණ වූහ. විශේෂ අධිකරණයක තීන්දුවකින් මොවුහු වරද කරුවන් වී සිර දඬුවම්වලට යටත් වූහ. එහෙත් වරද කළාට පසු සම්මත කරගත්

ඡායාරූප: 280
පොලිස්පති ස්ටැන්ලි සේනානායක මහතා

නීති හේතුවෙන්, වරදකරුවන් වී දඬුවම් පැමිණවීම වූ ආදී හේතුවෙන්, මාස කිහිපයකට පසු ඔවුන් ප්‍රිවි කවුන්සලය මගින් නිදහස් කරන ලදහ.

මේ කුමන්ත්‍රණය ව්‍යර්ථ කිරීමට ජීවිතය පරදුවට තබා ක්‍රියා කළේ, කොළඹ පොලිස් අධිකාරී ව සිටි ස්ටැන්ලි සේනානායක මහතාය. කිතුල්ගල දී උපත ලත් එතුමාගේ සම්පූර්ණ නම දොන් ස්ටැන්ලි අර්නස්ට් පෙරේරා රාජපක්ෂ සේනානායකය. එක්දහස් නවසිය දාහතේ දී උපත ලත් එතුමා සහකාර පොලිස් අධිකාරීවරයෙක් හැටියට සේවයට බැඳුණේ, එක්දහස් නවසිය හතළිස්තුනේදීය. එතුමා මා මුලින්ම හඳුනා ගත්තේ පොලිස් අභ්‍යාස විදුහලේ අධ්‍යක්ෂ වශයෙන් සේවය කළ එක්දහස් නමසිය හැටේ සිට හැටඑකේ පමණ කාලයේ දීය.

පී. ද ඇස්. කුලරත්න මැතිතුමාගේ දියණිය වූ මායා සේනානායක මැතිනිය ස්වභාෂා ප්‍රකාශකයෝ මුද්‍රණාලයේ අධ්‍යක්ෂවරිය වූවාය. පසුව මේ මුද්‍රණාලය හැඳින්වූයේ පී. ද ඇස්. කුලරත්න සමාගම යන නමිනි. සර්වෝදයේ මුල්ම ප්‍රකාශන, සර්වෝදය පත්‍රය, නැගෙනහිර පත්‍රය ආදිය පළ කළේ මේ මුද්‍රණාලයේය. දිනපතාම මෙහි ගිය මායා සේනානායක මැතිනිය පමණක් නොව, ස්ටැන්ලි සේනානායක මහතා ද, සන්ජීව, සාලිය, අතුල හා මිලින්ද යන පුතාලා හතර දෙනා ද හොඳින් දැන සිටියෙමි. අපේ දෙල්ගහයට ගෙදරට නිතරම ස්ටැන්ලි සේනානායක මහතා ඒ දිනවල පැමිණියේය. මම ද පොලිස් අභ්‍යාස විද්‍යාලයේ දේශනවලට මෙන්ම, කොළඹට මාරු වූවාට පසු පොලිස් මූලස්ථානයේ දේශනවලටද එතුමාගේ ඇරයුම් මෙන් සහභාගි වූයෙමි. මේ නිසා ස්ටැන්ලි සේනානායක මහතා මා ඉතා ළඟින් ඇසුරු කළ පුද්ගලයෙකි.

ඡායාරූප: 281
මායා සේනානායක මැතිනිය සමග

කුමන්ත්‍රණය ව්‍යර්ථ කිරීමට මුල් වූ සේනානායක මහතා පඩි පිට වූවත් නිවාඩු යැවීමෙන්, එතුමාට ජ්‍යෙෂ්ඨත්වයෙන් හිමි වන්නට තිබූ පොලිස්පති පදවිය ලැබීම වැළැක්වීමට වෙනත් ආත්ම කේන්ද්‍රිය

නිලධාරීහු සමත් වූහ. එක්දහස් නවසිය හැටදෙකේ සිට එක්දහස් නවසිය හැට අට දක්වා වූ කාලය තුළදී සතියේ දිනවල හැමදාම වාගේ පස්වරුවේ එතුමා අපේ නිවසට පැමිණ පොත් කියෙව්වේ ය. කවදා හෝ සත්‍යය ජය ගන්නා බවත්, එතුමාට හිමි තැන ලැබෙන බවත් පවසමින් නිතරම මම එතුමා ධෛර්යමත් කළෙමි.

ඡායාරූප: 282
බද්දේගම විමලවංස නාහිමියෝ

එක්දහස් නවසිය හැත්තෑවේ දී එතුමාට පොලිස්පති පදවිය ලැබී, කාර්යාලයට ගොස් – මුලින්ම දුරකතන – යෙන් කතා කරන විට මට ඇතිවූ සතුට නිම්හිම් නැත.

රට පුරාම බෞද්ධ ජාතික බලවේගයේ රැස්වීම් සංවිධානය කළෙමු. එදා සිටි අග්‍රගණ්‍යයේ සංඝයා වහන්සේලා දේශන සඳහා ඉදිරිපත් වූහ. මහාචාර්ය කේ.එන්. ජයතිලක, කේ.එච්.එම්. සුමතිපාල මහතා වැනි විද්වත්හු ද එකතු වූහ. සුමතිපාල මහතාගේ දේශනවල වියට්නාමයේ සිදුවුනු ඝාතන ගැන විශේෂයෙන් සඳහන් වූ නිසා, මිනිසුන්ගේ ලේ උණුවන තරම් ආවේගාත්මක විය. පූජ්‍ය කලුකොඳයාවේ පඤ්ඤාශේඛර නාහිමි, පූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ නාහිමි, පූජ්‍ය දැවමොට්ටාවේ අමරවංස නාහිමි, පූජ්‍ය බද්දේගම විමලවංශ නාහිමි ආදී හිමිපාණන් වහන්සේලා ද කථිකයන් අතර වූහ. මෙත්තානන්ද මහතා මේ හැම තැනකදීම පළමු දේශනය බාරදී තිබුණේ මටය. හේතුව, මෙයට අහිංසාවාදී පදනමක් දැමීමටත්, වෙනත් ආගමික ශාස්තෘවරයන් වහන්සේලාට අපහාස කිරීම වැළැක්වීමටත්ය. බෞද්ධ ජාතික බලවේගය විසින් කතෝලික ආක්‍රමණය පිළිබඳ කරුණු එකතු කොට පොතක් පළ කළේය. මේ සමඟම පුවත්පත් කොමිසමක් ද බණ්ඩාරනායක මැතිනියගේ රජය විසින් පිහිටුවන ලදී. එය අපි පාවිච්චි කළේ බෞද්ධ විරෝධී කටයුතු ඉස්මතු කිරීමටත්, සදාචාර විරෝධී ජාතිද්‍රෝහී ක්‍රියාවන් හෙළා දැකීමටත්ය. මෙහි සභාපති වූයේ විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු කේ.ඩී. ද සිල්වා මහතාය.

බෞද්ධ ජාතික බලවේගය පැවැත් වූ රැස්වීම් එකක දී හැර (මා අසනීප වී රෝහල් ගතවී සිටි කාලය තුළ) අන් හැම රැස්වීමකදීම මම කතා කළෙමි.

මේ රැස්වීම් සඳහා මෙත්තානන්ද මහතා, ටී.යූ. ද සිල්වා ආදීන් ගෙන යෑමට බොහෝ විට පාවිච්චි කළේ ඩබ්ලිව්.ජේ. ප්‍රනාන්දු මහතාගේ බෙන්ස් රථයයි. සමහර විට ඩී. පී. ජයසේකර මහතාගේ වාහනය ද, කරුණානන්ද මහතාගේ හා ඒ.එන්.එස්. කුලසිංහ මහතාගේ වාහන ද අපි පාවිච්චි කළෙමු. බොහෝ විට රියැදුරා වූයේ මමයි. වෙළඳ ව්‍යාපාරිකයකු වූ ධර්මසේන වීරරත්න මහතා ද බෞද්ධ ජාතික බලවේගයට එකතු වී විශාල වශයෙන් මහන්සි විය. ත්‍රිකුණාමලය, පොළොන්නරුව, මැදවච්චිය ආදී නගරවල මෙන්ම – බදුල්ල, මහනුවර, රත්නපුරය, කලුතර, බේරුවල, ගාල්ල, මාතර ආදී නගරවල ද මහා පෙරහැරවලින් පැමිණි මහජනතා දහස් ගණනින් මේ රැස්වීම්වලට සහභාගි වූහ. මේ යුගයේ දී එක්දහස් නමසිය පනස් හයෙන් පසු විශාලම බෞද්ධ ප්‍රබෝධයක් ඇති වූ බව කිව යුතු ය.



ඡායාරූප: 283
ආචාර්ය ඒ. එන්. එස්. කුලසිංහ

සමහර අවස්ථාවලදී ශ්‍රීමත් කන්දයියා වෛද්‍යනාදන් වැනි හින්දු නායකයෝ ද මේ රැස්වීම්වලට පැමිණ, මෙත්තානන්ද මහතා සමඟ එකම වේදිකාවේ වාඩිවී සිටියහ. ආනන්ද විදුහල ඉදිරිපිට දී පැවැත්වූ මුලු මරදානම පිරී සෙනඟ සිටි රැස්වීමට ද, මෙතුමන්ලා සහභාගි වූහ. ඒ.එන්.එස්. කුලසිංහ මහතාගේ හා පුංචිහේවා මහතාගේ සංවිධානයෙන් වරාය බෞද්ධ බල මණ්ඩලයේ දහස් ගණන් අය මේ රැස්වීමට පැමිණියහ. තිරුකෝණේෂ්වරම් වැනි ප්‍රදේශවල හින්දූන් – කතෝලික ආගමට හැරවීමේ ක්‍රියාවලට විරුද්ධව හින්දු නායකයෝ, බෞද්ධයන් සමඟ අත්වැල් බැඳ ගත්හ.



ඡායාරූප: 284
විජයානන්ද ආබෲ මහතා

එතුමන්ලා පිළිගත්තත්, නැතත්, නිශ්ශංක විජේරත්න මහතා සහ රොනී ද මැල් මහතා ජාතික නායකයින් හැටියට කලඑළි බැස්සේ මේ යුගයේදීය. ඇත්ත වශයෙන්, සියලු ම පර්යේෂණ කටයුතු සහ ලියකියවිලි ආදිය

බෞද්ධ ජාතික බලවේගය වෙනුවෙන් දිවා රෑ මහන්සි වී සකස් කළේ ගුණසීල විතානගේ මහතාය. ප්‍රේමචන්ද්‍ර සිල්වා, සී. එච්. පෙරේරා සහ විජයානන්ද ද ආබෲ වැනි මහත්වරු ද බෞද්ධ ප්‍රබෝධය සඳහා පුදුම වෙහෙසක් දැරූහ.

අප ඉදිරියේ තබාගෙන තිබූ ඉතා උසස් අරමුණු පසෙකට දමා, පසු කාලයේ බෞද්ධ ජාතික බලවේගයට ඇතුලු වූ දෙතුන් දෙනෙක් මෙය දේශපාලනයට නැඹුරු කර ගත්හ. මම මෙත්තානන්ද මහතාට කියා බෞද්ධ ජාතික බලවේගයෙන් ඈත්ව, සර්වෝදය කටයුතුවලට නැවත මගේ සම්පූර්ණ කාලය යොමු කළෙමි. කාලයාගේ ඇවෑමෙන් බෞද්ධ ජාතික බලවේගය අක්‍රිය විය. එහෙත් ඒ නිසා ඒ යුගයේ විශාල බෞද්ධ පිබිදීමක් ඇති වූ බව කිව යුතුය.

ඡායාරූපː 285
ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු මහතා

අපේ ජාතික කොඩියට මහජනයාට පිළිගත හැකි අර්ථ කථනයක් දීමට මේ දිනවල මම මහන්සි වුනෙමි. ධර්මද්වීප, ධාන්‍යාගාර අරමුණ පිළිබිඹු වන සේ කහ පාට හා රතු පාට වර්ණ කොඩියේ පිළිබිඹු විය. බෝ කොළ හතරෙන් මිනිසාගේ පූර්ණ පෞරුෂෝදය පිළිබිඹු වන සතර බ්‍රහ්ම විහරණය ද, සමාජයේ ප්‍රගතිය පිළිබිඹු වන සතර සංග්‍රහ වස්තුවද සංකේතවත් කෙරේ. බිම පතිත වී තිබෙන සිංහයාගේ ත්‍රිපාද අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය ද, සිංහයාගේ දකුණු අතේ තිබෙන කඩුව දසරාජ ධර්මය ද පිළිබිඹු කෙරිණි. සිංහයාගෙන් සංකේතවත් වූයේ ජාතියකට අවශ්‍ය වූ ආත්ම දමනය, ආත්ම විශ්වාසය, නිර්භීතකම, ස්වයංපෝෂණය, නොපනත්කම් නො කිරීම යන පංච විධ ගුණ ධර්මයන් ය. අපේ සිංහ කොඩිය දෙස මේ අර්ථ කථනයෙන් යුතුව බැලීමට මම ජනතාවට කරුණු ගෙන හැර පෑවෙමි.

පසු කලෙක හැව්ලොක් ගොල්ෆ් පිටියේ වාඩි වී උපාලි සේනානායක මහතාට ජාතික කොඩියේ මෙම අර්ථ කථනය තේරුම් කර දුනිමි. එතුමා මෙය කට පාඩම් කර ගත්තා පමණක් නොව, භික්ෂූන් වහන්සේ නමකගේ මාර්ගයෙන් කොඩියේ සිංහයාගේ සෑම කොටසකටම බෞද්ධ දර්ශනය අලළා තේරුම් කරගෙන, ඔහුට මුණ ගැසුණු සෑම දෙනාටම මන්ත්‍රයක් මෙන් එය මතුරන්නට විය. යමෙකුට උපාලි සේනානායක මහතාගේ ජාත්‍යාලය මණින්නට උවමනා නම් ඔහුට කළ යුතුව

තිබුණේ මේ ජාතික කොඩිය ගැන ප්‍රශ්නයක් ඇසීම පමණකි. ඔහු පැය ගණන් එය තේරුම් කරයි. ඒ අනුව අපේ රට නැවත ගොඩනැගිය හැකි මාර්ගය ඔහු පෙන්වා දෙයි. සර්වෝදයෙන් එය කරන හැටි විස්තර කරයි. ඔහු කලක් සර්වෝදයේ උප සභාපතිවරයෙක් ද විය.

ඇල්. එච්. මෙත්තානන්ද මහතා මා ළඟින් ඇසුරු කළ බෞද්ධ නායකයින් අතර මුල් තැන ගනී. මා එතුමා මුලින්ම දුටුවේ මහින්ද විද්‍යාලයේ විවාද කණ්ඩායමේ සාමාජිකයකු ලෙස – එක්දහස් නවසිය පනස්එකේ දී – ආනන්ද විද්‍යාලයට පැමිණි අවස්ථාවේදීය. ඒ කාලයේ සම්ප්‍රදාය වූයේ ආනන්ද – මහින්ද ක්‍රිකට් තරඟයට පෙර දින සවස පාසල් දෙකේ විවාද කණ්ඩායම් අතර විවාදයක් පැවැත්වීමය. මා එදා විවාදයේ දී කළ කතාවට පැහැදුණු මෙත්තානන්ද මහතා, විශේෂයෙන් මගේ කතාව අගය කරමින් කතා කළේය. නාලන්දාවේ ආචාර්ය මණ්ඩලයට බැඳීමෙන් පසුව ඉතාමත්ම කිට්ටුවෙන් මම එතුමා ආශ්‍රය කළෙමි.

මෙත්තානන්ද මහතා නිහතමානී, නිර්භීත, ප්‍රතිපත්ති ගරුක, සරල ජීවිතයක් ගත කළ, කිසිවෙකුට වෛර නො කළ ආදර්ශමත් ජාතික නායකයෙකි. ඔහුට විවිධ රජයන් විසින් පිළිගැන්වීමට තැත් කළ ඇමතිකම්, තානාපතිකම් ආදී උසස් තනතුරු එතුමා ප්‍රතික්ෂේප කළේ ය. ආර්ථික ව ඉතා අමාරුවෙන් ජීවත් වූවත්, පෞද්ගලික වාසිය සඳහා යුක්තියට මිස – ශක්තියට අබමල් රේණුවකවත් තැකීමක් නො කළේය. තරුණ මා, එතුමාගේ ජීවිතයෙන් බොහෝ පාඩම් ඉගෙන ගතිමි. එක්දහස් අටසිය අසූහතරේ මාර්තු දහනමවෙනි දා උපත ලත් මෙත්තානන්ද මහතා, එක්දහස් නවසිය හැටහතේ නොවැම්බර් පළමුවැනි දා පරලෝ සැපත් විය. මේ ශ්‍රේෂ්ඨ ජාතික වීරවරයාගේ අවසාන කටයුතු සඳහා එවකට අපට තිබූ ශක්ති ප්‍රමාණයෙන් අපි සහභාගි වීමු.

බෞද්ධ ජාතික බලවේගය පිළිබඳ ලියූ මේ පරිච්ඡේදය අවසන් කිරීමට පෙර, පොදුවේ අප සියලු දෙනා ම අතින් වූ අඩුවක් මෙහි ලියා තැබිය යුතුය. එනම්, සිංහල බෞද්ධයා අප ජීවත් වූ සමාජ, ආර්ථික දේශපාලන පරිසරය තුළ අපේ අයිතිවාසිකම් සඳහා විවිධ ක්‍රියා මාර්ග ගත් අතර, සැබෑ ජාතික සමගියක් සහ ජාතික ප්‍රබෝධයක් ඇති කිරීමට, අසිංහල – අබෞද්ධ පිරිස්වල පූර්ණ සහභාගිත්වය ලබා ගැනීම පිළිබඳව අපි එතරම් අවධානයක් යොමු නො කෙළෙමු. ද්‍රවිඩ හින්දු ජනතාව ද, සිංහල බෞද්ධයන් මෙන්ම විවිධ දුෂ්කරතාවලින්



ඡායාරූප: 286
1961 සර්වෝදය වාර්ෂික සම්මේලනය පන්නිපිටියේ ධර්මපාල විද්‍යාලයේ දී පැවති අවස්ථාවේ විල්මට් ඒ. පෙරේරා මහතා සම්මේලනය අමතා කතා කරයි. රොනී ද මැල් මහතා සහ මම (බිම වාඩි වී)

පෙලුණහ. ඔවුන් ගෙන් කොටසක් විදේශ ආධිපත්‍යය යටතේ රාජ්‍ය සේවයේ ඉහලම තැන් ලබා ගැනීම ආදී වූ වරප්‍රසාද භුක්ති වින්ද බව සැබෑය. එහෙත් පොදුවේ දුප්පත් සිංහල බෞද්ධ ජනතාව පෙලුණු දුෂ්කරතාවලින් හින්දු, ක්‍රිස්තියානි, මුස්ලිම් ආදී ජනතාව ද පෙලුණහ. මේ නිසා සිංහල බෞද්ධයිනට විදේශිකයන් කළ අසාධාරණකම් හදා ගන්නා අතර, පොදුවේ සමස්ත ජනතාවටම සාධාරණත්වය සැලසෙන ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කිරීමේ වගකීම බහුතරය විසින් පිළිගනු ලැබිය යුතුව තිබිණි. මේ අවශ්‍යතාව ද මීළඟ පරිච්ඡේදයේ එන, බොදු පුබුදුවට මහක්, යන නිබන්ධනය සකස් කිරීමේ දී මගේ හිතේ වැඩ කළේය. පසුව සර්වෝදය දර්ශනය වශයෙන් ගොඩනහා, සියල්ලන්ටම පිළිගත හැකි සිතිවිලි රටාවක් සමාජයට ඉදිරිපත් කළෙමි. එය මේ වෙලුමේ 98 වන පරිච්ඡේදයෙන් විස්තර කර ඇත.

ආනන්ද විදුහලේ ආචාර්යවරයකු වූ ගරු ආචාර්ය කොටගම වාචිස්සර හිමි, ගරු බඹරන්දේ සිරි සීවලී හිමි, ගරු නාත්තන්ඩියේ පඤ්ඤාකර හිමි, ගරු ගණේගම සරණංකර නාහිමි, ගරු කිරිවත්තුඩුවේ ප්‍රඥාශේඛර නාහිමි, ගරු තල්පාවිල ශීලවංශ නාහිමි, ගරු ආචාර්ය වල්පොල රාහුල හිමි ආදී වූ බහුශ්‍රැත භික්ෂූන් වහන්සේලා ආශ්‍රය කිරීමෙන් හා උන් වහන්සේලා ගේ පොත් පත් කියවීමෙන් මගේ දැනීම පෝෂණය කර ගැනීමට ඒ යුගයේ මගේ කාලයෙහි සෑහෙන කොටසක් යෙදවීමි.

68

බොදු පුබුදුවට මහක්



ජායාරූප: 287
අනගාරික ධර්මපාලතුමා

එක්දහස් නවසිය හැටතුනේ ධර්මපාල දිනයේ දී, 'බොදුනුවන් පුබුදු කරන බෞද්ධ ජාතික බලවේගය' යන මැයින් පොත් පිංචක් සිංහලෙන් හා ඉංගිරිසියෙන් ලියා, සීමාසහිත ස්වභාෂා ප්‍රකාශකයෝ සමාග මෙන් පළ කළෙමි. මේ පොත අනගාරික ධර්මපාල නාමයට මා පිරිනැමුවේ පහත සඳහන් වදන්වලිනි.

'නිදා සිටි ජාතියක් අවදි කළ – බෞද්ධයා යා යුතු මග හෙළි කළ අනගාරික ධර්මපාලතුමන් ගේ විරෝදාර නාමයට මේ පොත පිරි නමන ලදී. එදා ආගම් පිස්සකු ලෙස සමහරුනට පෙනුණ එතුමා, අද අවිවාදයෙන් පිළිගැනුණ ජාතික වීරවරයෙකි. එතුමාගේ අඩි පාරේ අපිදු යමු.'

අදට දශක හතරකට පමණ උඩදී මා විසින් ලියූ ඒ පොත් පිංචට සම්පූර්ණයෙන්ම මේ පරිච්ඡේදය කැප කරන්නේ බාල පරපුරට ආදර්ශයක් වශයෙනි.

අනගාරික ධර්මපාල සහ වලිසිංහ හරිස්චන්ද්‍ර තුමන්ගෙන් පණ පෙවුන වර්තමාන ජාතික බෞද්ධ පුනර්ජීව ව්‍යාපාරය නිසා, ලංකාවාසී අපි අවදි වී සිටියෙමු. එතුමන් මුදා හළ බල වේගයන්ට නියම අරමුණු සහ මග පෙන්වීම් ලැබී බෞද්ධ දර්ශනයෙන් ආලෝකවත් වූ, බෞද්ධ සංස්කෘතියෙන් අලංකාර වූ නිවහල් ලාංකික මනුෂ්‍ය සමාජයක් බිහිවෙන

පෙර නිමිති එදා අපට පෙනෙන්නට විය. එහෙත් දේශපාලන පරාධීනත්වයෙන් මිදුනු දවසේ සිටම, ගතවුන වසරක් පාසාම අපට ඒත්තු ගියේ අපේ ඒ උත්කෘෂ්ට බලාපොරොත්තු ව්‍යාජ සිහින බවට පෙරළී යන බවත්, ඒ වෙනුවට අපේ මව්බිමේ කිසිම අරමුණක් නැති ජාතියක් සහ හැමතින්ම කෙළෙසුණු සමාජයක් බිහිවන බවත්ය. අපි නැවතත් නිදිබර වීමු. මෙසේ බලාපොරොත්තු සුන් වී නිදි කිරන සමයක, බෞද්ධ ජාතික බලවේගය බිහිවීමෙන් අපේ හදවත් තුළ ඇති වූයේ සැනසුම් සහගත හැඟීමකි. අප ජීවත්වන සමාජය – යුක්තිය, සාධාරණත්වය සහ ප්‍රගතිය ඔස්සේ මෙහෙයවීම සඳහා අවශ්‍ය වූ ස්ව ශක්තිය ජනිත කළ හැකි ඒ බලවේගය කල් ගත වී නමුත්, අප අතර එළිය දුටු හැටිත්, එය ඉතා කෙටි කාලයක දී විශාල මහජන ප්‍රබෝධයකට පාත්‍ර වී වැඩෙන හැටිත් පෙනෙන විට, සෑම දේශමාමක හදවතක්ම නැවතත් අමුතු වේගයකින් ගැහෙන්නට පටන් ගෙන තිබෙන බව නොරහසකි.

මාර්ග සංඥා තුනක්

බෞද්ධ ජාතික බලවේගය තෝරා ගන්නා අභිප්‍රාය, එය සැබෑ කර ගැනීමට ඉවහල් කර ගන්නා මාර්ගය සහ ක්‍රියාත්මක සැකැස්ම මත එහි සාර්ථක හෝ අසාර්ථක භාවය රඳෙන බව මගේ දැඩි විශ්වාසයයි. මෙම සංඥා තුන නිතරම පෙරමුණෙහි තබා ගැනීමේ වැදගත්කම වටහා ගැනීම ව්‍යාපාරයේ සාර්ථක භාවය ස්ථිර කරයි. සංවිධානය කෙතරම් කාර්යක්ෂම වුවත්, එහි සාමාජිකයින් හා මහජනයා තුළ කොතරම් උනන්දුවක් හා උද්‍යෝගයක් දිස් වුවත්, මෙම බලවේගය පැහැදිලි අරමුණක්, අගනා පාරිශුද්ධතාවක් සහ බුද්ධිමත් ක්‍රියා පිළිවෙළක් නොපිළිගතහොත්, එයට දීර්ඝ අනාගතයක් බලාපොරොත්තු විය නොහැක. බෞද්ධ ජාතික බලවේගය තුළ මේ ලක්ෂණ දක්නට තිබේද? එසේ නම් මඳක් විමසිලිමත් ව, අපි ඒවා ගැන අපේ මනස යොමු කරමු.

වැරදි බැල්මක්

විනාශ කරන ලද අපේ අතීත බෞද්ධ සමාජ ක්‍රමයේ ගැබ්ව තිබූ ගුණ ධර්ම සදාචාර විධි වෙනුවට, පිළිගත හැකි අලුත් වටිනාකම් වත්මන් සමාජ ක්‍රමයේ නොමැති වූ නිසා, ලංකාවේ සෑම තරාතිරමක පුරවැසියන් පෞද්ගලිකව ද, ප්‍රජාවක් වශයෙන් ද අරමුණක් නැතිව,

අවිනිශ්චිත ස්වභාවකින් අතරමං වී සිටින අවදියකය, බෞද්ධ ජාතික බලවේගය බිහි වූයේ. මෙම බලවේගය විග්‍රහ කරන්නෙක් සමහර විට එහි මතු පිට පමණක් පරීක්ෂා කොට, එයට සම්බන්ධ වී පුරෝගාමීව ක්‍රියා කරන පුද්ගලයින් කීප දෙනෙකුගේ දක්ෂකම් හෝ දුබලකම් හෝ පමණක් දැක, යම් යම් වැරදි නිගමනවලට එළඹිය හැක. එසේ නැතිනම් තවත් කෙනෙක් මෙම බෞද්ධ ජාතික බලවේගය මගින් තමා ජීවත් වන සමාජය පිළිබඳ නියම තත්වාබෝධයක් ලබා ගැනීමට මහජනයා උනන්දු කරවීමේ අපේක්ෂාවෙන් ඔවුන් ඉදිරියේ තබන ලද කෙටිකාලීන අරමුණක් දෙස පමණක් බලා, කුල්මත් වූ සිතින් යම් යම් නිගමනයන්ට එළඹිය හැකිය. මේ දෙයාකාරයෙන්ම බැලීමෙන් යමෙකුට පෙනෙන්නේ, නියම බෞද්ධ ජාතික බලවේගය නොවේ. වත්මන් සමාජයේ අංග සම්පූර්ණ සංවර්ධනය සඳහා බෞද්ධ ජාතික බලවේගයෙන් ඉටු විය හැකි හෝ ඉටු කළ හැකි හෝ මෙහෙය ගැන පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට නම්, නොවක් ඇසින්ම අප මේ ව්‍යාපාරය දෙස බැලිය යුතුයි.

නිවැරදි දැකීමක්

අපට ප්‍රජාවක් හැටියට වර්තමානයේ දී මුහුණ දීමට තිබෙන බර පතල ජාතික සංවර්ධන ප්‍රශ්නය දෙස බලන විට පෙනී යන කරුණක් නම්, වෙන කවරදාකටවත් වඩා මුලු මහත් ජනතාවගේම කායික හා බුද්ධිමය ශ්‍රම ශක්තිය නොපමාව එක් තැන් කිරීම හා ප්‍රගති මාර්ගය ඔස්සේ මෙහෙයවීම අද අතිශයින් ම අවශ්‍ය වී තිබෙන බවය. මේ ජාතික අවශ්‍යතාව ගැන මෙනෙහි කරන විට, බෞද්ධ ජාතික බලවේගයේ උත්පත්තියට තුඩු දුන් හේතූන් හෝ පුද්ගලයින් නිරායාසයෙන්ම පසු පසට තල්ලු වී, මේ සංස්ථාවෙන් මූදා හරින ස්ව ශක්තියම පෙරමුණට පැමිණේ. බෞද්ධ ජාතික බලවේගයෙන් ඇති වූ ප්‍රබෝධයෙන් බුද්ධිමත් දේශප්‍රේමී ජනයා බලාපොරොත්තු වන්නේ, එහි ආරම්භයට තුඩු දුන් ඇතැම් බෞද්ධ විරෝධී ක්‍රියාවන් හෙළා දකිමින් හෝ එහි සමාරම්භක භවතුන්ගේ ගුණ ගයමින් හෝ සදාකල්ම කල් ගෙවන්නට නොවේ.

සියලු ම පරිහානිකර ධර්මයන් බල පවත්වමින් රට අන්ධකාරයට යද්දී ඒ ගමන වළක්වා, නැවත සමාජය නියම මගට යොමු කරන්නට, මේ රටේ බහුතර ජන කොට්ඨශය වූ බෞද්ධයන් පෙරමුණ ගන්නට සූදානම් වීම, ජාතික පුනර්ජීවයට තුඩු දෙන ප්‍රධාන ලක්ෂණයක් බව අප තේරුම් ගත යුතුයි. ජාතික සංවර්ධන කාර්යයේ පෙරමුණ ගැනීම

බෞද්ධයන්ගෙන් හැර, අන් සුළු කොටසකින් බලාපොරොත්තු විය හැකිද? එම නිසා මේ බලවේගය බෞද්ධයන් අතරින් පැන නැඟීම පුදුමයට කරුණක් නොවේ. එය ස්වභාවික සිද්ධියකි.

අබෞද්ධයන් වුවද, මේ මොහොතෙහි කලබල වීම හෝ බලාපොරොත්තු කඩ කර ගැනීම යුක්ති සහගත නොවේ. මක්නිසාද යත්, බෞද්ධයන්ගේ වර්තමාන පිබිදීම වනාහි, ඔවුන්ට අතීතයෙහිත්, වර්තමානයෙහිත් විඳීමට සිදුවී තිබෙන දුක් ගැහැටවල ස්වභාවික ප්‍රතිඵලයයි. එය ඓතිහාසිකව වැළැක්විය නොහැකි පිබිදීමකි.

මේ බෞද්ධ පිබිදීම මුළු ජාතියේම පිබිදීමේ පෙර නිමිත්ත බවත්, බෞද්ධ ශක්තිය මේ රටේ බලපැවැත් වූ හැම යුගයකදීම සියලුම අන්‍ය වාර්ගික හා අන්‍ය ආගමිකයනට වෙන කුමන සමාජ ක්‍රමයකින් වත් නොලැබුණ සමානත්වයක් – සාධාරණත්වයක් හා යුක්තියක් සැලසූන බවත් සිහිකොට, සියලු බෞද්ධ–අබෞද්ධ රටවැසියන් බෞද්ධ ජාතික බලවේගය දෙස අවධානය යොමු කළ යුතු බව අපේ අවංක හැඟීමයි. බෞද්ධ ජාතික බලවේගය පිළිබඳ සාධාරණ සහ නිවැරදි දැකීමක් ඇති කර ගැනීමට නම්, එහි තහවුරුවීම සහ අනාගත පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය ලක්ෂණයන් වූ එම ව්‍යාපාරයේ පරමාර්ථය, මාර්ගය සහ වැඩපිළිවෙල දෙස බැලිය යුතුමය.

උපහාරයක්

බෞද්ධ ජාතික බලවේගයට කිට්ටුවෙන් සම්බන්ධව, ඉතා අගනා ජාතික සේවයක යෙදී සිටින එහි පුරෝගාමී ලොකු, කුඩා බොහෝ පින්වතුන් සමග අපේ ලාංකික සමාජය අද මුහුණ පා ඇති ගැටලු පිළිබඳව සාකච්ඡා කිරීමට මට අවස්ථා ලැබුණි. ඔවුන් මෙම සත් කාර්යයෙහි පොළඹවනු ලබන්නේ කුමන නිමිති සහ හේතූන් නිසාදැයි විමසා දැන ගතිමි. මිනිසා විසින් මිනිසුන් බෙදන නා නා විධ බලවේග නිසා, දූෂිත වූ සමාජයක වෙසෙන පුරවැසියන්ගෙන් සමහරෙකුට, ඔවුන්ගේ ආකල්ප හා පරමාර්ථ පිළිබඳව සාවද්‍ය හැඟීම් පහළ වීමට ඉඩ තිබේ. එහෙත් කලක සිට එල්ල වුන සමහර චෝදනා හා නින්දා පරිභව නිසා, මෙම පුරෝගාමීන්ගේ හදවත් ක්‍රමයෙන් පිරිසිදු වෙමින් ඔවුන් තෝරා ගත් නිර්මල මධ්‍යගත පරමාර්ථවලට වඩ වඩා ළං වී මහජන සේවයට යෝග්‍ය වූවන් සේ පරිවර්තනය වනු දැකීම සතුටට කරුණක් බව නොකියාම බැරිය.

සියලු දෙනාගේම යහපත සඳහා සේවය කිරීමේ සර්වෝදය පරමාදර්ශයෙහි පිහිටි ආචාර්ය විනෝබා භාවේ තුමාගේ අහිංසක අනුගාමිකයෙකු වූ මට, බෞද්ධ ජාතික බලවේගය මගින් අප සමාජයට ඉටු කළ හැකි අගනා සේවය වැටහුණ නිසාදෝ, එම බලවේගයේ අභිප්‍රාය නිර්මලතාව සහ සැකැස්ම යන මැයින් අදහස් ස්වල්පයක් එම පුරෝගාමීන්ට උපහාරයක් ලෙස ලියා, ඔවුන්ගේ කාරුණික සැලකිල්ලට භාජනය කරවීමට කල්පනා කළෙමි.

පරමාදර්ශයක්

විද්‍යා යුගයේ අවසාන අවධියට ලෝකවාසී අපි එළඹ ඇත්තෙමු. අලුත් ම යුගයක්, මනුෂ්‍ය ශිෂ්ටාචාරයේ උසස්ම ඵල නෙලිය හැකිවන අගනා යුගයක්, අප වෙත උදාවීමට ඉතා ආසන්නය. මේ යුගය, විද්‍යා හා ආධ්‍යාත්මික යුගය යන නමින් ඉතිහාසය විසින් හඳුන්වනු නියතය. මා විශ්වාසය කරන්නේ මේ ශ්‍රේෂ්ඨ යුගය ලෝක ශිෂ්ටාචාරය සඳහා උදා කරලීමේ භාග්‍යය ඉතිහාසය විසින් පවරා තිබෙන්නේ, අපගේ රමණීය මාතෘ භූමිය වූ ලංකාද්වීපය මධ්‍යස්ථානය කරගෙනයි. මෙවැනි ලෝක සභ්‍යත්වයක් බිහි කරලීමේ උතුම් ප්‍රාරම්භක වගකීම ලංකාවාසීන් වූ අප විසින් ඉසිලිය යුතු වේ. ඉතාම උසස් ක්ෂෙත්‍රයක පිහිටුවා ගත් පිරිසිදු පරමාදර්ශයක් ඉදිරියේ තබා නොගෙන කිසිම සත් ව්‍යාපාරයක් සාර්ථකව ඉටු කරගත නොහැකි බවට ඉතිහාසය දෙස් දෙයි. මුලු මනුෂ්‍ය සංහතියටම පිළිගත හැකි අත්‍යුත්තම පරමාදර්ශයක් ලෝකය ඉදිරියේ තැබීම, මේ රටේ බෞද්ධයන් වූ අප වෙත පැවරී තිබෙන වගකීමක් බව අවධාරණයෙන් ම කිව යුතුය.

බලය ලබා ගැනීමට පොර කෑම සහ ලබා ගත් බලය තහවුරු කර ගැනීමට වෙහෙසීම හෝ ධනය රැස්කිරීම සහ රැස් කර ගත් ධනය පස් කම් සැප විඳීමට වැය කිරීම හෝ වැනි පටු පහත් ජීවිත පරමාර්ථයන්හි ගැලී සිටින්නෝ මානසික රෝගීහු වෙති. එවැනි ආත්ම කේන්ද්‍රීය පුද්ගලයන්ගේ දර්ශන පථය තමා වටේම මවා ගත් පටු ක්ෂේත්‍රයකට සීමා වී තිබෙන අතර, ඊට ඔබ්බෙහි තිබෙන අගනා ලෝක සේවා ක්ෂෙත්‍රයන් ඔවුන්ට පෙනෙන්නේ නැත. 'දුර්වලයා මෙසේ තමා ජීවත් වන ලෝකය තමාගේ ප්‍රයෝජනය සඳහා පමණක් මවා තිබේ යැ'යි යන හැඟුමෙන් ජීවත් වන අතර, වීර්යවන්තයා ගන්නේ ඊට ඉඳුරා ම වෙනස් වූ මගකි. හෙතෙම සාමාන්‍ය ජනයාට ඉටු කරගත නොහැකි පරමාදර්ශ යන්ගෙන් උදම් වී ඒවා ඉලක්ක ලෙස තබා ක්‍රියා කිරීමට නිරතුරු

වෙහෙසෙයි. එවැනි ධෛර්යය සම්පන්න බුද්ධිමතුන් විසින් ඔවුන් අපේක්ෂා කරන අරමුණු ඉටු කර ගැනීමට, සෑම විටම අපොහොසත් වුවත්, ඔවුහු ඉහත කී ආත්ම කේන්ද්‍රීය පුද්ගලයින්ගේ ජීවන අරමුණු පරදවා තමන් ජීවත් වන සමාජය ඉදිරියටම ගෙන යෑම නිරායාසයෙන්ම සිදු කරති. මේ වනාහී අප සිත් සතන්හි තහවුරු කරගත යුතු පරම සත්‍යයකි.

ආධ්‍යාත්මික යුගය

අපේ මාර්ගෝපදේශකයාණෝ, අප ශාස්තෘන් වහන්සේ වූ බුදුරජාණන් වහන්සේ ය. සම්‍යක් සම්බුද්ධත්වයට පැමිණීම සඳහා උන් වහන්සේ විසින් තමන් වහන්සේ ඉදිරියේ තබා ගත් පරමාදර්ශය, අවුරුදු කෝටි ගණනක් නොව, කල්ප ගණනක්ම පුරා පැතිර සිටි අතිශයින්ම දුෂ්කර වූ අරමුණකි. එහෙත් අදින් අවුරුදු 2552 කට පෙර දිනෙක උන් වහන්සේගේ ඒ පරමාදර්ශය සැබෑවක් විය. වත්මන් ලෝක ශිෂ්ටාචාරයේ පළමු වරටත්, සමහර විට තව ශත වර්ෂ ගණනාවකට ලෝක ශිෂ්ටාචාරයට කවදාවත් ඇති කරගත නොහැකි යැයි විශ්වාස කළ හැකි නිසා, අවසාන වරටත් – මිනිස් සිතේ ඉහළම ආධ්‍යාත්මික පාරිශුද්ධතාවක් එදා දක්නා ලදී. ලේඛන ගත වූ මනුෂ්‍ය සභ්‍යත්වයේ මීට උසස් ආධ්‍යාත්මික දියුණුවක් වෙන කිසිම අවදියක දී ලබාගත් බවක් සඳහන් නොවෙයි. ඒ අවදිය 'ආධ්‍යාත්මික යුගය' ලෙස හඳුන්වමු.

ධර්ම විජය යුගය

බුදුරජාණන් වහන්සේ විසින් බිහිකොට, උන් වහන්සේ ගේ ජීවිත කාලය ගත කළ ඒ ආධ්‍යාත්මික යුගයෙන් ද, බුද්ධ ජීවිතය හා ශ්‍රී සද්ධර්මයෙන් ද උද්දාම වූ ධර්මාශෝක අධිරාජයා ඊළඟ, නොනැසෙන සභ්‍යත්ව යුගය උදා කළේය. තම ජීවිතයේ එකම දර්ශනය සහ පරමාදර්ශය 'ධර්ම විජය' කරගත් ධර්මාශෝක රජතුමා විසින් එතෙක් ලොව නුදුටු විධියේ මනුෂ්‍ය කථාන්තරයේ කියවන්නට ලැබෙන විශාලම ශිෂ්ටාචාරාත්මක බලවේගය මුදා හරින ලදී. බුදුරජාණන් වහන්සේ උදා කළ ආධ්‍යාත්මික බල වේගයෙනුත්, අශෝක අධිරාජයාගේ "ධර්ම විජය" පරිශ්‍රමයෙනුත් පසු, මනුෂ්‍ය ඉතිහාසයෙහි හා සභ්‍යත්වයෙහි නොමැකෙන සුවිශ්‍රේෂ්ඨ ස්ථානයක් ලබා ගැනීමට පොහොසත් වූ එකම නිර්මාණය වන්නේ විද්‍යා යුගයයි.

විද්‍යා යුගය

විද්‍යා යුගයේ අවසානය ළඟ ළඟම එන බව මම කලින් සඳහන් කළෙමි. පසුගිය ශත වර්ෂ පහේදී ලත් අසම සම සීඝ්‍ර දියුණුවෙන් හා වර්ධනයෙන් පසු, විද්‍යා යුගය අවසන් වීමේ ලකුණු පැහැදිලිව පහළ වී තිබේ. ලෝක ඉතිහාසය දෙස නෙත් හෙළන්නෙකුට මෙය සියලුම අනිත්‍ය දේ කෙරෙහි බලපාන සත්‍යයක් ලෙස වැටහිය යුතුය. මිනිසා විසින්, මිනිසුන් පෙළීම සඳහා මාර්ගයක් ලෙස විද්‍යාවේ පිහිට සෙවූ අවධිය කිනම් කලක ද–අන්න ඒ කල්හිදීම, මෙම විද්‍යා යුගය විනාශ වීමේ බීජයත් විද්‍යාව තුළම රෝපණය විය.

මේ යුගයේදී විවිධ අධිරාජ්‍ය, ඒකාධිපති ක්‍රම හා ධනේශ්වර ක්‍රමයේ උපත්, නැගීම් හා විපත් දක්නා ලදී. ධනේශ්වර වාදයේ ඓතිහාසික ප්‍රතික්‍රියාව වූ සමාජවාදය ද, මෙම යුගයේ දී සීඝ්‍රයෙන් පැතිරිණි. එහි ඉදිරි ගමන ද, අප ඉදිරියේ විද්‍යමානව පෙනේ. එහෙත් හේතුව ඉවත් කළ විට, ප්‍රතිඵලය ද නැතිවීමේ සිද්ධාන්තයේ සත්‍යය අනුව, ධනේශ්වර වාදය අහෝසි වූ විට එහි ප්‍රතිඵලය වූ සමාජවාදය ද අදෘශ්‍යමාන වන බව මගේ විශ්වාසයයි. වෙනත් වචනවලින් කිවහොත් ඉක්මනින් ම අඩපණ වන බලවේගයක් හැටියට සමාජවාදය ද සැලකිය හැකිවාක් මෙන්ම, ඒ වනාහි විද්‍යා යුගයේ අවසාන පරිච්ඡේදය වන්නේය.

විද්‍යා හා ආධ්‍යාත්මික යුගය

විද්‍යා යුගයේ අවසානයට සහ විද්‍යා හා ආධ්‍යාත්මික යුගය යනුවෙන් අප හැඳින් වූ නව යුගයක් උදාවීමේ අවදියකට අපි මුහුණ දී ඇත්තෙමු. මේ යුගය උදා කිරීමේ ප්‍රාරම්භක ශක්තිය සහ වගකීම ලංකා වාසී බෞද්ධ අප සතු බව කල්පනා කළ යුතුය. කවදාවත් සැබෑ කරගත නොහැකි උමතු කල්පනාවක් හැටියට මේ අදහස සමහර ළාමක දුර්වල සිතැත්තන් විසින් ඉවත දමනු ඇත. එහෙත් අපක්ෂපාතී නිදහස් සිතකින් මේ ගැන කල්පනාව යොමු කරන්නෙකුට නම්, මෙහි සාර්ථකත්වය ගැන සැක කිරීමට කිසිදු හේතුවක් ඇති විය නොහැකිය.

ප්‍රජා සිත

නූතන ලෝක තත්වය ගැන ද සිහියේ තබාගෙන අප ජීවත් වන සමාජය, අපගේ ආර්ථික සම්පත්, දේශපාලන දියුණුව සහ විශේෂයෙන්

අපේ ජාතිය නමැති හදවත කෙබඳු ආකාරයකින් ස්පන්දනය වන්නේද යන කරුණු ගැන මඳක් අපි අපේ සිත් යොමු කරමු. ඕනෑම ක්‍රියාවකට මුල් වන යම් චේතනාවක් තිබෙන බව අපි දනිමු. සිත සියල්ල අබිබවා වැජඹෙයි. සත්‍යය නැතහොත් ධර්මය මෙයයි. යම් ප්‍රජාවක ක්‍රියාත්මක වන ඕනෑම බල වේගයකට ප්‍රාරම්භක ශක්තිය ලැබෙන්නේ, ඒ ප්‍රජාවේ බල පවත්වන "ප්‍රජා සිත" හෙවත් "ජන සිත" හේතු කොට ගෙන ය. ප්‍රජාතන්ත්‍රවාදයෙන් නැවතත් පණ ගැන්වුණ වටිනා යමක් ලෝක සමාජයේ ඉතිරිව ඇත්නම්, ඒ තමා – මේ "ජන සිත" හෙවත් "ප්‍රජා සිත."

එක්දහස් නවසිය පනස්හයේ දී ලක් දිවෙහි යටපත් වී තිබූ මේ ජන සිත නැවතත් මතු විය. එහෙත් ඒ අවස්ථාවේ දී එහි පිළිබිඹු වූයේ අප කලින් සඳහන් කළ ලක්ෂණ තුනෙන් පළමුවැන්න වූ අභිප්‍රාය හෙවත් අරමුණ පමණි. ඒ කෙසේ වුවත් එකල ජනිත වූ "ජන සිත" විසින් මුදා හළ ජන ශක්තියේ හේතුවෙන්, ලංකාවේ විශාල දේශපාලන විප්ලවයත් ඇති වූ බව, කාටත් ප්‍රත්‍යක්ෂ කරුණකි. අභාග්‍යයකට මෙන් ඒ සමාජ පෙරළිය සම්පූර්ණ වීමට අවශ්‍ය සෙසු ලක්ෂණ දෙක වූ පාරිශුද්ධතාවත්, පැහැදිලි සැකැස්මකුත් අප ඉදිරියේ නො තිබුණු හෙයින්, එහි නියම ප්‍රතිඵල ජාතියට අහිමි විය. එපමණක් නොවේ. මෙම අඩුපාඩුවේ අවාසනාවන්ත ප්‍රතිඵල අද අපට සමාජයේ සෑම දෙසින්ම පෙනෙන අවිනිශ්චිත අඳුරු හා ව්‍යාකූල තත්වයෙන් ද, ජාතියක් වශයෙන් අරමුණක් නොමැතිවීමෙන් ද මොනවට පැහැදිලි වේ.

සත් වසකට පෙර ප්‍රබෝධමත් ව ක්‍රියාකාරී වූ මෙම ලාංකික "ජනහිත" නැවත වරක් කඩින් කඩ වී දුර්වලවීමේ ලකුණු පහල විය. එහෙත් කුමන අතවරයන්ට ලක් වුවත්, එය සදහටම නිසොල්මන් කළ නොහැකි බව නම් පැහැදිලි ය. තැනින් තැන කඩින් කඩ වී නමුත්, එහි ජීවය තවම නොනැසී පවතී. අවශ්‍ය ව තිබෙන්නේ, මේ සියල්ල එක්තැන් කොට, නැවත වරක් ජන සිත යොමා, නියම ජන ශක්තිය ගොඩනැගීමය. මේ පණ ගැන්වීම සඳහා නියම ආමන්ත්‍රණයක් ප්‍රජාවට ලැබිය යුතුය. පැහැදිලි අරමුණක්, සුපිරිසිදු මාර්ගයක් හා කාර්යක්ෂම වැඩ පිළිවෙලක් යන ත්‍රිවිධ සංඥා වන්ගෙන් ම පරිපූර්ණව 'ප්‍රජා සිතට' මේ ආමන්ත්‍රණය දිය යුතුය. මෙම ආමන්ත්‍රණය දීමට පොහොසත් වන්නේ කවුරුන් ද? කෙසේ ද?

අත්හදා බැලීම් වශයෙන් බෞද්ධ ජාතික බලවේගය අලු යට සැඟවී තිබෙන ගිනි පුපුරක් මෙන් වූ මෙම "ජන සිත" ප්‍රබෝධමත් කිරීමට ජීවන හුස්මක් පිම්බාය. නූතන බෞද්ධ ඉතිහාසයේ නුදුටු විරූ ප්‍රබෝධයකින් "බෞද්ධ ප්‍රජා සිත" ඒ ආමන්ත්‍රණයට සවන් දුන් බව නොරහසකි. එහෙත් බෞද්ධ ජාතික බලවේගයට පවා ඉහත කී ලක්ෂණයන් අතුරින් ස්ථිරවම සතුව තිබුණේ නිර්මල චේතනාවකින් පිරිසිදු වූ පිරිසිදු ක්‍රියා මාර්ගයක් පමණකි. එය ද අංග සම්පූර්ණව නොවේ. ඒ කෙසේ වුවත්, බෞද්ධ ජාතික බලවේගයේ පුරෝගාමීන් පිරිසිදු සිතින් හා හදවතින් යුතුව නියම මග ගමන් කිරීමට තැත් කළ බවට සැකයක් නැත.

පිරිසිදු ප්‍රතිපත්තීන් හි පිහිටා නියම සැකැස්මක් පෙරදැරි කොට ගෙන ක්‍රියා නොකිරීම නිසා – මාරාත්මක නින්දකට වැටී, පරිහානියේ ප්‍රපාතය කරා දිවෙන අපේ සිංහල වර්ගයා, ලංකා ජාතිය, බේරා ගැනීමට මේ බලවේගයට ශක්තිය තිබේද? මගේ අවංක විශ්වාසය නම් එය සැබෑ කළ හැකි කරුණක් බවයි. ඇයි ද මා එසේ සිතන්නේ?

බෞද්ධ සමාජ ක්‍රමයක්

අද ලංකා ජාතිය සතුව තිබෙන විශාලතම ජාතික සම්පත් නිධානය කුමක්දැයි ඔබෙන් ප්‍රශ්න කළහොත්, ඔබ දෙන පිළිතුර කුමක්ද? ඒ අපේ ධන ශක්තිය ද, පාලකයන් ද, නිලධාරීන් ද, ත්‍රිවිධ හමුදාවන්ද, එසේත් නැත්නම් සමහර බලකාමීන් විශ්වාස කරන්නාක් මෙන් ඡන්ද බලය ද? නැත. අපේ අගනාම වස්තුව මේ එකක්වත් නොවේ.

නූතන ලංකාවේ උසස්ම සම්පත නම් ප්‍රධාන වශයෙන් බෞද්ධ ජනතාව ද දෙවනුව හින්දු ජනතාව ද බව සැලකිය යුතුය. ලාංකික ප්‍රජාවගේ ආවේනික සංස්කෘතික රටාවට නුදුරින්ම සිටින්නේ මේ බහුතර මනුෂ්‍ය කොට්ඨාශ දෙකයි. සෑම බෞද්ධයෙක් තුළම (සෑම හින්දු භක්තිකයෙක් තුළම) තමන්ට උරුම වූ සංස්කෘතික දයාදයේ මහිමයෙන්, තම වර්තමානය හා අතීතය සම්බන්ධ කරන පිටතට නොපෙනෙන එහෙත් අභ්‍යන්තරයේ ජීවමාන වූ ඓතිහාසික පුරුකක් තිබේ. අතීතයෙන් තොර වර්තමානයක් වත් අතීත – වර්තමානයකින් තොර අනාගතයක්වත් අවුරුදු 4000ක පමණ ශිෂ්ටාචාරයක් ඇති ජාතියකට ඇති විය නොහැකිය.

අතීතයේ දී නොයෙක් විජාතික ආක්‍රමණිකයන්ගේ තර්ජනයන් ගෙන් ද, වර්තමානයේ දී විවිධාකාරයෙන් සංවිධානය වූ බලගතු ජාති විරෝධී ආයතනවලින් එල්ල වන මරු පහරින් ද, දරුණු පීඩා වින්දත්, මොවුන්ගේ ලේ, ඇට, නහර, සම, මස්වල හා සිරිත් විරිත්වල කැවී තිබෙන මෙම සංස්කෘතික තත්වාබෝධය සුදුසු ආමන්ත්‍රණයක් ලත් විට මතුවීම වැළැක්වීමට සමත් කිසිදු බලයක් මේ මිහිපිට නැත.

බෞද්ධ හෝ හින්දු හෝ නොවන ජන කොට්ඨාශයන් කෙරෙහි ද, බහුතර ජනතාවගේ මේ අවිද්‍යමාන බලය ක්‍රියා කර ඇති බැවින්, ඔවුන්ගේ යටි සිත්වල ද යම් අන්දමක ජාතික පෙළඹවීමක් ඇති වන බව ද සත්‍යයකි. එම නිසා බෞද්ධ ජාතික බලවේගයේ අභිප්‍රාය වනුයේ කිසිදු භේදයක් නොතකා, සමස්ත ලාංකීක සත්පුරුෂ ජනතාවගේම "ජන සිත" පුබුදු කොට, යහපත් මාර්ගයකට යොමු කිරීමයි.

මුලු ජාතියක් ඉදිරියෙහි මෙවැනි ආයාචනයක් කළ හැක්කේ අපේ ජාතික ජීවන ක්‍රමයෙහි, සමාජ සංස්ථාවෙහි, මුල් බැස තිබෙන බෞද්ධ සංස්කෘතික බීජයේ බලය නිසාය.

වෙනත් වචනවලින් කිවහොත්, බෞද්ධ ජාතික බලවේගයේ පරමාර්ථය වනුයේ කුමන ආගමක් අදහන පුරවැසියෙකුට වුවත්, සම්පූර්ණ නිදහස සහ අවස්ථා සැලසෙන, බෞද්ධ දර්ශනය සහ ප්‍රතිපත්ති අනුව හැඩ ගැසුනු, ජාතියක් වශයෙන් අපට ලෝකයා ඉදිරියේ ආඩම්බර විය හැකි, ලාංකික බෞද්ධ සමාජ ක්‍රමයක් ගොඩ නැගීමය. මෙන්න මෙවැනි සමාජ ක්‍රමයක් තුළය, නූතන විද්‍යාඥානය සහ අතීත ධර්මඥානය එක්තැන් කොට සම්මිශ්‍රණය කළ හැක්කේ.

නොනැසෙන බලය

කතෝලික ආක්‍රමණය, සංවිධානාත්මක ආගම්, කුලය. ජාතිය, දේශපාලන පක්ෂ ආදී මිනිසා මිනිසාගෙන් ඈත් කරන, සමාජය පලුදු කරන, සියලුම බෙදීමේ බලවේග අඩ පණ වී තිබේ. ලෝකයේ ඉතා සීඝ්‍රාකාරයෙන් වර්ධනය වන, මනුෂ්‍ය වර්ගයාගේ ඒකීය භාවය ස්ථිර කරන, නූතන විද්‍යාවේ බල මහිමය ඉදිරියේ ඉහත කී බෙදීමේ බලවේග සියල්ලක්ම දිරාපත් වී සුනු විසුනු වී යෑම නියතය. නවීන විද්‍යාවට එඩිතරව මුහුණ දී , එය මුලු මනුෂ්‍ය වර්ගයාගේම දියුණුව උදෙසා නිසි මග මෙහෙය විය හැකි එකම සර්ව භෞමික බලවේගය බෞද්ධ ආධ්‍යාත්මික ශක්තිය බව අවබෝධ කරගත යුතුය.

බෞද්ධ ජීවන ක්‍රමයෙහි සදාදරණීය මිත්‍රයා - නූතන විද්‍යාව වන්නේය. එම නිසා මේ බලවේග දෙක ලෝක සත්වයාගේ හිත සුව පිණිස සම්මිශ්‍රණය කිරීම අපගේ අභිප්‍රාය හා අරමුණ විය යුතු ය. ජනසිත ඉදිරියේ මේ අභිප්‍රාය තැබූ විගසම, කුමන ආගමක් ඇදහුවත්- මේ රටේ සියලුම සත් පුරුෂ බුද්ධිමතුන් ද - සාමාන්‍ය මහජනයා ද- මෙම අරමුණ තේරුම් ගෙන- පිළිගෙන, එය තහවුරු කිරීමට සහ ක්‍රියාවේ යෙදවීමට මෙතෙක් නුදුටු විරූ උද්යෝගයකින් පෙරමුණ ගන්නවාට කිසිම අනුමානයක් නැත.

නවීන විද්‍යාව හා අහිංසාව

ඒකාධිපතිවාදී මුහුණුවරක් ඇත්තා වූත්, මිනිසාගේ නිදහස් කල්පනාවට අවකාශ නොදෙන්නා වූත්, විශාල ලෙස සංවිධානාත්මක සහ ව්‍යාපාරික පදනමක පිහිටියා වූත්, කිසිම ආගමකට නූතන විද්‍යාවේ පිපාසය සංසිඳවීමට හැකියාවක් ලැබෙන්නේ නැත. ක්‍රිස්තු ධර්මය ආගමක් ලෙස පරිවර්තනය වී, සංවිධානාත්මක කළ මූලික සිද්ධාන්තයන්ගේ පදනම පවා සහමුලින්ම දෙදරා ගොස් තිබෙන අවදියක, වතිකානුවේ ඇති කිරීමට තැත් කෙරෙන ප්‍රතිසංස්කරණවලින් විද්‍යාවේ අභියෝගයට සෑහෙන ප්‍රතිකර්මයක් ලැබේ යැයි විශ්වාස කළ නොහැක. ඩොලර් කාසිය හා වතිකානුව සතු අසහාය බලයේ අවසාන කාලය දැන් ළඟා වී තිබේ.

අප ජීවත් වන පෘථිවි තලයෙහි මනුෂ්‍ය සංහතිය දිගින් දිගටම නොනැසී පැවැත්මට නම්, නවීන විද්‍යාව හා හිංසා බලය එකිනෙකින් ඈත් විය යුතුය. එසේම විද්‍යාවත්, අහිංසාවත් අත් වැල් බැඳ ගත යුතුය. මනුෂ්‍ය වර්ගයා සාමූහික සමූල ඝාතනයක් සිදු කර ගනිමින්, සිය දිවි හානි කර ගැනීමට කිසිසේත් සූදානම් නැති බව මම විශ්වාස කරමි. කෙනඩි සහ කෘෂෙප් * යන මහතුන් ද මෙවැනි අඥාන ක්‍රියාවකට හරි සිහිය තිබෙන තුරු නොපෙළඹෙනු ඇත. එ නිසා අනාගතයේදී මේ මිහිපිට මිනිස් පරපුර නොනැසී පවතින බවටත්, අනාගත ලෝක ශිෂ්ටාචාරය ගොඩ නැගීමේ ශක්තිමත් පදනම වශයෙන් අහිංසාත්මක විද්‍යාව මිනිසා විසින්ම තෝරා ගනු ලබන බවටත් සැකයක් නැත. බෞද්ධ දර්ශනය, බෞද්ධ ප්‍රතිපත්ති, බෞද්ධ ජීවන ක්‍රමය හා සිරිත් විරිත්වලින් සහ බෞද්ධ සංස්කෘතියෙන් අහිංසාවාදී සමාජ ක්‍රමයට

---

* එවක අමෙරිකානු හා රුසියානු ලෝක බලවතුන් දෙදෙනා

ලැබුණු රුකුල හා ආස්වාදය ඉතිහාසයේ අන් කිසිම දර්ශනයකින් හෝ පැවැත්මකින් හෝ ලැබී නොමැති බව බුද්ධිමත් මනුෂ්‍යයෝ පිළිගනිති. කුල, ජාති, ආගම්, දේශපාලන පක්ෂ ආදී මිනිසා විසින් මිනිසුන් බෙදන විධියේ මාර්ග කිසිවක් බෞද්ධ ධර්මය විසින් හෝ නවීන විද්‍යාව විසින් පිළිගෙන නැත. අහිංසාත්මක විද්‍යාව ද, බෞද්ධ දර්ශනය ද නිතර නිසොල්මන්ව ජප කරන මන්ත්‍රය නම් "සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා, - සියලු සත්වයෝ සැපවත් වෙත්වා" යන මන්ත්‍රයයි.

අනිකුත් සංවිධානාත්මක ආගම්වලට හාත්පසින්ම වෙනස් ස්වභාවයකින් හැඩගැසී ඇති බෞද්ධාගම කිසිවිටෙක තම අනුගාමිකයන්ගේ සංඛ්‍යාව තර කරගෙන සංවිධානාත්මක බලයක් ගොඩනැංවීමට වැර නොගනියි. විද්‍යාව හා බුද්ධ ධර්මය සම්බන්ධ කොට, අහිංසාවාදී නව ශිෂ්ට මනුෂ්‍ය සමාජයක් ගොඩනැගීමේ වගකීම ඉසිලීමට ලෝකයේ රටවල් අතුරින් අද්විතීය ස්ථානයක් ලංකාව උසුලන්නේ ඒ නිසාය.

විද්‍යාව හා සමාජවාදය

මේ වනතුරු විද්‍යාවෙන් වැඩිම ආශිර්වාදයක් ලැබීමට පොහොසත් වූ එක ම සැබෑ ලෝක බලවේගය නම්, සමාජවාදයයි. ද්‍රව්‍යයන්හි ගැබ් වී ඇති බලය පිළිබඳ රහස් සොයා ගෙන එම විද්‍යා ඥානය ඉවහල් කර ගැනීමෙන්, අභ්‍යවකාශයේ තොරතුරු සෙවීමේ පර්යේෂණයන් පවා සාර්ථකව පවත්වා ගෙන යෑමෙන්, සමාජවාදය පදනම් වී ඇති භෞතික මූලධර්මවල වලංගුතාවය එන්ට එන්ටම තහවුරු වී ඇති බවට සැකයක් නැත. මිනිසා විසින් – මිනිසුන් පෙළීමේ අමනුෂ්‍ය දීන ක්‍රියාව නැවැත්වීමට ශක්තිය ඇති එකම විද්‍යාත්මක සූත්‍රය සමාජවාදය බව නූතන විද්‍යාව විසින් ඒත්තු ගන්වා තිබේ. මක්නිසාද යත්, ආර්ථික ක්ෂේත්‍රයට අදාල වූ ඉඩම්, ශ්‍රමය, මූල ධනය හා සංවිධානය යන නිෂ්පාදන සාධක සතර මුලු මනුෂ්‍ය සංහතියේ ම ඒකාකාර යහපත සඳහා යොදා ගැනීමට සමත් වූ සමාජවාදී ක්‍රමය සමග තරඟ කළ හැකි වෙනත් සමාජ ක්‍රමයක් නොමැති නිසාය.

ආර්ථික වශයෙන් මිනිසා විසින් මිනිසුන් පෙළීමේ ස්වභාවය නතර කළ විට, මතු වන්නේ, උනු'න් අතර "බෙදා ගැනීමේ" පිළිවෙතකි.

බෞද්ධයන් වූ අපි මේ බෙදා ගැනීමේ තත්වය හඳුන්වන්නේ දානය යනුවෙනි. "දාන" යන තමාගේ අභ්‍යන්තරය පරීක්ෂා කිරීමේ, ජීවිත ගැටලුවේ නොපෙනෙන රහස් සෙවීමේ, කුතුහලය, නිරතුරුවම මිනිස් සිතේ බලපවත්වයි. ද්‍රව්‍යමය විද්‍යාවට හෝ සමාජවාදී

සිද්ධාන්තවලට හෝ මේ ආධ්‍යාත්මික මිථ්‍යා විශ්වාසයන්ට හෝ දේව ධර්මයන්ට ද, මෙම ප්‍රශ්නය කෙරෙහි විද්‍යා ඥානයට අනුකූල වූ බලපෑමක් ඇති කිරීම දුෂ්කරය. සම්‍යක් දෘෂ්ටියකින් යුතුව බලන විට, මෙයින් පෙනී යන්නේ සමාජවාදී ක්‍රමයක "බෙදා ගැනීම හා සදාචාරය" (දානය සහ ශීලය) යහපත් ලක්ෂණ හැටියට පැවතුණත්, ද්‍රව්‍ය වාදයෙන් පමණක් පිරවිය නොහැකි විශාල ශූන්‍යතාවක් තිබෙන බවය.

දානය සහ ශීලයට – භාවනාව ද එකතු විය යුතුය. වෙනත් වචනවලින් කිවහොත්, අපේ අභ්‍යන්තරික චිත්ත සන්ථානයන්හි නියම තත්වාවබෝධයකින් යුතු පාරිශුද්ධතාවක් ද ඇතිවිය යුතු ය. තෘෂ්ණාව, වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව ආදී පහත් ගුණ වෙනුවට, පරිත්‍යාගය, ප්‍රේමය, දයාව, කරුණාව ආදී ගුණ අපේ සිත් තුළ ඇති විය යුතුය. නුදුරු අනාගතයේදී බිහිවන නව යුගයට සුදුසුවීමට නම්, අංග සම්පූර්ණ මිනිස් සමාජයක් බිහිවීමට නම්, දාන සීල, භාවනා යන අංග තුනම අවශ්‍ය ය. මේ දිනවල ලෝක සමාජවාදී පෙරමුණෙහි උද්ගත වී තිබෙන උග්‍ර මතභේද ගැන මෙනෙහි කරන විට, ආධ්‍යාත්මික පිබිදීමකින් තොර ව, ද්‍රව්‍යමය පදනමක් මත පමණක් සිටිමින්, මනුෂ්‍ය වර්ගයා ගේ ඒකීය භාවය තහවුරු කිරීමට තැත් කිරීම මහත් අනුවණකමක් බව මොනවට අවබෝධ වේ.

බෞද්ධ ජාතික බලවේගයට ලැබෙන තැන

මේ අන්දමින් කල්පනා කරන විට, බෞද්ධ ජාතික බලවේගය අන් ව්‍යාපාර, ධර්ම හෝ ආක්‍රමණ ආදී කිසිවකට එරෙහිව බිහිවූ ප්‍රතික්‍රියාත්මක ව්‍යාපාරයක් නොවන බව පැහැදිලි වේ. එය අපේ සංස්කෘතිය තුළින්ම බිහිවූවකි. ඒ වනාහි, මෙතෙක් අප සමාජය කෙරෙහි බලපා ඇති සියලු ලෝක සමාජමය බලවේගයන්ගේ හරය එක්තැන් වූ – එහෙත් ඒ සියල්ල අබිබවා සිටින ඒකායන බලයකි. එමෙන්ම නූතන විද්‍යා යුගයේ ගෙවී යෑමෙන් පසුව, විද්‍යා හා ආධ්‍යාත්මික යුගයක් බිහි කිරීමට සමත් එකම බලවේගය ද එය වේ.

අපේ රට කුඩා රටක් යැයි කල්පනා කොට, එම නිසා මෙතරම් භාරදූර විශ්වමය – කර්තව්‍යයක් ඉසිලීමට තරම් ශක්තියක් මේ කුඩා දිවයිනට නොමැති යයි අප මුළා නොවිය යුතුය. ස්ථිර අභිප්‍රායකින් යුතුව යම් ප්‍රජාවක "ජන සිත" එකම මගක යොමු කළ හැකි යම් බලවේගයක්, කොතරම් කුඩා රටක වුවත්, ජනිත වුවහොත් – ඒ රටට

වර්තමාන ලෝකයම කෙරෙහි මානසික බලපෑමක් ඇති කිරීමට තරම් විද්‍යා මාර්ග අද දියුණුය.

ප්‍රජාවක් වශයෙන් අපේ ලාංකික ජනතාවගේ "ජන සිත" පුබුදුවාලීමට අවශ්‍ය සියලුම සාධක දැන් සම්පූර්ණ වී තිබේ. තවම අපේ රට, ගම්වලින් ගහන වූ රමණීය දිවයිනකි. සාරවත් ආගමික සංස්කෘතියකට සම්බන්ධ වූ, සාම්ප්‍රදායික ගුණධර්ම හා වත් පිළිවෙත්වලට ගරු කරන, වැඩිහිටි ගැමි පරම්පරාවක්, අප අතර තවම ජීවත් වෙයි. දේශපාලන පක්ෂ ක්‍රමයේ අසාර්ථක භාවය ප්‍රත්‍යක්ෂ වී ඇති නිසා, ඔවුහු අද උදාසීන වී සිටිති.

අතීත සංස්කෘතියත් නූතන විද්‍යාවත් සංකලනය වී බිහිවන විද්‍යාත්මක ක්‍රියා පිළිවෙලක නායකත්ත්වය අවිවාදයෙන් පිළිගැනීමට පුල පුලා සිටින වටිනා තරුණ පරම්පරාවක්, අද අපේ රටේ සිටිති. ඒ වාගේ ම අංග සම්පූර්ණ ජාතික හා මානුෂික වූ ද, සදාචාරාත්මක වූ ද, පුනර්ජීවයක පෙරමග, ගැනීමට සමත් අපේ කුල දේවතාවන් වූ මහා සංඝරත්නය ද අප අතර වැඩ සිටිති.

ස්ථිර හා පැහැදිලි අභිප්‍රායයන් පෙරදැරිව, ඒ සියල්ල මුදුන් පමුණුවාගත හැකි නිර්මල මාර්ග ද තෝරා ගෙන, විද්‍යාත්මක පදනමක් මත සැකැසුණු සාමාජික ක්‍රියා පිළිවෙලක් ඇතිව, මනා අවබෝධයෙන් හා ආත්මහරණයෙන් යුක්තව, ඉදිරිපත් වෙන නායකත්වයක් පිළිගැනීමට අප දිවයිනේ වැඩි ජනතාව, කුල, ආගම්, ජාති, දේශපාලන පක්ෂ භේද ආදිය නොතකා සූදානම් ව සිටිති. එවැනි නායකත්වයක් පක්ෂ දේශපාලන සම්බන්ධකම්වලින් තොර විය යුතු බව නොකිවමනාය. බෞද්ධ ජාතික බලවේගය එවැනි දේශපාලන පක්ෂ සම්බන්ධයෙන් සම්පූර්ණයෙන් ඈත්ව සිටිනු දැකීම ජාති හිතෛෂී කාගේත් සතුටට කරුණකි.

පක්ෂ හා බලකාමී දේශපාලනයෙන් මිදුනු සංස්ථාවක්

ප්‍රජාතන්ත්‍රවාදී සංස්ථාවන්ගේ ක්‍රියාකාරිත්වය සඳහා දේශපාලන පක්ෂ අත්‍යවශ්‍ය නොවේ. අපගේ වර්තමාන පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය වනාහි ප්‍රජාතන්ත්‍රවාදී සමාජ ක්‍රමය ආරක්ෂා කර ගැනීමට යොදා ගත හැකි එකම දේශපාලන ආයතන ක්‍රමය හැටියට සැලකීම ද අනුවණකමකි. නිදහස් ලංකාවේ බහුතර ජනතාවගේ අපේක්ෂාවන් සපුරාලීමට අපොහොසත් වූ මේ දේශපාලන සංස්ථාවන් ගැන අද අපට නිගමනය කිරීමට සිදුව තිබෙන්නේ, ඒවා ප්‍රජාතන්ත්‍රවාදී මූල ධර්ම

වරදවා යොදාගෙන අන්ධ විශ්වාසයෙන් අනුගමනය කළ වැරදි ක්‍රම හැටියටය. ප්‍රජාතන්ත්‍රවාදයයි – හංවඩු ගසා ගත් වැරදි ක්‍රියා මාර්ග පිළිගෙන, ව්‍යාජ පක්ෂ දේශපාලනය කෙරෙහි විශ්වාසය තැබීමෙන්, අපගේ මනුෂ්‍ය දක්ෂතාවන් ද ද්‍රව්‍යමය වස්තුව ද මෙපමණ කල් විනාශ වී ගිය බව අපි අවංකව පිළිගත යුතු වෙමු. ඇත්තවශයෙන්ම පක්ෂ දේශපාලනය මුල්කොට ප්‍රජාතන්ත්‍රවාදය යැයි කියා ගත්තේ ප්‍රජා භේදවාදයක් නොවේ ද?

නියම ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම විය යුත්තේ මහ ජනතාවයි. ජාතියෙහි මූලික ඒකකය වූ–ගැමි ප්‍රජාව පදනම් කරගෙන ප්‍රජාතන්ත්‍රවාදී සමාජ ක්‍රමය ගොඩනැගිය යුතුය. වර්තමානයෙහි ක්‍රියාත්මක වන ව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදයේ සම්පූර්ණ බර, ගැමි ප්‍රජාව මත වැටී ඇති අතර, පක්ෂ නිසා මිනිසා විසින් මිනිසුන් බෙදන තවත් සාධකයක් අද ඔවුන් අතරට ඇතුල් වී තිබේ. උසස් ගුණ ධර්ම වන ආත්ම පරිත්‍යාගය, සේවය සහ අභ්‍යන්තරික පාරිශුද්ධතාව ලබා ගනු වෙනුවට, දේශපාලන පක්ෂවලින් සිදුවන්නේ ඉතා පහත් අපේක්ෂාවන් වූ බලය, නිලය, තත්වය සහ ධනය ලබා ගැනීම සහ ආරක්ෂා කර ගැනීම පිණිස කැප වුණු ආත්මාර්ථකාමී පිරිසක් බෝවීමය. අප දිවයිනේ ඇති සියලුම දේශපාලන පක්ෂ මෙම සාමාජික පරිහානියට වගකිව යුතුය. මෙසේ කල්පනා කරන විට, බෞද්ධ ජාතික බලවේගය කිසිම දේශපාලන පක්ෂයක් හා සමග අත්වැල් බැඳගෙන නොසිටීම නියම මග යැමට ගත් ඥානවන්ත පියවරක් සේ සැලකිය හැකිය. බෞද්ධ ජාතික බලවේගය පිළිගත් ප්‍රඥප්ති දශයෙන් එක් ප්‍රඥප්තියකින් මේ බව නොවළහා කියැවෙයි.

ප්‍රජාතන්ත්‍රවාදයේ නියම ලක්ෂණ වශයෙන් සැලකිය හැක්කේ, මහජන නියෝජනය, සාධාරණ පාලනය සහ අපක්ෂපාතී අධිකරණය යන ත්‍රිවිධ අංශයි. මහජනතාව විසින් ම තම තමන් පාලනය වන මූල ධර්ම හා නීති රීති පනවා ගැනීමේ අයිතියක් ඔවුන්ට ඇත්තේය. එම නීති රීති නිසියාකාරව ක්‍රියාවේ යෙදෙනු පිරික්සා බැලීම හා නීතියේ රැකවරණය අනුව, මහජනතාවට අපරාධවලින් හා හිංසාකාරී ක්‍රියාවලින් නොපෙළී, සතුටින් හා සාමයෙන් ජීවත් වීමට ඇති සමාජයීය අභිප්‍රාය සපුරාලීම ද ප්‍රජාතන්ත්‍රවාදී සමාජ ක්‍රමයෙන් ඉටු විය යුතු ය. එමෙන් ම තමන්ගේම ප්‍රගතිය සඳහා ඉවහල්වන සියලු ම ප්‍රයෝජනවත් ක්‍රියාවන්හි යෙදීමට අවශ්‍ය අවස්ථා ඔවුනට තිබිය යුතුය.

පක්ෂ ක්‍රමයක අවසාන ප්‍රතිඵලය වනුයේ, එයින් බලා පොරොත්තු වූ මුල් පරමාර්ථවලට ප්‍රතිවිරුද්ධ වූ ප්‍රතිඵල ලැබීමයි. දේශපාලන පක්ෂවලින් මහජනයා අතර වැපිරෙන බීජ නම් කේවලත්වය, වෛරය, ගුඪභාවය, නොඉවසීම සහ අවිශ්වාසයයි. එහෙත් සියලුම දේශපාලන පක්ෂවලට අයිති මහජනයා ඇතුළත් වී එකමුතු වී, පිරිසිදු වී සියලු දෙනාගේම යහපත සහ ශුභ සිද්ධිය සඳහා ක්‍රියා කිරීමට ඉඩකඩ තිබෙන සංවිධානයක අගය පිළිබඳව කිසිවෙකුට වාද කළ නොහැක.

අපේ පාර්ලිමේන්තු ක්‍රමයෙහි සදාකාලික විරුද්ධ පක්ෂයක් තිබීම අගේ ඇති අංගයක් ලෙස වටහාගෙන, අපේ රටේ ආණ්ඩු ක්‍රමය සකස් කළ පණ්ඩිතයෝ, ආණ්ඩු පක්ෂය සහ විරුද්ධ පක්ෂය අතර සමතුලිත භාවය ඇති කිරීමේ අවශ්‍යතාව ගැන ද කල්පනා කළෝය. මේ අරමුණ ඉටු කිරීම සඳහා "එංගලන්තයේ රැජිනිය සිටින්නාක් මෙන්" ඔවුහු බලයෙන් තොර, එහෙත් උත්සව අවස්ථාවල දී පමණක් ප්‍රධානියා ලෙස ක්‍රියා කරන රාජ්‍ය නායක තනතුරක් "අග්‍රාණ්ඩුකාර වරයෙක්"ද (දැන් විධායක ජනාධිපති ක්‍රමය බලපැවැත් වෙයි.) ඇති කළෝය. නියම විධායක බලයක් මොහු සතුව නැත. මෙම විධායක බලය පැවරී ඇති නියම රාජ්‍ය නායකයා වන අගමැතිවරයා, ඡන්ද දායකයින්ගෙන් කොටසක පමණක් නායකයෙකි. හෙතෙම වැඩි ආසන ගණනක් ලබා ගත් පක්ෂයෙහි දේශපාලන නායකයා ද වන්නේය.

ජනාධිපති හෝ අග්‍රාණ්ඩුකාර හා අගමැති යන නිල දෙකම ඒකාබද්ධ කොට සකස් කොට ගත් විධායක බලතල ඇති රාජ්‍ය නායකයකු හා ඔහුගේ කාර්ය පහසුව සඳහා සමාජයේ හැම දක්ෂතාවන්ගෙන්ම නියෝජනය වූ විධායක මණ්ඩලයකට ද, රටට ඔබින සංවර්ධන සැලැස්මක් අදට වඩා පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකි වනු නො අනුමානය. මෙම රාජ්‍ය නායකයාට මැතිවරණ කටයුතු ගැන වෙහෙසීමට හෝ කාලය මිඩංගු කිරීමට ඉඩ නො තැබිය යුතුයි. රාජ්‍ය කටයුතු මහජනයා කෙරෙහි බලපාන අයුරු හෝ මහජන යහපත සඳහා රාජ්‍ය කටයුතු එල්ල විය යුතු අන්දම ගැන රාජ්‍ය නායකයාට උපදෙස් දීමේ වගකීම් මහජන නියෝජිතයින්ගෙන් සමන්විත පාර්ලිමේන්තු උපදේශක සභාවකට පැවරිය හැකිය. මහජන නියෝජිත මණ්ඩලයට මුදල් පිළිබඳ සම්පූර්ණ වගකීම පැවරෙන හෙයින්, රාජ්‍ය නායකයාගේ හ විධායක මණ්ඩලයේ අයුතු දරදඬු පාලනය කෙරෙහි බලපෑමට මෙම උපදේශක සභාවන්ට අවස්ථා සැලසෙන්නේය.

රජයේ විවිධ දෙපාර්තමේන්තු අතර අන්‍යොන්‍ය සම්බන්ධතාවන් ඇති වන අන්දමින් කාර්ය සංවිධානය කිරීමෙන්, රජයේ අරමුණු හා වැඩ පිළිවෙලවල් අද මෙන් නොව, ඉතා ඉක්මනින් ක්‍රියාවට පෙරළීමට පහසු වන්නේය. රජය මගින් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළවල් වරින් වර තක්සේරු කිරීමට හා ගුණදොස් සෙවීමට ඇගයීම් මණ්ඩලයක්ද පත් කළ යුතුය. මීටත් වඩා වැදගත් වන්නේ ලක්දිව දිස්ත්‍රික් පාලන ඒකකයන් පිහිටා තිබෙන අයුරු සියුම් ලෙස විග්‍රහ කොට, නැවත වරක් රටේ විද්‍යාත්මක සංවර්ධනයට අදාළ වන පරිදි ගංගාවන් හා අන්‍ය වාරිමාර්ග ක්‍රම කේන්ද්‍රස්ථාන කොට, එම පාලන මණ්ඩල සංවිධානය කර ගැනීමේ භාරදූර කාර්යයයි.

මේ එක් එක් දිස්ත්‍රික් පාලන මණ්ඩලය තුළ එය පිහිටි ප්‍රදේශයේ මහජන මතය පිළිබිඹු වීම අවශ්‍ය වේ. මහජන නියෝජිතයින්ගෙන් සමන්විත මෙම ප්‍රාදේශීය පාලන මණ්ඩලවලට පැවරෙන කාර්යයන් මනාව ඉටු කර ගැනීම සඳහා මුදල් පාලනය ද විමධ්‍ය ගත කළ යුතු වේ. එහෙත් මෙම ප්‍රාදේශීය පාලන මණ්ඩල තුළ ද තව වරක් පාලන බලය විමධ්‍ය ගත වී, අවසාන පාලන ඒකකය විය යුත්තේ, ගම්බද නම් ඉඩම් අයිතිය හා පාලනය පිළිබඳ වැදගත් ප්‍රතිසංස්කරණ කොට, නව ජීවනයක් ලබා දුන් සම්ප්‍රදායික ගම්මානයන් ද, නගර බදව නම්, කර්මාන්ත විමධ්‍ය කිරීමෙන් සකස් කරගත් සුලු නගර ද වේ. මෙම ගම්වල හා නගරවල එහි නා නා සාමාජික අංශයන් එකට වෙලා සමස්තයක් ලෙස සකස් කිරීමට ද, ආර්ථික සාධාරණත්වය හා සංස්කෘතික සංවර්ධනය ඇති කිරීමෙහි ද සම්පූර්ණ බලතල පැවරෙන ග්‍රාම මණ්ඩල හා සුලු නගර මණ්ඩල පිහිට විය යුතුය. තම කොටසෙහි පිහිටි අධ්‍යාපනික පහසුකම් වැනි පොදු දේ භුක්ති විඳීමට සෑම කෙනෙකුට ම සම අවස්ථා සලසා දීම ද, ආරෝග්‍යශාලා හා සමාජ සේවා මගින් සැලසෙන යහපත තම සාමාජිකයන්ගේ ප්‍රයෝජනය සඳහා යුක්ති ගරුකව ලබා දීම ද, මෙම ග්‍රාමීය පාලන මණ්ඩලවල වගකීම වන්නේය.

මෙසේ පාලන හා පහසුකම් විමධ්‍යගත කිරීමෙන්, සෑම රටවැසියකුටම අලුත් නිදහසක් හා සුරක්ෂිත භාවයක් භුක්ති විඳීමට හැකි වන්නේය. එසේම මුලු රටම සමස්තයක් ලෙස සැලකීමට හා සමාජයේ දැනට පවතින නොයෙකුත් බෙදීමේ බලවේග සම්පූර්ණයෙන් තුරන් කිරීමට ද පොහොසත් වන්නේය. මහජනයාගේ ඉරණම මහජනයා විසින්ම විසඳා ගන්නා මෙවැනි විමධ්‍යගත පාලන තන්ත්‍රයක් මගින්

රටකට සමෘද්ධිය, සෞභාග්‍යය හා සතුට ඉක්මනින් ළඟා කර දිය හැකි බව පැහැදිලිය.

තම එකම පරමාර්ථය බලය තහවුරු කර ගැනීම ලෙස සලකන දේශපාලන පක්ෂයක් මෙන් නොව, නියම මහජන අරමුණු හා ප්‍රාර්ථනාවන් ලෙස ගිනිය හැකි මෙවැනි ක්‍රමානුකූලව සකස් වූ විප්ලවකාරී වැඩ පිළිවෙලක් "ජන හිත" ඉදිරියෙහි තැබීමෙන් බෞද්ධ ජාතික බලවේගයට තම මාතෘ භූමියට අගනා සේවයක් ඉටු කිරීමට අවස්ථාව එළඹී තිබේ.

බෞද්ධ ජාතික බලවේගය පක්ෂ දේශපාලනයට සම්බන්ධ බලවේගයක් නොවේ. එහෙත් එය මුළු සමාජයම පිරිසිදු කිරීමේ කාර්යයෙහි යෙදෙන බලවේගයකි. එය අධ්‍යාපනික බලවේගයකි. වැරදි සොයා නිවැරදි කිරීමේ බලවේගයකි. තව ද එය නිර්මාණාත්මක බලවේගයක් ද වේ. පක්ෂ දේශපාලනයෙන් ඈත් ව සිටිමින් තම පරමාධ්‍යාශයන්ට එකඟ ව. ලක්දිව දේශපාලනයට නියම මග පෙන්වීමක් දීමට සමත්, සදාචාරමය බලවේගයක් ඇති කිරීම බෞද්ධ ජාතික බලවේගය විසින් නොවළහා පිළිගත යුතු වගකීමකි.

අරමුණ මග හා සැලැස්ම

අප යන්නේ කොහේ ද? අප යන්නේ කුමන මාර්ගයකින් ද? අප යන්නේ කෙසේද? යන ප්‍රශ්න ඕනෑම ජාතික ව්‍යාපාරයකට සම්බන්ධ වීමට පෙර පොදු මහජනයා විසින් නගනු ලැබෙත්. වෙනත් වචනවලින් කිවහොත්, මහජනයාගේ මනැස ඉදිරියේ අප ව්‍යාපාරයේ අරමුණ, අප ගන්නා ක්‍රියා මාර්ගය සහ වැඩපිළිවෙල ගැන හොඳ අවබෝධයක් තිබිය යුතුය.

බලවේගයේ පළමුවැනි ප්‍රඥප්තිය

බෞද්ධ ජාතික බලවේගයේ සාමාජිකයෝ ඔවුන්ගේ පළමුවෙනි ප්‍රඥප්තියෙන් ලංකා භූමියෙහි ආර්ථික, සාමාජික හෝ දේශපාලනමය කිසිම අංශයකින්, මිනිසා විසින් මිනිසුන් පෙළීමේ ස්වභාවකින් තොර වූ යුක්තිය, සාධාරණත්වය සමානත්වය සහ සියලු දෙනාගේම යහපත ඉස්මතු වී පෙනෙන බෞද්ධ සාමාජික පිළිවෙතක් බිහි කිරීමට ප්‍රතිඥා දෙති.

බෞද්ධ සාමාජික පිළිවෙතක් හෝ බෞද්ධ සමාජ ක්‍රමයක් යන්නෙන් අප අදහස් කරන්නේ කුමක් ද? බෞද්ධ ජාතික බලවේගය

මෙම පැනයට පැහැදිලි පිළිතුරක් සෙවීමේ මහඟු ප්‍රයත්නයක දැන් යෙදී සිටියි.

මේ සඳහා රාජ්‍යය පිළිබඳ බෞද්ධ දර්ශනය, රාජ්‍යයේ ස්වභාව සහ බලය රැඳෙන ආයතන, රජයේ ආයතන ක්‍රියාත්මකවීමේ දී අනුගමනය කළ යුතු මූලික ප්‍රතිපත්ති හා සිද්ධාන්ත, රජයේ සේවකයින් සහ මහජන නියෝජිතයින් තුළ තිබිය යුතු ගුණාංග සදාචාර විධි සහ සුදුසුකම් යනාදී වැදගත් ප්‍රශ්න රාශියක් නිරාකරණය කරගෙන යනු ලැබේ. මෙහි දී ආර්ය අෂ්ටාංගික මාර්ගය සමාජමය අංශයෙන් ක්‍රියාත්මක කළ හැකි පිළිවෙළ, චතුර් සංග්‍රහ වස්තුවෙන් පෙන්වන පාලන මූලධර්ම, දශරාජ ධර්මයෙන් ඉගැන්වෙන පාලකයෙකු තුළ විද්‍යමාන විය යුතු ලක්ෂණ, මහා පරිනිබ්බාන සූත්‍රයෙන් පිළිබිඹු වන මා හැඟි සමාජ ධර්ම යනාදී වටිනා උපදෙස් රාශියක පිළිසරණ සෙවීම අවශ්‍ය වේ. මේ සියල්ලගේ ම ආභාෂය සහ ආශිංසනය ලැබීමෙන් ය, අපට බෞද්ධ සාමාජික පිළිවෙතක් ගැන පැහැදිලි අවබෝධයක් ඇති කර ගත හැක්කේ.

ක්‍රියා මාර්ගයේ පිරිසිදු භාවය

උතුම් අරමුණක් ඉදිරියේ තබා ගෙන එය ඉටු කර ගැනීමේ අභිලාෂයෙන් පහත් ක්‍රියා මාර්ග අනුගමනය කිරීමේ නුනුවණ සහ බියගුලු සිද්ධීන් නිසා මුලු මනුෂ්‍ය වර්ගයාට විඳින්නට සිදුවී තිබෙන අසීමිත දුක් ගැහැට කියා නිම කළ නොහැක. සංවිධානාත්මක ආගම් හා දේශපාලන සංස්ථාවන් විසින් මහජනයා ඉදිරියේ තැබූ ඉලක්ක කෙතරම් උසස් වුවත්, එම ඉලක්ක ඉටු කර ගැනීම සඳහා ඔවුන් යෙද වූ පහත් උපාය මාර්ගයන් නිසා මධ්‍යස්ථව කල්පනා කරන සියලුම ශිෂ්ඨ ජනයා ඔවුන් ගැන කලකිරීමට පත් ව සිටිති. එහෙත් ආරම්භයේ සිටම බෞද්ධ ජාතික බලවේගය විසින් අනුගමනය කරනු ලැබුවේ ඉතා පිරිසිදු ක්‍රියා මාර්ගයකි. මෙහි සාමාජික භවත්හු ඉතා දැඩි ආත්ම දමනයකින් යුක්ත වීම සඳහා දුෂ්කර රීති සංග්‍රහයකට ප්‍රතිඥා දී තිබේ. පෞද්ගලික ව එක් විධියක සදාචාරාත්මක පිළිවෙතකුත් පොදු මහජන ජීවිතයේදී ඊට ඉඳුරාම වෙනස් සදාචාරාත්මක පිළිවෙතකුත් අනුගමනය කිරීමට ඔවුන්ට ඉඩ නැත.

"ඔවා දෙනු පරහට – තමා සම්මතෙහි පිහිටා සිට" යන පැරණි පඬිවදනට ද , "යථාවාදී, තථාකාරී" යන බුද්ධ වචනයට ද ඔවුහු බැඳී සිටිත්. ඔවුන්ගේ ආදේශ හා පරිචයන් එක සමාන විය යුතුයි. බෞද්ධ

ජාතික බලවේගයේ මෙම අනගි ආදර්ශයෙන් මුලු මහත් සමාජයට මහඟු පාඩමක් ඉගෙන ගැනීමට හැකි වනවා මෙන්ම, වෙසෙසින් අපේ දේශපාලන සහ රාජ්‍ය සේවයන්හි යෙදී සිටින මහජන සේවකයන් තුළ විශාල සදාචාරාත්මක පෙරළියක් මේ නිසා ඇති වන බව මගේ දැඩි විශ්වාසයයි.

ලංකාවෙහි බෞද්ධ සමාජ ක්‍රමයක් පිහිටුවීමට අප ගන්නා උදාර පරිශ්‍රමයේ ප්‍රතිඵලවල නියම සාර්ථකත්වය රඳා පවතින්නේ, අපේ සිත් සහ හදවත් තුළ ඇති වන පිරිසිදුකම අනුවය. ආභ්‍යන්තරික පාරිශුද්ධතාවක් නොමැතිව, කිසි විටෙක සැබෑ ආදීනත්වයක් කිසිවෙකු තුළ ඇති වන්නේ නැත. අපේ සිතිවිලි පිරිසිදු නොවුවහොත්, අප ගන්නා තීරණයන් අවිනිශ්චිත භාවයෙන් ද, අප කරන ක්‍රියා කලබලකාරී ස්වභාවයෙන් ද වෙලී යනු නියතය. මෙවැනි අභ්‍යන්තරික පරිශුද්ධතාවක් ඇති කර ගැනීමට කැමැති බෞද්ධයාට නිතරම පිළිසරණ වන්නේ අපේ නිර්මල බුද්ධ දේශනයෙහි මධ්‍ය අදහස හැටියට සිතිය හැකි සියලු සංස්කාර ධර්මයන්ගේ අනිත්‍ය, දුක්ඛ හා අනාත්ම ස්වභාව අවබෝධ කර ගැනීමට පරිශ්‍රම දැරීමයි.

මෙය ඉතා පෞරාණික ධර්මයක් මෙන් ම, වර්තමානයට ද සත්‍යමය ඉගැන්වීමකි. බොහෝ සරල ඉගැන්වීමක් මෙන්ම, ඉතා ගැඹුරු අත්දැකීම්වලට ද මග පෙන්වන්නකි. "කරන ක්‍රියාව" මිස "කරන තැනැත්තෙක්' නැත්තේය. යන ඉගැන්වීම නිතරම අපගේ සිහියේ තබාගත යුතුය.

කොතැනක කෙබඳු වරදක් දුටුව ද, එයට විරුද්ධව නිර්භයව සටන් කිරීමටත්, "වරද කරන්නා" හා "වරද" වෙන් වෙන්ව හඳුනා ගැනීමටත් මේ නිසා අපට පුරුදු වේ. එය නිතරම අප බෞද්ධ මාර්ගයේ ම ගමන් කරවයි. "මා–මගේය" යන ආත්ම දෘෂ්ටිය තුනී කර ගනිමින්, බෞද්ධ ජාතික බලවේගයේ සමාජ සංශෝධන ක්‍රියා නැමැති මහා සාගරයෙහි ජල බින්දුවක් බවට පරිවර්තනය වෙමින්, යම් බෞද්ධ පිරිසක් එක්තැන් වුවහොත්, ඔවුන්ට මේ මුලු සමාජයම පිරිසිදු කිරීමට ධෛර්යයක් ඇති වේ. "ජන සිත"ට අවශ්‍ය වන්නේ ප්‍රාරම්භක සංඥාවක් පමණකි. මෙම සංඥා මාර්ගයෙන් තමන් වෙත ඉදිරිපත් කළ ගුණ ධර්ම පිළිගෙන ආරක්ෂා කිරීමට මුලු ප්‍රජාවම පෙළඹෙනු ඇත.

සැලැස්ම

බෞද්ධ ජාතික බලවේගයේ පරීක්ෂා කළ යුතු තුන් වැනි අංශය නම්, එහි මනා ලෙස සංවිධානය වූ ක්‍රියා මාර්ගයයි. බෞද්ධ විරෝධී හෝ ජාති ද්‍රෝහී හෝ ආක්‍රමණ පිළිබඳ තර්ජන ගැන පමණක් සිහි කරවමින්, "ජන හිත" දිගු කලක් සෝදිසියෙන් හා ප්‍රබෝධමත් ව තබා ගැනීම, දුෂ්කරය. ඉතා පුලුල් උත්තරීතර ඉලක්කය වූ බෞද්ධ සමාජමය පිළිවෙතට අනුකූල වූ උත්පාදක සැලැස්මක් මහජනයා ඉදිරියේ තැබීම වැදගත්ය.

පළමුව බෞද්ධ සමාජමය පිළිවෙත පරමාධ්‍යාශ කොට ගෙන ජාතියේ සංවර්ධනය ඇති කරලීමට පටහැනි වන්නා වූ සියලුම අසාධාරණ බාධකයන් දුරු කිරීමේ පවිත්‍ර චේතනාවෙන් අහිංසාවාදී හා ප්‍රජාතන්ත්‍රික සාමූහික ක්‍රියාවන්හි නිරත වීම සඳහා සියලුම මහජනයා පෙළඹවීමට සමත් සැලැස්මක් පිළියෙල කරගෙන යනු ලැබේ. අප සමාජයෙහි ඉතිරිව තිබෙන යටත් විජිත යුගයේ නටබුන් සියල්ල ද අධිරාජ්‍යවාදී පාලකයින් විසින් අප පිට පැට වූ බංකොලොත් ශිෂ්ටාචාරයද, අනුකම්පා විරහිතව මේ රටින් තුරන් කළ යුතුය.

මෙවැනි විදේශීය බලපෑම් නිසා යටපත් වී, සැඟවී ගිය ආදී සංස්කෘතික හා ආගමික උරුමයන් නැමැති නිධාන වස්තු නැවත වරක් මතු කොට ගෙන, නූතන විද්‍යාවේ අනුසාරයෙන් ඒවා ප්‍රතිසංස්කරණය කොට ඔප දමා, අනාගත පරම්පරාවේ ප්‍රයෝජනය සඳහා ආරක්ෂා කොට තැබිය යුතුය. තීරණාත්මක අවස්ථාවකට පත්ව ඇති ලෝක ශිෂ්ටාචාරය ඉදිරියේ, මේ ධර්මද්වීප වාසී අපට මාහැඟි මාර්ගයක් පෙන්වීමට විශේෂ ඓතිහාසික වරමක් ලැබී තිබෙන බව මතක තබා ගනිමු. අපේ අයිතිවාසිකම් රැක ගැනීමත්, ලෝකයට අපෙන් ඉටු විය යුතු මේ යුතුකම ඉටු කිරීමත් කඩාකප්පල් කිරීමට සර් අයිවර් ජෙනිංග්ස්ගේ නූතන ලංකාණ්ඩු ක්‍රම සංස්ථාවට හෝ අපේ බටහිර ස්වාමි පක්ෂයේ භාෂාවට හා සංස්කෘතියට හෝ ඉඩදී, නිකමුන් මෙන් සිටීම – වීර බෞද්ධ ජනතාවට තරම් නොවේ.

දෙවනුව, ආගමික, ආර්ථික හා සමාජමය ඈ නන් වැදැරුම් ක්ෂෙත්‍රයන්හි විවිධ ප්‍රයෝජනවත් කටයුතුවල පෞද්ගලිකව හා සාමූහිකව යෙදීමට, සෑම බෞද්ධයෙකුට ම මෙම සැලැස්මෙන් ඉඩ කඩ සැලසෙන්නේය. ආගමික අංශයෙහි සදාචාරමය හා ආධ්‍යාත්මික පුනර්ජීවයක් උදා කිරීම සඳහා බුද්ධ ධර්මය ඉගෙනීමට හා පිළිපැදීමටද,

පැරණි පූජනීය ස්ථාන ආරක්ෂා කිරීමට හා ප්‍රතිසංස්කරණය කිරීමටද, ආධ්‍යාත්මික දියුණුව ඇති කරන පොදු සාමූහික මධ්‍යස්ථාන ලෙස නැවත වරක් අපේ ආරාම දියුණු කිරීමට ද, ගිහි – පැවිදි දෙපක්ෂයේ අඩ පණ වී තිබෙන සම්බන්ධය තහවුරු කිරීමට ද විශේෂ තැනක් මෙම වැඩ පිළිවෙළින් ලැබේ.

දරිද්‍රතාවෙන් හා ආර්ථික විෂමතාවයන් නිසා පෙළෙමින් සිටින මහජනතාවට ඒවා මඟ හරවා සාධාරණත්වය ඉටු කිරීම සඳහා රජය විසින් ගනු ලබන සියලුම ප්‍රගතිශීලී සමාජවාදී පියවරවල් බෞද්ධ ජාතික බලවේගය විසින් අනුමත කරනු ලැබේ. ඒ සඳහා සියලුම ආධාර දෙනු ලැබේ. ඒ අතරම ඉතා සීඝ්‍රයෙන් වැඩිවන ජනගහනයක් ඇති අපේ රටේ පොදු ජනතාවට, ආර්ථික සම්පත් නිසි සේ නොලැබීමට හේතුව වනුයේ, ආර්ථික සාධකයන් නිසි සේ ඒකාබද්ධ කොට, ජාතික සංවර්ධන සඳහා නො යෙදවීම බව රජයට පෙන්වාදීමට අදහස් කෙරේ.

අපගේ ආර්ථික දුබලතාවට සහ පසු බැස්මට ප්‍රධාන හේතූන් ලෙස බෞද්ධ ජාතික බලවේගය සලකන, මුදල්, වෙළඳ හා කර්මාන්ත ක්ෂෙත්‍රයන්හි බිහිකොට තිබෙන ඉතා විශාල ආයතනයන් කෙරෙහි සම්පූර්ණ විශ්වාසය තැබීමේ වරද ද. සර්වප්‍රකාරයෙන් ම, ස්වයංපෝෂිත වූ අංග සම්පූර්ණ දියුණුවක් ලබාගත හැකි ආර්ථික ක්‍රමයක් වෙනුවට මුදල් භෝග කිහිපයක් පමණක් මත ගොඩනැගුණු ආනායන–අපනයන ආර්ථික ක්‍රමයක දුර්විපාක ද, පුරවැසියන් සියලු දෙනම සම්බන්ධ වී සකස් වෙන හා ක්‍රියාත්මක වන ස්ථිර ඒකාබද්ධ ජාතික සංවර්ධන සැකැස්මක් නැතිවීමේ බලවත් පාඩුව ද යන ත්‍රිවිධ දුර්වලකම් ඉක්මනින් නැති කිරීම වැදගත්ය.

බෞද්ධ ජාතික බලවේගය විසින් බලයට පත්වන රජයක් ඉදිරියෙහිද සාමාන්‍ය ජනතාව ඉදිරියෙහි ද මෙවැනි දුර්වලතාවන් මඟ හැරීමට සමත් යෝජනාවන් තැබීමට මහන්සි ගන්නා අතරම, රටවාසීන් තුළ ස්වභාවයෙන්ම පිහිටි ජන ශක්තිය පුබුදුවා, සෑම අවස්ථාවේදීම රජයේ ආධාර කෙරෙහිම මහජනතාවට බලා පොරොත්තුවීමට පුරුදු නොකොට, ඔවු නොවුන්ගේ අවශ්‍යතාවන් මුදුන් පමුණුවා ගැනීමට හා ප්‍රජා සංවර්ධන කටයුතු සඳහා ද, ශ්‍රමදාන සිද්ධාන්ත මුල්කොට ගත් ක්‍රියා මාර්ග ආරම්භ කරන්නේය.

සමාජමය අංශයෙහි කුලභේදය, ජාති භේදය, අල්ලස් හා දූෂණ නෑ මිත්‍රයින්ට විශේෂ ආධාර දීම, නීත්‍යානුකූලව හෝ නීති විරෝධීව කවුරුන් විසින් හෝ මත්පැන් නිෂ්පාදනය, විකිණීම හා බීම, ජාති

විරෝධී, සමාජ ද්‍රෝහී දුසිරිත් සහ ආගමට හා සංස්කෘතියට පටහැනි සදාචාර විරෝධී හැසිරීම් ක්‍රම සහමුලින්ම සමාජයෙන් උදුරා දැමීමට බෞද්ධ ජාතික බලවේගය විශේෂ පරිශ්‍රමයක් ගන්නේය.

තුන් වැනි ව අවශ්‍ය – වන්නේ නූතන විද්‍යා යුගයට කිසිසේත් නොගැලපෙන පක්ෂ දේශපාලන ක්‍රමයෙහි අයෝග්‍යතාව ය හා ඉන් සිදුවන දුර්විපාක ගැන මනා අවබෝධයක් මහජනයාට ලබා දීමයි. ඒ වෙනුවට, ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම වඩා හොඳින් ක්‍රියාත්මක වන, රටේ සෑම පුරවැසියකුටම තමන්ගේ පාලන තන්ත්‍රය කෙරෙහි වඩා හොඳින් සහභාගිව සේවය කිරීමට අවස්ථා සැලසෙන, දේශපාලන පක්ෂ ක්‍රමයෙන් තොර වූ, ප්‍රජා පාලන පිළිවෙළක් මහජනයා ඉදිරියේ තැබීමද බෞද්ධ ජාතික බලවේගයේ වගකීමයි. මේ කාර්යය සපුරාලීමේදී බෞද්ධ ජාතික බලවේගය කෙලින්ම හෝ අනියම්ව හෝ පක්ෂ හා බලකාමී දේශපාලන පොර පිටියට නොබසිනු ඇත. එය ක්‍රියා කරන්නේ හුදෙක් විජාතික මිථ්‍යා දෘෂ්ටික ක්‍රමයක ඇලී ගැලී ක්‍රියා කරන බලකාමී පිරිසකගේ හා ඔවුන් අනුව අන්ධ භක්තියෙන් පක්ෂ ක්‍රමය පසුපස ගොස් දේශපාලන ගැලවීම සෙවූ අහිංසක ජනතාවකගේ නෙත් සිත් සම්‍යක් මාර්ගයකට යොමු කිරීමේ අධ්‍යාපනික බලවේගයක් ලෙසය. ඒ හැර පක්ෂ දේශපාලන කාන්තාරයට ගොස් මංමුලාවීමට වෙර දරන, තවත් දේශපාලන කණ්ඩායමක් ලෙස නොවේ.

පක්ෂ හා බලකාමී දේශපාලන වනාහි, බෞද්ධ සමාජ ක්‍රමයක් හා ජනතා දේශපාලනයක් ගොඩ නැඟීමට විරුද්ධව තිබෙන විශාලම බාධකය බව මගේ පිළිගැනීමයි.

ප්‍රාර්ථනාව

බෞද්ධ ජාතික බලවේගය මට පෙනුණේ මේ අයුරින්ය. දිනෙන් දින පිරිහෙන සමාජයක් දකිමින්, සුසුම් හෙලූ අපේ සිතටත් – හදවතටත් බෞද්ධ ජාතික බලවේගයේ වැදගත්කම කාවැදුණේය. මහා සංඝරත්නයේ ආශිර්වාදය හා අනුශාසනය ලබා ගනිමින් බෞද්ධ දර්ශනයේ හා ප්‍රතිපත්තිවල උතුම් අරමුණු ඉස්මතු කර ගනිමින් එක් සිත් ඇති බෞද්ධයන් සමූහයක්, මෙසේ අහිංසාවාදීව මහා සමාජ පෙරළියක් සඳහා එක්වීම ප්‍රශංසනීයයි.

විද්‍යාව හා ආධ්‍යාත්මික යුගය උදාවීමට ඉතා ආසන්න බව මම නැවත වරක් මතක් කරමි. ඒ නිසා විශ්වමය දර්ශනයක් සහ මිනිස්

සමගිය ගැන කැක්කුමක් අප කා තුළත් රෝපණය විය යුතු ය. මනුෂ්‍ය ඉතිහාසයේ තීරණාත්මක අවධියක වාසය කරන අපගේ අසමගි වූ, ඊර්ෂ්‍යා සහගත වූ, ආගමින් ඈත් වූ පොදු මනුෂ්‍ය සේවයට නුසුදුසු වූ, ජීවිත පිරිසිදු කොට, නව බෞද්ධ සමාජ ක්‍රමයක් මේ රටේ ගොඩනැංවීමටත්, ඒ මගින් සමස්ත ලෝකවාසීන් වෙනුවෙන් විද්‍යා හා ආධ්‍යාත්මික යුගය උදා කර ලීමටත් බෞද්ධ ජාතික බලවේගය දිනෙන් දින ශක්තිමත් වේවා යයි ද, ඒ සඳහා සෑම දේශ ප්‍රේමියෙකුගේ ම ආශිර්වාදය හා සහාය ලැබේවා යයි ද පතමි.

සියලු සත්වයෝ සුවපත් වෙත්වා!*

---

* මේ ලිපියෙන් 1963 දී මාගේ සිතේ බලපැවැත් වූ අදහස් දැක්වේ.

69
රුවන් මඩුව පවුල් ගොවිපළ



ඡායාරූප: 288
යූ. බී. විජේකෝන් මහතා

වවුනියාව දිස්ත්‍රික්කයේ, සර්වෝදය කටයුතුවලට පදනම වැටුණේ එක්දහස් නමසිය හැටඑකේ ජනවාරි මස අටවැනි දින, එවකට එම දිස්ත්‍රික්කයේ දිසාපති ධුරය ඉසිලූ එන්. එච්. එම්. සෙනෙවිරත්න මහතා ගෙන් මා ලද ලිපියක ප්‍රතිඵලයක් වශයෙනි. ආචාර්ය විනෝබා භාවේ තුමා ගැනත්, එතුමාගේ අඩි පාරේ යමින් අප දියත් කොට තිබෙන ලංකා සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය ගැනත්, වවුනියාවේ ජනතාවට තේරුම් කරදීම සඳහා පැමිණ දේශන කීපයක් පැවැත්විමට එතුමා ආරාධනා කොට තිබුණේය. ඉතා කැමැත්තෙන් එය භාරගත් මම, වවුනියාවට ගොස් එම ඉල්ලීම ඉටු කළෙමි.

වවුනියා කෝරළයේ සිංහල සහ දෙමළ ජනතා නියෝජිතයනට වවුනියා මහා විද්‍යාලයේදී දේශනය බැගින් පවත්වා, ප්‍රදේශයේ සංවර්ධනය ගැන ඉතා සාර්ථක සම්මන්ත්‍රණ දෙකක් පැවැත්වීමු. එකල වවුනියාව සිංහල කොට්ඨාශයේ ආදායම් පාලක නිලධාරී වූයේ පසු කලක ඇමතිවරයෙකු වූ යූ. බී. විජේකෝන් මහතාය. ග්‍රාම සංවර්ධන සමිති හා කාන්තා සමිතිවල නියෝජිතවරුද පාසල් ගුරුවරු ද පූජ්‍ය, පූජක පක්ෂවල නියෝජිතයෝ ද මේ රැස්වීම්වලට සහභාගි වූහ.

එක්දහස් නවසිය හැටදෙකේ මාර්තු මාසයේ දී, වවුනියාවේ සිංහල දෙමළ ගම්මාන තිහක් විජේකෝන් මහතා සමඟ බැලීමට ගොස් ගම්වාසීන් දැනුවත් කළෙමි.

මේ සම්බන්ධය නිසා සිංහල–දෙමළ තරුණ–තරුණියන් එකට පදිංචි කොට, සර්වෝදය පවුල් ගොවිපල නමින් ජනාවාසයක් ඇති කිරීමට අපි අදහස් කළෙමු. මේ සඳහා දිසාපති කාර්යාලය විසින්ම

අනුරාධපුර - වවුනියා ප්‍රදේශ සීමාවේ පිහිටි රුවන්මඩුව යන අක්කර පන්සියයක් පමණ වූ දැනට කැලෑ වැවී තිබෙන පැරණි ගම්මානය තෝරා ගන්නා ලදී. එක්දහස් නමසිය හැටදෙකේ මැයි දහවැනි දින, විශේෂ ඉඩම් කච්චේරියක් පවත්වා අප විසින් තොරා ගන්නා ලද තරුණ 30 දෙනෙකුගේ නමින් ඒ ඉඩම් ලබා දෙන ලදී.

වවුනියා නගරයේ සිට සැතපුම් විසි එකක් ඈත අලි, කොටි වලසුන්ගේ රජ දහනක් බඳු වූ මහ වනය මැද පිහිටි රුවන් මඩුව (රත්න මණ්ඩප) නමැති ස්ථානය, දුටුගැමුණු රාජ සමයට අයත් පැරණි ගම්මානයකි. මෙහි සිංහලෙන් කුරුන්දි අටුවා ලියූ ඓතිහාසික ස්ථානයක් බව ජන ප්‍රවාදයේ එයි. එහෙත් කල් යත්ම, පැරණි නටබුන් මැදි කොට, මහා වනාන්තරයක් බවට පත් විය. එහි සිට–ළඟම මනුෂ්‍ය වාසයට දුර සැතපුම් එකොළහකි. යෝජිත ගොවිපළ ඉඩම බැලීමට ගිය මුල් ම ගමන ත්‍රාසජනක සිදුවීම්වලින් ගහණය.

මා, එවකට සර්වෝදය සභාපති ව සිටි ඇල්බට් විජයගුණවර්ධන මහතා ඇතුලු පිරිසක් සමග දුම්රියෙන් වවුනියාවට ගොස්, ආදායම් පාලක නිලධාරිතුමන්ගේ ආගන්තුක සත්කාර ලැබ, පසුදා උදය ජීප් රියකින් මහ වනය බලා පිටත් වීමු. තරමක ජනගහනය සිටි තැනින් තැන වූ කුඩා ගම්මාන පසු කරමින්, ගුරු පාර දිගේ සැතපුම් දහයක් දුර ගොස් පිරප්පන් මඩුවට ළඟා වීමු. එතැන් සිට, සම්පූර්ණ මහ ඝන වනයයි. එතැනදී "අප්පුහාමි" නමැති ගොවියෙක් මඟ පෙන්වීම සඳහා ඉදිරිපත් විය. එතැනට ඔබ්බෙන් ගලපිට වැව නමැති කුඩා වැවකි. එහි ඉස්මත්තේ කුඩා පැල්පත් දහයක පමණ කුඩා ගම්මානයකි. එහි ප්‍රධානියා වූයේ උස් – සිහින් – කලු සිරුරක් හා කුඩා කොණ්ඩයක් හා උඩු රැවුලෙන් හෙබි "කදිරා" නමින් හැඳින් වූ පුද්ගලයෙකි. ඔවුන් ජාතියෙන් සිංහල වුව ද, ව්‍යවහාර කළ භාෂාව වූයේ දෙමළය. පසු කලක දී මේ "කදිරා" නමැති පුද්ගලයා ගොවි පොළට නිතර ආ ගිය හිතවතෙක් බවට පත් විය.

මේ ගෙවල් කීපය හා එහි තිබූ කටු මැටි ගැසූ කුඩා තේ කඩය පසු කළ පසු, රුස්ස ගස්වලින් හෙබි මහා ඝන වනාන්තරය විය. මහා ගස්වලට යටින්, පඳුරුවලින් යුක්තය. ලී කපා නගරයට ගෙන එන ලොරි රෝද පාරවල් ඔස්සේ පිරිස ඉදිරියට ගියහ. දිවා කාලය වුව ද අඳුරෙන් පළාතම වැසී ඇත. තුරු මුදුනක හඬන කුරුල්ලෙකුගේ හඬත්, රෑහැයියෙකුගේ හඬත් දෙසවන වදී. සැතපුමක් දෙකක් පමණ ගිය විට, වම් අත දෙසින් අඩි එකසිය පනහක් පමණ උස අක්කර දෙකක

ප්‍රමාණය ඇති ගල් කුලකි. එහි බෞද්ධ සිද්ධස්ථානයක නටබුන් ඇති බව මහ පෙන්වන්නා විස්තර කළේය.

"නීල කොබෝ ගල" එහි ව්‍යවහාර නාමයයි. ඒ පසු කරත්ම මහා ගස්වල එතුනු ලියවැල් උන්සිල්ලා මෙන් පෙනෙයි. මේ කාලය වියළි සමය වුව ද, තැන් තැන්වල ඇති කලුගල්වල දිය රැඳී ඇත. මේ දිය පිරුණු කුඩා දිය කඩිති ළා කොළ පැහැයෙන් යුත් පාසිවලින් පිරී චමත්කාර දර්ශනයක් ඇති කළේය. තුරු මුදුන්වලින් වැටුණු මල් පෙතිත්, මල් රේණුත්, වියළි කොළත් වන පියසේ බිම අලංකාර කෙරිණි.

ඉඳහිට තුරු වදුලක නිදා හුන් වළි කුකුළන් දෙතුන් දෙනා- මිනිස් හඬින් අවදිව, ගමන් කළ පිය මං හරහා පැන දිවූහ. නීල කොබෙයියන්, අලු කොබෙයියන් ජෝඩු බිම සිට උඩට නැගී වේගයෙන් පියඹා ගියහ.

වරින් වර සිවලෙක් අඩිපාර හරහා පැන දුවයි. අලි-කොටි-වලසුන් බහුල වුවද, ඔවුනගේ මුණ ගැසීමක් එදා සිදු නොවීය.

මෙසේ ඝන වන මැදින් සැතපුම් දොළහක් ගිය තැන රුවන්මඩුව හමු විය. එහි නටබුන් වී ගිය වැවක කණ්ඩියක් දක්නට ලැබිණ. දකුණු පසින් අක්කර පන්සියක ගොවිපලට සුදුසු බවට තීරණය කොට, රජයේ අනුග්‍රහයෙන් ඒ ස්ථානය ලබාගෙන, එම ස්ථානයේ තරුණ පිරිසට නවතින්නට ගොඩනැගිල්ලක් සෑදීමටත්, ආ ගමන් මග රථයක් රැගෙන ආ හැකි පරිදි සකස් කිරීමටත්, ගොවිපළ සැලසුම් කරන ලදී. මුල දී තරුණයන් තිහක ගෙන් සාමුහික ගොවිපල ඇරඹීමටත්, ඒ සඳහා සුදුස්සන් තෝරා ගැනීමට සර්වෝදය පුවත් පතේ දැන්වීමක් පළකොට, අයදුම්කරුවන් කැඳවා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමටත් තීරණය විය. ගෙන ගිය ආහාර වැළඳීමෙන් පසු යළිත් ගමනාරම්භ කොට ආපසු වවුනියාවට ආවෙමු.

තරුණයන් දෙදෙනෙකු අතරමංවීම

පිරප්පන් මඩුවේ සිට පාර සකස් කර ගෙන යද්දී, 1962 මැයි මස හතර වැනි දින සවස්වරුවේ තරුණයන් දෙදෙනෙක් අනිත් පිරිසගෙන් වෙන්වී කැලයට ගියහ. රෑ බෝවන තුරු අනික් පිරිස ඒ දෙදෙනා සෙවූහ. එහෙත් මුණ නොගැසිණි. නවාතැන් පොළට ආපසු පැමිණි පිරිස පසුදා උදෙන්ම අවදිව, හූ හඬින් සංඥා දෙමින් කැලේ ඔබ මොබ ඇවිද්දාහ. මුලු රෑ මුලුල්ලේ වන සතුන්ට බියේ ගසක රැඳී සිටි ඒ දෙදෙනාට, හූ හඬින් සංඥා ලැබී එයට පිළිතුරු වශයෙන් හූ හඬ නැගූහ.

මෙසේ දෙපක්ෂයම හු හඬේ සංඥාව අනුව එකිනෙකා ගැන අනුමාන කළහ.

ඇවිද ගිය පිරිස අන්තිමේදී ගස් ළඟට ළඟා වූහ. ඉක්බිති එකිනෙකා හැඳිනගෙන ගසින් බස්වා, සිය නැවතුම් පොළට කැඳවාගෙන ආහ.

වාහනයක් යා හැකි පාර අවසන් කිරීම

ගලපිට වැව සිට සැතපුම් එකොළහක් දුර මහ වනය මැදින් රුවන් මඩුවේ වැව් බැම්ම දක්වා කැලැව එළි පෙහෙළි කරමින් සති තුනක් තිස්සේ පාර කපා නිම කරන ලදී. ඉන්පසු කැලයෙන් කපන ලද ලී දඬු ප්‍රයෝජනයට ගෙන අඩි 100 x 20 ගොඩනැගිල්ලක් තනා නිම කොට, පළමුවරට ලොරියකින් පොල් අතු ගෙන්වා සෙවිලි කළෙමු. කලුවන් මැටිවලින් කොට වරිච්චි බිත්ති බඳින ලදී. බිමට මැටි ගැසීමු. බිත්තිවල කලු පැහැය නැති කරනු සඳහා කුඹුක් ගස්වල පොතු පුලුස්සා ලබාගත් අලුවලින් සුදුපාට කරන ලදි.

අවශ්‍ය උපකරණ

කෑම පිසීම සඳහා ඇලුමිනියම් භාජනත්, පිඟන් කෝප්ප ආදියත් නගරයෙන් ගෙන යන ලදී. කැති,පොරෝ ආදී ආයුධ කොළඹින් ගෙන යන ලදී. නිදා ගැනීම සඳහා අවශ්‍ය ඇතිරිලි සියල්ලම මම යුද හමුදාවේ වෙන්දේසියකින් ලබා ගතිමි.

අරණ්‍යායකින් සහභාගි වූ එක් වඩු කාර්මිකයෙක් සිහින් කෝටු කැබලි එකිනෙක ගැවෙන නොගැවෙන සේ තබා වැල් පටින් බැඳ අපූරු පැද්දෙන ඇඳන් විශේෂයක් තැනීය. තමන්ගේ කෝප්ප පිරිසිදු කර එල්ලා තැබීමට අතු සහිත කුඩා ගසක් මිදුලේ සිටුවා තිබුණි. වාඩි වීම සඳහා කැපූ ගස්වල මුල් කොටස මිදුලේ තැන තැන සවි කොට තිබුණි.



ඡායාරූප: 289
ඩබ්ලිව්. ඩී. පීටන් මහතා

ළිඳ

වැව් කණ්ඩියට පහළින් තිබූ උස් තැනක ළිඳක් කපා, ආඬියා තනන ලදී. එහි ජලය ඉතා සිසිල්ය. ඉතා පිරිසිදුය. පසු

ඡායාරූප: 290
ඩී. ටී. අමරසේකර මහතා

කලෙක වවුනියා මහ දිසාපති මුසේන් මහතා මෙහි නැම පිණිස සති අන්ත හා නිවාඩු දිනවල පැමිණීම පුරුද්දක් කර ගත්තේය. මේ ළිඳ සකස් කරන ලද්දේ ගොවිපළට පසුව එක් වූ ඉන්දියාවේ ගාන්ධි ග්‍රාමවල ජීවත් වූ අත්දැකීම් ඇති "බාබුජී" යයි සුරතල් නමින් හැඳුන්වනු ලැබූ පුද්ගලයෙකි.

වොලිබෝල් පිටිය

තරුණයන් උදෙසා අත්පන්දු ක්‍රීඩාවේ යෙදීමට වොලිබෝල් පිටියක් ද තැනීමු.

එක්දහස් නවසිය හැටදෙකේ අගෝස්තු පාසල් විවේකය වවුනියාවේ ගත කිරීමට අපි කණ්ඩායමක් තීරණය කර ගතිමු. ඒ අනුව තිලකරත්න මහතාත්, ඩී.ටී. අමරසේකර මහතාත්, විලියම් කන්දගේ මහතාත්, මාත් ඒ කණ්ඩායමට අයත් වූහ. දුම්රියෙන් වවුනියාවට ගිය අපි එතැන් සිට ජීප් රියෙන් පිරප්පන් මඩුවට ගොස් එතැන් සිට පයින් ගමන් ඇරඹූ -වෙමු. මහ පෙන්වන්නට කඳවුරෙන් මල්ලිලා දෙදෙනෙක් ඇවිත් සිටියහ. ඒ අය සතියකට අවශ්‍ය එළවලු ගෙන ගියහ. අතරමග දී අපට පිපාසය ඇති වූයෙන් ගෙන ගිය ඉදුණු තක්කාලි කමින් පිපාසය නිවා ගතිමු.

බියකරු මහ වනය මැදින් ඈත ඇසෙන සියොතුන්ගේ මිහිරි රාව හා වන සතුන්ගේ හඬ මැදින් ගමන් ගත් අපි පැය තුනකින් පමණ ගොවිපළට ළඟා වීමු.

බිම අතුරන ලද ඇඳ ඇතිරිලි (ලෝම බ්ලැන්කට්) මත වැතිරී විවේක ගත් අපි පසුව දිවා ආහාරය ගතිමු. සම්පූර්ණ නිර්මාංශ ආහාරයෙන් එය සමන්විතව තිබුණි. එදා සවස් වරුව වටපිටාව තේරුම් ගැනීම සඳහා ඔබ මොබ ඇවිද්දෙමු. තරුණ පිරිස අක්කර විසිපහක් පමණ කැලෑ ශුද්ධ කර තිබුණේය. එදා රෑ ගොඩනැගිල්ලේ බිම අපි නිදා ගත්තේ, වන සතුන් ගැන සිහි කරමිනි. පෙර දින වල් අලි රංචුවක් ගැවසුණු බව නේවාසික තරුණයෝ කීහ. එහෙයින් එදා රෑ නිදා ගත්තේ තරමක් බියෙනි. හේතුව, අඩු තරමින් තුවක්කුවක් හෝ කඳවුරේ නොතිබීමය. අහිංසාව අකුරටම ඇගැයූ ඒ සමයේ ද, වල් සතුන්ගෙන් වන උපද්‍රව ගැන සලකා වුව ද, ආයුධ පාවිච්චි කිරීමක් හෝ ආයුධ තබා ගැනීමක් සර්වෝදය තුළ නොතිබුණු හෙයිනි.

පසුදා අපිත් කැලෑව ශුද්ධ කිරීමට ගියෙමු. එවකට හේනෙගම මධ්‍ය විද්‍යාලයේ ආචාර්ය වරයෙකු වූ – විධායක සභිකයෙකු වූ (පසුව උප සභාපති වූ ද) ඩී.ටී. අමරසේකර මහතා, ගසක් කපා බිම හෙළන්නට යාමේදී පොරවට කකුල කපා ගත්තේය. උඩු පතුලෙන් ලේ වැස්සෙන්නට විය. ඔහු හිසේ ජටාවක් බැඳ තිබූ සුදු තුවායෙන් ලේ ගලන තුවාලය වෙලා, ලේ ගමන නවතා කඳවුරට ඔසවාගෙන ආවෙමු. ප්‍රථමාධාර පෙට්ටියෙන් ප්‍රථමාධාර දී – වෙනිවැල් ගැට තම්බා බොන්නට දුනි. සතියක් පමණ ඒ මහතාට විවේක සුවයෙන් කඳවුරේ සිටින්නට සිදු විය.

එවකට නාලන්දා විදුහල්පති ව සිටි ඇම්. ඩබ්ලිව්. කරුණානන්ද මහතාත්, එම්. ඒ. තිලකරත්න මහතාත් ඒ සතියේ අග කඳවුරට පැමිණියහ. මහ වනය මැද දී පැමිණි ජීප් රථය ක්‍රියා විරහිත වී, අතරමංවී සිටි බවත්, පසුව අහම්බෙන් පැමිණි ලී ලොරියක රියැදුරු මහතෙකු මගින් නගරයට පණිවුඩයක් යවා, වෙනත් රථයක් ගෙන්වා ගෙන එහි පැමිණි බවත් කීහ. මේ පිරිස ද පසුදා ශ්‍රමදාන කටයුතුවල යෙදුණහ. අප අවට වනයේ ඇවිදිද්දී බිම වැටී තිබුණු ලස්සන බුදු පිළිමයක් දක්නට ලැබුණි. පසු දා පසළොස්වක දිනයක් වූ හෙයින් අපි ඒ ප්‍රතිමාව තිබූ ස්ථානය කැළය කපා, උදලු ගා – ශුද්ධ පවිත්‍ර කළෙමු. මල් ආසනය ද පෙර තිබූ පරිදි සෘජු කොට තබා පසු දින එහි ආගමික වතාවත් කිරීමට තීරණය කළෙමු.

පසළොස්වක දා සවස විස්සක් පමණ දෙනා වනමල් කඩාගෙන මැටි පහන් හා පොල්තෙල් ගෙන සැතපුම් බාගයක් පමණ දුර ගෙවා නටබුන් සිද්ධස්ථානය වෙත ළඟා වීමු. මලසුන සෝදා පිරිසිදු කොට, මල් පුදා කරුණානන්ද මහතාත්, පොල් තෙල් පහන දල්වන විට සිරිපොද වැස්සක් වැටුණි. ආශ්චර්යකි, සිව් මසකින් වැසි බිඳක් නොලැබුණු මේ වන පියසට මෙසේ මල් වැස්සක් වැටීම ප්‍රාතිහාර්යයක් ලෙස සැලකූ පිරිස සාදු නාද පැවැත් වූහ. මේ පින්කම අවසන කඳවුරට ආවෙමු.

භය සන්ත්‍රාසය දනවන ගමනක්

අපේ කඳවුරේ සිට සැතපුමක් පමණ ඈත වැවක් ඇති බව දැන ගත් හෙයින්, ඒ නරඹන්නට යෑමට තිරණය කළෙමු. පසුදා උදය ඒ සඳහා අපි පස් දෙනෙක් පිටත් වීමු.

කොටියෙකුගේ පලා යෑම

කරුණානන්ද මහතාත්, කන්දගේ මහතාත්, මමත් ඇතුලු පිරිස වැව බැලීමට යද්දී, අඩි පාරට නොදුරු ගසක අත්තක සිටි තරමක කොටියෙක් බිමට පැන දුවන්නට විය. අපි සංත්‍රාසයෙන් ගල් ගැසී සිටියෙමු. ඉන්පසු යළිත් ගමනාරම්භ කොට ඉදිරියට ගියෙමු. තවත් යාර සියයක් පමණ ඉදිරියට යත්ම, කැලෑ රොදේ නොපෙනෙන වංගුවකට ළඟා වීමු. තදින් කුර ගැටෙන, දිව එන සතුන්ගේ හඬක් ඈතින් ඇසෙයි. කවර නම් සතෙක්ද? කුමක් කරමු දැයි දෙගිඩියාවෙන් විමතියට පත් වීමු. ගත වූයේ නිමේෂයකි. යාර 50 කට පමණ ඈතින් දුව එන වල් මීමුන් දෙදෙනෙකි. ඇගේ මඩ ගා ගෙන බිහිසුණු ස්වරූපයකින් පිඹ එන මීමුන් දකින විට, අපට දෙවියන් සිහිවුණි. තෙරුවන් සරණ හා දෙවි පිහිට පතන්නට වත් ආපසු දුවන්නට වත්, මඟහැර යන්නටවත් වේලාවක් නැති! සිත සිතා ඉන්නට ද වේලාවක් නැති!! කුමක් හෝ වේවායි සිතා හිටි අඩියේ අපි නැවතීමු. පුදුමයක මහත – අප දුටු මී නාම්බන් ගමන බාල කොට, අපට අඩි පහළොවක් පමණ දුර දී ආපසු හැරුණි. ඔවුනගේ ඇඟේ තිබූ මඩ අපේ සුදු පාට ඇඳුම්වලට විසි වී බතික් කළාක් මෙන් විය. දැන් වැව කිට්ටු නිසා අපි ඉදිරියට ගියෙමු.

ඉවුරේ සරුවට වැවුණු මහ කුඹුක් ගස්ය. එහි එක් ගසක මුදුන් අතු අතර, දඩයම්කරුවන් සඳහා පැලක් බැඳ තිබුණි. දිය බීමට එන සතුන් මැරීමට ඉඳ හිට ගම්වාසී දඩයම් කරුවන් එන බව අසන්නට ලැබුණි.

කලුවන් පැහැ දිය පිරි ගැඹුරු කුඩා වැව ළඟ ටික වේලාවක් ගත කළ අපි, කලුවර වැටෙන්නට කලියෙන්, ආපසු කඳවුරට පැමිණියෙමු. එදා රෑ නිදන්නට ගිය අවස්ථාවේ ඒ ප්‍රදේශයේ සිටින ගොයම් මැස්සන් නමැති කුඩා කෘමීන්ගෙන් නිකුත් වන අමුතු ගඳක් නිසා නින්දට තරමක් බාධා විය.

කිනිතුල්ලන් සපා කෑම

පසුදා ශ්‍රමදාන කටයුතු සඳහා කැලයට ගිය විට එහි කුඩා පඳුරුවල රැඳී කිනිතුල්ලන් නැමති කෘමි විශේෂයක් පාවල එල්ලී දෂ්ට කළහ. මගේ පාදවල තවමත් එම කලු කැලැල් තිබේ.

දිවි මකුලුවන්ගෙන් බේරීම

දවසක් සවස් වරුවේ ගොඩනැගිල්ලේ මිදුලේ විශාල පලු ගහ යට වාඩි වී කන්දගේ මහතාත්, කරුණානන්ද මහතාත් – මමත් කතා කරමින් සිටියෙමු. අප ඉදිරියේ ගහයට කොළොම්බු කොටයක් (හිඳ ගැනීමට පිළියෙල කළ ගසක මුල් කොටසින් සකස් කළ ආසනයක්) තිබුණි. එහි කවුරුත් වාඩි වී සිටියේ නැත. පුදුමයක මහත එක්වරම ගසේ සිට යමක් ඒ මත වැටෙනු ඇසී අපේ නෙත් ඒ දෙස හැරවීමු. විශාල දිවි මකුලුවන් දෙතුන් දෙනෙකු ඒ මත වැටී උදරයන් පැලී මැරී යනු අපි දුටිමු. යම් හෙයකින් අපේ ඇඟට වැටුණා නම්, අපට සිදුවන දේ ගැන මවිත වීමු.

කිලිනොච්චි උරුත්‍රපුරම්
ගොවිපළ

ඡායාරූප: 291
එස්. කේ. වේලායුදපිල්ලේ මහතා

රුවන් මඩුවේ සතියක් ගත කළ අපි, ගාන්ධි සේවා සංගමය මගින් කිලිනොච්චි ප්‍රදේශයේ පැවැත්වෙන ගාන්ධි නිලයම් ගොවිපළ බැලීමට තීරණය කළෙමු.

ඊට පසු දින කන්දගේ මහතාත්, කරුණානන්ද මහතාත්, තිලකරත්න මහතාත්, මමත් සිව්දෙනා ආපසු වවුනියාවට ඒමට පයින් පිටත් වීමු. අපේ මඟ පෙන්වන්නා ගලපිටවැව අප්පුහාමි විය.

පිපාසය නිවාගත් හැටි - දියවැස්සෙන වැලක්

පැය දෙකක් පමණ වනය මැදින් ආ අපට පිපාසය සැදුණි. ඒ බව පවසන විට අප්පුහාමි අපට නවතින්නට කියා අඩි පාරෙන් බැහැර මඳක් දුර ගොස්, ගසක එතුණු වැලක් කපනු පෙනුණි. මම ද එතැනට දිව ගියෙමි. පුදුමයක මහත ඒ කැපූ වැල් කැබැල්ලෙන් කුඩා දිය උල්පතකින් මෙන් දිය වැස්සෙයි. ඒවා බීමට සුදුසු යයි කී නිසා කැපූ වැල් කැබැල්ලෙන් වැස්සෙන දිය මුවට තබා බීමි. අනෙක් අයට ද අඩියක් පමණ දිග වැල් කැබලි අතට ලැබුණු නිසා සිත් සේ දිය බීවෙමු. 'දිය ලබු වැල්' නමින්

හඳුන්වන ඒ වැව්වලින් විශේෂයෙන් – ඒ ගැමියන්ගේ පිපාසය නිවා ගැනීම සුපුරුදු පාරම්පරික පුරුද්දකි.

මෙසේ දුෂ්කර ගමනින් පිරප්පන් මඩුවට ආ අපි එතැනට පැමිණ, තිබූ ජීප් රියෙන් වවුනියාවට පැමිණ, එහි නැවතී පසුදා පරන්තන්, කිලිනොච්චි ප්‍රදේශයට ගියෙමු.

'ගාන්ධි නිලයම්' ගොවිපළ

මහත්මා ගාන්ධි තුමන්ගේ දර්ශනය අනුව සිය ජීවිතය කැප කළ එස්.කේ. වේලායුදපිල්ලේ මහතාගේ මූලිකත්වයෙන් පැවැත්වෙන උරුත්‍රපුරම් ගොවිපළට ගියෙමු. එහි අසරණ ළමයි රැසක් නේවාසිකව සිටියහ. එදා රෑ පවුල් හමුවලට හා උදෑසන පවුල් හමුවලට සහභාගි වූ අපි, එතැන පවතින විනය ගැන සොම්නස් වීමු. අපේ ගමන නිමිත්තෙන් අඹ පැළ කීපයක් සිටවීමු. දැන් හොඳින් පල දරණ අඹ ගස්වලින්, අවුරුදු පතා – දෙසැම්බර් මාසයේ දී අඹ තොගයක් සර්වෝදය මූලස්ථානයට එවන පුරුද්දක් පැවතුණේය.

රුවන්මඩුව ගොවිපළ අසාර්ථක වීම

මාස හයක් තිස්සේ හොඳින් පවත්වාගෙන ආ ගොවිපළ එක්දහස් නමසිය හැටදෙකේ දෙසැම්බර් මාසයේ දී වැටුණු ධාරාණිපාත මහා වැස්ස නිසා, මුලු ප්‍රදේශය – පාර සමගම ගංවතුරෙන් යට වී ගියේය. මහ කැළය මැද ගංවතුරට කොටු වි දින කිහිපයක් සිටීමේ භයානකකම තේරුම් ගත් පිරිස, උපකරණ ආදියත් රැගෙන ආපසු වවුනියාවට පැමිණියහ. එවකට සිංහලයන් 16,000 ජීවත් වූ වවුනියා ප්‍රදේශයේ දෙමළ ජනතාව සමඟ සමගියෙන් විසීම අරමුණු කර ගත් ඒ ගොවිපළ ගංවතුර නිසා වසා දමන්නට සිදු විය. එතකුදු වුවත්, සර්වෝදය විධායක සභික ගරුතර වවුනියාවේ බෝධි දක්ෂිණාරාමාධිපති සියඹලාගස්වැව විමලසාර නාහිමිපාණන් සර්වෝදය සහාය ඇතිව 'වන්නිය සාම පදනම' මගින් අදත් ඉමහත් සේවාවක් කිරීම සතුටට කරුණකි.

ඡායාරූප: 292
සියඹලාගස්වැව විමලසාර නාහිමියන්

අපට අවශ්‍ය ආහාරපානාදිය ගෙන ඒමට තබා, සැතැප්ම විසි දෙකක් පමණ දුර වූ වවුනියා නගරයට පණිවුඩයක් යැවීමට පවා නොහැකි විය. දිසාපතිතුමා ඇතුළු රජයේ නිලධාරීන් විශේෂයෙන් උප දිසාපති යූ. බී. විජේකෝන් මහතා අතිශය උනන්දුවක් ගෙන අපට අත දුන් නමුත්, මාස හයකට වඩා මේ ස්ථානය නඩත්තු කර ගැනීමට අපි අසමත් වීමු. වැව ප්‍රතිසංස්කරණය කරගෙන, මහකච්චිකුඩිය හරහා කෙටි පාරක් කපාගෙන, ආහාරපානාදී අත්‍යවශ්‍ය ද්‍රව්‍ය පහසුවෙන් ලැබෙන විදියක් සූදානම් කර ගෙන වැහි කාලයෙන් පසු නැවත එන අටියෙන්, අපි අපේ වාඩිය අතහැර – අවි ආයුධ ආදිය දිසාපති තුමාට බාර දී තාවකාලිකව කඳවුර වසා දැමුවෙමු.

ඡායාරූප: 293
පරන්තන් කඳවුරේ දී පිටුපා වැඩ කරන්නේ කලක් උද්‍යෝගිමත්ව කඳවුරුවලට සහභාගි වූ රංජිත් සන්දනායක ශිෂ්‍යයා ය

ධර්මසේන සේනානායක මහතා හා මට විරුද්ධව තිබූ සියලු චෝදනාවලින් අපි නිදහස් වී තිබුණත්, මේ වන විටත් අපට නැවත සේවයට වාර්තා කිරීමට දැනුම් දී තිබුණේ නැත. අපේ වැඩ තහනම අවසන් කර, නාලන්දාවේ සේවයට වාර්තා කිරීමට අණ ලැබුණේ, එක්දහස් නවසිය හැටදෙකේ ඔක්තෝබර් හතරවැනිදාය. මේ නිසා රුවන්මඩුව ගොවිපළ ගැන කටයුතු කිරීමට සිදු වූයේ මෙවැනි කරදර යුගයකදීය.

මෙවැනි තරුණ ගොවි ප්‍රජාවන් මන්නාරමේ සිට වවුනියාව හරහා ත්‍රිකුණාමල ප්‍රදේශය දක්වාත්, පදවිය ප්‍රදේශයේ සිට මඩකලපුව

දක්වාත් – අම්පාර, වැල්ලවාය හරහා තණමල්විල දක්වාත් – එහි සිට හම්බන්තොට, මාතර, දෙනියාය හා කලුතර දක්වාත් පිහිටුවීම, මගේ අභිලාෂය විය. රුවන්මඩුව මෙන්ම, මේ සඳහන් කළ ප්‍රදේශවල ද කුඩා පරිමාණයෙන් හෝ උදව් ලබා ගත හැකි හැමෝගෙන් ම උදව් ලබා ගෙන කෘෂි ආර්ථිකය මෙන්ම කෘෂිකර්මය සම්බන්ධ කර්මාන්ත ද මුල් කොට, තරුණ ප්‍රජා කණ්ඩායම් ආරම්භ කළෙමු. මේවායේ උනුනුන්ගේ ජාතිය, ආගම සහ සංස්කෘතියට එක සේ ගරු කොට සිංහල, දමිළ, මුස්ලිම් තරුණ තරුණියන් පිරිසක් හැඩ ගැසුණහොත්, ජාතික සමගියක් ඒ තුළින් ඇති විය හැකි බවත්, තවදුරටත් හිංසක ක්‍රියා මාර්ග ඇති නොවිය හැකි බවත් මගේ විශ්වාසය විය.

ඒ කාලයේ මා දැන හැඳිනගෙන සිටි දේශපාලන නායකයින්ටත් උසස් නිලධාරීන්ටත් – මෙහි තිබෙන ජාතික අගය තේරුම් කළ මුත්, ඒ කිසිවෙක් ප්‍රතිපත්තියක් හැටියට එය පිළිගත්තේ නැත. 'ආරියරත්න හොඳ අදහස් තිබෙන එහෙත් සිහින ලෝකයක ජීවත් වන හොඳ මිනිසෙක් බව' තවත් අය සමග පැවසීම පමණකි, ඔවුන් කළ සේවය. එක්තරා අධ්‍යාපන ලේකම්වරයෙක්, ඩී. එස්. සේනානායක විදුහල්පති රැලෆ් අලස් මහතාට මා පෙන්වා, මවුන්ට් ලැවිනියා හෝටලයේ උත්සවයකදී කියා ඇත්තේ "ආරියරත්න ඉතා හොඳ වැඩ කරන බවත් එහෙත් ඔහු ඒවා ප්‍රමාණය ඉක්මවා කරන බවත්"ය. තවත් පරිපාලන ලොක්කෙක් කළේ අප ඉදි කළ තරුණ ගම් දිහා බලා, රට පුරාම එවැනි ගම් කිසිම සැලැසුමක් නැතිව අනුකරණයෙන් රජයේ සම්පත් යොදා ආරම්භ කිරීමයි. ඒ සියල්ල අභාවයට ගියේය.

සර්වෝදය ඇරඹූ මෙවැනි බොහෝ ව්‍යාපෘති අදත් ඉතිරි ව තිබේ. එහෙත් අසාර්ථක වූ රුවන් මඩුව, ඇටමැස්සකන්ද ආදි තැන් ගැන සඳහන් කොට, අපේ කරුණානන්ද මහතා ද මා විවේචනය කළ වාර බොහෝය. එතුමා කොටස් දිහා බැලූ අතර, මා නිතරම බැලුවේ සමස්ත සමාජය ඉදිරියේ දී එන විනාශයෙන් බේරා ගැනීමට මං සෙවීමය.

70
උන්ගේ පාඩුවේ ඉන්න ඇරපන්

ඡායාරූප: 294
ශ්‍රීමත් ජෝන් කොතලාවල

දේශපාලනයෙන් විශ්‍රාම ගැනීමෙන් පසු ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමා අවුරුද්දේ කාලයක් එංගලන්තයේ ද, කලක් ලංකාවේ ද ගත කළේය. ලංකාවේ කඳවලවත්තේ ගෙදර සිටිය අවස්ථාවලදී ඉඳහිට උපාලි සේනානායක මහතා සමඟ කඳවලට යාමට අපි පුරුදුව සිටියෙමු. දවසක් උපාලි සේනානායක මහතා පැමිණ, මගේ එවකට සිටි දරුවන් තිදෙනා හා නීතා ද සමඟ මා කඳවලවත්තට කැඳවාගෙන ගියේය. කොතලාවල මහතා කාලසටහනකට අනුව දින චරියාව ගෙන ගිය කෙනෙක් විය. මේ දින චරියාව එතුමාගේ වත්තේ සිටි කුරුල්ලන්, ලේනුන්, මුවන් ආදී කුඩා සිවුපාවුන්ගේ සිට අලියා දක්වා සතුන්ට ද පුරුදු කර තිබුණේය.

එදා අප කඳවල වත්තට ඇතුලු වූයේ සතුන්ට තියම කර තිබූ වේලාවේය. ඉස්තෝප්පුවේ පුටුවේ වාඩි වී තමන්ගේ වාරය පිළිවෙලට පැමිණි විට, පැමිණ හිටපු අගමැතිතුමා අතින් මේ අහිංසක සතුන් ආහාර ගන්නා දර්ශනය කාගේ වුවත් සිත් මෛත්‍රියෙන් තෙත් කරයි. චාරිකා, චිත්‍යා සහ ජීවන් අත්පුඩි ගසමින් සිනාසෙමින් මේ දර්ශනයෙන් හොඳටම විනෝද වූහ. අලියා ද, ආහාර ගෙන ගිය පසු අප දෙසට හැරුණු සර් ජෝන් කොතලාවල මහතා "දැන් උඹලාගේ වේලාවයි" කියමින් පොඩි අයටත්, අපටත් සංග්‍රහ කළේය. නීතාට, ළමයින් ද කැටුව වත්ත නැරඹීමට අණ කළ කොතලාවල මහතා, උපාලිත් – මාත් පමණක් රඳවාගෙන අප සමඟ වාඩි වුණේය. දැන් ඔහු කතාව පටන් ගත්තේය. මුලින්ම මගෙන් වැඩ නොගැනීම ගැන රට ආණ්ඩු කරන අයට හොඳටම බැන්නේය. ඊට පසු මා දෙසට හැරී "ආරි, ටික දවසක

ඉඳලා උඹට පොඩි කතන්දරයක් කියලා දෙන්න හිටියා. මට ඒකට ඉඩක් තිබුණේ නෑ. දැන් මං ඒක කියලා දෙන්නම්."

"එකමත් එක රටක කැලයක් අයිනේ කුඩා මැටි ගහපු ගෙදරක තරුණ ජෝඩුවක් හිටියා. මේ දෙදෙනා ඔවුනොවුන්ට හරි ආදරෙයි. හැමදා ම උදේ නැගිටලා මොනව හරි දෙයක් කාලා, කෑම පාර්සලයකුත් බැඳගෙන පොරවක්, මහ පිහියක් හා ලණු කැරලි කීපයක් අරගෙන මේ දෙන්නා කැලේට යනවා. දවසම දර කපනවා. දර මිටි බැඳලා අයිනක තියලා බත් මුල දෙන්න ම කාලා – ආපසු එන්න පිටත් වෙනවා. හැබැයි ආපසු එන්න ඉස්සෙල්ලා කැලේ තිබෙන රුස්ස ගහක් ළඟට යනවා. එතැන ඒ අය මැටි පහනක්, පොල්තෙල් බෝතලයක්, පාන් තිරත් තියලා තියෙනවා. හැමදාම පාන් තිරයක් මේ මැටි පහනට දාලා තෙල් වත් කරලා – පහන පත්තු කරලා – වැඳලා ගහේ දෙවියන්ට පින් දීලා තමයි ගෙදර යන්නේ. ඔන්න ඔය විදියට හැමදා ම අවුරුදු ගණනක් මේ ගොල්ලන් දර කපලා, ඒවා විකුණලා ජීවත් වුණා. දැන් තවත් දුරට මේ ගොල්ලන් තරුණ නැහැ. හොඳටම නාකියි. ඒත් මේ දින චරියාව අතහැරියේ නැහැ. කාටවත් යටත් වුණේත් නැහැ. හරිම සන්තෝසයෙන් පණට පණ වගේ ජීවත් වුණා.

දවසක් මේ නාකි මනුස්සයයි, ගෑනියි ගැන දෙවියන්ට හරියට දුක හිතුණා. ඒ මිනිස්සු අවුරුදු 50 කටත් වැඩි කාලයක් මට පින් දුන්නා නේද? මම මේ මිනිසුන්ට මොනවා ද දුන්නේ? මේ විදියට අනුකම්පා කළ දෙවියෝ, මේ වයෝවෘද්ධ දෙපළට පරිත්‍යාගයක් කිරීමට අදහස් කළා.

එදා දවසෙත් දර කපා ගෙන, මිටි දෙකක් හදා ගෙන – බත් මුලත් කාලා – ගස ළඟට මේ දෙපල පහන් පත්තු කරන්න ගියා. පාන පත්තු කරලා දෙවියන්ට පින් දීලා නැගිටින කොටම, මේ දෙන්නා දැක්කේ මොකක්ද? පළාතම එළිය වැටුන නොයෙක් පාටවලින් දිලිසෙන මැණික් ගල් ගොඩක් තිබෙන වට්ටියක් ගහ මුල තිබෙනු දුටුවා. ඒ දෙන්නම ඒ දිහාට පැන්නා. දෙවියෝ අපට මෙච්චර කල් කරපු වන්දනාමානවලට අපට පිහිටවෙලා තියෙනවා. දැන් දෙවියන්ට වැඳලා මැණික් ගල් පොදිය රෙද්දේ ඔතා ගෙන දර මිටි දෙකයි, පොරවයි, ලණුයි එතනම තබා සන්තෝෂයෙන් දෙන්නා ගෙදර යන්න පටන් ගත්තා.

ගෙදර ගිහිල්ලා අද හොඳට අපේ මහත්තයාට කන්න දෙන්න ඕනැයි කියලා මැහැල්ල ගෙදර තිබුණ දේවලින් බොහොම රසට කෑමක් හැදුවා. මහල්ලා කළේ ළිඳ ළඟට ගොස් ඒ කිට්ටුව වත්තේ

ලොකු වලක් කපලා හොඳට නා ගත්තා. දැන් ඉතින් බිරිඳ ළිඳ ළඟට ඇවිල්ලා මුහුණ කට සෝදන කොට, මහල්ලා අර වළ කපපු උදැල්ලෙන් මැහැල්ලියගේ ඔලුවට දුන්නා පාරක්. මැහැල්ලිය එතනම මැරී වැටුණා. ඔහු කපපු වළේ ඇය දාලා – වළ පස්වලින් වහලා සතුටින් ගෙදර ගියා. යන ගමන් සිතුවේ දැන් මැහැල්ල නැහැ – මම නගරයට ගොසින් ලොකු ගෙයක් හදලා – තරුණියක් අරගෙන සතුටින් ඉන්නවා කියලා. ගෙදර ගිහින් කන්න පටන් ගත්තා. ටිකක් කන කොට ඔහුත් මැරුණා. මහල්ලා වගේම මැහැල්ලත් හිතා තිබුණේ මේ මහල්ලා එක්ක මට ඉඳලා වැඩක් නැහැ. මම තරුණයෙක් අරගෙන සතුටින් හොඳින් ඉන්නවා කියලා හිතලා බත්වලට වස දමා තිබෙනවා."

"ඔන්න ආරි, බොහොම ගුණ යහපත් අඹු සැමි දෙන්නෙක් පෝසත් කරන්න ගිහිල්ලා දෙයියෝ කරපු වැඩේ."

"ආරි උඹ කරන්නෙත් ඕකමයි. ඔය දුප්පත් මිනිසුන්ට ගුණ යහපත්කම රැක ගෙන හොඳින් ඉන්න එක – ධනවත් වෙනවාට වැඩිය වටිනවා. ඒ නිසා ඒ මිනිසුන්ට උන්ගේ පාඩුවේ ඉන්න ඇරපන් බං"

අපි තිදෙනාම මහ හඬින් සිනාසුණෙමු.

ශ්‍රීමත් ජෝන් කොතලාවල මහතාගේ මෙම කතාව ගැන මෙනෙහි කරමින්, අන් අයත් සමඟ මම ගෙදර ආවෙමි. මගේ සටහන් පොතේ පහත සඳහන් වැකිය ලියා තැබුවෙමි.

"සර්වෝදය කරන්නේ දුප්පත්කමිනුත් තොර – පොහොසත් කමිනුත් තොර සමාජයක් ගොඩනැංවීමය. බාහිර සංවර්ධනය සමඟම ආධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කිරීමය."

71

ඊශ්‍රායල් ගමන

එක්දහස් නවසිය හැටපහේ මැද සිට – එක්දහස් නවසිය හැටහයේ සැප්තැම්බර් දාහත්වැනිදා දක්වා නාලන්දාවෙන් පඩි සහිත අධ්‍යයන නිවාඩුවක් මම ලබා ගතිමි. මගේ විශ්ව විද්‍යාලය උපාධිය විද්‍යෝදයේ අභ්‍යන්තර ශිෂ්‍යයකු හැටියට සම්පූර්ණ කර ගැනීමටයි, ඒ නිවාඩුව ලබා ගත්තේ. මගේ මිත්‍ර පියසෝම මේදිස් මහතා අභ්‍යන්තර ශිෂ්‍යයකු වශයෙන් ද, මා බාහිර ශිෂ්‍යයකු වශයෙන් ද, ඒ වනවිට මධ්‍යම විභාගය සමත් වී තිබුණේය. අවසාන පරීක්ෂණය සඳහා අප දෙදෙනාම පෙනී සිටියේ එකම විෂයයන්ටය. ඒ නිසා අපේ ගෙදරම වැඩි කාලයක් නැවතී සිට පියසෝම මල්ලී ද විශ්ව විද්‍යාල පන්තිවලට ගියේය.

ආර්ථික විද්‍යාව දේශන දෙකකට ගිය මට, ඒ දේශන දෙකම සුපුරුදු ඒවා විය. කථිකාචාර්යවරයා කළේ මහාචාර්ය එෆ්. ආර්. ජයසූරිය මහතාගේ පොතකින් අකුරෙන් අකුරට සටහන් ලියා ගැනීමට කියවීමය. ශිෂ්‍යයෝ මේවා ලියා ගනිති. පැරණි සිංහල දේශනය හැරුණු විට, අනිත් දේශනවලින් ද අමුතු දෙයක් ඉගෙනීමට තිබුණේ නැත. අධ්‍යාපනය පිළිබඳ දේශන කළේ මහාචාර්ය එල්. ජී. හේවගේ මහතා, කේ. එච්. එම්. සුමතිපාල මහතා හා ධර්මසේන අරම්පත්ත මහතා නිසාත්, ඒ අය මගේ කිට්ටු මිතුරන් නිසාත් – ඒ දේශනවලට

ඡායාරූප: 295
ඊශ්‍රායලයේ මා නැවතී සිටි ගෙදරක අය සමග

ඡායාරූපඃ 296
ගොවිපලේ
වැඩට යැම
මා දකුණු
කෙළවරේ

නොගියොත් ඒ අයට පෙනෙන නිසාත් – ඔවුන්ගේ දේශන කිහිපයකට ගියෙමි. අනිත් – සියලුම දේශනවලට යැමෙන් වැළකී සිටියෙමි. මා විශ්ව විද්‍යාලයයේ අභ්‍යන්තර ශිෂ්‍යයකු වුවත්, දින දහයකට වඩා විශ්ව විද්‍යාල පන්තිවලට නොගියෙමි. කුඩා කල සිට පොත් පත් කියවීමට මගේ තිබූ පුරුද්ද නිසා, විෂය අන්තර්ගතයන් වශයෙන් මට අමුතු දෙයක් ඉගෙනීමට තිබුණේ නැත. මා විශ්ව විද්‍යාලයේ සිටි බව වත් දන්නේ කිහිප දෙනෙකි.

පියසෝම මල්ලි සමග ඔහු හැමදාම දේශනවලට ගිය විට මගේ නම ද අත්සන් කරන ලෙස කතිකා කර ගතිමි. ඔහු සවස සියලුම සටහන් ගෙදර ගෙන එයි. පරණ අවසාන විභාගවල ප්‍රශ්න පත්‍ර ද බලා මම එක විෂයයකට ප්‍රශ්න තිහ බැගින් සූදානම් කළෙමි. ඒවාට පිළිතුරු මා කියන අතර, පියසෝම මල්ලී ඒවා ලියා ගනියි. අවසාන පරීක්ෂණයට පෙර දින දහයක් මේවා පුනරීක්ෂණය කිරීමට තීරණය කර ගතිමු. දැන් පියසෝම මල්ලී ඉගෙන ගනියි.

මම රට පුරා ම යමින් සර්වෝදය ව්‍යාප්ත කරමි.

* * *

මේ අතර ඊශ්‍රායලයේ 'කිබුට්ස්' නම් වූ සාමුහික ගොවිපළවල් පිළිබඳව පොත් පිංචක් මම කියවීමි. ප්‍රජාවන් ගොඩනැංවීමට අපිදු අවුරුදු කීපයක් වෙහෙසී තිබෙන නිසා, කිබුට්ස්වල මාස කීපයක් ගත කිරීමට මට ආශාවක් ඇති විය. මේ පිළිබඳව, එවකට සිටි ඊශ්‍රායල තානාපති ෂවුල් රමාති මහතාට මම දැන් වූ විට, එතුමා මා ඊශ්‍රායලයට යැවීමට පහසුකම් සලසා දුන්නේ ය. ඒ කාලයේ ඉන්දියාවේ සර්වෝදය භූදාන් ව්‍යාපාරවල ද අය රැසක්ම මේ ගොවිපළ ක්‍රමය නැරඹීමට ගියහ.

ඡායාරූප: 297
ඩොරොත්
ගමේ මිතුරන් සමග

මා ඊශ්‍රායලයට යන විට 'කිබුට්සිම්' යනුවෙන් හැඳින්වූ පොදු අයිතියට යටත් වූ ගම්මාන දෙසීය පනහක් පමණ තිබූ අතර, ඒවායේ සාමාජිකයෝ 250,000 ක් පමණ වාසය කළහ. අගමැතිවරයා, කථානායකවරයා හා ඇමතිවරු හතර දෙනෙක් ද, කිබුට්සිම්වල සාමාජිකයෝ වූහ. ඔවුන්ට ඇඳුම් කට්ටල දෙකක් හා තේ ටිකක් සාදා ගැනීමට පෞද්ගලිකව යම් යම් දේ අයිති කර ගත හැකි වූ අතර, තමාගේ වේතනය ඇතුලු අන් සියලුම දේවල් පොදු අයිතියට යටත් විය. ඔවුන්ගේ අවශ්‍යතාවල් සමූහ ජනාවාසය විසින් සපයනු ලැබේ.

එක්දහස් නවසිය එකොළහ වර්ෂයේ මේ ජනපද ආරම්භ විණි. යුදෙව් ඒජන්සිය මගින් මිලට ගත් කාන්තර වැනි භූමි සශ්‍රීක කොට, මේ ජනාවාස ගොඩනගන ලදී. කෘෂිකර්මය ඒවායේ ආර්ථික පදනම වූ අතර, මා යන කාලයේ දී කුඩා කර්මාන්ත ද ඇරැඹී තිබිණි. ලොව පුරා විසිරී සිටි යුදෙව් ජාතිකයෝ පැමිණ මෙහි පදිංචි වූ අතර, විශාල යුදෙව් පොහොසතුන් විසින් මේ සඳහා විශාල වශයෙන් ධන සම්පත් පරිත්‍යාග කරන ලදී. කය වෙහෙසා වැඩ කිරීම මේ ජනාවාසවල ප්‍රධාන අංගයයි. අවුරුදු දහස් ගණනකට පසුව තමන්ගේම යැයි රටක් ඔවුන්ට වෙන් කර ගැනීමට හැකි වූ නිසා, විසිපත් ලක්ෂයක් පමණ යුදෙව් ජනතාවට අසූ

ඡායාරූප: 298
ඊශ්‍රායලයේ මළ මුහුද අසළ

ඡායාරූපඃ 299
ජෙරුසලමේ
පවුලක් සමග

ලක්ෂයක් අරාබින් මැද්දේ ශක්තිමත් ජාතියක් හැටියට නැගී සිටීමට ආධාර වූයේ 'කිබුට්සිම්' ක්‍රමයයි.

මේ හැරුණු විට 'මොෂෙප්' යන සාමාන්‍ය ගම්මාන ද 'මොෂෙප් ෂිටුෆි' යන අතර මැදි ගම්මාන ද ඊශ්‍රායලයේ විය. මාස දෙකක් ඩොරොට් නැමැති සම්පූර්ණයෙන්ම පොදු අයිතියට යටත් වූ ගම්මානයක සති තුනක් ද, මොෂෝප් ෂිටුෆි ගම්මානයක සතියක් ද, මොෂේප් ගම්මානයක දෙසතියක් ද ජීවත්වෙමින් – හැකි තාක් අත්දැකීම් හා අධ්‍යාපනයක් ලබා ගැනීමට වෙහෙසුණෙමි.

ලැලිවලින් හදන ලද කුඩා කාමරයක මම ලැගුම් ගතිමි. කුඩා කොට කලිසම් දෙකක් හා අත් නැති බැනියම් දෙකක් ඇතුලු අවශ්‍ය දේවල් පොදු ඇඳුම් ගබඩාවට හා ස්ටෝරුවට ගොස් මම ලබා ගතිමි. ආහාර ගන්නේ පොදු බොජුන්හලේය. උදේ පහේ සිට එකොළහ දක්වාත් සවස තුනේ සිට පහ දක්වා පැය අටක් කය වෙහෙසා වැඩ කළ යුතුය. ට්‍රැක්ටර් පැදවීම, ඇපල් හා මිදි නෙලීම, පාත්ති සකස් කිරීම,

ඡායාරූපඃ 300
ඇපල් වත්තක වැඩ
කිරීම

ඡායාරූප: 301
ඊශ්‍රායලයේ මා
බලා ගත් යුවළ

ස්ප්‍රින්ක්ලර්ස් මගින් වතුර දැමීම, කුස්සියට හා කෑම ශාලාවට උදව් කිරීම, ප්‍රාථමික, මධ්‍ය හා උසස් පාසලේ ළමයින්ට ලංකාවේ ඉතිහාසය හා වර්තමානය ගැන ඉගැන්වීම ආදි කටයුතුවල මේ කාලය තුළ දී මම යෙදුණෙමි.

ඊශ්‍රායලය ඉතාම කුඩා රටකි. ඒ නිසා රට පුරාම ඇවිදීමට ද මට අවස්ථාවක් ලැබුණේය. පරණ බයිබලයේ සඳහන් සොඩොම් හා ගොමෝරා යන ස්ථාන, ජේසුස් වහන්සේගේ ජීවිතය සම්බන්ධ බෙත්ලෙහෙම–යේරුසලම ආදී ස්ථාන පළමුවරට දැක ගත්තේ මේ කාලය තුළදීය.

ඊශ්‍රායලයේ හමුදා නිලධාරින් හැර, ස්ථිර හමුදාවක් නැත. සෑම පුරවැසියෙක්ම යුද පුහුණුව ලබා තිබේ. ගඩ්නා නැමැති ශිෂ්‍ය බලකායද, 'නහාල්' නැමැති තරුණ බලකාය ද මොවුන් පුහුණු වන පළමු ආයතනයි. හිටිහැටියේම සයිරන් සීනු නාද කොට, සතියකට වරක් දෙවරක් මුලු රටම යුද අභ්‍යාසවල යෙදෙති. ඕනෑම ප්‍රහාරයකට මුලු රට ම මිනිත්තු පහකින් ක්‍රියාන්විත කිරීමට, ඔවුහු සංවිධාන වී සිටියහ. මොවුන්ගේ කැපවීම, කාර්යක්ෂම බව, විද්‍යාත්මක බව, සමගිය හා සාමූහිකත්ව –යෙන් මම මවිත වීමි. එක් දේශපාලන පක්ෂයක රැස්වීමක්

ඡායාරූප: 302 කුඩා දරුවන් සමග

ඡායාරූප: 303
ඊශ්‍රායල් රටේ දකුණු කෙළවර අසල වූ ඉලාට්වලදී

පැවැත්වෙද්දී විරුද්ධ දේශපාලන පක්ෂවල අය ද එයට සහභාගි වී ඉදිරි පෙළේ ම අසුන් ගෙන සිටිති. දේශපාලන පක්ෂ රට බෙදීමට කටයුතු කරන තත්වයක් මා එහි දී දුටුවේ නැත.

දිය ඇල්ලක් පෙන්වීමට යයි ඔවුහු වරක් මා මායිම් ප්‍රදේශයට කැඳවා ගෙන ගියහ. අඟල් නවයකට වඩා පළල නැති ජල පහරකි, එහි දී මා දුටුවේ. මීටර් පහක් පමණ විෂ්කම්භය ඇති ජල නළයක් රට පුරා සෑම බිම් අඟලකට ජලය සපයයි. ඒ ජලය නාස්ති නොකොට පැළෑටිවල මූලකේශවලට බින්දුවෙන් බින්දුව ජලය ලැබෙන සේ තාක්ෂණයක් ඒ වන විටත් ඔවුන් ගොඩ නගාගෙන තිබුණි. තද ග්‍රීෂ්මයෙන් යුතු වැලි කතර, අඟල් තුන හතරක් ගැඹුරැති පස් තට්ටුවක්, පොහොර කළ පස්, තණ වැනි කුඩා පැළෑටි, ඊට වඩා ලොකු පැළෑටි, එළවලු, දොඩම් ඇපල් හා මිදිවතු, විශාල වගාවන් ආදී වශයෙන් සැතැප්ම පහක් හයක් ඇතුළත කාන්තාරයක් සශ්‍රීක වතුපිටි උද්‍යාන හැටියට ඔවුන් පරිවර්තනය කරන හැටි විශ්මය ජනකය.

මේවා දකින මට සොබා දහමින් දායාද කළ අපේ රන් බිම, පක්ෂ දේශපාලකයින් විසින් හැම අතින්ම කාන්තාරයක් කරන හැටි සිහි වන විට ඇති වූයේ කෝපයකි; දුකකි. මාස තුනක් මම ඉස්රායලයේ ගත කළෙමි.

ඡායාරූප: 304
මා නතර වී සිටි කාමරය ඉදිරිපස

72
තරුණ සමුලුවට සංස්කෘතික ආක්‍රමණයක්

එක්දහස් නවසිය හැටපහ වර්ෂයේ දී මහනුවර ගුරු සංගමය ඉදිරියේ දේශනයක් පැවැත්වීමට මට ආරාධනා ලැබ තිබුණි. මෙම දේශනය පැවැත්වූයේ ඉංග්‍රීසි භාෂාවෙනි. මේ සඳහා පැමිණ සිටියේ විශාල වශයෙන් ගුරුවරුන්ය. එම සභාවේ සුදු ජාතිකයෙක් ද සිටිනු මම දුටුවෙමි. ඔහු එහි පැමිණ තිබෙන්නේ අහම්බෙනි.

දේශනය අවසන් වූ වහාම මෙම සුදු මහතා මා ළඟට පැමිණියේය. "මා මේ කතා කරන්නේ ඔබව සතුටු කිරීමට නොවේ. ඔබ අද කළ දේශනය මා ඇසූ හොඳම දේශනයයි. ලෝක සමාජය යා යුතු මාර්ගය පිළිබඳ ව ඔබ දරන අදහස් ඉතාමත් ම පැහැදිලියි. ප්‍රායෝගිකයි. ලෝක සමාජයට එය අත්‍යවශ්‍ය ය. තව දින කිහිපයකින් බැංකොක් නුවර දී පැවැත්වෙන ස්වේච්ඡා සේවා සම්මේලනයට මම ඔබට ආරාධනා කරමි. මෙය සංවිධානය කරන්නේ ජාත්‍යන්තර ස්වේච්ඡා සේවා මහලේකම් කාර්යාලය මගිනි. එය සම්බන්ධීකරණය කරන්නේ මා යි. අද ඔබ කළ කතාව ම මෙහිදී පවත්වන්නට මම ආරාධනා කරමි."

මෙම ආරාධනය පිළිගත් මම, එම සමුලුවට සහභාගි වීමි. මා ඇඳගෙන සිටියේ ජාතික ඇඳුම නිසා, එතැනට වාර්තා කිරීමට පැමිණ සිටි රූපවාහිනී කැමරා වැඩියෙන් එල්ල වූයේ මා දෙසටයි. ඒ අවස්ථාවේදී බැංකොක් නගරයට පැමිණ සිටි පිලිපීන විනිශ්චයකාරවරයෙක් මගේ දේශනය රූපවාහිනියෙන් අසා – දැක, පිලිපීනයේ රමන් මැග්සයිසයි ආයතනයට මා පිළිබඳව සොයන ලෙස දන්වා තිබෙන බව මම පසුව දැන ගතිමි.

මේ අතර තරුණ සම්මේලනයේ ආසියානු ලේකම් කේ. වී. රෙඩ්ඩි මහතා අප ව්‍යාපාරය දැක බලා ගැනීමට ලංකාවට පැමිණියේ ය. මේ කාලයේ 'සිලෝන් එසෙම්බ්ලි ඔෆ් යූත්' යනුවෙන් ලෝක සම්මේලනයේ ශාඛාවක් ලංකාවේ පිහිටුවා තිබුණේය. සර්වෝදය වැඩ කටයුතු දුටු රෙඩ්ඩි මහතා, එක්දහස් නවසිය හැටහතේ දී ලෝක තරුණ සම්මේලනය මගින් සිංගප්පූරුවේ පැවැත්වුණු නගරායනය පිළිබඳ සම්මේලනයට

ඡායාරූප: 305 – එම්. වී. රාජසේකරන් මහතා සමග

සහභාගි වන ලෙස මට ඇරයුම් කළේය. මෙම සම්මේලනය ද ලෝක තත්වය පිළිබඳව වඩාත් කරුණු ඉගෙනීමට මට බෙහෙවින් උදව් විය. එපමණක් නොවේ; පසුව යුරෝපයේ සහ ඇමරිකාවේ තරුණ කණ්ඩායම් සමඟ සම්බන්ධකම් ඇති කර ගැනීමට ද මෙය අවස්ථාවක් විය. සම්මේලනයට සහභාගි වූ හැමදෙනාටම උවමනා කළේ 'සර්වෝදය සංවර්ධන ක්‍රමය' පිළිබඳව මගේ මුවින්ම හැකි තරම් තරුණ පිරිස්වලට දැන ගැනීමට සැලැස්වීමය.

මා මුලින් ම බැංගලෝරය පැමිණියේ එක්දහස් නවසිය හැටහතේ දී ය. එම්. වී. රාජසේකරන් මහතා (රාජා) මුලින්ම මුණ ගැසුණේත් ඒ අවස්ථාවේ දී ය. එක්දහස් නවසිය හැටහතේ දී බැංගලෝර්වල පැවැති ආසියානු තරුණ සමුලුවේ 'ග්‍රාම සංවර්ධනය හා තරුණ සහභාගිත්වය' යන මැයින් මට දේශනයක් කිරීමට තිබිණි. ඒ සමුලුව සංවිධානය කර තිබුණේ, එවකට ඉතා ක්‍රියාත්මක ආයතනයක් වූ ලෝක තරුණ සමුලුව මගිනි. ලෝක තරුණ සමුලුවේ එකල මහ ලේකම් ධූරය ඉසිලුයේ ඉන්දීය ජාතිකයකු වූ ජෝති ශංකර් සිං මහතාය. නියෝජ්‍ය මහ ලේකම් වූයේ, නෙදර්ලන්ත ජාතික පීට් ඩයික්ස්ට්‍රා මහතාය. ආසියානු ලේකම් වූයේ ඉන්දීය ජාතික කේ. වී. රෙඩ්ඩි මහතාය. රාජසේකරන් මහතා ද එහි විධායක සභිකයෙක් විය. ඔහු එවකට ඉන්දීය තරුණ මණ්ඩලයේ සභාපති පදවිය ඉසිලීය. අප ඒ සමුලුව කාලය තුළ නැවතී සිටියේ කර්නාටක් ප්‍රාන්තයේ ව්‍යවස්ථාදායක

සභිකයන් නතර ව සිටි නේවාසිකයේ ය. මට මතක හැටියට, ලංකාවෙන්ද තරුණ නියෝජිතයින් කීප දෙනෙක් මේ සමුලුවට සහභාගි වූහ. මෙයින් එක් අයෙක්, මා විසින්ම – මේ සඳහා සර්වෝදය ව්‍යාපාරයෙන් ලංකා තරුණ මණ්ඩලය මගින් එවූ තරුණයෙක් විය.

ඡායාරූපඃ 306
පීට් ඩයික්ස්ට්‍රා මහතා

ඒ සමුලුවේ දී මා කළ දේශනය දැනට මුද්‍රණය වී තිබෙන බැවින්, මෙහි විස්තර කිරීම අනවශ්‍යය. එහෙත් කරුණු තුනක් මේ සමුලුව හා සම්බන්ධව මගේ සිතට නැඟේ.

පළමුවැනි තරුණ සංස්කෘතික ආක්‍රමණයයි. මෙම සමුලුවේ සංවිධාන කටයුතු බාරව තිබුණේ, එවකට ඉන්දීය තරුණ මණ්ඩලයට සම්බන්ධ වූ බැංගලෝර් කණ්ඩායමකටයි. මේ අය සංවිධාන කටයුතු ඉතා ඉහළින් සිදු කොට තිබූ බව කිව යුතුය. එහෙත් ආගන්තුක සත්කාරවලට සම්බන්ධ පැත්ත ද, සංස්කෘතික සන්ධ්‍යාව ද බාර වී තිබුණ අය – පොහොසත් කොම්පැනිකාරයින්ට ගැති වී තිබුණ බව පෙනිණි. එක් සන්ධ්‍යාවක රාත්‍රි ආහාරය සූදානම් කර තිබුණේ අලුතින් විවෘත වුණු නවීන පන්නයේ හෝටලයක් වූ 'බැංගලෝර් ඉන්ටර්නැෂනල්' යන හෝටලයේය. ඒ රාත්‍රි භෝජන සංග්‍රහයට ඉන්දීය රජයේ මධ්‍යම කැබිනට් ඇමති වරයකු වූ වෛද්‍ය චන්ද්‍ර ශෙඛරර් මහතා ද, ප්‍රාන්ත රාජ්‍යයේ මැති ඇමතිවරු කිහිප දෙනෙක් ද ඇතුලු තුන්සියක් පමණ සහභාගි වූහ. දකුණු සහ පෙරදිග ආසියානු රටවල තරුණ–තරුණියන් වැඩි පිරිසක් මෙහි වූහ. මා එවූ තරුණයා ඇතුලු ලාංකික තරුණ තරුණියෝ ද වූහ. මට ඇරැයුම් කර තිබුණේ කථිකයකු ලෙස බැවින්, ප්‍රධාන මේසයේ ඇමතිවරු සමඟ මගේ අසුන ද විය.

රාත්‍රි කෑම නිමා විය. ඉන්දීය සංස්කෘතියේ අගනා විශේෂාංග ඇතුළත් සංස්කෘතික වැඩ සටහනක් ඉදිරිපත් කෙරෙන බව නිවේදනය කෙරුණි. ගත වූයේ මොහොතකි. දිග ඇඳුමක් ඇඳගත් චීන තරුණියක් කුඩයක් කර කවමින් සබයට ආවාය. බටහිර සංගීතය අනුව නටමින් සිටි ඇයගේ දිග ඇඳුම මුලින්ම ගැලවිණි. තව රවුමක් ඇය කැරකී වුත් කුඩය උස්සන විට, මිනි ගවුමත් ගැල වී හැට්ටයත් ගැල වී තිබිණි. දැන් බිකිණි යට අමුඩයත් – තන පටයත් පමණකි ඉතිරි වූයේ.

දැන් මට මෙතනින් නැගිට යෑමට සිතේ. එහෙත් තනියෙන් කෙසේ මේ මැති ඇමතිවරුන්ට අගෞරව කොට නැගිට යන්න ද? කීප දෙනකුගේ මුහුණු බැලීමි. එහෙත් කාගේත් ඇස් යොමු ව තිබුණේ ඒ මිටි තරබාරු කැරපොතු හමක් තිබුණු ඒ කෙල්ල දෙසටය. ඇගේ තනපටයද ගැල වී විසිවුණි. දැන් ඇය කුඩය ඉවත් කරමින් ටික ටික ඇගේ දෙතන පෙන්වමින් ශාලාව පුරා තාලයට නටයි. හිටි හැටියේ එක් එක් අයගේ මුහුණ ළඟට ඇගේ ඒ නෙරාගිය මස් පිඩුව අතින් අල්ලා ස්පර්ශ කරයි. මම නැගිට්ටෙමි. නැගිට්ටා නොව මා ඉබේ ම නැගිට විණි. ඇමතිවරුන් දෙසට හැරීමි.

මා ආවේ බුදුන් වහන්සේගේ–ධර්මාශෝක අධිරාජයාගේ– මහත්මා ගාන්ධි තුමාගේ – ඉන්දියාවට මිස, පහත් බිස්නස් කාරයන්ගේ ඉන්දියාවට නො වන බවත්, ඉන්දීය සංස්කෘතික අංශයක් ඉදිරිපත් කරන්නේ යැයි නිවේදනය කරන විට මා බලාපොරොත්තු වූයේ භාරත නාට්‍ය වැනි කලා අංගයක් බවත්, ආසියාවේ තරුණ තරුණියන්ගේ ලජ්ජා බය මෙසේ කඩ කරනවාට මා විරුද්ධ බවත් පවසා, එවේලේම නැගිට්ටෙමි.

මගේ සර්වෝදය ගෝලයාත්–මිත්‍රයාත් දෙස බැලීමි. ඔහු විනෝදාත්මක සිනහවක් පෑවා මිස මා හා නැගිට එළියට ආවේ නැත. මම තනිව ම ඒ ශාලාවෙන් පිටවීමි. "බ්‍රදර් බ්‍රදර්" – "මල්ලී මල්ලී" යනුවෙන් අමතමින්, මා පිටුපසින් එක් කාන්තාවක් පමණක් පැමිණෙනු දිටිමි. චාම් සාරියක් ඇඳගෙන සිටි තලඑළලු මේ කාන්තාව නියම ඉන්දීය කාන්තා රත්නයකි. ඇය නො සිටින්නට ඒ ශාලාවට ඇතුලුවන තැන සිටි හැඩි දැඩි මුරකාරයා, අපට හෝටලයෙන් පිටවන්ට ඉඩ දෙන්නේ නැත. ඒ ශ්‍රේෂ්ඨ කාන්තාවගේ නම පද්මාසිනී අසූරි නම් වූවාය. ඉන්දීය රජයේ පෝෂණ වැඩ පිළිවෙළෙහි සේවය කරන රාජ්‍ය සේවිකාවක් වූ ඇය බැලීමට, බැංගලෝරයට පැමිණි විට, මා කවදාවත් අමතක කරන්නේ නැත. එදා රෑ අප නැවතී සිටි නිවාසයට ඕ මා හැරලූවාය.

මගේ සර්වෝදය ගෝලයා බැලීමට පසුවදා උදේ ඔහුගේ කාමරයට ගියෙමි. ලංකාවෙන් පැමිණි තවත් වෙන ආයතනයක තරුණයෙකුත්, තවත් කීප දෙනකුත් සමඟ – ලංකාවෙන් ගෙනා අරක්කුවල රස බලන අන්දම දුටු මට ඇති වූයේ මහත් සංවේගයකි; පිළිකුලකි. මේ සිංහල–බෞද්ධ දෙමාපියන් යටතේ හැදුණු මේ හොඳ තරුණයා, බටහිර සංස්කෘතික ආක්‍රමණයකට බිලි වූ හැටි! එතැනින් නො නැවතී මදුරාසියේ කෙල්ලක් සමඟ දුටු පමණින් හේ ආලයෙන් වෙලුණේ ය. මේ

තරුණයා නැවත නියම මගට ගෙන, අපේ පාරට නැවත ඇද ගැනීමට ඊට පසු වසර කීපයක් ගත විය. දැන් ඔහු ඉතා හොඳ උසස් තැනක් දරන මගේ ගෞරවය නැවත හිමි කරගත් තරුණ පියෙකි.

සර්වෝදය පණිවිඩයක් රැගෙන යුරෝපයට යෑමට මට මග පෑදුණේ මේ සමුලුවේ දී වීම, දෙවැනි වැදගත් සිද්ධියයි. මේ සමුලුවේදී මුණ ගැසුණ නෙදර්ලන්ත ජාතික පීට් ඩයික්ස්ට්‍රා මහතා, මගේ සිත් ගත් හොඳම වැඩිහිටියාය. සමුලුව යන අතරේ අප දෙදෙනා එකව, බ්‍රසල්ස් නගරයේ තිබෙන ලෝක තරුණ සමුලුව මාර්ගයෙන් - පැරිසියේ යුනෙස්කෝවල තෑගි කූපන් ක්‍රමයට, සර්වෝදය මගින් ගැමි පුස්තකාල සියයක් ආරම්භ කිරීමේ යෝජනා ක්‍රමයක් සකස් කළෙමු.

පීට් සහ මා අතර ඇතිවුණු ඒ මිත්‍රත්වය ඊළඟ අවුරුදු කිහිපය තුළ දියුණු වූයේ සර්වෝදය බීජය ක්‍රම ක්‍රමයෙන් යුරෝපීය රටවල ද රෝපණය කිරීමෙනි. මේ ගැන විස්තර කිරීම පසුවට තබමි.

මේ සමුලුවෙන් ලැබුණු තුන්වැනි ප්‍රතිඵලය නම්, ලෝක තරුණ සමුලුවත් සමඟ මගේ ඇති වුණු කිට්ටු සම්බන්ධයයි. එකල එම්. වී. රාජසේකරන් මහතා ද සමුලුවේ විධායක සභිකයෙක් විය.

73

ගාන්ධි ශත සංවත්සරය

මහත්මා ගාන්ධිතුමාගේ ජන්ම ශත සංවත්සර උළෙල යෙදී තිබුණේ එක්දහස් නවසිය හැටනවයේ ඔක්තෝබර් මස දෙවෙනිදාය. එක්දහස් නවසිය හැටහතේ සිට මෙම සංවත්සර උළෙල ඉතා ඉහළින් පැවැත්වීම සඳහා අපි සංවිධානය වීමු. මේ සඳහා කුඩා රැස්වීම් කිහිපයක් ම සෙනෙට් චතුරස්‍රයේ පිහිටි සෙනෙට් සභාපති ඒ. රත්නායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් එතුමාගේ කාර්යාලයේ පැවැත්වීමු. මේ සම්බන්ධ යෙන්, එක්දහස් නවසිය හැටඅටේ මාර්තු පළවැනිදා බොරැල්ල තරුණ බෞද්ධ සමිති ශාලාවේදී ප්‍රසිද්ධ රැස්වීමක් පැවැත්වීමු. ගාන්ධි ශත සංවත්සර ජාතික කමිටුවක් මෙහි දී පිහිටුවා ගත් අතර, එහි ප්‍රධාන නිලධාරීන් වශයෙන් පහත සඳහන් අයවලුන් පත් කර ගතිමු.

ප්‍රධාන අනුශාසක
අග්‍රාණ්ඩුකාර විලියම් ගොපල්ලව මැතිතුමා

උප අනුශාසකවරු
ගරු අග්‍රාමාත්‍ය ඩඩ්ලි සේනානායක මැතිතුමා
විරුද්ධ පක්ෂයේ නායිකා ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය

සභාපති
සෙනෙට් සභාපති ගරු ඒ රත්නායක මැතිතුමා

ප්‍රධාන ලේකම්වරු
ඒ.ටී. ආරියරත්න මහතා
ලලිත් හේවාවිතාරණ මහතා

ඇල්බට් එදිරිසිංහ මහතා
පාලිත වීරසිංහ මහතා

උප ලේකම්වරු
එම්.ඒ. තිලකරත්න මහතා
එස්.කේ. තම්බිපිල්ලේ මහතා
පියසෝම මේදිස් මහතා

භාණ්ඩාගාරිකවරු
තෝමස් අමරසූරිය මහතා
ජේ.එල්. ගංගුලි මහතා
සී.බී. මෝඩි මහතා

මෙම ජාතික කමිටුව සංස්ථාපිත කිරීමේ රැස්වීම කැඳ වූයේ සර්වෝදය ශ්‍රමදාන සංගමය, ගාන්ධි සේවා සංගමය, මහාබෝධි සංගමය සහ ඉන්දු ලංකා සංගමය ඒකාබද්ධවය. සෙනෙට් සභාපති ගරු ඒ. රත්නායක මැතිතුමාට මුලසුන ගෙන කටයුතු කරන ලෙස ආරාධනා කළේ, එම්. ඒ. තිලකරත්න මහතාය. මහත්මා ගාන්ධිතුමා සිහිකොට මිනිත්තු දෙකක පමණ නිශ්ශබ්දතාවකින් පසු ගරු ඒ. රත්නායක මැතිතුමා මුලින්ම කතා කළේය.

මහත්මා ගාන්ධිතුමාගේ චරිතය සැකෙවින් විස්තර කළ රත්නායක මහතා, හතලිස් කෝටියක් ඉන්දීය ජනතාව පමණක් නොව, පකිස්ථානය, බුරුමය, මැලේසියාව, සිංගප්පූරුව, ලංකාව ඇතුලු ආසියාවේ රටවල් ද අප්‍රිකාවේ සහ දකුණු ඇමරිකාවේ රටවල් ද නිදහස කරා යොමු කිරීමට මහත්මා ගාන්ධිතුමා කළ සේවය අගය කළේය. මෙම ශත සංවත්සර

ඡායාරූප: 307
ගාන්ධි ශත සංවත්සර උළෙලට සහභාගි වූ ජාතික නායකයින් ප්‍රධාන පිරිස පන්සිල් ගැනීම

ඡායාරූපඃ 308
ගාන්ධිතුමාගෙ
ජීවිත කතාව
ප්‍රදර්ශනය

උළෙල ඉතාමත්ම ඉහළින් පැවැත්වීමට එතුමා කාගේත් ආධාරය සහයෝගය පැතුවේය.

කොළඹ නගරාධිපති ජබීර් ඒ. කාදර් මහතාගේ සහ එස්. සෝමසුන්දරම් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ඉහත සඳහන් විධායක මණ්ඩලය සම්මත කර ගන්නා ලදී.

ඉන්දීය තානාපති ශ්‍රී වයි.ඩී. ගන්දේවියා, පූජ්‍ය හැඩිගල්ලේ පඤ්ඤාතිස්ස නාහිමි, මුදලියර් එස්.සින්නතම්බි, පූජ්‍ය හෙට්ටිමුල්ලේ වජිරබුද්ධි නාහිමි සහ වෛද්‍ය එම්. සී. එම්. කලීල් මහතා සභාව අමතා කතා කළහ.

ආචාර්ය එන්. එම්. පෙරේරා මහතා, විරුද්ධ පක්ෂයේ නායිකා ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ආදීහු කතා කරමින් මහත්මා ගාන්ධි ජන්ම ශත සංවත්සර උළෙල සාර්ථක කර ගැනීමට සියලුම සහයෝගය දෙන බවට ප්‍රකාශ කළහ.

අබ්දුල් අසීස් මහතා සහ මම ද අවසාන දේශන පැවැත්වීමු.

මහාචාර්ය ජී. පී. මලලසේකර මහතාගේ ප්‍රධානත්වයෙන් සහ එම්. ඒ. තිලකරත්න, එස්. කේ. වේලායුදපිල්ලේ යන මහත්වරුන් ලේකම්වරු හැටියටත්, මහාචාර්ය වල්පොල රාහුල හිමි, මහාචාර්ය බඹරැන්දේ සිරි සීවලී හිමි, මහාචාර්ය කේ. එන්. ජයතිලක, මහාචාර්ය ඕ. එච්. ද එස්. විජේසේකර යන මහතුන්ගේ ප්‍රධානත්වයෙන් ජාතික ඒකාබද්ධතා කමිටුවක් ක්‍රියාත්මක කිරීමට පටන් ගන්නා ලදී. ආර්. ඒ. විජේගුණවර්ධන, ඩී. එස්. සේනානායක, මුදලියර් එස්. සින්නතම්බි, උපාලි සේනානායක, එස්. සිරිනිවාසන් යන මහත්වරු ද – සීතා රාජසූරිය මැතිනිය ද ග්‍රාමෝදය කමිටුව ක්‍රියාත්මක කිරීමට පටන් ගත්හ.

ඡායාරූප: 309
ඉන්දීය මහ කොමසාරිස් ආචාර්ය හිම්සෙන් සචාර්, ගාන්ධි සාම පදනමේ සභාපති ආචාර්ය ආර්. ආර්. දිවාකර්, නැදලගමුවේ ධර්මරාජ පිරිවෙනේ පැවති සමුලුවට කැඳවාගෙන යෑම

අධ්‍යාපන කමිටුව හැන්ඩි පෙරිම්පනායගම් මහතා, එල්.ජී. හේවගේ මහතා. එස්.කේ. තම්බිපිල්ලේ මහතා සහ පියසෝම මේදිස් මහතාගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක විය.

සමාජ සංවර්ධන කමිටුව ඩී.බී. ඇල්ලෙපොල මහතා, එස්. සිවසුබ්‍රමනියම් මහතා, ආදීන්ගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක විය.

සම්පත් සෙවීමේ කමිටුව ඇල්බට් එදිරිසිංහ මහතා, සී. නඩේෂන් මහතා. ආර්. ඒ. නඩේෂන් මහතා, ජේ. එල්. ගංගුලි මහතා සහ සී. බී. මෝඩි මහතාගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක විය.

තම තමන්ගේ ශක්ති ප්‍රමාණයේ හැටියට මේ සියලු ම කමිටු ක්‍රියාත්මක වූ අතර, මෙම උත්සවයට අදාල සියලු ම ලියකියවිලිවලට අත්සන් තැබුවේ මායි.

ගරු අග්‍රාමාත්‍ය ඩඩ්ලි සේනානායක මැතිතුමාගේ ඇරියුමෙන් එක්දහස් නවසිය හැටඅටේ, සැප්තැම්බර් මස එකළොස් වැනිදා, එකසිය හැට හත් දෙනෙක් පමණ වූ ගාන්ධි ශත සංවත්සර කමිටුවට සම්බන්ධ අය රජගෙදරට රැස්ව, අතිගරු විලියම් ගොපල්ලව මැතිතුමා දුන් තේපැන් සංග්‍රහය ද භුක්ති විඳ, ගාන්ධි ශත සංවත්සර වැඩ සටහන අනුමත කර ගත්හ.

සර්වෝදය කොටස හැටියට පහත සඳහන් කාර්යයන් අපි බාර ගත්තෙමු:

1. දැනට ක්‍රියාත්මක වන ගම් සියයේ සංවර්ධන යෝජනා ක්‍රමය
2. ප්‍රජා නායකත්වය සඳහා තරුණ තරුණියන් 5000 ක් පුහුණු කිරීම
3. මහත්මා ගාන්ධි සාහිත්‍ය පළ කිරීම

4. මහජන දේශන, චිත්‍රපටි සංදර්ශන, පුවත්පත් ලිපි, පාසල්වල දේශන, ගුවන්විදුලි වැඩ සටහන්, රචනා, නාට්‍ය, ගී සින්දු ආදී තරඟ මාර්ගයෙන් සර්වෝදය අදහස ප්‍රකාශ කිරීම

5. සර්වෝදය මූලස්ථානයක් පිහිටුවා ගාන්ධි අනුස්මරණ ශාලාවක් සහ සාම පුස්තකාලයක් ගොඩනැඟීම

6. සර්වෝදය ආශ්‍රමයක් සහ සමුපකාර ගොවිපලක් ගොඩනැගීම.



ඡායාරූප: 310
ආචාර්ය එන්. එම්. පෙරේරා

අපේ ශක්ති ප්‍රමාණයේ හැටියට ඉහත සඳහන් වැඩ සටහන් අපි අඛණ්ඩ ව ක්‍රියාත්මක කළෙමු.

එක්දහස් නවසිය හැටඅටේ ඔක්තෝබර් දෙවැනිදා සිට එක්දහස් නවසිය හැත්තෑවේ ජනවාරි තිස්වැනිදා දක්වා මහත්මා ගාන්ධි ශත සංවත්සර උළෙල ඉතා සාර්ථකව ක්‍රියාත්මක කළෙමු.

එක්දහස් නවසිය හැටඅටේ දෙසැම්බර් මස විසිඑක්වැනිදා යාපනයේ ගාන්ධි ශත සංවත්සර උළෙලේ කටයුතු සංවිධානය කිරීම සඳහා විලියම් කන්දගේ මහතා, එම්. ඒ. තිලකරත්න මහතා සහ මම යාපනයට ගියෙමු.

මුලසුනේ සිටියේ දිසාපති එස්. පී. පීටර්ස් මහතාය. යාපනයේ ප්‍රජා නායකයින් සියලු දෙනාම වාගේ මේ රැස්වීමට සහභාගි වී සිටි අතර, මෙහි දී තීරණය කර ගත් වැඩ සටහන් අතර, ශ්‍රී ජයප්‍රකාශ් නාරායන් තුමා එක්දහස් නවසිය හැටනවයේ ජනවාරි නවවැනිදා ලංකාවට පැමිණි විට යාපනයට ද එතුමා කැඳවා ගෙන ඒමට පොරොන්දු වීමි.

මහත්මා ගාන්ධිතුමාගේ ජීවිතය සහ දර්ශනය අළලා රාජකීය විද්‍යාලයීය ශාලාව, නාලන්දා විද්‍යාලයීය ශාලාව, බොරැල්ල සහ කොටුවේ තරුණ බෞද්ධ සමිති ශාලාව ආදියේ පැවැත්වූ දේශන ඉතා ජනප්‍රිය විය. මේ දේශන පැවැත් වූ අය අතර මහාචාර්ය කේ. එන්. ජයතිලක, ආචාර්ය එන්. එම්. පෙරේරා, මහාචාර්ය ධර්මසේන අරම්පත්ත, එම්. ඒ. තිලකරත්න, ගරු ජේ. ආර්. ජයවර්ධන, ගරු පිලිප් ගුණවර්ධන, කේ. රාමචන්ද්‍රන්, කේ. නේසයියා ආදී වූ දේශකයෝ සහ නායකයෝ ද වූහ.

74

අධ්‍යාපනය සහ ප්‍රජා සංවර්ධනය

ඡායාරූප: 311
මහාචාර්ය ජේ. ඊ. ජයසූරිය

එක්දහස් නවසිය හැට එක අවසානයේදී පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ අධිපති මහාචාර්ය ජේ. ඊ. ජයසූරිය මැතිතුමාගේ ඇරියුමෙන් විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන විෂයයෙන්, පශ්චාත් උපාධිය හදාරණ ශිෂ්‍යයින්ට දේශනයක් කිරීම සඳහා මට ආරාධනා ලැබුණේය. මා මහරගම ගුරු අභ්‍යාස විද්‍යාලයේ අධ්‍යාපනය ලබද්දී, ජේ. ඊ. ජයසූරිය මහාචාර්යතුමා පැමිණ, අපේ සමාජ සේවා සංගමයට දේශන පවත්වනවා මට මතකයි. ඒ දේශනවලදී එතුමා ඉන්දියාවේ සර්වෝදය, භූදාන්, ශ්‍රමදාන ව්‍යාපාරය ගැනත්, විනෝබා භාවේතුමා ගැනත් කරුණු කියා දෙනවා මට මතකයි. එහෙත් ප්‍රායෝගිකව එක්දහස් නවසිය පනස් අට වනතුරු එවැනි සේවාවන් විශාල වශයෙන් නො කළ නිසා එහි ගැඹුර මට ඒ අවස්ථාවේදී තේරුම් ගියේ නැත.

මට දේශනය කිරීමට තිබුණේ "ශිෂ්‍යයින් සහ ගුරුවරුන් ප්‍රජා සංවර්ධනයට සහභාගි කරවීම" යන මාතෘකාව ඔස්සේය. මා නිතරම කතා කළේ, මගේම අත්දැකීම් සිහියට නගමින්, ඒවා පදනම් කරගෙන ශාස්ත්‍රීය වශයෙන් කරුණු ඉදිරිපත් කිරීමය. ලොව පුරා සම්භාවනීය රැස්වීම්වල මා කතා කර ඇතත්, කලින් ඒවා සූදානම් කළේ කලාතුරකිනි. මේ නිසා විශ්ව විද්‍යාලයේ පැවැත් වූ මේ දේශනය ද මම කිසිම සූදානමක් නැතිව පැවැත්වීමි. දේශනය සහ සාකච්ඡාව පැය තුනක් පමණ පැවැතියේය. එය අවසානයේදී මහාචාර්ය ජේ.ඊ. ජයසූරිය මැතිතුමා මා එතුමාගේ කාර්යාලයට කැඳවාගෙන ගොස්, මගේ කතාවේ පිටපත මගෙන් ඉල්ලීය. මගේ ළඟ පිටපතක් නැති බවත්, මා ක්ෂණිකව එම කතාව කළ බවත්, එතුමාට පැවසූ විට – එතුමාට එය

විශ්වාස කළ නොහැකි විය. මා විශ්ව විද්‍යාලයක විධිමත් අධ්‍යාපනයක් නොලැබූ බව ප්‍රකාශ කළ විට ද එතුමා පුදුම විය. එතැන ආචාර්ය ස්වර්ණා ජයවීර මැතිනිය ද සිටියාය. මේ මාතෘකාව උඩ කිසිම ලිඛිත නිබන්ධනයක් කිසිවෙකු පළ කොට නැති නිසා, වහාම මේ කතාව ලියා දෙන ලෙස එතුමා මගෙන් ඉල්ලීමක් කළේය. මා කී කිසිවක් මට මතක නැති බව ප්‍රකාශ කළ විට, ස්වර්ණා ජයවීර මැතිනිය එතුමියගේ සටහන් මට දීමට පොරොන්දු විය.

ඡායාරූප: 312
ආචාර්ය ස්වර්ණා ජයවීර මැතිනිය

ජයසූරිය මැතිතුමාගේ කාර්යාලයේ තිබුණු ඉංගිරිසි යතුරු ලියනයක් ළඟ වාඩි වී එම කතාව සම්පූර්ණයෙනම ලේඛනගත කළෙමි. එදා රෑ මා ගත කළේ ජයසූරිය මහතාගේ නිවසෙහිය. එතුමාට මම දේශන පිටපත දුන් විගසම එය කියවා බලා, ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපන සංගමයේ සඟරාවෙහි පළ කරන ලෙස ස්වර්ණා ජයවීර මැතිනියගේ අතට දුන්නේය. එම සඟරාවේ සංස්කාරක වශයෙන් එවකට කටයුතු කළේ ස්වර්ණා ජයවීර මැතිනියයි. සංස්කාරක මණ්ඩලයේ සිටියේ මහාචාර්ය ජේ. ඊ. ජයසූරිය, කථිකාචාර්ය කේ. නේසයියා යන මැතිතුමන්ලා සහ කථිකාචාරිනී හිල්ඩා ඊ. පීරිස් මැතිනිය සහ කිංස්වුඩ් කොලීජියේ ආචාර්ය කෙනත් ද ලැනරෝල් මහතා ය.

ජාතික අධ්‍යාපන සඟරාවේ එකළොස් වෙනි වෙලුමේ අංක 1 දරන– එක්දහස් නවසිය හැටදෙකේ, මාර්තු කලාපයේ මගේ එම ලිපිය පළ විය.

75

බඩේ ලෙඩේ හදාගන්න එපා

ඡායාරූප: 313
ඩඩ්ලි සේනානායක මැතිතුමා

අරලියගහ මන්දිරයේ ගේට්ටු දෙකම සම්පූර්ණයෙන් විවෘතව තිබුණේය. එක පොලිස් කොස්තාපල් වරයෙක් අපේ වාහනය ඇතුලු වන විට ආචාර කළේය. සමහර විට උපාලි සේනානායක මහතාගේ හිල්මන් රථය නිතර එහි යන එන නිසා වන්නට ඇත. පෝටිකෝවේ අපි අපේ වාහනය නැවැත්තුවෙමු. අපි ඉස්තෝප්පුවට ගොඩ වන විට අගමැතිතුමා පුටුවක හාන්සි වී පයිප්පය උරමින් සිටියේය. වෙන කවුරුත් පේන තෙක් මානයේ සිටියේ නැත.

වේලාව දහවල් 12.00 ට පමණ ඇත. දවස මට මතක නැත. අවුරුද්ද යන්තම් මට මතකය. ඒ එක්දහස් නවසිය හැටඅටේ වර්ෂයයි. අද මෙන් එදා අරලියගහ මන්දිර වත්තවත්, අරලියගහ මන්දිරයවත් සුඛෝපභෝගී රූපයක් ඉසුලූවේ නැත. එය ලංකාවේ වෙනත් ඕනෑම තැනකදී දැකිය හැකි පැරණි වලව්වක සිරිය ඉසිලීය. පරණ තාලේ මේස, පුටු ආදිය නිසා බාහිර ආටෝපයකට වඩා ගාම්භීර ස්වරූපයක් අරලියගහ මැදුරෙන් පිළිබිඹු විය. එළිපිට වත්, හැංගිලා වත් ගිනි අවි ගත් කිසිවෙක් පේන තෙක් මානයේ සිටියේ නැත. රටේ නායකයා වූ ඩඩ්ලි සේනානායක මැතිතුමා තුළ තිබූ නිහතමානී භාවය නිසා නිහඬව–නිසසල සිතින් ජාතික ප්‍රශ්න ගැන කල්පනා කිරීමට මේ නිශ්චල පරිසරය අතිශයින්ම ගැලපුණේය.

"කම්... කම්... ආරි, නයිස් ටු සී යූ, සිට් ඩවුන්, සිට් ඩවුන්" යැයි පයිප්පය දකුණු අතට ගත් ඩඩ්ලි සේනානායක මැතිතුමා අපට වාඩිවීමට ඇරියුම් කළේය.

තම ඥාති සහෝදර උපාලි සේනානායක මහතා දෙසට හැරුණු අගමැතිතුමා, අප ආහාර ගෙන පැමිණියේ දැයි විමසුවේය. අප තාමත්

ආහාර නොගත් බව පැවසුවෙමු. ගේ ඇතුළට හැරී එහි සිටි වැඩිහිටි සේවකයෙකුට කථා කොට කෑම පැකට් 8 ක් රියදුරු සමඟ ගෝල්ෆේස් හෝටලයට ගොස් රැගෙන එන ලෙස පවසනවා අපට ඇසුණේය.



ඡායාරූප: 314
ආර්. ජී. සේනානායක මැතිතුමා

සර්වෝදය වත්මන් තත්ත්වය ගැනත්, වල්පැළ නෙළීමේ ව්‍යාපාරය පිළිබඳවත් ඩඩ්ලි සේනානායක මැතිතුමා අපෙන් විමසීය.

එතකොටම ගෝල්ෆේස් වෙරළ මත මහ මුහුදෙන් නොකඩවා හැපෙන රළ දහරාවන් මෙන් උපාලි සේනානායක මහතා සර්වෝදයත්, වල්පැළ නෙළීමේ හා ගොයම් පැළ සිටුවීමේ ව්‍යාපාරයත් – මාත් පිළිබඳව කථා කරන්නට පටන් ගත්තේය. ටික වේලාවක් යන විට – තවත් වාහනයක්, අරලියගහ මැඳුරේ පෝටිකෝව අසලට ළඟා විය. එයින් බැස ආවේ තවත් මහ කලු සිංහලයෙකි. මේ තිදෙනා එක තැන සිටි විට පැරණි යුගයේ සිටි දස මහා යෝධයන් මතක් වේ. දැන් පැමිණි අමුත්තා ආර්. ජී. සේනානායක මහතායි. මේ සහෝදරයන් තිදෙනා උනුනුන් සමඟ වාද කරන සැටි – උනුන් විහිලුවට භාජනය කරමින් කථා කරන හැටි – අසා සිටි මට, එය ලොකු විනෝද අවස්ථාවක් විය.

මා හා පුරා කියා අපේ ගමේ සමාජ සේවයක් අරඹා, ඉදි කළ නව ගොඩනැගිල්ල ඒ කාලයේ දේශපාලනයෙන් ඉවත්ව සිටි ඩඩ්ලි සේනානායක මැතිතුමා අතින් විවෘත කළ හැටි – මම උපාලිට හා ආර්. ජී. ට පවසන විට ඩඩ්ලි සේනානායක මැතිතුමා මට වඩා හොඳින් ඒ උත්සවය විස්තරය කළේය.

"ආරිගේ අවවාදය ගණන් නොගෙන, මගේ කරුමයට නැවතත් මේ දේශපාලනයට ඇතුල් වන්නට සිදු වුණා" යැයි එතුමා පවසනවා මට හොඳට මතකය.

අපේ කෑම පාර්සල් ටික දැන් මේසය උඩය. ඒ වටේ පිඟන් 4 ක් ද තබා තිබුණි. "මට හොඳටම බඩගිනි"යි කියූ ඩඩ්ලි සේනානායක මහතා, අපත් සමඟ ගොස් පාර්සල් දිග හැර ගෙන, කෑම කන්නට පටන් ගත්තේය. අත සේදීමටත්, බීමට වතුරත් තිබෙන භාජන හා අත් පිස්නා හැර, හැඳි – ගෑරුප්පු හෝ අතට පයට සේවකයෝ හෝ එහි නොවූහ. පුද්ගලයෙකු වශයෙන් මා කවදත් ගරු කළ, ඩඩ්ලි සේනානායක

මහතාගේ සරල චාම් ජීවන රටාව දුටු විට මගේ ගෞරවය තවත් වැඩි විය.

මගේ බත් මුලෙන් තුනෙන් එකක්වත් කැමට මට නොහැකි වූයේ එය එතරම් විශාල බත් මුලක් වූ නිසයි. ඩඩ්ලි සේනානායක මහතා පළමුවන බත් මුල ඉවර කළේය. දැන් දෙවෙනි බත් මුල භුක්ති විඳී. දැන් මට තවදුරටත් කට පියා ගෙන සිටිය නොහැකිය.

"සර්, ඔච්චර බත් කන්න හොඳ නැහැ."

"පිස්සු කතා නොකර ඉන්න ආරි, මට කන්න හම්බ වෙන්නේ වේල් කීපයකට සැරයයි. හම්බ වුන වෙලාවට අර ඔක්කොටම හරි යන්න මම කනවා" අගමැති තුමා පිළිතුරු දුන්නේය.

එවිට ආර්. ජී. සේනානායක මහතා කතා කරන්නට පටන් ගත්තේය. "ආරි, දේශපාලනය නොකළට – ඔයත් අපි වගේම මහන්සිවෙලා සමාජ සේවයක් කරන කෙනෙක්. මම ඔයාට අවවාදයක් කරන්න කැමතියි. ඔයා අහලා ඇතිනේ, පත්තරවල ඩඩ්ලි අයියගෙයි– මගෙයි බඩේ ලෙඩේ ගැන කියනවා. ඒක සම්පූර්ණ ඇත්ත. අපි දෙන්නාම කවදා හරි මැරෙන්නේ බඩේ ලෙඩෙන් තමයි. හේතුව දන්නවාද? මේ දේශපාලනයක් නිසා – කවදාවත් අපට එකම වේලක්වත් වෙලාවට කන්න ලැබෙන්නේ නැහැ. ඒක සෞඛ්‍යයට හරිම නරකයි. ඔබට මම දෙන අවවාදය ප්‍රධාන වේල් තුනෙන් – අඩුම වශයෙන් එකක් වත් නියමිත වේලාවට කන්න පුරුදු වෙන්න ඕනැ."

එදා සිට අද වනතුරු ලෝකේ කොහේ සිටියත්, දිවා ආහාරය 12.30 ත් 1.00 ත් අතර ගැනීමට මම අමතක නො කෙළෙමි.

76

ශාන්ති සේනාවේ ආරම්භය

ජායාරූප: 315
ශ්‍රීමතී ආශා දේවි

සර්වෝදය සංසදයේ විශේෂ සේවා ආයතන රැසක්ම තිබේ. එයින් මුල්ම විශේෂ සර්වෝදය සේවා අංශය වූයේ සර්වෝදය ශාන්ති සේනාවයි.

එක්දහස් නවසිය හැටදෙකේ වසරේ අප්‍රේල් අවසන සිට ජූනි මුල් කාලය දක්වා ඉතා වැදගත් ඉන්දීය නායකයන් දෙපළක් සර්වෝදය අප සමඟ ලංකාවේ සිටියහ. ලංකාවේ උපත ලත් – එහෙත් ඉන්දියාවේ අධ්‍යාපනය ලබද්දී මහත්මා ගාන්ධි තුමා සමඟ ඉන්දීය නිදහස් සටනට එක් වූ ඊ. ඩබ්ලිව්. ආරියනායගම් මැතිතුමා මෙයින් එක් අයෙකි. අනෙක් තැනැත්තා එතුමාගේ භාර්යාව වූ රවීන්ද්‍රනාත් තාගෝර්තුමා ගේ ලේලියක් වූ ශ්‍රීමති ආශා දේවි විය.

ඉන්දියාවට නිදහස ලැබීමෙන් පසු 'වර්ධා ක්‍රමය' නමින් ප්‍රසිද්ධ වූ නව අධ්‍යාපන ක්‍රමය ගොඩනැංවීමට මහත්මා ගාන්ධි තුමා විසින් පැවරුවේ ඊ.ඩබ්ලිව්. ආරියනායගම් මහතාටය. එම ක්‍රමයේ සාර්ථකත්වය නිසා, ඔහු භාරතයේ පමණක් නොව, ලොව පුරාම ශ්‍රේෂ්ඨ අධ්‍යාපනඥයකු වශයෙන් ප්‍රසිද්ධ විය. ඔහු උපත ලැබුවේ යාපනයේ වඩුකෝට්ටේ ප්‍රදේශයේය.

මේ දෙපළ මගේ ආරාධනයෙන් ශ්‍රී ලංකාවට පැමිණ බොහෝ සර්වෝදය ගම්මානවලට ගොස් දේශන පැවැත්වූහ. ඔහුගේ උපන් භූමිය වූ යාපනයට ද ගොස් දින කිහිපයක් ගත කළේය.

ආශාදේවී ආරියනායගම් මැතිනිය, එක්දහස් නවසිය හැටදෙකේ මැයි මස දහතුන් වැනිදා සර්වෝදය මූලස්ථානය වූ දෙල්ගහ යට ගෙදර කාර්යාලයේදී, 'ශාන්ති සේනා' යන මැයින් දේශනයක් කළාය. මේ

ඡායාරූපඃ 316
ආශා දේවී
සර්වෝදය
සේවකයෝ
අමතමින්... වමේ
සිට නාලන්දා
විදුහල්පති කේ. එම්.
ඩබ්. කුරුප්පු මහතා,
මා, ආරියනායගම්
මහතා, සොමී මීගම
මැතිනිය,
රාමචන්ද්‍රන්
මෙනෙවිය

දේශනය අවසානයේ දී ලංකාවේ ද 'සර්වෝදය ශාන්ති සේනාවක්' බිහි කිරීමට අපි තීරණය කර ගතිමු.

ශාන්ති සේනාවේ පරමාර්ථ හැටියට කරුණු 4 ක් අපි ඉදිරියේ තබා ගත්තෙමුඃ

1. මහජනයා අතර ඇති වන ඕනෑම කලබලකාරී අවස්ථාවකදී, එය සාමකාමීව--අහිංසාවාදීව--නිරාකරණය කිරීම සඳහා සිය කැමැත්තෙන් ඉදිරිපත්ව ගැටුම් තිබෙන ස්ථානවලට ගොස් සාමය සඳහා සේවය කිරීමට ඉදිරිපත් වන ශාන්ති සේවක පිරිසක් තෝරා ගැනීම, පුහුණු කිරීම හා සංවිධානය කොට තබා ගැනීම.
2. සාමය පවතින කාලවලදී කුලය, වර්ගය, ආගම, ඇදහිලි ආදී භේදයන් නොමැතිව මුලු මහත් මනුෂ්‍ය වර්ගයාටම සාම සේවා සේනාවක් ලෙස සේවය කිරීම.
3. ලෝක සාම හමුදාවේ කාර්යයන් සඳහා හැකි සෑම ආධාරයක්ම දීම.
4. හිංසක ක්‍රියා ඇතිවීමට හේතු සහ එහි විපාකත්, ඒවා අහිංසාවාදීව ඉවත් කළ හැකි ක්‍රම පිළිබඳවත්, මහජනයාට අධ්‍යාපනයක් ලබා දීම.

ප්‍රතිපත්ති 3 ක් ද අප විසින් පිළිගත්තෙමුඃ

1. අප විසින් බිහි කිරීමට උත්සාහ ගත යුත්තේ සියල්ලන්ගේම අභිවෘද්ධිය සලසන සත්පුරුෂ සමාජයකි.

2. සත්‍යය, අහිංසාව, ආත්මහරණය යන ත්‍රිවිධ ධර්ම න්‍යායයන් මත සියලුම ශාන්ති සේනා කටයුතු පදනම් වේ.
3. නියම සාමය ඇති කළ හැක්කේ අහිංසාවාදී ක්‍රියා මාර්ගයකින් පමණි.

ශාන්ති සේනාවේ සේවක සේවිකාවන් විසින් පිළිගත යුතු ප්‍රතිඥාවක් අනුමත කර ගත්තෙමු:

අ. මිනිසුන් අතර ඇති වන කවර අන්දමේ හෝ ඝට්ටනයක් විසඳීමේ ඒකායන මාර්ගය ලෙස අහිංසාව කෙරෙහි මම සදාකල්හි විශ්වාසය තබමි.

ආ. මම සැම විටම සැම අතින්ම චාම් දිවි පෙවෙතක් ගත කරමි. මගේ ජීවත්වීම සඳහා උවමනා කරන දෑ, මගේම උත්සාහයෙන් කෙරෙන සාධාරණ මාර්ගයකින් සොයා ගන්නා අතර – මගේත්, මගෙන් යැපෙන අයගේත් මූලික අවශ්‍යතාවන්ගේ ප්‍රමාණයට වඩා ධනය රැස් නොකරමි.

ඇ. මම කිසි විටෙක කුලය, වර්ගය, ජාතිය, පන්තිය, වර්ණය, ආගම ආදී භේද අනුව යමෙක් උසස් හෝ පහත් කොට නො සලකමි.

ඈ. මම කිසිවිටෙක පක්ෂ දේශපාලනයෙහි හෝ බලලෝභී දේශපාලනයෙහි නියම වශයෙන් හෝ අනියම් වශයෙන් හෝ නොයෙදෙමි.

ඉ. මගේ රටේ හෝ ලෝකයේ හෝ ඕනෑම පළාතක ඕනෑම තැනක අහිංසාවාදී සාම කටයුතු සඳහා මගේ සේවය අවශ්‍ය වූ විට, ඒ සඳහා සිය කැමැත්තෙන්ම ඉදිරිපත්වීමට පොරොන්දු වෙමි.

ඊ. ජාතික සාමය හා ලෝක සාමය ආරක්ෂා කිරීමෙහි ලා ජීවිත පරිත්‍යාගයෙන් ඉදිරිපත් වීමට මම කැප වෙමි.

උ. සාම කාලයේ දී මම ප්‍රජා සේවා කටයුතුවල යෙදෙමි.

පළමු සර්වෝදය ශාන්ති සේනා පුහුණු කඳවුර පැවැත්වූයේ 1962 අගෝස්තු නිවාඩුවේදී රුවන්මඩුව පවුල් ගොවිපළේදීය. පළමු ශාන්ති සේනා කඳවුර කිලිනොච්චියේ උරුත්‍රපුරම් ගාන්ධි නිලයම්හිදී සහ දෙවැන්න, ත්‍රිකුණාමලයේ විල්ගම් විහාරයේ දී ද, තෙවැන්න සබරගමු පළාතේ කෑගල්ලේ දී ද, සිව්වැනි කඳවුර යාපනයේ දී ද පස්වන කඳවුර නෑදලගමුවේ දී ද පවත්වන ලදී. මේ හැම කඳවුරකටම හාරසියයකට නොඅඩු සිංහල–දෙමළ–මුස්ලිම් පිරිස් සහභාගි වූහ.

ඡායාරූපඃ 317
ආශා දේවි
වවුනියාවේ දී කළ
දේශනයට සවන්
දුන් පිරිස

මෙහි දී තවත් එක් කරුණක් වාර්තා කළ යුතුය. එනම්, මීට අවුරුදු කිහිපයකට පසු නැවත ලංකාවට පැමිණි ඊ. ඩබ්ලිව්. ආරියනායගම් මහතා. කොළඹ දී මා හමුවීමට කුමන කරුණක් නිසා හෝ නොහැකි වූ නිසා කෙලින්ම යාපනයට ගොස් තිබේ. ඔහු උපන් නිවසේ ඉස්තෝප්පුවේ වාඩි වී, ආශා දේවිය මාර්ගයෙන් වතුර වීදුරුවක් ගෙන්වා ගෙන එය පානය කොට තිබේ. ආශා දේවියගේ තුළට ගොස් නැවත ඉස්තෝප්පුවට එන විට ආරියනායගම් මහතා එම පුටුවේම මිය ගොස් තිබුණි. වඩුකෝට්ටම් හි දී ඔහුගේ අවසාන කටයුතු නිම කොට, ආශා දේවිය ඉන්දියාවට ගොස් තිබේ. මේ පිළිබඳව මම දැන ගත්තේ ඔහුගේ අභාවය පිළිබඳ සංවේගය පළ කොට ඉන්දියාවේ ජනාධිපතිතුමා ඇතුලු නායකයින්ගේ විදුලි පුවත් මගේ භාරයේ ලැබෙන විටයි.

ශ්‍රීමති ආශා දේවී, ඉන්පසු මට ලියා එවා තිබුණේ ශ්‍රී ආරිය-නායගම් මහතා ඇය සමඟ අන්තිමටම කථා කළේ සර්වෝදය ගැන බවත්, ඔවුන්ගේ ජීවිතයේ ඉතිරි කාලය ආරියරත්නගේ කටයුතුවලට උදව් වීමට කැප කළ යුතු බවත්ය. එය සම්පූර්ණ කිරීමට නොබෝ දිනකින් ඇගේ එහි කටයුතු නිමවා එන බවත් දන්වා තිබුණාය. එහෙත් හදිසියේ රෝගාතුර වූ ඕ ටික කලකින් මිය ගියාය.

77

තිරුකේත්තීශ්වරම් කඳවුර

එක්දහස් නවසිය හැටහතේ–නත්තල් සමයේදී විශාල කුණාටුවකින් මුහුද ගොඩගලා ගෙන වුත්, මන්නාරම ප්‍රදේශයේ විශාල ව්‍යසනයක් සිදුවිණි. මෙම සුළිසුළඟ නිසා නිවාස, පොදු ගොඩනැගිලි, ගොවිතැන් කටයුතු, හරකා–බාන පවා විනාශ වී ගිය අතර, මේ සඳහා රජයට මැදිහත් වීමට සිදු විය.

ඇල්ස්ටන් පෙදෙසේ පිහිටි ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ, ජාතික සේවා කාර්යාලයට එකතු වූ ස්ථිර ලේකම්වරු තිදෙනෙක් මේ සඳහා කුමක් කළ යුතු දැයි සාකච්ඡා කළ අතර, පොලීසිය. හමුදාව ඇතුලු සියලුම රාජ්‍ය සේවකයින් නත්තල් නිවාඩුව සඳහා ගොස් සිටි බැවින්, ඔවුන්ට ඉක්මනින් රාජ්‍ය යන්ත්‍රය ක්‍රියාත්මක කරවීමට නොහැකි විය. මේ අවස්ථාවේදී එහි සිටි එක් ස්ථිර ලේකම්වරයකු වූ ශ්‍රී කාන්ත මහතාගේ යෝජනාවක් අනුව, මට දුරකතන පණිවුඩයක් ලැබුණේය. වහාම මම එම කාර්යාලයට ගියෙමි. එතැනට වහාම ගුවන් විදුලිය කැඳවන ලෙසත්, ඒ මාර්ගයෙන් සර්වෝදය ස්වේච්ඡා සේවකයන්ට පණිවුඩයක් දීමට මට අවස්ථාව සලසන ලෙසත් මම ඉල්ලා සිටියෙමි. එම දැනුම් දීමෙන් පසුව සියයකට අධික ස්වේච්ඡා සේවකයන් පිරිසක් මරදානට එක්වූ අතර, අපේ ඉල්ලීම අනුව ආහාර–පාන, ඇඳුම් ආදී වූ මිනිසෙකුට මූලිකව අවශ්‍ය වූ දේවල්, දෙල්ගහ යට ගෙදරට හැම තැනින්ම ලැබෙන්නට විය.

නත්තල් දින උදෑසනින්ම ලොරි 7 කට බඩු පුරවාගෙන, වතුර බවුසරයක් ද රැගෙන, අපි මන්නාරම බලා පිටත් වීමු. විශේෂ ජීප් රියක් මගේ ප්‍රයෝජනයට දී තිබූ අතර, අප පිරිසේ 50 ක් පමණ ස්වේච්ඡා සේවකයෝ වූහ. එයින් වැඩි දෙනෙක් විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයෝ වූහ. දුම්රිය බලපත්‍ර, ඉන්ධන වවුචර් පත් අත්සන් කිරීමේ තාවකාලික බලයක් ද, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මට පවරා තිබුණි. මට මතක හැටියට දින කිහිපයකට පසු එම වගකීම් දී රජයේ මාණ්ඩලික නිලධාරියෙක් තලෙයිමන්නාරමට එවන ලදී. බොහෝ

දෙනා මගදී අප නවත්වන්න තැත් කළ නමුත්, මා කෙලින්ම පිරිස කැඳවා ගෙන ගියේ උස්ම භූමිය වූ තිරුකේතීෂ්වරම් කෝවිල පිහිටි ස්ථානයටයි.



ඡායාරූප: 318 – තිරුකේතීශ්වරම් කෝවිල

වාහන නවත්වා, කෙලින්ම මම කෝවිල ඉදිරිපසට ගියෙමි. එහි වහලවල් සම්පූර්ණයෙන්ම ගැලවී විනාශ වී තිබිණි. මා කෝවිලට ඇතුළුවන විටම වේට්ටියක් ඇඳගෙන, තවත් වේට්ටියක් ඉන වටා ඔතාගෙන දෙවියන්ට යාඥා කරමින් සිටි වයෝවෘද්ධ මහත්මයෙක් එක් වරටම මා දෙසට හැරුණේය.

“ආරියරත්න, මම දෙවියන්ට යාඥා කළේ – ඔබ මෙතැනට එවන්නට කියායි. දැන් ඔබ මෙහි පැමිණ සිටිනවා. මේ මොහොතේ සිට මෙහි සියලු කටයුතු ඔබ විසින් බාරගත යුතුයි. එන්න – මා සමඟ” කියා එතුමා මා අතින් අල්ලා ගත්තේය.

මම කෝවිල ඇතුළට ගොස් මුලින් බුදුන් වැඳ, ඊළඟට දෙවියන්ට පින් දී මේ මිනිසුන්ට හැකි තරම් සේවයක් කිරීමට ආශීර්වාද කරන්න යැයි දෙවියන්ගෙන් ඉල්ලා, ශ්‍රීමත් කන්දයියා වෛද්‍යනාදන් තුමා සමඟ එතුමාගේ කුටිය වෙතට පා නැඟුවෙමි.

තිරුකේත්තීස්වරම් කෝවිලේ ප්‍රධාන භාරකරුවා වූයේ සර් කන්දයියාය. එතුමාගේ කුටියේම කොටසක්, මගේ නිවහන ලෙස යොදා ගන්නා ලෙස පවසා – විශාල වශයෙන් සහල් සහ පිටි ගබඩා කර තිබූ විශාල ගබඩාවේ යතුර ද එතුමා මට බාර දුන්නේය.

හති අරින්නටත් පෙර කඳවුරු භූමිය පරීක්ෂා කළ මම, අපේ ස්වේච්ඡා සේවකයන් ද එතැනට රැස්ව සිටි ගම්වාසීන් ද කණ්ඩායම් කිහිපයකට සංවිධානය කළෙමි. එක් කණ්ඩායමක් පිරිසිදු ජලය තිබෙන පොකුණේ ජලය තවදුරටත් අපතේ යෑමට නොදී ආරක්ෂා කර ගැනීමට පොකුණ ප්‍රතිසංස්කරණය කිරීමට යෙදුවෙමි. තවත් කණ්ඩායමක් තැනින් තැන විසිරී තිබුණු සතුන්ගේ මළ සිරුරු එකතු කොට වළවල් කපා වළ දැමීමට යැවීමි. තවත් කණ්ඩායමක් ඉතිරි වී තිබුණු දේවල් රැස් කොට, කෝවිලේ වහල යන්තම් සෙවිලි කොට, කෝවිලත්–අවටත් පිරිසිදු කිරීමට යෙදවූයෙමි. තවත් කණ්ඩායමක් අපට තේ පැන් සූදානම් කිරීමටත්, රාත්‍රී ආහාරය සකස් කිරීමටත්, සති කිහිපයක් නැවතී සිටීමට අවශ්‍ය විදියට වාඩි සහ නවාතැන් සකස් කිරීමටත් යොමු කළෙමි. අපි කඳවුරට පැමිණ පැය කිහිපයක් ඇතුළත ඉතාමත්ම හොඳ සංවිධානයකින් යුතුව සර්වෝදය ශ්‍රමදාන කඳවුරක් බවට තිරුකේතීශ්වරම් පූජා භූමිය සංවිධානය කළෙමු.

පසුදා උදේ 5.00 සිට රාත්‍රී 10.00 දක්වා කාල සටහනක් අනුව කඳවුරු වැඩසටහනක් සූදානම් කොට අවට ගම්වල සිදුවී ඇති හානි දැක–බලා ගෙන ඒවායේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අවශ්‍ය විධි විධාන යෙදුවෙමි.

තුන්වැනි දින සිටම ලංකාවේ නොයෙක් ප්‍රදේශවලින් සර්වෝදය කණ්ඩායම් තිරුකේතීශ්වරම්වලට එක් රොක් වන්නට වූහ. දිනකට බාහිරින් පැමිණි ස්වේච්ඡා සේවකයින් සංඛ්‍යාව 300 ක් පමණ විය.

මෙහිදී ත්‍රාසජනක සිද්ධීන් රැසක් ම සිදු විය.

දිනක් මන්නාරම් හමුදා කඳවුරේ ප්‍රධානියා සමඟ හොඳට ඉංග්‍රීසි කතා කරන මහත්මයෙක් කඳවුරට පැමිණියේය. ඔහු තමාව හඳුන්වා දුන්නේ බදුල්ල ප්‍රදේශයේ වත්තක වතු සුපිරින්ටෙන්ඩන්වරයෙක් හැටියටය. ඔහු ශාන්ත තෝමස් විද්‍යාලයේ ඉගෙන ගත් කෙනෙක් බවත්,

'ඩේලිනිවුස්' පුවත්පතේ ස්වේච්ඡා සේවකයන් සඳහා මා කරන ලද ආයාචනය අනුව සේවය කිරීමට පැමිණි බවත්, ප්‍රකාශ කළේ ය. ඔහු ගැන කිසිදු සැකයක් ඇතිකර ගැනීමට මට හේතුවක් නොතිබුණි. මගේ කුටියේම ඔහු ද නවත්වා ගතිමි.

මේ අතර 'ඇදිහැස' සංවිධානයෙන් 'කෙයාර්' (CARE) පිටි මලු විශාල සංඛ්‍යාවක් ලැබෙන්නට විය. දිවා රෑ දෙකේ මා සහ මගේ සහකරු වශයෙන් සිටි වීරතුංග මල්ලී ද ඇතුළු පිරිස, සමහර දවස්වල මැදියම් රැය වනතුරු මේ කිරිපිටි බෑමට වෙහෙසුණෙමු.

දිනක් බාගෙට විවෘත ව තිබූ වීරකෝන් මහතාගේ සූට්කේසය තුළ ගිනි අවියක් තිබෙනු දුටුවෙමි. මේ ගැන කිසිත් අන් අයට නොදන්වා, මම ජීප් රියෙන් අනුරාධපුරයට ගොස්, එවකට නියෝජ්‍ය

ඡායාරූපඃ 319
කඳවුර සැලසුම් කිරීම

ඡායාරූපඃ 319.1
දකුණෙන් ගිය පොල්අතු බෑම

ඡායාරූපඃ 319.2
ආහාර පිසීම

පොලිස්පති ව සිටි ටී. බී. වේරපිටිය මහතාට මේ පුද්ගලයා ගැන විස්තර සෙවීමට පැවරුවෙමි. වීරතුංග මල්ලීට මොහු ගැන පරීක්ෂාවෙන් සිටින ලෙස ද පැවසුවෙමි. ඔහුට නොදන්වා රාත්‍රියේම මා කොළඹ ඇවිත්, පොලිස් මූලස්ථානයට ගොස් වේරපිටිය මහතාගෙන් සියලුම තොරතුරු දැනගෙන, ජීප් රියෙන් ම තිරුකේතීශ්වරම්වලට පසුදා දහවල් වනවිට ගියෙමි. වීරකෝන් මහතා අයිනකට කැඳවා – ඔහු සමඟ මම සුහදව කතා කළෙමි. ඔහු මෙහි පැමිණි සැබෑ හේතුව කියන ලෙස ඉල්ලා සිටියෙමි.

පළමුවෙන් ම ඔහු සමාජ සේවය ගැන කතා කළත්, මා ඔහු ගැන සියල්ල දන්නා බව කී විට, ඔහු පැවසුවේ කන්දයියා වෛද්‍යනාදන් මහතාගෙන් හොර චෙක්පතක් මාරු කරගෙන යෑමට ඔහු පැමිණි බවයි; සර්වෝදය සේවක සේවිකාවන් වැඩ කරන අන්දම දුටු විට ඔහුගේ හොර සිත වෙනස් වූ බවත්, හිස් ගෝනි 25 ක් විකුණා රුපියල් 25/– ක් වියදමට සොයා ගැනීම හැර, වෙන කිසිම හොරකමක් ඔහු කළේ නැති බවත් කියා සිටියේය. හොඳ පරිසරයක –නරක කෙනෙක් පවා හොඳ මඟට යොමුවන හැටි, මෙයින් මට ප්‍රත්‍යක්ෂ විය. ඔහුට රුපියල් 25/– ක් දී ඔහු සතිපතා පොලීසියට වාර්තා කළ යුතු බැවින්, ආපසු යන ලෙස කැමති කරවාගෙන අනුරාධපුරය දක්වා මගේ ජීප් රියෙන් හැරලුවෙමි.

අපි මන්නාරමට ගොස් දින 3 කට පසු සුදුපාට දිග කලිසමකින් සහ කමිසයකින් සැරසුණු තරුණ දිසාපතිතුමා එහි පැමිණියේය. ඔහු සිංහලයෙකි. ඔහු එන විට නිවාස අහිමි වූ අයට තාවකාලික ගෙවල් හදමින් අපි සිටියෙමු. එහි වැඩ කළ වැඩිදෙනා විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයින් වූ නිසා, ගම්මු ඒ ගම්මානයට විද්‍යෝදය ග්‍රාමම් යන නමින් හැඳින්වීමට පටන් ගත්හ. මෙහි පැමිණි දිසාපතිතුමා ඇසූ එකම ප්‍රශ්නය – මේ අයට ගෙවල් හැදීමට පෙර මොවුන් පුරවැසියන් දැයි සොයා බැලුවා ද යන ප්‍රශ්නයයි. මෙයින් මවිතයට පත්වූ මා, ඔහුට එකවරම දුන් පිළිතුර වූයේ, අප මෙහි ආවේ මේ මිනිසුන්ගේ විපතට උදව්වීමට මිස, ඔවුන්ගේ පුරවැසි භාවය සොයා බැලීමට නොවන බවයි.

තිරුකේතීශ්වරම් කඳවුර පුරා මාස 3 ක් ම පැවතියේය. මිනිසුන්ගේ ජීවිත සාමාන්‍ය තත්වයට හැරුණු පසු ගම්මුන්ට ආයුබෝවන් කියා අපි නිවෙස් බලා පිටත් වීමු.

78

ගම් සියයේ යෝජනා ක්‍රමය



මහත්මා ගාන්ධි ශත සංවත්සර වැඩ පිළිවෙලේ ප්‍රධානම අංගයක් හැටියට සර්වෝදය විසින් තෝරාගනු ලැබුවේ ගම් සියයක ඒකාබද්ධ සංවර්ධන යෝජනා ක්‍රමයක් ඇරඹීමටය. 1967 දී පැවැත්වූ ගාන්ධි ශත සංවත්සර ජාතික කමිටුවේ දී මේ අදහස ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගතිමු. 1966 අප්‍රේල් 24 දා සිට 28 වැනිදා දක්වා නැදලගමුවේ පැවැත්වූ 6 වැනි සර්වෝදය වාර්ෂික සම්මේලනයේදී ද මේ යෝජනාව සම්මත විය.

මෙම සමුලුවට ඉන්දීය සර්වෝදය නායකයෙකු වූ ආචාර්ය ආර්. ආර්. දිවාකර් මහතා, ඉන්දීය ගාන්ධි ශත සංවත්සර කමිටුවේ ලේකම් ශ්‍රී දේවේන්ද්‍ර කුමාර් ගුප්තා මහතා, 'ගාන්ධි මාර්ග්' සඟරාවේ කර්තෘ ශ්‍රී. ටී. කේ. මහදේවන් මහතා, කාදි සහ ගැමි කර්මාන්ත කොමිසමේ සාමාජික ශ්‍රී ජවහර්ලාල් ජේන් මහතා, මදුරාසි ප්‍රාන්තයේ භූදාන් මණ්ඩලයේ ලේකම් එස්. ආර්. සුබ්‍රමනියම් මහතා සහ ඉන්දීය මහ කොමසාරිස් ආචාර්ය බිම්සෙන් සචාර් මහතා යන අයගෙන් සමන්විත ඉන්දීය නියෝජිත කණ්ඩායමක් ද මේ සමුලුවට සහභාගි විය.

ගුවන් විදුලියෙන් සහ පුවත්පත්වලින් නිවේදන නිකුත් කොට ලංකාවේ දුප්පත් ගම්මානවලට අපේ අවධානය යොමු කරන මෙන් මහජනයාගෙන් ඉල්ලා සිටියෙමි. මෙම ගම් ලැයිස්තුව 1966 දෙසැම්බර් මාසය වනවිට සම්පූර්ණ කර ගතිමි. දෙසැම්බර් මාසය තුළදීම මූලික

ඡායාරූප: 320
ගාන්ධි මාර්ග සහරාවේ කර්තෘ
ශ්‍රී ටී. කේ. මහාදේවන් මහතා
චාරිකා විසින් පිළිගැනීම

සමීක්ෂණ තිම, කොට, සෑම ගමකින් ම තරුණ නියෝජිත පිරිස් කැඳවා කෙටි පුහුණුවක් දුනිමු. 1967 ජනවාරි 01 වනදා නිල වශයෙන් ගම් සියයේ සංවර්ධන යෝජනා ක්‍රමය ආරම්භ කළෙමු.

මෙම සංවර්ධන යෝජනා ක්‍රමය සඳහා අපට කිසිදු ධන සම්පතක් තිබුණේ නැත. අප කළේ මේ සෑම ගමකම ශ්‍රමදාන කඳවුරක් පවත්වා, මිනිසුන්ට ඔවුන් සතු ජන ශක්තිය සහ සාමූහිකත්වය තුළින් විශාල වැඩ කොටසක් කළ හැකි බව අවබෝධ කරවීමය.

ගම්වල මූලික සමීක්ෂණ කළේත්, සංවර්ධන වැඩ පිළිවෙල සැලසුම් කර ගත්තේත් ගම්වාසීන් විසින්මය. අපේ මූලස්ථානයෙන් මෙම හැම ගමකටම - මාත් - තව කිහිප දෙනෙකුත් ගිය අතර සංවර්ධන ව්‍යාපෘති ඉදිරියට ගෙන යෑමට, ගමේ ම කමිටුවක් සූදානම් කර ගතිමු. ගමේ පාරවල්, ළිං, වැව් අමුණු, වැසිකිළි, රුක් රෝපණ, සෞඛ්‍ය කටයුතු, වැඩිහිටි අධ්‍යාපන කටයුතු, පරිසර සංරක්ෂණ කටයුතු ආදී වූ ගම්මුන් එතෙක් කළ නොහැකි යැයි සැලැකූ කාර්යය රැසක් ම ඉටු වෙමින්, මෙම ගම් සියයේ ජනතාව අවදි වන්නට වූහ.

ගමට සම්බන්ධ විවිධ දෙපාර්තමේන්තු නිලධාරීන්ගෙන් විශේෂයෙන් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් මේ වැඩ සටහනට විශාල ක්‍රියාකාරී සහයෝගයක් ලැබිණ. මා ගම්වලට යන අතර, සෑම ආදායම් පාලක නිලධාරී මහතෙක් ලවාම ප්‍රදේශයේ විදුහල්පතිවරුන්, ගුරුවරු, භික්ෂූන් වහන්සේලා, ප්‍රජා නායකයින් රජයේ නිලධාරී පිරිස් කැඳවා සර්වෝදය ගම් සංවර්ධන වැඩ පිළිවෙල පිළිබඳව ඔවුන් දැනුවත් කළෙමි.

මුලදී ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නොදියුණු සමාජ හැටියට නම් කරන ලද ගම්, මේ සංවර්ධන යෝජනා ක්‍රමයට ඇතුළත් වූ නමුත්, පහුවෙන විට සාමාජික හෝ ආර්ථික තත්වයන් ගැන නොතකා, පොදුවේ සෑම ගමකම දුප්පත් සහ මධ්‍යම පාන්තික මිනිස්සු සර්වෝදය සමිති ඇති කර ගත්හ. මේ නිසා මුල් අවුරුදු 3 ඇතුළතදී ගම් සියය වෙනුවට ගම් දෙසීයකටත් අධික ප්‍රමාණයක සර්වෝදය සේවාවන් සිදු විය.

මෙම ගම් සඳහා සරල සංවර්ධන යෝජනා ක්‍රම සැලසුම් කිරීමටත්, විවිධ වයස් කණ්ඩායම් සඳහා සිහිති හවුල්, යොවුන් හවුල්, මව් හවුල්, ගොවි හවුල් ආදියට යම් අරමුණු හෝ ප්‍රතිපත්ති සමූහයක් අඩංගු කොට ව්‍යුහාත්මක පදනමක් ඇති කිරීමටත් මම දිවා රෑ වෙහෙසී ලිපි ලේඛන සකස් කළෙමි. කෙටියෙන් කිවහොත්, ගමේ ග්‍රාමෝදයත්– ග්‍රාම ස්ව රාජ්‍ය තුළින් සශ්‍රීක සාමකාමී ශ්‍රී ලාංකික සමාජයක් ගොඩ නැංවීමට දාර්ශනික, තාක්ෂණික, ව්‍යුහාත්මක සහ සංවිධානාත්මක අංශයන් ගොඩනැඟීමට වෙහෙසුණෙමි. මේ සඳහා මා සමඟ වැඩ කළ ඇලෙක්ස් තෙන්නකෝන් මහතා, එල්.පී. මේදිස් මහතා ආදීහු මට විශාල වශයෙන් අත දුන්හ.

පසු කලෙකදී ගම් සියය ගම් දස දහසේ යෝජනා ක්‍රමයක් හැටියට දියුණු වූයේ මේ වැඩ පිළිවෙල නිසයි.

ඡායාරූපඃ 321
නැදලගමුවේ සමුලුවට යාපනයෙන් පැමිණි මුදලියර් සින්නතම්බි ප්‍රධාන පිරිස

79

ශ්‍රී ජයප්‍රකාශ් නාරයන් තුමාගේ ලංකා සංචාරය

මේ වනවිටත්, ශ්‍රී ඊ.ඩබ්ලිව්. ආරියනායගම්, ශ්‍රීමතී ආශාදේවී ආරියනායගම්, ශ්‍රී දේවේන්ද්‍ර කුමාර් ගුප්තා, ශ්‍රී රාධා ක්‍රිෂ්ණා, ආචාර්ය ආර්.ආර්. දිවාකර්, ආචාර්ය බිම්සෙන් සචාර් ආදී ඉන්දීය සර්වෝදය නායකයන් ලංකාවට පැමිණ, විවිධ සර්වෝදය කටයුතුවලට සහභාගී වී තිබුණි. එහෙත් මගේ හිතේ වැඩ කළේ කෙසේ නමුත් ආචාර්ය විනෝබා භාවේ තුමාත්, ශ්‍රී ජයප්‍රකාශ් නාරයන්තුමාත් ලංකාවට ගෙන්වා ගැනීමටයි.



ඡායාරූප: 322 ශ්‍රී ජය ප්‍රකාශ් නාරයන්

ආචාර්ය විනෝබා භාවේ තුමා මුණගැසුණු අවස්ථාවක දී, මට හැඟී ගියේ, එතුමා ඉන්දියාවෙන් බැහැරට යෑමට අදහස් නො කරන බවයි. මේ නිසා මගේ හිතේ වැඩ කළේ ශ්‍රී ජයප්‍රකාශ් නාරයන් තුමා කෙසේ හෝ ශ්‍රී ලංකාවට පමුණුවා ගැනීම ය. බලාපොරොත්තු රහිතවම එතුමා 'ක්වේකර්' සංවිධානයේ රැස්වීමකට පැමිණෙන බව මට දන්වා තිබුණේ ය. ඒ අවස්ථාවෙන් ප්‍රයෝජනය ගෙන, එතුමා ලංකාවේ සිටි දින කිහිපය ඇතුළත දෙල්ගහ යට ගෙදරට ද එතුමා පමුණුවා ගෙන, අපේ අය මුණ ගැස්වීමටත්, ගරු පිලිප් ගුණවර්ධන මැතිතුමා, ආචාර්ය එන්. එම්. පෙරේරා මැතිතුමා, හෙක්ටර් අබේවර්ධන මැතිතුමා, ආදී වූ එතුමාගේ මිත්‍රයින් මුණ ගැස්වීමටත් මට අවස්ථාව ලැබුණි. වඩාත්ම වැදගත් වූයේ එතුමා සහ එතුමාගේ මැතිනිය ප්‍රභාවතී දේවිය පෞද්ගලිකව දැන හැඳින ගැනීමට ලැබීමය.



ඡායාරූපඃ 322.1
රත්මලාන ගුවන් තොටුපළේ දී ජයප්‍රකාශ් තුමා
කේ. සී. තංගරාජා මැතිතුමා ඇතුළු පිරිස විසින් පිළිගැනීම

ඡායාරූපඃ 322.2
ඉන්දීය තානාපති ගන්දේවියා මහතා සංස්කෘතික
ලේකම් ත්‍රිපාති මහතා ද මේ දෙපළ පිළිගැනීමට පැමිණ...

ඡායාරූප: 322.3
ආචාර්ය
වල්පොල
රාහුල
හිමියන්
සමග
ජයප්‍රකාශ්
නාරායන්තුමා හා
ප්‍රභාවතී දේවී
මැතිනිය



පසුව මා ඉන්දියාවට ගිය අවස්ථාවක ගාන්ධි සාම පදනමේදීත්, බිහාරයේ පැට්නා නගරයේ කුවාම්වල පිහිටි එතුමාගේ ආශ්‍රමයේදීත් එතුමා මුණගැසී 1969 ජනවාරි මාසයේ දී ලංකාවට පැමිණීම ගැන සාකච්ඡා කර ගතිමි.

ඉදිරියේදී ලංකාවේ ඇතිවීමට හොඳටම ඉඩ තිබුණු ජාති භේදය උග්‍ර වීම වැළැක්වීම එතුමාගේ චාරිකාවෙන් මා බලාපොරොත්තු වූ ප්‍රධානම අරමුණ විය. මේ නිසා 1969 ජනවාරි 02 දා සිට 13 වැනිදා දක්වා වූ දින 11 ක කාලය තුළදී ලංකාවේ හැකි තරම් ප්‍රදේශවලට විශේෂයෙන් කඳුරටට සහ උතුරට එතුමා කැඳවාගෙන යෑමට මම වැඩ සටහන් සූදානම් කොට, ජාතික කමිටුවේ හැම දෙනාගෙම අනුමැතිය ලබා ගතිමි.

1969 ජනවාරි 02 වැනි පුන් පෙහෝ දින සන්ධ්‍යාවේ රත්මලාන ගුවන් තොටුපලට සැපත් වූ ශ්‍රී ජයප්‍රකාශ් නාරායන් මැතිතුමා සහ එතුමාගේ බිරිඳ වූ ප්‍රභාවතී දේවී මැතිනිය, ගරු ඒ. රත්නායක මහතා ප්‍රධාන ජාතික කමිටුවේ අපි ඉතාමත් උත්සවාකාරයෙන් පිළිගතිමු. එතැන සිට අපි කෙලින්ම ගියේ රාමක්‍රිෂ්ණ මිසමටය. රාත්‍රිය ගත කළේ ඒ. රත්නායක මැතිතුමාගේ නිවසෙහිය.

තුන්වැනිදා උදේ අග්‍රාණ්ඩුකාර විලියම් ගොපල්ලව මැතිතුමා රජගෙදරදී ද, ගරු අග්‍රාමාත්‍ය ඩඩ්ලි සේනානායක මැතිතුමා වුඩ්ලන්ඩ් මන්දිරයේදී ද හමු වූ අපි, කෙලින්ම ගියේ පාර්ලිමේන්තු මන්ත්‍රී ටී. බී. සුබසිංහ මැතිතුමා සහ වින්සන්ට් සුබසිංහ මැතිතුමාගේ ඇරයුම පරිදි සඳලංකාවේ සමුපකාර මන්දිරයටය. එතුමන්ගේ සංග්‍රහ භුක්ති විඳ ජනතාව අමතා දේශනයක් ද කළ ජයප්‍රකාශ් නාරයන්තුමා, නැදලගමුවේ

ධර්මරාජ පිරිවෙනට කැඳවා ගෙන ගියෙමු. එහි දෙදාහක් පමණ වූ පන්නල, නැදලගමුව ප්‍රදේශයේ සර්වෝදය සේවක-සේවිකාවන්ට දේශනයක් පවත්වා, දිවා ආහාරය සඳහා කුලියාපිටියේ නීතා ආරියරත්න මහත්මියගේ දෙමාපියන්ගේ නිවසට ගියෙමු. සවස 3.00ට පමණ පුබ්බිලිය ගමට ගිය අපි, එහි උත්සව රාශියකට සහභාගි වී රාත්‍රී ආහාරය ද ගෙන නුවර බලා පිටත් වීමු. 3 වැනිදා රාත්‍රිය ගත කළේ මහනුවර දිසාපති ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු මහතාගේ නිල නිවසේය.

හතර වැනි දා උදේ අපි කෙලින්ම ගියේ නුවරඑළියේ ග්‍රෑන්ඩ් හෝටලයටයි. අප එහි ළඟා වන විට දහස් ගණනක් සහභාගි වූ විශාල පෙරහැරක් සංවිධානය වී තිබුණේය. නගර ශාලාවේ ප්‍රසිද්ධ රැස්වීමක් පැවැත්වූ අතර, අහිංසාව සහ ජාතික සමගිය අළලා ඉතා අගනා දේශනයක් ජයප්‍රකාශ් නාරයන්තුමා එහිදි කළේය. ග්‍රෑන්ඩ් හෝටලයෙන් දිවා ආහාරය ගත් අපි, ආගරපතන නගරයට ගියෙමු. දහස් ගණනක ජනතාවක් එහි රැස්ව ජයප්‍රකාශ් නාරායන්තුමා පිළිගෙන එතුමාගේ දේශනයකට සවන් දුන්හ. මේ හැම රැස්වීමක්ම මෙහෙයවීමේ භාග්‍යය මට ලැබුණි. එදා රාත්‍රිය ගත කළේ ග්‍රෑන්ඩ් හෝටලයේය.

නුවරඑළිය රැස්වීමේ නායකත්වය එස්. තොන්ඩමාන් මහතා දැරූ අතර, අගරපතන රැස්වීමේ නායකත්වය අබ්දුල් අසීස් මහතා දැරුවේය.

ඡායාරූප: 322.4
කම්කරු නායක අබ්දුල් අසීස් මහතා සමග

පස්වැනිදා උදේ අපි බදුල්ලට ගියෙමු. උදේ වරුවේ සේනානායක පිටියේ විශාල මහජන රැස්වීමක් පැවැත්වූ අතර, දියතලාවේ හපුගහ වත්ත බංගලාවේ දී දිවා ආහාරය ගෙන, බණ්ඩාරවෙල නගර ශාලාවේ ඊළඟ රැස්වීම පැවැත්වීමු. නැවතත් රාත්‍රියේ නුවරඑළියේ ග්‍රෑන්ඩ් හෝටලයේ ලැගුම් ගතිමු.

හයවැනිදා නානුඔය, තලවකැලේ, හැටන්, නාවලපිටිය, මැද්දේගොඩ යන ස්ථානවල සංවිධානය කර තිබූ මහජන රැස්වීම්වලට සහභාගිවීමු. රාත්‍රිය ගත කළේ මැද්දේගොඩය.

ඡායාරූප: 322.5
ජයප්‍රකාශ්
නාරායන්තුමාගේ
ප්‍රාදේශීය සංචාර
උරුතුපුරම්වලදී

හත්වැනිදා මඩොල්කැලේ රැස්වීමකට සහභාගිවීමෙන් පසු දළදා මාලිගාව වැඳ පුදාගෙන මහානායක ස්වාමීන් වහන්සේලා ද බැහැ දැක මහනුවර නගර ශාලාවේ ප්‍රසිද්ධ රැස්වීමකට සහභාගි වීමු. රාත්‍රිය ගත කළේ දිසාපති නිල නිවසේය.

අටවැනිදා කෙලින්ම අපි අනුරාධපුරයට ගියෙමු. අනුරාධපුර 'කිංග්ස් ලොජ්' අවන් හලේදී දිවා ආහාරය ගෙන, ශ්‍රී මහා බෝධිය, රුවන්වැලිසෑය, ථූපාරාමය ආදී සිද්ධස්ථාන වැඳ පුදා ගැනීමට දවසේ වැඩි කොටසක් ගත කළෙමු. අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයේ විශාල සෙනඟක් ජයප්‍රකාශ් නාරායන්තුමාට සවන් දීමට පැමිණ සිටියහ. අනුරාධපුරයේ සිට උරුතිරපුම්වලට ගිය අපි රාත්‍රිය ගත කළේ ගාන්ධි නිලයම් ආශ්‍රමයේය.

ඡායාරූප: 322.6
හැටන් හි දී

ඡායාරූප: 322.7
සමාධි පිළිමය අසළ



ඡායාරූප: 322.8
කුට්ටම් පොකුණ අසල



ඡායාරූප: 322.9
ඉසුරුමුණිය

ඡායාරූප: 322.10
ජයප්‍රකාශ් නාරායන් යුවල ගමන් කළේ මා පදවා ගෙන ගිය මේ රියේය.

නව වැනිදා අක්කාරායනකුලම්, ගාන්ධිග්‍රාම්, ධර්මපුරම්, කස්තුර්බා නිවාසය ආදී තැන්වල සංචාරය කළ අපි දවල් 2.00 පමණ වනවිට යාපනයේ 'කිංග්ස් හවුස්' අවන් හලට ළඟාවීමු. දිස්ත්‍රික් කමිටුව විසින් අප පිළිගත් අතර, යාපනයේ සමූපකාර මණ්ඩල ශාලාවේ රැස්වීමක්, මහජන පුස්තකාල ශාලාවේ සම්මන්ත්‍රණයක් ද පැවැත්වීය. මේ රැස්වීම්වලට දහස් ගණනක සෙනඟක් සහභාගි වූහ.

අවසාන රැස්වීම පැවැත්වෙද්දී එවකට යාපනයේ සිටි පොලිස් අධිකාරී විමලසේන ද සිල්වා මහතා වේදිකාවට පැමිණ මට ඉතා කණගාටුදායක ආරංචියක් දුන්නේය. එතුමා මට කතා කරන විට, මා හිටියේ අඩ නින්දේය. අපේ වාහනය ගිනි ගන්නවා මම දුටුවෙමි. මා ළඟ වාඩි වී සිටි සෙල්වනායගම් මහතා දෙසට හැරී "සෙල්වා. අපේ වාහනය ඇක්සිඩන්ට් වුණා" යැයි මම පැවසුවෙමි. ඔහු මා දෙස බලා පිස්සු නැතුව ඉන්න යැයි කීවේය. මගේ අංක 5 ශ්‍රී 1106 දරණ මිට්සුබිෂි අලුත් ජීප් රථයෙන් කොළඹ බලා පිටත් වූ අම්රත් අම්ලියන් මහතා ඇතුළු පිරිස, මැදවච්චිය කිට්ටුව රඹෑව යන ස්ථානයේ දී විශාල අනතුරකට භාජනය වී ඇති බවයි, පොලිස් අධිකාරී –තුමා මට කීවේ.



ඡායාරූප: 322.11
පොලිස් අධිකාරී විමලසේන ද සිල්වා මහතා

ජයප්‍රකාශ් නාරායන්තුමාට පසුදින වැඩ සටහන නිම වී ගුවන් යානයෙන් කොළඹ ඒමට කටයුතු යෙදූ මම, එවේලේම එස්. ජේ. වී. සෙල්වනාදන් මහතාගේ අලුත් කේම්බ්‍රිජ් රථය ඉල්ලා ගෙන, අනතුර සිදුවූ ස්ථානයට යෑමට

ඡායාරූප: 322.12
එස්. වේලායුදපිල්ලේ
හා මුදලියර්
සින්නතම්බි සමග
උරුත්‍රපුරම් හි දී



ඡායාරූප: 322.13
ගරු තලේවෙල විජිත
ධම්මරක්ඛිත හිමි
සමග කැලණි විහාරයේ දී

පිටත් වුණෙමි. රියැදුරෙක් නොසිටි නිසා මටම එළවාගෙන යෑමට සිදු විය. මා සමඟ වාහනයේ තව කවරෙක් සිටියේ දැයි මතක නැත.

මා රඹෑවට එන විට එළිවෙන්නට 2.00 ට පමණ ඇත. එතැන තිබූ කඩයකින් විමසූ විට මා දැනගත්තේ, අනුරාධපුර පොලීසියෙන් පැමිණි තුවාලකාරයින් සහ වාහනය ද අනුරාධපුරයට ගෙන ගිය බවයි. මම කෙලින්ම අනුරාධපුර පොලිසියට ගියෙමි. එවකට එහි සහකාර පොලිස් අධිකාරීවරයා වශයෙන් සේවය කළේ විමලසේන ද සිල්වා මහතාය. එතුමා මා සමඟ මහින්දයේ ඉගෙන ගත් ශිෂ්‍යයෙකි. මගේ වාහනය හදිසි අනතුරකට භාජනය වූ බව දැනගත් පසු එතුමා පෞද්ගලිකවම

ගොස්, අවශ්‍ය සියලු කටයුතු කර තිබිණ.



ඡායාරූප: 322.14
අම්රත් අම්ලියන් මහතා

අම්රත් අම්ලියන් ඉතා වේගයෙන් රිය පදවන්නෙකි. වැස්ස තිබුණු නිසා, හෙමිහිට යෑමට මා ඔහුගෙන් ඉල්ලා සිටියත් – ඔහු ඉතා වේගයෙන් රිය පදවා තිබේ. රඹෑවේ වංගුව ගන්නා විට වාහනය ලිස්සා ගොස් තෙවරක් පමණ පෙරළී ගොස් තිබේ. මා දුටු වාහනය එකම යකඩ ගොඩකි. පොලිසියේ තිබූ ඒ දෙස බැලීමට මට හිත නොදුන්නේය. විමලසේන ද සිල්වා මහතා සමඟ කෙලින්ම මා අනුරාධපුර රෝහලට ගියෙමි. දෙදෙනෙකුට සිහිය තිබුණේ නැත. එයින් එක් කෙනෙක් වීරතුංග මල්ලී විය. අනෙකා බුලත්සිංහල හේමේන්ද්‍ර ජයසිංහ මල්ලීය. සිහිය තිබුනේ අම්රත් අම්ලියන් මල්ලීට පමණකි. මා දුටු විගස ඔහුටද සිහි නැති විය.

වෛද්‍යවරුන්ගෙන් උපදෙස් ලබාගෙන, පසුදා ඔවුන් කොළඹ මහ රෝහලට ගෙන ඒමට කටයුතු යොදා, මම 10 වැනිදා කොළඹ ආවෙමි.

ජයප්‍රකාශ් නාරයන්තුමා 10 වැනිදා ගත කර තිබෙන්නේ තරුණ කණ්ඩායම්, කාන්තා කණ්ඩායම්, සමූපකාර සාමාජිකයින්, ගුරුවරුන් සහ ග්‍රාම සංවර්ධන සමිතිවල අය හමුවීමටය. ගම් කිහිපයක් බැලීමටද ඔවුන් ගොස් තිබේ.

එකළොස් වැනිදා උදෑසන ජයප්‍රකාශ් නාරායන්තුමා සහ මැතිනිය ගුවන් යානයකින් රත්මලානට පැමිණියහ. දිවා ආහාරය ගරු පිලිප් ගුණවර්ධන මැතිතුමා සූදානම් කර තිබිණි. ඉන්පසු 'ක්වේකර්' සාමාජිකයින් ද, දෙමටගොඩ මුස්ලිම් සමිතිය ද, සර්වෝදය මූලස්ථානයේ සර්වෝදය පිරිස ද මුණගැසුනු නාරායන්තුමා, තරුණ බෞද්ධ සංගමයටද ගියේය.

දොළොස් වැනිදා ගත වූයේ කැලණිය රජමහා විහාරය නැරඹීමට, ගාන්ධි ශත සංවත්සර කමිටුව සහ ඉන්දු-ලංකා සංගමය දුන් දිවා ආහාරය, නගරාධිපතිතුමා දුන් පිළිගැනීමකට, සරස්වතී ශාලාවේ පැවති රැස්වීමකට, විවේකානන්ද ශාලාවේ තිබූ රැස්වීමකට සහ පුවත්පත් සාකච්ඡාවකටය. රෝස්මිඩ් පෙදෙසේදී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ද ඔවුන්ට මුණ ගැසීමට සැලැස්සුවෙමි.

දහතුන් වැනිදා උදේ ජයප්‍රකාශ් නාරායන්තුමා සහ මැතිනිය රත්මලාන ගුවන් තොටුපලින් සියරට බලා පිටත් වූහ.

1969 පෙබරවාරි මස 07 දාතමින් එතුමා විසින් මා වෙත එවන ලද ලිපිය මෙසේ පළ කරමි:



ඡායාරූපඃ 322.15
සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය සමග

Jayaprakash Narayan
Permanent Address:
KADAM KUAN, PATNA-3
BIHAR, INDIA.

Telephone: 25547
Camp: Sarvodaya Ashram
Sokhodeora
February 7, 1969

Dear Aryaratne,

I am sorry for not having written you immediately after returning. As soon as I come back I had to fulfil a number of crowded engagements after which I fell ill from which I am still recovering. I am writing this from my Ashram where I have retreated for quiet and rest.

Even though I had met you at the time when I went to Ceylon for the Quaker Seminar, it was indeed a very great pleasure to know you so intimately during my last Gandhi Centenary tour. I really wish there were some workers like you in the movement here. There is no Vinoba in Ceylon and yet you and your young friends have been able to build up such a fine movement which holds so much promise for the future.

Please do not think I am being formal when I send you my and my wife's most sincere thanks for all that you did for us in Ceylon. Please also convey my thanks to your colleagues who helped to make my visit so pleasant and successful. I hope Amrath and the other two young men who were injured in the motor accident have now fully recovered.

I wonder if you have any plan to visit India in this Centenary year. If you have, do let me know at least a couple of months in advance. It is likely that I shall be away in Australia during a part of September. I need hardly add that it would be a joy to see you and Mrs. Aryaratne in India. A good time to come might be in November when the Sarva Seva Sangh's annual conference is being held at Rajgir where a Japanese Budhist organization is building a Stupa. You would then be able to meet all the Sarvodaya leaders together as also to be a pilgrimage to the Holy Budhist spots in Rajgir.

With affectionate greetings from my wife and me for both of you,

Yours sincerely,

(Jayaprakash Narayan)

80

ශ්‍රී ජය ප්‍රකාශ් නාරායන් තුමා

ගාන්ධි ශත සංවත්සර ජාතික කමිටුවේ සම ලේකම් හැටියට මා විසින් ජයප්‍රකාශ් නාරායන්තුමා ජනතාවට පුවත්පත් මගින් හඳුන්වා දුන්නේ මෙවැනි ලිපි ලියා යවමිනි.

මහත්මා ගාන්ධි ජන්ම සංවත්සර ලංකා උත්සව කමිටුවේ විශේෂ ආරාධනය පරිදි දස දිනක ලංකා චාරිකාවක් සඳහා සුප්‍රසිද්ධ ඉන්දීය ජන නායක ශ්‍රී ජය ප්‍රකාශ් නාරායන් තුමා සහ ඔහුගේ බිරිඳ වූ ශ්‍රීමතී ප්‍රභාවතී දේවිය අද සවස හයයි–තිහට රත්මලාන ගුවන් තොටුපලට සැපත් වෙති. යටත් විජිත යුගයේ දී බ්‍රිතාන්‍ය පාලකයින්ගේ ලොකුම හිසරදයක් වූ ශ්‍රී ජයප්‍රකාශ්, ඉන්දීය සමාජවාදී ව්‍යාපාරයේ පුරෝගාමියාද විය. පක්ෂ හා බලකාමී දේශපාලනයෙන් ඈත්ව– බුද්ධගයාවට නුදුරු ආශ්‍රමයක් මධ්‍යස්ථානය කොට මිනිස් සේවයත්, ලෝක සාමයත් සඳහා වෙහෙසෙන මේ හැටහත් හැවිරිදි ශ්‍රේෂ්ඨ නායකයා, ආචාර්ය විනෝබා භාවේ තුමාත් සමග සර්වෝදය ව්‍යාපාරය සඳහා ජීවිතය ඇප කැප කොට ඇත.

බර්ට්‍රන්ඩ් රසල් සාමිවරයා බ්‍රිතාන්‍යයට යම් සේ ද, ජය ප්‍රකාශ් නාරායන් තුමා ඉන්දියාවට ද එසේය. තමාගේ අදහස්වලට ඉඳුරාම විරුද්ධ වූ අදහස් දරන අයගෙන් පවා ආදරයත් – ගෞරවයත් ලබන මේ ශ්‍රේෂ්ඨ මිනිසුන් දෙදෙනා අතර ඇත්තේ එකම වෙනසකි. එනම් රසල් උපතින්ම ආඪ්‍ය ජීවිතයක් හා උසස් අධ්‍යාපනයක් ලබා ගැනීමේ පහසුකම් ලද්දකු වූ අතර, නාරායන්ට සිදු වූයේ කුඩා කල සිටම කම්කටොලු මැද්දේ පියවරක් පියවරක් පාසා සටන් කිරීමටය.

ජය ප්‍රකාශ් ජන්ම ලාභය ලැබුයේ එක්දහස් නවසිය දෙකේ ඔක්තෝබර් මාසයේ බිහාර් ප්‍රාන්තයේ දීය. දුප්පත් ග්‍රාමීය නිලධාරියෙකු වූ ඔහුගේ පියා, සිය පුතුන් දෙදෙනා හා දූවරුන් දෙදෙනා හදා වඩා ගැනීමට මහත් දුකක් වින්දේය. දුප්පත් කමට විරුද්ධව අභියෝග කළ හැක්කේ හොඳින් ඉගෙන ගැනීමෙන් බව, කුඩා කල දීම අවබෝධ කර ගත් ජය ප්‍රකාශ්, මුලු වැර යොදා පත පොතෙහි නියැළිණි. පන්තියේ

පළමුවන තැන ගත් හෙතෙම, එක්දහස් නවසිය දහනවයේ මැට්‍රිකියුලේෂන් විභාගයෙන් පළමුවැනියා ලෙස සමත් විය.

සිරිත් පරිදි, දාහත් වැනි ලාබාල වියේ දී ජය ප්‍රකාශ්ට විවාහ ජීවිතයට ඇතුලු වීමට සිදුවිය. මහත්මා ගාන්ධි තුමාගේ අනුගාමිකයකු වූත්, රාජේන්ද්‍ර ප්‍රසාද් තුමාගේ කිට්ටු ඥාතිවරයෙකු වූත්, බ්‍රිජාර් කිෂෝර් බාබුගේ දියණියක් වූ ප්‍රභාවතී දේවියයි ඔහුගේ බිරිඳ වූයේ.

පැට්නා විශ්ව විද්‍යාලයේ විද්‍යා උපාධිය සඳහා රජයේ ශිෂ්‍යත්වයක් ලැබ ජය ප්‍රකාශ් දක්ෂ ලෙස ඉගෙන ගත්තේය. එහෙත් වැඩි කලක් නොවේ; ජාතිය නිදහස් කර ගැනීම සඳහා අධ්‍යාපන ආයතනවලින් ඉවත්ව සටනට බසින ලෙස මහත්මා ගාන්ධිතුමා තරුණයන්ට ආයාචනය කළේ මේ අවදියේදීය. පියාගේ එකම බලාපොරොත්තුව සුන් කරමින්, රජයේ ශිෂ්‍යත්වය ද අතහැර – විශ්ව විද්‍යාලයෙන් ද පිටවුණු ජය ප්‍රකාශ්, කිසිදු පැකිළීමක් නැතිව සටනට එක් විය. එහෙත් සහයෝගිතා වර්ජන ව්‍යාපාරයට අවුරුද්දක් පිරෙනවාත් සමග, මහත්මා ගාන්ධි තුමා හදිසියේම එම ව්‍යාපාරය නැවැත්විය. විසි හැවිරිදි ජය ප්‍රකාශ් මෙන්ම රටේ වෙනත් සටන්කාමී තරුණයෝ ද මේ නිසා අතරමං වූහ.

ජාතික විමුක්ති ව්‍යාපාරයේ කෙනෙකු හැටියට ජය ප්‍රකාශ්ගේ ශිෂ්‍යත්වය නතර කරන ලදින්, තවදුරටත් පැට්නාවල ඉගෙනීමට ඔහුට වත්කමක් නොවීය. වැඩ කරන අතරේ එයින් උපයන මුදලින් උසස් ඉගෙනීමක් ලැබීමට හැකි එකම රට ඇමෙරිකාව බව ඔහුට මෙහිදී සිහි විය. මහත්මා ගාන්ධිතුමා භාරයේ සිය බිරිඳ නවත්වා, එක්දහස් නවසිය විසිදෙකේ දී ඔහු ඇමෙරිකාවට පැමිණෙන විට ඔහු අත මුදල් නොවීය. කිසිදු මිතුරෙක් ද එහි නොසිටියේය; වාසනාවකට මෙන් විශ්ව විද්‍යාල නිවාඩු කාලය නිසා පලතුරු උද්‍යානයක සේවය කොට, ඩොලර් අසූවක් ඉතිරි කර ගැනීමට ඔහුට හැකි විය. මුලින් කැලිෆෝනියාවේ ද, පසුව අනෝමා විශ්ව විද්‍යාලයේ ද හෙතෙම ඉගෙන ගත්තේය. වරින් වර මුදල් නැති කමින් – ඔහුට අධ්‍යාපනය නතර කිරීමට සිදුවුව ද, අප්‍රතිහත ධෛර්යයෙන් යුත් තරුණ ජය ප්‍රකාශ් ගොවිපලවල, කම්හල්වල, භෝජන ශාලාවල ආදී නොයෙක් තැන්වල කය වෙහෙසා වැඩ කොට උපයා ගත් මුදලින් දිගටම අධ්‍යාපනය ලැබීය. විස්කොන්සින්වල දී ආර්ථික හා දේශපාලන විද්‍යා ඇම්. ඒ. උපාධිය සඳහා ඔහු ලියූ පර්යේෂණාත්මක රචනය ශ්‍රේෂ්ඨ ගණයේ කෘතියක් හැටියට සම්මාන ලැබීය.

ඇමෙරිකාවේ වැඩි දෙනාගේ ශ්‍රමයෙන් - සුළු දෙනෙකු සුඛෝපභෝගී ජීවිත ගත කරනු දුටු ජය ප්‍රකාශ්, ධනේශ්වරවාදය පිළිකුල් කළේය. ස්වකීය මහචාර්යවරුන්ගේ සහ සහෝදර ශිෂ්‍යයන් ගේ බලපෑම් නිසාත්, ඇම්. ඇන්. රෝයිගේ කෘතීන් කියවීමෙනුත්, ජය ප්‍රකාශ් මාක්ස්වාදය කෙරෙහි උනන්දු විය. ගාන්ධි තුමාගේ සිවිල් නීති කඩ කිරීමේ හා අහිංසාවාදී සහයෝගිතා වර්ජනයේ ක්‍රමයට වඩා, හොඳ - ඉක්මන් විප්ලවවාදී මගක් මාක්ස්වාදය තුළින් හෙතෙම දුටුවේය. සත් වසකට පසු ඇමරිකාවේ සිට සිය රට පැමිණි ජය ප්‍රකාශ්, මාක්ස් දර්ශනයේ පතුලට කිඳා බැස උගත් පරිපූර්ණ විප්ලවවාදියෙක් විය.

බරණැස හින්දු විශ්ව විද්‍යාලයේ ආර්ථික හා සමාජ විද්‍යාව පිළිබඳ ආචාර්යවරයෙකු ලෙස ජීවිතය නැවත වරක් එක්දහස් නවසිය විසිනවයේ දී ඇරඹූ ජය ප්‍රකාශ්, වැඩි කල් නොගොස් නැවත මුළු කාලය යොදා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට විරුද්ධ නිදහස් සටනේ පෙරමුණ ගත්තේය. මෙම තීරණාත්මක යුගයේ දී ඉන්දීය කොමියුනිස්ට්වරුන්ගේ ක්‍රියා කලාපය නිසා, ජය ප්‍රකාශ් නාරායන් ඔවුන් කෙරෙහි කලකිරුණේ ය. ඉන්දීය නිදහස් සටන ඉන්දියාවේ ධනේශ්වර පන්තියේ සටනක් හැටියටත්, මහත්මා ගාන්ධි ඔවුන්ගේ අතකොලුවක් හැටියටත්, හංවඩු ගැසීම ජය ප්‍රකාශ් අනුමත නො කෙළේය. කොංග්‍රස් සභාව තුළ සමාජවාදී පක්ෂය බිහි වූයේ මේ අවධියේය. නිදහස් ඉන්දියාව සමාජවාදී ඉන්දියාවක් වනු දැකීම ඔහුගේ අභිලාෂය විය. හිට්ලර්ගේ නැඟීමත්- යුරෝපීය සිද්ධීනුත්, රුසියන් කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රතිපත්ති වෙනස් වීමත් නිසා, ඉන්දීය කොමියුනිස්ට් පක්ෂය විසින් හිටි හැටියේම කොංග්‍රස් සභාව ජාතික පෙරමුණක් හැටියට පිළිගැනිණි. සමාජවාදීන්ගේ එකතුවක් පැතූ ජය ප්‍රකාශ්, ඉන්දියානු කොමියුනිස්ට්වරුන් ට සමාජවාදී පක්ෂයේ දොර විවෘත කළේ මෙහිදීය. මව් රටට වඩා රුසියාවට පක්ෂපාතකම් දැක්වීම නිසා, වැඩි කල් මේ එකතුව නොපැවතිණි.

මේ සියල්ලෙහි ප්‍රතිඵලය වූයේ, ඉන්දියාවේ සමාජවාදී ක්‍රමයක්- රුසියානු ක්‍රමය මත ගොඩනැංවීමේ සිහිනය ජය ප්‍රකාශ් විසින් සදහටම අත්හැර දැමීමයි. ස්ටාලින්ගේ දරුණු මනුෂ්‍ය ඝාතනවලින් තවදුරටත් ඔහුගේ බලාපොරොත්තු සුන් විය. ආසියාවට ආවේණික වූ මගකින්, ආසියාවේ සමාජවාදී ගමන මෙහෙයවිය යුතුය යන හැඟීම ඇති වූයේ මෙහිදීය. ආර්ථික හා දේශපාලන බලය මධ්‍යගත වීමට ඉඩ දීම

ඒකාධිපතියනට මග පෑදීමක් බව හෙතෙම විශ්වාස කළේය. සාමූහික චර්යාවන් සහ සමාජ පාලනය සඳහා වෙනත් මං සෙවිය යුතුය.

දේශපාලනය සදාචාරයෙන් ඈත් කළ යුතු නැත. සදාචාරයෙන් තොර දේශපාලනය අධම ප්‍රතිඵල ගෙන දේ. මේ අදහස් ජයප්‍රකාශ් තුළ මේරීමට පටන් ගත්තේ, දෙවැනි ලෝක යුද්ධ සමයේ දී ඔහුගේ කාලයෙන් වැඩි කොටසක් ගෙවුණේ හිර මැදිරි තුළ හෝ රහස් ජීවිතයක් ගෙන යාම සඳහා හෝ බැවිනි. ජය ප්‍රකාශ් නාරායන් තුමා සිර අඩස්සියට ගැනීමේදී බ්‍රිතාන්‍ය පාලකයනට එතුමා පිළිබඳ රහස් ඔත්තු සැපයීමේ අශෝභන ක්‍රියාව සිදු කළේ ඉන්දීය කොමියුනිස්ට් පක්ෂයයි. නඩු විභාගයක් නොමැතිව, දරුණු පීඩා දෙමින් බ්‍රිතාන්‍යයන් විසින් ජය ප්‍රකාශ් සිර කොට සිටිද්දී, ගාන්ධි තුමා ජය ප්‍රකාශ් පිළිබඳව කළ ප්‍රකාශයෙන් කොටසක් මෙසේය:

"ජේ.පී. ශ්‍රේෂ්ඨතම සටන් කාමියෙකි. තමාගේ ජන්ම භූමිය වෙනුවෙන් හෙතෙම සියල්ල අත් හළ පුද්ගලයෙකි. ඔහුගේ සේවා ශක්තියේ සීමාවක් නැත. ඔහු තරම් දුක් පීඩා ඉවසීමට හැකි තවත් අයෙක් මා දැක නැත. ජය ප්‍රකාෂ්ගේ අදහස් මගේ අදහස්වලට වෙනස් වුවත්, ඔහු සතු ධෛර්යයත්, ඔහුගේ දේශාලයත් නො දැකීමට තරම් මම අන්ධයෙකු නොවෙමි. බටහිර සමාජවාදය ගැන ඔහු නොදන්නා යමක් ඇත්නම්, එය දන්නා වෙනත් පුද්ගලයෙක් මේ ඉන්දියාවේ නැත."

එක්දහස් නවසිය හතළිස්දෙකේ නොවැම්බර් මාසයේ දී ජය ප්‍රකාශ්, හසරිබාග් සිර ගෙයින් පැන ගියේ ය. "නිදහසේ සොල්දාදුවන්ට" ඔහු ලියූ ලියුම්වලට එවකට විශාල ප්‍රසිද්ධියක් ලැබිණි. ජය ප්‍රකාශ් අල්ලා දෙන තැනැත්තාට බ්‍රිතාන්‍ය රජය විසින් රුපියල් දහදාහක තෑග්ගක් පිරිනැමිණි. අගය කළ නොහැකි ජාතික නායකයකු කවරෙක් සුද්දාට පවා දෙද් ද? එහෙත් විදේශීය රටකට ගැතිකම් කළ ස්වදේශිකයෙක්, ජය ප්‍රකාශ් සිරබාරයට ගැනීම පිළිබඳ ඔත්තුව බ්‍රිතාන්‍ය රහස් පොලීසියට දුන්නේය. නේපාලයේ දී, ජය ප්‍රකාශ් ගරිල්ලා භටයන් විසින් තාවකාලික ව මුදා ගනු ලැබුවත්, නැවත පන්ජාබයේ දී අල්ලා ගනු ලැබූ ඔහු, ලාහෝර් සිරගෙයට දැඩි මුරකාවල් ඇතිව යවන ලදී. එක්දහස් නවසිය හතළිස්පහ වන විට, සියලුම දේශපාලන සිරකරුවන් නිදහස් කරන ලද නමුත්, ජය ප්‍රකාශ් සිරෙන් නිදහස් කැරුණේ එක්දහස් නවසිය හතළිස්හයේ අප්‍රේල් මාසයේදීය.

ඉන්දියාව දෙකට කැඩී පාකිස්ථානයක් බිහි වෙද්දී, නිදහස වෙනුවෙන් කිසිදු පරිත්‍යාගයක් නො කළ – ධනවත් කණ්ඩායම්වල

බලපෑම් තුබූ අය මධ්‍යම කැබිනට්ටුවට ඇතුලු වෙද්දී – විප්ලවවාදී ජය ප්‍රකාශ් දුක් විය. මුහුකුරා නොගිය දේශපාලකයින් – සදාචාරයෙන් බංකොළොත් වුවත්, නිදහස් ඉන්දියාවේ පෙරමුණට එනු දුටු මහත්මා ගාන්ධි තුමා මෙන් ජය ප්‍රකාශ්ගේත් අදහස වූයේ "කොංග්‍රෙස් සභාව දේශපාලන පක්ෂයක් වීමට ඉඩ නොදී විසිරුවා හැර, මනුෂ්‍ය සේවය සඳහා කැප වූ ලෝක සේවා සංගමයක් බවට පරිවර්තනය විය යුතු බව"ය. එහෙත් බලාපොරොත්තු නොවුවක් ම සිදු විය. සංවිධානාත්මක දේශපාලනයෙන් මේ ශ්‍රේෂ්ඨ ජාති හිතෛෂී අවංක පුද්ගලයා ඈත් වන්නට විය. ආත්ම පාරිශුද්ධිය සඳහා විසි එක් දිනක උපවාසයක් ඇරඹූ ජය ප්‍රකාශ් තුමා කෙමෙන් ගාන්ධි මාර්ගයට පිවිසුණේය. උපවාසයෙන් පසු ඔහු කීවේ "වර්තමාන සමාජයේ විෂමතා නැති කිරීමට ගතානුගතික ව සමාජවාදය විසින් විශ්වාසය තැබුවේ ආයතනීය වෙනස්කම් ඇති කිරීම කෙරෙහිය. එහෙත් ආයතනීය වෙනස්කම් පමණක් ප්‍රමාණවත් නොවේ. සමාජයේ පදනම වූ මිනිසා වෙනස් කළ යුතුය. ඒ නිසාය ගුණවත් බව සහ නිවැරදි මාර්ග පිළිබඳව අප දැන් වඩා සැලකිල්ල යොමු කළ යුත්තේ. අලුත් මිනිසෙක් සහ අලුත් සමාජයක් ගොඩනැංවීමට නම් සමාජවාදයට සේවය කිරීමට නම්, ඒ සඳහා අවශ්‍ය ගුණයෙන් පිරි මිනිසුන් බවට අපි පරිවර්තනය විය යුත්තෙමු.

'සෝෂලිස්ට්' පක්ෂයත් – කොංග්‍රෙස් පක්ෂයත් එකට බැඳී තිබුණ පුරුක මහත්මා ගාන්ධිතුමාය. එතුමාගේ මරණයත් සමග මේ සම්බන්ධය දෙදුරුම් කෑවේ ය. ගාන්ධි තුමා ජීවතුන් අතර සිටියේ නම්, එතුමාගේ රාම් රාජ්‍යයටත්, ජය ප්‍රකාශ් තුමාගේ සමාජවාදී රජයටත් එකතු වී නව භාරතයක් ගොඩනැංවීමට අවස්ථාව තිබිණි. එක්දහස් නවසිය හතළිස්අටේ මාර්තුවේ දී සමාජවාදීහු කොංග්‍රෙස් පක්ෂයෙන් ඉවත් වූහ.

බලය පිළිගත් නේරුතුමාත්, බලය ප්‍රතික්ෂේප කළ ජය ප්‍රකාශ් තුමාත්, විශ්වාස කළ සමාජවාදයන්හි පරතරය එන්ට–එන්ට ම පුලුල් විය. එක්දහස් නවසිය පනස්හත වන විට ඔවුන් එකඟ වන තැන්වලට වඩා වැඩි වූයේ, එකඟ නොවන තැන්ය. එහෙත් වෛරය, තරහව, ඊර්ෂ්‍යාව කුමක් දැයි නොදත් ජය ප්‍රකාශ්, ජීවත්ව සිටින තාක් ශ්‍රී නේරුගේ සදාදරණීය මිත්‍රයෙක් විය.

එක්දහස් නවසිය පනස්දෙකේ සිට සර්වෝදය ව්‍යාපාරය ගැන විමසිල්ලෙන් සිටි ජය ප්‍රකාශ්ට, එක්දහස් නවසිය පනස්හත වන විට පක්ෂ දේශපාලනයේ ව්‍යාජ බව වැටහී ඉවරය. පක්ෂවල ක්‍රියාකාරීත්වය

මුල සිට අගටම දන්නා, අවුරුදු හතලිහක් තිස්සේ කොංග්‍රෙස් පක්ෂය ඇතුලු පක්ෂ ගණනාවක උසස්ම තනතුරු ඉසිලූ ජය ප්‍රකාශ්ට, සමාන කළ හැකි පක්ෂ නායකයෙක් අද ඉන්දියාවේ නැත. නියම සහෝදරත්වය, සමානත්වය සහ නිදහස රජයන සමාජවාදී මගට යා යුතු එකම මග ගාන්ධි, විනෝබා පෙන්වා දුන් සර්වෝදය මග බව අවසානයේ දී ජය ප්‍රකාශ් නාරායන් තුමා පිළිගත්තේය. මේ අනුව ඉන්දීය ජනාධිපති, අගමැති ආදී සියලු නායකයන් පැමිණ සිටි බුද්ධගයා සර්වෝදය සම්මේලනයේ දී, මේ අවංක ජන නායකයා ඒ හැම දෙනාම විශ්මයට පත් කරමින්, එදා සිට "පක්ෂ හා බලකාමී දේශපාලනයෙන් ජීවිතාන්තය තෙක් ඈත්ව, දුප්පත් මහජනයා සමග ජීවත්ව, මහජන සේවයට ජීවිතය විනෝබාට පූජා කරන බව" ප්‍රකාශ කළේය. ඉන්දීය පක්ෂ දේශපාලනයට ශ්‍රේෂ්ඨතම දේශපාලන නායකයෙක් අහිමි විය. සර්වෝදය ව්‍යාපාරයට හා සත් පුරුෂ මහ ජනතාවට තව ගැලවුම්කාරයෙක් බිහි විය.

81
රැමන් මැග්සයිසයි ත්‍යාගය

ඡායාරූප: 323
රැමන් මැග්සයිසයි රන් තිළිණය

මරදානේ දෙල්ගහයට ගෙදරට දිනපතාම සන්ධ්‍යා වරුවේ විවිධ තාරාතිරමේ පුද්ගලයෝ පැමිණියහ. එදා සන්ධ්‍යාවේ අප නිවසේ සාලයේ තිබුණු පරණ වේවැල් පුටු හතරේ වාඩි වී සිටි අය අතර මා මිත්‍ර උපාලි සේනානායක මහතා හා මහාචාර්ය ආර්. පී. ජයවර්ධන මහතාද වූහ. කොළඹ නගරයේ ඉහළ පෙළේ ව්‍යාපාරිකයින්, දේශපාලකයින්, නිලධාරීන් හා ලොකු පවුල්වල අය අතරට – සර්වෝදය පිළිබඳවත්, මා පිළිබඳවත් පණිවුඩය ගෙන ගියේ උපාලි සේනානායක මහතාය. තමන්ගේ පන්තියේ අය ගැන සැහැල්ලුවෙන් කතා කරමින්, ශ්‍රී ලංකා සමාජය යා යුතු සැබෑ මඟ පෙන්වන, නියම මාර්ගෝපදේශකයා හැටියට උපාලි සේනානායක මහතා, මා වර්ණනා කරන්නේ අතිශයෝක්තියෙනි.

නිදහස් සටනේ පුරෝගාමියා වූ තම පියා, දේශබන්ධු එෆ්.ආර්. සේනානායක මහතා, තම සුළු පියා ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැති ඩී.එස්. සේනානායක මහතා, තම වැඩිමහල් සොහොයුරු ආර්.ජී. සේනානායක



ඡායාරූප: 324
දෙල්ගහයට ගෙදර
මැග්සයිසයි ප්‍රවෘත්තිය
ඇසූ ගුවන් විදුලි යන්ත්‍රය

මහතා හා වෙනත් ජාතික නායකයින්ට වඩා ඉහළින් ඔහු වර්ණනා කරන පුද්ගලයා බැලීමට බොහෝ අය දෙල්ගහයට ගෙදරට ඔහු සමග පැමිණියහ. ඔවුන් ඉදිරිපිට සතර බ්‍රහ්ම විහරණය, සතර සංග්‍රහ වස්තුව, ධර්මද්වීප ධාන්‍යාගාර අරමුණු, ජාතික කොඩිය ආදි විෂයයන් අළලා කථා කරන උපාලි සේනානායක මහතා, මා හඳුන්වන්නේ මේවා ක්‍රියාවට නංවා, වත්මන් සමාජයට පෙන්වා දෙන පුද්ගලයා ලෙසයි. ඔහු ආරම්භ කළ පාසල් සිසුන්ගේ සහභාගිත්වයෙන් වල් පැළ නෙළීමේ ව්‍යාපාරය, නැකත, කයිය හා පංගුව නැවත ගොවි ජනතාව අතරට ගෙන යෑම ආදි වූ සියලු සමාජ ක්‍රියාවල ගෞරවය ද එතුමා මා පිට පටවයි.

දකුණු අත කාරෙකෙන් එළියට දමාගෙන, වම් අතින් සුක්කානම අල්ලාගෙන, හම්බන්තොට, තණමල්විල, ත්‍රිකුණාමලය, වව්නියාව, යාපනය ආදී ලංකාවේ ඈත දුර බැහැර පෙදෙස්වලට මා සමග යෑමට ප්‍රිය කළ - මේ මහ කලු සිංහලයාගේ හදවත, පොදු ජනතාවගේ විමුක්තිය සඳහාම කැපවූයේ - කිසිම දේශපාලනයකට නැඹුරු නොවෙමිනි.

නීතා තේ රැගෙන සාලයට ආවාය. කුඩා චාරිකා, විත්යා හා ජීවන් සමග මහාචාර්ය ආර්. පී. ජයවර්ධන මහතා ලොකු සංවාදයකය. මම ප්‍රවෘත්ති ඇසීමට සාලයේ තිබූ කුඩා ගුවන් විදුලි යන්ත්‍රය ක්‍රියා කළෙමි. ප්‍රධාන ප්‍රවෘත්තිය වූයේ

"CEYLON SCHOOL MASTER WINS THE MAGSAYSAY AWARD"

"ලංකාවේ ගුරුවරයා මැග්සයිසයි ත්‍යාගය දිනයි". යන්නය.

විදුලි සැරයක් වැදුණා මෙන් පුටුවෙන් ඉහළට විසි වූ උපාලි සේනානායක මහතා-



ඡායාරූපඃ 325
නිල වශයෙන් පිලිපීන තානාපතිතුමා මැග්සයිසයි ත්‍යාගය පිළිබඳ දැනුම් දීමට දෙල්ගහ යට ගෙදරට පැමිණි අවස්ථාව. නීතා, උපාලි සේනානායක මහතා හා කරුණානන්ද මහතා ද සිටිති

"ARI, IT'S YOU - IT'S YOU – ආරි, ඒ ඔබ–ඒ ඔබ" යයි කියමින් පොඩි ළමයෙක් මෙන් මා වැළඳ ගත්තේය.

"මොන පිස්සුදැයි "කී මම අන් අය සමඟ ප්‍රවෘත්ති විස්තරයට ඇහුම්කන් දෙන විටයි – ඇත්තවශයෙන්ම, 1969 ප්‍රජා නායකත්වය සඳහා පිරිනැමෙන රැමන් මැග්සයිසයි ත්‍යාගය මට පිරිනමා ඇති බව මා විශ්වාස කළේ.

පැයක් ඇතුළත දී, දේශීය – විදේශීය මාධ්‍යවේදීන්, නෑදෑ හිතවතුන්, සර්වෝදය සේවක සේවිකාවන්, සුබ පතන්නන් වැළ නොකැඩී අප නිවසට ආ අතර, ඔවුනට තේ කෝප්පයකින් වත් සංග්‍රහ කිරීමට අපේ ගෙදර සම්පත් නොවීය. නිල ප්‍රකාශනය හා ලියමන රැගෙන පිලිපීන තානාපතිතුමා අප නිවසට පැමිණියේ පසුදා උදේ ය. සෙනෙට් සභාපති ඒ. රත්නායක මහතා හා සෙනෙට් සභික ඩී.එල්.එෆ්. පේදිරිස් මහතා ද උදෙන් ම පැමිණ සුබ පැතූහ. දින කිහිපයක්ම අපේ ගෙදර මංගල සිරියක් ඉසිලීය.

මීට සතියකට පමණ පෙර නාඳුනන මැදිවියේ අහිංසක පෙනුමක් තිබුණ මිනිසෙක් අප නිවසට ආවේය. 'මහත්තයාගේ අත දෙන්න ශාස්තරයක් කියන්න!' ඔහු පැවැසීය. "කීයක් ගන්නවාද?" 'රුපියල් දෙකයි.' මම අත දුනිමි. මිනිත්තු දෙකකින් පමණ අත පසෙකට ලා ඔහු මෙසේ පැවසීයඃ

'මහත්තයා තව සතියකින් ලෝක ප්‍රසිද්ධ වෙනවා. ලොකු ධනයක් ලබනවා. මාසයක් ඇතුළත නෝනයි – මහත්තයයි දෙන්නම පිටරටකට යනවා.' රුපියල් දෙකත් රැගෙන මිනිසා ගියේය. එදායින් පසු කවදාවත් ඒ තැනැත්තා මට හමු නොවීය.

මේ දිනවල තාත්තා සිටියේ උණවටුනේ අපේ මහ ගෙදර ය. ගුවන් විදුලි පුවත ඇසූ අසල්වැසියන් අපේ ගෙදරට පැමිණ, තාත්තාට මේ සුබ ආරංචිය දී තිබේ. තාත්තා පවසා ඇත්තේ 'මේ ගැන බොහෝ සතුටුවන බවත්, එහෙත් පසුදා උදේ "මේ මගේ පුතා දැ"යි පත්තර කියවීමෙන් පසු තීරණය කරන බවත්ය. මෙය ගමේ ඇඩ්මන් අයියා ඇතුලු පිරිසට ප්‍රහේලිකාවක් විය.

පසුදා පත්‍රවල මේ ත්‍යාගය ගැන හොඳ ප්‍රසිද්ධියක් දී තිබූ අතර, මේ ත්‍යාගය සමඟ පිරිනැමෙන ඩොලර් දහදාහක සම්පූර්ණ මුදල මා පෞද්ගලික ව නොගෙන, සර්වෝදයට පරිත්‍යාග කරන බව ද සඳහන් වී තිබුණි. එය කියවූ පසු මගේ තාත්තා මහ ආඩම්බරයෙන් ගම්මුන්ට පවසා ඇත්තේ "අන්න මගේ පුතා" යන්න පමණකි. තාත්තා එදා සවසම පැමිණ මට සුබ පැතීය. අම්මා, මේ දිනවල අපේ දරුවන් බලා ගනිමින් දෙල්ගහ යට ගෙදරම සිටියාය.

නීතා හා මා රත්මලාන ගුවන් තොටුපලෙන් හොංකොං හරහා මැනිලාවලට යැමට පිටත්වන අවස්ථාවේ, අපට සුබ පැතීමට ගරු ඒ. රත්නායක මැතිතුමා, ගරු ඩී.එල්.එෆ්. පේදිරිස් මැතිතුමා, එම්. ඩබ්ලිව්. කරුණානන්ද මහතා, උපාලි සේනානායක මහතා, මහාචාර්ය එල්. ජී. හේවගේ මහතා ප්‍රධාන – අපේ විධායක සභිකයෝ ඇතුලු හිතවත්තු විශාල පිරිසක් පැමිණ සිටිය හ. පුංචි අක්කාට හා අම්මාට දරුවන් බලා ගැනීමට බාර දී, හිතුවක්කාරකම්වලට දඬුවම් දී – ගෙදර යවා සිටි කුඩා හර්ෂට ද නැවත අපේ ගෙදර නැවතීමට ඉඩ දී අපි මැනිලා බලා පිටත් වීමු.

අප ගුවන් යානයේ පියගැට පෙළින් බසින විට සුදු මහත, කොණ්ඩය කොටට කපා තිබූ ලස්සන රවුම් මුහුණක් තිබූ මැදිවියේ කාන්තාවක්, තවත් තරුණ කාන්තාවකුත් සමඟ මල් මාලාවක් සහ මල් කළඹක් රැගෙන අප ඉදිරියට එනවා දුටුවෙමි. මේ කාන්තාව මා කොහේදී මුත් කලින් දැක තිබේ. අපව සාදරයෙන් පිළිගෙන සුබපැතූ එතුමිය, තමා රැමන් මැග්සයිසයි ත්‍යාග පදනමේ විධායක අධ්‍යක්ෂවරිය බව හඳුන්වා දුන්නා ය. එතැන පේළි ගැසී සිටි අය අතර, ශ්‍රී ලංකාවේ තානාපතිවරයා ලෙස ඒ කාලයේ සිටි ප්‍රනාන්දු මහතා හා මැතිනිය ද අන් අය ද හඳුන්වා දී, අප විශේෂ අමුත්තන්ගේ කාමරයට කැඳවා ගෙන යන ලදහ. මේ අතර එහි සිටි නිලධාරීන් ඇතුලු හැම දෙනාම අත් පොළසන් දෙමින් අපට ගෞරව කළහ.

ඡායාරූප: 326
සෙනෙට් සභික
මනහාන් මහතා ,
බෙලෙන් ආබෲ
මෙනෙවිය හා අපේ
තානාපති ප්‍රනාන්දු
මහතා ගුවන් යානය
ළඟ දී කළ පිළිගැනීම

විධායක අධ්‍යක්ෂිකා බෙලෙන් එච්. ආබෲ මැතිනිය සමඟ අප දෙදෙනා එක් විශේෂ රියක ද, අන් අය වෙනත් රියවල ද නැගී ගුවන් තොටුපලේ සිට අපට නේවාසික පහසුකම් යොදා තිබූ, මැනිලා හිල්ටන්, හෝටලයට පැමිණියෙමු. අපේ වාහනයේ, රැමන් මැග්සයිසයි ත්‍යාගලාභියා, යනුවෙන් විශේෂයෙන් සකස් කරන ලද වචන අලවා තිබිණ.

අපට සූදානම් කර තිබුණේ හිල්ටන් හෝටලයේ විශාලම කාමරයකි. එය කාමරයක් නොවේ. ලොකු කාමරයක් - කුඩා කාමරයක්- අමුත්තන් පිළිගන්නා විසිත්ත කාමරයක් - වැසිකිළි හා නාන කාමර දෙකක් - ආහාර පිළියෙල කර ගැනීමට හා ආහාර ගැනීමට කොටසක් ආදී වශයෙන් වූ අංග සම්පූර්ණ නිවාසයක් මෙන් වූ 'සූවිට්' එකකි. අපේ කුඩා බෑග් දෙකේ තිබුණු සතියකට ප්‍රමාණ ඇඳුම් හැරුණු විට මේ ස්ථානය හිස් බවක් ඉසිලීය.



ඡායාරූප: 327
බෙලෙන් ආබෲ
මෙනෙවිය අප
කැඳවාගෙන යයි

අපි ටික වේලාවක් ගිමන් හැර පිරිසිදු වී, බෙලෙන් ආබෲ මෙනෙවිය හා ඇන්ග්ලෝ මහතා සමග අපේ වැඩ සටහන ගැන සාකච්ඡා කිරීමට පටන් ගතිමු.

ඡායාරූප: 328
බෙලෙන් එච්. ආබෲ මෙනෙවිය

මුලින් ම බෙලෙන් මෙනවිය ඇසුවේ මගේ සෞඛ්‍යය ගැනයි. එදා ඇය මා දකින විට ගමක කූඩාරමක් ඇතුලේ මා උණ ගැනී සිටි බවත්, ඊට පසු රෝහලට වූත් මා බැලූ බවත්, ඕ සඳහන් කළාය. එවිට – එදාට මාස හතකට පෙර උඟරුවෙල පැවැත් වූ ජාත්‍යන්තර කඳවුරට මේ කාන්තාව පැමිණි බව මට මතක් විය. මට හරි හැටි සිහිය තිබුණේ නැත. උණෙන් වෙව්ලමින් මා කූඩාරමක නිදා සිටින විට ඇය පැමිණ තිබේ. දෙසීයක් පමණ දේශීය විදේශීය ස්වේච්ඡා සේවකයෝ, උඟරුවල පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ කඳවුරේ ශ්‍රමදානය කළහ. ලෝක තරුණ සමුලුවේ මහ ලේකම් ජෝති ශංකර් සිං හා ආසියානු ලේකම් කේ.වී. රෙඩ්ඩි මහතා ද එහි වූහ.

ගම්පහ රෝහලේ එකල සේවය කළ දොස්තර එස්. සෝදිනාදන් මහතා, මා ගම්පහ රෝහලට එතුමාගේ රියෙන් ගෙන ගියේය. උණසන්නිපාත රෝගයෙන් පෙලුණු මට, ඇගේ මුහුණ සිහිනයක දී මෙන් මතක් වන අතර, වෙන කිසිවක් මතක නැත.

ලොකු ෆයිල් එකක් අතට ගත් බෙලන් මෙනෙවිය, මා පුදුමයට පත් කරමින් – අපේ දෙල්ගහ යට ගෙදර කුස්සියේ සිට හැම කොටසකම පින්තූර ද, මා ගැන පළ වූ පුවත්පත් වාර්තා හා ලිපි ලේඛන ද මට පෙන්වා, අවුරුදු තුනක කාලයක් ඔවුන් මා ගැන සොයා බැලූ බවත්, රජයේ උසස් නිලධාරීන් දෙදෙනෙක් හැර, රටේ අගමැතිතුමා ඇතුලු ඇය මුණගැසුණු හැම දෙනෙකුම, මගේ සේවය අගය කළ බවත් පැවැසුවා ය. මට ප්‍රජා නායකත්වය පිළිබඳ ත්‍යාගය පිරිනැමීමට ලැබීම ගැන, රමන් මැග්සයිසයි ත්‍යාග පදනම ආඩම්බර වන බවත් ඇය පැවැසුවාය. දලයි ලාමා තුමා හැරුණු විට, එතෙක් මේ ත්‍යාගය හිමි කරගත් ලාබාල ම පුද්ගලයා වූයේ මායි.

පසු දින සිට සවිස්තර වැඩ සටහනක් ඕ මා අත තැබුවාය. පෙරහුරුව හා ප්‍රධාන ත්‍යාග ප්‍රදාන උළෙල හැරුණු විට, ජනාධිපති ඇතුලු ප්‍රභූන් හමුවීම, විශ්ව විද්‍යාලවල හා මහජන ආයතනවල දේශන



ඡායාරූප: 329
ඌරුවල කඳවුර කේ. වී. රෙඩ්ඩි මහතා හා කරුණානන්ද මහතා

පැවැත්වීම, විශේෂ සංචාර, රූපවාහිනිය, ගුවන් විදුලිය හා පුවත්පත් සාකච්ඡා ආදී මාධ්‍ය කටයුතු මේ අතර විය. එක්දහස් නවසිය හැටනමයේ, අගෝස්තු මස විසිහත්වැනි දා සිට සැප්තැම්බර් හයවැනිදා දක්වා වැඩ සටහන් යොදා තිබුණේය.

ප්‍රධාන උත්සවයට පෙර ශ්‍රී ලාංකිකයෝ කිහිප දෙනෙක් මට මුණ ගැසුණ හ. මෙයින් සමහර දෙනෙකු මා කෙසේ මේ උත්සවය අමතයි ද, මගේ චාම් සුදු සරම, බැනියම හා සෙරෙප්පු යුගලය මැතිලාවේ ඉහළ සමාජය කෙසේ පිළිගනියි ද, මේ ගොඩයා අපේ රටට කෙබඳු ප්‍රතිචාරයක් ලබා දෙයි ද – යන කරුණු ගැන මට වඩා චකිතයකින් සිටි බව පෙනිණි. මම ඔවුන්ට හිතෙන් අනුකම්පා කරමින්, මගේ ගැමි විලාසය එසේම පෙන්වීමි.

ඡායාරූප: 330
ලෝක තරුණ සමුලුවේ මහ ලේකම් ජෝති ශංකර් සිං මහතා

මගේ හිතට ලොකු සැහැල්ලුවක් වූයේ, නිල වශයෙන් අපේ රජය මේ ත්‍යාගය පිළිබඳව එතෙක් කිසිම ප්‍රතිචාරයක් නො දැක්වීමයි. අප දෙදෙනාගේ ගමන් බිමන් පහසුකම් ආදී සියල්ල රැමන් මැග්සයිසයි ත්‍යාග පදනම විසින් කිසිම අඩුවක් නොමැති ව සම්පූර්ණ කර තිබිණි.

එක්දහස් නවසිය පනස්තුනේ දී තෝරා පත් වූ රැමන් මැග්සයිසයි ජනාධිපති තුමා, ජනතාවගේ නායකයෙකි. ඔහු තරම් පොදු ජනතාවගේ ආදරය දිනා ගත්, පොදු ජනතාවට සේවය කළ වෙනත් නායකයෙක් එතෙක් පිලිපීන ජනරජයේ සිට නැත. කිසිම ආරක්ෂාවක් නොමැතිව ඕනෑ ම දුපතක සිටි ජනතාව අතරට යෑමට ඔහු නො පැකිලුණේය. මගේ අභිප්‍රාය – දුප්පත් ජනතාවගේ කුසගිනි නිවීමට තවත් ටිකක් ආහාර සැපයීමත්, ශරීරය වසා ගැනීමට තව ටිකක් රෙදිපිළි සැපයීමත් අව්වෙන් – වැස්සෙන් ආරක්ෂාවීමට තව ටිකක් සෙවණ සැපයීමත්, ලෙඩ දුකින් මිදීමට තව ටිකක් සෞඛ්‍ය පහසුකම් සැපයීමත් බව ඔහු බොහෝ විට ප්‍රකාශ කළේය.

රැමන් මැග්සයිසයි තුමා හැරුණු විට, ජනතාව අතරට මෙසේ ගිය මා දන්නා අනිත් නායකයා, කෙතරම් වෙනත් දුර්වලකම් තිබුණත්, අපේ ජනාධිපතිව සිටි ආර්. ප්‍රේමදාස මැතිතුමාය.

එක්දහස් නවසිය පනස්හතේ දී, තමාම පදවාගෙන වෙනත් දූපතක ජනතාව ගැන සොයා බැලීමට යන අතර, කුණාටුවකට මැදි වූ එතුමාගේ ගුවන් යානය, අනතුරකට පත්වීමෙන් රැමන් මැග්සයිසයි ජනාධිපති තුමා හදිසියේ ජීවිතක්ෂයට පත් විය. එතුමා පිළිබඳ මහත් සේ දුක් වූ ජනතාව විසින් ඔහුගේ නම සදා ස්මරණය කරනු පිණිස රැමන් මැග්සයිසයි ත්‍යාග පදනම පිහිටුවන ලදී. ඔහුගේ අනුගාමිකයන් වූ සෙනෙට් සභික මනහාන් හා නීතිඥ බෙලන් එච්. ආබෲ වැනි හිතවත්තු මේ සඳහා ප්‍රමුඛ ව ක්‍රියා කළහ.

'රොකපෙලර් පදනම' විසින් මේ පදනම ස්ථාපිත කිරීමට විශාල පරිත්‍යාගයක් කළේය. මැනිලා කලපුව ඉදිරිපිට රොහාස් බොලිවාඩ් යන ස්ථානයේ තට්ටු විස්සක් පමණ වූ එවකට තිබූ ලස්සනම, උසම ගොඩනැගිල්ල ඉදි කර, පදනමේ මූලස්ථානය පිහිට වූහ. මේ ගොඩනැගිල්ලේ තට්ටු කිහිපයක්ම කුලියට දීමෙන් ලැබෙන ආදායම ත්‍යාග පදනමේ සියලු කටයුතු ඉතා හොඳින් ගෙන යෑමට ප්‍රමාණවත්ය.

මේ ගොඩනැගිල්ලේ විශාල රැස්වීම් ශාලාවක්, කාර්යාල කාමර, පුස්තකාලයක්, ලෝකයේ සියලුම ප්‍රජා නායකයින්ගේ සියලු විස්තර

ඇතුළත් ලේඛනාගාරයක්, ශ්‍රව්‍ය දෘශ්‍ය ශාලාවක් ආදී සියලු පහසුකම්වලින් යුක්ත ය.

'ආසියාවේ නොබෙල් ත්‍යාගය' යනුවෙන් ප්‍රසිද්ධ වූ මේ ත්‍යාගය, අවුරුදු පතා පස් දෙනෙකුට පිරිනමනු ලබයි. ප්‍රජා නායකත්වය, රාජ්‍ය සේවය, ජාත්‍යන්තර අන්‍යෝන්‍ය අවබෝධය, මහජන සේවය හා සාහිත්‍ය නිර්මාණාත්මක කලාව හා ජනමාධ්‍ය යන අංශවලට මේ ත්‍යාග පහ පිරිනමනු ලබයි.

මැග්සයිසයි ත්‍යාගලාභීන් අතර මා ත්‍යාගය ලබන කාලය වන විට, ආචාර්ය විනෝබා භාවේ, ශ්‍රී ජයප්‍රකාශ් නාරායන්, මලයාසියානු අගමැති තුන්කු අබ්දුල් රහමන්, අතිගරු දලයි ලාමා තුමා, සත්‍යජිත් රායි, කමලාදේවි චට්ටෝපාධ්‍යාය, ලංකාවේ මේරි රත්නම් මැතිනිය හා ටාසි විට්ටච්චි මහතා ආදීහු වූහ.

එක්දහස් නවසිය හැටනවයේ දී –ප්‍රජා නායකත්ව ත්‍යාගය මට හිමි වූ අතර, රාජ්‍ය සේවය පිළිබඳ ත්‍යාගය චීන සමූහාණ්ඩුවේ මුදල් ඇමති වූ ෂූ ෂී චූ මහතාත්, ජාත්‍යන්තර සහයෝගිතාව පිළිබඳ ත්‍යාගය ආචාර්ය රොබට් චැන්ඩ්ලර් මහතා මගින් ජාත්‍යන්තර වී පර්යේෂණ ආයතනයත්, මහජන සේවය පිළිබඳ ත්‍යාගය කොරියාවේ කිම් යූං සියෝ මහතාත්, සාහිත්‍ය, නිර්මාණාත්මක කලාව සහ සන්නිවේදනය පිළිබඳ ත්‍යාගය ජපන් ජාතික මිතෝජි නිෂිමෝටෝ මහතාත් හිමි කර ගත් හ.

ත්‍යාග ප්‍රදානෝත්සවය පැවැත්වූයේ 'ෆිලෙම්ලයින් ඔඩිටෝරියම්' යන විශාල නවීන ශාලාවේය. දිනය එක්දහස් නවසිය හැටනවයේ අගෝස්තු මස තිස්එක් වැනිදාය. රැමන් මැග්සයිසයි ජනාධිපතිතුමා මිය ගියේ එදාය. අග විනිසුරුතුමා මුලසුන ඉසිලීය. පදනමේ එවකට සිටි සභාපති මහාචාර්ය ඩයස්කොරි උමාලි මහතා, මැග්සයිසයි මැතිනිය හා දරුවන්, ජනාධිපති මාකොස් මැතිතුමා හා මැතිනිය, සෙනෙට් සභිකවරු, ඇමතිවරුන්, තානාපතිවරුන්, ඇතුලු සම්භාවනීය ආරාධිතයන් තුන් දහසක් මේ ශාලාවේ අසුන් ගෙන සිටියහ.

මා ඇතුලු ත්‍යාගලාභීන් ශාලාවට කැඳවාගෙන ආවේ උත්සව පෙරහැරකිනි. අප ඇතුල් වන විට සියල්ලෝ නැගිට අත්පොළසන් නාද කළහ. වේදිකාවේ සිටියේ අගවිනිසුරුතුමාත්, භාරකාර මණ්ඩලයත් අපත් පමණකි. මූලික උත්සව කටයුතුවලින් පසු, එක් එක් ත්‍යාග ලාභියාගේ ජීව දත්තයන් ඇතුලු හේතු පාඨ – එක් එක් භාරකරුවන් විසින් කියවනු ලැබීය. ඉන්පසු සහතිකයක්, වටිනා රන් පදක්කමක් හා

1969, මැග්සයිසයි ත්‍යාග උත්සවය

ඡායාරූප: 331.1
ත්‍යාග ප්‍රදානය
සඳහා වේදිකාව
වෙත කැඳවාගෙන
යාම

ඡායාරූප: 331.2
මැග්සයිසයි ත්‍යාගය
පිළිගැනීමේ දේශනය

ඡායාරූප: 331.3
(මැද) අග්‍ර විනිශ්චයකාර තුමා අතින්
ත්‍යාගය ලබා ගැනීම. දකුණේ මහාචාර්ය
ඩයස්කොරි උමාලි මහතා

ඡායාරූප: 331.4
මැග්සයිසයි ආර්යාව ගෙන්
සුබ පැතුම්

ඩොලර් දස දහසක චෙක්පතක් ද එක් එක් ත්‍යාගලාභියාට පිරිනමනු ලැබීය. ඉන්පසු මිනිත්තු පහක තිළිණය පිළිගැනීමේ දෙසුමක් පැවැත්විණි. මම අගවිනිසුරුතුමා ළඟින්ම වාඩිවී සිටි අතර, මගේ වාරය පැමිණියේ අන්තිමටය. මා බලාපොරොත්තු නොවූ විදියේ අත්පොළසන් නාදයක් මා නැගිට සිටි විට ශාලාවෙන් නිකුත් විය. ඊළඟට මගේ දේශනය පැවැත්වීමි. ඒ මගේ ඇඳුම නිසා වෙන්නට ඇත.

පෙරේදා රාත්‍රී මම දේශනයක් ලියා ඔවුන්ගේ ඉල්ලීම පරිදි ආබ්‍රා මෙනවියට දුන් නමුත්, මගේ දේශනය මා පැවැත්වූයේ කිසිම කොළ කෑල්ලක් අතේ නොමැති ව ක්ෂණිකවය. ඒ දේශනය මෙසේය:

* * *

"ගරු අග්‍ර විනිශ්චයකාරතුමනි, භාරකාර මණ්ඩලයේ භවතුනි, සහෝදර ත්‍යාගලාභීනි, මැග්සයිසයි ආර්යාවෙනි, ජනාධිපතිතුමා, ආර්යාව ප්‍රධාන මැති ඇමතිවරුනි, තානාපතිවරුනි, කාන්තාවරුනි, මහත්වරුනි, සහෝදරියනි, සහෝදරවරුනි,

මෙම ඓතිහාසික මොහොතෙහි ඔබ විසින් පිරිනමන ලද ශ්‍රේෂ්ඨ තිළිණය පිළිගනිමින් මේ කෙටි වදන් කිහිපය මම පවසන්නේ ඉමහත් නිහතමානී බවකින් හා මිනිස් සේවය කෙරෙහි ඇති වූ නව විශ්වාසයකින් යුතුවය. මෙම ගෞරවය ඔබ විසින් මගේ මව්බිමට පිරිනැමුණු ගෞරවයක් ලෙස ද, ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරයේ අහිංසක සේවකයන් වෙත පිරිනැමුණු ගෞරවයක් ලෙස ද, ඒ සියල්ලටම වඩා, අපේ දයාවේ හා සේවයේ පණිවුඩය පිළිගෙන සර්වෝදය මගට පිළිපන් සාමාන්‍ය ජනතාවට පිරිනමන ලද ගෞරවයක් ලෙස ද මම සලකමි.

සාමාන්‍ය මිනිසාගේ විමුක්තිය සඳහා ජීවත් වෙමින් ඒ සඳහාම යෙදෙමින්, සිටියදී, හදිසියේ මිය ගිය ඔබගේ ශ්‍රේෂ්ඨ නායකයා වූ ජනාධිපති රැමන් මැග්සයිසයි සම්මාන පදනමට අත දීම සඳහා දෛවය විසින් ලබාදුන් මාධ්‍යයක් හැටියට මම මේ ත්‍යාගය සලකමි.

රැමන් මැග්සයිසයි තුමා වැනි ශ්‍රේෂ්ඨ මිනිස්සු එක් රටකට හෝ එක් යුගයකට හෝ එක් පරම්පරාවකට හෝ අයිති වූවෝ නොවෙත්. ඔවුහු අන්ධකාරය අතරට විටින් විට වැටෙන ක්ෂණික විදුලිය මෙන් හිටි හැටියේ පෙනී, මග පෙන්වා – නොපෙනී යන සමාජ බලවේගයෝ වෙත්. ඔවුහු මුලු විශ්වයටම අයත් වන අතර, කාලය පිළිබඳ සම්මතයන් අබිබවා සිටිත්. "රූපං ජීරති මච්චානං - නාම ගොත්තං නජීරති" යනු මගේ ශාස්තෘ බුදුරජාණන් වහන්සේගේ වචන කිහිපයකි. අපේ රූපය

ඡායාරූප: 332
මැග්සයිසයි
ත්‍යාගලාභීන්
සමග

දිරා යන අතර, අපේ සිතිවිලි, වදන් හා ක්‍රියා අපේ භෞතික ශේෂයන් නැති වී බොහෝ කලක් යන තුරු පවතී.

මිනිසෙකුගේ නියම ශ්‍රේෂ්ඨත්වය මිණිය හැක්කේ, ඔහුගේ මරණින් පසු, ඔහුගේ සහෝදර ජනතාව ඔහු කෙරෙහි දිගටම පවත්වා ගෙන යන ගෞරව භක්තිය අනුවය. මේ අන්දමින් ගෞරව ලැබීමට නාමයක් ඉතිරි කර ගිය ඔහුගේ ජීවය, දේවත්වයට පත් වූවාට සැකයක් නැත. අපේ සහෝදර ජනතාවට වෙසෙසින් – සමාජයේ අන්ත දුගී දුප්පත් තත්වයට පත්ව සිටින අපේ සහෝදර ජනතාවට සේවය කිරීමට අප ගන්නා ව්‍යායාමයන්ට ඔහුගේ ආශීර්වාදය ලැබෙනු නියතය.

සමාජ නායකත්වය සඳහා පිරිනැමෙන මේ සම්මානයට ඔබ විසින් මා තෝරා ගෙන ඇත්තේ, මාගේ බාහිර හැසිරීම් රටාව ගැන විනිශ්චය කිරීමෙන් පසුව යයි හඟිමි. එම නිසා මේ සම්භාවනීය සභාව ඉදිරියෙහි මගේ බාහිර හැසිරීම් රටාවට මා පෙළඹවුනු, මගේ අභ්‍යන්තරික සිතිවිලි කිහිපයක් ඔබ ඉදිරියෙහි තැබීම මගේ යුතුකමක් හැටියට සලකමි:



ඡායාරූප: 332.1
ජනාධිපති රිසාල්
ස්මාරකයට මල්
වඩමක් තැබීම

මා ඉපදුනු හැදුනු වැඩුණු සංස්කෘතියේ සමහර සිතිවිලි මා කෙරෙහි තදින් බලපෑවේය. සමහර විට එම සංස්කෘතිය විසින්ම, මේ ශ්‍රේෂ්ඨ සිතිවිලි ක්‍රියාවට පරිවර්තනය කිරීම ඊළඟ ආත්මයට කල් තැබූ බව ද සත්‍යයකි. "සියලු සත්ත්වයෝ සැපවත් වෙත්වා" "පීතෝ භවතු ලෝකොව" යන පාඨය මා ඇදී ගිය එක් සිතිවිල්ලකි. "වැඩි දෙනාගේ වැඩි යහපත සැලසීම නොව – සියලු දෙනාගේම පූර්ණ උදාව ඇති කිරීම" යන සිතිවිල්ල මගේ ජීවිතයට තදින්ම කා වැදුනකි. සියලු දෙනාගේම සම්පූර්ණ යහපත යන අදහස, මහත්මා ගාන්ධිතුමා සහ ආචාර්ය විනෝබා භාවේ තුමා විසින් සර්වෝදය යන වචනයෙන් ප්‍රචලිත කැරුණි.

සමාජයේ සියල්ලන් අවදි කිරීමට පළමු, අපි අවදි විය යුතු වෙමු. මිනිසුන් හැටියට අරමුණු කර ගතයුතු ශ්‍රේෂ්ඨ ඉලක්ක හතරක් මා ඉපදුණු බෞද්ධ සංස්කෘතිය විසින් මට පෙන්වා දී තිබුණි. 'මෙත්තා' හෙවත් මෛත්‍රිය ඉන් පළමු වැන්නය. මවක් තමාගේ එකම දරුවාට තම දිවි වුව පුදා ආදරය කොට රැක ගන්නේ යම් සේ ද, එසේම සියලු සත්වයන් කෙරෙහි දයාවත් – ආරක්ෂාවත් සැලසීම අපේ පළමු අරමුණ විය යුතු ය. 'කරුණාව' දෙවැන්නයි. දුකින් පෙළෙන්නවුන් සොයා ගොස්, ඔවුන්ගේ එම දුකට මුල්වුනු හේතූන් ඉවත් කිරීමට කැප වීම යනු මෙහි අදහසයි. අනුන්ගේ සතුටෙන් නිරාමිස ප්‍රීතියක් භුක්ති විඳීමට පුරුදු වීම අපට පෙන්වා ඇති 'මුදිතා' නම් වූ තෙවැනි ඉලක්කයයි. කීර්තිය හෝ අපහාසය, ලාභය හෝ අලාභය, දිනුම හෝ පැරදුම, සැප හෝ දුක නො ඇලීමකින් සහ ඉවසීමෙන් යුතුව පිළි ගැනීමට හැකි වන සේ අපේ හැඟීම් සමබර ව පාලනය කර ගැනීම හෙවත්, උපෙක්ෂාව අපට පෙන්වා ඇති සතර වැනි අරමුණයි. මේ ලක්ෂණ හතරෙහි යම් මිනිසකු පිහිටාද ඔහු දේවත්වයට පත් වූවකු ලෙස සැලකෙන නිසා, මේවාට අපි සතර බ්‍රහ්ම විහරණ යයි කියමු. ගෞරව කළ යුතු යැයි ඔබ විසින් තීරණය කැරුණු මෙම සේවයට මා පොළඹවනු ලැබුවේ, මේ ජීවිත දර්ශනයයි.

මේවා නව විද්‍යාත්මක හා කාර්මික ලෝකයට නොගැලපෙන පුරුදු කළ නොහැකි හිස් අදහස් නොවේ. නවතාව තීරණය වන්නේ කාලය විසින් නොවේ. ජීවිතය දෙස සහ ජීවත් වීම දෙස අප විසින් බලන අන්දම අනුවය; නවතාව තීරණය වන්නේ, අපේ සමාජයේ සංස්කෘතිය නිදහස හා මානව ගෞරවය රැඳී ඇති පදනම වූ අපේ ගැමි පරිසරයේ සෑහෙන ප්‍රගතිශීලී වෙනස්කම් ඇති කිරීම සඳහා – අප විසින් මේ

අදහස ප්‍රායෝගික වශයෙන් අත්හදා බැලූවෙමු. ප්‍රජාතන්ත්‍රවාදය ගොඩනැගිය යුත්තේ සාමාන්‍ය ජනතාවගේ සිට බව ප්‍රකාශ කළේ, ඔබගේ මේ ශ්‍රේෂ්ඨ ජාතික නායකයාණෝ නොවෙත්ද?

මේ සිතිවිල්ල ක්‍රියාවට නැඟීමට අප යොදා ගත් ක්‍රියා මාර්ගය නම්, සහෝදර ජනතාව සමඟ තමාගේ කාලය, සිතිවිලි සහ කාය ශක්තිය බෙදා ගැනීමට කැමැත්තන් වෙත ආයාචනා කිරීමයි. අපි මෙය ශ්‍රමදානය යයි නම් කෙළෙමු. දානය - ප්‍රිය වචනය - අර්ථ චර්යාව සහ සමානාත්මතාව යන බෞද්ධ සමාජ ලක්ෂණ – ශ්‍රමදාන සේවයේ අනිවාර්යය ලක්ෂණ වේ. මෙම අදහස, ක්‍රියා මාර්ගය, අපේ ශක්ති ප්‍රමාණය අනුව ඉවහල් කර ගනිමින්, ශක්තිමත් ආධ්‍යාත්මික හා භෞතික පදනමකින් යුතු නව ශ්‍රී ලංකාවක් ගොඩ නැඟීමට අපි වෙහෙසෙමු. නැවත වරක් ධර්මය රජයන, ධර්මද්වීපය යන නමට සුදුසු දිවයිනක් බවට අපේ ජන්ම භූමිය, විද්‍යාවේත් – අපේ අතීත ආධ්‍යාත්මික උරුමයේත් – සම්මිශ්‍රණයෙන් ගොඩ නැංවීමට අපි වෙහෙසෙමු. ඔබගේ ශ්‍රේෂ්ඨ නායකයාගේ නාමයෙන් මා දිවුරුම් දී ප්‍රකාශ කර සිටින්නේ, ඔබ විසින් පිරිනමන ලද ගෞරවයේ හැම බිඳක්මත් – ඔබ විසින් ප්‍රදානය කරන ලද මුදල් ත්‍යාගයේ හැම සතයක්මත් මගේ පෞද්ගලික කීර්තිය හෝ ලාභය සඳහා හෝ නොව, මගේ මව්බිමේ ධර්මද්වීපයක් ගොඩ නැංවීමේ අරමුණ සඳහා කැප කරන බවයි.

"අපේ සැබෑ ස්වභාවය අපට සොයාගත හැක්කේ අපේ ආත්මීය හැඟීම අප තුළින් තුරන් කළ පමණටය"

ඔබේ නායකයා විශ්වාස කළ පමණටම– මමත් විශ්වාස කරමි. කුමක් සඳහා ද ආත්මහරණය කළ යුත්තේ? මිනිස් වර්ගයාගේ සියලු ම දුකට මුල් වූ හේතූන් වන ලෝභය, මෝහය සහ ද්වේෂය සහමුලින් තුරන් කිරීමට සම්පූර්ණයෙන් කැපවීම සඳහාය."

* * *

මේ අවස්ථාව එතෙක් මගේ ජීවිතයේ ලත් ඉහළම පිළිගැනීම විය. රටේ ලොක්කන් කෙසේ වෙතත්, ලොවේ මිනිසුන් අපේ දර්ශනය හා කැපවීමට මෙසේ ගරු කිරීම නීතාට හා මට ලොකු සතුටක් ගෙන දුනි.

මෙහිදී මා මිත්‍ර ඔලිම්පික් ශූර ඩන්කන් වයිට් මහතා කී කතාවක් මට මතක් විය. "ඒ මොහොතේ මට දැනුණේ මුලු ලංකාවේම ගෞරවය රැක ගැනීම මා පිට පැවරී ඇති බවය". මා පිලිපීනයේ ගත කළ කාලය, ශ්‍රී ලංකාවේ නාමය පිලිපීන ජනතාව අතරට ගෙන යෑමට එතෙක් කර තිබූ විශාලම ව්‍යායාමය විය.

අප මැග්සයිසයි ත්‍යාගය ලබාගෙන ශ්‍රී ලංකාවට ගොඩ බසින විට, නිල වශයෙන් කිසිම පහසුකමක් අපට සලසා තිබුණේ නැත. අනික් මගීන්ට වඩා මිනිත්තු 45 ක පමණ කාලයක් අපට ගුවන් තොටුපළේ රේගුවේ රැඳී සිටින්නට සිදු වූයේ එහි සිටි මෝඩ නිලධාරියෙක් මා ළඟ තිබූ රත්රන් පදක්කමත්, ඩොලර් දහ දාහක චැක්පතත් නිසා, රේගු බදු අය කිරීම ගැන ප්‍රශ්නයක් මතු කළ නිසාය. එතැනට පැමිණි බුද්ධිමත් උසස් නිලධාරියෙක් නිසා, රේගුබදු නො ගෙවා අපට එළියට ඒමට පුලුවන් විය. විශාල පිරිසක් අපව පිළිගෙන නාලන්දා විද්‍යාලයේ පැවැත්වූ පිළිගැනීමේ උත්සවයට උත්සවශ්‍රීයෙන් අප කැඳවා ගෙන ගියහ.

ඡායාරූප: 333
මැග්සයිසයි ත්‍යාගය ලබාගෙන
ලංකාවට පැමිණි අවස්ථාව

මේ යුගය ප්‍රධාන අධිරාජ්‍ය දෙක අතර බල කඳවුරු දෙක අතර සීතල යුද්ධය තදින් ම පැවති යුගයයි. ඒ නිසා කොමියුනිස්ට් පක්ෂය ඇතුලු මාක්ස්වාදී පක්ෂ 'අධිරාජ්‍ය ගැත්තෙක්' 'සීඅයිඒ කාරයෙක්' ආදී වශයෙන් ඉවක් බවක් නැතිව – මටත්, සර්වෝදය සංසදයටත් ඉතා පහත් විදියට පහර දුන්හ. පසු කලෙක ඔවුන් බොහෝ දෙනෙක් මා හමුව වරදවා තේරුම් ගෙන එසේ කළ බවට පාපොච්චාරණය කළහ. මා ඔවුන්ට මතක් කර දුන්නේ, මා පුරුදු කරන සතර බ්‍රහ්ම විහරණයේ එක් අංගයක් නම් උපේක්ෂාව බවය. ඒ නිසා ප්‍රශංසාව මෙන්ම, ගැරහීමත් මා එකම විදියට බාර ගන්නා බවය.

මා පිළිබඳ තද ඊර්ෂ්‍යාවකින් පෙලුනේ මා කළ වැඩවලින් කොටසක් අනුකරණය කරමින්, රාජ්‍ය බලය හා සම්පත් යොදවා රාජ්‍ය ශ්‍රමදානයන් කළ සමහර උසස් නිලධාරීන්ය. මෙයින් කෙනෙක් ද මේ ත්‍යාගය ලබා ගැනීමට බලපෑම් කර ඇති බව පසුව මට දැන ගන්නට ලැබිණි. මිදි කඩා ගන්න උඩපැන්න නරියා "මිදි තිත්ත යයි" කියා යන්නට ගියා සේ, මේ නිලධාරියා ද මට මේ ත්‍යාගය ලැබුණු බව ඇසූ විට, තම ඉදිරිපිට සිටි සහාය අධ්‍යක්ෂට කියා ඇත්තේ මෙසේය:

"ආරියරත්නගේ තත්වය ඉහළ යෑමක් නොව, මේ ත්‍යාගය ඔහුට පිරිනැමීමෙන් සිදු වී තිබෙන්නේ, මැග්සයිසයි ත්‍යාගයේ තත්වය පහළ බැසීමයි".

මැග්සයිසයි ත්‍යාගය පිළිගෙන එනවිට පිළිගැනීම් නාලන්දා විද්‍යාලයේ දී

ඡායාරූප: 334.1
මාපා රා පොඩි අප්පුහාමි මහතා කතා කරයි. අතිගරු බිෂොප් ලක්ෂමන් වික්‍රමසිංහ, මා, නීතා, ඒ. රත්නායක මහතා, නාලන්දා විදුහල්පති ගුණපාල වික්‍රමරත්න, ඩී. එල්. එෆ්. පේදිස් මහතා ද මෙහි සිටිති.

ඡායාරූප: 334.2
කරුණානන්ද මහතා අප කැඳවා ගෙන නාලන්දාවට එයි

ඡායාරූප: 334.3
සර්වෝදය සේවක සේවිකාවෝ පිළිගැනීම් ගීතයන් ගයති

මේ නිල දරුවාගේ අවසන් කටයුතුවලට සහභාගිවීමට මා ගිය අවස්ථාවේදී, මෘත දේහය ළඟ අනිත්‍ය භාවනාව කොට – ඔහුට පින් දී මා ප්‍රාර්ථනා කළේ, ඊළඟ දිවියේ දී මෙවැනි පව් චේතනා ඔහු තුළ ඇති නොවී – අනුන්ගේ සතුටේ දී, තමනුත් සතුටුවීමේ මුදිතා ගුණය ලැබේවා – යයි යනුවෙනි.

මැග්සයිසයි ත්‍යාගයෙන් ලත් මුදල ඔහුගේ නමින් පිටරට බැංකුවක තැන්පත් කරන ලෙසත්, නීත්‍යානුකූලව ලැබෙන රුපියල් වටිනාකමෙන් තුන් ගුණයක් හෝ හතර ගුණයක් ඔහු ලංකාවේ දී මට දෙන බවත්, එක්තරා වැදගත් – උගත් – ශ්‍රද්ධාවන්ත – පොහොසතෙක් මා හමුවීමට වුත් යෝජනා කළේය. එය ප්‍රතික්ෂේප කළ මම, මේ සිද්ධිය පුවත්පත් සාකච්ඡාවක දී නම සඳහන් නොකොට ප්‍රකාශ කළෙමි.

ඩේලි මිරර් පත්‍රයේ කතු වැකියක් ලියූ රෙජ් මයිකල් මහතා, මා හඳුන්වා දී වර්ණනා කළේ **"A Man in a Million"** යන ශීර්ෂ පාඨය යටතේ ය. ශ්‍රී ලංකාවේ සියලුම පුවත්පත් හොඳ ප්‍රචාරයක් දී තිබුණි. එහෙත් පිලිපීනයේ හා විදේශීය පුවත්පත්, සඟරාවල එහි දී මා කළ දේශනවලට පිටු ගණනින් විශාල වශයෙන් ප්‍රසිද්ධිය දී තිබුණි.

මීට මාස කිහිපයකට පසු ලෝක ප්‍රසිද්ධ **Readers Digest** සඟරාවේ මාධ්‍යකරුවන් පැමිණ පළමුවරට ශ්‍රී ලාංකිකයෙක් ගැන පළ කළ ලිපිය නම් කර තිබුණේ **"CEYLON'S PICK AND SHOVEL SAMARITANS - ARI'S ROAD TO HEAVEN"** යනුවෙනි. මේ ගැන පසුව ලියමි.



ඡායාරූප: 335
ත්‍යාග මුදලේ චැක්පත අගමැති ඩඩ්ලි සේනානායක මහතාට බාර දීම.

ඒ. රත්නායක මැතිතුමා, ඩී.එල්.එෆ්. පේදිරිස් මැතිතුමා සහ උපාලි සේනානායක මැතිතුමාගේ පෙළඹවීම නිසා දෝ, ගරු අග්‍රාමාත්‍ය ඩඩ්ලි සේනානායක මැතිතුමන් විසින් අරලියගහ මන්දිරයේ දී මා හා නීතා පිළිගැනීමට විශේෂ ප්‍රිය සම්භාෂණයක් සූදානම් කර තිබුණේය. මේ උත්සවයට මැති ඇමතිවරුන් කිහිප පොළක්ද, ප්‍රභූන් කිහිප පොළක්ද, සර්වෝදය වැඩිහිටි මණ්ඩලය හා විධායක සභිකයෝ ද සහභාගී වූහ.

අවසාන දේශනය කළ මා, අගමැතිතුමා අතින් සභාපති ඇම්. ඩබ්ලිව්. කරුණානන්ද මැතිතුමන්ට ත්‍යාග මුදල් චෙක්පත සර්වෝදය සංගමයේ කටයුතු සඳහා පරිත්‍යාග කළෙමි.

මහින්ද ආදි ශිෂ්‍ය සංගමය ඇල්බට් එදිසිංහ මහතාගේ නිවසේදීද, මහින්ද විද්‍යාලයේ විදුහල්පතිතුමා, ගුරුවරුන් හා ශිෂ්‍යයින් ගාල්ලේ මහින්ද විද්‍යාලයේ ද, සමාජ සේවා මධ්‍ය මණ්ඩලය කොළඹදී ද, වෙනත් සංවිධාන රටේ විවිධ පළාත්වලදී ද මා පිළි ගැනීමට උත්සව සංවිධානය කර තිබුණෙන්, මේ සඳහා වැඩි කාලයක් ද – මහන්සියක් ද යෙදවීමට මට සිදු විය.

82

ඉහළ කුරුකැටියාවේ වෙද මහතා

දිනක් මරදානේ මගේ නිවසට හොඳට වැඩුනු දේහයකින් යුත් අවුරුදු 35 ක් පමණ වයස ඇතැයි මට සිතුණු මහත්මයෙක් පැමිණියේය. මෙතුමාගේ මුහුණේ ශෝකාකුල බවක් මම එකවරම දුටුවෙමි. ඔහුට වාඩිවීමට සලස්වා, ඔහු පැමිණි කාරණය කුමක් දැයි මම විමසීමි.

"මහත්මයා, මම ඔබතුමා මුණගැසීමට පැමිණියේ ලොකු උපකාරයක් ලබා ගැනීමට."

"කියන්න මොකක් ද ඔබට උවමනා උපකාරය."

"මම කොළඹ නගර සභාවේ වැඩ කරන ලිපිකරුවෙක්. දැනට මාස කිහිපයකට පෙර මගේ උගුරේ ආබාධයක් ඇති වුණා. එය පිළිකාවක් බව වෛද්‍යවරුන් තීරණය කරල විදුලිසැරය ද ඇල්లුවා. ඒත් සනීප වුණේ නැහැ. දැන් ඔවුන් කියනවා මාස තුනකට වඩා මට ජීවත්වීමට අපහසුයි කියා. මට දැන ගන්නට ලැබුණා පුත්තලම් දිස්ත්‍රික්කයේ ඉහළ කුරුකැටියාව කියන ගමේ 'කව්වා' නම් වූ වෙද මහත්මයෙක් ඉන්න බව. ඒ ගමට සාමාන්‍ය වාහනයකින් යෑමට අපහසු බවත් දැන ගත්තා. මම ආවේ ඔබතුමාගේ ජීප් රථය මට එහි යන්නට දෙන්න පුලුවන් ද කියා දැන ගන්න."

"මගේ වාහනයේ රියැදුරා මමයි. ඒ නිසා සති අන්තයේ මම ඔබව රැගෙන යන්නම්."

ඔහු එයට එකඟ විය. අපි පුත්තලම ආණමඩුව හරහා ඉහළ කුරුකැටියාව ගමට – අතිශය අමාරු ගම්සභා පාරක් ඔස්සේ ළඟා වී කව්වා වෙදමහතාගේ ගෙදර සොයාගෙන ගියෙමු.

ඔහු කොහේ දැයි ළමයෙකුගෙන් විමසූ විට, කුඹුරේ වැඩ කරන කෙනෙකු අපට පෙන්නුවේය. අපි එතැනට නියර දිගේ ගියෙමු. අපි දුටුවේ අමුඩයක් ඇඳගෙන කුඹුර කොටන වෙද මහතාය. ඔහු වහාම අත පය සෝදා ගෙන, සරමක් ද දවටාගෙන –අපත් සමග ඔහුගේ මැටි ගැසූ කුඩා නිවසට පැමිණියේය.

එතුමා මෙම ලෙඩාගේ තත්ත්වය පරීක්ෂා කළේය.

"මහත්මයා ඔබ කරන්ට් අල්ලන කලින් ආවා නම් මම මෙය සනීප කරනවා. නමුත් දැන් මට කළ හැක්කේ ඔබ අඩුම වශයෙන් අවුරුද්දක් ජීවත් කරවීමයි. මා කියාදෙන විදියට හොඳින් ප්‍රතිකාර පාවිච්චි කරන්න."

තමා පරම්පරාවෙන් ගොවියෙක් බවත්, එහෙත් පරම්පරාවෙන් ඔහු ලැබුණු බෙහෙත් වට්ටෝරු අනුව, විවිධ තුවාල, පිළිකා ආදියට සාර්ථකව ප්‍රතිකාර කරන බවත්, වෙදමහතා ප්‍රකාශ කළේය. පිළිකා වර්ග 60 කට වඩා තිබෙන බවත්, එයින් බොහොමයක් සනීප කළ හැකි බවත්, ඔහු ප්‍රකාශ කළේය. දීර්ඝ සාකච්ඡාවකින් පසු – ඔහුගේ වත්තෙන්ම උදුරා – තම්බා අපට දෙන ලද බතල ආහාරයක් ද, පොල් සමග අනුභව කළ හැටි මට මතකය.

පිළිකා රෝගය ගැන පමණක් නොව, අපේ පැරැණි ගැමියන්ගෙන් උගත හැකි බොහෝ දේ තිබෙන නිසා, මා විසින් වයෝවෘද්ධ ගැමියන් සලකනු ලැබුවේ මාගේ ගුරුවරුන් හැටියටයි. ඉහළ කුරුකැටියාවේ වෙද මහතා එවැනි ගුරුවරයෙක් යැයි සිතා – එතුමාගෙන් මම ප්‍රශ්න මාලාවක් ඇසුවෙමි.

"වෙද මහත්මයා ජීවත් වෙන්නේ සතුටින්ද?"

"අනේ මහත්තයෝ හරිම සතුටින්."

"සතුටින් ජීවත් වන්නට අවශ්‍ය වන්නේ මොනවාද?"

"පළමුවෙන් ම හොඳ වටපිටාවක් තියෙන්න ඕනෙ. බලන්න අපි ජීවත්වන ලස්සන පරිසරය. මේ ගස් කොළන්, කුඹුරු යායවල් සුළඟ ආදී දේ පමණක් නොවා, හිතෙත් බයක් – සැකක් නැතිව ජීවත්වන්න පුළුවන් වෙන්න ඕනෙ."

දෙවැනි කාරණය තමයි ජලය. අපේ එදිනෙදා ජීවිතය පවත්වා ගෙන යන්නත්, ගොවිතැන් කටයුතු කරන්නත් ජලය අපට අවශයයි.

තුන්වැනි කාරණය අපේ විළිවසා ගැනීමට සරල වාම් ඇඳුම් අවශ්‍යයි.

හිසට සෙවණක් අවශ්‍යයි.

අපේ ආහාරපානාදිය සකස් කරන්න ගෙදර එළිය කරගන්න ඉන්ධන අවශ්‍යයි. අපට විදිලිය නැහැනේ. අඩුම වශයෙන් භූමිතෙල් ටිකක් වත් තියෙන්න ඕනෙ. ලෝකේ රටේ වෙන දේවල් දැන ගන්න ක්‍රමයක් ඇත්නම් ඒකත් හොඳයි.

අපේ දරුවන්ට පොත–පත ඉගෙන ගන්න අධ්‍යාපන ක්‍රමයකුත් ඕනෙ.

මේ ඔක්කොටම වැඩිය අවශ්‍ය අපේ හොඳ සිරිත් විරිත් සහ ආධ්‍යාත්මික දියුණුවක්. මේ අවශ්‍යතා ටික සම්පූර්ණ වෙනව නම් මහත්තයෝ සතුටින් ඉන්න තවත් මොනවද ඕන?"

අද සර්වෝදයේ ක්‍රියාත්මක වන දශ විධ මූලික මානුෂික අවශ්‍යතා පිළිබඳ අදහස මට දුන්නේ ඉහළ කුරුකැටියාවේ මේ වෙද මහතායි.

බුලත් කොළයක මා අත තිබූ මුදලක් තබා එතුමාට පරිත්‍යාග කොට, බෙහෙත් ද රැගෙන අපි ආපසු කොළඹට පැමිණියෙමු.

එදා වෙද මහත්මයාත් – මාත් අතර ඇරඹුනු මිත්‍රකම දිගටම පැවැත්තේය. බොහෝ අවස්ථාවලදී ඔහු බස් රථයෙන් අපේ ගෙදරට පැමිණ, රාත්‍රී ගත කොට – අර ලෙඩා ද ගෙන්වා ගෙන ප්‍රතිකාර කර ආපසු ගියේය. සමහර අවස්ථාවලදී මම එතුමා බැලීමට ගියෙමි. ඉහළ කුරුකැටියාව, සර්වෝදය ගමක් හැටියට දියුණු කිරීම පටන් ගත්තෙමු. එහි පූර්ණකාලීනව වෙදමහත්මයා ළඟ නැවතී – වෙදකමත් ඉගෙන ගෙන ගමේ සංවර්ධනයට අත දීමට තරුණයෙක් ද යැවීමි.

වැඩි කලක් ගත වූයේ නැත. එක්දහස් නවසිය හැත්තෑඑකේ අප්‍රේල් කැරැල්ල ඇති වූයේය. මා නැවැත්වූ තරුණයා හදිසියේ ම ආපසු පැමිණියේය. මාස කිහිපයක් ගත විය. ඔහු ගැන සොයා බැලීමට මම පණිවුඩකරුවෙක් යැවීමි. ඒ වන විට වෙදමහතා ස්වභාවික හේතූන් උඩ මිය ගොස්ය. එතුමාගේ ප්‍රතිකාර ක්‍රමය ද ඒ සමගම සමාජයට අහිමි විය. මේ ගැන පර්යේෂණ කිරීමට කීප වරක්ම මා විසින් උනන්දු කිරීමට මහන්සි ගත් මගේ වෛද්‍ය විද්‍යාලයේ මිත්‍රයින්ට, මම හිතෙන් දොස් කීවෙමි. මාස තුනකට කල් දී තිබූ අපේ හිතවත් රෝගියා ද අවුරුදු 2කට වැඩි කාලයක් ජීවත්ව වී පරලෝ සැපත් විය.

කෙසේ නමුත් වෙද මහතාගෙන් ඉගෙන ගත් දශ විධ මූලික මානුෂික අවශ්‍යතා වැඩසටහන, දස දහසකට අධික සර්වෝදය ගම්වල අද ක්‍රියාත්මක වනවා පමණක් නොව, ලෝක බැංකුව – එක්සත් ජාතීන්ගේ මණ්ඩලය ඇතුලු බොහෝ ජාත්‍යන්තර සංවර්ධන ආයතනද අද මූලික මානුෂික අවශ්‍යතා ගැන කතා කරති.

මගේ මතකයේ හැටියට එක්දහස් නවසිය හැත්තෑ එකේ දී පමණ ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිල සඟරාවේ මා විසින් මේ පිළිබඳව ලියන ලද ලිපියක් පළ විය. මා දන්නා හැටියට දශවිධ මූලික මානුෂික අවශ්‍යතා ගැන ජාත්‍යන්තර වශයෙන් ප්‍රථමයෙන්ම සඳහන් වූ අවස්ථාව මෙයයි.

83

අදම ආපසු සිය රටට යන්න

එක්දහස් නවසිය හැත්තෑවේ දී, මගේ මල්ලී වීර ජිනදාස – රැකියාව කළේ එංගලන්තයේ කෙන්ට් ප්‍රදේශයේ ඇමර්ෂම් කවුන්ටි කවුන්සිලයේ ඉංජිනේරුවෙක් හැටියටය. ඔහුගේ නිවසේ සිටින විට සර්



ඡායාරූප: 336
එංගලන්තයේ කෙන්ට් ඇමර්ෂම්වල මල්ලීගේ ගෙදර. මල්ලී වීර ජිනදාස, බිරිඳ කමලා, ලොකු පුතා දීපාල් ඇතුළු අසල්වැසි ළමයින්

ජෝන් කොතලාවල මහතාගේ කෙන්ට්වල පිහිටි නිවසට යාමට අපි එතුමාට ටෙලිෆෝන් කළෙමු. රාත්‍රී ආහාරය සඳහා පැමිණෙන ලෙසත්, එසේ පැමිණෙන විට, මාගේ බඩු මුට්ටු සියල්ලම ආපසු යෑමට සූදානම් කර තබා එන ලෙසත් එතුමා පැවසීය. මෙය මල්ලීටත් – මටත් ප්‍රහේලිකාවක් විය.

එතුමාගේ නිවසට ඇතුළු වන විට දොර උළුවස්සේ සිංහලෙන් "සිය රටටමයි කවදත්" වචන කොටා තිබෙනු දුටුවෙමු. ඉක්මණින් අප සමඟ රාත්‍රී ආහාරය ගත් සර් ජෝන් කොතලාවල, සැරෙන් කථා කරන්නට පටන් ගත්තේය.

එක්සත් ජාතික පක්ෂයේ නායකයා ඇතුළු හැමෝටම, දොස් කීවේය. ඔවුන් මැතිවරණයෙන් අන්ත පරාජයකට පත් වන බව

කීවේ ය. මැතිනිය තුනෙන් දෙකකට වඩා ආසන ලබා ගන්නා බවත් පැවසීය.

"සර් කොහොම ද ඕක දන්නේ?"

"ඇයි මනුස්සයෝ මම අගමැති කාලේ – මගේ මිනිස්සු ඇවිල්ල මට කීවේ සර් උඩින් දිනනවා කියලා. අන්තිමට අපි අන්ත පරාජයකට පත් වුණා. අද ඩඩ්ලිගෙ මිනිස්සු ඩඩ්ලිට කියන්නෙත් – ඔය විදියටයි. දැන් මිනිස්සු මට ඇත්ත කියනවා. මා දේශපාලනයේ නැති නිසා. ඒ නිසා තමයි මම යු.ඇන්.පී ය අන්ත පරාජයකට පත් වෙනවා කියන්නේ."

"ඉතින් සර් මට කියන්නේ මොකක් ද?"

"ඇයි මිනිහෝ තේරෙන්නේ නැද්ද? ජාතික ව්‍යාපාරයක නායකයෙක් හැටියට ආණ්ඩුවක් වෙනස් වෙන කොට – උඹ එතන ඉන්න එපායැ? වහාම ලංකාවට ගොස් අනිද්දා උදේ නැවත අගමැතිකමට පත්වෙන සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට සුභ පතපන්."

"මම කොහොමද සර් ඔච්චර ඉක්මණට යන්නේ. බඩු මුට්ටුත් අරන් – දැන් ගුවන් තොටපලට යන්නේ?"

"මම 'එයාර් සිලෝන්' මැනේජර්ට කියලා ආරිගෙ ආසනය වෙන් කරලා තිබ්බා."

එතුමාගේ උපදෙස් පරිදි, පසු දිනම සිය රට පැමිණියෙමි. ඡන්දයද පාවිච්චි කළෙමි. පසු දින අගමැති කාර්යාලයට ගොස් නව අගමැතිනියට සුභ පැතුවෙමි.

84

දෙල්ගහයට ගෙදරින් මෙත් මැදුරට

ඡායාරූප: 337
මෙරිල් ඒ. ප්‍රනාන්දු මහතා

එක්දහස් නවසිය හැත්තෑව වර්ෂය වන විට උපාලි සේනානායක මහතා, මගේ දකුණු අත මෙන් දිවා, රෑ මා සමඟ සර්වෝදය කඳවුරුවලට යමින්, කහටගහ පතලේ කාර්යාලයේ දී සාකච්ඡා කරමින් නැතහොත් කනත්ත පිටුපස පිහිටි ගොල්ෆ් සමාජයේ කතාබස් කරමින් සර්වෝදය කෙසේ ඉදිරියට යා යුතු ද? යන මං සොයමින් සිටි යුගයකි. මගේ නිදහස් කාලය එතුමාගේ දොන් කරෝලිස් පාරේ නිවසෙහි හෝ ඔහුගේ නිදහස් කාලය දෙල්ගහයට ගෙදර මගේ නිවසේ හෝ ගත විය. මැග්සයිසයි ත්‍යාගය නිසා සර්වෝදය ගැන ගැමි ජනතාව තුළ තිබූ විශ්වාසය ද ඉහළ ගොස් තිබිණි. එතුමා ආරම්භ කොට, ඉතා සාර්ථකව ගෙන ගිය වල්පැළ නෙලීමේ ව්‍යාපාරය දේශපාලන ඉරිසියාකාරකම් හා නිලධාරිවාදය නිසා අඩපණ කර තිබුණේය. අපේ උප සභාපතිවරයකු ලෙස – ඒ නිසාත්, එතුමාගේ අවධානය සර්වෝදයට වැඩියෙන් යොමු විය.

දිනක් අප දෙදෙනා රීගල් සිනමාහලේ චිත්‍රපටියක් නරඹා 'ෆවුන්ටන් කැෆේ' ආපන ශාලාවට පැමිණි විට, අහම්බෙන්ම බෝගල මිනිරන් පතල අයිති මෙරිල් ඒ. ප්‍රනාන්දු මහතා මා කරන සේවයට ප්‍රශංසා කරමින් කතා කළේය. එවිට උපාලි සේනානායක මහතා කීවේ

"ආරිට ප්‍රශංසාවලින් වැඩක් නෑ. ඕනෑ කරන්නේ උදව්වක්."

"ඉතිං ඉල්ලන්ට එපායැ? මොකක් ද මගෙන් ඕනෑ උදව්ව?" මෙරිල් ප්‍රකාශ කළේය.

"දැන් අපේ මරදානේ නිවස–අපේ කාර්යාල කටයුතුවලට ඉඩ මදියි. මට ඉඩ ඇති තැනක් කොළඹින් සොයා දෙන්න" යයි මම පැවැසුවෙමි.

එතුමා ටිකක් කල්පනා කළේය. කොළඹ නගරය තුළ නම් තැනක් දීමට නොහැකි බවත්, එහෙත් මොරටුවේ ද සොයිසා පාරේ ඔවුන්ගේ පාරම්පරික නිවස වූ 'මෙත්මැදුර' දැන් හිස්ව තිබෙන බවත්, කැමැති නම් -- එය මට පරිත්‍යාග කිරීමට කැමති බවත් එතුමා කීවේය.

ඡායාරූප: 338
උපාලි සේනානායක මහතා

පසුදින උදෑසන පැමිණි මා සමඟ මොරටුවට ගිය එතුමා එවකට මුරකරුවෙක් පමණක් යොදා තිබූ අක්කර එකහමාරක භූමිය සහ මෙත්මැදුර නිවාසය මට පෙන්වීය. ඒ ස්ථානයේ අපේ මූලස්ථානය සහ පුහුණු මධ්‍යස්ථානය පැවැත්වීමට හැකි බව මා පැවැසූ විට, වහාම මුරකරු කැඳවූ මෙරිල් ඒ. ප්‍රනාන්දු මහතා, මගේ අතට යතුරු ටික බාර දී මෙසේ පැවැසීය:



"සර්වෝදය ව්‍යාපාරය පවතින තුරු – මේ 'මෙත් මැදුර' නිවාසය ඔබේයි. මගේ මුතුන්මිත්තන් අවුරුදු 150 කට පමණ උඩදී මෙම නිවාසය 'මෙත් මැදුර' යැයි නම් කරන්නට ඇත්තේ මෛත්‍රිය මුල් වූ ජාතික ව්‍යාපාරයකට කවදා නමුත් මෙම නිවස මූලස්ථානය වන බව ඔවුන්ට පෙනෙන්නට ඇති නිසා" යැයි එතුමා කොක් හඬලා සිනාසෙමින් පැවැසීය.

මේ පරිත්‍යාගයෙන් පුදුම වූ උපාලි සේනානායක මහතා සහ මම, නිශ්ශබ්දව උනු'න් දෙස බලා සිටියෙමු. තව දුරටත් කතා කළ එතුමා, "මේ පිළිබඳව කිසිම ප්‍රසිද්ධියක් දෙන්නට එපා. මෙය නිශ්ශබ්ද දානයක්! ගුප්ත දානයක්!!" යැයි පැවැසීය.

සර්වෝදයට මෙත් මැදුර ලැබීම නිසා පුදුම විදියේ සේවයක් රට පුරා කිරීමට මඟ පෑදුණේය. දහස් ගණන් තරුණ–තරුණියෝ මේ ස්ථානයේ පුහුණු වී, රට පුරාම සර්වෝදය දිස්ත්‍රික්ක මධ්‍යස්ථාන සහ ප්‍රාදේශීය මධ්‍යස්ථාන හාරසීයකට අධිකව පිහිටුවා, ගම් දස දහසකට අධික තැන්වල සේවයට පිළිපන්හ. 'මෙත් මැදුර' නාමය රට පුරා

පමණක් නොව, ලොව පුරා ද පැතිරුණේය. නෙදර්ලන්තයෙන් පැමිණි ස්වේච්ඡා සේවක පිරිසක්, නෙදර්ලන්තයේ ඇමර්ස්ෆුට් නගරයේ ද, මෙත් මැදුරක් පිහිටුවා ප්‍රජා සේවා සේවා ආරම්භ කළහ.

ඡායාරූපː 339
උපාලි සේනානායක මහතා හා කරුණානන්ද මහතා මහාචාර්ය මලලසේකර මහතා සමග

අවුරුදු විසිපහක් ගත විය. ඒ කාලය තුළ එතුමා පැමිණ – අපගේ සේවාවන් දැක, වරින් වර විශාල සතුටක් භුක්ති වින්දේය. හදිසියේම දිනක් මා කැඳවූ එතුමා, තම දියණිය වූ නෙලුම් සිරිවර්ධන මැතිනිය අතින් මෙත් මැදුර සර්වෝදයට පරිත්‍යාග කිරීමේ තෑගි ඔප්පුව මා අත තැබුවේය. අද සර්වෝදයේ යම් දියුණුවක් ලබා තිබේ නම්, එම ගෞරවය වැඩියෙන්ම හිමි විය යුත්තේ, පරිත්‍යාගශීලී – ඉතා සිහින් හඬින් කතා කළ, එහෙත් නිතරම සතුටින් සිටි – මෙරිල් ඒ. ප්‍රනාන්දු මහතාටය.



ඡායාරූපː 340
මෙරිල් ප්‍රනාන්දු මහතා, දුව නෙලුම්, මුණුපුරා දිමිත්‍රි සහ අප දෙදෙනා

ඡායාරූපː 341
පිලික්ස් ඩයස්
බණ්ඩාරනායක
මැතිතුමා
මෙත් මැදුරේ
පවුල් හමුව
අමතයි

ඡායාරූපː 342
මෙත් මැදුරේ
මගේ කාර්යාලය

ඡායාරූපː 343
මෙත් මැදුරේ
කුඹුරේ පැළ
සිටුවීම

බෝගල් පතලේ හිමිකරු වශයෙන් ඔහු ඉතා ආඪ්‍යව සිටි අවස්ථාවලත්, එතරම් සරු බවක් නොමැති වූ අවස්ථාවලත්, එකම විදියේ උපේක්ෂාවෙන් හා සතුටින් එතුමා කාලය ගත කළ හැටි මට මතකය.

වරක් සිවි දරු උපතක් පිළිබඳව ආරංචි වී, එතුමා–එම පවුල සොයාගෙන කලුතරට ගියේය. අවශ්‍ය සියල්ලම සපයා ආපසු එන්නට සැරසෙන විට, ඒ දුප්පත් පවුලේ පියා – තමා කවුදැයි – එතුමාගෙන් විමසීය. හඬ නගා සිනාසුනු එතුමා කීවේ එය වැදගත් නොවන බවයි. සැබෑ පරිත්‍යාගශීලිත්වය නම්, ආත්ම දෘෂ්ටිය වැඩි කරන්නක් නොව– අඩු කළ යුතු මගක් බවයි එතුමා විශ්වාස කළේ.

ව්‍යාපාරික ජීවිතයෙන් විශ්‍රාම ගෙන, අවුරුදු කිහිපයක් එතුමා තම දියණිය නෙලුම් සහ මුනුබුරු දිමිත්‍රි සමඟ ගත කළේය. දිවා ආහාරයෙන් පසු කතා කරමින් – සිනාසෙමින් ඔවුන් සමඟ ගත කළ මෙම පරිත්‍යාගශීලී උතුම් පුද්ගලයා, හදිසියේම හෘදයාබාධයකින් නොසිතූ අවස්ථාවක මිය ගියේය. සර්වෝදය ඉතිහාසයේ නො මැකෙන නමක් තැබූ එතුමා, සදහටම අපේ මතකයේ ජීවත් වේ. එතුමා පරලෝ සැපත්වූයේ එක්දහස් නවසිය හැටඅටේ – මැයි මස දහතුන් වැනිදාය. එතුමාට නිවන් සුව ලැබේවා.

ඡායාරූපඃ 344
ඇලෙක්ස් තෙන්නකෝන් මහතා පෙරපාසල් ගුරුවරියන්ට සෞඛ්‍ය පාඩමක් කියා දෙයි.

ඡායාරූප: 345
මෙත් මැදුරේ
පළමු සිහිති හමුව
(පෙර පාසල)

මා නාලන්දා විදුහලේ සේවය කළ නිසාත්, දරුවන් පාසල් ගියේ අගනුවර නිසාත්, එකවරටම ප්‍රධාන කාර්යාලය මොරටුවට ගෙන ඒමට අපහසු විය. ඒනිසා මගේ නංගි පද්මා හා ඇයගේ සැමියා වූ බුද්ධදාස නවරත්න මහතාට ටික කලක් ද, විමල් විජේසූරිය මහතාගේ පවුලට ටික කලක් ද මෙත්මැදුර බලා ගැනීමට බාර දුනිමි.

ගරා වැටී තිබුණු අවුරුදු එකසිය හැත්තෑ පහක් පමණ පැරණි විශාල නිවාසය, සම්පූර්ණයෙන්ම කැලෑ රොදක් වී තිබුණු අක්කර එකහමාරට වඩා වූ ගෙවත්ත, ශ්‍රමදාන කඳවුරු පවත්වමින් – ටිකෙන් ටික ජීවත්වීමට සුදුසු තත්ත්වයකට පත් කළෙමු. එම්.ඩී. අබේනායක, බී.ඒ. සුමනදාස, බී.ඒ. ගුණදාස, වින්සන්ට් සිරිසේන, සාලිය සමරවික්‍රම, උක්කුබණ්ඩා ආදී වූ තරුණ තරුණියන් ක්‍රම ක්‍රමයෙන් මෙහි පදිංචි කොට, නීතා හා දරුවන් සමඟ මම ද මෙහි පදිංචි වීමු.

මා සිහින දකිමින් සිටි සාමූහික ජීවිතය ගොඩනැංවීම මෙත් මැදුරෙන් ආරම්භ විය. මෙතැන පුහුණුව, ආභාෂය ලැබ ලංකාව පුරාත් – ලොව පුරාත් විසිර ගිය පිරිස දහස් ගණනකි.



ඡායාරූප: 346
ප්‍රජා නායකත්ව පුහුණුව
ලබන තරුණියෝ

85

'ඔබේ වහලෙන් වතුර කාන්දුවීම නවත්වන්න'

මේ වනවිට මෙත් මැදුර ඕනෑම අමුත්තෙකුට ප්‍රිය එළවන තැනකි. දිවා රාත්‍රි ඕනෑම අවස්ථාවක තරුණ තරුණියන් පනහකට අධික සංඛ්‍යාවක් මෙහි විවිධ සේවාවන්වල යෙදී සිටි අතර, තවත් පනහක් පමණ දිවා කාලයේ පැවැත්වෙන පාඨමාලාවලට සහභාගි වෙති.

උදේ පහේ සිට රාත්‍රී දහය දක්වා ඔවුහු සාමූහික පවුලකට අයිති සියලු කටයුතුවල යෙදෙති. මේ දෛනික වැඩසටහනට භාවනාව, කසල ශෝධනය, ශ්‍රමදානය, කෘෂිකර්මය, කුඩා කර්මාන්ත, ප්‍රජා නායකත්ව පුහුණු පාඨමාලා වෘත්තීය පුහුණු පාඨමාලා, සංගීතය, ගායනා හා වෙනත් සංස්කෘතික අංශ, ක්‍රීඩා, පූර්ව පාඨශාලා අධ්‍යාපනය ආදී සියලු අංගෝපාංග අයිති විය.

ආහාර නිෂ්පාදනයෙහි මෙන් ම ආහාර පිසීම, බෙදීම, පිඟන් සේදීම ආදී සියලුම කටයුතුවල සියල්ලෝ යෙදෙති. එක්දහස් නවසිය හැත්තෑඑකේ කැරැල්ලේ දී සර්වෝදය තරුණ තරුණියන් කිසිවෙක් සිර භාරයට නොගත් නිසා, තරුණ සංවර්ධනයට මෙත් මැදුරේ සිදුවන සේවය මේ ගැන දත් හැමෝම අගය කළහ.

දවසක් උදේ මා කාර්යාලයයේ වැඩ කරන අතර, රියැදුරෙක් එළවාගෙන ආ මෝටර් රියක් – අපේ පෝටිකෝවේ නවතන හැටිත්, රැලි වැටුණු හිසකෙස් දෙපැත්තට බෙදා – පීරා, සුදු කලිසමක් හා කමිසයක් හැඳ ගත්, රන්වන් පැහැයෙන් යුත් සිරුරකින් හෙබි මැදි වියේ මහතකු එයින් බසින හැටිත් මම දුටුවෙමි. එදා වැසි දිනයකි. කාර්යාලයෙන් පිට වූ මම, ඔහු ඉදිරියට ගොස් ආයුබෝවන් කියා පිළිගතිමි.

"ඔබ ආරියරත්න මහතා දැ"යි ඔහු ඉංගිරිසියෙන් විමසීය.

"ඔව්" යැයි මම පිළිතුරු දුනිමි.

"මම තිස්ස" යැයි පැවැසූ ඔහු සර්වෝදය ගැන කියවා – අසා තිබෙන බවත්, මේ මූලස්ථානය බැලීමට ආ බවත් කීවේය.

පැය එකහමාරක කාලය තුළ දී මෙත් මැදුරේ හැම අංශයකටම එතුමා රැගෙන ගොස් පෙන්වා, අප කරන කටයුතු තේරුම් කර දුනිමි. මේ අතර මෙත් මැදුරේ නොයෙක් තැන්වල බිත්තිවල එල්ලා තිබූ සර්වෝදය දර්ශනය, වැඩ සටහන් ආදිය ගැන විස්තර කළ මම, ගම්වල කෙරෙන වැඩ පිළිබඳ ද තේරුම් කළෙමි.

ගොඩනැගිල්ලේ තත්වය ගැන තේරුම් කළ මම, අපට වහල ප්‍රතිසංස්කරණය කර ගැනීමට මුදල් නැති නිසා, මේ තත්වයේ තිබෙන බව ද තේරුම් කළෙමි. පුහුණු වන ළමයින්ගේ නිෂ්පාදන නිසා, බතික් විකුණා ගැනීමට අමාරු බව කීවෙමි. එහි තිබෙන සියලුම බතික්වල වටිනාකම කීය දැයි එතුමා ඇසූ විට, මා සාලිය දෙස බැලීමි. රුපියල් දහදාහක පමණ බතික් එහි තිබෙන බව ඔහු ප්‍රකාශ කළේය. වහලෙන් වතුර ගේ ඇතුළට වැටීම ගැන ද සමාව ඉල්ලුවෙමි.

අපේ සමරු පොතේ සටහනක් ලියා මේ අමුත්තා අපට ආයුබෝවන් කියා ගියේය.

පැය බාගයකින් පමණ ඒ රථයම නැවත පැමිණියේය. එහි සිටියේ රියැදුරා පමණකි. ඔහු 'මහත්මයා' දුන්නේ යැයි කියූ ලියුමක් මා අතට දුන්නේය. එහි කෙටි ලියමනක් හා චැක්පත් දෙකක් තිබුණේය. එහි ලියා තිබූ පණිවුඩය මෙසේය:

"මට ඔබ ළඟ තිබෙන සියලුම බතික් නිෂ්පාදන එවන්න. එහි වටිනාකම වූ රු. 10,000/– ක චැක්පත එවා ඇත.

"තවත් රු.10,000/– ක චැක්පතක් ඇත. ඒ (See that your roof doesn't leak.) ඔබේ වහලෙන් වතුර ගේ ඇතුළට වැටීම නතර කිරීම සඳහාය."

ඇන්ග්ලො ඒෂියන් සමාගමේ නිර්මාතෘ–සභාපති තිස්ස විජයවර්ධන මහතා සර්වෝදයට එක් වූයේ මේ අන්දමිනි.

ඡායාරූප: 347
"Small is Beautiful"
කතුවර ආචාර්ය ඊ. එෆ්. ෂූමාකර්
මෙත් මැදුර නැරඹීම

මෙත් මැදුරට පැමිණි විශේෂ අමුත්තෝ

ඡායාරූපඃ 348
ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක
මහතා ආචාර්ය හැවන්පොල
රත්නසාර හිමි සමග
මෙත් මැදුරේ දී



ඡායාරූපඃ 349
නොවිබ් මහලේකම් ආචාර්ය ජෙෆ් තියුනිස්, පාර්ලිමේන්තු මන්ත්‍රී විමලසිරි ද මෙල්, පාර්ලිමේන්තු මන්ත්‍රී බර්නාඩ් සොයිසා යන මහත්වරු මෙත් මැදුරේ දී

මෙත් මැදුරට පැමිණි විශේෂ අමුත්තෝ



ඡායාරූපː 350
පූජ්‍ය පණ්ඩිත නැදලගමුවේ ජිනානන්ද හිමි; අග්‍රාණ්ඩුකාර විලියම් ගොපල්ලව මැතිතුමා සමග මෙත් මැදුරේ දී

ඡායාරූපː 351
නිම්නා, ලොකු අක්කා සහ අම්මා

ඡායාරූපː 352
නොවිබ් මහලේකම් ජේරාඩ් වැන් ෆ්ලයිමන් මහතා සහ මැතිනිය සමග මෙත් මැදුරේදී

මෙත් මැදුරට පැමිණි විශේෂ අමුත්තෝ

ඡායාරූප: 353
ආනන්ද මෛත්‍රීය මහ
නාහිමි මෙත් මැදුරේදී

ඡායාරූප: 354
බිෂොප් ලක්ෂ්මන් වික්‍රමසිංහ
සමග



ඡායාරූප: 355
වින්යා ආග්‍රාණ්ඩුකාර
විලියම් ගොපල්ලව
මැතිතුමාට සර්වෝදය
කොඩියක් විකුණයි.
උප සභාපතිනි සීතා.
රාජසූරිය මැතිනිය හා
මා ද එහි සිටී

ඡායාරූප: 356
තිස්ස විජයවර්ධන මහතා

එක්දහස් නවසිය අසූතුනේ දී ජාතිභේද කෝලාහලයෙන් පසු දම්සක් පවුල් හමු ශාලාවේ ව්‍යාපාරිකයන් රැසක් කැඳවා සාකච්ඡා රැස්වීමක් කැඳවීමි. එයට මූලික වී ක්‍රියා කළේ තිස්සය. පසුව බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවැති ජාතික සමගි සම්මේලනය සංවිධානය කිරීමට ද, කතරගම සිට නාගදීපයට යැමට යොදා ගත් සාම සක්මනට ද එතුමා සහාය දුන්නේය. මට නිදා ගැනීමට, ලිවීමට, වෙනත් ශාරීරික අවශ්‍යතා සඳහා සියලු පහසුකම්වලින් යුතු විශාල වාහනයක් මේ සඳහා සකස් කර දුන්නේ තිස්ස විජයවර්ධන මැතිතුමාය.

ඔහු අවසන් කාලයේ ටිකක් අසනීපයෙන් සිටි මුත්, රට ගැන හිතා – රැකියා සැපයීම ආදිය සඳහා නව ක්‍රම සෙවීම අතපසු කළේ නැත. ඇවිදීමට අමාරු වුණත් හොඳ හැටි ඇස් නො පෙනුණත්, හිටි හැටියේ මා බැලීමට එතුමා පැමිණියේය. මම ද ඉඳහිට ගොස් දුක සැප සොයා බැලුවෙමි. අවුරුදු අසූවකට කිට්ටු කාලයක් ආයු වළඳා එතුමා එක්දහස් නවසිය අනූඅටේ දී පරලෝ සැපත් වන විට මම සියරට නො සිටියෙමි.

අපේ ඉංජිනේරු අංශයේ එල්ලා තිබෙන ලොකු පුවරුවක මෙසේ ලියා ඇත.

'වැඩට බට ශ්‍රී ලංකාව' "Sri Lanka at Work"

මේ වචන දකින හැම විටම මට මතක් වන්නේ, මෙසේ ලියා එල්ලා තබන ලෙස මගෙන් ඉල්ලූ තිස්ස විජයවර්ධන ශූරීන්ය.

86

මගේ පියාගේ අභාවය

එක්දහස් නවසිය හැත්තෑවේ අප්‍රේල් නවවැනිදා මා සිටියේ මාගම තෙලුල්ල ගමේ, සර්වෝදය සහ ලෝක තරුණ සමුලුව සංවිධානය කළ ජාත්‍යන්තර ශ්‍රමදාන කඳවුරේය.

ඡායාරූපඃ 357 – මගේ පියා අවුරුදු 89 දී

හදිසියේම තාත්තා අසනීප බව කියා උණවටුනෙන් විදුලි පුවතක් ලැබුණේය. එවේලේම කඳවුරේ වගකීම් සෙසු අයට පවරා, රාත්‍රියේ මිට්සුබිසි ජීප් රථය මමම වේගයෙන් එළවාගෙන පැය දෙකකින් පමණ උණවටුනට ආවෙමි.

තාත්තා ලිස්සා වැටුණු බවත්, තුනටියේ ඇටයක් පුපුරා ඇති බවත්, සිංහල බේත් කළ බවත් දැනගන්නට ලැබුණේය. පසුදා උදෙන්ම ගාලු ගොස්, ඇඩ්මන් අයියා සමග ගාල්ලේ මහ රෝහලේ ප්‍රධාන වෛද්‍යවරයා හමුව, වෛද්‍ය ඩී. ඇන්. පෙරේරාත් සමග තාත්තා පෙන්වීමට ගෙන ආවෙමු. එම වෛද්‍යවරයාගේ නම මට මතක නැත. ඔහු ඉංගිරිසියෙන් මා හා කථා කළේය.

තාත්තා රෝහලට ගෙන යාමට අවශ්‍ය නැති බවත්, තාත්තාට වද නොදී, ඔහුගේ අවසාන දින කීපය ගෙදරදීම ගත කිරීමට ඉඩ දිය යුතු බවත්, අවශ්‍ය හැම ප්‍රතිකාරයක්ම ගෙදර දී කිරීමට පහසුකම් සලසන බවත් ඔහු මට කීවේය. වෛද්‍යවරයාගේ අදහස අනුව, දැන් අනූ වියේ සිටි මගේ පියා තව ජීවත් වන්නේ වැඩි ම වශයෙන් දින තුනකි. තාත්තාට ඉංගිරිසි තේරෙන බව වෛද්‍යවරයා නොදත්තේය.

තාත්තා කතා කළේ ය. 'මහත්මයා මගේ පුතා වගේ උගත්. දක්ෂ තරුණ වෛද්‍යවරයෙක්. එහෙත් මා ඔය කියන දිනේට මැරෙන්නේ නෑ. මා මැරෙන්නේ අප්‍රේල් 29 දා පස්වරු දෙකට.'

වෛද්‍යවරයා පුදුමයෙන් අප දෙස බැලුවේය. නැවතත් තාත්තා ළඟට ගිය ඔහු මෙසේ ඇසුවේය:

"ඇයි තාත්තාට 29 දා ම මැරෙන්න උවමනාව?"

"මහත්මයා" මම බොහෝම පින් කළ කෙනෙක්. ඊටත් වඩා දහස් ගණනකගෙ බඩගිනි නිවන ලෝකෙටම සේවය කරන බෝධි සත්ව පුතෙක් මම හදල තියෙනවා. ඒ නිසා මා මැරෙන්න බය නැහැ. දුක් විඳිනවට වැඩිය හොඳයි මැරෙන එක. මට මැරෙන්න ඕනෑ හොඳ දවසක. අපේ රටේ නැවත බුද්ධ ශාසනය සහ සිංහල ජාතිය බැබල වූ හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක හාමුදුරුවෝ, අනගාරික ධර්මපාල තුමා සහ මගේ ගුරුවරයා වූ අහංගම ශ්‍රී සුමනජෝති නායක හාමුදුරුවෝ අපවත් වුනේ අප්‍රේල් 29 වැනිදා දිනයක. මටත් මැරෙන්න ඕනෑ එදාටමයි.

දොස්තර මහතුන් දෙපළම කිසිවක් කීවේ නැත.

තවදුරටත් ප්‍රශ්න කළේ නැත.

"හෘදය වස්තුව සහ පෙණහලු ඉතා ශක්තිවන්තයි."

"ඒ වගේමයි සිතත්" මම කීවෙමි.

එදා සිට අපේ ගෙදර සාත්තු නිවාසයක් මෙන් විය. ඇඩ්මන් අයියා සාත්තු සේවකයා හැටියටත්, පුහුණුව ලත් හෙදියන් ද සහිතව අපි තාත්තා බලා ගතිමු.

එංගලන්තයේ සිටින මල්ලීට – වීර ජිනදාසට – තාත්තාට හුහක් අන්තිම බවත් – එන්ට කරදර විය යුතු නැති බවත්, දන්වා විදුලි පුවතක් යැවීමි. පත්මා හා අමරා නංගිලාට ද තාත්තා බැලීමට පැමිණෙන ලෙසත්, 28,29,30 දිනයන් විශේෂයෙන් මහ ගෙදර සිටීමට නිදහස් ව තබා ගන්නා ලෙසත් දැන්වීමි. ලොකු අක්කා හා බේබි අක්කා – ලලනා – දිවා රෑ තාත්තා ළඟ සිටින නිසා, මම ආපසු තෙලුල්ලට ගොස්, කඳවුර නිමවා ජාත්‍යන්තර නියෝජිතයින් සමග අනුරාධපුරයට ද ගියෙමි.

අනුරාධපුර නගරයට රාත්‍රී දහය පමණ වනවිට මම ළඟා වුණෙමි අනුරාධපුර විශේෂ කොමසාරිස් ඩඩ්ලි දිසානායක මහතා මගින් මා ලද විශේෂ පණිවිඩය වූයේ පෙරළා වහාම ගෙදර පැමිණිය යුතු බවයි. එවේලේම මම ආපසු පිටත් වීමි. පත්මා හා අමරා ද නීතා හා දරුවන් ද සමග රාත්‍රී තුනට පමණ කොළඹින් පිටත් වීමු. බෙන්තොට දී හදිසි අනතුරකින් ද යන්තම් බේරී, තාත්තාගේ ඇඳ ළඟට නැවතත් ළඟා වීමි. දිනය අප්‍රේල් 27 දායි. 29 දා තාත්තා අවසන් හුස්ම හෙළන බවට මට නම් සැකයක් තිබුණේ නැත. ලොකු හාමුදුරුවන්ට සහ ඇඩ්මන් අයියාට ද එසේමය. ඒ අතර බන්දුසේනත් සමග අවසන් කටයුතු සඳහා සියලුම දේවල් ක්‍රමයෙන් සපයා ගතිමි.

දිගටම උදේ සවස පන්සලේ හාමුදුරුවරු පැමිණ පිරිත් සජ්ඣායනා කළහ. නෑදෑ හිතවතුන් පැමිණ තාත්තා හා කථා බස් කර ගියහ. අමාරුවෙන් වුවත්, පරණ කථාන්තර කීමට තාත්තා මැලි වූයේ නැත. පැය දෙක තුනකට වරක් අමරා ගැන ගැන පමණක් දුක් වූයේය.

"මට දුක උඹට තාම දරුවෙක් නැති එක තමයි. මම උඹේ පුතා වෙලා ලබන ජාතියේ උපදින්නම්කො. උඹ බය නැතිව හිටපන්." යනුවෙන් තාත්තා හින්නි දූ අමරාව සැනසුවේය.

විසි අට වැනිදා සවස් වන විට තාත්තාට කතා කිරීමට නොහැකි විය. ශබ්දය පිටවුයේ නැත. ඒ අවස්ථාවේ සිටම, කිසිවකුටත් ඇඩීමට තහනම් නීති පැන වූ මා, සති පට්ඨාන සූත්‍රය ඇතුලු පිරිත් පොත් කියවීමටත්, ධම්මපදයේ ගාථා කියවීමටත්, තාත්තා ආශා කළ 'ජින පඤ්ජරය' කියවීමටත් සැලැස්වූයෙමි. මුලු රාත්‍රියේම අපි ඇහැර ගෙන සිටියෙමු.

1970 අප්‍රේල් 29ට එළි විය. නොවැළැක්විය හැකි දේ වන බව අපි කවුරුත් දැන සිටියෙමු. තාත්තා වරින් වර ඇස් හැර බැලීමත්, යමක් කියන්නටත් තැත් කිරීමත්–ඉඳහිට අත් පා සෙළවීමත් හැර–වෙන

කිසිවක් කීමට හෝ කිරීමට හෝ තරම් ශක්තිමත් තත්වයක සිටියේ නැත.

දවල් එක පමණ වන විට අවසාන මොහොත ළං විය. තාත්තාගේ ප්‍රාණප්‍රිය මිත්‍ර අහංගම වනරතන ලොකු හාමුදුරුවෝ ද, පන්සලේ පඩි පෙළ මුදුනේ බිම ඇණ ගසාගෙන, එක් අතක් කම්මුලට තබාගෙන සිටිනු මම දුටුවෙමි. තාත්තාගේ අත අල්වාගෙන, වරින් වර පපුවට ද අත තබාගෙන සිටි මගේ අණ පරිදි, කිසිවෙක් ශබ්ද නගා ඇඬුවේ නැත. තාත්තා අවසාන හුස්ම හෙළන තුරු ධම්මපදයෙන් ගාථා කියවීමටත්, මා සංඥාවක් දුන් පසු – ඕනෑ තරම් අඬන ලෙසත්, නංගිලාට – අක්කලාට හා නැන්දලාට මා කියා තිබුණි. අපේ විශ්වාසයේ හැටියට මිය යන තැනැත්තාගේ අවසාන සිතුවිලි, ඊළඟ භවයේ හොඳ නොහොඳ උත්පත්තිය සඳහා බලපායි. තාත්තා වේගයෙන් හුස්ම ගත්තේය. ගමේ වහරින් "සුවාසේ" ඇද්දේය. දැන් අවසන් මොහොත ළඟයි. තාත්තා ඇස් ලොකුවට විවෘත කර අප සැම දෙනා දෙසම බැලුවේය. දත් නැති මුවෙන් සිනා රැල්ලක් මතුවිණි. තාත්තා ඇස් පියා ගත්තේය. මට සංඥාවක් දෙන්ට වේලා නොතිබිණි. තාත්තාගේ මුව සිප ගත් මගේ බාල නංගී අමරා, තාත්තාගේ කනට ඇගේ මුව තබා "තාත්තා, මගේ බුදු තාත්තේ මගේ පුතා වී උපදින්න" යයි කීහිප වරක්ම කෑ ගැසුවාය. මා අමරා බලෙන් අල්ලා ඉවතට ගන්නට තැත් කළෙමි. එවිට මගේ තාත්තා නැවතත් ඇස් ඇර, නැවතත් පෙර මෙන් සිනා සී මෙවර අවසන් වරට හුස්ම හෙලුවේය.

සොයුරු – සොයුරියන් – දරු – මුණුබුරන් අම්මා ආදී සැමටම ඕනෑ තරම් විලාප ගසා අඬන්නට ඉඩ හැර, මගේ බලවත් සංවේගය සිතේ බලයෙන් මැඩ පවත්වාගෙන, ඉස්තෝප්පුවේ මිදුලට බැස්ස මම පන්සල දෙසට හැරුණෙමි.

අවුරුදු නවයකට පසු ඈත ඉන්දුනීසියාවේ අගනුවර වන ජකර්තා නගරයේ සිට මෙසේ මම මගේ ආදරණීය පියාගේ අවසාන මොහොත ගැන ලීවෙමි. එතෙකින් නොනැවතී බෝරෝ බුදූර් ඇතුලු බෞද්ධ සිද්ධස්ථාන වැඳ පුදා, මා කළ පුණ්‍ය සම්භාරයත්, ජීවිතයේ මෙතෙක් කර තිබෙන පුණ්‍ය සම්භාරයත්, මගේ ආදරණීය පියාට අනුමෝදන් කරමි. සතර බැම් කඩා නිවන් සුවය ලබාදීමට ද කවදා හෝ පිහිට වෙමි.

"පියෙහි විප්පයොගො දුක්ඛො"

1971 ත[illegible]ැරැල්ල

එක්දහස් නවසිය හැටඅට, හැටනවය කාලවලදී ද විශේෂයෙන් එක්දහස් නවසිය හැත්තෑවේ දී ද අප පැවැත් වූ කඳවුරුවල දී මම විශේෂ සිදුවීමක් දුටුවෙමි. එනම් කඳවුරුවල අප 'පවුල් හමු' පවත්වන අවස්ථාවල දී කඳවුරේ වැඩට සහභාගි නොවුණු, එහෙත් පවුල් හමුවලට පමණක් පැමිණි දහයක පමණ තරුණ කණ්ඩායමක්, අනිත් අයගෙන් වෙනස්ව හැසිරෙන ආකාරයක් මගේ අවධානයට වැටුණේය. මේ ස්වභාවය හම්බන්තොට, මොණරාගල, කෑගල්ල, අනුරාධපුරය ආදී හැම තැනකම එකම විදියට සිදුවන හැටි දකින විට, මට කුතුහලයක් ඇති විය.

ගරු ඩඩ්ලි සේනානායක අගමැතිතුමා ප්‍රධාන රජයේ නායකයින්ටත්, විරුද්ධ පක්ෂයේ නායිකාවටත්, වෙනත් මා දැන හැඳින සිටි දේශපාලන නායකයින් මෙන්ම – පොලිස්පතිතුමා ප්‍රධාන – ආරක්ෂක නිලධාරීන්ටත් මම මේ කාරණය පැවැසීමි. රටේ යම්කිසි පෙර නොවූ විරූ තත්වයක්, ගැමි සමාජයේ තරුණයින් අතර ඇති වෙමින් පවතින බවට, ඒ හැම දෙනාටම අනතුරු ඇඟවීමක් කෙළෙමි. 'ඩේලි නිව්ස්' පත්‍රයේ කර්තෘ ඇතුලු පුවත්පත් කතුවරුන් රැසක් ද හමුවී මේ ගැන කීවෙමි. හිංසක ප්‍රචණ්ඩ මානසිකයක් ගොඩනැඟෙන බව දන්වා ලිපි කීපයක් ද ලංකාදීප පත්‍රයේ පළ කළෙමි.

මේ අතර නාලන්දාවේ කාර්යාල සහායක ඩේවිඩ් මහතා විදුහල්පතිවරයකු මා හමුවීමට පැමිණ සිටින බව, මගේ පන්තියට පැමිණ දැනුම් දුන්නේය. පාඩම අවසන් කොට පැමිණෙන තෙක් එතුමාට වාඩිවීමට සලසා, තේ කෝප්පයක් ගෙන දෙන ලෙස පැවැසීමි.

බත්තරමුල්ලේ මධ්‍ය විද්‍යාලයයාධිපති හල්පේ මහතා පෞද්ගලික යමක් කීමට තිබෙන බව පැවැසීය. මම එතුමා අපේ ආපනශාලාවට කැඳවාගෙන ගියෙමි. දැසේ කඳුලු පිරී එතුමා ප්‍රකාශ කළේ, ළඟක සිට පාසල කිසිසේත් පාලනය කළ නො හැකි තත්වයට පත්ව ඇති බවත්,

රසායනාගාර, ගුරු නිවාස, පන්ති කාමර ආදී සියල්ලම සුළු ශිෂ්‍ය පිරිසකගේ වැරදි නායකත්වය ඔස්සේ, අන් සිසුන් ද සම්බන්ධ කරගෙන පාසලේ මහා විනාශයක් සිදු කරන බවත්ය. තමන් දන්නා සියලු උපක්‍රම යෙදුවත්, කිසිසේත් තමන්ට හෝ ගුරුවරුන්ට හෝ විනය පාලනය කර ගත නොහැකි තත්වයක් උද්ගත වූ නිසා සර්වෝදයේ සහයෝගය පැතීමට ආ බවත් එතුමා ප්‍රකාශ කළේය.

පාසලේ ගුරුවරුන්ට හා ශිෂ්‍යයන්ට කතා කිරීමට අවස්ථාවක් සලසන ලෙස මා කළ ඉල්ලීමට එතුමා එකඟ විය. නියම කර ගත් දිනයෙහි නාලන්දාවේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් කීප දෙනෙකු ද සමඟ මම එම විදුහලට ගියෙමි. විදුහලට ඇතුලුවන විට ඇති වූයේ කම්පාවක් මෙන්ම, අපේ අධ්‍යාපනයට යන කල ගැන වේදනාවකි. ශිෂ්‍යයෝ ප්‍රධාන ශාලාවට රැස්ව සිටියහ. විදුහල්පතිතුමා සමඟ ශාලාවට මා ඇතුලු වන විට පටන් ගත් හූ හඬ හා ගාලගෝට්ටිය මිනිත්තු 30 කට ත් අධික කාලයක් පැවැතිණි. විදුහල්පතිතුමාගේ හඬ ඇසීමට ළමයින් ඉඩ නුදුන් නිසා, අවසන ඔහු මගේ දෙස බැලීය. මොහොතක නිශ්ශබ්දතාව යෙන් ප්‍රයෝජන ගෙන මම කතා කිරීමට පටන් ගතිමි:

"මෙතෙක් ඔබ කතා කළා. දැන් මටත් කතා කරන්න ඉඩ දෙන්නකෝ" කියමින් මම කතාව ඇරැඹීමි. මිනිත්තු කිහිපයකින් ශාලාව නිහඬ වී සියල්ලෝ සවන් දුන්හ. එවිට ශිෂ්‍යයෝ හත් අට දෙනෙක් පමණක් ශාලාවෙන් පිටතට ගියහ. දිගටම පැයක් පමණ කතා කොට, එන සති අන්තයේ කඳවුරක් පවත්වා පාසල සම්පූර්ණයෙන් ම ප්‍රතිසංස්කරණය කිරීමට ශිෂ්‍යයෝ එකඟ කර ගතිමි.

නාලන්දාවේ ශිෂ්‍යයන් පණහක් පමණ ද සහභාගි කරගෙන එම පාසලේ ශිෂ්‍යයන් සිය ගණනකගේ ද සහභාගිත්වයෙන් දින දෙකක දී පාසලට නව මුහුණුවරක් දීමට අපි සමත් වීමු. මීට වඩා වැදගත් වූයේ ශිෂ්‍යයන්ගේ සිත් හැදීමයි.

කඳවුර නිමවා ඊළඟ සතියේ මහත්මා ගාන්ධි චරිතය ගැන සමුලුවක් ද, ප්‍රදර්ශනයක් ද සංවිධානය කළෙමු. කඳවුරේ ප්‍රතිඵලවලින් උද්දාම වූ විදුහල්පතිතුමා, අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාට මෙය විවෘත කිරීමට ඇරැයුම් කළේය. එතුමා පැමිණීමට පෙර, රාජකීය විදුහල්පති බෝගොඩ ප්‍රේමරත්න මැතිතුමා, ආනන්ද විදුහල්පති එම්. ඩබ්. කරුණානන්ද මැතිතුමා, කුමාර විදුහල්පති ධර්මසේන අරම්පත්ත මැතිතුමා, වෙස්ලි විදුහල්පති ෂෙල්ටන් වීරසිංහ මැතිතුමා ආදී වූ

සම්භාවනීය පිරිසක් වේදිකාවේ එළා තිබුණු පැදුරු මත පනවා තිබුණු කොට්ට උඩ වාඩි වී සිටියහ.

ස්ථිර ලේකම්තුමා පැමිණියේය. විදුහල් පතිතුමා විසින් මා හඳුන්වා දෙන විට "හා ශ්‍රමදානකාරයා" යැයි කියූ එතුමා වට පිට බලා අකැමැත්තෙන් මෙන් වේදිකාවේ බිම පනවා තිබුණු අසුනේ වාඩි විය. ඉතා වැදගත් දේශනවලින් පසු එතුමා දුන් දේශනයේ හරය මෙසේය.

"ළමයිනේ අර ඈත පේන උළුගෙවල්වල ඉන්න ළමයි රාජකීය, ආනන්ද, නාලන්දා වැනි පාසල්වලට යනවා ඇති. අර පේන පොල් අතු හා පොඩි ගෙවල්වල ළමයි මේ පාසලට එනු ඇති. ඕක තමයි අප රටේ තිබෙන ප්‍රශ්නය. ඇතිවුන් හා නැතිවුන් අතර තිබෙන පරතරය. පන්ති භේදය. පන්ති අරගලයකින් මෙය නැති කරන තුරු මොන ශ්‍රමදාන කරලා වත් වැඩක් නැහැ."

වැඩිහිටි අප පමණක් නොව, ශිෂ්‍යයෝ ද – මේ කතාව ගැන පුදුම වූහ. කලකිරුණහ. ස්තුති කථාව කිරීමට නැඟී සිටි මම, මේ ස්ථිර ලේකම්වරයා කෙලින්ම සමච්චලයට භාජන නොකර, ඇති–නැති පරතරය නැති කිරීමට අහිංසාවාදීව අප ගෙන යන නිර්මාණාත්මක අරගලය, පැහැදිලිව තේරුම් කොට, ළමයින් නැවත හිංසා මගකට යොමුවීම වැළැක්වීමි.

මේ සිද්ධිය වූයේ එක්දහස් නවසිය හැත්තෑවේ අග භාගයේදීය. විශාල ලේ හැලීමක්, තරුණ ඝාතනයක් සිදු වන බවට මට නම් සැකයක් තිබුණේ නැත. ඈත නොසිතන–ආත්මවාදීව ඒ මොහොතේ මහජන සම්පත්වලින් සැප විඳින දේශපාලන නායකයින්ට හෝ නිලධාරීන්ට අවබෝධයක් ඇති කරන්නට යෑම නිශ්ඵල ක්‍රියාවක් බව මම අවබෝධ කර ගතිමි. දැන් මට උවමනා කළේ අපේ තරුණ තරුණියන් හා තුන්සියකට අධික වූ සර්වෝදය ගම්මාන මෙයින් බේරා ගැනීමටය.

අපේ පූර්ණ කාලීන සේවකයන් දැනුවත් කර, ඔවුන් මාර්ගයෙන් ලංකාවේ ස්ථාන අනූවක දී – මේ ගම් තුන්සියයක පමණ නායකයින් කැඳවා ඔවුන් දැනුවත් කිරීමි. අවසාන රැස්වීම වවුනියාවේ දී පැවැත්විණ. ඒ එක්දහස් නවසිය හැත්තඑකේ මාර්තු තිස්වැනිදාය.

මා ඔවුන්ට දුන් පණිවිඩය කෙටියෙන් මෙසේය:

"අප රටේ විශාල හිංසාවාදී කැරැල්ලකට උවමනා කරන සම්පූර්ණ පසුබිම අපේ ඊනියා දේශපාලන නායකයින් ද, කිසිදු ජාතික හැඟීමක්

නැති නිලධාරී පැලැන්තියක් විසින් ද අද සකස් කර ඉවරයි. දැන් තිබෙන්නේ කොයි මොහොතේ හෝ මේ ඉන්ධන ගොඩට ගිනිකූරක් දැල්වීම පමණයි. සර්වෝදය ආරම්භ කළ දවසේ සිටම, අද දක්වා-අප මහන්සි ගත්තේ, සාධාරණ සමාජයක් - අහිංසාවාදී මාර්ග තුළින් ගොඩ නැංවීමේ මාර්ගය ක්‍රියාවෙන්ම පෙන්වා දීමටයි. අධ්‍යාපනය, සංවර්ධනය සහ සාමය සඳහා අප දියත් කළ ක්‍රියා මාර්ගය වරප්‍රසාද ලත් ඇත්තන්ගේ අන්ධ භාවය නිසා ඔවුහු හරි හැටි නොදුටුවහ. ඔවුන්ගේ බිහිරි බව නිසා කන්වලට නොවැටුණේ ය. අප සේවය කරන ගම්වල සාමය ආරක්ෂා කර ගැනීමත්, අපේ තරුණ ජීවිත රැක ගැනීමත් - සර්වෝදය පූර්ණ කාලීනව වැඩ කරන තරුණ-තරුණියන්ගේ ජීවිත ආරක්ෂා කර ගැනීමත් පමණයි, දැන් අපට කළ හැකි එකම දෙය. මේ වගකීම ඔබ බාර ගත යුතුයි."

වවුනියාවේ පැවැත් වූ අවසාන රැස්වීමේ දී මූලාසනය ගෙන ක්‍රියා කළේ මහ දිසාපති නෙවිල් ජයවීර මහතායි. දෙමළට පරිවර්තනය කළේ කච්චේරියේ වැඩ කළ කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයෙකි. එදා සිට මාසයක් යනතුරු කිසි ම ගමකට නොයන බවත්, මූලස්ථානයේ රැඳී සිටින බවත් පවසා, එදා රාත්‍රිය නෙවිල් ජයවීර මහතා සමඟ මැදියම් රැය පසුවන තුරු මේ ප්‍රශ්නය ගැන සාකච්ඡා කොට පසුදා ගෙදර ආවෙමි.

ඊට දෙදිනකට පසු ලෝක ආහාර සංවිධානයේ නියෝජිතයා විසින් පැවැත් වූ ප්‍රිය සම්භාෂණයක දී මා මිත්‍ර සුසිල් සිරිවර්ධන මහතා සමඟ ද මේ ප්‍රශ්නය ගැන සාකච්ඡා කෙළෙමි. එතුමා එවකට රජයේ තරුණ ගොවිපලවල් බාරව සිටියේය. මගේ බිය බෙදා ගත් එතුමා පැවසුවේ, දැන් වත් මේ ගැන යමක් කළ නොහැකි ද යනුයි. එයට මා පිළිතුරු දුන්නේ පළමුවෙනි වෙඩිල්ල පත්තු වී රජයට ඇහැරුණ පසු ඔවුන් විසින් යමක් කරනු ඇත කියායි.

මීට දින කිහිපයකට පසු සුසිල් සිරිවර්ධන මහතා ද සැක පිට අත්අඩංගුවට ගත් බව ආරංචි විය. ගරු ලක්ෂ්මන් වික්‍රමසිංහ පියතුමා අත ඔහු මට බන්ධනාගාරයේ සිට කෙටි ලිපියක් ද එවා තිබුණු බව මට මතකයි.

මේ කැරැල්ල ඇතිවීමට පෙර මාස කිහිපයක් ම රෝහණ විජේවීර මහතා හමුවීමට මම හැම ප්‍රයත්නයක්ම දැරිමි. මට උවමනා වූයේ හිංසාව අතහැර, අහිංසාවාදී ව මේ සටන දියත් කරන්නේ නම්, දස දහස්

ගණනකගේ ජීවිත ආරක්ෂා කර ගත හැකි බව තේරුම් කර දීමටයි. එහෙත් ඔහු මුණ ගැසීමට මට හැකි වූයේ ඔහු සිර බාරයට පත් වූ පසුවයි.

ඡායාරූප: 358
රෝහණ විජේවීර මහතා

සිරගෙයි සිට කෙසේ නමුත්, මට ලැබෙන සේ ඔහු ලිපියක් එවා තිබුණේය. එයින් විවිධ ආධාර උපකාර ඉල්ලා එවා තිබුණි. ඔහු එවූ ක්‍රමයට ම එම ලිපිය ආපසු යවා බන්ධනාගාර කොමසාරිස් තුමා මාර්ගයෙන් එම ලිපිය නැවත එවන ලෙස ඉල්ලා සිටියෙමි. මේ අවස්ථාව ප්‍රයෝජනයට ගෙන මම ද, සිරභාරයට ගැනීමට යම් නිලධාරියෙක් ආරක්ෂක කමිටුවේ දී යෝජනා කර තිබුණු බව මේ වනවිට මම දැන සිටියෙමි. ස්ටැන්ලි සේනානායක පොලිස්පතිතුමාත් හමුදාපතිතුමාත්, තදින් ම එයට විරුද්ධ වූ නිසා, ගරු අගමැතිනි බණ්ඩාරනායක මැතිනිය විසින් පෞද්ගලික එදිරිවාදිකම් පිරිමසා ගැනීමට ජාතික අර්බුදයක් තිබෙන මෙවැනි අවස්ථාවක මෙවැනි කතා නො කළ යුතු බවට ඔහුට අවවාද කර තිබේ. මේ නිසා රෝහණ විජේවීර මහතාට සහ ඔහුගේ සගයන්ට සිර ගෙය ඇතුළත දී උදව්වීම නීතියට එකඟව කිරීමට මම පරිස්සම් වූයෙමි.

මගේ පුස්තකාලයේ තිබූ වටිනා පොත් 80 කට අධික සංඛ්‍යාවකුත්, හිර ගත වී සිටි තරුණ තරුණියන්ට අවශ්‍ය ඇඳුම් - පැළඳුම්, පොත-පත, සබන්-තුවා ආදී දේවලුත් මගේ දියණිය චාරිකා සහ තවත් තරුණ පෙළක් මාර්ගයෙන් ඔවුනට මම සැපයුවෙමි.

රෝහණගේ බලවත් ඉල්ලීම මත ඔහු බැලීමට මම ගියෙමි. එවකට බන්ධනාගාරයේ අධිපතිව සිටි දෙල්ගොඩ මහතා මා ගැන හොඳින් දැන සිටි කෙනෙක් නිසා, ඕනෑම වේලාවක සිර මැදිරිය තුළ රෝහණ සමඟ තනියෙන් මට කතා කිරීමට අවස්ථාව දී තිබුණි. පැයක් පමණ අපි සාකච්ඡා කළෙමු. අහිංසා මාර්ගයට ඔහු ගැනීමට මගේ ශක්ති ප්‍රමාණයේ හැටියට කරුණු කීවෙමි.

එක්දහස් නවසිය හැත්තෑඑකේ - සිර බාරයට ගත් එකම සර්වෝදය තරුණයෙක් හෝ තරුණියක් නොවීය. ඔවුන්ගේ ජීවිත ආරක්ෂා කර ගැනීම පිළිබඳව මම බෙහෙවින්ම සතුටු වූයෙමි. එවකට

371 ක් පමණ අපේ සර්වෝදය ගම්මාන ද මේ හිංසක තත්ත්වයෙන් බේරුණේය.

ඡායාරූප: 359
ටී. බී. වේරපිටිය මහතා

එක්දහස් නවසිය හැත්තෑඑකේ කැරැල්ලට සම්බන්ධ මගේ පෞද්ගලික අත්දැකීම් රැසක් ම තිබේ. එහෙත් මේ පිළිබඳව විශාල වශයෙන් විවිධ පොත් පත් පළ වී ඇති නිසා, ඒවා විස්තර කිරීමට යාමෙන් වැළකෙමි. සඳහන් කළ යුතු එකම දෙය ප්‍රචණ්ඩත්වය ප්‍රචණ්ඩත්වයෙන්ම තාවකාලිකව මැඩ පැවැත් වීමෙන් ප්‍රශ්නයට හේතු වූ සාධක ඉවත් නොවන බව අපේ නායකයින් තේරුම් නොගැනීමයි.

අප්‍රේල් මුල් සති දෙක මා සිටියේ මරදානේ දෙල්ගහයට ගෙදරය. හිටි හැටියේ සුපුරුදු පරිදි, පොලිස්පති ස්ටැන්ලි සේනානායක මහතාත්, නියෝජ්‍ය පොලිස්පති, කලින් මහින්ද විද්‍යාලයේ මගේ ආචාර්යවරයෙකු වූ, ටී. බී. වේරපිටිය මහතාත් අප නිවසට ඇතුල් වූහ. සුපුරුදු සිනහව පාමින් ස්ටැන්ලි සේනානායක මහතා 'ඔබ හොඳින් සිටිනවාදැයි බලන්නට අපි ආවා'යැයි කියමින් දොරින් ඇතුල් වූහ. ඔවුන් වාඩි කර වූ මම බිත්තියට හේත්තු කර තිබූ චේ ගුවේරාගේ විශාල පින්තූරයක් පෙන්වීමි.

දෙදෙනා ම තිගැස්සී මා දෙස බැලූහ. 'කලබලවෙන්න එපා'යැයි පවසා, මා 'මේ පින්තූරය එළියට ගත්තේ මේ රටේ අද සිදුවන මේ කැරැල්ල චේ ගුවේරා ව්‍යාපාරයකැයි කීම සාවද්‍ය බව පෙන්වා දීමටයි. ඒ චේ ගුවේරාට නිග්‍රහයක්.' ඒ අය තවත් පුදුම වූහ.

බෙල්ජියමේ 'ලීජ්' විශ්ව විද්‍යාලයේ දී දෙවසරකට පමණ පෙර මා චේ ගුවේරා මුණ ගැසුණු බව කියා, ඔහු හා මා අතර ඇති වූ සංවාදයක් පිළිබඳව ඔවුන්ට තේරුම් කර දුන්නෙමි. ඒ කතාන්තරය මෙසේ ය:

එක්දහස් නවසිය හැට ගණන්වල අග භාගයේ දී, නෙදර්ලන්තයේ හා බෙල්ජියමේ විශ්ව විද්‍යාල, පාසල්, ප්‍රජා ශාලා ආදී ස්ථාන රැසකම සර්වෝදය පිළිබඳ මම දේශන පැවැත්වූයෙමි. 'ලීජ්' විශ්ව විද්‍යාලයට දේශනය සඳහා එය සංවිධානය කර තිබුණු පියතුමා සමඟ යද්දී, එතුමා මට පැවසුවේ 'චේ ගුවේරා සහෝදරයා හිංසාවාදී විප්ලවය ගැන කථා කරන බවත්, මා අහිංසාවාදී විප්ලවය ගැන කථා කළ යුතු

බවත්'ය. මෙය විහිලුවකට ගණන් ගත් මා, එය විහිලුවක් නොවන බව තේරුම් ගත්තේ ශාලාව ඉදිරිපිටට එන විටයි. එහි අප දෙදෙනාගේම පින්තූර සහ අප දෙදෙනා කථා කරන මාතෘකා ද සඳහන් කර තිබුණේ ය.

ශාලාවට ඇතුලුවීමට පෙර එහි වම්පස තිබුණු කාමරයකට මා කැඳවා ගෙන ගියේය. එහි වාඩි වී සිටි දිග රැවුලක් සහ දිගට වැඩුණු හිස කෙස් කලාපයක් තිබුණු හැඩි දැඩි පුරුෂයෙක් එකවරම දෑත් දෙපසට ඔසවා ගෙන මා ඉදිරියට පැමිණ, මාව ආදරයෙන් බදා ගත්තේය. "කම්රඩ් ආරී, මා ඔබ එනතුරු නොඉවසිල්ලෙන් බලා ගෙන සිටියේ, ඔබ හමුවන්නට ආශාවෙන්."

"කම්රඩ් චේ, ඔබ හමුවීම මගේ ජීවිතයේ වටිනාම අවස්ථාවක්. එහෙත් ... අප දෙදෙනා කරන කටයුතුවල අරමුණ සමාන බවක් තිබෙන බව ඇත්ත ... එහෙත් ඔබ ලෝකයේ සිටින දරුණුම හිංසාවාදී ග්වරිල්ලා නායකයා, මා මදුරුවෙක්වත් තලන්නේ නැති අහිංසාවාදී පුද්ගලයෙක්, ඉතින් අප දෙදෙනා සමාන වන්නේ කොහොමද?"

"කවුද කීවේ මා හිංසකයෙක් කියා? ඒ අධිරාජ්‍යවාදීන්ගේ ප්‍රචාර."

"මම වෛද්‍යවරයෙක්, මම ආශා කළේ ලාදුරු රෝගීන්ට ප්‍රතිකාර කරන්නට. නමුත් ලාදුරු රෝගයේ රෝග නිධානය අතලොස්සක් ධනේශ්වරයන් විසින්, කෝටි සංඛ්‍යාත ලතින් ඇමෙරිකානු ජනතාව එදා වේල කන්න නැති, බොන්න වතුර බිඳක් නැති, විලි වසා ගන්න රෙදි කෑල්ලක් නැති, හිසට සෙවණක් නැති තත්වයට පත් කර තිබෙනවා. එම හේතුව අවබෝධ කර ගත් මම, කැස්ත්‍රෝ සමඟ එකතුවෙලා බැටිස්ටාගේ හමුදාව විනාශ කළා. එම සටනේ දී ඔහුගේ කිසිම සොල්දාදුවෙකුට වෛරයකින් මම ක්‍රියා කළේ නැහැ. මා ඇතුලු අපේ පැත්තේ හටයින්ගෙන් බැටිස්ටාගේ සෙබලුන් තුවාල වුනාම, ඔවුන් නිරායුධ කොට – අවශ්‍ය ප්‍රථමාධාර හෝ ශෛලකර්ම කර, ඊළඟටයි මා තව ඉදිරියට ගොස් සටන් කළේ. ඒ නිසා මා දරුණු මිනීමරුවෙක් යයි කියන ප්‍රචාර විශ්වාස කරන්නට එපා. මා විනාශ කරන්නට හැදුවේ "වරද" මිස "වරද කරන්නන් නොවේ."

මේ අන්දමින් කථා කර ගෙන යන විට මට අවබෝධ වූයේ හොඳ පරමාර්ථයක් ඉටු කර ගැනීමට හිංසාවාදී මගක යන කෙනෙකුට වුවත්, ඒ කාර්යය මානවවාදීව – මනුෂ්‍යත්වයෙන් ඉටු කළ හැකි බවයි. වරදට විරුද්ධව නිශ්ශබ්දව සිටීමේ බියගුලු බවට වඩා, හිංසාවාදීව හෝ එම

තත්වය වෙනස් කිරීමට මහත්මා ගාන්ධි තුමා විරුද්ධ නොවූයේ මේ නිසා වන්නට ඇත.

අහිංසක මිනිසුන් මරා දමමින්, සමාජය පෙළන්නවුන්ට එසේම ඉන්නට සලසා කරන්නට හදන හිංසක විප්ලව, සැබෑ විප්ලව නොවන බව මේ දෙපළට මම තේරුම් කර දුන්නෙමි. දාර්ශනිකවත් තාක්ෂණිකවත් – ව්‍යුහාත්මකවත් පවතින තත්වය – සියයට සියයක්ම අහිංසාවාදී මාර්ගවලින් වෙනස් කළ හැකි බව, අපේ තරුණ–තරුණියන්ට අවබෝධ වූ දාට – සැබෑ ප්‍රජාතන්ත්‍රවාදයත් –සැබෑ සමානත්වයත් – නියම සාමයත් ඇති වන බව එතුමන්ලාට විග්‍රහ කළෙමි.

නීතා ගෙනා තේ පැන් සංග්‍රහය මේ තිදෙනාම භුක්ති විඳින අතර, මම වේගුවේරාගේ පින්තූරය ඇතුලු කාමරයේ තිබුණු ස්ථානයටම ගොස් තැන්පත් කර තැබුවෙමි.

මෙහිදී සිදු වූ හාස්‍ය ජනක සිද්ධියක් ද සඳහන් කළ යුතුය. පොලිස්පතිතුමාත්, නියෝජ්‍ය පොලිස්පති වේරපිටිය මහතාත්, සිටියේ නිල ඇඳුම් ඇඳ ගෙනය. වේරපිටිය මහතාගේ පටියේ දකුණු කෙළවරින් පිස්තෝලය රඳවා ගත් හම් ආවරණ කොපුව එල්ලෙනු මම දුටුවෙමි. මහින්ද විද්‍යාලයයේ 10 වැනි ශ්‍රේණියේ දී, එතුමා අපට ෂේක්ස්පියර්ගේ හැම්ලට්, මැක්බත් ආදී නාට්‍ය ඉගැන්වූ සැටිත්, පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පුහුණුවන පොලිස් නිලධාරින් වරකට සියක් පමණ ගෙනවුත් එතුමා ද කොට කලිසමක් ඇඳගෙන කනාන–මාලඹේ තික්ගහ – ගවරගිරිය ආදී ගම්වල ශ්‍රමදානයෙන් පාරවල් කැපූ සැටිත් මට සිහි විය. විහිලුවක් කිරීමට සිතා මම මෙසේ පැවැසීමි.

"සර්, ලැජ්ජා නැද්ද මේ විදියට පිස්තෝලයක් අරගෙන යන්න?"

වේරපිටිය මැතිතුමා කොක් හඬලා සිනා සී වට පිට බැලුවේය. හෙමිහිට ආවරණය ඇර පිස්තෝලය එළියට ගත්තේය. එය කරකවා එහි එකම වෙඩි උණ්ඩයක් ද නැති බව පෙන්වීය.

"මේක මේ ඇඳගෙන යන්නෙ යුනිෆෝම් එකේ කොටසක් හැටියටත්, බොරු බයක් පෙන්වන්නත්, මම කොහොම ද ආරි, මට වෙඩි තිබ්බත් මම වෙන කාටවත් වෙඩි තියන්නේ?" අපි සියල්ලෝම සිනාසුණෙමු.

පුටුවෙන් නැගිටින ගමන් සාක්කුවට තට්ටු කොට, සිනාසී–ස්ටැන්ලි සේනානායක මැතිතුමා කීවේ "මගේ ආයුදේ නම් හොඳට උණ්ඩ තිබෙනවා" යනුවෙනි. පොලිසියේ හා හමුදාවේ එවකට සිටි

උගත්, නිහතමානී, කරුණාවන්ත නිලධාරීන් නිසා එම ආයතන බැබලුණේය.

අප්‍රේල් පළමුවන සතියේම බෙල්ජියමේ සර්වෝදය සමිතියේ නියෝජිත පිරිසක් මෙත් මැදුරට පැමිණියෝය. ඔවුන්ට සම්බන්ධ වූ කුඹුක්ගොල්ලෑව ගම බැලීමට යෑමට මොවුහු උනන්දු වූහ. මේ අවස්ථාවේදී කිසිසේත් එයට ඉඩ දිය නොහැකි බව මා ප්‍රකාශ කළත්, ඔවුන් එයට එකඟ වූයේ නැත. මේ නිසා යම් කරදරයක් සිදු වුවහොත්, තමාගේ දිවි ගියත් – මේ අය රැක ගත යුතු බව පවසා, සරත් විජේසිංහ ඇතුළු තරුණයින් කිහිප දෙනෙකු සමඟ ඔවුන් කුඹුක්ගොල්ලෑව ගමට පිටත් කර හැරියෙමි. අප්‍රේල් කැරැල්ල ආරම්භ වූයේ මේ අවස්ථාවේදීය. ඔවුන්ට කුමක් වූයේ දැයි සොයා ගැනීමට කිසි ම ක්‍රමයක් නොතිබුණේ, අප්‍රේල් 5 දා සිට මුළු රට ම කැළඹී තිබූ නිසාය. ඔවුන් ආපසු පණ බේරා ගෙන පැමිණියේ සති දෙකකට පමණ පසුවය.

ඔවුන් කුඹුක්ගොල්ලෑවට ගිය හැටියේම, ඔවුන් කැටුව ගිය ළමයින් දෙපළත්, ගමේ මිනිසුන් විසින් කොයි මොහොතේ හෝ කැරළිකාර තරුණ පිරිස් ගමට පැමිණෙන බැවින්, කැලෑ මැදින් වැටුණු අඩි පාර ඔස්සේ අනුරාධපුර – පුත්තලම පාරට ඔවුන් කැඳවාගෙන ගොස් තිබේ. ඔවුන් පිට වී පැයක් යන්නටත් පෙර, බයිසිකල් දෙකකින් ගල්කටස් තුවක්කු ද රැගෙන පැමිණි තරුණයින් පිරිසක් මුලින්ම ශාලාව ඉදිරියේ තිබූ බුදු පිළිමයට බැණ වදිමින්, වෙඩි පහරක් තබා තිබේ. 'ගමට ආපු ඇමරිකන්කාරයෝ කොහිදැ'යි මේ මෝඩ පිරිස ඔවුන්ගෙන් අසා තිබේ. ඔවුන් පෙර දිනම ආපසු ගිය බව ගම්මුන් කී විට, මේ අය ආපසු ගොස් තිබේ. අතරමඟ දී ඔවුන්ට මුණ ගැසී තිබෙන්නේ ජීප් රියකින් එන පොලිස් භට පිරිසකි. මොවුන්ගේ ගල්කටස් ඉස්සීමට පෙර පොලීසිය විසින් ඔවුන්ට වෙඩි තබා මරා දමන ලදී.

හමුදාව සහ පොලිසියේ ආරක්ෂාව සහිතව මිනිසුන් ගෙන යන වාහන මොවුන්ට හමුව තිබේ. ඔවුන්ට කාරණය තේරුම් කර දී, අපේ විදේශ පිරිස පුත්තලමට පැමිණ දවස් ගණනක් කුසගින්නේ සිට – බොහෝ දුක් විඳ, මොරටුව මෙත් මැදුරට ළඟා වූහ. මේ කණ්ඩායමේ සිටියේ බෙල්ජියමේ සර්වෝදය නායක රෙනී ෆියට්ස් මහතා සහ රෙදි කර්මාන්ත ශාලා හිමි වොන් ෆයන් බෘක් මැතිනිය ප්‍රධාන පිරිසකි. ඔවුන්ට යම්කිසි කරදරයක් වූයේ නම් එය මුළු රටටම කැළලක් වීමට

ඉඩ තිබුණි. ඒ නිසා මොවුන් ආරක්ෂා කරගෙන ආ මල්ලීට විශේෂ පවුල් හමුවක් පවත්වා මම ප්‍රශංසා කළෙමි.



ඡායාරූප: 360
එච්. සෝමරත්න මහතා

අපේ මුල්ම පූර්ණකාලීන සේවකයකු වූ, දැනට සර්වෝදය සීඩ්ස් ආයතනයේ වැඩ කරන එච්. සෝමරත්න මල්ලී ද එවකට වැඩ කළේ හල්මිල්ලෑව ගම බාරවය. මගේ හිතේ තිබුණු ලොකුම වේදනාව සෝමරත්න මල්ලී ගැන කිසිම ආරංචියක් නො ලැබීමය. කැරැල්ලේ උච්චතම අවස්ථාව පසුවන තුරු ඔහු හල්මිල්ලෑවේ මධ්‍යස්ථානයෙන් පිට නොවී, එම භූමියේ වගා කිරීමේ කටයුතුවල යෙදී තිබේ. අවසානයේදී සියල්ල සන්සුන් වූ පසු, ඔහු මෙත් මැදුරට පැමිණියේය. ඔහු මෙත් මැදුරට ඇතුළු වන විටයි, මගේ හිතේ තිබූ වේදනාව සම්පූර්ණයෙන් ඉවත් වූයේ.

"සෝමරත්න මල්ලී, ඔබ පිළිබඳ අපි හරිම වේදනාවෙන් - ගින්දරෙන් හිටියේ. ඇයි පණිවුඩයක් නො එව්වේ?" ඔහු මෙසේ පිළිතුරු දුන්නේය. "සර්, මෙවැනි අවස්ථාවක කළ යුත්තේ කලබල වී එහෙ මෙහෙ දුවන එක නොවේ. පුලුවන් තරම් නිශ්ශබ්දව ඉන්නා තැනම ඉඳගෙන ප්‍රයෝජනවත් වැඩක් කරන එකයි." යනුවෙන් ඔහු පිළිතුරු දුනි. අපේ සෑම පූර්ණ කාලිකයකුගේම ජීවිත බේරා ගැනීමට සමත් වූයේ යැයි එදා මම සැනසුණෙමි.

88

නාලන්දාවට ආයුබෝවන් කීම

ගුරුවරයකු වශයෙන් සේවය කිරීම මම ඉතා ප්‍රිය කළෙමි. මගේ උපරිම මහන්සිය යොදවා ළමයිනට ඉගැන්වීමට මම මහන්සි ගතිමි. එහෙත් ගුරුවරයාගේ පළමු යුතුකම තමන්ට බාර විෂයය ඉගැන්වීම නොවේ. තමා උගන්වන විෂයය තුළින් ශිෂ්‍යයාගේ පෞරුෂය උදා කරවීමය.

පූර්ණ පෞරුෂෝදයකට ශිෂ්‍යයින් යොමු කිරීම පත–පොතින්, පන්ති කාමරයෙන්, විභාග සමත් කරවීමෙන් පමණක්, සිදු කළ නොහැකි බව, එක්දහස් නවසිය පනස් ගණන් වනවිට මම හොඳින් තේරුම් ගෙන සිටියෙමි. පවතින අධ්‍යාපන ක්‍රමය තුළින්ම, මේ කාර්යය සඳහා ද ඉඩක් ලබා ගැනීමට මම කල්පනා කළෙමි. මගේ සහෝදර ගුරුවරුන්ගේත්, ශිෂ්‍යයින්ගේත්, වෙසෙසින් එවකට නාලන්දා විදුහල්පතිව සිටි එම්. ඩබ්ලිව්. කරුණානන්ද මහතා සහ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය කළ ආරියනන්ද අබේසේකර මහතාගේත් උදව්වෙන්, රටපුරා ක්‍රියාත්මක කෙරුණු අධ්‍යයන සහ ප්‍රජා සේවා ශ්‍රමදාන කඳවුරු මේ අදහස ක්‍රියාත්මක කරන ලද ප්‍රතිඵලයයි.

එක්දහස් නවසිය හැත්තෑඑක වනවිට, විශාල ලේ ගැලීමක් රටේ සිදුවන බවත්, දහස් ගණන් තරුණ – තරුණියන් මේ නිසා ජීවිතක්ෂයට පත්වන බවත් මම දැන සිටියෙමි. මෙය වැළැක්වීමට තිබෙන එකම මඟ අහිංසාවාදී සර්වෝදය විප්ලවීය මඟ බවට මගේ සැකයක් තිබුණේ නැත. දශක තුනක පමණ පන්ති සටන මුල් වූ – හිංසක විප්ලවීය දැනුවත් කිරීමක් මේ වන විට ශ්‍රී ලාංකික සමාජයට– වාමාංශික ව්‍යාපාරය තුළින් ලැබී තිබුණේය. මේ නිසා අහිංසාවාදී සර්වෝදය විප්ලවයක් ගැන ජනතාව දැනුවත් කිරීමට, අප වයසින් හෝ අත්දැකීම්වලින් හෝ මෝරා තිබුණේ නැත.

මේ නිසා එක් අතකින් අප වැඩ කළ ගම්වල ජනතාවගේ සහ අපගේ සේවක සේවිකාවන්ගේ ජීවිත බේරා ගැනීම මගේ සීමිත

අරමුණ විය. නැගීගෙන ආ කැරැල්ලේ නායක රෝහණ විජේවීරයන් මුණගැසීමට මා දැරූ හැම ප්‍රයත්නයක්ම අසාර්ථක විය. කෙසේ හෝ විප්ලවය සිදු විය; අසාර්ථක විය. තරුණ ජීවිත රැසක් – එක්දහස් නවසිය හැත්තෑඑකේ දී විනාශ විය. අවුරුදු ගණනාවක්ම ගුරු වෘත්තියේ සිට, දෙවසරක් පමණ පඩි රහිත නිවාඩු ගෙන, සම්පූර්ණ කාලය සර්වෝදය වෙනුවෙන් කැප කිරීමට මා ගත් හැම ප්‍රයත්නයක්ම ව්‍යර්ථ විය. අධ්‍යාපන ඇමතිතුමාටත්, අගමැතිනියටත් අපේ විධායක සභාවෙන් පවා ලියූ අභියාචනාවලින් ප්‍රයෝජනයක් නොවීය. රටේ සිටි විවිධ ප්‍රභූන් ද, රජයට මේ ඉල්ලීම ඉදිරිපත් කළ මුත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීවාදය මෙයට ඉඩ නුදුන්හ. අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවය කරන ගමන්ම, සර්වෝදය ව්‍යාපාරය ද අධ්‍යාපනයේම කොටසක් වශයෙන් ගොඩනැංවීමට ප්‍රයත්න දැරීම, මගේ අභිලාෂය විය. එහෙත් එයට ද ඉඩ නොලැබුණේ ය. මේ නිසා එක්දහස් නවසිය හැත්තෑදෙකේ දී නාලන්දාවට 'ආයුබෝවන්' කීමට මම තීරණය කළෙමි.

එක්දහස් නවසිය හැටඑකේ දී, කරුණානන්ද මහතා – ආනන්ද විදුහල්පති හැටියට මාරු වී ගිය පසු, විදුහල්පති පදවියට පත් කේ. එම්. ඩබ්ලිව්. කුරුප්පු මහතා අධ්‍යාපන අමාත්‍යාංශයේ බලපෑම නිසා අපට එරෙහි වූ බව මම දැන සිටියෙමි. ඒ නිසා එතුමා කෙරෙහි කිසිම අමනාපයක් මා තුළ නොවීය. එතුමාට පාසල හොඳින් පාලනය කිරීමට මම පාසලට නැවත ආපසු සියලු සහයෝගය දුනිමි. පසු කලෙක එතුමාට අපේ පාතකඩ සර්වෝදය ප්‍රජා නායකත්ව භික්ෂු පුහුණු ආයතනයේ පරිපාලන ලේකම් වශයෙන් රැකියාවක් ද දුනිමි.

ඊළඟට පත් ව ආ ඩී. ජේ. එදිරිසිංහ මහතා, ගුණපාල වික්‍රමරත්න මහතා හා සුගුණදාස අතුකෝරාළ යන විදුහල්පතිවරුන් මගේ සුහදශීලී මිතුරෝ වූහ. නාලන්දාව සැබැවින් ම පුනරුත්ථාපන කළේ වික්‍රමරත්න මහතාගේ ඍජු දැඩි පාලනය විසිනි. සුගුණදාස අතුකෝරාළ මහතා නිවුණු නිහතමානී පාලකයෙක් විය. අධ්‍යාපන ඇමතිවරුන්ගේ සුහදත්වය දිනාගෙන, එතුමා විශ්ම කර්මයෙක් මෙන් පාසලේ ගොඩනැගිලි ආදී වූ, අවශ්‍යතා ඉක්මණින් සම්පූර්ණ කළේ ය. මේ දෙපළම මට සියලුම ධෛර්යය සර්වෝදය කටයුතු සඳහා දුන් අතර, දැන් අපේ සංගමය දෙල්ගහයට ගෙදර මධ්‍යගත වී ශක්තිමත් තත්වයක පැවැතියේය.

මේ කාලය වන විට අපේ වැඩ තහනම් කළ, අපේ පන්තිවලට පැන චණ්ඩිකම් පෙන්වූ, ලොග් පොතේ ලියා, ඊනියා කුලහීන ගම්වලට

ශිෂ්‍යයන් ගෙන යෑම තහනම් කළ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලොක්කෝ වෙනත් තැන්වලට මාරු වී සිටියහ. ඉතිරි වූ අය අපේ සේවය අගය කොට, අපට උදව් දුන් හ. සටනක් නැති තැන ඉදීම මට එපා විය. විශේෂයෙන් එක්දහස් නවසිය හැත්තෑඑකේ දී ඇති වූ තරුණ විනාශය, මට ඉවසා ගත නො හැකි සමාජ ඛේදවාචකයක් විය. මගේ පාසලේ ගුරු රස්සාව කැප කොට 'ප්‍රජා ගුරුවරයෙක්' වශයෙන් මහජනයා අතරට මා යා යුතුය.

එදා අවසාන වේතනය ගෙන, පාසලේ මට උදව්-පදව් කළ සුළු සේවකයිනට එයින් භාගයක් පමණ බෙදා දී, මම ගෙදර ආවෙමි. මෙත්මැදුරේ මගේ බිරිඳ සහ දරුවනට අමතරව විස්සක් පමණ ජීවත් වූයේ මා ලත් සුළු වේතනයෙනි. එදා මා අත තිබුනේ රුපියල් හය සියයයි. අවුරුදු දාහතක් ගුරු වෘත්තියේ සිට ඉන් ඉවත් වූ පසු, මා අත ඉතිරි වූ එකම මුදලයි. ඉදිරියට ජීවත් වන්නේ කෙසේ දැයි සිතමින් මම හාන්සි වුනෙමි. මට විශ්‍රාම වැටුපක් ද හිමිවන්නේ නැත.

මා මුණගැසීමට මිත්‍රයෙක් පැමිණ සිටින බව සැල වූයෙන්, මම සාලයට ගියෙමි. ඔහු පැමිණ ඇත්තේ හදිසි උවමනාවක් සඳහා බව මට පැවැසුවේය. ඔහුගේ මාසික වේතනය ලැබෙන්නට තව දින දෙකක් පමණ තිබෙන බවත්, ඔහුගේ නිමවෙමින් පවතින ගෙයට අවශ්‍ය උලුකැට කිහිපය ගැනීමට රුපියල් 500/- ක් අවශ්‍ය බවත් ඔහු කියා සිටියේ ය. මගේ අමාරුව ඔහුට තේරුම් කර දුනිමි. මා අත තිබෙන එකම මුදල දින දෙකකින් ආපසු දෙන පොරොන්දුව පිට ඔහු ඉල්ලුයේ, කිසිම ලැජ්ජාවකින් තොරවයි. එය ඔහු අත තබා නැවත කාමරයට ගොස් මම නිදා ගතිමි. මේ මුදල අද වනතුරු ඔහු මට ආපසු දී නැත. මට ඇහැරෙන විට කලුවර වැටී තිබිණි.

එදා රාත්‍රී අපේ පොදු මුළුතැන්ගෙයි තිබුණේ පානුත්-පොල් සම්බෝලයකුත් පමණකි. එය භුක්ති විඳ, මම රාත්‍රී එකොළහට පමණ වනතුරු මොකක් දෝ ලීවෙමි.

මෙත් මැදුර ගේට්ටුව ඉදිරිපිට වාහනයක් නවත්වා නලාව ශබ්ද කරනු මට ඇසිණි. මමම යතුර ගෙන ගොස් ගේට්ටුව ඇරීමි. කුලී රථයකින් පැමිණි සුදු කාන්තාවක් සමාව අයදිමින්, කුලී රථයෙන් බැස්සාය. ඇය කෙලින්ම කටුනායක ගුවන් තොටුපළේ සිට එන බවත්, එළිවෙන්නට පෙර වෙනත් යානයකින් ජිනීවාවලට යන බවත්, පැවැසුවාය. ටෙලිෆෝන් නොම්මරය නොදත් බැවින් කතා කිරීමට නොහැකි වූ බව පැවැසූ ඇය නැවතත් සමාව අයැදීය.

මැදියම් රයේ ඔබ වැනි ලස්සන තරුණ කාන්තාවක් පැමිණීම ප්‍රතික්ෂේප කරන්නේ කවුදැයි කියා විහිලු කළ මා, ඇය ගෙදරට කැඳවාගෙන ගොස් නීතාට හඳුන්වා දුනිමි. ඉතිරි වූ පාන් පෙත්ත කෙසෙල් ගෙඩියකුත් සමඟ ඇයට දී, තේ කෝප්පයක් ද නීතා හදා දුන්නාය. මේ අතර 'දශවිධ මූලික අවශ්‍යතා' යන මැයින් ලෝක සෞඛ්‍ය සම්මේලනයේ රැස්වීමක දී ජිනීවාවල මා කළ දෙසුමක් ඇය විසින් ලිපියක් වශයෙන් සකස් කොට ටයිප් කරගෙන විත් තිබිණි. එය කියවූ මම, එය පළ කිරීමට අවසර දී අත්සන් කළෙමි. රිසිට් පතක් ද අත්සන් කිරීමට ඇය මා අත තැබුවාය. ඩොලර් 500 ක චෙක්පතක් එවේලේම ලියා ඇය මා අත තැබුවාය. ඒ කුමකටදැයි මා ඇසූ විට ඇය පිළිතුරු දුන්නේ මේ ලිපියට කරන ගෙවීමක් ලෙසයි.

මේ චෙක්පත නීතා අතට දුන් මම, තවත් මාස කිහිපයක් අපේ සර්වෝදය පවුල ජීවත් කරවීමට එය ප්‍රමාණවත් බව පැවැසුවෙමි. එදා සිට අනාගතයට මුහුණ දීමට ආර්ථික වශයෙන් බයක් මට ඇති නොවීය. ධර්මය අනුව නිස්සරණාධ්‍යාශයෙන් සේවය කරන විට මගේ අවශ්‍යතා ධර්ම ශක්තිය විසින් සැපයෙනු ඇති බවට මගේ විශ්වාසය තවත් තහවුරු විය.

ලෝක තරුණ සම්මේලනය ඇතුළු විවිධ ජාත්‍යන්තර සංවිධාන, එක්සත් ජාතීන්ගේ සංවිධානය, ලෝක සෞඛ්‍ය සංවිධානය, ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය, යුනෙස්කෝ සංවිධානය, යුනිසෙෆ් සංවිධානය, යුරෝපා පාර්ලිමේන්තුව, ජර්මන් රජය ඇතුළු විවිධ රාජ්‍ය සංවිධානවලින් සහ විශ්ව විද්‍යාලවලින් මට ඇරයුම් ලැබෙන්නට පටන් ගත්තේ ය. මගේ ගමන්–බිමන්, ඉඳුම්–හිටුම්, වියදම් ඔවුන් දැරූ අතර, මගේ සේවයට ගෙවීම් ද කළේය. වරෙක දේශකයකු ලෙස, වරෙක විශේෂඥයකු ලෙස, වරෙක යම් ව්‍යාපෘතියක් නිබන්ධනය කරන්නෙකු ලෙස, වරෙක ආගන්තුක මහාචාර්යවරයකු ලෙස ආදී වශයෙන් ලොව පුරා සේවය කළෙමි. පාසලේ දී ලත් පඩියට වඩා කිහිප ගුණයක් මා ඉපයූ අතර, මගේ පවුලේ වියදම් යන්තම් පියවාගෙන, මෙත් මැදුර ඇතුළු රටපුරා තිබෙන සර්වෝදය ආයතන ගොඩනැඟීමට හා සේවක සේවිකාවන් නඩත්තු කිරීමට ඉතිරි මුදල් සංගමයට පරිත්‍යාග කළෙමි.

එක්දහස්නවසිය හැත්තෑදෙකේ – මාර්තු තුන්වැනි දා, නාලන්දා විදුහල්පති සුගුණදාස අතුකෝරළ මහතාට මම පහත සඳහන් ලිපිය යැව්වෙමි. මේ පිළිබඳ ඉතා සංවේගයට පත් එතුමා සේවය හැර යාම පිළිබඳ ලිපියක් මට එවීම ප්‍රතික්ෂේප කළේය. එතුමාගේ රැකියාව අහිමි

වුවත්, එය නො කරන බව මා සමඟත් – අන් අය සමඟත් පවසා තිබේ. ඒ නිසා එම ක්‍රියාව කිරීමේ වගකීම එතුමා අධ්‍යාපන අමාත්‍යාංශයටම පැවරුවේය. එහිද කිසිවෙක් ඒ වගකීම බාර නොගත් නිසා, අද වන තුරු නිල වශයෙන් පළමු වන ශ්‍රේණියේ විශේෂ ගුරු තනතුරක සිටි මම, නිල වශයෙන් අමාත්‍යාංශයෙන් අස් කර නැත.

ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අධ්‍යාපන ඇමති ව සිටි කාලයේ නාලන්දාවේ තෑගි බෙදා දීමේ උත්සවයකට මීට වසර ගණනකට පසු පැමිණ සිටියේය. මට විශ්‍රාම වැටුපක් නොලැබෙන බවත්, මගේ ඉල්ලා අස්වීම තවමත් බාර ගෙන නැති බවත්, ඒ නිසා මා විශ්‍රාම යන දවස දක්වා සේවයේ සිටි බව සලකා – එක්දහස් නවසිය හැත්තෑදෙකේ සිට වේතනය ලබා ගැනීමට උසාවි යා යුතු බවත් මම එතුමාට විහිලුවට ප්‍රකාශ කළෙමි. එතුමා කොක්හඬලා සිනාසුණේය. කෙසේ හෝ මේ ලිපිය මම මෙහි සඳහන් කරමි:

ඒ. ටී. ආරියරත්න,
සර්වෝදය කාර්යාලය,
මෙත් මැඳුර
77, ද සොයිසා පාර,
මොරටුව.
72.03.18

විදුහල්පතිතුමා,
නාලන්දා විද්‍යාලය,
කොළඹ 10.

කාරුණික මහත්මයාණෙනි,

01. අප ජීවත්වන ලාංකික සමාජය සදාචාරයෙනුත්, අහිංසාවාදී බවෙනුත් දිනෙන් දිනම පිරිහෙනු දකින මට, මෙම තත්වයෙන් අප සමාජය මුදා ගැනීම සඳහා – වැඩි සේවාවක් මගේ ශක්ති ප්‍රමාණයේ හැටියට සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය තුළින් කළ හැකි බව මම අදහස් කරමි. එම නිසා දැනට එම ව්‍යාපාරය මගින් ගම් හාරසියයක මෙහෙයවා ඇති වැඩ පිළිවෙල ගම් දහස දක්වා ව්‍යාප්ත කිරීමේ පරමාර්ථයෙන් එම ව්‍යාපාරයට මගේ මුලු කාලය ම යෙදවීමට අද සිට තීරණය කර ඇති හෙයින්, තවත් නාලන්දා විදුහලේ සේවයට මා නොපැමිණෙන බව කරුණාවෙන් සලකන්න.

02. නිස්සරණධ්‍යාසයෙන් තමන් උපන් රටටත්, ලොවටත් සේවය කිරීමට කැපවෙන පුද්ගලයෙකුට, පඩි රහිත දෙවසරක නිවාඩුවක් දීමට තරම් වත්, අප අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නීති රීතිවලින් ඉඩක් නැති නිසා, මෙම අවශ්‍ය කාලය අවසරයක් නොමැතිව ම ලබා ගැනීමට මම තීරණය කළෙමි. නීති රීති අනුව, මා සේවයෙන් පහ කිරීමට ඉඩ තැබීම සඳහා සේවාවෙන් ඉල්ලා අස් නොවී, මෙසේ නොපැමිණ සිටීමට තීරණය කළෙමි. ඉතිහාසය විසින් මෙවැනි පරිපාලන නීති රීතිවලට අවශ්‍ය විනිශ්චය කවදා නමුත් ලබා දෙනවා ඇත.

03. මාර්තු මාසයට මා වෙනුවෙන් ලැබෙන වේතනය ආපසු අමාත්‍යාංශයට යවන්න.

04. රටේත්, ලොවේත් සත්පුරුෂ ජනයා මහ ඉහළින් අගය කරන උදාර සේවාවක් අරඹා, පවත්වාගෙන යාමට නාලන්දා විදුහලේ විදුහල්පතිතුමන්ලාත්, ගුරු මණ්ඩලයේ සහෝදර සහෝදරියනුත්, සිසු දරුවනුත් මට දුන් සහයෝගය සදා අගය කරමි. ඉදිරියට ද ස්වේච්ඡාවෙන් නාලන්දාවට කළ හැකි සෑම සේවයක්ම කිරීමට හැකි හැම අවස්ථාවක දී ම ඉදිරිපත් වීමට මම කැමැත්තෙමි.

05. සම්‍යක් දෘෂ්ටියත්, බෞද්ධ ජීවන ක්‍රමයත් තම සිසු දරුවනට දීම තුළින්, නාලන්දාව රටටත්, ලොවටත් සේවය කරන සිසු පරපුරක් ඉදිරියට ද ගොඩනංවනු ඇතැයි ප්‍රාර්ථනා කරමි. ඔබතුමා සහ ආචාර්ය මණ්ඩලයත්, සිසු දරුවනුත් මට හැම විට ම දැක් වූ සහාය සහ ආදරය ගැන නැවත වරක් පින් දෙමින් – ආයුබෝවන් කියමි.

මෙයට,
අදරැති,

ඒ. ටී. ආරියරත්න,
උප ගුරු – කොළඹ නාලන්දා විද්‍යාලය,
ලියාපදිංචි අංකය 702126

89

කෝ බුද්ධිමතුන් ? බුද්ධිමතකුගේ පිස්සුව!

එක්දහස් නවසිය හැත්තෑ එකේ දී, මෙත් මැදුර සර්වෝදය මූලස්ථානය වීමෙන් පසු, වසර තුන – හතරක් ඇතුළත දී දිවයින පුරාත්, එය ප්‍රසිද්ධ විය. සාමාන්‍ය ජනතාව පමණක් නොව, රටේ ඉහළ මට්ටමේ දේශපාලකයින්, නිලධාරීන් හා විවිධ ප්‍රජා නායකයින් ද අපේ ආරාධනයෙන් මෙන්ම, අනාරාධිතව ද මෙත් මැදුර නැරඹීමට පැමිණියහ.

මේ වන විට ලීලා ජයසේකර මැතිනියගේ මාර්ගෝපදේශකත්වය යටතේ සර්වෝදය සිහිති සේවා අංශය ද දියුණු වෙමින් පැවැත්තේය. සිහිති සේවා ගුරුවරියක් මෙන්ම, උපදේශිකාවක් ද වූ සුමනා රත්නායක මෙනෙවිය, ඒ කාලයේ කැපී පෙනුණු තරුණ නායිකාවක් විය. අගනුවර පැවැති විවිධ රැස්වීම් හා සාකච්ඡාවලට බොහෝ විට ඕ සර්වෝදය නියෝජනය කළාය.

දිනක් සුමනා පැමිණ, මගේ අතට – කොළඹ කාන්තා ව්‍යාපාරයක ක්‍රියාකාරී මහත්මියක් දුන්නේ යැයි කියා, ටැලිෆෝන් අංකය සහ ඇයගේ නම ඇතුළත් කොළ කැල්ලක් මගේ අත තැබුවාය. මේ නෝනාට

ඡායාරූප: 361.1
මුල්ම පෙර පාසල් ගුරුවරියන්, ලීලා ජයසේකර මැතිනිය, බාලසූරිය මහතා සහ මා

ටැලිෆෝන් කර, ඇයට මෙත් මැදුර නැරඹීමට එන්නට පහසු – මා එහි සිටින දිනයක් දන්වන මෙන් පැවසූ බව කීවාය.

ඡායාරූපඃ 361.2 – ලීලා ජයසේකර මැතිනිය සමග

මේ අනුව මම ඒ අංකයට කතා කළෙමි. පිරිමි කටහඬකින් අනිත් පැත්තෙන් මට කතා කළ මහත්මයාට, ඒ අංකයට කතා කිරීමට කලින් සඳහන් කළ කාන්තාව මට පණිවිඩයක් එවා තිබුණු බව කීවෙමි.

මට ලැබුණු ප්‍රතිචාරය මෙසේය.

"ඒක වෙන්නට බෑ. මම ඇයගේ සැමියා. කවදාවත් ඇය සර්වෝදයට එන්ට අහන්නේ නෑ. සර්වෝදයට ඇවිත් ඈ කා සමඟ කතා කරන්නද? සර්වෝදයේ ඉන්න බුද්ධිමතුන් කවුද? එය වැරදීමක්."

මේ දෙබස සිදු වූයේ ඉංගිරිසියෙනි. **"Sarvodaya has no Intellectuals"** යනුවෙන් පවසන විට මේ මිනිසා කෙරෙහි මට ඇති වූයේ තරහක් නොව, පිළිකුළකි.

"ඒක නම් ඇත්ත. සර්වෝදයේ බුද්ධිමතුන් (Intellectuals) නැහැ. එහෙම අය හම්බවෙන්ට අපට උවමනාවකුත් නැහැ. කණගාටුයි ඔබට කරදර කළාට." මෙසේ පැවසූ මම රිසීවරය තබන විට ඔහුත් රිසීවරය තැබුවේය.

මේ 'බුද්ධිමතා' ගැන දැන ගන්නත්, පණ පිටින් දැක ගන්නටත් මට ආශාවක් ඇති විය.

මීට ටික දිනකට පසු ලෝක ප්‍රසිද්ධ උගතකු වූ නෝර්වේ ඔස්ලෝ නුවර සාම පර්යේෂණ ආයතනයේ නිර්මාතෘ මහාචාර්ය යොහාන් ගල්තුං මහතා හා මම ලෝක තරුණ සම්මේලනය විසින් සංවිධානය කර, ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පැවැත්වූ සම්මේලනයේ තේමා දේශන දෙක පැවැත්වීමු. මා පළමුව කථා කළ අතර, ගල්තුං මහතා දෙවැනිව කථා කළේය.

සාකච්ඡා වාරයේ දී, පොඩියට රැවුලක් තිබූ හීන්දෑරි පුද්ගලයෙක් නැඟිට, ඉතා පහත් විදියට "මේ කථා දෙකේම Intellectual Content (බුද්ධිමත් අන්තර්ගතයක්) නැතැයි" ප්‍රකාශ කළේය.

වේදිකාවෙන් බැස්ස පසු මේ පුද්ගලයා කවුරුදැයි මම එතැන සිටි අයගෙන් විමසීමි. 'ඔලුව උදුම්මා ගත් මෝඩ පණ්ඩිතයෙක්' යැයි කෙනෙක් කී අතර, තවෙකෙක් කීවේ 'තමන්ගේ අනන්‍යතාවය තවමත් සොයා ගන්නට බැරිව ඔලුවේ කුණු ගොඩවල් රැසක් පුරවා ගෙන සිටින විකෘති වූ මනසක්' බවයි. ඒ අතර මේ ආචාර්යවරයාගේ නම සොයා ගතිමි. රූපයද දිටිමි.



ඡායාරූපඃ 362
මහාචාර්ය යොහාන් ගල්තුං

මීට තවත් කලකට පසු මහවැලි මණ්ඩලයේ ඇරයුමෙන් (සමාජ සංවර්ධන කමිටුවක) රැස්වීමක් සඳහා මට මහඉලුප්පල්ලමට යෑමට සිදු විය. ඊට පෙර දින, ඒ ළඟම තිබෙන කුඹුක්ගොල්ලෑව ගමෙහි රෑ ගත කොට– උදේ රැස්වීම තිබෙන ස්ථානයට යෑමට කල්පනා කළෙමි. එහි යන අතර මහඉලුප්පල්ලමට ගොඩවී, රැස්වීම තිබෙන ස්ථානය හරි හැටි දැන ගැනීමට එහි ගියෙමි. එහි බංගලාවක සිටි මහත්මයෙකුගෙන් ඒ ගැන විමසූ විට – ඔහු අහක බලා ගේ තුළ ට පිවිසියේ ය. එදා ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දි ප්‍රශ්නය ඇසූ බුද්ධිමතා බව ඒ සන්ධ්‍යාවේ කල්පනා නූනත්, පසු දින රැස්වීමේ දි ඒ පුද්ගලයාම බව මම හැඳින ගතිමි. මා කතා කරන්නට හැදුවත්, ඔහු අහක බලා ගත්තේය.

මීට සති කීපයකට පසු ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී, තවත් කීප දෙනෙක් සමඟ සර්වෝදය පිළිබඳ කාර්ය සැසියක් හොර රහසේ තබා, මේ පුද්ගලයා සර්වෝදය ගැන නිබන්ධනයක් ඉදිරිපත් කළ බව මට ආරංචි විය. එහි දී සර්වෝදය වනාහි පිටරට ආධාර ගලා එන නාලයක් බවත්, ඒ හැර කිසිම හරයක් සර්වෝදයෙහි නැති බවත් මොහු සඳහන් කර තිබිණි. **'A Reply from a Conduit'** 'නාලියකින් දෙන පිළිතුරක්' යනුවෙන් පත්‍රිකාවක් ලියා – මුද්‍රණය කොට, ඔහුගේ තර්කවලට පිළිතුරු දී බෙදා හැරියෙමි.

මේ පුද්ගලයා මා අන්තිමට දුටුවේ මහ බැංකුවේ රැස්වීම් ශාලාවේදී එවකට අධ්‍යාපන ඇමති රනිල් වික්‍රමසිංහ මහතාගේ සහභාගිත්ව –යෙන් මහ බැංකු අධිපති ආචාර්ය වර්ණසේන රාසපුත්‍රම් මහතාගේ සහභාගිත්වයෙන්, අධ්‍යාපන ධවල පත්‍රිකාව ගැන පැවැත් වූ කාර්ය සැසියකදී ය. මේ බුද්ධිමතා පැමිණ මගේ වම් පස පුටුවේ වාඩි විය. ඔහුට

සුහදව ආමන්ත්‍රණය කොට, සර්වෝදය පිළිබඳ පොත් දෙකක් ඔහුට දුනිමි. ඒ පොත් දෙක අතට ගත් ඔහු 'මෙය මෙතන තිබෙන කුණු කූඩයේ දාන්න ද? ගෙදර ගෙන ගොස් කුණු කූඩයට දාන්න දැ' යි ඇසීය. "අපොයි ගෙදරට කුණු ගෙනයන්ට එපා" යැයි ඒ පොත් දෙක නැවත මගේ අතට ගතිමි.

මේ රැස්වීමේ දී ඔහුට පෙර, මගේ අදහස් දැක්වීමට ආරාධනාව ලැබිණි. ඔහු සුදු කොළයක 'Paradigm, Scenario' ආදී වූ බර ඉංගිරිසි වචන රැසක්ම ලියා තිබෙනවා මම දුටිමි. මගේ කතාවේ දී මට මතක් වූ මේ වචන සඳහන් කොට මෙවැනි නොතේරෙන ඉංගිරිසි වදන් යොදා අප වැනි පෘථග්ජනයන්ට කතා කරන ඊනියා බුද්ධිමතුන්ට වඩා, අධ්‍යාපන ධවල පත්‍රිකාව ගැන ගමේ ගොඩේ පාසල් ගුරුවරුන්ගෙන් දෙමාපියන් ගෙන් ආගමික හා ප්‍රජා නායකයින්ගෙන් අදහස් ගැනීම වැදගත් බව පැවසීමි. මේ වචනවලින් තොරව, මට පසු – ඔහු කළ කතාව පුස්සක් විය.

ඔහු පළ කළ සඟරාවක බුදු පිළිමයකට සමාන චිත්‍රයක් හාස්‍යයට ලක් කොට තිබුණ නිසා, ඔහු රජයේ සේවයෙන් පහ කළ බව පසු කලෙක මට ආරංචි විය. මේ ගැන කිසිත් නොදත් මා, එය රජයට කියා කළ වැඩකැයි මොහු නොයෙක් අය සමග පවසන බව මට ආරංචි විය. කිසිම හේතුවක් නොමැතිව මට අපහාස කළ පුද්ගලයෙකුට දැන් හේතුවක් ගොතා ගත හැකිව තිබෙන බව මට හැඟිණි.

ඊනියා විදේශ සල්ලිවලින් යැපෙමින් ලොව පුරා සැරි සරන මොහු ගැන අවසන් වරට මට දැන ගන්නට ලැබුණේ එක්දහස් නවසිය අනූනමයේදීය. ලොස් ඇන්ජලීස් නුවර බෞද්ධ සමිතියක කතා කරමින්, 'සර්වෝදය සිංහල බෞද්ධයාට විරුද්ධව කටයුතු කරනවා' යැයි මොහු පවසා තිබේ. මේ ගැන මට දැන් වූ ගරු වල්පොල පියනන්ද නාහිමියන් නවත් ඔහුට එම ආරාමය පළාතට එන්නට එපා යැයි අවවාද කළ බව, දුරකතනයෙන් මට පැවැසුවේය.

අපේ පාඩුවේ අප කරන යහපත් කටයුතුවල දී මෙවැනි අපූර්ව බුද්ධිමතුන්ගේ විකෘති වූ මනසකින් කරන ක්‍රියා ද උපේක්ෂාවෙන් විඳ දරා ගැනීමට අපට සිදු වේ.

90
නැවත පිලිපීනයට

එක්දහස් නවසිය හැටනවයේ රමන් මැග්සයිසයි ත්‍යාගය බාර ගැනීමට පිලිපීනයට මා ගිය අවස්ථාවේ දී විවිධ විශ්ව විද්‍යාල, උසස් පාසල් සහ වෙනත් විවිධ ආයතනවල දේශන කිහිපයක්ම පැවැත්වීමි. මේවාට විශාල ප්‍රසිද්ධියක් දී තිබුණ නිසාත්, ඒවා බොහෝ දුරට මානව නිදහස සහ අයිතිවාසිකම්, ආර්ථික සූරාකෑම්වලින් මිදීම, නව යටත් විජිතවාදයෙන් මිදීම සහ මේ සියලු වෙනස්කම් ආධ්‍යාත්මික පදනමක පිහිටා අහිංසාවාදය පෙරමුණේ තබාගෙන ක්‍රියාත්මක කිරීම ආදී අදහස්වලට පිලිපීනය පුරා විශාල ප්‍රසිද්ධියක් ලැබුණි.

ජනාධිපති ෆර්ඩිනන්ඩ් මාකෝස් මහතාගේ දැඩි පාලනය යටතේ බොහෝ ප්‍රජාතාන්ත්‍රික හිමිකම් නොමැතිව සිටි ජනතාව, මගේ දේශන බොහෝ දුරට ප්‍රිය කළහ. ඉතාමත් භක්තිමත් කතෝලිකයන් වූ පිලිපීන ජාතිකයෝ, හිංසාවට වඩා අහිංසාවාදීව වෙනස්කම් කළ හැකි ක්‍රියා මාර්ගවලට වැඩි කැමැත්තක් දැක්වූ බව මම තේරුම් ගතිමි. සමහර පාසල් සැසි තුනක් ම පැවැත්වේ. පාසල්වල ඉඩකඩ මදි නිසා, මෙසේ තුන්වරකට ශිෂ්‍යයෝ – සමහර විට රාත්‍රී දොළහ වනතුරු – පාසල්වලට සහභාගි වෙති. ඉගෙන ගැනීමට තිබෙන බලවත් ආශාව නිසා, ඔවුහු අප වැනි දේශකයන්ට සවන් දීමට බොහෝ කැමති වූහ.

එක්දහස් නවසිය හැටනවයේ අගෝස්තු මාසයේ මා ත්‍යාගය ලබා ගැනීමට ගිය අවස්ථාවේ, පිලිපීනයේ සෑම දිවයිනකින්ම වාගේ මා කැඳවා දෙන්නට යැයි රමන් මැග්සයිසයි ආයතනයට ඉල්ලීම් ලැබී තිබුණේය. එහෙත් මා හා නීතා එහි ගත කළේ සතියක් පමණක් බැවින්, මේ ඉල්ලීම් සියල්ල ඉටු කිරීමට නොහැකි විය. මේ නිසා නැවත වරක් මට ආරාධනා කරනු ලැබුවහොත්, පිලිපීනයට පැමිණීමට පොරොන්දු වන බව, මම බෙලන් ආබඃ මැතිනියට ප්‍රකාශ කළෙමි. එක්දහස් නවසිය හැත්තෑඑකේ – නොවැම්බර් මස දහඅටවැනිදා සිට දෙසැම්බර් මස දහ වැනිදා දක්වා සති තුනක කාලයක් මේ නිසා මට පිලිපීනයට නැවත යෑමට සිදුවිය.

මා පිලිපීනයට යන බව දැනගත් අක්ෂිදාන සංගමයේ සභාපති වෛද්‍ය හඩ්සන් සිල්වා මැතිතුමා, මා අත ඇස් හතරක් යැවීමට සූදානම් කරන බව මා සමඟ පැවසීය. මම එයට එකඟ වූයෙමි. නාලන්දා ආදි ශිෂ්‍යයෙක් වූ වෛද්‍ය හඩ්සන් සිල්වා මහතා, වෛද්‍ය ශිෂ්‍යයෙක්ව සිටින කාලයේ දී එම ශ්‍රේෂ්ඨ අක්ෂිදාන ව්‍යාපාරය ආරම්භ කළේය. ලංකාවේ පමණක් නොව, ලොව පුරාම වෛද්‍ය හඩ්සන් සිල්වා මහතාගේ අක්ෂිදාන ව්‍යාපාරය ප්‍රසිද්ධ විය. එතුමා විසින් යවන ලද අක්ෂිදානවලින් රට පුරාත්, ලොව පුරාත් නැවත ඇස් පෙනීම ලත් සංඛ්‍යාව දහස් ගණනකි. මේ නිසා මෙම පින්කමේ කොටස්කරුවකුවීමට මම කැමැත්තෙන්ම එකඟ වූයෙමි.


ඡායාරූප: 363
දොස්තර හඩ්සන් සිල්වා මහතා

'එයාර් සිලෝන්' සමාගම විසින් බදු ගන්නා ලද ස්විස් ගුවන් යානයෙන්, එක්දහස් නවසිය හැත්තෑඑකේ – නොවැම්බර් දහඅට වැනිදා ගුවන් තොටුපළේදී වෛද්‍ය හඩ්සන් සිල්වා මැතිතුමා හා මැතිනිය දුන් ඇස් හතර ද රැගෙන මම සිංගප්පූරුව බලා පිටත් වීමි.

මම සිංගප්පූරු ගුවන් තොටුපළට ළඟාවන විට රාත්‍රී දහයයි තිහට පමණ විය. එක්දහස් නවසිය හැටහතේ – සිට මා සමඟ මිතුරුදම් පැවැත්වූ ජොනී ටාන් මහතා මා මුණගැසීමට පැමිණ සිටියේය. ජොනී ටාන් මහතා ඊස්රායලයේ හිස්ට්‍රාඩුත් නැමැති කම්කරු පුහුණු මධ්‍යස්ථානයේ ඉගෙන ගෙන, සිංගප්පූරුවේ බෝනවිස්ටා තරුණ පුහුණු මධ්‍යස්ථානයේ උපදේශකයෙක් හැටියට එවකට සේවය කළේය. ශ්‍රී ලංකාවේ ජාතික තරුණ සේවා සභාව සැලසුම් කළ මාගේ මිත්‍ර ඊස්රායල් ජාතික ආරියේ ලෙවී මහතා, සිංගප්පූරු තරුණ සේවාව සංවිධානය කොට, එම ආයතනයේ ප්‍රධානියා වශයෙන් ඒ කාලයේ සේවය කළේය. ජොනී ටාන් මහතා ඉක්වටෝරියල් හෝටලයට මා සමඟ ගොස් මට රාත්‍රී ආහාරය ද අරන් දුන්නේය.

පිලිපීන ගුවන් සේවයට අයත් යානයකින් දහනව වැනිදා පස්වරුවේ මම මැනිලා ගුවන් තොටුපළට ළඟාවීමි. එදා රාත්‍රී මිනිස් ඇස් හතර සහිත පාර්සලය, හෝටලයේ අයිස් පෙට්ටියක් තුළ තබා මා නිදාගත්තේ, රාත්‍රියේ එහි අයිතිකාරයෝ පැමිණේය යන සැකයෙන් – විදුලි එළිය නොනිවාමය. කෙසේ නමුත් මගේ උකුලේම මෙම ඇස් පෙට්ටිය තබාගෙන ඉතා පරිස්සමෙන් ගෙන ඒම පිළිබඳව මම සතුටු වූයෙමි.

ගුවන් යානයේ පියගැට පෙළින් බසින තැන ඉදිරියෙන්ම මැග්සයිසයි පදනමේ විධායක අධ්‍යක්ෂිකා බෙලන් ආබ්‍රෘ මැතිනිය ද, මෙම සංචාරයේදී මගේ කටයුතු සැලසුම් කළ එලන් ඇකිනෝ මෙනවිය ද, මල්මාලා අතැතිව සිටියහ. එවකට අපේ තානාපති කාර්යාලය බාරව සිටි එන්. එන්. එම්. අයි. හුසේන් මැතිතුමා ද, ජයරාජා නැමැති නිලධාරී මහත්මයෙක්ද, ඔවුන් සමඟ සිටියහ. පිලිපීන ඇස් බැංකුවේ නියෝජිතයින් මා ගෙල වටා මල්මාලා දැමූ අතර, වෛද්‍ය හඩ්සන් සිල්වා මහතා විසින් මා වෙත බාරදුන් ඇස් පෙට්ටිය ඔවුන්ගේ අතට බාර දුනිමි.



ඡායාරූප: 364
පිලිපීනයේ තානාපතිව සිටි
එන්. එන්. එම්. අයි. හුසේන් මහතා

එතැන සිට කෙලින්ම 'බේ වීව් හෝටලයට' මා කැඳවාගෙන ගොස් මට සුලු විවේකයක් ගන්නා ලෙස දන්වා, ඔවුහු පිටව ගියහ. නැවත සවස හයට පමණ රැමන් මැග්සයිසයි ත්‍යාග පදනමේ කාර්යාලයට ගොස් සති තුනක මගේ වැඩසටහන මගේ අතට දී, ඒ පිළිබඳ විස්තරයක් ද ඔවුන් විසින් කරන ලදී.

රාත්‍රී ආහාරයෙන් පසු 'බේවීව්' හෝටලයේ 8 වැනි මාලයේ 37 වැනි කාමරයේ මගේ සිහින ලොවේ මම නැවතත් තනිවීමි. එක්දහස් නවසිය හැටනවයේ දී – නීතා මා සමඟ සිටි නිසා, මෙවර ඇ නොසිටීමේ තනිය මට හොඳින්ම දැනුණේය. එහෙත් එවකට අපට සිටි දරුවන් තිදෙනා තනි කර ඒමට නොහැකි වූ බැවින්, ඇයට මා සමඟ ඒමට නුපුලුවන් විය.

මෙම චාරිකාවේ ප්‍රධානම කාර්යය වූයේ රැමන් මැග්සයිසයි ත්‍යාග පදනම සහ ලෝක ආහාර සහ කෘෂිකර්ම සංවිධානය විසින් පවත්වනු ලබන සමුලුවක තේමා දේශනය පැවැත්වීමයි. එකවරම බෙලන් ආබ්‍රෘ මැතිනිය මගෙන් ඇසුවේ එම පත්‍රිකාව සූදානම් දැයි කියාය. මගේ දබර ඇඟිල්ල හිස පැත්තට දිගු කර, සංඥා කළ මම, යතුරු ලියනයක් සහ කඩදාසි ටිකක් හෝටලයේ මගේ කාමරයට ලැබෙන්න සැලැස්වුවහොත්, එම අදහස් ලියා දිය හැකි බව පැවසුවෙමි. ඉතාමත්ම නිහතමානී – හෙම්හිට කතා කරන කාන්තාවක් වූ ආබ්‍රෘ මැතිනිය, එයට කැමති වී, වහාම ඒවා මගේ කාමරයට ලැබීමට සැලැස්වූවාය.

ඡායාරූප: 365
පිලිපීන දූපත්වල දිගටම
දේශන පැවැත්වීම

මගේ වැඩ සටහන දුටු විට, එක්තරා බියක් මට ඇති විය. දේශන, කාර්ය සැසි, සම්මේලන, උපාධි ප්‍රදානෝත්සව, දිවා සහ රාත්‍රී භෝජන සංග්‍රහ සහ පිළිගැනීම්වලින් එම වැඩ සටහන පිරී තිබුණේය. හැරත්, මට පිලිපීනයේ සෑම දූපතකටම වාගේ යෑමට පිළියෙල කර තිබුණේය. නිබන්ධනය ලිවීමට වේලාව තිබේ දැයි මම ටිකක් අනුමාන කළෙමි. පසුවදා රාත්‍රී ආහාරය සූදානම් කර තිබුණේ තානාපතිතුමාගේ නිවසේය. ලයනල් හෙන්රි සහ ජයරාජා මහතා පැමිණ, මා හුසේන් මහතාගේ සහ මැතිනියගේ නිවසට කැඳවාගෙන ගියහ. ඇංජලා හුසේන් මැතිනිය මා බලාපොරොත්තු වූ විදියේ කෙනෙක් නොවූවා ය. අපේ ගමක සිංහල කාන්තාවක් මෙන්, ඉතා චාම්ව ඇඳගෙන, සිටි ඕ – මගේ දුවගේම වයසේ දියණියක් ද, ඊට වැඩිමහල් පුතා ද සමඟ මා ඉතා ආදරයෙන් පිළිගත්තාය.

හුසේන් මහතා අතිශයින් ම බහුශ්‍රැත පුද්ගලයෙකි. වචනාර්ථ–යෙන්ම නිහතමානී බුද්ධිමතෙකි. ඔහුගේ ඇසූ පිරූ තැන් බොහෝ ය. ජ්‍යොතිශාස්ත්‍රය, තරුණ අසහනය, සිවිල් සමාජයේ වැඩි වන අපරාධ, පිලිපීනයේ ඡන්ද ව්‍යාපාරය ආදී වූ විවිධ විෂයයන් ගැන කතා කළ එතුමා, ඇවිදින විශ්වකෝෂයක් මෙන් විය. මේ අතර කුස්සියත් – සාලයත් අතර සියක් වාරයක් එහා මෙහා දුවමින්, හුසේන් මැතිනිය අපේ රාත්‍රී ආහාරය සූදානම් කළාය. අපේ ගෙදරදී රස විඳින ආප්පවල රසයටම ආප්ප, ඉඳිආප්ප, බත් ආදී සියලුම දේ සූදානම් කොට, නියම ගෘහිනියක් මෙන් එතුමිය අපට ආගන්තුක සත්කාර කළාය. මේ නිසාදෝ – මීට පසු මා පිලිපීනයට ගිය හැම වතාවකදීම, හුසේන් යුවලගේ ගෙදර නැවතී සිටීම මගේ සිරිත විය.

ආපසු 'බේ වීව්' හෝටලයට මා හැරලද්දී, හෙන්රි මහතා මා අතින් ලියන ලද නිබන්ධනය ටයිප් කර දීමට පොරොන්දු විය. එතුමා දැනටමත් සර්වෝදය අනුගාමිකයෙක් බව මට කීවේය.

ලෝක විශ්ව විද්‍යාල සේවය හා ලූ ලූ මැනිවෙල් කිව්සෝන් මැතිනියගේ සභාපතිත්වයෙන් ලෝක තරුණ සම්මේලනය මුලින්ම මගේ දේශන පැවැත්වූ ස්ථාන දෙක විය. බෙල්ජියමේ ලීජ්වලදී මා හඳුනාගෙන සිටි ලූලූ, පිලිපීනයේ හිටපු ජනාධිපතිවරයෙක් වූ කිව්සෝන් මැතිතුමාගේ පුතා සමඟ මාස තුනකට පමණ පෙර විවාහ වී සිටියාය. ඇය මා පිළිබඳ මහ ඉහළින් වර්ණනා කළ අතර, මා ඔවුන්ට බොහෝ අත්දැකීම් කියා දුනිමි; ඔවුන්ගෙන් ද වැදගත් අදහස් ලබා ගතිමි. ලයනල් හෙන්රි මහතාගේ ඇරැයුමෙන් බිරිඳ විමලා, කුඩා දුව සහ පුතා සමඟ රාත්‍රී ආහාරය ගතිමි. පොරොන්දුව අනුව මගේ නිබන්ධනය ඔහු ටයිප් කර දුන්නේය. මේ දිනවල පැය දෙකකට වඩා මට නිදා ගැනීමට ඉඩක් නොලැබුණේය. මා හෝටලයේ ම රැඳී ලියන විට, ගෙදරින් ආහාර ගෙනවිත් මට සංග්‍රහ කිරීමට හෙන්රි සහ ඔහුගේ භාර්යාව විමලා අමතක නොකළහ.

22 දා සිට මට කිසිසේත් විවේකයක් නොලැබිණි. එළිවන විට ම එලන් ඇකිනෝ මෙනවිය පැමිණ මා සමඟ දිනකට පාසල් සහ විශ්ව විද්‍යාල 4 කට පමණ රැගෙන යන්නී ය. ඒවායේ දී සැබෑ අධ්‍යාපනය යනු කුමක්ද? ජාතික සංවර්ධනය සඳහා ශිෂ්‍යයින්ගේ භාරය, චරිත සංවර්ධනය ආදී විවිධ මාතෘකා අනුව, පාසල් ගුරුවරුන්ට හා ශිෂ්‍යයින්ට දේශන රැසක්ම මම පැවැත්වීමි. මේ අතර රැමන් මැග්සයිසයි ත්‍යාග පදනමේ භාරකාර මණ්ඩලය ද, දිවා හෝජන සංග්‍රහ පවත්වා සුළු පිරිසකට මා ලවා සර්වෝදය පිළිබඳ අදහස් ලබා ගත්හ.

සමහර ශිෂ්‍යයෝ රැමන් මැග්සයිසයි පදනම සහ ත්‍යාගය ගැනත්, දේශනය ගැනත් මගෙන් ප්‍රශ්න ඇසූහ. ඒ සැමටම මම ශිෂ්‍යයින්ට පිළිගත හැකි අන්දමින් පිළිතුරු දුනිමි. ඉතාමත්ම. කලබලකාරී වූ ශිෂ්‍ය සමිතියකට "කැමැත්තෙන් කරන විප්ලවය" මාතෘකාවෙන් යන මවිසින්, කළ කතාව ඔවුන්ගේ ප්‍රශංසාවට ලක් විය. ආසියානු සමාජ ආයතනයේ ද ප්‍රසිද්ධ දේශනයක් කළෙමි. සාගිනි නිවීමේ කමිටුව සහ පෝෂණ පදනම විසින් ද, විශේෂ සම්මේලන සංවිධානය කර තිබුණේය.

මගේ වැඩ සටහනේ ඉතිරි කොටස සඳහා වෙනත් දූපත්වලට යෑමට පෙර, ලෝක ආහාර සහ කෘෂිකර්ම සංවිධානයත්, රැමන්

මැග්සයිසයි පදනමත් සංවිධානය කර තිබූ ජාත්‍යන්තර සම්මේලනයට සහභාගී වීමි. මා ලවා ලියවා ගත් නිබන්ධනය මුද්‍රණය කොට, සියලු ම සහභාගිවන්නන්ට බෙලන් ආබෲ මැතිනිය විසින් බෙදා දී තිබුණු අතර, මගේ දේශනය පැවැත්වූයේ ඒ නිබන්ධනය දෙස නොබලා සම්පූර්ණයෙන්ම මතකයෙනි.

ජාත්‍යන්තර සම්මේලනවලදී නිබන්ධන කියවීම තරම් මෝඩකමක් නැත. බොහෝ දෙනා කන් දෙකට වඩා පාවිච්චි කරන්නේ පත්‍රිකා දෙස බැලීමට ඇස් දෙකය. ක්ෂණිකව කතාවක් කරන විට, කෙලින් ම තමාගේ චිත්ත වේගයන් අසා බලා සිටින අයගේ චිත්ත වේගයන්ට කෙලින්ම සම්බන්ධ කළ හැකිය. මේ කාලයේ සිට අද දක්වා–ජාතික වේවා, ජාත්‍යන්තර වේවා, සම්මන්ත්‍රණ, සම්මේලන, කාර්යය සැසි ආදියේ මා සෑම විටම කතා කළේ ක්ෂණිකවය. එවේලේම කතා කරන විට, තමා කතා කරන්නේ කාටද? ඔවුන් බලාපොරොත්තු වන්නේ කුමක්ද? ඔවුන් ප්‍රතිචාර දක්වන්නේ කෙසේද? යන සියල්ලම තමාට අවබෝධ කරගෙන තැනට අවශ්‍ය පරිදි අදහස් දැක්විය හැකිය. එසේ නොවුවහොත්, වන්නේ අසා සිටින අය නිදා වැටීමය.

මා සිරිතක් වශයෙන් එදා සිට අද දක්වාම මගේ කුඩා ටේප් රෙකෝඩරය මා ඉදිරිපස තබා ගෙනයි, කතා කරන්නේ. ඒ නිසා අපේ ලේඛනාගාරයේ සිය ගණනක් පටිගත කරන ලද ශබ්ද පටි තැන්පත් කර තිබේ. මහාචාර්ය නන්දසේන රත්නපාල මහතාගේ උනන්දුව නිසා මෙයින් සමහරක් ලේඛනගත කොට, මේ වන විට වෙලුම් 7 කින් විශ්ව ලේඛා ප්‍රකාශකයන් ලවා ඒවා ප්‍රකාශයට පත්කර තිබේ. එදා එක්දහස් නවසිය හැත්තෑඑකේ නොවැම්බර් මාසයේ දී මා කළ දේශනය පිළිපීන සමාජයේ සාමාජික, ආර්ථික සහ දේශපාලන තත්වය අනුව, අතිශයින්ම විප්ලවකාරී දේශනයක් බව, එය නැවත කියවන විට දැන් මට හැඟේ. වර්තමානයේ පවා බොහෝ දෙනා මේ අදහස් ප්‍රකාශ කිරීමට මැළි වෙති.

එම දේශනයේ හැඳින්වීම පමණක්, ඊළඟ පරිච්ඡේදයේ මෙම වෙලුමේ ඉදිරිපත් කොට ඇත. එය ඉතා දීර්ඝ දේශනයක් නිසා සම්පූර්ණයෙන් එය කියවීමට කැමැත්තෝ, මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා විසින් සංස්කරණය කරන ලද මගේ සමුච්චිත දේශනවල ඉංගිරිසි වෙලුම කියවිය යුත්තෝය.

මේ අතර දිනක අපේ තානාපතිතුමා හා ඇස් බැංකුවේ වෛද්‍යවරුන් ද සමඟ මා ගෙනා ඇස් බද්ධ කළ අයවලුන් දැකීමට

ගියෙමි. එයින් එක් තරුණ කාන්තාවක් ඇගේ ඇස වසා තිබූ ආවරණය වෛද්‍යවරයා විසින් ඉවත් කරන විට, මගේ අත අල්ලාගෙන "මට දැන් පේනවා, මට දැන් පේනවා" යැයි සතුටින් කෑගැසූ හැටි සිහිවන විට අදත් මට ඇති වන්නේ සතුටෙකි.

මෙම සම්මේලනයෙන් පසු, පිලිපීන දූපත්වල සියලුම අගනුවර –වලට ඇන්ග්ලෝ මහතා සමඟ මම ගියෙමි.

පුලුල් නළල් තලයක් ඇති – පැත්තට පීරපු කෙස් කළඹකින් යුක්ත රවුම් මුහුණක් ඇති, මා තරම් ම උස මහත ඇති – එවකට මගේම වයසේ යැයි හැඟුණ පුද්ගලයෙකි, ඇන්ග්ලෝ මහතා. ඔහු ඉතාමත්ම කරුණාවන්තය.

මගේ අවශ්‍යතා සියල්ලක්ම අඩුවක් නැතිව සොයා බැලුවේය. කිසි විටෙක මගේ බෑගය උස්සාගෙන යෑමට මට ඉඩ දුන්නේ නැත. ඩවාවෝ නගරයේ 'ඉන්සිවුලර්' හෝටලයේ අප සිටින දිනවල, ඒ ප්‍රදේශයේ තිබූ රමණීය දර්ශන මගේ කැමරාවට හසු කර ගැනීමට අවශ්‍ය බව පැවැසූ විට, ඔහු මා හොඳම තැන්වලට එක් කරගෙන ගියේය. ඩවාවෝ අප සිටි දිනයන්හි, අපේ රියැදුරා මෙන්ම, ආරක්ෂකයා වශයෙන් ද ක්‍රියා කළ, හිටපු හමුදා නිලධාරියකු වූ මේජර් ඔන්ඩෝ මහතා ද මට සිහිවේ. දිනක් ඔහු වෙලාවට මා රියට නංවා ගැනීමට කොතරම් හදිසි වූයේ ද කිවහොත්, මා නාන කාමරයේ සිටින අතර මගේ සියලුම ගමන් මලු කාර් එකට දමා තිබුණේය. තුවායක් ඇඳගත් මම කාරයට පණිවුඩ යවා ඇඳුම් ටික ගෙන්වා ගත් හැටි මට මතක් වෙන හාස්‍ය ජනක සිද්ධියකි.

කතෝලික බැතිමතුන් සිටින රටක් වශයෙන් ඩවාවෝවල දී, චීන බෞද්ධ පන්සලක් නැරඹීමට යෑම ගැන මම සතුටු වෙමි. අතිශයින්ම අලංකාර වූ, පිරිසිදු වූ, චීන ගෘහනිර්මාණ ශිල්පය අනුව ගොඩනඟන ලද මේ විශාල පන්සල, එහි සිටි චීන ජාතික භික්ෂුවක් විසින් මට පෙන්වන ලදී. එහි පිළිමගෙයි තිබුණු අඩි 5 ක් පමණ උස ශාන්ත බුදුපිළිමය ඉදිරියේ මම දණ ගසා වැන්දෙමි. චීන හැඩහුරුකමක් මුහුණේ තිබුණත්, ප්‍රධාන පිළිම දෙපස තිබූ අගසව් පිළිම දෙක මගේ සිත් ගත්තේය. මම දණගසා හිස බිම තබා පන්සිල් ගෙන, ගාථා කියා කරණීය මෙත්ත සූත්‍රය ද සජ්ඣායනා කොට – භාවනා කළෙමි. අවසන මළගිය ඥාතීන්ට සහ දෙවියනට පින්දී මගේ රට ධර්මද්වීපයක් – ධාන්‍යාගාරයක් කරා ගෙන යෑමට උදව්වන ලෙස ප්‍රාර්ථනා කළෙමි.

මේ පිළිම ගෙය පිටුපස තිබුණේ මහායාන ප්‍රතිමා හා ඒ සම්ප්‍රදායට නිම වූ තවත් ලස්සන ප්‍රතිමා ගෘහයකි. එය බෝධි සත්ව පිළිමවලින් යුක්ත විය.

එතැන සිට අප ගියේ මින්ඩනාවෝ විශ්ව විද්‍යාලයටය. එහි ආචාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයිනට පැයක දේශනයක් කර පැය බාගයක ප්‍රශ්නෝත්තර සැසියක් ද මෙහෙයවීමි. මෙය සංවිධානය කර තිබුණේ ආචාර්ය පිඩෙල් මහතාය. මෙහි දී වූ එක් සිද්ධියක් මට මතකය. එනම්, අවුරුදු විස්සක පමණ තරුණයෙක් පැමිණ – තමා විප්ලවවාදියෙක් බවත්, එන්ට එන්ටම හිංසක විප්ලවය ගැන ඔහුගේ විශ්වාසය කඩ වී ඇති බවත්, ඔහුට මගේ දේශනය හුහක් ප්‍රයෝජනවත් වූ බවත් පවසා, සර්වෝදය සාහිත්‍යය ඔහුට එවන ලෙස ද ඉල්ලා සිටියේය. ඔහු මින්ඩනාවෝ විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය සංගමයේ උප සභාපතිවරයායා. ඔහුගේ නම රේනල්ඩෝ රෙඩෙස්මාය.

ඉතාමත් ම ශාන්ත – එහෙත් හුහක් කලබල වන – පුද්ගලයෙක් වූ ඇන්ග්ලෝ සමඟ ගුවන් තොටුපළට පැමිණ, මම කගායන් ඩිඕරෝ නගරයට මිනිත්තු තිහක ගුවන් ගමනකින් පසු ළඟා වුණෙමි. අප වැරදි ගුවන් යානයට නැඟීමට යැමෙන්, සමහර විට මේ යානය අපට වැරදෙන්නට තිබුණි. අඩි 16000 ක් ඉහළින් ලස්සන කඳු මිටියාවත් උඩින් අපි පියාසර කළෙමු.

ලෝක ප්‍රසිද්ධ සියර්සොලීන් ආයතනයේ මාස්ටර්සන් පියතුමාගේ ඇරියුමෙන්ය, මා මෙහි පැමිණියේ. මල් මාලා දමා කාන්තාවන් දෙපළක් අප පිළිගෙන, 'වීඅයිපී' හෝටලයට කැඳවාගෙන යන ලදී. එහි දී ආහාර ගත් අපි, මුලින්ම සහභාගි වූයේ රොටරි සමාජයේ රැස්වීමකටය.

එහිදී දේශනයක් පැවැත්වීමෙන් පසු, සේවියර් විශ්ව විද්‍යාලය හෙවත් සියර්සොලින් විශ්ව විද්‍යාලයේ විශාල පිරිසකට – ප්‍රසිද්ධ දේශනයක් කළෙමි. පසු කලෙක හර්ෂ නවරත්න මහතා ආදී වූ අපේ තරුණ සර්වෝදය සේවකයන්ට මාස්ටර්සන් පියතුමාගේ ආරාධනයෙන් මෙහි පුහුණුවක් ලබා දීමට අපට පුලුවන් විය.

සුප්‍රසිද්ධ වෛද්‍යවරයෙක් වූ පසුව, පිලිපීනයේ සෞඛ්‍ය ලේකම් සහ සෙනෙට් සභිකයකු වූ ආචාර්ය ජුවන් ෆ්ලෙවියර් ලියූ හෙවත් Doctor in the Barrio නොහොත් "ගමේ දොස්තර" යන පොත මා කියවූයේ මෙහිදීය.

මෙම විශ්ව විද්‍යාලයට එන ආගන්තුක මහාචාර්යවරුන් නිදියන කාමරයකයි, අපි නිදා ගත්තේ. දෙදෙනාම එකම කාමරයේ නිදා ගත්

පළමු අවස්ථාව මෙය විය. මෙහි දී වූ හාස්‍ය ජනක සිද්ධියක් මට මතක් වෙයි. මේ දැල්වෙන විදුලි පහන්වලට කොහොමත් මුදල් වැය වෙන නිසා, "අපි විදුලි එළිය නොනිමා නිදා ගනිමු" යනුවෙන් ඇන්ග්ලෝ මට යෝජනා කළේය. එයට එකඟ වූ මම, ඔහුට නින්ද යන තුරු විදුලි එළිය දමාගෙන පොතක් කියවූයෙමි. ඔහුට නින්ද ගිය පසු, මම විදුලි පහන් නිවා දැම්මෙමි.

කගායන් ඩි ඔරෝ නගරයේ සිට සැතපුම් දහඅටක් ඈත පිහිටි පිලිපීන්ස් පැකින් සමාගමට අයිති අක්කර දහසක අන්නාසි වත්තක් බැලීමට අපි ගියෙමු. පිලිපීනයේ පවතින විශාල පන්ති පරතරය ගැන මෙහි දී මට හොඳ අවබෝධයක් ඇති විය. පාලකයෝ සිටින නිවාස සහ කම්කරුවෝ සිටින නිවාස දකින විට ඇති–නැති පරතරය ගැන හොඳ අවබෝධයක් ඇති වේ.

ප්‍රජාව ඉතා හොඳින් සංවිධානය වී මෙම පරතරය තිබුණත් සතුටින් ජීවත් වන බව පෙනිණි. එහි පාසල්, පල්ලි, ක්‍රීඩා භූමි, රෝහල්, ගොවිපළවල් ආදී වූ විවිධ දේවල් දැක ගැනීමට අපි ගියෙමු.

ඇමරිකන් ජාතික ආයෝජකයෝ විශාල මන්දිරවල ජීවත් වූ අතර, පිලිපීන ජාතික කුඩා දැරියක් සුදු ජාතික දරුවකු බලා ගන්නා හැටි ද මම දුටුවෙමි. දුප්පත් ගම්වාසීන්ගෙන්, ගවයින් මිලට ගෙන – ගාල් – කොට මස්වලට විකුණන 'කොම්පැනියක්' ද දුටුවෙමි. එතැන සිටි කම්කරුවන් දෙදෙනෙකුගෙන් එක් අයෙකුගේ බැනියම හොඳට ම ඉරී තිබිණි.

'පැෂන්ෆෲට්', කෙසෙල් සහ වෙනත් බෝග වර්ග නවීන තාක්ෂණය යොදා, ඉතා පිළිවෙලට වගා කරන ලද ඩෙල්මොන්ටේ ගොවිපළ මගේ සිත් ඇද ගත්තේය. එතැන සිට අපට නිල්වන් සාගරය ද පෙනුණේය. ගොඩබිම තැනින් තැන ඇමරිකාවට අන්නාසි පැටවීම සඳහා ගොඩනඟන ලද විශාල අන්නාසි සකසන කර්මාන්ත ශාලා කිහිපයක්ද දුටුවෙමි. විශාල නැවක් ද නැංගුරම් ලා තිබුණේය. කුඩා බෝට්ටු කිහිපයක් ද, මසුන් අල්ලන්නන්ගේ කුඩා පැල්පත් කිහිපයක් ද, මුහුදට නුදුරින් දුටුවෙමි.

මෙහි දී මට හිටිහැටියේ ම රූපවාහිනී සාකච්ඡාවකට සහභාගිවීමට සිදු විය. එතැනට මා ඇතුලූ වන විටත්, සජීවීව ක්‍රියාත්මක වන බව නොදත්තෙමි. මා ඇතුලූ වනවිටම එතැන සිටි සෙනෙට් සභිකයකු ඇතුලූ තිදෙනෙකුගෙන්, ලංකාව – 'සිලෝන්' පිහිටියේ කොහේ දැයි වැඩ සටහන මෙහෙයවූ තැනැත්තා ඇසීය. ඔවුන් එකිනෙකාගේ මුහුණ

බැලූ අතර, එක් අයෙක් කීවේ කැරීබියන්වල යැයි කියාය. එතැන සිටි කාන්තාවක් කීවේ ඉන්දියාවට දකුණු පැත්තෙන් ඇති දූපතක් කියා ය. එකවරම මා දෙසට හැරුණු එම සාකච්ඡාව මෙහෙයවන්නා, මා වාඩි වනවාත් සමගම මගෙන් ඇසුවේ, 'ඔබ ගැහැනු ඇගමැතිවරයෙක් තෝරා ගත්තේ ඇයි? දැයි යන්න ය. 'මේ වෙලාවේ අපට සිටින හොඳ ම පිරිමියා ඇය බව' මා කී විට සියල්ලෝ ම කොක්හඬ ලා සිනාසුණෝය.

මෙම ගමනේ දී මගේ දීර්ඝ ම දේශනය කළේ, සියර්සොලීන් විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ - එකසියපනහක පමණ වූ ශිෂ්‍යයින්ටය. මගේ මාතෘකාව වූයේ 'අහිංසාවාදී සමාජ විප්ලවය' යන්නය. මේ ස්ථානයේ මට පැය තුනක් පමණ ගත කිරීමට සිදු විය.

නැවත මැනිලා නුවරට ගුවනින් ළඟා වන විට, මම ඉතාමත්ම වෙහෙස වී සිටියෙමි. එහෙත් එදා දවසේ ද, දස පාරමිතා අළලා බෞද්ධ ක්‍රිස්තියානි ධර්මයන්හි පොදු තැන් පෙන්වමින් - ක්‍රිස්තියානි පියවරු, මව්වරු, සහෝදර, සහෝදරියන් රාශියකට ම කතා කිරීමට මට සිදු විය.

ලස්සන ගැමි පරිසරයන් හි දවස් අටක් පමණ ගත කොට නැවත මැනිලා නගරයට ආ මට හැඟුණේ, පිස්සන් කොටුවකට ඇතුලු වූ ආකාරයකි. දහස් ගණන් වාහනවලින් පිටවන දුම හා ශබ්දය නිසා හිසරදයක් හැදී නිදා ගැනීමට නොහැකි වීමත් සිදු විය.

පසුව දා බැගියෝ විශ්ව විද්‍යාලයේ 'අධ්‍යාපනය තුළින් පුද්ගලයාත් සමාජයත් වෙනස් කළ හැක්කේ කෙසේ ද?' යන මාතෘකාවෙන් දේශනයක් පවත්වා, පැයක පමණ සාකච්ඡාවක් ද කළෙමි. බැගියෝ නගරය ඉතාමත්ම ලස්සන කුඩා නගරයකි. හස්ත කර්මාන්තය, කෘෂිකර්මය සහ කුඩා වෙළෙඳාමෙහි යෙදෙන පිරිස් සිටිති. බැගියෝවල රත්රන් ආකර සූරා කන ඇමරිකානුවන් පිළිබඳ - මේ පිරිස මා සමග තදින් දොස් කීහ. මා මුණගැසීමට පැමිණි බොහෝ දෙනෙක් - විශේෂයෙන් තරුණ පිරිස්, මගෙන් උපදෙස් පැතූහ. මෙහි දී ද චීන පන්සලක් බැලීමට ගියෙමි.

සෙන්ට් ලුවී විශ්ව විද්‍යාලය, සමූපකාර ඉතිරි කිරීමේ ව්‍යාපාරය, ප්‍රජා සංවර්ධන ආයතන, උසස් පාසල් මෙන්ම, කුඩා පාසල්, ප්‍රජා සංවර්ධන පුහුණු ආයතන, වෛද්‍ය විද්‍යාලය, යෝග්‍ය තාක්ෂණික ආයතන ආදී වූ ස්ථාන රැසකම, දින හතරක් තිස්සේ - වෙහෙස නොබලා දේශන පවත්වන්නටත් - ඔවුන්ට කන් දීමටත් සිදුවිය. මේ නගරයේ මා ඇමතූ රැස්වීම් ශ්‍රී ලංකාවේ ගම්බද පළාත්වල මෙන්, සමහර විට මිනිසුන් දෙදාහකට අධික සංඛ්‍යාවක් සහභාගි වූ විශාල රැස්වීම්

විය. මෙහි දී මෙන්ඩිස් නැමැති කන්‍යා සොහොයුරියක්ද, පෙරේරා නැමැති පියතුමෙක්ද, මට මුණගැසිණි. ඔවුහු මාගේ පැමිණීම ගැනත්, මා කළ දේශන ගැනත් බොහෝ ආඩම්බර වූහ.

බැගියෝවල සිට මැනිලාවලට පැමිණි පසු දවසක හෝ නිවාඩුවක් ගැනීමට මම කල්පනා කළෙමි. එය කෙසේ වත් ඉටු නොවිණි. ඡන්ද රැස්වීම්වලට යන්නාක් මෙන්, එක් තැනක දී මිනිත්තු පහ – දහයේ දේශන පවත්වමින් කුඩා පාසල්, ලොකු පාසල් පමණක් දොළහකට පමණ යෑමට මට සිදුවිය. මා ලැබුවේ පුදුම ආදරයකි; පුදුම පිළිගැනීමකි. මැග්සයිසයි ත්‍යාගලාභියෙකුට පිලිපීන ජනතාව ගෞරව කරන ආකාරය මට අවබෝධ වූයේය. බොහෝ විට මා පිළිගැනීමට පැමිණියේ නගරාධිපතිවරුන්, පොලිස්පතිවරුන් ආදී වූ සම්භාවනීය පිරිසකි.

ප්‍රාථමික සහ බාලාංශ පන්තිවල ළමයින් සඳහා මා කුඩා කතාන්තර කියා දී, මිනිත්තු දහයකට වඩා අඩු සුළු කාලයක දී ළමයින්ට යමක් ඉගෙන ගැනීමට කියාදුන් ආකාරය ගැන හැමදෙනාම මට ප්‍රශංසා කළහ.

මේ වන විට මම විදේශීය රටක සිටින්නේ යැයි යන අදහස, මා සිතින් තුරන් වී ගොස්ය. ලංකාවේ දී මා කතා කරන විලාශයට ම, කිව යුතු දේ සභ්‍ය විදියටත්, ඍජුවත් – අසා සිටින පිරිසගේ තත්වය බලා ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබී තිබේ.

පිලිපීන ජනතාවගේ ජන ශක්තිය, පාලකයිනට අහිංසාවාදීව පෙන්වන දිනය ඉතා ඈත නොවන බව, මේ වනවිටත් මට හොඳටම අවබෝධ වී තිබුණේය. පිලිපීන ජනතාව භක්තිමත් ක්‍රිස්තියානි ජනතාවකි. කතෝලික පල්ලියේ ප්‍රධානියා වූ කාඩිනල් සින් පියතුමා හැම අතින්ම, ඔවුන්ට නායකත්වය දීමට සූදුස්සෙක් විය. මට මුණගැසුණු සිය ගණන් කතෝලික පූජකවරුන්, රට පත්ව ඇති දේශපාලන සහ ආර්ථික ඒකාධිපතිත්වයෙන් මුදා–අහිංසාවාදීව ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් බවට රට පරිවර්තනය කිරීමට පැහැදිලි දර්ශනයක් අනුව ගමන් කරන බව මට ප්‍රත්‍යක්ෂ විය. ජනාධිපති මාකෝස් ගේ පාලනයෙන් කවදා හෝ මෑත අනාගතයේ දී අහිංසාවාදී ව මොවුන් රට මුදාගනු ඇත.

91

ර්නියා සංවර්ධනය හා දුප්පත් ජනතාව

මැනිලාවේ මා දී කළ ප්‍රධාන දේශනයේ හැඳින්වීමේ කොටස පමණක් සිංහලයට පරිවර්තනය කොට මෙහි පළ කරන්නේ එක්දහස් නවසිය හැත්තෑ එකේ දී පවා මා විශ්වාස කළ සංවර්ධනය පිළිබඳ අදහසක් පාඨකයා හමුවේ තැබීමටය.

ඡායාරූප: 366 – මැනිලා ජාත්‍යන්තර සමුලුව ඇමතූ අවස්ථාව

'මම ආවේ ශ්‍රී ලංකාවෙ ගමක ඉඳලයි. මගේ කාලයෙන් වැඩි හරියක් මම ගත කරන්නෙ ශ්‍රී ලංකාවෙ ගැමි ප්‍රදේශවල – මගේ සහෝදර සහෝදරියන් සමඟයි. මගේ රටේ නායකත්වය ගෙන ක්‍රියා කරන "නවීකාරකයන්" කොපමණ සිටියේ වී නමුත්, මගේ අදහස්, මගේ ආකල්ප සහ මගේ ස්වේච්ඡා සේවා වැඩ කොටස සකස් වී ඇත්තේ ගම්වල වසන මෙම "පිටස්තරයන්ගේ" සිතුම් පැතුම්වලට අනුකූලවයි. "ප්‍රතිගාමියෙක්" "විඥානවාදියෙක්" හෝ එසේත් නැතිනම් "කොමියුනිස්ට්" කාරයෙක් වැනි නම් මට පට බැඳීමේ අන්තරාදායක තත්වයක් ඇත්තේ වී නමුත්, මට ඉදිරිපත් කිරීමට නියමිතව ඇති මෙම දේශනයෙන්, මා මගේ ජනතාවගේ භාෂාව කතා කළ යුතු බව මම විශ්වාස කරනවා. තීරණ ගන්නා අයගේ ඇස්වලින් බලන විට, මේ මිනිසුන් පිටස්තරයන් හැටියට පෙනුණත්, ඔවුන් නොමැතිව ජාතියක් තිබිය නොහැකියි. ඔවුන් පාවිච්චි කරන භාෂාව දරදඬු වුවත්, ඔවුන් කතා කරන්නේ තේරුමක් ඇති දේවල්.

ආසියාව ජීවත් වූයේත්, අනාගතයේ දී ජීවත් වන්නේත් ගම්වලයි. නමුත් අද නගරය විසින් ආසියාවට පාඩම් උගන්වනවා. තව අවුරුදු බොහෝ ගණනක් ඉදිරියට ද, ආසියාවේ ග්‍රාමීය තත්ත්වය එසේම තිබෙනවා ඇති. අතීතයේ දී නගරයෙන් පිළිබිඹු වූයේ ගැමි වටිනාකම්, ගැමි සමෘද්ධිමත් බව සහ ගැමි පරමාර්ථවල වඩාත් පාරිශුද්ධ කොටසක් පමණයි. අද ඇත්තේ එහි අනික් පැත්තයි. යටත් විජිතවාදී අතීතයක නෂ්ඨාවශේෂ වැඩියෙන් පිළිඹිබු කරන අගැයීම්වලින් අනූන වූ ද, ආනයනය කරන ලද අවුල් සහගත කාර්මික මහා පරිමාණ පරිභෝජන ශිෂ්ඨාචාරයක තත්වයන් ප්‍රදර්ශනය කරන්නා වූද ආසියාතික නගරය විසින් අද ගැමි ජනතාව පාලනය කරනු ලබනවා.

අතීතයේදී ශාන්තුවරයින්ගේ හා ගෞරවනීය වැඩිහිටියන්ගේ ජීවමාන ආදර්ශවලින් ගැමි ආසියාව පෝෂණය වුණා. මිනිසා සොබා දහම සහ සම්පත් සංවිධානය කිරීම සම්බන්ධ වූ අරමුණු සහ ක්‍රමවල සුබනම්‍ය ඒකාග්‍රතාවයක් පැවතුණු අතර, එම ව්‍යායාමයේ අවසාන පොදු අරමුණ වූයේ, සියලුදෙනාටම ජීවත්වීමේ ප්‍රීතිය ළඟා කර දීමයි. ආසියාතික සංස්කෘතියේ මෙම තත්ව – සාරධර්ම නිගමනය කරන්නවුන් විසින් සම්මත කරන ලද අගැයීම්වලට, ඒ කාලයේ ජීවත් වූ ප්‍රබල යුද්ධ නායකයන් පවා හිස නැමුව.

ඉන්පසු යටත් විජිත වාදීහු පැමිණ ඔවුන්ගේ "උසස්" අගැයීම්, ඔවුන්ගේ දියුණු ක්‍රම උපක්‍රම සහ ඔවුන්ගේ නවීනතම ශිල්ප ක්‍රම සහ ආයතන අපේ මිනිසුන්ගේ කරපිට පැටෙව්වා. ඔවුන්ගෙන් වැඩි දෙනෙකු කොල්ලකා ගත් දේවල් ද රැගෙන – ශාරීරික වශයෙන් ආසියාවෙන් ඉවත්ව ගිහිල්ල. එනිසා ඇති වූ හිස් තැන පිරවීම පිණිස ඔවුන්ගේ ක්‍රමයට "අධ්‍යාපනය" ලබා දී දේශීය ජනතාව අතරින් මතු කර ගන්නා ලද මිනිසුන් කොටසක් ඔවුන්ගේ කලින් යටත් විජිතවල නායකයන් හැටියට ඔවුන් ඉතිරි කර ගියා. යටත් විජිතවාදීන් විසින් ශත වර්ෂ ගණනාවක් තිස්සේ ගොඩනංවන ලද සංවිධානයන්, අණසක පිළිබඳ හැඟීමක් මෙන්ම, නිදහස පිළිබඳ මායාවක් ද ඉතිරි වුණා. පුරාණ ශාන්තුවරුන්ගේ හා වැඩිහිටියන්ගේ අණසක තවදුරටත් පැවතුනේ නැහැ.

මෙම නවීන බලවතුන් විසින් ඔවුන් හඳුන්වා ගනු ලබන්නේ වරප්‍රසාද ලත් උගත් පැලැන්තිය හැටියටයි. දේශපාලනමය, ව්‍යාපාරික රාජ්‍ය තාන්ත්‍රික, ආර්ථික සැලැසුම් සකස් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ අංශවල, අනිකුත් වෘත්තිවල මෙන්ම – ග්‍රාම සංවර්ධනය නමින්

හැඳින්වෙන වැඩ කටයුතුවල ද මේ අය ඉන්නව. මෙම ඉහළ පැලැන්තිය "සංවර්ධනය වන" හා "සංවර්ධනය වූ" යන අන්දමින් ලේබල් ගසාගෙන වෙන් කර ගෙන ඇති ලෝක දෙක අතර සන්නිවේදන පරතරය පියවන පිරිස හැටියට ද පෙනී ඉන්නව. ඔවුන් වැඩ කරන්නේ නිහඬ – විවේකී – ගැමි පෙදෙස්වල නොව, නගරබද කලබැගෑනියෙන් නොඅඩු වීදිවල පිහිටි තට්ටු ගණනාවකින් යුක්ත වූ ද, සීතල වායුව පිර වූ සැප කාමරවලින් යුක්ත වූ ද, කොන්ක්‍රීට් ගොඩනැගිලි තුළයි. ඔවුන් සංවර්ධනය වන සහ සංවර්ධිත ජනතාව අතර පාලමක් බවට සැකයක් නැතුවාක් මෙන්, ඔවුන්ගේ සැලසුම් සැකසුම් කිරීමේ මන්දිරවල කටයුතු කෙරෙන්නේ ඒ දෙපැත්ත වෙතම බැල්මක් ඇතිවයි.

මේ කියන ඉහළ පැලැන්තිය එකම සංවිධානයට අයත් වූවත් ඔවුනොවුන්ට පමණක් විශේෂ වූ තත්වයන් ද ඇති කරගෙන තියනව. සමහර විට, ඔවුන් අතරම භේද සහ සණ්ඩු දබර ඇතිවෙනව. මේවාට මුල් වන්නේ දෝෂාරෝපණය ලැබිය යුත්තේ කවුද? වගකීම බාරගත යුත්තේ ඉහල පැලැන්තියේ කොයි දේශපාලන කණ්ඩායමද? කොයි නිලධාරි කණ්ඩායම ද? නැතිනම් කොයි ආර්ථික සංවිධානයද? වැනි ප්‍රශ්නයි. මේ සණ්ඩු සරුවල් ඉතා ඉක්මණින් ම සමථයකට පත් වෙනව. සංවිධානය හෙවත් හවුල විනාශ වීමට ඉඩ දීමට නොහැකියි. මේ අතර, අතේ දුරින් තබාගෙන සිටිනු ලබන සාමාන්‍ය ගැමි ජනතාව, වඩා හොඳ හෙටක් සහ දීප්තිමත් අනාගතයක් කෙරෙහි බලාපොරොත්තු තබා ගෙන ජීවත්වෙනව.

මේ කියන ඉහළ පැලැන්තිය, ආසියාවේ ජනතාවගෙන් ඉතාමත් සුලු පිරිසක් වන අතර, ඔවුන්ගේ සංවිධානයෙන් පිටස්තර ජීවත් වන අයට අවශ්‍ය දේ සහ අභිමතාර්ථයන් අකුරට, දන්නව. ඒ අනුවම ඔවුන් ඒ ජනතාව සඳහා සැලසුම් සකස් කර -- බොහෝ විට එම ජනතාව වෙනුවෙන්, විශේෂයෙන් ජාතික සහ ජාත්‍යන්තර මට්ටමෙන් ක්‍රියා කරනවා. අසරණ තත්වය, සංවිධානයක් නැතිකම සහ අවුල් සහගත තත්වය යටතේ ජීවත්වන ගැමි ජනතාව, බාගෙට බඩගින්නෙන් එදිනෙදා දිවි ගැට ගසා ගැනීමට සටන් කරන අතර, ඉහළ පැලැන්තියේ අයගේ සැලසුම් සාදා ඇති ආකාරය ගැන අවබෝධයක් නැති වුවත්, එම පැලැන්තිය සහ ඔවුන්ගේ සැලසුම් කෙරෙහි විශ්වාසය තියනව.

"ගැමි දුප්පතුන්" වෙනුවෙන් ඔවුන් හඬ නගා කතා කරනව. එපමණක් නොව, අප්‍රතිහත ධෛර්යයෙන් යුතුව – එහෙත් අමාරු තත්වයට පත්ව – නගරයේ මුඩුක්කුවලට සංක්‍රමණය වූ ඔවුන්ගේ

සහෝදර නෑදෑ හිතවතුන් වෙනුවෙන් ද, ඔවුන් කටයුතු කරනව. එබඳු "අවබෝධයක් ඇති" පුද්ගලයන්ට පමණක් තේරෙන්නා වූ යෙදුම් හා තර්කවල මාර්ගයෙන් නිතරම ක්‍රියාත්මක වන ඔවුන්ගේ දුප්පත් ජනතාවට ආධාර පිණිස ඉදිරිපත් වන ලෙස සංවර්ධනය වූ ලෝකයේ ආණ්ඩු, සංස්ථා හා දේශපාලනමය පුද්ගලයන් පොළඹවනව.

දේශීය ඉහළ පැලැන්තිය ආර්ථික හා දේශපාලනමය වචන හරඹයේ කෙළ පැමිණි පුද්ගලයන් නිසා, ප්‍රධාන පෙළේ ආධාර වැඩ පිළිවෙලවල් සමඟ සාර්ථක ලෙස සාකච්ඡා පැවැත්වීමට – එය ඔවුන්ට උපකාරී වෙනව. කෘතගුණ සැලකීමක් වශයෙන් "සංවර්ධිත ලෝකයට" දේශපාලන සහ ආර්ථික සහන සැලසීමට වුවත් ඔවුන් සූදානම්. මේ ඊනියා සංවර්ධනය වන රටවල ඉහළ පැලැන්තියත් – සංවර්ධිත රටවල සිටින සගයනුත් අතර සන්නිවේදන මාර්ග ඉතාමත් පැහැදිලිව – හොඳ තත්වයේ පැවතීම අත්‍යවශ්‍ය නමුත්, ඉහල පැලැන්තියත් ඔවුන්ට සේවය කරන බව කියන ගැමි ජනතාවත් අතර එබඳු සම්බන්ධකමක් ඇති කරලීම ගැන කිසිදු සැලකිල්ලක් දක්වන්නෙ නෑ. ඉහළ පැලැන්තියේ අය අතරින් කලකට වරක් නුසුදුස්සන් ඉවත් කිරීම සිදුවෙනව. සංවිධානයේ පිළිගත් සම්ප්‍රදායන්ට අනුකූලව ක්‍රියා නොකර, අනවශ්‍ය පරිදි හිසරදයක් බවට පත්වන අය – කාලයාගේ ඇවෑමෙන් කොන්කර දමනු ලබනව.

"ඉහළ පැලැන්තියේ ලබන්නන්" සහ "සංවර්ධිත දෙන්නන්" අතර ඇතිවන සාර්ථක හවුලේ ප්‍රතිඵලය වශයෙන්, බොහෝ විට ආදර්ශ ව්‍යාපෘති සහ සමහර විට ආදර්ශ ජාතීන් පවා බිහිවෙනව. දැනට ආසියාවේ සිදුවෙන්නාක් මෙන් අන්ත දුගී තත්ත්වයේ තිබුණත්, අවුල් සහගත දේශපාලන අර්බුදවලට මැදිවී පැවතුණත්, මේවාට බාධාවක් නැහැ. මෙම "ආදර්ශ" අනුගමනය කළ යුතු ඒවා බවත්, ආසියාවේ කුස ගින්නෙන් සිටින කෝටි සංඛ්‍යාත ජනතාව වෙනුවෙන් ඒකාබද්ධ ප්‍රයත්නයක් මගින් ගත හැකි නිවැරදි ක්‍රියා මාර්ගය එය බවත්, අපට කියා දෙනව. කෙසේ වෙතත් මේ ආදර්ශ සඳහා ඇගයීම් සහ තත්වයන් නිගමනය කරන්නේත් මේ ඉහළ පැලැන්තිය විසින්මයි. "අඥාන" පොදු ජනතාව විසින් කළ යුතුව ඇත්තේ, අර ඉහළ පැලැන්තිය විසින් කරනු ලබන දේවල් දෙස බලා – ඒවා අගය කර පුන පුනා අනුමත කිරීම පමණයි. මේ අතර සාමාන්‍ය ජනයා අතර ඉන්න උද්‍යෝගිමත් කාර්ය ශූර අයට අනුබල දෙනව – ඉහළ පැලැන්තියේ තත්වයට සංවර්ධනය වන්නටත්.

සමහර ගැමි ජනයා "මොට්ට" අයයි. ඉහළ පැලැන්තිය විසින් ඉදිරිපත් කරනු ලබන සංවර්ධන කටයුතුවල ඉලක්ක, අරමුණු සහ ශිල්පීය ක්‍රම ගැන ඔවුන් ප්‍රශ්න කරනව. ගතානුගතික අතීතයක පා ඔබා ගෙන සිටින ඔවුන්, අනාගතයේ නාමයෙන් ඉහළ පැලැන්තිය සහයෝගය ඉල්ලූ විට – එය දීමට ඉදිරිපත්වීමට සූදානම් නැහැ. බලාපොරොත්තු වන තරමේ වෙහෙස වී වැඩ කිරීම, කීකරුකම, ක්‍රමවත් බව හෝ විනය ඔවුන්ට නැති බවයි – ඉහල පැලැන්තිය කියන්නෙ. අලුත් ක්‍රමය ක්‍රියාවට නංවන අයගේ කළමනාකාරිත්ව හැකියාවන් ගැන ඔවුන් ප්‍රශ්න කරනව. එයින් බොහෝ දෙනාගේ අවංකකම ගැන පවා සැක සිතෙන අතරම, ගැමි ප්‍රශ්න ගැන ඔවුන් තුළ ඇති බව කියන දැනීම ගැන ද ගැමියෝ ප්‍රශ්න කරනව.

දේශපාලන අධ්‍යාපන, වාණිජ, යුද්ධමය, පරිපාලන, තාක්ෂණික සහ ක්‍රම සම්පාදන වශයෙන් නොයෙකුත් මට්ටම්වල සිට පාලනය කරනු ලබන ඉහළ පැලැන්තියේ අය ගැන ගැමි ජනතාව ප්‍රශ්න නඟන්නේ ඔවුන්ගේ මිථ්‍යා විශ්වාස සහ "අඥානකම" නිසයි. සංවර්ධනය වන ලෝකයේ ප්‍රශ්න මාස ගණනකින් විසඳීම විජ්ජාවකින් මෙන් කිරීමට ක්‍රමයක් ඔවුන්ට නැත්තේ වී නමුත්, මේ ජාතීන් හට අරමුණක් සහ ස්ථාවරත්වයක් ලබා දුන්නේ ඔවුන් විසින් බව, ඉහළ පැලැන්තියේ අය කියා හිටිනව.

ඉහළ පැලැන්තියේ මේ වරප්‍රසාද ලත් කොටස ප්‍රශ්න ද අසති: "උගත් ඉහළ පැලැන්තිය වන අපේ බලතල ඉවත් කර දමා, සාමාන්‍ය ජනයාට ඔවුන්ගේ පොදු අරමුණු ඇති කරගෙන ඒවා විසඳීමට ඔවුන්ටම ඉඩ දුනහොත් – අවුල් සහගත තත්වයක් ඇති වෙන්නේ නැද්ද? අනික් අතින් බලන විට, සාමාන්‍ය ජනතාව, ඔවුන්ට බැරි වුවත්, අඩු ගණනේ ඔවුන්ගේ දූ දරුවන්ගෙන් සියේට එකකටවත් විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබා දී , දැනට විශේෂඥයන්ගේ බර වචනවලට සීමා වී ඇති නූතන ආර්ථික සැලසුම් සකස් කිරීම පිළිබඳ අවංක උත්සාහයක් නොදැරිය යුතු ද?"

"සංවර්ධිත ලෝකය" – නිදසුනක් වශයෙන් කිවහොත්, බටහිර යුරෝපය – අද ලබන ඒක පුද්ගල ආදායම වන අමෙරිකානු ඩොලර් 1250 දක්වා දියුණුවීමට පෙර, ශත වර්ෂ ගණනක් ඉතා වෙහෙස මහන්සි වී වැඩ කිරීමට සිදුවූ බව ඉහළ පැලැන්තිය කියනව. සමහර රටවල පවතින තත්වය අනුව, තරුණ පරපුරට තවත් අඩු ගණනේ අවුරුදු හතලිස් පහක් ඉවසා ගෙන ඉන්න බැරි ඇයි? ඔවුන් කළ යුතුව

ඇත්තේ ඉහළ පැලැන්තිය දෙන උපදෙස් අනුව ඉවසිලිමත්ව, මහන්සියෙන් වැඩ කර විට, වර්තමාන වාර්ෂික වැඩීමේ ප්‍රමාණය 2.1 සිට 5 දක්වා වැඩි කිරීම පමණයි. ශත වර්ෂවලින් ගණන් බලන කොට අවුරුදු 45 ක් කියන්නෙ ඉතා සුලු කොටසක් නොවෙයි ද?

නමුත් තරුණයෝ, ඒ අයගේ වැඩිහිටියන්ටත් වැඩිය "මොට්ටයි". වැඩිහිටියන්ගේ මොට්ට කම්වලට නම් සමාව දෙන්න පුලුවන්. ඒ වුණාට යන්තම් අධ්‍යාපනයක් ලබාපු, පළපුරුද්දක් නැති, කලබලකාරී තරුණයෝ නම්, ඉහල පැලැන්තිය නමැති සංවිධානයට පමණක් නොවෙයි, මුලු මහත් ශිෂ්ඨ ලෝකයටම තර්ජනයක්. ඔවුන්ට ලියන්න – කියන්න උගන්නල තියෙන්නෙ මහජන මුදලින්. ඒ මුදල වියදම් කරන්න පියවර ගත්තෙ ඉහළ පැලැන්තියේ අයයි. ඒත් තරුණයෝ කෙළෙහි ගුණ අමතක කරලා කැරලි ගහනවා. විශාල වශයෙන් උද්ගත වූ රැකී රක්ෂා නැතිකමත්, සුදුසු රක්ෂා නැතිකමත් ඇත්ත වශයෙන් විදේශ විනිමය අර්බුදයේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ දෙයක්. ඇත්තටම තරුණයන්ට ටිකක් ඉවසන්න බැරි ඇයි?

මේ අවස්ථාවේදී තරුණ–තරුණියො කියනව, "හොඳයි අපි ඉවසන්නම්. තමුසෙලත් ඉවසනව. තමුසෙලාගෙ වරිගෙ අයටත් ඉවසන්න කියනව" කියල. ඉහළ පැලැන්තියෙ අය මේ කිසිවක් කරන්න සූදානම් නැති වගට සැකයක් නෑ. ඔවුන්ගේ ප්‍රගතිය කරා යන ගමන, බලා සිටීම මගින් අවහිර කර ගැනීම නිසා කිසිම හොඳක් සිදුවේ යයි ඔවුන් විශ්වාස කරන්නෙ නෑ.

"නොමඟ ගිය නොමේරු" තරුණයො සමහර විට දරුණු ක්‍රියාවලටත් පෙළඹෙනව. සමාජයේ යහපත උදෙසා ඔවුන් තමන්ටත් – අනුන්නටත් හිංසා කරන්ට උත්සාහ කරනව. යටත් කර ගනු ලැබූ ජනතාවගෙන්, යටත් විජිතවාදී පාලකයන් ආරක්ෂා කර ගැනීමට උපයෝගි කරගත් බලය මෙතැනදීත් ප්‍රයෝජනයට ගන්න වෙනව, තරුණයින්ගේ ප්‍රහාරයෙන් ඉහළ පැලැන්තිය ආරක්ෂා කර ගැනීමට. ඒ වුවත්, මේක කරන්න වෙලා තියෙන්නෙ සමාජයේ ස්ථාවරත්වය රැක ගැනීමේ නාමයෙනුයි. එහෙම නොකළොත්, මේ පැලැන්තියෙ අයත් – අර කලින් පිටමං වෙලා ගිය ඔවුන්ගේ යටත් විජිතවාදී ස්වාමිවරුන්ගේ ගොඩටම දාලයි මහජනයා සලකන්නෙ. අනික් අතින් බලන විට රටේ අවුල් සහගත තත්වයක් සහ දරුණු ක්‍රියා තියන ඉහළ පැලැන්තිය කොහොම ද සංවර්ධනයක් කරන්නෙ?

සාමාන්‍ය කාලවලදී ඉහල පැලැන්තියත් – ඒ අය අතරේ දබර ඇති කර ගන්නව. නමුත් ඔවුන්ගේ භාෂාව ජනතාවට තේරෙන්නෙ නැහැ.

මහජනයා සඳහා යථාර්ථය ඇත්තේ ඔවුන් වෙනුවෙන් කටයුතු කරන අයගේ ක්‍රියාවන් සහ අවංකකම මතයි. සාමාන්‍යයෙන් ඉහළ පැලැන්තියේ අයගේ පක්ෂපාතීකම් ලෝකයේ විවිධ කොටස්වල – විවිධ සුබ සාධක කටයුතුවල යෙදී සිටින අය අතරේ බෙදිලයි තියෙන්නෙ. ඔවුන් ලෝක තුනක් ඇති කරගෙන තියනව. ඒවාට 'පළමුවෙනි ලෝකය, දෙවෙනි ලෝකය සහ තුන්වෙනි ලෝකය' කියල ඔවුන් කියනවා. ආසියාවෙ අප්‍රිකාවෙ සහ ලතින් ඇමරිකාවේ ගැමි ජනතාව ඉන්නවයි කියන්නෙ මේ තුන්වෙනි ලෝකෙයි. නොවැළැක්විය හැකි හේතූන් නිසා ම, මේ අපේ ඉහළ පැලැන්තියේ අය පෙනී සිටින්නේ තුන්වෙනි ලෝකයේ සාමාන්‍ය ජනතාවගේ නියෝජිතයින් හැටියටයි. ඊට හේතුව, ඔවුන් වෙනුවෙන් සිතීම, ඔවුන් වෙනුවෙන් කතා කිරීම, ඔවුන් වෙනුවෙන් ණය සහ ආධාර ලබා ගැනීම, ඔවුන් සඳහා සංවර්ධන ව්‍යාපෘති සහ සුබ සාධක වැඩ පිළිවෙලවල් ක්‍රියාත්මක කිරීම, ඒවායේ සාර්ථක – අසාර්ථක භාවය ගැන ඔවුන් වෙනුවෙන් වාර්තා කිරීම, ඔවුන් වෙනුවෙන් ණය ආපසු ගෙවීම සහ අවසාන වශයෙන් ඔවුන්ට ඉදිරියට හොඳ කාලයක් සහතික කරදීම යන සියලුම දේවල් ඉහළ පැලැන්තිය විසින්ම කිරීමයි.

මෙම ඉහළ පැලැන්තිය අතරින් පක්ෂ දේශපාලනඥයන් හැටියට හැඳින්වෙන කොටස සමහර විට ඔවුන්ගේ දබර ගම් ප්‍රදේශවලටත් අරන් යනව. මැතිවරණයේ දී චන්ද පත්‍රිකාවේ කතිරයක් ගැසීමෙන්, ඔවුන්ගේ දබරයට මුල් වූ ප්‍රශ්න ගැන විනිශ්චයක් දෙන ලෙස ජනතාවට කියනව. දිනපු පැත්ත අනුව ගමේ ටික දෙනකුට පමණක් වාසි ලැබෙනවා. මැතිවරණය නිසා ගමේ මහජනයාටත් සංවර්ධන සම්බන්ධතාවලටත් සිදු වූ අලාබයත්, හෙමින්–හෙමින් ප්‍රකෘති තත්වයට පත් කර ගැනීමට අනික් අය වෙහෙසනව. සදාකාලික ව පරිපාලනය ගෙන යාමේ නිරතව සිටින ඉහළ පැලැන්තියේ නිලධාරීන්ගෙන්, දේශපාලන ඉහල පැලැන්තියේ "වැරදි පැත්තට" ඕනෑවට වැඩියෙන් හේත්තු වී සිටි අය හැරුණු විට, අනික් අය දිගටම ඒ පාලනය ගෙන යනව. වැරදි පැත්තට හේත්තු වූ අයට සිදුවන්නේ බලයට පත් අයගේ හිතවත් අයට ඉඩ දී තැන් මාරු කර ගැනීමයි.

ඉතින් ඔන්න ඔය විදියටයි – ගැමි ජීවිතය ගත වෙන්නෙ. පරිපාලනයේ වැදගත් තැන්වලට වී තම තමන්ගේ කාර්යක්ෂමතාව ඔප්පු කළ ඉහළ පැලැන්තියේ අය – සමහර විට ජාත්‍යන්තර සංවර්ධන ආයතනවලට උසස්වීම් ලබනව. සමහර අය පහළට වැටී ගම්බද නොදියුණු ජනතාව අතරට පත්වෙනව. ඒත් ගමේ ජීවිතය දිගටම කෙරෙනව. ඒ අතර මා කලින් කිව්ව වගේ සමහරු මේ ඉහළ පැලැන්තියේ අයගේ ප්‍රගතිය හා සංවර්ධනය කරා යන ආකාරය ගැන ප්‍රශ්න කරනවා. තමන්ගේ ජීවිතයත්–මරණයත් සම්බන්ධ ඉතාමත් වැදගත් වූ මේ කටයුත්තේදී, ඔවුන්ටත් ඊට හවුල් විය හැකි අන්දමින් එම වැඩ කරන ක්‍රමයේ සම්පූර්ණ වෙනසක් ඇති කරන ලෙස ගැමියෝ කියා හිටිනව. ඔවුන් සම්පූර්ණයෙන් හරි වෙන්න බැරුව වගේම– සම්පූර්ණයෙන්ම වැරදි වෙන්නත් බැහැ. කෙසේ වෙතත් මේ ඉහළ පැලැන්තියේ අයගේ සේවය දෙනවායි කියන ගැමි ජනතාව, සංඛ්‍යා වශයෙන් බලන විට ඉතාමත් බලවත්. ඉහළ පැලැන්තියේ අයගේ සංවිධානය සම්පූර්ණයෙන්ම හරිය කියන්නත් බැරි නිසා, ගැමි ජනතාවටත් වැඩ කරල පෙන්වන්න අවස්ථාවක් දීම වැදගත් විය හැකියි.

මෙම ඉහළ පැලැන්තිය වරප්‍රසාද ලත් කොටසක් හැටියට විස්තර කිරීමට මම අකැමැතියි. මෙතරම් දීර්ඝ කාලයක් තිස්සේ නුගත් පොදු ජනතාව වෙනුවෙන් තීරණ ගැනීමේ කොටස රඟ පෑ ඔවුන්ට – එය අත්හැර දැමීම කොතරම් අපහසු දෙයක් ද යනු මම දන්නව. කාලයාගේ අවශ්‍යතා සහ ඔවුන්ගේ හෘදය සාක්ෂිය එක් පැත්තකිනුත්, ඔවුන්ගේ චිරාගත ආඩම්බරකම සහ වංචා සහගත බව අනික් පැත්තෙනුත් ඇතුව, හිත ඇතුළේ ලොකු සටනක් කරමින් ඔවුන් බොහෝ දෙනෙකු ජීවත්වන බවත් මම දන්නව.

මම බොහෝ විට ගැමි ජනතාවගෙන් අහනව – ඔවුන් ජීවත්වන පිටස්තර ලෝකයේ මොකද වෙන්නෙ කියල? මේ ගැමි ජනතාව දන්නවයි කියල ඉහල පැලැන්තිය හිතන ප්‍රමාණයට වැඩියෙන් – ඇත්ත වශයෙන් ඔවුන් දන්නා බව පේනව. මිනිසා විසින් මිනිසා සූරා කන්නෙ කොහොම ද කියල ඔවුන් දන්නව. මිනිසා–මිනිසා මරන හැටිත්, ස්වභාව ධර්මය විනාශ කරන හැටිත්, ඔවුන් දන්නව. මිනිසා–මිනිසා මුලා කර, ස්වභාව ධර්මය මුලා කරන්න උත්සාහ කරන හැටිත් ඔවුන් දන්නව. ඔවුනොවුන් විනාශ කරලීම පිණිස, මිනිසා–මිනිසා මත් කරන ආකාරයත් ඔවුන් දන්නවා. "සංවර්ධිත" ජාතීන් අසත්‍ය, දාමරික

කම් හා ආත්මාර්ථකාමී බවින් පිරි තිරිසන් තත්වයට පත්ව ඇති සැටි දකින ගැමි මවක්, බියෙන් තැති ගන්නව. මිනිසා තුළ මිනිස් ගති ගුණ දියුණු කරන්නේ නැතිව, ලෝකය දියුණු කිරීමෙන් පලක් නැතැයි කියන සත්‍යයත් ඇය දන්නවා.

අද ඇති සංවර්ධනය ඇය දකින්නේ, මහා විනාශයක් කරා මුහුණ ලා යන ගමනක් හැටියටයි. අචේතනික විද්‍යාව සහ තාක්ෂණික ඥානය ඉදිරියේ ගැමි ජනතාවගේ දර්ශනය අමතක කර දමන්නට බැහැ. අනික් අතින් බලන විට, ඉහළ පැලැන්තිය ගැමි ජනතාවගේ ලොක්කන් හැටියට නොව, ගැමි සංස්කෘතියේ අඛණ්ඩ අංශයක් හැටියට එක්සත් කරලීමට අවශ්‍ය මාර්ගය එම ගැමි ජනතාවගේ ඇට්ටකුණා නොවූ, චාම් චින්තනය තුළ තිබෙන්නට පුලුවන්. ගැමි මවක් සිතන පරිදි, මිනිසා–මිනිසාට ආදරය කිරීම, මිනිසා–මිනිසා සමඟ බෙදා හදා ගැනීම, මිනිසා මිනිසා උසස් කොට සලකා කටයුතු කිරීම, මිනිසා මිනිසා වෙනුවෙන් කැපවීම සහ මිනිසා විසින් මිනිසාගේ බුද්ධිය දියුණු කිරීම යන පදනම මත සිටයි අපි මේ කටයුත්ත පටන් ගත යුත්තේ. අපට මුලු වටයක්ම හැරී යන්න සිද්ද වෙන්න පුලුවන්; නමුත් එය කළ යුත්තක්. කොතරම් ඉහළ පැලැන්තියේ මිනිසෙකුගේ හෝ පාලනයේ ග්‍රහණයට අසු නොවන ඊනියා නවීන සංවිධානයකට යටත් වීමට මිනිසා ප්‍රතික්ෂේප කරනව. මෙම ආත්ම අවබෝධයත් – ආත්ම අධිෂ්ඨානය සහ ආත්ම ගෞරවයත් ඒකාබද්ධ කර – ඒ මත ආසියාතික ග්‍රාම සංවර්ධන වැඩ පිළිවෙල ගොඩ නැගිය යුතු බවයි, මා විශ්වාස කරන්නෙ. මා ඉදිරිපත් කරන පත්‍රිකාවෙන් මා ඉතා නිහතමානී ලෙස උත්සාහ කරන්නේ, ප්‍රධාන වශයෙන් ගම්වල වැඩ කර – මා ලබා ගත් පළපුරුද්ද පදනම් කර ගෙන මේ උත්සාහය කෙතෙක් දුරට සාර්ථක කර ගත හැකිද කියල විපරම් කර බලන්නටයි."

ඉහත සඳහන් හැඳින්වීමේ කොටසින් පසු – මානව නිදහස – බහුතර ජනතාවට සැබෑ කරලීම, දරිද්‍රතාව මුලුමණින් නැති කිරීම, පාරිසරික විනාශයෙන් පෘථිවි ගෝලය බේරා ගැනීම සහ යුද්ධය සහමුලින්ම පිටුදැකීම යන අරමුණු ඉටු කර ගැනීම සඳහා සර්වෝදය දියත් කළ ඇති මාර්ගය විස්තර කළෙමි.

92

පීට් ඩයික්ස්ට්‍රා මහතා



ඡායාරූප: 367

පීට් ඩයික්ස්ට්‍රා මහතා සමග

එක්දහස් නවසිය හැටේ දශකය – එක් අතකින් සර්වෝදය දර්ශනය සහ ශ්‍රමදාන ක්‍රියා මාර්ග ශ්‍රී ලංකාවේ සංස්ථාපිත වූ දශකයකි. අනික් අතින්, ජාත්‍යන්තර දේශපාලනය සහ ආර්ථිකය පිළිබඳ මගේ දැනීම පුළුල් වූ දශකයකි. අපේ අසල්වැසි රාජ්‍යය වන භාරතයට කිහිප විටක් ම යෑමට ලැබීමත්, පිලිපීනය, තායිලන්තය, ඊශ්‍රායලය, එංගලන්තය, බෙල්ජියම, නෙදර්ලන්තය, ස්වීඩනය, ජර්මනිය, නෝර්වේ, ස්විස්ටර්ලන්තය සහ ප්‍රංශය ආදී රටවලට විවිධ සම්මේලන, කාර්ය සැසි සහ දේශන සඳහා යෑමට ලැබීමෙන් මගේ දැනීම සහ අත්දැකීම් ඉතා පුළුල් විය. එහෙත් මේ සියල්ලටම වඩා වැදගත් ප්‍රායෝගික අධ්‍යාපනයක් මා ලැබුවේ, ලෝක තරුණ සම්මේලනයේ විධායක සභිකයෙකු ලෙස – එක්දහස් නවසිය හැටඅටේ දී පමණ තේරී පත් වූ පසුවය. බ්‍රසල්ස්වල පිහිටි එහි මූලස්ථානයේ රැස්වීම් සහ විවිධ ක්‍රියා මාර්ගවලට සහභාගිවීමට අවස්ථාව ලැබුණු නිසා මගේ දැනුම මුහුකුරා ගියා සේ දැනිණි.

එවකට ලෝක තරුණ සමුළුවේ ප්‍රධාන විධායක ධූරය හෙවත් මහලේකම් ධූරය ඉසිලුවේ ජෝති ශංකර් සිං නැමැති තිස් හැවිරිදි තරුණ ඉන්දියානු මහතෙකි. එතරම් උස නැති එහෙත් උසට සරිලන මහතින් යුක්ත වූ ජෝති ශංකර් සිං මහතා, මට පෙනුණේ අහිංසාවාදී – එහෙත් විප්ලවීය ලෝක තරුණ ව්‍යාපාරයක අණ දෙන නිලධාරියා මෙනි. ජෝති ශංකර් විවාහ වී සිටියේ බාබරා නැමැති ස්පාඤ්ඤ ජාතික

තරුණියක් සමඟය. ඔවුන්ට ලස්සන හුරතල් පුතුන් දෙදෙනෙක් සිටියහ.

ඔහුගේ දෙවැනියා මෙන් ක්‍රියා කළේ ලෝක තරුණ සමුලුවේ නියෝජ්‍ය මහලේකම්වරයා වූ පීට් ඩයික්ස්ට්‍රා මහතාය. පීට් ඩික්ස්ට්‍රා ජීවත් වූයේ නෙදර්ලන්තයේ, ඇල්ක්මාර් නගරයට නුදුරු බෙරගන් නැමැති ලස්සන ගමකය. ඔහුගේ බිරිඳ ෆ්‍රෙනී නම් වූ කාර්යයශීලී කාන්තාවකි. ඒ කාලයේ ඔවුන්ට පුතෙක් සහ දුවක් ද සිටිය හ. ගෙදර දොරේ කටයුතුත්, පීට්ගේ පෝක්ස්වෝගන් රථය එළවන රියැදුරු හැටියට පිරිමියෙක් මෙන් ක්‍රියා කළේත් ෆ්‍රෙනීය.

පීට් – නිවුනු, බුද්ධිමත්, හැම දෙයක් ගැනම ගාන්ධි දර්ශනයෙන් යුතුව ක්‍රියා කළ බුද්ධිමත් අධ්‍යාපනඥයෙකි. ඒ ප්‍රදේශයේ තිබෙන උසස් පාසල් ඇතුලු ප්‍රජා මධ්‍යස්ථාන සහ අධ්‍යාපන මධ්‍යස්ථාන සමඟ ඔහු ක්‍රියාකාරී උපදේශකයෙක් වශයෙන් කටයුතු කළේය. යුරෝපයට පළමුවෙන් ම මට ආරාධනා කොට, එහි කැඳවා ගෙන ගියේ පීට්ය. මට වඩා ටිකක් වැඩිමහල් කෙනෙක් වුවත්, ඔහු මගේ ගමන් මලු උසුලාගෙන මට මඟ පෙන්වන්නා සහ ආරක්ෂකයා මෙන්ම, බෙල්ජියමේත් නෙදර්ලන්තයේත් අස්සක් මුල්ලක් නැර මා කැඳවාගෙන ගියේය. යුරෝපීය සමාජය දෙස මට උපේක්ෂාවෙන් බැලීමට මඟ පෙන්වූයේ ඔහුය. ගාන්ධි අනුගාමිකයෙක් වශයෙන් කෙසේ හෝ සර්වෝදය සංසදය යුරෝපීය සිතියමට ඇතුලු කරන්න වෙහෙසුණේ පීට්ය.

ඡායාරූප: 368 – පීට් ඩයික්ස්ට්‍රා මහතා මෙත් මැදුරේ දී

බෙල්ජීයමේ ලිජ්ජීවල පැවැති ලෝක ආහාර සම්මේලනයේ දේශනයක් පැවැත්වීමට මට ආරාධනා ලැබෙන්නට සැලැස්වූයේ පීටිය. එමෙන්ම, යුරෝපයේ පාර්ලිමේන්තුව ඉදිරියේ දියුණු වන රටවල් පිළිබඳ දේශනයක් පැවැත්වීමේ භාග්‍යය මට උදා වූයේත් පීට් ඩයික්ස්ට්‍රා විසින් පසුබිමේ සිට කරන ලද හඳුන්වාදීම නිසාය.

ඡායාරූප: 369
චන්ද්‍රා සොයිසා මහතා

නොවිබ් ආයතනයේ මහලේකම් ජෙරාඩ් වොන් ෆ්ලයිමන් මහතා සහ ඔහුගේ සහායිකාවන් වන ලෙනී සහ ලියා නියුන්ස් මෙනවියත් ඇතුලු කුඩා නොවිබ් කාර්යය මණ්ඩලය මා කලින් දැන සිටියත්, පළමුවෙන්ම ඒ කාලයේ හේග් නුවර ෆොන් බ්ලැන්කන්බර්ග් වීදියේ පිහිටි නොවිබ් කාර්යාලයට මා මුලින්ම කැඳවා ගෙන ගියේ පීට් ඩයික්ස්ට්‍රා මහතාය.

බෙල්ජීයමේ අපේ සර්වෝදය නියෝජිතයා වශයෙන් කටයුතු කළේ රෙනේ ගියර්ට්ස් සහ ඔහුගේ මස්සිනා වූ ජැක් ජැන්සන් ඇතුලු ක්‍රියාකාරී මණ්ඩලයකි. ඔහු සර්වෝදය ශාඛාවක් බෙල්ජීයමේ ඇති කළ අතර, අදත් එහි 'ශ්‍රමදාන මාවත' නමින් බාලේන් ගමේ පාරක් නම් කොට තිබේ.

යුරෝපයේ සර්වෝදය සංගමයේ සභාපති සහ ප්‍රධාන සංවිධායක හැටියට කටයුතු කළේ පීට් ඩයික්ස්ට්‍රා මහතාය. පැරීසියේ යුනෙස්කෝ ආයතනයට මා කැඳවාගෙන ගොස්, තරුණ සම්මේලනය හරහා යුනෙස්කෝ තෑගි කූපන් ක්‍රමය සර්වෝදයට හඳුන්වා දුන්නේත් ඒ මහතාය.

එවකට පැරීසියේ යුනෙස්කෝ ආයතනයේ තෑගි කූපන් ක්‍රමය භාරව කටයුතු කළේ පැට් මෝටිමාර් නැමැති කැනේඩියානු ජාතික කාන්තාවකි.

ලෝක තරුණ සමුලුව හරහා අලුත්ම 'ලැන්ඩ් රෝවර්' රථ දෙකක් සර්වෝදයට පරිත්‍යාග වශයෙන් ලැබුණේ ද පීට් ඩයික්ස්ට්‍රා නිසාය.

පසු කලෙක ජර්මන් ෆෙඩරල් සමූහ ආණ්ඩුවේ 'ෆ්‍රෙඩ්රික් නවුමාන් ආයතනයේ' සේවයට බැඳුණු පීට් ඩයික්ස්ට්‍රා මහතා, එම ආයතනයට ද මා හඳුන්වා දුන්නේය. මගේ අතිශයින්ම හද බැඳි මිතුරෙකු වූ චන්ද්‍රා

සොයිසා මහතා මුලින්ම මට ජර්මනියේ බොන් නගරයේ දී මුණගැසුණේ පීට් ඩයික්ස්ට්‍රා මහතා සමඟය.

යුරෝපීය සර්වෝදය ශාඛාව සහ නෙදර්ලන්තයේ සර්වෝදය ශාඛාව පිහිටුවීමට පෙරමුණ ගෙන ක්‍රියා කළේ පීට්ය.

සර්වෝදය සංසදය ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධ වීමට පමණක් නොව, යුරෝපීය සංවර්ධන ක්‍රම අන්ධානුකරණයෙන් අනුගමනය නො කිරීමට – මුල සිටම මට අනතුරු ඇඟවූයේ ද පීට් ඩයික්ස්ට්‍රා මහතාය. 'WAY' ලෝක තරුණ සමුලුවේ සඟරාව මුද්‍රණය කළ හොයිට් පර්විස් මහතා, ආසියානු ලේකම් කේ.වී. රෙඩ්ඩි මහතා සහ සඟරාව සකස් කළ නීතිඥ හේස් එල්ඩර් හා ඔහුගේ මැතිනිය ද මගේ මිතුරෝ වූහ.

එක්දහස් නවසිය හැට ගණන්වල දී මෙන්ම, හැත්තෑ ගණන්වලදීද, පීට් ඩයික්ස්ට්‍රා මහතා කිහිපවරක්ම සර්වෝදය මූලස්ථානයට පැමිණියේය.

Ceylon's Pick-and-Shovel Samaritans

By Emily and Ola d'Aulaire

'Moving mountains' is all in a day's work for Ari and his youthful volunteers

The lovely island of Ceylon dangles from the southern tip of India like a giant pear. Nature is bountiful there and the country enjoys one of the higher standards of living in Asia. Yet more than 80 per cent of its 12 million people live in scattered rural villages, and a substantial proportion have been left far behind in the country's advance towards modern development. There are people who still live in mud-floor huts, whose daily wage (when they can find work) comes to only 25p, and who are on intimate terms with disease and malnutrition.

In 1958, a teacher named Ahangamage Tudor Ariyaratne decided to do something about all this. At

ශ්‍රී ලංකාව පිළිබඳව ලෝක ප්‍රසිද්ධ **Readers Digest** සඟරාවේ එක්දහස් නවසිය හැත්තෑඑකේ ඔක්තෝබර් කලාපයෙහි එමිලි හා ඕලා ඩුලෙයාර් යුවලගේ නමින් පළවූ ලිපියකි, මේ. මේ සඟරාවේ ශ්‍රී ලංකාව පිළිබඳ පළවූ ප්‍රථම ලිපිය මෙයයි. මේ ලිපිය භාෂා රැසකින් ම පළවීම නිසා එක්දහස් නවසිය හැත්තෑඑක ගෙවීමට පෙර සර්වෝදය ශ්‍රමදාන සංගමය ලෝක ප්‍රකට විය. මේ ලිපිය මා පළ කරන්නේ සර්වෝදය ජාත්‍යන්තර සංසදයක් වීමට පියවරෙන් පියවර ඉදිරියට ගමන් කළ හැටි පෙන්වීමට සාධකයක් වශයෙනි.

93

ලංකාවේ අසරණයින්ට කැත්තෙන් - උදැල්ලෙන් සරණවන්නෝ

ඡායාරූප: 370
මාපා රා පොඩි අප්පුහාමි මහතා

ආරිටත්, ඔහුගේ තරුණ සමාජ සේවකයින්ටත් කඳු සෙලවීම දින චරියාවේ එක් අංගයක් වූවා පමණි.

සුන්දර ලංකා දිවයින, දකුණු ඉන්දියාවේ කෙළවරින් ඇමුණුන විශාල පෙයාස් ගෙඩියක් වැනිය. ස්වභාව ධර්මයේ චමත්කාර යෙන් අලංකෘත වූ මෙම කුඩා දිවයින, ආසියාවේ රටවල් අතුරින් උසස් ජීවන තත්ත්වයක් උසුලනු ලබයි. ජන ගහණයෙන් 80% ක පමණ ප්‍රමාණයක් සාපේක්ෂව බලන විට උසස් ජීවන රටාව භුක්ති විඳිනු ලැබුව ද, මිලියන 12 ක් පමණ ජීවත්වන්නේ දිවයින පුරා විසිරී ගිය කුඩා ගම්මානවලය. එහෙයින් ජාතියේ නව සංවර්ධනය කරා යන ඉදිරි ගමනේ දී, සෑහෙන සංඛ්‍යාවක් පසෙකට තල්ලු වී ඇත. සෑහෙන සංඛ්‍යාවක් කටු මැටි පැල්පත්වල දිවි ගෙවන අතර, කුලී බැල මෙහෙවර තුළින් පැන්ස විසිපහක් පමණ දෛනික වැටුපක් ලබා ගනී. ලෙඩ රෝග හා මන්දපෝෂණය ඔවුනගේ ජීවිත වෙලා ගෙන ඇත.

දුගී දුප්පත් අහිංසක ගැමියන් මුහුණ පාන අනේක විධ සමාජ ප්‍රශ්න හමුවේ යමක් කරන්නට අහංගමගේ ටියුඩර් ආරියරත්න ගුරුවරයා තීරණයක් ගනු ලැබුවේ එක්දහස් නවසිය පනස්අටේ වර්ෂයේදීය. කොළඹ රජයේ පාසලක සේවය කරමින් සිටින අතර, විවේක අවස්ථාවලදී අත්හදා බැලීමක් වශයෙන්, රටෙහි ඉතාමත්ම බෙලහීන ගැමියන්ගේ බිඳ වැටුණු ආත්ම විශ්වාසය යළි ගොඩ නගන්නට කටයුතු ආරම්භ කළේය. ඉතාමත් කුඩාවට ආරම්භ කළ මෙම අත්හදා බැලීම, අද ලෝ පතල ජනතා ව්‍යාපාරයක් බවට පත් වූවා පමණක් නොව, දස දහස් සංඛ්‍යාත ජනතා සහභාගිත්වය දැකිය හැකිය. මෙම වැඩ පිළිවෙල කෙතරම් ප්‍රසංසාවට ලක් වීද යත්, ප්‍රජාව වෙනුවෙන් සේවය කිරීම

සඳහා පිරිනමනු ලබන ආසියාවේ ඉතාමත් ශ්‍රේෂ්ඨ ත්‍යාගය වන මැග්සයිසයි ත්‍යාගයෙන් එක්දහස් නවසිය හැටනවයේ දී පිදුම් ලැබීය. එදා මෙදා තුරු එතුමාගේ උදාර ජනතා මෙහෙවර පිළිබඳ වූ දේශන මගින්, ලෝක ප්‍රජාව දැනුවත් කිරීම සඳහා කැනඩාව, බෙල්ජියම හා පිලිපීනය වැනි යුරෝපා සහ ආසියාතික රටවලින් ආරාධනා ලැබුණි. ශ්‍රී ලංකාවේ ගාන්ධි යන අන්වර්ථ නාමයෙන් ද ජනතා උපහාරය එතුමා ට හිමි විය.

තිස්නව හැවිරිදි ආරියරත්න – (මිතුරන්ට ආරි) අඩි පහකුත් අඟල් දෙකක් උස් වූ පුංචි මිනිසෙකි. බැලූ බැල්මට ජාත්‍යන්තර සම්මානයන්ගෙන් පිදුම් ලැබීමට තරම් අයෙක් සේ නො පෙනේ. එහෙත් ඔහුගේ තද කලු විශාල ඇහි බැම – සුන්දර සිනහව – දුටුවන් වශී කරවන සුලුය. අවංකකමේ ප්‍රතිමූර්තියක් වූ ආරියරත්නයන්ගේ බසට, ජනතාව අවනත විය.

දුක්බර කථාවක්

දිනක් පන්තියක උගන්වමින් සිටියදී ඔහු මෙසේ කියන්නට විය: "උපතින් සිදු වූ වැරැද්දක් නිසා ඉතා දිළිඳු පවුල් තිස්හතකින් සමන්විත ශ්‍රී ලංකාවේ කුඩා ගම්මානයක් ගැන කියන්නම්."

"ලංකාවේ ජන සමාජයට අයත් සමාජ අසාධාරණයන්ට ලක්වූ ජන කොටසකි. දුගී දුප්පත්කම නිසා, අසල්වැසි ගම්මානවල අය ඔවුන් පිටමං කරනු ලැබීය. මංගල – අවමංගල – ආවාහ – විවාහ කටයුතු පමණක් නොව, රැකියාවක් ලබා ගැනීමට ද අවකාශ නොවීය. බොහෝ දෙනකුට උරුම වුයේ මහ මග හිඟමන් පමණි.

මට හිතෙන්නේ මේ මිනිසුන්ට උදව් කරන්න පුලුවන් කියලා. ඔබලා කී දෙනෙකුට ලබන පාසල් නිවාඩුවට මේ සඳහා සහභාගිවන්න පුලුවන්ද?" දැඩි නිහඬතාවයකින් පසු තිස්දෙනෙක් අත් එස වූවෝය.

පාසල් නිවාඩුව පැමිණි වහාම, ආරියරත්න මහතා ඇතුලු ස්වේච්ඡා කණ්ඩායම බස් රථයක නැඟී සැතපුම් හැටක් පමණ දුර ගෙවා කුරුණෑගල – කනතොලුව ගම්මානයට ගියේ ය. මේ අමුත්තන් දක්නට ලැබූ ගම්වැසියන්ගේ බිය සැක දුරු කරමින්, ආරි කටහඬ අවදි කළේය.

"මේ පිරිස පැමිණියේ ඔබලාට වැඩ කිරීමට නොවෙයි. ඔබත් සමග වැඩ කිරීමට." විශ්මයට පත් අසරණ ගැමියන් බලා සිටිය දී, නගරයේ හැදුණ වැඩුණ මේ ස්වේච්ඡා සේවක පිරිස කැත්ත–උදැල්ල

ගෙන වැඩට පිවිසියෝය. දෙවැනි දින වන විට, ගමේ වැඩ කළ හැකි සෑම කෙනෙකුගේම සහභාගිත්වය දැකිය හැකි විය. විශ්මිත විපර්යාසයක් සිදුවිය. අලුත්වැඩියා – ප්‍රතිසංස්කරණ ආරම්භ විය. උදාර උත්සාහයක ප්‍රතිඵලයක් වශයෙන් බටකොළ සෙවිලි කළ පැල්පත් දහනවයක්, වැසිකිළි තුනක්, පානීය ජලය සඳහා ළිඳක් සකස් කිරීමට හැකි විය. එපමණක් නොව, ගෙවතු වගාවන් සහ පොල් පැළ සිටුවීම ද, වේවැල් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය සඳහා ශාලාවක් ද ගොඩනැංවීය. එතැනින් නොනැවතුණ ආරියරත්නයන්ගේ ස්වේච්ඡා කණ්ඩායම සාක්ෂරතා පන්ති, ක්‍රීඩා ආරම්භ කළේය. කාන්තාවන් සඳහා හස්ත කර්මාන්ත වශයෙන් මලු–පැදුරු විවීම ද, පිරිමින්ට ගොවිතැන් ක්‍රම ද කියා දුන්නේය. සෞඛ්‍ය සනීපාරක්ෂාව–පෝෂණය පිළිබඳ ඇති වැදගත්කම් පැහැදිලි කළේය.

දින එකොළහක් මේ කුඩා ගම්මානයේ සේවය කළ ස්වේච්ඡා සේවක කණ්ඩායම ආපසු කොළඹ බලා පිටත්වන විට, ගැමියන් තුළ ජීවත්වීමේ බලාපොරොත්තු ආත්ම විශ්වාසයන් තරමක් දුරට ගොඩ නැඟී තිබෙනු දක්නට ලැබීම සතුටට කරුණක් විය.

"අප ඔවුන්ට පෙන්වා දෙන තෙක් තමන්ට යමක් කරගත හැකි බව ඔවුන් දැන සිටියේ නැහැ" ආරි පැවසීය. ඉතා ආසන්නම ප්‍රතිඵලය වූයේ, ආරිගේ රැකියාව අහිමි වී යාමය. ආරිගේ ව්‍යායාමයට එක්වූ ස්වේච්ඡා සේවකයින් සඳහා ඔවුනගේ දෙමාපියන්ගෙන් අවසර ලැබුණද, උසස් යයි සම්මත පවුල්වල ළමුන් හා කුලහීන මිනිසුන් සමඟ දුක සැප බෙදා ගැනීම සෙසු අයට දරා ගත නොහැකි විය.

මේ නිසා ඇති වූ බලපෑමක ප්‍රතිඵලයක් වශයෙන් ආරිගේ වැඩ තහනම් කෙරිණි. මේ පාඩුව ආරි විඳගත්තේ උපේක්ෂාවෙනි.

"කොයි ම අලුත් දෙයක් ආරම්භ කළත්, ඊට විරුද්ධවාදීන් සිටින එක සාමාන්‍ය දෙයක්"යැයි ඔහු කරුණු පහදා දෙයි.

දැන් ඔහුට ඇති කාර්යය පන්ති භේදය තුරන් කිරීම සහ ස්ව උත්සාහයෙන් ග්‍රාමීය සංවර්ධනය ඇති කළ හැකි බව ඒත්තු ගැන්වීමය. ඔහුගේ විරුද්ධවාදීන්ට ඔහු කීවේ පැරණි පාරම්පරික සංස්කෘතික සාරධර්ම වෙනස් නො කොට, සමාජ සුභ සිද්ධිය සඳහා නව උපාංග එකතු කළ යුතු බවය.

සහයෝගය ලබා දීම පිළිබඳව ආරිගේ දර්ශනය, විපරම් කරන සැමටම කියා දෙන ලදී. පුවත්පත් කර්තෘවරු, අධ්‍යාපන නිලධාරීන්, නීති සම්පාදකයින් වැනි අයගේ මාර්ගයෙන්, ඔහුගේ අවනඩුව අගමැතිනි

බණ්ඩාරනායක මැතිනියගේ කනට ද වැටිණි. මෙම අසාධාරණයට පිළියමක් වශයෙන් ආරි නැවත රැකියාවෙහි පිහිටුවන ලදි. මේ සිද්ධිය ආරිට නොපෙනී පැමිණි ආශීර්වාදයක් වැනිය. ඊට ලැබුණු ප්‍රසිද්ධිය නිසා, විශ්ව විද්‍යාල සිසුන්-බුද්ධිමත් තරුණයින් වැඩ පිළිවෙලට සම්බන්ධ වීමට කැමැත්ත දක්වා ලියන්නට විය. එමෙන්ම නොදියුණු ගම්මානවලින් ආධාර ඉල්ලීම් ගලා එන්නට විය. 'මේ තත්වය ශක්ති සම්භාරයක් ගොඩනැගීමට හොඳ අවස්ථාවක් බව මට වැටහුණා'යයි ආරි කීවේ ය. එක් අතකින් දුගී අය ආධාර ඉල්ලන අතර, අනෙක් අතින් තරුණයෝ ආධාර දීමට කැමැත්ත පළ කර සිටියෝය. ඉතාම ස්වාභාවික දෙය නම්, මේ දෙපාර්ශවය එක්තැන් කිරීමය.

පාසලින් පසු, ඉතා රැ. බෝවන තෙක් දේශපාලනයෙන් තොර-ලාභ ප්‍රයෝජන නොලබන සංවිධානයක අධිකාරි පත්‍රයක් සකස් කරන ලදී. සැම දෙනාගේම සුභ සිද්ධිය හා ශක්තිය බෙදා ගැනීම යන අරුත ඇති 'සර්වෝදය ශ්‍රමදාන' වශයෙන් එය නම් කරන ලදී. නව සංවිධානයට වැදගත්කමක් හා පිළිගැනීමක් ලැබෙන ආකාරයෙන් සෙනෙට් සභාවේ සභාපති ඇතුලු ප්‍රභූන් පහලොස් දෙනෙකුගෙන් සමන්විත විධායක සභාවක් මගින් පාලනය කිරීමට කටයුතු සංවිධානය කරන ලදී. ඉතා ඉක්මනින් මෙම ව්‍යාපාරය පුළුල් විය. ඉතා සීඝ්‍රව – ශක්ති සම්පන්නව පුද්ගලයින් සිය කැමැත්තෙන්ම ඊට බැඳෙත්ම, සමාජිකත්වය දස දහස් ගණනින් වැඩි විය. එය ඉතා ජනප්‍රිය සංවිධානයක් විය.

සර්වෝදය සංවිධානාත්මක වශයෙන්, විශේෂ කෘතියක ප්‍රතිමූර්තියක් විය. ස්වේච්ඡා සේවකයින් තමන්ම ගමනාගමන පහසුකම් සපයා ගත් අතර, ගම්මුන් විසින් ආහාර හා වාසස්ථාන සපයන ලදී. උපකරණ හා ද්‍රව්‍ය සඳහා මුදල් පරිත්‍යාග වශයෙන් ලැබිණ. ජනයා තමන්ට හැකි දේ ලබා දුන්නෝය; එක් ස්ත්‍රියක් දින භාගයක වැටුප් පරිත්‍යාග කළාය. කොළඹ වරාය කම්කරුවන්ගේ පරිත්‍යාගයක් වශයෙන් පවුම් දහයක් ලැබිණි. නමුත් ප්‍රධානතම වත්කම වූයේ, ස්වේච්ඡා සේවකයින්ගේ ශ්‍රමයයි. විශාල ජන ශක්තියක් හා අත් උපකරණ හැරෙන්නට වෙන කිසිවක් නැති වුවත්, සර්වෝදය සේවකයෝ සෙසු අයට වඩා සාර්ථක ප්‍රතිඵල නෙළා ගත්තෝය.

ඇපාකන්දේ වැසියන් හයසිය දෙනාට ඉතාම අවශ්‍යව තිබුණේ පාරකි. මේ ගම ඉතා උස් කඳු මුදුනක පිහිටියේය. ඊට තිබුණේ ඉතා පටු වංගු සහිත පාරකි. එය සැතපුම් භාගයක් ඇතුළත අඩි සියයක් උසට නැගෙන තරම් හෙළකි. එවැනි ස්ථානයක නියම පාරක් තැනීමට මහත්

වියදමක් දැරිය යුතු බව ඉංජිනේරුවෝ පැවසූහ. අවසාන වශයෙන් ගම්මුන් සර්වෝදයේ පිහිට පැතුවෝය.

මේ ගැන සලකා බැලූ ආරි "අපි හෙට ආරම්භ කරමු" යයි කීවේය. "එය කොහොත් ම කළ නොහැකිය" කියමින් සාවද්‍ය ලෙස ඉඟි කරමින් එහි සිටි ආණ්ඩුවේ නිලධාරියෙක් පුදුමය පළ කළේය. ඔබ මොවුන්ට හිස් බලාපොරොත්තු ඇති කරනවා පමණක් යයි කීවේය. "අපි ඔට්ටුවක් අල්ලමු" යයි ආරි උත්තර දුන්නේය. 'මසක් තුළ කඳු මුදුනට රථයක් පැදවීමට හැකි වන අන්දමට පාර තැනුවොත්, ඔබ ඊට තාර දමා දිය යුතු' බව කීවේය.

ඇපා කන්දේ අවට ගම්වල මිනිසුන් දහසක් පමණ ද, සර්වෝදය ස්වේච්ඡා සේවකයින් සිය ගණනක් ද, සති අන්ත හතරකදී වැලමිටි හන්දි සාදමින් 'කඳු ගැට කපමින් – කඳු මුදුන දක්වා පාර තැනීම ආරම්භ කරන ලදී. රැබෝවන තෙක්ම යෝධ කලාමැදිරියන් මෙන් ලන්තෑරුම් සහිතව මිනිසුන් වැඩ කරනවා දකින්නට ලැබිණ. රජයේ නිලධාරියා සමග කරන ලද ඔට්ටුව ගැන ආරංචිය පැතිරීම නිසා, සර්වෝදය සේවකයින් ආපසු පැමිණි පසු, ගම්මු නොකඩවා වැඩ කරගෙන ගියහ.

හරියට සුමාන හතරකින් සැක පහළ කරගෙන සිටි නිලධාරියාගේ රථය පදවාගෙන කඳු මුදුනට යා හැකි විය. 'ඔබට කන්ද සෙලවීමට හැකිවූවා නම්, මගේ පොරොන්දුව මම ඉටු කරන්නම්' යයි කීවේය. අද තාර දැමූ හොඳ පාරක් ඇපාකන්දට දිවේ. ගම්මුන් එම පාර හඳුන්වන්නේ දෙව්ලොවට යන ආරිගේ මහා මාර්ගය ලෙසිනි. ගම්මුන්ට ආරි කුඩා ගාන්ධිය.

ඇත්තෙන්ම ආරි ඉන්දියාවේ මහා ජාති හිතෛෂී වූ මහත්මා ගාන්ධිගේ ආභාසය ලබා ඇති අතර, ප්‍රජා සහභාගිත්වය–ආත්ම පරිත්‍යාගය හා අහිංසාවාදී ක්‍රියා ගැන එතුමන්ගේ ප්‍රතිපත්තිවල පිහිටා තම ව්‍යාපාරය ද ගොඩ නගනු ලැබීය. හිංසාව කෙනෙකුගේ සිහිනයන් භයංකාර සිහිනයක් බවට පත් කරනු ලබන අතර, ඇත්තෙන්ම විප්ලවයේ සැබෑ නිර්මාණාත්මක බලවේගය වනුයේ අහිංසාවයි.

එක්දහස් නවසිය හැටහත වන විට අවශ්‍ය ඕනෑම මොහොතක කැඳවා ගත හැකි ලක්ෂයක් පමණ වූ ස්වේච්ඡා පිරිසකින් සමන්විත ලංකාවේ විශාලතම සේවා ව්‍යාපාරය සර්වෝදය විය. මේ තත්වය පාදක කොට ගෙන ගම් සියයේ ඒකාබද්ධ සංවර්ධන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට ආරි තීරණය කළ අතර, එය ගම් සියයක ආර්ථික

හා සාමාජික ව්‍යාධීන් ඉවත් කිරීමට පිළියමක් විය. ආරිගේ අනෙකුත් ව්‍යාපාරයන්හි මෙන්ම, මෙහි දී ද අධ්‍යාපනය කෙරෙහි දැක්වූ විශේෂත්වය හේතුකොට ගෙන දහස් ගණන් ජනයාගේ ජීවිත පරිවර්තනයකට ලක් විය.

මුලින්ම ආරි සහ ඔහුගේ ස්වේච්ඡා සේවක පිරිස උඟුරුවල ගමට ගිය විට දක්නට ලැබුණේ, පාරක් – තොටක් – නොමැති පාසලක් නොමැති පසුගාමී තත්ත්වයේ ජීවන රටාවක් ගෙවන–රණ්ඩු සරුවල් ගහණ අවිධිමත් ලෙසට හැඩ ගසා ගත් ජීවන රටාවක් ඇති ගැමි පිරිසකි. අද තත්වය බොහෝ දුරට වෙනස්ය. සර්වෝදය සේවකයින්ගේ උදව්වෙන් සාදා ගත් පාර නිසා, ගම්මුන්ගේ කොහු ලනු සහ සහල් වැනි නිෂ්පාදන වෙළඳ පොළට යවා නියමිත මිලක් ලබා ගැනීමට හැකි වී තිබේ. ඒ සමගින් පවුලේ මාසික ආදායම පවුම් හයේ සිට දොළහ දක්වා දියුණු වී තිබේ. සර්වෝදය මගින් පවත්වනු ලබන අධ්‍යාපන පන්ති වලට පින් සිදු වන්නට උඟුරුවල ගමේ සාක්ෂරතා ඥානය ඉහළ ගොස්ය. "සර්වෝදය අපට – අපගේ හැකියාවන් හඳුනා ගැනීමට උදව් කළේය. එය අපේ ජීවන මගෙහි විප්ලවිය වෙනසක් ඇති කළේය" යයි ගැමි නායකයෙක් අප සමග සඳහන් කළේය.

ආරිගේ විවිධ ව්‍යාපෘතීන් හේතුකොට ගෙන, සර්වෝදය වාර්ෂික ක්‍රියාකාරී වියදම් පවුම් දහදහසක් ඉක්මවා ඇත. එය දිනපතාම වැඩි වෙමින් පවතී. වාසනාවකට මෙන් ඔහුගේ වැඩ පිළිවෙල ඇසුවන් ඔහුගේ වටිනා මිත්‍රයන් බවට පත්වී ඇත. වසර හතරකට පෙර සිට ලෝක තරුණ සමුලුව, ගම් සියයේ සංවර්ධන යෝජනා ක්‍රමයට ආධාර කිරීමට බැඳී තිබුණේය. එය ඔවුන්ගේ ආසියාවේ ඇති ප්‍රධානතම ව්‍යාපෘතීන්ගෙන් එකකි. යුනෙස්කෝ ආයතනයට ද මේ සඳහා ආධාර කරන ලෙසට ඉල්ලුම් කළේය. ජංගම පුස්තකාල හරහා ප්‍රජා සාක්ෂරතා වැඩසටහන්, ළමා අධ්‍යාපන වැඩ සටහන් ඇරඹීමට දැනටමත් ලෝකයේ නන් දෙසින් පවුම් තිස් දහසක්* පමණ සොයා ගැනීමට හැකි විය. ගම් සියයේ සංවර්ධන යෝජනා ක්‍රමය, දැනටමත් දෙගුණයකටත් වඩා වැඩි වෙමින් පවතී. මේ ආරම්භයක් පමණක් බවත්, එක්දහස් නවසිය හැත්තෑදෙක වනවිට, ගම් පන්සියයක් ද, එක්දහස් නවසිය හැත්තෑපහ වනවිට, ගම් දාහක් වශයෙන් ස්වයං උපකාරක ව්‍යාපෘති ලෙස ගම්මාන සංවිධානය වනු ඇතැයි ඔහුගේ අදහසයි. මෑතකදී ප්‍රජාව හා පාසල් සම්බන්ධ මධ්‍යස්ථාන සියයක් පමණ ඉදි කර ඇති අතර, එපමණම

---

* (එක්දහස්නවසිය හැටඅටේ පවුමක වටිනාකම රුපියල් 13.00 කි)

ළමා පුස්තකාල ද විවෘත කර තිබේ. දැනටත් ඉතාම දුෂ්කර ප්‍රදේශවල සැතපුම් පන්සියයක් පමණ පාරවල් තනා ඇති අතර, දෙලක්ෂ පනස්දහසක් පමණ සර්වෝදය ස්වේච්ඡා සේවක පිරිස විසින් පවුල් හතලිස්දහසක් – එනම්: තුන් ලක්ෂ පනස් දහසක් පමණ ජනතාවට වඩා යහපත් ජීවන තත්ත්වයක් ලබාදීමට කටයුතු කර ඇත.

ආරි,ආරම්භයේ සිටම – විවේකී සෑම මොහොතකදීමද, ලැබෙන සුලු සම්පතින් වැඩි කොටසක් ද – සර්වෝදය වෙනුවෙන් කැප කර ඇත. කොළඹ නගරයේ, ජනාකීර්ණ වීදියක–අබල දුබල නිවසක සිට ආරි මෙහෙයුම දියත් කරයි. එය ආරිගේ නිවස ද වේ.

කාර්යාලයට යා බද කුඩා කාමරයක ඔහුගේ බිරිඳ නීතා හා දරු තිදෙනා ජීවත් වේ. දෙබිච්චිය අතර ඔහුගේ මුලුතැන් ගෙය වේ. එහෙත් ඔවුහු චෝදනා නොකරති. නිබඳවම ආරිගේ වැඩට සම්බන්ධව සිටින පවුලේ අය, සියලුම ශ්‍රමදාන කඳවුරුවලට සහභාගි වෙති. නීතා ස්වේච්ඡා සේවකයින් සඳහා ඉවුම් පිහුම් කරන අතර, දරුවන්–ගැමි තරුණයින්ට ගීත හා ක්‍රීඩා උගන්වයි. "ආරි වඩා යහපත් සමාජයක් සඳහා මනුෂ්‍යත්වය වෙනුවෙන් විප්ලවවාදියෙකුගේ දර්ශනයත්– සාන්තුවරයෙකුගේ ඉවසීමත් එක් කරන කෙනෙකි"යයි නීතා කීවාය. "ඔහු මිනිසාගේ මූලික සත්පුරුෂ භාවය විශ්වාස කරන්නේය. ඔබ ඔවුන්ගේ නිවැරදි ස්ථානයට අවධානය එල්ල කළහොත්, හොඳ ප්‍රතිචාරයක් ලැබෙනු ඇත."

94
සෙරිනේෂන් උත්සවයක්

මගේ ඉහත සඳහන් කළ පිලිපීන සංචාරයේ දී* අමතක නොවන සිද්ධියක් වූයේ බලංගොබොන් නැමැති ගමේදීය. දිවා කාලයේ දී පාසල් රැසකම දේශන පැවැත් වූ මට, ඇන්ග්ලෝ සමඟ රාත්‍රී ගත කිරීමට යොදා තිබුණේ ගමක මැද ලීවලින් සාදන ලද කුඩා නිවසකය. මේ නිවසට අපි ළඟා වනවිට රෑ බෝවී තිබුණේය. මේ නිසා වටපිටාව කිසිවක් දැක ගැනීමට අපට නොහැකි විය. පාසල්, ගුරු විද්‍යාල, ප්‍රජා මධ්‍යස්ථාන ආදියේ උදෑසන සිටම දේශන පවත්වා පැමිණි අපට, ඉතාමත්ම වෙහෙස වූයෙන් – ලෑලි පඩිපෙළ දිගේ ඉහළට ගිය වහාම මුහුණ කටවත් සෝදා නොගෙන, මගේ කාමරයේ ඇඳේ හාත්සි වුනෙමි. යන්තම් පැයක් පමණ නින්ද යන්නට ඇත. කාන්තාවන් දෙදෙනෙකුගේ කටහඬ ඇසී මට ඇහැරුණේය. ඉතාමත්ම ලස්සන ඇඳුම්වලින් සැරසුණු රූප රාජිනියන් දෙදෙනෙක් මෙන්, මේ දෙදෙනා මගේ ඇස්වලට දිස් විය. සදාකාලික මල්වලින් සාදන ලද මල්මාලා දෙකක් අපේ ගෙල වටා මේ දෙදෙනා විසින් පළඳවන විට මගේ මිත්‍ර ඇන්ග්ලෝ ලජ්ජාවෙන් ඇඹරෙන බව මම දුටුවෙමි. ඔවුහු හඬ ලා සිනාසුණෝය. 'අපේ නිවසට ඔබ සාදරයෙන් පිළිගනිමු' යැයි කී ඔවුන් දෙදෙනා පහන් දල්වා, ඒ වන විටත් අප නිදාගෙන සිටි කාමර දෙක ද, පුටු කිහිපයක් සහ ගුවන් විදුලි යන්ත්‍රයක් තිබූ ස්ථානය ද, සාලය ද, නාන කාමරය ද – පඩිපෙළෙන් බැස ගිය විට පහළ තට්ටුවේ තිබෙන වැසිකිළිය ද අපට පෙන්වූහ.

ලීවලින් සාදන ලද ගොඩනැගිල්ලේ බිම සහ බිත්ති කණ්නාඩි මෙන් පොලිෂ් කර තිබුණේය. මුලු දවසම, මේ අය මේ ස්ථානය අප සඳහාම සූදානම් කර තැබීමට වෙහෙසී ඇති බව අපට පෙනුණේය.

දැන් සියලු ජනෙල් -- දොරවල් වසා, මේ තරුණියන් දෙදෙනා– ඔවුන් පැමිණ කතා කරන තුරු දොර ජනෙල් නොඅරින ලෙසත්, ඒ

---

* 90 පරිච්ඡේදය බලනු මැනවි.

අතර ඇඟපත සෝදාගෙන, විවාහ මංගල්‍යයකට සුදුසු අන්දමට ලස්සන ඇඳුම් ඇඳගන්නා ලෙසත් දන්වා පිටව ගියහ.

මගේ මිත්‍ර ඇන්ග්ලෝ, ඔවුන් දොර ජනෙල් වසා ගිය පසු-අතිශයින් කලබලකාරී ස්වභාවයක් දැක්වීය. ඔවුන් අප 'සෙරිනේෂන්' උත්සවයකට සූදානම් කරන බව ඔහු කීවේය.

"මොකක්ද සෙරිනේෂන් කරනවා කියන්නේ?"

"ගමේ යුවතියන් දෙදෙනෙකුට අපි දෙදෙනා විවාහ කර දෙන එකයි." ඇන්ග්ලෝ වෙව්ලන ස්වරයකින් මට උත්තර දුන්නේය.

ඇන්ග්ලෝ තරම් මම කලබල වූයේ නැත. මට කල්පනා වූයේ මෙය ගමේ ආගන්තුකයන් පිළිගන්නා උත්සවයක් බවත්, පැරණි සිරිතක් ප්‍රදර්ශනය කිරීම පමණක් බවත්ය. එහෙත් ඇන්ග්ලෝ තවත් භය කිරීමට සිතා මම මෙසේ කීමි.

"ඇන්ග්ලෝ දෙවැනි විවාහයක් කරගන්න ලැබීම කොච්චර එකක් ද?"

ඔහු පුදුමයෙන් මෙන් මා දෙස බැලීය.

"ආරි, ඔයා බැඳලා ළමයින් තුන්දෙනෙක් ඉන්නවා නේද?"

"ඔව්. ඉතිං මොකද? ඒ අය ඉන්නෙ ලංකාවෙ. ඔබේ අය ඉන්නෙ මැනිලාවෙ. අපේ ගම්වල කතාවක් තියෙනවා තැනේ හැටියට ඇනේ ගහන්න කියලා. බය නැතුව අපි දෙන්නම එන දේකට මුහුණ දෙමු." මෙසේ පැවැසූ මා, වතුර ටිකක් නා ගෙන, තිබෙන හොඳම ඇඳුම් කට්ටලයත් ඇඳගෙන, සෙරිනේෂන් උත්සවයට සූදානම් වීමි. අලුතින් තෑගි ලැබුණු 'බරෝනය' නමින් හඳුන්වන අත්දිග සුදු කමිසයත්, සුදු දිග කලිසමත් ඇඳ ගත්තෙමි. බලෙන් වාගේ ඇන්ග්ලෝටත් හොඳ ඇඳුමක් ඇඳ ගැනීමට සැලැස්වූයෙමි.

දැන් අපට පහළ මිදුලෙන් සංගීත නාදයක් ඇසේ. ලස්සන ගීයක්ද ගයනු ඇසේ. ඇන්ග්ලෝ වෙව්ලමින් මා ළඟට ආවේය.

"මොකක් ද ඇන්ග්ලෝ ඒ ගීයෙ තේරුම?"

"ඒ කියන්නේ මනාලයිනි, දොර ජනෙල් අරින්න-මනාලියන් ඇවිල්ලා සිටිනවා. පහළට බහින්න. ඔවුන් පිළිගන්න. අප සමඟ කා-බී විනෝද වන්න. ඒකයි තේරුම. මට නම් බැහැ බහින්න."

මම ජනෙල් ඇරියෙමි. ඇන්ග්ලෝ බලෙන් මෙන් ජනේලය ළඟට කැඳවා ගෙන ආවෙමි. මෙතෙක් කලුවර වැටී තිබුණු මිදුල පුරාම, වටේට පුටු තබා තිබුණි. පෙට්‍රෝල් මැක්ස් ලාම්පු පත්තුවෙමින් තිබිණි. මුළු ගමම හතර වටේට රැස්ව සිටිති. මෙම දිස්ත්‍රික්කය බාර

පොලිස්පතිවරයාද, නගරාධිපතිවරයා ද, ආණ්ඩුකාරවරයා ද ඇතුළු රජයේ සහ ප්‍රජාවේ නායකයෝ එහි රැස්ව සිටියහ.

මනමාලියන් මෙන් ඇඳ ගත් – කලින් අපට උපදෙස් දී ගිය තරුණ කාන්තාවන් දෙපළ පඩිපෙළ ළඟ – මල්මාලා දෙකක් අතේ ඇතිව සිටියහ. ඇන්ග්ලෝ අතින් අල්ලාගෙන මම පඩිපෙළ බැස්සෙමි. මල්මාලා දැමීමට ඉඩ දුන්නෙමි. මට කිසිම ලජ්ජාවක් හෝ බියක් හෝ ඇති නොවූයේ මේ උත්සව රඟපෑමක් බව මම හොඳින් විශ්වාස කළ නිසාය.

ඡායාරූප: 371 – 'තිංක්ලිං ඩාන්ස්'

මගේ විවාහයේදීවත් පෝරුවක නැඟීමට අවස්ථාවක් නොලත් මා දැන් මේ අලුත් මනමාලියත් සමඟ ඇය අතින් අල්ලාගෙන අපට නියම කර තිබුණු ආසනයේ වාඩිවීමට සිදු විය. ඇන්ග්ලෝ ද ඔහුගේ මනමාලිය යන්තම් ඇඟිල්ලකින් අල්ලාගෙන, බොහෝම අකමැත්තෙන් ඔහුට වෙන්කර තිබුණු ආසනයේ වාඩි විය.

පිලිපීන ගමක තිබෙන ඉහලම ගැමි ආහාර, අපි සියලු දෙනාම උත්සවශ්‍රීයෙන් භුක්ති වින්දෙමු. ඉන්පසු ගැමි නැටුම් ගැයුම් සංදර්ශනයක් විය. ඊළඟට සිදු වූයේ අඩි 6 ක් පමණ දිග පොලු 2 ක් දෙදෙනෙක් අල්ලා ගෙන, ඒ පොලු එකට තට්ටු කරන අතර – ඒවාට කකුල් හසු නොවී නැටීමයි. ඉතාම විනෝද ජනක ක්‍රීඩාවක් වූ මෙයට, අපට ද සහභාගි වන්නට සිදු විය. මනාලියත් අතින් අල්ලා ගෙන එතනට ගොස්, දෙතුන් වරක් කකුල් අසු නොවන සේ මේ පොලු දෙක අතර බලා සිටින්නන්ගේ ඔල්වර හඬ මැද්දේ මම ද නැටුවෙමි. මේ නැටුමට කියන්නේ 'තිංක්ලිං' නැටුම් කියාය.

මෙසේ විනෝදවීමෙන් පසු ආණ්ඩුකාරවරයා ප්‍රධාන සියලු දෙනාම අපෙන් සමුගෙන ගියහ. දැන් රෑ 10.00 ට පමණ ඇත. පුටු සියල්ලද එතැනින් ගෙන යන ලදී. මනාලියන් දෙදෙනා අප දෙදෙනා අතින් අල්ලා ගෙන දැන් පියගැට පෙළින් ඉහළට නගිති. ඇන්ග්ලෝ හොඳටම වෙවුලයි. මා නො පෙන්වූවත් මගේත් පපුව ටික ටික ගැහෙන්නට පටන් ගනී.

මගේ මනමාලිය ලස්සනට සරසා තිබුණු මගේ කාමරයට මා රැගෙන ගියාය. බලෙන් ම වාගේ ඇන්ග්ලෝගේ මනාලිය, ඔහු – ඔහුගේ කාමරයට කැඳවාගෙන ගියාය.

මගේ නැති ගැන්ම වැඩි විය. එයින් ගැලවීමට මෙන් කෝපි කෝප්පයක් සූදානම් කරන හැටියට ඇයගෙන් ඉල්ලීමි. අතින් මනමාලියද කැඳවාගෙන කෝපි සූදානම් කිරීමට මැය කුස්සියට ගිය අතර, ඇන්ග්ලෝගේ කාමරයට මම ගියෙමි. ඔහුගේ ඇසේ කඳුලු පිරී තිබුණි. ගොත ගසමින් ඔහු මෙසේ කීය.

"බලන්න මට බිරිඳක් සහ දරුවන් හය දෙනෙක් ඉන්නවා. මා අසුවුනු උගුල."

"මටත් බිරිඳක් සහ ළමයින් තුන්දෙනෙක් ඉන්නවා. මේ ඔය ගැන හිතන වෙලාවක් නොවේ." මම කලබලයක් නැතුව ඔහුට ප්‍රකාශ කළෙමි.

මගේ හිතේ තිබෙන බය ඔහුට නො පෙන්වීමි. මේ අතර කෝපි කෝප්ප දෙකත් රැගෙන මනාලියන් සාලයට පැමිණි අතර, අප දෙදෙනා ද සාලයේ වාඩිවීමු. මොනවා කතා කළා දැයි මට මතක නැත. දැන් රෑ එකොළහ ට පමණ ඇත. ඇන්ග්ලෝටත් වඩා මට දැන් අවශ්‍ය මේ අයගෙන් ගැලවීමටය.

මේ දෙපළ පැමිණ මුලින්ම මටත්, පසුව ඇන්ග්ලෝටත් ආචාර කොට "සෙරිනේෂන් උත්සවය හමාරයි. දැන් අපි යනවා. සුභ රාත්‍රියක් වේවායි" කියා දොර පියන් ඇරගෙන පඩිපෙළින් බැස්සෝය.

හිතේ විශාල සැහැල්ලුවකින් "බොහෝම ස්තූතියි. සුභ රාත්‍රියක් වේවා"යි අපි ද ඔවුන්ට සුභ පැතුවෙමු.

පෙට්‍රොනීලා සහ ෆෙලිසිතා නම් වූ ඒ තරුණියන් දෙදෙනා පිටතට ගිය වහාම, දොර–ජනෙල් වසාගත් අප දෙදෙනා, මේ සන්ධ්‍යාව ගැන කතා කරමින් විනෝද වී–මැදියම් රැය පසුවී නිදා ගත්තෙමු.

පසු දා උදෙන්ම මනමාලියන් ලෙස රඟ පෑ සුරූපී කාන්තාවන් දෙපළ ඔවුන්ගේ ස්වාමිපුරුෂයන් ද සමඟ පැමිණ, ඔවුන් උගන්වන

පාසලේ දේශනයක් සඳහා අප කැඳවාගෙන ගියහ. එදා දවසම පාසල්වල දේශන පවත්වා, දිවා භෝජන සහ රාත්‍රී භෝජන සංග්‍රහවලටද සහභාගි වී පසුදා අපි මැනිලා නගරයට පැමිණියෙමු.

ඉතිරි දවස් කිහිපය සඳහා ද යොදා තිබුණු සියලු වැඩසටහන් නිම කොට, අවසාන දිනයේ පැයක් පමණ පිලිපීන කාන්තා සංවිධානය සමඟ සාකච්ඡාවක් ද, තවත් පැයක් පමණ ඈත පෙරදිග ගුවන්විදුලි සංස්ථාව සමඟ සාකච්ඡාවක් ද පැවැත්වීමි. එය මෙහෙයවූයේ කෙනත් සිල්වා නැමැති මහතෙකි. අවසාන කටයුත්ත වූයේ 'මැනිලා ඕවසීස් ප්‍රෙස් කල්බ්' හෙවත් 'විදේශීය ප්‍රවෘත්ති සමාජය' සමඟ පිලිපීනයේ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගි වීමය. ව්‍යවස්ථා සම්පාදන සභාවේ නියෝජිතයින් පහළොස් දෙනෙක් ඇතුළු උගත් පිරිසක් එහි වූහ. මා වැඩියෙන්ම අවධාරණය කළේ, සමාජයේ පහළම මට්ටමේ සිටින බහුතර ජනතාවට සාධාරණත්වය ඉටුවන විදියේ – ගැමි මට්ටමට විමධ්‍යගත වූ ව්‍යවස්ථාවකින් පමණක් සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය ගොඩනැඟිය හැකි බවයි.

95
බඩගින්නේ සිටීමට උපන්නෝ

(1968, 'බඩගින්නේ සිටීමට උපන්නෝ' **(Born to Hunger)** යනුවෙන් පළවුනු 'පෙන්ග්වින්' ප්‍රකාශනයක් වූ ඉංග්‍රීසි පොතෙන් උපුටා ගත් ලිපියක පරිවර්තනයකි. **'Born to Hunger'** නම් වූ මේ පොතේ කර්තෘවරයා වූයේ ආතර් හොප්ක්‍රාෆ්ට් නැමැති මහතෙකි. මේ ලිපිය මෙහි පළ කරන්නේ මේ වෙලුමත් - ඉදිරි වෙලුම් හතරත් කියවන පාඨකයාට සර්වෝදයේ පරිනාමය ගැන විදෙස් ඇස්වලින් බැලීම සිදු වූ ආකාරය අවබෝධ කිරීම සඳහාය.)

ලංකා සර්වෝදය ව්‍යාපාරයේ පුරෝගාමියා

රජයේ පරිපාලනයෙන් තොරව - ඉතා ක්‍රියාකාරි මෙන්ම, යහපත් ශ්‍රී ලාංකිකයන්ගේ ශ්‍රමය සංවර්ධනය සඳහා සර්වෝදය විසින් යොමු කරනු ලැබේ. මෙම නිදහස් ව්‍යාපාරයට අනායාසයෙන්ම පිරිස එකතු වීම නිසා, රජයේ සේවා කටයුතුවලට විශාල අනුබලයක් වී ඇත. මෙය හඳුන්වන්නේ 'සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය' යනුවෙනි. මෙයට පාසල් ගුරුවරයෙක් වන ආරියරත්න මහතා, දැඩි උනන්දුවකින් නායකත්වය දෙනු ලබයි. ගම්වලින් සැකසුණු ලංකාවේ නොදියුණු බව පිළිබඳව ඔහුගේ අදහස් මීට ප්‍රථමයෙන් දැක්වීමි.

එක්දහස් නවසිය පනස්අටේ පමණ ආරම්භ වූ මෙම ව්‍යාපාරය, ගැන ලියවුණු පත්‍රිකාවක, ඔහුගේ ගති පැවතුම් ගැඹුරු අධ්‍යාත්මය දක්වාම අනාවරණය කර ඇත. ඔහුගේ ව්‍යාපාරයට 110,000 පමණ ජනතාව සම්බන්ධ කරගෙන ඇත.

'සර්වෝදය' සහ 'ශ්‍රමදානය' යන වචන දෙකකින් හඳුන්වන මේ ව්‍යාපාරයේ සමාන ඉංග්‍රීසි අදහස වන්නේ, ඉඩම් ප්‍රදානය කිරීම, ධනය පරිත්‍යාගය, ජීවිතාන්තය දක්වා ප්‍රජාවට සේවය කිරීම, සාමයේ හමුදාව ගොඩනැඟීම, ග්‍රාම ස්ව රාජ්‍යය, මනුෂ්‍ය සංහතියට පොදුවේ සේවය කිරීම වේ. මෙවැනි වැඩසටහන් දියත් කරන විට, විවේක ගැනීමට අවස්ථාවක් නැත. ආරියරත්න මහතා හිසේ සිට දෙපතුල දක්වාම මෙවැනි උදාර ගති ලක්ෂණ පෙන්නුම් කරයි.

ඔහු දිනක් මා සර්වෝදය ව්‍යාපාරයේ මූලස්ථානයට ගෙන ගියේය. රථවාහන තදබදය ඇති කොළඹ වීදි දිගේ ඔහු පසුපස යෑම, පාපන්දු තරගයකට පැමිණි විශාල පිරිසක් අතර සිටි බලු කුක්කෙක් සොයන්නා සේ ය. දෙබිච්චියක් අතර කෙළවරක කුඩා අච්චු කන්තෝරුවක් අසල ගෙදරකට ගොඩ වැදී, විසිත්ත කාමරයේ දී ගෙදර උදවිය සමග කෙටි සාදයකින් පසුව, පඩි පෙළක් නැඟ කුඩා කාමරයට ඇතුල් විය. මෙය ව්‍යාපාරයේ පරිපාලනය සිදු වූ ස්ථානයයි. මුලු කාමරය පුරා ම පත්‍රිකා හා ෆයිල් කවර පිරී ඉතිරී තිබිණි. ඇතුළත පුටු කිහිපයකට පමණක් එහි ඉඩකඩ තිබිණි. මේ විශාල ගොන්නෙන්, වරින් වර ආරියරත්න මහතා ලිපි අදින්නේ හදිසියේ හිතට එන අදහස් අනුවය. වැඩි ම සංඛ්‍යාවකට ඉතාමත් යහපත් දේ කිරීමට කැප වී ඇති ව්‍යාපාරයක පෙනුම වූයේ, ඒක පුද්ගල තූර්යවාදක කණ්ඩායමක් සේය. එය බොහෝ විට හොඳ වැඩවල නිරන්තර ලක්ෂණයක් සේ දැක්විය හැක.

එහෙත් මේ ව්‍යාපාරයේ පිටුපස යම්කිසි බලයක් තිබිණි. එය ආරම්භ වූයේ ගුරුවරු හා සිසුන් හැත්තෑපස් දෙනෙකුගේ ශ්‍රමදාන චාරිකාවකිනි. කුල භේදයෙන් ඉතා පහත් සේ සලකනු ලැබූ තදබල ලෙස පීඩා විඳි කිසිවකුගේ සැලකිල්ලට භාජනය නොවූ කුලහීනයන් වාසය කළ ගමකිනි. එවකට කුලහීනයන් සේ සැලකෙන කුඩා ජනකොටස් එකසිය පනහක් පමණ ලංකාවේ සිටියහ. සෙසු ජනගහනය ඔවුන් පිළිනොගත් අතර, ඔවුන් ජීවත් වූයේ ඉතා දුෂ්කර ලෙස ය. ලංකාවේ සමාජ ස්වභාවය අනුව බුද්ධිය උසස් තැනක් ගනී. ඒ අනුව මෙම ගම හදා වඩා ගැනීම පුදුමාකාර සිද්ධියක් සේ පැහැදිලි විය. මෙම කණ්ඩායම ගමේ ටික දිනක් පදිංචි වී, පාසලක් සාදා, අත්කම් සැලක් ඇති කොට – ගොවිතැන් ක්‍රම දියුණු කිරීමට උදව් කර – ළිං කපා දියුණු භාවයේ සංකේත වශයෙන් වැසිකිළි සාදා දීම සිදු කරන ලදී.

මෙවැනි වැඩ කටයුතු එක්දහස් නවසිය පනස්අටේ සිට නොයෙකුත් පළාත්වල ආරම්භ කර ඇත. රජයේ ශ්‍රමදාන සේවාවල මෙන්, කෑම පාර්සල් දීමෙන් දිරි ගන්වා නැත. වැඩට යන සේවකයෝ තමන්ගේ ම කෑම රැගෙන යනවා ඇත. නැත්නම් බොහෝ විට ගැමියන් විසින් කෑම සපයනු ලැබේ. ප්‍රවාහන පහසුකම් ද නොමිලයේ උදව්කරුවන්ගෙන් ලබයි. වරෙක ව්‍යාපාරය විසින් දුම්රියක් කුලියට ගෙන, දහසකට ගමන් පහසුකම් සපයනු ලැබුවේය.

සෑම අවුරුදු තුනකට වරක් ගම් සියයක් බැගින් බාරගෙන දියුණු කිරීමට එක්දහස් නවසිය හැටහතේ දී ව්‍යාපාරය කීර්තිමත් අංග ලක්ෂණයන් සහිත වැඩසටහන් ආරම්භ කළේය. (මෙම වැඩසටහන වැඩපිළිවෙලක් හා හේතුවක් ඇතිව සිදු වූ බවය පෙනුණේ.) ඒ සඳහා වෛද්‍ය හා මහජන සෞඛ්‍ය පිළිබඳ දැනුම ඇති අය හා කම්කරුවන් ව්‍යාපාරයට එක් වී සිටි බැවින්, මේ අයගෙන් සමබරව සෑදුනු කණ්ඩායම් යොදා ගැනීමට හැකිවීම, සෑම ගමක්ම සමීක්ෂණයට භාජනය කර, සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම්, අධ්‍යාපන අවශ්‍යතා, කෘෂි කර්මාන්තය හා ගෘහ කර්මාන්තවලට ඇති ඉඩකඩ ආදිය පිළිබඳ පවුලක් පවුලක් පාසා ගොස් සොයා බැලීම සිදු කරන ලදී. එමෙන් ඔවුන්ට අවට දිස්ත්‍රික්කයන්ට බලපෑම් කිරීමට ඇති ශක්තිය පිළිබඳව ද සැලකිල්ලට ගන්නා ලදී. සංවර්ධන වැඩ ආරම්භ වූවාට පසු, ගමේ වයස අවුරුදු 14 ත් 35ත් අතර තරුණ තරුණියන් පුහුණු කරවා ගමේ ක්‍රියාකාරී කණ්ඩායම් වශයෙන් යොදවන ලදී. එම කාර්යයන් නොකඩවා පවත්වාගෙන යෑමට ප්‍රයත්න දැරුවේය.

අප ගිය වෙනත් සංවර්ධන වෙමින් පැවති කිසිම රටක නොදැක්ක විශේෂ ලක්ෂණයක් – මේ ව්‍යාපාරය තුළ දැක්කෙමි. තුන්වන ලෝකයේ රටවල කලාතුරකින් දැකිය හැකි ලක්ෂණයක් වන දුගී ජනතාවගේ ජීවිත සමග ස්වේච්ඡාවෙන් සම්බන්ධ වීමට කැමැති ගුරුවරු – ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් හා හිමිවරුන් වැනි උගතුන් විශාල සංඛ්‍යාවක් දක්නට ලැබීමයි. ඊට හේතුව බොහෝ විට මෙම රටවල උගත් අයගේ සංඛ්‍යාව සීමිත බැවිනි. එමෙන්ම සමාජ මෙහෙවර පිළිබඳව ඇති හැඟීම ද නොදියුණු තත්වයෙන් පවතින බැවිනි.

"අපේ දිවයිනේ මිනිසා – ඒ සමාජය – සම්පූර්ණයෙන්ම ප්‍රතිසංවිධානය කිරීමේ විප්ලවයක ආරම්භය ද, මේ?" කියා ආරියරත්න මහතාගේ පත්‍රිකාවක ලිපියක් තිබුණි. මෙවැනි ප්‍රකාශන පිළිගත් දේශපාලන – ඥයින්ට හිසරදයක් මෙන්ම, ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට ද තුඩු දෙනු ඇත.

මේ ව්‍යාපාරය සෑම අතින්ම දේශපාලනයෙන් තොර වුවත්, සංවිධානාත්මක වූ බලවේගයකි. එමෙන්ම එය ව්‍යාප්ත වෙමින් පවතින්නකි. එක්දහස් නවසිය හැටහතේ දී නව මූලස්ථානයක්, ජීවන දීමනාවක් ලබන පූර්ණකාලීන සේවක පිරිසක් අයත් කර ගැනීමට බලාපොරොත්තුවෙන් සිටියේය. එක්රැස් වන විශාල පිරිසට සරිලන වැඩ කොටසක් කෙරෙන්නේ ද යන මැසිවිලි හා විරුද්ධවාදිකම්

කිහිපයක් ආණ්ඩු පක්ෂයෙන් ඉදිරිපත් වන බව අසන්නට මට ලැබුණි. "අප රටේ අවාසනාවන්ත සහෝදර පිරිස බැඳීම්වලින් නිදහස් කර සමාජයේ නව පරපුරක් බිහි කර දීම මාගේ පැතුම" යැයි කියමින් කලින් සිටි අගමැතිවරයෙක් මේ ව්‍යාපාරයට සුභ පැතුවේය. ඇත්ත වශයෙන්, මා දන්නා හැටියට ආරියරත්න මහතාගේ පෞද්ගලික දියුණුව හෝ දේශපාලන බලාපොරොත්තුව ඔහු තුළ ගැවී නොතිබුණි. හුදෙක්ම පරාර්ථ සේවයට කැප වූවෙකි.

ආරි ඉතා සියුම් හඬක් දෙන වාදන භාණ්ඩයක් සේ සිහින් කට හඬක් ඇති හද බැඳි පුද්ගලයෙකි. ඔහුගේ ගති සිරිත් ඉතා සීඝ්‍රයෙන් ගොස් හදිසියේ එක තැන නැවතිය හැකිය. ඔහු ගැන සිතන විට මට මතකයට නැඟුණේ, ඉංග්‍රීසි සමාජයේ ක්‍රියාකාරී පුද්ගලයෙකු ලෙසය. ප්‍රජාව උසි ගන්වමින් ආත්මහරණය උත්පාදනය කරමින්, කිසි කෙනකුටත් අවමානයට ලක් කළ නොහැකි පුද්ගලයෙක් හැටියට සඳහන් කළ හැකියි. ආසියාවේ ඇති නා නා විධි විපර්යාසයන් තුළ කලාතුරකින් දැකිය හැකි පුද්ගලයෙකි, ආරියරත්න මහතා. එනිසා මම මෙය අවසන් කරන්නේ බුබුලු දමන්නාක් වැනි බලාපොරොත්තු ඇතිවය.

මාතෘ පාදං නමාමි

මම දිනක් නාලන්දාවේ සිට එන ගමන් මාලිගාකන්ද පාරේ පිහිටි ස්වභාෂා ප්‍රකාශකයෝ සමාගමට සුපුරුදු පරිදි ගොඩ වීමි. මගේ වේතනයෙන් ඉතුරු කර ගෙන දිය හැකි උපරිම මුදල සර්වෝදය පත්‍රයේ බිලෙන් ටිකක් පියවීමට සේනානායක මැතිනිය අතට දුනිමි. එතුමිය සිනා මුහුණින් යුතුව මට ස්තුති කොට එය බාර ගෙන, රිසිට් පතක් නිකුත් කළාය. තවත් රුපියල් 15,000/– කට වැඩි මුදලක් මුද්‍රණ බිලට අප ණය බව ද එතුමිය සිනා මුහුණින් ප්‍රකාශ කළාය. මා එය කෙසේ හෝ ගෙවන බව ද පවසා දෙල්ගහයට ගෙදරට සෙමින් සෙමින් පා නැඟුවෙමි.

මා කිසිවෙකුගෙන් ණයක් ගෙන තිබුණේ නැත. කෙසේ නමුත්, ගෙදර වියදම ලද වේතනයෙන් පියවා ගතිමු. නීතා ද සකසුරුවම් කමින් කටයුතු කොට, දරුවන්ගේ අවශ්‍යතාවනුත්, ආගන්තුක සත්කාරයත් යන්තම් ඉටු කළාය.

බොහෝ දෙනා මගෙන් අත මාරු ගත්තත්, ඒවා මට මතකයේ තිබුණේ නැත. එසේ ගත් අයෙකු ආපසු දීමක් කළේ කලාතුරකිනි. එවැනි අවස්ථාවක දී පමණක් යමක් දුන් බව මට මතක් වුණි.

දිවා ආහාරය ගැනීමෙන් පසු සර්වෝදය පත්‍රය සඳහා ගෙවිය යුතු ඉතිරි මුදල කෙසේ සොයා ගන්නේ දැයි කල්පනා කරමින්ම මම ඇඳේ හාන්සි වීමි.

මේ දිනවල අම්මා සහ තාත්තා හිටියේ උණවටුනේ අපේ මහ ගෙදරය. සතියකට දෙකකට වරක් අම්මා හා තාත්තා අප බැලීමට පැමිණියහ. මට ඇහැරුණේ අම්මාගේ කටහඬ ඇසෙන විටය. සැබෑ මව් කෙනෙකුට කුඩා දරුවෙක් අඬන විට, ඒ දරුවා අඬන්නේ ඇයි දැයි

එක වරම අවබෝධ වේ. බඩේ කැක්කුමක්, හිසරදයක්, වතුර තිබහක්, බඩගින්නක් ආදී වශයෙන් දරුවා හැඬීමට හේතුව සොයා ගැනීමට මවකට ගත වෙන්නේ ක්ෂණයකි. මොහොතකින් ඇය හේතුව සොයා ගෙන අවශ්‍ය ප්‍රතිකාරය කොට දරුවාගේ හැඬීම නවත්වයි.

අපේ මව ද මේ ආකාරයේ මාතෘ රත්නයක් වූවාය. එහෙත් මා වැනි අවුරුදු තිහක් පසු කළ දරුවකුගේ වේදනාව ඇයට දැනේ වී යැයි මම නො සිතුවෙමි. මා ඇඳෙන් නැගිට අම්මාට වැඳීමට පෙර මගේ මුහුණ සිපගත් ඇය මගෙන් මෙසේ ප්‍රශ්න කළාය.

'මොකද? මූණ කලු වෙලා. දාහෙට අරන් දහයට දීල වගේ ඉන්නෙ?'

'නෑ අම්මෙ කිසි ම ප්‍රශ්නයක් නැහැ.'

'මොකද නැත්තෙ ප්‍රශ්නයක් තියෙනවා. ඒක මූණෙන්ම මට පේනවා.'

'ඒක අම්මට කියල වැඩක් නැහැ.'

'මොකද නැත්තෙ? අම්මලට දරුවන්ගේ විසඳන්න බැරි ප්‍රශ්නයක් නැහැ.'

'ඒ වුනාට අම්මට මේක විසඳන්න බැහැ. මේක මුදල් ප්‍රශ්නයක්.'

'ඒකත් මට විසඳන්න පුලුවන්. කොච්චර මුදලක ප්‍රශ්නයක් ද?'

'රුපියල් දහසය දාහක විතර ප්‍රශ්නයක්.'

'ඒක මා විසඳන්නම්. මම ආපසු ගමේ ගිහිං එනකම් ඉන්න.'

"පුතා හැමෝටම කියනවා හිනා වෙවී ඉන්න කියලා. දැන් ඔයා හිනා වෙවී ඉන්න... මම ගමේ ගිහින් එනකම්," කියමින් ඇය නීතා ළඟට ගියාය.

අප දුප්පත් නොවූවත්, පොහොසත් ද නොවන බව මම දැන සිටියෙමි. අම්මා ට මුදල් කොයින් ද? කාගෙන්වත් ණයතුරුස් ගනීවි ද? ගෙදර තිබෙන යමක් විකුණාවි ද? මේ ප්‍රශ්න මගේ හිතට නැගෙන්නට විය. එහෙත් අම්මා කතා කළ විලාශයේ තිබූ ස්ථිර ස්වරය නිසා අම්මා අතේ යම් මුදලක් එකතු කරගෙන ඇත් දැයි සැකයක් ද මට පහල විය.

අම්මා හැන්දෑවේ ම ආපසු උණවටුනට ගියාය. පසු දා මා පාසල් ඇරී එන විට ඇය පැමිණ සිටියාය. ලොකු කවරයක් මා අත තැබූ අපේ අම්මා "ඔන්න, ඉල්ලපු ගාණටත් වැඩි ය තුන් ගුණයක් ඕකෙ තියෙනවා. සියලුම ණය බේරා දමන්න."

ඒ කවරය ඇතුලේ තිබුණේ මා කුඩා කාලයේ අම්මා මට අරන් දී තිබූ තැපැල් කන්තෝරුවේ ඉතිරි කිරීමේ පාස් පොතය. එහි පොලියත්

සමග රුපියල් 50,000/- කට කිට්ටු මුදලක් එකතු වී තිබුණේය. මා නාලන්දාවේ රැකියාව බාර ගත් දින සිට, ගෙදර වියදමට මාසිකව යැව් රුපියල් දෙසීය වියදම් නොකොට, අම්මා මගේම පාස්පොතේ තැන්පත් කර තිබීමෙන් එතරම් විශාල මුදලක් ඉතිරි වී තිබිණි.

එවේලේම පුංචි බොරැල්ලේ තැපැල් කාර්යාලයට ගිය මම අවශ්‍ය මුදල ලබා ගෙන, එදා සවසම සර්වෝදය පත්‍රයේ බිල ස්වභාෂා ප්‍රකාශන සමාගමට ගෙවා සැහැල්ලු සිතින් ගෙදර ආවෙමි. නැවත පාස් පොත අම්මාගේ අතට දී මම ඇයගේ දෙපා වැඳ ප්‍රාර්ථනා කළේ සසර වසනා තුරු ඇය මගේම අම්මා වේවා යනුවෙනි.

97
අනගාරිකයෙක් වීමට කළ ඉල්ලීමක්



ඡායාරූප: 372
මහාචාර්ය ගුණපාල මලලසේකර මැතිතුමා

දිනක් මහාචාර්ය ජී. පී. මලලසේකර මැතිතුමා මට දුරකතනයෙන් කතා කොට, උසස් අධ්‍යාපන ජාතික මණ්ඩලයේ ඔහුගේ කාර්යාලයේ දී හමුවන මෙන් මට දැන්වීය. මෙම මණ්ඩලයේ සභාපති වශයෙන් එක්දහස් නවසිය හැටහතේ සිට එක්දහස් නවසිය හැත්තෑඑක වර්ෂය දක්වා එතුමා සේවය කළේය. මට මතක හැටියට එතුමා මා කැඳවූයේ එක්දහස් නවසිය හැත්තෑ එකේ මුල් භාගයේදීය.

මහාචාර්ය මලලසේකර මැතිතුමා මම දේවත්වයෙන් සැලකූ ශ්‍රේෂ්ඨ ජාතික නායකයෙකි. සිංහල, පාලි, සංස්කෘත සහ ඉංග්‍රීසි භාෂා වලින් පමණක් නොව, වෙනත් භාෂා රැසකින්ම, අග්‍ර ගණයට පත් එවැනි උගතෙක් මේ යුගයේ බිහි වූයේ නැත. වරක් බොරැල්ලේ තරුණ බෞද්ධ සමිති ශාලාවේ පැවැති ('පාලි ටෙක්ස් සොසයිටි') පාලි ග්‍රන්ථ සමාගමේ සභාපති කළ පැයක ඉංග්‍රීසි දේශනයක් එතුමා ඇස් පියාගෙන අසා සිටියේය. එය නිම වූ වහාම, නැගිට සිටි මලලසේකර මහතා එක වචනයක් වත් අමතක නො කොට, තවත් පැයක් මේ දේශනය සිංහලට පරිවර්තනය කළේය. මා ඉංග්‍රීසි දේශනය සම්පූර්ණයෙන් ලියාගෙන තිබූ නිසා එතුමාගේ ස්මරණ ශක්තිය – භාෂා කෞශල්‍යය පිළිබඳව විමතියට පත්වීමි. චීන අගමැති චෞ එන් ලායි මැතිතුමා, නිදහස් චතුරස්‍රයේ දී චීන භාෂාවෙන් කළ කතාව අසා සිට, අවසානයේ දී වචනයක් නැර ක්ෂණිකව පරිවර්තනය කළ ආකාරය ද මට මතකය. එතුමාට එම දේශනයේ පිටපතක් කලින් දී නැත. අගමැති බණ්ඩාරනායක මහතා සහ චෞ එන් ලායි මහතා මේ පිළිබඳව පුදුම වී, එතුමාගේ චීන භාෂා ප්‍රවීනත්වය ගැන ප්‍රශ්න කර

තිබේ. එතුමා පිළිතුරු දී තිබෙන්නේ, තමන් චීන වචනයක් වත් නො දන්නා බවයි. එසේ නම් එතුමා කීවේ කුමක් දැයි ඇසූ විට, එතුමා චෞ එන් ලායි මැතිතුමාගේ අදහස් එසේ ම නිවැරැදිව ප්‍රකාශ කළ අන්දම විස්තර කර තිබේ. එම රැස්වීමේදී මේ පිළිබඳව බොහෝ දෙනා කතා කරනු මට ඇසුණි. මෙය සැබෑවක් වූවත් නැතත් එතුමාගේ ශාස්ත්‍රීය ප්‍රවීනත්වය අබිබවා, එතුමාගේ අන්තර් ඥානය ඉහලම මට්ටමක පැවැති බව මට අවබෝධ විය.



ඡායාරූප: 373
මහාචාර්ය ගුණපාල මලලසේකර මහතා වැවල කුරුප්පු මහතා සමග මෙත් මැදුරේ දී

නාලන්දා විදුහලේ ශිෂ්‍යයිනට කිහිපවරක්ම මලලසේකර මැතිතුමාගේ දේශන ඇසීමට මම සැලැස්වීමි. එක්දහස් නවසිය විසිහයේ නාලන්දා විද්‍යාලය ආරම්භ කළ අවස්ථාවේ ආචාර්ය පී. ද එස්. කුලරත්න මැතිතුමා, නාලන්දාවේ ප්‍රථම විදුහල්පති හැටියට පත් කළේ ජී. පී. මලලසේකර මැතිතුමාය. වයස අවුරුදු විස්සක් වනවිට වෛද්‍ය විද්‍යාලයේ අධ්‍යාපනය ලබන අතර, බාහිරව ලන්ඩන් විශ්ව විද්‍යාලයේ බී.ඒ. උපාධිය ලත් මලලසේකර මැතිතුමා, එක්දහස් නවසිය විසිඑකේ ආනන්ද විද්‍යාලයේ ගුරු මණ්ඩලයට බැඳී, එක්දහස් නවසිය විසිදෙකේ නියෝජ්‍ය විදුහල්පති හැටියට සේවය කළේය. එක්දහස් නවසිය විසිපහ වනවිට ශාස්ත්‍රපති උපාධිය සහ ආචාර්ය උපාධිය එක් වරම ලබා ගත් එතුමා එක් දහස් නවසිය තිස්අටේ දී ලන්ඩන් විශ්ව විද්‍යාලයේ සාහිත්‍යාචාර්ය උපාධිය ද දිනා ගත්තේ ය. පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරයෙකු සහ සෝවියට් රුසියාව, කැනඩාව, එක්සත් ජාතීන්ගේ මණ්ඩලය, මහා බ්‍රිතාන්‍යය ආදී රටවල අපේ තානාපතිවරයා වශයෙන් අද්විතීය සේවයක් කළ එතුමා, රටවල් රැසකින් ම ගෞරව උපාධි ලැබීය. ලෝක බෞද්ධ සහෝදරත්වය ආරම්භ කළ එතුමා, විවිධ බෞද්ධ නිකායවල ලෝක බෞද්ධ ජනතාව එකට–එකතු කිරීමට අනුපමේය සේවයක් කළේය. බෞද්ධ විශ්ව කෝෂයේ ප්‍රධාන කර්තෘ හැටියට එතුමා කළ සේවය අසම සමය.

අවසානයේ දී පසුව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම (University Grants Commission) බවට පත්වූ උසස් අධ්‍යාපන ජාතික මණ්ඩලයේ සභාපති වශයෙන් කළ සේවය එතුමාගේ අවසාන සේවය විය.

ඉතාමත්ම සුහදව මා පිළිගෙන කතා කළ මලලසේකර මැතිතුමා, රටේ ඇති වී ගෙන යන ආගමික සහ සදාචාර පරිහානිය ගැන සංවේගය පළ කළේය. අනගාරික ධර්මපාල තුමා ගැන සිහි කළේය. බුදුදහම, කුල, ජාති, ආගම්, ගෝත්‍ර අබිබවා ප්‍රායෝගිකව සර්වෝදය තුළින් ගෙන යන සේවය එතුමා බෙහෙවින් අගය කරමින් කතා කළේය. ලංකාවේ මෙන්ම, ලෝකයේ නොයෙක් තැන්වලින් තමාට ආරාධනා ලැබෙන බවත්, එසේ ආරාධනා කරන සැමට තමාගේ ගමන් පහසුකම් සලසා දීමට තමන්ට ඉල්ලා සිටීමට නොහැකි බවත්, එතුමාගේ ආර්ථික තත්ත්වය දුර්වල නිසා, බොහෝ ඇරයුම් ප්‍රතික්ෂේප කිරීමට සිදු වූ බවත් ප්‍රකාශ කළේය.

'ආරියරත්න, අනගාරිකව සිටීමට අධිෂ්ඨානය කර ගන්න. ධර්මපාලතුමා නැවැත් වූ තැන සිට ඉදිරියට රට දැය සමය ගෙන යෑමේ වගකීම, ඔබ බාරගත යුතුයි. මම ජීවත්ව සිටින තුරු ඔබට අවශ්‍ය සහයෝගය දෙන්නම්.'

මම විවාහක බවත්, දැනටමත් පුතාලා දෙදෙනෙක් සහ දියණියන් දෙදෙනෙක් සිටින බවත් පැවැසූ විට, මලලසේකර මහතා විශ්වාස කිරීමට නොහැකි අන්දමට මා දෙස බැලුවේය.

"ඔතරම් බරක් තියාගෙනත් – මෙතරම් වැඩ රාශියක් කරන්නේ කොහොම ද?"

"සර්, මගේ බිරිඳත් – දරුවන් හතර දෙනාත් – දැනටම මා සමඟ මගේ සියලු ම වැඩවල නිරත වෙනවා. ගුරුවරයකු වශයෙන් මට ලැබෙන වේතනය මට හොඳටම ප්‍රමාණවත්. එහෙත් මා කොයි මොහොතේ හෝ ගුරු සේවයෙන් අස්ව මේ සේවයටම යෙදෙනවා."

"හෙට අනිද්දාට බිරිඳ සහ දරුවන් සමග අපේ ගෙදරට පැමිණ මා හමුවන්න. මට ආසයි ඔවුන් දකින්න."

එතුමා මිය යනතුරුම මට ඒ සඳහා අවස්ථාවක් නො ලැබිණි.

98

දස්සනේන සම්පන්නෝ

මගේ ජීවිතයේ 40 වැනි සැතපුම් කණුව පසු කරන විට මගේ අනාගත ජීවිත ගමන පිළිබඳ පැහැදිලි දර්ශනයක්, මා තුළ ගොඩනැඟී තිබුණේය. මා බොහෝ විට විශ්වාස කළේ බුද්ධියට හා තර්කනයට වඩා අන්තර් ඥානයෙන් ක්‍රියාකාරී හිතට එන චිත්ත ධාරාවන් පෙන්වන මාර්ගය නිවැරදි බවය. මේ නිසා මා විසින් සමහර අවස්ථාවල දී ගත් තීරණ -- මගේ සහෝදර සේවක – සේවිකාවන් මෙන්ම, මගේ වැඩිහිටියන් ද විමතියට පත් කළේය. ඔවුන් මාගේ ඒ තීරණ ඉවසා, ඒවාට සහයෝගය දුන්නේ – එක් අතකින් ඔවුන් කාටත් වඩා මා ජීවිත පරිත්‍යාගයක් කර ඇති නිසාත්, සමහර විට ඔවුන් සමඟ මගේ තිබූ සුහද අන්තර් පුද්ගල සම්බන්ධතාව හේතුවෙන්, මට ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ඇල්ම කළ නිසාත් යැයි මම සිතමි.

රාජ්‍ය නිලධාරියෙකු හැටියට රාජ්‍ය තන්ත්‍රයේ ඉහළ හිණි පෙත්වලට නැඟීමට තිබුණු අවස්ථාවන් මේ වන විට, සම්පූර්ණයෙන්ම මම අත්හැර සිටියෙමි. හැකි තරම් ධනය උපයා ගෙන – සමාජයේ වරප්‍රසාද ලත් ධනේශ්වර පන්තියේ කෙනෙකු වීමේ අදහසක ඡායා මාත්‍රයක්වත් මේ වන විට මා තුළ තිබුණේ නැත.

රටේ පවතින දේශපාලන ක්‍රමය කිසි දිනෙක මා පිළිගත්තේ නැත. මේ නිසා පක්ෂ හා බලකාමී දේශපාලන ක්ෂේත්‍රයේ කොටස්කරුවෙකු වී, දේශපාලන බලතල ලබා ගැනීමේ සංකල්පනාවන් ද ජය ගැනීමට මම සමත් වුණෙමි.

එසේ නම්, වනගත ව, භාවනායෝගී ව විදර්ශනා වඩා – කෙලෙස් ප්‍රහීන කොට, ලෝකෝත්තර සුවය ලබා ගැනීම මා විසින් වත්මන් ජීවිතයේ අරමුණ කරගත යුතුද? එවැනි මගේම ආධ්‍යාත්මික විමුක්තිය සොයන අරමුණක් ද මා තුළ තිබුණේ නැත.

පවතින සමාජ ක්‍රමය අසාධාරණ ය. දහසක් ආර්ථික, සාමාජීක, පෙළීම්වලට බහුතර ජනතාව ගොදුරුව සිටිත්. දරිද්‍රතාවය නිසාම මිනිසුන් තුළ ගැටීම් හට ගැනීමත්, ඒවා තව තවත් තීව්‍ර කරන

කුල – මල, ජාති – ගෝත්‍ර, ආගම්, දේශපාලන ආදී හේතූන් නිසා සමාජය හිංසාවට යොමුවීමත් සිදු වේ. මේ තත්වයෙන් සමාජය මුදවා ගැනීමට පක්ෂ දේශපාලනය මත ගොඩනැගෙන රජයකටත්, පටු පෞද්ගලික අරමුණු සහ යල් පැනගිය පරිපාලන නීතිරීති ආදී බන්ධන නිසා මේ තත්වයෙන් රට මුදා ගැනීමට නිලධාරී පන්තියටත් නුපුලුවන. යල් පැන ගිය මති මතාන්තරවල එල්බගෙන සිටීම නිසාත්, විශේෂයෙන් පිරිසිදු බුදුදහම අනුව කිසිදු භේදයකින් තොරව හැම දෙනාගේ ම සාධාරණත්වය – හිංසාවකින් තොරව ඇති කළ හැකි යැයි ස්ථිරව විශ්වාස නොකරන නිසාත්, මේ ආගමික සංස්ථාවලින් ද යම් ප්‍රයෝජනයක් සමාජයට ගත හැකි වුවත්, සමාජයේ ආධ්‍යාත්මික සහ ආර්ථික දාරිද්‍රතාවය නැති කොට ජාතිය සමගි සම්පන්න කිරීමට – ඔවුන්ට ද ශක්තියක් නොමැති බවත්, මේ කාලය වන විට මට තේරුම් ගොස් තිබුණේය.

බෞද්ධ ජාතික බලවේගය ද – දුර්වල වී, අකර්මන්‍ය වූ පසු සර්වෝදය තුළින්ම කලක් ගත වුවත්, මේ ඓතිහාසික කාර්යය කළ යුතු බව මම අවබෝධ කර ගත්තෙමි.

සර්වෝදය ජාතියේ හැමදෙනාගේම ගැලවුම් මාර්ගය බවට පත් කිරීමේදී, අපට මුහුණ දෙන්නට සිදුවුණු, බලාපොරොත්තු වූ මෙන්ම – බලාපොරොත්තු නොවූ අභියෝගයන් ගැන සැහෙන හැඟීමක් මට තිබුණේය. මේ නිසා පළමුවෙන්ම කළ යුත්තේ දර්ශනයෙන් සම්ප්‍රයුක්ත වීමයි.

බුදුන් වහන්සේ දේශනා කරන ලද කරණීය මෙත්ත සූත්‍රයේ සඳහන් පහත දැක්වෙන පාඨය අපේ සර්වෝදය දර්ශනයේ හරය හැටියට සැලකිය හැකිය.

"දිට්ඨිංච අනුපගම්ම සීලවා
දස්සනේන සම්පන්නෝ"

මිනිසා මිනිසාගෙන් බෙදන "දෘෂ්ටිය" අත හැරීමත්, දැඩි "විනයකින් යුක්ත වීමත්"- "දසුනකින්" පිරිපුන් වීමත් සඳහා මගේ සිත විවිධ අන්දමේ සුබසාධන, සංවර්ධන සහ අධ්‍යාපනික කටයුතු කරන අතර, යොමු කළෙමි. එහි ප්‍රතිඵලයක් ලෙස අඩු වශයෙන් ශ්‍රී ලංකාව සාමය සහ සෞභාග්‍යය සඳහා කුමන මහක යායුතු දැයි මට නම් සැකයෙක් නැත.

එක්දහස් නවසිය පනස්නවයේ දී, නවදිල්ලියේ පැවැති නව අධ්‍යාපන සම්මේලනයේ දී, මහාචාර්ය ජී. රාමචන්ද්‍රන් මහතා 'සර්වෝදය දර්ශනය' විග්‍රහ කරද්දී මගේ හිතට මැවී පෙනුණේ, හැම මනුෂ්‍ය

කොට්ඨාශයකටම පිළිගත හැකි පරිදි, බෞද්ධ දර්ශනය පදනම් වූ දර්ශනයක් ගොඩනැඟීමයි. එක්දහස් නවසිය හැටඑක වන විට ඒ දර්ශනය මා විසින් ලිඛිතව සකස් කොට – සම්පූර්ණ කර තිබුණේය. ඉන් පසුව මා අතින් කළ යුතුව තිබුණේ ඒ පිළිබඳ ලිවීමයි. ඒවා තවදුරටත් විග්‍රහ කිරීමයි. ක්‍රියාවට නංවන පිළිවෙළ පැහැදිලි කිරීමයි.

මගේ ස්ව චරිතාපදානයේ පළමු වෙලුමේ අවසාන පරිච්ඡේදය වූ මෙහි එහි සාරාංශය සඳහන් කිරීම විශේෂයෙන් අපේ තරුණ පෙළට ප්‍රයෝජනවත් වේ යැයි සිතමි.

'සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය' වූ කලී, කිසිසේත්ම ලංකාවට ආගන්තුක හෝ ආධුනික හෝ වූවක් නොවේ. එය අවුරුදු දෙදහසකට අධික කාලයක් මෙහි පැවැති සංස්කෘතියේ සාරය පදනම් කර ගෙන නිර්මාණය කරන ලද්දක් වන අතර, නිරතුරුවම වර්ධනය වෙමින් පවතින්නක් බව ද කිව යුතුය.

බුදු සමයේ ආගමනයෙන් පසු ලංකාවාසීන්ගේ ආර්ථික – සමාජයීය හා ආධ්‍යාත්මික ජීවිතය එහි මූලධර්මයන්ට අනුව හැඩ ගැසුනු අතර, මෙම පැවැත්මේ බොහෝ අංගයන් ඉදුරාම වැඩි දියුණු කළ මෙන්ම, පාලනය කළ කේන්ද්‍රීය ගිහි විනය පද්ධතිය වූයේ ද, බුදු සමයමය. ගමත් – පන්සලත් – වැවත් – දාගැබත් මේ සංස්කෘතියේ සංකේතයන් වූ අතර, සමබර ආර්ථික ක්‍රමයක් තුළ වැසියෝ සැහැල්ලු සාමකාමී දිවි පෙවෙතක් ගත කළහ.

සියවස් ගණනක් මුලුල්ලේ ක්‍රමිකව වර්ධනය වෙමින් පැවැති මෙම ක්‍රමයේ පදනම, ලංකාව විදේශ ආධිපත්‍යයන්ට යටත් වීමෙන් පසු දෙදරා වැටිණ. විදේශීන්ගේ මූලික කාර්යය ආර්ථික සූරා කැම වූ අතර, ඒ සඳහා ඔවුන් විසින් සමකාලීනව යුරෝපා සමාජයේ සිදුවෙමින් පැවති ආර්ථික දේශපාලන සමාජ හා පරිපාලන ආදී වර්ධනයන් ඉතා සූක්ෂම ලෙස අප සමාජ ක්‍රමය තුළ ට කාවද්දන ලදී. මෙම ප්‍රතිසංස්කරණ හේතුවෙන් ඇති වූ අනිටු විපාකයන් ප්‍රධාන වශයෙන් දෙකක් වේ:

පළමුවැන්න සමතුලිත යා දෙන ආර්ථික ක්‍රමය බිඳ වැටී, ආනයන–අපනයන ආර්ථික ක්‍රමයක් ඇති වීමයි.

දෙවැන්න, ආරෝපිත අධිරාජ්‍යවාදී ආර්ථික ක්‍රමයේ ප්‍රතිඵලයක් වශයෙන්, සමාජ ක්‍රමයේ සෑම අවස්ථාවක්ම තියුණු තරගකාරී බවක් ඇතිවීම නිසා කලින් පැවති උසස් සමාජ හර රටාව දූෂණය වීමයි.

ඉහත සඳහන් විපාකයන් දෙකට සමාන්තරව සිදු වූ තවත් අතුරු ඵලයක් නම් මුලු ජන සංඛ්‍යාවෙන් සියයට අසූවකටත් වැඩි ගැමි ජනතාවගේ තත්වය දුක්මුසු ලෙස පිරිහී යෑමය.

සර්වෝදය ශ්‍රමදාන සංසදයේ දර්ශනය සැකැසී ඇත්තේ ඉහත සඳහන් දුර්විපාකයන් ජයගෙන, චෛතසික – සමාජයීය හා ආර්ථික වශයෙන් සමෘද්ධිමත් සමාජයක් ගොඩ නැඟීමටයි. මේ සඳහා සර්වෝදය දර්ශනය උපයෝගි කොට ගෙන ඇත්තේ, පැරන්නන් කළ පරිදි, අපට ආවේනික බෞද්ධ සංස්කෘතියට අනුව ඔප මට්ටම් වූ සමාජ ආර්ථික රීති සම්ප්‍රදායයි. වෙනසකට ඇත්තේ එම දර්ශනික සිතුවිලි සමුදාය වර්තමාන සංකීර්ණ සමාජයට ගැලපෙන ලෙස මුදා හැරීමය.

1950 දශකයේ මුල් වකවානුවේදී ජාතික නායකයන් විසින් ඇති කරනු ලැබූ සමාජ ආර්ථික හා දේශපාලන වෙනස්කම්වලින් ලැබිය හැකි සුබ සිද්ධිය, මෙතෙක් වරප්‍රසාද නොලබා සිටි ලක්ෂ ගණන් ජනතාවට සැලසීමට නම්, සංවර්ධන කාර්යයෙහිලා එම ජනතාවගේ සහභාගිත්වය විශාල අවශ්‍යතාවක් බව, සර්වෝදය ව්‍යාපාරයේ පුරෝගාමීහු අවබෝධ කරගෙන සිටියහ. එබැවින් ඔවුහු වරප්‍රසාද නොලත් ගැමි ජනතාව හා තරුණ තරුණියන්, උන්නතිකාමී කටයුතු සඳහා ස්වේච්ඡාවෙන් සහභාගි කර ගැනීමෙන්, පහත සඳහන් අරමුණු ඉටු කර ගනු වස්, ඉතා පුලුල් එල්ලයක් ඇති ව මේ ව්‍යාපාරය ආරම්භ කළ හ.

1. අපේ සංස්කෘතියට එකඟ ව කටයුතු කරන අතර, අප අවට ලෝකයේ සීඝ්‍රයෙන් සිදුවන වෙනස්කම් පිළිබඳව ද අවබෝධයකින් යුතුව, තරුණ–තරුණියන්ගේ පෞරුෂය ගොඩනැංවීම.
2. ගැමි ජනතාව සමාජ වෙනස්වීම්වල නියම ස්වභාවය වෙත පුබුදුවා ලීම හා ඔවුන්ගේ සංස්කෘතියට හා ඕනෑ එපාකම්වලට අනුව, ඔවුන් එබඳු වෙනස්කම්වල කොටස්කරුවන් බවට පත් කිරීම.
3. පන්ති, කුල, ජාති ආගම් හා භාෂාමය භේදයන්ගෙන් ඉවත් කොට, ජාතික ඒකරාශී බව ඇති කිරීම සඳහා සත්‍යය අවිහිංසාව ආත්මහරණය යන සංකල්පයන් මත පදනම්ව ජාතිය ගොඩනැඟීමේ පොදු ප්‍රයත්නයෙහි ලා සිය කොටස ඉටු කිරීමට හා මූලික මානව අයිතීන් ද, සමාජ සාධාරණත්වය ද, අවබෝධ කර ගැනීමෙහි ලා ඉඩ ප්‍රස්තාවන් පොදු ජනතාවට සලසා දීම.

4. ලෝක සාමය සඳහා අදහස් හා වැඩ පිළිවෙලවල් ඇති රටවල ජනතාව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට හා මූලික ජන කොටස් අතර සහෝදරත්වය හා සංවර්ධනය සඳහා සහයෝගිත්වය ඇති කර ගැනීමට අවස්ථාවක් සැලසීම ද, මෙහි අරමුණු වේ.

ඉහත සඳහන් අරමුණු හා දාර්ශනික සිතුවිලි, ඒවා ගොඩනැඟුණු මුල් අවදියේ දී, වර්ධනය වූ අයුරු සමීපව පරීක්ෂා කර බැලුවහොත්, ඒ මෙසේ දැක්විය හැක:

1. සියලු දෙනාගේ ම සුබ සිද්ධිය සිදු විය යුතුය.
2. නගරවලට වඩා ගම්වලට අවධානය යොමුවීම අවශ්‍යය.
3. අවිචාරාත්මක බවින් – අන්ධ විශ්වාසවලින් හා පටු සංකල්පනාවලින් ගැමියන් මුදා ගත යුතුය.
4. මෙම අරමුණු මුදුන්පත් කර ගත හැකි එකම මාර්ගය වන්නේ, ගැමියන් අතර අධ්‍යාපනය පතුරවමින් ඔවුන්ගේ දුක සැප බෙදා ගනිමින් හා ඔවුන'තර වැඩ කරමින්, ජීවත්වන මනාව පුහුණු වූ හා කැපවීමෙන් කටයුතු කරන සේවක පිරිසක් සිටීමෙනි.

මෙම අදහස් ඇතිවීමට විශාල වශයෙන් ම බලපෑ කරුණු මෙසේ සඳහන් කළ හැකි ය:

1. සත්‍යය හා අවිහිංසාව පදනම් කරගෙන, ආත්ම පරිත්‍යාගයෙන් සමාජ යහපත සඳහා සිය ජීවිතය කැප කළ මහත්මා ගාන්ධිගේ චින්තනය.
2. ගාන්ධිතුමාගේ ශ්‍රේෂ්ඨතම ශ්‍රාවකයා වූ ආචාර්ය විනෝබා භාවේගේ ලෝ පතල 'භූදාන' ව්‍යාපාරය පිළිබඳ අදහස්.

සර්වෝදයේ දාර්ශනික චින්තනය විකාශනය වීම පරීක්ෂා කිරීමේ දී මතක තබා ගත යුතු ඉතා වැදගත් කරුණු දෙකක් වේ:

1. සර්වෝදය ව්‍යාපාරය එහි වර්ධනයේ මූලික අවස්ථාවල දී ගාන්ධි හා විනෝබාගේ අදහස්වලින් ආභාසය ලැබුව ද, ක්‍රමයෙන් එය එයට ම ආවේනික වූ එසේ ම කැපී පෙනෙන ලෙස වෙනස් වූ දර්ශනයක් ගොඩ නංවා ගන්නා ලදී. 'සර්වෝදය' යන පදය ඇත්ත වශයෙන්ම, ඉන්දියාවෙන් ගනු ලැබුවක් වුවද, අපගේ බෞද්ධ සංස්කෘතියට සම්බන්ධව හා ජාතික ලක්ෂණයන්ට

අදාල ව, එහි පදාර්ථය ගැඹුරින් සලකා බැලුවහොත්, පෙනී යන්නේ එය සම්පූර්ණයෙන් ම අපේ ම පදයක් බවය.

2. සර්වෝදය එහි දර්ශනය ගොඩනැඟීමේ දී ඉතා විශාල ලෙස බුද්ධ ධර්මයේ සාරය උකහා ගෙන ඇති අතර, අවුරුදු 2500 ක් තිස්සේ මෙහි මුල් බැස තිබෙන සිංහල බෞද්ධ සංස්කෘතිය ද, සුපරීක්ෂාකාරී ලෙස සලකා කටයුතු කර ඇත. ව්‍යාපාරයේ ඇති ශක්තිමත් බෞද්ධ දාර්ශනික පදනම පහත සඳහන් කොටසින් පැහැදිලි වේ:

අනාදිමත් කාලයක සිට අප වෙත උරුම ව තිබූ බෞද්ධ දර්ශනයේ සාරය අප විසින් විශාල ලෙස උකහා ගැනීම නිරායාසයෙන්ම සිදු වූවකි. කෙසේ වුවත්, ලෝක සම්මත සදාචාරාත්මක හා ආධ්‍යාත්මික පරමාර්ථයන් සමඟ එකමුතුව පවතින සමාජ – ආර්ථික – පරමාදර්ශනයන් ක්‍රමවත් ව දැක්වීම සඳහා මෙම චින්තනය යෙදවීමට අප විසින් උත්සාහ දරා ඇත. තරුණයන් පොළඹවාලීමට සහ ව්‍යාපාරයේ නායකත්වය ගොඩනැංවීම සඳහා බුදු දහමේ ඉගැන්වෙන නිර්මල ජීවන දර්ශනයත්, එහි ප්‍රතිපලයක් වශයෙන් අද මෙහි පවතින සංස්කෘතියත් උපයෝගි කර ගන්නා ලදී. බුදු දහමට අනුව, මිනිසා දුක් විඳීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ, ඔහු තුළ හා ඔහු වටා ඇති සත්‍ය ස්වභාවය ගැන නොදැනීමත්, නොසලකා හැරීමත්ය. නිස්සරණ ප්‍රීතිය ප්‍රාර්ථනා කරන්නවුන් සඳහා උන්වහන්සේ විසින් අවිද්‍යාවෙන් නොසැලකිලිමත් බවින් හා එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන දුකට පත් වීමෙන්, මිදීම සඳහා මධ්‍යම ප්‍රතිපදා මාර්ගය පෙන්වා දී ඇත.

අවුරුදු 42 ක පමණ කාලයක් තිස්සේ සර්වෝදය ව්‍යාපාරයේ සිදු වූ වර්ධනයත් සමඟම, එහි බෞද්ධ දාර්ශනික පදනම වඩා ගැඹුරු වූ අතර, ඒ සමඟ ක්‍රමයෙන් "මිනිසා තුළ සැඟ වී ඇති යහ ගුණ ඔහුගේ හෝ ඇයගේත් සෙසු සියලුදෙනාගේත් උදාව පිණිස යෙදවිය යුතුය" යන චින්තන ධාරාවන්ගේ කේන්ද්‍රය බවට පත් විය.

'සර්වෝදය හෙවත් සැමදෙනාගේ ම සම්පූර්ණ උදාව' කේන්ද්‍රීය වූ මේ චින්තනය තුළින් වත්මන් සමාජයේ තිබෙන දුර්වලකම් හා ඒවා ඉවත් කිරීමට ගොඩනැඟිය යුතු 'සර්වෝදය සමාජ ලක්ෂණ දහයක්' ද මෙසේ ඉදිරිපත් කරයි:

වර්තමාන සමාජ ක්‍රමයේ ලක්ෂණ

1. ආත්මාවබෝධය සහ ආත්ම විශ්වාසයෙන් තොරය.

2. අන්ධානුකරණයෙන් භෞතික වටිනාකම් සොයා යයි.

3. ධනය, බලය, තත්වය පුදයි; බොරුව, හිංසාව හා ආත්මාර්ථකාමී බව රජයයි.

4. අයිතිය සහ තරගය මුල් වූ සංවිධාන බලවත් වේ. ධනවාදී ආර්ථිකය, නිලධාරී පරිපාලනය සහ බලකාමී පක්ෂ දේශපාලනය ප්‍රධාන සමාජ බලවේග බවට පත් වේ.

5. මිනිසා සතු දුර්ගුණ එක් වේ. ජාති, කුල, ආගම් හා පක්ෂ භේදවලින් සමාජය කඩින් කඩ වේ.

6. ආර්ථික සම්පත් වැරදි ලෙස පාවිච්චි වේ. ආර්ථිකය දුර්වල වේ. රැකියා විරහිත වේ.

7. යටත් විජිත යුගයෙන් උරුම වූ වෙළඳ භාණ්ඩ නිපදවෙන ආයාත – නිර්යාත අර්ථ ක්‍රමයකි. විදේශීය ණය සහ නව යටත් විජිතවාදයට යටත් වේ.

8. මහා පරිමාණ සංවිධානවලට වහල් වීම, ප්‍රාග් ධන සූක්ෂමතාව, මිනිස් ශ්‍රමය අපතේ යැම, දූෂණය අධික වීම හා පාරිසාරික දූෂණය සිදු වේ.

9. ගම නගරයට වහල් වෙයි. නගරයට ඇදී යාම, සදාචාර පරිහානිය සහ සමාජ අසහනය ඇති වේ.

10. දණ්ඩ නීතිය, දණ්ඩ ශක්තිය හා රාජ්‍ය බලය වැඩි වේ. ධර්ම නීතිය, ධර්ම ශක්තිය සහ ජන බලය අඩු වේ. පාලකයෝ සර්ව බලධාරී වෙත්. ජනතාව බෙලහීන වෙත්.

සර්වෝදය සමාජ ක්‍රමයේ ලක්ෂණ

1. ආත්මාවබෝධය සඳහා ආත්ම විශ්වාසයෙන් යුතුව වෙහෙසෙයි.
2. දේශීය සංස්කෘතිය පදනම් වූ ආධ්‍යාත්මික වටිනාකම්වලින් ප්‍රබෝධමත් වෙයි.
3. ගුණවත් බව, නැණවත් බව සහ හැකියාව ගරු කරයි. සත්‍යය, අවිහිංසාව, ආත්මත්‍යාගය රජයයි.
4. බෙදා හදා ගැනීම සහ සහයෝගය පදනම් වූ සංවිධාන බලවත් වේ. සමාජ භාරකාරත්ව ආර්ථිකය, ජනතා සහභාගිත්වයෙන් යුතු පරිපාලනය හා පක්ෂවලින් තොර, ජනතා දේශපාලනය සැබෑ වේ.
5. මිනිසා සතු යහ ගුණ එක්තැන් වේ. එකම මිනිස් පවුලක් ලෙස සමාජය එකට බැඳේ.
6. ආර්ථික සම්පත් නිවැරදි ලෙස එක්තැන් වේ. නිෂ්පාදනය ඉහළ යයි.
7. ජනතාවගේ මූලික අවශ්‍යතා මත පදනම් වූ ස්වයංපෝෂිත අර්ථ ක්‍රමයක් – ණය බරින් මිදුනු – ආත්ම ගරුත්වයක් ඇති – ආර්ථික නිදහසක් ඇති ජාතියක් බිහි වේ.
8. කුඩා පරිමාණ සංවිධාන මත පිහිටීම, සූක්ෂම ලෙස මිනිස් ශ්‍රමයෙන් – ප්‍රයෝජන ගැනීම, දූෂණ අඩුවීම හා භෞතික මෙන්ම, මානසික, පාරිසාරික දූෂණයෙන් ද ආරක්ෂාවීම සිදු වේ.
9. සම බර ලෙස නගරෝදය, ග්‍රාමෝදය, සහ සදාචාර පුනර්ජීවනය සිදු වේ.
10. ධර්ම නීතිය, ධර්ම ශක්තිය, ජන බලය මතු වේ. පාලක පන්තියක් නැත. ජනතාව සර්ව බලධාරී වෙති.

සර්වෝදය සැබෑ වේ.

මේ වෙනස සිදු කිරීමට සර්වෝදය මුඛ්‍ය පරමාර්ථ හයකට බෙදේ. ඒවා නම්:

1. 'පූර්ණ පෞරුෂෝදය' හෙවත් මිනිස් පෞරුෂයේ සම්පූර්ණ උදාව.
2. 'කුටුම්බෝදය' හෙවත්, මූලික සමාජ ඒකකය වූ පවුලේ සම්පූර්ණ උදාව.
3. 'ග්‍රාමෝදය හා ග්‍රාම ස්ව රාජ්‍යය' හෙවත් ගැමි ප්‍රජාවේ ජීවිතයට බලපාන සියලුම කරුණුවලදී, ගැමි ප්‍රජාව විසින්ම තීරණ ගැනීමේ තත්වයට පත්වීම; එය ග්‍රාමීය ස්වයං පාලන තත්වය තුළින් ග්‍රාම ස්ව රාජ්‍යය දක්වා වර්ධනය කිරීම.
4. 'නගරෝදය' හෙවත් නාගරික ජන කොට්ඨාශයන් ද සාර ධර්ම මත පිහිටා, ගැමි ජනතාව මෙන් ම, සහභාගිත්ව, සාමූහික සංවර්ධනයකට යොමු කිරීම. 'නගර ස්ව රාජ්‍යය'.
5. 'දේශෝදය' හෙවත්, දේශීය සාර ධර්ම මුල් වූ ධර්ම ද්වීප ධාන්‍යාගාර අරමුණු ඉටු කර ගැනීම.

   සහ

6. 'විශ්වෝදය' හෙවත් මානව සහෝදරත්වය, සහයෝගය සහ සහයෝගය තුළින් ලෝක ජනතාවගේ සාමය උදා කර ගැනීම.

මේ අනුව සර්වෝදය පරමාර්ථ කිසිදු කුල, ජාති, දේශපාලන, ආගම්, දේශසීමා ආදී බාධකයන්ගෙන් තොර ව පුද්ගලයාත් සමාජයත් අහිංසාවාදී මාර්ග තුළින් වෙනස් කිරීමට යොමු වූ විප්ලවීය ඒවාය.

මේ එක් එක් පරමාර්ථය ඉටු කර ගැනීමට පැහැදිලි ප්‍රතිපත්ති මාලාවකුත් – ක්‍රියාදාමයන් රැසකුත් පසුගිය දශක හතරකට වඩා වූ කාලය තුළ දී සර්වෝදය විසින් සකස් කරගෙන ක්‍රියාවට නංවයි.

පූර්ණ පෞරුෂෝදය සඳහා බෞද්ධ දර්ශනයෙහි එන සතර බ්‍රහ්ම විහරණයන් මාර්ගෝපදේශක මූල ධර්මයන් ලෙස සර්වෝදය ශ්‍රමදාන සංසදය විසින් පිළිගෙන තිබේ:

1. මෙත්තා හෙවත් සැම දෙනාගේම පණට ගරු කොට – සැමදෙනා කෙරෙහිම මිතුරු සිත පැතිර වීම.
2. කරුණා හෙවත් දුකට හේතු වූ කරුණු සොයා – ඒවා ඉවත් කිරීමට ගනු ලබන විවිධ සුබසාධනමය සහ සංවර්ධනමය ක්‍රියා මාර්ග.

3. මුදිතා හෙවත් සේවය තුළින් සැපයට පත්වන අයගේ සතුට දැක තමා තුළ ඇතිවන නිස්සරණ ප්‍රීතිය
සහ
4. උපේක්ඛා හෙවත් සම චිත්ත ස්වභාවය ඇතිවන පරිදි ගැඹුරට සිතා අට ලෝ දහමට මුහුණ දීම.

පළමුවෙනි මූලධර්ම මගින් පුද්ගලයාට අනෙක් සියලුම පුද්ගලයින් එකම පවුලක අය ලෙස සැලකීමට අවස්ථාව සලසයි. මෙය මිනිසා විසින් රැස් කර ගෙන ඇති ධනය, උගත් බව, කුලය, ජාතිය, වර්ණය, හා ආගම ආදිය නිසා ඇති වන භේද සහ අවිචාරාත්මක කඩතොලු ඉවත් කිරීමට මග පාදයි. මේ මගින් පුද්ගලයා ඔහු තමා ලෙස බලන අයුරින්ම අනුන් දෙස බැලීමට ද පුරුදු වේ. පළමුවන මූල ධර්මයෙන් අදහස් වන්නේ, චේතනාව මගින් ඇතිවන ක්‍රියාවයි. මෙය හුදෙක් ලෝක සත්වයාට පමණක් සීමා වන්නක් නොවේ. එය ඉන් ඔබ්බට සියලුම සප්‍රාණික ධාතූන් කෙරෙහි ද පැතිරවිය යුත්තකි. ඉන් අදහස් වන්නේ මිනිසා සිය පරිසරය කෙරෙහි ද මෙත් සිත පැතිරවිය යුතු බවය.

පළමුවෙනි ධර්මය වන මෙත් සිත ක්‍රියාවට පෙරළීම 'කරුණාව' වෙයි. වර්තමාන සංකීර්ණ සමාජ ක්‍රමය තුළ සිදුවන සංවර්ධන හා සුබසාධනය යන විෂයයන් යටතේ කෙරෙන සියලුම ක්‍රියාදාමයන් සර්වෝදය දර්ශනයට අනුව අයත් වන්නේ, කරුණා යන සානුකම්පික ක්‍රියාවලියට ය. ආර්ථික, දේශපාලන ක්‍රියා, අධ්‍යාපනය, සෞඛ්‍යය හා පරිපාලනය ආදී සියලුම කටයුතු වැටෙන්නේ මේ ගණයටය. එසේ සමාජයේ දක්නට ලැබෙන බලකාමය, ඇන කොටා ගැනීම, යහපත් කටයුතුවලට අකුල් හෙළීම, අල්ලස, දූෂණය ආදී නොයෙකුත් සමාජ පිළිලයන් ද මේ ක්‍රියාවලිය මගින් වළකා ගත හැක. තවදුරටත් සප්‍රාණික වස්තූන්ට ගරු කිරීම – ක්‍රියාවට පෙරළීමෙන් වෘක්ෂලතා ඇතුලු සියලුම පාරිසාරික සම්පත් රැක ගැනීමෙන් සියලු දෙනාගේම සුබ සිද්ධිය සඳහා ඇති අවස්ථාවන් පුලුල් වන අතර, පාරිසාරික දූෂණයෙන් ඊට වන බාධාවන් ද මඟ හරවා ගත හැක.

'මුදිතා' යනු කරුණා හරිත ක්‍රියාවක ක්ෂණික ප්‍රතිඵලයක් වශයෙන් මානසිකව ඇති වන සොම්නස් සහගත තත්වයකි. එය කෙටිකාලීනව පවතින්නක් බව කිව යුතුය. 'උපේක්ඛා' යනුවෙන් අදහස් කරන්නේ, මෙහිම වර්ධනය වූ දිගු කාලීන අවස්ථාවයි. මේ අවස්ථාව මානසිකව ස්ථායි සම චිත්ත ස්වභාවයක් ඇති කරවන අතර, මුදිතාව නිතර නිතර අත්දැකීමෙන් ලබන පුහුණුවෙන් ලැබිය යුතු

තත්වයකි. මේ තත්වයට ළඟා වන විට, මනස මුදිතාවට ඇබ්බැහිවීම නිසා නොසැලෙන ස්වභාවයකින් පිහිටයි.

ඡායාරූප: 374 – භාවනා

පුද්ගලයින්ගේ පෞරුෂ සංවර්ධනය සමාජයේ සෙසු සෑම සංවර්ධනයකම අඩිතාලම විය යුතු බව, සර්වෝදය තරයේ විශ්වාස කරයි. 'සතර බ්‍රහ්ම විහරණයේ' එන මෙත්තා ප්‍රතිපත්තිය – බලවත් චිත්ත ශක්තියක් ලෙස සර්වෝදය සේවක සේවිකාවන් දියුණු කර ගන්නා ආකාරය ප්‍රකාශ වන්නේ මෙසේය:

මේ පොළෝ තලයේ කොතනක ජීවත් වුවත්, අපි සියලුදෙනාම මනුෂ්‍යයෝ වෙමු. මනුෂ්‍යයා සතු ඉහලම බලය කල්පනා කිරීමට හා හිත දියුණු කර ගැනීමට ඇති බලයයි. හිත දියුණු කර ගත් මිනිස්සු – උනුන් කෙරෙහි ප්‍රිය මනාපව සුහදව සාධාරණව ජීවත්වීමේ ක්‍රමය නිරායාසයෙන්ම ලබත්. හිත දියුණු කර ගැනීමට ප්‍රයත්නයක් දරන්නේ නැතිව වචනවලින් සහ ක්‍රියාවලින් පමණක්, ප්‍රශ්න විසඳා ගන්නට යෑමේ දී, ඒවා තව තවත් අවුල් වී හැම දෙනාටම දුක් විඳීමට සිදු වේ. මේ නිසා සර්වෝදය පිළිවෙත පිළිගන්නා ලොකු කුඩා හැමදෙනාම තම තමන්ගේ සිත් සතන් දියුණු කර ගැනීමට යම් යම් චිත්ත ව්‍යායාමයන්හි යෙදෙති.

අප ජීවත් වන චිත්ත පරිසරය සාමයත් – සමගියත් – සුහදතාවත් ඇති වීමට ඉවහල් වන පරිදි ශක්තිමත් කිරීමේ පියවර පහකින් යුතු ක්‍රියා මාර්ගයක ඔවුහු යෙදෙති. සර්වෝදයේ අපි පෞද්ගලිකවත් සාමූහිකවත්, මෙහි විස්තර කෙරෙන භාවනාවේ යෙදී පෞද්ගලිකව ආධ්‍යාත්මික ශක්තියක් අපේ පෞරුෂයට එකතු කර ගන්නා අතරම, සාමූහික ආධ්‍යාත්මික ශක්තියක් අප ජීවත් වන ආධ්‍යාත්මික පරිසරයටද එකතු කරන්නෙමු.

පහත සඳහන් වන්නේ භාවනාවේ අරමුණු පහකි:

පළමුවෙනි අරමුණ: අපේ සිත සහ ගත අතර තිබෙන සම්බන්ධය නිතරම සිහියට නැගෙන අයුරු අපේ පෞරුෂයට චිත්ත බලයක් ඇතුලු කර ගැනීම.



ඡායාරූප: 374.1 – භාවනා

දෙවෙනි අරමුණ: නොයෙක් නොයෙක් අරමුණුවල නිතර නිතර යෙදී පුරුදු අපේ සිත්වලින් කිසිදු පාලනයක්, ශික්ෂණයක් නොමැතිව පිටවෙන චිත්ත ධාරාවන් තුළින් විසිර යන චිත්ත ශක්තිය හැකි තරම් දුරට එක් තැන් කර, එකම අරමුණකට සිත යොමු කර රඳවා ගැනීමේ හැකියාව පුරුදු පුහුණු කර, එම ශක්තිය අප පෞරුෂය තුළම රඳවා ගැනීම.

තෙවෙනි අරමුණ: එසේ එක් තැන් කරගත් චිත්ත ශක්තිය මෛත්‍රී භාවනාව තුළින් තවත් පුළුල් කර ශක්තිමත් කර ගැනීම.

සිව්වෙනි අරමුණ: තමා තුළ වර්ධනය කර ගත් එම යහපත් චිත්ත ශක්තීන් සහ සෙසු මනුෂ්‍යයින්ගේ සහ වෙනත් අදෘශ්‍යමාන ජීවීන්ගේ යහපත් චිත්ත ශක්තීන් අතර විශ්වමය සම්බන්ධයක් ඇති කර ගැනීම.

පස්වෙනි අරමුණ: දැ සමගිය සහ ලෝක සාමය පිළිබඳව අපේ සිත්වලින් අධිෂ්ඨාන ශක්තිය මුදා හැරීම.

මේ පස් වැදෑරුම් චිත්ත ව්‍යායාමය උදෑසන අවදි වූ විටත්, රාත්‍රියේ නින්දට යනවිටත්, පවුල් හමු රැස්වීම් ආදී සෙසු සාමූහිකව එක්වන වේලාවලදීත් පුරුදු පුහුණු කළ යුතුවෙමු.



ඡායාරූප: 374.2 – භාවනා

පළමු පියවර: පහසුවෙන් වාඩි වී පිට කොන්ද සහ හිස කෙලින් තබා ගෙන වම් අත උඩ දකුණු අත තබාගෙන, ශරීරය සැහැල්ලු කරන්න. ඇස් දෙක පියාගෙන, මාපට ඇඟිල්ලෙන් පටන් ගෙන හිස දක්වා තමන්ගේ සිත මාංශපේශීයෙන් මාංශපේශියට අවයවයෙන් – අවයවයට, යොමු කරන්න. ඒ මගින් මුලු සිරුර ම සිතින් සැහැල්ලු කර ගන්න. විනාඩි කිහිපයක් ශරීරය පුරා මේ අන්දමට හිත යැවීමෙන්ද ශරීරයට ඉතා සැහැල්ලු බවක්ද හිතට පහසුවක් ද දැනේ. දිනපතා ඉඩ ලත් සෑම අවස්ථාවකදී මේ අන්දමින් සිතෙන් ගත දෙස බැලීමට පුරුදු වුණු තැනැත්තා කියන කරන සෑම දෙයක දීම, සිතේ පාලනයට යටත්ව ඒවා සිදු කිරීමට පුරුදු වේ. මනුෂ්‍ය පෞරුෂයෙහි සිතත් – ගතත් යන දෙකම ඉතා ළඟින් බැඳී තිබෙන අයුරු එවිට නිරායාසයෙන්ම අපට අවබෝධ වේ.

ඡායාරූප: 374.3 – භාවනා

දෙවෙනි පියවර: විසිරී යන සිතිවිලි ඕනෑකමින් නිවැරදි සිහියෙන් යුතුව පාලනය කිරීමය. සෑම භාවනාවකටම මුල් වන ආනාපාන සති භාවනාව අපට මෙහිදී වැදගත් වේ. නාස්පුඩුවලින් අපේ ශරීරයට හුස්ම ඇතුලුවීම සහ පිටවීම දෙස හිත යොමු කිරීම මෙහිදී සිදු

ඡායාරූප: 374.4 – භාවනා

ඡායාරූප: 374.5
සාමූහික භාවනා



කළ යුතුය. එක් එක් අයගේ සිත එකඟ කිරීමේ ශක්තිය අනුව, මෙය පුරුදු කළ හැකිය. සී සී කඩ දිව යන චිත්ත ධාරාවන් එසේ විසිර යෑම නතර කළ යුතුය. අවශ්‍ය වන්නේ නාස් පුඩුවේ කෙළවර සිත තබා ගෙන එතැන පසු කොට හුස්ම ඇතුළට හා පිටතට ගමන් කරන ආකාරය සිහියෙන් යුතුව හිතින් බලා හිඳීම පුරුදු කිරීමය.

තෙවෙනි පියවර: තමන්ටත් අනුන්ටත් විශාල මෛත්‍රී සිතක් පහළ කර ගැනීමය. තමන්ගේ ශරීරය සුවපත් වීමටත්, තමන්ගේ සිතේ ලෝබකම, මෝඩකම, තරහ අඩු වී සිත සුවපත් වීමටත් ප්‍රාර්ථනා කළ යුතුය. මීළඟට තමාට ඉතා කිට්ටු මව, පියා, බිරිඳ, සැමියා, දරුවන්, ගුරුවරුන්, සොයුරු සොයුරියන්, වෙනත් නෑදෑ හිතවතුන් ආදී අය ගැන මෙනෙහි කොට, ඔවුන් සිතේ මවාගෙන ඔවුන්ගේ ගතත් සිතත් සුවපත් වෙත්වායි ප්‍රාර්ථනා කළ යුතුය. ඉන්පසු තමා නුරුස්සන අහිතවත් හැටියට සලකන අය ගැන ද, තමා නුදුටු, නොදන්නා සෑම කෙනෙකු ගැනම ද මුලු මනුෂ්‍ය වර්ගයා ගැනම ද සිතා, ඔවුන්ගේ ද සිතත් – ගතත් සුවපත් වෙත්වායි සිතිය යුතුය. අවසානයේ මේ මෛත්‍රී සිත සියලුම සතුන් ඇතුළත් වන සේ මුලු ජීව ලෝකයටම ව්‍යාප්ත කළ යුතුය.

මේ අන්දමින් තමන්ගේ මෛත්‍රී සිත ලොවටම පතුරුවන විට, පුදුම විදියේ සිතේ සැහැල්ලුවක් මෙන්ම – විවිධ පුද්ගලයින්, වස්තූන් හා සම්බන්ධකම් ආදිය වඩා සතුටු එළවන අන්දමකට තමන්ගේ සිතට පෙනෙන්නට ගනී. එමෙන්ම තමා තුළ විශාල ආත්ම ශක්තියක් මතුවන බව ද දැනෙන්නට පටන් ගනී. මිනිසා විසින් මිනිසකු වෙන් කිරීමට කෘතිම වශයෙන් ගොඩනගා ගෙන තිබෙන කුල, ජාති, ආගම්, පක්ෂ,

ඡායාරූප: 374.6 – සක්මන් භාවනා

පන්ති, වර්ණ ආදී භේදවල තිබෙන ව්‍යාජ – තේරුමක් නැති – ස්වභාවය ප්‍රත්‍යක්ෂ වේ. මනුෂ්‍යත්වයේ අගය හා මනුෂ්‍ය සිතේ බලය ඉතා සූක්ෂමව තමන්ට අවබෝධ වේ.

සිව්වෙනි පියවර: තමන්ගේ සිත තුළ ඇති කරගත් මේ ශක්තිය තමා වැනි සෙසු මිනිසුන්ගේ ද සිත් තුළ තිබෙන යහපත් ශක්තීන් සමඟ එකතු වේවා යන ප්‍රාර්ථනය ඇති කර ගැනීමය. එමෙන්ම තමා අදහන යම් දෙවිවරු ඇතොත්, ඔවුන් තුළ තිබෙන යහපත් සම්‍යක් ශක්තීන් ද – තමාගේ චිත්ත ශක්තිය සමඟ එකතු වේවායි යන ප්‍රාර්ථනය කිරීමය. මේ අන්දමින් තමා වර්ධනය කර ගන්නා චිත්ත ශක්තිය, චිත්තභ්‍යවකාශයේ සෙසු චිත්ත බලවේගයන් සමඟ සම්බන්ධ කර ගැනීමෙන්, තමාගේ සිත ද විශ්වමය – වේගාත්මක සිත් දැලක කොටසක් වෙයි. මුළු ලොව පුරාම හොඳ මිනිසුන් මෙන්ම, නරක මිනිස්සු ද සිටිති. අපට අවශ්‍ය වන්නේ හොඳ මිනිසුන්ගේ සිත්වලින් පිට වන හොඳ චිත්ත බලය චිත්තාභ්‍යවකාශයේ වඩා ශක්තිමත් කිරීමය. එවිට තව තවත් අය වැරදිවලට පෙළඹෙන්නේ නැතිව, හොඳ ක්‍රියාවලට පෙළඹෙති. වෛර කිරීම වෙනුවට, දයාව පැතිරීමට ඔවුනට සිත් දෙයි. ලෝබකම් කිරීම වෙනුවට, නිර්ලෝභීවීමට ඔවුන්ගේ සිත් යොමු වෙයි. මිනිසුන්ගෙන් ඈත්වීම වෙනුවට, මිනිසුනට ළංවීමට ඔවුනට සිත් දෙයි.

පස්වන පියවර: මෙම චිත්ත ව්‍යායාමයේ පස්වෙනි පියවර වන්නේ, අපේ ජාතියේ සමගියත් – ලෝකයේ සාමයත් ආදී වශයෙන් වූ

යහපත් ප්‍රාර්ථනයන්ය. ගතානුගතික වශයෙන් අප සමාජයේ ජීවත් වූ මිනිසුන් කළ මේ උතුම් ප්‍රාර්ථනය දෙස සිත් යොමු කරන්න:

කල් වැසි	වසීවා
කෙත් වතු	සාර වේවා
සත් සිත්	නිවේවා
රජය දැහැමි ව ලොවැඩ	වේවා

මෙම ප්‍රාර්ථනයෙහි කිසිදු උස්, පහත්, කුල, ජාති, පක්ෂ, ආගම්, භේදයක් තිබේ ද? සොබා දහම රැකී, පරිසරය සරු වී, සිත නිවී - තමනුත් අන්‍යයනුත් සියල්ලෝමත් සුවපත් වෙත්වා යන්න මෙහි මුඛ්‍ය අර්ථය යි.

ශ්‍රී ලංකාවේ ජීවත්වුණු පැරණි මිනිස්සු වෙහෙර විහාර වැඳ පුදා ගෙන, අවසානයේ දී තමා එක්රැස් කර ගත් පින්, එක් අතකින් තමන්ට වඩා සැපවත් දිවියක් ගෙවන සම්‍යක්දෘෂ්ටික දෙවිවරුන් ආදීන්ටත්, අනික් අතින් තමනට වඩා අඩු සැප ඇති ජීවිත ගෙවන මිථ්‍යාදෘෂ්ටික ප්‍රේත-පිසාච ආදී අනික් ජීවීන්ටත් ඔවුන් සුවපත් කරන අටියෙන් අනුමෝදන් කළහ. බටහිර පන්නයට අනුව, බුද්ධිමතුන් යැයි ඔවුනොවුන්ටම කියා ගන්නා සුලු කොටසක් හැරුණු විට, අදත් පන්සල්, කෝවිල්, පල්ලිවලට යන සාමාන්‍ය මිනිස්සු මේ අන්දමට සියලු සතුන් වෙත ඉමහත් මෛත්‍රියක් පතුරුවති.

මේ මෛත්‍රී චිත්ත ධාරාවන් සුදෝ සුදු චෛත්‍යයක ගර්භයේ පතිත වූ විට, එතැනින් පරාවර්තනය වී-තවත් චෛත්‍යයකට ද - අපේ චිත්තභ්‍යවකාශය පිරිසිදු කරමින් ගමන් කරන බව අපේ විශ්වාසයයි. එමෙන්ම බෞද්ධයා ඉතා භක්තියෙන් වඳින පුදන බෝධි වෘක්ෂයක පත්‍රවල මේ චිත්ත ශක්තීන් පතිතව, සෙසු වෘක්ෂලතාදියේ ආධාරයද ඇතිව, තවත් බෝධි වෘක්ෂයක පත්‍ර සමඟ යම් අන්දමක විද්‍යුත් සම්බන්ධකමක් ඇති කර ගන්නා බව ද අපේ විශ්වාසයයි.

අප ජීවත් වන පරිසරයේ ගස් කොළන් වැවීමේ අගය මෙහි දී අවබෝධ විය යුතුය. හින්දු, ක්‍රිස්තියානි, මුස්ලිම් ආදී සිද්ධස්ථානවල දේව භක්තියෙන් යාඥා කරන භක්තිමතුන්ගේ යහපත් චිත්ත ධාරාවන්ද මේ චිත්තභ්‍යවකාශයට - මේ අන්දමින්ම එකතු වන බව අපේ විශ්වාසයයි. ආගමික විශ්වාසයක් නැතත් - කාගේත් යහපත පතන වෙනත් අයගේ සිත්වලින් මතුවන යහපත් සිතිවිලි ධාරාවන් ද මේ චිත්තාභ්‍යවකාශයට එකතු වන බවට ද අපට සැකයක් නැත.

ජාතික සමගියකට තුඩු දෙන සෙසු සියලුම ක්‍රියාවලට මුල් විය යුත්තේ - ඕනෑකමින්ම වීර්යවත්ව - පුද්ගලයන් වශයෙන් සමූහ වශයෙන් අප විසින් ඇති කරනු ලබන මේ ආධ්‍යාත්මික පරිසරය බව සර්වෝදය විශ්වාස කරයි. අන් කුමන දෙයක් සම්පූර්ණ වුවත්, මේ ආධ්‍යාත්මික පදනම ස්ථිර වශයෙන් ඇතිවන තුරු ජාතික සමගියක් ඇති වන්නේ නැත.

දැනට අප රටේ උද්ගත වී ඇති තත්වය පිළිබඳව අසවල් පියවර ගත යුතු යැයි අප විසින් රජයට හෝ වෙනත් අයට හෝ කීම පමණක් ප්‍රමාණවත් නොවේ. එයින් කිසිදු ප්‍රතිඵලයක් ඇති වන බවක් පෙනෙන්නට නැත. ඊට හේතුව සනාතනික සාර ධර්ම පදනමක් නොමැතිව, ප්‍රශ්න විසඳීම වචනවලට හෝ තමා අයිති කොටසට පමණක් වාසිදායක වේ යැයි සිතන පටු ක්‍රියාමාර්ගවලට පමණක් හෝ සීමා වී බොහෝ දෙනා කටයුතු කිරීමය. මෙහි අවසාන ප්‍රතිඵලය වන්නේ එක් කොටසකට පමණක් නොව, සෑම කොටසකටම අහිතකර වූ මනෝවිද්‍යාත්මක සාමාජික - ආර්ථික සහ දේශපාලනික පිරිහීමකට රටේ ජීවත්වන සියලුම ජනයා පත්වීමය. මේ නිසා සර්වෝදය විශ්වාස කරන්නේ රජයට හෝ වෙනත් අයට විසඳුම් ඉදිරිපත් කරමින් සිටීමට වඩා, පෞද්ගලිකවත් - සාමූහිකවත් වත්මන් අර්බුදයට හේතුභූත වූ මූලික සාධකයන් සොයා ඒවා ඉවත් කිරීමය. සර්වෝදයේ විශ්වාසයේ හැටියට, අප සමාජය හසු වී තිබෙන පිරිහුණු ආධ්‍යාත්මික පරිසරය වත්මන් අසහනකාරී හිංසක තත්වයට ප්‍රධාන හේතුවය. ඒ හේතුව ඉවත් කළ හැක්කේ පෞද්ගලිකව සහ සාමූහික ව අප විසින් පුරුදු කරනු ලබන චිත්ත ව්‍යායාමයක් තුළින්, සාමූහික චිත්ත සමාධියක් ඇති වන අන්දමේ සිතිවිලි පරිසරයක් අප රට තුළ නැවත ගොඩනැංවීමෙනි.

'කුටුම්බෝදය' හෙවත් පවුලේ උදාවේ සිට 'විශ්වෝදය' හෙවත් ලෝක ප්‍රජාවේ උදාව දක්වා-සර්වෝදයට මග පෙන්වන තවත් සාර ධර්ම හතරකි. ඒවා නම්: බෞද්ධ දර්ශනයේ දැක්වෙන සතර සංග්‍රහ වස්තු හෙවත් 'දානය, ප්‍රියවචනය, අර්ථ චර්යාව, සමානාත්මතාව' යන සමාජ ධර්ම හතරය.

දානය

ශ්‍රමදානය නම්, තමන්ගේ කාලය, කායික ශ්‍රමය සහ සිතිවිලි සමාජයේ යහපත සඳහා බෙදා ගැනීමය. බුද්ධි දානය නම් දැනුම බෙදා ගැනීමය. ශිල්ප දානය නම් යමෙකු සතු ශිල්පීය දක්ෂකම් ප්‍රජාවේ යහපත සඳහා බෙදා ගැනීමය. භූමි දානය යනුවෙන් ඉඩම් පිළිබඳ

අයිතිය බෙදා ගැනීමත්, ග්‍රාමදානය යනුවෙන් ගම සාමූහික හැටියට සලකා – සියලු සම්පත් බෙදා ගැනීමත් අදහස් කෙරේ. වෛද්‍ය දානයෙන් වෛද්‍යාධාර, පෝෂ්‍යදායි ආහාර, බෙහෙත් වර්ග, ප්‍රථමාධාර, පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව සඳහා අවශ්‍ය දැනීම සහ සම්පත් බෙදා ගැනීම අදහස් කෙරේ. ධර්මදානයෙන් ආධ්‍යාත්මික දැනීම හෙවත් ආත්මාවබෝධය බෙදා ගැනේ.

දානය යන්නට – යම් සමාජයක සාමාජිකයන් සතු භෞතික වස්තූන් බෙදා ගැනීම පමණක් අදහස් නො කෙරේ. එයට සියලුම නිශ්චල චංචල වස්තූන් ද, ලැබූ දැනුම හා පවතින ශ්‍රමය ද ඇතුළත් වේ. මේ හැරෙන්නට, ජන සමාජයක් තුළ 'සංවිභාගය' හෙවත් සාධාරණ ලෙස බෙදී යෑමේ තත්ත්වයක් ඇති කිරීම ද දානය යන්නෙන් අදහස් කෙරේ. එනම් යම් සමාජයක සාමාජිකයන් අතර පවතින අන්තර් සම්බන්ධතා සමතුලිත බවකින් යුතු වීමය. සංවිභාගය යන්නෙන් අදහස් කරන්නේ යහපත් බෙදා ගැනීම වේ. වර්තමාන සමාජයේ පුද්ගලයන් වටා විවිධ ස්වරූපවලින් බලය ඒකරාශී වීමක් දක්නට ලැබීම නිසා, බලය අසමතුලිත ලෙස පවතිනු දක්නට ඇත. බලය මෙසේ මධ්‍යගත වීම, සමාජයකට ඉතාමත් ම හානිදායක තත්වයකි. මේ නිසා සමාජය කණ්ඩායම් වශයෙන් බෙදීමත්, උනුන් අතරේ විවිධාකාර මතභේද ගැටුම් ආදිය ඇතිවීමත් ප්‍රකට කරුණකි. සමාජ අස්ථායීතාවට හේතුවන්නේ මෙම තත්වයය. සංවිභාගය හෙවත් සමාජය තුළ බලය බෙදා හැරීම සමාජයක් සමතුලනය කරන ක්‍රමයයි. බලය විමධ්‍යගත කිරීමෙන් එය ඒකරාශීවීමක් නොවන අතර, අනිසි හා විනාශකාරී අයුරින් ප්‍රයෝජනයට ගැනීම ද වැළැක්වේ. ඒ සමඟම ඒ සියලුදෙනාටම සමාන අවස්ථාවක් සපයා දෙන්නක් බැවින්, සමාජයක් තුළ පැවතිය යුතු සමානාත්මතා මූල ධර්මයට ද ආලෝකයක් වේ. ආර්ථික සාධක පිළිබඳ කිව යුත්තේ ද, මෙයමය. සමාජය සතු නිෂ්පාදන සාධකයන් සුලු පිරිසක් තුළ ඒකාරාශි කිරීම වර්තමාන සමාජ ක්‍රමයේ විශේෂතම ලක්ෂණයකි. මෙහි ප්‍රතිඵල වශයෙන් සූරාකෑම, පෙළීම් ආදියත් එයට ප්‍රතික්‍රියා වශයෙන්, නොයෙකුත් හිංසාවාදී සිද්ධීන් ඇතිවීම ද දැක්විය හැක. දානය යන්නෙන් මෙම තත්වය ද සමතුලිනය කිරීම අදහස් කෙරේ. එනම් සමාජය සතු නිෂ්පාදන සාධක මුලුමහත් සමාජය සතු වීමය.

ප්‍රිය වචනය

ප්‍රිය වචනය යන්නට ද, සර්වෝදයෙන් පුළුල් අර්ථ කථනයක් කෙරේ. සැර පරුෂ වචනවලින්, කේලාම් කීමෙන්, මුසා බස් කීමෙන්, ප්‍රමණක් වැළකීම, මෙයින් අදහස් නොකෙරේ. ඒ සියල්ලෙන් ම වැළකෙන අතර, පොදු මහජනතාවට තේරුම් ගත හැකි සරල බසින් - පොදු මහජනතාව සඳහා සැකසෙන සැලසුම් ද ඉදිරිපත් නොවීම, එක්තරා විදියක අප්‍රිය වචන භාවිතයක් හැටියට සර්වෝදය කල්පනා කරයි. මේ නිසා පොදු මහජනතාව සඳහා සකස් වූ සංවිධානාත්මක අරමුණු හා ක්‍රියාදාමයන් ද බොහෝ විට ජනතාව අතරට යන්නේ, කුඩා දරුවනට පවා එක්ව ගායනය කළ හැකි කවි - ගී - සින්දු මාර්ගයෙනි. මෙය ජනතාව පසෙක තබා, ජනතාව වෙනුවෙන් ඉහළ ජාතික හෝ අන්තර්ජාතික මට්ටම්වල භාවිත වන සංවර්ධන භාෂාවට වඩා ඉඳුරාම වෙනස් වචන භාවිතයකි.

අර්ථචර්යාව සහ සමානාත්මතාව

අර්ථ චර්යාව සහ සමානාත්මතාව යන ප්‍රතිපත්තිය ද, සර්වෝදය විසින් විග්‍රහ කෙරෙන්නේ මේ අන්දමින්ම - දේශීය සාර ධර්මවලට සහ ජනතාවගේ සිතුම් පැතුම්වලට පටහැනි නොවන ආකාරයටය.

ග්‍රාමෝදය, ග්‍රාම ස්වරාජ්‍යය පිළිබඳව විග්‍රහ කිරීමේ දී සප්ත අපරිහානිය ධර්මයන්, සර්වෝදය පෙරමුණෙහි තබා ගනී. මේ ධර්මයන් තුළින් ස්ව ශක්තිය සාමූහිකත්වය සහ සැලසුම්ගත ක්‍රියා මාර්ගයක් ඔස්සේ ස්ව සංවර්ධන මාර්ගයකට පිවිසීමට අවශ්‍ය සමාජ සංයමය ජනතාවට ලැබේ. ගැමි ජනතාවගේ අරමුණ වන්නේ දරිද්‍රතාවයෙන් මිදී සුඛෝපභෝගීත්වය අරමුණු වූ පාරිභෝගික සමාජයක් බවට පත්වීම නොවේ. සොබා දහමත් - ධර්ම නීතියත් - සාධාරණ රාජ්‍ය නීතියත් යටතේ මූලික මානුෂික අයිතිවාසිකම් හා යුතුකම් රැකගෙන, මූලික මානුෂික අවශ්‍යතාවන් සහ සාමූහික අවශ්‍යතාවන් සම්පූර්ණ කර ගෙන ආධ්‍යාත්මික සදාචාර සහ සංස්කෘතික දියුණුව ඇති කර ගැනීමය.

ගැමි සමාජයේ පිරිහීම - පිරිහීමට හේතු - පිරිහීමෙන් මිදීම සහ ඒ සඳහා ගත යුතු මාර්ගය - සර්වෝදය විග්‍රහ කරන ආකාරය සසර දුකින් මිදීමට බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළ චතුරාර්ය සත්‍යය ආදර්ශයට ගෙන, සර්වෝදය විසින් නිර්මාණය කර ගත් දර්ශනයකි. චතුරාර්ය සත්‍යය පුද්ගලයාගේ සංසාරික මිදීම සඳහා වන අතර, ගැමි

සමාජය පිළිබඳ සර්වෝදය විග්‍රහය ලෞකික අරමුණක් සඳහා වූයේ වෙයි.

මේ දර්ශනය අනුව, සර්වෝදයෙන් මූලික මානුෂික අවශ්‍යතා දහයක් තෝරා ගෙන ඒවා සපුරා ගැනීමට අවශ්‍ය ශිල්පීය ක්‍රමයක් සහ ව්‍යුහයන් ගැමි ජනතාවට ඉදිරිපත් කරයි.

'නගරෝදය' පිළිබඳව මෙම සංකල්පනාවන්ම, නගරයට ගැලපෙන අන්දමට සකස් කරගෙන තිබේ.

සමස්ත ශ්‍රී ලාංකික ජනතාවගේ ආධ්‍යාත්මික – සදාචාර – සංස්කෘතික – සාමාජික – ආර්ථික සහ දේශපාලනික ජීවිතය ඒකාබද්ධව උදා කර ලීම හෙවත් 'දේශෝදය' සඳහා සර්වෝදය දර්ශනය අනුව අරමුණු පහක් පෙරමුණේ තබා ඇත. 'ධර්මද්වීප ධාන්‍යාගාර' පරමාර්ථය විග්‍රහ වන එම දේශෝදය මාර්ගය සැකෙවින් මෙසේ දක්වා ඇත.

දේශෝදය මාර්ගය

1. පෞද්ගලික, පවුල්, සමූහ, ග්‍රාමීය, නාගරික සහ ආයතනික යන සෑම මට්ටමකදීම මිනිසාගේ ආධ්‍යාත්මික සදාචාර හා සංස්කෘතික වටිනාකම් නැවත පුනරුත්ථාපනය කිරීම.
2. සමාජයේ අන්තයේ සිටින මිනිසුන්ගෙන් පටන් ගෙන ඉහළට සෑම මනුෂ්‍යයකුගේම දස විධ මූලික මානුෂික අවශ්‍යතා සපිරීම.
3. ඒකාබද්ධ සංවර්ධන අධ්‍යාපන වැඩ සටහන් වඩාත් ක්‍රියාත්මක කිරීම තුළින් ග්‍රාමීය හා නාගරික ප්‍රජාවන් තුළ පහත දැක්වෙන අංශවල සාමාජික සංවර්ධනයක් ඇති කිරීම.

    1. තත්වාබෝධය ඇති කිරීම
    2. තීරණ ගැනීමට ප්‍රජාව සහභාගි කරවීම
    3. ප්‍රජා සංවිධානය
    4. ප්‍රජා අධ්‍යාපනය
    5. සාමාජික සමානාත්මතාව
    6. සෞඛ්‍ය සංවර්ධනය
    7. දේශීය ඒකාග්‍රතාවය
    8. මූලික මානුෂික අයිතිවාසිකම් සම්පූර්ණයෙන් සැබෑ කිරීම

4. රටේ දේශපාලන බල ව්‍යුහය පහත සඳහන් ප්‍රතිපත්ති මත සංවිධානය කිරීම:

   1. පක්ෂවලින් තොර, ප්‍රජාතාන්ත්‍රික සහභාගිත්ව ආයතන ඇති කිරීම.
   2. ග්‍රාමීය සහ නාගරික මට්ටමේ ප්‍රජාතාන්ත්‍රික ආයතනවලට සම්පූර්ණයෙන්ම, විමධ්‍යගත වන සේ බලය බෙදා දීම.

5. ජාතික ආර්ථිකය පහත දැක්වෙන ප්‍රතිපත්ති මත සම්පූර්ණයෙන්ම ප්‍රතිසංවිධානය කිරීම:

   1. මූලික මානුෂික අවශ්‍යතා අතින් ජාතික ස්වයංපෝෂිත භාව ලබා ගැනීම.
   2. නිෂ්පාදන කාර්යයන් සඳහා කුඩා පරිමාණයේ, විමධ්‍යගත, සූක්ෂම, යෝග්‍ය තාක්ෂණය ලබා ගැනීම.
   3. දැනට පවතින නිෂ්පාදන සබඳතා සූරාකෑමෙන් තොර, භාරකාරත්ව සම්බන්ධකම්වලට නීතියේ බලයෙන් හැරවීම.
   4. සූරා කෑම පදනම් වූ අන්තර්ජාතික සබඳතාවලින් සම්පූර්ණයෙන්ම – මිදී ස්ව ශක්තිය ගොඩ නහා ගැනීම.

සංස්කෘතිය යනුවෙන් සර්වෝදය අදහස් කරන්නේ, මානුෂික සහ භෞතික අවශ්‍යතාවන් සපුරා ගැනීම සඳහා යම් මිනිස් සමාජයක් විසින් උපයෝගි කර ගන්නා සියලුම ද්‍රව්‍යමය සහ මානසික සම්පත්, ක්‍රම විද්‍යාවන්, තාක්ෂණ, කලා ශිල්ප, භාෂා ශාස්ත්‍ර සහ සංවිධානාත්මක ව්‍යුහයන් සමස්තයක් වශයෙන් ගත් කල එම සමාජයේ මතුවන අභ්‍යන්තරික මෙන් ම බාහිර රටාවය.

බෞද්ධ ධර්මයේ ආභාෂයෙන් ගොඩ නැඟී ඇති ශ්‍රී ලාංකික සංස්කෘතික රටාවේ අංශ හතරක් ගැන මෙසේ සඳහන් කළ හැකිය:

1. මනුෂ්‍යයන් වූ අපට, මේ ජීවිතයට පෙර ජීවිතයක් තිබෙන්නට ඇත. ඒ ජීවිතවල දී කළ හොඳ නරකවල බලපෑම් මේ ජීවිතයේදී අපට ඇතිවීමට පුලුවන. එමෙන්ම මරණයෙන් පසු අපට තවත් ජීවිත ගත කරන්නට සිදු වේ. මේ ජීවිතයේ දී අප කරන ක්‍රියා මරණින් මතු ජීවිත කෙරෙහි බලපානු ඇත. මේ නිසා අප සිතන කියන – කරන දේවල් මෙලෝ දියුණුවට පමණක් නොව, පරලොව දියුණුව ගැන ද සිතා කළ යුතුය. මේ අපේ සංස්කෘතියේ මුල් බැස ගෙන තිබුණු එක් දහමකි.

2. ශරීරයට අධික දුක් දීම මෙන්ම, ශරීරයට අධික සැප සම්පත් දීමද අත් හළ යුතු අන්තයන්ය. සත්‍යාවබෝධය නම් වූ විමුක්තිය හෙවත් නිවන ලැබීමට නම් මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කළ යුතුය. මිනිස් ජීවිතයේ අරමුණ අසීමිතව පිනවීම නොවේ. ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය ආදී අවශ්‍යතා සපුරා ගන්නා අතරම, ආධ්‍යාත්මික සදාචාර සංවර්ධනය ද සිදු විය යුතුය. බෞද්ධ සංස්කෘතියෙන් අගය කළේ, සරල චාම් ජීවන රටාවකි. එහි අවශ්‍යතා සපුරා ගැනීම සම්මා ආජීවයෙන් – නිවැරදි ජීවිකා වෘත්තීන් තුළින් කළ හැකිය.

3. පස් පව් හැටියට ගැනෙන කිසිදු ජීවන වෘත්තියකට සංස්කෘතික රටාවේ අනුබලය නොලැබුණි. උදාහරණයක් වශයෙන්, සත්ව ඝාතනය, කාමුක හැඟීම් මතු කරන විනෝදවීම, මත් ද්‍රව්‍ය නිෂ්පාදනය, සූදුව වැනි ක්‍රියාවන්ට පරාධීන සමයට පෙර තිබූ දේශීය ආණ්ඩුවලින් ආර්ථික සංවර්ධනයේ හෝ රැකියා සුලබ කිරීමේ නාමයෙන් කිසිදු රාජ්‍ය අනුග්‍රහයක් දුන්නේ නැත.

4. සොබා දහම පාලනය කිරීම වෙනුවට, සොබා දහමේ සම්පත්– සොබා දහම සමඟ සහජීවනයෙන් පැවතීම සඳහා යොදා ගැනීමේ ක්‍රම විද්‍යාවන් අපේ සංස්කෘතියේ දියුණු වී තිබිණි. වත්මන් යුගයෙහි සංවර්ධනයේ නාමයෙන් සිදුවන වනාන්තර විනාශ කිරීම, කඳු බෑවුම් එළිපෙහෙළි කිරීම, රසායනික ද්‍රව්‍ය ප්‍රමාණය ඉක්මවා භාවිත කිරීම, මහා පරිමාණ ව්‍යාපෘතින් කෙරෙහි විශ්වාසය තැබීම, ප්‍රාග් ධන සූක්ෂම යන්ත්‍ර සූත්‍ර භාවිතය යනාදී හැම ක්‍රම විධියකින්ම පෙනෙන්නේ මේ සහජීවන ප්‍රතිපත්තිය වෙනුවට, වාණිජමය සංස්කෘතික රටාවකට හසු වී – අපේ රටේ සොබා සම්පත් විනාශ කිරීමේ හා නැති ප්‍රශ්න අපේම මෝඩකමින් ඇති කර ගැනීමේ මාර්ගයක අප ගමන් කරන බවය.

සාමාජික ප්‍රගතිය

සර්වෝදය දර්ශනය අනුව යම් රටක සාමාජික ප්‍රගතිය මනින්නේ කරුණු අටක් පදනම් කර ගෙනය. ඒවා එකිනෙක සැකෙවින් සලකා බලමු:

1. පළමුවෙන්ම, මිනිසාගේ පූර්ණ පෞරුෂෝදයට තුඩුදෙන ආත්මාවබෝධය ඇති කර ගැනීමට ඉවහල් වන අධ්‍යාපනයක්

සෑම මනුෂ්‍යයකුටම ලැබිය යුතුය. අවාසනාවකට මෙන්, අප විධිමත් අධ්‍යාපනය ගැන කෙතරම් පුරසාරම් දෙඩෙව්වත්, මේ අංශය පිළිබඳ ව එතරම් සැලකිල්ලක් යොමු කර නැති බව පිළිගත යුතු ය. මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ ඕනෑම පටු අරමුණක් ඔස්සේ – සමාජ විරෝධී ක්‍රියාවන් කිරීමට පවා යොමු කර විය හැකි පිරිසක් අප අතරේ සිටීමය. මෙයින් වැඩි දෙනෙකු යොවුන් වියේ සිටින අය නිසා, ඔවුන්ගෙන් වැරදි ප්‍රයෝජන ගැනීමට සමාජ විරෝධී බලවේගවලට හැකියාවක් ලැබී තිබේ. ආත්මාවබෝධය අඩු ජන අනුපාතය වැඩි වූ තරමට, එවැනි සමාජයක ඒ ප්‍රමාණයටම සමාජ පරිහානියක් ඇති වේ.

2. යම් සමාජයක පුද්ගලයන් තුළ ප්‍රජාව පිළිබඳ අවබෝධයක් තිබිය යුතුය. තමා ජීවත්වන සමාජය පිළිබඳව යථාර්ථය නොදැනීම ද, විධිමත් මෙන්ම – අවිධිමත් අධ්‍යාපනයේ වරදින් සිදු වන්නකි. ප්‍රජා අධ්‍යාපනය, ප්‍රජා සංවර්ධනය ආදී ශිල්පීය ක්‍රම තුළින් ප්‍රජාව පිළිබඳ අවබෝධයක් වැඩි ජන අනුපාතයකට ලබා දුන් තරමට එම ප්‍රජාව සාමාජිකව දියුණු වේ.

3. ප්‍රජාවට බලපාන විවිධ දේවල් පිළිබඳ ව ප්‍රජාව විසින් ම තීරණ ගැනීමේ හැකියාව, සලකා බැලිය යුතුය. මෙම තීරණ ගැනීමේ බලය ප්‍රජාතාන්ත්‍රික සමාජයක ජනතාව සතු පරම උරුමයකි. නිදහසෙන් පසු ලංකාවේ ඇති වූ සෑම රජයක්ම වාගේ, මෙම අයිතිය නොයෙක් හේතු දක්වා ප්‍රජාව තුළින් උදුරාගෙන තිබේ. ප්‍රජාවක යම් අසහනයක් ඇති වූ විටක, රාජ්‍යයේ දණ්ඩ බලය සොයා යනු විනා, ප්‍රජා නායකයනට ඉදිරිපත් වීමට ඇති ඉඩකඩ දැන් ඇහිරී තිබෙන්නේ මේ තීරණ ගැනීමේ අයිතිය – දේශපාලන බලධාරීන් වෙත පවරා ගෙන තිබීම නිසාය. මෙහි අනිෂ්ඨ විපාක වඩ වඩා භයානක ස්වරූපයෙන් අද අපි භුක්ති විඳිමු.

4. යම් සමාජයක තිබෙන සංවිධානාත්මක ස්වභාවය වැදගත්ය. අප රටේ පණ්ඩුකාභය යුගයේ දී පවා තිබූ ගම්සභා ක්‍රමය ගැන අපි උදම් අනමු. එහෙත් දේශපාලන වශයෙන් දියුණු යැයි කියා ගන්නා වර්තමානයෙහි, ගැමි හෝ නාගරික ප්‍රජාවකට ලැබී තිබෙන්නේ දේශපාලන නායකයින්ගේ අභිමතය පරිදි අවුරුදු කිහිපයකට වරක් ලැබෙන අවස්ථාවන්හි දී – මධ්‍යගත ආයතනයකින් ඉදිරිපත් කරන කිහිප දෙනෙකුගෙන් එක්

කෙනෙකු සඳහා – කතිරයක් ගැසීමේ තත්පර කිහිපයක බලයක් පමණි. දීර්ඝ කාලයක් තිස්සේ මේ අන්දමින් බලය හීන වූ ජනතාවගෙන් කොටසක්, රට දෙකට කැඩීමට තැත් කිරීම පුදුමයක් නොවේ. පුදුමය නම්, එවැනිම අරගල වෙනත් වෙනත් ගෝත්‍රීය හෝ ආගමික හේතූන් උඩ ඉදිරියට ද ඇති නො වූයේ නම්ය. තම ජන ජීවිතයට බලපාන තීරණ කෙරෙහි නීත්‍යානුකූලව සංවිධානාත්මක ව තීරණ ගැනීමේ බලය තිබෙන ප්‍රමාණයට එම සමාජය සාමාජික ව දියුණු වේ. සර්වෝදය ග්‍රාම ස්ව රාජ්‍යයක් ඉලක්ක කරගෙන කටයුතු කරන්නේ මේ හේතුව නිසාය.

5. සමාජ සමානත්වය වැදගත්ය. මෙය ද නීතියෙන් පමණක් නොව, විධිමත් සහ සෙසු සියලුම අධ්‍යාපන ක්‍රමවලින් – මිනිස් පෞරුෂයට කාවැද්ද විය යුතු ගුණයකි.

6. සමාජයක ප්‍රගතිය මනින්නේ, එහි ජීවත්වන මිනිසුන්ගේ සෞඛ්‍ය තත්වය මතයි. වෛද්‍ය විද්‍යාව සහ සෞඛ්‍ය විධි කොතරම් දියුණු වුවත්, ප්‍රජා සෞඛ්‍යය දිනෙන් දිනම රසායනික පෙතිවලටත්, කෘත්‍රිම "විෂ" කැවූ ආහාරවලටත් යටත් වන බව පෙනේ. රෝග සුව කිරීමට වඩා, රෝග වැළැක්වීමට තුඩු දෙන සෞඛ්‍ය තත්වයක් සමාජයේ ඇති වන්නේ අප මෙතෙක් සඳහන් කළ සියලුම කරුණු මුල් කරගෙනය. ඒ සියල්ල එකිනෙකට බැඳී තිබේ.

7. මූලික මානුෂික අයිතිවාසිකම් සහ යුතුකම් – සෑම ශිෂ්ට සමාජයක් විසින් ම අනුමත කරන ප්‍රතිපත්ති පද්ධතියකි. අප විදේශයනට යටත්වීමට පෙර, මේ මූලික මානුෂික අයිතිවාසිකම් සැපිරීම පිළිබඳ ඉතා හොඳ වාර්තාවක් තැබූ ජාතියකි. එහෙත් අද විදේශිකයන්ගෙන් මානුෂික අයිතිවාසිකම් පිළිබඳ බණ ඇසීමට තරම් නිවට ජාතියක් බවට අපි පත්ව සිටිමු. එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ දී පවා ඔවුහු අප රට ගැන ප්‍රශ්න අසති.

8. ජාතියේ ඒකීය භාවය සහ ඒකාග්‍රතාව පිළිබඳ යථා තත්ත්වය අපේ සමාජ ප්‍රගතිය පිළිබිඹු කරන තවත් මිණුම් දණ්ඩකි. මෙය සිංහල–දෙමළ ජාති දෙක අතර පමණක් නොව,

රට පුරා සෑම ජන කොට්ඨාශයක් තුළම දුර්වල වී ඇති බව පිළිගත යුතු වෙමු. රට දෙකට කැඩීම පිළිබඳ ප්‍රශ්නය – දේශපාලන පාඨයක් හැටියට පමණක් සැලකීමට, සමහරු පුරුදුව සිටිති. රට දෙකට හෝ තුනට හෝ හතරට හෝ කැඩීමට යමෙකු පෙළෙඹෙන හේතු තිබිය යුතුය. හැඟීම්වලට බරව සිතන්නේ නැතිව ගැඹුරට කල්පනා කළහොත්, සමහරුන් පටු බලකාමී අදහසින් මේ සඳහා පෙළඹවිය හැකි අතර, තවත් අය මනුෂ්‍යයන් හැටියට ආත්ම ගරුත්වයෙන් සහ ජීවිත ආරක්ෂාවෙන් යුතු ව ජීවත්වීම සඳහා මෙවැනි හිංසක මාර්ගවලට පෙළඹෙනු ඇත. මේ පෞද්ගලික නිදහස සහ ආත්ම ප්‍රකාශනය මනුෂ්‍යයකුට භුක්ති විඳිය හැක්කේ, විශේෂයෙන් – මහා පරිමාණ ආයතන තුළ ද ඔවුනොවුන් හඳුනන ජන කොට්ඨාශ තුළ ද යන ප්‍රශ්නය මෙහිදී පැන නැගේ. සර්වෝදය විශ්වාස කරන්නේ රටේ ඒකීයභාවය සහ ඒකාග්‍රතාවය ආරක්ෂා වන්නේ රට දෙකට තුනට කැඩීමෙන් නොව, වර්ග සැතපුම් 24,000 කට සමීප, – වූ අප රටේ ග්‍රාමීය සහ නාගරික ජන කොට්ඨාශවලට උපරිම වශයෙන් බලය විමධ්‍යගත වන විදියේ නිදහස් සාමාජික, දේශපාලනික සහ ආර්ථික ඒකක ගොඩනැංවීමෙන් බවය. ග්‍රාම ස්ව රාජ්‍ය, නගර ස්ව රාජ්‍ය, ප්‍රජා ස්ව රාජ්‍ය දේශපාලන සංකල්පනාවන් අනුව ක්‍රියා කිරීමෙන් පමණක් බව ය. පක්ෂ දේශපාලනය, ජාති, කුල, ගෝත්‍ර, ආගම් භේද ආදිය පදනම් කොට කවදාවත් මේ ප්‍රශ්නයට විසඳුම් සෙවිය නොහැකිය.

සර්වෝදය ව්‍යාපාරය සාමාජික ප්‍රගතියක් ඇති කිරීම සඳහා පැහැදිලි සමාජ සංවර්ධන ක්‍රියාමාර්ගයක් අවුරුදු 42 ක පමණ සිට ක්‍රියාත්මක කර ගෙන යනු ලැබේ.

සර්වෝදයේ 'විශ්වෝදය' අරමුණු සහ ක්‍රියා මාර්ගයන් සකස් කර ගැනීමේ පරමාර්ථයෙන්, මොරටුව මූලස්ථානයේ ද – නෙදර්ලන්තයේ එන්ස්කඩේ නුවරදී ද, සර්වෝදය අන්තර් ජාතික සම්මන්ත්‍රණ දෙකක් 1980 සහ 1982 දී පැවැත්විණි. ඒවායේ දී පිළිගත් 'සර්වෝදය විශ්වෝදය' අරමුණු මෙසේය:

1. ඔවුනොවුන්ගේ ඓතිහාසික හා සංස්කෘතික තත්වයනට අනුකූල වන පරිදි, ලෝකයේ සියලු රටවල ප්‍රබෝධමත් වූ පුද්ගලයන් සහ කණ්ඩායම් පෞරුෂෝදය, කුටුම්බෝදය, ග්‍රාමෝදය,

නගරෝදය සහ දේශෝදය ව්‍යාපාර ආරම්භ කිරීම සහ දියුණු කිරීම බලවත් කළ යුතුය.

2. මෙම පුද්ගලයන් සහ සංවිධාන සමීපත්වය සහ සහෝදරත්වය යන අංශ දෙක පදනම් කොට, ඉතා කිට්ටුවෙන් අත්දැකීම් හුවමාරු කර ගත යුතු අතර, ඔවුනොවුන්ට අන්‍යෝන්‍යව ආධාර වීම ද කළ යුතුය.

3. විශ්වමය සාරධර්ම මුල් වූ පහත සඳහන් විකල්පීය ක්‍රියා මාර්ග ඔවුන් විසින් පිළිගත යුතුයඃ

   i. නව සරල ජීවන රටාවක් ගොඩනැංවීම.
   ii. නිෂ්පාදනය–හුවමාරු සහ පරිභෝජනය පිළිබඳ නව ශිල්පීය ක්‍රම සහ ව්‍යුහයන් ගොඩනැංවීම.
   iii. දැනට පවතින මතවාදී සීමා හා දේශපාලන පවුරු අබිබවා ඔවුනොවුන්ට උදව් වීම.

4. ආදර්ශයෙන් අහිංසාවාදී ආරක්ෂක සංවිධාන සහ ශිල්පීය ක්‍රම ගොඩනැංවීමේ ප්‍රයත්නවලට සහයෝගය දෙන අතර හිංසක මාර්ගවලට හැමතින්ම විරුද්ධ විය යුතුය.

5. ලෝකයේ ඕනෑම තැනක සිදුවන ස්වභාව ධර්මය වනසන, පරිසරය දූෂණය කරන, පරිසර අසමතුලිතතාව ඇති කරන, මානසික සහ ආර්ථික දරිද්‍රතාවය ඇති කරන නිෂ්පාදන ක්‍රමවලට තරයේ විරුද්ධ විය යුතුය.

ලෝක සමාජයේ දේශපාලනික සහ ආර්ථික අර්බුදකාරී තත්වය උග්‍රවීමත් සමඟ ම, පසුගිය අවුරුදු කිහිපය තුළ දී සර්වෝදය දර්ශනය කෙරෙහි ලෝක ජනතාවගේ අවධානය වඩ වඩාත් යොමුවන්නට විය.

මේ අනුව විවිධ රටවල පැවැත්වූ අන්තර් ජාතික සමුලු අමතා සර්වෝදය අන්තර් ජාතික ප්‍රතිපත්ති හා අරමුණු විග්‍රහ කිරීමට මට අවස්ථාව ලැබුණේය.

දැනට ශ්‍රී ලංකාවේ පවතින අර්ථ ක්‍රමය වෙනුවට, සර්වෝදය විකල්පීය අර්ථ ක්‍රමයන් ඉදිරිපත් කරයි. සාමාන්‍යයෙන් ආර්ථික දියුණුව යනුවෙන් කුමක් අදහස් වේ ද? එවැනි ජීවිත රටාවක – ආර්ථික අවශ්‍යතා සේවාවන් නිෂ්පාදනය කිරීමේ ප්‍රවේගය සහ ප්‍රමාණය ඒවා මහජනයාගේ පාරිභෝජනය සඳහා බෙදී යන පිළිවෙල සහ නිෂ්පාදනය සඳහා ආර්ථික නිෂ්පාදනයේ සාධකයන් ලෙස සලකන භූමිය, ශ්‍රමය, ප්‍රාග් ධනය, ව්‍යවසාය විවිධ තාක්ෂණික ක්‍රමයන් ද යොදා ගෙන,

එක්තැන් කරන අන්දම ආදී විෂයයන් සම්බන්ධ අංශයන් පිළිබඳ ප්‍රගතිය මැනීමකි.

සර්වෝදය ඇසින් බලන විට, ආර්ථික සංවර්ධනය දෙස බලනු ලබන්නේ මීට වඩා පුළුල් වූ දෘෂ්ටියකිනි. සාර්ථක මනුෂ්‍ය ජීවිතයක් යනුවෙන් කුමක් අදහස් වේ ද? එවැනි ජීවිත රටාවක ආර්ථික අවශ්‍යතා මොනවා ද? මේ අවශ්‍යතා සපුරා ගැනීමට තරම් ප්‍රමාණවත් ජාතික සම්පත් අප සතුව තිබේ ද? සම්පත් සහ අවශ්‍යතා සම්බන්ධ කිරීමේදී කුමන අන්දමේ තාක්ෂණ ක්‍රමයක් අපට ඔරොත්තු දෙනු ඇත්ද? කොතෙක් දුරට මූලික මානුෂික අවශ්‍යතා සපුරා ගැනීමටත් පොදු අවශ්‍යතා සපුරා ගැනීමටත්, අපේ සම්පත් බෙදී යා යුතු ද? විමධ්‍යගත ස්වයංපෝෂිතභාව සහ මධ්‍යගත වෙළඳ පලකට නිෂ්පාදනය කිරීම අතර තබා ගත යුතු සමබරතාව කුමක් ද? කොතෙක් දුරට කුමන අංශවලින් – කෙබඳු ප්‍රමාණයකට – විදේශීය ආර්ථික ව්‍යුහයන් සමඟ සම්බන්ධකම් ඇති කර ගත යුතු ද? සොබා දහමත් – මනුෂ්‍ය සමාජයත් – සෙසු සත්ව ලෝකයත් සමඟ අපේ ආර්ථික කටයුතුවල දී තබා ගත යුතු සම්බන්ධතාව කුමක් ද? ආර්ථිකය ගැන කතා කිරීමේදී, මේ සියල්ල ගැන සර්වෝදයේ අවධානය යොමු වේ. සර්වෝදය විශ්වාස කරන අර්ථ ක්‍රමය සහ වර්තමානයේ බලපවත්වන අර්ථ ක්‍රමය පහත සඳහන් අන්දමින් සසඳා බලමු:

වර්තමාන අර්ථ ක්‍රමය

1. මිනිසාගේ ආශාවන් සපුරා ලීමට ක්‍රියා කරයි.
2. කාර්මික සමාජ ආදර්ශයට ගෙන – දේශීය සම්පත්වලට ඔරොත්තු නොදෙන – ජීවන රටාවකට ජනතාව හුරු කිරීමට ආධාර දෙයි.
3. මහා පරිමාණ යෝජනා ක්‍රම – නවත ම කාර්මික ශිල්පීය ක්‍රම විශාල ප්‍රාග්ධන ආයෝජන සහ වාණිජ බලවේග කෙරෙහි විශ්වාසය තබයි.
4. මුදල් ආදායම් මුල් වූ – නිෂ්පාදනවලට මුල් තැන දී, අවශ්‍යතා සපුරා ගැනීම ආදායම් මට්ටමට පැවරේ. ජීවන රටාවේ දියුණුව ප්‍රමාණාත්මකව මනී.
5. භූමිය, ශ්‍රමය, ප්‍රාග් ධනය, ව්‍යවසාය යන ආර්ථික නිෂ්පාදන සාධක හතර, ආර්ථික සැලසුම් සෑදීමේ මූලික සිද්ධාන්ත හැටියට සලකයි.

6. සමාජයේ සියලුම දෙනාට එක්තරා වයසකින් පසු, පෞද්ගලික වේතනයක් හෝ ආදායමක් ලැබිය යුතුය යන සංකල්පය පිළිගෙන, ප්‍රධාන වශයෙන් රැකියා නියුක්තිය ඉලක්ක කොට සැලසුම් හදයි.

7. විදේශීය ආධාර, විදේශීය ණය, විදේශීය කළමනාකාරිත්වය, විදේශීය තාක්ෂණය සහ ආයාත – නිර්යාත ආර්ථිකය කෙරෙහි විශ්වාසය තබා, කාර්මික රටවල් පාලනය කරන අන්තර් ජාතික ආර්ථික ව්‍යුහයට ශ්‍රී ලාංකික ආර්ථිකය බැඳ තබයි.

8. ග්‍රාමීය ආර්ථිකයේ 'සාරය' නගරවලට සහ විදේශයනට ඇදී යාමට මග සලසයි.

9. මිනිසා විෂම අර්ථ චක්‍රයකට හසු වූ අසහනකාරී පුද්ගලයකු බවට පත් කරයි.

10. ධන සම්පත් සුලු පිරිසකගේ අතට පත් කොට, ඔවුන් සුඛෝපභෝගී විනෝදකාමී – නාස්තිකාරයන් කරන අතර, බහු ජනතාව වඩ වඩාත් අගහිඟකම් වලින් පිරුණු ප්‍රකෝපකාරී පිරිසක් බවට පත් කරයි.

සර්වෝදය අර්ථ ක්‍රමය

1. මිනිසාගේ අවශ්‍යතා සපුරාලීමට අවධානය යොමු කරයි.

2. ආධ්‍යාත්මික, සදාචාර, සංස්කෘතික ආභාෂයන් සහ සාමාජික යථාවබෝධයකින් යුතුව හැඩගස්වා ගත යුතු ජීවන රටාවකට ජනතාව හුරු කිරීමට වෙහෙසෙයි.

3. කුඩා පරිමාණ යෝජනා ක්‍රම, යෝග්‍ය කාර්මික ශිල්පීය ක්‍රම, කුඩා පරිමාණයේ ප්‍රාග් ධන ආයෝජන සහ ජනතා පාලනයට යටත් වන වාණිජ සංවිධානයන් කෙරෙහි විශ්වාසය තබයි.

4. අවශ්‍යතා සැපිරීම මුල් වූ නිෂ්පාදනයට මුල් තැන දී, ජීවන රටාව ප්‍රමාණාත්මක ව පමණක් නොව, ගුණාත්මක මිණුම් දඬු –වලින්ද මනී.

5. සොබා දහම, මනුෂ්‍යයා, සමාජයීය සම්පත්, විද්‍යා ඥානය සහ ප්‍රඥාව ආර්ථික ප්‍රගතියට මුල් වන මූලික සාධක ලෙස සලකයි.

6. නිවැරදි ජීවන මාර්ගයක් තුළින් (සම්මා ආජීවය) මානුෂික අවශ්‍යතා සැපිරීමේ (ආර්ථික) ව්‍යායාමයක සියලුම මනුෂ්‍යයන් යෙදිය යුතුය යන සිද්ධාන්තය මත සැලසුම් හදයි.

7. ස්ව ශක්තිය, දේශීය සම්පත්, දේශීය ඉතිරි කිරීම්, දේශීය ආයෝජන, දේශීය කර්මාන්ත, දේශීය නිර්මාණත්වය, යෝග්‍ය තාක්ෂණය, ජාතික ස්වයංපෝෂණය කෙරෙහි විශ්වාසය තබා, ස්ව ශක්තියෙන් යුතුව නැඟී සිට, විදේශීය ආර්ථික ග්‍රහණයෙන් මිදී දේශීය ආත්ම ගරුත්වයෙන් යුතුව විදේශීය ආර්ථිකයන් සමඟ සම්බන්ධය පැවැත්වීම විශ්වාස කරයි.

8. ග්‍රාමීය ආර්ථිකයට ධනය ඇදී ඒමට සහ ග්‍රාමීය ආර්ථිකය පණ පෙවීමට මග සලසයි.

9. මිනිසා සේවා තෘප්තියක් ලබන සහනදායි පුද්ගලයෙකු බවට පත් කරයි.

10. සියලුම දෙනා මූලික මානුෂික අවශ්‍යතා සම්පූර්ණ කර ගත් පිරිසක් බවට පත් කරන අතර, ඔවුන්ගේ ජීවන රටාව තෘප්තිමත් නිර්මාණාත්මක සරල සංස්කෘතික ජීවිතයක් දෙසට යොමු කරවයි.

සර්වෝදය ආර්ථික අරමුණු සමහරක් වත්මන් සමාජයේ පවතින ස්වභාවයන් සමඟ මේ අන්දමින් සංසන්දනය කළ හැකිය. ජනතාවගේ දෛනික ජීවිතය සහ සිතුම් පැතුම්වලින් බාහිරව ජීවත් වන අතර මනෝරාජික ප්‍රජාතන්ත්‍රවාද සහ සමාජවාද ගැන ද සිද්ධාන්ත හදන සමහර වරප්‍රසාද ලද්දෝ, ඉහත සඳහන් සංසන්දනය සහ වෙනත් අප දැක් වූ බොහෝ අදහස් හාස්‍යයට භාජනය කරනු ඇත. ඔවුන්ගේත්– අපගේත් වෙනස නම් ඔවුන්ගේ දර්ශනය වචනයට සීමා වී ඇති අතර, අප මේ දක්වන සෑම අදහසක්ම යම් ප්‍රමාණයකට හෝ ඇස් ඉදිරිපිට ක්‍රියාත්මක කර තිබීමයි. සර්වෝදයේ ආර්ථික ක්‍රියාදාමයන් තුළින් ලත් අත්දැකීම් බොහෝය. ඉන් සමහරක් මෙහි සඳහන් කරනු වටී:

ප්‍රජාවක ආර්ථික සංවර්ධනය ඉහත සඳහන් කළ සංවර්ධන අංශ පහ සමඟ කිට්ටුවෙන් බැඳී සිටී. මේ නිසා ශ්‍රමදාන කඳවුරක් වැනි ක්‍රියා මාර්ගයක් තුළින් ප්‍රජාව තුළ මනෝවිද්‍යාත්මක පදනමක් දැමීම, භෞතික අවශ්‍යතාවන් කිහිපයක් පෙරමුණේ තබාගෙන අනුගමනීය කඳවුරු මාර්ගයෙන් ඒවා එක දිගටම සපුරා ලීම, විවිධ සාමාජික හවුල්වලට ප්‍රජාව සංවිධානය කොට, දශ විධ මානුෂික අවශ්‍යතා ඔස්සේ ඒවා ක්‍රියාත්මක කිරීම, නිජ නායකත්වයක් – විශේෂයෙන් සාමූහික නායකත්වයක් – ගැමි මට්ටමින් ගොඩ නැඟෙන පරිසරයක් සාදා, ඔවුන්ට ප්‍රජා නායකත්ව පුහුණුවක් දීම, ගමේ අවශ්‍යතාවන් සහ ගම පත් ව ඇති සංවර්ධන මට්ටම් අනුව ශිල්පීය පුහුණුවක් ලබා දීම, ඉතිරි

කිරීම් – ණය දීම් ආයෝජනය යන විවිධ මාර්ග ඔස්සේ, මැද වෙළෙන්දාගෙන් මිදීමට මෙන්ම, අවශ්‍ය ප්‍රාග් ධනය සොයා ගැනීමට මගක් සාදා ගැනීම, පොදු වෙළෙඳසැල් – සාමූහික ආර්ථික – ව්‍යාපෘති, ගැමි සංවර්ධන බැංකු ආදිය මගින් ගැමි ආර්ථික නිවහල් බව ඇති කර ගැනීම ආදිය පියවරෙන් පියවර සර්වෝදයෙන් ක්‍රියාත්මක වී තිබෙන ප්‍රජා සහභාගිත්ව ආර්ථික පුනර්ජීවන මාර්ගයයි. මෙය ස්වයං වර්ධන ආර්ථික ක්‍රමයකට පරිවර්තනය වන්නේ ජාතික මට්ටමේ ආර්ථික ප්‍රතිපත්ති සහ දේශපාලනික ප්‍රතිපත්ති ඉහත දැක් වූ අන්දමට වෙනස් වූ විටය. එහෙත් ඒ වනතුරු අපි නිහඬව නොසිට, අප වැඩ කරන ගම්මානවල අපේ ශක්ති ප්‍රමාණයෙන් – ශක්තිමත් ආර්ථික පුනර්ජීවන පදනමක් දමන්නෙමු.

ආර්ථික සංවර්ධනය ගැන සලකා බලන විට, කාර්යක්ෂමව නිෂ්පාදනය කිරීම, නිෂ්පාදනය කරන දේ ආරක්ෂා කර ගැනීම මෙන්ම, නිෂ්පාදනයේ දී ඉවහල් කර ගන්නා මූල සම්පත් විනාශ නොකිරීම, නිෂ්පාදනය සිදුවන සාමාජික පරිසරයෙහි මනුෂ්‍යත්වය ආරක්ෂා කර ගැනීම යන කාරණා ද වැදගත්ය. පරිසර දූෂණය සහ පාරිසාරික අසමතුලිත බව, පවුල් ජීවිතය අවුල් වීම, ඇති නැති පරතරය වැඩිවීම, මානසික රෝග අධික වීම, අපරාධ වැඩිවීම, හදිසි අනතුරුවලින් මිය යන සංඛ්‍යාව වැඩිවීම., ආහාර විෂවීම ආදී විනාශකාරී ප්‍රතිඵලවලින් බේරී අපේ ආර්ථික සංවර්ධනය සිදු විය යුතුය.

සර්වෝදය සේවක සේවිකාවන් විසින් නිතරම තම සේවා ක්ෂේත්‍රයේ ප්‍රගතිය අගය කරන විට, මෙතෙක් අප කතා කළ ආර්ථික සංවර්ධනය ගැන ද විචාරක්ෂියෙන් බැලීම වැදගත්ය.

සර්වෝදය කිසිදු පක්ෂ සහ බලකාමී දේශපාලනය සමඟ සම්බන්ධයක් නැත. එහෙත් දේශපාලන සංවර්ධනය පිළිබඳ පැහැදිලි දර්ශනයක් සර්වෝදයට තිබේ. එය පැහැදිලි කිරීමට මම කැමැත්තෙමි:

"බොහෝ දෙනා අපෙන් නඟන ප්‍රශ්නයක් නම්, අප කුමන දේශපාලන පක්ෂයකට අයත් ද යන්නයි. පක්ෂ දේශපාලනයෙන් ඈත්ව අප ව්‍යාපාරය මෙහෙයවන බව පවසන විට, සමහරු එය විශ්වාස නො කරති. එසේ නම් රජයේ අසවල් වැඩ පිළිවෙළට සහයෝගය දෙන්නේ මන්දැයි ඔවුහු අසති. රජය තේරී පත් වූ පසු කාටත් පොදු බවත්, අපේ ප්‍රතිපත්තිවලට පටහැනි නොවන – ජනතා සුබ සිද්ධියට ප්‍රයෝජනවත් වන – සංවර්ධන සහ සුබ සාධන ක්‍රියාවල දී සහාය දීම, රජය කරවන අයගේ දේශපාලන පක්ෂයට පක්ෂපාතී කමක් දැක්වීමක් නොවන

බවත් ප්‍රකාශ කළ විට, වෙසෙසින් රජයන පක්ෂයට විරුද්ධ දේශපාලන පාක්ෂිකයෝ එය විශ්වාස කිරීමට මැළි වෙති.

සර්වෝදය මෙතෙක් මහන්සි වන්නේ, දේශපාලන බලය සර්වෝදයට ලබා ගැනීමට නොවේ දැ යි ඊළඟට ප්‍රශ්න කරති. සර්වෝදය මහන්සි ගන්නේ බල කාමය පිටුදැකීමට බව ප්‍රකාශ කළ විට, එය මොවුන්ට තේරුම් නොයයි. පක්ෂ සහ බලකාමී දේශපාලනය හැරුණු විට, ඊට වඩා ජනතාවට ළං වූත්, ජනතා සුබසිද්ධිය නිසැකවම ඉටු කර ගත හැකි වූත්, සමාජවාදී ජනසහභාගිත්වක ජනතා දේශපාලනයක් කෙරෙහි සර්වෝදය විශ්වාසය තබා ඇති බව තේරුම් කරදීම ඉතා අමාරු කාර්යයකි. මෙයට ප්‍රධාන හේතුව නම්, මේ පක්ෂ දේශපාලකයින් තුළ අරටු බැසගෙන තිබෙන අධිරාජ්‍යවාදී ගැති කමයි. මේ ගැතිකම නිසා ම, මාක්ස්වාදී වේවා, ලිබරල්වාදී වේවා, ධනවාදී වේවා, අවස්ථාවාදී වේවා, වෙනත් මතවාදී වේවා, දේශපාලකයෝ තමන් පළඳා ගත් දෘෂ්ටි කණ්නාඩියේ වර්ණය අනුව සර්වෝදය දෙස බලති. කොමියුනිස්ටවාදී, ධනවාදී, විප්ලවාණවාදී, අධිරාජ්‍යවාදී, මනෝරාජ්‍යවාදී වශයෙන් විවිධ නම් පටබඳින මොවුන් කෙරෙහි අපි අනුකම්පා කළ යුතු වෙමු. මෝහාන්ධකාරයෙන් මොවුන්ගේ මනස වැසී ගොස් තිබෙන්නේ ඔවුන් තුළ තිබෙන බලකාමය නිසාය. ජනතාවට සේවය කිරීමේ නිස්සරණාධ්‍යාසය ඔවුන් තුළ ඇති වූ විට පමණකි, ඔවුන්ගේ දෘෂ්ටිය ඉවත හෙලා සැබෑ යෝනිසෝමනසි කාරයකින් ඔවුන් අප දෙස බලනු ඇත්තේ.

පසුගිය අවුරුදු 42 තුළ දී යට කී පටු සංකල්පනා මත දේශපාලනයට බට බොහෝ දෙනා සර්වෝදයට විවෘතවත් – හැංගි හොරාත් විවිධ අතවර කළහ.

වර්තමාන රජයේ පවා සමහර මැති ඇමතිවරු, මේ අන්දමින්ම අප ව්‍යාපාරයට සලකන බව සඳහන් කරන්නේ, ඔවුන් කෙරෙහි අප තුළ ජනිත වන සානුකම්පිත හැඟීමකිනි. පක්ෂ භේදය සහ බලකාමය සර්වෝදයට ඇතුලු නොවන තුරු, සර්වෝදයේ ඉදිරි ගමන මොවුන්ට නතර කළ නොහැකි බව පමණක් අප ප්‍රකාශ කළ යුතුය.

එසේ නම් දේශපාලන සංවර්ධනය යන්නෙන්, සර්වෝදය අදහස් කරන්නේ කුමක් ද? දේශපාලනය, ශිෂ්ඨ සමාජයට අලුත් දෙයක් නොවේ. විශේෂයෙන් – ශ්‍රී ලංකාව වැනි දීර්ඝ ඉතිහාසයක් ඇති රටකට එය අලුත් දෙයක් නොවේ. බෞද්ධ දර්ශනයේ ආභාසය ලත් දේශපාලන දර්ශනයක් අප රටේ ක්‍රියාත්මකව පැවැත්තේය. මේ දර්ශනය

වර්තමානයේ දී මෙන්, දේශපාලනයට බසින පුද්ගලයාගේ ජීවිත දෙබිඩි බවට පත් නොකළේ ය. පූර්ණ පෞරුෂෝදයක් – පෞද්ගලික වශයෙන් ඔවුන්ට ලබා ගැනීමටත් ඔවුන්ගේ සේවය ලබන ජන සමාජයට කුටුම්බෝදයක්, ග්‍රාමෝදයක්, ග්‍රාම ස්වරාජ්‍යයක්, නගරෝදයක් සහ දේශෝදයක් ලබා ගැනීමටත්, එම දර්ශනය උදව් විණි. වෙනත් වචන –වලින් කිවහොත් – ශිෂ්ඨ සමාජයට අශිෂ්ඨ අන්දමට, තමන්ගේ පෞරුෂයත් විනාශ කර නොගෙන, දේශපාලනික වශයෙන් සමාජයට සේවයක් කිරීමේ පළපුරුද්ද, අපේ පැරණියන්ට තිබුණේය.

ධර්මිෂ්ඨ රජුන්, පරමාදර්ශී සංඝ සමාජයත්, සාමකාමී පොදු ජනතාවත් යන අංශ තුනෙන් සැදුනු ශ්‍රී ලංකාවේ සමාජය, උසස් දේශපාලන සම්ප්‍රදායවලින් පිරී පැවතුණි. ඒ සාර ධර්ම සහ ශිල්ප ක්‍රම සම්පූර්ණයෙන් ම අමතක කර දමා, බටහිර ඊනියා ප්‍රජාතන්ත්‍රවාදී හෝ සමාජවාදී හෝ සම්ප්‍රදායන් ඔස්සේ අපේ සිත් යොමු කළෙමු. අප කළ මූලික වැරැද්ද මෙයයි. බ්‍රිතාන්‍යයන් අපට රට බාර දුන් අවස්ථාවේ දී ඔවුන් අපට පුරුදු පුහුණු කර තිබූ – ඔවුන්ගේ ඉතිහාසයට සහ පරිසරයට වඩා ගැලපෙන දේශපාලන සහ ආර්ථික ක්‍රම පිළිගැනීම අප කළ ලොකුම මෝඩකමකි. මේ මෝඩකම – මෝඩකමක් බව දැන ගෙන– දැන් වත් එය හරිගස්වා ගැනීමට අප ක්‍රියා නොකළහොත්, එය මෝඩකමක් පමණක් නොව, අපේ අතීතයටත් – අනාගතයටත් කරන මහා අපාරාධයකි. බටහිරින් ආ පක්ෂ සහ බලකාමී දේශපාලන දර්ශනයත්, පුද්ගලික අයිතිය සහ තරගය පදනම් වූ ආර්ථික දර්ශනයත් යන දෙකම සර්වෝදය විසින් ප්‍රතික්ෂේප කරන්නේ මේ නිසාය.

එසේ නම් සර්වෝදයට දේශපාලන බලකාමය නැද්ද? සර්වෝදය ව්‍යාපාරය දේශපාලනයෙන් තොර ද? මේ ප්‍රශ්නවලට අපි කෙලින්ම පිළිතුරු සැපයිය යුතු වෙමු. සර්වෝදයට දේශපාලන බලකාමයක් නැත. එහෙත් සර්වෝදය සෙසු අංශවල මෙන්ම, රටේ දේශපාලන අංශයේ ද සංවර්ධනයක් බලාපොරොත්තු වේ. ඒ නිසා සර්වෝදයට දේශපාලන දර්ශනයක් ද තිබේ.

සර්වෝදය දේශපාලනයේත් පක්ෂ දේශපාලනයේත් වෙනස පහත දැක්වේ:

පක්ෂ දේශපාලන ක්‍රමය

1. තම පක්ෂයට බලය ලබා ගැනීම අරමුණු කර ගනී.
2. විශේෂයෙන් පක්ෂයේත් - වැඩිදෙනාගේත් යහපත සැලසීම අරමුණු කර ගනී.
3. බලය ලබා ගැනීම සඳහා බොරුව, හිංසාව සහ ආත්ම වර්ණනය උපයෝගී කර ගැනීමට බොහෝ විට පසුබට නොවේ.
4. මධ්‍යගත බලය කෙරෙහි විශ්වාසය තබයි.
5. නීති බලය සහ හමුදා ශක්තියෙන් ලැබෙන දණ්ඩ බලය ප්‍රධාන ආධාරකයා කර ගනී.
6. සංවර්ධන සැලැසුම් සැදීමේදී දේශීය සාර ධර්ම සහ දීර්ඝ කාලීන ජාතික උන්නතියට වඩා ළඟ මැතිවරණය දෙස බලයි.
7. ප්‍රජාවබෝධනය සහ ප්‍රජා සහභාගිත්වය පක්ෂ බලයට එරෙහි වන සාධක හැටියට සලකයි.
8. ජනතාව භේද භින්න කරයි.
9. පෞද්ගලික ජීවිතය හා මහජන ජීවිතය යනුවෙන් දෙබිඩි ජීවිත අනුමත කරයි.
10. පක්ෂයට හානි නොවෙතොත් අල්ලස, වංචාව, දූෂණය, දුරාචාරය, අකාර්යක්ෂමතාව, ප්‍රචණ්ඩත්වය ආදිය නිශ්ශබ්දව අනුමත කරයි.
12. භෞතික අරමුණුවලට මුල් තැන දී ඇති අතර ආධ්‍යාත්මික වටිනාකම් පෞද්ගලික ජීවිතයට සීමා කර තබයි.

සර්වෝදය දේශපාලන ක්‍රමය

1. පොදු ජනතාවගෙන් පක්ෂ විසින් උදුරා ගෙන තිබෙන බලය, නැවත පොදු මහජනතාවගේ අතට පත් කිරීම අරමුණු කර ගනී.

2. විශේෂයෙන් සමාජයේ අන්තයේ සිටින ජනතාවගේ යහපත (අන්තෝදය) හා පොදුවේ සියලු දෙනාගේ උදාවත් අපේක්ෂා කරයි.

3. සත්‍යය, අහිංසාව, ආත්මහරණය පදනම් වූ සේවා මාර්ග තුළින් සමාජය වෙනස් කිරීමට ප්‍රයත්න දරයි.

4. විමධ්‍යගත ග්‍රාමීය සහ නාගරික ජන කොට්ඨාශ තුළ තිබෙන ස්වයං පාලන ශක්තිය හෙවත් ප්‍රජා ස්ව රාජ්‍යය කෙරෙහි විශ්වාසය තබයි.

5. ධර්ම බලය සහ ජනතා ශක්තිය ප්‍රධාන ආධාරකයා කර ගනී.

6. දේශීය සාර ධර්මත්, දීර්ඝකාලීන ජාතික උන්නතියත්, සෑම විටම සැලකිල්ලට භාජනය කරයි.

7. ප්‍රජාවබෝධනය සහ ප්‍රජා සහභාගිත්වය ප්‍රජාතාන්ත්‍රික ජීවන ක්‍රමයේ හරය ලෙස සලකයි.

8. ජනතාව එක ම පවුලක් සේ එක්තැන් කරයි.

9. පෞද්ගලික ජීවිතයත් – පොදු ජීවිතයත් – එකම කාසියේ දෙපැත්ත හැටියට සලකයි.

10. ජනතාවට හානි කරන සියලුම වැරදි ක්‍රියා හෙළා දකී.

11. සෑම අවස්ථාවකදීම ජන සහභාගිත්වයත් විවෘත සංවාදයත් පදනම්ව ක්‍රියාත්මක වේ.

12. ආධ්‍යාත්මික වශයෙනුත් – භෞතික වශයෙනුත් – පුද්ගලයාගේත් සමාජයේත් පූර්ණ උදාවක් අරමුණු ව ක්‍රියාත්මක වේ.

අප සමාජයේ පවතින පක්ෂ දේශපාලන ක්‍රමයත්, සර්වෝදයෙන් ඇති කිරීමට බලාපොරොත්තු වන දේශපාලනික වෙනසත් අතර තිබෙන පරතරය – මේ සැසැඳුමෙන් පැහැදිලි වනු ඇත. එසේ නම් සර්වෝදයෙන් කළ හැකි දේශපාලනික නිර්මාණය කුමක් ද?

I. පක්ෂ දේශපාලනයේ යෙදී සිටින අයවලුන්ට, එහි ඇති නිස්සාර භාවයත් – එයින් ජන සමාජයට වන අයහපතත් අවබෝධ කර දී, පක්ෂවලින් තොර, දේශීය පාලන ක්‍රමයක් කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු කරවීම.

II. පක්ෂ භජනයෙන් තොර සේවා පරිසරයක් සහ සේවා ක්ෂේත්‍රයක් සර්වෝදය සම්බන්ධ කටයුතු තුළින් ඉදිරිපත් කිරීමෙන්, දැනට විවිධ පක්ෂ අතර පවතින උග්‍ර වෛරය, අසමගිකම් සහ හිංසක තත්වයන් හැකි දුරට තුනී කර ලීම.

III. ග්‍රාමීය සහ නාගරික කුඩා ජන කොට්ඨාශයන් ආධ්‍යාත්මික සදාචාර සංස්කෘතික පෙළඹවීම් තුළින් එකම පෙරමුණකට ගෙන, විවිධ සර්වෝදය හවුල් මගින් – ඔවුන්ගේ ශක්තිය ඔවුන්ගේම දශ විධ මූලික අවශ්‍යතා සපුරාලීමට යොමු කිරීමෙන්, එම ජන කොට්ඨාශ තුළ ස්වසංවර්ධනයකට සුදුසු පක්ෂ භේදයෙන් තොර පරිසරයක් ඇති කිරීම.

IV. ස්ව ශක්තිය, සාමූහිකත්වය සහ ප්‍රජා සංවිධාන මාර්ගයෙන් ගැමි සාමාජික සහ ආර්ථික ව්‍යුහයේ වෙනස්කම් ඇති කිරීම තුළින් පළමුව – ග්‍රාමෝදයක් සහ නගරෝදයක් ද, දෙවැනිව ග්‍රාම ස්ව රාජ්‍යයක් සහ නගර ස්ව රාජ්‍යයක් ද ඇති කළ හැකි බැව් ප්‍රායෝගිකව පෙන්වා දීම; පක්ෂ ක්‍රමයෙන් බාහිරව ජන සහභාගිත්ව – ප්‍රජාතාන්ත්‍රික ගම්/නාගරික පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කළ හැකි බැව් ප්‍රායෝගිකව පෙන්වීම.

V. ශ්‍රී ලංකාවේ බහු ජනතාව ග්‍රාමීය සමාජ පරිසරයේ වාසය කරන නිසා, පක්ෂ ක්‍රමයෙන් තොර – ප්‍රජාතාන්ත්‍රික ග්‍රාම ස්ව රාජ්‍ය ඒකක දේශීය මට්ටමේ ජන සහභාගිත්ව දේශපාලන ක්‍රමය දක්වා සංවර්ධනය කර ගත හැකි බැව් දේශපාලන පක්ෂවල සිටින අවංක දේශ ප්‍රේමී බුද්ධිමත් ජන නායකයින්ට අවබෝධ කරවීම.

මේ පස් වැදැරුම් වැඩ සටහන සර්වෝදය දේශපාලන ක්‍රියා මාර්ගයයි. මහජන ඡන්දවලට ඉදිරිපත් නොවී, දේශපාලන තානාන්තර ලබා ගැනීමේ සටනක නොයෙදී, කිසිදු වෛරයක් අවුස්සන්නේ නැතිව, සියලු ම පක්ෂ කෙරෙහි උපෙක්ෂාවෙන්, සර්වෝදය කරන සංවර්ධන දේශපාලනය මෙයයි.

මෙවැනි පක්ෂ සහ බලකාමී නොවන, එහෙත් – නිර්වචනයෙන් දේශපාලනය හැටියට සැලකිය යුතු ක්‍රියා මාර්ගයක් අපි අනුගමනය

කරමු. මේ ක්‍රියාමාර්ගය – දැනට කරලියට බැස සිටින සියලුම දේශපාලන පක්ෂවල මූලික සිද්ධාන්තයට පටහැනි නිසා, කෙතෙක් දුරට මෙය සාර්ථක කර ගත හැකි ද යන ප්‍රශ්නය මතු වේ. මෙයට පිළිතුරු සැපයීම සමාජ විද්‍යාත්මක සිද්ධාන්තවලට එක් අතකින් ද, පොදු ජනතාවගේ සහජ බුද්ධිය කෙරෙහි තිබෙන භක්තියට ද, දේශපාලනික නායකයන්ගේ හෘද සාක්ෂියට අනිත් අතින් ද භාර දිය යුතුය. අපට ශක්තිය ලැබිය යුත්තේ, අප ගෙන තිබෙන මාර්ගය නිවැරදි යැයි විශ්වාස කරනවා නම්, ඒ භක්තිය මත අපේ සේවාවන් කර ගෙන යාමෙන් ය.

අපට එරෙහිව අගතිගාමී ලෙස ක්‍රියා කරන දේශපාලකයින් කෙරෙහි අප කෙසේ හැසිරිය යුතුද? අප අත වැරදි නොමැති බව අපටම විශ්වාස – නම් ඔවුන්ගේ අගතිගාමී විවේචනයන් නිසා, අපි පසුබට වනු වෙනුවට, වඩාත් ධෛර්ය සම්පන්න විය යුතු වෙමු. රටේ පවතින සදාචාර නීතිය සහ රාජ්‍ය නීතිය ඇතුළත අප ක්‍රියා කරන තුරු – අගතිගාමීන් විසින් අපට විරුද්ධව නගන චෝදනා – ආපසු ඔවුන්ටම එල්ල වනු ඇත. ඉතාමත් අඩුවෙන් ඒවාට ප්‍රතික්‍රියා කොට – අපේ ශක්තිය උපරිම වශයෙන් යෙදිය යුත්තේ, ඔවුන්ගේ ක්‍රියාවලට පසුබිම් වූ වැරදි සමාජ රටාව තව තවත් කඩිනමින් වෙනස් කිරීමටය.

අපේ දර්ශනය තේරුම් ගත් පක්ෂ දේශපාලකයෝ ද සිටිති. වඩා යහපත් දේශපාලන ක්‍රමයක් බිහි කිරීමට, බලකාමී දේශපාලනයේ නොයෙදී අප කරන පර්යේෂණ දෙස ඔවුහු අවධානයෙන් යුතු ව බලා සිටිති. අප සාර්ථක ප්‍රතිඵල පෙන්වුවහොත්, වඩා දැහැමි සර්වෝදය ක්‍රමයේ දේශපාලනයක් බිහි කිරීමේ කාර්යය ඔවුන් විසින් ම කවදා හෝ බාර ගනු ඇත.

මෙම සර්වෝදය දර්ශනය මත පිහිටා ක්‍රියාවට නංවන ලද සමහර ශිල්පීය ක්‍රම සහ සංවිධාන ව්‍යුහයන් මේ වෙලුමේ සඳහන් වී ඇතත්, මෙම ස්ව චරිතාපදානයේ දෙවන, තුන්වන, හතරවන සහ පස්වන වෙලුම්වල දී පාඨකයාට ඒවා පිළිබඳ සම්පූර්ණ අවබෝධයක් ඇති කර ගැනීමට පුලුවන් වනු ඇත.

මගේ ජීවිතයේ මුල් අවුරුදු හතළිහ පිළිබඳ සමහර සිද්ධීන් ඇතුළත් වූ භව තණ්හා ස්ව චරිතාපදානයේ පළමුවන වෙලුම මෙයින් නිමියේය.

පසු වදන



ඡායාරූප: 375
මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ

භව තණ්හා ස්ව චරිතාපදානය මට කියවන්නට ලැබුණු දිගම චරිත කථාවයි. ආචාර්ය ඒ. ටී. ආරියරත්න මහතා එය ලියන්නට පටන් ගත්තේ, එක්දහස් නවසිය හැත්තෑහයේ සිටය. මේ වන විට අවුරුදු 24ක් එය ලිවීමට ගත වී තිබේ. වෙනත් කාර්යයන්හි අවිවේකී ව සිටිමිනු යි මෙය ලියා ඇත්තේ. පිටු 600 කින් යුත් මෙම පළමුවෙනි වෙලුම පාඨකයා අතට පත් කෙරෙන මේ අවස්ථාවේ එයට පසුවදනක් සැපයීමට ලැබුණු ආරාධනාව මා සලකන්නේ, මට කරන ලද ගෞරවයක් හැටියටය. ප්‍රවීණ ලේඛකයන් වන ගුණදාස ලියනගේ, ලාල් ප්‍රේමනාත් ද මැල්, ප්‍රෙමිල් රත්නායක මහත්වරුන් විසින් ද, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා විසින් ද, ආචාර්ය ඒ. ටී. ආරියරත්න මහතාගේ චරිත කථාව ඔවුන් දුටු ආකාරයට ලියා තිබේ. මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා විසින් මෙම ස්ව චරිතාපදානයේ පෙරවදන සපයා තිබේ. පසුවදන ලිවීමට මට ලැබුණු අවස්ථාව මා අගය කොට සලකන්නේ, අප අතර ජනතා සේවයට කැපවුණු, සමාජ, ආර්ථික හා දේශපාලන දර්ශනයක් ඇති, මානව දයාවෙන් පිරුණු, උතුම් මනුෂ්‍යයකුගේ ජීවිතය ඇගැයීමට පෙළගැසුනවුන්ගේ අගට හෝ එකතු වන්නට හෝ ලැබීම නිසයි.

ගෞතම බුදුන් වහන්සේ, මහත්මා ගාන්ධි, ආචාර්ය විනෝබා භාවේ යන ලෝක පූජිත ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයන්ගේ දර්ශනයෙන් හා ජනතා සේවයෙන් ආවේශය ලැබූ ආචාර්ය ඒ. ටී. ආරියරත්න මහතා විසින් ලියන ලද ඔහුගේම වන චරිතාපදානය භව තණ්හා – එක දිගට, වෙනත් වැඩත් සමග කියවීමට මට ලැබුණු කාලය සති තුනකි. නැවත නැවතත් මගේ හද සසල කළ, සමහර විට කියවීමට අපහසු වන

තරමට දෙනෙතින් කඳුලු වැගිරෙව් – මේ කතාවෙන් මා ලැබූ වින්දනය වචනයෙන් විස්තර කළ නොහැකිය. ආචාර්ය ආරියරත්න මහතා, ඔහුගේ බිරිඳ නීතා පමණක් නොව, දරුවන් ද මිනිසාට සේවය කිරීමට ගොස්, විඳින්නට සිදු වූ කරදර මෙන්ම, ජාතික හා අන්තර් ජාතික ප්‍රජාව ආචාර්ය ආරියරත්න මහතාගේ සේවය ඇගයූ අවස්ථා පිළිබඳ විස්තර මෙන්ම, ඔහු ආත්මහරණයෙන් කළ පුදුම වැඩ ගැන කිය වූ මට– දුක, සතුට හා ඒ දෙකෙන්ම මිශ්‍ර හැඟීම් උද්දීපනය වීම නිසා දෙනෙතින් කඳුලු වැගුරුණා පමණක් නොව, ශබ්දනගා හඬන්නට සිදු වූ අවස්ථාවල දැඩි ආත්ම ශක්තිය යොදා සිත වාවා ගැනීමට ද සිදු විය. ආචාර්ය ආරියරත්න ගැන කලින් මා තුළ වූ සෙනෙහස ස්ථාවර වීමටත්, වර්ධනය වීමටත් මේ පළමුවෙනි වෙලුම කියවීමෙන් ලොකු අනුබලයක් ලැබිණි.

කොළඹ සහ අවට කාන්තාවන්ට මහාචාර්ය එස්. එච්. පී. නානායක්කාර මහතා නැතුව ම බැරි කෙනෙකි. දරුවන් ප්‍රසූත කිරීමේදී ඔවුන්ට ඇති වන බිය මුලුමනින්ම නැති වීමට – ඒ මහතා දැක්කත් ප්‍රමාණවත්ය. ආචාර්ය ආරියරත්නගේ බිරිඳ වූ නීතාට සිය සැමියා නැතත්, නානායක්කාර මහතා සිටීම දරු ප්‍රසූතියක දී ප්‍රමාණවත් විය. මහාචාර්ය නානායක්කාර මහතා, නීතා හොඳින් බලාගෙන, දරු ප්‍රසූතිය මැනවින් සිදු වූවාට පසු සමහර විට, රෝහල් බිලත් ගෙවා, මව සහ දරුවා ගෙදරට ඇරලීමට පවා ඉදිරිපත් විය. ඒ වැඩ එසේ සිදුවෙද්දී ආචාර්ය ආරියරත්න ශ්‍රමදාන කඳවුරුවල කාර්ය බහුලව සිටි බව මේ ස්ව චරිතාපදානයේ සඳහන් වෙයි. ඔහු පුන පුනා කථා කරන ආත්මහරණය මෙවැනි සිද්ධිවලින් සනාථ වන සත්‍යයකි.

ආත්මහරණය යනු මම–මගේ–ආත්මය යන තුනෙන් වඩාත් අහිතකර වූ ආත්මය යන දෘෂ්ටිය බැහැර කිරීමයි. මජ්ඣිම නිකායේ මූලපරියාය සූත්‍රය දේශනා කර තිබෙන්නේ සියලු ධර්මයන්ට මුල මම, මගේ, ආත්මය යන තුන බවයි. ආචාර්ය ආරියරත්න මහතා ආත්මය පමණක් නොව මම, මගේ යන දෘෂ්ටි ද මැඩ පවත්වා ගන්නට සමත් කෙනෙකු බව, මීට පළමු ව දැක් වූ නිදසුනෙන් වුව ද පැහැදිලි වනු ඇත. මෙම ස්ව චරිතාපදානයේ මෙවැනි නිදසුන් කොපමණවත් තිබේ. මම, මගේ, ආත්මය දැඩි ලෙස අල්ලාගෙන සිටින කෙනෙකුට සර්වෝදය වැනි සමාජ සේවාවක් කරගෙන යාමට නොහැකි වනු ඇත.

භව තණ්හා ස්ව චරිතාපදානය, ගත වූ අඩ සියවසකට ආසන්න කාලය තුළ මේ රටේ ඉතිහාසයේ අත්දැකීම් හා සිද්ධීන් සමුදායක්

තුළින් දිවෙන – හරවත් චින්තනයක් හා වැඩ පිළිවෙළක්ද ඒ පිළිබඳ ඇඟැයීමක් ද අප හමුවේ තබයි. දැනට පවතින අතිශයින්ම දූෂණය වූ දේශපාලන ආර්ථික හා සමාජ ක්‍රමය නිවැරදි කිරීමට අවශ්‍ය දර්ශනය එයින් සැපයෙයි.

පක්ෂ නායකයන් හා පක්ෂත්, සමහර විට පවුල් බලයත් තර කරන, රටේ ප්‍රශ්නවලට විසඳුම් නො සපයන, ප්‍රජාතන්ත්‍රවාදය මරා දමන, අපරාධ හා දූෂණ බහුල වර්තමාන ශ්‍රී ලංකාවට – ඒ භයානක අගාධයෙන් ගොඩ ඒමට ආචාර්ය ආරියරත්න මහතා ගත් මගත්, ඔහුගේ දර්ශනයත් බෙහෙවින් ප්‍රයෝජනයට ගත හැකිය.

පක්ෂ ක්‍රමය මුලුමණින්ම අහෝසි විය යුතුය; පවුල් බලය ද අවසන් විය යුතුය. වාර්ගික වෙනස්කම් ද දිය වී යා යුතුය. ප්‍රජාතන්ත්‍රවාදී රටක් වශයෙන් ගත් විට මොනම භේදයක්වත් නැතිව, සෑම පුරවැසියෙකුටම සමාන පරමාධිපත්‍යය තිබිය යුතුය. එය ක්‍රියාත්මක කිරීමට ද, ඔහුට නිදහස තිබිය යුතුය. පක්ෂ නායකයා නියම කරන කෙනෙකුට ඡන්දය දෙන්නට, පරමාධිපත්‍යය හිමි ඡන්දදායකයාට සිදු වන විට – ඔහුට තමන් කැමති, වඩාත් බුද්ධිමත්, කාර්යශූර, ශීලාචාර හා මානව හිතවාදී කෙනෙකුට ඡන්දය දීමට තිබෙන අයිතිය නැති වෙයි. මේ නිසා පවුල් හා පක්ෂ මානසිකත්වය මුලුමණින්ම ඡන්ද දායකයන්ගේ සිත්වලට අවහිරයක්, බලපෑමක් නොවිය යුතුය. මෙවැනි වාතාවරණයක් යටතේ ඕනෑම කෙනෙකුට ඡන්දයට ඉදිරිපත් වීමට අවස්ථාව සැලසෙයි. ඡන්දදායකයන් කැමති කෙනෙකුන් තෝරා පාර්ලිමේන්තුවට යැවීමට ද ඉඩ ලැබෙයි. මේ ක්‍රමය ක්‍රියාත්මක කරන්නේ නම්, දැනට තිබෙන ජනවාර්ගික ප්‍රශ්නය පවා විසඳිය හැකිය. ආචාර්ය ආරියරත්න මහතා මෙවැනි දේශපාලන ක්‍රමයක් සඳහා මඟ පෙන්වීමට සමත් දර්ශනයක් ඇති කෙනෙකි.

ආචාර්ය ආරියරත්න මහතා, බෞද්ධ ආර්ථික දර්ශනය මැනවින් වටහා ගෙන තිබේ. එය ක්‍රියාවට නැඟීමේ වැදගත්කම ඔහු ජාතික හා අන්තර්ජාතික වශයෙන් පෙන්වා දී තිබේ. මෙම ආර්ථික දර්ශනයේ සුවිශේෂත්වය රැඳී පවතින්නේ ඉල්ලුම හා සැපයුම මෙහෙයවන චින්තනය මතයි. ආසාවන් තෘප්තිමත් කිරීම නිමාවක් නැති භයානක ප්‍රතිඵල ඇති කරන්නකි. අවශ්‍යතා සපුරාලීම ඒ වෙනුවට, ආදේශ කරගත යුතුය. එයින් අර භයානක ප්‍රතිඵල ඇති නොවනු ඇත. එපමණක් නොව, බුදු දහමේ ඉගැන්වෙන ප්‍රධාන ආර්ථික සිද්ධාන්තයක් වන අල්පෙච්ඡතාව පවත්වා ගනිමින්, සම්පත් විනාශය වෙනුවට –

සම්පත් සංරක්ෂණය ද, අපරාධ අවම කර ගැනීම ද එමගින් අපේක්ෂා කළ හැකිය.

රටේත්-සමාජයේත්-සංවර්ධනයත් අපේක්ෂා කරන, එහෙත් දේශපාලන හා ආර්ථික දර්ශනයක් නැති දේශපාලනඥයන්ට, නිසි මග පෙන්වීමට දර්ශනයක්, අත්දැකීමක් හා කැපවීමක් ඇති වැදගත්ම ශ්‍රී ලාංකිකයා ආචාර්ය ඒ. ටී. ආරියරත්න මහතා බව ප්‍රකාශ කිරීමට මම පසුබට නොවෙමි.

මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
ගංගොඩවිල - නුගේගොඩ
2000.08.27

පින් දීම

- මා අහරින් මෙන්ම, ගුණ දහම්වලින් ද පෝෂණය කළ දෙමාපිය, වැඩිහිටියන්ටත්, භික්ෂූන් වහන්සේලා ඇතුලු මෙහි සඳහන් වූ මෙන්ම, සඳහන් නොවූ සියලුම ගුරුවර ගුරුවරියන්ටත් මුලින්ම පින් දෙමි.
- මෙම ස්ව චරිතාපදානයේ 1956 සිට 1971 දක්වා වූ මුල් වසර 15 තුළ දී සර්වෝදය ගොඩනැංවීමට මා සමග එක් වී සහාය දුන් වැඩිමහල්, බාල, මහලු ජීවතුන් අතර සිටින, ජීවතුන් අතර නැති සියලුම දෙනාටත්,
- මගේ වැරදි පෙන්වා දෙමින් මෙන්ම, මගේ සේවයට බාධා කරමින්, මගේ අඩුපාඩු සාදා ගෙන ධෛර්යය හා උපේක්ෂාව වර්ධනය කර ගැනීමට උදව් කළ හැම දෙනාටත්,
- මා මුල් අවදියේ දුටු සිහින සැබෑ කර ගැනීමට – මා කෙරෙහි පූර්ණ විශ්වාසය තැබූ සර්වෝදය ගැමි සහ නාගරික කොට්ඨාශවල සිටින සියලු දෙනාටත්,
- මා පිළිබඳ චරිතාපදාන ලියූ පරලෝ සැපත් ගුණදාස ලියනගේ, ලාල් ප්‍රේමනාත් ද මැල්, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර, ප්‍රේමිල් රත්නායක මහත්වරුන්ට සහ මහාචාර්ය නන්දසේන රත්නපාල ඇතුලු සෙසු ලේඛකයින්ටත්,
- මෙහි පෙර වදන සහ පසු වදන ලියාදීමෙන් හා අත් පිටපත කියවා ප්‍රකාශනයට සුදුසු ලෙස සකස් කර දුන් මහාචාර්ය නන්දසේන රත්නපාල සහ මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ යන විද්වතුන්ටත්,
- සුවදනක් ලියා දුන් කලාකීර්ති එඩ්වින් ආරියදාස මහතාටත්
- සියලුම සෝදුපත් කියවා, පොත සකස් කිරීමේ භාරය ඉසිලූ පියසේන වික්‍රමගේ මහතාටත්,
- ආකර්ෂණීය කවරය සකස් කර මේ පොත එළිදැක්වීමට වෙහෙසුණු බර්ට්‍රම් නිහාල් කලාශූරීන්ටත්,
- මුලික යතුරු ලියන කටයුතු කළ පුෂ්පා රංජනී සහ සෝමා අබේනායක මහත්මියන්ටත්,

- සියලුම පරිගනක පිටපත් සකස් කළ සර්වෝදය විශ්ව ලේඛා හි සුජාතා ලෝපේස්, චම්පා ඉරාණී, පුෂ්පිකා ද සිල්වා සහ ලක්මාල් ද සිල්වා යන මහත්ම මහත්මියන්ටත්.

- ඡායාරූප සකස් කිරීමේ කාර්ය භාර ගෙන කටයුතු කළ අනුර පීරිස් මහතාටත්, විශේෂ ඡායාරූප සැපයූ විමලසිරි ජයලත් මහතාටත්, නාලන්දා විද්‍යාලයයේ ඡායාරූප සපයා දුන් පුලතිසි සූරියබණ්ඩාර මහතාටත්

- මගේ මතකය අලුත් කර ගැනීමට උදව් වූ ධර්මා ගුණසිංහ, ධර්මසේන සේනානායක සහ සිරිල් ඒකනායක මහත්වරුන්ටත්, මගේ බිරිඳ නීතා ධම්මචාරීටත්,

- ප්‍රකාශන කටයුතු පිළිබඳව මා දිරිමත් කොට භව තණ්හාවේ පළමු වෙලුම මුද්‍රණය කිරීම සහ ප්‍රකාශනයට පත් කිරීමට වෙහෙසුනු සුසිරි ද සිල්වා මහතා ප්‍රධාන විශ්ව ලේඛා ආයතනයේ සේවක සේවිකා මඩුල්ලටත් දයා පෙරදැරිව පින් දෙමි.

ළඟදීම ප්‍රකාශනයට පත්වන භව තණ්හාවේ සෙසු වෙලුම් හතර සකස් කර ගැනීමට ද ඔබ කාගේත් සහයෝගය පතමි.

ඡායාරූප: 376

මා පිළිබඳ චරිත කතා සම්පාදනය කළෝ

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර

ගුණදාස ලියනගේ මහතා

මහාචාර්ය නන්දසේන රත්නපාල

ලාල් ප්‍රේමනාත් ද මැල් මහතා

ප්‍රේමිල් රත්නායක මහතා



ඡායාරූප: 377 1970 දශකයේ සිට අප දෙදෙනාගේ සර්වෝදය මෙහෙයට එක් වූ දරුවෝ (වමේ සිට) වින්යා, මා, නීතා, ජීවන්, නිම්නා, චාරිකා, සදීවා සහ දියත්

ඒ. ටී. ආරියරත්න

සුවදනක්

ගම, නගරය සහ ලෝකය, මානව සේවයේ බලයෙන් ඒකාබද්ධ කොට, මිනිස්කම පිළිබඳ සහන් එළිය විශ්ව ව්‍යාප්ත වේගයක් බවට පත්කළ අපූරු පුද්ගලයෙකු වශයෙන් ආචාර්ය ඒ.ටී. ආරියරත්න ජගත් ජනහද අරක් ගෙන සිටින ප්‍රජා නායකයෙකි. නව තාක්ෂණයේ ග්‍රහණයට අසුව, මානව හර පද්ධතිය විපරිත කොට ගත්, ජන ප්‍රවාහය, පෙරලා අන්‍යොන්‍ය සහයෝගයේ සුහද මගට පත්කොට, ඔවුන් උදාර යුගයක නවෝදය කරා ගෙන ආවේ, ගම්මානයකින් බිහිව මුළු ලොවම සිය ගම්මානය කොටගත් ආචාර්ය ඒ.ටී. ආරියරත්න ජන වේදියාණන් විසිනි.

මෙසේ සිය දර්ශනයෙන් ලොව අවදි කොට, විශ්ව ව්‍යාප්ත සම්මානයටත් ගෞරවෝපාහාරාවලියකටත් සුදුසු වී හැම විටම සරළව නිමලව වෙසෙන ආචාර්ය ඒ.ටී. ආරියරත්න ජන නියමුවාගේ ස්වචරිතාපදානය, මිනිස්කම සොයා යන මානව සේවයේ අගය දැන හැඳින ගන්නා ලෝකයකට පිදුනු සඳුපදේශයකි. හැදුනු පරපුරත්, හැදෙන පරපුරත්, මේ ස්වචරිතාපදානය, සිය ජීවන තරණයෙහි නිසි මග සොයා ගන්නට ඇසුරුකරන පැහැදිලි සිතියමක් වනු නියත යැයි මගේ ඒකාන්ත විශ්වාසයයි.

කලා කීර්ති එඩ්වින් ආරියදාස

SARVODAYA
VISHVA LEKHA
Printers
ISBN 955-599-224-X
මිල රු. 750/=

භව තණ්හා

ස්ව චරිතාපදානය

පළමුවන වෙලුම